පෞරාණික කිසියම් ස්ථවිරපාදයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ

අපදානට්ඨ කථා

(සිංහල පරිවර්තනය)



ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

අපදානාර්ථ කථා
පළමුවෙනි භාගය

දෙහිවල නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් පාලි අර්ථ කථා සිංහලයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපදානාර්ථ කථා පළමුවෙනි භාගය පරිවර්තනය කරනු ලැබූ ඒ. ඇම්. ඩී. වයි. සරන්චන්ද්‍ර අමරතුංග මහතා කැළණි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති (MA) උපාධිධාරියෙකි. (1994) 1983 වර්ෂයේ දී ඒ මහතා ප්‍රාචීන පණ්ඩිත විභාගය සමත් වූයේ මූල් දිවයිනෙන්ම සංස්කෘත විෂයයෙන් දෙවැනි ස්ථානය ලබා ස්වර්ණමුද්‍රිකාවද දිනා ගැනීමෙනි.

විද්‍යාලංකාර මහා පිරිවෙනේ ආචාර්ය වරයෙකු වසයෙන් සේවය කරන ඒ මහතා ග්‍රන්ථ කර්තෘවරයෙක් ද වෙති.

භෝජ ප්‍රබන්ධය, රසූ වංශය, නාගානන්ද නාට්‍යය, යන පොත් සිංහලට පරිවර්තනය කර ඇති ඒ මහතා, ථේරී ගාථා සිංහලට පරිවර්තනය කර ඇත. බෞද්ධ අර්හත් සංකල්පය ද එතුමා විසින් රචිත ග්‍රන්ථ අතර වේ.

Vol XLIII

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ

අපදානට්ඨ කථා

පළමුවන කොටස

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 18

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ

අපදානට්ඨ කථා

පළමුවන කොටස

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

පන්නිපිටිය විද්‍යාලංකාර මහ පිරිවෙනේ ආචාර්ය

රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති

ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 21736737

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ
අපදානට්ඨ කථා - I

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2007

I S B N - 978-955-1604-42-4

පරිගණක අකුරුකරණය
උපමාලි කුලසේකර - කටුගස්තොට.

පිටකවරය
සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය
අජන් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය,
බොරලැස්ගමුව.
දුරකථනය : 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෙගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සළකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රනයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයීක භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුනු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුත් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙනි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෘවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාදීපයේ තහවුරු විය.

හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්නිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්විය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදී. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධී මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංගනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩ්ලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයුර සුත්ත පට්ඨන හෝ මයුර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය වර්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාර්‍යන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දැන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්ෂ එක්සැට්දහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගූ සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන **මහාපච්චරිය කුරුන්දි** ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැගීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

අටුවා විස්තරය

විනය පිටකය

පෙළ	අටුවාව	කර්තෘ	කාලය
උභය විභංග 1 පාරාජිකා පාලි	1 ආණා දෙසනා සමන්තපාසාදිකා	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
2 පාචිත්තිය පාළි	2 යථාපරාධ සාසන විනය අට්ඨකථා		
ඛන්ධක 3 චුල්ල වග්ග පාළි	3 සංවරාසංවර කථා		
4 මහාවග්ග පාළි			
පරිවාර 5 පරිවාර පාළි			
	භික්ඛුපාතිමොක්ඛ කඞ්ඛා විතරණි	බුද්ධඝෝෂ හිමි	5වන ශ.ව.
	භික්ඛුණී පාතිමොක්ඛ (මාතිකට්ඨ කථා)		

අභිධර්ම පිටකය

1 ධම්මසංගණිප්පකරණ	1 පරමත්ථ දේසනා	අත්ථසාලිනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
2 විභංගප්පකරණ	2 යථාධම්ම සාසන	සම්මෝහ විනෝදනී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
	3 නාමරූප පරිච්ඡේද කථා		
3 කථාවත්ථුප්පකරණ			බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව.
4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ			
5 ධාතුකථාප්පකරණ	පරමත්ථදීපනී		
6 යමකප්පකරණ	පඤ්චප්පකරණට්ඨකථා		
7 පට්ඨානප්පකරණ			

සූත්‍ර පිටකය

1 දීඝනිකාය	1 වොහාරා දේශනා	සුමංගල විලාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
2 මජ්ඣිමනිකාය	2 යථානුලෝමසාසන	පපඤ්ච සූදනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
3 සංයුක්තනිකාය	3 දිට්ඨි විනිවෙඨන කථා	සාරත්ථප්පකාසිනි	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
4 අංගුත්තරනිකාය		මනෝරථපූරණී	බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
5 බුද්දක නිකාය			
1 බුද්දකපාඨ	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
2 ධම්මපද	ධම්මපදට්ඨ කථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
3 උදාන	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
4 ඉතිවුත්තක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
5 සුත්තනිපාත	පරමත්ථ ජෝතිකා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
6 විමානවත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
7 පේත වත්ථු	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
8 ථේර ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
9 ථේරී ගාථා	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
10 ජාතක	ජාතකට්ඨකථා		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
11 නිද්දේස (චුල්ල-මහා)	සද්ධම්ම ජෝතිකා		උපසේන ආචාර්ය 6වන ශ.වි.
12 අපදාන (ථේර-ථේරී)	විසුද්ධ ජන විලාසනී		මහානාම ආචාර්ය 7වන ශ.වි.
13 පටිසම්භිදා මග්ග	සද්ධම්මප්පකාසිනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
14 බුද්ධවංස	මධුරත්ථප්පකාසිනී		බුද්ධදත්ත හිමි 5වන ශ.වි.
15 චරියාපිටක	පරමත්ථ දීපනී		ධම්මපාල ආචාර්ය 5වන ශ.වි.
	විසුද්ධි මග්ග		බුද්ධඝෝෂ හිමි 5වන ශ.වි.
නෙත්තිප්පකරණ	නෙත්ති අට්ඨකථා		ධර්මපාල ආචාර්ය 5වන ශ.වි.
චතුභාණවාරපාළි	චතුභාණවාර අට්ඨකථා		ආනන්ද විහාරතන 8වන ශ.වි.

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාලියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසිනි.

බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනි නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථීකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරික්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සභභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනනමාමක පිරිස්ද මෙම රැස්වීමට සභභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සවිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනි" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනිනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැළමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතමිහ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

කිරම විමලජෝති ස්ථවිර,
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ශ්‍රී සුමංගල නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යටගම ධම්මපාල අනුනායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත ආදාවල දේවසිරි නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක මාහිම්පාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැස්ටියේ උපනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පැපිලියානේ සුමිත්ත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බමුරුගම ධම්මවංස හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත තුඹුල්ලේ ධම්මානන්ද නායක හිමිපාණන් වහන්සේ

රාජකීය පණ්ඩිත	කීර්ති නාරම්පනාව මහතා
ශාස්ත්‍රවේදී	ඇන්.එච්. පෙරේරා මහතා
පණ්ඩිත	ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා
පණ්ඩිත	ටී.ජී. ජයතිලක මහතා
පණ්ඩිත	ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා
පණ්ඩිත	එච්.පී.ඇස්. නිශ්ශංක මහතා

පණ්ඩිත	බී.ඇම්.පී. බාලසූරිය මහතා
පණ්ඩිත	සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා
පණ්ඩිත	දයා ගුණසේකර මහතා
පණ්ඩිත	ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා
පණ්ඩිත	ජිනදාස ගොඩකන්ද මහතා
පණ්ඩිත	ලසිත් නලන්ත මහතා
පණ්ඩිත	පී.ඇල්.කේ. පෙරේරා මහතා

සම්බන්ධීකරණය:- විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
(පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ
(කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. පූජ්‍ය අම්පාරේ ධම්මෝදය හිමිපාණන් වහන්සේ. (දර්ශනපති)
6. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
7. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
9. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
10. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

පටුන

පිටු අංකය

අපදානට්ඨ කථා 1

	බුද්ධාපදාන වර්ණනා	3 - 142
	පචෙචක බුද්ධ වර්ණනා	142 - 228
	ථෙරාපදාන වර්ණනා	228 - 322
	සුමේධ කථා	3
	නිදාන කථා	40
	බුද්ධාපදාන වර්ණනා	117
1.	පළමු ගාථා වර්ණනාව	149
2.	සංසග්ග ගාථා වර්ණනා	169
3.	සුහද මිත්‍ර ගාථා වර්ණනා	173
4.	වංසකළීර ගාථා වර්ණනා	174
5.	මිග අරණ්‍යක ගාථා වර්ණනා	176
6.	ආමන්ත්‍රණ ගාථා වර්ණනා	181
7.	බ්‍රඩ්ඩාරතී ගාථා වර්ණනා	182
8.	චාතුද්දිස ගාථා වර්ණනා	183
9.	දුස්සංග ගාථා වර්ණනා	185
10.	කෝවිළාර ගාථා වර්ණනා	187
11.	සහාය ගාථා වර්ණනා	188
12.	අද්ධාපසංසා ගාථා වර්ණනා	190
13.	සුවණ්ණ චලය ගාථා වර්ණනා	191
14.	ආයතිභය ගාථා වර්ණනා	192

15.	ඊති ගාථා වර්ණනා	195
16.	සීතාලුක ගාථා වර්ණනා	196
17.	නාග ගාථා වර්ණනා	197
18.	අධ්‍යාන ගාථා වර්ණනා	198
19.	දිට්ඨි විසූක ගාථා වර්ණනා	200
20.	තිල්ලෝලූප ගාථා වර්ණනා	201
21.	පාප සහාය ගාථා වර්ණනා	204
22.	බහුස්සුත ගාථා වර්ණනා	204
23.	විභූෂණීධ්‍යාන ගාථා වර්ණනා	206
24.	පුත්තදාර ගාථා වර්ණනා	207
25.	සංගහ ගාථා වර්ණනා	207
26.	සන්දාල ගාථා වර්ණනා	208
27.	ඔක්කිත්ත චක්ඛුගාථා වර්ණනා	209
28.	පාරිච්ඡත්තක ගාථා වර්ණනා	210
29.	රසගෙධ ගාථා වර්ණනා	211
30.	ආවරණ ගාථා වර්ණනා	213
31.	විජිටිඩී ගාථා වර්ණනා	213
32.	ආරද්ධ විරිය ගාථා වර්ණනා	214
33.	පටිසල්ලාන ගාථා වර්ණනා	216
34.	තණ්හක්ඛය ගාථා වර්ණනා	217
35.	සීහනාද ගාථා වර්ණනා	218
36.	දාඨාබලී ගාථා වර්ණනා	220
37.	අප්පමඤ්ඤා ගාථා වර්ණනා	221
38.	ජීවිත සංඛය ගාථා වර්ණනා	222

පච්චේක බුද්ධ වර්ණනා 222 - 228

ථෙරාපදාන වර්ණනා

සැරියුත් මහ තෙරුන්ගේ අපදානය 228

මුගලන් මහතෙරුන්ගේ අපදානය 267

මහා කාශ්‍යප මහ තෙරුන්ගේ අපදානය 274

අනුරුද්ධ මහ තෙරුන්ගේ අපදානය 292

පුණ්ණ මන්තානිපුත්ත මහා තෙරුන්ගේ අපදානය 297

උපාලි මහතෙරුන්ගේ අපදානය 300

සංඥාපනය

බුද්දක නිකායට අයත් අපදාන පාළියට ලියන ලද විසුද්ධ ජන විලාසිනී නම් වූ අපදාන අට්ඨ කථාවෙහි සිංහල පරිවර්තනය මෙහි දැක්වේ.

අපදාන අට්ඨකථාවෙහි දැක්වෙන සෑම කථාවක්ම ආර්ය නමින් හැඳින්වෙන රහතන්වහන්සේ නමකගේය. රහත් බව ලැබීම දක්වා වූ ගමන්මග අතිදීර්ඝ අතිදුෂ්කර වූවකි. ජාතක කථාවකින් දැක්වෙන පාරමිතා පුරන බෝධිසත්ත්වයකුගේ ඥානය, ප්‍රඥාව වැනි පුරුෂාර්ථ අපදාන කථාවක දක්නට නැහැත් පහන් සිතින් කරන ලද ඉතා සුළු පිංකමකින් පවා බොහෝ කාලයක් තිස්සේ සංසාරයෙහි සැප සම්පත් විඳිය හැකි බව සෑම අපදාන කථාවකින්ම පෙන්නුම් කෙරේ.

සෑම අපදාන කථාවක්ම පාහේ සමාන ආකෘතියකින් සැකසී ඇති බැවින් ඒ ආකෘතිය කුමක්ද යන්න සලකා බැලීම වනේය.

අපදාන කථාවක ආකෘතිය

1. අපදානය හඳුන්වා දීම.

2. පෙර බුදුවරුන් හමුවෙහි උත්සාහය අරඹා
නිර්වාණාධිගමයට උපනිශ්‍රය වන පින් රැස්කොට
බුද්ධෝත්පාද කාලයකදී බුදුන් හමුවී ධර්මය ඇසීම.

3. ප්‍රාර්ථනාවක් තැබීම.

4. දෙවි මිනිසුන් අතර සම්පත් අනුභවකොට බුද්ධෝත්පාද කාලයක මිනිස් ලොව ඉපදී ප්‍රාර්ථනා සමෘද්ධ කරගැනීම.

5. විදසුන් වඩා රහත් බව ලැබ පූර්ව කර්මය ප්‍රකාශ කිරීම.

මේ එක් එක් අංගයක් විමසා බැලීම භික්ෂු ජීවිතයක අවසන් ප්‍රතිඵලය වන රහත්බව ලබනා තාක් කල් සිදුවන ක්‍රියාවලිය දැන ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන්නේය. සියලු අපදාන එක හා සමාන සැපවත් නැත. මනුෂ්‍යයන් පමණක් නොව වඳුරන්, කිඹුලන් වැනි සතුන් පවා චිත්තප්‍රසාදයෙන් කරන ලද පින්කම් හේතුවෙන් දීර්ඝ කාලයකට පසු මනුෂ්‍යාත්ම භාවයන්හි ඉපිද රහත්බව ලැබූ ආකාරය අපදාන කථාවලින් හෙළිවේ. මනුෂ්‍යයන් වුවද දූෂිත සිත් හේතුවෙන් බුද්ධෝත්පාද කාලයක උපත ලැබුවත් බුද්ධි සාඵල්‍යය නිසා රහත්බව ලැබුවද ඒහිභික්ෂු භාවයෙන් පැවිද්ද ලැබීම නොහැකි වූ තැන් දක්න ලැබේ. මේ නිසා අපදාන කථාවක ආකෘතිය විමසා බැලීම වැදගත් වේ.

1. අපදානය හඳුන්වා දීම

අපදාන පාළිය ගාථාවලින් පබැඳි ඇති බැවින් එහි සම්පූර්ණ කථා ප්‍රවෘත්තිය ඇතුළත් නොවේ. අට්ඨකථාවෙන් සිදුකෙරෙන්නේ ඒ අඩුව සපුරාලීමය. 'පදුමුත්තර සම්බුද්ධන්නි' ආදිකා ආයසමතො අඤ්ඤා කොණ්ඩඤ්ඤ ථෙරස්ස අපදානං' අඤ්ඤා කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේගේ අපදානය ඇරඹෙන්නේ එසේය. අනිකුත් අපදාන ඇරඹෙන්නේද ඒ අයුරිනි. අපදාන පාළියෙහි ආරම්භක ගාථාවෙහි මුල්පදය ඵුවාවෙහි ආරම්භයයි.

2. පෙර බුදුවරුන් හමුවෙහි උත්සාහය අරඹා නිර්වාණාධිගමය උපනිශ්‍රය වන පින් රැස්කොට බුද්ධෝත්පාද කාලයකදී බුදුන් හමුවී ධර්මය ඇසීම.

සෑම අපදානයකම 'පුරිම බුද්ධෙසු කතාධිකාරෝ' යන්න දක්න ලැබේ. නත්‍ථ තත්‍ථ භවෙ විවට්ටූපනිසසයානි පුඤ්ඤානි උපචිනනෙතා පදුමුත්තරස්ස භගවතො කාලෙ ගහපති මහාසාල කුලෙ නිබ්බතතිවෝ වුද්ධිපපතෙතා එකදිවසං සත්‍ථු සන්තිකෙ ධම්මං සුණානෙතා - සෑම අපදානයකම මෙබඳු සමාන වාක්‍යයක් දක්නට ඇත. වෙනසක් වන්නේ බුදුරජාණන් වහන්සේ වෙනස්වීමත්, උත්පත්තිය ලැබූ කුලය හෝ ස්ථානය වෙනස් වීමත්ය.

3. ප්‍රාර්ථනාවක් තැබීම

අදාළ බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා ප්‍රාර්ථනාවක් තැබීම පොදු ලක්ෂණයකි. බුදුරජාණන් වහන්සේ එක් භික්ෂුවක අන් භික්ෂූන් අතර අග්‍රස්ථානයෙහි තබනු දැක එම තනතුර තමාටත් කවදා හෝ ලබන්න ඇත්නම් යන චේතනාවෙන් ඒ ස්ථානය ප්‍රාර්ථනා කළ තැන් බොහොමයක් ඇත. එසේ නැතහොත් සිත් පහදවාගෙන බුදුරජාණන් වහන්සේට පූජාවක් කිරීමද දක්නට හැකිය. ඇතැම්විට ඒ පූජාව ඉදිකටුවක්, පුටුවක්, සිවුරක් සඳහා රෙදිකඩක්, වැනි තමතමාගේ හැකියාවන් අනුව පහන් සිතින්ම කරන ලද්දකි.

4. දෙවි මිනිසුන් අතර සම්පත් අනුභවකොා මෙම බුද්ධෝත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපිද, ප්‍රාර්ථනා සමෘද්ධ කරගැනීම.

දෙව මනුසෙසුසු සංසාරනෙනා උභය සමපතතියෝ අනුභවිතවා
උපපනනුපපනනාභවෙ සබබසෝ පූජිතෝ ඉමසමිං බුදධුපපාදෙ
කුලගෙහෙ නිබබතතිබා විඤඤුතමපතෙනා පුබබ වාසනා බලෙන
සතථරි පසනෙනා පබබජිතෝ නචිරසෙසව අරහා අහොසි

සෑම අපදානයකම පාහේ මේ වාක්‍යය දක්නට ලැබේ. උභය සම්පත් විඳින්නට ලැබෙන්නේ පහන් සිතින් කළ කුඩා වූ හෝ පිනක මහිමය නිසාය. රහත්භාවය ලබනතුරු පවත්නා වාසනාගුණ නිසා බුදුන් දැක පැවිදිවී රහත්බව ලබාගන්නට හැකිවේ.

5. විදසුන් වඩා රහත්බවට පත්ව පූර්වකර්මය ප්‍රකාශ කිරීම.

අපරභාගෙ අතතනෝ කුසලකමමං සරිතවා සොමනසසජාතෝ
පුබබචරිතාපදානං පකාසෙනෝ

රහත්බවට පත්වන තාක්කල් ගෙවූ ජීවිතය පිළිබඳව නිරාමිසව සලකා බලන රහතන්වහන්සේ තම අතීත ජීවිතය දුක්කම්කටොලින් වෙන්ව සුඛ විහරණයෙන්ද ගෙවීගිය ආකාරය සඳහන් කරති.

රහත්බව ලැබීමට උත්සාහයක්ද ප්‍රාර්ථනාවක්ද තිබිය යුතු බව මෙහි දැක්වෙන සෑම අපදානයකින්ම පැහැදිලිවන සත්‍යයෙකි. අනාගත

බුදුවරයකුගේ සසුනෙහි පැවිද්ද ලැබීම පින් රැස් කළයුතුමය. ඇතැම් රහතන් වහන්සේලා පෙර ආත්ම භාවවල බ්‍රහ්ම ලෝකවල උත්පත්තිය ලබා ඇත. ඒ ධ්‍යානලාභීව සි අපවත් වූ විටය. ඇතැම් රහතන් වහන්සේ නමක් පැවිද්ද සඳහා නිසමුඩුකරනු ලබනවිට රහත්බව ලබා ඇත. රහත්බවට පත්ව තමා පෙර ආත්ම භාවයන්හි කළ පුණ්‍යකර්මයන් සිහිකොට සොම්නස්ව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කිරීම සෑම අපදානයකම පොදු ලක්‍ෂණයයි.

විවට්ටූපනිසසය පින් මෙහි දැක්වෙන අයුරින් නම් ඉතා විශාල පින් නොවේ. පිනෙහි මහත්ඵල භාවය රඳ පවත්නේ එහි විශාලත්වය හෝ කුඩා බව මත නොවේ. ඒ පින කිරීමේදී මූලික වූ සිතෙහි ස්වභාවය මතය. පින කුඩා වුවද 'පසනන මානසො', 'සොමනස්සන්තො' යන පදයන්ගෙන් විස්තර කෙරෙන්නේ ඒ සිතෙහි ස්වභාවයයි. විභව සම්පත් ඇති මහාභෝග කුලවල උපන් ඇතැමුන් රත්රනින් පාත්‍ර දහසක් තනවා එහි කිරිබත් පුරවා විපස්සි බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේට පිදූ හැටිත් ඇතැමුන් තේසාද කුලයෙහි ඉපිද දඩමස් පූජාකළ වී බුදුරජාණන් වහන්සේ ඔහු කෙරෙහි අනුකම්පාවෙන් ඒවා වැළඳූ බවද සඳහන් වේ. මේ කරුණු කෙරෙහි අවධානය යොමුකරනවිට වර්තමාන කාලයෙහි අනිකුත් කුදුමහත් පින්කම් පසෙකලා සාමූහික භාවනා වැඩසටහන්වලට පමණක් මිනිසුන්ගේ සිත් යොමුකරනු ලැබීම හරවත් දෙයක්ද යන්න පිළිබඳව සැකයක් ඇතිවේ. පෙර කරන ලද පින් නැතිනම් කිසිවකුට නිවන්මගට යොමුවිය නොහැකි බව පෙනේ. මේ කරුණ බාහියදාරුචීරිය අපදානයෙන් පැහැදිලිව දැකගත හැකිය. පෙර කරන ලද පින් පහන් සිතින් නොකළ බැවින්ද සංසාරයෙහි සැරිසරද්දී එකදු අටපිරිකරක්වත් පූජා නොකිරීම නිසා එහිහිඤ්ඤභාවයෙන් පැවිද්ද ලැබීම නොහැකිව අවාසනාවන්ත මරණයකට ගොදුරුවීමට දාරුචීරිය හිමියන්ට සිදුවිය. ප්‍රාර්ථනා කිරීම් ලෝභය නිසා සිදුවන්නක් බව දැන් දැන් අවබෝධ කරවනු ලැබේ. දීපංකර පාදමූලයේදී සුමේධ තවුසා කළ ප්‍රාර්ථනය අනාගතයේදී බුද්ධත්වය ලැබීමට හේතුවිය. ප්‍රාර්ථනා තැබීම යනු එක් පරමාර්ථයක් වෙත පැමිණෙන්නෙමියි යමකු විසින් කරනු ලබන අධිෂ්ඨානයෙකි. බුදුකෙනෙකුන්ගේ ශාසනයෙහි බුද්ධශ්‍රාවකයන්ට තනතුරු ප්‍රදානය සිදුවිය. පෙර බුදුකෙනකුන් වහන්සේ ශ්‍රාවකයන් තනතුරුවලට පත්කිරීමේදී ඒ දෙස බලාසිටින්නකු තමාද එබඳු තනතුරක් ලබන්නෙමියි කරන ලද ප්‍රාර්ථනා බොහෝ අපදානවල දක්නට ලැබේ. ඒ බව බුදුරජාණන්

වහන්සේට දැන්වූවිට ඒ පුද්ගලයා අනාගතයේදී එම තත්ත්වය ලැබීම සුදුසු බව බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශයට පත්කරනු ලැබේ. මෙබඳු තත්ත්වයකට පත්වීමට ඒ සඳහා පෙරුම්පිරීමක් නොව ඊට අදාළ පින්කමක් සංසාරයේ කොතැනකදී හෝ පහන් සිතින් කරතිබීම අවශ්‍යය.

බොහෝ රහතන් වහන්සේලාගේ නම් දෙස බලනවිට උන්වහන්සේලාට ඒ නම් ලැබී ඇත්තේ තමන්වහන්සේලා විසින් කරන ලද පින්කමකට අනුවය. ධූපදායක, ලඝුණදායක, සයනදායක ගන්ධොදකිය, ධජදායක, අම්බදායක, පුප්ඵවිංගොමිය, බෝධිසිඤ්චක වැනි නම් විශාල ප්‍රමාණයක් නිදසුන් ලෙස දැක්විය හැකිය. එබඳු නම් ඇති භික්ෂූන් වහන්සේලා අද නම් හඳුන්වනු ලබන්නේ ධූනුදෙන භාමුදුරුවෝ, කොඩිදෙන භාමුදුරුවෝ, මල්වට්ටි භාමුදුරුවෝ යනාදී වශයෙන් විය හැකිය. ඇතැම් ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා මහාභෝග ඇති උසස් කුලවල ජන්මලාභය ලත්විට චාරිත්‍රානුකූලව නම් තබන ලද නම් ඇත්තෝය. එහෙත් අපදාන අටුවාවෙහි දැක්වෙන බොහෝ චරිත එබඳු මහේශාඛ්‍ය කුලවල උපන් දරුවන්ගේ නොවේ. දෙමාපියන් විසින් තබන ලද නමක් ඔවුන්ට නැත. සමාජයේ පහත් යයි සම්මත කුලවල ඉපදීමේ හේතුව නිසා දරුවන්ට නම් තැබීම සඳහා බමුණන් ගෙන්වා ගැනීමේ වරප්‍රසාදය ඔවුන්ට ලැබුණේ නැත. එබඳු දරුවන් 'එකස්මිං කුලගෙහෙ නිබ්බත්තිත්වා' යන හැඳින්වීම යටතේ දක්වා ඇත. ඇතැම්විට මෙබඳු නමක් ලැබීමට මනුෂ්‍යාත්ම භාවයක් ලැබීම අවශ්‍යම නැත. අම්බදායක තෙරුන් වහන්සේ ඒ නම ලබා ඇත්තේ වඳුරු යෝනියෙහි ඉපිද අනෝමදස්සි බුදුරජාණන් වහන්සේට අඹ ඵලයක් පහන් සිතින් පූජා කිරීමේ හේතුවෙනි.

වර්තමාන බෞද්ධයන් අතර බෝධිපූජාවට හිමිවන්නේ ප්‍රධාන තැනකි. බෝගසකට පැන් වත්කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලය කුමක්ද යන ප්‍රශ්නය නගන්නේ ඒ පිළිබඳ දැනුමක් නැත්නවුන් බව කිවයුතුය. බෝධිසිඤ්චක තෙරුන් වහන්සේගේ කථාවස්තුව කියවන්නකු එහි ඇති අර්ථය කුමක්ද යන්න පැහැදිලි වනු ඇත. සාසනෙ පබ්බජිත්වා වත්ත පිපත්තියා සාසනං සොහෙන්තො මහාජනෙ බෝධිපූජං කුරුමානෙ දිස්වා අනෙකානි පුප්ඵානි සුගන්ධොදකානිච ගාහා පෙත්වා පූජෙසි' උන්වහන්සේ මහජනයා බෝධිපූජා කරනු දැක මල්සුවඳ ජලය ගෙන්වාගෙන බෝධීන් වහන්සේ පිදූ බව බෝධිසිඤ්චක තෙරුන්ගේ කථාවෙහි කියැවී.

මෙහි ඇතුළත් වන අපදානයන් එකසිය අනූතුනෙන් වැඩි ගණනක් පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලය අයත්ය. සිද්ධාර්ථ කුමාරයාගේ පුත් රාහුල හිමියන්ගේ චරිතාපදානය ඇරඹෙන්නේද පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහිය.

කෙසේ වුවද ගිහි බෞද්ධයන්ගේද පෘථග්ජන භික්ෂූන්ගේද ජීවිතවල හරවත් බවක් සහ සරල බවක් ඇතිකරවීම ජාතක කථාවලින් මෙන්ම ශ්‍රාවක චරිත කථා දැක්වෙන අපදාන කථාවලින්ද ලැබී ඇති ශික්ෂණය සුළුපටු නොවේ. බුදුදහම ලංකාවට හඳුන්වා දෙනු ලැබූ තැන් පටන් එතෙක් පැවති හරසුන් දිවි පැවැත්ම හරවත් බවට පත්කිරීම සඳහා මිහිඳු මාහිමියන් උත්සාහ දරා ඇත්තේ ගැඹුරු දහම් දෙසීමෙන් පමණක් නොවේ. වත්මන්හි ධර්ම දේශක භික්ෂූන් වහන්සේ මේ ධර්මදේශනා මාර්ගයෙන් බැහැරවීම නිසා සමාජයද ඒ සරල දිවිපැවැත්මෙන් බැහැර වන්නට පටන්ගෙන ඇත. මෙතෙක් පාලි භාෂාවෙන් පැවති අපදාන අට්ඨකථා සරල සිංහල බසින් තැබීමට දෙහිවල නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ අතිපූජ්‍ය කිරම විමලජෝති නාහිමියන් දරන උත්සාහය ධර්මකාමී සැමදෙනාගේ ප්‍රශංසාවට ලක්විය යුතු බව ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු.

දයා ගුණසේකර

ගංගොඩවිල
නුගේගොඩ.

විසුද්ධජනවිලාසිනී නම් වූ
අපදානට්ඨ කථා

පළමු භාගය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට
නමස්කාර වේවා!

නැණ සයුර තරණය කළ - සසර සයුරෙන් එතරව
උදාරම පුද්ගල වූ - බුදුරදුන් සිරසින් වැඳ

ගැඹුරු නුවණින් දත් - සතරනු වෙතින් පුද ලද
සසර දුක් සිඳිනා - සිරි සදහම් රුවන් වැඳ

සව්කෙළෙස් සිඳ ලූ - අරි අටඟ ගුණයෙන් යුත්
දැමුණු ඉඳුරන් ඇති - මහ සඟගණ ද වඳිනෙමි

"මේ එකිනෙකට කරන ලද ප්‍රණාමය ඇත්තේ
රත්නත්‍රය විශේෂ වූ විශේෂ සාදර ගෞරවයෙන්"

"ප්‍රඥාවන්තයන් අතුරෙන් අතිශය ප්‍රඥාකර වූ විඤ්ඤූ
පුරුෂයන් අතර අග්‍රතර වූ ස්වාමිනි, විශේෂයෙන්
අපදාන අට්ඨකථාව කළයුතු වන්නේය"

"යළි යළිත් හටගත් ආදර බැතියෙන්, කීර්තිමත්
වූ බුදුරදුන්ගේ චරිත කතා සහිත සෙසු චරිතකථා ද
කරන ලෙස ඉල්ලන ලදුව, ඒ මා විසින්"

"විශේෂයෙන් පිටකතුයේ ප්‍රදීපයක් සේ බබළන
පාළි න්‍යාය අනුගමනය කරමින් යහපත් වූ
අර්ථ වර්ණනා සහිතව"

"කවරකු විසින්, කොතනකදී, කවරදා මේ උතුම් ධර්මය
දේශනා කරන ලද්දේද, කුමන අර්ථයක් පිණිස දේශනා
කළද, නිසි පරිදි මෙසේ විවරණ කොට,"

"නිදානයද, ප්‍රකටවන අර්ථයද, මැනවින් ධාරණය වනු පිණිස
යථා විධි පෙළගස්වා පූර්වපර සන්ධි ගළපා"

"පැරණි සිංහල භාෂාවෙන් කරන ලද පෞරාණික අර්ථ කථාවලද
තබන ලද අයුරු සාධනය නොවේ. පණ්ඩිතයන්ගේ කැමැති
අකමැති නැන්ද ගලපා"

"එබැවින් පෞරාණික අර්ථකථා න්‍යාය උපනිශ්‍රය කොට,
විශේෂ අර්ථ ප්‍රකාශ වන සේ, විරුද්ධ අර්ථ දුරුකොට
විශේෂ වර්ණනාවක් වශයෙන් මෙම අර්ථ වර්ණනාව
කරන්නෙමි.

කවරකු විසින්, කවදා, කොතනකදී මේ උතුම් ධර්මය දේශනා කරන ලද්දේද? අර්ථ වර්ණනාව කරන්නෙමියි ප්‍රතිඥා දුන් බැවින් ඒ මේ අපදාන අර්ථ වර්ණනාව දුරේ නිදාන, අවිදූරෙ නිදාන, සන්තිකෙනිදාන යන මේ තුන් නිදාන දක්වමින්, වර්ණනා කරනු ලබන්නේ, යමෙක් එය අසන්ද? ඒවායේ මූලපටන්ම දැනගත යුතු බැවින්, (යමකු කෙරෙන් සරළව දැනගැනීම නම් වෙයි. එහෙයින්) එම නිදාන කථා පෙන්වා වර්ණනා කරන්නෙමි. එහි මුල පටන් නිදානයන් දක්වා පරිච්ඡේද දතයුතුය. දීපංකර පාද මූලයේ පටන් කරන ලද අභිනීහාර ඇත්තේ, මහබෝසතුන්ගේ වෙස්සන්තර ආත්ම භාවයෙන් චුතවී තුසිත පුරයේ උපත දක්වා වන ප්‍රවෘත්තිය කථා මාර්ගය දූරේ නිදාන නම් වේ. තුසිත භවනයෙන් චුතව

බෝමැඩ සර්වඥභාවයට පත්වීම දක්වා (බුදුවීම දක්වා) පවත්නා කථා මාර්ගය අවිදූරෙ නිදාන නම් වේ. සනතිකෙ නිදාන නම්, ඒ ඒ තන්හි වැඩ වසමින් කරන ලද බුද්ධ කෘත්‍යයයි. දැන් දක්වනුයේ දූරෙ නිදානයයි.

මෙයින් සතර අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයකට ඉහත අමරවති නම් නගරයක් විය. එහි සුමේධ නම් බ්‍රාහ්මණයකු වාසය කරයි. උභය කුල පරිශුද්ධව ඔහුගේ මවද පියාද, කුල හතක් දක්වා පිරිසිදු වූ පරම්පරා ඇති, අපහාස නොලැබූ, නින්දා නොලැබූ, උපතින් මනාරූ ඇති, දැකුම්කළු පැහැදීම් ඇති කරන පරම වර්ණයෙන් හේ සමන්විතය. හෙතම වෙනත් ක්‍රියාවක් නොකොට බ්‍රාහ්මණ ශිල්පයම උගත්තේය. ඔහුගේ ළදරු කාලයේම දෙමව්පියෝ කළුරිය කළහ. ඉක්බිති ඔහුගේ රාසිවර්ධක ඇමතියා (භාණ්ඩාගාරය භාර නිලධාරියා) අයපොත ගෙන්වාගෙන රන් රිදී මුතුමැණික් ආදියෙන් පිරුණ නිධන් ගැබ විවරකොට කුමාරයාණනි; ඔබට මවගෙන් උරුම මෙපමණය, පිය උරුමයෙන් මෙපමණය මුත්තාගේ හා මීමුත්තාගේ ධනය මෙපමණය. ධනය ගැන කියවා, මේවා පිළිගන්නැයි කීවේය. සුමේධ පණ්ඩිතයා මෙසේ සිතීය. මේ ධනය පිළිගෙන මගේ පියමුතු පරපුර පරලොව යන්නාහු එක කහවනුවකුදු ගෙන නොගියේය. මා විසින් පිළිගෙන පරිත්‍යාග කිරීම වටී යයි, රජුට දැනුම් දී, නගරයේ බෙරහඬ නංවා, මහජනයාට දන් දී තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි විය. ඔහුගේ මේ අදහස හෙළි කිරීමට, මෙතැන්හිදී සුමේධ කථාව කිවයුතුය. එය වනාහි නිරතුරුව බුද්ධවංසයෙහි ආ පරිද්දෙන් ගාථා බන්ධනයෙන් යුක්ත බැවින් සරළ ලෙස ප්‍රකට නොවේ. එහෙයින් ඒ අතරතුර ගාථා සම්බන්ධ වචන හා අර්ථ සමග කියන්නෙමු. සාර අසංඛෙය්‍ය කල්ප සත් දහසකට අධික වූ මත්තෙහි, දස ශබ්දවලින් නිරතුරු පැවති, දර්ශනීය වූ, මනහර වූ, අමරවතී යයි ද, අමර යයි ද නම් ලද නගරයක් විය. යමක් සඳහා බුද්ධවංස පාළියේ කියන ලද්දේද:-

"සාරාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයකට පෙර
දසවිධ ශබ්දයෙන් නිරතුරු පැවති ආහාරපානවලින්
සුලභ දර්ශනීය මනෝරම්‍ය වූ අමර නම් නගරයක් වී.

එහි **දසහිසද්දෙහි අවිවිත්තං** යනු ඇත් ශබ්දයෙන්, අශ්ව ශබ්දයෙන්, රථ ශබ්දයෙන්, භේරි ශබ්දයෙන්, උඩැක්කි නාදයෙන්, වීණා නාදයෙන්, ගීත ශබ්දයෙන්, හක් ශබ්දයෙන්, පණාබෙර නාදයෙන් අනුභව කරවූ!

වළඳවු! කවු! බොවු! යන දසවිධ ශබ්දයෙන්ද මෙම ශබ්දවලින් නිරතුරුව පැවතියේ විය. ඒ ශබ්දය එකක් වශයෙන් ගෙන

"ඇත් ශබ්ද, අශ්ව ශබ්ද, බෙර, සක්, රථ ද
කවු, බොවු ආහාරපානයෙන් සෝෂා කරන
ලද සේ" යයි

බුද්ධවංස පාළියේ මේ ගාථාව කියා :-

"සියළු කාමවස්තුවලින් යුක්ත වූ සියළු නගර අංගයන්ගෙන්
පිරිපුන් සත්රුවනින් යුතු නොයෙක් ජනයාගෙන් ගැවසුණු
පින් කැමැතියන්ට ආවාසයක් වූ දේව නගරයක් මෙන්
සමෘද්ධ වූ"

"නොයෙක් කෝටි ගණනින් රැස්කළ බොහෝ ධනය ඇති
සුමේධ නම් බ්‍රාහ්මණ පණ්ඩිතයෙක් අමරවතී නගරයෙහි විසූහ.

හේ වේදය ඉගෙන, වේද මන්ත්‍ර දරන, ත්‍රිවේදයේ පරතෙරට පත්
ඉතිහාසය ලක්ෂණ විද්‍යාව සහිත තම ධර්මයෙහි
පරතෙරට පැමිණියේ" යයි කියන ලදි.

ඉක්බිති එක්දිනක් ඒ සුමේධ පණ්ඩිත තෙම ප්‍රාසාද තලය මස්තකයේ රහසිගතව හිඳ පලඟක් බැඳ හුන්නේ මෙසේ සිතීය. පුනර්භවයෙක යළි ප්‍රතිසන්ධි ගැනීම නම් දුකකි. එසේ උපන් උපන් තැන ශරීරයේ බිඳීමද, (දුකයි.) මම ඉපදීම ස්වභාවකොට ඇත්තෙමි. ජරාව ස්වභාවකොට ඇත්තෙමි. ව්‍යාධිය ස්වභාවකොට ඇත්තෙමි මරණය ස්වභාවකොට ඇත්තෙමි. මෙසේ ඇතිකල්හි මා විසින්, නොඉපදීමද, නොදිරීමද, නිරෝගී බවද, නොමැරීමද, දුක් නැති බවද, සිසිල් වූ අමෘත මහා නිර්වාණය සෙවීමට වටී යයි, අවශ්‍යයෙන්ම භවයෙන් මිදී නිර්වාණගාමී වූ ඒකායන මාර්ගයෙන්ම විය යුතුය. ඒ නිසාවෙන් කියන ලදී.

"රහසිගතව හිඳ - මම එකල මෙසේ සිතුවෙමි
ශරීරයේ බිඳීමද පුනර්භවයද දුකකි."

"ජාති ජරා ව්‍යාධි ස්වභාවකොට ඇති
මම අජර අමර ක්ෂේම වූ නිවන සොයන්නෙමි."

"ඉදින් මේ කුණුකය නොයෙක් නොයෙක් කුණපවලින්
පිරී ඇත. අර්ථයක් නැතිව, බලාපොරොත්තු රහිතව
එය හැරදමා යා යුතුය.

හේතුවක් නැතිව කිසිවක් සිදු නොවේ. හේතුවක් ඇති
එවැනි මාර්ගයක් ඇත. භවයෙන් මිදෙනු ලබන්නා වූ ඒ මාර්ගය
සොයා යන්නෙමි."

ඉක්බිති පසුවද මෙසේ සිතුවේය. යම්සේ ලෝකයෙහි දුකට ප්‍රතිවිරුද්ධ වූ, සැප නමින් දෙයක් ඇති මෙසේ භවය ඇතිකල්හි එයට විපක්ෂ වූ විභවයක්ද තිබිය යුතුය. යම්සේ උෂ්ණය ඇතිකල්හි එය මැඩපැවැත්වීමට සීතලක්ද ඇත. මෙසේ රාග ගිනි ආදිය සංසිඳවීම පිණිස නිවනක්ද තිබිය යුතුය. යම්සේ ළාමක පාප ධර්මයට විරුද්ධ වූ යහපත් නිරවද්‍ය පෙරදැරි වූ ධර්මයක් ද ඇත්තේමය. එසේම පාපකාරී උපතක් ඇතිකල්හි සියළුම උත්පත්තීන් නික්මීමට සමත් නොඉපදීම මුල් වූ නිර්වාණයක් ද තිබිය යුතුමය.

එසේ හෙයින් කියන ලදී.

"යම්සේ දුකක් විද්‍යමාන වන කල්හි සැපයක්ද විද්‍යමාන වේ.
එසේ භවයක් විද්‍යමාන කල්හි විභවයක්ද කැමතිවිය යුතු."

"යම්සේ උණුසුමක් ඇතිකල්හි වෙනත් ශීතලක් ද පවතී
එසේ තෙවැදෑරුම් ගින්න විද්‍යමාන කල්හි නිවනද කැමති විය යුතු

"යම්සේ පාපය ඇතිකල්හි යහපත ද විද්‍යමානය.
එසේම උපත ඇතිකල්හි නූපදීමද කැමැතිවිය යුතු.

තවදුරටත් මෙසේ සිතීය.

යම්සේ අසූචි රාශියක ගිලුනා වූ මිනිසකු විසින් දුරදීම පස් පියුමෙන් ගැවසුණු මහා තඩාගයක් දැක, කවර මාර්ගයකින් එහි යා යුතුදැයි, ඒ පොකුණ සෙවීම සුදුසුය. යම් හෙයකින් එය නොසොයන්නේ නම් එය තඩාගයේ දෝෂයක් නොවේ. මිනිසාගේම දෝෂයකි. එසේ කෙළෙස්

මළ පිරිසිදු කිරීමේදී අමෘතමහා නිර්වාණය නමැති තඩාගය විද්‍යමාන කල්හි එය නොසෙවීම ඒ අමාමහ නිවන නමැති තඩාගයේ දෝෂයක් නොවේ. පුරුෂයාගේම දෝෂයකි. එපරිද්දෙන් කෙලෙස්වලින් පිරිවරා ගත්තා වූ පුරුෂයාට නිර්වාණගාමී යහපත් මාර්ගය විද්‍යමාන කල්හි, එය නොසෙවීම මාර්ගයේ දෝෂයක් නොව, පුරුෂයාගේම දෝෂයකි. යම්සේ රෝගයෙන් පෙළෙන පුරුෂයා, ව්‍යාධියට පිළියම් කරන වෛද්‍යවරුන් විද්‍යමාන කල්හි, ඒ වෙදාගෙන් චිකිත්සා කිරීමට නොසොයයි නම් එය ඔහුගේම දෝෂයකි. වෛද්‍යවරයාගේ දෝෂයක් නොවේ. එපරිදි, කෙලෙස් රෝගයෙන් පෙළෙන අයෙකු කෙලෙස් සංසිඳවන මාර්ගය දත්තකු විද්‍යමාන කල්හිම ඒ ආචාර්යවරයාව නොසොයයිද, එය ඔහුගේම දෝෂයකි. කෙලෙස් විනාශ කරන ගුරුවරයාගේ දෝෂයක් නොවේ.

එසේ හෙයින් කියන ලදී.

"යම් සේ අසූචියේ වැටුණු මිනිසා, ජලය පිරි
තඩාගයක් දැක, එම පොකුණ (නොසොයයිද) ප්‍රයෝජනයට නොගනීද
එය තඩාගයේ දෝෂයක් නොවේ."

"එසේ කෙළෙස්මල ධෝවනයට අමෘතමහා නිවන නමැති
පොකුණ විද්‍යමාන කල්හි, ඒ පොකුණ නොසොයයිද,
එය නිවන් නැමැති පොකුණේ දෝෂයක් නොවේ."

"යම්සේ සතුරන් විසින් වටකරන ලදවිට ගැළවී යාමට
ගමන් මාර්ගයක් විද්‍යමාන කල්හි, ඒ මිනිසා පලානොයේද,
එය මාර්ගයේ දෝෂයක් නොවේ."

"මෙසේ කෙලෙස්වලින් වටකරන ලද්දේ ආරක්ෂිත මාර්ගයක්
විද්‍යමාන කල්හි ඒ මාර්ගය නොසොයයිද එය සුරක්ෂිත මාර්ගයාගේ
දෝෂයක් නොවේ.

"යම්සේ රෝගයෙන් පෙළෙන මිනිසා, වෛද්‍යවරයෙකු ඇතිකල්හි ඒ
ව්‍යාධියට පිළියම් නොකරයිද, එය වෛද්‍යවරයාගේ දෝෂයක් නොවේ."

"එසේ කෙළෙස් නැමැති ව්‍යාධිවලින් පෙළෙමින්
දුකට පත්වූවකු එයින් මිදීමට අදාළ ගුරුවරයකු නොසොයයිද,
එය ශාස්තෘවරයා කෙරෙහි පිහිටි දෝෂයක් නොවේ."

යම්සේ, අලංකාරයෙන් සැරසුණු මිනිසා බෙල්ලේ ඇලුණු කුණපය ඉවත්කොට, සැපසේ යන්නේද, එසේ අප විසින්ද, මේ කුණු කය ඉවත දමා අපේක්ෂා රහිතව නිර්වාණ නගරයට පිවිසිය යුතුය. යම්සේ ස්ත්‍රී පුරුෂයෝ වැසිකිළි බිමෙහි මල-මූත්‍රාකොට, එය උකුලට ගෙන හෝ රෙදිපටි කෙළවර වෙළාගෙන හෝ නොයත් ද, පිළිකුල් කරමින් අපේක්ෂා රහිතව ඉවත දමා යත්ද, එසේ අප විසින්ද මේ කුණු කය අපේක්ෂා රහිතව ඉවත දමා අමෘතමහා නිර්වාණ නගරයට පිවිසීමට වටියි. යම්සේ නාවිකයෝ දිරාගිය නැව අපේක්ෂා රහිතව ඉවතදමා යත්ද එසේ මම ද තුවාල මුඛ නවයකින් (කුණු) වැගිරෙන්නා වූ ශරීරය හැරදමා අපේක්ෂා රහිතව නිවන් නගරයට පිවිසෙන්නෙමි. යම්සේ පුරුෂයා නොයෙක් රන් රුවන් ආදිය රැගෙන සොරුන් සමග මාර්ගයට යන්නේ තමන්ගේ රන් නැසේ යන බියෙන් ඔවුන් හැර දමා ආරක්ෂිත වූ මග ගනියිද එසේම රුවන් පහරණ සොරෙකු සමාන වූ තම ශරීරය ද හැරදමා ක්ෂේම මගට යා යුතුය. ඉදින් මම මෙහි තෘෂ්ණාව කරන්නෙමි නම් ආර්ය මාර්ග කුසල් දහම් රත්න නසන්නේය. එහෙයින් මා විසින් මේ සොරුන් හා සමාන ශරීරය හැරදමා අමෘතමහා නිර්වාණ නගරයට පිවිසීමට වටී යනුවෙනි. එහෙයින් කියන ලදී.

ගෙළෙහි කුණපයක් බැඳි පුරුෂයාද ඒ කුණපය පිළිකුල් කර අතහැර දමා තම ගමන යන්නේ ද එසේ නොයෙක් කුණපයන්ගෙන් පිරුණු, අනපේක්ෂිත වූ අර්ථ විරහිත වූ, මෙම ශරීරය හැරදමා යා යුතු වෙමි.

මළ මුත්‍ර පහ කරන ස්ත්‍රී පුරුෂයෝ බලාපොරොත්තු රහිතව ඒවා හැරදමා යත්ද,

එසේම නොයෙක් කුණපයන්ගෙන් පිරී පවත්නා වූ මේ ශරීරයද, මළ මුත්‍ර වැසිකිළියේ හැරදමා යන්නාක් මෙන් හැරදමා යා යුතුය.

දිරාපත් වූ පලුදු සහිත වූ දිය පිරෙන්නා වූ නැව නැව්හිමියා විසින් බලාපොරොත්තු රහිත හැරදමා යයිද,

එසේ සිදුරු නවයකින් ද්‍රව වැගිරෙන්නා වූ මේ ශරීරය ද නැව හැර දැමූ නැව් හිමියන් මෙන් හැරදමා යා යුතුය.

රන් රුවන් භාණ්ඩ රැගෙන සොරුන් සමග යන පුරුෂයා
භාණ්ඩ පැහැර ගනිතියි යන බියෙන්, ඒ මග හැර වෙනත් මගක
යේද,

එසේම මහා සොරෙකු සමාන වූ මේ ශරීරය ද, කුසල් නැසීමේ
බිය නිසා හැර දමා යන්නෙමි.

මෙසේ සුමේධ පණ්ඩිත තෙමේ නොයෙක් ආකාර උපමාවලින් මේ නෛෂ්ක්‍රම්‍ය හා බැඳුනා වූ අර්ථය සිතා තම නිවස්නේ ඇති අප්‍රමාණ භෝග රාශිය යට කියන ලද අයුරින් දිළිඳු යාචකාදීන්ට බෙදා දී, මහ දන් දී, වස්තු කාමයද, ක්ලේශ කාමයද හැරදමා අමර නගරයෙන් නික්ම හුදකලාවම හිමාලයේ ධාර්මික නම් පර්වතය ඇසුරුකොට ආශ්‍රමයක් කොට, එහි පන්සලක්ද, සක්මන්මළුවක්ද මවා, පංචනීවරණ දෝෂවලින් දුරුකරන ලද, 'මෙසේ සමාධිහිත සිත් ඇති කල්හි' කියන ලද ආදි ආකාරයෙන් ගුණ කාරණා අටකින් යුක්ත වූ අභිඥා සංඛ්‍යාත බලය ගෙනහැර පෑමට, ඒ ආශ්‍රමයේදී දෝෂ නවයකින් සමන්විත වූ (හැඳසිටි) සළුව හැරදමා, දොළොස් ආකාර ගුණයෙන් යුක්ත වූ, වැහැරී සිවුර පොරවා, ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි විය. මෙසේ පැවිදි වූ කල්හි දෝෂ අටකින් ගැවසුණු ඒ පන්සල හැරදමා, දස ගුණයෙන් සමන්විත වූ වෘක්ෂ මූලයට සපැමිණ සියළු ධාන්‍ය භෝජන හැරදමා වැටුණු ගෙඩි කොල ආහාරයට ගනිමින්, සිටි ස්ථානයේම සක්මන් වශයෙන් ප්‍රධන් වීර්ය වඩන්නේ දින හතක් ඇතුළතම අෂ්ට සමාපත්තීන්ද පංච අභිඥාවන්ද ලැබගත්තේ විය.

මෙසේ හෙතම ප්‍රාර්ථනා කළ පරිදි, අභිඥා බලයට පැමිණියේය. ඒ නිසාවෙන් කියන ලද,

"මෙසේ මම සිතා නොයෙක් කෝටිගණන් ධනය
නාථ-අනාථයන්ට දී හිමාලයට පැමිණියෙමි.

"හිමාලයට නුදුරින් ධම්මික නම් පර්වතය
මට මනාසේ පිළියෙළ කළ අසපුවයි. එහි පන්සලක්ද
මවන ලද්දීය.

"පංච දෝෂයන් දුරුකොට එහි සක්මන් මළුවක්ද
මැව්වෙමි. අෂ්ට ගුණයෙන් යුතු අභිඥා බලයද
ලැබුවෙමි."

"නව දෝෂයෙන් යුතු සළුව අත හැරියෙමි.
දොළොස් ගුණයෙන් යුතු රළු සිවුර පෙරවූවෙමි."

"දෝෂ අටකින් ගැවසුණු පන්සල අතහැරියෙමි.
දස ගුණයෙන් යුතු වෘක්ෂ මූලයට සපැමිණියෙමි."

"වවන ලද, රෝපණය කළ ධන ධාන්‍ය නිරවශේෂවම
දුරු කළෙමි. නොයෙක් ගුණයෙන් යුතු 'පවත්තඵල භෝගී'
වූයෙමි."

"සක්මනෙහි හුන් තැනම ප්‍රධන් වීර්ය වැඩුයෙමි.
දින හතක් ඇතුළත අභිඥා බලයට පැමිණියෙමි.

එහි **අසසමො සුකතො මයහං පණ්ණසාලා සුමාපිතා** යනු මේ පෙළෙන් සුමේධ පණ්ඩිතයන් විසින් ආශ්‍රමය පන්සල සක්මන් යන සියල්ල තම අතින් මවන ලද්දක් මෙන් කියන ලදී. මේ එහි අර්ථයයි. අද බෝසතුන් හිමාලයට පැමිණ ධම්මික පර්වතයට පිවිසෙන්නේය යයි දැක ශක්‍රයා විශ්වකර්ම දිව්‍ය පුත්‍රයාට ආමන්ත්‍රණය කළේය. දරුව! මේ සුමේධ පණ්ඩිතයා පැවිදි වන්නෙමියි නික්මෙයි. මොහුට වසන තැනක් මවනු මැනවි. හෙතෙම ඔහුගේ වචනය පිළිගෙන රමණීය ආශ්‍රමයක්ද, මනාව රක්ෂිත වූ පන්සලක්ද, සිත් අලවන සක්මන් මළුවක්ද මැවීය. භාග්‍යවතුන් වහන්සේ, එකල පුණ්‍යානුභාවයෙන් නිපන් ඒ ආශ්‍රමය නිසා, සාරිපුත්‍රය; ඒ ධම්මික පර්වතයේ

"මා සඳහා ආශ්‍රමයක් මනාව කරන ලදි. පන්සලක්ද මවන ලදි.
පංචදෝෂ හැරදැමූ සක්මන්මළුවක්ද එහි මැවීය.
යනුවෙන් කීහ.

එහි **සුකතො මයහං** යනු මා විසින් මනා ලෙස කරන ලදී. **පණ්ණසාලා සුමාපිතා** යනු කොලවලින් වසන ලද ශාලාවද මට මැනවින්

මවන ලද්දේ විය. **පඤ්ච දෝස විවජ්ජිතං** යනු මේ පස්වැදෑරුම් සක්මන් දෝෂයෙන් නම්, තද විෂම බව, ඇතුළත ගස්වලින් ගැවසී ගත් බව තෘණ ලතාදියෙන් යුක්ත බව, බොහෝ උවදුරු සහිතව වූ බව ඉතා විශාල බවද වේ. තද විෂම වූ භූමි භාගයෙහි සක්මන් කරන කල්හි සක්මන් කරන්නාගේ පාද රිදේ. වෙළී ගැටගැසෙත්. සිත එකඟතාවය නොලබයි. කර්මස්ථාන බිඳී යයි. මෘදු තැනිතලාවේ වනාහි පහසු විහරණයට පැමිණ කර්මස්ථාන රැකදෙයි. එහෙයින් තද විෂම බව භූමි භාගයේ එක දෝෂයක් යැයි දත යුතුය. සක්මන්මළුවේ ඇතුළත හෝ මැද හෝ කෙළවර හෝ ගස් අපරීක්ෂාකාරීව ඇතිකල්හි සක්මන් කරන්නාගේ නළල හෝ හිස හෝ එහි වැදී වෙහෙසට පත්වෙයි. ඇතුළත ගස් ඇති බව දෙවෙනි දෝෂයයි. තෘණවැල් ආදියෙන් වැසීගිය සක්මන්මළුවේ සක්මන් කරන කල්හි අන්ධකාර වේලාවේ සර්පාදි ප්‍රාණීන් පයට පැගී හෝ මිය යයි. ඔවුන් විසින් දෂ්ට කරන ලදුව හෝ දුකට පත්වේ. තෘණලතාදියෙන් වැසී තිබීම තෙවෙනි දෝෂයයි. පළලින් රියනක් හෝ අඩරියනක් වූ ඉතා බාධක සහිත සක්මන්මළුවේ සක්මන් කරන්නාගේ කකුල් පැකිලී නියපොතු ඇඟිලි බිඳෙත්නුයි ඉතා සම්බාධක සහිත වූයේ මේ සිවුවෙනි දෝෂයයි. අති විශාල වූ සක්මන්මළුවක සක්මන් කරන්නාගේ සිත විඩාපට පත්වේ. එකඟතාවයක් නොලබයි. අතිවිශාල බව පස්වෙනි දෝෂයයි. පුළුළින් වනාහි දෙපැත්තෙහි අඩරියනක් පමණ පළල වූ දෙපසෙහි රියනක් පමණ වූද, දිගින් අත් රියන් හැටක් පමණ වූ මෘදු තැනිතලා සමසේ විසුරුවන ලද වැලි ඇති සක්මන්මළුව වටියි. සෑගිරියෙහි දීපප්‍රසාදක මහා මහින්ද මහරහතුන්ගේ සක්මන්මළුව එබඳු විය. එසේ හෙයින් කියන ලදි. "පස් දෝෂයන්ගෙන් විනිර්මුක්ත වූ සක්මනක් එහි මැව්වෙමි." යනුවෙනි. **අධිගුණ සමූපේතං** යනු අටවැදෑරුම් ශ්‍රමණ සැපවලින් යුක්ත මෙහි ශ්‍රමණ සැප අට නම්, ධනධාන්‍ය පිළිනොගැනීම, නිරවද්‍ය පිණ්ඩපාත සේවනය, සිසිල් පිණ්ඩපාත වළඳන බව, රට පෙළා ධනසාරය හෝ කහවණු ආදිය ගන්නා වූ රාජ කුල මෙන් රට නොපෙළන බව, උපකරණ අකමැති බවයි, සොරුන්ගෙන් වන මංකොල්ලකෑම්වලින් නිර්භය බව රාජරාජ මහාමාත්‍යාදින් සමග නොඇලෙන බව, සතර දිශාවල පැතුරුණු අප්‍රතිහත භාවයයි, නිදහස් බව මෙය කියන ලද්දේ වෙයි. ඒ අසපුවේ වසන්නහු විසින් මේ ශ්‍රමණ සැප අට විඳීමට හැකිවෙත්. මෙසේ අෂ්ට ගුණවලින් යුතු ආශ්‍රමයක් මවන ලද්දේ වෙයි. **අභිඤ්ඤාබල මාහරිං** යනු පසුව ඒ ආශ්‍රමයේ වාසය කරමින් කසිණ පරිකර්ම කොට අභිඥාවන්ද සමාපත්තීන්ද උපදවනු පිණිස, දුක්ඛ වශයෙන් විදර්ශනා වඩා ප්‍රබල

වීර්යයට පැමිණියේ විදර්ශනා බලයට පැමිණියෙමි. යම්සේ එහි වාසය කරන්නේ ඒ බලයට පැමිණීමට හැකිවෙමි. මෙසේ ඒ ආශ්‍රමය අභිඥා පිණිසද, විදර්ශනා බලයට ද සුදුසු සේ සකස්කොට මවන ලද්දේ යන අර්ථයයි. **සාටකං පජහිං තසථ නව දෝස මුපාගතං** යනු මෙහි මේ පිළිවෙළ කථාවයි. එකල වනාහි කුටි, ලෙන්, සක්මන්මළු ආදියෙන් අලංකෘත වූ මල්, ගෙඩි ආදියෙන් ගැවසුණු රමණීය මිහිරි ජලාශ ඇති, නපුරු වන සතුන්ගෙන් හා බිහිසුණු පක්ෂි ආදින්ගෙන් තොර විවේකයට යෝග්‍ය ආශ්‍රමයක් මවා, අලංකාර වූ සක්මන්මළුවේ දෙකෙළවර එල්ලෙන පුවරුවක් සවිකොට හිඳීම පිණිස සක්මන්මළුව මැද සමතලා මුංඇටපාට ගලක් මවා ඇතුළත පන්සලෙහි ජටාමඩුළු සහිත වැහැරි සිවුරක්, තුන් තැනකින් වක් වූ කදක් ආදී තවුස් පිරිකර ද, මණ්ඩපයේ පැන් කලයක්ද පැන් සකක් ද පැන් පෙරහනක්ද, ගිනිශාලාවේ අඟුරු කබලද දර ආදියද, යම් යම් පැවිද්දන්ට උපකාර පිණිස පවතින්නා වූ ඒ සියල්ල මවා, පන්සලේ බිත්තියෙහි යම් කිසිවකු පැවිදිවනු කැමැත්තේද, මේ පිරිකර රැගෙන පැවිදි වෙත්වා! යි අකුරින් කොටා දෙව්ලොවටම විශ්වකර්ම දිව්‍යපුත්‍රයා ගියකල්හි, සුමේධ පණ්ඩිතයෝ හිමවතේ ගිරි-කඳුරැළි අනුසාරයෙන් තමන්ගේ නිවාසයට ගැලපෙන පහසු තැනක් බලන්නේ නදී නිවර්තනයෙහි විශ්වකර්ම විසින් නිර්මාණය කරන ලද, ශක්‍රයා දුන් රමණීය ආශ්‍රමය දැක, සක්මන කෙළවරට ගොස් පාසටහන් නොදකින්නේ ස්ථිරවම මෙහි සිටින පැවිද්දෝ දුර ගමක පිඬු පිණිස ගොස් ක්ලාන්ත වී අවුත් පන්සලට පිවිස හුන්නේ වන්නේ යයි සිතා ටිකක් බලාපොරොත්තුව සිට ප්‍රමාද නිසා දැකගන්නෙමියි පන්සල් දොරටුව විවෘතකොට ඇතුළට පිවිස ඔබ්-මොබ බලන්නේ මහා බිත්තියේ අකුරු දැක, කියවා, මට කැප පිරිකරයයි, මේවා ගෙන පැවිදි වන්නෙමියි තමන් විසින් පොරවන ලද සාටක යුගලය අතහැරියේය. එසේ හෙයින් කියන ලදි. **සාටකං පජහිං තසථ** යනු මෙසේ පිවිසියේ, මම, සාරිපුත්ත! ඒ පන්සලේදි සාටකය අත්හළෙමි. **නව දෝස මුපාගතං** යනු සාටකය ඉවතලන්නේ, නවාකාර දොස් දැක දුරුකළේය යන අර්ථ දැක්වේ. තවුස්පැවිදි වූවන්ගේ සාටකයෙහි දෝෂ නමයක් ඇතිවෙයි. මහා අනගි බව එක දෝෂයකි. අනුන්ගෙන් ලැබෙන බව එක් දෝෂයකි. පරිහරණය කිරීමෙන් වහා කිලුටුවන බව දෝෂයකි. කිළිටි වූ විට සේදිය යුතුයි. පඬුපෙවිය යුතු බව තව දෝෂයකි. පරිභෝග කිරීමෙන් දිරණ බව, එකක් දිරාගිය කල අණ්ඩ දැමීම හෝ මැසිය යුතු බව නැවත සෙවීමද අපහසුය. තාපස පැවිද්ද පිණිස නොසරුප් බව සතුරන්ට සාධාරණ බව වේ. යම්සේ ඔහු එය විරුද්ධකරුවෝ

නොගනිත්ද? සුරක්ෂිත කළයුතු බව. පරිභෝග කරන්නවුන්ට අලංකාර භාවය ගෙනදෙන බව දෝෂයකි. රැගෙන හැසිරෙන්නහුගේ උරහිසට බරකි. මහිමතාව තවත් දෝෂයකි. **චාකචීර නිවාසෙසිං** යනු එකල මම සාරිපුත්ත. මේ දෝෂ නමය දැක සළුව හැර රළු සිවුර පෙරවූයෙමි. බට වැනි තෘණ වර්ගයක් කිතු කිතුකොට ගෙන ගොතන ලද රළු සිවුර පෙරවීම හා හැඳීම් සඳහා ගත්තෙමි යන අර්ථයි. **ද්වාදසගුණ මුපාගතං** යනු දොළොස් ආනිශංසවලින් යුක්ත වූ වැහැරි සිවුරේ දොළොස් ආනිශංස අඩු අගයක් ඇති බව, සිත්කළු බව, සුදුසු බව යනු මෙහි එක ආනිශංසයකි මේ දෙවැන්නයි. පරිභෝග කිරීමෙන් හනික කිළිටි වන්නේය. සෝදනු ලබන්නේද ගැටීමක් නැත. මේ තුන්වැන්නයි. පරිභෝග කිරීමෙන් දිරාගියද, මැසීමට පුළුවනි. මේ සතරවැන්න සොයන්නාට සුවසේ සෙවිය හැකි බව පස්වැන්නයි. තාපස පැවිද්ද පිණිස කැප සරුප් වීම හයවැන්නයි. පිළියෙල කරන්නාට ගැලපෙන බව සත්වැන්නයි. පරිහරණය කරන්නාට ශ්‍රමණ අලංකාරය ඇතිවීම අටවැන්නයි. සැහැල්ලු ලෙස දැරීමට හැකිවීම නවවැන්නයි. සිවුර පිළියෙළ කිරීමේ අල්පේච්ඡ බව දසවැන්නයි. වැහැරි පට්ටාවලින් සකස් කළ බැවින් ධාර්මික නිරවද්‍ය භාවය, එකොළොස්වැන්නයි. රළුසිවුර විනාශ වුවද, අපේක්ෂා රහිත බව දොළොස්වැන්න වේ. **අඨ්ඨදොස සමාකිණ්ණං පජහිං පණ්ණසාලකං** යනු කෙසේ දුරුකළෙමිද?ඔහු වර සාටක යුග්මය ගලවන්නේ සිවුරු එල්ලා තබන ලීයේ එල්ලන ලද කටුකරඬු මල් දාමයක් හා සමාන රතු වැහැරි සිවුර ගෙන පොරවා, ඒ මත වෙනත් රන්වන් වැහැරි සිවුරක්ද හැඳ දොඹමල් සමාන මදටිය පාට කුර සහිත අඳුන්සමක් ඒකාංශකොට ජටාමඩුල්ල ගලවා, කොණ්ඩ මුදුන සහිත නිශ්චල බව ඇතිකරනු පිණිස ලී කුරක් ප්‍රවේශකොට, මුතුවන් දැලක් සමාන පසුම්බිය පිණිස පබළු පාටැති කෙණ්ඩියක් බැඳගෙන තුන් තැනෙකින් වක්වූ කදක් ගෙන, එක් කද කෙළවරක කෙණ්ඩියද, එක කෙළවරක අංකුසයේ පසුපසද දඬු තුනකින් එල්ලාගෙන, කත් ලීය අංශයකින් දරා දකුණු අතින් සැරයටියක් ගෙන, පන්සලෙන් නික්ම හැට රියනක් මහා සක්මන්මළුවේ එහා-මෙහා සක්මන් කරන්නේ, තමන්ගේ විලාශය බලා මගේ මනදොළ මස්තක ප්‍රාප්ත වූවේ යයි මගේ ප්‍රවෘජ්‍යාව ඒකාන්තයෙන් බබළයි. බුදු, පසේබුදු ආදී වීර පුරුෂයන් විසින් වර්ණනා කරන ලද්දේය. මේ පැවිද්ද නම් ස්තුති ප්‍රශංසා කරන ලද්දකි. ගිහි බන්ධනය ප්‍රහීණ කළෙමි, නික්මුණේ වෙමියි නෛෂ්ක්‍රම්‍ය නම් මේ ලද මගේ මේ උතුම් පැවිද්ද කරන්නෙමි. ශ්‍රමණ ධර්මය මාර්ග-ඵල සුවය ලබන්නෙමි, උත්සාහවත් වූයේ කත්ලීය

බිම දමා සක්මන්මළුව මැද මුංඇට පාට ගල්තලාවේ රන්වන් පිළිමයක් මෙන් හිඳිමින් දිවාකාලය කල්යවා, සවස් කාලයේ පන්සලට පිවිස හිඳින ඇඳ මත්තෙහි ලී මැස්සේ හොත්තේ ශරීරය උණුසුම් කරවාගෙන ඉතා අළුයම කාලයේ පිබිද තමන්ගේ පැමිණීම ආවර්ජනා කළේය. මම ගෘහවාසයේ ආදීනව දැක අප්‍රමාණ භෝග, අනන්ත යසඉසුරු හැරදමා අරණ්‍යයට පිවිස නෛෂ්ක්‍රම්‍යය සොයන්නේ වී පැවිදිව දැන් පටන් ප්‍රමාද චරිතය ඉසිලීමට නුසුදුසුය. ප්‍රවිවේකය හැර හැසිරෙන්නේ මිථ්‍යා විතර්ක ගැන හිතාමතා බලති. දැන් පමාවීම යළි සළකා බැලීම වටී. මම වනාහි ගෘහවාසයේ උපද්‍රව දැක නික්මෙන්නේ, මේ මනාප වූ පන්සලද පැසුණු බෙලිගෙඩියේ වර්ණයෙන් යුතු භූමියද, රිදීවර්ණ වූ සුදු බිත්තිද පරෙවිපා පාටැති කොලඅතු සෙවිලියද විසිතුරු වර්ණ ඇති හුණ පතුරු ඇඳ නිවාස පහසුව ඇති වසන තැන මෙපමණක්ද, අතිරේක වශයෙන් මගේ ගෘහසම්පත්ම පෙනේ. වෙනසක් නොපෙනේ. පන්සලේ දොස් පරීක්ෂා කරන්නේ දෝස අටක් දුටුවේය. පන්සල් පරිභෝග කිරීමේ ආදීනව අටකි. මහා ආරම්භයක් වශයෙන් ද්‍රව්‍ය රාශියක් එක්තැන්කොට කරනු ලැබීම එක් ආදීනවයකි. තෘණ පත් මැටි ආදියේ වැටුණුකල්හි ඒවා නැවත නැවත තැබිය යුතු බැවින් නිරතුරු පවතින ප්‍රතිසංස්කරණය දෙවැන්නයි. සේනාසන නම් අවේලාවේ මහල්ලන් පැමිණෙයි. නිතර නැගිටීමට සිදුවන බැවින් සිතේ එකඟතාවය නොපවතියි. නැගිසිටින ස්වභාවය තෙවැන්නයි. සීත උෂ්ණාදිය විනාශකරන බැවින් ශරීරය සියුමැලි කිරීම සතරවැන්නයි. ගෙට පිවිසෙන යම් කිසිවෙකු පාප කර්මයක් කළහැකි බැවින් ගර්හා කරන බව පස්වැන්නයි. මගේ මගේ යයි පටිහරණය කිරීම සයවැන්නයි. ගෙදරක් ඇති බව පෙනෙන නිසා දෙවෙනි වාසස්ථානය යනු සත්වැන්නයි. උකුණෝ, මකුණෝ, කැරපොත්තෝ ආදීන් සැරිසැරීම අටවැන්නයි. මෙසේ මේ අටවැදෑරුම් ආදීනව දැක බෝසත් තෙම පන්සල දුරු කළේය. එසේ හෙයින් කීවේය. **අධ්‍යර්ධාස සමාකීර්ණං පජහිං පණ්ණසාලකං** යනුවෙනි. **උපාගම්ං රුක්ඛමූලං ගුණෙ දසඵුපාගතෙ** යනු ආවරණය ප්‍රතික්ෂේපකොට දසගුණයෙන් යුක්ත වූ වෘක්ෂමූලයට පැමිණියේ වෙමියි කියයි. මේ ඒ ගුණ දහයයි. ඉතා කුඩා ආරම්භයක් වීම එක ගුණයකි. පැමිණි මොහොතේ එහි සිටිය හැකිවෙයි. පෝෂණය කිරීමක් පිළිදැගුම් කිරීමක් අනවශ්‍යය. එහි සමතලා බවද, උස්පහත් බවද පරිභෝග කිරීම පහසු වේ. විශේෂ උත්සාහයක් නොකිරීම තෙවැන්නයි. ගර්හා කිරීම නොවසාලයි. එහි පව්කම් කරන්නා ලජ්ජා කරයි. ගර්හාවට ලක් කරයි යනුවෙන් නොවසා තිබෙන බව සතරවැන්නයි. අභ්‍යවකාශය

මෙන් ශරීරය සන්තර්පණය නොකරයි. ශරීරය සන්තර්පණය නොකිරීම පස්වැන්න වේ. ප්‍රතිසංස්කරණය කරන බව සයවැන්නයි. ගෘහ ආලය ප්‍රතික්ෂේප කිරීම සත්වෙනි වේ. බොහෝ දෙනාට සාධාරණ ගෙදරක් මෙන් පිළිදැගුම් කරන්නෙමි. එතැනින් නික්මෙවූ! කියා ඉවත්කරන බවක් නැති නිසා අටවැන්න වේ. වාසය කරන්නාගේ ප්‍රීතිසහගත ස්වභාවය නවවැන්නයි. වෘක්ෂමූල, සෙනසුන් ගිය ගිය තැන්වල සුලභ හෙයින් අපේක්ෂා රහිත බව දසවැන්න වේ. මේ ගුණ දහය දැක රුක්බමූලං ගතෝස්මි යනුවෙන් ප්‍රකාශ කරයි. මේ කරුණු මෙපමණකින් සළකා බෝසත්තෙම, දෙවෙනි දිනයේ පිඬු පිණිස ගමට පිවිසි සේක. එකල්හි ඔහුට පැමිණි ගමේ මිනිස්සු මහත් උත්සාහයෙන් භික්ෂාදානය දුන්හ. හෙතම බත්කිස නිමවා, ආශ්‍රමයට පිවිස, හිඳ සිතුවේය. මම පැවිද්දෙන් ආහාර නොලබමි. මේ ආහාර සිනිදුය. මානමදය පුරුෂමදය වඩවයි. ආහාර මුල්වීමෙන් දුකෙහි කෙළවරක් නැත. යෙහෙකි, මට වවන ලද රෝපණය කළ ධාන්‍යය ධනය උපන් ආහාර දුරුකොට, "ළඟට වැටුණු ගෙඩිකොළ පමණක්" ආහාරය පිණිස වන්නේ යයි යනුවෙනි. හෙතම එතැන් පටන් එසේකොට උත්සාහ කරන්නේ වෑයම් කරන්නේ දින හතක් ඇතුළත, අෂ්ට සමාපත්ති ද පංච අභිඥාවන්ද ඉපදවීය. එසේ හෙයින් කියන ලදී.

"වවන, රෝපණය කළ ධාන්‍ය නිරවශේෂ
වශයෙන්ම දුරු කළෙමි. නොයෙක් ගුණ සම්පන්න වූ
පවත්තඵල භෝජී වූවෙමි."

"හුන්නැනමද සක්මන්මළුවේද එහිදී ප්‍රධන් වීර්ය
වැඩුවෙමි. සත්දිනක් ඇතුළත අභිඥා ලාභයට
පත්වූයෙමි."

මෙසේ අභිඥා බලයට පැමිණ, සුමේධ තාපසයෝ සමවත් සුවයෙන් කල්ගත කරන කල්හි දීපංකර නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේගේ පිළිසිඳගැනීම, උපත, බුදුවීම, ධම්මචක්ක දේශනාව පැවැත්වීම ආදී අවස්ථාවල දී සියළුම දස දහසක් ලෝකධාතු කම්පා විය. විශේෂයෙන් කම්පා විය. වෙව්ලමින් කම්පාවිය. මහඬින් නාදවිය. දෙතිස් පෙරනිමිති පහළ වූහ. සුමේධ තාපසයන් සමාපත්ති සුවයෙන් කල් ගෙවන්නේ (ඔහුට) ඒ ශබ්දය නොඇසුණේය. එම නිමිතිද නොදුටුවේය. එබැවින් කියන ලදී.

"මෙසේ මට අභිලාෂ සිද්ධවන කල්හි ශාසනයේ ඇල්ම
ඇතිවන කල්හි ලෝකනායක වූ දීපංකර නම් බුදුරදුන්
උපන් සේක."

"ඉපදුනු කල්හිද, පහළ වූ කල්හිද, බුදුවීමේදී හා
ධර්ම දේශනාවේදී ධ්‍යානරතියෙන් යුක්ත වූයේ
එම නිමිති සතර නොදුටුවෙමි."

එකෙණෙහි දීපංකර දසබලයන් වහන්සේ හතළිස් දහසක් මහරහතුන් පිරිවරණ ලදුව, පිළිවෙළින් චාරිකා කරන්නේ රම්ම නම් නගරයට පැමිණ සුදර්ශන මහා විහාරයේ වැඩවාසය කරන සේක. රම්‍ය නගරවාසීහු දීපංකර නම් ශ්‍රේෂ්ඨ ශ්‍රමණයා, පරම අභිසම්බෝධියට පැමිණ, පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තේ අනුපිළිවෙළින් චාරිකාවේ හැසිරෙන්නේ රම්ම නගරයට පැමිණ සුදර්ශන මහා විහාරයේ වැඩවාසය කරතියි අසා, ගිතෙල්, වෙඬරු ආදියද, බෙහෙත්ද, වස්ත්‍රපිළි ආදියද ගෙන්වාගෙන සුවඳමල් ආදී ගත් අත් ඇතිව බුදුරදුන් යම්තැනකද, ධර්මය යම්තැනකද, සංඝයා යම්තැනකද, එතැන ගොඩබිමක්ද, සිත් අලවන තැනක්ද, පර්වතයක්ද, යන්න නොසළකා එතැන ශාස්තෘන් වහන්සේ වෙත එළඹි බුදුරදුන්ට සුවඳමල් ආදියෙන් පුදා වැඳ එකත්පසක හුන්නේ ධර්මදේශනාව අසා හෙට දවස සඳහා ආරාධනාකොට අසුනින් නැගිට පිටත්ව ගියහ. ඔවුහු දෙවන දිනයේ මහාදානයක් පිළියෙළ කරවා, නගරය අලංකාරකොට, දසබලයන් වහන්සේ වඩිනා මාර්ගය අලංකාර කරන්නෝ ජලය වැටුණු තැන්වල පස් ඉවත්කොට භූමිය සමතලා කොට රිදීපාට වැලි විසුරුවති. ලදපස්මල්ද විසුරුවති. නොයෙක් වර්ණ වූ වස්ත්‍රවලින්ද, ධජ පතාකද ඔසවති. කෙසෙල්ද, පුන්කලස් පේළිද, පිහිටුවති. එකල්හි සුමේධ තවුසා තමන්ගේ අසපුවෙන් පිටත්ව, ඒ මිනිසුන්ට ඉහළින් අහස්තලයේ යන්නේ ඒ තුටු පහටු වූ මිනිසුන් දැක කවර හේතුවක් නිසාදැයි අහසින් බැස එක්තැනක සිට මිනිසුන්ගෙන් විචාළේය. පින්වත්නි, තෙපි කවරෙකුට මෙම මාර්ගය සරසන්නහුද? එහෙයින් කියන ලදී.

"ප්‍රත්‍යන්ත දේශසීමාවේදී - තථාගතයන්ට ඇරයුම්කොට
උන්වහන්සේ පැමිණෙන මාර්ගය - සතුටු සිතින් පිරිසිදු කරත්"

"මම එසමයෙහි සිය අසපුවෙන් නික්මී රළුසිවුර දරමින්
එකල අහසෙන් යමි."

"ප්‍රීතිමත් වූ මිනිසුන් දැක ප්‍රමෝදිතව සතුටු සිතින්
අහසින් බැස එකෙණෙහි මිනිසුන්ගෙන් විචාළේය."

"ප්‍රීතිමත් වූ මහජනයා ප්‍රමුදිත වූ සතුටු සිතින්
කවරෙකුට මාර්ගය පිරිසිදු කරයිද, මාර්ගය පිළිසකර කරහුද?"

මිනිස්සු කීවාහුය. ස්වාමීනි; සුමේධයනි, ඔබ නොදනිහිද? දීපංකර බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පැමිණ පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තේ, චාරිකාවේ හැසිරෙන්නේ අපගේ නුවරට පැමිණ සුදර්ශන මහා විහාරයේ වාසය කරති. අපි, ඒ භාග්‍යවතුන්ට ආරාධනාකොට, ඒ භාග්‍යවත් බුදුරදුන්ගේ පැමිණෙන මාර්ගය අලංකාර කරමු. ඉක්බිති සුමේධ තවුසා සිතුවේය. බුද්ධ යන හඬ පමණක් ලෝකයෙහි දුර්ලභය. බුද්ධෝත්පාදයද එසේමය. මා විසින්ද මේ මිනිසුන් සමග දසබලධාරීන් වහන්සේ වඩින මාර්ගය අලංකාර කිරීම වටී යයි, හෙතෙම ඒ මිනිසුන්ට කීවේය. ඉදින් පින්වත් නුඹලා මේ මාර්ගය බුදුරදුන්ට අලංකාර කරවු නම් මටද එක් ඉඩකඩක් දෙවු! මම ද නුඹලා සමග මාර්ගය අලංකාර කරන්නෙමියි. ඔවුහු යහපතැයි පිළිගෙන සුමේධ තාපසයන් ඍද්ධිමත් බව දන්නා නිසාවෙන් ජලයෙන් බිඳුණු ඉඩකඩ සළකා, නුඹ මේ ස්ථානය අලංකාර කරවයි දුන්හ. සුමේධ බුදුන් අරමුණු කරගත් සතුටින් යුතුව සිතීය. මම මේ ඉඩකඩ ඍද්ධි බලයෙන් අලංකාර කිරීමට සමත් වෙමි. එසේ සැරසීම මට සතුටක් නොවන්නේ ය. මෙහි මා විසින් කයින් වතාවත් කිරීම වටී යයි පස් ගෙනවුත් ඒ පෙදෙසෙහි දැමීය. එවිට ඒ පෙදෙස නිම නොකරද්දීම දසබලවූ දීපංකර බුදුරජු මහානුභාව සම්පන්න, ඡට් අභිඥාලාභී හතළිස් දහසක් මහරහතුන් පිරිවරණ ලදුව, දේවතාවන් දිවමල් දිවසුවඳ ආදියෙන් පුදන කල්හි, දිව්‍ය සංගීතයෙන් පුදන කල්හි, මිනිසුන් අතර මානුෂික වූ සුවඳ මල් ආදියෙන්ද තූර්ය නාදවලින්ද පුදනු ලබන කල්හි, උපමා රහිත බුද්ධ ලීලාවෙන් හිරියල් පර්වතයක වැජඹෙන සිංහයෙකු මෙන්, ඒ අලංකාරව පිළියෙළ කරන ලද මාර්ගයට පිළිපන් සේක. සුමේධ තාපසයන් ඇස් විවෘතකොට අලංකාර කරන ලද මාර්ගයෙන් වැඩම කරන්නා වූ බුදුන් වහන්සේගේ දෙතිස් මහ පුරුෂ ලක්ෂණවලින් සමන්විත, අසූවක් අනුකුඩා ලක්ෂණවලින් මනරංජිත වූ බ්‍යාම ප්‍රභා මණ්ඩලයෙන් වටකරන ලද, නිල්මිණි වන් අහස්තලේ විහිදෙන්නා වූ නොයෙක් ආකාර විදුලි යුගල යුගල මෙන් සවණක් බුදුරැස් විහිදුවන්නා වූ මුදුන් මල්කඩක් බඳු වූද තථාගතයන් වහන්සේ,

දෙස දෙඇස් විවෘතකර "අද මා විසින් දසබලධාරීන් වහන්සේට ජීවිත පරිත්‍යාග කිරීම වටී, භාග්‍යවතුන් වහන්සේ මඩගොඩ නොපාගාවා! මැණික් පුවරු ඒ දණ්ඩකින් එතෙර වන්නාක් මෙන්, හතළිස්දහසක් මහරහතුන් සමග මගේ පිට පාගමින් වඩීවා! එය මට දිගුකලක් හිත පිණිස සැප පිණිස වන්නේ යයි කෙස් මුදවා අඳුන් දිවිසම ජටාමඩුල්ල වැහැරි සිවුර, කලුපාටැති මඩෙහි අතුරා මැණික් පුවරුවකින් සෑදූ පාලමක් මෙන් මඩ මත්තෙහි හොත්තේය. එබැවින් කියන ලදී.

මා විසින් විචාරන ලදුව ලෝකයෙහි අනුත්තර වූ ලෝකනායක වූ
දීපංකර නම් බුදුරජාණන් වහන්සේ ඉපදුනු බවත්, උන්වහන්සේ
වැඩමවීම පිණිස මාර්ගය පිළිසකර කරන බවත් ඔව්හු කීහ.

එකල්හි බුද්ධයයි නම ඇසූ පමණින් මට ප්‍රීතිය පහළ වූයේය.
බුද්ධ බුද්ධ යැයි කියත් කියත්ම සොම්නසින්
උද්දාමයට පත්වීමි.

තුටුපහටු වූ සිතින්, යුතු මම එම සතුට ඉක්මයාමට පෙරම
එහි බීජ රෝපණය කළ යුතුයයි එතැන සිටම සිතීමි.

ඉදින් බුදුන් සඳහා මාර්ගය සකස් කරන්නේ නම් මට ද අවකාශයක්
(කොටසක්) දෙනු මැනවි. මම ද මාර්ගය පිළිසකර කරමි.

එකල්හි මාර්ගය පිළිසකර කිරීම සඳහා එක් ඉඩකඩක් මට දුන්හ.
බුද්ධ බුද්ධ යයි සිතමින්ම මහත් භක්තියෙන් මාර්ගය
පිළිසකර කළෙමි.

මගේ කොටස පිළිසකර කර නොනිමි කල්හිම,
ෂඩ් අභිඥා සම්පන්න වූ නිර්මල වූ මහ රහතන් වහන්සේලා
පිරිවරා දීපංකර බුදුන්වහන්සේ මහමගට වැඩමවූ සේක.

ප්‍රමුදිත වූ දෙව්මිනිස්සු පසුගමන් පවත්වති. සාධුකාර පවත්වති.
බොහෝ හේරිහු වයනු ලැබෙත්.

මිනිස්සු සහ දෙවියෝ බුදුන් වහන්සේ නරඹත් දෙඅත් ඔසවා වැඳගත් දෙපිරිසම, තථාගතයන් වහන්සේ අනුව යති.

දෙවියෝ දිව බෙර වයමින් ද, මිනිස්සු මානුෂික බෙර වයමින්ද තථාගතයන් වහන්සේ අනුව යති.

දිව්‍යමය වූ මඳාරා මල්ද, පරසතු මල්ද, ආකාශගත දෙව්වරු දිසාවෙන් දිසාවට විසුරුවති.

දිව්‍යමය වූ සඳුන් සුවඳ කුඩුද උතුම් වූ සුවඳ වර්ගද අහසෙහි හැසිරෙන දෙව්වරු දිසාවෙන් දිසාව විසුරුවත්.

සපු - සලල - මිදෙල්ල - නා - දොඹ - වැටකේ ආදී මල්, පොළවෙහි සිටින මිනිස්සු මග දෙපස විසුරුවති.

මම හිසකෙස් මුදවා - වැහැරි සිවුරද සම්කඩද, මඩෙහි අතුරා මුනින්තලා වී වැදහොත්තෙමි.

බුදුන් වහන්සේ ශ්‍රාවක පිරිස් සමඟ මා මැඩගෙන වඩිනු මැනවි. මම මඩවගුරෙන් ඉවත් නොවෙමි. මා මැඩගෙන වැඩීම (බොහෝකල්) මට හිතසුව පිණිස වන්නේය.

හෙතම මඩ මත්තෙහි සිටම ඇස් ඇර දීපංකර බුදුන්ගේ බුද්ධශ්‍රීය බලන්නේ මෙසේ සිතුවේය. ඉදින් මම කැමැති වන්නේ නම් සියලු කෙලෙස් දවා, නවක පැවිද්දකු වී, රම්‍ය නුවරට පිවිසිය හැකිය. වෙනත් විලාශයකින් කෙලෙස් දවා, නිවනට පැමිණීමට තරම් නොවේ. දීපංකර බුදුරදුන් මෙන් පරම අභිසම්බෝධියට පැමිණ දහම් නැව නගා මහජනයා සංසාර සාගරයෙන් එතරකොට පසුව පරිනිර්වාණයට පත්වෙන්නේ නම් ඉතා යෙහෙකි. මේ මගේ අපේක්ෂාවයි. අනතුරුව අෂ්ට ධර්මයෙන් පරිපූර්ණව බුද්ධභාවය පිණිස අභිනීහාර කොට හොත්තේය. එබැවින් කියන ලදී.

"පොළොවේ හොත්තා වූ මට මෙබඳු අදහසක් පහළ විය.
අද මම මගේ කෙලෙස් දැවීමට කැමැති වන්නෙමි

අනෙක් විලාශයකින් ධර්මය මෙහිදී සාක්ෂාත් කිරීම
කවර අර්ථයක්ද, සර්වඥතාභාවයට පැමිණ, සදේවක ලෝකයාට
බුදුවරයෙක් වන්නෙමි.

ධෛර්ය ඇති මම හුදෙකලාව එතෙර වීමෙන් කවර අර්ථයක්ද?
සර්වඥ භාවයට පැමිණ, බොහෝ ජනයා එතෙර කරන්නෙමි.

"සසර සැඩ පහර සිඳ තුන් භවය විධිවංසනය කොට
දහම් නැවට නංවා, සදේවක ලෝකයා එතර කරවන්නෙමි.

යම් හෙයකින් බුද්ධත්වයට පත්වන්නෙකු විසින් මිනිසෙකු වීම, පිරිමියෙකු වීම, අරහත්වය සඳහා හේතු සම්පත් ඇති බව, ජීවමාන බුදුවරයෙකු දැකීම, පැවිදිවීම, ගුණසම්පත්තිය, බුද්ධකාරක ධර්ම පිළිබඳ උත්සාහය, බුදුවීම පිළිබඳ කැමැත්ත. යන කරුණු අට තිබිය යුතුය.

මනුෂ්‍ය ආත්මභාවයෙහි සිට බුදුබව ප්‍රාර්ථනා කරන්නහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. නාගයකුගේ, ගුරුළුකුගේ හෝ දේවතාවකගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. මිනිස් ආත්ම භාවයේ සිටියේද පුරුෂ භාවයෙන් සිටියහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධය. ස්ත්‍රියක හෝ නපුංසක, පණ්ඩව යන උභතොව්‍යඤ්ජනයන්ගේ පැතුමද සමෘද්ධ නොවේ. පුරුෂයකුගේ වුවද ඒ ආත්මභාවයේ අරහත්ඵලයට පැමිණීමට හේතුවාසනා ඇත්තාගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. අනෙකකුගේ එසේ නොවේ. ඉදින් හේතුසම්පත් ඇත්තේ නමුත් ජීවමාන බුදුවරයකුගේ සමීපයේ ප්‍රාර්ථනා කළ අයගේ පැතුම සඵල වේ. පිරිනිවන්පෑ බුදුවරයකුගේ හෝ චෛත්‍යය සමීපයේ හෝ බෝධිමූලයේ සිට ප්‍රාර්ථනා කරන්නහුගේ පැතුම සමෘද්ධ නොවේ. බුදුවරුන්ගේ සමීපයේ ප්‍රාර්ථනා කරන්නේද පැවිදි බව ඇත්තාගේම පැතුම සමෘද්ධ වේ. ගිහියාගේ එසේ සඵල නොවේ. පැවිද්දාගේ වුවද පංචාභිඥා, අෂ්ට සමාපත්ති ලාභියාගේම පැතුම සමෘද්ධ වේ. මේ ගුණ සම්පත් විරහිත වූවහුගේ නොවේ. ගුණසම්පන්න වුවද යම්බඳු වූ තමන්ගේ ජීවිතය බුදුවරුන්ට පරිත්‍යාග කිරීම සිදුවූවහුගේ පැතුම සඵල වේ. ඔහුගේ මේ ආකාර කැමැත්ත ඇත්තාගේ පැතුම සමෘද්ධ වේ. අනෙකකුගේ එසේ නොවේ. අධිකාර සම්පන්න වුවද

බුද්ධකාරක ධර්මයන්ගේ අර්ථ සිද්ධිය පිණිස මහත් කැමැත්ත, මහත් උත්සාහය, වෑයමද සෙවීමද ඇත්තාගේ පැතුම සමෘද්ධ වේ. අනෙකකුගේ එසේ නොවේ. එහිලා කැමැත්තේ මහත්බව පිණිස උපමාවක්ද ඇත. ඒ මෙසේය. "යමෙක් චක්‍රවාට ගර්භයේ හුදකලා වූයේ තමන්ගේ බාහු බලයෙන් පැතිර පරතෙරට යන්නට සමත්වේදැ? හෙතම බුදුබවට පැමිණෙයි. යමෙක් වනාහි මුළු චක්‍රවාට ගර්භය උණ ලීයකින් සිදුරුකොට මැද පියවරෙන් යන්නේ පරතෙරට යන්නට සමත් වේද, ඔහු බුදුබවට පැමිණෙයි. යමෙක් මුළු සක්වල සැතකින් කොටා නිරතුරුව සැතින් කොටන ලද තැන් පාදයෙන් මැඩගෙන පරතෙරට යන්නට සමත් වේද, හෙතම බුද්ධත්වයට පැමිණෙයි. යමෙක් මුළු චක්‍රවාටය දැල්වෙන අඟුරු අතුරා පාවලින් මඩිමින් පරතෙරට යාමට සමත්වේද, හෙතම බුදුබවට පැමිණෙයි. මේවා අතර එකකුදු තමන්ට දුෂ්කර යයි නොහඟියි. මම එසේද කොට, ගොස් පරතෙරට යන්නෙමියි එසේ මහත් වූ කැමැත්තෙන් මහත් වූ උත්සාහයෙන්, ව්‍යායාමයෙන්, සෙවීමේ නිරත වීමෙන් සමන්විත වූයේ වෙයි. ඔහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. අනෙකකුගේ නොවේ. සුමේධ තාපසයා මේ අෂ්ටධර්ම සමාදන් වී බුදුබව පිණිස අභිනීහාරකොට හොත්තේය. දීපංකර භාග්‍යවතුන් වහන්සේද වැඩමකොට සුමේධ තාපසයාගේ හිස සම්පයේ සිට මැණික් සිංහ පඤ්ජරයක් ගලවා දමන්නාක් මෙන් පස් පැහැ පියුම් සමාන වූ ඇස් විවරකර බලා මඩ මත්තෙහි හුන්නා වූ සුමේධ තාපසයා දැක මේ තාපසයා බුදුබව පිණිස, අභිනීහාරකොට හොත්තේ මොහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේද, නැද්ද යනුවෙන් අනාගත (සංඥාවක්) තත්ත්වයන් සළකා බලන්නේ, මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මත්තෙහි මෙතෙම ගෞතම නම් බුදුවන්නේය යයි දැන එහි සිටියදීම, පිරිස මැද අනාගත වාක්‍ය ප්‍රකාශ කළ සේක. "මේ මඩ මත්තෙහි හොත්තා වූ උග්‍ර තපස් ඇති මේ තාපසයා දෙස බලවු." එසේය ස්වාමීනි, මෙතෙම බුදුබව පිණිස අභිනීහාර කොට හොත්තේය. මොහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේය. මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මත්තෙහි ගෞතම නම් බුදුවන්නේය. ඔහුගේ ආත්මභාවයේදී කපිලවස්තු නම් නගරය නිවාස වන්නේය. මායා දේවිය ඔහුගේ මව වේ. සුද්ධෝදන නම් රජු පියා ය. උපතිස්ස නම් තෙරුන් අග්‍රශ්‍රාවකයාය. දෙවෙනි අග්‍ර ශ්‍රාවකයා කෝලිත නමි. බුද්ධ උපස්ථායකයා ආනන්ද නමි. අග්‍රශ්‍රාවිකාව බෙමා නම් වේ. දෙවෙනි ශ්‍රාවිකාව උප්පලවණ්ණා නම් තෙරණිය වන්නීය. මෙතම පැසුණු බුද්ධිය ඇත්තේ, මහාභිනිෂ්ක්‍රමණය කොට ප්‍රධන් වීර්ය වඩා නුගරුක්මුල කිරිබත පිළිගෙන

නේරංජරා නදී තීරයේදී වළඳා බෝධි මණ්ඩපයට පැමිණ ඇසතු රුකමුල අභිසම්බෝධියට පත්වන්නේය.

එසේ හෙයින් කියන ලදී.

1. මාගේ පූජාව පිළිගත් ලෝකවිදූ ගුණයුත් දීපංකර සර්වඥයන් වහන්සේ මගේ හිස සමීපයේ සිට මෙම වචන වදාළ සේක.

2. උග්‍ර තවුස්දම් රකින මේ ජටිලයා බලව, මෙයින් මතු කල්පයකදී මෙතෙම ලෝකයෙහි (ලොව්තුරා) බුද්ධත්වයට පත්වන්නේය.

3. රම්‍ය වූ කපිලවත්‍ථු පුරයෙන් නික්ම යන්නා වූ ඔහු දුෂ්කර ක්‍රියාකොට, ප්‍රධන් වීර්යය වඩා තථාගතභාවයට පැමිණේ.

4. එසේ ගියා වූ හෙතෙම අජපාල නුගරුක් මලදී කිරිපිඬු පිළිගෙන නේරඤ්ජරා නදිය වෙත පැමිණෙනු ඇත.

5. නේරඤ්ජා නදිය අසබඩදී කිරිපිඬු වළඳා සරසා පිළියෙළ කළ මාර්ගයෙන් බෝධි මණ්ඩපය වෙත පැමිණෙයි.

6. අනුත්තර වූ බෝමැඩ ප්‍රදක්ෂිණාකොට, අස්වත්ථ රුක්මුල්හිදී මහත් කීර්තියට පත්ව සිව්සස් අවබෝධ කරන්නේය.

7. මොහුගේ වැදූ මව මහාමායා නම් වන්නීය. පියා සුද්ධෝදන වන අතර, මෙතෙමේ ගෝතම නම් වේ.

8. ආශ්‍රව නැත්තා වූ වීතරාගී වූ සන්සුන් සිතින් සමාහිත වූ කෝලිත උපතිස්ස දෙනම අග්‍රශ්‍රාවකයෝ වන්නාහ.

9. ආනන්ද නම් වූ උපස්ථායක තෙමේ ඒ ජිනයන් වහන්සේට උපස්ථාන කරයි. ඛේමා සහ උප්පලවණ්ණා අග්‍ර ශ්‍රාවිකාවෝ වන්නාහ.

10. අනාශ්‍රව වූ වීතරාගී වූ සන්සුන් සිත් ඇත්තා වූ දැමුණු ඉඳුරන් ඇත්තා වූ, මෙම භාග්‍යවතුන්ගේ බෝධිය අස්වත්ත (ඇසතු) නම් වන්නේය.

ඒ අසා සුමේධ තාපස තෙමේ මගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේ යයි සොමනසට පැමිණියේ විය. මහජනයා දීපංකර බුදුරදුන්ගේ වචන අසා, සුමේධ තාපසයා බුද්ධ බීජංකුර යයිද, බුද්ධ අංකුරයක් යයිද තුටු පහටු විය. මෙසේ විය. යම්සේ මිනිසකු නදියක් තරණය කරන්නේ ඍජුවම තොටුපොළ තරණය කිරීමට නොහැකිව යටින් පිහිටි තොටුපළකින් එතරවන්නේ ද එසේ අපි දීපංකර බුදුරදුන්ගේ ශාසනයේදී මාර්ග-ඵල නොලබන්නමෝ නම් අනාගතයේ යම්දිනක ඔබ බුදුවන දිනක ඔබ ඉදිරියේ මාර්ග-ඵල සාක්ෂාත් කිරීමට සමත් වන්නෙමුයි ප්‍රාර්ථනා තැබූහ. දීපංකර බුදුරදුන්ද බෝසතුන්ට ප්‍රශංසාකොට මල් අටමිටකින් පුදා, ප්‍රදක්ෂිණා කොට වැඩිසේක. ඒ ක්ෂීණාශ්‍රවයෝ හතළිස් දහසද, බෝසතුන්ට සුවඳ මල් ආදියෙන් පුදා ප්‍රදක්ෂිණාකොට පිටත්ව ගියහ. දෙව් මිනිස්සුද එසේම පුදා, වැඳ පිටත්ව යන්නෝ, බෝසතුන් සියළුදෙනා ඉවත්ව ගියකල්හි හුන්තැනින් නැගිට පාරමී ඍස්කරන්නෙමියි මල්ගොඩ මැද පලක් බැඳ හුන්නේය. මෙසේ බෝසතුන් හිඳිනාකල්හි, මුළු දසදහසක් සක්වළ දේවතාවෝ ඍස්ව් සාධුකාර දී ආර්ය වූ සුමේධ තාපස පෙර බෝධිසත්වරුන් පාරමී සිහිපත් කරන්නෙමුයි හුන්කල්හි යම් පූර්ව නිමිති ප්‍රකට වූවෝද, ඒ සියල්ලම අද පහළ වූවෝ වෙති. නිසැකයෙන්ම ඔබ බුදු වන්නෙහිය. මෙය අපි දනිමු. මෙවැනි යම් නිමිති ප්‍රකට වෙත්ද, ඒකාන්තයෙන් හෙතම බුදුවෙයි. ඔබ තමන්ගේ වීර්ය දැඩිකොට උත්සාහ කරන්නැයි බෝසතුන්ට නොයෙක් ආකාරයේ ස්තුතිවලින් අභිස්තුතිය පුද කළහ.

එහෙයින් කියන ලදී :-

"අසම වූ මහර්ෂි බුදුරදුන්ගේ මේ වචන අසා, මෙතෙම
බුද්ධාංකුරයකු යයි දත් දෙව් මිනිස්සු සතුටට පත්වූහ.

"දසදහසක් සදේවක ලෝවැසියෝ උණුසුම් ලෙස මහත්සෝෂා
පවත්වති. අත්පොළසන් දෙති. සිනහ වී සතුට පළකරති. ඇඳිලිබැඳ
නමස්කාර කරති.

යම් ආකාරයකින් මෙම ලෝකනාථයන්ගේ ශාසනයෙන්
(අපේ මගපල) වැරදී ගියොත් අනාගතයෙහිදී ඔබවහන්සේ හමුවේ
එය ලබා ගනිමු.

යම්කිස අයුරකින් නදියකින් එතරවන මිනිසුන් ප්‍රධාන තොටුපලෙන් එතෙරවීමට නොහැකි වුවහොත්, පහල පිහිටි වෙනත් තොටුපලකින් නදිය තරණය කරති.

එසේ අප සියළු දෙනම වර්තමාන, ජිනයන් වහන්සේගෙන් සසරින් මිදීමට අපොහොසත් වුවහොත් අනාගතයේ ඒකාන්තයෙන් ඔබ හමුවට පැමිණෙන්නෙමු.

ලෝකය දත්තා වූ දීපංකර සර්වඥයන් වහන්සේ මගේ පූජාව පිළිගෙන, මගේ ක්‍රියාවට ප්‍රශංසාකොට වැඩමවීය.

ඉක්බිතිව සියළු බුද්ධ ශ්‍රාවකයෝ මා පැදකුණු කළහ. මිනිස්සුද, නාගයෝද, ගන්ධර්වයෝ ද මා නැමැද ගියහ.

සංඝයා සහිත වූ ලෝක නායකයන් වහන්සේගේ දර්ශනය ඉක්මවූ කල්හි තුටු පහටු වූ සිතින් මම හුන් තැනින් නැගිටිමි.

සැපයෙන් සැපයට පත්වුනෙමි. ප්‍රීතියෙන් ප්‍රීතියට පත්වුනෙමි. ප්‍රීතියෙන් අභිෂේක ලත් මම එකල්හි පලක් බැඳ,
(කකුල් ගොතා හිඳගෙන)

එකල්හි මම පලඟෙහි සිට මෙසේ සිතීමි. මම ධ්‍යානයෙහි ඇලුණේ වෙමි. අභිඥාවන්ගෙන් කෙළවරට ගියෙමි.

සුවහසක් ලෝකයෙහි මා සමාන ඍෂිවරයෙක් නැත. අසම සමවූ සෘද්ධි ධර්මයෙන් මේ සමාන සැපයක් ලද්දෙමි.

මගේ පලඟ සේවනය දැක දසදහසක් සක්වල වැසියෝ, ඔබ ඒකාන්තයෙන් බුදුවන්නේ යයි මහානාද පැවැත්තූහ.

පෙර යම් බෝධිසත්ත්වවරයෝ උතුම් වූ පලඟට නැග යම් යම් නිමිති දැක්කාහුද, ඒ නිමිති අද මම දකින්නෙමි.

සීතල පහව ගියේ වෙයි. උණුසුමද සමවායෙන් පවතී.
අද ඒ තත්ත්වයන් ප්‍රදර්ශනය වේ. ඒකාන්තයෙන් බුදු වන්නේමය.

දසසහශ්‍රී ලෝකධාතුව නිහඬව සිටී. ආරාවුල් රහිතද වේ.
ඒ තත්ත්වය අද ප්‍රදර්ශනය වේ. ඒකාන්තයෙන් බුදු වන්නේමය.

මහා සුළං හමා නොයත්. ගංගාවෝ (තදින්) ගලා නොබසති.
මේ ලක්ෂණ අද ප්‍රදර්ශනය වේ. ඒකාන්තයෙන් මම බුදු වන්නේමය.

ගොඩබිමෙහිද, ජලයෙහිද සියළු පුෂ්පයන් එකවර පිපී ඇත.
ඒ සියල්ල අද පල දරා ඇත. ඒකාන්තයෙන් මම බුදුවන්නෙමි.

ගස්වැල් මේ වනවිට හොඳින් ඵල දරා ඇත. ඒ සියල්ල
ඵල දැරුවාක් මෙන් මම ඒකාන්තයෙන් බුදුවන්නෙමි.

අහසෙහිද පොළවෙහි ද ඇත්තා වූ සියළු රත්නයන්
දිලිසෙමින් පවති. ඒ රත්නයන් දිලිසෙන්නාක් මෙන් ඒකාන්තයෙන්
බුදු වන්නේමය.

මානුෂික වූද දිව්‍යමය වූද තූර්ය භාණ්ඩයෝ එකෙණෙහි වාදනය
කරත්. එම තූර්ය භාණ්ඩ හඬ නගන්නාක් මෙන් ඒකාන්තයෙන්
බුදු වන්නේය.

එකෙණෙහි අහසෙහි විසිතුරු පුෂ්පයෝ වර්ෂා කෙරෙත්.
අද විසිතුරක පහල වන්නාක් මෙන් ඒකාන්තයෙන් බුදු වන්නේමය.

දහසහශ්‍රී ලෝකධාතුව ප්‍රකම්පිත වේ. මහා සමුද්‍රය (සියරළ) හකුළා
ගනී. මෙසේ සතුටු වන්නාක් මෙන්, ඒකාන්තයෙන් බුදු වන්නේමය.

එකෙණෙහි සියළු නිරයන්හි ගිනි නිවෙත්. එවන් ගිනි
නිවුණාක් මෙන් ඒකාන්තයෙන් බුදු වන්නේමය.

සූර්යයා නිර්මල වේ. සියළු තාරකාවෝ දක්නට ලැබෙත්,
අද මෙවැනි විසිතුරු ප්‍රදර්ශනය වේ. ඒකාන්තයෙන් බුදුවන්නේමය.

එකෙණෙහි ඇතිවුනා වූ වැස්සෙන් පොළව ඉල්පී සතුටු වෙයි.
පොළවෙහි එම ඉල්පීමෙන් දක්වන්නේ ඒකාන්තයෙන් බුදුවන බවයි.

ගගන ගැබෙහි නැකැත් තරු සමූහයා බැබළෙති.
වෙසක් මසේ දිනූ චන්ද්‍රයා මෙන් ඒකාන්තයෙන් බුදු වන්නේය.

සිතේ කිළිටි බවද, විඩාබර බවද, තමන් සමීපයෙන් නික්මෙයි.
සිත්හි පවත්නා ආකාරය පිරිසිදු වේ. ඒකාන්තයෙන් බුදුවන්නේය.

සිතෙහි රෝගයෝ ව්‍යුපසමනය වෙත්, පිළිකුල් බව විනාශවී ඇත.
අද මේ සියල්ල ප්‍රදර්ශනය කෙරේ. ඒකාන්තයෙන් බුදුවන්නේය.

එකල්හි රාගය නොවැඩේ. ද්වේෂයද මෝහයද නැසුනේය.
අද ඒ සියල්ල ප්‍රදර්ශනය වෙත්. ඒකාන්තයෙන් බුදුවන්නේය.

අද පටන් කිසිදු බියක් හට නොගනී. එම ස්වරූපයෙන්
ඒකාන්තයෙන් බුදුවන බව දැනගනිමි.

ඉස්මතු වූ (කෙලෙස්) රජස් දූලි අද විධ්වංසනය වන බව දිස්වේ.
එම ස්වභාවයෙන් ඒකාන්තයෙන් බුදුවන්නේ යයි දැනගනිමි.

අනිෂ්ට වූ දුර්ගන්ධය ඉවත්ව යයි. දිවසුවඳ හමායයි.
ඒකාන්තයෙන් බුදුවන බව පවසමින් දිවසුවඳ හමා යනවා වැනිය.

රූපයෙන් තොරව සිටියා වූ දෙවිවරු රූපීවත්ව බබළමින්
පෙනේ. අද ඒ සියල්ල දකින්නේ ඒකාන්තයෙන් බුදුවන බැවිනි.

එකෙණෙහි යම්තාක් සියළු නිරයෝ දක්නේද, ඒ සියල්ල දකින්නේ
ඒකාන්තයෙන් බුදුවන බැව් දක්වමිනි.

බිත්ති-දොරපලු-ජනෙල්-ගල්කුළු ආදී ආවරණයන්ගෙන් තොරවී
ආකාශගත වූවා වැන්න. එසේ විවෘත වූයේ ඒකාන්තයෙන්
බුදුවන්නේ යයි කියමිනි.

චුතියද උත්පත්තියද ක්ෂණයෙහි විද්‍යමාන නොවේ.
ඒ සියල්ල අද දැක්වෙන්නේ ඒකාන්තයෙන් බුදුවන්නේ යයි දන්වමිනි.

දැඩි වීර්යයෙන් කටයුතු කරව, නොනැවතී ඉදිරියටම යන්න.
ඒකාන්තයෙන් බුදුවන බව, අපි නිසැකවම දන්නෙමු.

බෝධිසත්වයෝ දීපංකර බුදුරදුන්ගේ සහ දසදහසක් සක්වළ දේවතාවන්ගේ වචනය අසා බොහෝසෙයින් සොම්නසට පැමිණියේ, හටගත් උත්සාහය ඇතිව මෙසේ සිතීය. බුද්ධ යනු අර්ථ සහිත වචනයකි. බුද්ධ යන වචනයට සමාන අන්දෙයක් නැත. යම්සේ අහසට විසිකළ ගල්කැටය බිමවැටෙන සේ, උපන්නහුට මරණය අරුණ උදාවූ කළ සූර්යෝද්ගමනය ගුහාවෙන් නික්මුණු සිංහයාගේ සිංහනාදය, දරු ගැබ්බර ස්ත්‍රිය එම බරින් මිදීම, ඒකාන්තයෙන් සිදුවේ. එපරිදි බුදුවරුන්ගේ වචනය නම් ඒකාන්තයෙන් නොසිස් වේ. ඒකාන්තයෙන් මම බුදුවන්නෙමි. එබැවින් කියන ලදී.

බුදුරජුන්ගේ ද දසදහසක් සක්වළ දෙවියන්ගේ ද යන දෙපාර්ශ්වයේම වචන ඇසූ මම ප්‍රීතියෙන් පිනා ගියේ මෙසේ සිතීමි.

බුදුවරයෝ සත්‍ය අසත්‍ය වශයෙන් දෙ ආකාර වදන් ඇත්තෝ නොවෙති. මුනිවරයෝ හිස්වචන ඇත්තාහු නොවෙති.
බුදුවරුන්ගේ බොරුවක් නැත. නිසැකයෙන්ම මම බුදුවන්නෙමි.

යම්සේ අහසට විසිකළ ගල්කැටය නිසැකවම බිම වැටේද? එසේම බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ වචනය ඒකාන්තයෙන් සත්‍ය වන්නේය.

යම්සේ සියළු සත්ත්වයන්ගේ මරණය ඒකාන්තද? එසේම බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ වචනය ද ඒකාන්තමය.

යම්සේ රාත්‍රිය ඉකුත්වීමෙන් සූර්යයාගේ ආගමනය ස්ථිර වන්නේද, එසේ බුද්ධශ්‍රේෂ්ඨයන්ගේ වචනය සදාකාලික සත්‍යය වන්නේය.

යම්සේ ගුහාවෙන් නික්මුණු සිංහයාගේ නාදය ඒකාන්තද? එසේම බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ වචනය සදාකාලික සත්‍යය වන්නේය.

යම්සේ දරුගැබ් ඇත්තියක් ඒකාන්තයෙන් ඒ බරින් සැහැල්ලු වන්නේමද, එමෙන් බුද්ධ ශ්‍රේෂ්ඨයන්ගේ වචනය ඒකාන්තයෙන් සදාකාලිකය.

ඒ ස්ථිරසාර වූ අදහස් ඇත්තේ මම ඒකාන්තයෙන් බුදුවන්නෙමියි මෙසේ කරන ලද සනිටුහන් ඇත්තේ, බුද්ධකාරක ධර්ම සළකා බැලීමට, බුද්ධකාරක ධර්ම සෙවීමට, බුද්ධකාරක ධර්ම කොහිද? උඩ යට දිසා විදිසාවලදැයි, අනුක්‍රමයෙන් සියලු ධර්ම ධාතුව පරීක්ෂා කරන්නාහු පෙර බෝධිසත්වවරුන් සෙවුනා ඇසුරු කරන ලද දාන පාරමිතාව දැක, මෙසේ තමන්ට අවවාද කළේය; සුමේධ පණ්ඩිතය; නුඹ මෙතැන් පටන් පළමු දාන පාරමිතාව පුරනු මැනවි. යම්සේ යටිකුරු කරන ලද දිය කළය නිරවශේෂ කොට ඉතිරි නොකොටම වගුරවමුද ආපසු නොගනීද, එපරිදි ධනය හෝ පිරිවර හෝ අඹුදරුවන් අඟපසඟ වශයෙන් නොබලා සපැමිණි යාචකයන්ට කැමති කැමති සියළු දෙය ඉතිරි නොකොට දෙන්නාහු බෝරුක් මුල හිඳ බුදුවන්නේ යයි පළමු දාන පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කරගත් සේක.

එබැවින් කියන ලදී.

බුද්ධත්වය සිදුකරන ධර්ම, බුද්ධකාරක ධර්මනම් දාන පාරමිතාදි
දශ ධර්මයි. සොයන්නෙමි. පරීක්ෂා කරන්නෙමි.
දෙව්ලොව මනුලොව සරස දිසා විදිසාවල සොයන්නෙමි.
ස්වභාවධර්මයන්ගේ රුත් අරුත් පැවැත්ම කොතැන්හි ඒ තැන්වල
සොයන්නෙමි.

පුරාණ බෝසතුන් විසින් ඇසුරු කළ පුරුදු කළ
පළමු දාන පාරමිතාව සොයන්නේ දුටුවෙමි.

ඉදින් බෝමුලට පැමිණ අනුත්තර සම්බෝධියට පැමිණීමට
කැමැත්තෙහි නම්, ප්‍රථම දාන පාරමිතාවට යව, ප්‍රථම දාන
පාරමිතාව දැඩිකොට ගනුව.

යම් කිසිවකු විසින් දිය පුරවන ලද කළය මුව යටට හරවන
ලද්දේද, එයින් නිරවශේෂයෙන් දිය වැගිරෙයිද,

එසේ පහත් මධ්‍යම උසස් යාචකයන් දැක, යටට හැරවූ
කළය මෙන් තමහට නොතබා සියළු ධනය පරිත්‍යාග කරන්න.

ඉක්බිති ඔහුට බුද්ධකාරක ධර්මයන් පවතින්නේ මෙපමණක් නොවිය හැකිය. මතුමත්තෙහි සලකා බලන්නේ දෙවෙනි සීල පාරමිතාව දැක මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය, නුඹ මෙතැන්පටන් සීල පාරමිතාවද පුරනු මැනවි. යම්සේ සෙමෙර මුවා තම ජීවිතය ගැනද නොබලා තමන්ගේ වාලධිය රක්නාක් මෙන්, නුඹද මෙතැන් පටන් ජීවිතය ගැන නොබලා සීලයම රකිමින් බුදු වෙමියි, දෙවෙනි සීල පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක.

එහෙයින් කියන ලදී.

බුද්ධකාරක ධර්මයන් මෙපමණක් නොවිය යුතුයි.
සර්වඥතා ඥානය මෝරවන මාර්ගය පෙන්වන, අනෙක් ධර්මයක් ගැනද සොයා බලන්නෙමි.

මෙසේ සොයන්නේ පෙර මහර්ෂීන් විසින් ඇසුරු කළ මෙන්ම බහුල කළ දෙවැනි වූ සීල පාරමිතාව දුටුයේය.

බෝමැඩට පැමිණ අනුත්තර සම්බෝධියට පැමිණීමට කැමැත්තෙහි නම්, මේ දෙවැනි වූ සීල පාරමිතාවට යව, දැඩිකොට සමාදන් වව.

සෙමරා සිය වල්ගය ගස්වැල් කටු ආදී කිසිවක පැටලුණු විට වලග කඩාගෙන නොයයි ද, එහිම මරණයට පත්වෙයි ද, මෙසේ වලිගය ආරක්ෂා කරන සෙමරා මෙන් සීලය ආරක්ෂා කළ යුතුය.

සතර ස්ථානයෙක්හි බෙදන ලද සීලය හැමකල්හි, වල්ගය රක්නා සෙමරෙකු මෙන්, රකින්න.

ඉක්බිති බුද්ධකාරක ධර්මයන් මෙපමණවත් නොවේයයි මත්තෙහිද සළකා බලන ඔහුට තෙවෙනි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවද දැක, මෙබඳු අදහසක් පහළවිය. සුමේධ පණ්ඩිතය නුඹ, මෙතැන් පටන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවද පුරනු මැනවි. යම්සේ චිරාත් කාලයක් බන්ධනාගාරයේ වසන්නා වූ පුරුෂයාද එයට සෙනෙහස නොකරයි. තවද එහි කළකිරුණේ

එහි වාසය කිරීමට අකමැති වෙයි. එපරිදි නුඹද, සියළුම භවයන් බන්ධනාගාරය හා සමානකොට සියළු භවයන්හි කළකිරී, මිදෙනු කැමැත්තේ වෙයිද නෛෂ්ක්‍රම්‍යාභිමුඛ වෙව. මෙසේ බුදුවන්නෙහි යයි තෙවෙනි නෙක්ඛම්ම පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළේය.

එහෙයින් කියන ලදී :-

බුද්ධකාරක ධර්මයන් මෙපමණක් නොවන්නේය.
මාර්ගය මෝරවන සර්වඥතාඥානය මෝරවන ධර්මයක් ඇත්නම්
අන්‍ය වූ එයද සොයන්නෙමි.

"එකල මෙසේ සොයා බලන්නේ තෙවෙනි නෙක්ඛම්ම පාරමිතාව
දුටුවෙමි. එය පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින්ද සෙවුනා ලද
මෙන්ම පුරුදු කළ ධර්මයක් වේ."

"මේ ඔබ තෙවෙනි පාරමිතාව දැඩිකොට සමාදන් වන්න.
ඉදින් බෝධියට පැමිණ අනුත්තර සම්බෝධිය කැමැත්තෙහි නම්
නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව වෙතද ගමන් කරන්න."

"යම්සේ දම්වැලකින් ගැටගසා ඇති පුරුෂයකු හෝ බන්ධනාගාර
ගතවූවෙකු චිරාත් කාලයක් දුකින් කල්ගෙවයිද? එහිදී එතැන
සෙනෙහස නොහටගනියි. මිදීම ම සොයා බලයි.
මුත්තියම සොයයි.

"එපරිදි සියළු භවයන් සිරමැදුරු මෙන් බලව.
භවයෙන් මිදීම පිණිස නික්මීම පිණිස අභිමුඛ වෙව.

ඉක්බිති ඔහු මෙපමණකින් බුද්ධකාරක ධර්ම අවසන් නොවිය යුතුය. තවත් කරුණු ඇතැයි සළකනු ලබන්නේ සතරවෙනි වූ ප්‍රඥා පාරමිතාව දැක මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය, ඔබ මෙතැන් පටන් ප්‍රඥා පාරමිතාව ද පුරනු මැනවි. හීන, මධ්‍යම උත්කෘෂ්ට වශයෙන් කිසිවකු නොබලා, සියළුම පණ්ඩිතයන් වෙත එළඹ ප්‍රශ්න විචාරන්නෙහිය. යම්සේ පිණ්ඩපාතික භික්ෂුවක් හීනාදී භේදකුල අතර විශේෂකම් කිසිවක් නොසළකා අනුපිළිවෙලින් පිඬු පිණිස හැසිරෙන්නේ

වහාම යැපිය යුතු ප්‍රමාණය ලබයි. එපරිදි නුඹද, සියළුම පණ්ඩිතයන් වෙත සමීප වී ප්‍රශ්න අසන්නාහු බුදුවන්නේ යයි සතරවෙනි ප්‍රඥා පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක.

එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම මෙවිතරක්ම නොවිය යුතු
යම් බෝධිය පිණිස ඉවහල්වන විශේෂ ධර්මතාවයක්
වෙතොත් අන්‍ය වූ ඒ සියල්ල පරික්ෂා කරන්නෙමි.

"පෙර බුදුවරුන් විසින් ද සේවනය කරන ලද සතරවෙනි වූ
ප්‍රඥා පාරමිතාව, එසේ පරික්ෂා කරනවිට දුටුවෙමි.

"මේ නුඹ සතරවෙනි වූ පාරමිතාව දැඩිකොට සමාදන් වන්න.
ඉදින් බෝධියට පැමිණ අනුත්තර සම්බෝධිය කැමැත්තෙහි නම්
ප්‍රඥා පාරමිතාව වෙතටද ගමන් කරන්න.

"යම්සේ භික්ෂුවක් පිඬු සිඟා යන්නේ හීන, මධ්‍යම, උසස්
සියළු කුල වර්ජනය නොකරන්නා සේ මෙසේ යැපීම් ප්‍රමාණයට
ආහාර ලබන පරිද්දෙනි."

"එපරිදි ඔබ සියලුකල්හි විද්වත් ජනතාව ඇසුරු කරන්නේ
ප්‍රඥා පාරමිතාව වෙත ගොස් සම්බෝධියට පැමිණෙන්නෙහිය.

ඉක්බිති ඔහු බුද්ධකාරක ධර්ම මෙවිතරක්ම නොවේ. තවත්, බුද්ධකාරක ධර්මයන් ඇති බව සළකන්නේ පස්වෙනි වූ වීර්ය පාරමිතාව දැක, මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය නුඹ; මෙතැන් පටන් වීර්ය පාරමිතාව පුරන්නෙහිය. යම්සේ සිංහ සිවුපාරාජයා, සියලු ඉරියව්වල දැඩි වීර්යයෙන් යුක්ත සේ, නුඹද සියලු භවවල සියළුම ඉරියව්වල, දැඩි වීර්යයෙන් යුතු වූයේ, ලෝකෝත්තර වීර්යයෙන් සමාන වූ බුදුවන්නෙහි යයි, පස්වෙනි වීර්ය පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක. එහෙයින් කියන ලදී.

"මෙපමණකින් බුද්ධකාරක ධර්ම නිමා නොවන්නේය.
තවදුරටත් පරීක්ෂා කරන්නෙමි, යම්බඳු බුද්ධකාරක ධර්ම
පිරිය යුතුද යන වග.

"එකල වැඩිදුරටත් පරීක්ෂා කරන්නේ පස්වෙනි වීර්ය පාරමිතාව
දුටුවෙමි. එයද පෙර මහර්ෂි වූ උතුමන් විසින් සේවනය කළ,
පුරුදු කළ ධර්මයකි."

"මේ නුඹ පස්වෙනිවූ පාරමිතාව දැඩිකොට සමාදන් වෙව.
ඉදින් බෝමැඩදී සම්බෝධිය ලබනු කැමැති නම්, වීර්ය පාරමිතාවද
පුරුදු කරන්න.

යම්සේ මෘගරාජයන් වූ සිංහරාජයා සියලු භවයන්හි සියලු ඉරියව්වල
නොපසුබට වීර්යය ඇතිවම ක්‍රියා කරන්නේද එසේ සැමදා එසවූ
මනසින් යුතුව අලෞකික වීර්යයෙන් යුක්ත වව;

"එසේම නුඹ සියලු අවස්ථාවන්හිදී භවයන්හිදී එසවූ වීර්යයෙන්
යුතු වෙව. වීර්ය පාරමිතාව මැනවින් පුරා සම්බෝධියට
පැමිණෙන්නෙහිය.

ඉක්බිති ඔහුට බුද්ධකාරක ධර්මයන් මෙපමණ නොවේයයි
වැටහුණේ, තවත් ඇතැයි සළකනු ලබන කල, සවෙනි වූ, ක්ෂාන්ති
පාරමිතාව දැක, මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය, නුඹ
මෙතැන් පටන් ක්ෂාන්ති පාරමිතාව පුරනු මැනවි. සම්මානයෙහිද,
අවමානයෙහිද, ඉවසන්නෙක්ම වන්න. යම්සේ මහපොළොව, පිරිසිදු
දේද, අපිරිසිදු දේද බහාලත්ද ඒ නිසා පොළොව ස්නේහත් නොකරයි.
වෛරද නොකරයි. ක්ෂමාව දෙයි. ඉවසයි. මැනවින් ඉවසයි. එපරිදි ඔබද
සම්මානනයේද, අවමානනයේද, සමාන ඉවසීම් ඇතියෙක්ව බුදුවන්නෙහි
යයි සයවෙනි ක්ෂාන්ති පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක.
එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම මෙපමණක් නොවන්නේය.
යම්බඳු සම්බෝධියට පැමිණෙන පිණිස ඉවහල්වන අනෙක්
ධර්මයක්ද සොයන්නෙමි."

"එසේ එදා සොයා බලන්නේ, පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින් සේවනය කරන ලද සයවෙනි වූ ක්ෂාන්ති පාරමිතාව ද දුටුවෙමි."

"මේ නුඹ සවෙනි පාරමිතාව දැඩිකොට සමාදන් වෙව.
මම බුදුවන්නෙමැයි ඒකාන්ත මනසින් යුක්තව සම්බෝධියට පැමිණෙන්නෙහි"

"යම්සේ පොළොව සර්ප-බලු-මිනිස් කුණප මළමුත්‍ර කෙළ-සොටු ආදී අපවිත්‍ර දේවල් ද, සඳුන්-කොකුම්-සුවඳ මල් ආදී පිරිසිදු දේවල්ද, ඉවසයි. ක්‍රෝධයක් නොකොට ක්ෂමා කරයි."

"එසේම ඔබද සියළු සම්මාන-අවමාන ඉවසන්න.
ක්ෂාන්ති පාරමිතාවට ගොස් ක්ෂාන්ති පාරමිතාව පුරා සම්බෝධියට පැමිණෙන්නෙහි"

ඉක්බිති ඔහු, බුද්ධකාරක ධර්මයන් මෙවිතරක් නොවේ. තවත් ඇතැයි සළකනු ලබන්නේ සත්වෙනි වූ සත්‍ය පාරමිතාව දැක, මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය! නුඹ, මෙතැන් පටන් සත්‍ය පාරමිතාවද පුරන්නෙහිය. හිස්මුදුනේ හෙණ වැටෙන නමුදු, ධන සම්පත් පිණිසද, ඡන්දාදී වශයෙන් දැන දැන බොරු නොකියව, යම්සේ ඕෂධී තාරකාව සියළු ඍතුවල තමන්ගේ ගමන්මග අතහැර අනෙක් වීථියක නොයන්නේද, සිය වීථියේම ගමන් කරයිද, එපරිදි ඔබද, සත්‍යය හැර මුසාවාද නම් නොකියන්නේමය. සත්‍යවාදීව බුදු වන්නෙහි යයි, සත්වෙනි සත්‍ය පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක. එහෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්මයෝ මෙපමණකැයි නොසිතන්නේය.
බෝමැඩට පැමිණ සම්බෝධිය අවබෝධ කිරීම සඳහා අනෙක් වූ යම් බෝධි කාරක ධර්ම ඇද්ද එයද සොයන්නෙමි."

"එකල එසේ පරීක්ෂා කරන්නෙමි, පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින් සෙවුනා ලද පුරුදු කරන ලද සත්‍ය පාරමිතාව දුටුවෙමි.

"මේ ඔබ, සත්වෙනි වූ පාරමිතාවද දැඩිකොට සමාදන් වේවා.
එහි අවෙරී වචන ඇත්තේ සම්බෝධියට පැමිණෙන්නෙහි."

"යම්සේ ඔසධී නම් තාරකාව, සදේවක ලෝකයෙහි සමාන වූයේ ඍතු සමය එළඹි කල්හිද ගමන්මග නොඉක්මවා නොයන්නේය. එකම මග යන්නේය."

"එපරිදි නුඹද, සත්‍යතා ධර්මවල ගමන්මග නොඉක්මවව. සත්‍යය පාරමිතාවට ගොස් සම්බෝධියට පැමිණෙන්නෙහිය.

ඉක්බිති ඔහු බුද්ධකාරක ධර්මයන් මෙපමණ නොවිය යුතුයයිද, තවත් ඇතැයි සළකනු ලබන්නේ, අටවෙනි වූ අධිෂ්ඨාන පාරමිතාව දැක මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය; නුඹ මෙතැන් පටන් අධිෂ්ඨාන පාරමිතාව පුරන්නෙහිය. යම් අධිෂ්ඨානයක් වේද, ඒ අධිෂ්ඨානයේ නිශ්චල විය යුතුය. යම්සේ පර්වතය නම්, සියලු දිශාවල වාතය හමායන කල්හි කම්පා නොවේ. නොසෙල්වේ. තමන්ගේ තැනෙහිම සිටියි. එපරිදි ඔබද, තමන්ගේ අධිෂ්ඨානයේ නිශ්චලව හුන්නේම බුදුවන්නෙහිය, අටවෙනි අධිෂ්ඨාන පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළේය. එබැවින් කියන ලදී :-

"බුද්ධකාරක ධර්ම මෙපමණකින් නිම නොවන්නේය. අන්‍ය වූද පරීක්ෂා කරන්නෙමි, බෝමැඩ සිට සම්බුද්ධත්ව අවබෝධ කිරීම සඳහා අනෙක් බුද්ධකාරක ධර්මද පරීක්ෂා කරන්නෙමි."

"එකල පරීක්ෂා කරන්නේ පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින් සේවනය කරන ලද පුරුදු කරන ලද අටවෙනි අධිෂ්ඨාන පාරමිතාව දුටුවෙමි."

"නුඹ මේ අටවෙනි පාරමිතාව දැඩිකොට සමාදන් වෙන්න. එහිදී නුඹ නොසෙල්වී සිට සම්බෝධියට පැමිණෙන්නෙහි."

"යම්සේ මැනවින් පිහිටි ශෛල පර්වතය නොසෙල්වේද, දැඩි සුළඟකින්ද එය සිය තැනම පිහිටා සිටියි. නොසෙල්වෙයි."

"එසේම ඔබද, සැමදා අධිෂ්ඨානයේ අචල වන්න. අධිෂ්ඨාන පාරමිතාවට ගොස් සම්බෝධියට පැමිණෙන්නෙහිය."

ඉක්බිති ඔහු බුද්ධකාරක ධර්මයන් මෙපමණක් නොවිය යුතුයයිද, තවත් ඇතැයි සළකා බලනවිට නවවෙනි වූ මෛත්‍රී පාරමිතාව දැක මෙබඳු අදහසක් පහළවිය. සුමේධ පණ්ඩිතය, නුඹ මෙතැන් පටන් මෛත්‍රී පාරමිතාවද පුරව. හිතයන් කෙරෙහිද අහිතයන් කෙරෙහිද එකම යන ඇත්තක් වන්. යම්සේ ජලය නම්, පාපී ජනයාටද යහපත් ජනයාටද සිසිල් බව එක සමානකොට පතුරුවයි. එපරිදි ඔබද සියලු සතුන් කෙරෙහි මෛත්‍රී සිතින් එක්සිත්ව කටයුතු කරන්නේ බුදුබව ලබන්නෙහි යයි නවවන මෛත්‍රී පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළ සේක.

එසේ හෙයින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම මෙතුවක්ම නොවෙතැයි මතුද පරීක්ෂා කරන්නේ
බෝධි ධර්මතා පිළිබඳ ඉවහල්වන අනෙකක්ද සොයන්නෙමි."

"එකල පරීක්ෂා කරන්නේ පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින්
සේවනය කරන ලද, පුරුදු කරන ලද නවවෙනි වූ
මෛත්‍රී පාරමිතාව දුටුවෙමි."

"මේ නුඹ නවවෙනි පාරමිතාව දැඩිකොට සමාදන් වෙව.
ඉදින් බෝධිය කැමැත්තෙහි නම්, මෛත්‍රිය දියුණු කරව."

"යම්සේ ජලය යහපත් අයහපත් ජනතාවට සමසේ
රජස් මලස් ශීතල එකසේ පතුරුවයිද, ගලාබසියි."

"එපරිදි ඔබද හිතයන් අහිතයන් සැමට සමසේ මෛත්‍රියෙහි
පිහිටවන්න. මෛත්‍රී පාරමිතාව දියුණුකොට සම්බෝධියට
පැමිණෙන්නෙහිය."

ඉක්බිති ඔහුට බුද්ධකාරක ධර්ම මෙතුවක්ම නොවිය යුතුයි, තවත් ඇතැයි සළකා බලන කල්හි දසවෙනි උපේක්ෂා පාරමිතාව දැක, මෙබඳු අදහසක් පහළ විය. සුමේධ පණ්ඩිතය, නුඹ මෙතැන් පටන් උපේක්ෂා පාරමිතාවද පුරන්න. සැපේද, දුකේද මැදහත් වන්න. යම්සේ පොළොව නම් පිරිසිදු වූද, අපිරිසිදු වූද දේ හෙළනු ලබන්නේ මධ්‍යස්ථ බවට පත්වෙයි. එපරිදි ඔබද සැපේදී දුකේදී මධ්‍යස්ථ වී හුන්නේ බුදුවන්නෙහි යයි දසවෙනි උපේක්ෂා පාරමිතාව දැඩිකොට අධිෂ්ඨාන කළේය.

එබැවින් කියන ලදී.

"බුද්ධකාරක ධර්ම මෙපමණකැයි නොවන්නේය.
බෝධිය පිණිස ඉවහල්වන අනෙකක්ද සොයන්නෙමි."

"එකල පරීක්ෂා කරන්නේ පෙර මහර්ෂි වූ බුදුවරුන් විසින්ද
සෙවුනා ලද පුරුදු කරන දසවෙනි උපේක්ෂා පාරමිතාව
දුටුවෙමි."

"මේ ඔබ දසවෙනි පාරමිතාව දැඩිකොට සමාදන් වෙව.
සමානකොට දැඩිවී, සම්බෝධියට පැමිණෙන්නෙහි."

"යම්සේ පොළොව නම් හෙළනු ලබන පිරිසිදු-අපිරිසිදු
සියල්ල උපේක්ෂාවෙන් ඉවසයි ද, ඒ දෙපක්ෂය පිළිබඳවම
කෝපවීමක් නොමැත්තෙහිද, එමෙන්ම වෛරය හෝ අනුරාගය
නැතිව, උපේක්ෂාවෙන් යුක්ත වව."

"එපරිදි ඔබ සදාකල් සැප-දුක දෙකේ සමාන වන්න.
උපේක්ෂා පාරමිතාවට ගොස් මධ්‍යස්ථ වෙමින් සම්බෝධියට
පැමිණෙන්නෙහි යනුවෙනි.

ඉක්බිති මෙසේ සිතීය. මේ ලෝකයෙහි බෝධිසත්වවරුන් විසින් පිරිය යුතු බෝධි මුහුකුරු වන ධර්මයෝ වූ බුද්ධකාරක ධර්මයෝ මෙපමණෙක්මය. දස පාරමී හැර අන් දෙයක් නැත. මේ දසපාරමිතාද, උඩ ආකාශයේද නැත. යට පොළොවේද නැත. පෙරදිග දිශාවලද නැත. මගේම හෘදය අභ්‍යන්තරයේම පිහිටියේය. මෙසේ තමන්ගේ හදවතේ පිහිටි බව දැක සියල්ලම දැඩිකොට අධිෂ්ඨාන කොට නැවත නැවත මෙනෙහි කරන්නේ අනුලෝම-ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළහ. කෙළවරින් ගෙන මුලින් තබයි. මුලින්ගෙන අගින් තබයි. මැදින් ගෙන දෙකෙළවර ඔසවා තබයි. දෙකෙළවරින් ගෙන මැදට තබා ඔසවයි. බාහිර වස්තු පරිත්‍යාගය, දාන පාරමිතාව නම් වේ. අංග පරිත්‍යාගය දාන උපපාරමී නම් වේ. ජීවිත පරිත්‍යාගය පරමාර්ථ පාරමී නම් වේ යයි දස පාරමී, දස උපපාරමී, දස පරමත්ථ පාරමිතා යයි සමත්‍රිංශත් පාරමී යුගල කාලයක් වෙන් කරන්නාක් මෙන් සිහි කරද්දී යම්බඳු මහාමේරු පර්වතය

දණ්ඩක් කොටගෙන, චක්‍රවාට මහා සමුද්‍රය කළඹන්නාක් මෙන්ද, පරාමර්ශනය කළේය. ඒ දස පාරමිතාවෝ පරාමර්ශන කරත් කරත්ම හේම ධර්ම තේජසින්, සිවු අතුවක් අධික යොදුන් දෙලක්ෂයක් ඝනකම ඇති මේ මහපොළොව ඇතකු විසින් මඩින ලද බටනලයක් මෙන් පෙළනු ලබන්නේ. උක් යන්ත්‍රයක් මෙන්ද, මහාහඬ නංවමින් කම්පා විය. දැඩිව කම්පා විය. ප්‍රකම්පා විය. කුඹල්කරුගේ කුඹල් සකක් මෙන්ද, තෙල් යන්ත්‍රයක් මෙන්ද කරකැවුණේය. එසේ හෙයින් කියන ලදී.

"මේ ලෝකයේ බෝධි පාක්ෂික ධර්මයන් මෙපමණක්ද,
වැඩි අඩුවකත් නොවේද ඒ පාරමී ධර්මවල දැඩිසේ පිහිටියහ."

"ස්වභාව ලක්ෂණ සහිත වූ මේ ධර්මය නිවැරදි සිහියෙන්
සිහිකරන්නේ පාරමී පරිචය ඤාණ, තේජසින් දසදහසක් මහපොළව
කම්පා කරවීය."

"තෙරපන ලද උක් යන්ත්‍රයකින් පෙළනා සේ මේ පෘථිවිය
චක්‍රාකාරව කම්පා විය. නාදවිය. තෙල් මඩින යන්ත්‍රයේ රෝදය
කරකැවෙන්නාක් මෙන් මෙසේ මහපොළොව කම්පා විය."

මහපොළොව කම්පාවන කල්හි රම්ම නගරවාසීන්ට සිටීමට නොහැකිව යුගාන්ත වාතයෙන් කම්පාවන මහා ශාල වෘක්ෂයක් මෙන් සිහිමුළා වී බිම වැටුණාහ. කළ ආදියද මැටි භාජනද එකට ගැටී ඔවුනොවුන් පහරදෙමින් සුණුවිසුණු බවට පත්වූහ. මහජනයා බියට හා තැති ගැනීමට පත්ව, ශාස්තෘන් වහන්සේ වෙත සපැමිණ, කුමක්ද භාග්‍යවතුන් වහන්ස, මේ නාගාවර්තයක්ද? භූත යක්ෂ දේවතාවන් සම්බන්ධ වෙනත් විපත් සුළියක්ද? අපි මේ කිමෙක්දැයි නොදනිමු. තවද මේ සියළු මහජනයා උපද්‍රවයට පත්වූවෝ මේ ලෝකයාගේ පාපකර්මයක් වන්නේ ද? නැතහොත් යහපතක්ද? අපට මේ කාරණාව වදාරනු මැනවි යයි කීවේය. ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ කථාව අසා, නුඹලා බිය නොවව්! නොසිතවු! තොපට මේ හේතුකොට ගෙන බියක් නැත. යමක් මා විසින් අද සුමේධ පණ්ඩිතයන් අමතා අනාගතයේ ගෞතම නමින් බුදුවන්නේ යයි ප්‍රකාශ කරන ලද්දේ ද, හෙතම දැන් පාරමිතා ධර්ම සිහිපත් කරයි. ඒ පාරමිතා සිහිපත් කරන්නහුගේ කම්පා වීමෙන් ධර්ම තේජසින් සියලු දස දහසක් ලෝකධාතු එක් පහරින් කම්පා වෙයි. එසේම නාදකරයි, යනුවෙන් වදාළේය. එබැවින් කියන ලදී.

ඒ බුදුරජුන් වළඳන තැන යම් පිරිසක් සිටියේද, ඒ පිරිස කම්පා වන්නාහු මූර්ඡා වී බිම වැටුණහ.

කළ හා මැටි භාණ්ඩ සිය ගණනක් එකිනෙක ගැටුනේ, කුඩු වී ගියේය.

උත්‍රාසයට පත් හද ඇත්තාහු, මහජනයා එක්රැස්ව දිවකුරු බුදුන් වෙත පැමිණියාහුයි.
ලෝකයට කුමක් වන්නේද, යහපතක් වන්නේද අයහපතක් වන්නේද, පසැසකින් චක්ෂුර්මත් වූ, බුදුන් වහන්සේ ලෝකයේ සියලු උපද්‍රවයන් හා බිය පහකෙරේවා.

එදා ඒ මහජනයා දීපංකර මහා මුනීන්ද්‍රයන් වෙත මෙසේ දැන්වූහ. විස්වස් සිත් ඇත්තාහු තෙපි මේ පෘථිවි කම්පාව කෙරෙහි බිය නොවෙව.

මම අද අනාගතයේදී මේ ලෝකයෙහි බුදුවන්නේ යයි (සුමේධ තාපසයන්ට) විවරණ දුන්නේද, හෙතෙමේ පෙර බුදුවරුන් විසින් සේවනය කරන ලද බුද්ධකාරක ධර්ම සිහි කරන්නේය.

බුද්ධ භූමියට පමුණුවන්නා වූ ඒ ධර්ම සිහි කරන්නේ ඒ හේතුවෙන් දසසහස්සී සදේවක ලෝකය කම්පිත වූයේය.

මහජනයා තථාගතයන්ගේ වචන අසා තුටුපහටු වූයේ මල් සුවඳදුම් විලේපන රැගෙන රම්‍ය නගරයෙන් නික්ම බෝසතුන් වෙත එළඹ මල් ආදියෙන් පුදා, වැඳ, ප්‍රදක්ෂිණාකොට, රම්ම නගරයට පිවිසියේය. බෝධිසත්වයෝද දසපාරමී මෙනෙහිකොට, උත්සාහය දැඩිකොට අධිෂ්ඨාන සහිතව හිඳී අසුනින් නැගිට්ටේය.

එබැවින් කියන ලදී.

බුදුන් වහන්සේගේ වචනය අසා, උද්වේගයට පත් මහාජනයාගේ සිත් නිවී ගියේය. සියල්ලෝම එළඹ නැවත බුදුන් නමස්කාර කළහ.

බුද්ධ ගුණය මනාව ගෙන සමාදන්ව ශ්‍රද්ධාවෙන් මනස දැඩිකොට
දිවකුරු බුදුන් වහන්සේ වැඳ හුන් ආසනවලින් නැගිට්ටහ.

ඉක්බිති බෝසතුන් අසුනින් නැගිටින කල්හි සියලු දසදහසක් සක්වල දේවතාවෝ රැස්ව දිව්‍යමල් සුවඳාදියෙන් පුදා, ආර්ය සුමේධ තාපසය; ඔබ විසින් අද දීපංකර බුදුරදුන්ගේ පාමුල මහත් වූ ප්‍රාර්ථනාවක් පැතීය. ඔබට අනතුරක් නොමැතිව එය සමෘද්ධ වේවා! ඔබට බියක් හෝ තැති ගැනීමක් හෝ නොවේවා! ශරීරයේ අල්පමාත්‍ර රෝගයකුදු නූපදීවා! වහාම පාරමිතා පුරා සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගනුව. යම්සේ මල් හා ගෙඩි හටගන්නා ගසක් අදාළ කාලයේ මල්වලින් හා ගෙඩිවලින් සමෘද්ධ වේද එපරිදි ඔබද, ඒ කාලය නොඉක්මවා වහාම සම්මා සම්බෝධිය අවබෝධ කරගනුව ආදී වශයෙන්

දෙවියෝ දිවකුසුම්ද මිනිස්සු මිනිසුන්ගේ කුසුම්ද අසුනින්
නැගිටින්නා වූ තවුසන් මත විසිරවූහ.

දෙව් මිනිස්සු ඔබ සුවපත් වේවායි නිවේදනය කළහ.
ඔබ විසින් මහත් කරුණක් ප්‍රාර්ථනය කරන ලදී. පැතූ අයුරින්ම එය ලබනු මැනවි.

සියලු උපද්‍රව නොවේවා! ශෝක ද රෝග ද විනාශ වේවා! අනතුරු නොවේවා. සර්වඥතා ඥානය පැමිණෙනු ලැබේවා!

මල් පිපෙන කාලය පැමිණි කල්හි (මල්) පිපෙන ගස් මෙන් මහාවීරය! ඔබද සුදුසු කල්හි අටලොස් බුදු නුවණින් පිපේවා.

යම්සේ පෙර බුදුවරයෝ යම්කිසි දස පාරමිතාවක් පුරන ලද්දාහුද, මහාවීරය ඔබද ඒ දසපාරමී සපුරාලනු මැනව.

යම්සේ පෙර බුදුවරයෝ බෝමැඩදී සම්මා සම්බුද්ධත්වය අවබෝධ කළේද, මහාවීරය ඔබද ඒ පරිද්දෙන්ම බුදුවරයන් වහන්සේලාගේ බෝධියෙහි බුද්ධත්වය අවබෝධ කළ මැනව.

පෙර බුදුවරයෝ යම්සේ ධර්මචක්‍රය බබළයිද, එසේම ඔබද සම්පූර්ණයෙන්ම පිරුණු මනදොළ ඇතිව දසසහශ්‍රී ලෝකධාතුව බබළාවා.

රාහුගෙන් ද වළාකුළුවලින් ද මිදුණු සූර්යයා ප්‍රතාපයෙන් ආලෝකයෙන්, මුලුලොව බබළවයිද, එසේම ලෝකය මුදවා බුද්ධශ්‍රීයෙන් බබළනු මැනව.

යම්සේ නදීහු නොනැවතී මහා සමුද්‍රය වෙත ගලා යද්ද, එසේම දෙවියන් සහිත ලෝවැස්සෝ ඔබවහන්සේ වෙත එළඹෙත්වා!

එකල්හි දෙවියන් විසින් ස්තුති කරන ලද්දේ දිවකුරු බුදුන් පසසන ලද්දේ, බුද්ධකාරක දස ධර්මයන් සමාදන්ව ඒ ධර්මයෙහි නියැලෙනු සඳහා සම්පූර්ණ කිරීම සඳහා මහා වනයට පිවිසියේය.

සුමේධ කථාව නිමියේය.

නිදාන කථා

රම්ම නගරවාසීහු නගරයට පිවිස බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් දුන්හ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට දහම් දෙසා, මහජනයා සරණ ගිලාදියෙහි පිහිටුවා රම්ම නගරයෙන් නික්ම අනතුරුව, උඩත් පිරිසෙයින් සම්පූර්ණ ආයු කාලයෙහි වැඩවෙසෙමින් සියලු බුදුකිස නිමවා, අනුපිළිවෙළින් අනුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක. එහි යම් කිවයුතු දෙයක් ඇද්ද? ඒ සියල්ල බුද්ධවංසයෙහි කියන ලද ආකාරයෙන් විස්තර දත යුතුයි. එහි මෙසේද කියන ලදී.

එකල්හි රඹගම් නුවරවැසියෝ සංඝයා සහිත ලෝකනායකයන් වළඳවා ඒ දීපංකර බුදුන් වහන්සේගේ සරණ ගියාහුය.

තථාගතයන් වහන්සේ කිසිවෙකු සරණගමනයෙහිද, සමහරෙකු පන්සිල්හිද සමහරෙකු දසසිල්හිද පිහිටවූහ.

කිසිවෙකුට උතුම් සතර ශ්‍රමණඵලද, කිසිවෙකුට අසම පිළිසිඹියා දහම් ද දුන්හ.

නරාසභයන් වහන්සේ කිසිවෙකුට උතුම් සමාපත්තියද, කිසිවෙකුට ත්‍රිවිද්‍යාවන්ද ෂට් අභිඥාවන්ද දුන්හ.

ඒ මහා මුනීන්ද්‍රයන් වහන්සේ එහිදී මහාජනයාට අවවාද දුන් සේක. එහෙයින් දීපංකර බුද්ධ ශාසනය පුළුල් ලෙස පැතිර ගියේය.

දීපංකර බුදුන් වහන්සේ බොහෝ දෙනකු සසරින් එතෙර කොට දුගතියෙන් මිදවූහ.

ඒ මහා මුනීන්ද්‍රයන් වහන්සේ සිව්සස් අවබෝධයට වාසනා ඇති ජනයා දැක යොදුන් සිය දහස් ගණන් වැඩමවා සිව්සස් අවබෝධ කරවූ සේක.

බුදු තෙමේ ප්‍රථමාභිසමයේදී කෝටි සියයක් ජනතාවට ද,

දෙවන අභිසමයේදී සියක් දහසකටද ධර්මය අවබෝධ කරවීය.

බුදුහු දේව භවනයෙහි දී ධර්මය දේශනාකොට නවකෙළ දහසක් දෙනාට ධර්මය අවබෝධ කරවීය. ඒ තුන්වන අභිසමය විය.

දීපංකර බුදුන්වහන්සේට සමූහ රැස්කරවීම් තුනක් වූයේය. පළමු සමාගමයෙහි කෙළ ලක්ෂයක් විය.

නාරද පව්වෙහි විවේකීව සිටි සමයේ කෝටි සියයක් කෙලෙස් දුරුකොට රහත් බවට පැමිණ රැස්වූහ.

බුදුන් වහන්සේ සුදස්සන පව්වෙහි (සුදර්ශනාරාමයේ) වසන සමයේ වස් පවාරණයේදී අනූකෝටි දහසක් ධර්මාභිසමය ලත්හ.

මම ඒ කාලයෙහි උග්‍ර වූ තවුස්ධර්ම ඇති ජටිලයෙක් වීමි. පංච අභිඥාවන්ගෙන් පරතෙරට ගිය අහස්හි සැරිසරන්නෙක් වූයෙමි.

දස දහසක් විසිදහස් වශයෙන් අසංඛ්‍ය ගණනාවක් (මේ බුද්ධ ශාසනයේදී) චතුරාර්ය සත්‍යය අවබෝධ කළහ.

මනාව සංවිධානය කරන ලද, බොහෝදෙනා අතර පැතුරුණු මහා සම්පත් ඇති දීපංකර බුද්ධශාසනය ඉතාමත් ශෝභා සම්පන්න විය.

මහර්ධී වූ, ෂඩ් අභිඥාලාභී සාර ලක්ෂයක් මහරහතන් වහන්සේලා දීපංකර බුදුන්ගේ පිරිවර වශයෙන් නිරන්තරයෙන් සිටියහ.

එසමයෙහි අධිගමයකට නොපැමිණ මිනිස්බව අත්හරින යමෙක් විද, ඔහු ගර්භාවට පාත්‍ර විය.

එකල්හි ක්ෂීණාශ්‍රව වූ නිර්මල වූ රහතන් වහන්සේලා බුද්ධවචනය උගෙන දෙවියන් සහිත ලෝකයෙහි මනාව පිපුණු මල් මෙන් බබළත්.

දීපංකර ශාස්තෘන් උපන් නගරය රම්මවතී නම් විය.
පියා සුදේව නම් වූ ක්ෂත්‍රිය රජුය. සුමේධා බිසව මව වූවාය.

සුමංගල, තිස්ස දෙනම දීපංකර ශාස්තෘන්ගේ අග්‍ර ශ්‍රාවකයෝ වූහ.
සාගර තෙරුන් උපස්ථායක විය.

නන්දා ද සුනන්දා ද අග්‍රශ්‍රාවිකාවෝ වූහ. පළොල් ගස
උන්වහන්සේගේ බෝධිය විය.

අසූරියන් උස ඇති දීපංකර බුදුන් වහන්සේ මුල පටන් අග දක්වා
මල් පිපී බැබළෙන සල්රුකක් මෙන් බැබළීය.

ඒ මහාර්ෂීන් වහන්සේට අවුරුදු ලක්ෂයක් ආයුෂ විය. ඒ ජීවමාන
කාලය තුළ අතිවිශාල ජනකායක් සසරින් එතෙර කරවීය.

ශ්‍රී සද්ධර්මය බබළවා, දෙවියන් සහිත ලෝවැස්සන් එතෙර කරවා
ශ්‍රාවක සංඝයා සමග ගිනිකඳක් මෙන් බැබළී පිරිනිවන්පෑහ.

දීපංකර බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි අනන්ත වූ තේජස්
ඇති, අප්‍රමාණ කීර්තියෙන් යුත්, ගුණයෙන් හා තේජසින් අනූන්ට
ළංවිය නොහැකි, කොණ්ඩඤ්ඤ නම් බුදුවරයන් වහන්සේ
ලොව පහළවූ සේක.

දීපංකර භාග්‍යවතුන් වහන්සේට පසුව කාලයේ එක් අසංඛ්‍යෙයක්
ඉක්මවා, කොණ්ඩඤ්ඤ නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ විය.
උන්වහන්සේට ද ශ්‍රාවකයෝ තුන් අයුරකින් රැස්වූහ. පළමු රැස්වීමේදී
කෝටි සියක් දහසක්ද, දෙවැන්නෙහි කෝටි දහසක්ද, තෙවැන්නේ අනූ
කෝටියක්ද වූහ. එකල බෝධිසත්වයෝ විජිතාවි නම් සක්විති රජව ඉපිද,
කෝටි දසදහසක් අපමණ වූ බුදුන් ප්‍රමුඛ සංඝයාට මහදන් දුන්හ. ශාස්තෘන්
වහන්සේ බෝසතුන් බුදුවන්නේ යයි, විවරණ දී දහම් දෙසූ සේක. හෙතෙම
බුදුරදුන්ගේ බණ අසා, රාජ්‍යය පවරා දී පැවිදි විය. හෙතෙම තුන්පිටකය
උගෙන අෂ්ට සමාපත්ති, පංච අභිඥා උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන්
බ්‍රහ්මලෝකයේ උපන්නේය. රම්‍යවතී නගරයේ සුනන්ද නම් ක්ෂත්‍රිය රජු
කොණ්ඩඤ්ඤ බුදුරදුන්ගේ පියා විය. සුජාතා නම් දේවිය මවයි. භද්දා,

සුභද්දායනුවෙන් අග්‍රශ්‍රාවකයෝ දෙනමක් වූහ. උපස්ථායකයා අනුරුද්ධ නම් විය. අග්‍රශ්‍රාවිකාවෝ තිස්සා උපතිස්සා නම් වූවෝය. සල් කළණ ගස බෝධියයි. ශරීරය අසූඅටරියනක් උසවිය. වර්ෂ ලක්‍ෂයක් ආයුෂ වින්දහ.

එයින් මතුව අසංඛ්‍යයක් ඉක්මවා, එක කල්පයක බුදුවරු සතර නමක් උපන්නාහුයි. මංගල, සුමන, රේවත සහ සෝභිත යනුවෙනි.

මංගල බුදුරදුන්ට ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ඒ අතර පළමුවන සන්නිපාතයේ කෝටි සියදහසක් භික්‍ෂූහු වූහ. දෙවැන්නේ කෝටි ලක්‍ෂයක්ද, තුන්වැන්නේ අනූකෝටියක්ද විය. ඔහුගේ ඥාති සොයුරු ආනන්ද කුමරු අනූකෝටියක් පමණ පිරිස සමග ධර්මශ්‍රවණය පිණිස ශාස්තෘන් සමීපයට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ ඔහුට අනුපිළිවෙළ කථාව වදාළ සේක. හෙතම පිරිස සමග පිළිසිඹියා පත් රහත්බවට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ ඒ කුලපුත්‍රයන්ගේ පූර්ව චරිත බලන්නේ ඍද්ධිමය පාත්‍රසිවුරු ලැබෙන වාසනාව දැක, දකුණු අත දිගුකොට, මහණෙනි; මෙහි එවු! යයි වදාළ සේක. එකෙණෙහි සියල්ලෝම ඍද්ධිමය පාත්‍ර සිවුරු ඇතිව, හැටවස් පිරුණු තෙරණුන් ලෙසින් ආකල්ප සම්පන්නව වී ශාස්තෘන් වහන්සේ වැඳ පිරිවරා ගත්හ. මේ උන්වහන්සේගේ තෙවෙනි ශ්‍රාවක සන්නිපාතය විය. උන්වහන්සේටද අනෙක් බුදුවරුන් මෙන් අත් උස අසූරියනක් පමණ වූ ශරීර ප්‍රභාවක් විය. ඒ භාග්‍යවතුනට පමණක් එසේ නොවේ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීර ප්‍රභාවය නිතරම දසදහසක් ලෝකධාතුවල පැතිරී පැවතිණ. ගස්පොළොව පර්වත සමුද්‍ර යටත් පිරිසෙයින් සැළි ආදිය හටගෙන රන් පටියකින් වෙළන ලද්දේ මෙන් විය. ආයුෂ ප්‍රමාණය අවුරුදු අනූදහසක් පමණ විය. මෙපමණ කලක් සඳ-හිරු ආදියද තමන්ගේ පැහැය බැබළීමට නොහැකි වූහ. දිවා රාත්‍රී දෙක නොපෙණුනාහ. දවල් සූර්යාලෝකයෙන් මෙන් සත්වයෝ නිතර බුද්ධාලෝකයෙන්ම හැසිරුණහ. සවස පිපුණු මල් ආදියෙන්ද, උදේ කුරුල්ලන්ගේ ගීත නාදයෙන්ද වශයෙන් ලෝකය දිවා-රාත්‍රී කාල පරිච්ඡේද වශයෙන් සැලකීය. කිමෙක්ද අනෙක් බුදුවරුන් හා සසඳනවිට මෙය අසමානුභාවයක් නොවන්නේද, එසේ නොවේ. (ඔවුහු සලකමින් දසදහසක් ලෝකධාතුහුද, බෙහෙවින් ආලෝකය පැතුරුණහ.) මංගල භාග්‍යවතුන් වහන්සේගේ පෙර ප්‍රාර්ථනා වශයෙන් අනෙක් ව්‍යාම ප්‍රභාව මෙන් ශරීර ආලෝකය නිතරම දසදහසක් ලෝකධාතුවේ පැතිරී තිබුණේය.

හෙතෙම බෝධිසත්ව චර්යාව හැසිරෙන කාලයේ වෙස්සන්තර සමාන ආත්මභාවයක සිටියේ, අඹුදරුවන් සමග වංකගිරිය හා සමාන පර්වතයක වාසය කළේය. ඉක්බිති එක් ඛරදායීක නම් යක්ෂයකු මහබෝසතුන්ගේ දානාධ්‍යාශය ගැන අසා බමුණු වේශයකින් පැමිණ බෝසතුන්ගෙන් දරුවන් දෙදෙනා ඉල්ලීය. බ්‍රාහ්මණය, පුතුන් දෙමියි පවසා සතුටු වූයේ මහ මුහුදු තෙක් මහපොළොව කම්පා කරවමින් දරුවන් දෙදෙනා දුන්නේ ය. යක්ෂයා සක්මන කෙළවර එල්ලෙන පුවරුව ඇසුරු කොටගෙන සිට, බෝසතුන් බලා සිටිද්දීම නෙලුම් අලයක් මෙන් දරුවන් කෑවේය. මහාපුරුෂයා යක්ෂයා දෙස බලා, මුඛයෙහි ඇතුළත ගිනිජාලාවක් මෙන් වූ ලේ ධාරාවක් වැගිරෙන ඔහුගේ මුඛය දැකද කෙස්අගක් පමණකුදු දොම්නසක් නො හටගත්තේය. මගේ දානය මැනවින් දෙන ලද්දී යයි සිතමින්, ඔහුගේ ශරීරයේ මහත් ප්‍රීතිසොම්නසක් හටගත්තේය. ඔහු, මගේ මේ දානය නිසා අනාගතයේ මේ ආකාරයෙන් රැස් විහිදෙත්වායි ප්‍රාර්ථනා කළේය. උන්වහන්සේගේ ඒ ප්‍රාර්ථනාව නිසා බුදුබවට පත් ශරීරයෙන් රැස් විහිදී, මෙපමණතැනක පැතුරුණාහ. තවද පූර්ව චරිතයක් ඇත. ඔහු බෝසත් කාලයේ එක් බුදුවරයකුගේ දාගැබක් දැක, පැහැදුනු සිත් ඇත්තේ මා විසින්ද, මේ බුදුරදුන්ට ජීවිතය පරිත්‍යාග කිරීමට වටී යයි, ලීයක් පහන්තිරවලින් වෙලන්නාක් මෙන් මුළු ශරීරය (පාන්කඩවලින්) වෙළා ලක්ෂයක් රන්පපාක ගිතෙල් පුරවා, එහි පහන්වැටි දහසක් දල්වා, එය හිසමත තබා සියලු සිරුර ගිනිදල්වා චෛත්‍යය ප්‍රදක්ෂිණා කරමින් මුළු රැයක් ගතකළේය. එහෙත් උදෑසන උදාවනවිට ලෝම කූපයකටවත් රස්නයක් නොවීය. නෙළුම් ගැබකට පිවිසි කාලයක් මෙන් විය. ධර්මය රකින තැනැත්තා ධර්මය විසින්ම ආරක්ෂා කරයි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

> "ඒකාන්තයෙන් ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින්ම රකියි.
> මනාසේ පුරුදු කරන ලද ධර්මය සැප ඵලවයි. ධර්මයේ
> හැසිරෙන්නා කෙරෙහි මේ ආනිශංසය වෙයි. ධර්මචාරියා දුගතියට
> නොයයි."

මේ කුසල කර්මය නිසාවෙන් ඒ බුදුරදුන්ගේ ශරීර ශෝභාව දසදහසක් ලෝකධාතුව පුරා පතුරා සිටියේය. එකල අපගේ බෝධිසත්වයෝ සුරුචි නම් බ්‍රාහ්මණ වී ශාස්තෘන්ට ආරාධනා කරන්නෙමියි, එළඹ, මිහිරි බණකථා අසා ස්වාමීනි; හෙට මගේ භික්ෂාව පිළිගනු මැනවැයි කීවේය.

බ්‍රාහ්මණය; ඔබට කොපමණ භික්ෂූන් ප්‍රමාණවත්ද? ස්වාමීනි; ඔබගේ පිරිවර භික්ෂූන් කොපමණද? එකල උත්වහන්සේගේ පළමු සන්නිපාතය වෙයි. එහෙයින් කෝටි ලක්ෂයක් යයි වදාළහ. ස්වාමීනි; ඒ සියළුම දෙනා සමග මගේ භික්ෂාව පිළිගනු මැනවි. ශාස්තෘන් වහන්සේ ඉවසා වදාළ සේක. බ්‍රාහ්මණයා බුදුරදුන්ට හෙට පිණිස ඇරයුම්කොට ගෙට යමින් මෙසේ සිතුවේය. මම මෙපමණ භික්ෂූන්ට කැඳ බත් වස්ත්‍රාදිය දීමට හැකිවෙමි. හිඳිනාතැන් ආදිය කෙසේ වන්නේද? ඔහුගේ සිතිවිල්ල යොදුන් අසූහාරදහසකින් කරවන්නට සමත්විය. ශක්‍රයා; කවරෙක් මා කෙරෙන් මේ ස්ථානයෙන් පහකරනු කැමැති වේද? දිව ඇසින් බලනවිට බෝසතුන් දැක, සුරුචි බ්‍රාහ්මණයා බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට ආරාධනාකොට හිඳිනා අසුන් පිණිස සිතුවේය. මා විසින්ද එහි ගොස් පින් කොටසක් ගැනීමට වටියයි, වඩුවකුගේ විලාශයක් මවාගෙන වෑ පොරෝ ගත් අත් ඇතිව බෝසතුන් ඉදිරියේ පහළවී, කිසියම් බැලමෙහෙවරක් ඇද්දැයි කීවේය. බෝසතුන්ද දැක, තමන් වැඩක් කළ හැකි වන්නේද? ඇසීය. මම නොදන්නා ශිල්පයක් නම් නැත. ගෙයක් හෝ මණ්ඩපයක් හෝ යමක් කළයුතුද? එය කිරීමට දනිමියි, එසේ වීනම් මට වැඩක් ඇත. ආර්යන් වහන්ස; කිමෙක්ද?

හෙට සඳහා මා විසින් කෝටි ලක්ෂයක් භික්ෂූන්ට ආමන්ත්‍රණය කරන ලදී. ඔවුන්ට හිඳිනා තැන් කරන්නෙහි. මම එය කරන්නෙමි. ඉදින් මට වැටුප් දීමට හැකිවන්නෙහුද? දරුව; හැකිවන්නෙමි. යහපතැයි, කරන්නෙමියි ගොස් එක් පෙදෙසක් බැලුවේය. යොදුන් දහයක් දොළහක පමණ ප්‍රදේශයක් කසිණ මණ්ඩලයක් මෙන් සමතලා විය. හෙතම මේ ස්ථානයේ සත්රුවන්මය මණ්ඩපයක් පහළ වේවා!යි සිතා බැලුවේය. එකෙණෙහිම පොළොව බිඳී මණ්ඩපය පැනනැංගේය. ඒ ස්වර්ණමය වූ කණුමුල රිදීමය කළපේළි පහළ වූහ. රිදීමය, ස්වර්ණමය, මැණික්මය, කණුමුල්වල පබළුමය, මැණික්මය ද, සත්රුවන්මය වූ කණුමුල්වල සත්රුවන්මය කළපේළිද වූහ. අනතුරුව; මණ්ඩපය අතරින් පතර කිකිණිදැල් පහළ වේවායි, බැලුවේය. බැලූ විගස රහුදල් එල්ලුණේය. මඳ සුළඟින් ලෙළදෙන විට පංච තූර්යනාදය මිහිරිහඬින් නිකුත් වෙයි. දිව්‍ය සංගීතය පවත්වන කාලයක මෙන් විය. අතරතුර, සුවඳ වැල්, මල්දම් එල්ලේවායි සිතුවේය. ඒවා එල්ලුණහ. කෝටි ලක්ෂයකට අධික භික්ෂූන්ට ආසනද, ආධාරකද පොළොව බිඳගෙන පහළ වේවා!යි සිතුවේය. එකෙණෙහි හටගත්හ. කොණින් කොණ, වෙන් වෙන්ම දියසැළි පහළ

වේවා!යි සිතුවේය. දියසැළි පහළ වූහ. හෙතම එපමණ මවා, බමුණා සමීපයට ගොස් එනු උතුමාණනි; ඔබේ මණ්ඩපය බලා, මට වැටුප් දෙන්නැයි කීවේය. බෝසතුන් ගොස් මණ්ඩපය බැලුවේය. බලන මොහොතේම මුලු සිරුරම පස්වනක් ප්‍රීතියෙන් නිරතුරුව පිනා ගියේය. ඉක්බිති ඔහුට මෙබඳු අදහසක් පහළවිය. මේ මණ්ඩපය මිනිසකු විසින් කරන ලද්දක් නොවේ. මගේ අදහස, මගේ ගුණයට පැමිණ, ඒකාන්තයෙන් ශක්‍ර භවන උණුවන්නට ඇත. ඉක්බිති ශක්‍ර දිව්‍යරාජයා විසින් මේ මණ්ඩපය කළේ වන්නේය. මෙබඳු ආකාර මණ්ඩපයක එක්දිනක් පමණක් දන්දීම සුදුසු නැත. දිනහතක් දන්දෙමියි සිතුවේය. බාහිරදාන එපමණ කලත් බෝසතුන්ගේ සතුටක් කරන්නට නොහැකිවෙයි. අලංකාර කළ හිස කපා, අඳුන්ගෑ ඇස් උගුලුවා, හෘදයමාංශ හෝ උදුරුවා දෙනකල්හි බෝධිසත්වයන්ගේ ත්‍යාගය නිසා සතුටක් නම් විය. අපගේ බෝසතුන්ගේද සිව්රාජ ජාතකයේ දිනපතා කහවණු පනසක් දහසක් වියදම් කොට, දොරටු සතරෙහිද නගර මධ්‍යයේද, දන් දුන්නේද මොහුගේ දාන ත්‍යාග සතුට ඉපදවීමට නොහැකිවිය. යම්කලෙක බමුණු වේශයෙන් අවුත් ශක්‍ර දිව්‍යරාජයා ඇස් ඉල්ලීය. එකල ඒවා උගුල්ලා දෙනු ලබද්දීම සිනහව පහළවිය. කෙසඟ මාතුයකුදු සිත වෙනසක් නොවීය. මෙසේ දෙනලද දාන නිසා බෝසතුන්ට තෘප්තියක් නම් නැත. එහෙයින් ඒ මහා පුරුෂයා දින හතක් මා විසින් කෝටි ලක්ෂයකට අධික භික්ෂූන්ට දන් දීමට වටීයයි සිතුවේය. ඉක්බිති ඔහු ඒ මණ්ඩපයේ හිඳුවා, සත්දිනක් ගවපානය දුන්නේය. "ගවපානං" යනු මහත් මහත් වූ මහසැළිවල කිරි පුරවා උඳුනක තබා සන ලෙස පැසුණු කල්හි සහල් බහා පැසුණු මී උක්සකුරු කුඩු ගිතෙල් සමග සකස්කළ භෝජනයක් යයි කියනු ලැබේ. මිනිසුන්ට සකස් කළ නොහැකි වූහ. දෙවිවරුම මෙපමණ දේ සකස් කළහ. යොදුන් දොළහක් දහතුනක් පමණ වූ ප්‍රමාණයක භික්ෂූන්ට ගැනීමට නොහැකි විය. ඒ භික්ෂූහු තම තමන්ගේ ආනුභාවයෙන් වැඩහුන්හ. අවසන් දිනයේ සියළු භික්ෂූන්ගේ පාත්‍ර සෝදා බෙහෙත් පිණිස, ගිතෙල් වෙඩරු තෙල් මීපැණි පුරවා තුන්සිවුරු සමග දුන්නේය. නවක සංඝ භික්ෂූන් විසින් ලද සිවුරු රෙදි සියදහසින් අතර්ඝ විය. ශාස්තෘන් වහන්සේ අනුමෙවෙනි දේශනය කරන්නේ, මේ පුරුෂයා මෙබඳු ආකාර මහා දානයක් දුන්නේය. කවරෙක් නම් වන්නේදැයි සලකන්නේ, අනාගතයේ කල්ප දසදහසකටද අසංඛ්‍ය දෙකකටද මත්තෙහි ගෝතම නම් බුදුවන්නේ යයි දැක මහාපුරුෂයා අමතා ඔබ මෙපමණ නම් කලක් ඉක්මවා ගෝතම නමින් බුදුවන්නෙහි යයි විවරණ කළ සේක. බෝධිසත්වයෝ විවරණය අසා, "මම වනාහි

බුදුවන්නෙමි." මට ගෘහවාසයෙන් කවර අර්ථයක්ද? පැවිදි වන්නෙමියි සිතා එබඳු ආකාර සම්පත් කෙළපිඬක් මේ ඉවත දමා ශාස්තෘන් සමීපයේ පැවිදිව බුද්ධ වචනය උගෙන අභිඥා සමාපත්ති උපදවා ආයුෂ කෙළවර බ්‍රහ්මලෝකයේ උපන්නේ ය.

මංගල නම් භාග්‍යවතුන් වහන්සේගේ නගරය උත්තර නම් විය. පියාද උත්තර නම් ක්ෂත්‍රියෙකි. මව උත්තරා නම් දේවියයි. සුමේධ, ධම්මසේන නම් අග්‍ර ශ්‍රාවකයෝද පාලිත නම් උපස්ථායකයාද, සීවලී, අශෝකා යන අග්‍ර ශ්‍රාවිකාවෝද, නා ගස බෝධියද වූහ. අසූ අටරියන් උස ශරීරයක්ද විය. වර්ෂ අනූදහසක් සිට ඒ බුදුරදුන් පිරිනිවනට පත්කල්හි එක මොහොතකින්ම දසදහසක් සක්වල එකම ඝන අන්ධකාර විය. සියළු සක්වල මිනිසුන්ගේ මහත් හැඬීම් වැලපීම් විය.

"කොණ්ඩඤ්ඤ නම් බුදුරදුන්ගෙන් පසුව මංගල නම් රහතන් වහන්සේ, අන්ධකාරය ලොව නසා ධර්මාලෝකය පැතිරවීය.

මෙසේ දසදහසක් ලෝකධාතුව අඳුරුකොට බුදුරදුන් පිරිනිවන්පෑවාට පසුව කාලයක "සුමන" නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවිය. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේදී කෝටි ලක්ෂයක් භික්ෂූහු වූද, කංචන පර්වතයේ දෙවෙනි සන්නිපාතයේදී අනූකෝටි ලක්ෂයක්ද, තුන්වෙනුව අසූකෝටියක්ද වූහ. එකල (අපගේ) බෝධිසත්ව තෙම අතුල නම් නාගරාජයා විය. හේ මහත් ඍද්ධි ඇති මහානුභාව සම්පන්න විය. හෙතම බුදුරදුන් උපන්නේ යයි අසා, නෑදෑ සේනාව පිරිවරාගෙන නා භවනෙන් නික්ම, කෝටිලක්ෂයක් භික්ෂු සංඝයා පිරිවරාගත් භාග්‍යවතුන් වහන්සේට දිව්‍ය තූර්යනාදයෙන් උපහාරකොට, මහදන් පවත්වා අතිරේක වස්ත්‍ර යුගල බැගින් දී, සරණ ශීලයෙහි පිහිටිය. ඒ ශාස්තෘන් වහන්සේ, මෙතෙම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය 'ඛෙම' නම් විය. සුදත්ත නම් රජු පියා විය. සිරිමා නම් දේවිය මව වූවාය. සරණ, භාවිත්ත නම් අග්‍රශ්‍රාවකයෝ දෙනමකි. උදේන නම් උපස්ථායකයාද, සෝණා උපසෝණා නම් අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක්ද වූහ. නාගස බෝධියයි. අත්රියන් අනූවක් උස ශරීරයක්ද වර්ෂ අනූදහසක ආයු ප්‍රමාණයක්ද වූයේය.

මංගල බුදුරජුන්ට පසුව, සියලු ධර්මයන්ට අසම වූ, සියලු සත්ත්වයන්ට උතුම් වූ සුමන නම් බුදුහු ලොව පහළවිය.

එයට පසුකාලයේ රේවත නම් ශාස්තෘන් වහන්සේ පහළ විය. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ සීමාවක් නොවේ. දෙවැන්නේ කෝටි ලක්‍ෂයක් වූහ. තෙවැන්නේද එසේමය. එකල අප බෝසත්තුමා අතිදේව නම් බ්‍රාහ්මණයෙකු වී ශාස්තෘ ධර්ම දේශනාව අසා සරණ ශීලයෙහි පිහිටියේ සිරසින් ඇඳිලි බැඳ ඒ ශාස්තෘන් වහන්සේගේ කෙලෙස් ප්‍රහාණය කිරීමේ වර්ණනාව අසා උතුරුසළුව පූජා කළේය. උන්වහන්සේද, මෙතම බුදුවන්නේ යයි විවරණ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය 'සුධඤ්ඤවති' නම් විය. පියා වුපල නම් ක්‍ෂත්‍රියෙකි. මව විපුලා නම් වූවාය. වරුණය, බ්‍රාහ්මදේවයා නමින් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමකි. උපස්ථායකයා 'සම්භව' නම් විය. භද්දා, සුභද්දා නමින් අග්‍රශ්‍රාවිකාවෝ දෙනමකි. 'නාගස' බෝධිය විය. ශරීරය අසූරියන් උස විය. ආයුෂ වර්ෂ සැටදහසකි.

සුමන බුදුරජාණන් වහන්සේගෙන් පසුව උපමා රහිත වූ අසදෘශ වූ, අසමාන වූ උත්තම ජින වූ රේවත බුදුන් වහන්සේ ලොව පහළ වූ සේක.

එයට පසුකාලයේ 'සෝභිත' නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ශ්‍රාවක සන්නිපාත තුනක් විය. පළමු සන්නිපාතයේ කෝටි සියයක් භික්‍ෂූහු වූහ. දෙවැන්නේ අනූකෝටියක්ද, තෙවැන්නේ අසූකෝටියක්ද වූහ. එකල අප බෝසත්හු අජිත නම් බ්‍රාහ්මණයෙකුව සිට ශාස්තෘ ධර්ම දේශනාව අසා, සරණ ශීලයෙහි පිහිටා බුදුන් ප්‍රමුඛ භික්‍ෂු සංඝයාට මහදන් පැවැත්වූහ. උන්වහන්සේද මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුධම්ම නම් විය. පියා සුධම්ම නම් රජුය. මව සුධර්මා නම් බිසව වූවාය. අසම, සුනෙත්ත නමින් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමක්ද, අනෝම නම් උපස්ථායකයාද විය. අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනම නකුලා ද, සුජාතා ද වූහ. නාගස බෝධියයි. රියන් පනස්අටක් උස ශරීරයක් විය. වර්ෂ අනූදහසක් ආයුෂ විය.

රේවත බුදුන් පිරිනිවි කල්හි තැන්පත් වූ, සන්සුන් සිත් ඇති, අසම වූ සමානයකු නැති, සෝභිත නම් බුදුන්වහන්සේ ලොව පහළවූ සේක.

ඉන් පසු කාලයේ එක් අසංඛ්‍යයක් ඉක්මවා, එක් කල්පයක බුදුවරු තෙනමක් උපන්නාහ. අනෝමදස්සි පදුම සහ නාරද යනුවෙනි. අනෝමදස්සි බුදුන්ගේ ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය. පළමු සන්නිපාතයේදී අටලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ සත් ලක්ෂයක්ද, තෙවැන්නේ හයලක්ෂයක්ද වූහ. එකල අප බෝසත්හු මහත් ඍද්ධි ඇති මහානුභාව සම්පන්න, නොයෙක් කෝටිලක්ෂ ගණනාවක් යක්‍ෂයන්ට අධිපති යක්‍ෂ සේනාපතියෙක් විය. හෙතම බුදුන් උපන්නේ යයි අසා අවුත්, බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් පැවැත්වීය. උන්වහන්සේද මෙතම ලෝකයේ බුදුවන්නේ යයි, විවරණ දුන් සේක. අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ නගරය චන්ද්‍රවතී නම් විය. 'යසවා' නම් රජු පියා වූයේය. යසෝධරා මව වූවාය. නිසභ, අනෝම යනුවෙන් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමක්ද, වරුණ නම් උපස්ථායකයාද, සුන්දරී, සුමනා නම් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමක්ද වූහ. කුඹුක් ගස බෝධියයි. රියන් පනහක් උස ශරීරයක්ද විය. වර්ෂ ලක්‍ෂයක් ආයුෂ විත්දේය.

"සෝභිත බුදුරදුන්ට පසුව අපමණ යසස් ඇති, තේජස් ඇති,
ඉකුත් කිරීමට අපහසු දෙපා ඇත්තන්ට උතුම් වූ අනෝමදස්සි
සම්බුදුරදුන් ලොව පහළ විය."

එයට පසු කාලයේ 'පදුම' නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ කෝටි ලක්‍ෂයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ තුන් ලක්ෂයක්ද, තෙවැන්නේ ග්‍රාම්‍ය නොවූ අරණ්‍යයේ මහවනවාසී, භික්ෂූන් දෙලක්ෂයක්ද වූහ. එකල අප බෝසත් තෙම සිංහයකු වී ශාස්තෘන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවදින ආකාරය දැක, පැහැදුණු සිත් ඇත්තේ වැඳ, ප්‍රදක්ෂිණා කොට ප්‍රීති සොම්නසට පැමිණියේ, තුන්වරක් සිංහනාද කොට සත්දිනක් බුද්ධාලම්භන ප්‍රීතිය අත්නොහැර ප්‍රීතිසුඛයෙන් ගොදුරු පිණිස පිටත්ව නොගොස්, ජීවිතය පරිත්‍යාගකොට බුදුරදුන් ආශ්‍රය කරමින් සිටියේය. ශාස්තෘන් වහන්සේ සත්දිනක් ඇවෑමෙන් නිරෝධ සමවතින් නැගිට සිංහයා දෙස බලා භික්ෂු සංඝයා කෙරෙහිද සිත පහදවා සංඝයා වඳින්නේය. භික්ෂු සංඝයා පැමිණේවායි සිතුවේය. භික්ෂූහු එකෙණෙහි ආවාහුය. සිංහයාද භික්ෂු සංඝයා කෙරෙහි ප්‍රසාදයට පත්විය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ මනස බලා, අනාගතයේ බුදුවන්නේ යයි ඔහුට විවරණ දුන් සේක. 'පදුම' බුදුරදුන්ගේ නගරය චම්පක නම් විය. පදුම නම් රජු

පියා විය. ('පදුම' බුදුන්ගේ පියා අසම රජු නමින් බොහෝ අට්ඨ කථාවල සඳහන් වෙතත් මෙහි ඇත්තේ 'පදුම' රජු කියාය.) මව අසමා නම් වූවාය. සාල, උපසාල නමින් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමක්ද, වරුණ නම් උපස්ථායකයාද වූහ. රාමා, සුරමා නමින් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමකි. සෝමුරුතු ගස බෝධිය විය. රියන් පනස් අටක් උස ශරීරයක් විය. ආයුෂ වර්ෂ ලක්ෂයකි.

"අනෝමදස්සි බුදුරදුන්ගෙන් පසුව අසමසම වූ
අප්‍රතිම පුද්ගල වූ දිපදුත්තම වූ පදුම නම් බුදුරජාණන් වහන්සේ
ලොව පහළවූ සේක."

ඉන්පසු කාලයේ නාරද නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ අනූකෝටි ලක්ෂයක්ද, තෙවැන්නේ අසූකෝටි ලක්ෂයක්ද වූහ. එකල අප බෝධිසත්ත්වයෝ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංච අභිඥා, අෂ්ට සමාපත්ති උපදවා පුරුදු කරන ලද ඉන්ද්‍රිය වසඟ ඇත්තේ බුදුරදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් දී රත්හඳුන්වලින් පූජා කළේය. උන්වහන්සේද මෙතම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ බුදුරදුන්ගේ නගරය ධඤ්ඤවතීනම් විය. සුමේධ නම් ක්ෂත්‍රියා පියාය. මව අනෝමා නම් වූවාය. සුළුමුරුත ගස බෝධිවෘක්ෂය විය. ශරීරය අසූ රියනක් උස ඇත්තේ විය. වර්ෂ අනූදහසක් ආයුෂ වැළඳූ සේක.

"පදුමුත්තර බුදුරදුන්ට පසුව, ලොවට උතුම් වූ
අසම සම 'නාරද' නම් බුදුරජහු ලොව පහළ වූහ."

නාරද බුදුරදුන්ට පසුකාලයේ කල්ප ලක්ෂයකින් මත්තෙහි එක් කල්පයක එක් පදුමුත්තර නම් බුදුරජාණන් වහන්සේ පහළවූ සේක. උන්වහන්සේට ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේදී කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවෙන්නේදී චේහාර පර්වතයේ අනූකෝටියක්ද, තෙවෙන්නේදී අසූකෝටියක්ද වූහ. එකල අප බෝසත්හු ජටිල නම් මහසිටු වී බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට තුන්සිවුරු දානය දුන්හ. ඒ ශාස්තෘන් වහන්සේද හෙතම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. පදුමුත්තර බුදුරදුන්ගේ කාලයේ තීර්ථකයෝ නම් නොවූහ.

සියලුම දෙව් මිනිස්සු බුදුන් සරණම ගියහ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය හංසවතී නම් විය. පියා ආනන්ද නම් ක්ෂත්‍රියෙකි. මව සුජාතා නම් දේවියයි. දේවල, සුජාත යනුවෙන් අග්‍රශ්‍රාවකයෝ දෙනමක්ද, සුමන නම් උපස්ථායකයාද වූහ. අග්‍රශ්‍රාවිකාවෝ දෙනම අමිතා අසමා නම් වූහ. සල්රුක බෝධියයි. ශරීරය අටඅසූරියන් උස විය. ශරීරප්‍රභාව දොළොස් යොදුන් හාත්පස පැතිරුණේය. වර්ෂ ලක්ෂයක් ආයුෂ වින්දේය.

නාරද බුදුරදුන්ට මතුයෙහි, සාගරයට සමාන ගැඹුරු ගුණ ඇති,
නොකැළඹිය හැකි, පදුමුත්තර නම් ජිනයන් වහන්සේ
සම්බුද්ධත්වයට පැමිණි සේක.

ඉන්පසු කාලයේ කල්ප තිස්දහසක් ඉක්මවා සුමේධය, සුජාත යයි එකම කල්පයේ බුදුවරු දෙනමක් පහළවූහ. සුමේධ බුදුරදුන්ගේ ශ්‍රාවක සන්නිපාත තුනක් විය. පළමු සන්නිපාතයේ සුදර්ශනා නගරයේ කෝටි සියයක් ක්ෂීණාශ්‍රවයෝ වූහ. දෙවැන්නේ අනූකෝටියක්ද, තෙවැන්නේ අසූ කෝටියක්ද වූහ. එකී බෝධිසත්වයෝ උත්තර නම් මානවකයා වී නිධන් කර තිබූ අසූ කෝටියක් ධනය වියදම්කොට බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් දුන්හ. දන් දී, දහම් අසා, සරණ ශීලයේ පිහිටා නික්මගොස් පැවිදි විය. හෙතෙමේ අනාගතයේ බුදුවන බවට උන්වහන්සේ විවරණ දුන් සේක. සුමේධ බුදුරදුන්ගේ නගරය සුදර්ශන නම් විය. සුදත්ත නම් රජු පියා විය. මවද සුදත්තා නම් වූවාය. වරුණය සබ්බකාමය යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙනමයි. උපස්ථායකයා සාගරනම් වී රාමා සුරාමා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමය. මහකොහොඹ ගස බෝධිය විය. ශරීරය අසූඅටරියන් උසය. අනූදහසක් වර්ෂ ආයුෂ ඇත්තේ විය.

පදුමුත්තර බුදුන්ට ඉක්බිතිව, ලංවීමට දුෂ්කර වූ,
බලවත් වූ, තේජස් ඇති, සකල ලෝකයටඋතුම් වූ, සුමේධ නම්
නායකයාණෝ බුද්ධත්වයට පැමිණියහ.

උන්වහන්සේට පසුව, සුජාත නම් ශාස්තෘන් වහන්සේ, පහළ වූහ. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ සැටදහසක් භික්ෂූහු වූහ. දෙවැන්නේ පනහකි. තුන්වැන්නේ සතළිහකි. එකල අප බෝධිසත්ත්වයෝ චක්‍රවර්ති රජවී බුදුන් උපන්නේ යයි අසා, එළඹ බණ අසා බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට සත්රුවන් සමග සතර

මහද්වීපවල රාජ්‍යය පවරා දී ශාස්තෘන් සමීපයේ පැවිදි විය. සියළු රටවැසියෝ රාජ්‍ය පඬුරු රැගෙන ආරාමික කෘත්‍යය සාදන්නෝ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට නිතර මහදන් පිරිනැමූහ. ඒ ශාස්තෘන් වහන්සේද මෙතම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ බුදුරදුන්ගේ නගරය, සුමංගල නම් විය. උග්ගත නම් රජු පියා විය. මව ප්‍රභාවතී නම් වූවාය. සුදර්ශන, සුදේව නම් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමකි. උපස්ථායකයා නාරද නම් විය. නාගා, නාගසමාලා අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනම වෙති. මහ උණගස බෝධිය විය. එය මද සිදුරු ඇති, ඝන කඳ ඇති, උඩට විහිදුණා වූ මහා ශාඛා ඇති, නිර්මල ඡත්‍රයෙන් ගැවසී ගත් මොනර පිල කළඹක් මෙන් බැබළියේය. උන්වහන්සේගේ සිරුර පනස් රියන් උසය. අනූදහසක් අවුරුදු ආයුෂ විය. ඒ මණ්ඩ කල්පයෙහි, මනාව වැඩුණු කය ඇති, ළංවී ගැටී එළඹිය නොහැකි, සිංහයකුට බඳු හනු ඇත්තා වූ, සුජාත නම් බුදුන් වහන්සේ ලොව පහළවූ සේක.

සුජාත බුදුරදුන්ට පසු භාගයෙහි මෙයින් කල්ප සියයක් අධික කල්ප අටළොස් කපකට මත්තෙහි එක් කල්පයක, පියදස්සි, අත්ථදස්සි, ධම්මදස්සි යන තුන් බුදුවරු උපන්නාහ. පියදස්සි බුදුරදුන්ගේ ශ්‍රාවක සන්නිපාත තුනෙකි. පළමු සන්නිපාතයේ කෝටි සියයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ අනූ කෝටියක්ද, තෙවැන්නේ අසූවක්ද වූහ. එකල බෝසත්හු කස්සප නම් මානවකව ත්‍රිවේදයේ පරතෙරට පැමිණ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා කෝටි ලක්ෂ ගණනින් ධන පරිත්‍යාගයෙන් සංඝාරාමයක් කරවා ශරණයෙහිද ශීලයෙහිද පිහිටියේය. ඉක්බිති ඒ ශාස්තෘන් වහන්සේ කල්ප අටළොසක් ඇවෑමෙන් බුදුවන්නේ යයි විවරණ දුන් සේක. උන්වහන්සේ උපන් නගරය අනෝම නම් විය. පියා සුදින්න නම් රජය. මව සුචන්දානම් වූවාය. පාලිත, සබ්බදස්සි යනු අග්‍රශ්‍රාවකයෝ දෙනම වෙති. උපස්ථායකයා සෝභිත නම් විය. සුජාතා ධම්මදින්නා යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙකි. පියඟු ගස (පුවඟු) බෝධියයි. ශරීරය අසූරියනක් උස විය. ආයුකාලය වර්ෂ අනූදහසක් වූයේය.

සුජාත බුදුරදුන්ට මත්තෙහි, ස්වයම්භූඥාන ඇති, වෙත පැමිණීමට දුෂ්කර වූ අසමසම වූ මහත් කීර්තිමත් වූ, පියදස්සී නම් ලෝක නායකයන් වහන්සේ බුද්ධත්වයට පත්වූ සේක.

ඉන්පසු කාලයේ අත්ථදස්සි නම් භාග්‍යවතුන් වහන්සේ පහළවූ සේක. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ අනූඅට කෝටියක් භික්ෂූහු වූහ. දෙවැන්නේ අසූඅටදහසක්ද, තෙවැන්නේද එසේමය. එකල බෝසත්හු සුසීම නම් මහත් ඍද්ධි ඇති තාපසයකු වී දිව්‍යලෝකයෙන් මදාරා මල් කූඩයක් ගෙනවුත් ශාස්තෘන් වහන්සේට පූජා කළේය. උන්වහන්සේද මෙතෙම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ බුදුරදුන් උපන් නගරය සෝභිත නම් විය. සාගර නම් රජු පියාය. සුදස්සන යනු මවයි. සන්ත, උපශාන්ත යනු අග්‍රශ්‍රාවකයෝ දෙනමයි. අභය නම් උපස්ථායකයාද විය. ධම්මා, සුධම්මා යනු අග්‍රශ්‍රාවිකාවෝ දෙනම වූහ. සපුගස බෝධියයි. ශරීරය රියන් අසූවක් උසය. ශරීර ප්‍රභාව යොදුන් සතක් පමණ හාත්පස පැතිරී සිටියේය. ආයුෂ වර්ෂ ලක්ෂයකි.

ඒ මණ්ඩ කල්පයෙහි මහා අඳුර දුරුකොට අත්ථදස්සී නම් වූ මහා පුරුෂයා සම්මා සම්බෝධියට පත්වූයේය.

ඉන්පසු කාලයේ ධම්මදස්සි නම් ශාස්තෘන් වහන්සේ පහළවිය. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක්ම වූහ. පළමු සන්නිපාතයේ කෝටිසියයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ හැත්තෑ කෝටියක්ද, තෙවැන්නේ අසූකෝටියක්ද වශයෙනි. එකල බෝසත්හු ශක්‍ර දිව්‍යරාජයා වී, දිව්‍ය මල්වලින්ද, දිව්‍ය තූර්යනාදයෙන්ද පූජා කළේය. ඒ ශාස්තෘන් වහන්සේ මෙතම අනාගතයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සරණ නම් විය. පියා සරණ නම් රජුය. මව සුනන්දා නම් වූවාය. සුමන පුෂ්පදේව යනු අග්‍රශ්‍රාවකයෝ දෙනම වෙති. උපස්ථායකයා සුනෙත නම් වේ. අග්‍රශ්‍රාවිකාවෝ දෙනම ඛේමා, සච්චනාමා නම් වූහ. රත්කරඬු ගස බෝධියයි. එයට බිඹුදැල් යයිද කියනු ලැබේ. උන්වහන්සේගේ ශරීරය රියන් අසූවක් උසය. වර්ෂ ලක්ෂයක් ආයුෂ වී,

> "එම මණ්ඩ කල්පයෙහි මහා යශස් ඇති කීර්තිමත් වූ, ධම්මදස්සී බුදුන් වහන්සේ ලොව පහළව, අඳුකාරය දුරුකොට දෙවියන් සහිත ලෝකය බැබළවීය."

එයට පසුකාලයේ මෙයින් අනූසතර කල්පයක් මත්තෙහි එක් කල්පයක එකම සිද්ධත්‍ථ නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ පහළවූහ.

උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනෙකි. පළමු සන්නිපාතයේ භික්ෂූන්ගේ ගණන කෝටිසියයක් විය. දෙවැන්නේ අනූකෝටියක්ද, තෙවැන්නේ අසූකෝටියක්ද වූහ. එකල අප බෝසත්හු උග්‍රතේජස් ඇති, අභිඥා බලසම්පන්න වූ, මංගල නම් තාපසයෙක් විය. මහජම්බු ගෙඩියක් ගෙනවුත් තථාගතයන්ට දුන්නේය. ශාස්තෘන් වහන්සේ ඒ ගෙඩිය වළඳා අනූසතර කල්පයක් මස්තකයේ බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය වේභාර නම් විය. පියා ජයසේන නම් රජය. මව සුජාස්සා නම් වූවාය. සම්බල, සුමිත්ත යනු අග්‍රශ්‍රාවකයෝ දෙනම වෙත්. උපස්ථායකයා රේවත නම් වේ. සීවලී සුරාමා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමයි. කිණිහිරිය ගස බෝධියයි. ශරීරය හැටරියනක් උසය. ආයුෂ වර්ෂ ලක්ෂයකි.

ධම්මදස්සී බුදුනට මත්තෙහි සිද්ධාර්ථ ලෝකනායකයාණෝ,
සූර්යයා උදා වූ කලක් මෙන්, සකල අන්ධකාරයන් දුරුකොට
බුද්ධත්වයට පත්වූ සේක.

එයට පසුකාලයේ මෙයින් කල්ප අනූදෙකකට මත්තෙහි එක් කල්පයක තිස්ස, පුස්ස යනුවෙන් බුදුවරු දෙනමක් උපන්නාහ. තිස්ස බුදුරදුන්ට ශ්‍රාවක සන්නිපාත තුනෙකි. පළමු සන්නිපාතයේ භික්ෂූන් කෝටි සියයක් විය. දෙවැන්නේ අනූකෝටියක්ද, තෙවැන්නේ අසූ කෝටියක්ද වශයෙනි. එකල අප බෝසත්හුව මහත් භෝග ඇති මහත් යශස් ඇති, සුජාත නම් රජවී, ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවී මහත් ඍද්ධිභාවයට පැමිණ, බුදුන් උපන්නේ යයි අසා දිව්‍යමය වූ මදාරා, පියුම්, පරසතු මල් ආදියද, ගෙන සිවු පිරිස මැද යන්නා වූ බුදුරදුන්ට පූජා කළේය. අහසෙහි මල් වියනක් වූයේය. ඒ ශාස්තෘන් වහන්සේද මෙතෙම මෙයින් අනූකපක් මත්තෙහි බුදුවන්නේ යයි විවරණ දුන් සේක. ඒ බුදුරදුන්ගේ නගරය බ්‍රහ්ම නම් විය. පියා ජනසන්ධ නම් වූයේය. මව පදුමා නම් වූවාය. බ්‍රහ්මදේව, උදය යනුවෙන් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමක් වූහ. උපස්ථායක සුමන නම් විය. පුස්සා-සුදත්තා යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙකි. අසනිය ගස බෝධියයි. ශරීරය හැටරියන් පමණ උස විය. වර්ෂ ලක්ෂයක් ආයුෂ විය.

සිද්ධාර්ථ බුදුරදුන්ට පසුව අනන්ත සිල් ඇති
අප්‍රමාණ යශස් ඇති අසහාය අසම සම
තිස්ස ලෝකනායකයාණන් වහන්සේ පහළ වූහ.

එයට පසුකාලයේ ඵුස්ස නම් ශාස්තෘන් වහන්සේ පහළ විය. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. පළමු සන්නිපාතයේ සැටලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ ලක්ෂ පනහක්ද, තෙවැන්නේ ලක්ෂ තිස්දෙකක්ද වූහ. එකල අප බෝධිසත්වයෝ විජිතාවි නම් ක්ෂත්‍රිය රජව මහා රාජ්‍යය හැර ශාස්තෘන් සමීපයේ පැවිදිවී තුන්පිටකය ඉගෙන මහජනයාට ධර්මය වදාළ සේක. සීල පාරමිතාවද පිරිය. උන්වහන්සේද මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන් සේක. උන්වහන්සේගේ නගරය කසීනම් වී. ජයසේන නම් රජතුමා පියා විය. මව සිරිමා නම් වූවාය. සුරක්ඛිත, ධම්මසේන යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙනමක් වූහ. උපස්ථායකයා අභය නම් වී. සාලා, උපසාලා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. නෙල්ලි ගස බෝධියයි. ශරීරය පනස්අට රියන් උස විය. අවුරුදු අනූදහසක් ආයුෂ වින්දේය.

ඒ මණ්ඩ කල්පයෙහි, උපමා රහිත වූ, මහා කීර්තිමත් වූ,
නිරුත්තර වූ ලෝකයට අග්‍රනායක වූ ඵුස්ස නම් ශාස්තෘන්
වහන්සේ පහළවූ සේක.

ඉන් මතුකාලයේ මෙයින් කල්ප එක අනූවකට පෙර විපස්සි නම් භගවත්හු පහළ විය. උන්වහන්සේට ශ්‍රාවක සන්නිපාත තුනෙක් වූහ. පළමු සන්නිපාතයේ අටසැට ලක්ෂයක භික්ෂූහු වූහ. දෙවැන්නේ අනූ එක් ලක්ෂයක්ද, තුන්වැන්නේ අසූ දහසක්ද වූහ. එකල බෝසත්හු මහා ඍද්ධි ඇති මහානුභාව සම්පන්න අතුල නම් නාගරාජයා වී මැණික් හතක් ඔබ්බවන ලද මාණික්‍යය පුටුවක් බුදුරජාණන් වහන්සේට පිදිය. උන්වහන්සේද, මෙතෙම මෙයින් කල්ප එක් අනූවකින් මතු බුදුවන්නේ යයි විවරණ ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ උපන් නගරය බන්ධුමතී නම් විය. බන්ධුමා නම් රජු පියා විය. මව බන්ධුමතී නම් වූවාය. බණ්ඩ, තිස්ස යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙනම වූහ. අසෝක යනු උපස්ථායකයාය. චන්ද්‍ර, චන්ද්‍රමිත්තා යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙකි. පළොල් ගස බෝධියයි. ශරීරය අසූ රියනක් උසය. ශරීර ප්‍රභාව යොදුන් සතක් දුර පැතිරී තිබුණේය. අවුරුදු අසූදහසක් ආයුෂ වින්දේය.

ඵුස්ස බුදුන් වහන්සේට මතුයෙහි, ලොවට ඇසක් වැනි වූ,
දෙපා ඇත්තන්ට උතුම් වූ, විපස්සී නම් සම්බුද්ධයන් වහන්සේ
ලොව පහළවූ සේක.

ඉන්පසු කාලයේ මෙයින් කල්ප තිස්එකක් මත්තෙහි සිබී, වෙස්සභූ යන බුදුවරු දෙනම වූහ. සිබී බුදුරදුන්ට ශ්‍රාවක සන්නිපාත තුනෙක් වූහ. පළමු සන්නිපාතයේ භික්ෂූන් ලක්ෂයක් විය. දෙවැන්නේ අසූදහසක්ද, තෙවැන්නේ සැත්තෑදහසක්ද වූහ. එකල බෝසත්හු අරින්දම නම් රජු වී බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට චීවර සහිත මහා දානයක් පවත්වා, සත්රුවනින් අලංකාර කළ, හස්තිරත්නයක් දී ඇතකු ප්‍රමාණ කැප බඳුද දන් දුන්නේය. ඒ ශාස්තෘන් වහන්සේ මෙයින් එක්තිසක් කල්පයෙහි මෙතෙම බුදුවන්නේ යයි විවරණ කළ සේක. ඒ භාග්‍යවත් බුදුරදුන් උපන් නුවර අරුණවතී නම් විය. අරුණ නම් ක්ෂත්‍රිය රජු පියා විය. ප්‍රභාවතී බිසව මව වූවාය. අභිභූ, සම්භූත යනුවෙන් අග්‍ර ශ්‍රාවක දෙනමක් වූයේය. ඛේමංකර යනු උපස්ථායක භික්ෂුවයි. මබිලා, පදුමා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. ඇටඹ ගස බෝධියයි. ශරීරය තිස්හත් රියනක් උස විය. ශරීර ප්‍රභාව යොදුන් තුනක් දුර පැතිරී සිටියේය. අවුරුදු සැත්තෑදහසක් ආයුෂ වැළඳියේය.

"විපස්සි බුදුරදුන්ට පසුව, ලොවට පහනක් වැනි දෙපා ඇත්තන්ට නායක වූ අසමසම, අසහාය සිබී නම් බුදුරදුන් ලොව පහළවූ සේක."

ඉන්පසු කාලයේ වෙස්සභූ නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. පළමු සන්නිපාතයේ අසූ ලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවැන්නේ සැත්තෑ දහසක්ද, තෙවැන්නේ සැටදහසක්ද වූහ. එකල බෝසත්හු සුදර්ශන නම් රජවී බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට චීවර සහිත මහදන් දී උන්වහන්සේ සමීපයේ පැවිදි වී ආචාර ගුණ සම්පන්නව බුද්ධරත්නයෙහි නොසැලෙන ප්‍රීති බහුලතාවයෙන් යුතු විය. ඒ භාග්‍යවතුන් වහන්සේද මෙතෙම මෙයින් කල්ප තිස්එකක් ඇවෑමෙන් බුදු වන්නේ යයි විවරණ දුන් සේක. ඒ භගවත්හු අනෝම නුවර උපන්හ. සුප්පතීත නම් රජු පියා විය. යසවතී මව වූවාය. සෝණ, උත්තර යනුවෙන් අග්‍ර ශ්‍රාවකයෝ දෙනමකි. උපස්ථායකයා උපශාන්ත වී. රාමා, සුරාමා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමය. සල්රුක බෝධියයි. හැට රියනක් උස ශරීරය විය. වර්ෂ හැටදහසක් ආයු වැළඳියේය.

"මේ කල්පයෙහි අසම වූ අපමණ ගුණ ඇති වෙස්සභූ නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක."

ඉන් මෑත භාගයේ මේ කල්පයෙහි බුදුවරු සතර නමක් උපන්නෝය. කකුසඳ, කෝණාගම, කස්සප සහ අපගේ භාග්‍යවතුන් වහන්සේ යනුවෙනි. කකුසඳ බුදුරදුන්ට එකම ශ්‍රාවක සන්නිපාතයකි. එහි සතළිස් දහසක් භික්ෂූහු වූහ. එකල අප බෝසත්, බෙම නම් රජව් බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට පාත්‍රසිවුරු ද, අඳුන් ආදි බෙහෙත් දන් දී ශාස්තෘ ධර්ම දේශනාව අසා පැවිදි විය. උන්වහන්සේද මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන් සේක. කකුසඳ බුදුරදුන් උපන් නුවර බෙම නම් විය. අග්ගිදත්ත නම් බ්‍රාහ්මණයා පියා වූයේය. විසාඛ නම් බැමිණිය මව වූවාය. විදුර, සංජීව නමින් අග්‍ර ශ්‍රාවකවරු දෙනමකි. උපස්ථායකයා බුද්ධිජ නම් වී. සාමා, චම්පා යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. මහරිය ගස බෝධියයි. ශරීරය රියන් හතළිහක් උස විය. වර්ෂ හතළිස් දහසක් ආයුෂ විත්දේය.

"වෙස්සභූ බුදුරදුන්ට මතුකාලයේ ලොවට උතුම් පහනක් වූ
අප්‍රමාණ ඤාණ සම්භාරයෙන් පිරි වෙත පැමිණීම දුෂ්කර වූ
කකුසඳ නම් සම්බුදුරදුන් ලොව පහළ වූහ."

උන්වහන්සේට මතුකාලයේ කෝණාගමන නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළ විය. උන්වහන්සේටද එකම ශ්‍රාවක සන්නිපාතයකි. එහි භික්ෂූන් තිස්දහසක් වූහ. එකල බෝසත්හු අප 'පර්වත' නම් රජවී, ඇමති සේනාව පිරිවරා ශාස්තෘන් සමීපයට ගොස් ධර්මදේශනාව අසා බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට ආරාධනාකොට මහදන් පවත්වා උවටැන් කොට පාත්‍ර පත්තුණ, චීනවස්ත්‍ර, ලිහිල් කම්බල කෝසෙය්‍ය දුහුලී වස්ත්‍ර දන්වන් මිරිවැඩි ද අනෙක් බොහෝ පිරිකර ද පුදා ශාස්තෘන් වහන්සේ සමීපයේ පැවිදි විය. උන්වහන්සේද මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන් සේක. උන්වහන්සේ සෝභවතී නම් නගරයෙහි උපන්නේය. යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණ තෙමේ පියා විය. උත්තරා නම් බැමිණිය මව වූවාය. භිය්‍ය, උත්තර යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙනම වෙති. සොතිම්ප් යනු උපස්ථායක භික්ෂුවයි. සමුද්දා, උත්තරා යනු අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. දිඹුල් ගස බෝධිය විය. ශරීරය රියන් තිහක් උසය. වර්ෂ තිස්දහසක් ආයුෂ විත්දේය.

"කකුසඳ බුදුරදුන්ගෙන් මතු ලොවට පහනක් වැනි නරශ්‍රේෂ්ඨ වූ
ලෝකජ්‍යෙෂ්ඨ වූ කෝණාගමන ජිනේන්ද්‍රයාණන් වහන්සේ
ලොව පහළවූ සේක."

උන්වහන්සේට මතුකාලයේ කස්සප නම් ශාස්තෘන් වහන්සේ පහළවූ සේක. උන්වහන්සේටද එකම ශ්‍රාවක සන්නිපාතයකි. එහි විසිදහසක් භික්ෂූහු වූහ. එකල අප බෝධිසත්ත්වයෝ ජෝතිපාල නම් මානවකයා වී ත්‍රිවේදයේ පරතෙරට පැමිණ පොළොවේද අහසේද ප්‍රකට වූයේය. ඔහු සටිකාර කුඹල්කරුගේ මිත්‍රයා විය. හෙතෙම ඔහු සමග ශාස්තෘන් වෙත එළඹ ධර්මදේශනාව අසා පැවිදි වී, පටන්ගත් වීර්ය ඇතිව තුන්පිටකය ඉගෙන වත්පිළිවෙතින් බුද්ධශාසනය ශෝභාමත් කළහ. උන්වහන්සේද මෙතම බුදුවන්නේ යයි විය‍රණ දුන්හ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ උපන් නගරය බරණැස නම් විය. බ්‍රහ්මදත්ත නම් බමුණා පියා වූයේය. බඤ්ඤුමතී නම් බැමිණිය මව වූවාය. තිස්ස භාරද්වාජ යනු අග්‍ර ශ්‍රාවකයෝ දෙනම වූහ. උපස්ථායකයා සබ්බමිත්ත නමි. අනුලා, උරුවෙලා නමින් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙනමකි. නුගරුක බෝධියයි. ශරීරය විසිරියනක් උසය. වර්ෂ විසිදහසක ආයු කාලයක් වින්දේය.

"කෝණාගමන බුදුරදුන්ට පසුව සූර්යරාජයකු වැනි
ලොවට පහනක් වැනි ධර්මරාජන් වූ කස්සප බුදුරදුන්
පහළ වූ සේක."

යම් කල්පයක දීපංකර භාග්‍යවත්හු පහළ වේද, එම කල්පයෙහි තවත් බුදුවරු තෙනමක්ද වූහ. උන්වහන්සේලා සමීපයේ බෝධිසත්වයාණන්ට විවරණ දීමක් නොමැත. එහෙයින් ඔවුහු මෙහි නොපෙනෙත්. අට්ඨකථාවේ, තණ්හංකර බුදුරදුන්ගේ පටන් සියළු බුදුවරුන් පෙන්වීමට මෙය කියන ලදී :-

"තණ්හංකර මේධංකර තවද සරණංකර, දීපංකර
ලොවට පහනක් බඳු කොණ්ඩඤ්ඤ බුදුරදුන්ද,

මංගල, සුමන, රේවත එසේම සෝභිත, අනෝමදස්සි,
පදුම, නාරද, පදුමුත්තර

සුමේධ ද, සුජාත ද මහත් කීර්තිමත් පියදස්සි,
අත්‍ථදස්සි, ධම්මදස්සි, සිද්ධාර්ථ ලෝකනායකවරු

තිස්ස, ඵුස්ස සම්බුදුරදුන්ද, විපස්සී, සිඛී, වෙස්සභූ,
කකුසඳ, කෝණාගමන, කස්සප යන ශාස්තෘවරුද,

වීතරාගී වූ එකඟ වූ සිත් ඇති මේ සම්බුදුවරු වූහ.
මහ අඳුර දුරු කරමින් සූර්යරාජයා මෙන් උපන්නාහුය.
ශ්‍රාවක සංඝයා සහිත ඔවුහු ගිනිකඳන් සේ බැබළී
නිවුණෝය."

එහිදී අපගේ බෝධිසත්ත්වයෝ දීපංකර ආදි සිව්විසි බුදුවරුන්ගේ සමීපයේ ප්‍රාර්ථනා කරන්නේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක සිට පැමිණි සේක.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙන් පසුභාගයෙහි මේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ හැර, වෙනත් බුදුකෙනෙක් නම් නැත්තාහ. මෙසේ දීපංකරාදී සූවිසි බුදුවරුන්ගෙන් ලබන ලද, විවරණ ඇති බෝසතාණෝ,

"මිනිසත් භාවයද, ලිංග සම්පත්තියද, ශාස්තෘ කෙනෙකු දැකීමේ
වාසනාවද, පැවිදිවීමද, මහත් ගුණ සමූහයද බුදුවීමේ
දැඩි කැමැත්තද, මේ අෂ්ට ධර්ම ගැලපීමෙන් ප්‍රාර්ථනාව
සමෘද්ධ වේ"

යන මේ අෂ්ට ධර්ම සමාදන් වී, දීපංකර පාමුල කරන ලද අභිනීහාර ඇත්තේ, ඒකාන්තයෙන් සැමතැන බුද්ධකාරක ධර්මයේ සොයමීයි සොයන්නේ පළමු දාන පාරමිතාව දුටුවෙමි. දානපාරමිතා ආදී බුද්ධකාරක ධර්මයෝ දක්නා ලදි. ඒවා පුරමින් වෙස්සන්තර ආත්මභාවය දක්වා පැමිණියේය. එසේ පැමිණෙන්නේද පැමිණෙන්නාහු කරන ලද යම් ඒ අභිනීහාරයන්හි ආනිශංස වර්ණනා කරන ලදී.

මෙසේ සියළු අංගවලින් යුක්ත වූ, සම්පූර්ණ බුදුබවට නියත
පුද්ගලයෝ කල්ප කෝටි සියගණන් දිග සසර සැරිසරන්නාහු නමුදු
අවීචියෙහි නූපදිති. එසේම ලෝකන්තරිකවලද නූපදිති.
නිජ්ඣාම තණ්හික බුපිපාස කාලකඤ්ජක නොවෙති.

දුගතියෙහි ඉපදුන ද, ක්ෂුද්‍ර ප්‍රාණීහු නොවෙති. මිනිසුන් අතර
උපදනා ඔවුහු ජාත්‍යන්ධයෝ නොවෙති.

කර්ණ විකලතා නොවෙති. ගොළු නොවෙති. ස්ත්‍රීත්වයට නොයති.
උභතෝ ව්‍යඤ්ජක පණ්ඩක නොවෙති.

බෝධියට නියත උතුමෝ පරියාපන්න නොවෙති.
ආනන්තරිකයන්ගෙන් වෙන් වූවාහු හැමතන්හි පිරිසිදු චරියා
ඇත්තෝ,

කර්මවාදී කිරියවාදී දර්ශන ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිය ඇසුරු
නොකරති. ස්වර්ගයෙහි සිටියත් අසංඥ සත්තයෙහි නූපදිති.
සුදුවැසි දෙවියන් අතර ඉපදීමට හේතුවක් නොවෙයි.

නෛෂ්ක්‍රම්‍යයට නැමුණු සත්පුරුෂයෝ සසර නොඇලී
සියලු පාරමී පුරන්නාහු ලෝකාර්ථ චරියාවෙහි හැසිරෙති.

මේ ආනිශංස ලබා පැමිණියෝය. පාරමීදම් පුරන්නා වූ මගේ අකිත්ති බ්‍රාහ්මණ කාලයේද, සංඛ බ්‍රාහ්මණ කාලයේද, ධනංජය රාජ සමයේද මහා සුදර්ශන රාජ්‍ය කාලයේද, මහාගෝවින්ද කාලයේද, නිමි මහරජුගේ කාලයේද, චන්දකුමාර කාලයේද, විසය්හ සෙට්ඨි කාලයේද, සිවි රජුගේ කාලයේද වෙස්සන්තර රාජ කාලයේදැයි, දාන පාරමිතාව පුරණ ලද ආකාරයේ ප්‍රමාණයක් නම් නැත. ඒකාන්තයෙන්ම වන්න. සස පණ්ඩිත ජාතකයේ :-

"ආහාර පිණිස පැමිණියේ දැක - සිය ආත්මය පරිත්‍යාග කළෙමි
දානය හා සමාන දෙයක් මට නැත - මේ මගේ දාන පාරමිතාවයි

මෙසේ ආත්මභාවය පරිත්‍යාග කරන්නාවුගේ දාන පාරමිතාව, පරමත්ථ පාරමිතා නම් විය. එසේ සීලව රාජකාලයේ, එම්පෙය්‍ය නාරජු සමයේ. භූරිදත්ත නාරජු සමයේ. ඡද්දන්ත හස්තිරාජ කුලයේ ජයද්දිස රාජ පුත්‍ර වූ අලීනසත්තු කුමාර කාලයේ සීල පාරමිතාව පිරියයුතු අවස්ථාවන්ගේ ප්‍රමාණයක් නැත. මෙම අර්ථය වනාහි සංඛපාල ජාතකයේ:-

"හුල්වලින් විදිනු ලබන කල්හිද, සැත්වලින් කොටනු ලබන
කල්හිද, භෝජ පුත්‍රයා කෙරෙහි නොකිපියෙමි. මේ මගේ
සීල පාරමිතාවයි."

මෙසේ ආත්මය පරිත්‍යාග කරන්නහුගේ සීල පාරමිතාව පරමත්ථ පාරමිතා නම් වේ. එපරිදි සෝමනස්සකුමාර කාලයේද හත්ථිපාල කුමාර

කාලයේද, අයෝඝර පණ්ඩිත කාලයේද, මහරාජ්‍යය හැරදමා නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පුරණ ලද ආත්මවල ප්‍රමාණයක් නම් නැත. මේ අර්ථය වනාහි චූලසුතසෝම ජාතකයේ,

"අතට පත් මහාරාජ්‍යය, කෙළපිඬක් මෙන් ඉවත දැමුවෙමි.
බිඳකුදු ඇලීමක් නැතිව පරිත්‍යාග කළෙමි. මේ මාගේ
නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවයි."

මෙසේ සැකයෙන් ඇල්මෙන් තොරව රාජ්‍යය හැරදමා නික්ම ගියහුගේ නෙක්ඛම්ම පාරමිතාව, පරමාර්ථ පාරමිතා නම් වේ. එපරිදි විධුර පණ්ඩිත කාලයෙහි, මහාගෝවින්ද පණ්ඩිත කාලයේ, කුද්දාල පණ්ඩිත කාලයෙහි, අරකපණ්ඩිත කාලයේ, බෝධි පරිබ්‍රාජක කාලයේ, මහෞෂධ පණ්ඩිත කාලයෙහි ද ප්‍රඥා පාරමිතාව පුරණ ලද ප්‍රමාණයන්ගේ ප්‍රමාණයක් නම් නැත. එකම අවස්ථාවක් දක්වන්නේ නම් සත්තභත්ත ජාතකයේ සේනක පණ්ඩිත කාලයෙහි ;

ප්‍රඥාවෙන් සොයා බලා විසඳූ මම බ්‍රාහ්මණයා දුකෙන් මුදාලීමි.
ප්‍රඥාවෙන් මා හා සමානයෙක් නැත. (ප්‍රඥාව හා සමාන දෙයක් මට නැත.) මේ මාගේ ප්‍රඥා පාරමිතාවයි.

පසුම්බිය ඇතුළට ගියා වූ සර්පයා දක්වමින් බමුණා දුකින් මිදූ ප්‍රඥා පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් වේ. එපරිදිම විරිය පාරමිතාදියද, පුරණ ලද ගණනේ ආත්ම ගණනේ සීමාවක් නම් නැත. එකම අවස්ථාවක් දක්වන්නේ නම් මහාජනක ජාතකයේ, ඒ සම්බන්ධ තොරතුරු මහාජනක ජාතකයේ දැක්වේ :-

"තෙරක් නොපෙනෙන මහමුහුද මැද සියලු මිනිසුන් නැසෙද්දී
චිත්ත ධෛර්ය උපදවා වීර්යය වඩා මුහුදින් එතරවීම,
මගේ වීර්ය පාරමිතාවයි."

මෙසේ මහා සමුද්‍රය තරණය කර දිවි ගලවා ගැනීම් වීර්ය පාරමිතාවේ පරමත්ථ පාරමී නම් වේ. ඛන්තිවාදි ජාතකයෙහි :-

"තියුණු වූ පොරොවකින් චේතනා විරහිතව මට කොටන කල්හිද,
කසීරජු කෙරෙහි නොකිපියෙමි. ඒ මගේ ඛන්ති පාරමිතාවයි."

මෙසේ චේතනා රහිතව මෙන් මහා දුකක් ඉවසන්නහුගේ ක්ෂාන්තිය, ක්ෂාන්ති පරමාර්ථ පාරමිතා නම් වේ. මහා සුතසෝම ජාතකයේ පෙනෙන පරිදි :-

"සත්‍යය වචනයම රකින්නේ මගේ ජීවිතය හැර දමා,
එක්සියයක් රජවරුන් මුදවාලීමි. ඒ මගේ සත්‍ය පාරමිතාව වේ."

මෙසේ ජීවිතය හැරදමා සත්‍යය අනුව රැක ක්‍රියා කරන්නහුගේ සත්‍යය පාරමිතාව සත්‍ය පරමාර්ථ පාරමිතා නම් වේ. මුගපක්ඛ ජාතකයේ:-

"මට දෙමව්පියෝ අප්‍රිය නොවේ. මහා කීර්තියද අප්‍රිය නොවේ.
ඒ සියල්ලම වඩා සර්වඥතා ඥානය මට ප්‍රිය ය. එහෙයින්
ව්‍රතය අධිෂ්ඨාන කළෙමි."

මෙසේ ජීවිතය තොර වුවද, ව්‍රත අධිෂ්ඨානයෙහි පිහිටා කටයුතු කිරීම අධිෂ්ඨාන පාරමිතාවේ පරමාර්ථ පාරමී නම් වේ.
සාම ජාතකයේ:-

මා දැක කිසිවෙක් බිය නොවේ. මම ද කිසිවකු දැක බිය නොවෙමි.
මෛත්‍රී බලයෙන් ශක්තිමත් වූ මම හැමකල්හිම මහා වනයෙහි
සතුටින් වෙසෙමි.

මෙසේ ජීවිතය ද නොබලා මෛත්‍රිය වඩන බෝසතුන්ගේ මෛත්‍රී පාරමිතාව මෛත්‍රී පරමත්ථ පාරමිතා නම් වූයේය.
ලෝමහංස ජාතකයෙහි :-

මිනීඇට පොදියක් හිසට කොට්ටය වශයෙන් තබාගෙන,
මම සොහොන්බිමෙහි සැතපෙමි. ගොපලු දරුවෝ පැමිණ
විරූප රූප දක්වති. උසුළු විසුළු කරති.

මෙසේ ගම්දරුවෝ සමහරු කෙළගැසීම් කරති. සමහරු මල්දම් ගෙන උපහාර දක්වති. ඔවුන් මෙසේ කරද්දීත්, සැපදුක් වේදනා නොඋපදවා දෙපිරිස කෙරෙහිම මැදිහත්බවින් යුක්තව විසීමි. මෙසේ මැදිහත් බවින් යුකතව පිරූ උපෙක්ඛා පාරමිතාව උපෙක්ඛා පාරමිතා නම් වෙයි.

මේ දැක්වූයේ ඉතා කෙටියෙනි. මෙහි විස්තර චරියා පිටකයෙන් ගතයුතුය. විස්තර එහි ආයේය. මෙසේ පාරමිතාවන් පුරා වෙස්සන්තර ආත්මභාවයෙහි උපන්නේ,

සිත් පිත් නැති සුවදුක් පිළිබඳ හැඟීමක් නැති සිතිවිල්ලෙන් තොර මහපොළව දාන පාරමිතාවෙන් සත්වරක් කම්පා කරවීය.

මෙසේ මහපොළොව කම්පාකොට, මහා පින්කොට ආයුෂයාගේ කෙළවර වෙසතුරු ආත්මභාවයෙන් චුතව තුසිත දෙව්ලොව උපන්නේය.

මෙසේ දීපංකර පාද මූලයෙහි පටන්, යම් දවසක තුසිත දෙව්ලොව උපන්නේද, ඒ දක්වා වූ කථා පුවත දූරෙ නිදාන නම් වන්නේය.

බෝසතුන් තුසිත පුරයෙහි වසන්නා වූ කාලයෙහිම බුද්ධ කෝලාහලය හටගත්තේය. ලෝකයෙහි මහත් කෝලාහල තුනක් උපදී.

කල්ප කෝළාහල, බුද්ධ කෝළාහල සහ චක්‍රවර්ති කෝළාහල යනුවෙනි. එහි වර්ෂ සියදහස් ගණනක් ඇවෑමෙන් කල්පය හටගැනීම වන්නේ යයි ලෝකව්‍යවහාරයයි. කාමාවචර දෙවිවරු හිස පහත්කරගෙන කෙස් විසුරුවාගෙන කඳුළුපිරි මුහුණින් ගැලූ කඳුළු අත්වලින් පිසදමමින් රතු වස්ත්‍ර හැඳ අනිශය විරූපවේශධාරීව, මනුෂ්‍ය ලෝකයේ හැසිරෙන්නෝ මෙසේ දැනුම් දෙති. මෙයින් වර්ෂ සියදහස් ගණනක් ඇවෑමෙන් කල්පය හටගැනීම වන්නේය. මේ ලෝකය විනාශ වන්නාහ. මහා සමුද්‍රයද වියළෙයි. මේ මහපොළොව සිනේරු පර්වතරාජයාද, දැවෙන්නේය. විනාශ වන්නේය. බ්‍රහ්මලෝකය දක්වා ලෝක විනාශ වන්නේය. මෛත්‍රිය වඩව්! කරුණා මුදිතා උපේක්ෂා වඩව්! මවට උපස්ථාන කරවු! පියාට උපස්ථාන කරවු! කුලයේ වැඩිහිටියන්ට වතාවත් කරව්! යනුවෙනි. මෙය කල්ප කෝලාහල නම් වේ. වර්ෂ දහසක් ඇවෑමෙන් ලෝකයෙහි සර්වඥ බුදුරජාණන් වහන්සේ උපදින්නේ යයි, ලෝකපාලක දෙවිවරු, මෙතැන්සිට වර්ෂ දහසක් ඇවෑමෙන් ලොව බුදුකෙනෙකු උපදින්නේය යයි ඝෝෂා කරමින් ඇවිදිති. මෙය බුද්ධ කෝළාහල නම් වේ. වර්ෂ සීයක් ඇවෑමෙන් චක්‍රවර්ති රජු උපදින්නේ යයි උද්ඝෝෂණය කරමින් ඇවිදිති. මෙය චක්‍රවර්ති කෝළාහල නම් වේ. මේ කෝළාහල තුනම මහා කෝළාහල වෙති. මේවා අතර බුද්ධ කෝළාහල ශබ්දය අසා මුළු දසදහසක් සක්වළ

දේවතාවෝ එකට රැස්වී, අසවල් නම් සත්ත්වයා බුදුවන්නේ යයි දැන ඔහු වෙත එලඹ ආයාචනා කරයි. ආයාචනා කරනු කැමැත්තේ, පූර්ව නිමිති පහළවූ කල්හි ආයාචනා කරති. එකල වනාහි ඒ සියල්ලෝම එක එක චක්‍රවාලයේ හුන් අයද, චාතුම්මහාරාජිකයේ ශක්‍රයාද, සුයාම, සන්තුසිත, පරනිර්මිත වසවර්ති මහා බ්‍රහ්මාදීන් සමග එක සක්වළෙහි රැස්වී තුසිත භවනයේ වසන්නා වූ, බෝසතුන්ගේ සමීපයට ගොස් නිදුකාණනි, නුඹ විසින් දස පාරමිතා පුරණ ලද්දේ, ශක්‍ර සම්පත් නිසා නොව, බ්‍රහ්ම සම්පත් නිසා නොව, චක්‍රවර්ති සම්පත් නිසා නොව, පාරමිතා පුරණ ලද්දේ, ලෝකයෙන් එතෙරවීම පිණිස, සර්වඥතා ඥානය ප්‍රාර්ථනා කිරීම් වශයෙන්ම පුරණ ලද්දිය. නිදුකාණනි, ඒ ඔබට දැන් බුදුවීම පිණිස කාලයයි. බුදුබව පිණිස සුදුසු කාලයයි. ආයාචනා කළහ. ඉක්බිති බෝසත්හු, දේවතාවන්ට ප්‍රතිඥා නොදී කාලය, දීපය, දේශය, කුලය, මවගේ ආයුෂ කෙළවරවීම් වශයෙන් පංචමහා විලෝකන බැලුවේය. එහිදී කාලයද අකාලයදැයි පළමුව සුදුසු කාලය බැලුවේය. එහි වර්ෂ සියදහස් ගණනක් උඩට වැඩෙන ආයුෂ කාලය කාලය නම් නොවෙයි. කුමක් හෙයින්ද? එකල සත්වයන්ට ජාති ජරා මරණ ආදිය ප්‍රකට නොවෙත්. බුදුවරුන්ගේ ධර්මදේශනාද ත්‍රිලක්ෂණයෙන් මිදීමක් නම් නැත. ඒවායේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යයි කියන්නන්ට මේ කුමක් කියන්නේදැයි නොඇසිය යුතුය. නොඇදහිය යුතුයයි සිතති. ඒ නිසා සුදුසු කාලය නොවේ. එසේ නොමැතිකල්හි අනෙර්යාණික ශාසනයක් වෙයි. එහෙයින් එය අකාලයයි වර්ෂ සියයකට වඩා අඩු ආයුකාලයද අකාල නම් වෙයි. කුමක් හෙයින්ද? එකල සත්ත්වයෝ උඩට නැගුණු කෙලෙස් බහුලව වසති. කෙළෙස් උත්සන්න වූ කල්හි, දෙන ලද අවවාදද අවවාද තැන නොපිහිටයි. ජලයේ දණ්ඩක් මෙන් වහාම ඉවත්ව යයි. එහෙයින් එයද අකාලය. වර්ෂ සියදහසේ පටන් යටට වර්ෂ සියයේ උඩට ඇති ආයුකාලය කාලය නම් වේ. එකලද වර්ෂ සියයේ ආයු කාලයයි. ඉක්බිති බෝසත්හු ඉපදීමට සුදුසු කාලයදැයි බැලුවේය. ඉක්බිති දිවයින බලන්නේ පිරිවර සහිත සතර මහද්වීප බලා දිවයින් තුනක බුදුවරු නූපදිති. ජම්බුද්වීපයේම උපදිති. එයින් දීපයද බැලුවේය. අනතුරුව ජම්බුද්වීප නම් මහා දස දහසක් යොදුන් ප්‍රමාණ ඇති කවරනම් ප්‍රදේශයක බුදුවරු උපදින්නාහුද? ඉඩකඩද බලන්නේ මජ්ඣිම දෝෂය දුටුවේය. මජ්ඣිම දිශාව නම් පෙරදිගින් කජංගල නාම නියම්ගමයි. ඉන් පසුපස මහාසාලයයි අනතුරුව පසුසම ජනපදයෝ වලක්වා මැද පූර්ව දක්ෂ දිශාවෙහි, සල්ලවතී නම් නදියයි. ඉන් අනතුරුව පසුපස ජනපදයෙන් මෙතෙර මැද දකුණු දිශාවෙන්

සේතකණ්ණිකා නම් නියම්ගමයි. ඉන් අනතුරුව ප්‍රත්‍යන්ත ජනපදයෙන් මෙතෙර මැද පශ්චිම දිශාවෙහි ථූන නම් බ්‍රාහ්මණ ගමෙකි. ඉන් අනතුරුව ප්‍රත්‍යන්ත ජනපදයකි. උතුරු දිශාවෙන් උසීරද්ධජ නම් පර්වතයයි. ඉන් අනතුරුව ප්‍රත්‍යන්ත ජනපද වේ. මෙසේ විනයෙහි කියන ලද ප්‍රදේශය දිගින් යොදුන් තුන්සියයක්, පළලින් ඉන් අඩකි. වටප්‍රමාණය යොදුන් නවසීයකි. මේ ප්‍රදේශයේ බුදු, පසේබුදු, අග්‍රශ්‍රාවක, අසූමහා ශ්‍රාවක, චක්‍රවර්ති රජවරු වෙනත් මහේශාක්‍ය ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහසාල (සිටු) කුලවල අයද උපදිති. දැන් මෙහි කපිලවස්තු නම් නගරයක් ඇත. එහි මා විසින් ඉපදිය යුත්තේ කොහේද නිශ්චයකට පැමිණියේය. ඉක්බිති කුලය පිළිබඳ සලකා බලන්නේ බුදුවරු නම් වෛශ්‍ය කුලයෙහි හෝ ශුද්‍ර කුලයෙහි නූපදින්නාහ. ලෝක සම්මතයට අනුව ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි යනු කුල දෙකෙහි පමණක් උපදිත්. දැන් ක්ෂත්‍රිය කුලය ලෝක සම්මතයයි. එබැවින් එහි උපදින්නෙමි. සුද්ධෝදන නම් රජතුමා මගේ පියා වන්නේ යයි කුටුම්බය බැලුවේය. ඉක්බිති මව පිළිබඳ සළකා බලන්නේ බුද්ධ මාතාව නම් පුරුෂ ලෝලියක් හෝ සුරාලෝලී නොවෙයි. කල්ප දසදහසක පටන් පුරණ ලද පාරමී නිසා උපතේ පටන් නොකඩවා පංචසීලයෙහිම පිහිටයි. මේ මහාමායා දේවිය එබඳු ආකාර නිසා, මැය මට මව වන්නී යයිද, ඇයගේ ආයුෂ කොපමණද? උපරිම මාස දහයකුත් සත්දිනක් බව දුටුවේය. මෙසේ මේ පස්මහබැලුම් බලා මේ බුදුවීමට කාලය යයි, නිශ්චයකොට දේවතාවන්ට සංග්‍රහ කරින් ප්‍රතිඥා දී දෙව්වරුනි; නුඹලා යව්ලයයි ඒ දේවතාවෝ පිටත්කර යවා තුසිත දේවතාවන් විසින් පිරිවරණ ලද්දේ තුසිතපුරයේ නන්දන වනයට පිවිසියේය. සියළුම දිව්‍යලෝකවල නන්දන වනයන් ඇත. එහිදී දෙව්වරු ඔහුට "මෙතනින් චුතව සුගතියට යව! මෙතනින් චුතව සුගතියට යව!" යයි මෙසේ, පෙර කරන ලද කුසල කර්මයන්ගේ ඉඩකඩ සොයමින් හැසිරෙති. හෙතෙම මෙසේ දේවතාවන් විසින් කුසල් සිහිපත් කරනකල්හි පිරිවරණ ලදුව, එහි හැසිරෙන්නේම චුතවී මහාමායා දේවියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. ඔහුගේ පිළිසිඳගැනීම පිළිබඳව පිලිවෙල කථාවයි. එකල වනාහි කපිලවස්තු නගරයෙහි ඇසළ නැකැත් සැණකෙළිය විය. මහජනයා නැකැත් ක්‍රීඩා කරයි. මහාමායා දේවිය පුර මාසයේ සත්වෙනි දිනයේ පටන් පහ වූ සුරාපානයෙන් හා මල් සුවඳවිලවුන් දැරීමෙන් ද වැලකුණී. නැකැත් කෙළියෙන් සතුටුවන්නී සත්වෙනි දිනයේ උදේම නැගිට සුවඳ පැන්වලින් ස්නානයකොට, හතළිස් දහසක් වියදම්කොට මහදන් දී සියලු අලංකාරවලින් සැරසී සිට, උදේ භෝජනය වළඳා උපෝසථ අංග අධිෂ්ඨාන

කොට අලංකාරයෙන් පිළියෙළ කළ සිරියහන් ගබඩාවට පිවිස සිරියහනේ හොත්තී, නින්දට වැටෙද්දීම මේ සිහිනය දුටුවාය.

සතරවරම් මහරජවරු සයනයත් සමග ඔසවා හිමාලයට ගෙන ගොස් සැටයොදුන් හිරියල් ගල්තලාවේ තබා යොදුන් හතක් පමණ, මහසල් ගසක් යට තබා, එකත්පසක සිටියහ. ඉක්බිති ඔවුන් දේවිය රැ ගෙන විත් දේවිය අනොතප්ත විල දෙසට ගෙන ගොස්, මිනිස් කිළිටි දුරුකිරීම පිණිස, නාවා දිව්‍ය වස්ත්‍ර අන්දවා සුවඳ දෑ ආලේපනය කරවා දිව්‍යමල් මාලා පළඳවා අනතුරුව රිදී පර්වතයට නුදුරෙහි රන් විමනක් ඇත. එහි නැගෙනහිරට හිසලා දිව්‍ය සයනයක් පනවා වඩා හිඳුවෝය. ඉක්බිති බෝසත් සුදු ඇතකු වී ඒ නුදුරෙහි එක් ස්වර්ණ පර්වතයක හැසිර එතැනින් බැස, රිදී පර්වතයට නැග උතුරු දිශාවට අවුත් රිදීපාට වර්ණයෙන් යුතු සොඬෙන්, සුදු පියුමක් ගෙන කුංචනාද කොට රන්විමනට පිවි, මවගේ යහනාව තෙවරක් ප්‍රදක්ෂිණාකොට දකුණු ඇලය පලා කුසට පිවිසි ආකාරය විය. මෙසේ උතුරුසල් නැකතින් පිළිසිඳ ගත්තේය. දෙවන දිනයේ පිබිදුණු දේවිය ඒ සිහිනය රජුට දැන්වීය. රජු හැටහතරක් බමුණු උගතුන් කැඳවා හරිතවර්ණයෙන් ආලේප කරන ලද, පොරි ආදි ඉසි කරන ලද මංගල භූමියක සිරියෙන් මහාර්ඝ ආසන පනවා එහි හුන්නා වූ බමුණන්ට ගිතෙල් මී සකුරු ආදියෙන් සමන්විත කිරිබත් පිළියෙළ කොට රන් පාත්‍රවලට දමා රන් රිදී භාජනවලින් වසා පිළිගැන්වීය. වෙනත් වස්ත්‍ර පළඳනා ගව මහිෂාදියද දී ඔවුන් සතුටු කරවා ඉක්බිති ඒ සියළු කාම සම්පත්වලින් සන්තර්පණය වූ බමුණන්ට සිහිනය ගැන දැනුම් දී කුමක් සිදුවන්නේදැයි විචාළේය. බමුණෝ කීවාහුය. "මහරජ, නොසිතුවු! දේවියගේ කුසේ ගැබක් පිහිටියේය. එයද පුරුෂ ගර්භයකි. ස්ත්‍රී ගර්භයක් නොවේ. ඔබට පුතකු ලැබෙන්නේය. ඉදින් ඔහු ගිහිගෙය වසන්නේ නම් චක්‍රවර්ති රජ වන්නේය. ඉදින් ගිහිගෙය නික්ම පැවිදි වන්නේ නම් බුදුවන්නේය. ලෝකයෙහි පැවැත්ම වෙනස් කරන්නේය.

බෝසතුන් මව්කුසෙහි පිළිසිඳ ගන්නා මොහොතෙහි එකහ හඬින් සියලු දසදහසක් ලෝකධාතුව කම්පා විය. විශේෂයෙන් කම්පා විය. බලවත් සේ වෙව්ලුවේය. දෙතිස්මහ පූර්ව ලක්ෂණ පහළ වූහ. දසදහසක් සක්වළ අපමණ ආලෝකය පැතිරුණේ විය. ඒ ඓශ්වර්යය දකිනු කැමැත්තන්ට දැකීමට අන්ධයෝ ඇස් ලැබූහ. බිහිරෝ ශබ්ද ඇසූහ. ගොළුවෝ කථාබස් කළහ. කුදුවූවෝ සෘජු වූද, පිළුවෝ (සාමාන්‍ය) පියවරින්ද

ගමන් කළහ. බන්ධනාගාරගත සියළු සත්ත්වයෝ විලංගු ආදියෙන් මිදුණාහ. සියලු අපායවල ගිනි නිවුනි. ප්‍රේතයන් විෂයෙහි සා පිපාසාව සංසිඳුනාහ. තිරිසන්ගත අයට බියක් නොවීය. සියළු සතුන්ගේ රෝග නිවාරණය විය. සියලු සත්ත්වයෝ ප්‍රියවචන ඇත්තෝ වූහ. මිහිරි ආකාරයෙන් අශ්වයෝ හේෂාරවය කළහ. ඇත්තු කුංචනාද කළහ. සියළුම තූර්යනාද ස්වකීය ස්වකීය නාදය තුමුම නිකුත් කළහ. නොගැටෙන ලද මිනිසුන්ගේ අත-පය පළඳින ආභරණ නාද කළහ. සියළු දිශාවන් ඉතාම ප්‍රසන්න විය. සත්ත්වයන්ට සැප උපදවනු කැමැත්තේ මෘදු සීතල සුළං හැමීය. අකල් වැසි වැස්සේය. පොළොවෙන් ජලය උඩට පැන නැග පැතිරුණේය. පක්ෂීහු ආකාශ ගමන් වැලැක්වූහ. නදීහු ගලා නොබැස්සහ. මහා මුහුදු ජලය රසවත් විය. සියළු තැනකදීම පස්පියුමෙන් ගැවසුණු ගොඩබිම විය. ගොඩබිම සහ සියළු ජලාශවලද මල් පිපුණේය. ගස් කඳන්වල මැද පියුම්ද, අතුවල අතු පියුම්ද, වැල්වල වැල්පියුම්ද පිපුණාහ. ඝන ගල්තලා බිඳී ඒ මත්තෙහි සියක් පෙති පිහිටා නෙළුම්දඬු නික්මුණහ. අහසේ එල්ලෙන පියුම් එල්ලී සිටියහ. හාත්පස මල් වර්ෂාවක් වැස්සාහ. අහසේ දිව්‍ය තූර්ය නාදවලින් නාද වූහ. සියලු දසදහසක් ලෝකධාතුව වටකොට විසුරුණු මල්දාම මෙන් උඩට එසවී බැඳුණු මල්කලප් මෙන් අලංකාරයෙන් පිළියෙළ කළ මල් ආසනයක් මෙන්ද එකම මල් මාලාවකින් සැලෙන්නා වූ වල්විදුනාවක් මෙන්, මල්සුවඳවලින් තැවරුණේ, අතිශය සෞභාග්‍යයෙන් පිරුණේ විය.

මෙසේ ගන්නා ලද පිළිසිඳගැනීම් ඇති, බෝසතුන්ගේ පිළිසිඳ ගැනීමේ පටන් බෝසතුන්ටද, බෝසත් මෑණියන්ටද උවදුරු දුරුකිරීම පිණිස කඩු ගත් අත් ඇති, දේවපුත්‍රයෝ සතරදෙනා අරක්ගෙන සිටියහ. බෝසතුන්ගේ මෑණියන්ට පුරුෂයන් කෙරෙහි රාග සිතක් නූපන්නීය. ලාභයෙන් ද කීර්තියෙන්ද අග පැමිණියේ විය. සුවපත් වූ ක්ලාන්ත නොවූ සිරුර ඇත්තීය. බෝසතාණන් මව්කුස ඇතුළත සිටියේ පිරිසිදු මාණික්‍යරත්නයක අවුලන ලද පඬුවන් පැහැති නූලන් මෙන් පෙනේ. යම් හෙයකින් බෝසතුන් විසින් වාසය කරන ලද කුස, චෛත්‍යය ගර්භයක් හා සමානය. අනෙක් සත්ත්වයෙකුට එසේ වාසය කිරීමට හෝ පරිභෝග කිරීමට නොහැකිය. එහෙයින් බෝසත් මව බෝසතුන් ඉපිද සත්දිනකින් කලුරියකොට තුසිතපුරයේ උපදී. යම්සේ අනෙක් ස්ත්‍රීහු දසමස නොපිරිද, ඉක්මවාද හිඳගෙනද සයනය කරද ප්‍රසූත කරත්ද බෝසත් මව එසේ නොවේ. ඇය වනාහි බෝසතුන් දස මාසයක් කුසින් දරා සිටියේම ප්‍රසූත

කරයි. මේ බෝසත් මවගේ ධර්මතාවකි. මහාමායා දේවියද පාත්‍රයේ තෙල් මෙන් දස මාසයක් කුසින් බෝසතුන් දරාගෙන පිරිපුන් ගැබ ඇත්නී නෑ ගෙදර යනු කැමැත්නී, සුද්ධෝදන මහරජුට දැනුම් දුන්නීය. රජතුමනි, මම කුලගෙදර වූ දෙව්දහනුවරට යන්නට කැමැති වෙමි. රජු මැනැවැයි කියා පිළිගෙන කපිලවස්තුවේ සිට දෙව්දහනුවර දක්වා මාර්ගය සමකොට, කෙසෙල් පුන්කලස්, ධජපතාක ආදියෙන් අලංකාර කොට දේවි රන්සිවි ගෙයක වඩාහිඳුවා ඇමතියක් දහසක් ආරක්ෂාව සඳහා යොදවා මහත් පිරිවරින් යැවීය. නගර දෙක අතර දෙනුවරවාසීන්ටම අයත් ලුම්බිණි වන නම් මංගල සල්ලයනක් ඇත. එසමයේ මුල පටන් අතු අග දක්වා මුළුමනින්ම එකට පිපීගිය මල් ඇත්තේ විය. අතු අතරද, මල් අතරද, පංච වර්ණැති බඹර සේනාවෝ නොයෙක් ආකාර පක්ෂි සේනාවද මිහිරිහඬින් නාද කරමින් හැසිරෙත්. මුළු ලුම්බිණි වනය, චිත්‍රලතා වනය හා සමානව මහානුභාව සම්පන්න රජුන් සඳහා මනාව සරසන ලද, ආසන මණ්ඩලයක් මෙන් විය. දේවියට එය දැක සල්වනයේ විවේකව ගතකිරීමට සිත් පහළ වූවාය. ඇමතියෝ දේවිය ගෙන සල්වනයට පිවිසුණහ. ඇය මංගල සල්ගස මුලට පැමිණ, සල්අත්තක් ගනු කැමැත්නී වූවාය. සල්අත්ත මනාව සකස්කළ චේවැලක් මෙන් නැමී, දේවියගේ අත සමීපයට එළඹුණේය. ඇය අත දිගුකොට අතුඅග ඇල්ලීය. එකෙණෙහි කර්මජ වාතය සැලුණාහ. ඉක්බිති ඇය වටකොට වටතිරයක් ඇද මහජනයා ඉවත් කළේය. සල්අත්ත ගෙන සිටින්නියගේම ගැබ නික්මීම විය. එකෙණෙහිම මහා බ්‍රහ්මයෝ සත්දෙනෙක් රන්දැලක් ගෙන පැමිණියාහු, ඒ රන්දැලින් බෝසතුන් පිළිගෙන මව ඉදිරියේ තබා සතුටු සිත් ඇතිව දේවිය බලන්න, මහේශාක්‍ය පුතකු ඔබට උපන්නී යයි කීහ. යම්සේ වනාහි අනෙක් සත්ත්වයෝ මව්කුසෙන් නික්මෙන්නා පිළිකුල් සහගතව අසූචි තැවරී නික්මෙතිද බෝසතුන් එසේ නොවේ. ඔහු වනාහි ධර්මාසනයෙන් බසින ධර්ම කථිකයෙකු මෙන්, හිණිමගෙන් බසින පුරුෂයකු මෙන්, අත්දෙක ද පා දෙක ද දිගුකොට සිටියේම මව්කුසින් උපන්නේය. කිසිදු අශුචි මල මූත්‍ර නොවීය. පිරිසිදුව, සිහිපත්ව කසී වස්ත්‍රයෙක තැබූ මිණිරුවනක් මෙන්, බබළමින් මව්කුසයෙන් නික්මුණේය. එසේ වුවද බෝසතුන්ගේද, බෝසත් මවගේද සත්කාරය පිණිස අහසින් ජලධාරා දෙකක් නික්ම බෝසතුන්ගේද මවගේද ශරීරයෙහි ඍතු ගැන්වීය. ඉක්බිති හෙතම රන්දැලින් පිළිගෙන සිටි මහා බ්‍රහ්මයන්ගේ අතින් සතරවරම් මහරජවරුද, මංගල සම්මත වශයෙන් සුව ස්පර්ශය පිණිස අඳුන්දිවි සම් ඇතිරියෙන් පිළිගත්හ. ඔවුන්ගේ අතින් මිනිස්සුද දුනුල්

වස්ත්‍රයකින් පිළිගත්හ. මිනිසුන්ගේ අතින් මිදී පොළොවේ පිහිටියේ (නැගෙනහිර) පෙර දිශාව බැලුවේය. නොයෙක් දහසක් සක්වල එකම අංගනයක් මෙන් විය. එහි දෙව් මිනිස්සු සුවඳ මල් ආදියෙන් පුදනු ලබන්නාහු, "මහා පුරුෂයා මෙලොව ඔබ හා සමාන අනෙකෙක් නැත. කෙසේ උත්තරීතර අයෙක් කොහිදැයි ඇසූහ." මෙසේ සතර දිශාවද අනුදිශාද, යට, උඩ දස දිශාවලද සොයාබලා තමන් හා සමාන කිසිවෙකු නොදැක මේ උතුරුදිග බලා පියවර සතකින් ඉදිරියට ගියේය. මහා බ්‍රහ්මයා විසින් සුදුකුඩ දරනු ලබන්නේ, සුයාම විසින් වල්විදුනාවකින්ද, අනෙකුත් දෙවිවරුන් විසින් සෙසු රාජ කකුධ භාණ්ඩද අතැතිව, අනුගමනය කරන්නේ සත්වන පියවරෙහි සිටියේ **"අගොහා හමස්මි ලොකස්ස"** ආදී ශ්‍රේෂ්ඨ වචන නිකුත් කරමින් සිංහනාද කළේය.

බෝසත්හු ආත්මභාව තුනකදී මව්කුසින් නික්මෙනවිට වචන නිකුත් කළේය. "මහෞෂධ ආත්මභාවයේද, වෙස්සන්තර ආත්ම භාවයේද, මේ ආත්ම භාවයේද වශයෙනි. මහෞෂධ ආත්මභාවයේදී මව්කුසින් නික්මෙන්නේම ශක්‍ර දිව්‍යරාජයා පැමිණ, සඳුන් හරයක් අතේ තබා ගියේය. හෙතම එය මිටෙන් ගෙන නික්මුණේය. ඉක්බිති ඔහුගේ මව දරුව, කුමක් රැගෙන ආවේදැයි විචාළාය. මෑණියනි, 'ඖෂධ' යයි කීය. ඖෂධ රැගෙන පැමිණි බැවින් ඖෂධ කුමාරයා යයි නම් කළද ඒ ඖෂධ ගෙන ජල හැළියක බහාලූහ. ආවා වූ නොආවා වූ අදගොළු බිහිරන්ට එයම සියළු රෝග සංසිඳවීම පිණිස බෙහෙතක් විය. තවද මෙය මහත් ඖෂධයයි උපන් අදහස ඇති බැවින් එම වචන නිසා මහෞෂධ යයි ඔහු නම් තැබීය. වෙස්සන්තර ආත්මභාවයේ මව්කුසින් නික්මෙන්නේ දකුණු අත දිගුකොට මෑණියනි! ගෙයි කිසිවක් තිබේද? දානයක් දෙන්නෙමියි, මවට පවසමින් නික්මුණේය. ඉක්බිති ඔහුගේ මව "ධනය සහිත පවුලක උපන්නෙහි යයි" පවසා පුතුගේ අත තමන්ගේ අත්තලයෙහි තබා, රන්බැඳි දහසක පියල්ලක් තැබුවාය. මේ ආත්මභාවයේදී මේ සිංහනාදය කරයි. මෙසේ බෝධිසත්ත්වයෝ ආත්මභාව තුනක මව්කුසෙන් නික්මෙන්නේම වචන නිකුත් කළේය. යම්සේ පිළිසිඳ ගැනීම් මොහොතේ, උපන් ක්ෂණයේද, ඔහුට දෙතිස් පෙරනිමිති පහළ වූහ. යම්කිසි කාලයක අපගේ බෝධිසත්ත්වයෝ ලුම්බිණි වනයේ උපන්නේද, එම දිනවලම **රාහුල මව-දේවිය, ආනන්ද, ඡන්න ඇමති, කාලුදායි ඇමති, කන්ථක අශ්වරාජයා, බෝධිවෘක්ෂය, සතරමහා නිධාන** පහළ වූහ. එහි එක නිධානයක ගව්වක් පමණි. එකක් අර්ධ යොදුක් පමණි. තව එකක් නම් තුනක් පමණි.

අනෙක යොදුනක් පමණි. තව එකක් ගම් තුනක් පමණි. අනෙක යොදුනක් පමණි. ගැඹුරු බැවින් පොළොව කෙළවරම පිහිටියේය. මේවා 'සත්ත සහජාත' වස්තු නම් වේ.

දෙනුවර වැසියෝ බෝසතුන් පිළිගෙන කපිලවස්තු පුරයටම ගියහ. එදවස "කපිලවස්තු පුරයේ සුද්ධෝදන මහරජුට පුතෙකු උපන්නේය. මේ කුමරා බෝමුල හිඳ බුදුවන්නේ" යයිද තුටුපහටු සිත් ඇති තව්තිසා භවනයේ දේව සමූහයා පිළි සිසාරා ප්‍රීති උත්සව පවත්වමින් ක්‍රීඩා කළහ. එකල සුද්ධෝදන මහරජුගේ කුලුපග අෂ්ට සමාපත්තිලාභී කාලදේවල නම් තාපසයා බත්කිස නිමකොට දිවා විහරණය පිණිස තව්තිසා භවනට ගොස් එහි දිවා විහරණය හුන්නේ, ඒ දේවතාවන් එසේ ක්‍රීඩා කරනු දැක "කුමන කරුණක් නිසා නුඹලා මෙසේ සතුටු සිතින් ක්‍රීඩා කරමිද?" "මට ඒ කාරණය කියවු" යයි කිවේය. දේවතාවෝ කිහ. "නිදුකාණනි, සුද්ධෝදන මහරජුට පුත්‍රයෙක් උපන්නේය. හෙතම බෝමැඩ හිඳ, බුදුවී ධම්මචක්කය පවත්වන්නේය. ඔහුගේ අනන්ත බුද්ධලීලාව දකින්නෙමු. ධර්මය අසන්නෙමු. එහෙයින් සතුටු වන්නෙමු යනුවෙන් කිහ. මේ කාරණයෙන් අපි සතුටු වන්නෙමු. තාපසයා ඔවුන්ගේ වචන අසා වහාම දෙව්ලොවින් බැස රාජ මන්දිරයට පිවිස, පනවන ලද ආසනයේ හුන්නේ, "මහරජ, ඔබට උපන් පුත්‍රයා බලනු කැමැත්තෙමි" කිවේය. රජු අලංකාරයෙන් පිළියෙල කළ කුමාරයා ගෙන්වාගෙන තාපසයා වැන්දවීමට යොමු කළේය. බෝසත්හුගේ පාදයෝ පෙරලී අවුත්, තාපසයාගේ ජටාවේ පිහිටුවූහ. බෝසතුන්ගෙන් ඒ ආත්මභාවයේදී වැඳුම් ලැබිය යුතු අන් අයකු නම් නැත. ඉදින් නොදන්නා බැවින් බෝසතුන්ගේ හිස, තාපසයාගේ හිස්මුදුන තැබුවෝද? ඔහුගේ හිස්මුදුන සත්කඩකට පැලෙන්නේය. තාපසයා මගේ ආත්මය (තමන්) නසන්නට නුසුදුසුයයි අසුනින් නැගිට බෝසතුන්ට ඇදිලිබැඳ වැන්දේය. රජු ඒ අසිරිය දැක තමන්ගේ පුතා වැන්දේය. තාපසයා අතීතයේ කල්ප හතළිහක්ද අනාගතයේ කල්ප හතළිහක්දැයි, අසූ කල්පයක් සිහිකරයි. බෝසත්හුගේ ලක්ෂණ සම්පත්තිය දැක "මෙතෙම බුදුවන්නේද නැතහොත් නැද්දැයි" ආවර්ජනා කොට සලකන්නේ නිසැකයෙන්ම බුදුවන්නේ යයි දැන, මේ පුරුෂයා ආශ්චර්යය මෙනෙහිකොට අනතුරුව "මම මේ බුදු උතුමා දකින්නට ලැබෙන්නෙමිද නැද්දැයි" සලකන්නේ, "නොලබන්නෙමි. අතරතුර කලුරියකොට බුදුන් සියයකුදු බුදුන් දහසකුදු වෙත ගොස් අවබෝධ කිරීමට නොහැකිවන්නේ අරූපභවයේ උපදින්නෙමි"යි දැක "මෙබඳු ආකාර ආශ්චර්ය පුද්ගලයෙකු බුදුවනවා දැකීමට

නොලැබෙන්නෙමියි, මහත් දුක් ඇතිවන්නේ යයි ඇඬුවේය. මිනිසුන් මෙය දැක අපගේ ආර්යයා, දැන් සිනහවී යළි අඬයි. කිම ස්වාමිනි, අපගේ ආර්ය පුත්‍රයාට කිසියම් අනතුරක් වන්නේද? ඔහුගෙන් විචාලහ. ඔහුට අනතුරක් නැත. නිසැකයෙන්ම බුදු වන්නේ ය. ඉක්බිති කුමක් හෙයින් ඇඬුවෙහිද? මෙබඳු ආකාර බුද්ධ භූමියට පත්වන පුරුෂයකු දැකීමට නොලබන්නෙමි. මගේ මරණය සිදුවන්නේ යයි, තමන්ට මහත් හානියක් සිදුවන්නේ යයි ශෝක කරමින් හඬමි'යි කීවේය. ඉක්බිති ඔහු මගේ ඤාතීන් අතර කිසිවකු මේ සම්බුද්ධයන් දැකීමට ලබන්නේද, නොලබන්නේදැයි සලකන්නේ, තමන්ගේ බෑණා වූ නාලක දරුවා දුටුවේය. ඔහු නැගනියගේ ගෙදරට ගොස්, "ඔබගේ පුතු නාළක කොහේදැයි විචාළේය. ආර්යනි, නිවසේය. "ඔහුට අඬගසන්න." කැඳවා තමන්ගේ සමීපයට ආවා වූ කුමරුට මෙසේ කීවේය. දරුව; සුද්ධෝදන මහරජුගේ කුලයෙහි පුතකු උපන්නේය. මෙතෙම බුද්ධාංකුරයෙකි. පන්තිස්වසක් ඉක්මවා, බුදුවන්නේය. නුඹට මෙතෙම දැකීමට ලැබෙන්නෙහිය. අදම පැවිදිවන්න. අසූහත් කෝටි ධනක් ඇති කුලයක උපන්නා වූ දරුවා "මට මාමා අනර්ථයක් නොකරන්නේය යයි සිතා එකෙණෙහිම ඒකාංශකොට කෂාවස්ත්‍ර පොරවා මැටි පාත්‍රයක්ද ගෙන කෙස් රවුල් බහා කෂා වස්ත්‍ර හැඳ, "ලෝකයෙහි යම් උත්තම පුද්ගලයෙක් වේද, ඔහු උදෙසා මගේ පැවිද්ද යයි බෝසතුන් දෙසට අභිමුඛව ඇඳිලිබැඳ පසඟ පිහිටුවා වැඳ පාත්‍රය සම්කඩකින් වටකොට, එක් උරහිසක එල්ලාගෙන, හිමාලයට පිවිස මහණ දම් කළේය. හෙතම ප්‍රථම අභිසම්බෝධියට පත් තථාගතයන් වෙත එලඹ නාලක ප්‍රතිපදාව කියවා නැවත හිමාලයට පිවිස අරහත් ඵලයට පැමිණ, උතුම් ප්‍රතිපදාවට පිළිපන්නේ, මාස හතක් ආයුෂ රැක එක් ස්වර්ණ පර්වතයක් ඇසුරුකොට සිටියේම අනුපදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ සේක.

පස්වෙනි දවසේ බෝසතුන් හිසෙහි නහවා "නම් තැබීම කරවන්නෙමු"යි රජමැදුර සිටු දෑ සුවඳවලින් ආලේපනය කොට, ලද පස්මල් විසුරුවා, නොඉඳුල් කිරිබතක් උයවා, ත්‍රිවේදය පරතෙරට ගිය එකසිය අටක් බමුණන් කැඳවා, රාජ භවනයේ වඩාහිඳුවා, රසමසවුලෙන් සන්තර්පණය කරවා, මහ සත්කාර කොට "කුමක් වන්නේදැයි ලක්ෂණ පරීක්ෂා කළහ. ඔවුහු අතර :-

"රාම, ධජ, ලක්ඛණ, කොණ්ඩඤ්ඤ,
භෝජ, සුයාම, සුදත්ත, මන්ති

යන මේ වේදාංග සයෙහි කෙළ පැමිණි මෙම බමුණන් අටදෙනා මෙසේ ප්‍රකාශ කළහ.

මේ බමුණන් අටදෙනා අංග ලක්‍ෂණ විද්‍යාවෙහි සම්ප්‍රාප්තයෝ වූහ. පිළිසිඳ ගන්නා ලද දවසේ දුටු සිහිනයේද (මතකයන්) මේ කාරණයද විචාරණ ලදී. මේ අය අතුරින් සත්දෙනෙක් ඇඟිලි දෙකක් ඔසවා, කරුණු දෙකක් විවරණ කළහ. "ඉදින් මේ ලක්‍ෂණවලින් යුක්ත වූවෝ ගිහිගෙය වසන්නේ නම් චක්‍රවර්ති රජ වන්නේය. ඉදින් පැවිදි වන්නේ නම් බුදුවන්නේය" යනුයි. චක්‍රවර්ති රජුගේ සියලු ශ්‍රී සම්පත් ප්‍රකාශ කළහ. ඔවුන් අතර ළාබාලම වූ ගෝත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් බමුණා බෝසතුන්ගේ උතුම් දේහ ලක්‍ෂණ පිහිටීම බලා "මොහුගේ ගෘහවාසයේ අදාළ කරුණු නැත. ඒකාන්ත වශයෙන්ම කෙළෙස් නසා බුදුවන්නේම යයි එකම ඇඟිල්ලක් ඔසවා එකම විවරණයක් ප්‍රකාශ කළේය. මෙතෙම කරන ලද ප්‍රාර්ථනා ඇත්තේ, පශ්චිම භවික සත්ත්වයෙකු වූයේ, ප්‍රඥාවෙන් සෙසු සත්ත්ව සමූහයා අභිබවා සිටින්නේ, මේ වැනි ලක්‍ෂණවලින් සමන්නාගත වූ බෝසතුන්ගේ ඒකාන්ත බුද්ධභාවය සංඛ්‍යාත එකම ස්වභාවය දුටුවේය. එහෙයින් එක් ඇඟිල්ලක් ඔසවා මෙසේ ප්‍රකාශ කළේය. ඉක්බිතිවැ ඔහුට නම් තබන්නේ සියලු ලොවට අර්ථ සිද්ධිය කරන බැවින් "සිද්ධත්‍ථ" යයි නම් කළහ. ඉක්බිති ඒ බ්‍රාහ්මණයෝ තමන්ගේ ගෙවල්වලට ගොස් පුතුන් ඇමතූහ. "දරුවනි; අප මහලුය. සුද්ධෝදන මහරජුගේ පුත්‍රයා සර්වඥතා ඥානයට පත්ව සම්පූර්ණත්වයට පත්වන්නාහ. අප හිටියත් නැතත් නුඹලා ඒ කුමරු සර්වඥ බවට පත්කල්හි උන්වහන්සේගේ සමීපයේ පැවිදි වෙවු! ඒ බමුණන් සත්දෙන ආයුෂ ඇති පරිදි සිට කම්වූ පරිදි ගියහ. කොණ්ඩඤ්ඤ මානවකයා නිරෝගී විය. හෙතෙම බෝසත්තුමා තරුණවියට පත්ව, මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්මී, පැවිදිවී, පිළිවෙළින් උරුවෙල් ජනපදයට ගොස්, "මේ භූමිභාගය ඉතා සිත්කළුය. රමණීයයි. ප්‍රධන් වීර්ය වඩන කුලපුත්‍රයකුට ප්‍රධන් වීර්ය වැඩීම පිණිස මෙය ඉතා සුදුසුය." සිත උපදවා එහි වාසයට පැමිණි කල්හි, මහා පුරුෂයා පැවිදි වූයේ යයි අසා අනෙක් බමුණන්ගේ පුතුන් වෙත එළඹ, මෙසේ කීවේය. සිද්ධාර්ථ කුමාරයා පැවිදි වූයේය. හෙතම නිසැකයෙන්ම බුදු වන්නේය. ඉදින් නුඹලාගේ පියවරු නීරෝගි වූවාහු නම් අද නික්ම පැවිදි වන්නෙහු. ඉදින් නුඹලාද කැමැති වවු නම්, එවු! මම මහා පුරුෂයා අනුව පැවිදි වන්නෙමි. ඒ සියල්ලෝ එක අදහසක පිහිටීමට නොහැකි වූහ. ඔවුන් අතර තිදෙනෙක් පැවිදි නොවූහ. කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා

ජ්‍යෙෂ්ඨ කොට ඔවුන් අතර සෙසු සිවුදෙනා පැවිදි වූහ. ඒ පස්දෙනා පංචවග්ගිය තෙරවරු යයි හැඳින්වූහ.

එකල සුද්ධෝදන මහරජු "කුමක් දැක මගේ පුතා පැවිදි වන්නේදැ"යි විචාලේය. "සතර පෙරනිමිති වෙති." "කවර කවර දේවල්ද?" "මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදිරුවක් යනුවෙනි." රජු මෙකැන් පටන්ම මෙබඳු රූප මගේ පුතාගේ සමීපයට නොඑළඹේවාඩයි සමීපයට ඒමට ඉඩ නොදෙවු! මගේ පුතාට බුදුබවෙන් වැඩක් නැත. මම මගේ පුතා දෙදහසක් පිරිවර දිවයින් සහිත සතරමහා ද්වීපයෙහි, ඉසුරුමත්ව සක්විති රජකු කරන්නෙමියි, තිස්හය යොදුන් පරිමණ්ඩලයේ පිරිස පිරිවර කොටගෙන, අහස්තලයේ හැසිරෙමින් ඉඩකඩ දකිනු කැමැති වේවා. මෙසේ පවසා, මේ ප්‍රාකාර සතර තුළට මෙබඳු නිමිති කුමාරයාගේ ඇස් මානයට පැමිණීම වැලැක්වීම සඳහා සතර දිශාවල ගව්වෙන් ගව්ව ආරක්ෂාව තැබීය. එදවස මංගල අවස්ථාවේ රැස්වුනා වූ අසූදහසක් ඥාති කුල අතර එක එකා එක එක පුත්‍රයා බැගින් "මෙතම බුදුවේවා හෝ රජ වේවා! යි එක එක පුතකු බැගින් දෙමු. ඉදින් බුදුවන්නෙහි නම්, ක්ෂත්‍රිය ශ්‍රමණ පිරිසක් පිරිවරා හැසිරෙන්නේය. ඉදින් රජවන්නේ නම් ක්ෂත්‍රිය කුමාරයන් පිරිවරා හැසිරෙන්නේ"යයි දරුවන් දුන්හ. රජුද බෝසතුන්ට උතුම් රූපසම්පන්න වූ, පහවූ සියළු දොස් ඇති, කිරි මව්වරුද යොදවනු ලැබීය. බෝසත් තෙමේ මහත් පිරිවරින් මහත් වූ සිරි සෞභාග්‍යයෙන් වැඩෙයි. ඉක්බිති එක් දවසක් රජුගේ වප්මගුල් උළෙල විය. එදවස සියලු නුවර දේව නගරයක් මෙන් අලංකාර වෙත්. සියළු දැසි දස් කම්කරුවෝ අළුත් වස්ත්‍ර හැඳ, සුවඳමල් ආදියෙන් සැරසී රජ මැදුරේ රැස්වෙති. රජුගේ කෘෂිකර්මාන්තයට නඟුල් දහසක් යොදවති. ඒ දවසේ සත්සිය අනූනමයක් නඟුල් සමග ගොනුන් විසින් යොදවන ලද, යොත් රිදී පටියකින් වටකොට පවතිත්. රජු සඳහා පිළියෙළ කළ නඟුල රතු රන් ටියකින් වෙලා තිබෙත්. ගවයන්ගේ අං රැස් විහිදෙන රන් කොපුවලින් පිරිකෙව් කරන ලදහ. රජු මහත් පිරිවරින් නික්මෙන්නේ පුතාද රැගෙන ගියේය. කෘෂි කර්මාන්ත භූමියෙහි එක් දඹගසක්ද, බොහෝ කොළ අතු සහිත සිසිල් සෙවනද විය. ඒ ගස යට කුමරුගේ යහන පනවා ඒ මත්තෙහි රන් තරු ඔබ්බවන ලද වියනක් බන්දවා සනීප ආකාරයෙන් වටකොට ආරක්ෂාව තරකොට සර්ව අලංකාරයෙන් සැරසුණු රජු :-

ඇමති ගණයා පිරිවරා නඟුල් උපකරණ ගෙන කුඹුරට ගියේය.

එහිදී රජු රන් නගුල ගනියි. ඇමතිවරු හත්සිය අනූනමයක් රිදී නගුල්ද, ගොවියෝ සෙසු නගුල්ද ගත්හ. ඔවුහු ඒවා රැගෙන ඔබි-මොබ සිසාත්. රජු එකරටට යයි අගසිට මුලට එයි. මේ ස්ථානයේ මහා උත්සවයක් විය. බෝසතුන් පිරිවරා හුන්නා වූ කිරි මව්වරු රජුගේ සම්පත් බලන්නෙමුයි, ඇතුල් සානුවෙන් පිටතට නික්මුනාහුය. බෝසත්හු ඔබි-මොබ බලන්නේ කිසිවකු නොදැක, ඉක්මණින් නැගිට පලඟක් බැඳ ආනාපාන සතිය වඩවා ප්‍රථමධ්‍යානය ඉපදවීය. කිරිමව්වරු කෑයුතු බීයුතු ආහාර පිරික්සමින් ටිකක් බලා සිටියහ. සෙසු ගස්වල සෙවනැල්ල පුළුල්ව පැතිරුණේ, ඒ ගසේ සෙවනැල්ල වටකොට සිටියේය. කිරිමව්වරු, ආර්ය පුත්‍රයා හුදකලාවමයයි ඉක්මනට අවුත්, තිරය ඔසවා ඇතුළට පිවිසෙන්නී, බෝසතුන් යහනේ පර්යංකයක් බැඳ සිටින්නා වූ ඒ ආශ්චර්ය දැක වහා ගොස් රජුට දැනුම් දුන්හ. දෙව්කුමරු මෙසේ සිටින්නේ අනෙක් ගස්වල සෙවනැල්ල ඉක්මගිය අතර දඹගසේ සෙවනැල්ල වටාකාරව පැවතියේය. රජු වේගයෙන් ගොස් ප්‍රාතිහාර්ය දැක "දරුව, මේ ඔබට මගේ දෙවන වැඳීම යයි" පුතාට වැන්දේය. ඉක්බිති පිළිවෙළින් බෝසත්හු සොළොස්වියට පැමිණියේ විය. රජු බෝසතුන්ට සෘතු තුනට සුදුසු වනසේ, මාළිගා තුනක් කරවීය. එකක් මහල් නවයකින්ද, එකක් මහල් සතකින්ද, එකක් මහල් පහකින්ද විය. සතළිස්දහසක් නාටක ස්ත්‍රීන් යෙදවීය. බෝසත්හු අප්සරාවන් පිරිවරාගත් දෙවියකු මෙන්, අලංකාර නාටක ස්ත්‍රීන් විසින් පිරිවරණ ලදුව, පුරුෂයන් රහිත තූර්යනාදයෙන් නැටුම් පිරිවර කොට ඇතිව මහා සම්පත් අනුභව කරමින් සෘතුවාර වශයෙන් ප්‍රාසාද තුනෙහිම වාසය කළේය.

රාහුල මාතාව ඔහුගේ අගමෙහෙසිය වූවාය. ඔහු මෙසේ මහත් සම්පත් අනුභව කරමින් සිටිනවිට එක් දිනයක ඤාති සමූහයා අතර මෙවැනි කථාවක් හටගත්තේය. සිද්ධාර්ථ ක්‍රීඩාවට ඇලී වාසය කරයි. කිසි ශිල්පයක් නොහදාරයි. යුද්ධයක් පැමිණිකල්හි කුමක් කරන්නේද? රජු බෝසතුන් කැඳවා "දරුව; ඔබගේ ඤාතීහු, සිද්ධාර්ථ කිසි ශිල්පයක් නොහදාරා ක්‍රීඩාවටම ඇලී වාසය කරයි" යනුවෙන් පවසති. කිම මෙහිලා සුදුසු කාලය යයි නොසිතවුද?" "දේවයනි; මට ශිල්ප ඉගෙන ගැනීමට කිසිවක් නැත. නගර මැද ශිල්ප පෙන්වීමට බෙරහඬ නංවවු! මෙයින් සත්වෙනි දිනයේ ඤාතීන්ට ශිල්ප දක්වන්නෙමි. රජු එසේ කරවීය. බෝසතාණෝ අකුබණ වෙධී හෙවත් විදුලිය එලියෙන් ඉලක්කයට විදුනාහ. වාලවේධී හෙවත් බටු පලය එල්ලූ අස්ලොමට විදීමට සමත් ආදී දුනුවායන්

රැස්කරවා මහාජනයා මැද, අනෙක් දුනුවායන්ට සාධාරණ නොවූ, දොළොස් ආකාර ශිල්පයක් ඤාතීන්ට පෙන්වීය. එය සරභංග ජාතකයේ සඳහන් අන්දමට දතයුතුය. එකල උන්වහන්සේගේ ඤාති සමූහයා සැකයෙන් තොර විය.

ඉක්බිති දිනක් බෝසත් උයනට යනු කැමැත්තේ, රියදුරා අමතා, රථය පිළියෙළ කරන්නැයි කීවේය. ඒ රියදුරා යහපතැයි පිළිවදන් දී උතුම් මහාර්ඝ රථය සියලු අලංකාරවලින් අලංකාරකොට කුමුදු පත්‍ර වර්ණැති මංගල අශ්වයන් සතරදෙනෙකු යොදවා, බෝසතුන්ට දැන්වීය. බෝසත්හු දිව්‍ය විමානයක අසිරිය ඇති රථයට නැග, උයන පෙරටුව ගමන් කළේය. දේවතාවෝ සිදුහත් කුමරුගේ බුදුවීමට කාලය ආසන්න වෙයි. පෙරනිමිති පෙන්වන්නෙමුයි, එක් දිව්‍ය පුත්‍රයකු ජරාජීර්ණ කැඩුණු දත් ඇති, කෙස් රැලි වැටුණු, ඇද වූ නැමීගිය සිරුරක් ඇති, දණ්ඩක් අතින් ගත් වෙව්ලන අයෙකු කොට පෙන්වූහ. එම රූපය බෝසතුන් හා රියදුරා පමණක් දකිති. ඉක්බිති බෝධිසත්ත්ව තෙම "මිත්‍ර රියදුරුණනි; මේ මිනිසා කවරෙක්ද? ඔහු කෙස්ද අන් අයගේ සමානව නොපෙනේ. මහාපදාන සූත්‍රයේ දැක්වූ නයින් රියදුරුගෙන් විචාරා, රියදුරාගේ පිළිතුර අසා, "පින්වත, නින්දා වේවා! ඉපදීම නිසා, ජරාවට පත්වන්නේය." යනුවෙන් කළකිරුණු සිතින්, එතැනම නැවතී, ප්‍රාසාදයටම වන්හ. රජු:- කුමන කරුණක්ද, මගේ පුතා වහාම පෙරළා ආවේදැයි විචාළේය. දේවයන් වහන්ස, මහලු පුරුෂයෙකු දැකීමෙන් මහල්ලෙකු දැක පැවිදි වන්නේ යයි පෙර ඒ වචනය සිහිකළේය. මා නොනැසුව මැනව. වහාම මගේ පුතුට නාට්‍ය සංගීතාදිය පිළියෙළ කරවු. සම්පත් අනුභව කරනවිට පැවිද්ද පිළිබඳ සිහිකල්පනාව නොකරන්නේ යයි පවසා, ආරක්ෂාව යෙදවිය. යම් දෙවන දිනයක බෝසතුන් එපරිදිම උයනට යන්නේ දේවතාවන් විසින් මවන ලද, රෝගී පුරුෂයකු දැක, පළමු ආකාරයෙන්ම විමසා, යටකියන ලද අයුරින්ම කළකිරුණු සිතැත්තේ යළි නැවතී ප්‍රාසාදයටම ආහ. තවත් එක්දිනක් බෝසතුන් එසේම උයනට යන්නේ, දේවතාවන් විසින් මවන ලද මළසිරුරක් දැක පෙර පරිද්දෙන්ම විචාරා කළකිරුණු සිත් ඇත්තේ යළි නැවතී ප්‍රාසාදයට පැමිණියේය. රජුද විචාරා යට හාත්පස යොදුනක් මණ රැකවල් ලැබූහ. යළිත් එක්දිනක් උයනට යන්නේ දෙවියන් විසින් මවන ලද මනාවූ සිවුරු හැඳ පෙරවූ පැවිදිරුවක් දැක, මේනම් කවරෙක් දැයි රියදුරාගෙන් විචාළේය. බුදුසසුන පවත්නා කාලයක් නොවන නිසා පැවිද්ද ගැන හෝ පැවිදි ගුණ ගැන නොදනිතත්, රියදුරා දෙවියන්ගේ

අනුසසින් "දේවයිනි, මේ පැවිද්දෙකි'යි හඳුන්වා පැවිදිගුණ ද වර්ණනා කළේය. බෝධිසත්ත්වයෝ පැවිද්දට රුචි උපදවා එදවස උයනට ගියහ. දීඝභාණකයෝ පෙරනිමිති හතරම එකම එක දිනයේ දැක මහබිනික්මන් කළ බව කියති. ඔහු එදින අඩක් සෙල්ලම්කොට මංගල පොකුණින් නා, හිරු අවරට ගියකල්හි, මංගල ගල්තලාවේ හුන්නේය. එහිදී තමන් අලංකාර කරවාගනු කැමැති වූහ. ඉක්බිති ඔහුගේ පිරිවර පුරුෂයෝ නොයෙක් වර්ණ ඇති වස්ත්‍ර නොයෙක් ආකාර ආභරණ ද ගෙන මල්සුවඳ දුම් විලේපන ආදිය රැගෙන හාත්පස පිරිවරා සිටියහ. එකෙණෙහි ශක්‍රයා හුන්නා වූ පඬු ඇඹුල් ආසනය උණුසුම් විය. ඔහු කවරෙක් නම් මෙතනින් චුතවනු කැමැත්තේදැයි සලකන්නේ බෝසතුන් අලංකාරවීමට කැමැති බව දැන විශ්වකර්මයා ඇමතීය. මිත්‍ර විශ්වකර්මය; සිද්ධාර්ථ කුමාරයා අද, මැදියම් රාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණය කරන්නේය. මේ ඔහුගේ අවසාන සැරසීමයි. ඔබ උයනට ගොස් හේ දිව්‍ය ආභරණයෙන් සරසවයි නියම කළේය. ඔහු යහපතැයි පිළිගෙන දේවානුභාවයෙන් එකෙණෙහිම බෝසතුන් වෙත එලඹ, ඔහුගේම ඇඳුම් අන්දවන්නා (පනික්කියා) වශයෙන් සිට, දිවසළුවලින් බෝසතුන්ගේ හිස වෙළුවේය. බෝසත්හු අතේ ස්පර්ශයෙන්ම මේ මිනිසකු නොව, දේවපුත්‍රයෙකු බව දැන ගත්තේය. හිස වෙළූ කෙණෙහිම ඔටුන්නෙහි එබ්බවූ මිණිකැට අයුරින් පිළි දහසක් පැනනැංගේය. මෙසේ හිස වෙළත් වෙළත්, පිළිදහස බැගින් දසවරක් පිළි පැනනැංගේය. මෝලිය මෙන් සකස් කළහ. මෙහිදී හිස කුඩාය. වස්ත්‍ර බොහෝය. කෙසේ මෝලිය මෙන් සකස් කළේදැයි නොසිතිය යුතුය. ඒවා අතරින් සියල්ලටම වඩා මහත් වූ පිළිය පූඩා මලක් පමණ විය. ඉතිරි ඒවා ඉඹුල්මල් ප්‍රමාණයේද වූහ. බෝසතුන්ගේ හිස මල්කෙසරු ගැවසිගස් බක්මී මලක් මෙන් විය.

සියළු ආභරණයෙන් සැරසී සිටි, බෝසතුන්ට, සියළු වාද්‍ය විෂයයන්හි දක්ෂ වූවන් තමතමන්ගේ දක්ෂතාවයන් දක්වද්දී, බමුණන් ජයවේවා, සතුටුවේවා ආදී වදන් කියද්දී, වන්දිභට්ටයන් නන් අයුරින් සුභ වචන කියද්දී, සතුන් නාදයෙන් බුහුමන් දක්වද්දී, එතුමෝ සර්වාංලංකාරයෙන් යුතුව උතුම් රථයට නැංගාහ. එසමයේ යශෝදරා පුතකු බිහිකළා යයි ඇසූ සුද්ධෝදන රජතුමා, මගේ පුතුට මේ සතුට දැනුම් දෙවයි හස්නක් යැවීය. බෝධිසත්ත්වයෝ එය අසා **"රාහුලයෙක් උපනි. බන්ධනයක් හටගත්තේය."** යයි කීවේය. රජු:- කිම මගේ පුත්‍රයා කුමක් කීවේද? විචාරා ඒ වචනය අසා, මෙතැන්පටන් මගේ මුණුබුරා

රාහුල කුමාර නම් වේවා'යි කීවේය. බෝසත්හුද, උතුම් රථයට නැග මහත් කීර්තියෙන් අතිරමණීය ශ්‍රී සෞභාග්‍යයෙන් යුතුව නගරයට පිවිසියේය. එසමයෙහි කිසාගෝතමී නම් ක්ෂත්‍රිය කන්‍යාව ප්‍රාසාදයේ උඩුමහලට නැග නගරය ප්‍රදක්ෂිණා කරන්නා වූ බෝසතුන්ගේ රූපශෝභාව දැක ප්‍රීතියෙන් සොම්නසට පත්වී මේ උදානය ප්‍රකාශ කළාය.

මෙවන් පුතෙකු ලද මව සැනසුනා වේ
මෙවන් පුතෙකු ලද පිය සැනසුනා වේ
මෙවන් පතිඳු ලද කත සැනසුනා වේ
මෙවන් අයකු ගෙන් ලොව සැනසුනා වේ.

ඒ උදාන වාක්‍යය අසා බෝසත් මෙසේ සිතීය. මෙතුමිය මෙසේ කීවාය. මෙබඳු රූසපුවක් ඇති ආත්මභාවයක් දකින්නා වූ මවගේ හදවත නිවියයි. පිය හදවතද නිවියයි. ප්‍රජාපතිගේ හදවතද නිවියයි. එහෙත් කුමක් නිවුනුකල්හි හදවත නිවේද? ඉක්බිති ක්ලේශයන් නොඇලුනු ලබන්නා වූ ඔහුට මෙබඳු අදහසක් පහළවිය. රාග ගින්න නිවුණු කල්හි නිබ්බුත නම් වෙයි. දෝෂ ගින්න නිවුණු කල්හි මෝහ ගින්න නිවුණු කල්හි නිවුණේ නම් වෙයි. දෘෂ්ටිමාන ආදි සියළු කෙලෙස් නිවුණු කල්හි නිවුණේ වෙයි. ඇය මට හොඳ මාහැඟි දහමක් ඇස්සවූවාය. මම නිවන සොයමින් හැසිරෙමි. අද ම මා විසින් ගෘහවාසය හැරදමා නික්ම පැවිදි වී නිවන ගවේෂණය කිරීමට වටියි. මෙය මැයට ගුරුපඬුරු වේවා'යි ශ්‍රීවයෙන් මුදා කිශාගෝතමියට ලක්ෂයක් වටිනා මුතුහර යැවීය. ඇය, සිද්ධාර්ථ කුමාරයා මා කෙරෙහි බැඳුණු සිත් ඇතිව පඬුරු එවන ලද්දේයයි සොම්නසට පත්වූවාය. බෝසත් මහත්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් තමන්ගේ ප්‍රාසාදයට නැග සිරියහනේ හොත්තේය. එකෙණෙහි ඔහුට සියළු ආකාරයෙන් සැරසුණු නෘත්‍ය ගීත ආදියෙන් සංවර වූ දේවකන්‍යාවන් සේ රූපයෙන් හා සෞභාග්‍යයෙන් පිරි නාටක ස්ත්‍රීහු තූර්යභාණ්ඩ රැගෙන සහපිරිවරව සතුටු කරන්නී, නැටුම් ගැයුම් වැයුම් ආදිය ඉදිරිපත් කළහ. බෝසත්තෙම කෙලෙසුන් කෙරෙහි නොඇලුණු සිත් ඇති බැවින් නෘත්‍යාදියෙහි නොසතුටු වූයේ මොහොතින් නින්දට වැටුණේය. ඒ ස්ත්‍රීහුද යමෙකු සඳහා අපි නැටුම් ආදිය ඉදිරිපත් කරමුද? ඔහු නිද්‍රාවට වැටුණේය. දැන් කුමක් පිණිස ක්‍රීඩා කරන්නෙමුද? ගත් ගත් තැන්වලම තූර්යභාණ්ඩ අතහැර දමා හොත්තාහ. සුවඳින් මුසු තෙලින් පහන දැල්වේ. බෝසතුන් පිබිද, යහන මතම පලඟින් සිටින්නේ විප්‍රකාර වූ ඒ ස්ත්‍රීන් දුටුවේය. ඒ

ස්ත්‍රීහු තූර්යභාණ්ඩ අතහැර නිදාගත්තාහු. ඇතැමෙක් ගොරවමින්ද ඇතැමෙක් දොඩවමින්ද, ඇතැමෙක් මුව අයාගෙනද, ඇතැමෙක් නිර්වස්ත්‍රව ප්‍රකට කළ පිළිකුල් රහස්තැන් හෙළිකරමින්ද සිටියහ. හෙතෙම ඈලාගේ විකාර රූප දැක භීතියට පත්ව කාමයන්හි නොඇලුණු සිත් ඇතිව සිටියේය. ඔහුගේ, අලංකාර කළ ශක්‍රභවන හා සමාන ඒ මහා සඳළුතලය තැන තැන දමන ලද නොයෙක් කුණපවලින් පිරි අමු සොහොනක් මෙන් පිහිටියේය. කාමරූප අරූප භවත්‍රයම ගිනිගත් ගෙයක් හා සමාන සේ වැටහුනහ. "පින්වතුනි, ඒකාන්තයෙන් උපද්‍රවයකි. පින්වතුනි ඒකාන්තයෙන් පෙළනු ලබන උවදුරකි." යයි හැඟීම්බර වදන් මුවෙන් පිටවිය. අතිශයින්ම පැවිද්ද සඳහා සිත නැමුණේය. හෙතෙම අදම මා විසින් මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්මීමට වටීයයි, යහනෙන් නැගිට දොරටුව සමීපයට ගොස් මෙහි කවරෙක්ද? යනුවෙන් පැවැසීය. එළිපත්ත පිට හිස තබා හොත්තා වූ ඡන්න ආර්ය පුත්‍රය මම ඡන්න යයි කීවේය. අද මම මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්ම යාමට කැමැත්තේ, මට එක අශ්වයකු පිළියෙළ කරවයි, කීවේය. දේවයන් වහන්ස; යහපතැයි ඔහු අශ්ව භාණ්ඩ ගෙන අශ්වහලට ගොස් සුවඳ තෙල් පහන් දැල්වෙද්දී දෑසමන් වියන යට සිත්කලු භූමිභාගයක සිටි කන්ථක අශ්වරාජයා දැක, මා විසින් මොහුව පිළියෙළ කිරීම වටී යයි කන්ථක සැරසීය. හෙතම සරසන්නේම දැනගත්තේය. මේ සැරසීම අතිශය දැඩිය. අනෙකුත් දවස්වල උයන් ක්‍රීඩාවට යනකල්හි සැරසීම මෙන් නොවෙයි. මගේ ආර්ය පුත්‍රයා අද මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්මීමට කැමැති වන්නේය. ඉක්බිති සතුටු සිතැතිව මහඟඩින් සිනහ විය. ඒ ශබ්දය මුළු නගරය පුරා පැතිරී යන්නේය. දේවතාවෝ ඔහුට බාධාකොට කිසිවකු ඇසීමට බාධා කළහ.

බෝසතුන්ද ඡන්න යවා පළමුවරට තම පුතා බලන්නෙමියි සිතා රාහුල මාතාව වසන්නා වූ ශ්‍රීයහත් ගැබට ගොස් දොර විවර කොට සිටියේය. එකෙණෙහි ඇතුළත ගර්භයෙහි සුවඳතෙල් පහන දැල්වෙයි. රාහුල මාතාව දෑසමන්මල් අමුණක් පමණ අතුරන ලද යහනේ පුතුගේ හිසට අත තබා නිදාසිටියි. බෝසත්හු උළුවස්සට පය තබා සිටියේම, බලා, ඉදින් මම දේවියගේ අත ඉවත්කොට මගේ පුත්‍රයා ගත්තේනම්, දේවිය අවදි වන්නීය. එසේ වූ විට මගේ ගමනට අනතුරක් වන්නේය. බුදුවී පැමිණම පුත්‍රයා බලන්නෙමියි ප්‍රාසාද තලයෙන් බැස්සේය. යම් ජාතකට්ඨ කථාවේ "රාහුල කුමරුන් ඉපදී සත්දිනකින්" මහභිනිෂ්ක්‍රමණය කළේයයි සඳහන් වේ යනුවෙන් කියන ලදී. එය සෙසු අට්ඨකථාවල

සඳහන් නොවේ. එහෙයින් මෙයම ගතයුතුය යනුවෙනි. මෙසේ බෝසත් ප්‍රාසාද උඩුමහලින් බැස, අශ්වයා සමීපයට ගොස් මෙසේ කීවේය. "දරුව, කන්ථකය, නුඹ අද රාත්‍රියෙහි මා එතර කරව. මම ඔබ නිසා බුදුවී, සදේවක ලෝකයා එතර කරන්නෙමි." ඉක්බිති බෝසත්තුමා කන්ථකගේ පිටට නැංගේය. කන්ථක බෙල්ලේ පටන් දිගින් රියන් දහඅටක් වෙයි.

සුදුසුවූ උසින් යුක්ත වූද, පරාක්‍රමයෙන් හා ශක්ති සම්පන්න වූ සෝදන ලද සුදු හක්ගෙඩියක් බඳු සම්පූර්ණ සුදුපාට වේ. ඉදින් හෙතම සිනහසෙන්නේ හෝ පා ශබ්ද කරන්නේ හෝ එම ශබ්දය මුළු නගරය සිසාරා යන්නේය. එහෙයින් දේවතාවෝ තමන්ගේ ආනුභාවයෙන් එම හඬ කිසිවකු නොඇසෙන සේ වැළැක්වූහ. මෙසේ සිනහ ශබ්දයට බාධාකොට තබන තබන පියවරක් පාසා අත් තල, තැබූහ. බෝධිසත්ත්වයෝ අශ්වයාගේ පිට මැදට ගියේ, ඡන්න අශ්වයාගේ වලිගය අල්ලාගෙන මැදියම් රාත්‍රියෙහි මහදොරටුව සමීපයට පැමිණියේය. එකල රජතුමා, මෙසේ මගේ පුත්‍රයා යම්කිසි වේලාවක නුවර දොරටුව විවරකොට නික්මීමට නොහැකිවන්නේයි දොරපුවරු දෙකේම මිනිසුන් දහස බැගින් යොදවා ආරක්ෂා කරවීය. බෝධිසත්ත්වයෝ බලසම්පන්නය. ඇතුන් ගණනින් කෝටිදහස් ගණනක ඇතුන්ගේද, පුරුෂ ගණනින්, දසකෝටි ගණනක් පුරුෂයන්ගේ බලයද දරයි. ඔහු සිතුවේය. ඉදින් දොරටුව විවෘත නොකරයිද, අද කන්ථකගේ කලවාවලින් පෙළා රියන් අටළොසක් උස ප්‍රාකාරයට පැනනැග ඉක්මවා යන්නෙමි. ඡන්නද සිතීය. ඉදින් දොරටුව විවෘත නොකරයිද, මම ආර්ය පුත්‍රයා උරේ හිඳුවාගෙන කන්ථක දකුණු අතින් කිහිල්ල අතර රඳවාගෙන ප්‍රාකාරයට උඩින්පැන ඉක්මවා යන්නෙමි. කන්ථකද මෙසේ සිතුවේය. ඉදින් දොරටුව විවෘත නොකරයිද, මම තමන්ගේ ස්වාමියා පිටඋඩ හිඳුවාගෙනම ඡන්නව වාලධියෙන් ගෙන සිටියේම ඔවුන් සමගම ප්‍රාකාරයට උඩින් පැන ඉක්ම යන්නෙමි. ඉදින් දොරටුව විවර නොවන්නේ නම්, ඔවුන් තිදෙනා අතර එකකු සිතන පරිද්දෙන් කටයුතු සම්පාදනය කරන්නේය. දොරටුවෙහි අධිගෘහිත දේවතාවා දොරටුව විවෘත කළහ. එකෙණෙහි පවිටු මාරයා බෝසත්හු නවත්වා ගන්නෙමියි අවුත් අහසේ සිට මෙසේ කීවේය. **"නිදුකාණනි; නික්ම නොයන්න. මෙතැන් සිට සත්වෙනි දිනයේ ඔබට චක්‍රරත්නය පහළ වන්නේය."** යනුවෙනි. දෙදහසක් පරිවාර දිවයින් සහිතව සතරමහා ද්වීපයේ රජ කරන්නෙහිද, නිදුකාණනි; නවතින්න යයි කීවේය. නුඹ

කවරෙක්ද? මම වසවර්ති මාරයා වෙමි. මට චක්‍රවර්ති රත්නය පහළ වන බව මම දනිමි. මට රාජ්‍යයෙන් අර්ථයක් නැත. දසදහසක් ලෝකධාතුව නාදකරවා බුදුවන්නෙමි'යි කීවේය. මාරයා දැන් මෙතැන් සිට කාම විතර්ක හෝ ව්‍යාපාද විතර්ක හෝ විහිංසා විතර්කය හෝ සිතුයේ නම් කළයුතු දේ දැනගන්නෙමියි සිදුරු සොයමින් සෙවනැල්ල මෙන් පසුපස යමින් ලුහුබැන්දේය. බෝසතුන් වනාහි අතට පත් චක්‍රවර්ති රාජ්‍යය කෙළපිඬක් මෙන් අපේක්ෂා රහිතව හැරදමා මහත් සත්කාරයෙන් යුතුව නගරයෙන් නික්ම ගියේය. ඇසළ පුන් මාසයේ උතුරුසළ් නැකැතින් පවත්නා කල්හි නික්මගොස් නැවත උන්නුවර නැවත හැරී බැලීමට සිත්විය. මෙසේ සිතක් උපන් ඇසිල්ලේම මහාපුරුෂය, ඔබ විසින් පෙරුම් පුරන ලද්දේ නැවත ආපසු හැරී බැලීමට නොවේයයි කියන්නාක් මෙන්, මහපොළොව කුඹල් රෝදයක් මෙන් කරකැවී සිටියේය. බෝසත්හු නගරාභිමුඛව සිට නගරය බලා ඒ ප්‍රදේශයේ කන්ථක නතරවූ චෛත්‍ය ස්ථානය වශයෙන් දක්වා ගතයුතු මාර්ගයට අභිමුඛව කන්ථක තබා, සිරි සෞභාග්‍යයෙන් උදාර වූ මහත් සත්කාර සම්මානයෙන් යුතුව පිටත්විය. එකල දේවතාවෝ පෙරටුව සැටදහසක් ගිනිපන්දම් දැරූහ. පසුපසින් දකුණුපසින් වම්පසින් සැටදහස බැගින් ආලෝකවැටි දැරූහ. සමහර දේවතාවෝ සක්වළ මුව සිට අප්‍රමාණ ගිනිපන්දම් දැරූහ. සෙසු දෙවිවරුද නාග ගුරුලෝද දිව්‍ය සුවඳ මල් මාලාවලින්ද, සුවඳකුඩු ආදියෙන්ද පුදනු ලබන්නෝම යති. පරසතු මල්වලින්ද මදාරම් මල්වලින්ද, ඝන වැසි වලාකුළු දරන්නාක් මෙන් අහස නිරතුරුව විය. දිව්‍ය සංගීත ආදියද පවත්වති. හාත්පස අෂ්ට තූර්යයෙන්ද, සැටක් තූර්ය නාදයෙන්ද, සැටඅටක් තූර්යදැයි සියදහස් වාරයක් තූර්යනාදය පැවැත්වූහ. ඔවුන්ගේ ශබ්දය මුහුදු කුසෙහි මේඝවලාකුළු වැටෙන කාලය මෙන්ද, යුගන්ධර පර්වත කුසෙහි සාගරය ගිගුම් දෙන කාලය මෙන්ද පවතියි. මෙසේ ශ්‍රී සෞභාග්‍යයෙන් යන්නා වූ බෝසත් තෙමේ එක රැයකින් රාජ්‍යය තුනක් ඉක්මවා, තිස්යොදුනක් මත්තෙහි අනෝමා නම් නදී තීරයට පැමිණියේය. කිමෙක්ද, එවිට අශ්වයා ඉන් ඔබ්බට යාමට නොහැකි වෙයිද? නොහැකි වීමය. ඔහු වනාහි එක් සක්වල වටයක් මැද, අක්ෂයෙන් තබන ලද රියසකක නිම්වලල්ල වටව යන්නාක් මෙන් කෙළවරටම ගොස් තමන් සඳහා වූ භෝජනය බුදීමට සමත්ය. එකල, දේව නාග ගරුඬාදීන් විසින් අහසේ සිට ඔසවන ලද සුවඳමාලා ආදියෙන් කලවා ප්‍රදේශ දක්වා ගිලුණු සිරුර ඔසවා සුවඳමල් ජටා සිඳීමට ඉතා ප්‍රමාද විය. එහෙයින් තිස් යොදුන් දුර පමණම ගියේය. ඉක්බිති බෝසත් ගංතෙර සිට ඡන්න ඇමතීය.

මේ නදිය නම් කුමක්ද? දේවයන් වහන්ස; අනෝමා නම් වේ. අපගේ පැවිද්ද ද ළාමක නොවූවක් (අනෝමා) වන්නේ යයි, පාදයෙන් ගටමින් අශ්වයාට සංඥාවක් දුන්නේය. අශ්වයාද උඩපැන අට ඉස්බක් පුළුල් වූ නදිය තරණයකර එතෙරට ගියේය. බෝසත් අශ්වයාගේ පිටෙන් බැස රිදී පටියක් හා සමාන වැලිතලාවේ සිට ඡන්න ඇමතිය, මිත්‍ර ඡන්නය, ඔබ මගේ ආභරණද, කන්ථකද රැගෙන යන්න. මම පැවිදි වන්නෙමි. මමද දේවයනි; පැවිදිවන්නෙමියි කීය. බෝසත්, ඔබට පැවිදි වීමට නොලැබේ. නුඹ යා යුතුමය. යයි තුන්වරක් දැඩිව කියා, ආභරණද අශ්වයාද සූදානම් කොට යවා සිතුවේය. මේ මගේ කෙස් ශ්‍රමණ සාරූප්‍ය නොවේ. බෝසතුන්ගේ කෙස් සිඳීමට සුදුසු පුද්ගලයකු නැති හෙයින් ඔහු තෙමේම කඩුවෙන් කපන්නෙමියි, දකුණු අතින් කඩුව ගෙන, වම් අතින් කෙස්වැටිය මිටකට ගෙන කපා දැමීය. කෙස් අඟල් දෙකක් පමණ වී දකුණට කරකැවී හිසට ඇලී තුබුණි. ඔවුන්ගේ දිවි ඇතිතෙක් එම ප්‍රමාණයම විය. සුවද ඒ ආකාර වූයේ නැවත කෙස්රවුල් කපාදැමීමේ කටයුත්තද නොවීය. බෝසත් තෙම කෙස්කලඹ ගෙන ඉදින් මම බුදුවන්නෙමිද? එසේනම් අහසේ සිටීවා. නැතිනම් බිම පතිත වේවා'යි අහසට විසි කළේය. ශක්‍ර දිව්‍යරාජයා දිවඇසින් බලා යොදුනක් දුරදී රන් කරඬුවකින් පිළිගෙන තව්තිසා භවනයේ කුඩා මණිචෛත්‍ය සිළුමිණසෑය නමින් පිහිටුවීය. (සිළුමිණ)

උතුම් සුවඳින් සුවඳවත් කරන ලද, මෝලිය සහිත වූ කෙස්වැටිය
සියතින්ම සිඳ අහසට විසිකළේය. දහසක් දිවැස් ඇති සක්දෙවි
රජ රන් කරඬුවකින් එය පිළිගෙන සිළුමිණසෑය කරවන ලද්දේය.

විසි නව වසක් සුරැකි මල් සුවඳ දිදී
සිදුහත් කෙස් කළඹ සිය කඩුපතින් සිඳී
බුදු බව පතා අහසට විසිකරන ලදී
ඉඳුවර එයින් සිළුමිණි සෑ තනන ලදී

බෝධිසත්ත්වයෝ නැවත සිතූහ. මේ කසීසළු මගේ ශ්‍රමණ සාරූප්‍යයට නුසුදුසුය. ඉක්බිති ඔහුට කාශ්‍යප බුද්ධකාලයේ පුරාණ සහායක වූ සටීකාර මහා බ්‍රහ්මයා එක් බුද්ධාන්තරයක් ගතවුවද පැරණි මිත්‍ර භාවය නිසා අද මගේ සහායකයා මහාභිනිෂ්ක්‍රමණයට නික්මෙන්නේ ඔහුට ශ්‍රමණ පරිෂ්කාර ගෙන යන්නෙමියි සිතා

"තුන්සිවුරද, පාත්‍රයද, පෙරහනද, ඉඳිකටුවද, කඩකැත්තද සහ බඳපටියද, භික්ෂුවට යෝග්‍ය වූ පිරිකර වශයෙන් තිබෙන අංග අට වේ."

මේ ශ්‍රමණ අටපිරිකර බෝසතුන්ට ගෙන දුන්නේය. බෝධිසත්ත්වයෝ අරහත් ධජය පොරවාගෙන උතුම් පැවිදි විලාශය ගෙන ඡන්න; ඔබ මගේ වචනයෙන් මාපියන්ට මම නිරෝගී වෙමියි කියන්නැයි පවසා පිටත් කළේය. ඡන්න බෝසතුන් වැඳ ප්‍රදක්ෂිණා කොට පිටත්ව ගියේය. කන්ථක ඡන්න සමග කථාකරන්නා වූ බෝසතුන්ගේ වචන අසා දැන් මට නැවත හිමියාගේ දර්ශනයක් නැතැයි සිතා, ඇස් මානයෙන් නොපෙනී යන්නේම ශෝකය ඉවසා ගත නොහැකිව, හදවත පැලීමෙන් කළුරිය කොට, තව්තිසා භවනයේ කන්ථක නම් දේවපුත්‍රයාව ඉපදුණේය. ඡන්නට ළමුව එක ශෝකයක් විය. කන්ථකගේ කළුරිය කිරීමෙන් දෙවෙනි ශෝකයෙන්ද පෙලුණේ හඬමින් වැළපෙමින් නගරයට ගියේය.

බෝධිසත්ත්වයෝ ඒ ප්‍රදේශයේම වූ අනුපිය නම් අඹ වනයෙහි සත්දිනක් පැවිදි සුවයෙන් කල්ගෙවා, එක දවසකින් යොදුන් තිහක් පමණ දුර පියවරින් ගොස් රජහගනුවරට පිවිසි අනුපිළිවෙළින් පිඬු පිණිස හැසිරුණේය. මුළු නගරයම බෝසතුන්ගේ රූපය දැකීමෙන් ධනාල නම් ඇතා පිවිසි රජගහනුවර මෙන්, අසුරිඳු ප්‍රවිෂ්ට වූ දේවනගරයක් මෙන්ද, කැළඹීමට පත්වුණේය. රාජපුරුෂයෝ ගොස්, රජතුමනි, මෙබඳු ආකාර සත්ත්වයෙකු නගරයේ පිඬු පිණිස හැසිරෙයි. දෙවියෙකු හෝ මිනිසකු හෝ නාගයකු හෝ ගුරුලකු හෝ අසවල් නමක් ඇත්තැකැයි නොදනිමු යයි රජුට දැනුම් දුන්හ. රජු සඳළුතලයේ සිට මහාපුරුෂයා දැක ආශ්චර්ය අද්භූත සිතින් රාජපුරුෂයන්ට අණ කළේය. බොල යව්! විමසව්! ඉදින් අමනුෂ්‍යයකු වන්නේ නම් නගරයෙන් නික්ම අතුරුදන් වන්නේය. ඉදින් දේවතාවකු වන්නේ නම් අහසින් යන්නේය. ඉදින් නාගයකු වන්නේ නම් පොළොවේ ඉපිලී යන්නේය. ඉදින් මනුෂ්‍යයකු වන්නේ නම් යම්සේ ලබනලද ආහාර අනුභව කරන්නේය. මහා පුරුෂයාද මිශ්‍ර බත පිළිගෙන මට යැපීම පිණිස මෙපමණ යයි දැන පිවිසි දොරටුවෙන්ම නගරයෙන් නික්ම පාණ්ඩව පර්වතය ඡායාවට මුහුණලා හිඳ ආහාර පිළිගැනීමට පටන් ගත්තේය. ඉක්බිති ඔහුට ආහාර පෙරළා අවුත් මුඛයෙන් නික්මෙන ඔක්කාර ගතියක් විය. ඉක්බිති ඔහු ඒ ආත්මභාවයෙන් මෙබඳු ආකාර ආහාරයක් ඇසින් නුදුටු විරූ නිසාය.

එයින් ආහාරයේ පිළිකුල් බව සළකනු ලබන්නේ මෙසේ තමන් තමන්ටම අවවාද කළේය. සිද්ධාර්ථ; නුඹ ආහාරපාන සුලභ කුලයක වාසය කළේය. සුවඳසැල් භෝජන නොයෙක් අනර්ඝ රසයෙන් වළඳනා තැනක උපත ලබා වැරහැළි එක් පංශුකූලික සිවුරක් පොරවාගත් අයකු දැක, කවරදා හෝ මමත් මෙබඳු ආකාරවී පිඬු පිණිස හැසිර අනුභව කරන්නෙමි වන්නේ ය. මට ඒ සුදුසු කාලය යයි සිතා රාජ්‍යය අතහැර පැමිණියේය. දැන් කුමක්නම් කරහිද? දැන් ඒ ආහාර පිළිකුල් කරන්නේද? මෙසේ තමන්ට අවවාද දී, කළකිරුණේ වී නමුත් ආහාර අනුභව කළේය. රාජපුරුෂයෝ ඔහු දැක රජුට දැනුම් දුන්හ. රජු දූත වචන අසා වේගයෙන් නගරයෙන් නික්ම බෝසත්හුගේ සමීපයට ගොස් ඉරියව් ආදියෙහි පැහැදී බෝසතුන්ට සියලු සම්පත් පවරා දුන්නේය. රාජ්‍ය වී බෝධිසත්ත්වයෝ, මට මහරජ; වස්තුකාමයෙන් හෝ ක්ලේශ කාමයෙන් වැඩක් නැත. මම උතුම් අභිසම්බෝධිය ප්‍රාර්ථනා කරමින් නික්ම යන්නෙක්මි. රජු නොයෙක් ආකාරයෙන් ඉල්ලන්නේ නමුත්, ඔහුගේ සිත නොලබා, ඒකාන්තයෙන් ඔබ බුදුවේවා. බුදුවීමෙන් පසු ඔබ විසින් පළමුව මගේ රාජ්‍යයට පැමිණිය යුතුයයි ප්‍රතිඥාවක් ගත්තේය. මේ මෙහි සංක්ෂේපයයි. විස්තර වනාහි **"යම්සේ ප්‍රාඥයා පැවිදිවේද පැවිද්ද වර්ණනා කරන්නෙමි"** යනු මේ පබ්බජ්ජා සූත්‍රය අටුවා සහිතව බලා දතයුතුය. බෝසත් තෙමේ රජුට ප්‍රතිඥා දී අනුපිළිවෙළින් චාරිකාවේ හැසිරෙමින් ආලාර-කාලාම, උද්දක රාමපුත්‍ර වෙත එළඹ, ධ්‍යාන සමාපත්තීන් ලබාගෙන මෙය සත්‍යය අවබෝධයට මාර්ගය නොවේ. ඒ සමාපත්ති භාවය ප්‍රමාණ වශයෙන් පිළිනොගෙන අලංකාර නොකොට සදේවක ලෝකයාට තමන්ගේ බල වීර්යය මානසික ශක්තිය දැක්වීම සඳහා ප්‍රධන් වීර්ය වඩනු කැමැත්තේ උරුවෙලාවට ගොස් සිත්කළු රමණීය භූමියක් දැක මේ භූමිභාගය රමණීය යයි එහිම වාසයකොට ප්‍රධන්වීර්ය වැඩුවේය. ඒ කොණ්ඩඤ්ඤ ආදී පංච වග්ගිකයෝ ද ගම්නියම්ගම් රාජධානිවල පිඬු පිණිස හැසිරෙමින් එහි බෝසතුන් වෙතට පැමිණියාහ. ඉක්බිති ඔව්හු වර්ෂ හයක් දුෂ්කරක්‍රියා කරන බෝසතුන් දැන් බුදුවන්නේය, දැන් බුදුවන්නේ යයි සිතමින් පිරිවෙන් මළු ඇමදීමාදියද, කාය පිළිවෙත්වලින්ද උපස්ථාන කරනු ලබන්නේ සමීප ආගන්තුකයෝ වූහ. බෝසත්හුද කෙළවර පැමිණි දුෂ්කරක්‍රියාව කරන්නෙමියි එක තල ඇටයකින්, එක සහල් ඇටයකින් පමණක් කල් ගෙවීය. සියළුම ආහාර දේවතාවෝද ලෝමකූපවලින් ආහාර සාරය ඇතුළු කිරීම වැලක්වූහ. ඉක්බිති ඔහුගේ නිරාහාරතාවය නිසා ඉතාමත් කෘෂභාවයට පත්වූයේ, රන්වන් වූ ශරීරය කාලවර්ණ විය. දෙතිස්මහ

පුරුෂ ලක්ෂණද වැසී ගියහ. සමහර වෙලාවට ආශ්වාස ප්‍රශ්වාස නැතිකොට ධ්‍යාන වඩන්නේ මහත් වේදනා මැඩපවත්වමින් විසංඥ වූයේ සක්මන් කෙළවර වැටුණේය. එවිට ඇතැම් දේවතාවෝ ශ්‍රමණ ගෝතමයා කළුරිය කළේය යයි පවසති. ඇතැමෙක් නිරාහාරය නිසා මෙතම මූර්ඡා වූයේ ඇතැමෙක් රහතුන්ගේ ඒකරන්තරා විහරණයෙහි කීහ. එක් දෙවිකෙනෙක් බෝසතුන් මළහයි සිතූහ. ඔහු ගොස් සුද්ධෝදන රජුට ඔබ පුත් මළහයි දැන්වීය. මගේ පුතා බුදුවී කළුරිය කළේද නැතහොත් නොමැතිවද? බුදුවීමට නොහැකිවිය. ප්‍රධන්භූමියේම වැටී කළුරිය කළේය. මේ වචන අසා රජතුමා, මම එය නොඅදහමි. මගේ පුතා බෝධියට නොපැමිණ කලුරිය කිරීමට නම් නැතැයි ප්‍රතික්ෂේප කළේය. කුමක් නිසා රජු නො අදහයිද? කාලදේවල තාපසයාගේ වැඳීම් දවසේ කළ පෙළහරින්, දඹරුක මුලදී කරන ලද ප්‍රාතිහාර්යන් දක්නා ලද බැවිනි. යළි බෝසත්තුමා සිහිලැබ නැගිටි කල්හි ඒ දේවතාවෝම අවුත් මහරජතුමනි, ඔබගේ පුතා නිරෝගී වේවා'යි දැනුම්දුන් කල්හි රජතුමා; දැනිමී මම, පුතාගේ අමරණීයභාවය යයි කීවේය. මහාසත්ත්වයාගේ සය අවුරුදු දුෂ්කරක්‍රියාව කරන කාලයේ අහසෙහි ගැට ඇති කාලය මෙන් විය. (වලා පිඬු) අනතුරුව මෙම දුෂ්කරක්‍රියාව නම් අවබෝධයට මර්ගය නොවේ යයි තීරණ කොට ඕලාරික ආහාර ගැනීමට ගම් නියම්ගම්වල පිඬු පිණිස හැසිර ආහාර ගෙනාවේය. එවිට උත්වහන්සේගේ දෙතිස්මහ පුරුෂ ලක්ෂණ ප්‍රකෘතිමත් වූහ. ශරීරය ස්වර්ණ වර්ණ විය. පංචවාර්ගික භික්ෂූහු, මෙතෙම සය අවුරුද්දක් දුෂ්කරක්‍රියා කරන්නේ නමුත් සර්වඥතා ප්‍රතිවේධය ලැබීමට නොහැකි විය. දැන් ගම්වල පිඬු පිණිස හැසිර ළාමක ආහාර රැගෙන එමින් කුමක් කළහැකි වන්නේද? ප්‍රධන් වීර්යට මෙය උවදුරකි. මොහු වීර්යයෙන් පිරිහුනේය. අප මොහු විශේෂාධිගමයක් ලබාවියයි සිතීම හිස පටන් නහනු කැමති කෙනෙක් පිනිබිඳුවකින් නෑමක් වැනිය. මොහුගෙන් අපට ප්‍රයෝජනයක් නැතැයි බෝසතුන් අතහැර තම තමන්ගේ පාත්‍රසිවුරු රැගෙන යොදුන් දහඅටක් මග ගෙවා ඉසිපතනයට පිවිසියහ.

එසමයෙහි වනාහි උරුවෙලාවේ සේනානි නියම්ගම සේනානි කෙළෙඹියාගේ ගෙදර උපන් සුජාතා නම් දැරිය සුදුසුවියට පැමිණි කල්හි එක් නුගරුකක් වෙත ගොස් ප්‍රාර්ථනාවක් කළාය. ඉදින් මට සමාන ජාතික කුල ගෙදරකට ගොස්, පළමු ගර්භයේදී පුතකු ලබන්නෙම් නම්, වර්ෂයක් පාසා ඔබට ලක්ෂයක් වියදම් කිරීමෙන් පූජා කර්මයක් කරන්නෙමි යනුවෙනි. ඇගේ ඒ ප්‍රාර්ථනාව සමෘද්ධ විය. ඇය බෝසතුන්

දුෂ්කරක්‍රියා කරන්නා වූ සවෙනි වර්ෂයෙහි පිරිපුන් වෙසක් පුන්පෝදා පූජා කර්මය කරනු කැමැති වී පළමුවෙන්ම දෙනුන් දහසක් වැල්මී වනයක කවා ඇලාගේ කිරි පන්සියයක් දෙනුන්ට පොවා, ඇලාගේ කිරි එකසිය පනහක් දෙනුන්ටද, මෙසේ සොළසක් දෙනුන්ගේ කිරි දෙනුන් අටදෙනෙකුටද පොවා පිඬු පිණිස හැසිරන කාලය පැමිණෙනු ලබන්නේ උදෑසනම ගොස් ඒ ගසමුල වැඩසිටි සේක. තමන්ගේ ප්‍රභාවෙන් මුළු ගසමුල බබළන්නේ, එවිට බෝසතුන් ගසමුල නැගෙනහිර ලෝකධාතුව බලමින් වැඩසිටිනා අයුරු පුණ්ණා දුටුවාය. උන්වහන්සේගේ සිරුරින් නික්මෙන්නා වූ ආලෝකයෙන් මුළු ගසම රන්වන් ආකාරයෙන් දැක ඇයට මෙබඳු අදහසක් පහළ වූවාය. අද අපගේ දේවතාවා ගසෙන් බැස සැබවින්ම පූජා පිළිගැනීමට හුන්නේ යයි හඟිමි. ප්‍රීතියට පැමිණ ඉක්මනට ගොස් සුජාතාවට මේ කරුණ දැන්වූවාය. සුජාතා ඇගේ වචනය අසා සතුටු සිතැතිව අද මෙතැන් පටන් මගේ ජ්‍යෙෂ්ඨ දුවණිය තනතුරේ පිහිටවයි දුවට සුදුසු සියළු අලංකාර දුන්නාය. යම්ලෙසකින් බුද්ධ ආනුභාවයෙන් පැමිණෙන දවසෙහි දසදහස් ගණන් ගණනින්, අනර්ඝ වූ රන්තැලියක් ලැබීමට වටී. එහෙයින් ඇය රන් තැලියක කිරිබත් පිසන්නෙමියි සිත උපදවා සියදහස් අනර්ඝ වූ රන්තැලියක් ගෙන්වාගෙන එහි කිරිබත පිසනු කැමැතිව පිසන භාජනයක් ආවර්ජනා කළාය. සියලු කිරිබත් නෙළුම්කොලයේ වැටෙන ජලය මෙන් නොනැවතී භාජනයේ පිහිටීය. එකසැළියක් පිරුණේම විය. ඇය ඒ පාත්‍රය රැගෙන භාජනයකින් වසා සුදු වස්ත්‍රයකින් වෙලා තෙමේ සියළු අලංකාරවලින් සිරුර සරසවා ඒ භාජනය තමන්ගේ හිසමත තබා මහත් ආනුභාවයෙන් න්‍යග්‍රෝධරුක මුලට ගොස්, බෝසතුන් දැක, බලවත් සතුටට පත්වූයේ වෘක්ෂ දේවතාවා යන හැඟීමෙන්, දුටු මොහොතේ පටන් නැමී නැමී ගොස් හිසෙන් පාත්‍රය බහා තබා හැසිර රන් කෙණ්ඩියකින් සුවඳමල් මිශ්‍ර ජලය ගෙන බෝසතුන් වෙත ගොස් පිළිගන්වා සිටියාය. සටිකාර මහා බ්‍රහ්මයා විසින් දෙන ලද මැටිපාත්‍රය මෙපමණ කලක් බෝසතුන් අත්නොහැර එකෙණෙහි නොපෙනී ගියේ බෝධිසත්ත්වයෙක් පාත්‍රය නොදකින්නේ දකුණු අත දිගහැර සුජාතාවනි, පැන් පිළිගන්වන්න. පැන් සමග බෝසතුන්ගේ අතෙහි කිරිබත්ද තැබුවාය. බෝසත්හු සුජාතා දෙස බැලූහ. ඇය අවස්ථාව සළකා, ආර්යනි; මා විසින් ඔබතුමාට පිරිනමන ලද්ද කැමැති දෙයක් කරාවා!යි කියා වැඳ, යම්සේ මගේ මනදොළ සඵල වූයේද, එසේ ඔබගේ ද පැතුම සඵල වේවා!යි පවසා සියදහස් ගණනක් අගනා රන් පාත්‍රයද, පෞරාණික පාත්‍රයක් මෙන් පරිත්‍යාගකොට අපේක්ෂා

රහිතව පිටත්ව ගියාය. බෝසත්හුද හුන් තැනින් නැගිට ගස ප්‍රදක්ෂිණාකොට පාත්‍රය රැගෙන නේරංජරා නදී තීරයට ගොස්, නොයෙක් දස දහස් ගණන් බෝධිසත්වවරු අභිසම්බෝධියට පත්වන දවසේ බැස ස්නානය කරන සුප්පතිට්ඨිත නම් මනාසේ පිහිටි තොටුපොළක් ඇත. එහි ඉවුරෙහි පාත්‍රය තබා තොටුපොළට බැස නා; නොයෙක් සියදහසක් බුදුවරු පොරවන අර්හත්ධජය පොරවා, පෙරදිගට මුහුණලා හිඳ එක් ඉදුණු තල්ගෙඩියක ප්‍රමාණයේ බත්පිඬු හතළිස්නමයක් කොට, අල්ප උදක ඇති පැණි කිරිබත සියල්ල අනුභව කළේය. හෙතම බුදුවීමේ අභිලාෂයෙන් සත් සතියක් බෝධි මණ්ඩපයේ වාසය කරන්නේ දින හතළිස් නමයක්ම ආහාර විය. එපමණකල් වෙනත් ආහාරයක් නැත. නෑමක් නැතිව, මුව සේදීමක් නැතිව, ශරීරකෘත්‍යය නොමැතිව, ධ්‍යානසුවයෙන් හා ඵලසමාපත්ති සුවයෙන් කල්ගෙවීය. ඒ කිරිබත වළඳා රන්පාත්‍රය ගෙන ඉදින් අද මම බුදුවන්නේ නම්, මේ පාත්‍රය උඩුගං බලා යේවා!යි එසේ නොවන්නේ නම්, යටිගං බලායේවා'යි පවසා නදී සැඩ පහරට දැමීය. එය සැඩපහර සිඳිමින් නදිය මැදට ගොස් මැද සිටින්නා වූ ජව සම්පන්න අශ්වයෙකු මෙන් අසූරියනක් පමණදුරට උඩුගං බලා ගොස් එක ආවාටයක ගිලී කාල නාගරාජ භවනට ගොස් බුදුවරු තෙනමක් පරිභෝග කළ පාත්‍ර "කිලි කිලි" යයි නාද කරවමින් පහරදී ඒ සියල්ලට යටින් සිටියේය. කාල නාරජු ඒ ශබ්දය අසා බියට පත්ව, එක් බුදුවරයකු උපන්නේය. යළිත් අද එක් බුදුවරයෙකු උපන්නේ යයි පවසා නොයෙක් ගාථා පද සියයකින් තුති පුද කරමින් නැගී සිටියේ එහිදී මහාපොළොව එක් තැනකින් තුන් ගව්වක් පමණ දුරට අහස පුරා උඩට නගින කලක් මෙන් අද හෝ ඊයේ හා සමාන විය. බෝසතුන්ද නදීතීරයේ මනාසේ මල් පිපුණු සල්වනයේ දිවා විහරණය කොට සවස් කාලයේ මල් නටුවෙන් මිදෙන කල්හි දේවතාවන් විසින් අලංකාර කරන ලද, රියන් අටක් පමණ පළල වූ මාර්ගයෙන් සිංහයකු මෙන් බෝරුක් මුල කරා වැඩම කළේය. නාග, යක්ෂ, ගුරුලෝ, ආදීහු දිව්‍ය සුවඳ මල් ආදියෙන් පූජා කළහ. දිව්‍ය සංගීතයද පැවැත්වූහ. දසදහසක් ලෝකධාතුව සුවඳවත්වූ එකම මල් මාලාවක් විය. එකම සාධුකාර නාදය පැවැත්විය. එසමයෙහි සොත්ථිය නම් කුසතණ ගෙනියන්නා, තෘණ රැගෙන මාර්ගයේ යන්නේ මහාබෝසතුන්ගේ ස්වභාවය දැක තණමිටි අටක් දුන්නේය. බෝසත්තුමා තෘණ රැගෙන බෝමැඩට නැඟ දකුණු දිශාවේ සිට උතුරට මුහුණලා සිටියේය. එකෙණෙහි සක්වළ දකුණ ගිලාබැස අවීචිය උඩට එන්නාක් මෙන් විය. උතුරු සක්වල භවාග්‍රය මෙන් විය. බෝසතුන් එතැන

සම්බෝධියට පැමිණීමට තැන නොවේයයි දැන ප්‍රදක්ෂිණා කරමින් පශ්චිම දිශාවට ගොස් පෙරදිගට මුහුණලා සිටියේය. එහිදී පශ්චිම සක්වල ගිලාබැස අවිචිය ඉස්මතු විය. පෙරදිග සක්වළ ඉස්මතු වී භවාග්‍රය මෙන් විය. සම්බෝධිය සඳහා මෙතැන සුදුසු තැන නොවේ යයි දැනගත්තේය. මෙසේ සිටි සිටි තැන් නැබින් තැබූ චක්‍රයක් කෙමියෙන් මඩනා කලක් මෙන් මහපොළව උතුර පහත් විය. බෝසතුන් සම්බෝධියට මේ තැන නොවේ යයි හඟිමින් බෝමැඩ ප්‍රදක්ෂිණා කරමින් නැගෙනහිර පැත්තට ගොස් නැගෙනහිරට මුහුණලා සිටියේය. නැගෙනහිර දිසාව වනාහි සියලු බුදුවරුන්ගේ පර්යංක පිහිටි තැනයයි දැන නොසෙල්වෙන තැන යයි, පරාජය නොවන තැන යයි කෙළෙස් පඳුරු විනාශ කිරීමට සුදුසු තැනයයි දැන කුසතණ අතින් ගෙන සැළීමී. එකෙණෙහි එහි තුදුස්රියන් වශ්‍රාසනය පහළ විය. බෝසතාණෝ ප්‍රීතියෙන් යුතුව වැඩහුන්හ. මෙම අවස්ථාව නිරූපණය කිරීමට කිසිම චිත්‍ර ශිල්පියෙකුට හෝ මූර්ති ශිල්පියෙකුට නොපිළිවන. ඒ තරම් ප්‍රීතිජනක අවස්ථාවකි.

මගේ සම් මස්, කෙස් ද විසිරී
නහරවැල් ඇට වුවද ඉතිරී
සිරුර මස් ලේ ගියද වියලී
බුදුව මිස මින් නොනැගිටින්නෙමි.

මම සම්බෝධියට නොපැමිණ මේ පලඟ නොබිඳින්නෙමියි. හෙණ සියයක් පාත්වුවද බිඳිය නොහැකි වූ අපරාජිත පලඟ ඇසුරුකොට හුන්නේය. එසමයේ පවිටු මාරයා සිද්ධාර්ථ කුමාරයා මගේ බලය ඉක්මවනු කැමැත්තේය. දැන් එය ඉක්මවීමට ඔහුට ඉඩ නොදෙන්නෙමියි මාර බලකාය සමීපයට ගොස් මේ කාරණය දන්වා මාර සෝෂාවකින් ගිගුම් දී මාරසේනාව රැගෙන නික්මුණේය. ඒ මාරසේනාව මාරයා පෙරටුව දොළොස් යොදුනක් වෙයි. දකුණින් ද, වමෙන් ද දොළොස් යොදුනක් වෙයි. පසුපසින් සක්වළ සීමාකොට සිටියේය. උසින් නවයොදුනක් උස් වෙයි. ඔවුන් විසින් නද දෙන ලද ගිගුම් නාද ශබ්දය යොදුන් දහසක පටන් පොළොව බිඳහෙළෙන ශබ්දය මෙන් ඇසේ. ඉක්බිති මාරදිව්‍ය පුත්‍රයා අඩයොදුනක් සහිත ගිරිමේඛලා නම් ඇතා පිට නැගී අත් දහසක් මවා නොයෙක් ආයුධ එසවීය. අවශේෂ මාර සේනාවද, ජනකාය දෙකක් එකකට එකක් අසමානව සැදී, එකිනෙකට අසමාන ආයුධ ගනිමින් ආහ. නොයෙක් වර්ණයෙන්ද නොයෙක් ආකාර මුහුණුවලින්ද නොයෙක් ආයුධ

ගනිමින්ද බෝසතුන් මැඩගෙන යන්නාක් මෙන් පැමිණියහ. දසදහසක් සක්වල දේවතාවෝ මහබෝසතුන්ට තුති පුදමින් සිටියහ. ශක්‍ර දිව්‍යරාජයා විජයොත් නම් සක පිඹිමින් සිටියේය. ඒ සක අත් විස්සකින් ඉසිලිය යුතු වෙයි. තෙමේ වාතය ගෙන, පිඹිමින් සාර මාසයක් ශබ්දකොට නිශ්ශබ්ද වෙයි. මහාකාල නාරජු, අතිරේක වචන සියයකින් වර්ණනා කරමින් සිටියේය. මහා බ්‍රහ්මයා සුදු කුඩයක් දරමින් සිටියේය. මාරසේනාව බෝධි මණ්ඩලය වෙත පැමිණෙන කල්හි ඔවුන් එකකුට හෝ සිටීමට නොහැකි විය. ඔව්හු හිස් ලූ ලූ අත පලාගියහ. නාරජුද පොළොවේ ගිලී යොදුන් පන්සියයක් පමණ වූ මඤ්ජරී නාග භවනයට ගොස් දෑතින් මුව වසාගෙන හොත්තේය. ශක්‍ර දේවරාජයාද විජයොත් සක පිටේ තබාගෙන සක්වළ මුවවිට සිටියේය. මහා බ්‍රහ්මයා සුදුකුඩය සක්වළ කෙළවර තබා බ්‍රහ්මලෝකයටම ගියේය. එක් දේවතාවකුට හෝ සිටීමට හැකි වූයේ නැත. මහාබෝසත්හු හුදකලාවම සිටියේය. මාරයාද තම පිරිසට කීවේය. දරුවනි; සුද්ධෝදන පුත්‍ර වූ සිද්ධාර්ථ සමාන වෙනත් පුරුෂයකු නැත. අපි ඉදිරියේ යුද්ධ කිරීමට නොහැකි වන්නෙමු. පසුපසින් යමු!යි බෝසත්හුද තුන්පැත්ත බලා සියළු දේවතාවන් පලාගිය බැවින් ශූන්‍ය බව දුටුවේය. නැවත උතුරු පැත්තෙන් මාරසේනාව ආක්‍රමණය කරන බව දැක, මෙපමණ ජනතාව මා හුදකලා කොට එක් අයකු මා පරාජය කිරීම සඳහා මහත් වෑයමක් කරයි. මේ ස්ථානයේ මගේ මව හෝ පියා හෝ සහෝදරයෙක් හෝ අනෙක් නෑදෑයෙක් හෝ නැත. මේ චනාහි මා දීර්ඝ කාලයක් පුරා දසපාරමිදම් පුරා, දරුපිරිස හා සේවක ජනතාව සමාන වූයේ එහෙයින් මා විසින් පාරමිතා බලය මුල්කොට පාරමිතා සැතින්ම පහරදී මේ බලකාය පලවා හැරීමට වටී යයි දස පාරමිතා ආවර්ජනා කරමින්ම සිටියේය. ඉක්බිති මාරදිව්‍යපුත්‍රයා සුළඟින්ම සිද්ධාර්ථව පලවා හරින්නෙමියි (වාත) සුළං බලයක් නිකුත් කළේය. එකෙණෙහිම මුලදීම බිඳුණු වාතය යොදුන් අඩක් යොදුනක් යොදුන් දෙකක තුනක පමණ, මහ පර්වත පුරා වනාන්තරයේ මහා ගස් මුලින් උදුරා දමා, හාත්පස ගම් නියම්ගම් සුණුවිසුණු කිරීමට සමත් වුවද, මහ බෝසතුන්ගේ පින් තේජසින් පැතිරුණු ආනුභාවයෙන් බෝසතුන්ගේ සිවුරු කොනක්වත් සෙලවීමට නොහැකි වූහ. ඉක්බිති ජලයෙහි ගිල්වා මරන්නෙමියි මහා වර්ෂාවක් වැස්සවීය. වළාකුළු එකිනෙක මත සියක් වලාපටල නැගී දහසක් පටලවලට බෙදී වර්ෂාව වැස්සහ. වර්ෂා ධාරාවල වේගයෙන් පොළොව සිදුරු විය. වනාන්තරයේ ගස්වැල් මහසැඩ පහරක් අවුත් බෝසතුන්ගේ උසට සිටියද, වැසිවලින් බෝසතුන්ගේ සිවුරු කොනක් පිණිබිඳකින් තෙමෙන පමණටවත්

තෙම්මට නුපුළුවන් විය. ඉක්බිති ඔහු ගල් වර්ෂාවක් වස්සවන ලදී. මහත් මහත් වූ ගල් පර්වත දුම් දමමින්, ගිනිගනිමින් අහසින් වැටේ. බෝසතුන් ළඟ වැටුණු ඒ ගල් දිවමල් ගොමු බවට පත්විය. ඉක්බිති ආයුධ-ප්‍රහාරණ වර්ෂාවක් වැස්සවීය. එක පැත්ත දෙපැත්ත කැපෙන කඩු මුවහත් මෙන් තියුණු මුවහත් ඇති අවි ආයුධ දුම දමමින් දිළිසෙමින් අහසින් අවුත් බෝසතුන් සමීපයට වැටුණ ඒ ආයුධ දිව්‍ය පුෂ්ප බවට පත්විය. ඉක්බිති අඟුරු වැස්සක් මැවීය. කිණිහිරි මල් වැනි දිළියෙන අඟුරු අහසින් අවුත් බෝසතුන්ගේ පාමුල ඒ අඟුරු දිව්‍යමල් බවට පත්වී විසිරුණහ. ඉක්බිති උණු අළු වර්ෂාවක් මවාපීය. ඉතා උණු ගිනියම් වූ උණු අළු අහසින් ඇවිත් බෝසතුන්ගේ පාද මූලයේ සඳුන්කුඩු බවට පත්වී වැටුණි. ඉක්බිති වැලි වර්ෂාවක් එවීය. ඉතා සියුම් වැලි, දුම් දමමින් ගිනිගෙන බැබළෙමින් අහසින් අවුත් බෝසතුන්ගේ පාමුල දිව්‍ය පුෂ්ප බවට පත්වී වැටුණහ. ඉක්බිති මඩ වර්ෂාවක් එවන ලදී. ඒ මඩ දුම් දමමින් දිළිසෙමින් අහසින් අවුත් බෝසතුන්ගේ පාමුල දිව්‍ය විලේපන බවට පත්වී වැටුණේය. ඉක්බිති මේ අයුරින් හිංසාකොට සිද්ධාර්ථ බියගන්වා පලවා හරින්නෙමියි, අන්ධකාරයක් මවන ලදී. එය සතර ආකාරයෙන් සමන්විත අඳුරක් මෙන් මහා අඳුරක් වී බෝසතුන් වෙත පැමිණ සූර්යාලෝකය පැතිරෙන්නාක් මෙන් අඳුර අතුරුදන් විය.

මෙසේ ඒ මාරයා මේ වාත, වැසි, ගල්, ආයුධ, වාත වර්ෂා, පාසාණ, අඟුරු, උණුඅළු, වැලි, මඩ, අඳුරු නවාකාර වර්ෂාවලින් බෝසතුන් පලවාහැරීමට නොහැකි වන්නේ, බොල; කුමකට සිටිවුද? මේ සිද්ධාර්ථ කුමාරයා ගනිවු! පහර දෙවු! පලවා හරිවු! යයි තමන්ගේ පිරිසට අණකොට, තෙමේ ගිරිමේඛලා ඇතුගේ කඳෙහි හුන්නේ, චක්‍රායුධය ගෙන බෝසතුන් වෙත එළඹ සිද්ධාර්ථය; නැගිටින්න. මේ පලඟින් ඔබට පැමිණීමට නොහැකියි, එයට මම පැමිණෙමි යනුවෙන් කීවේය. බෝසත් ඔහුගේ වචන අසා මෙසේ කීවේය. මාරය; ඔබ විසින් දසපාරමිතා පුරා නොමැත. දස උප පාරමිතාද පුරා නැත. දස පරමාර්ථ පාරමිතාද පුරා නැත. පංචමහා පරිත්‍යාග සිදුකර නොමැත. ඥාති චර්යාව නැත. ලෝකාර්ථ චරියාවද නැත. බුද්ධ චර්යාව ද පුරා නොමැත. සියල්ල මා විසින්ම පුරා ඇත. එහෙයින් ඔබට පළඟෙහි හිමිකමක් නැත. එය මා වෙතම පැමිණෙයි. මාරයා, කිපුණේ, ක්‍රෝධ වේගය නොඉවසන්නේ බෝසතුන් වෙත චක්‍රායුධය දමා ගැසීය. එය පාරමිතා සිහිපත් කරන්නා වූ බෝසතුන්ගේ හිස මතුයෙහි මල් වියනක් මෙන් සිටියේය. එම සියුම් මුවහත් ඇති චක්‍රායුධය, කිපුණු

මරුවා විසින් වෙන දිනක විහිදුවා හළේ නම්, කළුගල් පර්වතයක් වුවද හුණබඩක් මෙන් සිඳී යන්නේය. අද ඒ චක්‍රායුධය බෝසතුන්ගේ හිස මතුයේ මල් වියනක් මෙන් පිහිටියේය. මරසෙනඟ දැන් දැන් බෝසතුන් පළඟ හැර පලායතැයි මහත් මහත් ගල්කුළු පෙරළා හැරියත් ඒවාද බෝසතුන් ඉදිරියේ මල්ගුලා බවට පත්ව බිම පතිත විය. දේවතාවෝ චක්‍රවාටයේ මුව අභියස සිටියෝ, බෙල්ල දිගුකර, හිස ඔසවා ඒකාන්තයෙන් සිද්ධාර්ථ කුමාරයාගේ රූපයෙන් අග පැමිණි ආත්මභාවය විනාශ වූයේය. ඔහු කුමක් කරන්නේ දැයි බලන්. ඉක්බිති බෝධිසත්ත්වයෝ පුරණ ලද පාරමිතා බෝසතාණන්ගේ අභිසම්බෝධි ලබන දිනයේ පැමිණි පලඟ මට පැමිණෙයි කියා සිටි මාරයාට මෙසේ කීවේය. මාරය! ඔබ විසින් දෙන ලද දානයන් පිළිබඳව කවරෙක් සාක්ෂිද? මාරයා මෙපමණ ජනතාව මට සාක්ෂි වෙයි යයි මාරබල සේනාව ඉදිරියට අත දිගු කළේය. එකෙණෙහිම මාර පිරිසද මම සාක්ෂි, මම සාක්ෂි යයි පවත්වන ශබ්දය පොළොව පලාගෙන යන ආකාරයක් විය. එවිට මාරයා බෝසතුන්ට කීවේය. සිද්ධාර්ථය; ඔබ දාන දෙන ලද බවට කවරෙක් සාක්ෂිද? බෝධිසත්ත්වයෝ ඔබ දන් දෙන ලද බවට චේතනා සහිත සාක්ෂි වෙති. මට වනාහි මේ ස්ථානයේ පණ ඇති සාක්ෂි කිසිවක් නැත. ටික වේලාවක් සිටිවා! මාගේ අවශේෂ ආත්මභාවවල දුන් දාන තබා, එක වෙස්සන්තර ආත්ම භාවයේ සිට සත්සියයක් මහදන් මා විසින් දුන් බවට, අචේතන වුවද මේ මහ ඝනපොළොව සාක්ෂි යයි, සිවුරුගැබ අතරින් දකුණු අත ඉවතට ගෙන, වෙස්සන්තර ආත්මභාවයේ සිට මා විසින් සත්සියයක් මහදන් දුන් බවට ඔබ සාක්ෂිද? සාක්ෂි නැතිද? කියමින් මහපොළොව දෙසට අත දිගු කළේය. මහපොළොව මම ඔබ ඔබට සාක්ෂි යැයි සියක් වරක් හඬනගමින්, දහස්වරක් හඬ නගමින් දසදහස් වරක් හඬ නගමින්, මාරසේනාව නිරුත්තර කරන්නාක් මෙන් නාද කළේය. අනතුරුව; සිද්ධාර්ථය, ඔබ මහාපුරුෂ වූ ඔබ දෙනලද දාන මහාදාන වේ. උත්තම දාන වේ. යනුවෙන් වෙස්සන්තර දානය සිහිපත් කරමින් අඩසියයක් යොදුන් ඇති ගිරිමේඛලා ඇතා දණහිසින් පිහිටුවීය. මාර පිරිස දිසාවිදිසා බලා පලාගියහ. දෙදෙනෙක් එකමගක ගිය බවක් නැත. හස් ආභරණද, ඇඳි වස්ත්‍රද හැරදමා හමුවන හමුවන දිසාවලටම පලාගියහ. ඉක්බිති දේව සමූහයා, පලායන මාරබලය දැක මාරයාට පරාජය අත්විය. සිද්ධාර්ථ කුමාරයාට ජය අත්විය අප ඔහුට ජය පූජා කරන්නෙමුයි නාගයෝ නාගයන්ට, ගුරුලෝ ගුරුලන්ට, දේවතාවෝ දේවතාවන්ට, බ්‍රහ්මයෝ

බ්‍රහ්මයන්ට සෝෂා කරවා සුවඳමල් ආදිය ගත් අත් ඇතිව, බෝසතුන්ගේ සමීපයට බෝධිපල්ලංකය වෙත ගියහ. එසේ ගියකල්හි :-

"සිරිමත් බුදුරදුන්ට ජයවේවා!
පාපී වූ මාරයාට පැරදුම වේවා!
බෝධිමණ්ඩයේ ප්‍රමුදිත වූ, මහර්ෂීන්ට
ජය අත්වේවායි නාගසේනාව මහත් වූ හඬ නගා ප්‍රකාශ කළහ.

"සිරිමත් වූ මේ බුදුරදුන්ට ජයවේවා!
පාපී වූ මාරයාට පැරදුම වේවා!
බෝධි මණ්ඩපයේ ප්‍රමුදිත වූ මහර්ෂීන්ට
ජය අත්වේවායි සුඵර්ණ සේනාව මහත්වූ හඬනගා සෝෂාකළහ.

"සිරිමත් වූ මේ බුදුරදුන්ට ජයවේවා!
පාපී වූ මාරයාට පැරදුම වේවා!
බෝධි මණ්ඩපයේ ප්‍රමුදිතව මහර්ෂීන්ට
ජය අත්වේවායි දෙව් පිරිස මහත් වූ හඬනගා සෝෂා කළහ.

"සිරිමත් වූ බුදුරදුන්ට ජයවේවා! - පාපී වූ මාරයාට
පැරදුම වේවා! බෝධිමඩුල්ලේ ප්‍රමුදිත වූ
මහර්ෂීන්ට ජය අත්වේවායි මහත් වූ හඬ නගා සෝෂා කළහ.

අවශේෂ, දසදහසක් සක්වල දේවතාවෝ මල්සුවඳ විලේපනවලින් පුදනු ලබන්නෝ නානාප්‍රකාර වූ ස්තුති වදන් කියමින් සිටියහ. මෙසේ හිරු පායා සිටියදීම මහා පුරුෂයා මාරබලය පලවාහැර, රන්පබළු දැලකින් පුදන්නාක් මෙන් බෝ අංකුරවලින්ද, රතු පබළු මෙන් වූ ළාදුළු වලින්ද පුදනු ලබන්නේ, පළමු යාමයේම පූර්වේනිවාසානුස්සති ඤාණය (පෙර භවය පිළිබඳ සිහිකරන) මධ්‍යම යාමයේ දිබ්බචක්ඛු (දිවැස්) ඤාණයද පිරිසිදුකොට පශ්චිම යාමයේ පටිච්ච සමුප්පාද ඤාණය ලබාගත්හ. ඉක්බිති උන්වහන්සේ දොළොස් වැදෑරුම් වූද මුලසිට අගට අගසිට මුලට වශයෙන්ද, අනුලෝම-ප්‍රතිලෝම වශයෙන්ද මෙනෙහි කරන්නාහු, සමුද්‍රර සීමාකොට ඇති දසදහසක් ලෝකධාතුව දහදොළොස් වාරයක් කම්පා විය. බෝසත්තෙම දසදහසක් ලෝකධාතුව අලංකාරයෙන් සැරසුණේ විය. නැගෙනහිර සක්වළ මුවවිටින් ඔසවන ලද්දා වූ රැස්දහර පශ්චිම

සක්වළ මුවවිටට වැදේ. එපරිදි පශ්චිම චක්‍රවාටයේ මුවවිට ඔසවන ලද රැස්දහර නැගෙනහිර චක්‍රවාටයේ මුවිටට වැදේ. දකුණු සක්වල මුවවිට කෙළවර ඔසවන ලද රැස්දහර උතුරු සක්වල මුවවිට වැදේ. උතුරු සක්වල මුවවිට කෙළවර රැස්දහර දකුණු සක්වල මුවවිටට වැදේ. පොළෝතලයේ චක්‍රවාටය මුවවිට ඔසවනලද ධජ පතාකයන්ගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි හැපේ. බ්‍රහ්මලෝකයේ බඳනා ලද ධජ පතාකයන්ගේ කෙළවර මහපොළොව මත පිහිටියේය. දස දහසක් සක්වල මල් නැති ගස් මල් ඵල ගත්හ. ගෙඩි නැති ගස් ඵලබරින් බර වූහ. කඳන්වල කඳ පියුම් පිපුණාහ. අතුවල අතු අග මල් පිපිණ. වැල්වල වැල් පියුම්, අහසේ එල්ලෙන පියුම්, ගල්තලා බිඳගෙන ඒ මත සත සත බැගින් වී, දණ්ඩ පියුම් පැනනැංගාහ. දසදහසක් ලෝකධාතුව වටකොට විසුරුවන ලද මල් ගුහාවක් මෙන් මල් යහනාවක් මෙන්ද මල් විසුරුණේ විය. සක්වල අතර යොදුන් අට දහසක ලෝකාන්තරික නිරයේ සත්ත්වයෝ සූර්යා ඇති කල්හිද නොබබළන්නේ වී, එදින ඒකාලෝක වූහ. අසූහතර දහසක් යොදුන් ගැඹුරැති, මහා සමුද්‍රය මිහිරි ජලයෙන් යුක්ත විය. නදීහු ගලා නොගියහ. ජාති අන්ධයෝ රූප බැලූහ. උපන් බිහිරෝ ශබ්ද ඇසූහ. උපන් කොරවූවෝ පියවර ගමන් කළහ. අඳුන් බන්ධනාදිය සිඳී වැටුණාහ. මෙසේ අප්‍රමාණ සිරි සම්පතින් පුදනු ලබන බෝසතාණෝ නොයෙක් ආකාර ආශ්චර්ය අද්භූත ධර්මයන් පහළවන කල්හි සර්වඥතා ඥානය අවබෝධ කොටගෙන සියළු බුදුවරුන් විසින් දෙසා වදාළ උදානයෙන් උදන් ඇනිය.

"නොයෙක් ජාතිවල සසර ඇවිද්දෙමි
සසර තනන වඩුවා සොයමින්
ඔහු මට හමුවිය දනිමි හැඳින්නෙමි
සසර පිරූ පාරමී බලයෙන්
ගෙයක් තනන්නට මින්පසු නම් බැහැ
දැවදඬු සමගින් කැණීමඩලද ගෙන
සියළුම අවයව පිළිස්සුවේ
උදම් අනමි අද විනාස කෙරුවෙන්
'තණ්හා' නම් ඇති රූඳු වඩුවා

මෙසේ තුසිත භවනින් පටන් බෝධි මණ්ඩලයේ සර්වඥතා ඥානයට පැමිණීම දක්වා මෙපමණ තැන් **අවිදූරෙ නිදාන** යයි දත යුතුය.

සන්තිකෙ නිදානං වනාහි "එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයේ අනාථපිණ්ඩික සිටුගේ ආරාමයේ වැඩවාසය කරන කල්හිද, විශාලාවේ මහවනයේ කූටාගාර ශාලාවේ වැඩවාසය කරන කල්හිද, යනුවෙන් මෙසේ ඒ ඒ ස්ථානයේම ලබයි යනුවෙන් කියන ලදි. කුමක් නිසා මෙසේ කියන ලදද? ඉක්බිති එය මුල පටන් මෙසේ දතයුතුය. උදානයෙන් උදම් වී ජය පල්ලංකයෙහි වැඩසිටින්නා වූ බුදුරදුන්ට මෙබඳු අදහසක් පහළවිය. "මම සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ මෙම පල්ලංකයට අදාළ කාරණා සෙව්වෙමි, මම මෙපමණ කලක් මේ බෝධි පලඟින් වැඩසිටීමේ කාරණය සඳහා, අලංකාර වූ හිස, ග්‍රීවයෙන් වෙන්කොට දෙන ලද්දෙමි. මනාසේ සිතුවම් කළ ඇස් හෘදය මාංශද, උදුරා දෙන ලදි. ජාලය කුමරු හා සමාන පුත්‍රයින් ද කෘෂ්ණජිනා කුමාරිය හා සමාන දූවරුන්ද මද්‍රි දේවිය හා සමාන භාර්යාවන්ද අනුන්ට දාස පිණිස දෙන ලදී. මගේ මේ පල්ලංකය ජය පල්ලංකයකි. උතුම් පල්ලංකයකි. මෙහි මා හුන්නා වූ අවස්ථාවේ ඇතිවූ සංකල්පනාව නම් "එය පරිපූර්ණ කොට මිස මෙතනින් නොනැගිටින්නෙමි" යනුවෙනි. නොයෙක් කෝටි සියදහස් ගණන් සමාපත්ති සමාදන් වෙන්නේ, සත්දිනක් එතැනම වැඩ හුන්නේය. යමක් සඳහා කියන ලදද?

> **"ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විමුක්ති සුවය මෙනෙහි කරමින් සත් දිනක් එකම පළඟක් මත වැඩසිටි සේක."** තව ද ඇතැම් දෙවිවරුන්ට අදද ඒකාන්තයෙන් සිද්ධාර්ථ හට කළයුතු කිස ඇත. පලඟෙහි ආලය අත් නොහරියි යනුවෙන් තර්ක විතර්ක හටගත්තේය. ශාස්තෘන් වහන්සේ දේවතාවන්ගේ තර්ක විතර්ක දැන ඔවුන්ගේ තර්ක විතර්ක සංසිඳවීම පිණිස අහසට පැන නැග, යමක ප්‍රාතිහාර්ය පෑ සේක.

මහාබෝධි මණ්ඩපයේදී කරන ලද ප්‍රාතිහාර්ය ද, ඤාති සමූහයා මැද කරන ලද ප්‍රාතිහාර්යද පාටික පුත්‍ර සමූහයා ඉදිරියේදී කරන ලද ප්‍රාතිහාර්ය සියල්ලද ගණ්ඩම්බ රුක්මුලදී (අඹගස මුලදී) කරනලද ප්‍රාතිහාර්ය හා සමාන විය. මෙසේ ශාස්තෘන් වහන්සේ මේ ප්‍රාතිහාර්යයෙන් දේවතාවන්ගේ විතර්ක සංසිඳවා පළඟට ස්වල්පයක් නැගෙනහිර ඇසුරුකොට, උතුරුදිශා භාගයේ සිට "ඒකාන්තයෙන් මේ පල්ලංකයේදී මට සර්වඥතා ඥානය අවබෝධ වූයේ" යයි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පුරණ ලද පාරමිතාවන්ගේ අධිගම ඵලය පලඟේදී අනිමිස

ලෝචනයෙන් බලමින් සත්දිනක් කල්ගත කළ සේක. ඒ ස්ථානය "**අනිමිස චේතිය**" යන නමින් හැඳින්වේ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ පලඟේ වැඩසිටි අතර සක්මනක් මවා ඉදිරියටද පසුපසටද රුවන් සක්මන දිගේ සක්මන් කරමින් සත්දිනක් කල්ගත කළ සේක. ඒ ස්ථානය **රුවන් සක්මන** යනුවෙන් හැඳින්වේ. සතරවෙනි සතියෙහි වනාහි බෝධියට පසු උතුරුදිශා භාගයේ දේවතාවෝ රුවන්ගෙයක් මැවූහ. එහි භාග්‍යවතුන් වහන්සේ පලඟින් වැඩහිඳ විශේෂයෙන් අභිධර්ම පිටකය මුලසිට අගට මෙනෙහි කරමින් සත්දිනක් කල්ගත කළ සේක. අභිධර්මිකයෝ **කිවානුය.** රතනඝර යනු මැණික්මය ගෙයක් නොවේ. ප්‍රකරණ සප්තකය මෙනෙහි කරන ලද බැවින් රතනඝර (රුවන්ගෙය) නම් වේ. යම්හෙයකින් මෙහි අර්ථ දෙකම පර්යාය වශයෙන් යොදනු ලැබෙත්. එබැවින් අර්ථ දෙකම ගතයුතුය. එතැන් පටන් එම ස්ථානය **රතනඝර චේතිය** නමින් හැඳින්විය. මෙසේ ශාස්තෘන් වහන්සේ බෝධිය සමීපයේම සතර සතියක් කල්ගත කොට පස්වෙනි සතියෙහි බෝරුකමුල සිට අජපාල නුගරුක මුල යම්තැනකද? එතනට වැඩම කළහ. එහිදී ද ධර්මය **පරීක්ෂා කරන්නේ** විමුක්ති සුවය පිළිබඳ මෙනෙහි කරමින් කල්ගත කළ සේක. එසමයෙහිද පවිටු මාරයා, "මෙපමණ කලක් මොහුගේ සිදුරු සොයමින් ලුහුබැන්දේ වී නමුත් මොහුගේ කිසිම දෝෂයක් වනවා නුදුටුවෙමි. මොහු මගේ බලය ඉක්මවූයේ යයි සිතමින් දොම්නසට පැමිණියේ, මහා මාර්ගයේ හිඳ, කාරණා දහසයක් ගැන සිතන්නේ, බිම ඉරි දාසයක් ඇන්දේය. මම මෙතුමා මෙන් **දාන පාරමිතාව** නොපිරුවෙමි. එසේ හෙයින් මොහු හා සමාන නොවූයේ යයි එක ඉරක් (රේඛාවක්) ඇඳිය. එසේම මම මෙතුමා මෙන්, **සීල පාරමිතාව, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව, ප්‍රඥා පාරමිතාව, වීර්ය පාරමිතාව, ක්ෂාන්ති පාරමිතාව, සත්‍ය පාරමිතාව, අධිෂ්ඨාන පාරමිතාව, මෛත්‍රී පාරමිතාව, උපේක්ෂා පාරමිතාව** නොපිරුවෙමි. එහෙයින් මම මොහු හා සමාන නුවූවෙමි. රේඛා දහයක් ඇන්දේය. එසේය. මම මොහුගෙන් අන්‍යයන්ට පොදු නොවූ ඉන්ද්‍රිය පරෝපරියත්ති ඤාණය, ආසයානුසය ඤාණය, මහා කරුණා සමාපත්ති ඤාණය, යමක පාටිහාරී ඤාණය, අනාවරණ ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, ලැබීමට දස පාරමිතාවන් නොපිරීමි. එම නිසා මම ඔහු සමාන නොවීමි'යි පිළිවෙළින් දහසය වන රේඛාව ද අඳිමින් උන්නේය.

එසමයෙහි, **තණ්හා, රති, රගා** යන මාර දූවරු තිදෙනා "අපට පියා නොපෙනෙයි" මොහු කොහේදැයි සොයාබලන්නේම ඔහු දොම්නසට

පැමිණ භූමියෙහි ඉරි අදිමින් සිටිනවා දැක, පියා සමීපයට ගොස් "පියාණනි; කුමක් හෙයින් ඔබ දුක්වූ නරක් වූ සිතින් දැයි විචාළේය. "දරුව, මේ මහා ශ්‍රමණයා මගේ බලය ඉක්මවා යන්නේ මෙපමණ කලක් බලා සිටින්නේ ඉඩකඩ මාත්‍රයක් නොහැකි වීමි. එබැවින් දුකින් නරක් වූ සිතින් යයි කීවේය" ඉදින් මෙසේ නොසිතවු! අපි මොහු තමන්ගේ වසඟයට ගෙන පැමිණෙන්නෙමු" කීවාහුය. දරුවනි; මේ පුරුෂයා අචල ශ්‍රද්ධාවෙහි පිහිටියෝ මෙතුමා කිසිවකු විසින් වසඟ කරනු ලැබීමට නොහැකිය. පියාණනි, අපි ස්ත්‍රීහු වෙමු. දැන් මොහුට රාගබන්ධනාදියෙන් බැඳ රැගෙන එන්නෙමු. නුඹ නහමක් නොසිතුව මැනව යයි පවසා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ශ්‍රමණය; ඔබගේ පා සේවනය කරමු'යි කීවාහුය. භාග්‍යවතුන් වහන්සේ ඈලාගේ වචන මෙනෙහි නොකළේය. යම්තම්න්වත් ඇස් ඇර නොබැලුවේය. අවබෝධ කරගත් අනුත්තර වූ විමුක්ති සුවයද, විවේක සුවයද අනුභව කරමින් වැඩහුන් සේක. නැවත මාර දූවරු "උස් පහත් හඬින් පුරුෂයන්ගේ අභිප්‍රාය කෙසේනම් ගැහැණුන් වෙත පත්වේද, ගැහැණුන් කෙරෙහි ප්‍රේමය වෙයිද? කෙසේනම් පළමු වයසෙහි සිටියේද, කෙසේ මධ්‍යම වයසේ සිටියෝද, පශ්චිම වයසේදි කෙසේ නම් වේද? යම්බඳු වූ අපි නොයෙක් ආකාරයෙන් පොළොඹවා ගන්නෙමු'යයි එක් එක් කුමාරිකාවන් වර්ණ හැඩතල වශයෙන් සියයක් සියයක් ආත්ම භාවයන් මවාගෙන නොඉඳුල් කුමාරිකාවක ලෙසද, එක්වරක් ප්‍රසූත කළ, දෙවරක් ප්‍රසූත කළ, මධ්‍යම ප්‍රමාණයේ ස්ත්‍රීහු, මහා ස්ත්‍රීහුද වී ආදී වශයෙන් සය වතාවක් බුදුරදුන් වෙත එළඹ, ශ්‍රමණය; ඔබගේ පාද සේවනය කරමු යයි කීවාහුය. උතුම් නුවණින් මිදීම ලැබූ උතුමන් යම්සේද, භාග්‍යවතුන් වහන්සේ ඔවුන් මෙනෙහි නොකළ සේක. සමහර ආචාර්යවරු මෙසේ කියත්. "ඈලා මහා ස්ත්‍රී විලාශයෙන් පැසුළු ස්ත්‍රීන් මෙන් පැමිණියන් දැක, භගවත්හු මෑලා දත් කැඩුණු, පැසුණු කෙස් ඇතිවේවා! යනුවෙන් අධිෂ්ඨාන කළ සේක. එය නොපිළිගත යුතුය. භගවත්හු මෙබඳු ආකාර අධිෂ්ඨානයක් නොකළ සේක. භගවත්හු නුඹලා පහව කුමක් දැක මෙසේ වෙර වඩවිද ? මෙසේ වෑයම් කරවුද? මෙබඳු ආකාර වූ දේ රාගාදිය දුරු නොකළ එවුන් ඉදිරියේ කීම වටියි. තථාගතයන් වහන්සේ වනාහි රාගය ප්‍රහීණ කළ සේක. ද්වේෂය ප්‍රහීණ කළේය. මෝහය ප්‍රහීණ කළේ යයි, තමන්ගේ කෙළෙස් ප්‍රහාණය අරබයා :-

"යමකු ලැබූ දිනුම කිසිවිටක පැරදුමක් කළහැකිද, යමෙකු විසින් පරදවන ලද කෙලෙස්වලින් එකකුත් නැවත ඔහු ලුහුබඳීද,

සියළු කෙලෙසුන් දුරුකළා වූ බුදුරදුන් කවර පියවරකින්
මාරයා කරා ගෙනගිය හැකිද?
ඇලෙනසුළු වූද, දැලක් වැනි වූද, තෘෂ්ණාව යමෙකුට නැතිනම්,
සර්වඥතා ඥානය ඇති කෙලෙස් පිහිටීම් නැති බුදුරදුන්
කවර ආකාරයකින් මාරයා වෙත ගෙනගිය හැකිද?"

මේ ධම්මපදයේ බුද්ධ වර්ගයේ ගාථා දෙකක් වදාරමින් ධර්මය දේශනා කළ සේක. එය සත්‍යයයි අපගේ පියා කීවේය. සුගතයන් වහන්සේ ලෝකයෙහි අරහත්ය. රහතන් වහන්සේ වසඟයට රාගයෙන් පමුණුවාගත නොහැකියි ආදිය පවසා පියා සමීපයට ගියහ. භාග්‍යවතුන් වහන්සේද එහිම සත්දිනක් කල්යවා, අනතුරුව මුවලින්ද මූලයට ගියේය. එහි සත්දිනක් අහස වළාකුලින් වැසි තිබුණු නිසා උපන් ශීතල ආදිය නැතිකිරීමට මුවලින්ද නාගරාජයා විසින් හත්වරක් දරණයෙන් වෙලාගෙන, සම්බාධක රහිතව ගඳකිළියේ වාසය කරන්නාක් මෙන් විමුක්ති සුවය මෙනෙහි කරමින් සත්දිනක් කල් ගතකොට රාජායතනයට එළඹ එහිදීද විමුක්ති සුවය මෙනෙහි කරමින් සත්දිනක් කල්ගත කළේය. මෙපමණකින් සත සත බැගින් පරිපූර්ණ වූයේ සත්සතිය නිමා විය. මේ අතරතුර මුව සේදීමක් නොවීය. ශරීරය පිළිදැගුම් කිරීමක් නොවීය. ආහාරකිසද නොවීය. ධ්‍යාන සුවයෙන් කල් ගතකළ සේක. ඉක්බිති උන්වහන්සේට ඒ සත සත බැගින් වූ ඉහත කාලයේ දින හතළිස් නමයක් එහි වැඩසිටියේ මුව සෝදන්නෙමියි සිත් පහළවිය. ශක්‍ර දේවේන්ද්‍රයා බෙහෙත් අරළු ගෙනවිත් දුන්නේය. ශාස්තෘන් වහන්සේ ඒවා වැළඳූ සේක. එයින් උන්වහන්සේගේ ශරීර කෘත්‍යය සිදුවිය. ඉක්බිති උන්වහන්සේට ශක්‍රයාම නාළිය (බුලත්වැල්) දැහැට්ටක්ද මුව සේදීමට ජලයද දුන්නේය. ශාස්තෘන් වහන්සේ දැහැටි වළඳා අනෝතත්ත විල් ජලයෙන් මුව සෝදා ඒ රාජායතන මූල වැඩසිටි සේක. එසමයෙහි තපස්සු-භල්ලික නම් වූ වෙළෙන්දුන් දෙදෙනෙක් පන්සියයක් ගැල් සමග උක්කලා ජනපදයේ සිට මජ්ඣිම දේශයට යන්නෝ පෙර තමන්ගේ සහ ලේ නෑයකු වූ දේවතාවක විසින් කරත්ත නතර කරවා, ශාස්තෘන් වහන්සේට ආහාර සම්පාදනයේ උත්සාහවත් කළේය. අත්සුණු ද මිපිඬු ද රැගෙන "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපට අනුකම්පා උපදවා මේ ආහාර පිළිගන්නා සේක්වා"යි ශාස්තෘන් වෙත පිළිගන්වා සිටියහ. බුදුරදුන් කිරිබත් පිළිගන්නා දිනයේදී තම පාත්‍රය අතුරුදන්ව ඇති බැවින් තථාගතයෝ අත්වලට නොපිළිගනිත්. මම කුමකට පිළිගන්නෙමිද දැයි සිතුවේය. ඉක්බිති උන්වහන්සේගේ සිත දැන සතර දිශාවල සතරවරම් මහරජවරු ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් උපන් පාත්‍ර

පිළිගැන්වූහ. භාග්‍යවත්හු ඒවා ප්‍රතික්ෂේප කළ සේක. නැවත මුංඇට වර්ණයැති ශෛලමය පාත්‍ර සතරක් පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ, සතරවරම් රජදරුවන්ගේ ශ්‍රද්ධාව රැකීම පිණිස පාත්‍ර සතරම පිළිගෙන එකිනෙක තබා එකක් වේවා'යි අධිෂ්ඨාන කළ සේක. සතරද මුවවිටින් ප්‍රකටවන රේඛාවන් වී මධ්‍යම ප්‍රමාණයේ එකක් බවට පත්කළහ. භාග්‍යවත්හු ඒ අනර්ඝ ශෛලමය පාත්‍රයෙහි ආහාර පිළිගෙන වළඳා අනුමෝදනා කළ සේක. ඒ සහෝදර වෙළෙන්දෝ දෙදෙනා බුදුන්, දහම් සරණ ගොස් 'ද්වේවාචික' උපාසකයෝ වූද ඉක්බිති ස්වාමීනි අපට වැඳුම් පිදුම් කළයුතු දෙයක් දෙත්වායි, බුදුරදුන්ට පවසන්නේ, දකුණු අතින් තමන්ගේ හිස පිරිමැද කේශධාතු මිටක් දුන්හ. ඔවුහු තමන්ගේ නගරයෙහි ඒ ධාතු රන් කරඬුවක බහා චෛත්‍යයක් පිහිටවූහ. සම්මා සම්බුදුරදුන්, එතනින් නැගිට නැවත අජපාල නුගරුක මුලට ගොස් නුගරුක මුල වැඩසිටි සේක. එසේ වැඩහිඳිනා විටම තමන් අවබෝධ කළ ධර්මයේ ගැඹුරු බව මෙනෙහි කරන්නේ සියළු බුදුවරුන්ට ආවේනික වූ **තමා විසින් අවබෝධ කර ගත්** මේ ධර්මය අනුන්ට දේශනා නොකිරීමට සිත නැඹුරු විය. තමන් විසින් අවබෝධ කළ ධර්මය විමසත් විමසත්ම එහි ගැඹුරු බව දැනීමෙන් මෙසේ ඇතිවිය. ඉක්බිති සහම්පති බ්‍රහ්මයා "පින්වතුන් වහන්ස, ඒකාන්තයෙන් ලෝකය විනාශ වන්නේ යයි පවසා දස දහසක් සක්වලද ශක්‍ර, සුයාම, සන්තුෂිත, නිම්මානරති, වසවර්ති මහා බ්‍රහ්මයා ආදීන් රැගෙන ශාස්තෘ බුදුන් සමීපයට ගොස් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ධර්මය දේශනා කෙරේව. සුගතයන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා" ආදී න්‍යායෙන් ධර්මදේශනාවට ආයාචනා කළේය. ශාස්තෘන් වහන්සේ ප්‍රතිඥා දී මම කවරෙකුට පළමුව ධර්මදේශනා කරන්නෙම්දැයි, සිතන්නේ, ආලාර පණ්ඩිතයා :- ඔහු මේ ධර්මය වහාම දැනගන්නේ යයි සිත් උපදවා නැවත බලන්නේ ඔහු සත් දිනකට පෙර කළුරිය කළ බව දැන උද්දක ගැන ආවර්ජනා කළ සේක. ඔහුද පෙර දින සවස කළුරිය කළ බව දැන, මට පංචවාර්ගික භික්ෂූන් බොහෝ උපකාර කළේ යයි මෙනෙහිකොට, මේ වේලාවේ ඔවුහු කොහේ වාසය කරන්නේදැයි ආවර්ජනා කරන්නේ බරණැස ඉසිපතනයේ මිගදායේ බව දැන කිහිප දිනකින් මම බෝධිමණ්ඩපය හාත්පස පිඬු පිණිස හැසිරෙමින් වාසයකොට ඇසළ පූර්ණමී දිනයේ බරණැසට ගොස්, ධර්මචක්‍රය පවත්වන්නෙමියි, මාසයේ තුදුස්වන අවපක්ෂය දා අළුයම් වේලාවේ වේලාසනින් නැගිට, කලින්ම පා සිවුරු රැගෙන යොදුන් දහඅටක් මගට පිළිපන්නේ අතරමග උපක නම් ආජීවකයා දැක ඔහුට තමන් බුදුවූ බව පවසා, එදවස සවස් කාලයේ ඉසිපතනයට පැමිණි සේක.

පංචවග්ගිය භික්ෂූහු තථාගතයන් වහන්සේ පැමිණෙන ආකාරය දුරදීම දැක, ඇවැත්නි මේ ශ්‍රමණ ගෞතමයා, බොහෝ ප්‍රත්‍යය අනුභවකොට පිරිපුන් කයක් ඇතිව පිනන ලද ඉඳුරන් ඇතිව රන්වන්පාට වී පැමිණෙයි. මොහුට වැඳුම්-පිදුම් නොකරන්නෙමු. මහකුලයක උපතලද බැවින් සුදුසු ආසනයක් පමණක් පැනවීම සුදුසුය. එහෙයින් ඔහුට ආසනයක් පමණක් පනවන්නෙමු යි කථිකා කළහ. භාග්‍යවතුන් වහන්සේ සදේවක ලෝකයාගේ සිත් මැනවින් දැනගැනීමේ සමර්ථ වූ නුවණින් යුක්ත හෙයින් "මොවුහු කුමන දෙයක් සිතුවෝදැයි ආවර්ජනාකොට, සිත් දැනගන්නේය. ඉක්බිති ඔවුහු සියලු දෙවිමිනිසුන් අතර නියම කෙනෙකු නැති බැවින් පැතිරීමට සමත් මෛත්‍රී සිත හකුළුවා නියම කිරීම් වශයෙන් මෛත්‍රී සිතින් පැතිරවීය. ඔවුහු බුදුරදුන්ගේ මෛත්‍රී සිතින් ගැටුණේ, යම්සේ යම්සේ භගවත්හු ඔවුන් වෙත පැමිණේද, ඒ ඒ පරිදි කථා කරගත් අයුරින් සිටීමට නොහැකි වන්නේ පෙරගමන් කොට අභිවන්දනා කිරීම ආදී සියලු කටයුතු කළහ. සම්මා සම්බුදු භාවය නොදන්නා බැවින් හුදෙක් නාමයෙන් "ආවුසො" වාදයෙන් ආමන්ත්‍රණය කරහු, ඉක්බිති ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ, මහණෙනි, තථාගතයන්ට නාමයෙන් හෝ ආවුසෝ වාදයෙන් කථා නොකරවු. මහණෙනි, තථාගත සම්බුදුරදුන් අර්හත්ය යනුවෙන් තමන්ගේ බුද්ධභාවය හඟවා පනවන ලද උතුම් බුද්ධාසනයේ වැඩහුන්නේ, උතුරුසල් නැකැත් යෝගය පවත්නා කල්හි අටකෝටියක් බ්‍රහ්මයන් විසින් පිරිවරණ ලදුව, පස්වග තෙරුන් අමතා, දොළොස් ආකාර වූ ත්‍රිපරිවෘත්තයෙන් යුතු අවබෝධය වඩාත් ඉස්මතු කරවා අනුත්තර වූ ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කළ සේක. ඔවුන් අතර කොණ්ඩඤ්ඤ තෙරුන් දේශනාව අනුසාරයෙන් ඤාණය මෙහෙයවමින් සූත්‍රය අවසානයේ අටකෝටියක් බ්‍රහ්ම සේනාව සමග සෝවාන් ඵලයෙහි පිහිටි සේක. ශාස්තෘන් වහන්සේ එහිම වස් සමාදන් වී, දෙවෙනි දිනයේ වප්ප තෙරුන්ට අවවාද දෙමින් විහාරයේම වැඩසිටි සේක. සෙසු සතරදෙනා පිඬු පිණිස හැසිරුණහ. වප්ප තෙරුන් පෙරදීම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ශාස්තෘන් වහන්සේ එහිම වාසයකොට ඊළඟ දවසේ භද්දිය තෙරුන්ද, ඊළඟ දිනයේ අස්සජි තෙරුන්ද වශයෙන් සියල්ලෝ සෝවාන් ඵලයෙහි පිහිටුවා කළුවර පක්ෂයෙහි පස්වෙනිදා තෙරවරුන් පස්දෙනාම රැස්කරවා "අනත්ත ලක්ඛණ" සූත්‍රය දේශනා කළ සේක. දේශනාව අවසානයෙහි තෙරවරු පස්දෙනාම අරහත්ත ඵලයෙහි පිහිටියාහුය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ යසකුල පුත්‍රයාගේ හේතුසම්පත් දැක රාත්‍රී කාලයෙහි නින්දෙන් පිබිදී සසර කළකිරී ගෙය

හැර නික්ම එනු යසකුල පුත්‍රයා දැක, යස මෙහි එන්න යයි කැඳවා ඒ රාත්‍රී කාලයේම සෝතාපත්ති ඵලයේද, දෙවෙනි දිනයේ අරහත් ඵලයෙහිද පිහිටුවා, පසුව ඔහුගේ යහළුවන් වූ සිවු පනසක් ජනතාව ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි කරවා, රහත් ඵලයට පැමිණවීය. මෙසේ ලෝකයෙහි හැටළුවක් රහතන් වහන්සේ හටගත් කල්හි, ශාස්තෘන් වහන්සේ සමාදන් වූ චස්කාලය පවාරණය කොට "මහණෙනි, චාරිකාවේ හැසිරෙව්!" යනුවෙන් හැටක් භික්ෂූන් දිශාවලට පිටත්කර යවා තෙමේ, උරුවෙලාවට වැඩම කරන්නේ අතරමග 'කප්පාසික' වන ලැහැබෙහි (කපු වනයෙහි) භද්ද වග්ගිය කුමාරවරු තිස්දෙනෙකු හික්මවාලූ සේක. ඔවුන් අතර සියල්ලට ලාබාල වූ කුමන සෝවාන් ඵලයේද සියල්ලට වැඩිහිටි කුමරා අනාගාමීද විය. ඒ සියළු දෙනාම ඒහිභික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි කරවා, දිසා දිසාවන්හි පිටත්කර යවා තමන්වහන්සේ උරුවෙලාවට වැඩ තුන්දහස් පන්සියයක් ප්‍රාතිහාර්ය දක්වා ජටිලයන් දහසක් පිරිවරකොට ඇති උරුවෙල කස්සප ආදි තුන්බෑ ජටිලයන් පිරිවර සහිතව පහදවා ජටිලයන් දමනයකොට, ඒහිභික්ෂු භාවයෙන් පැවිදිකරවා ගයා ශීර්ෂයෙහි වැඩහිඳුවා "ආදිත්ත පරියාය" දේශනාවෙන් රහත්ඵලයේ පිහිටුවා, ඒ දහසක් රහතන් වහන්සේ විසින් පිරිවරන ලදුව බිම්බිසාර රජුට දෙනලද ප්‍රතිඥාව මුදවන්නෙමියි රජගහනුවර ඇසුරුකොට (වැල්මී) උයනට වැඩි සේක. රජු උද්‍යාන පාලකයාගෙන් ශාස්තෘන් වහන්සේ වැඩම කළේයයි අසා එක්ලක්ෂ විසිදහසක් බමුණු ගෘහපතියන් පිරිවරණ ලදුව, ශාස්තෘන් වහන්සේ වෙත ගොස්, (එකුවාත තලයෙහි) රන්පට වියනක් මෙන් ප්‍රභා සමූදායක් විහිදෙන තථාගතයන් වහන්සේගේ ශ්‍රීපාදයන් සිරසින් වැටී වැඳ පිරිසත් සමග එකත්පසෙක සිටියානු ඉක්බිති ඒ බ්‍රාහ්මණ ගෘහපතියන්ට මෙබඳු අදහසක් පහළ විය.

ශ්‍රමණ ගෞතමයෝ උරුවේල කාශ්‍යපයන්ගේ ශාසනයේ ශ්‍රාවකයෙක්ද? නැත්නම් උරුවේල කාශ්‍යප ශ්‍රමණ ගෞතමයන්ගේ සව්වෙක්ද? යන සිතිවිලි පරිවිතර්කය ඇතිවිය. ශාස්තෘන් වහන්සේ මේ අවුල් සහිත සිතිවිල්ල දැනගෙන උරුවෙල කස්සපට ගාථාවක් වදාළ සේක.

උරුවෙල වාසී කාශ්‍යපයිනි, ඔබ ගිනි පිදීම
අත්හැරියේ කාගේ ධර්මයක්
අදහාද? කාගේ කිනම් ධර්මයක් අවබෝධ කරගෙනද?

තෙරුන්ද භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැන

> රූප-ශබ්ද, රස, ස්ත්‍රීන් ආදී ඇලුම්කරන දේ
> යාගයෙන් ලැබෙවියයි මම සිතුවෙමි.
> මේවා කෙලෙස් වශයෙන්ද, නැවත ඉපදීමට
> හේතු වශයෙන්ද දැන යාගයෙන් ද, ගිනි පිදීමෙන් ද මම මිදුනෙමි.
> නොඇලුණෙමි.

මේ ගාථාව පවසා තමන්ගේ ශ්‍රාවක බව ප්‍රකාශ කිරීමට තථාගතයන්ගේ පාමුල හිස තබා "ශාස්තෘන් වහන්ස, භාග්‍යවතුන් වහන්ස; ස්වාමීනි මම ශ්‍රාවක වෙමි." යයි පවසා එක තල්ගසක ප්‍රමාණයේ සිට තල්ගස් හතක් දක්වා ප්‍රමාණයක් සත්වරක් අහසට පැන නැඟ, බැස, තථාගතයන්ට වැඳ එකත්පසෙක හුන්නේය. ඒ ප්‍රාතිහාර්ය දැක මහජනයා දැඩි මිථ්‍යා දෘෂ්ටිකයකු වී තමන් රහත් යයි හඟිමින් සිටි උරුවේල කාශ්‍යපගේ දෘෂ්ටිජාලය බිඳ දමා, තථාගතයන් විසින් දමනය කරන ලද්දේ යයි ශාස්තෘන්ගේ ගුණකථනයම කථා කළේය.

භාග්‍යවතුන් වහන්සේ; මම දැන් පමණක් නොව උරුවෙල කස්සප ආදීන් දමනය කළේ. අතීතයේද, මා විසින් මොවුන් දමනය කළේ යයි වදාරා, මේ පිළිබඳ අර්ථෝත්පත්ති කථාව **මහා නාරද කස්සප ජාතකය** වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කළ සේක. රජු එකොළොස් නහුතයක් සමග සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. එක් නහුතයක් උපාසක බවට ප්‍රතිඥා දුන්නේය. රජු බුදුරදුන් සමීපයේ හුන්නේම තමන් ලද අස්වැසිලි පසක් ප්‍රකාශකොට සරණ ගොස් හෙට සඳහා ආරාධනාකොට අසුනින් නැගිට බුදුරදුන් ප්‍රදක්ෂිණා කොට පිටත්ව ගියෝය. දෙවන දිනයේ ඊයේ භාග්‍යවතුන් වහන්සේ දක්නා ලද්දේද, නොදක්නා ලද්දේදැයි ඒ සියළුම රජගහනුවර වැසියෝ අටළොස් කෝටියක් පමණ මිනිස්සු තථාගතයන් දකිනු කැමැතිව උදෑසනින්ම රජගහනුවර සිට ලටියී වනයට පැමිණියහ. ගව්තුනක් පමණ වූ මාර්ගය ප්‍රමාණවත් නොවීය. මුළු ලටියී වනයම මිනිසුන්ගෙන් පිරී ඉතිරී ගියේය. මහජනයා දසබලධාරී බුදුරදුන්ගේ රූපයෙන් අග පැමිණි, ආත්මභාවය දැකීමෙන් ප්‍රසන්න වුවද තෘප්තිමත් කිරීමට නොහැකි විය. භාග්‍යවතුන්ගේ රූපය දෙතිස්මහ පුරුෂ ලක්ෂණද අනුව්‍යඤ්ජන ආදි ලක්ෂණ ද සියලු රූපකායද, සෞභාග්‍යයද, වර්ණනා කළ යුතුම ය. මෙසේ රූපයෙන් අග පැමිණි බුදුරදුන්ගේ රූපය දකිනු ලැබීමෙන් මහජනයා විසින් නිරන්තරව උයනෙහි ගැටෙන්නේ, ගමන්

මාර්ගයේද එක භික්ෂුවකට වත් ඇතුල්වීමටද නික්මෙන අයට නික්මීමටද ඉඩකඩක් නොවීය. එදවස භාග්‍යවතුන්ට බත සිදුණේ වන්නට තිබුණි. එහෙයින් එය එසේ නොවේවායි ශක්‍රයාගේ පඬුඇඹුල් අසුන උණු වූ ආකාරයක් දැක්වීය. ඔහු ආවර්ජනා කරනු ලබන්නේ ඒ කාරණාව දැන මානවක වේශයක් මවා බුද්ධ, ධම්ම, සංඝ ගුණ ප්‍රතිසංයුක්ත වූ ස්තුති ගීතිකා ගයමින් තුති පුද කරමින් දසබලයන්ගේ ඉදිරිපිටට බැස, දේවානුභාවයෙන් මාර්ගයේ ඉඩ ලබා අවසර ලබාදෙමින්.

දැමුණු සිතින් යුත්, දමනය කරන ලද පුරාණ ජටිලයන් පිරිවැරූ
භාග්‍යවතුන් වහන්සේ රන්වන් පාටින් බබළමින්
රජගහ නුවරට වැඩි සේක.

ශාන්ත පැවතුම් ඇති ශාන්ති නායකයාණෝ ශාන්ත වූ
පුරාණ ජටිලයන් පිරිවරා රන්වන් පාටින් බබළමින්
රජගහ නුවරට වැඩි සේක.

කෙළෙසුන්ගෙන් මිදුනා වූ භාග්‍යවතුන් වහන්සේ
පුරාණ ජටිලයන් ද කෙලෙසුන්ගෙන් මුදවා ඔවුන් පිරිවරා
රන්වන් පාටින් බබළමින් රජගහ නුවරට වැඩි සේක.

සසරින් එතරවූ භාග්‍යවතුන් වහන්සේ පැරණි ජටිලයන් ද
නතර කරවා ඔවුන් පිරිවරා රන්වන් පාටින් බබළමින්
රජගහ නුවරට වැඩි සේක.

දශවිධ ආර්යවාස ඇති, දශවිධ කායබල හා ඤාණබල ඇති
කුශලාකුශල ආදී දශ ධර්මයන් අවබෝධ කළා වූ, දස අසේඛ
අංගයෙන් යුක්ත වූ දහසක් සතුන් පිරිවැරූ බුදුන් වහන්සේ
රජගහ නුවරට වැඩි සේක.

පින් පිඬ වැඩමවයි සම්බුදු සමිදු න්ව
සංයමයෙන් වඩිති සඟගණ සන්සු න්ව
දම් ඇස ලද ජටිල දහසම සුපස න්ව
දැන් රජගහ නුවර බබළයි රන්වන් ව

සක්දෙවිඳු මේ අන්දමින් වර්ණනා කරමින් බුදුරදුන්ට පෙරටුව ගියේය.

මහජනයා මානවකයාගේ රූපශ්‍රීය දැක, මේ මානවකයාට
අතිශය මනා රූපයක් ඇත යයි මේ මානවකයා අප විසින්
පෙර නුදුටුවිරූ යයි සිතා මේ මානවකයා
කොහේ සිට ආවේද? කාගේද කවුද ආදිය විමසූහ.
ඒ අසා මානවක තෙමේ,

"යම් ප්‍රාඥයකු සියළු කෙලෙස් දමනය කළේ ද,
බුදුබවට පැමිණි අසහාය පුද්ගලයෙකු වීද, ඒ බුදුරදුන් ලෝකයෙහි
අරහත්ය. සුගතය. මම උන්වහන්සේ සමග
හැසිරෙන සේවකයෙක් වන්නෙමි. යි කීවේය.

ශාස්තෘන් වහන්සේ ශක්‍රයා විසින් කරන ලද ඉඩකඩ ඇත්තේ මාර්ගයට පිවිස, භික්ෂූන් දහසක් පිරිවරාගෙන රජගහ නුවරට පිවිසි සේක. රජු බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දී ස්වාමීනි, මම ත්‍රිවිධ රත්නය නොමැතිව වාසය කිරීමට නොහැකි වන්නෙමි. වේලාවේ හෝ අවේලාවේ හෝ භාග්‍යවතුන්ගේ සමීයට පැමිණෙන්නෙමි. ලටඨි වන උයන නම් ඉතා දුරය. මේ අපගේ වේළුවන උයන ඉතා දුරක් නොවේ. ඉතා ලඟත් නොවේ. ගමනාගමන පහසුකම් ඇත. බුදුරදුන්ට සුදුසු සේනාසනයකි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙය පිළිගන්නා සේක්වා! යයි, රත්රන් කෙණ්ඩියකින් මල් සුවඳ මිශ්‍ර මැණික් වර්ණැති ජලය ගෙන වේළුවන උයන පරිත්‍යාග කරමින් දසබලයන් වහන්සේගේ හස්තයෙහි ජලය වත් කළේය. ඒ ආරාමය පිළිගන්නා ලද අවස්ථාවේ බුද්ධශාසනය මුල්බැස ගත්තේ යයි මහපොළොව කම්පා විය. ජම්බුද්වීප තලයෙහි හැර වේළුවනය හැර පොළොව කම්පාකොට පිළිගන්නා ලද වෙනත් සේනාසනයක් නම් නැත. ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමය පිළිගෙන රජුට අනුමෝදන් කොට අසුනින් නැගිට භික්ෂු සංඝයා පිරිවරා වේළුවනයට වැඩම කළ සේක.

එසමයෙහි වනාහි සාරිපුත්‍ර-මොග්ගල්ලාන යන පරිබ්‍රාජකයෝ දෙදෙනා රජගහ නුවර ඇසුරුකොට නිවන සොයමින් වාසය කරති. ඔවුන් අතර සාරිපුත්‍ර, අස්සජි තෙරුන් පිඬු පිණිස පිවිසෙනු දැක පැහැදුනු සිතින් ළඟ ඇසුරට පත්ව, 'යෙ ධම්මා හෙතුප්පභවා' යනාදි ගාථාව අසා, සෝවාන් ඵලයෙහි පිහිටි නිසා, තමන්ගේ සහායක මොග්ගල්ලානටද, එම ගාථාවම කීවේය. ඔහුද සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඒ දෙදෙනාම

සංජය පිරිවැජියා හමුවී තමන්ගේ පිරිස සමග භාග්‍යවතුන්ගේ සමීපයෙහි පැවිදි වූහ. ඔවුන් අතර මොග්ගල්ලාන සත්දිනකින් රහත්ඵලයට ත්වුණි. සාරිපුත්ත අඩමසකිනි. ඔවුන් දෙදෙනාම ශාස්තෘන් වහන්සේ අග්‍රශ්‍රාවක තනතුරේ තැබූහ. සාරිපුත්ත තෙරුන් රහත්ඵලයට පැමිණි දිනයේම ශ්‍රාවක සන්නිපාතයක් (රැස්වීමක්) සිදු කළේය. තථාගතයන් වහන්සේ, ඒ වේළුවන උයනෙහි වාසය කරන සමයේ සුද්ධෝදන මහාරජු තම පුතා සය වර්ෂයක් දුෂ්කර ක්‍රියා කොට පරම අභිසම්බෝධියට ත්ව, පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තේ රජගහ නුවර ඇසුරුකොට වේළුවනයේ වැඩවාසය කරති යනු අසා එක්තරා ඇමතියෙක්ට ආමන්ත්‍රණය කළේ "සගය; මෙහි එනු මැනවි. නුඹ මිනිසුන් දහසක් පිරිවරා රජගහනුවරට ගොස්, මගේ වචනයෙන්, ඔබගේ පියා වූ සුද්ධෝදන මහරජු ඔබවහන්සේ දකිනු කැමති බව පවසා මගේ පුතා කැඳවාගෙන එන්නැයි" කීවේය. ඔහු දේවයන් වහන්ස, එසේ යයි රජුගේ වචනය හිස්මුදුණින් පිළිගෙන මිනිසුන් දහසක් පිරිවරාගෙන වහාම සැටයොදුන් මගක් ගොස් දසබලයන් වහන්සේ සිටුපිරිස මැද හිඳ දහම් දෙසන වේලාවේ විහාරයට පිවිසියේය. රජුගේ පණිවිඩය රැගෙන ගිය ඔහු ටික වේලාවක් සිට, පිරිස කෙළවර සිටියේ, දහසක් සමග රහත්බවට පැමිණියහ පැවිද්ද ඉල්ලීය. භාග්‍යවත්හු එවි මහණෙනි! යයි අත දිගුකළහ. සියල්ලෝ එකෙණෙහිම ඍද්ධිමය පාත්‍ර සිවුරු දරා, වර්ෂ සියයක් පිරුණු තෙරවරු මෙන් වූහ. රහත් ඵලයට පැමිණි කාලයේ පටන් ආර්යයෝ නම් මධ්‍යස්ථ වෙතියි, හෙතම රජු විසින් එවන ලද හසුන ඇත්තේ, බුදුරදුන්ට නොකීවේය. රජතුමා, "ඒ ඇමතියා නොආවේය. ආරංචියක්ද නැත. වෙනත් ඇමතියකු කැඳවා සගය, ඔබද යන්නැ"යි පළමු අයුරින්ම යැවීය. ඔහුද ගොස් පෙර පරිද්දෙන්ම පිරිස සමග රහත්ඵලයට පැමිණ නිශ්ශබ්ද විය. රජු ඒ ආකාරයෙන්ම පුරුෂයන් දහස දහස පිරිවර වූ ඇමතිවරුන් නවදෙනකු යැවීය. සියල්ලෝ තමන්ගේ කටයුතු නිමකොට නිශ්ශබ්දව එහිම වාසය කළහ. රජු හසුන් මාතුයක්වත් නැතිව කිසිදු තොරතුරක් නොලැබ මෙසේ සිතුවේය. මේ හැමදෙනා මට සෙනෙහස නැති බැවින් ලියුම් කැබැල්ලක්වත් පෙරළා නොගෙනාවෝය. මගේ අවශ්‍යතාව කවරෙක් ඉටු කරන්නේදැයි සියලු රජ බලසෙනග බලන්නේ කාලුදායි දුටුවේය. කාළුදායී වනාහි රජුගේ සියලු කටයුතු කරන, අභ්‍යන්තරික ඉතාම විශ්වාසවන්ත ඇමතියා වේ. බෝසතුන් සමග එකදිනයේ උපන්නේය. වැලිකෙළියේ පටන්ම මිතුයෙකි. ඉක්බිති ඔහුට රජු ආමන්ත්‍රණය කළේය. "දරුව, කාලුදායී, මම මගේ පුතා දකිනු කැමතිව දහසක් පිරිවරකොට

පුරුෂයන් නවදෙනෙකු ඇමතියන් නවදෙනෙකු යැව්වෙමි. ඔවුන් අතර එකකුදු අවුත් පණිවිඩ මාත්‍රයක්වත් දැනුම් දුන්නේ නම් නැත. මගේ ජීවිතයට අන්තරායක් වේදැයි නොදනිමි. ජීවමානවම මම මගේ පුතා දකිනු කැමැත්තේ වෙමි. මගේ පුතා කැඳවාගෙන එන්නට හැකිවන්නෙහිද?" "ඉදින් පැවිදිවීමට ඉඩ ලැබෙන්නේ නම් හැකිවන්නෙමි." "දරුව, නුඹ පැවිදිවී හෝ පැවිදි නොවී හෝ මගේ පුතා පෙන්වන්න." ඔහු 'යහපති දේවයන් වහන්ස' යයි රජුගේ හස්නක් ගෙන රජගහනුවරට ගොස් ශාස්තෘන් වහන්සේ ධර්ම දේශනා කරන වේලාවේ, පිරිස කෙළවර හිඳ, බණ අසා, පිරිවර සහිතව රහත්ඵලයට පැමිණ ඒහිභික්ෂු භාවයෙන් පැවිදි වී, කල්ගත කළේය. ශාස්තෘන් වහන්සේ බුදුවී පළමු ඇතුල්වස ඉසිපතනයේ වැස, සමාදන් වූ වස් පවාරණය කොට, උරුවේලාවට ගොස් එහි වැස තුන්බෑ ජටිලයන් දමනයකොට, භික්ෂූන් දහසක් පිරිවරාගෙන දුරුතු මාසේ පුන්පෝදා, රජගහනුවරට ගොස් මාස දෙකක් වාසය කළ සේක. මෙපමණ කලක් එනම් බරණැස් නගරයෙන් නික්ම මාස පහක් ඉකුත් විය. මුළු හේමන්තය ඉක්මවා යන්නේ, කාලුදායි තෙරුන් පැමිණි දිනයේ පටන් දින හත අටක් කල්ගත කළහ. තෙරුන් වහන්සේ නවම් මාසයේ පූර්ණමී දිනයේ මෙසේ සිතුවේය. හේමන්ත කාලය ඉක්මවා ගියේය. වසන්ත කාලය උදාවිය. මිනිසුන් විසින් ශස්‍ය ගොයම් ආදිය උදුරා (කපා) මාර්ගය හෙළි පෙහෙළිකොට තිබේ. මාර්ගයේ හමුවන හමුවන තැන නිල්වන් තණවලින් ගැවසී ඇත. රුක්ලිය පිපුණු වනමලින් ගැවසී ඇත. මාර්ගය ගමනට සුදුසුය. දසබලයන් වහන්සේගේ ඤාතීන්ට සංග්‍රහ කිරීමට සුදුසු කාලයයි සිතා බුදුන් වෙත එළඹ ගාථා හැටකින් කිඹුල්වත්පුර වැඩීම සඳහා ගමන්මග වැනූහ.

දළු දමා මල් පිපී ගනි අඟුරු වගෙයි ගස්
කොළ හැලී පල ගන්ට ළංවෙලා හිමියනේ
මහා ගස් බබළන්නෙ පහන්සිළු වගේමයි
නෑයින්ව සනසන්න මේ සුදුසු කාලයයි

දැඩි සීතලත් නැහැ උණුහුමත් නැහැ වැඩිය
මහ මගට වඩින්නට මේ හොඳම ඉර්තුවයි
දුබික් දුක් කිසිත් නැහැ මුළු බිමම නිල්වන්ය
ගම්බලා වඩින්නට මේ හොඳම කාලයයි

සැටක් පමණ ගාථාවලින් බුදුරදුන්ගේ කුල(පිය) නගරයට පැමිණීමේ ගමන වර්ණනා කළේය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ; උදායි, කුමක් නිසා මිහිරි ස්වරයෙන් ගමන වර්ණනා කරන්නේදැයි ඇසුවේය. ස්වාමිනි, ඔබ වහන්සේගේ පියා, සුද්ධෝදන මහරජතුමා ඔබව දකිනු කැමැතිව සිටී. ඤාතීන්ට සංග්‍රහ කිරීම සුදුසුයි. උදායි යහපති. එසේ කරන්නෙමි. ඤාතීන්ට සංග්‍රහ කිරීමට භික්ෂු සංඝයාට දැනුම් දෙන්න. ගැමිවත් සම්පූර්ණ කරන්නැයි භික්ෂූන්ට කියන්න. ස්වාමිනි යහපතැයි තෙරුන් කීවේය. භාග්‍යවතුන් වහන්සේ අංගමගධවාසී කුලපුත්‍රයන් දස දහසකින්ද, කපිලවස්තු නුවරවාසී, දසදහසක් ද සියල්ලම විසිදහසක්ද, ක්ෂීණාශ්‍රව භික්ෂූන් විසින්ද පිරිවරණ ලදුව, රජගහනුවරින් නික්ම දවස ගානේ, යොදුන බැගින් වැඩමවයි. රජගහනුවර සිට කපිලවස්තුවට යොදුන් සැටක් වේ. මාස දෙකක් ඇතුළත කිඹුල්වතට පැමිණෙන්නෙමියි, අතුරින චාරිකාවෙන් පිටත්වූ සේක. තෙරුන්ද, භාග්‍යවත්හුගේ නික්මුණු බව රජුට දැනුම් දෙන්නෙමියි අහසට පැන නැඟී, ගොස් රජුගේ මන්දිරයට පහළ විය. රජු තෙරුන් දැක, සතුටු සිතැත්තේ, අනගි පල්ලංකයක වඩා හිඳුවා, තමන්ට පිළියෙළ කරන ලද නොයෙක් අනර්ඝ රස භෝජනාදිය උන්වහන්සේගේ පාත්‍රයට පුරවා දුන්නේය. තෙරුන් නැගිට ගමන් කළයුතු බව පෙන්වීය. ස්වාමිනි, වැඩහිඳ වළඳන්න. මහරජ, ශාස්තෘන් සමීපයට ගොස් වළඳන්නෙමි. දරුව, ශාස්තෘන් වහන්සේ කොහිද? විසිදහසක් භික්ෂූන් පිරිවරාගෙන ඔබතුමා දකිනු පිණිස, චාරිකාවේ නිරතවෙමින් සිටිති. මහරජතුමනි, රජතුමා සතුටු සිතින් මෙසේ කීවේය. නුඹවහන්සේ මෙය වළඳා යම්තාක් මගේ පුතා මේ නගරයට පැමිණේද? ඒතාක් පිණ්ඩපාතය මගෙන්ම ගෙනයනු මැනවි. තෙරුන් ඉවසා වදාළ සේක. රජු තෙරුන් වළඳවා පාත්‍රය, සුවඳ කුඩුවලින් ආලේපනය කරවා අනගි උතුම් ආහාරපාන පුරවා තථාගතයන් වහන්සේට පිරිනමන්නැයි කියා තෙරුන්ගේ අතෙහි තැබීය. තෙරුන් සියළු දෙනා බලාසිටියද්දීම පාත්‍රය ගෙන අහසට දමා තෙමේද අහසට පැන නැඟී පිණ්ඩපාතය ගෙනවිත් ශාස්තෘ හස්තයෙහි තැබීය. ශාස්තෘන් වහන්සේ එය වැළඳූ සේක. ඒ ක්‍රමයෙන් තෙරණුවෝ දිනපතාම පිණ්ඩපාතය පිරිනැමීය. ශාස්තෘන් වහන්සේද අතරමගදී රජුගේම පිණ්ඩපාතය වැළඳූහ. තෙරුන්ද බත්කිස අවසානයේ දවස් පතා අද භාග්‍යවතුන් වහන්සේ මෙපමණ දුර පැමිණියේ. අද මෙපමණ දුර ආදී වශයෙන් බුදුගුණද මිශ්‍රවූ කථා පැවසීමෙන් මුළු රාජකුලය ශාස්තෘන් දැකීමෙන් තොරවම ශාස්තෘන් කෙරෙහි හටගත් ප්‍රසාදයෙන් යුක්ත කරවීය. ඒ කාරණයෙන්ම උන්වහන්සේට භාග්‍යවතුන් වහන්සේ, මහණෙනි,

මගේ ශ්‍රාවක භික්ෂූන් අතර කුල පැහැදවීමේ අග්‍ර තනතුර කාළදායි තෙරුන්ට හිමිවන බව වදාරා කාළදායි අග්‍ර තනතුරේ තැබූ සේක. ශාක්‍යයෝද පැමිණි කල්හි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපගේ ශ්‍රේෂ්ඨ ඤාති සමාගම පෙන්වන්නෙමු යයි රුස්වී භාග්‍යවතුන් වහන්සේ වැඩවාසය කරන ස්ථානය විමසන්නේ නිග්‍රෝධගේ ආරාමය රමණීය බව සලකා, සියලු සත්කාර සම්මාන විධි කරවා, සුවඳ මල්ගත් අත් ඇතිව, පෙර ගමන් කරන්නාහු සියලු ආකාරයෙන් සැරසුණු, ළදරු ළදරුවන්ද, නගරයේ දරුවන්ද නාගරික දැරියන්ද, පළමුව යැවූහ. ඉක්බිති රජ කුමාරයෝද, රජ කුමරියෝද, ඔවුන් අතරතුර සුවඳමල් චූර්ණාදිය පුදමින් භාග්‍යවතුන් වහන්සේ පිළිගෙන නිග්‍රෝධාරාමයටම වැඩමවූහ. එහි භාග්‍යවත්හු විසිදහසක් මහරහතුන් පිරිවරා පනවන ලද උතුම් බුද්ධාසනයේ වැඩසිටි සේක. ශාක්‍යයෝ නම් මානයෙන් යුතු දැඩි මානයෙන් පිරුණේ, ඔවුහු සිද්ධාර්ථ කුමාරයා අපට වඩා ළදරුය. අපට වඩා කනිෂ්ඨය. සොහොයුරාගේ පුතෙකි. අපගේ මුනුපුරාය ආදිය සිතමින්, ළදරු ළදරු රාජකුමාරයන්ට මෙසේ කීවානුය. නුඹලා වඳිවු. අපි නුඹලාගේ පිටුපසින් ගොස් හිඳින්නෙමු'යි ඔවුහු මෙසේ නොවැද, සිටිකල්හි භාග්‍යවතුන් වහන්සේ මොවුන්ගේ අදහස දැන ඤාතිහු මට නොවඳිත්. දැන් ඔවුන් ලවා වන්දවන්නෙමියි අභිඥාවන් මුල්වූ චතුර්ථ ධ්‍යානයට සමවැදුනෙහිය. එතැනින් නැගිට අහසට පැන නැග ඒ මානාධික ශාක්‍යයන්ගේ හිසෙහි පස්ගල් විසුරුවන්නාක් මෙන් ගණ්ඩබ්බ රුක්මුල පෑ යමක ප්‍රාතිහාර්ය හා සමාන ප්‍රාතිහාර්යක් දැක්වූහ.

රජු ඒ ආශ්චර්ය දැක මෙසේ කීවේය. ස්වාමීනි, ඔබගේ උපන් දිනයෙහි කාලදේවලට වැඳීම පිණිස ඔබ යොමුකළ කල්හි ඔබගේ පාද පෙරළී අවුත් බමුණාගේ හිස්මුදුනේ පිහිටියේ, මම එය දැකද, ඔබගේ පා වැන්දෙමි. මේ මගේ පළමු වන්දනයයි. වප්මගුල් දවසේදී දඹගස් සෙවනේ සිරියහනක හුන්නා වූ ඔබ දඹගස් සෙවනේ පළඟින් සිටීමද දඹරුක් සෙවන නොවෙනස්ව සිටීමද දැක පා වැන්දෙමි. ඒ මගේ දෙවෙනි වැඳීමයි. දැන් මේ නොදුටුවිරූ ප්‍රාතිහාර්ය දැක ඔබගේ පාද වඳිමි. මේ මගේ තෙවෙනි වැඳීමයි. රජු වැඳුම් පිදුම් කළ කල්හි භාග්‍යවතුන් වහන්සේට නොවැද සිටීමට සමත් එකම ශාක්‍යයෙක් වත් නොවීය. සියල්ලෝ වැන්දානුය. මෙසේ භාග්‍යවත්හු ඤාතීන් වන්දවා අහසින් බැස පනවන ලද ආසනයේ වැඩසිටි සේක. භාග්‍යවතුන් වහන්සේ එසේ වැඩසිටි කල්හි භික්ෂූන්ට පත් ඤාති සමාගමද අති විශාල විය. සියල්ලෝම එකඟ වූ සිතින් මැ සිටියහ. ඉක්බිති කළුවලා රුස්වී මහා පොකුරු වර්ෂාවක්

වැස්සේය. තඹවන් වූ ජලය නාදකරමින් ගලා බසී. තෙමෙනු කැමැති අය තෙමෙති. තෙමෙනු කැමැති නැති අයගේ ශරීරයේ එක දිය බිංදුවක් වත් නොවැටෙයි. ඒ දැක සියල්ලෝ ආශ්චර්ය අද්භූතජනක සිත් ඇත්තෝ වූහ. අනේ පුදුමයකි! අනේ මහ අසිරියකැයි, සාකච්ඡා කළහ. ශාස්තෘන් වහන්සේ; දැන් පමණක් නොව ඈත් සමූහය ඉදිරිපිට පොකුරු වර්ෂාවක් වස්සවන ලද්දේ. අතීතයේදී වරෂා කළේ යයි වදාළහ. මෙහි උපන් තොරතුරු සඳහා වෙස්සන්තර ජාතකය වදාළ සේක. ධර්මකථාව අසා සියල්ලෝ නැගිට වැඳ, පිටත්ව ගියහ. එකම රජකු හෝ රජ ඇමතියකු හෝ හෙට අපගේ භික්ෂාව පිළිගන්නැයි කියා ගිය කෙනෙක් නම් නැත. ශාස්තෘන් වහන්සේ දෙවෙනි දිනයේ විසිදහසක් භික්ෂූන් පිරිවරා කපිලවස්තුවට පිඬුසිඟා වැඩියහ. උන්වහන්සේට කිසිවකු ආරාධනා නොකළ නිසාවෙනි. පාත්‍රය හෝ නොගත්තේය. භාග්‍යවතුන් වහන්සේ සෘජුව සිට ආවර්ජනා කළ සේක. පෙර බුදුවරු කුල නගරයේ කෙසේ පිඬු පිණිස හැසිරුණේද? කිම අනුපිළිවෙළින් සම්පත් ඇති ගෘහවලට ගියාහුද? නැතහොත් පිළිවෙළින් සපදාන චාරිකාවේ හැසිරුණේද? ඉක්බිති එකම බුදුකෙනෙකුවත් අතරින් පතර ගමන් නොකළ බව දැන මා විසින්ද දැන් මේ පරිදි ඔවුන්ගේ වංශය උල්ලංඝනය නොකළ යුතු බැවින් මතු මගේ ශ්‍රාවකයෝද, මා පරිදි අනුව හික්මෙමින් පිණ්ඩ චාරිකා වත පරිපූර්ණය කළයුතු වන්නේ යයි කෙළවර පිහිටි නිවසේ පටන් සපිළිවෙළින් පිඬු පිණිස හැසිරුණු සේක. ආර්ය සිද්ධාර්ථ කුමාරයා වනාහි පිඬු පිණිස හැසිරේ යනුවෙන් දෙමහල් තුන්මහල් ආදී පහයවල සිටියෝ, සිහ කවුළුව විවෘතකොට බලා සිටියහ. මහජනයා වටවී බලා සිටියේය. රාහුල මව වූ, දේවියද ආර්ය පුත්‍රයා මේ නගරයෙහි මහත් වූ රාජානුභාවයෙන් රන්දෝලාවලින් හැසිර දැන් කෙස්රවුල් බහා කෂායවස්ත්‍ර හැඳ පැලැඳ පාත්‍රයක් අතින් ගෙන පිඬු පිණිස හැසිරෙයි. ශෝභන වෙයි. සිංහකවුළුව විවෘතකොට බලනකල්හි භාග්‍යවතුන් වහන්සේ, නොයෙක් අනගි ලෙසින් බබළමින් බඹයක් පැහිරී පෙනෙන, ශරීර ප්‍රභාවෙන් යුක්තව නගර වීථි බබළවමින් අසූවක් අනුවක් කුඩා ලක්ෂණවලින් පැහැපත් වූ දෙතිස්මහා පුරුෂ ලක්ෂණවලින් ප්‍රතිමණ්ඩිත වූ, උපමා රහිත බුද්ධලීලාවෙන් බබළන්නා වූ දැක හිස මුදුනෙ සිට පා මුල දක්වා බලා :-

සිනිඳු සුසිනිඳු තුරුණු කෙස් ඇති
හිරුමඬල සේ නළල් තල ඇති
දසත විහිදෙන රැස් වළල්ලෙන්
එකලු කරවයි කිඹුල්වත් පුර
අපේ නරසිහ බුදුරදාණෝ

මේ ආදී වූ දස නරසීහ ගාථාවලින් අභිස්තුති කොට, ඔබගේ පුතා පිඬු පිණිස හැසිරේ යයි රජුට දැනුම් දුන්නාය. රජු කලකිරුණු සිත් ඇත්තේ, සළුව වෙලාගන්නේ ඉක්මනට ඉක්මනට නික්ම වේගයෙන් ගොස් භාග්‍යවත්හු ඉදිරිපිට සිට මෙසේ කීවේය. "ස්වාමීනි; කුමක් නිසා පිඬු පිණිස හැසිරෙවුද? මෙපමණ භික්ෂූන්ට බතින් සංග්‍රහ කිරීමට නොහැක්කේ යයි සිතන්නහුද? මහරජ, මේ අපගේ වංශ චාරිත්‍රයයි. ස්වාමීනි, අපගේ වංශය මහාසම්මත ක්ෂත්‍රිය වංශය නොවේද? එක ක්ෂත්‍රියෙකුවත් පිඬු පිණිස හැසිරුණේ නම් නැත. මේ මහරජ, ක්ෂත්‍රිය වංශය නම් ඔබගේ වංශයයි. අපගේ වංශය නම් දීපංකර කොණ්ඩඤ්ඤ කස්සප ආදී මේ බුද්ධවංශයයි. මේ අනෙකුත් නොයෙක් දහස් සංඛ්‍යාත බුදුවරු පිඬුසිඟා හැසිරීමෙන්ම ජීවිකාව පවත්වාගෙන ගියහයි අතර වීථියේ සිට :

"අප්‍රමාදිව නැගී සිටින්න - සුචරිත ධර්මයෙහි හැසිරෙන්න.
ධර්මචාරී පුද්ගලයා - මෙලොව, පරලොව දෙක්හිම සැපයට පත්වේ"

යන මේ ගාථාව වදාළ සේක. ගාථාව අවසානයේ රජු සෝවාන් ඵලයෙහි පිහිටියේය.

"සුචරිත ධර්මයෙහි හැසිරෙන්න. දුසිරිතෙහි නොහැසිරෙන්න. දහමෙහි හැසිර ධර්මචාරී පුද්ගලයා මෙලොව-පරලොව සැපයට පත්වේ."

යන මේ ගාථාව අසා සකදාගාමී ඵලයෙහි පිහිටියේය. මහා ධර්මපාල ජාතකය අසා අනාගාමී ඵලයෙහි පිහිටියේය. මරණ මංචකයේ සුදුකුඩය යට සිරියහනයේ හොත්තේතම රහත් බවටද පත්විය. අරණ්‍යවාසය කිරීමක්ද ප්‍රධන් වීර්ය වැඩීමක්ද රජුට නොවීය. සෝවාන්ඵලය සාක්ෂාත් කොට භාග්‍යවත්හුගේ පාත්‍රය රැගෙන පිරිවර සහිතව බුදුරදුන් මහා ප්‍රාසාදයට වඩමවාගෙන ප්‍රණීත වූ කෑයුතු බීයුතු දේවලින් සන්තර්පණය කළේය. බත් කිස අවසානයේ අන්තඃපුර සියළු ස්ත්‍රීන් රාහුල මාතාව හැර, පැමිණ බුදුරදුන්ට වැන්දෝය. ඇය වනාහි "යව ආර්ය පුත්‍රයන්ට වඳින්න" යයි පිරිවර ජනතාව විසින් කියන ලද්දේද, "ඉදින් මගේ ගුණයක් ඇත්නම්, ආර්ය පුත්‍රයා තෙමේම මා සමීපයට පැමිණෙන්නේය. ආපු විගස උන්වහන්සේට වඳින්නෙමි යනුවෙන් පවසා නොගියාය. භාග්‍යවතුන් වහන්සේ රජුගෙන් පාත්‍රය ගෙන්වාගෙන අග්‍රශ්‍රාවක දෙනම සමග රාජ දියණියගේ සිරියහන් ගැබට වැඩමකොට රාජදියණිය කැමැති පරිදි වඳිනු

කැමැත්තී, කිසිත් වත්පිළිවෙත් කිවයුත්තක් නම් නැතැයි පවසා පනවන ලද ආසනයේ වැඩහුන් සේක. ඇය වේගයෙන් ගොස්, ගොප්මඬුළු අල්ලාගෙන පාමුල සිරස තබා කැමති පරිදි වැන්දාය. රජු භාග්‍යවතුන් කෙරෙහි සෙනෙහස හා බුහුමන් දැක්වීම ආදිය ගුණසම්පත් ප්‍රකාශ කළේය. "ස්වාමීනි, මගේ දුව ඔබ කෂාය වස්ත්‍ර අඳින්නේය යයි අසා එතැන් පටන් කෂාය වස්ත්‍ර පෙරවීමට ටන් ගත්තීය. ඔබට එකම භක්තිමත් බව අසා එකම බැතිබර බව හටගත්තී, ඔබවහන්සේ මහ ආසන සිරියහන් හැරදැමූ බව අසා පටි ඇඳෙහිම හොත්තී, ඔබ මල්සුවඳ ආදියෙන් වැලකුණු බව අසා වෙන්වුණු මල්සුවඳ ආදිය ඇත්තේ තමන්ගේ ඥාතීන් විසින් අපි පෝෂණය කරන්නෙමු යයි හසුන් එවූ කල්හි එක ඥාතියකුදු දෙස නොබැලුවේය. මෙසේ ගුණ සම්පන්නයි, මගේ දියණිය ස්වාමීනි;" "මහරජ, මෙය ආශ්චර්යයක් නොවේ. දැන් රකිනු ලබන්නා වූ රාජ දියණිය ඥාණයෙන් පිරිපුන් වූ කල්හි, තමන්වද රකින්නේය. ඇය පෙර අනාරක්ෂිතව රජවත පාමුල හැසිරෙන්නේ, ඥාණය නොසුණු කල්හිද, තමන්ව රැක්කේය යන පුවත පවසා සඳකිඳුරු ජාතක කථාව වදාරා අසුනින් නැගිට පිටත්ව ගියේය. දෙවෙනි දිනයේ නන්ද රාජ කුමාරයාගේ අභිෂේකයද, ගෙට ගෙවදීමේ මංගල්‍යයද, විවාහ මංගල්‍යයද පවත්වන කල්හි ඔහුගේ ගෙදරට ගොස් කුමරු අතට පාත්‍රය දී, පැවිදිවනු කැමැත්ත මංගල්‍යයක් බව පවසා අසුනින් නැගිට පිටත්ව ගියේය. ජනපද කල්‍යාණිය කුමාරයා යනවා දැක, "ආර්ය පුත්‍රය; ඉක්මනට එනු මැනවි" යයි පවසා බෙල්ල දිගුකොට බලා සිටියාය. හෙතම භග්‍යවතුන්ට පාත්‍රය ගන්නැයි කීමට නොකැමැති නිසා විහාරයටම ගියේය. ඔහු නොකැමැත්තේම භාග්‍යවතුන් වහන්සේ පැවිදි කළ සේක. මෙසේ භාග්‍යවත්හු කපිලවස්තුවට ගොස්, තෙවෙනි දිනයේ නන්ද පැවිදි කළ සේක. සත්වෙනි දිනයේ රාහුල මාතාව කුමරු අලංකාරකොට, බුදුරදුන් සමීපයට යැව්වාය. "දරුව; බලන්න. මේ විසිදහසක් ශ්‍රමණයන් පිරිවරාගෙන රන්වන් වූ බ්‍රහ්ම වර්ණයෙන් යුක්ත, මේ ශ්‍රමණයා ඔබේ පියාය. මොහුට මහත් නිධාන සම්පත් වූහ. ඔහු නික්මගිය කාලයේ පටන් නොදුටුමු. යව; ඔහුගෙන් දායාද ඉල්ලා ගන්න." "පියාණනි; මම ඔබගේ පුත්‍රයා වෙමි. අභිෂේක බවට පැමිණ, සක්විති රජ වන්නෙමි. මට ධනයෙන් වැඩක් ඇත. ස්වාමීනි, මට ධනය දෙන්න. පියා සන්තක වූ ධනය පුතුට යනුවෙනි." කුමරු භාග්‍යවතුන් සමීපයට ගොස් පිය සෙනහස නැවත ලැබ සතුටු සිතැත්තේ, ශ්‍රමණය; ඔබගේ සෙවනැල්ලද මට සැපයක් යයි පවසා තවත් අනෙක් බොහෝ තොරතුරු කථාකරමින් සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ කරන ලද බත්කිස ඇත්තේ අනුමෝදනා කොට අසුනින් නැගිට වැඩම කළහ. කුමරුද, "මට දායාදය දෙන්න, මට දායාදය දෙන්න ශ්‍රමණය" යයි භාග්‍යවතුන් වහන්සේ ලුහුබැඳ ගියේය. භාග්‍යවතුන් වහන්සේ ද කුමරු නොනවත්වන ලදී. පිරිවර ජනතාවද බුදුරදුන් සමග යන්නා වූ බැවින් නවතාලීමට නොහැකි විය. මෙසේ ඔහු භගවත්හු සමග ආරාමයටම ගියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිතුවෝය. මෙතම පියා සතු ධනය කැමැති වේයි. ඔහු ඉල්ලන ධනය සසර දික්කරයි. දුකටම හේතුවේ. එහෙයින් බෝධිමණ්ඩලයේ ප්‍රතිවේධ කරන ලද සප්තවිධ ආර්ය ධනයම දෙමි. හෙතම ලෝකෝත්තර දායාදයට හිමිකම් කරමි'යි ආයුෂ්මත් සාරිපුත්ත ඇමතිය, එසේ වීනම් සාරිපුත්‍රය; රාහුල පැවිදි කරවන්න. තෙරුන් ඔහු පැවිදි කළ සේක. කුමාරයා පැවිදි කළ කල්හි රජුට අධික දුකක් උපන්නේය. එය ඉවසීමට නොහැකි වන්නේ, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ **"ස්වාමීනි; මව්පියන් විසින් අනුනොදක්නා ලද දරුවන් පැවිදි නොකරනු මැනවි"** යයි වරයක් ඉල්ලීය. භගවත්හු ඔහුට ඒ අවසරය දී, නැවත එක දිනයක් රජමාළිගාවේ කරන ලද බත්කිස ඇත්තේ, එකත්පසක හිටියා වූ, රජු විසින්, "ස්වාමීනි, ඔබ දුෂ්කරක්‍රියා කරන කාලයේ එක දේවතාවකු මා වෙත පැමිණ ඔබගේ පුතා කළුරිය කළේ යයි කීවේය. ඔහුගේ වචනය නො අදහන්නේ, "මගේ පුතා සම්බෝධියට නොපැමිණ කලුරිය නොකරයි. එය ප්‍රතික්ෂේප කළෙමි"යි කී කල්හි නුඹ දැන් කුමක් අදහන්නෙහු ද, පෙර ඇට ආදිය දක්වා, ඔබගේ පුතා මළේ යයි කී කල්හි නොඅදහන්නෙද? ආදි මේ තොරතුරු පැවසීමට මහා ධර්මපාල ජාතකය දේශනා කළ සේක. කථාව අවසානයේ රජු අනාගාමී ඵලයෙහි පිහිටියේය. මෙසේ භගවත්හු පියාව සෝවාන් ආදි තුන් ඵලවල පිහිටුවා භික්ෂු සංඝයා පිරිවරාගෙන නැවත රජගහනුවරට ගොස් සීතවනයේ වැඩවාසය කළහ. එසමයෙහි අනාථපිණ්ඩික ගෘහපතියා පන්සියයක් ගැල් පුරවා බඩු රැගෙන රජගහ නුවරට ගොස්, තමන්ගේ ප්‍රියමිත්‍ර වූ සිටුතුමාගේ ගෙදරට ගොස් එහි, භාග්‍යවත් බුදුරදුන් උපන් බව අසා, ඉතාම අළුයම දේවතානුභාවයෙන් විවෘත කළ දොරටුවෙන් ශාස්තෘන් වෙත එළඹ, බණ අසා සෝවාන් ඵලයෙහි පිහිටා, දෙවෙනි දිනයේ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් දී, සැවැත්නුවරට එනු පිණිස, බුදුරදුන්ගෙන් ප්‍රතිඥා ලැබ, අතරමග යොදුන් හතළිස් පහක් තැනෙක්හි ලක්ෂය ලක්ෂය බැගින් දී යොදුනක් පාසා විහාරය බැගින් කරවා, ජේතවනය අටළොස් කෝටියක් රන් වියදම්කොට නවකර්ම කරවීය. ඒ මැද බුදුරදුන්ට ගන්ධකුටියක් කළේය. එය පිරිවර

කොට අසූමහා තෙරවරුන්ට එක එක කුටිය බැගින්ද, එකට වාසය කරන නිවෙස්නක්ද, ඒක කුටික ආවාස, කුටි දෙකක ආවාස, හංස හැඩැති දිගකොට ශාලාද, මණ්ඩප ආදි වශයෙන් සෙසු සේනාසන, පොකුණු සක්මන්මළු දිවාරාත්‍රී සක්මන් කරන ස්ථාන ආදී අටළොස් කෝටියක් පරිත්‍යාග කිරීමෙන් රමණීය භූමිභාගයක මනහර විහාරයක් කරවා බුදුරදුන්ට වැඩම කිරීම පිණිස, දූතයකු යැවීය. ශාස්තෘන් වහන්සේ දූතයාගේ වචන අසා මහා භික්ෂු සංඝයා පිරිවරා රජගහ නුවරින් නික්ම අනුපිළිවෙළින් සැවැත්නුවරට වැඩම කළ සේක. මහසිටුතුමාද, විහාරභූමිය සරසවා, බුදුරදුන් ජේතවනයට පිවිසෙන දිනයෙහි, තම පුත්‍රයා සියළු අලංකාරවලින් සරසවා කුමාරවරුන් පන්සියයක් සමග යැවීය. හෙතම පිරිවරාගෙන පස්වර්ණයෙන් යුතුව බබළමින් පන්සියයක් ධජපතාක ගෙන දසබලයන්ගේ ඉදිරියේ පෙනී සිටියේය. ඔවුන්ගේ පසුපසින් මහා සුභද්‍රා, චූල සුභද්‍රා යන සිටුදියණියෝ දෙදෙන පන්සියයක් කුමාරිකාවන් සමග පිරුණු කල පුන්කලස් ගෙන නික්මුණහ. ඇලාගේ පසුපසින් සිටු බිරිඳ සියළු අලංකාරවලින් සැරසි පන්සියයක් මව් කාන්තාවන් සමග පිරුණු පාත්‍ර ගෙන නික්ම ගියේය. සියල්ලන්ට පසුව තෙමේ මහා සිටුතුමා පොරවන ලද නව වස්ත්‍ර ඇත්තේ, පොරවන ලද අළුත් වස්ත්‍ර ඇතිව පන්සියයක් සිටුවරුන් සමග භාග්‍යවතුන් වහන්සේ බැහැදුටුවේය. බුදුරදුන් මේ උපාසක පිරිස පෙරටුකොට මහා භික්ෂු සංඝයා පිරිවරා, තමන්ගේ ශරීර ප්‍රභාවෙන් රන්වන් හා පාටින් යුතුද රතුපාට වනාන්තර අතරින් ගමන් කරමින් තමන්ගේ බුද්ධලීලාව ප්‍රකට කරමින් අපරිමිත බුද්ධ සිරියෙන් ජේතවනයට පිවිසියේය. ඉක්බිති අනේපිඬු සිටුතුමා බුදුරජුන්ගෙන් මෙසේ විචාළේය. "කෙසේද ස්වාමීනි, මම මේ විහාරය පිළිබඳව කෙසේ පිළිපදින්නෙම්ද යනුවෙනි. එසේ වීනම් ගෘහපතියා මේ විහාරය වැඩමකළ, වැඩම නොකළ සිවුදිශා වැසි සියලු භික්ෂු සංඝයා කෙරෙහි පිහිටුවව." යනුයි. ස්වාමීනි; යහපතැයි මහා සිටුතුමා රන්කෙණ්ඩියක් ගෙන, දසබලයන්ගේ අතේ ජලය වත්කොට, මේ ජේතවන විහාරය ආවාවූ, නොආවා වූ සිවුදිශා වැසි බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දෙමි'යි දුන්නේය. ශාස්තෘන් වහන්සේ විහාරය පිළිගෙන පින් අනුමෝදන් කරමින් :-

"සීතලද උණුසුමද නසති - වාලමිග සිවුපාවුන්ගේ ද
මැසි මදුරුවන්ගෙන්ද වන උවදුරු නසති.
පින්නෙන් හා වැස්සෙන් හානිද ඉවත්වෙයි.

එසේම තද සුළඟ, අව්ව, මහවැසි හටගත් සියල්ල ඒවා නසාලයි. වාසය කිරීම සඳහාද සැප විහරණ සඳහාද ධ්‍යාන වැඩීමටද, විදර්ශනාවටද ඉවහල් වේ.

සංඝයාට දුන් විහාර දානය අගය බුදුවරුන් වර්ණිත වේ එහෙයින් නුවණැති මිනිසා ආවාස දන් දී තමන්ගේ අර්ථ සිද්ධිය සලසා ගන්නේය. බහුශ්‍රැතයා රම්‍ය වූ විහාර කරවා පූජා කරන්නේය.

ඔවුන්ට ආහාරපාන වස්ත්‍ර සේනාසන, පිරිසිදු නිර්මල සිතින් ලබාදෙන්නේය.

එහි වෙසෙන භික්ෂූනු දහම් දෙසති. එය සියළු දුක් දුරුකිරීමට හේතු වෙයි. ඔවුන් එම දහම අවබෝධ කරගෙන සියළු කෙළෙස් නැතිකොට පිරිනිවෙත් යනුවෙන් විහාර ආනිශංස ප්‍රකාශ කළේය. අනාථ පිණ්ඩිකද දෙවෙනි දිනයේ පටන් විහාර පූජාව ආරම්භ කළේය. විශාකාවගේ විහාර පූජාවද සාර මාසයකින් නිම කළේය. අනාථපිණ්ඩික සිටාණන්ගේ විහාර කර්මාන්තය නව මාසයකින් නිම කළේය. විහාර පූජාවට කෝටි දහඅටක් වියදම් කළහ. මෙසේ එකම විහාරයෙහි පනස්හතර කෝටියක් ධනය පරිත්‍යාග කළේය. අතීතයේ විපස්සි බුදුරදුන්ගේ කාලයේ පුනබ්බසුමිත්ත නම් සිටුතුමා, රනින් කළ, නවාතැන්පොළක් මිලට ගෙන ඒ ස්ථානයේ, යොදුනක් පමණ සංඝාරාමයක් කරවීය. සිඛී බුදුරදුන්ගේ කාලයේ සිරිවඩ්ඪ නම් සිටුතුමා රත්රන් ගඩොල් ඇතිරූ නගර ශාලාවක් මිලට ගෙන ඒ ස්ථානයේ තුන්ගව්වක් මණ සංඝාරාමයක් කරවීය. වෙස්සභූ භාග්‍යවතුන්ගේ කාලයේ සොත්ථිය නම් සිටුතුමා රත්රන් ඇතුන් සිටින ශාලාවක් මිලට ගෙන ඒ ස්ථානයේ යොදුන් භාගයක් පමණ සංඝාරාමයක් කරවීය. කකුසන්ධ බුදුරදුන්ගේ කාලයේ අච්චුත නම් සිටුතුමා රත්රන් සාකච්ඡා ශාලාවක් මිලට ගෙන එම ස්ථානයේ ගව්වක් පමණ සංඝාරාමයක් කළේය. කෝණාගමන බුදුරදුන්ගේ කාලයේ උග්ග නම් සිටුතුමා රත්රන් වෙළඳශාලාව මිලට ගෙන එම ස්ථානයේ අඩ ගව්වක් පමණ සංඝාරාමයක් කරවීය. කස්සප බුදුරදුන්ගේ කාලයේ සුමංගල නම් සිටුතුමා රත්රන් සම්මන්ත්‍රණ ශාලාවක් මිලට ගෙන එම ස්ථානයෙහි අමුණු හැටහතරක ප්‍රමාණ සංඝාරාමයක් කරවීය. අපගේ භාග්‍යවතුන්ගේ කාලයේ අනාථපිණ්ඩික සිටුතුමා කහවණු කෝටියකින් නගරශාලාව මිලට ගෙන

එම ස්ථානයෙහි අමුණු තිස්දෙකක ප්‍රමාණයේ සංඝාරාමයක් කරවිය. මේ ස්ථාන සියළු බුදුවරුන් විසින් අත්නොහරින ලද ස්ථානමය.

මෙසේ මහාබෝධි මණ්ඩපයේ සිට සර්වඥතා ඥානයට පත්වීමද, පරිනිර්වාණය දක්වා යම් යම් තැන්වල භාග්‍යවතුන් වහන්සේ වැඩ වාසය කළේද? එය **සන්තිකෙ නිදාන** නමින් දත යුතුය.

"මෙසේ පිරිසිදු සිතින් බුද්ධ චරිතාපදානය අසනු මැනවි.
අසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනක් ධර්මරාජයෝ
සමතිංශත් පාරමිතා ධර්ම පුරණ ලදහ."

මෙහි අථ යනු අධිකාරිබලය හඳුන්වන නිපාත පදය විභක්තිවලට ගැලපෙන නිපාත පදයකි. නැතහොත්,

අධිකාර, මංගල, නිෂ්පන්න, අවධාරණ
අතරතුර, ගමන යන අර්ථයන්හි අථ ශබ්දය පවතී.

ඒ එසේමැයි :-

අධික ක්‍රියාව, අධිෂ්ඨාන, අධික අර්ථය බැබලීම
ශ්‍රේෂ්ඨ, ජ්‍යෂ්ඨ භාවයෙන්ද, අධිකාර හඳුන්වනු ලැබේ යයි,

කියන ලද බැවින් බුදුවරුන්ගේ සමතිංසත් පාරමී ධර්මයන් අධික කෘත්‍ය වශයෙන්ද, ශ්‍රේෂ්ඨ, ජ්‍යෂ්ඨ වශයෙන්ද, අධිකාර අර්ථයෙන් අථ ශබ්දය අපදානයේ යොදනු ලැබේ. ත්‍රිවිධ බෝධිසත්ත්වවරුන්ගේ සත්ත්වයන්ගේ පූජා මංගල යන අර්ථයෙන්ද "පිදිය යුත්තන් පිදීමද උතුම් මංගල්‍යයකි." යන වචනයෙන් මංගල අර්ථයෙන් අථ ශබ්දයෙන් කියන ලද බව පෙනේ. බුද්ධාදි භාග්‍යවතුන්ගේ වාසනා කෘත්‍යය ද අරහත්ත මාර්ගයෙන් නිපන් බැවින් නිෂ්පන්න අර්ථයෙන් අථ ශබ්දය අපදානයෙහි කියන ලදී. බුද්දක පාඨ සංග්‍රහ කරන ලදී. සංග්‍රහ කරන ලද බැවින් අතරතුර යන අර්ථයෙන් අථ ශබ්දය යෙදීම සුදුසු වේ. මෙයින් බුද්දක පාඨයේ පටන් අගමන (වෙන්වීම) අර්ථයෙන් අථ ශබ්දයෙන් ප්‍රකාශ වේ. බුද්ධො යනු මෙහි සත්‍යය අවබෝධ කළ බැවින් බුද්ධ නම් වේ. අවබෝධ කළයුතු ජනතාවට අවබෝධ කරවන බැවින් බුද්ධ නම්. සර්වඥතා ඥානය ඇති බැවින් බුද්ධ නම්. සියළු දර්ශන දුටු බැවින් බුද්ධ නම් වේ. කෙලෙස් දුරුකළ නිසා

බුද්ධ නම් වේ. මහරහත් බැවින් බුද්ධ නම්. උපක්ලේශ ධර්මයන් ශේෂ නොකොට දුරුකළ බැවින් බුද්ධ නම් වේ. ප්‍රවෘජ්‍යා සංඛ්‍යාත බුද්ධ නම් දෙවැන්නකු නැති බැවින් බුද්ධ නම් වේ. තෘෂ්ණාව ප්‍රහාණය කළ බැවින් බුද්ධ නම් වේ. ඒකායන මාර්ගය අංගය බුද්ධ නම් එකම නිරුත්තර සම්මා සම්බුද්ධත්වයට පත්වූ නිසා බුද්ධ නම් වේ. අබුද්ධිය (මෝඩකම නොදැනීම) තුළින් බුද්ධිය ඉස්මතු කළ බැවින් බුද්ධ නම්. බුද්ධියෙන් බුද්ධිය අවබෝධ කරන නිසාද, අර්ථය ප්‍රකට කරන නිසාද, යම්සේ නීල වර්ණයෙන් යුතු වස්තුය නිල් වස්තු, රතු වර්ණයෙන් යුතු වූයේ රතු වස්තු යයි කියනු ලැබේද? එසේ බුද්ධිගුණ යෝගයෙන් යුතු හෙයින් බුද්ධ නම් වේ. නැතහොත් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කළ නිසා බුද්ධ යයි කියනු ලැබේ. එම ඤාණයෙන් මුළු දසදහස් ගණන් ක්ලේශ සමූහයා ක්ෂයකොට නිර්වාණ අධිගමයට පත් ඤාණය බෝධි යයි කියනු ලැබේ. එයින් යුක්ත වූද එමගින් රැස්කළ යුතු පුද්ගලයා බුද්ධ නම් වේ. එම ඤාණයෙන්ම පසේබුදුවරුද සියළු ක්ලේශ ක්ෂය කොට නිර්වාණය අවබෝධ කරගනියි. බුදුවරු නම් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පුරා බෝධිඤාණය අධිගත කළ බැවින් ඉන්ද්‍රිය පරියත්ති ඥානය, මහා කරුණා සමාපත්ති ඥානය, යමක පාටිහාරිය ඥානය, සර්වඥතා ඥානය, අනාවරණ, ආසයානුසයා, අසාධාරණ ඥානයන්ගෙන් සමාධිගත වූ බැවින් එකම ධර්මදේශනාවකින් අප්‍රමාණ සත්ත්වයන්ට ධර්මය නමැති අමෘතය පොවා, නිර්වාණාධිගමයට යොමු කරන බැවින් එම ඥානය බුදුන්ටම අධිකාර බැවින් එයද සම්බුද්ධ චරිතයටම අදාළ වේ.

බුද්ධාපදානය දෙවැදෑරුම් වේ. කුසල-අකුශල වශයෙනි. කුසල අකුසල වශයෙන් පසේබුදුවරුන්ට එය කිරීමට නොහැකිය. ප්‍රත්‍යය දායකයන්ට සංග්‍රහ කරමින් :-

"ඔබ කැමැති වන ප්‍රාර්ථනා කරන සියල්ල වහාම
සමෘද්ධ වේවා! පුන් පෝදා චන්ද්‍රයා මෙන්
චිත්ත සංකල්පනාවෝ පිරෙත්වා!
බබළන මාණික්‍යයක් මෙන් සඵල වෙත්වා!

මේ ගාථා දෙකෙන්ම ධර්මදේශනා කරති. දේශනා කරන්නේ නමුත් අසංඛ්‍යෙය්‍යයක් සත්ත්ව කොටියාසවලට අවබෝධ කිරීමට නොහැකි වෙති. එහෙයින් බුදුන් හා සමානව එකම ලෙස සර්වඥතාවය නැති හෙයින් පච්චේක බුද්ධ නම් වේ. ඔවුන්ගේ අපදාන තොරතුරු පච්චේක බුද්ධාපදාන

නම් වේ. දිගුකලක් සිටි බැවින් **ථෙරා** නම් වේ. ස්ථිරසාර ශීල ආචාර ගුණයෙන් යුක්ත බැවින් ථෙර නම් වේ. නැතහොත් ස්ථිරසාර ලෙස සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඥාන දර්ශනවලින් යුක්ත නිසා ස්ථවිර නම් වේ. නැතහොත් ස්ථිර ලෙස නිර්වාණ මහාර්ගය අනුගත මගට පිළිපන් නිසා ථෙර නම් වේ. තෙරවරුන්ගේ අපදානය ථෙරාපදාන නම් වේ. එසේම තාදී ගුණයෙන් යුක්ත බැවින් ථෙරී නම් වේ. තෙරණියන්ගේ චරිතකථා ථෙරී අපදාන නම් වේ. මේවා අතර බුද්ධ අපදානය සමග අපදාන පහක් ඇති බැවින් සූත්‍රාන්තවල පංච අපදාන කියත්. එසේ හෙයින් පුරාණයන් කියන ලදී.

"අපදාන පහකි. සූත්‍ර පහකි.
මේ බුද්ධ අපදානය පළමුව පිළිවෙළ දතයුතුය.

පසේ බුදුවරුන්ගේ අපදානයද අපදාන පහකි. සූත්‍රාන්ත පහකි. එසේ හෙයින් පෞරාණිකයන් කියන ලදි.

"අපදාන පහකි. සූත්‍රාන්ත පහකි.
මේ පසේ බුදුවරුන්ගේ අපදානය දෙවෙනි අනුපිළිවෙළ බව දතයුතුය."

ථෙර අපදානවලද, පන්සිය දහයක් අධිකකොට ඇති අපදාන වර්ග වශයෙන් පනස් එකක් වර්ග ඇත. (10 x 51) එබැවින් පෞරාණිකයන් කියන ලදි.

"පන්සිය දහයක් අපදාන වර්ග පනස් එකකි.
මේ ථෙර අපදානය තෙවෙනි අනුපිළිවෙළට දතයුතුය."

ථෙරී අපදානවල හතළිහක් අපදාන ඇත. වර්ග වශයෙන් සතරකි. එබැවින් පෞරාණිකයන් කියන ලදි.

"වර්ග සතරකින් සතළිහක් අපදාන ඇති
මේ ථෙරී අපදානය සතරවෙනි අනුපිළිවෙළයි."

අපදාන යනු; මෙහි **අපදාන** ශබ්දය කාරණා ගැනීම පහවයාම අනුපිළිවෙළ තමන් හුවාදැක්වීම යන අර්ථවල දක්නට ලැබේ. ඒ එසේමය. "මේ ක්ෂත්‍රියන්ගේ අපදාන, බ්‍රහ්මයන්ගේ අපදාන යනුවෙන් ආදි කාරණාවලද දක්නට ලැබේ. ක්ෂත්‍රියයන්ගේ කරුණු, බමුණන්ගේ කරුණු

යන අර්ථයයි. "උපාසකයන්ගේ චරිත" ආදී වශයෙන්ද දක්නට ලැබේ. සරළ වශයෙන් ගැනීම අර්ථයයි. වෙළෙන්දන්ගේ අපදානය සුදුයන්ගේ අපදාන වශයෙන් ආදි අර්ථ අපගමනාර්ථයෙහි දක්නට ලැබේ. එසේ ඔවුන්ගේ ඉවත්වයාම යන අර්ථයයි. පිණ්ඩපාතික භික්ෂුව අනුපිළිවෙළ වශයෙන් පිඬු පිණිස හැසිරෙයි. ආදී ලෙස අනුපිළිවෙළ දක්නට ලැබේ. ගෘහ පිළිවෙළින් සැරිසරයි යන අර්ථයයි. මේ මහණකමින් ඉවත්වූයේ, බ්‍රහ්මත්වයෙන් ඉවත්වූයේ යන අපදානයයි. අක්‍රෝෂනයේද දක්නට ලැබේ. ආක්‍රෝෂ කරයි. පරිභව කරයි යන අර්ථයයි. මෙහි වනාහි **කාරණෙ** දක්නට ලැබේ. එහෙයින් බුදුවරුන්ගේ අපදානය බුද්ධාපදාන බුදුන්ගේ තොරතුරු යන අර්ථයයි. ගංගා වැලි උපමාකොට ඇති, අනේක වූ බුදුවරුන්ගේ දානපාරමිතාදි වශයෙන් සමතිංසත් පාරමිතා කාරණා ලෙස දතයුතුය. තවද, අධිකාරාදියෙහි සුදුසු අපදාන වේ. පිරිසිදු මනසින් අසවු යනුවෙන් සම්බන්ධ නම් වේ. එහි **සුද්ධමානසා** යනු අරහත් මාර්ග ඤාණයෙන් එක්දහස් පන්සියයක් කෙලෙස් ක්‍ෂයකොට සිටි බැවින් පිරිසිදු මනසක් ඇති බවද, සුපිරිසිදු මනසක් ඇති බවද, පිරිසිදු හදවත ඇති පන්සියයක් ක්‍ෂීණාශ්‍රවයෝ මේ දම්සභාවේ වැඩසිටින බැවින් අසවු. බහා තබන ලද කණින් මෙනෙහි කරවු යන අර්ථයයි. මෙහි අපදාන යයි නොකියා පසේ බුදුවරුන්ගේ අපදාන, ථෙර අපදාන, ථෙරී අපදාන වශයෙන් විද්‍යමාන වන කල්හි 'අනතුරුව' 'බුද්ධ අපදාන' යන වචනය ස්කන්ධ ධාතු ආයතන සතර සංඛාර ආදි වශයෙන් විද්‍යමාන කල්හිද, ප්‍රධාන වශයෙන් මූල වශයෙන් 'මූලයමක' යන වචනය මෙන්ද, සංසාදිසේස දහතුනද, අනියත දෙකද නිගහි පචිති තිහද, විද්‍යමාන වන කල්හි ප්‍රධාන වශයෙන් ද ආදි වශයෙන් ද (මූල) කියන ලදි යයි දතයුතුය. සම්මා සම්බුද්ධ අපදානය යයි කිවයුතු තැනදී **වණ්ණාගමො - පකෘඩිධ නිරුත්තිං** යනාදි නිරුක්ති න්‍යායෙන්ද, **තෙසු වුද්ධිලොපාගමො විකාරපරිතදෙසා** වා යන සූත්‍රයෙන්ද, තනියාර්ථ වාචක වූ 'සම්මා' යන නිපාත පදයට ද සයං යන ශබ්දාර්ථ වාචකය ද 'සං' යන උපසර්ග පදයට ද ලොප්කොට කරන ලද බැවින් බුද්ධ ශබ්දයම ගෙන ගාථා බැඳීම් සැප අර්ථයයෙන් බුද්ධාපදාන යයි කියන ලදි. එබැවින් සම්මා සම්බුද්ධාපදාන යන අර්ථයයි.

මෙසේ විසුද්ධජන විලාසිනි නම් අපදාන අට්ඨකථාවේ
අභ්‍යන්තර නිදාන වර්ණනාව නිමියේය.

දැන් අභ්‍යන්තර නිදානයෙන් අනතුරුව අපදාන අටුවාව කියනු කැමැතිව :-

"විස්තර අපදාන සහිත අපදානය විචිත්‍ර දේශනා විලාශයක් ලෙස
මහර්ෂී වූ බුදුරදුන් බුද්දක නිකායෙහි සංග්‍රහ කළෝ,
දැන් එහි අනුපිළිවෙළින් අර්ථ වර්ණනාව කියනු ලැබේ.

එහි යම් අපදානයක් වේද එහි සියලු බුද්ධ වචන එකම විමුක්ති රසය යයි කියන ලද බැවින් එකම රසය සංග්‍රහ කිරීමට යයි ධර්ම-විනය වශයෙන් දෙපරිදි සංග්‍රහ කළ කල්හි ධර්ම සංග්‍රහයට යයි ප්‍රථම මධ්‍යම පශ්චිම බුද්ධ වචනවල මධ්‍යම බුද්ධ වචනය සංග්‍රහ කරයි. විනය අභිධම්ම සූත්‍ර පිටකවලදී, සූත්‍රාන්ත පිටකයෙහි සංග්‍රහය කරයි. දීඝනිකාය මජ්ඣිම සංයුත්ත, අංගුත්තර බුද්දක නිකායවල පහ තුළ දී බුද්දක නිකායේ සංග්‍රහ කරයි. සුත්තගෙය්‍ය වෙය්‍යාකරණ, ගාථා උදාන ඉතිවුත්තක, ජාතක අබ්භූත ධම්ම වේදල්ල යන නවවිධ ශාසන සංග්‍රහවලදී ගාථා අංගයෙහි සංග්‍රහකර ඇත.

"සිවු විසි බුදුවරුන් විසින්ද, දෙදහසක් භික්ෂූන් කෙරෙන්ද
අසූහාරදහසක් ධර්මය මෙහි පවත්වනු ලැබේ."

මෙසේ කියන ලද, අසූහාර දහසක් ධර්ම ස්කන්ධවල ධර්ම කිහිපයක් සංග්‍රහ කරණ ලද්දේ වෙයි. ඒ අපදානය දක්වමින් දැන් **තිංසපාරමී සම්පුණ්ණා** ධම්මරාජා **අසංඛ්‍යා** යනුවෙන් කීවේය. එහි දස පාරමිතාම පශ්චිම, මධ්‍යම, උත්කෘෂ්ට වශයෙන් දසපාරමී, දස උපපාරමී, දස පරමාර්ථ පාරමී වශයෙන් සමතිහක් පාරමිතා වේ. ඒවා වනාහි සරල අර්ථය පිරුණේ, සම්පූර්ණ වූයේ සමන්විතව සමගි වූවා ඉගැන්වීම් වශයෙන් හඳුනාගත් බැවින් **තිංසපාරමී සම්පුණ්ණා** නම් වේ. සියළු ලෝකත්‍රයවාසී වූ සත්ත්ව නිකායේ මෙත් කරුණා මුදිතා උපේක්ෂා සංඛ්‍යාත සතර බඹ විහරණවලින් යුක්ත බැවින්ද, ඵල සමාපත්ති විහරණයෙන්ද සිත එක අරමුණක රඳනා බැවින් තමන්ගේ ශරීරයෙහි රැඳෙත් ඇලෙත්නුයි රජවරු දැහැමින් රජකරන බැවින් ධම්මරාජා නම්. මෙසේ පවත්නා බුදුවරු දසදහසක් කෝටි ප්‍රකෝටි ගණන විශාල සංඛ්‍යාවකි. කෝටි ප්‍රකෝටියකි යුගත්යක, පුණ්ඩරික, කුමුද, උත්පල, කථාන, මහා කථාන, අසංඛ්‍යය වශයෙන් **අසංඛ්‍යා** නම් වේ. සැකසංකා රහිත ධර්මරාජ

වූ, ඔවුහු අතීතය දුරුකළ නිරුද්ධ කළ නිවැරදි අර්ථයට ගිය බැවින් අභිප්‍රාය වූ, ඒ අතීත බුදුවරුන් අතර කරන ලද අධිකාරය ඇති තම බෝසත් සත්ත්ව වශයෙන්ද චක්‍රවර්ති රජකු වී කරන ලද සම්භාර ධර්මද ආනන්ද තෙරුන් විසින් විමසන ලදුව, භාග්‍යවතුන් වහන්සේ **සමෙබාධිං** බුද්ධ සෙය්‍යානං යන ආදිය කීවේය. පින්වත් ආනන්ද; මගේ චරිතය අසනු මැනවි යන අදහසයි. ආනන්දය; පෙර මම බෝධි සම්භාර ධර්ම පුරණ කාලයේ චක්‍රවර්ති රජකු වී, ශ්‍රේෂ්ඨයන් අතර ප්‍රශස්ත වූයේ අවබෝධ කරගත් චතුස් සත්‍යය ඇති බුදුවරුන්ගේ සම්බෝධිය ද, චතුරාර්ය සත්‍ය මාර්ග ඤාණය ද සර්වඥතා ඤාණය ද සිරසින් වන්දනය කරයි යන අදහසයි. **සංඝෙ ශ්‍රාවක සංඝයා සහිත. ලොකනායකෙ** ලෝකයෙහි ජ්‍යෙෂ්ඨ වූ බුදුවරුන්. **දසංගුලි** දෙඅත්පුඩිවලින්. **නමස්සිත්වා** වැඳ **සිරසා** ශීර්ෂයෙන් හිසින්. **අභිවාදයෙ.** ආදරයෙන් ප්‍රශංසා කොට ප්‍රණාම කරමි යන අර්ථයයි. **යාවතා** බුද්ධ බෙනෙතසු. යනු දසදහසක් සක්වල බුද්ධ ක්ෂේත්‍රවල. **ආකාසට්ඨා** ආකාශගත. **භූමට්ඨා** භූමිතලයෙහි වූ වෛඩූර්ය ආදි සප්ත මාණික්‍යරත්න. **අසංඛ්‍යා** සංඛ්‍යා රහිත. **යාවතා** යම් පමණ විද්‍යමාන වෙත්ද ඒ සියල්ල. මනසා සිතින්. **සමාහරෙ** පිරිසිදු සිතින්. අධිෂ්ඨාන කොටගෙන එන්නෙමි යන අර්ථයයි. මගේ ප්‍රාසාදයට හාත්පසින් රැස් කරමි යන අර්ථයයි. එහි **රූපියභූමියං** යනු ඒ නොයෙක් භූමියෙහි ප්‍රාසාදයෙහි රිදියෙන් සැදූ රිදීමය භූමි නිර්මාණය කර ඇති යන අර්ථයි. මම රත්නමයං සත්රුවනින් නිර්මාණය කරන ලද නොයෙක් සියගණන් භූමිවලට අයත් ප්‍රාසාද. **උබ්බිද්ධං** උද්ගත වූ. **නභමුග්ගතං** අහසෙහි බබළන මවනලද යන අර්ථයි. එයම ප්‍රාසාදයයි. වර්ණනා කරන්නේ **විචිත්තරමණං** යනාදිය කීවේය. විචිත්‍ර වූ අනේකාකාර වෛරෝඩි පාටින් යුතු කණුවලින් ඔසවන ලද. **සුකතං** මැනවින් කරන ලද ආරෝහ පරිණාහ වශයෙන් වූ ලක්ෂණයෙන් යුතු. **සුවිහතතං** නොයෙක් කෝටි සියගණනින් අනර්ඝ වූ තොරණින් නිර්මාණය කරන ලද බැවින්. **මහාරහං** යළිත් විශිෂ්ටතර වූ **කනකමය** සංඝාටං රත්තරන්වලින් කරන ලද වළලුවලින් යුතු එහි ඔසවන ලද කොඩිවලින්ද ඡත්‍රවලින්ද හෙල්ලෙන්ද. **මණ්ඩිතං** හොඳින ලද ප්‍රාසාද යන සම්බන්ධයි. යළිදු ප්‍රාසාදයගේ ඒ මම වර්ණනා කරන්නේ. **පඨමා වෙළුරියා භූමි** යනාදිය කීවේය. ප්‍රාසාද සහිත නොයෙක් සියගණන් භූමි **සුභා** ඉෂ්ටය කාන්තය මනාවිය. **අභ්‍රසමා** වලාකුළු පටල හා සමාන. **විමලා** නිර්මල වෛඩූර්ය මැණික් සමාන නීලවර්ණ පළමු භූමිය විය යන අර්ථයයි. ජලජ පියුම්වලින් ගැවසීගත් රැස්කරන ලද්දා වූ. **වරාය උතුම්** බැවින්. **කාඤ්චන භූමියා** ස්වර්ණ භූමියද ශෝභන වේ යන අර්ථයයි. ඒ

ප්‍රාසාදයගේ කිසියම් භූමියක වෙන්කළ ස්ථානයයි. **සුභා** මනෝහර වූ **ඉන්ද්‍රගොපක වණ්ණාභා.** රශ්මිහු ගලනු ලබන කිසියම් භූමියක දස දිශා බබළයි යන අර්ථයයි. එම ප්‍රාසාදයෙහි **නියූහා** නික්මවිය. ප්‍රමුඛ ශාලාව. **සුවිභත්තා** මැනවින් බෙදන ලද බැවින් කොට්ඨාශ වශයෙන් වෙන් වෙන්කොට. **සිංහපඤ්ජරා** සිංහදොරටුව **චතුරොවෙදිකා** වළලුවලින්ද දැල් ආවාටවලින්ද යුක්ත මනොරමා මනස ඇලී සිටින බැවින් සුවඳවැල් සුවඳදාම එල්ලෙන්නී යන අර්ථයයි ඒ ප්‍රාසාදයෙහිම. **සත්තරතන භූසිතා** සප්ත රුවනින් ශෝභමත් වූ කූටාගාර කුමක් විද? **නීලා** නිලවර්ණ **පීතා** පීත-කහපාට, රන්වන්. **ලොහිතකා** ලේපාට වර්ණ රතුපාට. **කූටාගාර වරූපෙතො** කූටාගාරයෙහි මුදුන්වහලය සහිත කූටාගාරවරයෙහිදි. **උපෙතො සමන්නාගත ප්‍රාසාද** යන අර්ථයයි. ඒ ප්‍රාසාදයෙහි. **උපෙතො** සමන්නාගත ප්‍රාසාද යන අර්ථයයි. ඒ ප්‍රාසාදයෙහි **ඔලෝකමයා** උඩට මුව ඇතිව පිපුණු. **පදුමා** ශෝභනවෙත්. සිංහව්‍යාඝ්‍රාදීන්ද, මල්මුව ගෝත්‍ර ආදීන්ද හංස කොස්වාළිහිණි මොනර ආදී පක්ෂි සමූහයෙන්ද යුතු. **සොභිතො** ඒ ප්‍රාසාදය යන අර්ථයයි. ඉතා උස්බැවින් අහස උසට යුක්ත. **නක්ඛත්තතාරකාභි ආකිණ්ණා වජිරසුරියෙහි** සඳ හිරු දෙදෙනාගෙන් යුක්ත. **මණ්ඩිතො** ඒ ප්‍රාසාදය යන අර්ථයයි. එය සක්විති රජකුගේ ප්‍රාසාදයකි. හෙමජාලෙන රන්දැලකින්. **සඤ්ඡනෙනා සොණ්ණ කිංකිණිකායුතො** රන්වන් කිංකිණි දැල්වලින් යුතු සමන්විත යන අර්ථයයි. **මනොරමා** සිත ඇලෙන තැන. **සොණ්ණමාලා** රන්වන් මල්පේළි. **වාතවෙගෙන** සුළං පහරින්. **කූජන්ත** ශබ්ද කරන්නී යන අර්ථයයි. **මඤ්ජුථකං** මදටිය පාටැති. **ලොහිතකං** ලේ වර්ණයැති. **පීතකං** කහ පාටැති. **හරිඡඤ්ජරං** රතුපාටැති ස්වර්ණ වර්ණැති වර්ණ පහකින් යුක්ත. **නානාරංගෙහි** නොයෙක් වර්ණවලින් යුතු. **සම්පීතං** රඳවන ලද ධජය **උස්සිතං** ප්‍රාසාදයෙහි ඔසවන ලද. ධජමාලිනී යනු ලිංග විපර්යාස වශයෙන් කියන ලද කොඩිවැල්වලින් යුතු ප්‍රාසාද යන අර්ථයයි. ඒ ප්‍රාසාදයෙහි අතුරණ ඇතිරිලි ආදියෙන් විසිතුරු ශෝභිත වූ ඇඳන් පුටු ආදී නිදන හිඳින ආසනයෝ. නොයෙක් සියගණනින් යුතු කිමෙක් විද? **එළිකා** පලිඟු මැණිකෙන් කරන ලද. **රජතමයා** රිදීවලින් කරන ලද. **මණිමයා** නිල් මැණික්වලින් කරන ලද. **ලොහිතංකරත්නා** දෑරඹ මිණියෙන් කරන ලද. **මසාරගල්ලමයා** කබරවර්ණ මැණිකෙන් කරන ලද. **සණ්හකාසික සණ්ඨා** යනු ඉතාම සියුම් වූ කාශි වස්ත්‍රයෙන් අතුරණ ලද. **පාපුරා** යනු නූපූර කෙබඳුද. **කම්බලා** ලොම් නූලෙන් කරන ලද. **දුකූලා** දුහුල් වස්ත්‍ර නූල්වලින් කරන ලද. **චිනා** චීන වස්ත්‍රවලින් කරන ලද. **පත්තුණ්ණා** විවිධ

වස්ත්‍ර තූල්වලින් කරන ලද. **පණ්ඩු** - පඬුවන් පාට. විචිත්‍ර ආස්තරණ නොයෙක් ඇතිරිලිවලින් යුතු. **පාපුරා** පාද පූර්ණය කළ විසිතුරු වූ. **සබබං** යහන් ආදිය. **මනසා සිතින් මම. පඤ්ඤපෙමි** යනු අර්ථයයි. ඒ ප්‍රාසාදයම වර්ණනා කරමින්. **තාසුතායෙව භූමිසු** යන ආදිය කීවේය. එහි **රතනකූටමලංකත** යනු රත්නමය පර්වතවලින්ද රත්න කර්ණිකාවලින් අලංකාර වූ ශෝභමත් වූ යන අර්ථයයි. **මණිවෙරොචනා උකකා** යනු වෛරෝචන මැණික්වලින් රතු මැණික්වලින්ද කරන ලද. **උකකා** ප්‍රදී දඬු. ධාරයනතා **සුතිට්ඨරෙ** යනු අහසෙහි මැනවින් දරන්නා වූ ගන්නා වූ නොයෙක් සියගණන් ජනතාව මැනවින් සරළ ලෙස සිටිත් යන අර්ථයයි. යළිත් එම ප්‍රාසාදය වර්ණනා කරමින් **සොභනති එසිකපට්ඨිභා** යන ආදියෙන් කීවේය. එහි එසිකපට්ඨිභ යනු නගර දොරටුවේ ශෝභනත්වය සඳහා පිහිටුවන ලද යකඩ ස්ථම්භය. **සුභා** ඉෂ්ට ප්‍රියමනාප. **කඤ්චන තොරණා** ස්වර්ණමය වූ. **ජමබෝ නදා** දඹරන් ස්වර්ණමය වූ. **සාරමයා** කිහිරිරුක් සාරයෙන් යුතු. **රජතුමයා** ච තොරණින් හොබනා වූ මේ තොරණ ද ඒ ප්‍රාසාදය ශෝභනය කරත් යන අර්ථයයි. ඒ ප්‍රාසාදයෙහි **සුවිභතතා අනෙකාසඤ්ඤි** කවාටවලින් ද අගුල්වලින් ද **විනිතතා** ශෝභමත් වූ සන්ධිවලින් වටකර වූ ශෝභමත් වේ, යන අර්ථයයි. **උභතෝ** ඒ ප්‍රාසාදයේ දෙපැත්තෙහි **පුණ්ණඝටා** නොයෙක් නෙළුම්වලින්ද උපුල්වලින් ද සංයුතා සම්පූර්ණ වූ ඒ ප්‍රාසාදය හොබනා වේ යන අර්ථයයි. මෙසේ ප්‍රාසාදයේ සුන්දරත්වය වර්ණනාකොට රතනමය ප්‍රාසාදය ද, සත්කාර සම්මානද සලසන්නේ. **අතීතෙ සබබබුදෙධව** යනුද කීවේය. එහි **අතීතෙ** යනු ඉක්මවා යන්නේ පහවූ කල්හි හටගත්. **සසංඝෙ** ශ්‍රාවක සමූහයා සහිත සියල්ලෝ. **ලොකනායකෙ** ස්වභාවයෙන් බුදුරදුන්. **පකතිවණණරූපෙන** ස්වභාවයෙන්. **සසාවකෙ** ශ්‍රාවකයන් සහිත පසේ බුදුරදුන් මවා යම් දොරටුවකින් ප්‍රාසාදයට පිවිසිය යුතුද ඒ දොරටුවෙන් පිවිස ශ්‍රාවකයන් සහිත සියළු පසේබුදුවරුන්. **සබබසොවණණමයෙ පීථෙ.** සියලු ස්වර්ණමය වූ පුටුවේ හුන්නා වූ. **අරියමණඩලා** ආර්ය සමූහයා වූහ යන අර්ථයයි. **එතරහි** වර්තමාන කාලයෙහි. **අනුත්තරා** උත්තර රහිත. පසේබුදුවරු. **අපී** දක්නා ලැබෙත්. **තෙව** පසේ බුදුවරුන්. **අනෙකසත සයම්භූ** තමන්ම අවබෝධ කරගත් අනෙකුත් ආචාර්යවරු රහිත වූ **අපරාජිතෙ** ස්කන්ධ කෙලෙස් සංස්කාර මාර දිව්‍යපුත්‍රයන් විසින් පරාජය කිරීමට නොහැකි වූ ජයට පැමිණියේ සන්තර්පණය කළේ යන අර්ථයයි. **භවනං** මගේ ප්‍රාසාදය අතීත කාලයේද, වර්තමාන කාලයේද **සබබෙ බුද්ධා සමාරුහං** සරල ලෙස නැංගාහ යන අර්ථයයි. **යෙ දිබබා දිබබා**

දිව්‍ය ලෝකයෙහි උපන් යම්බඳු කල්ප වෘක්ෂයක් ඇත. **යෙව මානුසා** මිනිසුන් ලෙස උපන්. යම් කල්පවෘක්ෂයක් ඇත්ද එයින්. **සබ්බදුස්සං සමාහත්වා** මැනවින් කරන ලද ගෙනෙවිත් තුන්සිවුරු කරවා ඒ පසේ බුදුවරුන්. **තිච්වරෙහි අච්ඡා දෙමි** යනු සම්බන්ධයයි. මෙසේ තුන් සිවුරුවලින් අන්දවා පොරවා ඒ හිඳින්නා වූ පසේ බුදුවරුන්ගේ **සමපඤ්ඤං** මිහිරි. **බජ්ඣං** කෑයුතු දේ. **භොජ්ජං** වැළඳිය යුතු දේ. **ආහාරංච** මිහිරි. **සායනීයංච ලෙහණීයංච** මිහිරි රසයෙන් පානය කළයුතු. අධ්‍යපානංච වැළඳිය යුතු ආහාර. **සුභෙ** සුන්දර වූ. **මණිමයෙ** ශෛලමය පාත්‍රයෙහි මැනවින් පුරවා. **අදාසිං** පිළිගැන්වූයෙමි යන අර්ථයයි. **සබ්බෙ අරියමණ්ඩලා** ඒ සියලුම ආර්ය සමූහයා. **දිබ්බ චක්ඛු සමාහුත්වා මධ්‍යා** යනු දිව්‍යැසින් සමන්විත වූ සුමට කෙලෙස් රහිත බැවින් මටසිළිටු වූ ශෝභමාන වූ. **චීවර සංයුතා** තුන් සිවුරෙන් යුක්ත වූ මීවලින්, සකුරුවලින් හා තෙල්වලින්ද, මීපැණිවලින්ද, **වරමනෙනන.** උතුම් ආහාරයෙන් මා විසින්. **තප්පිතා** සන්තර්පණය කළ පරිපූර්ණය කළාහුය යන අර්ථයයි. **තෙ** මෙසේ සන්තර්පිත වූ ආර්ය සමූහයා. **රතනගබ්භං** සත්රුවනින් නිර්මාණය කරන ලද ගැබට පිවිස. **ගුහාසයා** ගුහාවෙහි නිදනු ලබන කේසර සිංහයෝ මෙන්. **මහාරහස්මිං සයනෙ** අනර්ඝ වූ ඇඳෙහි. **සීහසෙය්‍ය** මකප්පයුං යම්සේ සිංහ සිවුපා රජා දකුණු පැත්තෙන් නිදන්නේ පාදයෙන් පාදය යටකොට දකුණු අත හිසට තබාගෙන වම්අත ඍජුව තබා වල්ගල හකුළුවාගෙන නිශ්චලව සයනය කරයි. මෙසේ නිදාගැනීම **කප්පයුං** කළහ යන අර්ථයයි. ඔවුහු මෙසේ සිංහ සෙය්‍යාවෙන් කල්යවා **සම්පජානා** සති සම්පජඤ්ඤයෙන් යුක්තව (සිහිබුද්ධිය එලවා) **සමුට්ඨාය** මැනවින් නැගිට. **සයනෙ** සයනයෙහි කලවා බැඳුණු **පල්ලංකමාභුජුං** කලවා බැඳුණු ආසනයක් පර්යංකයක් කළහ යන අර්ථයයි.

ගොචර සබ්බ බුද්ධානං යනු සියළු අතීත අනාගත බුදුවරුන්ට ගෝචර වූ අරමුණුවලට යටත්ව. **ඣානරති සමපිතා** ධ්‍යාන රතියේ මැනවින් ඇලී සමගි වූවා වූහ යන අර්ථයයි. **අඤ්ඤෑ ධම්මානි දෙසෙනති** යනු ඒ පසේ බුදුවරුන් අතර අන්‍ය වූ ඇතැමෙක් දහම් දෙසති. අනෙක් ඇතැමෙක් ඍද්ධි බලයෙන්. **පඨමාදි ඣානකීළාය කීළං** යනු ඇලෙති. **අඤ්ඤෑ** ඇතැමෙක් යන අදහසයි. **වසීභාවිතා** වසඟ කළහ. පංච අභිඥාවල. ආවර්ජන සමාවර්ජන නැගී සිටීම අධිෂ්ඨානය ප්‍රත්‍යවේක්ෂණය සංඛ්‍යාත පස්වැදෑරුම් වසඟභාවය මෙතනින් ගියා පැමිණියා අවබෝධ කරගත්. යහපතැයි සිතීම, සමාදන්වීම ඇති අන්‍ය ඇතැම් කරුණු. අනෙක

සත සහසසියො චිකුබබතා "එකකු වී බොහෝ වෙයි. බොහෝ වී එකකු වෙයි" මේ ආදී සෘද්ධිමය මවාපෑම්. **කුබබනති** කරත් යන අර්ථයයි. බුදධාපි බුදධෙ යනු මෙසේ රැස්වී ඒ පසේ බුදුවරුන් විෂයෙහි සර්වඥතා ඥානයට විෂය වූ අරමුණු මුල්වූ අවබෝධයෙන් අවබෝධය විචාරත් යන අර්ථයයි. ඒ බුදුවරු අර්ථ ගම්භීරතාවයෙන් යුක්තය. **ගම්භීරානිපුණං** සියුමැලි වූ. ඥානං කාරණය. **පඤඤාය විනිබුජඣරෙ** විශේෂයෙන් නිරවශේෂ වශයෙන් අවබෝධ කරති. එකල මගේ ප්‍රාසාදයට **රැස්වුණා** වූ ශ්‍රාවකයෝද බුදුන් කෙරෙහි ප්‍රශ්න විචාරත් බෞද්ධයෝ. **සාවකෙ** ශිෂ්‍යයන් ප්‍රශ්න විචාරති. ඒ බෞද්ධ වූ ශ්‍රාවකයෝද ඔවුනොවුන් ප්‍රශ්න විචාරා **අඤඤමඤඤං වාකරොනති** යනු විසඳති යළි ඒ සියල්ලෝ එකට පෙන්වමින් බුදුවරුද, **පචෙචක බුදධා** යන ආදිය කීවේය.

එහි බුදධා සම්මා සම්බුද්ධ. **පචෙචක බුදධාච** ශ්‍රාවකයෝද, **සිසසා පරිචාරකා** යනු ඇසුරින් මේ සියල්ලෝ ස්වකීය ස්වකීය ඇල්මෙන් සතුටු වෙමින් ඇල්මෙන්. මගේ ප්‍රාසාදයෙහි සතුටු වෙත් යන අර්ථයයි. **මේ** වෛජයන්ත ප්‍රාසාදයෙහි පසේ බුදුවරුන්ට ආචාර සමාචාර දක්වා දැන් තමන්ගේ ආනුභාවය ප්‍රකට කරවමින් හේ වනාහි ලොව ජයගත් චක්‍රවර්ති රජතුමාය. **ඡතතා නිඣතතු රතනා** යන ආදිය කීවේය.

එහි **රතනා** සප්ත රුවන්මය ඡත්‍රරත්නේ වියළි පත්‍ර රන්දැල්වලින් එල්ලා තබත්වා. **මුතතාජාල පරිකඛිතතා** මුතුදැල්වලින් පිරිවරණ ලදුව සියළු කුඩ මගේ හිස මුදුනේ දරත්වායි සිතනු ලබන්නේ ම කුඩ පහළ වූයේය යන අර්ථයයි. **සොණණතාරක විතතිතා** ස්වර්ණ තාරකාවලින් එල්ලෙනු ලබන්නා වූ වැල් වියනකින් **භවනතු** පහළ වෙත්වා! **විචිතතා** නොයෙක් වර්ණැති මල්වියන් මල්ගොමු සියළු අනේකාකාර වියන් **මතථකෙ** හිදිනා ස්ථානයෙහි මුල් කොටසෙහි කර්තවා! යන අර්ථයයි. **මලාදාමෙහි** නොයෙක් සුවඳැති මල්වැල්වලින් යුතු. **චිතතා** විසිතුරු වූ. **ගනධදාමෙහි** සඳුන් කුංකුම අගිල් ආදි සුවඳමල් දාමවලින්. **සොභිතා** පොකුණු යන සම්බන්ධයි. **දුසසදාමෙහි පරිකිණණා** යනු චීන ආදි අනර්ඝ රෙදිවලින් වටකරගත් සත්රුවන් වැල්වලින් අලංකාර වූ විභූෂිත වූ පොකුණු **පුපඵානිකිණණා** සපු සල් සුවඳින් සුවඳවත් වූ රන්වන් මල්වලින් ගැවසීගත් සියුම් විසිතුරු ලෙස හොබනා යළිදු පොකුණ කෙසේ වීද? මනා සුවඳින් සුවඳවත් වූ අලංකාර වූ ඉතා විභූතියෙන් සමන්විත වූ. **ගනධපඤඣං ගුලංකිතා** ඇඟිලි පහකින් ආලේප කළ සුවඳින් යුතු අලංකාර වූ

හෙමචඡදනඡාදිතා රන්වන් වසනයකින් රන්වන් වියනකින් වසා තබන ලද බැවින් ප්‍රාසාදයට සතරදිශාවෙන් පොකුණු පියුම්, උපුල් සියුම් ලෙස සැරසූ පැතු. **සුවණ්ණරුපා** රන්වන්පාට හටගනිත්. **පදුමරෙණුරජුගතා** පියුම් රේණුවලින්ද, දූවිලිවලින්ද ගැවසීගත් පොකුණු වෙත් යන අර්ථයයි. මගේ වෛජයන්ත ප්‍රාසාදයට හාත්පස ප්‍රාසාද පිහිටා ඇති බැවින් රන්වන් රූපයහි රන්වන් පාට විනාශ වෙති. **පදරෙණු රජුගතා** පියුම් රේණුවලින්ද, දූවිලි වලින්ද ගැවසුණු පොකුණු වෙති යන අර්ථයයි. මගේ වෛජයන්ත ප්‍රාසාදයට හාත්පසිනි. පාදපා සපු ආදී ගස් සියල්ලෝ පිපෙත්වා! මේවා මල්රුක්ය. **සයමෙව පුපඵං මුඤ්චිඤා** මල් තමන්ම පිපී නටුවෙන් ගිලිහී ගොකී ප්‍රාසාදයේ මතුපිට විසිරේවා. **ගනතවා භවනමොකිරුං** යනු අර්ථයයි. **තත්ථ** ඒ මහේ වෛජයන්ත ප්‍රාසාදයෙහි. **සිබිනො** මොනරු නටත්වා! **දිබබහංසා** දේවතා හංසයෝ. **පඤ්ජරෙ** ශබ්ද කරත්වා! **කරවිකාව** මිහිරිහඬ නගන කොවුලෝ. **ගායනතු** ගීත වාක්‍ය කරත්වා. පසුව ඇලෙත්වා. **දිජසංඝා** පක්ෂි සේනාව ප්‍රාසාදයට හත්පස මිහිරිහඬ නාදකෙරේවා! යන අර්ථයයි. **පාසාදසස සමනතතො** සියල්ලෝ ආතත විතත විතතාත ආදී බෙර වර්ජනය කරත්වා! ඒ සියල්ලෝ නසත්වා! නොයෙක් තන්ත්‍ර ඇති වීණා නාදකරත්වා! ශබ්ද කරත්වා! සියළු නොයෙක් ආකාර වූ සංගීතයේ ප්‍රාසාදය හාත්පසින් පවතිත්වා! ගායනා කරත්වා! යන අර්ථයයි. **යාවතා** යම්කිසි තැනෙක. බුද්ධබෙතතමහි දසදහසක් සක්වලද ඉන් එතර සක්වළවලද. **ජොති සම්පනනා අචිජිනනා** මහත් වූ හාත්පසින්. **රතනමයා සත්රුවනින්** කරන ලද ඔබ්බවන ලද. **සොණ්ණපලලංකා** ස්වර්ණ පලඟ. **තිටඨනතු** ප්‍රාසාදය හාත්පසින්. **දීපරුකඛා** තෙල්දරන පහන් රුක්. **ජලනතු** පහනෙන් ආලෝක වෙත්වා. සුදිලෙත්වා. **දසසහසසි පරම්පරා** දස දහසක් පරම්පරාවන්ගේ **එකපජ්ජොතා** එක එක පහන මෙන්. **භවනතු** උද්දීපනය වෙත්වා යන අර්ථයයි. නැටුම්-ගැයුම්වල දක්ෂ වූ. **ගණිකා** නටන ස්ත්‍රීහු. **ලාසිකා** මුඛයෙන් ශබ්ද කරන්නෝ, ප්‍රාසාදය හාත්පස නටත්වා. අප්සරාවෝ සමූහය **දිබ්‍ය ස්ත්‍රී** සමූහය නටන්නා වූ. **නානාරංගා** නොයෙක් වර්ණ, නොයෙක් රඟමඩල, ප්‍රාසාදය හාත්පස නටන්නෝ. **පදිසසනතු** ප්‍රකට වෙත්වා එකල මම **තිලෝක** විජයනම් සක්විති රජකු වී සකල චක්‍රවාටයෙහි. **දුමගෙ** ගස අග. **පබබතගෙ** හිමාලය චක්‍රවාට පර්වත අග සිනේරු පර්වතය මුදුනේද සියළු තැන මනාසේ විචිත්‍ර වූ නොයෙක් වර්ණ ඇති **විචිතතං පඤ්චවණ්ණිකං** නිල් කහ ආදි පංචවර්ණ ධජ ඔසවාමියි යන අර්ථයයි. **නරා** ලෝකෝත්තර මිනිස්සුද නාගලෝකයේ සිට **නාගාව** දේවලෝකයේ සිට. **ගන්ධබබාව** සියළු දේවයෝද. **උපෙනතු** පැමිණෙත්වා

ඒ මිනිස්සු ආදීහු. **නමස්සනතා** මට නමස්කාර කරමින්. **පඤ්ජලිකා** කරන ලද අත්පොළසන් ඇත්තේ මගේ වෛජයන්ත ප්‍රාසාදයට පිරිවර වෙත්වා යන අර්ථයයි.

මෙසේ හෙතෙම තිලෝක විජයනම් චක්‍රවර්ති රජව තමන්ගේ ප්‍රාසාදයේ ආනුභාවය වර්ණනාකොට දැන් තමන් විසින් කරන ලද පුණ්‍ය ඵලය සමාදන් වෙන්නේ **යං කිඤ්චිකුසලං කම්මං** යන ආදිය කීවේය. යම්කිසි කුසලකර්ම සංඛ්‍යාත ක්‍රියාවක් කළයුතුව ඇත. ඒ සියල්ල මම මා විසින් **කායෙන වාචාය මනසා ච** යනු තුන්දොරින් කරනලදැයි දක්වයි. **සුකතං** මැනවින් කරන ලදී. තව්තිසා භවනයෙහි ඉපදීමට සුදුසු ලෙස කරන ලදී යන අර්ථයයි. යළිත් සමාදන් වෙමිනි. **යෙ සතතා සඤ්ඤිනො** යන ආදිය කීවේය. එහි යම් සත්ත්වයෙක් මිනිස්සු හෝ දෙවියෝ හෝ බ්‍රහ්මයෝ හෝ සංඥිතලයේ සංඥා රහිතව හෝ ඇත. **යෙච සතතා අසඤ්ඤිනො** සංඥා රහිත සත්ත්වයෝ වෙති. ඒ සියලු සත්ත්වයෝ. **මයිහං** මා විසින් කරන ලද පින් ඵලලාභී වෙත්වා. භවය ලබත්වා. පුණ්‍යවන්තයෝ වෙත්වා යන අර්ථයයි. යළිත් බෝධිසත්ත්වයෝ සමාදන්වෙමින්. **යෙහි කතං** යන ආදිය කීහ. මා විසින් කරන ලද පින යම් මිනිස් නාග යක්ෂ ගන්ධර්ව දේව පිරිස් විසින් මනාසේ දැනගත්තේද? ඔවුන්ට මා විසින් දෙන ලද පුණ්‍ය ඵලය ඒ මා විසින් කරන ලද පිනෙහි දෙන ලද බව ඒ මිනිස්සු ආදීහු නොදනිත්. දෙවියෝ ගොස් එය නිවේදනය කරන්නාහ. දැනුම් දෙන්නාහුය යන අර්ථයයි. සියළු ලෝකයෙහි යම් සත්ත්වයෙක් ආහාර නිසා ජීවත්වෙත්ද? ඒ සියළු සත්ත්වයෝ සියල්ල භෝජන අනුදනිති. **මම චෙතසා** මගේ සිතින්, මගේ පින් ඍද්ධියෙන් ලබත්වා යන අර්ථයයි. **මනසා** පැහැදුණු සිතින් යම් දානයක් මා විසින් දෙන ලදද, ඒ කෙරෙහි නොයෙක් සිත් පැහැදීමෙන් යුක්ත වේ. **ආවහිං** උපදවමි. සියළු බුදුවරුද පසේ බුදුවරු ද බුද්ධ ශ්‍රාවකයෝ ද, මා විසින් සක්විති රජකු විසින් පුදන ලද්දේය. **සුකතෙන තෙන කම්මෙන** අදහා කරන ලද කුශල කර්මයෙන්. **චෙතනා පණිධිහිච** සිතින් කරන ලද ප්‍රාර්ථනාව ඇතිව. **මානුසං දෙහං** මනුෂ්‍ය ශරීරය. **ජහිත්වා** හැරදමා මම තව්තිසා භවනයෙහි අගඤ්ඤං ගියෙමි. නිදා පිබිදියකු මෙන් එහි එහි ඉපදුණේය යන අර්ථයයි. ඉක්බිති තිලෝකවිජය චක්‍රවර්තිරාජ කළුරිය කළේ, එතැන්හි ආවෙමි. **ද්වෙ භවෙ** ජාති දෙකක් දනිමි. **දෙවනෙත** දිව්‍ය ආත්ම භාවයෙහි. **මානුසෙ** මනුෂ්‍ය ආත්මභාවයෙහි ඒ ජාති දෙකෙක පටන්. **අඤ්ඤංගතිං** අනෙක් උතක්. **න ජානාමි** සිහිපත් නොකරමි. **මනසා**

සිතින්. **පත්ථනාඵලං** ප්‍රාර්ථනා කළ ප්‍රාර්ථනා කරන ඵලය යන අර්ථයයි. **දෙවානං අධිකො හොමි** යනු ඉදින් දිව්‍යලෝකවල උපන් ආයු වර්ණ බල තේජසින් දෙවියන්ට අධික වූ ජ්‍යෙෂ්ඨ වූ විය යන අර්ථයයි. ඉදින් මිනිසුන් අතර ඉපදුණේ මිනිසුන්ට අධික වූ මිනිසුන්ට අධිපති වූ ඉසුරු ඇති වෙමි. එසේම රජකු වූයේ මනා රූපයෙන් රූප සම්පත්තියෙන් ලක්ෂණයෙන් ආරෝහ පරිණාහ සම්පත්තියෙන් යුක්ත වූ සම්පූර්ණ වූ උනුපන් ආත්මභාවයෙහි ප්‍රඥාවෙන්ද, පරමාර්ථ ඥාන සම්භාරයෙන් ද ප්‍රඥාවෙන්ද, **අසමො** සමාන රහිත මා හා සමාන කිසිවකු නැත යන අර්ථයයි. මා විසින් කරන ලද පුණ්‍ය සම්භාරයෙන් පින් බලයෙන් උපනුපන් භවයෙහි ශ්‍රේෂ්ඨ වූ ප්‍රශස්ත වූ මිහිරි විවිධ නොයෙක් ආකාර ආහාරපානද අල්ප නැතිව බොහෝ සත්රුවන්ද, නොයෙක් ආකාර වූ පටකෝසෙය්‍ය ආදි වස්ත්‍ර ද **නහසා** අහසින් මං මා සමීපයට. **බ්‍යප්පං** වහාම පැමිණෙති. එළඹෙති. **පුථව්‍යා** පොළොවේද, පර්වතයේ ආකාශයේ ජලයේ වනයෙහි. **යං යං** යම් යම් තැන්වලදී. **හත්ථං පසාරෙමි** දිගුකරමි එවිට එවිට. **දිබ්බා භකබා** දිව්‍ය ආහාර. **මං** මා සමීපයට. **උපෙනති** ලඟට පැමිණෙති. පහළ වෙති යන අර්ථයයි. **තථා** කැමැති පරිදි. **සබ්බරතනා** සියළු සඳුන් ආදී සියළු සුවඳ ද්‍රව්‍ය යාන වාහන සියළු සපු නා දුනුකේ දොඹ ආදී මල් සියළු අලංකාර ආභරණ දිව්‍ය කන්‍යාවෝ සියළු මී උක්සකුරු බජ්ජා සියළු කැවුම් ආදි කෑයුතු දේවල්ද. **මං** මා සමීපයට එළඹෙති පහළවෙති යනුයි.

සමෙබාධිං වරපත්තියා යනු උතුම් චතුරාර්ය මාර්ග ඥාණයට පැමිණීම පිණිස මා විසින් යම් උතුම් දානයක් කරන ලද ද ඒ උතුම් දානයෙන් පුරන ලද ශෛල සංඛ්‍යාත පර්වතයක් මුළුමනින්ම ඒකනාද කරමින්. **බහලං ගිරං** විශාල වූ වචන කියමින් ඇඳිලි බැඳ සෝෂා කරන්නේ. ගර්ජනා කරන්නේ. **සදෙවකං** ලොකං සියළු මනුෂ්‍ය ලෝක හා දේවලෝක. **භාසයනෙතා** සොම්නසට පැමිණීමට කරනු ලබන. **ලොකෙ** සියළු තුන්ලොවෙහි, මැනවින් බෙදා වෙන්කරන ලද්දේ, මම බුද්ධ නම් වෙමි යනු අර්ථයයි. **දිසා දසවිධෙ ලොකෙ** යනු චක්‍රවාට ලොවෙහි. **දසවිධා** දස කොට්ඨාශ දිශාවෙති. එම කොටසෙහි **යායතො** ගමන් කරන්නේ කෙළවරක් නැත යන අර්ථයයි. චක්‍රවර්ති කාලයේ එහි මා විසින් ගිය ගිය තැන දිසා භාග වශයෙනි. **බුද්ධකෙබතතා** බුද්ධ විෂය. **අසංඛ්‍යා** සංඛ්‍යා රහිතය. **සභාපකිතනිකා** යනු එකල චක්‍රවර්ති රාජ්‍ය කාලයේ මගේ ප්‍රභාව චක්‍රරත්න මාණික්‍යරත්න ආදීන්ගේ ප්‍රභාව ආලෝකය යුගල වශයෙන් වී.

රංසිවහනා රැස් මිදෙන්නේ. **පකිත්තිතා** ප්‍රකට විය. **එත්තන්තරෙ** දස දහසක් සක්වල අතර. **රංසිජාලා** රැස් සමූහය. **ආලොකො විපුලො** බොහෝ තර විය. **භවෙ** විය යන අර්ථයයි. **එත්තකෙ** ලොකධාතුම්හි යනු දසදහසක් සක්වලෙහි සියළු ජනතාව මා බලත් දකිත් යන අර්ථයයි. **සියළු** දෙවියෝ යාව බ්‍රහ්ම **නිවෙසනා** බ්‍රහ්මලෝක දක්වා මා අනුව පවතින්නේ අනුකූල වෙත්වා! **විසිට්ඨමධුනාදෙනා** යනු විශිෂ්ට වූ මිහිරි නාදයෙන්. **අමතභෙරිමාහනං** යනු අමාබෙර දේව බෙරවලට පහර දුනිමි. එපමණ එක් දස දහසක් සක්වල අභ්‍යන්තරයේ සියළු ජනතාව මට **මධුරං ගිරං** ශබ්ද අසමින් මෙනෙහි කරත්වා! **ධම්ම මෙසෙන වස්සනෙන** ධර්ම දේශනාමය නාදයෙන් පරමාර්ථ ගම්භීර මිහිර සියුම් අර්ථ වශයෙන් වර්ෂා කාලය පවත්නා කල්හි සම්මා සම්බුද්ධ ආනුභාවයෙන් සියළු භික්ෂු භික්ෂුණී ආදීහු. **අනාසවා** කෙලෙස් රහිත වෙත්වා! **යෙපි පච්ඡිමකා සන්තා** යනු මෙහි මේ සිවුපිරිස් කෙළවර රැස්වූ කල්හි යම් සත්ත්වයෙක් පශ්චිම ගුණ වශයෙන්ද, යට කෙළවර සිටියේ මුත් ඒ සියල්ලෝ සෝවාන් ඵලයට පත්වෙත්වා! යන අදහසයි. එකල තිලෝක විය. චක්‍රවර්ති රාජ්‍ය කාලයේ දිය යුතු දාන මානාදිය පිරිනමා. **අසෙසනො** නිරවශේෂ වශයෙන්. **සීලං** සීල පාරමිතාව පුරා. **නෙක්ඛම්මෙ** නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව කෙළවරට පැමිණ උතුම් සම්බෝධිය වූ සතරමග ඤාණයට පැමිණියේ වෙමි. වන්නේ. **පණ්ඩිත** ප්‍රඥාවන්ත නුවන ඇති. **පරිපුච්ඡිත්වා** ස්වාමීනි, කුමක් කළ යුතුද? කුමක් නොකළ යුතුද? කුසලය කුමක්ද? අකුසලය කුමක්ද? කුමක් කොට ස්වර්ග මෝක්ෂ දෙකට කොටස්කරුවකු වෙයිද? යනු විචාරා මෙසේ ප්‍රඥා පාරමිතාව පුරා යන අර්ථයයි. **කත්වා විරියමුත්තමං** උතුම් ස්ථානයක හිඳින අතර නොකඩවා වීර්යකොට වීර්ය පාරමිතා පුරා යනු අර්ථයයි. සියළු විරුද්ධ ජනයන් විසින් කරන ලද අනාදර ඉවසීමෙන් යුතු ක්ෂාන්ති පාරමිතාව කෙළවරට ගොස් ක්ෂාන්ති පාරමිතාව පුරා උතුම් සම්බෝධියටද, උතුම් සම්බුද්ධත්වයටද පැමිණ වන්නේය. **කත්වා දළහමයිට්ඨානං** යනු මගේ ශරීර ජීවිත විනාශ වන්නේ නමුත් පින්කම් විනාශ නොවන්නෙමි යනු නොසෙල්වීම් වශයෙන් දැඩි අධිෂ්ඨාන පාරමිතාව කොට හිස සිඳින නමුත්, බොරු නොකියන්නෙමි යනුවෙන් සත්‍ය පාරමිතාවේ කෙළවරට. **ඡුරිය** - පුරා. **සබ්බෙ සන්තා සුඛී අවෙරා** යන ආදියෙන් මෛත්‍රී පාරමිතාවේ කෙළවරට පැමිණ උතුම් උත්තම සම්බෝධියට පැමිණියේ යන අර්ථයයි. සජීවක අජීවක වස්තූන්ටද ලාභය මෙන්ම අලාභයේ දී ද කායික මානසික සුවයෙහි ද, එසේම දුකේදී ද ආදර අනාදර ජනතාව විසින් කරන ලද සම්මාන අවමාන දෙකේදී ද

වශයෙනි. **සබ්බත්ථ සමකො** සමාන මනසින් උපේක්ෂා පාරමිතාව පුරා උතුම් සම්මා සම්බෝධියට **පතතො** පැමිණියේ යන අර්ථයයි. **කොසජ්ජං කුසීතකම. භයතො** භය වශයෙන් අපායෙහි දුක්විඳින්නා. **දිස්වා** දැන. **අකොසජ්ජං** කුසීත නැති බව නොඇලුණු බව වීර්යයි. **ඛෙමතො** ක්ෂේම වශයෙන් නිර්වාණ මාර්ගය දැක දැන. **විවාදං** කලහ. **භයතො දිස්වා** අපායභාගි වූවෝ දැක දැන **අවිවාදං** කලහයෙන් වෙන්වී නිර්වාණයට පැමිණියේය. **ඛෙමතො** දැක දැන **සමගඟා** එකඟ සිතින් **සබ්බා** සිලිටු මෛත්‍රී ධ්‍රයෙන් හොබනා වූවහු යන අර්ථයයි. **එසා කථා** වර්ණනාවෝ **උදීරණා** බුදුධානං අනුසාසනං අවවාද දීම. **පමාදං** ස්ථානවල හිඳින අතර සිහිය දුරලීමෙන් වාසය කිරීමය. **භයතො** නිවුණු නිවුණු තැන්වල දුක්ඛිත විරූපී අප්‍රසන්න ප්‍රාණීන් වාසය කරන්නා වූ අපාය දුක්ඛයට පැමිණි බව දැන. **අප්පමාදං** සියළු ක්‍රියාවල සති විහරණයෙන් ක්ෂාන්තිය වැඩීමෙන් නිර්වාණයට පැමිණෙන්නී දැක ප්‍රත්‍යක්ෂව දැන. **අට්ඨංගිකං මගගං** අංග අටකින් යුතු මාර්ගය. නිවැරදි දෘෂ්ටිය. නිවැරදි සංකල්පනා, නිවැරදි වචන, නිවැරදි කර්මාන්ත, නිවැරදි ආජීවය, නිවැරදි වෑයම, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය. අවයව අට සම්මා සම්බෝධි අධිගමයට උපාය වූ මාර්ගයයි. **භාවෙථ වඩව්!** මෙනෙහි කරවු! මේ බුදුවරුන්ගේ අනුශාසනාවයි. මේ කථා වර්ණනා කිරීම මැනවින් දෙසීම බුදුවරුන්ගේ අනුශාසනාවයි යන අර්ථයයි. **සමාගතා** බහුබුද්ධා යනු නොයෙක් සියදහස් ගණන්, සංඛ්‍යාත පසේබුදුවරු සමන්විතව **රැස්වූවෝ සබ්බසො** සර්ව ප්‍රකාරයෙන් අරහත් වූ ක්ෂීණාශ්‍රව වූ නොයෙක් සියදහස් ගණනක්. **සමාගතා රැස්වූවා.** එහෙයින් ඒ බුදුවරුද රහතන් වහන්සේද, වන්දනාමාන කරන්නේ වැඳීමට සුදුසු වන්නේ. **නමස්සථ** අංග අටකින් අංග පහකින් නමස්කාර කරමින් නමස්කාර කරවු. වඳිවු. එවං මේ මා විසින් කියන ලද අයුරින්. **අච්චන්තියා** සිතීමට නොහැකි වන්නේය. බුද්ධා බුදුවරු. **ධම්මා** බුදුවරුන් විසින් දේශිත සතර සතිපට්ඨාන ආර්ය අෂ්ටාංගික මාර්ගය, පංචස්කන්ධය, හේතු-ඵල දහම ආරම්මණ ආදී ප්‍රත්‍ය ධර්මයෝ. ධර්මය බුදුවරුන්ගේ **ස්වභාවය. අච්චන්තියා** සිතීමට නොහැකි වන්නේය. **අච්චන්තියෙසු** සිතීමට නොහැකි වූ විෂම වූ ඉක්මවා යන කල්හි පැහැදුණා වූ දේව මනුෂ්‍යයන්ගේ. **විපාකො** දිව්‍ය මනුෂ්‍ය සම්පත් නිර්වාණ සම්පත් සංඛ්‍යාත සිතීමට නොහැකි වන්නා වූ සංඛ්‍යා ඉක්මවා යන්නා වූ වෙයි.

මෙසේ, මෙපමණ වූද යම්සේ නිවන් මාර්ගයට මාර්ගය ප්‍රකාශ කරවු යයි වම් අතින් මුදා දකුණත ගනිවු යයි **කී** කල්හි ඒ මාර්ගයෙන්

ගොස් ග්‍රාම නිගම රාජධානිවල කළයුතු කෘත්‍යය නිමවා, නැවත මිදුණේ වෙනත් වම් මාර්ගයකින් ගියේද, ගම් නියම්ගම්වල කළයුතු කෘත්‍යය නිමකරති. එපරිදි බුද්ධ අපදාන, කුසලදාන වශයෙන් නිමවා එයම අකුශලපදාන වශයෙන් විස්තර කිරීමට මේ ප්‍රශ්නය :-

"දුෂ්කර වූද, අසත්‍ය දොස් දැකීමද යළි යළිත්
අසත්‍යයෙන් දෝෂාරෝපණය කිරීමද ගල්වල
ඇනීමද, කැට කැබලිවලින් වන වේදනාවද,

නාලාගිරිද, සැතින් කැපීමද, ශීර්ෂාබාධද, යවකෑමද
පිටෙහි අමාරුවද, අතිසාරයද, මේ අකුසල කාරණා වේ."

එහි පළමු ප්‍රශ්නය :- **දුෂ්කරං** යනු වර්ෂ හයක් දුෂ්කර ක්‍රියා කරන ලද්දේ අතීතයේ කාශ්‍යප සම්මා සම්බුදුරදුන්ගේ කාලයේ බෝධිසත්ත්ව තෙම ජෝතිපාල නම් බ්‍රාහ්මණ මානවකයා වී උපන්නේ, බ්‍රාහ්මණ ජාති වශයෙන් ශාසනයෙහි අප්‍රසන්න වන්නේ ඒ භාග්‍යවතුන් වහන්සේට කඩමාළු රෙද්දක් තුළින් උපන් බැවින් කාශ්‍යප භාග්‍යවතුන් යයි අසා, කරන ලද මුණ්ඩක ශ්‍රමණයාගේ බෝධිය ඉතාම දුර්ලභ යයි කීවේය. ඔහු ඒ කර්මය නිසාවෙන් නොයෙක් ජාති සිය ගණනක දුක් අනුභව කොට ඒ බුදුරදුන් කෙරෙන්ම ලද වියරණ ඇත්තේ. අනතුරුව, ඒ කර්මයෙන්ම ඉපදීම සංසාරය ගෙවා දමා අවසානයේ වෙස්සන්තර ආත්මභාවයට පැමිණ අනතුරුව චුත වී තුසිත භවනයේ උපන්නේ දේවතාවන්ගේ ආයාචනයෙන් එතැනින් චුතවී ශාක්‍ය කුලයේ උපන්නේ, නුවණ මුහුකුරා ගිය බැවින් සියලු දඹදිව රාජ්‍ය හැරදමා අනෝමා ගංතෙර සිනිදු තලාවේ හුන්නේ, සමලෙස කෙස් කලාපය සිඳදමා බ්‍රහ්මයා විසින් ගෙන එන ලද, ඍද්ධිමය වූ කල්පය කෙළවර වන කාලයේ පියුම් ගැබෙහි උපන් අෂ්ට පරිෂ්කාර පිළිගෙන පැවිදි වී බෝධි ඤාණදර්ශනයට ඒතාක් මුහුකුරා නොගිය බැවින් බුද්ධභාවයට වූ මාර්ග අමාර්ග නොදැන සය වර්ෂයක් උරුවෙලා ජනපදයේ එකම ආහාරයෙන් එකම ඵලයෙන් එකම සහල් ඇටයෙන් ඒකාසන භෝජන වශයෙන් ඇට මස් සම් නහර ඉතිරිවන සේ මස් රහිත රුධිරය රහිත ප්‍රේතයකු සදිසි රූපය ඇත්තකු වී මහාපදාන සූත්‍රයෙහි හෙතම මේ දුෂ්කරක්‍රියාව සම්බෝධියට මාර්ගය නොවේයයි සිතා ගම්නියම් රාජධානිවලදී ප්‍රණීත ආහාරපාන වළඳා පිනන ලද

ඉඳුරන් ඇත්තේ පිරිපුන් දෙතිස්මහා පුරුෂ ලක්ෂණවලින් යුතුව ඒ බෝමැඩ වෙත එලඹ පස්මරුන් දිනා බුදුබවට පත්වූයේ,

"එකල මම කස්සප සුගත සමයේ ජෝතිපාලව ඇවිද්දේ
බෝධිය මුඩු නිසාවෙන් කී නිසා අවබෝධ ඤාණය පරම
දුර්ලභ විය.

ඒ කර්ම විපාක නිසාවෙන් බොහෝ දුෂ්කරතා ලැබ
හැසිරුණෙමි. අනතුරුව බෝධිය පතා සයවසක්
උරුවේලාවට පැමිණියෙමි.

ඒ මම ඒ මාර්ගයෙන් උතුම් වූ බෝධියට පැමිණියෙමි.
පෙර කර්ම විසින් කරන ලද දුර්මාර්ගය නොසොයන්නෙමි.

සියළු ලෙස සිත් පිරිසිදු කර පින පව දැනගැනීමෙන්
ශෝක රහිත, උපායාස නැති ආශ්‍රව රහිත නිවනට පැමිණෙන්නෙමි."

දෙවෙනි ප්‍රශ්නයෙහි - අබ්භක්ඛානං යනු අභි අක්ඛානං බොරුවෙන් දෝෂාරෝපණය කිරීම. අපහාස කිරීමයි. අතීතයේ බෝසත් තෙම ශුද්‍ර කුලයෙහි ඉපිද අප්‍රකට අප්‍රසිද්ධ මුනාලි නම් ධූර්තයෙක් වී වාසය කරයි. එකල මහත් ඍද්ධි ඇති මහානුභාව සුරහි නම් පසේ බුදුරදුන් කිසියම් කාරණයකට ඔහුගේ සමීපයට පැමිණි සේක. හෙතම උන්වහන්සේ දැක දුස්සීල පාපධර්මයකි. මේ ශ්‍රමණයා ආදි වශයෙන් දොෂාරෝපණය කළෙමි. හෙතම ඒ අකුසලය නිසාවෙන් නොයෙක් වර්ණ සිය දහස් ගණනක් දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේ යම්කලෙක තීර්ථකයෝ පළමුව බුදුරදුන් තුසිත භවනයේ වාසය කරන සමයේ ප්‍රකට වී සියළු ජනයා රවටා දෙසැටක් මිථ්‍යා දෘෂ්ටිවලින් බබලවා හැසිරුණහ. එකල තුසිත පුරයෙන් නික්ම ශාක්‍යරාජ කුලයේ ඉපිද ක්‍රමයෙන් බුදුබවට පත්විය. තීර්ථකයෝ හිරු උදාවනවිට කළාමැදිරියන් මෙන් පහවූ ලාභ සත්කාර ඇත්තේ, බුදුරදුන් කෙරෙහි වෛර බැඳ හැසිරෙත්. එසමයෙහි රජගහනුවර සිටුතුමා ගංගාවේ ජලය බැඳ සෙල්ලම් කරන්නේ රත්සඳුන් කලයක් දැක අපගේ ගෙදර සඳුන් බොහෝ ඇත. මෙම දියසුළියකට නංවා දියසුළියක ආකාරයෙන් පාත්‍රයක ලියා තබා උණපඳුරේ ලග්ගවා යමෙක් මේ පාත්‍රය ඍද්ධියෙන් අවුත් ගනිත්ද? ඔවුන්ට බත

පිරිනමන්නෙමියි බෙරහඬ නංවාලීය. එදා තීර්ථකයෝ දැන් නටුයේ වෙමු. දැන් නටුයේ වෙමුයි සාකච්ඡා කළහ. නිගන්ඨනාථපුත්ත සිය පිරිසට මෙසේ කීවේය. මම උණගස් සමීපයට ගොස් අහසේ එල්ලෙන බවක් හඟවමි. නුඹලා බාල ලීයකින් උපන් පාත්‍රයක් නිසා ඍද්ධිය නොකරවු යයි මාව කදින් අල්ලාගෙන වලක්වවු යයි ඔවුහු එහි ගොස් එසේ කළහ. එකල පිණ්ඩෝල භාරද්වාජ මොග්ගල්ලාන ද තුන්ගව්වක් පමණ ගල්තලාවක සිට, පිණ්ඩපාතයට ගමන් කරන්නේ සිවුරු පොරවමින් ඒ කෝලාහලය ඇසූහ. ඒ අතර මොග්ගල්ලාන තෙරුන් පිණ්ඩෝල භාරද්වාජට නුඹ අහසින් ගොස් ඒ පාත්‍රය ගන්නැයි කීවේය. හෙතම, ස්වාමීනි, ඔබවම බුදුරදුන් ඍද්ධිමතුන් අතර අග්‍ර තනතුරේ තබන ලද්දේ, නුඹවහන්සේම ගන්නැයි කීවාහුය. එසේවුවත් මා විසින් අණකරන බැවින් ඔබම ගන්නැයි අණ ලද බැවින් තමන් සිටි තුන්ගව්වක් පමණ ගල් පර්වතයට පා තලයෙන් ලැග සැළියකින් වසන ලද මෙන් මුළු රජගහ නුවරම වසාලීය. එකල නගරවැසියෝ පළිඟු පර්වතයේ ආවරණය වූ රතුනූලක් මෙන් ඒ තෙරුන් දැක ස්වාමීනි, භාරද්වාජ අපව රකිවු! යනුවෙන් උද්ඝෝෂණය කළහ. බියට පත්වූවෝ නිදාගැනීම් ආදියද කළහ. එකල ඒ තෙරුන් ඒ පර්වතය පිහිටි ස්ථානය විසුරුවා හැර ඍද්ධියෙන් ගොස් ඒ පාත්‍රය ගත්තේය. එකල නුවරවැසියෝ මහා කෝලාහල කළහ. බුදුරදුන් වේළුවනාරාමයේ වසන්නේ ඒ ශබ්දය අසා මේ ශබ්දය කුමක්දැයි ආනන්ද තෙරුන්ගෙන් විචාළ සේක. ස්වාමීනි, භාරද්වාජ විසින් පාත්‍රය ගත් බැවින් සතුටුවූ නගරවාසීහු උස්හඬ කළහයි කීවේය. බුදුරදුන් එකල මතු සිදුවිය හැකි අනුන්ගේ උපවාද මිදීම පිණිස ඒ පාත්‍රය ගෙන්වාගෙන බිඳවා අඳුන් ආලේපකොට භික්ෂූන්ට දුන් සේක. දී වනාහි "මහණෙනි, ඍද්ධි ප්‍රාතිහාර්ය නොකළ යුතුය. කරන්නේ නම් දූකුළා පැවැත්වේ යයි ශික්ෂාපදයක් පැනවීය. ඉක්බිති තීර්ථකයෝ ශ්‍රමණභවත් ගෞතමයන් විසින් ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවන ලද්දේ ඒවා ජීවිතය නිසාවත් ඉක්මවා නොයති. අපි ඍද්ධි ප්‍රාතිහාර්ය කරන්නෙමුයි ඒ ඒ තැන රැස්වී කෝලාහල කළහ. ඉක්බිති බිම්බිසාර රජු ඒ අසා බුදුරදුන් සමීපයට ගොස් වැඳ එකත්පසක හුන්නේ බුදුරදුන්ට මෙසේ කීවේය. ස්වාමීනි, තීර්ථකයෝ ඍද්ධි ප්‍රාතිහාර්ය කරන්නෙමු යයි උද්ඝෝෂණය කරති. මහරජ, මම ද කරන්නෙමි. ස්වාමීනි, නොයන්න. ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්ද? එසේම මහරජ ඔබගෙන් විචාරන්නෙමි. ඔබගේ උයනේ අඹගෙඩි ආදිය කන්නවුන්ට මෙපමණ දඬුවම් යයි දඬුවම් කරන්නේ එයද එකක්කොට තැබුවේය. ස්වාමීනි මටද දඬුවමක් නැත. මෙසේ මහරජ මට ශික්ෂාපද පැනවීමක් නැත.

ස්වාමීනි කෙසේ ප්‍රාතිහාර්ය කරන්නේද? මහරජ සැවැත්නුවර සමීපයේ අඹ ගස මූලය. යහපති ස්වාමීනි, එය බලන්නෙමුයි ඉක්බිති තීර්ථකයෝ අඹගස මුල ප්‍රාතිහාර්ය පවත්වන්නේ යයි අසා නගරය හාත්පස අඹගස් කපාලූහ. නගරවැසියෝ මහා අංගනයෙහි ඇඳන් ඉක්මවා යන අට්ටාල බැන්දවූහ. සියලු දඹදිව වැසියෝ රැස්වී පෙරදිග දිශාවේ දොළොස් යොදුනක් පැතිරී සිටියහ. සෙසු දිශාවලද ඒ ආකාරයෙන්ම රැස්වූහ. බුදුරදුන්ද, කාලය පැමිණි කල්හි ඇසළ පෝදා උදෑසන කළයුතු කිස නිමවා ඒ ස්ථානයට ගොස් වැඩසිටි සේක. එකෙණෙහි ගණ්ඩබ්බ නම් උයන්පල්ලා කුඹියහින්න ගසක ඉදුණු අඹගෙඩියක් දැක ඉදින් මම මෙය රජුට දෙන්නේ නම් කහවනු අධිලාභයක් ලබන්නෙමි. බුදුරදුන්ට දුන්කල්හි මෙලොව පරලොව යහපත වන්නේ යයි බුදුරදුන්ට පිළිගැන්වීය. බුදුරදුන් එය පිළිගෙන ආනන්ද තෙරුන්ට අණකළ සේක. මේ ගෙඩිය ගෙන මිරිකා පානයක් දෙන්න. තෙරුන් එසේ කළහ. බුදුරදුන් අඹරස පානයකොට අඹඇටය උයන්පල්ලාට දී මෙය රෝපණය කරන්නැයි වදාළහ. ඔහු වැලි ඉවත්කොට එය රෝපණය කළේය. ආනන්ද තෙරුන් කෙණ්ඩියෙන් ජලය දැම්මේය. එකෙණෙහි අඹ අංකුරයක් පැන නැගී ජනතාව බලා සිටිද්දීම අතු වෙළෙප් සම්පන්නව, ගෙඩි බරින් යුතුව ප්‍රකට විය. වැටුණු අඹගෙඩි කන්නා වූ සියළු දඹදිව වැසියෝ නිමකිරීමට නොහැකි වූහ. ඉක්බිති බුදුරදුන් පෙරදිග සක්වලේ සිට පශ්චිම චක්‍රවාටය දක්වා මේ සක්වලෙහි මහාමේරුව මුදුනේ රුවන් සක්මනක් මවා අනේක පිරිසක් සමග සිංහනාදය කරන්නේ ධම්මපදට්ඨ කථාවේ කියන ලද අයුරින් මහා ඍද්ධි ප්‍රාතිහාර්යක් පා තීර්ථකයන් දමනය කොට ඔවුන්ගේ විකාර හෙළා ප්‍රාතිහාර්ය අවසානයේ පෙර බුදුවරුන් පුරුදු කළ විලසින් තව්තිසා භවනයට ගොස් එහි වස් වසන ලද්දේ, නිරතුරුව තුන්මාසයක් අභිධර්මය දේශනාකොට මව ප්‍රමුඛ නොයෙක් දේවතාවන්ට සෝවාන් මාර්ග අධිගමය කොට වැසූ වස් ඇත්තේ දේවාරෝහණය කොට නොයෙක් දිව්‍ය බ්‍රහ්ම සේනාව පිරිවරා සංකස්ස පුර ද්වාරයට බැස ලොවට අනුග්‍රහ කළේය. එකල බුදුරදුන් ලාභ සත්කාරවලින් ජම්බුද්වීපය උතුරා ගලායන පංචමහා ගංගා මෙන් විය. ඉක්බිති තීර්ථකයෝ පිරිහුණු ලාභසත්කාර ඇත්තේ දුකට දොම්නසට පත්වූයේ බිම බලාගෙන හුන්හ. එකල ඔවුන්ගෙන් චිඤ්චමාණවිකා නම් උපාසිකාව අතිශය රූපයෙන් අගතැන්පත්ව එසේ හුන්නා බව දැක ස්වාමීනි කිම, මෙසේ දුක් දොම්නසින් හුන්නේදැයි විචාලේය. කිම ඔබට නැගනිය අපහසුවක්ද? කිම ස්වාමීනි, ශ්‍රමණ ගෞතමයන් පහළවූ කාලයේ පටන් අපි නැසුණු ලාභ සත්කාර ඇත්තේ

නගරවාසීහු අපට කිසිවක් නොදෙත්. මා විසින් මෙහි කුමක් කළ යුතුද? ඔබ විසින් ශ්‍රමණ භවත් ගෞතමයන්ට අවඥාවක් උපදවාලීමට වටී යනුවෙනි. එය මට බාර යයි පවසා එහිදී උත්සාහ කරත්. නුසුදුසු වේලාවේ ජේතවන විහාරයට ගොස් තීර්ථකයන්ගේ ආරාමයේ වාසයකොට උදෑසනම තුවරවැසියන් සුවඳ දෑ ආදිය රැගෙන බුදුරදුන් වැඳීම පිණිස යන වේලාවේ ජේතවනයෙන් පිටත් වන්නාක් මෙන් කොහේ නිදාගත්තේ දැයි විචාරණ ලදුව, නුඹලාට කිම, මම කොතැන නිදාගත්තද, යනුවෙන් පවසා පිටත්ව ගියාය. ඇය ක්‍රමයෙන් කාලය ගතවන කල්හි විචාරණ ලදුව මම ශ්‍රමණ භවත් ගෞතමයන් සමග එක ගන්ධකුටියේ නිදාගෙන නික්මෙන්නේ යයි කීවාය. එය බාල පෘථග්ජනයෝ විශ්වාස කළහ. සෝවාන් ඵලලාභී උගත්තු එය විශ්වාස නොකළහ. එක්දිනක් ඇය දරමිටියක් බඩේ බැඳගෙන මත්තෙහි රතු වස්ත්‍රයක් පොරවාගෙන ගොස් රජු සමග බණ අසන පිරිස ඉදිරියට ගොස් බුදුරදුන්ට මෙසේ කීවාය. මහා ශ්‍රමණය, ඔබ ධර්මදේශනා කරන්නේය. ඔබ නිසා උපන් දරුගැබ දරන මට ලුණුමිරිසක්වත් දීමට නොවිචාරහි. ඒ බව නැගණිය ඔබම දැනගනුව. මම නම් මෙසේ මෙථුන සංසර්ගය කල කාලයක් දෙදෙනෙක්ම දනිත් අනිත් අය නොදනියි කීවේය. එකෙණෙහි ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවන බව පෙන්වීය. ශක්‍රයා ආවර්ජනා කරන්නේ ඒ කරුණ දැන දේවපුත්‍රයන් දෙදෙනෙකුට අණ කළේය. නුඹලා අතරින් එකකු මීයකුගේ විලාශයක් මවා ඒ දරමිටියේ බැම්ම කැපීමටද, එකකු වාත සමූහයක් මවා පොරවන ලද වස්ත්‍රය උඩට එසවාවා යනුවෙනි. ඔවුහු ගොස් එසේ කළහ. දරමිටිය බිම වැටෙනවිට ඇගේ පාද පිටිතලය බිඳුණේය. දම්සභාවේ රැස්වුණා වූ පෘථග්ජනයෝ සියල්ල, බොල දුෂ්ට තැනැත්තිය, තෝ මෙබඳු ආකාර ලෝකනාථ ස්වාමියාණන්ට මෙබඳු ආකාර ලැජ්ජාවක් කළේයි නැගී සිට එක එක මිටි පහර බැගින් දී සභාවෙන් බැහැර කළහ. දර්ශනය ඉක්මවන කල්හි පොළොව විවර විය. එකෙණෙහි අවීචි නරකයෙන් ගිනිජාලාවක් නැගී සිට කුලයෙන් දුන් රතු පොරෝනාවත් සමග එය අන්දවා අවීචියට වැටුණේය. බුදුරදුන්ට ලාභසත්කාර අතිරේකතර විය. ඒ නිසා කියන ලදි.

"සියළු කෙලෙස් නැසූ බුදුවරුන්ට ශ්‍රාවකයා
නොඉක්මවා යන්නේය. ඒ අපහාසය නිසා
මා විසින් නිරයේ චිරාත් කලක් හැසිරුණෙමි.

වර්ෂ දස දහසක් අපායේ හැසිරුණෙමි.
මම මිනිස් ආත්මභාවයක් ලැබද බොහෝ අපහාසවලට
මහුණ දුනිමි.

ඒ කර්මවිපාක අවසන්වීම් වශයෙන් මට
චිංචිමානවිකාව ජනකාය මැද අභූත චෝදනාවකින්
අපහාස කළේ."

තුන්වෙනි ප්‍රශ්නයෙහි අබභක්ඛානං යනු අභිඅක්ඛානං අක්‍රෝෂණය අපහාසය. අතීතයේ බෝසත්හු අප්‍රකට ජාතියක උපන්නේ මුනාලි නම් ධූර්තයා වී දුර්ජන සංසර්ග බලයෙන් සුරහිනම් පසේ බුදුරදුන්ට මේ පාපකාරී දුශ්ශීල භික්ෂුවකැයි අපහාස කළේය. ඔහු ඒ අකුශල කර්මයෙන් අකුශල වචී කර්මයෙන් බොහෝ වර්ෂ දහස් ගණනක් නිරයේ පැසී මේ විසූ ආත්මභාවයේ දසපාරමිතා පිරූ බලයෙන් බුදුබව ලැබුවේ ලාභයෙන් කීර්තියෙන් අගතැන්පත් විය. නැවත තීර්ථකයෝ කෙසේනම් ශ්‍රමණ භවත් ගෞතමයන්ට අපකීර්තියක් උපදවන්නෙමුයි උත්සාහ කළෝය. දුකින් දොම්නසින් කල්ගත කළහ. එකල සුන්දරී නම් එක් පරිව්‍රාජිකාවක් ඔවුන් වෙත එළඹ වැඳ සිටියේ ඔවුන් නිශ්ශබ්දව සිටිකල්හි කිසිවක් නොකියන්නේ කිම මගේ දෝෂයක්දැයි විචාළාය. ශ්‍රමණභවත් ගෞතමයා අපව වෙහෙසට පත්කරවන කල්හි ඔබ අපහසුවක්දැයි විමසන්නේය. මෙය ඔබගේ දෝෂයක් යයි මෙසේ කීවේය. එහිදී කුමක් කරන්නෙම්ද? ඔබ ශ්‍රමණ ගෞතමයන්ට අපකීර්තියක් ඉපදවීමට හැකිවන්නෙහිද? ආර්යයනි, හැකිවන්නෙමි යයි පවසා එතැන් පටන් කියන ලද අයුරින් දකින දකින අයට ශ්‍රමණ භවත් ගෞතමයන් සමග එක ගඳකිළියේ වාසයකොට නික්ම ආවේ යයි කියා ආක්‍රෝෂ කරයි. පරිභව කරයි. තීර්ථකයෝද බලවූ! ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ වැඩයයි අක්‍රෝෂ කරත්. පරිභව කරත්. මෙය මෙසේද කියන ලදි.

"පෙර මම මුනාලි නම් ධූර්තයෙකු වූයෙමි
පෙර වෙනත් ජාතියක සිට පසේ බුදුවරයෙකුට
අභූත චෝදනාවලින් අවමන් කළෙමි

ඒ කර්ම විපාකයේ බලයෙන් මම නිරයෙහි සැරිසැරියෙමි
බොහෝ වර්ෂ දහස් ගණනක් දුක්වේදනා වින්දෙමි.

ඒ කර්ම විපාක අවසානයේ මේ පශ්චිමභාවයේ
මා විසින් සුන්දරි විසින් කරන ලද අපහාස වින්දෙමි."

සතරවෙනි ප්‍රශ්නයෙහි **අබභකඛානං අභිවිසෙසෙන අක්‍රෝෂ** පරිභව කිරීම අතීතයේ බෝසත් බමුණු කුලේ උපන්නේ බහුශ්‍රැත වූයේ බොහෝදෙනා විසින් සත්කාර කළේ පුදන ලද්දේ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවී හිමාලයේ වනමුල්ගෙඩි ආහාරකොට බොහෝ මානවකයන්ට මන්ත්‍ර උගන්වමින් කල්ගත කළේය. එක් පංචඅභිඥා අෂ්ට සමාත්තිලාභී තාපසයාටද ඔහුගේ සමීපයට ගියේය. ඔහු හේ දැකම ඊර්ෂ්‍යාව ඉස්මතු වී, ඒ ඔබ ඒ පිරිසිදු තාපසයාට මේ ඍෂිවරයා කාමභෝගි කුහකයකැයි කියමින් අපහාස කළේය. තමන්ගේ ශිෂ්‍යයන්ටද කීවේය. මේ ඍෂිවරයා මෙබඳු ආකාර අනාචාරයකැයි ඔවුනුද ඔහුට අක්‍රෝෂ කළහ. ඔහු ඒ අකුසල කර්මවිපාක බලයෙන් නොයෙක් වර්ෂ දහස් ගණනක් අපායේ දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේ බුදුවී ලාභයෙන් කීර්තියෙන් අග පැමිණ අහසේ පූර්ණ චන්ද්‍රයා මෙන් ප්‍රකට විය. ඒ තීර්ථකයා අපහාස කරනුයේ අසන්තෝෂව යළිත් ඒ සුන්දරි ලවා බොරුවෙන් අපහාසකොට සුරා ධූර්තයන් කැඳවා අල්ලස් දී නුඹලා සුන්දරි මරා ජේතවනාරාමය සමීපයෙහි කසලවලෙහි දමවු යයි අණ කළහ. ඔවුහු එසේ කළහ. ඉක්බිති තීර්ථකයෝ, සුන්දරි පේන්නට නැතැයි කියමින් රජුට දැන්වූහ. රජු සොයවු යයි කීවේය. ඔවුන් තමන් වැටී තිබූ තැනින් ගෙන ඇඳක තබා රජුට පෙන්වා බලවු ශ්‍රමණ හවත් ගෞතම ශ්‍රාවකයන්ගේ වැඩ යයි පවසමින් බුදුරදුන්ටද, භික්ෂු සංඝයාටද මුළු නගරයේ අපකීර්තිය පතුරුවමින් හැසිරුණහ. සුන්දරිය අමු සොහොනේ අට්ටාලයක තැබූහ. රජු සුන්දරිය මැරූ වුන් සොයවුයයි පුරුෂයන්ට අණ කළේය. එකල ධූර්තකයෝ සුරා පානයකොට තෝ සුන්දරිය මැරුවෙහි, තෝ මැරුවෙහි කියමින් කෝලාහල කළහ. රාජපුරුෂයෝ ඒ ධූර්තකයන් අල්ලාගෙන රජුට ඉදිරිපත් කළහ. රජු බොලවු තොපි කුමක් නිසා සුන්දරි මරණ ලද්දී ද? දේවයන් වහන්ස එසේය. කවුරු විසින් අණකරන ලද්දේ ද? දේවයන් වහන්ස තීර්ථකයෝය. රජතුමනි, තීර්ථකයන් ගෙන්වාගෙන බඳවා, බොල යවු! බුදුරදුන්ට අපහාස කිරීම පිණිස අප විසින්ම සුන්දරිය මරණ ලද්දීය. බුදුරදුන්ද උන්වහන්සේගේ ශ්‍රාවකයන්ද කළ ආකාරයෙන් උද්ඝෝෂණය කරවු යයි කීවේය. ඔවුහු එසේ කළහ. සියළු ගම්වැසියෝ නිසැක වූහ. රජ තීර්ථකයන් ද, ධූර්තයන් ද මරවා වල දැමීය. ඉක්බිති භගවත්හට බොහෝ ලාභ සත්කාර වැඩෙයි. එබැවින් කියන ලදි.

"මම සකසා පුදන ලද ශ්‍රැතවත් බ්‍රාහ්මණයෙකු වූයෙම්
මහා වනයේ පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර ප්‍රගුණ කළෙමි.

එහි පැමිණි පංචාභිඥාලාභී මහත් සෘද්ධි ඇති
සෘෂිවරයෙකුට ඒ පැමිණියේ දැක මම බොරුවෙන්
ඉරිසියාවෙන් දොස් පැවරුවෙමි.

මමද මගේ සිසුන්ද මේ සෘෂිවරයා කාමභෝගියකැයි
කීවෙමි. මානවකයෝද මගේ වචනයම පවසමින්
අනුමෝදන් වූහ.

ඉක්බිති මානවකයෝ ගෙයක් පාසා පිඬු පිණිස යනකල්
මේ සෘෂිවරයා කාමභෝගියකැයි මහජනයාට කීහ.

ඒ කර්ම විපාක බලයෙන් මේ පන්සියයක් භික්ෂූන් සමග
සියල්ලටම සුන්දරිය කරණකොටගෙන
බොරුවෙන් අපහාස වින්දෙමි.

පස්වෙනි ප්‍රශ්නයෙහි **සිලාවෙධො** යනු බේදයට පත් සිත් ඇතිව සිලය ඉවතලීය. අතීතයේ බෝසත්ද, කනිටු සොයුරාද, එකම පියාගේ පුත්තු වූහ. ඔවුහු පියා ඇවෑමෙන් ධනය ද දාසයන් ද නිසා කෝලාහල කරන්නේ ඔවුනොවුන් විරුද්ධ වූහ. බෝසත්තුමා තමන්ගේ ශක්ති බලයෙන් කනිටු සොයුරා ඉවත්කොට ඔහුගේ පිරිසට ඔහු ඉවතලීය. හෙතම ඒ කර්ම විපාක බලයෙන් නරකාදියෙහි නොයෙක් වර්ෂ සහශ්‍රයක් දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේ බුදුවී, දේවදත්ත රාහුල කුමරුගේ මාමාය. පෙර සේරිවාණිජ කාලයේ බෝසතුන් සමග වෙළෙන්දකු විය. ඔවුහු එක් වරායක් සහිත ගමකට පැමිණ නුඹ එක වීදියක් ගන්න. මමද එක වීදියක් ගනිමියි දෙදෙනාම පිවිසි කල්හි දේවදත්ත පැමිණි වීදියටම ජීන්න සෙට්ටිගේ බිරිඳද මුණුපුරාද දෙදෙනාම වූහ. ඔවුන්ට ඉතා විශාල රන් තැලියක්, මලකඩ රහිත වූ භාවිත අතර තබන ලද්දේ වෙයි. එය රන්තැලියක් බව නොදන්නී, මේ තලිය ගෙන පලඳනාවක් දෙවයි කීවාය. ඔහු එය ගෙන ඉඳිකටුවකින් ඉරක් ඇඳ, රන්තැලියක් බව දැන ටිකක් දී ගෙනයන්නෙමියි, සිතා ගියේය. ඉක්බිති බෝසත් දොරටුව සමීපයට ආ බව දැක මුනුපුරා ආයි, කඩිඡපුට මගේ පිලන්ධනය දෙන්නැයි ඇය ඔහු

කැඳවා, හිඳුවා ඒ තලිය දී ගෙන මගේ මුනුපුරාට කච්ඡපුටය; පලඳනාවක් දෙවූ යයි කී. බෝසත් එය ගෙන රන්තැලියක් බව දැන ඔහු විසින් රවටන ලද බව දැන තමන්ගේ පසුම්බියේ තුබූ කහවණු අටද, ඉතිරි භාණ්ඩද දී කච්ඡපුට පළඳනාව කුමාරිකාවගේ අතේ තබා ගියේය. ඒ වෙළෙන්දා යළි අවුත් විචාළේය. දරුව; නුඹ නොගන්නා ලද්දේ මගේ පුතාට මේ මේ දේවල් දී ඔහු ගෙන ගියේයයි කී. ඔහු එය ඇසුවේම හදවත පැලුනාක් මෙන් දුවගෙන ගොස් ලුහුබැන්දේය. බෝසත් නැවට පැන පලා ගියේය. ඔහු හිටුව! පලා නොයව! පලා නොයව! යයි පවසා නවතාලීමට නොහැකි වන්නේ උපනුපන් ආත්මභාවයේ විනාශ කිරීමට සමත් වේවා!යි ප්‍රාර්ථනා කළේය. ඒ ඔහු ප්‍රාර්ථනා වශයෙන් නොයෙක් ජාති සියදහස් ගණනක ඔවුනොවුන් තලා පෙළා මේ ආත්මභාවයේ ශාක්‍ය කුලයේ ඉපිද, ක්‍රමයෙන් බුදුරදුන් සර්වඥතාත්වයට පැමිණ රජගහනුවර වාසය කරන කල්හි, අනුරුද්ධ ආදීන් සම බුදුරදුන් සමීපයට ගොස් පැවිදි වී ධ්‍යානලාභී වී, ප්‍රකට වී බුදුරදුන්ගෙන් වරයක් ඉල්ලීය. ස්වාමීනි, ඉදින් භික්ෂු සංඝයා පිණ්ඩපාතිකාංගය ආදිය තෙලෙස් ධුතාංග සමාදන් වන්නේද, සියලු භික්ෂු සංඝයා මගේ භාරයට පත්වේවා! භාග්‍යවතුන් වහන්සේ අනුදැන නොවදාළහ. දේවදත්ත වෛර බැඳ ධ්‍යානයෙන් පිරිහුණේ බුදුරදුන් මරනු කැමැත්තේ එක්දිනක් වේභාරපර්වත පාමුල සිටි බුදුරදුන් මස්තකයට ගල් පර්වතයක් පෙරළීය. එය ගැටී නැගී සිටි පතුරක් අවුත් බුදුරදුන්ගේ පිටිපතුලේ පහර දුන්නේය. එබැවින් කියන ලදී.

"එක මව්කුස උපන් මම පෙර ධනහේතු නිසා
ගිරිදුර්ගයකදී ගල්කැටයක් විත් පහර වැදුණෙමි

ඒ කර්ම විපාක බලයෙන් දේවදත්ත සිලය අත්හළේය.
මගේ පාද පිටිපතුලේ ගල් පතුරක් වැදී මාපට'ඟිල්ල බිඳුණි."

සයවෙනි ප්‍රශ්නයේ සකලිකාවෙධො යනු ගල්කැට කැබලිති ගැටීමය. අතීතයේ බෝසත් එක් කුලයක උපන්නේ ළදරු කාලයේ මහාමාර්ගයේ ක්‍රීඩා කරන්නේ වීථියේ පිඬු පිණිස හැසිරෙන පසේබුදුවරයෙකු දැක මේ මුඩු මහණා කොහි යන්නේදැයි ගල්කැටයක් ගෙන උන්වහන්සේගේ පය පිටිපතුලට දමාගැසීය. පිටිපතුලේ සම බිඳී රුධිරය පිටවිය. ඔහු ඒ පාප කර්මයෙන් නොයෙක් වර්ෂ දහස් ගණනක් අපායේ මහා දුක් අනුභවකොට බුදුවූයේද, කර්ම විපාක ඵලදීම් වශයෙන් පා පිට ගල්කැටයක් වැදීමෙන් පය රුධිරයෙන් නැහැවිණි. එබැවින් කියන ලදී.

"පෙර මම ළදරුවකු වී මහා මාර්ගයේ සෙල්ලම් කරන්නේ
පසේ බුදුකෙනෙකු දැක පාරේදි ගල්කැටයකින් ගැසුවෙමි.

ඒ කර්ම විපාක බලයෙන් බුදුවූ මේ කාලයේ
දේවදත්ත එහිදී ගල්කැටයක් විද තුවාල කරන ලදි."

සත්තම පඤ්ඤ නාලාගිරි යනු ධනපාලක ඇතාය. මරණු පිණිස එවන ලදී. අතීතයේ බෝධිසත්ත්වයෝ ඇත්ගොව්වකු වී උපන්නේය. ඇතුපිට නැගී මහාමාර්ගයේ හැසිරෙනකල්හි පසේබුදුවරයකු දැක මේ මුඩු මහණා කොහේ යයි දැයි හටගත් දුෂ්ට වූ සිතින් ඇතුව මෙහෙයවීය. ඔහු ඒ පාපකර්මයෙන් අපායවල නොයෙක් වර්ෂ දහස් ගණනක් දුක් අනුභවකොට පශ්චිම ආත්මභාවයේ බුදුවී උපන්නාහ. දේවදත්ත අජාසත් රජු සහාය කොටගෙන, මහරජ; නුඹ පියා මරා රජ වෙව! මම බුදුන් මරා බුදුවන්නෙමි යයි හඟවා, එක්දිනක් රජුගේ අනුදැනීමෙන් ඇත්හලට ගොස් නුඹ හෙට නාලාගිරි ඇතාට රා කල දහසයක් පොවවා, බුදුරදුන් පිඬු පිණිස වඩින වේලාවේ නාළාගිරිව එවවයි ඇත් ගොව්වාට අණ කළේය. මුළු නගරයම මහා කෝලාහලයක් මෙන් විය. බුද්ධ ඇතු සමග හස්ති නාගයාගේ යුද්ධය බලන්නෙමුයි රාජ වීදි දෙක ආසන පිට ආසන බඳවා උදෑසනම රැස්වූහ. බුදුරදුන්ද කරන ලද ශරීර පිළිදැගුම් ඇත්තේ භික්ෂු සංඝයා පිරිවරාගෙන රජගහනුවරට පිඬු පිණිස පිවිසි සේක. එකෙණෙහි කියන ලද ආකාරයෙන්ම නාළාගිරිව පිටත් කළහ. හෙතම වීථියේ කුණුකසල අවුස්සමින් එයි. එකල එක් ස්ත්‍රියක් දරුවා ගෙන වීථියෙන් වීදියට යයි. ඇතා ඒ ස්ත්‍රිය දැක ලුහුබැන්දේය. බුදුරදුන් නාළාගිරිට ඔහු සඳහා ඔබව නොඑවන ලදි. මෙහි එවයි කී සේක. ඇතා ඒ ශබ්දය අසා බුදුරදුන් අභිමුඛව දිව්වේය. භාග්‍යවතුන් වහන්සේ අප්‍රමාණ සක්වලවල අනන්ත සත්ත්වයන් කෙරෙහි පතුරුවන ලද මෙත් සිත ඇත්තේ නාලාගිරි කෙරෙහිද එය පැතිරවිය. හෙතම බුදුරදුන්ගේ මෛත්‍රියේ ගැටී, නිර්භය වී, භගවත් පාමුල වැටුණේය. බුදුරදුන් ඔහුගේ හිස්මුදුනේ අත තැබූ සේක. එකල දෙවි මිනිස්සු ආශ්චර්ය අද්භූත සිත් ඇත්තේ මල් පරාග ආදිය පූජා කළහ. මුළු නගරයේ දණක් පමණ ධනය රැස්වී තිබුණි. රජු පශ්චිම දොරටුවේ ධනය නගරවාසීන්ට වෙත්වා! පෙරදිග දොරටුවේ ධනය රාජ භාණ්ඩාගාරයට වෙත්වා!යි බෙරහඬ නැංවිය. සියල්ලෝ එසේ කළහ. එකල නාලාගිරි ධනපාල නම් විය. බුදුරදුන් වේළුවනාරාමයට වැඩම කළ සේක. එබැවින් කියන ලදි.

"පසේ බුදුවරයෙකු ගමන් යන කල්හි ඇතකු පිට
නැගි මම, පිඬු පිණිස හැසිරෙන මුනිවරයාට
ගර්ජනා කරමින් අපහාස කළෙමි.

ඒ කර්ම විපාක බලයෙන් නාළාගිරි ඇතා
මගධ රට හැසිරෙමින් දරුණු ලෙස මා වෙත එළඹීය.

අටවෙනි ප්‍රශ්නයෙහි **සත්ථවෙජ්ජදෝ** යනු, පිහියකින් ගෙඩියක් පැලීම, පොරවකින් සැතකින් සිදින ලදී. අතීතයේ බෝසත් ප්‍රත්‍යන්ත ජනපදයේ රජ විය. දුර්ජන සංසර්ගය නිසාවෙන් ප්‍රත්‍යන්ත දේශවාසි වූ සුරා සුදු ලොල් ධූර්ත සාහසිකයකු එක දවසක් කඩුවක් ගත් අත් ඇතිව පයින් යමින් නගරයෙහි හැසිරෙන්නේ නිරායුධ ජනතාව කඩුවෙන් පහර දෙමින් පලමින් ගියේය. හෙතම ඒ පාපකර්ම විපාකය නිසාවෙන් බොහෝ වර්ෂ දහස් ගණනක් අපායේ පැසී, තිරිසන් ආදි මහදුක් අනුභව කොට පැසවා, අවසානයේ පශ්චිම ආත්මභාවයේ බුදුවී යට කියන ලද ආකාරයෙන් දේවදත්ත විසින් විසිකරන ලද ගල්පතුරක ප්‍රහාරයෙන් හටගත් තුවාල ඇත්තේ විය. ජීවක මෛත්‍රී සිතින් ඒ ගඩුව පැලීය. වෛර සිත් ඇති දේවදත්තගේ රුධිරය සෙලවීමේ කර්මය ආනන්තරික විය. මෛත්‍රී සිත් ඇති ජීවකගේ ගඩුව පැලීම පින්කමක් විය.

එබැවින් කියන ලදී.

"රජවූ මම සැතක් ගත් පුරුෂයකු මාර්ගයේ වූයෙම්
ඒ කර්ම විපාක බලයෙන් බොහෝ කලක්
නිරයේ පැසුණෙමි.

කර්මය ශේෂවීමේ ප්‍රතිඵලයෙන් ඒ සියල්ලටම
පාදයේ සැතක් ඇති මෙන් ඒ කර්මය කෙළවර
විනාශ වන්නේය."

නවමෙ පඤ්හෙ සීස දුක්ඛං යනු ශීර්ෂාබාධ, හිසේ වේදනාවයි. අතීතයේ බෝසතුන් කේවට්ටගම කෙවුලකු වී උපත ලැබීය. ඔහු එක දවසක් කේවට්ට පුරුෂයන් සමග මසුන් මරණ ස්ථානයට ගොස් මසුන් මරණ ආකාරය දැක සොම්නසින් උඩපැන්නේය. එහිදී සොම්නසද ඉපදවූහ.

හෙතම ඒ අකුසල කර්මයේ බලයෙන් සතර අපායේ දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේ දූත පුරුෂයන් සමග ශාක්‍යරාජ කුලයේ ඉපිද, ක්‍රමයෙන් බුද්ධත්වයට පත්වූයේ ද තෙමේ ශීර්ෂාබාධයෙන් පෙළුනේ වෙයි. ඒ ශාක්‍ය රජවරුන් ධම්මපදට්ඨ කථාවේ කියන ලද අයුරින් විඩූඩභ යුද්ධයේදී සියල්ලෝ විනාශයට පත්වූහ. එබැවින් කියන ලදී.

"මම කේවට්ටගමෙහි ළදරු කේවට්ටයෙකු වූයෙමි
මසුන් මරණු දැක සොමිනසට පැමිණියෙමි.

ඒ කර්ම විපාක බලයෙන් මම ශීර්ෂාබාධයෙන් පෙළෙමි.
විඩූඩභ සංග්‍රාමයේදී සෙසු ශාක්‍යයෝ විනාශ වූහ.

දසවෙනි ප්‍රශ්නයේ යවබාදනං යනු වේරඤ්ජා නුවරදී යවසහල් කෑමය. අතීතයේ බෝසත් තෙම එක්තරා කුලයක උපන්නේ ජාති වශයෙන් අන්ධබාල භාවයෙන් යුතුව ථූස්ස බුදුරදුන්ගේ ශ්‍රාවකයකු මිහිරි ආහාරපාන ඇල් හෝජනාදිය අනුභව කරනු දැක, බොල; මුඩුමහණ, යව කාපියවු! සැල් සහලේ ආහාර අනුභව නොකරවු! යනුවෙන් අක්‍රෝෂ කළේය. ඔහු ඒ අකුසල කර්ම විපාක බලයෙන් නොයෙක් වර්ෂ දහස් ගණන් සතර අපාවල දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේදී ක්‍රමයෙන් බුදුබවට පත්ව ලෝකයාට සංග්‍රහ කරන්නේ ගම් නියම්ගම් රාජධානිවල හැසිර එක් කලෙක වේරඤ්ජ බමුණුගම සමීපයේ අතුපතර විහිදී ගිය කොහොඹ ගසක් මූලට පැමිණි සේක. වේරඤ්ජ බ්‍රාහ්මණයා බුදුරදුන් වෙත එළඹ නොයෙක් ආකාරයෙන් බුදුරදුන් ජයගැනීමට නොහැකිවන්නේ සෝවාන් වී, ස්වාමීනි; මෙහිම වස් එළඹීමට වටනේ යයි ආරාධනා කළේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දතාවයෙන් ඉවසා වදාළ සේක. ඉක්බිති දෙවෙනි දිනයේ පටන් පවිටු මාරයා සියලු වේරඤ්ජ බමුණුගම වැසියන්ට මාරාවේශ වීම කළේය. පිඬු පිණිස වැඩමකළ බුදුරදුන්ට මාරාවේශ වීමෙන් එකම බත් හැන්දක්වත් දීමට නොවීය. භාග්‍යවතුන් වහන්සේ හිස්වූ පාත්‍රය ඇතිව භික්ෂු සංඝයා පිරිවරා පෙරළා ආපසු වැඩියහ. එහි පැමිණි කල්හි එහිම නැවතී සිටි අශ්ව වෙළෙන්දෝ එදවස දන්දී වස් එළඹුනා වූ පන්සියයක් භික්ෂූන් පිරිවරාගත් බුදුරදුන්ට පන්සියයක් භික්ෂූන් පිරිවරා ආරාධනාකොට පන්සියයක් අශ්වයන්ගේ වැටුපෙන් වෙන්කොට තුන්මස පෝෂණය කරමු යයි සාකච්ඡා කොට 'යව' කොටා භික්ෂූන්ගේ පාත්‍රවල දමත්. සියලු දසදහසක් සක්වල දේවතාවෝ සුජාතාවගේ කිරිබත්

පිසන දිනයේ මෙන් දිව්‍ය ඕජස් බහාලති. භාග්‍යවතුන් වහන්සේ වළඳති. මෙසේ තුන්මස මුළුල්ලේ යව අනුභව කළ සේක. තෙමස ඇවෑමේ මාරාවේශය පහව ගිය කල්හි පවාරණ දිනයේ වේරඤ්ජ බ්‍රාහ්මණයා සිහිකොට, මහා සංවේගයට පැමිණියේ බුදුරදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් දී වැඳ ක්ෂමාව අයැද සිටියේය. එබැවින් කියන ලදී.

"ඵුස්ස බුදුරදුන්ගේ සමයේ බුද්ධ වචනයේ නිරත
ශ්‍රාවකයන්ට මම අපහාස කළෙමි. මෙසේ යව කවු!
සැල් සහල් බත් නොවලඳවු යනුවෙනි.

ඒ කර්ම විපාක වශයෙන් තුන්මසක් යව කන ලදිමි.
වේරංජා වැසි බ්‍රාහ්මණයන්ගේ ඇරයුමෙන් එකල
වස් සමාදන් වූයෙමි.

එකොළොස්වෙනි ප්‍රශ්නයේදී **පිටයී දුකඛං** යනු පිටේ අමාරුවයි. අතීතයේ බෝසතුන් ගෘහපති කුලයේ උපන්නේ ජවසම්පන්න කිසියම් මිටිබිහිරි අයෙකු විය. එසමයෙහි එක් මල්ලව පොර ශූරයකු මුළු දඹදිව ගම් නියම්ගම් රාජධානිවල මල්ල යුද්ධ පවත්වන කල්හි මිනිසුන් බිම හෙළා ජයගත්තේ ක්‍රමයෙන් බෝසතුන් වසන නගරයට පැමිණ, එහි ජනයන් බිම දමා යන්නට පටන් ගත්තේය. එකල බෝසත්හු මා වසන තැන මෙතම ජයගෙන යයි. එහිදී නගරශාලාවට පැමිණ අත්පුඩි ගසා, එව්, මා සමග යුද්ධකොට යව් යනුවෙනි. ඔහු සිනහසී කිවේය. මෙපමණ මහා පුරුෂයන් බිම හෙළා මේ මිටි බිහිරි ඇගුටුම්ට්ටකු වූ මගේ එක් අතක්වත් එසවීමට අපොහොසත් යයි අත්පොළසන් දී කෑගසා ආවේය. ඒ දෙදෙනාම ඔවුනොවුන් අත් පරමාර්ශනය කළහ. බෝසත් ඔහු ඔසවා අහසට ඔසවා බිම හෙළන්නේ කොඳුනාරටිය බිඳී බිම වැටුණේය. සියළු නුවරවාසීහු සියුරුම් හඬ නගමින්, අත්පොළසන් දෙමින් වර්ග පිළිවෙළින් වස්ත්‍ර ආභරණ ආදියෙන් බෝසතුන් පිදූහ. බෝසතුන් ඒ මල්ලව යෝධයා ඍජුව අල්ලාගෙන කොඳුඇටය ඍජුකොට යව! මෙතැන්පටන් මෙබඳු ආකාර දේ නොකරව!යි පවසා පිටත් කළේය. ඔහු ඒ කර්ම විපාක වශයෙන් උපනුපන් ආත්ම භාවවල ශාරීරික බොහෝ දුක් අනුභවකොට මේ පශ්චිම ආත්මභාවයේ බුදුවූයේ නමුත්, පිටේ රුදාව ආදී දුක් අනුභව කළේය. එහෙයින් කිසිදා පිටෙහි දුකක් උපන්කල්හි සැරියුත්-මුගලන් දෙනම එතැන් පටන් ධර්මදේශනා කරවු! යයි තෙමේ සුගත චීවරය

පනවා නිදයි. කර්ම විපාක දීම නම් බුදුවරුන්ටද නොමිදිය හැකිය. මෙයද කියන ලදී.

"බුදු නොවී සිටිකල්හි මල්ල පුත්‍රයකු තැලුවෙමි.
ඒ කර්ම විපාක බලයෙන් පිටෙහි දුකක් මට ඇතිවිය."

දොළොස්වෙනි ප්‍රශ්නයෙහි **අතීසාරෝ** යනු ලේ යාමේ විරේචනයයි. ලෝහිත පක්ඛන්දිකා ආබාධයයි. අතීතයේ බෝසතුන් ගෘහපති කුලයේ උපන්නේ වෛද්‍ය කර්මයෙහි දක්ෂයකු වී. වෛද්‍ය කර්මයෙන් ජීවිතය ගෙවිය. ඔහු ඒක සිටුපුත්‍රයකු රෝගයෙන් පෙළෙන කල්හි චිකිත්සා කරන්නේ බෙහෙත්කොට චිකිත්සා වශයෙන් දියයුතු දෙයෙහි ප්‍රමාදව පැමිණ, වෙනත් බෙහෙතක් දී, වමන විරේචනය කළේය. සිටුතුමා බොහෝ ධනය දුන්නේය. ඔහු ඒ කර්ම විපාකයෙන් උපනුපන් භාවයෙහි ලෝහිත පක්ඛන්දික (ලේ වමනය යාමේ) ආබාධයෙන් විරේචනය විය. මේ පසු ආත්මභාවයෙන්ද, පරිනිර්වාණ සමයේ, චුන්ද කම්මාර පුත්‍රයා විසින් පිසන ලද ඌරුමස් මද්දවය සියළු සක්වල දේවතාවන් විසින් පිරිනමන ලද දිව්‍ය භෝජනයෙන් ආහාර සමග අනුභව කළ කල්හි ලෝහිත පක්ඛන්දිකා විරේචනය විය. කෝටි සියගණන් ඇතුන්ගේ බල ශක්තිය ක්ෂය විය.

භාග්‍යවතුන් වහන්සේ වෙසක් පුන් පෝදා කුසිනාරාවේ පරිනිර්වාණය පිණිස යන්නේ නොයෙක් තැන්වල හිඳිමින් පිපාසිතව, පැන් පානයකොට මහා දුකකින් කුසිනාරාවට ගොස් අළුයම් කාලයෙහි පිරිනිවන්පෑ සේක. කර්ම විපාකය මෙබඳු ආකාර තුන්ලොවට ස්වාමි වූවහුට පවා අත්නොහරියි. එබැවින් කියන ලදි.

"වෛද්‍යවරයෙක් වී පෙර සිටුපුත්‍රයකු විරේක කරවූයෙමි.
ඒ කර්ම විපාකයෙන් මට පක්ඛන්දිකාරෝගය වෙයි.

මෙසේ බුදුරදුන් භික්ෂු සංඝයා ඉදිරියේ තොරතුරු
හෙළි කළ සේක. සර්වඥතා ඥාණ බලයට
පත්වූවකුට වුවද කර්ම විපාක ඵලදේමය.

මෙසේ ප්‍රතිඥා ලද්දේ ප්‍රශ්නයන්ට මාතෘකා අර්ථ වශයෙන් අකුසල අපදානය සමර්ථ නම් වේ යයි කියන ලදී. **ඉත්ථං සුදං** යනු මේ ආකාරයෙන්

යටකියන ලද අයුරින් දතයුතුය. සුදං යන නිපාතය පද පූර්ණාර්ථයෙහි ආවේය. භගවා භාග්‍ය සම්පන්න පුරණ ලද පාරමී ඇති මහා සත්ත්වයා

"භාග්‍ය ඇති හෙයින් භගවා යනු යෙදිය යුතුය.
භාග්‍යයෙන් බෙදා ඇත්තේය. නැතහොත්
භවයන්හි කෙළවර දත් බැවින් භගවා
යයි දතයුතුය."

මේ ආදී ගුණයෙන් යුතු දෙවියන්ට දෙවි වූ ශාක්‍යයන්ට ශාක්‍ය වූ, බ්‍රහ්මයන්ට බ්‍රහ්ම වූ බුද්ධාතිබුද්ධ වූ ඒ මහා කාරුණික භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ බුදුසිරිත බුදුකරණ ධර්මය **සමභාවයමානො** ප්‍රකට කරමින් බුද්ධාපදානියංනාම බුද්ධකාරණා ප්‍රකාශ කිරීම නම් **ධම්මපරියායං** ධර්මදේශනා යයි කියන ලදි. **අභාසිත්ථා** යනු කීවේය යනුයි.

මෙසේ විසුද්ධජන විලාසිනි නම් අපදාන අට්ඨකථාවේ
බුද්ධාපදාන සංවර්ණනාව සමාප්ත වේ.

ඉක්බිති අනතුරු අපදානය සංගායනා කරමින් පසේබුදුවරුන්ගේ අපදානය, ඇවැත්නි ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ විසින් කොතනකදී පනවන ලද්දේද, විමසන්නේ **අථ පච්චෙක බුද්ධාපදානං සුණාථ** යනුවෙන් කීවේය. ඒ අපදාන අර්ථ යට කියන ලද්දේමය. අසව් යයි කියන ලද උපත නිමාව වශයෙන් ප්‍රකාශ කරන්නේ **තථාගතං ජෙතවනෙ වසනතං** යන ආදිය කීවේය. එහි ජේත කුමාරයාගේ නම් වශයෙන් එසේ හඳුනාගත් විහාරයෙහි සතර ඉරියව්වලින් වාසය කරන, දිව්‍ය බ්‍රහ්ම ආර්යන් විහරණය කරන බැවින් වාසය කරන බැවින් වාසය කරන්නේ පෙර පරිදි, විපස්සි ආදි සම්මා සම්බුදුවරු සමතිංසත් පාරමී දම් පුරා ආවේය. එසේ අපගේ බුදුරදුන්ද, ආවේ යයි. තථාගතො = එයට තථාගතං ජේතවනයේ වාසය කරත් යන සම්බන්ධයයි. **වෙදෙහමුනි** යනු විදේහ රටෙහි උපන් ඒ දේවියගේ පුත්‍ර විදේහපුත්ත මුනිවරයා යයි කියනු ලැබේ. ඔහුට ඤාණය පවතින නිසා මුනි නම් වේ. වේදෙහි පුත්‍ර වූයේත් ඔහු මුනි වූයේත් - වෙදෙහි පුත්තමුනි යයි දතයුතුයි. **වණණාගමො** යන ආදියෙන් නිරුක්ති න්‍යායෙන් ඉකාරයට කෙළවර පුත්ත ශබ්දයට ලොප්කොට වේදේහ මුනි

යයි කියන ලදී. "මහණෙනි, මගේ ශ්‍රාවකයන් අතර ප්‍රඥාවන්ත ගතිමන්ත, ධෛර්ය සම්පන්න, බහුශ්‍රැතයන් අතර උපස්ථායන අතර ආනන්ද තෙරුන් අග්‍ර වේ" මෙසේ අග්‍ර තනතුරේ තබන ලද, ආයුෂ්මත් ආනන්ද තෙරුන් ස්වාමීනි, පසේ බුදුවරුන් කෙබඳු ආකාර වෙත්දැයි විචාරණ ලදී යන සම්බන්ධයයි. ඒ පසේ බුදුවරු කුමන කාරණාවලින් කවර හේතුවලින් **භවනත්‍රි** හටගනිත්ද? ධීරා යනු භාග්‍යවතුන්ට ආමන්ත්‍රණය කරයි. ඉන් අනතුරුව විස්තර කරන ලද ආකාරය දක්වමින් **තදාහ සබ්බඤ්ඤුතවරෝ මහෙසි** යන ආදිය කීවේය. සියළු අතීතාදි භේදය අතට ගත් නෙල්ලි ගෙඩියක් මෙන් දනියි යනුවෙනි. සබ්බඤ්ඤු සර්වඥතාවයෙන් හෙතම උතුමිය යනුවෙන් සබ්බඤ්ඤුවරෝ නම් වේ. මහත් සීලස්කන්ධයකින් සමාධිස්කන්ධයෙන්, ප්‍රඥා ස්කන්ධයෙන්, විමුක්ති ස්කන්ධයෙන් මහත් විමුක්ති ඤාණ දර්ශනස්කන්ධ මෙතම ගවේෂණය කරයි යනු මහේසි නමි. **ආනන්ද හදඳං මධුරසසංරණ** එකල එය විමසූ කල්හි කීවේය යන සම්බන්ධයයි. පින්වත් ආනන්ද, යෙ ඒ පසේ බුදුවරු සියළු බුදුවරුන් අතර අතීත බුදුවරුන් අතර **කථාධිකාරා** කරන ලද පුණ්‍යසම්භාරයෙන් යුක්ත **ජින සාසනෙසු අලදධමොකඛා** නොපතන ලද නිර්වාණය ඒ සියළු පසේ බුදුවරු ධීරයෝය. මේ මේ ලෝකයෙහි **සංවෙගමුඛෙන** එක පුද්ගලයෙකු ප්‍රධානකොට පසේ බුදුවරු දනියි යන අර්ථයයි. **සුනිකඛ පඤඤා** සියුම් සියුමැලි ප්‍රඥාව. **විනාපි** බුදෙඛහි බුදුවරුන්ගේ අවවාද අනුශාසනා රහිත ඉක්බිති **පරිත්තකෙනාපි** අප්‍රමාද අයකු විසින් **ආරම්මණෙනාපි** ප්‍රත්‍යෙක බෝධිය පෝෂණය කොට ලත් බෝධිය සම්මා සම්බුදුවරුන්ගේ අතුරුබෝධියයි. **අනුපාප්‍රණං** යනු අවබෝධ කරගනිත්. **සබබමහි** ලෝකයෙහි සියළු තුන්ලෝකයෙහි. **මමං ඨපෙත්වා** මා හැර පසේ බුදුවරුන් කෙරෙන් සමවූ සමාන වූම මහා මුනිවරුන්ගේ මේ වර්ණය මේ හැඩය ගුණය, ඒ පසේ බුදුවරුන්ට නැත. **පදෙසමත්තං** සංඛේප මාත්‍රයෙන් මම නුඹලාට යහපතක් කියමි. කියන්නෙමු යන අර්ථයයි. ආචාර්යවරයෙකු නොමැතිව තෙමේම බුද්ධත්වය තෙමේම අවබෝධ කරගත් බැවින් ඍෂිවරුන් අතර මහාඍෂි වූ. **මධුවබුද්දං** කුඩා මීවදයක් මෙනි. **සාදූනි** මිහිරි වූ. **වාක්‍යානි** උදානි වචනයෝ. **අනුත්තරං** උත්තර නැත. **හෙසඡ්ජං** ඖෂධ නිවන. **පත්‍යනතා** කැමැතිවන්නා වූ නුඹලා සියල්ල **සුපසනනචිත්තා** මැනවින් පිහිටි මනසා මෙනෙහි කරවු! යන අර්ථයයි. **සමාගතානං** රැස්වුනා වූ උපන්නා වූ. **පචෙචකබුද්ධානං** අරිටඨ, උසිතරගසිතුම්, යසසසී, සුදසසන, පියදසසි, ගන්ධාර, පිණ්ඩාල, උපාසභ නිඨ තථා සුතවා භාවිතතෙතා සුමභ සුභ, මෙථුල, අඨිම,

සුමේධ අනිස සුදාථ පිංගු පිංගු, දෙව ජාලිනෝ අධ්‍යක කොසල සුබාහු උපනෙමි, සොනෙමි, සොසනත චිතත, සචච, තථ, විරජ, පණ්ඩිත, කාල, උපකාල, විජිත, ජිත, අංග, පංග, සාදයට ගුතිජජිත, පසසී, ජහී, උපධි, දුකඛමුල, අපරාජිත සරභංග, ලොමහංස, උච්චංගමාය, අසිත, අනාසව, මනොමය, මානචජිද, බන්ධුමා, තදාධිමුත්ත, විමල, කෙතුමා, කෙතුම්බරාග, මාතංග අරිය, අචචුත, අචචුතගාමිබ්‍රාමකෙ, සුමංගල ආදීන් යන ආදීන්ගේ පන්සියයක් පසේබුදු පරම්පරා ප්‍රත්‍ය සහිත විස්තර විවරණ යමක ආදී යංච විරාග වත්තුං නො ඇලීමට කරුණ යමාච යම් කාරණයකින්. **බෝධි අනුපාපුණිංසු** චතුමාර්ග ඤාණය ප්‍රත්‍යක්ෂ කළහ. **සරාගවත්තුසු** යනු සරළ ලෙස ඇලේනුයි වස්තුකාම ක්ලේශකාම ආදී දේවල්වල. **විරාගසඤඤි** නොඇලුණු ප්‍රඥාවන්ත වූ. **රත්තමහි ලොකමහි** ඇලෙනසුළු ස්වභාව ඇති ලෝකයෙහි **චිරතනචිනතා** නොඇලෙන සිත් ඇතිව. **පපඤෙච** යනු රාගයේ ගැටීම ද්වේෂයේ ගැටීම සියලු ක්ලේශවල ගැටීම ගැටීම් සංඛ්‍යාත කෙලෙස් අතහැර. **ජිතබන්ධිතානි** ඒ සියළු දෙසැටක් දෘෂ්ටිගත ධර්ම ජයගෙන. **තථෙව** ඒ කාරණයෙන්ම එසේ. **බොධි අනුපාපුණිංසු** පච්චේක බෝධිඤාණය ප්‍රත්‍යක්ෂ කළහ යන අර්ථයයි. **සබෙබසු භූතෙසු නිධාය දණ්ඩං** යනු තර්ජන ඇලීම් වධබන්ධන අතහැර දමා ඒ සියළු සත්ත්වයන් අතර වෙනසක් නැතිව එකම සත්ත්වයකු ලෙස බැලීමයි. **අවිහෙඨයං** අවබෝධ කරගැනීම දුක් රහිතව සියළු සතුන් විෂයෙහි මෛත්‍රියෙන් යුතුව. **භූතා** තෘෂ්ණා සහිත. ස්ථාවර යයි කියනු ලැබෙත්. යමකුගේ තැනිගත් තෘෂ්ණාව ප්‍රහීණ නොවූ භය තැනිගැනීම ප්‍රහීණ නොවූ ඔවුහු **තසා** කුමන කරුණකින් තසං වේද? ත්‍රාසයට තස යයි කියනු ලැබේ. ත්‍රාසයට උත්‍රාසයට පරිත්‍රාසයට සන්තාපයට පැමිණෙත්. ඒ කාරණය කියනු ලැබේ. යමෙකුගේ තැනිගැනීම තෘෂ්ණාව, ප්‍රහීණ වී ද යමෙකුට බිය බිය ගෙනදීම ප්‍රහීණ වේද, ඔවුහු ථාවර නමි. කුමන කරුණකින් තවරා යයි කියනු ලැබෙත්ද? ථිරං යනු තැති නොගනිත් මත්තෙහි තසං යනු නොබිය වෙත්. සන්ත්‍රාසයට සිතේ කැළඹීමට නොපැමිණෙත්. ඒ කාරණය කියනු ලැබේ. **ථාවරා** තුන්දඬු, කායදණ්ඩ, වචීදණ්ඩ, මනෝ දණ්ඩ යනුවෙන් තුන්වැදෑරුම් වේ. කාය දුසිරිත කායදණ්ඩ වේ. වචීදණ්ඩ වචී දුශ්චරිතයයි සිවුවැදෑරුම් වේ. මනෝ දුශ්චරිතය තෙවැදෑරුම් වේ. මනෝදණ්ඩ නම් වේ. සියළු සක්වල සත්ත්වභූත කොට්‌යාසවල ඒ වධ දඬුවම්, **නිධාය** තබා බහා තබා ඉවත දමා නොනංවා දුරින්ම දුරුකොට සිනහ බවක් නොගෙන හාස්‍යයට ලක් නොකර සියළු සතුන් කෙරෙහි දඬු බහා තබා සිටීම අවිහෙඨය නම් වේ. **අඤඤතරමපි** ඔවුහු වෙති.

එකම එක සත්ත්වයෙකු ප්‍රාණියෙකු, කැටකැබලිතිවලින් දණ්ඩකින් හෝ ආයුධයකින්, ලණුවකින්, රැහැනකින් නොපෙලවන්නේ නොවෙලෙන්නේ සියළු සතුන් කෙරෙහි හිංසා නොකරන්නේ අවිහෙඨය එයට අමතරව වේ. **න පුත්ත මිච්ඡෙය්‍ය කුතො සහායං** යනු ප්‍රතික්ෂේප නොකරයි. පුත්‍රයෝ නම් වේ. පුත්‍රයෝ සතර දෙනෙකි. ඖරස පුත්‍රයා, කුඹුරේ උපන් පුත්‍රයා, දෙනලද පුත්‍රයා අන්තේවාසික හෙවත් අතවැසි පුත්‍රයා යහළුවා යයි කියනු ලැබේ. යමකු මිතුරකු සමග පැමිණීමේදී පහසු ගමන පහසු ස්ථානය පහසු හිඳීම පහසු පාලනය පහසු කථාබහ පහසු සතුටු කථාබහ පුත්‍රයකු කැමැති නොවන්නේය. කුමක් නිසා මිත්‍ර වූ පුතකු නොකැමැති වන්නේද, ප්‍රාර්ථනා නොකරන්නේද, කථා නොකරන්නේද, කුමක් නිසා දක්නාලද හටගත් මිත්‍රයකු කොයින්ද? යහළුවකු කැමැති වන්නේය. හඳුනා ගන්නේය. ප්‍රාර්ථනා කරන්නේය. කථාබහ සතුටු සාමීචි කරන්නේය. සහාය පුත්‍රයෙකු කැමැතිවන්නේ කොතනින්ද? **එකො චරෙ බගවිසාණ කපෙපා** යනු ඒ පසේ බුදුවරයා ප්‍රවෘජ්‍යා වශයෙන් එක් අයෙකි. දෙවැන්නකු නැති බැවින් එකකි. තෘෂ්ණාව දුරුකළ බැවින් එකකි. ඒකාන්තයෙන් රාගය පහකළ බැවින් එක් අයෙකි. ඒකාන්තයෙන් ද්වේෂය දුරුකළ බැවින් එක් අයෙකි. ඒකාන්තයෙන් මෝහය දුරුකළ බැවින් එක් අයෙකි. ඒකාන්තයෙන් කෙලෙස් රහිත බැවින් එක් අයෙකි. ඒකායන මාර්ගයට ගිය බැවින් එක් අයෙකි. අනුත්තර වූ පච්චේක සම්බෝධියට පත් පුත පච්චේක සම්බුදුන් සියළු ගෘහවාසයට අයත් පලිබෝධ උවදුරු සිඳ දමා කෙස් රවුල් බහා තබා කහපාට වස්ත්‍ර ඇඳගෙන ගිහිගෙයින් නික්ම අනගාරික පැවිද්ද ලබා ආකිඤ්චඤ්ඤ වාසයට පැමිණ හුදකලාව සැරිසරයි. වාසය කරයි. ඉරියව් පවත්වයි. පාලනය කරයි. යැපෙයි. යප්පවයි. මෙසේ ඒ පසේ බුදුරද, පැවිදි සංඛ්‍යාත එක් අයකු නිසාය. කෙසේ ඔහු දෙවැන්නකු නැති බැවින් එකකු වීද, ඔහු මෙසේ පැවිද්දෙන් සමාන වූයේ එකම අරණ්‍යයෙහි වනවදුලු සෙනසුන් ආදිය ඇසුරු කරයි. අල්ප ශබ්ද ඇති අල්ප ඝෝෂා ඇති, මිනිසුන්ගේ රැකවරණ ඇති, මනා වා කවුළු ඇති, පිළිසඳර කථාබහට යොමුවිය යුතු හෙතම හුදකලාව ගමන් කරයි. හුදකලාව හිඳියි. එකම යහන කැමැති වෙයි. එකම ගමට පිඬු පිණිස පිවිසෙයි. හුදකලාව ගමන් කරයි. හුදකලාව රහසිගතව හිඳියි. හුදකලාව සක්මන් කරයි. හුදකලාව යැපෙයි ආදියයි. මෙසේ ඔහු දෙවැන්නකු නැති බැවින් එකම වේ. කෙසේ ඔහු තෘෂ්ණාවෙන් ප්‍රහාණය කරන්නේ හුදකලාවම ඔහු එකම දෙවැන්නකු නැති බැවින් අප්‍රමාදීව කෙලෙස් ප්‍රහීණ කළ බැවින් මහ ප්‍රධන් වීර්ය වඩමින් වාසය කරන්නේ සේනාව සහිත පවිටු

වූ නෑදෑයෝ තෘෂ්ණාව නැමැති දැල විසර්ටික වූයේ විනෝද වෙත්. ප්‍රධන් වීර්යය විසත්ති නම් තෘෂ්ණා ජාලය දුරුකරයි. දුරින්ම දුරුකරයි. ක්ෂය කළේය යන අර්ථයයි.

"තෘෂ්ණාව දෙවෙනිකොට ඇති මිනිසා
දීර්ඝ වූ සංසාර මාර්ගයට පැමිණ
සංසාරයේ මෙසේ මේ ලෙස
හෝ අන් ලෙස නොපවතියි

මෙසේ ආදීනව දැක දුක හටගන්නා
තෘෂ්ණාවද තෘෂ්ණාව දුරුකළ කෙලෙස්
නැති සත්පුරුෂය, භික්ෂුව තෘෂ්ණාව
දුරලන්නේ."

මෙසේ ඒ පසේ බුදුරද තෘෂ්ණාව ප්‍රහාණය කරන බැවින් එක් අයෙකි. කෙසේ ඒකාන්තයෙන් රාගය දුරුකළ බැවින් එකකු වේද? රාගය ප්‍රහීණ කළ බැවින් ඒකාන්තයෙන් ඒකාන්ත රාගය දුරුකළ බැවින් එකෙකි. ද්වේෂය ප්‍රහීණ කළ බැවින් ඒකාන්තයෙන් විතදෝෂ නිසා එකකි. මෝහය ප්‍රහීණ කළ බැවින් ඒකාන්තයෙන් විත මෝහ බැවින් එකෙකි. කෙසේ ඒකාන්ත වේද නික්ලේශී වේද සියළු කෙලෙස් ප්‍රහීණ කළ බැවින් ඒකාන්තයෙන් නික්ලේශි නිසා එකෙකි. මෙසේ ඒ පසේ බුදුරද ඒකාන්ත නික්ලේශිවලින් එකෙකි. කෙසේ හෙතම ඒකායන මාර්ගයට ගියේද? එක ඒකායන මාර්ගය වැදෑරුම් වේ. සතර සතිපට්ඨාන සතර සම්‍යග්ප්‍රධාන සතර ඍද්ධිපාද පංචඉන්ද්‍රිය පංචබල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ටාංගික මාර්ගය

"ඒකායන මගෙන් ඉපදීම ක්ෂය කළේ යයි
දනිමි. මාර්ගය දැනගනියි. හිතානුකම්පිව
මේ මාර්ගයෙන් පෙර බුදුවරු සසර
ඕඝ තරණය කළහ. තරණය කරවන්නාහ."

මෙසේ හෙතම ඒකායන මාර්ගයට ගියේ යයි ඒක නම් වේ. කෙසේ ඒ පසේ බුදුවරු එකම නිරුත්තර පච්චෙක සම්බෝධිය අවබෝධ කරගත්තේද නුයි ඒක නම් වේ. බෝධි චතු මාර්ග ඤාණය බෝධි යයි කියනු ලැබේ. ප්‍රඥාව ප්‍රඥා ඉන්ද්‍රිය, ප්‍රඥා බලය, ධම්මවිචය සම්බෝධි

අංගය විමසීම විදර්ශනා සම්මා දිට්ඨියයි. ඒ පසේබුදුරජු ඒ ප්‍රත්‍යක්ෂ බෝධි ඥානයෙන් සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍ය යයි අවබෝධ කරගත් සේක. සියළු සංස්කාර දුක යයි අවබෝධ කළේය. සියළු ධර්ම අනාත්ම යයි අවබෝධ කළ සේක. අවිද්‍යාව නිසා සංස්කාර ඇතිවන බව අවබෝධ කළ සේක. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවන බව අවබෝධ කරගත්හ. විඤ්ඤාණය නිසා නාම-රූප ඇතිවන බව අවබෝධ විය. නාමරූප නිසා ෂට් ආයතන ඇතිවන බව අවබෝධ කරගත්හ. සළායතන නිසා ස්පර්ශය ඇතිවන බව අවබෝධ කරගත්හ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවන බව අවබෝධ කරගත්හ. වේදනාව නිසා තෘෂ්ණාව ඇතිවන බව අවබෝධ කරගත්හ. තෘෂ්ණාව නිසා උපාදානය ඇතිවන බව අවබෝධ කරගත්හ. උපාදානය නිසා භවය ඇතිවන බව අවබෝධ කරගත්හ. භවය නිසා ජාති හෙවත් ඉපදීම ඇතිවන බව අවබෝධ කරගත්හ. ජාති නිසා ජරාව මරණය ඇතිවන බව අවබෝධ කරගත්හ. අවිද්‍යාව නැති කිරීමෙන් සංස්කාර නිරුද්ධ වන බව අවබෝධ කරගත්හ. සංස්කාර නිරුද්ධ වීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වන බව අවබෝධ කරගත්හ. විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් නාමරූප නිරුද්ධ වන බව, නාමරූප නිරුද්ධ වීමෙන් සළායතන නිරුද්ධ වන බව, සළායතන නිරෝධයෙන් ඵස්ස නිරුද්ධ වන බව, ස්පර්ශය නිරුද්ධ වීමෙන් වේදනාව නිරුද්ධ වන බව, වේදනා නිරෝධයෙන් තෘෂ්ණාව නිරෝධ වන බව, තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදානය නිරුද්ධ වන බව, උපාදානය නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වන බව, භව නිරෝධයෙන් ඉපදීම නිරුද්ධ වන බව, ඉපදීම නිරුද්ධ වීමෙන් ජරා මරණ නිරුද්ධ වන බවද අවබෝධ වූ සේක. මෙය දුක යයි අවබෝධ විය. මේ දුක හටගැනීම යයි අවබෝධ විය. මේ දුක් නිරෝධය යයි අවබෝධ විය. මේ දුක නැතිකිරීමේ මාර්ගය යයි අවබෝධ විය. මේවා ආශ්‍රව ධර්මයයි අවබෝධ විය. මෙය ආශ්‍රව හටගැනීම යයි අවබෝධ විය. මේවා ආශ්‍රව නැති කිරීමේ ප්‍රතිපදාව යයි අවබෝධ විය. මේ ධර්ම අවබෝධ කරගත යුතු යයි අවබෝධ විය. මේ ධර්ම මැනවින් දතයුතු යයි අවබෝධ විය. මේ ධර්ම ප්‍රහාණය කළ යුතුයයි අවබෝධ විය. මේ ධර්ම සාක්ෂාත් කළ යුතුයයි අවබෝධ විය. මේ ධර්ම වැඩිය යුතුයයි අවබෝධ විය. සයවැදෑරුම් ස්පර්ශ ආයතනයන්ගේ හටගැනීමද වටහා ගැනීමද ආශ්වාදයද ආදීනවද මිදීමද අවබෝධ විය. පංච උපාසානස්කන්ධයන්ගේ හටගැනීමද, ආශ්වාදයද, මිදීමද අවබෝධ විය. සතරමහා භූතයන්ගේ හටගැනීමද වටහාගැනීමද, ආශ්වාදයද, ආදීනවද, මිදීමද අවබෝධ විය.

යම්කිසි ධර්මතාවයක් හටගත්තේද? ඒ සියල්ල නිරුද්ධ වන බව අවබෝධ කරගත් සේක. අවබෝධ කළයුතු අධිගම කළයුතු දැකිය යුතු, සාක්ෂාත් කළයුතු බැවින් ඒ ප්‍රත්‍යක්ෂ බෝධි ඤාණයෙන් අවබෝධ විය. මැනවින් අවබෝධ විය. අධිගම විය. දුටුවේය. සාක්ෂාත් කළේය. මෙසේ ඒ පසේබුදුරද එක් අනුත්තර වූ පච්චේක සම්බෝධිය අවබෝධ කරගත්හ. **චරෙති අථ චරියායො** ඉරියාපථචරියාව, ආයතන චර්යාව, සති චර්යාව, සමාධි චර්යාව, ඤාණ චර්යා මාර්ග චරියා ප්‍රතිපක්ෂ චර්යා (විරුද්ධ) ලෝකාර්ථ චර්යා ඉරියාපථ චර්යා යනු සතර ඉරියව්වල ආයතන චර්යා යනු සයවැදෑරුම් බාහිර අධ්‍යාත්මික ආයතනවල සති චරියා යනු සතර සතිපට්ඨානවල, සමාධි චර්යා යනු සතර ධ්‍යානවල, ඤාණ චරියා යනු චතුරාර්ය සත්‍ය ධර්මවල මග්ගචරියා යනු චතුරාර්ය සත්‍යවල පටිපක්ඛචරියා යනු සතර සමඤ්ඤඵලයෙහි. ලෝකත්ථචරියා යනු තථාගතයන් කෙරෙහි මහරහතුන් කෙරෙහි සම්මා සම්බුදුවරුන් කෙරෙහි ප්‍රදේශවල වැඩසිටින පසේ බුදුවරුන් කෙරෙහි සෙසු ශ්‍රාවකයන් කෙරෙහි ඉරියාපථ චර්යාවද, වාසනා සම්පන්න වේ. ආයතන චර්යාවෝ ඉන්ද්‍රියන්වල වසන ලද දොරටු ඇතිව සතිචර්යාව අප්‍රමාදීව හැසිරෙන්නන්ට. සමාධි චර්යාව අධි චිත්තයෙන් යුක්ත වූවන්ට. ඤාණ චර්යාව බුද්ධමතුන්ටය. මාර්ග චර්යාව මනාසේ පිළිපන්නවුන්ට ප්‍රතිපත්ති චර්යාව අධිගමය ශාක්ෂාත් කළවුන්ට ලෝකාර්ථ චර්යාව, තථාගත අර්හත් සම්මා සම්බුදුවරුන්ටය. ප්‍රදේශ පසේබුදුවරුන්ගේ ප්‍රදේශ ශ්‍රාවක සංඝයාටය. මේ අෂ්ටචර්යාවද වේ. **අපරාපි අථ චරියායො** මැනවින් මිදුණේ ශ්‍රද්ධාවෙන් හැසිරෙයි. අවබෝධ කරන්නේ වීර්යෙන් හැසිරෙයි. එළඹෙන්නේ සිහියෙන් හැසිරෙයි. බැලීම කරන්නේ සමාධියෙන් හැසිරෙයි. දැනගන්නේ ඤාණ චර්යාවෙන් හැසිරෙයි. මෙසේ පිළිපන්නහුගේ කුසල ධර්ම ආයතන නම් වෙති. ආයතන චරියාවේ හැසිරෙයි. මෙසේ පැමිණීම විශේෂ අවබෝධයක් ලැබ ගනියි යනු විශේෂ චර්යාවේ හැසිරෙයි. මේ චර්යා අටයි. දර්ශන චරියාවද සම්මා දිට්ඨියට ආරෝපණය කර පවතියි. සම්මා සංකල්පනාවට අයිතිය අල්වාගැනීම වේ. සම්මා වාචාවට සමුට්ඨානචරියාව හෙවත් හටගැනීමේ චරියාව වේ. සම්‍යක් කර්මාන්තයට ඕදාහ චර්යාව හෙවත් අවවාද දීමද, සම්මා ආජීවයට උත්සාහයට හෙවත් පග්ගහ චර්යාවද සම්‍යක් ව්‍යායාමයට උස්ථාන චර්යාවද **සම්මා** සතියට, කලබල නැති බව ඇතුළත් චර්යාවද සම්මා සමාධියට මේ අෂ්ටවිධ චර්යාවෝම අයත් වෙති. **ඛගවිසාණකපෙපා** යනු යම්සේ කඩුවක් වැනි අඟක් ඇත්තේ එකම අර්ථය වෙයි. දෙවැන්නක් නැත. ඒ සේ බුදුරද එය කැපය එය සමානය ඒහා ගැලපේය. ලුණු කැපබවට අතිලෝණ යයි

කියනු ලැබේ. තෙත අමු දේ කැපය යනු අතිත්තං යනු කියනු ලැබේ. මධු කප්පො යනු ඉතා මධුර යයි කියනු ලැබේ. අග්ගිකප්පො යනු ඉතා උෂ්ණ යයි කියනු ලැබේ. හිම කපප යනු ඉතා ශීතල බව කියනු ලැබේ. සමුද්දකප්ප යනු මහා ජලකඳ කියනු ලැබේ. මහත් බලයට පැමිණි ශ්‍රාවකයා කියනු ලැබේ. සත්තුකප්පො එපරිදි ඒ පසේ බුදුරද කඟවේනා හා සමානය. කඟවේණා හා සමානව දෙවෙනි නොවන බන්ධනයෙන් මිදී මැනවින් ලෝකයෙහි සැරිසරයි. වාසය කරයි. ඉරියව් පවත්වයි. යැපෙයි. අනුන්ව යැපීම කරවයි. හුදකලාව හැසිරෙන්නේ කඟවේනා හා සමානය. කැපය. එබැවින් පසේ බුදුවරු කියන ලදි.

"සියළු සතුන් කෙරෙහි දඬු බහාතබා
ඔවුනොවුන්ට පීඩා නොකරන්නේ
සහායට කිසි ලෙසකිනුත් පුත්‍ර දරුවන්
නොකැමැති වන්නේ හුදකලාව කඟවේනා මෙන්
හැසිරෙන්නේ

එක්වීම සංසර්ගය තුළින් සෙනෙහස වෙත්
ස්නේහත්වය මේ දුකට හේතුවේ
ස්නේහයෙන් උපදින ආදීනවය බලමින්
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

අනුකම්පාව තුළින් සුහද බව මිතුරු බව ඇතිව
කරුණු සහිත බැඳුණු සිතින් විකාශය ඇතිවේ
හටගන්නා මේ බිය අපේක්ෂා කරමින්
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

පරපුර විශාල යම්සේ ඇලීම පැටලීම ඇතිවේ
පුත්‍ර අඹු දරුවන් කෙරෙහි යම් බලාපොරොත්තුවක්
විමෙන් උණ බටයක් මෙන් නොගැටෙන්නේ
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

මුවෝ සිවුපාවෝ වනයෙහි නොඇලී නොබැඳී
සිටින්ද යමෙක් නිතර ගොදුරු පිණිස යයිද,
ප්‍රඥාවත් පුරුෂයා නිදහස අපේක්ෂා කරන්නේ
කඟවේනා මෙන් හුදකලාව සැරිසරන්නේය.

යහළුවන් මැද ආමන්ත්‍රණය කරයි
වාසය කිරීමද, සිටීමද, ගමන් කිරීමද චාරිකාවද
නොබිඳුණාව නිදහස අපේක්ෂා කරමින්
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

සහායකයන් මැද ක්‍රීඩාවේ ඇලේද
පුතුන් කෙරෙහි විපුල ප්‍රේමයක් හටගනියි
ප්‍රියයන් වෙන්වීම ඉතාම පිළිකුල් කරමින්
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

සිවු දිශාවේම පටිඝ තරහවෙන් වෙන්වූයේ
ඔවුනොවුන් සතුටු කරමින්
අනතුරු උපද්‍රව දුරු කරමින් වාසය කිරීම
කඟවේනා මෙන් හුදකලාව සැරිසරන්නේය

ඇතැම් පැවිද්දන්ට නරක ලෙස සංග්‍රහ
කිරීමද, ගෘහස්ථ වූ ජනයා එසේ කරන්නේද
අල්ප උත්සාහයක් ඇත්තා අනුන්ගේ පුතුන් කෙරෙහි
වී කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

ගිහි බන්ධන ඇසුර බහා තබා
පරසතු රුකක් මෙන් හැලී යන්නේ වේද
ගිහි බන්ධන මුලිනුපුටා දමා
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

ඉදින් ප්‍රඥාවන්තයාගේ සහාය ලැබේද,
යහපත් සාධුජනයන් සමග වාසය කරවු
සියළු පිරිස් මැඩගෙන
තමන් සිහිබුද්ධිය ඇත්තකු සේ හැසිරෙන්නේය

ඉදින් ප්‍රඥාවන්ත සහාය නොලබවුද
යහපත් සාධු ජනයා සමග වාසය නොකරයිද
රාජ්‍යය හැරදැමූ රජතුමා මෙන්
මාතංග නාගරාජයා මෙන් හුදකලාව සැරිසරන්නේය

ඒකාන්තයෙන් මිත්‍ර සම්පත ප්‍රශංසා කරමු
ශ්‍රේෂ්ඨ වූ සමබර මිතුරෝ සේවනය කළ යුතුය
එසේ නොලැබ වැරදි දේ අනුගමනය
කරන්නා හුදකලාව හැසිරෙන කඟවේනා මෙනි

මනාසේ හැඳ පොරවන ලද ලෝකුරු පුතකු
විසින් ස්වර්ණ-ප්‍රභාස්වර වර්ණ දැක
දෑතින් ගැටෙන්නේ ලොව
හුදකලාව හැසිරෙන කඟවේනා මෙන් වන්නේය

මෙසේ මට දෙවැන්නකු සහාය වීමෙන්
වචනයෙහි ඇලුණේ විවිධ දේ කරන්නේ
මේ බිය පැමිණේවි යන අපේක්ෂා ඇත්තේ
කඟවේනා මෙන් හුදකලාව සැරිසරන්නේය

විචිත්‍ර මධුර මනෝහර වූ කාමයෝ
විරූපාකාරයෙන් සිත පෙළත්
කාම ගුණවල ආදීනව දැක
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

ගඩු උපද්‍රව, විපත් රෝග හුල්
මේ බියද යන මේවා කාම වස්තුවල පිහිටි
මේ බිය සිඳ දමා
කඟවේනෙකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

ශීතල උෂ්ණය සා පිපාසා
සුළං අව්ව මැසි මදුරු උවදුර
මේ සියළු උවදුරු මැනවින් දැන
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

රැළ අතහරින හස්ති රාජයා මෙන්
උදාර වූ හටගත් පංචස්කන්ධය
කැමැති පරිදි අරණ්‍යයේ වාසය කරමින්
කඟවේනා මෙන් හුදකලාව සැරිසරන්නේය

අයෝග්‍ය තැන ඒකරාශි වීමද
සාමයික විමුක්තියට බාධා වන්නේය
ආදිච්ච බන්ධු වූ බුදුරදුන්ගේ වචන පිළිගෙන
කඟවේනා මෙන් හුදකලාව සැරිසරන්නේය

විකාර දර්ශන ආදියෙන් වලකින්නේ
ලබන ලද නිවැරදි මගට පැමිණ,
උපන්නා වූ ඤාණය නොදන්නා ලද්දේ
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

ලොල් නොවූ, කුහක නොවූ පිපාසා නැති
මැස්සන් රහිත රත්කොට පිරිසිදු කළ
මෙන් සියළු ලොව ආකාර හිතවී
කඟවේනා මෙන් හුදකලාව හැසිරෙන්නේය

අනර්ථය දකින විෂම වූ පිරිසිදු නොවූ
පාප සහාය දුරුකළ යුතුය
තෙමේ බහුල වශයෙන් ප්‍රමාද වන්නා සේවනය නොකරන්නේය
හුදකලාව හැසිරෙන කඟවේනා මෙනි

බහුශ්‍රැත වූ ධර්මධරයන් භජනය කරවූ!
ප්‍රතිභාසම්පන්න උදාර මිතුරන් ඇසුරු කරවූ
සැකය දුරුකොට අර්ථය දැනගෙන
හුදකලාව හැසිරෙන කඟවේනකු මෙන් වන්නේය

ලොව කාම සැපතෙහි ඇල්ම දුරුකොට
අලංකාර නොවී අපේක්ෂා රහිතව සිටින්නා
විභූෂණ ආදියෙන් වැලකෙන සත්‍යවාදියා
හුදකලාව හැසිරෙන කඟවේනකු මෙනි

අඹුදරුවන්ද, මව්පියෝද
ධන ධාන්‍ය නෑදැයෝද
කැමැති පරිදි අතහැර දමා
කඟවේනකු සේ හුදකලාව හැසිරෙන්නේය

ඒකරාශි වූ මෙතම අල්ප වූ සෞඛ්‍යය
අප්‍රසාදයද මෙහිලා බොහෝ දුකට හේතුවන්නේය
මේ ප්‍රඥාවන්තයා මෙය හොඳින් දන්නේය
හුදකලාව හැසිරෙන කඟවේනකු මෙන් වන්නේය

සිහිල් දියදහරා එකට කලවම්කොට
මිශ්‍රකොට දැල්වෙන ගින්න නිවනු
ලබන්නේය එපරිදි කඟවේනු සේ
හුදකලාව හැසිරෙන්නේය

ඇවිදීමට ලොල්වූ අය පහතට හෙළන ලද
ඇස් ඇත්තේ නොවන්නේය
රක්නාලද ඉඳුරන් ඇත්තේ රක්නාලද මනසක් ඇත්තේය.
නොරක්නා ලද සිත දවාලනු ලබන්නේ,
හුදකලාව හැසිරෙන කඟවේනකු සේ වන්නේය

ගිහි බන්ධන බහා තබා,
පරසතු මලින් ගැවසී ගත්තෙකු මෙන්
කෂාය වස්ත්‍ර ඇතිව නික්ම ගොස්
හුදකලා වූ කඟවේනකු මෙන් හැසිරෙන්නේය

රසයෙහි ගිජුවීම නොකළ යුතු ලොල් නොවී
අනුපිළිවෙළින් යන්නී අනුන් විසින් පෝෂණය නොකරන්නී,
කුල ගෙයක් පාසා නොඇලුණු සිත් ඇත්තේ,
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

සිතින් පඤ්ච නීවරණයන් හැරදමා
සියළු උපක්ලේශ ධර්මයන් දුරුකොට
නොඇලී සෙනහස් දෝෂ සිඳ දමා
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

සැපද දුකද කනපිට හරවා
පෙරවූ සොම්නස් දොම්නස් පෙරටුව ඉවත ලබන ලද්දේ
උපේක්ෂාවෙන් බලා පිරිසිදුව සමථයෙන් යුත්තේ
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

පටන් ගත් වීර්ය ඇත්තේ පරමාර්ථයේ පිහිටා
කුසීත නොවූ පැවතුමද, නොඇලෙන සිත් ඇති බවද
දැඩි වීර්යයෙන් යුක්ත වූයේ දැඩි පරාක්‍රමයෙන්
යුක්ත වූයේ කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

ධ්‍යානයේ ඇලෙන්නේ මානය දුරලන්නේය
නිතර ධර්මයේ පිහිටියේ ධර්මානුකූලව හැසිරෙන්නේය
භවයේ ආදීනව විමසා බලා
කඟවේනකු සේ හුදකලාව හැසිරෙන්නේය

තෘෂ්ණාව දුරුකොට අප්‍රමාදිව නිවන පතන,
ශ්‍රැතවත්ව සිහිබුද්ධිය ඇතිව
මුළාවට පත් නොවී, සංඛත ධර්මයන්
මැනවින් අවබෝධ කොටගෙන
කඟවේනකු මෙන් හුදකලාව හැසිරෙන්නේය

ශබ්දයන් නොඉවසන සිංහයෙකු මෙන්
දැලෙහි නොපැටලෙන වාතය මෙන්
ජලය නොඇලෙන පියුම් පත මෙන්
හුදකලාව හැසිරෙන්නේය - කඟවේනකු මෙන්

සිංහයා දත් බලය කොටගෙන රැකෙන්නේය
රජ සිවුපාවුන් මුල්කොට හැසිරෙන්නේය
නිශ්ශබ්ද සෙනසුන් ඇසුරු කරවු තොප
හුදකලාව හැසිරෙන කඟවේනකු සේ

මෛත්‍රිය, උපේක්ෂාව, කරුණාව, විමුක්තිය
මුදිතාවද සුදුසු කාලයේ සේවනය කරන්නේද
සියළු ලෝ වැසියන් විරුද්ධ නොවී පවත්නේය
හුදකලාව හැසිරෙන කඟවේනකු මෙනි

රාගයද, ද්වේෂයද, මෝහයද හැරදමා
සංයෝජන ධර්මයන්ද කඩා බිඳ දමා
ජීවිත සංකාව දුරුකර ගන්නා
හුදකලාව හැසිරෙන කඟවේනකු වැනි

යහපත පිණිස මිත්‍රයන් භජනය කරති. සේවනය කරති
නිකරුණේ මිතුරන් ඇසුර දුර්ලභය
අපිරිසිදු මනුෂ්‍යයෝ ප්‍රඥාවෙන් හසුනොවෙත්
හුදකලාව හැසිරෙන කඟවේනා මෙනි"

එහි පබෙබසු භූතෙසු යනු කඟවේනා බඳු පසේ බුදුවරු අපදාන සූත්‍රයයි කවර උපතක්ද? සියළු සූත්‍රයන්ගේ චතුර්විධ උපතක් කියත්. තමන්ගේ අදහසට අනුකූල වීම, අනුන්ගේ අදහසට අනුකූල වීම. උන් කරුණක් නිසා ප්‍රශ්නයක් විමසා පිළිතුරු තෙමේම සැපයීම වශයෙනි. එහි බග්ගවිසාණ සූත්‍රයෙහි අවශේෂ වශයෙන් පුච්ඡාවසික ප්‍රශ්නයක් නගා පිළිතුරු දීම කරුණු විශේෂයෙන් යම්හෙයකින්, මෙහි කිසියම් කිසියම් ගාථා වෙත්ද, ඒ ඒ පසේබුදු විසින් විමසන ලදුව කියන ලදී. කිසිවක් නොවිචාරණ ලද්දේද තමන්ගේ චරිතයට හා අදහස්වලට අනුරූප වූ උදානයක්මය. උදානයක් බැවින් කිසියම් ගාථාවකින් ප්‍රශ්න විමසන ලදුව කිසිවකු තමන්ගේ අදහස් වශයෙන් පහළවීම එහිදී මේ අවිශේෂ වශයෙන් ප්‍රශ්න විමසීමේ උපතයි. එය මූලපටන් මෙසේ දතයුතුය. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවාසය කරන කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තනිව වාසය කරනවිට මෙසේ චේතනාවක් පරිවිතර්කයක් පහළවිය. බුදුවරුන්ගේ ප්‍රාර්ථනාද, බෝසත්දම් පිරීමද පෙනේ යනුවෙනි. එසේ ශ්‍රාවකයන්ටද, පසේබුදුවරුන්ටද නොපෙනෙන්නේය. යම්හෙයකින් මට බුදුරදුන් වෙත එළඹ විචාරන්නෙමි. උන්වහන්සේ සමවත් සුවයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ක්‍රමයෙන් මේ කරුණ විචාළහ. උන්වහන්සේට බුදුරදුන් පෙර යෝගාවචර සූත්‍රයක් දේශනා කළ සේක. "මෙලොව පල දෙන ධර්මයන් අවබෝධ කරගැනීමෙන් පූර්ව යෝගාවචරයෙකුට ලැබෙන ආනිශංස පහකි. අඤ්ඤං අන්‍යයන් සතුටු කරවයි. නොඑසේ නම් සන්දෘෂ්ටික ධර්ම අවබෝධයෙන් සිත අන්‍යයන් සතුටු කරවයි. ඉක්බිති මරණ කාලයේ අන්‍යයන් සතුටු කරයි. අනතුරුව දේවපුත්‍රයකු සමානව අන්‍යයන් සතුටු කරවයි. අනතුරුව බුදුවරයකුගේ හමුවීමේදී වහාම අභිඥාලාභී වෙයි. තවත් පශ්චිම ආත්ම භාවයේදී පසේ බුදුවරයෙකු වෙයි යනුවෙන් වදාරා නැවත මෙසේ කීහ. ආනන්දය, පසේ බුදුවරුනම් බෝසත් ප්‍රාර්ථනා ගුණවලින් යුක්තය. පූර්ව යෝගාවචරයෝ වෙති. එහෙයින් බුදු, පසේබුදු ශ්‍රාවක සියල්ලන්ගේ ප්‍රාර්ථනාව අභිනිහාර බුදුබව පැතීම බව කැමතිවිය යුතුය. උන්වහන්සේ කීහ. ස්වාමීනි; බුදුවරුන්ගේ ප්‍රාර්ථනාවෝ කොපමණ වටීද? ආනන්දය;

බුදුවරුන්ගේ පහළට අදහසක් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද, මධ්‍යම ප්‍රමාණයේ අදහසක් අට අසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද, උපරිම උසස්ම පරිච්ඡේදනයක් සොළොස් අසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද මේ භේදය වෙනස්විය. ප්‍රඥාවෙන් අධික, ශ්‍රද්ධාවෙන් අධික, වීර්යයෙන් අධික වූවන්ට වශයෙන් දතයුතුය. ප්‍රඥාව අධික අයගේ ශ්‍රද්ධාව හීන වේ. ප්‍රඥාව ඉක්මවා ශ්‍රද්ධාව අධික වූවන්ගේ ප්‍රඥාව මධ්‍යම ප්‍රමාණ වේ. ශ්‍රද්ධාව ඉක්මවා වීර්ය අධික වූවන්ගේ ප්‍රඥාව අඩුවෙයි. වීර්යය ඉක්මවා නොපැමිණ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද දවසක් පාසා වෙස්සන්තර දාන සමාන දන් දෙන්නේ නමුත් ඒ හා බැඳුණු රූපය, සීල ආදී සියළු පාරමී ධර්මයන් පුරුදු කරන්නේ අතර බුදුවන්නේය යනු මෙබඳු තැනක් විද්‍යමාන නොවේ. කවර හෙයින්ද? ඤාණය ගැබට නොයයි. විපුල බව නොපත්වේ. පැසවීමට නොයයි. යම්සේ තුන්මාසයක්, සාර මාසයක්, පස්මසක්ද ඇවෑමෙන් නිදවන ශස්‍ය භෝග, ඒ ඒ කාලයට නොපැමිණ දවස් පතා සියක් වරක්, දහස් වරක් ගිජුවන්නේද, ජලය ඉසින්නේද, අතුරු පක්‍ෂයෙන් (මාසපෝයකින්) මාසයකින් හෝ නිපදවන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. කවර හෙයින්ද? ශස්‍යභෝග ගැබ් (කිරි) නොගනියි. විපුල බවට පත් නොවේ. පැසවීමට නොයයි. මෙපරිදි නොපැමිණ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් ඇතුළත බුදුවන්නේ යයි යන මේ කාරණය විද්‍යමාන නොවේ. එහෙයින් කියන ලද පරිදිම සුදුසු කල පාරමී පිරිම කළයුතුය, ඤාණය පිරිපුන් වීම වැඩීම පිණිස, මෙපමණ කලකින් බුදුබව ප්‍රාර්ථනා කරන්නේ බෝසත් දම් පිරීමට සමාපත්ති අටම කැමැතිවිය යුතුයි. මෙය වනාහි :

"මිනිසත් බවද, ලිංග සම්පත්තියද, ශාස්තෘවරයකු
දැකීමේ වාසනාවද, පැවිදි වීමේ ගුණ මහිමයද
බුදුවීමට කැමැත්තද යන අෂ්ට සමෝධාන
(සමාදන් විය යුතු) අභිනිහාර ධර්ම සඵල වන්නේය."

අභිනීහාරෝ යනු, මූලික ශ්‍රේෂ්ඨ කරුණු යන මෙයට විශේෂ වචනයකි. එහි මනුස්සත්තං යනු මනුෂ්‍ය ජාතියයි. මනුෂ්‍ය ජාතිය හැර අවශේෂ ජාතිවලද, දේව ආත්මයේ සිටියහු හටද අභිලාෂය සමෘද්ධ නොවේ. මෙහි සිටියහු විසින් බුදුබව ප්‍රාර්ථනා කරන්නාහු විසින් දාන ආදි පින්කම්කොට මිනිසත් බවම ප්‍රාර්ථනා කළ යුතුය. එහි සිට අභිලාෂය කළ යුතුය. මෙසේ සමෘද්ධ වේ. **ලිංග සම්පත්ති** යනු පුරුෂ බවයි. පිරිමි

කමයි. ස්ත්‍රීන්ටද, නපුංසක උභතෝ ව්‍යඤ්ජනිකයන්ටද මනුෂ්‍ය ජාතියේ සිටින්නේ නමුත් ප්‍රාර්ථනාව සඵල නොවේ. එහි සිටින්නවුන් බුදුබව ප්‍රාර්ථනා කරන්නේ නම් දානාදි පින්කම් කොට පුරුෂ බවම ප්‍රාර්ථනා කළ යුතුය. එහි සිට අභිලාෂය කළ යුතුය. මෙසේ සමෘද්ධ වේ. **හේතු** යනු අරහත් උතුමකුගේ සම්පත් ඇසුරු කිරීම යමෙක් ඒ ආත්මභාවයේ උත්සාහ කරමින් රහත් බවට පත්වීමට හැකි වේද? ඔහුගේ පණිධිය අභිලාෂය සමෘද්ධ වේ. අනෙක් අයට නොවේ. සුමේධ පණ්ඩිතයාට මෙනි. ඔහු දීපංකර පාමුල පැවිදිව ඒ ආත්ම භාවයෙන් රහත් බවට පැමිණීමට සමර්ථ විය. **සත්ථාර දස්සනං** යනු බුදුවරුන්ගේ සම්මුඛ දර්ශනයයි. එසේ සඵල වේ. නැතිනම් අන්පරිදි නොවේ. සුමේධ පණ්ඩිතයාට මෙනි. හෙතම දීපංකර බුදුරදුන් ඉදිරියේ දැක ප්‍රාර්ථනාව කෙළේය. **පබ්බජ්ජා** යනු අනගාරික ස්වභාවයයි. හෙතමද ශාසනයේ හෝ කර්මවාදියකු, ක්‍රියාවාදියෙකු, තාපසයකු, පරිබ්‍රාජක නිකායක නිරතවීම වටිය. සුමේධ පන්ඩිතයාට මෙනි. ඔහු තාපසයකු වී ප්‍රාර්ථනාව කළේය. **ගුණ සම්පත්ති** යනු ධ්‍යාන ආදි ගුණ ප්‍රතිලාභයයි. පැවිද්දාටද ගුණ සම්පත්තියෙහි පිහිටීම කැමැතිවිය යුතුය. එසේ නොවේ නම් යහපත් නොවේ. සුමේධ පණ්ඩිතයා මෙනි. හෙතම පංච අභිඥා අෂ්ට සමාපත්ති ලාභියෙකු වී බුදුවීමේ අභිලාෂය පැතීය. **අධිකාරෝ** යනු ආත්ම පරිත්‍යාගයයි. ජීවිත පරිත්‍යාගයකොට හෝ තම අභිලාෂය කැමැති වෙයි. සෙසු අයට එසේ නොවේ. සුමේධ පණ්ඩිතයා මෙනි.
ඔහු වනාහි :-

"බුදුරද, සිසුන් සමග මා මැඩගෙන වඩිවා
මඩ මත්තෙහි මා නොතැරවන්නේ නම්
මට හිත පිණිස පවතින්නේය."

මෙසේ ආත්ම පරිත්‍යාගය කොට ප්‍රාර්ථනා කළේය. **ඡන්දතා** යනු කරනු කැමැත්තයි. යමෙකුට කැමැත්ත බලවත් වේද, එය ඉෂ්ට වෙයි. කැමති වෙයි. එය ප්‍රණිධිය කොතෙක් වේද, කිසිවකු පවසන්නේද, කවරෙක් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් නිරයේ පැස බුද්ධත්වය කැමැති වේද, ඒ අසා යමෙක් මද එසේ කීමට උත්සාහ කරයිද? එම අදහස බලවත් වේයයි දතයුතුය. එසේ ඉදින් යමෙක් කියන්නේද? සියළු සක්වල චිරි චිරි ගා පැසෙන අඟුරු පිරුණේ මැඩ බුදුබව කැමැති වෙයිද? කවරෙක් සියළු සක්වල සැතින් උල්වලින් ගැවසී මැඩ බුදුබව කැමැති වෙයි. කවරෙක්

මුළු සක්වල සම මට්ටමට ජලය පුරවා උතුරුවා බුදුබව කැමැති වේද? කවරෙක් මුළු චක්‍රවාටය නිරන්තරයෙන් උණපඳුරුවලින් වසා දමමින් මඩිමින් ඉක්මවා බුදුබව කැමැති වේද? ඒ අසා යමෙක් ඒ 'මම' යයි කීමට උත්සාහ කරයිද? ඔහුගේ කැමැත්ත බලවත් යයි දතයුතුය. මෙබඳු ආකාරයෙන් කිරීමට කැමැත්තේ කැමැත්තෙන් සමන්විතව සුමේධ පණ්ඩිතයා බෝධි ප්‍රණිධිය කැමැත්ත පැතිය යනුවෙනි. මෙසේ සමෘද්ධිමත් වූ අභිනීහාර වී ඇති බෝධිසත්ත්වයෝ මේ අටළොස් අභව්‍ය ස්ථානවල නූපදියි. ඔහු වනාහි එතැන් පටන් ජාති අන්ධයෙක් නොවෙයි. ජාති බධිරෙක් නොවේ. උම්මත්තකයෙක් නොවේ. ගොළුවෙක් නොවේ. ප්‍රේතයෙකු නොවේ. ම්ලේච්ඡයන් උපදින ප්‍රදේශයේ නූපදියි. දාසියකගේ කුසේ නූපදියි. නියත මිථ්‍යා දෘෂ්ටිකයෙක් නොවේ. ඔහුට ලිංග විපර්යාසයක් නොවේ. පංච ආනන්තරිය පාපකර්ම නොකරයි. කුෂ්ට ඇත්තකු නොවේ. පශ්චිම ආත්මභාවයේ තිරිසන්ගත යෝනියේ නූපදියි. එසේ වුවද ඇතකුට වඩා බලවත් වේ.

සාපිපාසා වලින් පිරි නිජ්ඣාම තණ්හික ප්‍රේතලෝකයේ නූපදියි. කාලපේකා නම් අසුර නිකායේ නූපදියි. අවීචි නිරයේ නූපදියි. ලෝකන්තරික අපායේ නූපදියි. කාමාවචර ලෝකවලදී මාරයා නොවේ. රූපාවචර ලෝකවලදී අසඤ්ඤි භවයේ නූපදිති. සුද්ධාවාස බඹලොව නූපදියි. අරූප භවවල නූපදියි. අනෙක් චක්‍රවාටයෙහි නොසැරිසරයි. ඇවිදිය හැකි, වෑයම් කළහැකි, නොමගින් වැලකිය හැකි හිතචරියාවේ යෙදිය හැකි සතර බුද්ධ භූමියෙහි සමන්විත වේ.

"උත්සාහය වීර්ය යයි කියනු ලැබේ. මාර්ගය
ප්‍රඥාව යයි කියනු ලැබේ. මැඩගෙන යාම
අධිෂ්ඨානයයි. හිත චරියාව මෛත්‍රිය වැඩීමයි"

යයි දතයුතුය.

තවද මෙහි නෛෂ්ක්‍රම්‍යය අධ්‍යාශය තනිව සිටීමේ අධ්‍යාශය හෙවත් කැමැත්ත, අලෝභ අධ්‍යාශය අදෝෂ අධ්‍යාශය, අමෝහ අධ්‍යාශය, දුකින් මිදීමේ අධ්‍යාශය යයි අධ්‍යාශ හය බෝධිය මුහුකුරා යාම පිණිස ඉවහල් වෙති. යම්විටක නෙක්ඛම්ම අධ්‍යාශය සමන්විත වූ විට බෝධිසත්ත්වයෝ කාමයෙහි දොස් දක්නා සුළුය. පවිවේක හෙවත් හුදකලා වීමේ අධ්‍යාශය බෝධිසත්ත්වයන්ට රංචු ගැසීමේ හෝ සමූහ වශයෙන්

ඒකරාශි වීමේ දොස් දක්නා සුළු වේ. අලෝභ අධ්‍යාශයේදී බෝධි සත්ත්වයෝ ලෝභයෙහි දොස් දක්නා සුළුය. අදෝස අධ්‍යාශයේදී බෝධිසත්ත්වයෝ ද්වේෂයේ දොස් දක්නා සුළුය. අමෝහ අධ්‍යාශයේදී බෝසත්හු මෝහයේ දොස් සොයයි. නිස්සරණාධ්‍යාශයේදී බෝධිසත්ත්වයෝ සියලු භවවල දොස් දක්නා සුළුය යයි කියනු ලැබෙත්. ඒවායෙන් සමන්විත වේ යනුයි. පසේ බුදුවරු නම් කොපමණ කලක් ප්‍රාර්ථනා කරනු වටිද? පසේ බුදුවරුන්ට දෙඅසංඛ්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ මෙතරට පැමිණීමට නොහැකිවන්නේ එයට කාරණාව කියන ලද අයුරින්ම දතයුතුය. මෙපමණ තරම්වත් කාලයක් පසේ බුදුබව සඳහා ප්‍රාර්ථනා කරන්නහුගේ බුදුබවට හේතුකාරණා සම්පත් පහක් බව කැමැති විය යුතුය.

> "මනුෂ්‍යත්වය, ලිංග සම්පත්තිය, ආශ්‍රව පහකිරීමේ කැමැත්ත, අධිකාර පසේ බුදුවීමේ කැමැත්ත යන මේවා අභිනීහාර කාරණා වේ."

එහි **විගතාසවදස්සනං** යනු බුදු පසේ බුදු ශ්‍රාවකයන්ගේ යම්කිසි දර්ශනයක් ඇත යන අර්ථයයි. සෙසු කරුණු ඉහත කියන ලද පරිදිම වේ. තවද ශ්‍රාවකයන්ගේ ප්‍රාර්ථනා කොතෙක් වටිද? අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනාට එක් අසංඛ්‍ය කල්ප ලක්ෂයකි. අසූමහා ශ්‍රාවකයන්ට කල්ප ලක්ෂයකි. එසේම බුදුරදුන්ගේ මව්පියන්ම, උපස්ථායකයාට පුත්‍රයාට අනතුරුව මෙතරවිය නොහැකිය. එහි කරුණු කියන ලද පරිදිම වේ. මේ සියළු දෙනාගේම අභිලාෂය කැමැත්ත යයි, අංග දෙකකින් සමන්විත වේමය. බුදුබව පැතීම වෙයි. මෙසේ මේ ප්‍රාර්ථනාවද, මේ අභිනීහාරයෙන් යම්සේ කියන ලද කාල පරාසය තුළ පාරමීදම් පුරා ලොව බුදුවරු උපදින බැවින් ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ උපදිති. පසේ බුදුවරු ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති කුලයන්ගේ වෙනත් අග්‍ර ශ්‍රාවකයෝ වනාහි බුදුවරු මෙන් ක්ෂත්‍රිය බ්‍රාහ්මණ කුලවලම වේමය. සියලු බුදුවරු කල්ප විනාශය සිදුවන කල්පයෙහි නූපදිති. කල්ප විනාශය සිදුවන කල්පයෙහි උපදිති. එසේම පසේ බුදුවරු ඔවුහු බුදුවරු උදින කාලයෙහි නූපදිති. බුදුවරු තෙමේද අවබෝධ කරගනියි. අනුන්ටද අවබෝධ කරවති. පසේ බුදුවරු, තෙමේ අවබෝධ කරගනිති. අනුන්ට අවබෝධ කරලීමට නොහැකි වෙති. අර්ථ රසයම පිරිසිඳ දැනගනිති. ධර්මරසය නොවේ. ඔවුහු ලෝකෝත්තර ධර්ම පැනවීමට නොහැකි වෙති. එසේ පනවා ආරෝපණය

කොට දේශනා කිරීමට නොහැකි වෙති. මුගටියකු දුටු සර්පයා මෙන් වනයෙහි සැරිසරන්නකු විසින් නගරයේදී කන ලද ව්‍යඤ්ජන රසය මෙන් ඒ අයට ධර්මාභිසමය නොවේ. සියළු ඍද්ධි සමාපත්ති, පටිසම්භිදා පත්ති ආදී කොටස්වලට පැමිණෙති. ගුණයේ විශිෂ්ටත්වයෙන් බුදුවරුන්ට යටය. ශ්‍රාවකයන්ට ඉහළ වෙත්. අන්‍යයෝ පැවිදිකොට අභිසමාචාරික චාරිත්‍රාදි ශික්ෂා නොහික්මවති. අවසානයේ සිතට වද දෙන කළයුතු දේවල් වලට නොපැමිණෙත්. මෙසේ උදෙසිමෙන් උපෝෂථය කරත්. කරන්නේද, ගන්ධමාදන පර්වතයේ මදවිය ගසක් මුල රන්මළුවට රැස්ව "අද උපෝෂථ දිනයයි" වචන මාත්‍රයෙන් හෝ උපෝෂථය කරති. මෙසේ බුදුරදුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට පසේ බුදුවරුන්ගේ සියළු ආකාරයෙන් පරිපූර්ණ වූ ප්‍රාර්ථනාද, අභිනීහාරද වදාරා, දැන් මේ ප්‍රාර්ථනාද, මේ අභිනිහාරයෙන්ද සමන්විත වූ ඒ ඒ පසේ බුදුවරුන් ගැන කීමට සඛෙබසු භූතෙසු නිධාය දණ්ඩං යන ආදි න්‍යායෙන් මේ බග්ගවිසාණ සූත්‍රය දේශනා කළ සේක. මෙහි තවදුරටත් අවිශේෂයෙන් ප්‍රශ්න විචාරණ ලදුව බග්ගවිසාණ සූත්‍රයේ උපතද, දැන් විශේෂයෙන් කිවයුතුය. තවද ඒ ගාථාවේ උපතද, මෙසේ දතයුතුය. ඒ පසේබුදුරදුන් පසේ බුදු බෝසත් අවධිය පසුකරන්නේ ද්වි අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පුරා, කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ පැවිදි වී, අරණ්‍යවැසියකු වී ගතපච්චාගතවත්තං (යාම-ඒමේ වත සක්මන) පුරමින් ශ්‍රමණ දහම් කළ සේක. මෙතෙම මේ වත් නොපුරා පසේ බුදු බෝධියට පැමිණි බවක් නම් නැත. මේ යාම-ඒමේ වත නම් කුමක්ද? යාම-ආපසු ඒම වේ. එය යම්සේ මනා අවබෝධයෙන් කරයිද? එසේ කියන්නෙමු. මෙහි එක භික්ෂුවක් යයි ආපසු නොඑයි. ඇතැමෙක් පසුපස එයි. ඉදිරියට නොයයි. එහිදී යම් භික්ෂුව එතැනම නැගිට වෛත්‍ය අංගන බෝධි අංගන වත්පිළිවෙත් කරා බෝරුකට පැන් (ඉස) වත්කොට පැන්කලය පුරවාගෙන, පැන්මලුවේ තබා ආචාර්ය වත් උපාධ්‍යාය වත් ඉෂ්ටකොට අසූ දෙදහසක් අනු ශික්ෂාපද සමාදන් වී පවතියි. හෙතම ශරීර ප්‍රතිකර්ම කොට සේනාසනයට පිවිස පිඬු පිණිස හැසිරෙන වේලාව එනතුරු ඒතාක් විසිතුරු ආසනයේ හිඳ කල්යවා වේලාව දැන හැඳ පොරවා කාය බන්ධනය පටිය බැඳ, තනිපට සිවුර ඒකාංශකොට පොරවා, දෙපට සිවුර උරහිසේ දමා, පාත්‍රය අංශයකින් එල්ලාගෙන, කමටහන් මෙනෙහි කරමින් චෛත්‍ය මළුවට පැමිණ, චෛත්‍යය ද බෝධිය ද වැඳ ගම සමීපයේදී පොරවාගෙන පාත්‍රය ගෙන ගමට පිඬු පිණිස පිවිසෙයි. මෙසේ, පිවිසුණු කල්හි පින්ලාභී භික්ෂුවක් උපාසකයන් විසින් සත්කාර කරන ලද්දේ ගරුකරන ලද්දේ

උපස්ථායක කුලයේ හෝ වේවා නික්මෙන ශාලාවෙන් නික්මගොස් උපාසකයන් විසින් ඒ ඒ ප්‍රශ්න විචාරණු ලබන්නේ ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන්ද, ධර්මදේශනා පැවසීමෙන්ද ඒ මෙනෙහි කිරීම ඉවත දමා නික්මෙයි. විහාරයට ආවා වූ භික්ෂුවද ප්‍රශ්න විචරා කියයි. ධර්මය පවසයි. ඒ ඒ ව්‍යාපාර කටයුතුවලට පැමිණෙයි. පසුබත් කාලයේද, පෙරවරු කාලයේද මධ්‍යම යාමයේදීද මෙසේ භික්ෂූන් සමග ගැටී කාය ශරීර ආබාධයෙන් පශ්චිම යාමයේදී නිදයි. කමටහන් මෙනෙහි නොකරයි. මෙයට ගෙනයයි ආපසු ගෙන නොඑයි. යමෙක් රෝගාබාධ බහුල වේද, ආහාර බහුලකොට වෙයි. අළුයම් කාලයෙහි මනාකොට පූරණය නොකරයයි කලින්ම නැගිට කියන ලද ආකාර වත් හෝ කිරීමට නොහැකි වෙයි. කමටහන් හෝ මෙනෙහි කිරීමෙන් අනුන් විසින් දෙන ලද, කැඳ හෝ කෑ යුතු දෙයක් හෝ බෙහෙත් හෝ ප්‍රාර්ථනා කරන්නේ කල් ඇතිවම පාසිවුරු ගෙන ගමට පිවිසෙයි. එහි කැඳ හෝ කෑයුතු දේ හෝ බත් හෝ බෙහෙත් හෝ ලබන ලද්දේ පාත්‍රය බැහැරකොට බත් කිස නිමවා පනවන ලද ආසනයේ හුන්නේ කර්මස්ථාන මෙනෙහිකොට විශේෂයකට පැමිණ හෝ නොපැමිණ හෝ විහාරයට ගොස්, ඒ මෙනෙහි කිරීමෙන්ම වාසය කරයි. මෙයට පච්චාහරති න හරති යයි කියනු ලැබේ. මෙබඳු ආකාර භික්ෂුවක කැඳ බී විදර්ශනා වඩා බුද්ධාසනයේ රහත් බවට පැමිණ ගණන් සීමාව ඉක්මවා ගොසිනි. සිංහලද්වීපයේ ඒ ඒ ගම්වල ආපනශාලාවේ ආසන නැද්ද, එතැන භික්ෂු හිඳගෙනම කැඳ පානය කොට රහත් බවට නොපැමිණියාහ. යමෙකු ප්‍රමාද විහාරී වේද, බහා තැබූ ධුර ඇත්තේ සියළු වත් බිඳගෙන පස්වැදෑරුම් සියළු සිත් නිරවශේෂ ලෙස බැඳුණු සිත් ඇතිව වාසය කරමින් කර්මස්ථාන මෙනෙහි කිරීම නම් නුසුදුසු යයි ගමට පිඬු පිණිස පිවිස ගිහියන් සමග අල්ලාප සල්ලාපයෙන් යුක්ත වූයේ හිස් අයකු ලෙසට නික්මෙයි. මෙය නෙව හරති න පච්චා හරති යයි කියනු ලැබේ. යමෙක් කල් ඇතිව නැගිට පෙර කියන ලද අයුරින් සියළු වත් පුරවා පිඬු පිණිස හැසිරෙන වේලාව දක්වා පලඟට නැග කමටහන් මෙනෙහි කරයි. කර්මස්ථාන දෙවැදෑරුම් වේ.

1. **සබ්බපථක** - සැමතැන ප්‍රයෝජනවත්
2. **පාටිහාරියා** - පරිහරණය කළ යුතු පිළිවෙළ

එහි සබ්බපථක යනු මෛත්‍රියද, මරනානුස්සතියද වේ. එය වනාහි සියලු තැන කැමැතිවිය යුතුය. සියලු තැන සබ්බපථක යයි කියනු ලැබේ. මෛත්‍රී නම් ආවාස ආදියෙහි මෛත්‍රී විහරණයෙන් යුතු භික්ෂුව සබ්‍රහ්ම

චාරීන්ට ප්‍රිය වෙයි. මනාප වූයේ එතැන පහසුව නො ඇලී වාසය කරයි. දේවතාවන් අතර මෛත්‍රී විහරණයෙන් යුතු වූවා දේවතාවන් විසින් මනාව රකින ලදුව සැපසේ කල්ගත කරයි. රාජරාජ මහාමාත්‍යාදීන් අතර මෛත්‍රී විහරණයෙන් යුතුව ඔවුන් විසින් මගේ මගේ යන හැඟීම ඇතිව සැප විහරණය කරයි. ගම් නියම් ගම්වල මෛත්‍රී විහරණයෙන් යුතු වූවා සියළු තැන භික්ෂාචාර්යා ආදියෙහිදී මිනිසුන් විසින් සත්කාර සම්මාන කරන ලදුව සැපසේ විහරණය කරයි. මරණානුස්සති භාවනාව තුළින් ජීවිතය පිළිබඳ ඇල්ම අතහැර අප්‍රමාදීව වාසය කරයි. යමෙකු වනාහි සැමකල්හි පරිහරණය කළයුතු චර්යානුකූලව ගතයුතු දස අසුභ කසින අතර වෙනත් චතුධාතු ව්‍යවත්ථානයම සැමකල්හි පරිහරණය කළයුතුය. රැකිය යුතු වූද වැඩිය යුතු වූද දේ පාටිහාරිය යයි කියනු ලැබේ. මූලික කර්මස්ථානයම වැඩ කැමැති කුලපුත්‍රයන් විසින් ශාසනයේ පැවිදි වී දහය විස්ස තිහ හතළිහ පනහ සීය වශයෙන් එකට වාසය කරමින් සාකච්ඡාකොට වාසය කරත්. ඇවැත්නි; නුඹලා ණය නැතිව, බිය නැතිව ජීවන කරුණු නැතිව පැවිදි වූවෝ දුකින් මිදෙනු කැමැතිව පැවිදි වූ හෙයින් සංසාර ගමනේදී උපන් ක්ලේශ, ගමනේදීම ඉවත් කරවු. නිග්‍රහ කරවු. හුන් තැනේදි, යහනේදී උපන් කෙලෙස් යහනේදීම බැහැර කරවු. ඔවුහු මෙසේ කතිකාකොට පිඬු පිණිස හැසිරෙන්නෝ සැතපුම් අටකදී අඩ ගව්වක් අතරදී ගල් පර්වත වෙත්ද? ඒ පිළිබඳ සංඥාවෙන් කර්මස්ථාන මෙනෙහි කරමින්ම යති. ඉදින් කිසිවකුට ගමනේදී කෙළෙස් උපදවයිද? ඔහු එතනදීම බැහැර කරවු. එසේ කිරීමට නොහැකි වන්නකු සිටියිද? ඉක්බිති ඔහු පසුපසින් ගමන් කරමින් සිටියි. ඒ මේ භික්ෂුව ඔබට උපන් විතර්ක දනියිද? ඔබට ඒවා නුසුදුසු යයි තමන්ට ප්‍රතිවෝදනා කොට විදර්ශනාව වඩා එහිදීම ආර්ය භූමියට බැසගනියි. එසේ නොහැකි වන්නෝ සිටිත්ද? අනතුරුව ඔහුට පසුව යන්නාහු හිඳියි. ඔහුට හෝ ආර්ය භූමියට බැස්සවීමට නොහැකි වන කල්හි ඒ කෙලෙස් ක්ෂයකොට කමටහන් මෙනෙහි කරමින්ම යයි. කමටහන් නැද්ද? ඉක්බිති ඔහු පසුපසින්ම ගමන් කරයි. ඔහු මේ භික්ෂුව ඔබට උපන් විතර්ක දනියි. කෙළවර ඒවා නුසුදුසු යයි වෙන්කොට හඳුනාගැනීමෙන් පා බිම තබා පෙරළා නැවතී පෙර මුල් ප්‍රදේශයටම යයි. ආලින්දවැසි මහාඵුස්සදේව තෙරුන් මෙනි. උන්වහන්සේ වර්ෂ දහනවයක් පුරා යාම-ඒම වත් පුරමින්ම වාසය කළ සේක. මිනිස්සුද අතරමග සී සාමිනේර, වපුරමින් ද, මඩිමින් ද ක්‍රියා කරමින් තෙරුන් එසේ ගමන් කරනු දැක මේ තෙරුන් නැවත නැවත නැවතී ගමන් කරති. කිමෙක්ද මංමුළා වූයේද, නැතහොත් කිසියම්

අමතක වීමක්ද? විමසා බලන්නේ උන්වහන්සේ එය නොබලා කර්මස්ථානයෙන් යුතු වූ සිතින් ශ්‍රමණ දහම් කරමින් විසිවර්ෂයක් ඇතුළත රහත් බවට පැමිණි සේක. රහත්බවට පැමිණි දිනයේ උන්වහන්සේගේ සක්මන කෙළවර අධිගෘහිත දේවතාවෝ ඇඟිල්ලෙන් දී පහනක් දල්වා සිටියාහ. සතරවරම් මහරජවරුද, දෙවියන්ට අධිපති ශක්‍රයාද සහම්පති බ්‍රහ්මයාද, උපස්ථානයට ආවාහුය. ඒ ආලෝකය දැක වනවාසී තිස්ස තෙරුන් ඒ දෙවෙනි දිනයේ විචාළේය. රාත්‍රී කාලයේ ආයුෂ්මතුන් සමීයේ ආලෝකයක් විය. ඒ ආලෝකය කිම? තෙරුන් විස්තර කරන්නේ, ඔහාස යනු පහනයි. ආලෝකය වෙයි. මාණික්‍ය ආලෝකයද වෙයි. මේ ආදිය කිහ. ඔහු ඔබටද පිළිවදන් දෙවූ. මෙහෙයවන ලදුව එසේ යයි පිළිගෙන දැනුම් දුන්නේය. කලුවැල් මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙනි. උන්වහන්සේද යාම-ඒම වත පුරන්නේ පළමුව බුදුරදුන්ට මහා ප්‍රධාන පූජාව කරමියි වර්ෂ සතක්ම එකතැන ඇවිදිමින්ම සිටීමට අධිෂ්ඨාන කළ සේක. යළිත් සොළාස් වියේදී යාම-ඒම වත පුරා රහත් බවට පැමිණියේය. මෙසේ කර්මස්ථාන සුදුසු වූ සිතින්ම සිත් නොකැළඹෙන සිතින් යුතුව පෙරළා එමින් ගම සමීපයට ගොස් යමිද? පැවිදි වෙමිදැයි සැක නොමැතිව සුදුසු තැන සිට සඟල සිවුර පොරවා පාත්‍රය ගෙන ගම්දොරට පිවිස කුණු වලකින් ජලය ගෙන කට පුරවාගෙන ගමට පිවිසෙයි. ආහාර දීමට වැඳීමට හෝ සමීප වූ කල්හි මිනිසුන්ට දීර්ඝායුෂ වේවා! වචන මාත්‍රයෙන් මගේ කර්මස්ථානය විපිළිසර නොවේවා'යි ඉදින් ස්වාමිනි, අද සත්වෙනිදාද නැතහොත් අටවෙනිදාදැයි විචාරන්නේ ජලය ගිලී දන්වයි ඉදින් දවස අසන්නකු නොමැති නම් නික්මෙන වේලාවේ ගම්දොර සිට යයි. ලක්දිව ගලම්බ තොට විහාරයෙහි වස් සමාදන් වූ පනහක් පමණ භික්ෂූන් මෙනි. ඔවුහු වනාහි වස් එළඹෙන පෝය දවසෙහි රහත් බවට නොපැමිණ මිස ඔවුනොවුන් කථාබහ නොකරන්නෙමුයි සාකච්ඡා කළහ. ගමට පිඬු පිණිස පිවිසෙන්නෝ ගම් දොරටුවේදී ජලය ගෙන කට පුරවාගෙන පිවිසියහ. දිනක විචාරණ කල්හි ජලය ගිල දැන්වූහ. නොවිචාරණ කල්හි ගම්දොරටුව සිට විහාරයට ගියහ. එහි මිනිස්සු නැවතී සිටිනු දැක දැනගත්හ. අද එකකු ආවේය. අද දෙදෙනෙකු යයි මෙසේ සිතූහ. කුමක් නිසා මේ උතුමෝ අප සමග කථා නොකරත්ද? නැතහොත් ඔවුනොවුන් ඔවුනොවුන් සමග කථා නොකරත්ද? ඒකාන්තයෙන් කලහයක් උපන්නේ වන්නාහ. යළිදු ඉදින් ඔවුනොවුන් ක්ෂමා කරන්නෙමුයි, සියල්ලෝ විහාරයට ගියහ. එහි පනහක් පමණ භික්ෂූන් වස් සමාදන්ව සිටිනකල්හි, භික්ෂු දෙනමක් එකවිට ශබ්ද නොකළහ.

අනතුරුව ඔවුන් අතර සිටි බලාසිටින මිනිසකු මෙසේ කීවේය. පින්වතුන් කලහ කරගනිමින් සිටින නිසා මෙබඳු වේද, මටසිලිටු චෛත්‍ය මළුවටද, බෝධිමළුවටද රැස් වූවෝ අතුපතු ගෑම් ආදිය සිදුකොට පැන් ආදී පූජා වස්තු ගෙන එති. ඔවුහු අනතුරුව නතරවී ඒ භික්ෂූහු වස්කාලය තුළදීම විදර්ශනාව වඩා රහත් බවට පැමිණ මහා පවාරණයෙන් පිරිසිදුව පවාරණය කළහ. මෙසේ කාලවල්ලි මණ්ඩපවාසී මහානාග තෙරුන් මෙනි. කර්මස්ථානයෙන් යුතු සිතින් පා ඔසවමින් ගම සමීපයට පැමිණ ජලය උගුරක් ගෙන සුරාසොඬුන් ධූර්තයන් කලහකරුවන් මෘග ඇතුන් අශ්වයන් නැති වීදියක් සලකාගෙන ඒ වීදියට පිවිසෙයි. එහි පිඬු පිණිස හැසිරෙමින් ඉක්මන් ඉක්මන් නොවී ගමන් කරයි. ඉක්මන් පිණ්ඩපාත ධුතාංගයක් නම් නැත. විෂම භූමි ප්‍රදේශයකට පැමිණි ජල කරත්තයක් මෙන් නිශ්චලව සිට යයි. අනුපිළිවෙළින් ගෙදොරට පිවිසියේද, දියයුතු නොදිය යුතු දේ සැළකීමට ඒ හා සමා කාලයක් පැමිණෙන්නේ භික්ෂාව ගෙන සුදුසු පරිදි ටික වේලාවක් හිඳ, කමටහන් මෙනෙහි කරමින්, ආහාරයෙහි පිළිකුල් සංඥාව උපදවා ඉන්ද්‍රියයන් බිඳන ආලේපන රස මස් මාංශ නොවන බව ප්‍රත්‍යවේක්ෂා කරමින් අංග අටකින් සමන්විත ආහාරයක් ගෙනාවේ යයි "දහනය පිණිස නොව, මදය පිණිස නොව, වළඳන්නෙමියි" ඊට සුදුසු යයි, ජලකෘත්‍ය කොට, මොහොතක් බත් ක්ලාන්තය දුරුකොට, පෙරබත් කාලය, සවස්වරුව, පළමුයාමය, මැදියම, මධ්‍යම යාමය ද වශයෙන් කමටහන් මෙනෙහි කරයි. මෙයට හරති, ගෙනඒමද පච්චාහරති පසුපස ඒමද යයි කියනු ලැබේ.

මෙපරිදි ගෙනඒම වැළඳීම යාම-ඒම ආදියද කියනු ලැබේ. මෙය පුරනා විට ඉදින් වාසනාවේද, සම්පත් වේද, පළමු වයසේදීම රහත් බවට පැමිණෙයි. නොමැතිනම්, මධ්‍යම වයසේ පැමිණෙයි. මධ්‍යම වයසේ නොපැමුණේ නම් අනතුරුව මරණ සමයේ වේ. මරණ සමයේ නොපැමිණේ නම් අනතුරුව දේවපුත්‍රයකු වී, දේවපුත්‍රයෙකු නොවූයේ නම් පසේ බුදුවරයෙකු වී පිරිනිවන්පාති. අනතුරුව බුදුවරුන්ගේ ඉදිරියේ වහාම අභිඥාලාභී වෙයි. බාහිර තෙරුන් මේ සාරිපුත්ත තෙරුන් මෙන් මහා ප්‍රාඥ වෙයි. මේ පසේ බෝධිසත්ත්වයන් කස්සප බුදුරදුන්ගේ ශාසනයේ පැවිදි වී අරණ්‍යගතවී වර්ෂ විසිදහසක් යාම-ඒම වත පුරා කලුරියකොට කාමාවචර දෙව්ලොව උපත ලැබීය. එතැනින් චුතවී බරණැස රජුගේ අගමෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. පින්වන්ත ස්ත්‍රීනු එකෙණෙහි ගැබ් ගැනීම දැනගනිත් ඇලා අන් අයට වඩා වෙනස්.

එහෙයින් ඇයද ඒ ගැබ් ගැනීම රජුට දැනුම් දුන්නාය. මේ ස්වභාව ධර්මතාවයෙන් යම් පුණ්‍යවන්ත සත්ත්වයකු ගැබ් ගනියිද, මාගම ගැබ් පෙළහර ලබයි. එහෙයින් රජු ඇයට ගැබ් පෙළහර දුන්නේය. ඇය එතැන් පටන් ඉතා උණු කිසිවක් ලබා නොගනියි. අති ශීතල, ඉතා ඇඹුල්, ඉතා ලවණැති ඉතා කටුක, ඉතා තිත්ත, ඉතා උෂ්ණ කිසිවක් නොලබයි. ඉතා උෂ්ණ දෙයක් මව ගත් කල්හි ගර්භයට රත්කළ ලෝහ හැළියක් මෙන් වෙයි. ඉතා ශීතල දෙයක් ගත්විට, ලෝකාන්තරිකයේ වාසය කිරීම මෙනි. ඉතා ඇඹුල්, ලුණු කටුක තිත්ත දේවල් අනුභව කළ කල්හිද, ආයුධයකින් පලා ඇඹුල් දේවල් ඉසින්නාක් මෙනි. දරුවාගේ ශරීරය දැඩි වේදනා ඇතිවෙයි. ඉතා සක්මනද, හිඳීම, සයනාදියද වලකති. කුස තුළ සිටින්නාට සෙළවීමේ දුකක් නොවේවා'යි මෘදු ඇතිරිලි ආදිය ඇති බිමෙහි සක්මන්කිරීම් ආදියද ලබයි. ඒවා පිළිගෙන ඇය සක්මන් කරන්නී, හිඳින්නී, නැගිටින්නී ඇය මෙසේ පරිහරණය කරනාවිට ගැබ මුහුකුරා ගියකල සූතිකාගාරයට පිවිස අළුයම් කාලයේ පුතකු වැදුවාය. සපුතෙල් පිරිමැදූ මනෝසිලා පිණ්ඩයක් මෙන් පුණ්‍යවන්ත වාසනා ගුණයෙන්ද යුක්ත විය. ඉක්බිති ඔහුට පසුදිනයේ අලංකාරයෙන් සරසා රජුට පෙන්වූහ. රජතුමා සතුටුව හැටහයක් කිරිමවුවරුන් එළඹවිය. ඔහු සියළු භූමි සම්පතින් වැඩෙන්නේ නොබෝ කලකින්ම බුද්ධිමතකු බවට පත්විය. අවුරුදු දාසයේදී ඒ රජු රාජ්‍යයෙන් අභිෂේක කරනු ලැබිය. විවිධ නාටකවලින්ද පමුණුවනු ලැබිය. අභිෂේක කරන ලද රාජපුත්‍රයා, රාජ්‍යය කරන්නේ මුළු ඉන්දියාවේ විසිදහසක් නගරවල බ්‍රහ්මදත්ත යයි නමින් ප්‍රකට විය. ජම්බුද්වීපයෙහි පෙර අසූහාර දහසක් නගර වූහ. ඒවා පිරිහීමෙන් හැටක් වූහ. අනතුරුව පිරිහෙමින් සතළිහක්ද, සියල්ල පිරිහෙන කල්හි විස්සක් වෙති. මේ බ්‍රහ්මදත්තද සියල්ල පිරිහෙන කාලයේ උපත ලැබිය. ඒ නිසා ඔහුට විසිදහසක් නගර, විසිදහසක් ප්‍රාසාද, විසිදහසක් ඇත්තු, විසිදහසක් අශ්වයෝ, විසිදහසක් රථද, විසිදහසක් භාජනද, විසිදහසක් අන්තඃපුර නාටක ස්ත්‍රීනු ද, විසිදහසක් ඇමතියෝ ද වූහ. ඔහු මහා රාජ්‍යය කරනු ලබන්නේ කසිණ පිරිකම්කොට පංච අභිඥාද, අෂ්ට සමාපත්තිද ලදද යම්හෙයකින් අභිෂේක ලද රජු විසින් අවශ්‍යයෙන්ම අධිකරණ විනිශ්චයෙහි සිටිය යුතුය. එහෙයින් එක දවසක් උදෑසනම වළඳා විනිශ්චය ආසනයේ හුන්නේය. එහිදී උස්හඬද, මහා ශබ්ද ද, කළහ. හෙතම මේ ශබ්දය සමාපත්ති කෙලෙස්වලින් අපිරිසිදු වූයේ යළි ප්‍රාසාද මතු මහලට නැගී සමාපත්ති පිහිටන්නේ නම් මැනවැයි හිටීමට නොහැකි විය. සිටීමට රාජ්‍ය කලබලයෙන් සමාපත්ති පරිහානියට පත්වූයේ යයි සිතුවේය. කිම

රාජ්‍යය උතුම්ද? ශ්‍රමණ ධර්මය උතුම්ද? අනතුරුව රාජ්‍ය සැපයේ මහා නොයෙක් ආදීනවද, ශ්‍රමණ ධර්මය වනාහි විපුල වූ මහත් ආනිශංස යයිද උතුම් පුරුෂයන් විසින් සෙවුනා ලද බවද දැන අණ කළේය. මේ රාජ්‍යය දැහැමින් සෙමින් විචාරව. අධර්මයෙන් එසේ නොකරවව. සියල්ල ඔහුට පවරා දී ප්‍රාසාදයට නැග සමාපත්ති සුවයෙන් කල් යැවීය. කිසිවකු සම්පවිමට නොලබයි. වෙනත් මුවධෝවන දැහැටිකුරු බත් සැපයීමාදියද, අනතුරුව අඩමසක් ඉක්ම ගියතැන මෙහෙසිය විචාලේය. රජු උයන්ගමන දර්ශන නාටකාදියද කිසිවකු නොපෙනේ. කොහේ ගියේදැයි ඔහුගෙන් විචාලහ. ඇය ඇමතියාට කීවාය. රාජ්‍යය අත්හළ කල්හි, මම ද, ප්‍රතික්ෂේප කළේ වෙමි. පැමිණේවා. මා සමග සංවාසයේ නිරත වේවා! හෙතම කන් දෙක වසාගෙන නොඇසුණු විලාශයෙන් ප්‍රතික්ෂේප කළේය. ඇය යළිත් දෙතුන්වරක් යවා නොකැමැත්තේ තර්ජනය කළාය. ඉදින් නොකරහි නම් තනතුරෙන් ඔබව පහ කරමි. තොපේ ජීවිතයද තොරකරමි. ඔහු බියට පත්වූයේ මාගම නම් දැඩි නිශ්චය ඇත්ති, කිසි දිනක මෙසේද කරවනු ලබන්නි යයි, එක දවසක් රහසේ ගොස් ඇය සමග සිරියහනේ සංවාසය කළේය. ඇය පුණ්‍යවන්තය. සුව ස්පර්ශයෙන් යුක්තය. ඔහු ඇගේ ස්පර්ශ රාගයෙන් රත්වූයේ එහි නිතර සැක නොහැර ගියේය. ක්‍රමයෙන් තමන්ගේ ගෙදර සැමියා මෙනි. නිසැකවම පිවිසීමට පටන්ගත්තේ, ඉක්බිති, රජගෙදර මිනිස්සු ඒ පුවත රජුට දැනුම් දුන්හ. රජු විශ්වාස නොකරයි. දෙවනුවද, තෙවනුවද දැන්වූහ. ඉක්බිති සැඟවී සිට තමන්ම දැක, සියළු ඇමතියන් කැඳවා දැනුම් දුන්නේය. ඔවුනු මොහු රාජ අපරාධකරුවෙකි. අත කැපීම සුදුසුය. පා කැපීම සුදුසුය. උලේ තැබීම සුදුසු යයි, සියළු කටයුතු නිර්දේශ කළහ. රජු, මොහුට වධබන්ධනාදිය දීමෙන් මට හිංසා උපදවන්නේය. ජීවිත නැසීමේදී ප්‍රාණඝාතය සිදුවන්නේය. ධනය පැහැර ගැනීමේදී සොරකම වන්නේය. මෙබඳු ආකාර කරනවුන් විසින් මේ මගේ රාජ්‍යයෙන් ඉවත් කරවු යයි කීවේය. ඇමතියෝ එම කටයුතු කළහ. ඔහු තමන්ගේ ධනයද, අග්‍රිදරුවෝද, රැගෙන වෙනත් ප්‍රදේශයකට ගියේය. එහිදී රජතුමා අසා කුමකට ආවේදැයි විචාලේය. ඇමතියා කිහිපවිටක් ඇවැමෙන් ලද විශ්වාස ඇත්තේ ඒ රජුට මෙසේ කීවේය. මහරජ, මැස්සන් රහිත මී දකිමි. එය අනුභව කරන්නෙක් නැත. රජු එයට කවටකම් කරනු කැමැත්තේ කියවයි නොඅසයි. හෝ ඉඩක් ලැබ නැවතද මැනවින් වර්ණනාකොට දැන්වීය. බරණැස රාජ්‍යය දෙවයි විචාලේය. රජු, කිම, මා හැරදමා මරනු කැමැත්තේ රජු කිම මෙහි පැමිණියේදැයි කීවේය. දේවයන් වහන්ස, එසේ නොකියව. ඉදින් විශ්වාස

නොකරහි නම්, මිනිසුන් යවවයි, ඔහු මිනිසුන් යැවීය. ඔවුහු ගොස් දොරකොටුව හාරා රජුගේ යහන් මැදුරේ නැගී සිටියහ. රජු දැක කෙසේ ආවහුදැයි විචාලේය. මහරජතුමනි, අපි සොරු වෙමු. රජු ඔවුන්ට ධනය දී නැවත එසේ නොකරවු යයි, අවවාද දී පිටත් කළේය. ඔවුහු පැමිණ ඔහුගේ රජුට දැන්වූහ. ඔහු නැවතත් දෙතුන්වරක් එසේම විමසා සිල්වත් රජු තියුණු නොවේ යයි, චතුරංගනී සේනාව සන්නද්ධ කරවා, සීමාව ආසන්නයේ එක් නගරයකට පැමිණ, එහි ඇමතියාට කීවේය. නගරය මට දෙව. නැතිනම් යුද්ධ කරමි. ඔහු බ්‍රහ්මදත්ත රජුට ඒ කරුණ දැනුම් දුන්නේය. දේවයන් වහන්ස, අණ කෙරේවා! කිම යුද කරමිද? නගරය දෙමිද? රජු යුද නොකළ යුතුය. නගරය දී මෙහි පැමිණෙවු යයි පණිවිඩ යැවීය. ඔහු එසේ කළේය. යුවරජුද, ඒ නගරය අල්ලාගෙන අවශේෂ නගරවලටද එසේම දූතයකු යැවීය. ඒ ඇමතියෝද, එසේම බඹදත් රජුට යවා, යුද්ධ නොකළ යුතු යයි, මෙහි පැමිණිය යුතු යයිද, කියන ලදින් බරණැසට ආවාහුය. ඉක්බිති ඇමතියෝ බඹදත්ට කීවාහුය. මහරජ, ඔහු සමග යුද්ධ කරමුයි, රජු මා ප්‍රාණඝාතකයකු වන්නේ යයි, ඇමතියා වැලැක්වීය. මහරජ, අපි ජීවග්‍රහයෙන් නොගෙන මෙහිම ගෙන එන්නෙමුයි බොහෝ උපායවලින් රජුට හඟවා, මහරජ; එවයි, යාමට පටන් ගත්තෝ, රජු, ඉදින් සතුන් මැරීම, මංකොල්ලකෑම, මංපැහැරීම නොකරවු නම්, එමියි, ඇමතියෝ දේවයනි, බිය දක්වා පලායමුයි, චතුරංගනී සේනාව සන්නද්ධකොට කලවල පහන් දමා අඳුරට ගියහ. යුවරජු ඒ දවස බරණැස සමීපයේ නගරයක් ගෙන දැන් කිම රාත්‍රියේ සන්නාහ මුදවා ප්‍රමාද වී බලකාය සමග නින්දට වැටුණි. ඉක්බිති ඇමතියෝ බරණැස් රජු අල්ලාගෙන, යුවරජුගේ කඳවුරට ගෙනගොස් සියළු කලවලින් පහන් ඉවත්කොට එක හඬින් සේනාවට ශබ්ද කළහ. යුවරජුගේ ඇමතියා මහසෙනග දැක, බියට පත්වූයේ තමන්ගේ රජු වෙත එළඹ, නැගී සිටියේය. මැසි රහිත මීවද අනුභව කරන්නැයි මහහඬින් ශබ්ද කළේය. දෙවනුවද, තෙවනුවද එසේය. යුවරජු ඒ ශබ්දයෙන් අවදි වී බිය සන්ත්‍රාසයට පත්විය. මහ හඬින් ඝෝෂාද කළහ. ඔහු අනුන්ගේ වචන අසා සතුරු අතට පත්වූයෙමියි, රාත්‍රිය මුලුල්ලේ, ඒ ඒ විලාප හඬ නගා දෙවැනි දිනයේ, ධාර්මික රජු වලකින්නේ යයි ගොස් ක්ෂමා කරමියි සිතා, රජු වෙත එළඹ, දණිස්වලින් පිහිටුවා, ක්ෂමා වන්න මහරජ, මා අපරාධයක් කළේ යයි කීවේය. රජු ඔහුට අවවාද දී, නැගිටින්න. ක්ෂමාව දෙමියි කීවේය. ඔහු රජු විසින් එසේ කී කල්හිම පරම විශ්වාසයට පැමිණියේ විය. බරණැස් රජුගේ සමීපයේම ජනපදයෙක රාජ්‍යය ලැබීය. ඔවුහු ඔවුනොවුන්

සහායකව වූහ. ඉක්බිති බඹදත් රජුද සේනා දෙක සතුටු කථාබහින් එකට සිටිනු දැක එකඟවීම මගේ සිත රැකීම පිණිසම වේ. මේ මහජනකායෙහි කුඩා මැසි මදුරු මාතුයකුදු ලේ බිඳුවක් නොහටගනියි යයි අනේ යහපත! අනේ හොඳයි යයි සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා! අවෙරී වෙත්වා! අවිහිංසා වෙත්වා! යි මෛත්‍රී ධ්‍යානය උපදවා එයම පාදක කොට සංස්කාර මෙනෙහිකොට පසේබෝධි ඥානය සාක්ෂාත් කොට ස්වයම්භූ ඥානයට පත්විණි. හේ මාර්ග සුවයෙන්ද ඵල සුවයෙන්ද සැපසේ ඇතුපිට සිටින ඇමතියෝ නමස්කාරකොට කීවානුය. සුදුසු කාලයයි මහරජ; දිනන ලද බලකායට සත්කාර කළ යුතුය. පරාජිත බලකායට බත් වැටුප දිය යුතුයයි ඔහු කීවේය. බොල රජතුමනි, මම පසේ බුදුවරයෙකු නොවෙමි. රජතුමා කුමක් නම් කියයිද? මෙබඳු ආකාර පසේබුදුවරු නොමැත. බොල, පසේ බුදුවරු කෙබඳු ආකාරයක්ද? පසේ බුදුවරු නම් අඟල් දෙකක් පමණ කෙස්රවුල් ඇති, අටපිරිකර වලින් සමන්විත වර්ෂ සියයක් පිරුණු තෙරුන් කෙනෙකු සමානය. හෙතම සතර ධ්‍යාන සමාදන් වී ඇතු පිටින් වේහාස පර්වතයෙන් අහසට පැන නැග, පියුමක් මත්තෙහි වැඩ හුන්නේය. ඇමතියෝ වැඳ, කිම ස්වාමීනි; කමටහන් කෙසේ අධිගම කළේදැයි විචාළහ. හෙතම මෙපමණ මෛත්‍රී ධ්‍යාන කමටහන් විය. එයද විදර්ශනා වඩා ලබාගත්තේ, එහෙයින් ඒ අදහස දක්වමින් උදාන ගාථාවද ව්‍යාකරණ ගාථාවද මේ ගාථාවද කී සේක.

මැණික් ගුහා රිදී ගුහා යනු එහි මැණික් ගුහා දොරටුවෙහි මංජුසක නම් ගසකි. යොදුනක් උසය. යොදුනක් පළලය. එය යම් පමණ ගොඩබිම හා ජලයෙහි පිපිය යුතු මල් පිපෙත්. ඒ සියල්ල පිපෙයි. විශේෂයෙන් පසේ බුදුවරුන්ගේ ගමන් දිනයේ ඒ ගස ඉදිරියේ සියල්ල රතුමල් වෙයි. එහි අතුගා දමන කුණුරොඩු විසිකරයිද, වාතය හමා යාමෙන් රුවන්මය වැල්ලට සමාන වෙයි. සුළං හමා යාමෙන් අනෝතප්ත විලෙන් ජලය ගෙනවිත් එහි ඉසියි. සුවඳවත් කිරිමේදි, හිමාලයෙන් සියලු සුවඳ ගස්වල සුවඳ ගෙනඑයි. පිපිවන සුළඟින් මල්කඩා බිම හෙළයි. අතුරණ වාතයෙන් සියලු තැන අතුරවයි. සැමකල්හි පනවන ලද්දා වූම ආසනයෝ වෙති. යම් පසේ බුදුවරයෙකු උපදින දිනයෙක පෙහෙවස් දිනයකද, සියලු පසේ බුදුවරු රැස්වී වැඩසිටිති. මේ එහි ස්වභාවයයි. මේ පසේ බුදුරජ එහි ගොස් පනවන ලද ආසනයේ වැඩසිටිති. ඉක්බිති, ඉදින් ඒ කාලයේ වෙනත් පසේ බුදුවරුද විද්‍යමාන වෙත්. උන්වහන්සේද එකෙණෙහිම රැස්වී පනවන ලද ආසනවල හිඳිති. වැඩහිඳ, කිසියම් සමවතක් සමාදන් වී

නැගී සිටිති. අනතුරුව සංඝ ස්ථවිර, දැන් පැමිණි පසේ බුදුරදුන්ට සියල්ලට අනුමෝදනා පිණිස කෙසේ අධිගමවේදැයි, මෙසේ කමටහන් විචාරයි. එකල්හි ඔහු එයම තමන්ගේ උදාන ව්‍යාකරණ ගාථා කියයි. නැවත භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් විමසන කල්හි එම ගාථාවම වදාරයි. ආනන්ද තෙරුන්ද, සංගීතියට වදාළ සේක. මෙසේ එක එක ගාථා සේ බුදුන් අභිසම්බෝධියට පැමිණෙන තැනෙක්හි දිව්‍ය වෘක්ෂයක්හි මුල, සිට ආනන්ද තෙරුන් විසින් විචාල කල්හි, සතරවරක් සංගීති කළේ යයි කියන ලද්දේ වෙයි.

පළමු ගාථා වර්ණනාව සමාප්තයි.

1-2

සංසගම ජාතසස යන ගාථාවේ ආරම්භය කුමක්ද? මේ පසේ බුදුවරයාද කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ විසිදහසකට පෙර කියන ලද අයුරින්ම මහණදම් කරමින්, කෙළවර කසින ආරම්මණය කොට ප්‍රථමධ්‍යානය උපදවා, නාම-රූප පරීක්ෂා කර බලා ලකුණු මෙනෙහිකොට අරියමාර්ගය නොලැබ බඹලොව උපන්නේය. ඔහු එයින් චුත වූයේ, බරණැස් රජුගේ අගමෙහෙසියගේ කුසෙහි ඉපිද, පෙර පරිදිම වැඩෙන්නේ එතැන් පටන් මේ ස්ත්‍රියකි. මේ පුරුෂයෙකි. විශේෂ දැනගත්තේය. එසේ කොට කිරිමව්වරුන්ගේ අත්වල නොසතුටු වෙයි. සෝදන නාවන සරසන මොහොතවත් හික්මී නොසිටියි. ඔහුව පිරිමිම පෝෂණය කරති. කිරිදොවන කල්හි, කිරි මවුවරු සැටියට පිවිසවා පුරුෂ වේශයෙන් කිරි පොවත්. ඔහු ස්ත්‍රීන්ගේ සුවඳ ආඝ්‍රාණය කොට ශබ්දයක් හෝ අසා අඬයි. නැණ පැමිණි ස්ත්‍රීහුද, දැකීමට නොකැමැති වේ. එයින්ද ඒ ස්ත්‍රී සුවඳ යයි දැනගත්හ. ඔහු වර්ෂ දාසය උදාවූ කල්හි රජු කුලවංශය තබන්නෙමියි නොයෙක් කුලවලින් ඔහුට සුදුසු වූ කන්‍යාවන් ගෙනවිත් එක්තරා ඇමතියෙකුට අණ කළේය. කුමාරයා සතුටු කළ මැනවි යනුවෙනි. ඇමතියා උපායෙන් ඔහු සතුටු කරනු කැමැත්තේ ඔහුට නුදුරෙහි කානුවක් සහිත ප්‍රාකාරයකින් වටකොට නාටකාදිනු යෙදවීය. ඇමති කුමරා ගීත වාදන ශබ්දය අසා, මේ කවරකුගේ ශබ්දයක්දැයි කීවේය. දේවයන් වහන්ස, මේ නාටක ස්ත්‍රීන්ගේ ශබ්දයයි. පුණ්‍යවන්තයන්ට මෙබඳු වූ නාට්කාවෝ වෙති. දේවයන් වහන්ස, සතුටුවන්න. නුඹ මහ පින්වන්තයකැයි කීවේය.

කුමාරයා ඇමතියාව දණ්ඩකින් තළා පෙළා ඉවතට ඇද දැමීය. ඔහු රජුට දැනුම් දුන්නේය. රජු කුමරුගේ මව සමග ගොස්, කුමරු ක්ෂමා කොට, නැවත ඇමතියා කැඳවීය. කුමරු ඔවුන් විසින් නොපෙළනු ලබන්නේ, රන්කරුවන් කැඳවා, වටිනා මැණික් දී, සුන්දර ස්ත්‍රී රූපයක් කරවු යයි ඔවුන්ට අණ කළේය. විශ්වකර්මයා විසින් නිර්මාණය කළ සමාන සියළු ආකාරයෙන් අලංකාර වූ ස්ත්‍රී රූපයක් කොට පෙන්වූහ. කුමරු දැක විස්මයෙන් හිස සොළවා, මව්පියන්ට යැවීය. ඉදින් මේ ආකාර ස්ත්‍රියක් ලබමි. ගන්නෙමියි මව්පියෝ අපේ පුතා මහා පින්වන්තයෙකි. අවශ්‍යයෙන්ම ඔහු සමග කළ පින් ඇති කිසියම් දැරිවියක ලොව උපන්නේ වන්නේ යයි ඒ රන් රූය රථයක නංවාගෙන, ඇමතියන්ට පත්වූ නියෝග කළහ. යවු! මෙබඳු ආකාර දැරිවියක සොයවු! යයි ඔවුහු එය ගෙන සොළොස්මහා ජනපදයෙහි හැසිරෙන්නේ ඒ ඒ ගමට පැමිණ, දියතොටුපොළ ආදි යම් යම් ජන සමූහය රැ දකිත්ද, ඒ ඒ තැන දේවතාවියක මෙන් එම රන් රූපය තබා, නොයෙක් මල්, වස්ත්‍රාදියෙන් පූජාකොට වියනක් බැඳ එකත්පසක සිටිත්. ඉදින් කිසිවකු විසින් මෙබඳු ආකාර කෙනෙකු දක්නා ලද්දේ නම්, ඔහු වහාම පැමිණිය යුතු වන්නේ යයි මේ උපායෙන් මදුරට සියලු ජනපදවල ඇවිද එය කුඩා රටක් යයි නොසිතමින් එහි පළමුව පැමිණ නැවතුනහ. ඉක්බිති ඔවුන්ට මෙබඳු අදහසක් පහළවිය. මදුරටට යමුද, නැතහොත් බරණැසට නොපිවිසෙවු. රජු නැවත එවිය යයි මද්ද රට සාගල නුවරට ගියහ. සාගල නුවර මද්දව නම් රජුගේ දියණිය සොළොස්විය සපුරා මනා රූ ඇත්තී වූවාය. ඇගේ පරිවාර දාසියෝ ජලස්නානය පිණිස තොටුපොළට යන්නී, එහි ඇමතියන් විසින් තබන ලද, ඒ රන් රූපය දුරසිටම දැක අපව ජලයට යවා රාජ දියණිය තනිවම ආවා යයි කථා කරමින් සමීපයට ගොස්, මේ අපේ ස්වාමී දියණිය නොවේ. අපේ ස්වාමී දියණිය මීට වඩා ලස්සන යයි කීවාහුය. ඇමතියෝ එය අසා, රජු වෙත සපැමිණ සුදුසු ආකාර දැරියක ඉල්ලූහ. ඔහුද දුන්නේය.

ඔවුහු බරණැස රජු වෙතට පැමිණවූහ. රජතුමනි, කුමාරිකාවක ලැබුවෙමු. ඇයම පැමිණෙයිද, නැතහොත් අප රැගෙන එමුද? ඔහු දමා යන කල්හි ජනපද පීඩාව වන්නේය. නුඹලාම ඇය රැගෙන එවු යයි යැවීය. ඇමතියෝ දැරිය ගෙන නුවරින් නික්ම, කුමාරයාට පෙන්වූහ. ලද්දේ රන්වන් කුමාරිකාවකැයි, කුමරා අසාම, රාගයෙන් මැඩුණේ, ප්‍රථම ධ්‍යානය පිරිහුණි. ඔහු දූත පරම්පරාව යැවීය. වහා රැගෙන එවු. වහා

රැගෙන එවූ. ඔවුහු සියළු දෙන එකරාත්‍රියකින්ම බරණැසට පැමිණ, නගරයෙන් පිටත සිට, රජුට පෙන්වූහ. අදම අප වෙත පිවිසිය යුතුයි යනුවෙනි. රජු සිටු කුලයෙන් රැගෙන ආ දැරිය මංගල ක්‍රියාව සිදුකොට මහා සත්කාරයෙන් පිවිසවන්නෙමුයි ඇයව උයනට රැගෙන යන්නයි කීවේය. ඔවුහු එසේ කළහ. ඇය අතිශයින් සියුමැලි කුමරියකි. යානයක ගැටීමෙන් කරදර වූවා මාර්ග ප්‍රවේශයේදී උන් වාත රෝගයකින් මැලවුණු මලක් මෙන් වී රාත්‍රි කාලයේ කලුරිය කළාය. ඇමතියෝ සත්කාර කළෝ, කරකැවි හඬා වැලපුනහ. මුලු නගරයම මහත් කෝලාහලයක් මෙන් විය. කුමාරයාට ඇසූ මණින්ම මහත් ශෝකයක් හටගත්තේය. අනතුරුව කුමරු, ශෝකයට මුල් සෙවීමට පටන් ගත්තේ ඔහු මෙසේ සිතුවේය. මේ ශෝකය නම් නූපන්නහුට නොවේ. එහෙයින් ඉපදීම නිසා ශෝකය හටගනියි. ඉපදීම නම් කුමක් නිසා සිදුවේද? ඉක්බිති භවය නිසා හටගනියි. මෙසේ අගසිට මුලට හේතුඵල දහම දැක යළිත් සංස්කාරයන් ඇසුරු කිරීමෙන් එහිම හිඳිමින් පසේබුදු බව සාක්ෂාත් කළේය. ඇමතියෝ ඔහු මාර්ගඵල සුවයෙන් සුවපත් වී ශාන්ත ඉඳුරන් ඇතිව ශාන්ත මනසින් සිටින අයුරු දැක නමස්කාර කොට කීවාහුය. දේවයනි; ශෝක නොකරව. මහත් වූ දඹදිව තවත් මීට වඩා සුන්දර කන්‍යාවක් රැගෙන එන්නෙමු. ඔහු කීවේය. ශෝක නොකරමි. මම ශෝක රහිත පසේ බුදුවරයෙකු වෙමි. ඉන් අනතුරු සියල්ල පෙර කියන ලද ගාථාව හා සමානය. ගාථා වර්ණනාව හැර මේ ගාථා වර්ණනාව මෙසේ දතයුතුය.

සංසගඝ ජානසසා යනු ජාති සංසර්ගය දර්ශන, ශ්‍රවණ කාය, සතුටු කථාව, සම්භෝග වශයෙන් පස්වැදෑරුම් වේ. එහි සංසර්ගය අන්‍යෝන්‍ය වශයෙන් දැක චක්ඛු විඤ්ඤාණ වීථි වශයෙන් උපන් රාගය, දර්ශන සංසර්ගය නම් වේ. එහි ලක්දිව කාල දීඝවාපිගම පිඬු පිණිස හැසිරෙන කැලණි විහාරවාසී, දීඝභාණක නම් ළදරු භික්ෂුව දැක පිළිබඳ සිත් ඇති, කිසියම් උපායකින් එය නොලැබ කලුරිය කළේ වූ කෙළඹි දියණියක වූවා, ඇගේ හැඳගෙන සිටි රෙදි කැබැල්ල දැක මෙබඳු ආකාර වස්තු දරන්නියක සමග සංවාසය නොලබන්නේ, හදවත පැලී කලුරිය කළේ, එයම ළදරු වූ ඔහුටම නිදසුනකි. අනුන් විසින් කියනු ලබන, රූපාදී සම්පත්ද, තමන් විසින් සිනහකවට බස් අසා, සෝත විඤ්ඤාණ වශයෙන් උපන් රාගය සවණ්ණ සංසර්ගය නම් වේ. තවද ගිරිගමවාසී කම්කරු දියණිය (ලෝකුරු) කුමාරිකාවන් විසින් පස්දෙනෙකු සමග නෙළුම් විලට ගොස් නා, මල්මාලා ගසාගෙන උස්හඬින් ගායනා කරන ශබ්ද අසා,

අහසින් යන්නේ කාමරාගය විෂ වීමෙන් ඇය පිරිහී ව්‍යසනයට පැමිණියේ පංච ගල්ලෙන් වාසී තිස්ස ළඳරු භික්ෂුව නිදසුනකි. ඔවුනොවුන් අඟපසඟ පිරිමැදීමෙන් උපන් රාගය ඇතිවීම කාය සංසර්ග නම් වේ. දම්දෙසන තරුණ භික්ෂුවද රාජ දියණියද, මෙහි නිදසුනකි. මහා විහාරයේ තරුණ භික්ෂුවක් ධර්ම දේශනා කරයි. එහි මහජනයා ආවේද? රජුද අග මෙහෙසියද, රජ දියණියද සමග පැමිණියේය. ඉක්බිති රාජ දියණිය විසින් උන්වහන්සේගේ රූපයටද, හඬටද පැමිණ බලවත් රාගයක් උපන්නේ, ඒ ළඳරු භික්ෂුවටද, ඇය දැක රජු ගැන සලකා, තිර රෙද්දාකාරයෙන් වටකරන ලද්දේය. ඔවුහු ඔවුනොවුන් පරමාර්ශනය කොට වැළඳ ගත්හ. යළිත් තිරරෙද්ද ඉවත්කොට බලන්නේ, දෙදෙනාම කලුරියකොට සිටිනු දුටුවාහුය. ඔවුනොවුන් ප්‍රිය කථාබහ කිරීම් වශයෙන් උපන් රාගය සමුල්ලපන සංසර්ගය නම් වේ. භික්ෂු භික්ෂුණීන් සමග පරිහරණය කිරීමේ උපන් රාගය සම්භෝග සංසර්ග නම් වේ. පාරාජිකාවට පත් භික්ෂු භික්ෂුණීන් දෙදෙනා අතර නිදසුනකි මේ. මිරිසවැටි මහා විහාරයේ දුටුගැමුණු මහරජ, මහදන් පිළිගෙළ කොටදී උභතෝ සංඝයාම (භික්ෂු භික්ෂුණී) වාසය කරති. එහි උණුකැඳ දෙන ලද සංඝ නවක සාමණේරියක ආරාධනා නැති සංඝ නවක සාමණේරයෙකුට දැහැටි දඬු දී කථාබහ කළාය. ඒ දෙදෙනාම සමග වාසයකොට සැටවස් පුර පරතෙර ගියේ ඔවුනොවුන් සුහද කථාබහ කිරීමෙන් පූර්ව සංඥාව ලැබ, එකෙණෙහි හටගත් ස්නේහය නිසා, ශික්ෂාපද, ඉක්මවා පාරාජිකා වූහ. මෙසේ පස්වැදෑරුම් සංසර්ගයක් යම්කිසිවකු සංසර්ගයෙන් හටගත් සංසර්ගයට වෙයි. සෙනෙහස, පළමුව රාගයට හේතු වේ. බලවත් රාගය උපදවයි. එහෙයින් **සෙනෙහසට පත්වීම** මේ දුකට බහුල වශයෙන් **පැමිණෙයි.** එයම සෙනෙහස අනුව යන මෙලොව වශයෙන් හටගන්නා ශෝක වැලපීම් වශයෙන් නොයෙක් ආකාර වූ මේ දුක පත්වෙයි. හටගනියි. පසුව අරමුණේ සිත අත්හැරීම සංසර්ගයයි කියති. අනතුරුව සෙනෙහස ස්නේහ දුක යයි මේ අර්ථ ප්‍රභේදය, මේ ගාථාර්ථය පවසා ඒ පසේබුදු රද කී සේක.

ඉදින් මම මේ **ස්නේහත්වය** සෙනහස හා බැඳුණු ශෝකාදී දුක් **පහොනී** අනුභව කරයි. ඒ සෙනෙහසට අනුගත වූ දුකට මුල සොයන්නා වූ පසේබෝධිය අධිගම කළේය. මෙසේ කී කල්හි ඇමතියෝ කීවාහුය. ස්වාමීනි, අප දැන් කුමක් කළයුතුද? ඉක්බිති උන්වහන්සේ මෙසේ කීහ. නුඹලා හෝ අනෙකකු හෝ යමෙක් මේ දුකින් මිදෙනු කැමැත්තේනම් ඒ සියල්ලෝම **ස්නේහය** උදින ආදීනව බලමින් නුදකලාව හැසිරෙන

කඟවෙනකු මෙන් වෙයි. මෙහිදී යම්බඳු **සෙනහඤ්චයං දුක්ඛං මිදං පහොති** යයි කියන ලදි. ඒ සඳහාම **ආදීනවං සිනෙජං පෙක්ඛමානො** යනුවෙන් කියන ලදි. නැතහොත් ඉහත කියන ලද අයුරින් සංසර්ගයෙන් සංසර්ගය හටගැනීම වෙති. ස්නේහය, ස්නේහය නිසා මේ දුකට පත්වෙයි. මෙසේ, ඇති තතු පරිදි, ආදීනවද සෙනෙහස ඉපදීමද බැලීමෙන්, සාක්ෂාත් කළේයයි මේ සම්බන්ධයෙන්, පියවර සතර පෙර කියන ලද අයුරින් උදාන වශයෙන් කීවේයයි දතයුතුය. ඉන් අනතුරුව සියල්ල පෙර ගාථාවේ කියන ලද ආකාරයෙනි.

සංසර්ග ගාථා වර්ණනාවයි.

1-3

මිත්තෙ සුහජ්ජෙ යනු කවර උපතක්ද? මේ පසේබෝධි සත්ත්වයා පෙර ගාථාවේ කියන ලද අයුරින් ඉපිද බරණැස රාජ්‍යය කරන්නේ ප්‍රථමධ්‍යානය උපදවා, කුමන ශ්‍රමණ ධර්මයක් උතුම් වේද? රාජ්‍ය උතුම් වේදැයි විමසා, ඇමතියන්ට රාජ්‍යය පවරා දී ශ්‍රමණ දහම් කළේය. "ඇමතියෝ දැහැමින් සෙමින් රාජ්‍යය කරවු"යයි කියන ලද්දේද, අල්ලස් ගෙන අධර්මයෙන් කරති. ඔවුහු අල්ලස් ගෙන ස්වාමියා පරාජය කරන්නේ එක් දිනක් එක්තරා රාජ පුරුෂයෙකු පරාජය කළහ. හෙතම රජුගේ බත් බැලයන් සමග පිවිස සියල්ල දැනුම් දුන්නේය. රජු දෙවෙනි දිනයේ තෙමේම විනිශ්චය ආසනයට ගියේය. ඉක්බිති මහජනතාව, "ඇමතියෝ දිව්‍ය ස්වාමියාව අස්වාමියෙකු බව පත්කරති. උස්හඬින් ශබ්ද කරන්නේ මහා යුද්ධයක් මෙන් වූහ. ඉක්බිති රජු විනිශ්චය ආසනයෙන් නැගිට, මාළිගාවට නැග සමාපත්ති භික්ෂා කිරීමට හුන්නේ, ඒ ශබ්දයෙන් වික්ෂිප්ත වූ සිත් ඇත්තේ මෙනෙහි කිරීමට නොහැකි වෙයි. ඔහු කිම මේ රාජ්‍යයෙන් ශ්‍රමණ ධර්මයේ උතුම් යයි, රාජ්‍යය සැපය හැරදමා නැවත සමාපත්ති උපදවා පෙර කියන ලද අයුරින් විදර්ශනා වඩා පසේ බුද්ධත්වය ප්‍රත්‍යක්ෂ කළ සේක. කමටහන්ද වඩා විමසන ලදුව මේ ගාථාව කී සේක.

එහි මෛත්‍රිය පැතිරීම් වශයෙන් **මෙත්තා** නම් වේ. සුහද බවෙන් **සුහජ්ජා.** කිසිවකු ඒකාන්ත හිත කැමැති බැවින් මිත්‍රයෝම වෙති. සුහද බව නොවේ. කිසිවකු යම් ඒම් වශයෙන් වැඩහිඳ සුහද කථාබහ කිරීම් වශයෙන් හඳවතට සැප ගෙනදීම් වශයෙන්ද, සැප ජනනය කරන බැවින්

සුහද බවම වෙති. මිත්‍රයෝ නොවේ. කිසිවකු එ දෙපරිදි වශයෙන් සුහද බවද මිත්‍රරු බවද, වශයෙන් එය දෙපරිදි වෙති. අගාරික, අනගාරික වශයෙන්ද වේ. එහි අගාරික ප්‍රතිපදාව තෙවැදෑරුම් යන්න වේ. එහි උපකාර, සමාන දුක්ඛ, අනුකම්පක වශයෙනි. අනගාරිකයෝ විශේෂයෙන් අර්ථය දක්වන ලදී. එය වනාහි, අංග සතරකින් යුක්ත වේ. ඒ කෙසේද? ගෘහපති සූත්‍රය සුදුසු පරිදි උපකාර කරන මිත්‍රයා සුහද යයි දතයුතුය. ප්‍රමාද වූවෝ රකියි. ප්‍රමාද වූවහුගේ බඩු බාහිරාදිය රකියි. බියට පිහිට වෙයි. උපන්නා වූ කටයුතුවලදී එහිදී ද්විගුණ භෝග තූපදවයි. එසේ ගෘහපති පුත්‍රය සතර ආකාරයකින් සමාන සුඛ දුක්ඛ මිත්‍රයා සුහද බව දතයුතුය. ඔහුගේ රැකිය යුතු තැන් රකියි. රැකිය යුතු තැන් වඩාත් රකියි. ආපදාවලදී අත්හැර නොයයි. ජීවිතය පිණිස හෝ අර්ථ සිද්ධිය පිණිස පරිත්‍යාග කළේ වෙයි. එසේම ගෘහපති පුත්‍රය, සතර ආකාරයකින් අත්ථක්ඛායි මිත්‍රයා සුහද බව දතයුතුය. පාපයෙන් වලකියි. යහපතෙහි යොදවයි. නොඇසූ දේ ශ්‍රවණය කරවයි. ස්වර්ගයට මාර්ගය හෙළිපෙහෙළි කරයි. මෙසේ ඒ අගාරික ප්‍රතිපදාව ලද බැවින් අර්ථ වශයෙන් ඒ සියල්ල යොදනු ලැබෙත්. ඔවුහු සුහද මිතුරෝය. **අනුකම්පමානො** යනු දයාවෙන් යුතු බවය. ඔවුන්ගේ සැප සමානකොට සලකනු ලබන්නේ වේ. **නාපෙති අත්ථං** යනු දිට්ඨධම්ම සම්පරායික, පරමාර්ථ වශයෙන් තෙවැදෑරුම් වේ. එසේම ආත්මාර්ථ, පරාර්ථ, උභයාර්ථ වශයෙන්ද තෙවැදෑරුම් වේ. ලබන ලද අර්ථය, විනාශයෙන් නොලබන ලද්ද, ඉපදවීමෙන් දෙපරිදි විනාශ වේ. පිරිහේ. **පටිබද්ධ චිත්තො** යනු "මම මොහු නැතිව ජීවත් නොවෙමි. මේ මගේ ස්වභාවයයි. මෙය මා සරණකොට ඇත. මෙසේ තමන්ව පහත් තැන තබන්නේද, පිළිබඳ සිත් ඇත්තේ වේ. මොහු මා නැතිව ජීවත් නොවෙත්. මම ඔවුන්ගේ ස්වභාවයයි. මම ඔවුන්ට පිහිටකොට සිටිමි. මෙසේ තමන්ව උසස් තැන තබමින් පිළිබඳ සිත් ඇත්තේ වේ. මෙසේ මේ පිළිබඳ සිත් ඇති බව දතයුතුය. **එතං භයං** යනු මෙහි ආත්ම පටිහාණි බියයි. තමන්ගේ සමාපත්ති හානිය බව දතයුතුය. **සන්ථවෙ** යනු ත්‍රිවිධාකාර සංථාසයයි. තණ්හා, දිට්ඨි, මිත්‍ර සංසර්ග වශයෙනි. එහි තෘෂ්ණාව එකසියඅට වැදෑරුම් වේ. දිට්ඨි සන්ථවය දෙසැටක් මිථ්‍යා දෘෂ්ටිවලින්ද, මිත්‍ර සංසර්ගය පිළිබඳ සිත් ඇති, මිත්‍ර අනුකම්පාවෙන් යුතුය. ඒවා අතර මිත්‍ර සංසර්ගයට මෙහි උසස් වේ. එසේ හෙයින් මොහුගේ සමාත්ති පිරිහීම වේ. එබැවින් කියන දේ සංසර්ගයෙහි මේ බිය බලමින් මම අධිගමයට පත් වුනෙමි. ඉතිරිය කියන ලද අයුරිනි.

සුහදමිත්‍ර වර්ණනා ගාථාවෙන්

1-4

වංසොවිසාලෝ යන කවර උපතක්ද? පෙර කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ පසේ බෝසත්වරු තිදෙනෙකු පැවිදිවී වර්ෂ විසිදහසක් යාම - ආපසු ඒමේ වත සපුරා දෙව්ලොව උපන්නෝ, එතැනින් චුතව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයා බරණැස් රජකුලයේ උපන්නේ, අනෙක් දෙදෙනා ප්‍රත්‍යන්ත රාජකුලවලද ඉපදුණාහ. ඒ දෙදෙනාම කමටහන් උගෙන රාජ්‍යය හැරදමා පැවිදිව පිළිවෙළින් පසේබුදුවරු වී නන්දමූල පර්වතයේ වසන්නාහු එක්දිනක් සමාපත්තියෙන් නැගිට "අපි කුමන කර්මයක් කොට මේ ලෝකෝත්තර සැපයට පැමිණියේදැයි. ආවර්ජනා කොට ප්‍රත්‍යවේක්ෂා කරන්නේ කාශ්‍යප බුද්ධකාලයේ තම තමන්ගේ ක්‍රියාකලාප දුටුවාහුය. ඉක්බිති තෙවැන්නා කොහේදැයි ආවර්ජනා කරන්නාහු, බරණැස් රාජ්‍යය කරවනු දැක උන්වහන්සේගේ ගුණ සිහිකොට ඔහු ස්වභාවෙන්ම අල්පේච්ඡතාදි ගුණයෙන් සමන්විත බව විය. අපගේම අවවාදකව, වත්පිළිවෙත් පුරමින් වචනයෙන් සංවරව පාපයට ගරහන්නෙකු වී, ඉතින් ඔහුට අරමුණු පෙන්වා සිහිපත් කරමු යයි ඉඩකඩක් සොයන්නේ හේ එක දවසක් සර්ව අලංකාරයෙන් සැරසී උයනට යනවා දැක, අහසින් ගොස් උද්‍යානය දොරකඩ උණපඳුරක් මුල සිටියහ. මහජනයා අතෘප්තියෙන් රජදැක්මෙන් රජු බැලීය. ඉක්බිති රජු මා දකින මොහොතේ කිසියම් කටයුත්තක් නොකරයි දැයි බලන්නේ පසේ බුදුවරුන් දුටුවේය. දැකීමත් සමග උන්වහන්සේලා කෙරෙහි මහත් සෙනෙහසක් හටගත්තේය. ඔහු ඇතුපිටින් බැස, ශාන්තව ආචාරකොට එළඹ ස්වාමීනි; නුඹලා කවරනම් වේදැයි විචාලේය. ඔවුහු "මහරජ, අපි අසවල් නම් ඇත්තෝ වූහ. ස්වාමීනි, අසජ්ජමානා යනු මෙයට කවර අර්ථයක්ද"යි. මහරජ, නොලැගෙන යන අර්ථයයි. ඉක්බිති උණපඳුර පෙන්වා කීවාහුය. යම්සේ මහරජ, මේ උණපඳුර සියළු මුල්කඳ ශාඛා අනුශාඛා එකට හකුළුවා සිටියේ කඩුගත් අත් ඇති පුරුෂයකු, මුලින් කපා වටේට කරකවනු ලබන්නේද, ඉදිරිමට නොහැකි වන්නේය. එපරිදි නුඹ ඇතුළත සහ පිටත අවුල්වලින් වෙලී ඇලී-ගැලී සිටියේ එහි විලග්ග (ලැගීමයි). යම්සේ මැදින් ඇල්ලුවේද, මේ උණගස, හටනොගත් අතු ඇති බැවින් කිසිවක නොලැග සිටියේ අග හෝ මුල සිඳ ඉදිරිමට හැකිය. එපරිදි අපි කිසිතැනක නොඇලීමෙන් සියලු දිශාවල යමු. එකෙණෙහි සතරවෙනි ධ්‍යානයට සමවැදී ඒ රජු දෙස බලද්දීම අහසින් නන්දමූල පර්වතය පාමුලට ගියහ. ඉක්බිති රජු සිතීය. කවරදා නම් මම මෙසේ නොඇලෙන්නේ වන්නෙමිදැයි. එහිම

සිටියේ, විශේෂයෙන් බලන්නේ පසේබුදුභාවය සාක්ෂාත් කළ සේක. පෙරකී ආකාරයෙන්ම කමටහන් විමසනලදුව මේ ගාථාව කී සේක.

එහි වංසො යනු උණපුරුක්. **විසාලො** පැතිරුණු, 'ව' කාරය අවධාරණ අර්ථයේ මෙහි 'ම' කාරය වේ. සන්ධි වශයෙන් මෙහි 'එ' කාරය තවුයේ. ඒ පරපදය හා සම්බන්ධ වේ. එය පසුව යොදන්නෙමු. **යථා** යනු කොටසයි. **විසතෙතා** යනු ලැග්ගේ, කෙලෙස් ඇත්තේ මිශ්‍ර වූයේ. **පුත්තෙසු දාරෙසු ච්‍ඨා** යනු අඹුදරු දූපුතුන් විෂයෙහි **යා අපෙක්ඛා** යනු යම් තෘෂ්ණාවක්, යම් සෙනෙහසක් **වංස කළීරොව අසජ්ජමානො** යනු උණපුරුක් මෙන් නොලැගෙන, කුමක් කියන ලද්දේ වේද? යම්සේ උණ, විශාලව පැතිරුණේ වෙයි. අඹුදරුවන් කෙරෙහි යම් අපේක්ෂාවක් වේද, එයද මෙසේ ඒ වස්තු ස්පර්ශකොට සිටි බැවින් ඇලෙන නම් වේ. මෙසේ, මම ඒ අපේක්ෂාවෙන් අපේක්ෂාකොට විශාල උණපුරුක් මෙන්, ඇලුණු පැටලුණු බැවින් මෙසේ බලාපොරොත්තුවේ ආදීනව දැක, ඒ අපේක්ෂාව මාර්ග ඥානයෙන් සිදිමින් මේ උණපුරුක මෙන් රූපාදියෙහිද, දැකීම් කෙරෙහිද, කාමභවවලද, තණ්හා දෘෂ්ටි මාන වශයෙන් නොඇලෙමින් පසේබෝධිය අධිගම කළේය. සෙස්ස පෙර පරිදි දතයුතුය.

උණගොබ (වංසකළීර) ගාථා වර්ණනාවයි.

1-5

මිගො අරඤ්ඤමහි යනු කවර උපතක්ද? එක් භික්ෂුවක් කස්සප බුදුරදුන්ගේ ශාසනයේ යෝගාවචරව කලුරියකොට, බරණැස සිටුකුලයක උපන්නේ, ආඪ්‍යව මහත් ධන ඇති මහාභෝගී විය. ඔහු පරදාරික සිට කලුරිය කොට අපායේ උපන්නේය. එහි පැසී පැසුණු කෙළවර සිටුබිරිඳගේ කුසෙහි, ස්ත්‍රියක වී පිළිසිඳ ගත්තේය. නරකයේ ආවා වූ සත්ත්වයන්ගේ ශරීර උණුවෙත්. එයින් සිටු බිරිඳ දැවෙනු ලබන උදරයෙන් හටගත්තා වූ කරදරයෙන් යුතුව ඒ ගැබ දරා, සුදුසු කාලයේ දැරියක වැදුවාය. ඇය උපන් දවසේ පටන්, මව්පියන්ටද, සෙසු නෑදෑ පිරිවර ජනයාටද, විපතක් විය. වැඩිවිය පැමිණියේ, යම් කුලයක දෙන ලද, එහිදී සැමියාගේ නැදෑ මිතුරන්ගේ අප්‍රිය බවට ලක්වූවා අප්‍රිය අමනාප විය. ඉක්බිති නැකැත් කෙළියෙහි සෝෂා කරන ලද සිටුපුත්‍රයා ඇය සමග සෙල්ලම් කිරීමට නොකැමැත්තේ ගණිකාවක ගෙන්වා සෙල්ලම කරයි. ඇය ඒ දාසින්ගේ සමීපයේ අසා සිටුපුත්‍රයා වෙත එලඹ නොයෙක් ආකාරයෙන් නැලවීම්

කීවාය. ආර්ය පුත්‍රය, ස්ත්‍රියනම් රජවරු දහදෙනෙකුට වඩා බාලය. සක්විති රජකුගේ දුවක වුවද, එසේම ස්වාමියාට මෙහෙකාරියක වෙයි. ස්වාමියා කෙරෙහි ආදරයක් නැතිකල්හි උලක් ආරෝපණය කළාක් මෙන් දුක අනුභව කරයි. ඉදින් මට අනුග්‍රහයේ කැමැත්තේද, අනුග්‍රහ කළ යුතුය. නොඑසේනම් වෙන්වී සිටිය යුතුය කියා තමන්ගේ ඥාති කුලයට යන්නෙමි යනුවෙනි. සිටුපුත්‍රයා 'වේවා සොඳුර; ශෝක නොකරව. ක්‍රීඩාවේ ඇලුණ මැනවි. නැකැත්කෙළිය, ක්‍රීඩා කරන්නෙමුයි කීවේය. සිටුදියණිය එපමණකින් කථාබහ කිරීමට උත්සාහ වන්නේ හෙට නැකැත් ක්‍රීඩා පවත්වන්නෙමුයි, බොහෝ කනබොන දෑ පවරා දුන්නේය. සිටුපුත්‍රයා දෙවෙනි දිනයේ නොවිචාරා, ක්‍රීඩා ස්ථානයට ගියේය. ඇය, දැන් එන්නේය, දැන් එන්නේ යයි මගබලා සිටින්නී, ප්‍රමාදය දැක පුරුෂයකු යැවීය. ඔවුහු පෙරළා ගොස්, සිටුපුත්‍රයා ගියේ යයි දැනුම් දුන්හ. ඇය සියලු ඒ පිළියෙළ කළ දේවල් රැගෙන මහා රථයක නැග, උයනට යන්නට පටන් ගත්තාය. **ඉක්බිති නන්ද පර්වත පාමුල** පසේ බුදුරද සත්වෙනි දිනයේ නිරෝධ සමවතින් නැගිට නාග බුලත් දැහැටිකුරු ආදිය අනුභවකොට අනෝතප්ත විලෙන් මුව සෝදා, අද කොහේ පිඬු පිණිස හැසිරෙන්නේදැයි ආවර්ජනා කරන්නේ, ඒ සිටු දියණිය දැක, මැය මා කෙරෙහි ශ්‍රද්ධා ආකාරයක් කොට, ඒ වැඩ කෙළවරට යන්නේ යයි, දැන පර්වත පාමුල යොදුන් සැටක් මණ හිරියල් තලාවේ සිට පාසිවුරු ගෙන අභිඥා ආදිය සමාදන් වී අහසින් ගොස් ඈ සිටි මහාමාර්ගයේ බැස, බරණැසට මුහුණලා ගියේය. ඇය දැකම දාසීනු සිටු දියණියට දැන්වූහ. ඇය යානාවෙන් බැස සකසා වැඳ, පාත්‍රය සියලු රසමුසු දේවලින් කෑයුතු බීයුතු දේවලින් පුරවා පියුම්මලින් වසා, යටද නෙළුම්මල් තබා, මල් කළඹක් අතින් ගෙන, පසේ බුදුරදුන්ගේ අතෙහි පාත්‍රය දී වැඳ, මල්කළඹ ගත් අත් ඇතිව ප්‍රාර්ථනාවක් කළේය. "ස්වාමීනි, ගැබෙහි වාසය කිරීම දුකකි. එයට නොපැමිණ නෙළුම්මල මතම පිළිසිඳගැනීම වන්නේයයි, තෙවෙනි වරද පැතුවේය. ස්වාමීනි, මාගම පිළිකුල්ය. සක්විතිරාජ දුව වුවද අනුන්ගේ වසඟයට යයි. එහෙයින් මම ස්ත්‍රීභාවයට නොපැමිණ, පුරුෂයකු වන්නේය. සතරවෙනි ප්‍රාර්ථනාවද කළේය. "ස්වාමීනි; මේ සසර දුක ඉක්මවා අවසානයේ නුඹලා විසින් ප්‍රාර්ථනා කරන ලද, අමෘතයට පැමිණෙන්නේය. මෙසේ අපේක්ෂා හතර ඉෂ්ටකොට ඒ පියුම් කළඹ පූජාකොට පසඟ පිහිටුවා වැඳ, මල් සමානවම මගේ සුවඳද, වර්ණයද වේවා'යි මේ පස්වෙනි අපේක්ෂාවද ප්‍රාර්ථනා කළේය. ඉක්බිති පසේබුදු පාත්‍රයද මලකළඹද ගෙන අහසේ සිට,

"සිතන පතන ඔබේ පැතුම් වහාම සමෘද්ධ වේවා! පසළොස්වකදා පූර්ණ චන්ද්‍රයා සේ සියලු චිත්ත සංකල්පනාවෝ පිරෙත්වා."

මේ ගාථාවෙන් සිටු දියණිට පින් අනුමෝදන් කොට සිටු දියණිය, මා යන අයුරු බලත්වා'යි අධිෂ්ඨානකොට අහසින් නන්දමූල පර්වතයට ගියේය. සිටු දියණියට එය බැලීමෙන් මහත් සතුටක් ඉපදුණාය. සසර පුරා කරන ලද අකුශල කර්ම ඉඩක් නොලැබීම නිසා, ගෙවී ගියේය. ලුණු ඇඹුල්වලින් සෝදන ලද තඹ භාජනයක් මෙන් පිරිසිදු විය. එකෙණෙහි ඇගේ පතිකුලයේ සියලු ජනතාව සතුටුව "කුමක් කරමු"දැයි ප්‍රිය වචනද, පඬුරුද යැවීය. හිමියාද මිනිසුන් යැවීය. සිටු දියණිය වහාම රැගෙන එවූ යනුවෙනි. මම ඉක්මණින් උයනට ආවෙමි. එතැන් පටන් හේ උරහිසෙහි ආලේප කරන ලද සඳුන් මෙන්ද, පළඳවන ලද මුතුහර මෙන්ද, මල් මාලාවක් මෙන්ද, ප්‍රිය ගිල්වෙමින් වැඩුණේය. ඇය එහි ආයුෂ ඇති තාක් ඉසුරු සැපසම්පත් අනුභවකොට කලුරියකොට, පුරුෂයකු ලෙසින් දෙව්ලොව නෙළුම් මලක් මත ඉපදුණේය. ඒ දිව්‍යපුත්‍රයා යන්නේද, පියුම්මල් ගැබෙහිම යයි. සිටින්නේද, හිඳින්නේද, සයනය කරන්නේද, පියුම් කුසුම් ගැබෙහිම නිදයි. **මහා පදුම දිව්‍ය පුත්‍රයා** යයි ඔහු ව්‍යවහාර කළහ. මෙසේ ඔහු ඒ ඍද්ධි ආනුභාවයෙන් මූලසිට අගට අග සිට මූලට සදිව්‍යලෝකයේම සැරිසරයි.

එසමයෙහි බරණැස් රජුට විසිදහසක් ස්ත්‍රීහු වෙති. ඈලා අතර එකියක්වත් පුත්‍රයකු නොලබයි. ඇමතියෝ රජු වෙත දැනුම් දුන්හ. රජතුමනි, කුලවංශය අනුව පාලනය කරන පුතකු කැමැතිවිය යුතුය. වැඩිමහල් පුතකු තමන්ගේ නොමැති වූවිට ක්ෂත්‍රිය පරපුරෙන් උපන් අයකු කුලවංශය දරන්නේ වේ, යයි කැමැතිවිය යුතුය. ඉක්බිති රජු මෙහෙසිය හැර ඉතිරි නාටක ස්ත්‍රීහු සත්දිනක් ධර්මනාටකය කරවූ යයි කැමැති පරිදි පිටත හැරසිරවීය. එසේ වුවද පුතකු නොලැබුවෝ නැවත ඇමතියෝ කීවාහුය. මහරජතුමනි, මෙහෙසිය නම් පිනෙන් ද ප්‍රඥාවෙන්ද සියලු ස්ත්‍රීන්ට වඩා අග්‍රය. රජතුමා කැමැති නම්, මෙහෙසියගේ කුසෙහි පුතකු ලබන්නේ නම් යෙහෙකි. රජු මෙහෙසියට ඒ කරුණ දැන්විය. ඇය කීවාය. මහරජ, ස්ත්‍රිය නම් සිල්වත් සත්‍යවාදී පුතකු ලබන්නේය. ලජ්ජා බිය දෙකෙන් කෙසේ පුතකු ලබාද? ඇය මතු මහලට නැග පංචශීලය සමාදන් වී නැවත නැවත මෙනෙහි කරයි. සිල්වත් රජ දියණිය පංචශීලය ආවර්ජනය කරමින් පුතකු පතන සිතින් උපන් මාතුයෙහි ශක්‍රයාගේ ආසනය රත්විය. ශක්‍රයා ආවර්ජනා කරන්නේ, මේ කාරණය දැන සිල්වත් රජ දියණියට උතුම් පුත්‍රයෙකු දෙමි'යි අහසින් ගොස් දේවිය ඉදිරියේ සිට "නොසිතනු මැනවි යයි කියා දෙව්ලොවට ගොස්, මෙහි ආයුෂ

කෙටි වූවකු වෙත්දැයි ආවර්ජනා කරන්නේ, මේ මහා පදුම මතු දෙව්ලොව යනු කැමැත්තේ චුතවන්නේ යයි දැන ඔහුගේ විමානයට ගොස් "දරුව, මහා පදුම; මිනිස්ලොවට යන්නැයි ඉල්ලීය.

ඔහු මහරජ; එසේ නොකියව. මිනිස්ලොව පිළිකුල්ය. දරුව, නුඹ මනුෂ්‍ය ලෝකයේ පින්කම්කොට මෙහි උපන්නෙකි. එහිම සිට පාරමීදම් පිරිය යුතුය. දරුව, යන්න. මහරජ; ගැබක වාසය කිරීම මහා දුකකි. එහි වාසය කිරීමට නොහැකිය. දරුව; එහි ගැබක වාසය කිරීමක් නැත. එසේ වුවත් ඔබ කර්ම කළෙහිය. යම්සේ පියුම් ගැබ උපදින්නේය. යව; දරුවය. නැවත නැවත කියනු ලබන්නේ ඉවසීය. ඔහු දෙව්ලොවෙන් චුතව බරණැස් රජුගේ උයන් ගල්තලාවේ, පොකුණේ පියුම් ගැබහි උපන්නේ. ඒ රාත්‍රියද අළුයම් කාලයේ, මෙහෙසිය, සිහිනයකින් විසිදහසක් ස්ත්‍රීන් පිරිවරා උයනට ගොස් පොකුණේ පියුම් ගැබක පුතකු ලද මෙන් විය. ඇය අළුයම රාත්‍රියේ සිල්රකිමින් සිට එහි ගොස් එහි පුෂ්පයක් දුටුවාය. එය විල්තෙර නොවෙයි. ගැඹුරුද නොවේ. එය දැකීමෙන්ම ඇය එහිදී පුත්‍ර ස්නේහය හටගත්තේය. ඇය තෙමේම බැස, ඒ මල ගත්තීය. මල ගන්නා මොහොතේම පත්‍ර විකසිත වූහ. එහි රන්පිළිමයක් මෙන් දැරියක දුටුවාය. දැක "මට පුතකු ලැබුණේ යයි" ශබ්ද කළාය. මහජනයා දසදහසක් සාධුකාර දුන්හ. රජුට යැවීය. රජු අසා, කෙසේ ලැබුවේදැයි විචාරා ලබන ලද අවකාශය අසා, උයනද පියුමද පොකුණද අපගේමය. එහෙයින් අපගේ කෙතෙහි උපන් බැවින් මේ පුත්‍රයා බෙත්තජ යයි පවසා, නගරයට පිවිසවා, විසිදහසක් සමග කිරිමව්වරුන් ලෙස පත් කළේය. ඒ ඒ කුමාරයාට බව දන්වා ප්‍රණීත, කෑ යුතු දේ කවවයි ඇය දහසක් ලබයි. සියළු බරණැස සලිත විය. සියළු ජනතාව කුමාරයාට පඬුරු දහසක් එවීය. කුමරු ඒ ඒ අය අතින් අල්ලාගෙන මෙය කන්න. මෙය වළඳන්නැයි කියමින් භෝජනයෙන් අනිශයින් කලකිරුණේ නගර දොරටුව සමීපයට ගොස්, ලාකඩ ගුලියකින් සෙල්ලම් කරයි.

එකල එක්තරා පසේ බුදුවරයෙකු බරණැස ඇසුරුකොට ඉසිපතනයේ වැඩවාසය කරයි. උන්වහන්සේ කලින්ම නැගිට සේනාසන වත, ශරීර පිළිකම්, මෙනෙහි කිරීම් ආදි සියලු කෘත්‍යය නිමකොට සමවතට සමවැදුණේ අද කොහේ භික්ෂාව සඳහා පිඬුසිඟා යන්නෙම්දැයි ආවර්ජන කරන්නේ කුමාරයාගේ සම්පත් දැක "මෙතම පෙර කුමන කර්මයක් කළේදැ"යි විමසන්නේ මා වැන්නකුට පිණ්ඩපාත දී ප්‍රාර්ථනා හතරක්

කළේය. ඉන් තුනක් සිද්ධවිය. එකක් ඉටු නොවීය. ඔහුට උපායෙන් අරමුණු දක්වන්නෙමියි, පිඬු පිණිස හැසිරෙන විලාශයෙන් කුමරු ලඟට ගියේය. කුමරු උන්වහන්සේ දැක ශ්‍රමණය! ශ්‍රමණය! මෙහි නොඑව. මෙය මෙහිදී අනුභව කරන්න. මෙය කරන්න යයි කීවාහුය කීවේය. උන්වහන්සේ එක වචනයෙන්ම එහි නැවතී තමන්ගේ සෙනසුනට වැඩි සේක. කුමරු පිරිවර ජනයාට කීවේය. "මේ ශ්‍රමණයා මා විසින් කියන ලද මොහොතේම නතර විය. මට කිපුණේද? ඔහු ඔවුන් විසින්, පැවිද්දෝ නම් ක්‍රෝධය ඇසුරු නොකරන්නේ අනුන් විසින් ප්‍රසන්න මනසින් යමක් දෙන ලද්දේද, එයින් යැපෙති යයි කියනු ලබන්නේ, දුෂ්ට වූ මට මේ ශ්‍රමණයා ක්ෂමා කරන්නෙමියි, මව්පියන්ට දන්වා ඇතු පිට නැගී මහත් රාජානුභාවයෙන් ඉසිපතනයට ගොස්, මුව සමූහයා දැක විචාළේය. මේ කවුරුන්ද? ස්වාමීනි, මේ මුවෝ වෙති. මේ අය අනුභව කරවුද? මේ අය නිදා ගනිනුද කියා පෝෂණය කරන්නෝ ඇත්ද? නැත්ද? ස්වාමීනි, නැත. යම්තැනක තණ සහ ජලය ඇත්ද? එහි වාසය කරති. කවරදා නමුත් මමත් මෙසේ වසන්නෙමි. මේ අරමුණ සිතට ගත්තේය. පසේබුදුරදද ඔහුගේ පැමිණීම දැන සේනාසන මාර්ගයද සක්මන්මළුවද හැමද, සමකොට දෙතුන් වතාවක් සක්මන්කොට පියවර කිහිපයක් පෙන්වා, නික්මෙන පියවර කිහිපය නොපෙන්වා වෙනත් තැනකට ගිය සේක. කුමරු එහි ගොස් ඒ ප්‍රදේශය අතුගා සමකර තිබෙනු දැක, වාසය කරයි යයි හඟිනුයේ, මෙහි ඒ පසේබුදු රද පිරිවර ජනයා විසින් කියන ලද්ද අසා කීවේය. උදෑසනම ඒ ශ්‍රමණයා වස්ත්‍ර පොරවා, දැන් ඇත් අශ්ව ආදින් තමන්ගේ ඉඩකඩ මඩිනු දැක සෑහෙනතරම් ඉවසන්නේය. මෙහිම නුඹලා සිටිවු යයි, ඇතුපිටින් බැස හුදකලාව සෙනසුනට පිවිසියේ මනාසේ මට්ටම් කරන ලද ඉඩකඩ තුළ පියවර කීපයක් දැක මේ ශ්‍රමණයෙක් නොවේ. මෙහි සක්මන් කරන්නේ වෛද්‍යකර්ම කරන්නෙක් යයි සිතුවේය. ඒකාන්තයෙන් මේ තමන්ගේ දියුණුවම සිතුවේ යයි හඟියි. ප්‍රසන්න මනසින් සක්මනට නැග දුරුකරන ලද විතර්කය ඇත්තේ ගොස්, ගල්තලාවේ හිඳ, හටගත් සතුටින් හුදකලාව සිට පන්සලට පිවිස, විදර්ශනා වඩන්නේ පසේබෝධි ඥානය අධිගමකොට පෙර කියන ලද අයුරින් පුරෝහිතයා විසින් කමටහන් විචාරණ ලදුව ආකාශතලයේ හුන්නේ මේ ගාථාව කීවේය.

එහි මිගො යනු මුවෝ දෙන්නා නිණ මුව, පසඳ මුවා යනුවෙනි. සියල්ලෝ ආරණ්‍යගතව සිටුපා ඇති මොවුන්ට විශේෂ වචනයක් ලෙස

පසද මුවා යයි ව්‍යවහාර කරනු ලබත්. **අරඤ්ඤමහි** යනු ගමද, ගම ආශ්‍රිත ප්‍රදේශයද හැර, ඉතිරි කැලෑ, මෙහි වනාහි උයන්ද කියනු ලැබේ. එහෙයින් උද්‍යාන ආදියද කියන ලදී. අබඳෙධා යනු ලණු රැහැන් ආදි බැම්වලින් නොබඳිනා ලද. මෙහි විශේෂ අර්ථයක් දක්වයි. **යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය** යනු යම් යම් දිශාවලට යනු කැමැත්තේද, ඒ ඒ දිශාභාගවලට ගොදුරු පිණිස යති. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් ද මෙසේ වදාරන ලදි. "යම්සේ මහණෙනි, වනගතමුවා අරණ්‍යයේ සුළඟේ හැසිරෙමින් විසිරී යයිද? විසිරි විශ්වාසයෙන් සිටියිද, හිඳියිද, විශ්වාසයෙන් නින්දට වැටේද? එයට හේතුව කිම? මහණෙනි, වැද්දාගේ මාර්ගයක් නොමැති බැවිනි. එපරිදි මහණෙනි, භික්ෂුව කාමයන්ගෙන් තොර වූවේ ප්‍රථමධ්‍යානයට සපැමිණ වාසය කරයි. මෙයට මහණෙනි, භික්ෂුව මාරයා අන්ධ කළේය යයි කියනු ලැබේ. පියවරකට නොපැමිණ, මාර ඇස දැකීම පාපී මාරයා මළේයයි විස්තර කරන ලදී. **සෙරිතං** යනු සිය කැමැත්තෙන් කියන ලද, වෙනකකු විසින් කරන ලද්දක් යයි මෙය කියන ලද්දේ වෙයි. යථා යම්සේ මුවා අරණ්‍යයේ නොබැඳ යම් කැමැති තැනකට ගොදුරු පිණිස යයිද, කවරදා නමුත් මමද, තෘෂ්ණා බන්ධනය සිඳ, එසේ යන්නේය. **විඤ්ඤූ** පණ්ඩිතයා. **නරෝ සෙරිතං පෙකඛමානෝ එකෝ චරෙති** මිනිසා ස්වෛරීව බලමින් හුදකලාව හැසිරෙයි.

මිග අරණ්‍යක ගාථා වර්ණනාවයි.

1-6

ආමන්තණා හොති යනු කවර උපතක්ද? බරණැස් රජුගේ මහා උපස්ථාන සමයේ, ඇමතියෝ සමීපයට පැමිණියහ. ඔවුන් අතර එක ඇමතියකු, "දේවයන් වහන්ස; ඇසිය යුත්තක් ඇත" එක් වරක් ඉල්ලීය. ඔහු අසුනින් නැගිට ගියේය. යළිත් එකකු මහා උපස්ථානයේ හිඳීමට ඉල්ලීය. එකකු ඇතුපිට හුන්නේ, එකකු අසුපිට හුන්නේ, එකකු ස්වර්ණ රථයක හුන්නේ, එකකු ප්‍රධාන ශාලාවේ හුන්නේ උයනට යාමට ඉල්ලීය. ඉක්බිති රජු බැස ගියේය. අනෙකකු ජනපද චාරිකාවේ හැසිරීමට ඉල්ලීය. ඔහුගේ වචනයද අසා ඇතුපිටින් බැස, එකත්පසකට ගියේය. මෙසේ ඔහු ඔවුන් කෙරෙන් කළකිරුනේ වී, පැවිදිවිය. ඇමතියෝ ඉසුරින් වැඩෙති. ඔවුන් අතර එකකු ගොස්, රජුට මෙසේ කීවේය. මහරජ; අසවල් නම් ඇති ජනපදය මට දෙන්න. රජු අසවල් දේ අනුභව කරයි යනුවෙන්

පවසයි. ඔහු රජුගේ වචන නොපිළිගෙන "මම ඒ ජනපදය ගෙන අනුභව කරමි. යම්'යි එහි ගොස් කෝලාහල කොට, නැවත දෙදෙනාම රජුගේ සමීපයට අවුත් ඔවුනොවුන්ට දොස් නගන්නී, රජු මොවුන් පෝෂණය කිරීමට නොහැකි යයි, ඔවුන්ට ලෝභකමේ ආදීනව දැක විශේෂයෙන් බලන්නේ, (විදර්ශනාව වඩා) පසේබෝධිඥානය සාක්ෂාත් කළ සේක. හෙතම පෙර පරදිම මේ උදාන ගාථාව කී සේක.

එහි අර්ථය : **සභාය මඥේඛ** දිවාරාත්‍රී කැමැති පරිදි වාසය කරන. වා සෙ මහා උපස්ථානය හා සම්බන්ධ, **යානෙ** උයන් ගමන හා සම්බන්ධ. ගමනෙ ජනපදචාරිකා හා සම්බන්ධ. **චාරිකායං** මේ අසව, මෙය මට දෙන්න ආදි න්‍යායෙන් ඒ ඒ පරිදි. **ආමනතණාහොති** එහෙයින් මම එහි කලකිරී, යමක් මේ ආර්ය ජනතාව සේවනය කරන ලදද, නොයෙක් ආනිශංස ඇති ඒකාන්ත සැප ඇති, මෙසේ ඇතිකල්හි, ලෝභයෙන් මඩනා ලද, සියළු ආකාර මිනිසුන් විසින් ප්‍රාර්ථනා නොකරන ලද, පැවිද්ද. එය **අනභිඡඣිතං** අනුන් සතුව නොවතින ධර්ම පුද්ගල වශයෙන්. **සෙරිතංච පෙඛමානො** විදර්ශනා වඩා අනුක්‍රමයෙන් පසේබුදුභාවය අවබෝධ කළෙමි. ඉතිරිය කියන ලද අයුරිනි.

ආමන්ත්‍රණ ගාථා වර්ණනාව නිමි.

1-7

බ්‍රඹ්මදත්ත යනු කවර උපතක්ද? බරණැස ඒකපුත්‍ර බ්‍රහ්මදත්ත නම් රජකු විය. ඔහුට ප්‍රියමනාප ප්‍රාණය හා සමාන එකම පුතකු විය. රජු සියළු ඉරියව්වලදී, පුතාව ගෙන සිටී. එක දවසක් උයනට යන්නේ ඔහු හැර දමා ගියේ, කුමරු ඒ දවස උපන්නා වූ රෝගයකින් මළේය. ඇමතියෝ පුත්‍ර සෙනහසින් රජුගේ හදවත පැලේවි යන බියෙන් නොදන්වා ඔහු ආදාහනය කළහ. රජු උයනේ සුරා මදයෙන් මත්වී පුතුව සිහි නොකළේය. එසේ දෙවෙනි දිනයේද, ස්නානය කරන, ආහාර ගන්නා වේලාවලද, සිහි නොවීය. ඉක්බිති අනුභව කිරීමට සූදානම් වී, පුතු සිහිවී මගේ පුතා ගෙනෙව් යයි කීවේය. ඔහුගේ විධානයෙන් සුදුසු අයුරු ඒ පුවත දැන්වූහ. ඉක්බිති ශෝකයෙන් මඩනාලදුව හුන්නා සේ මෙසේ සිහිබුද්ධියෙන් මෙනෙහි කළේය. "මෙසේ ඇතිකල්හි මෙය වේ. මෙය ඉපදුණුවිට මෙය උපදියි" යනුවෙනි. මෙසේ පිළිවෙළින් හේතු-ඵල දහම මෙනෙහි කරන්නේ

පසේබුදුබව සාක්ෂාත් කළ සේක. ඉතිරිය සංසර්ග ගාථා වර්ණනාවේ කියන ලද අයුරින්ම දතයුතු අයුරු අතහැර ගාථාපද වර්ණනාව දැක්වේ.

එහි වර්ණනාව වනාහි; **බිඬඩා** යනු සෙල්ලම් කිරීමය. එය දෙවැදෑරුම් වේ. කායික-වාචසික යනුවෙනි. කායික නම්, ඇතුන් කෙරෙන් සෙල්ලම් කරති. අසුන් කෙරෙන්, දුනුහීවලින්, තරු ආදියෙන් මේ ආදි වශයෙනි. වාචසිකනම් ගීත, ශ්ලෝක, කථාකිරීම, මුවෙන් බෙරහඬ නැංවීම මේ ආදියයි. **රති** යනු පංචකාම ගුණයේ ඇල්මය. **විපුලං** යනු ඇටමිදුලුවල සිට සියලු ආත්මභාවය පුරා පැතිරුණු ඉතිරිය ප්‍රකට වේමය. අනුසන්ධි ගැලපීමද මෙහි සංසර්ග ගාථාවෙන් කියන ලද අයුරින් දතයුතුය. ඉන් අනතුරුව සියල්ලය.

ක්‍රීඩා ඇල්ම ගාථා වර්ණනාවයි

1-8

චාතුද්දිසෝ යනු කවර උපතක්ද? පෙර කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ පසේබෝධි සත්ත්වයෝ පස්දෙනෙකු පැවිදිව වර්ෂ විසිදහසක් යාම-ඒම-වත සපුරා දෙව්ලොව උපන්නාහ. අනතුරුව චුතවී ඔවුන්ගෙන් ජ්‍යෙෂ්ඨයා බරණැස රජු විය. ඉතිරි අය ස්වාභාවික රජවරු වෙති. ඔවුන් හතරදෙනාම කමටහන් උගෙන රාජ්‍යය හැර පැවිදිවී අනුපිළිවෙළින් පසේබුදු වී නන්දමූල පර්වතයේ වාසය කරන්නේ එක්දිනක්, සමවතින් නැගිට, උණගොබ සම්බන්ධ ගාථාව කියන ලද අයුරින්ම, තමන්ගේ කර්මයද, මිතුරාද ආවර්ජනාකොට, දැන බරණැස් රජුගේ උයෙන් අරමුණු දැක්වීමට ඉඩක් සොයති. ඒ රජුද, රාත්‍රී සිට තුන්වරක් හිතියට පත්වෙයි. බියට පත්ව තැතිගනියි. පොළොවේ දුවයි. පුරෝහිතයා විසින් කල්වේලා ඇතිව නැගිට, සුවසේ නිදා ගත්තේදැයි, විචාරණ ලදුව "ගුරුතුමනි, කවර සැපතක්ද?"යි ඒ සියලු ප්‍රවෘත්ති දැනුම් දුන්නේය. පුරෝහිතයාද මෙය රෝගයකි. යම් කිසිවූ විශ්වතාදි ක්‍රමයෙන් බෙහෙත් ආදිය ගෙන සුවකිරීමට නොහැකිය. මට එය ක්ෂය කරන උපායක් උපන්නේ යයි සිතා මහරජතුමනි, රාජ්‍ය හානියක්, ජීවිත අන්තරායක් ආදියේ මෙය පෙරනිමිත්තක් යයි රජුව හැකිතරම් බියකොට එය සනිපකිරීමට මෙපමණ මෙපමණ ඇතුන්, අශ්වයන් රන්, අමුරන්, මැණික් දක්ෂිණාහි (දන්) දී යාගයක් පුදකළයුතු යයි යාග සමාදානය සමාදන් කරවීය.

ඉක්බිති පසේ බුදුවරු නොයෙක් දහස් ගණන් ප්‍රාණීන් යාගය සඳහා රැස්කරනු දැක මෙබඳු ක්‍රියාවක් කිරීමෙන් නරක විපාක ඇතිවන්නේ යයි, "බොලව් ඔවුන් ඉදිරියට ගොස් බලමු. උණගොබයේ ගාථාවෙන් කියන ලද පරිද්දෙන්ම අවුත් පිඬු පිණිස හැසිරෙමින් රජමිදුලේ පිළිවෙළින් ගියහ. රජු සිංහකවුළුවේ සිට රජමිදුල බලන්නේ, ඔවුන් දුටුවේය. එය දැකීමත් සමග ඔහුට සෙනෙහස උපන්නේය. ඉක්බිති උන්වහන්සේ; කැඳවා, අහස්තලයෙහි පනවන ලද ආසනයේ වඩාහිඳුවා, සකසා වළඳවා, කළ බත්කිස ඇත්තේ නුඹලා කවුරුන්දැයි විචාලේය. මහරජ, අපි, **සිවු දිශාවෝ** වෙමු. මේ කවර අර්ථයක්ද? සිවු දිශාවල අපට කිසිතැනක කිසි බියක් හෝ නැති ගැනීමක් නැත. මහරජ; අපි **මෛත්‍රී** වඩමු. **කරුණාව** වඩමු. මුදිතාව වඩමු. උපේක්ෂාව වඩමු. එම නිසා අපට ඒ බියක් නොවේයයි පවසා, අසුනින් නැගිට තමන් වසන තැනට ගියහ. ඉක්බිති රජතුමා සිතුවේය. මේ ශ්‍රමණයෝ මෛත්‍රී ආදිය වැඩීම නිසා, බියක් නොවෙයි යයි පවසති. බ්‍රාහ්මණයෝ නම් නොයෙක් දහස් ගණන් ප්‍රාණීන් නැසීම වර්ණනා කරති. කවරකුගේ වචනයක් සත්‍ය වෙත්ද? ඉක්බිති ඔහුට මෙබඳු අදහසක් පහළවිය. ශ්‍රමණයෝ පිරිසිදුකමින් අපිරිසිදුකම සෝදති. බ්‍රාහ්මණයෝ අපිරිසිදුකමින් අපිරිසිදුකම සෝදති. අපිරිසිදුකමින් අපිරිසිදුකම සේදීමට නොහැකිය. පැවිද්දෙන්ම වචනය සත්‍ය වෙති. "ඔහු සියලු සත්ත්වයෝ සුඛිත වෙත්වායි, ආදි ක්‍රමයෙන් මෛත්‍රී ආදි සතර බ්‍රහ්ම විහරණ වඩා, හිතවත්කම පැතිරීමෙන්ද ඒ ඇමතියන්ට අණ කළේය. සියළු ප්‍රාණීන් මුදවවු! ශීතල ජලය පොවත්වා. හරිත තෘණ කවත්වා! සිසිල් සුළඟ ඔවුන්ට සලස්වාවා! ඔවුහු එසේ කළහ. ඉක්බිති රජු කල්‍යාණ මිත්‍රයන්ගේ වචනයෙන් පාපකර්මයෙන් මිදුණෝ වෙමුයි, එහිම සිට විදර්ශනා වඩා පසේබෝධිය සාක්ෂාත් කළේය. ඇමතියන් විසින් ආහාර වේලාවේ මහරජ; අනුභව කිරීමට සුදුසු කාලයයි **කී** කල්හි, මම රජ නොවෙමි යයි පෙර වූ පරිදි සියලු තතු පවසා මේ උදාන වාක්‍ය ගාථා වදාළ සේක.

එහි **චාතුද්දිසෝ** යනු සතර දිශාවල සැප කැමැති පරිදි වේ. එක දිශාවක් පතුරුවා, වාසය කරයි යනුවෙන් බ්‍රහ්ම වියරණ භාවනාවෙන් පතුරුවා සතරදිශාව ඔහුට සමීප වේනුයි - **චතුද්දිසා** නම් වේ. ඒ සතර දිශාවල කිසිතැනක් සත්ත්වයන් හෝ සංස්කාරයන් හෝ බියෙන් නොපෙළෙයි යනුවෙනි. **අපපටිසෝ සනතුසස මානෝ** යනු දොළොස් වැදෑරුම් සන්තෝෂ වශයෙනුයි. **ඉතරීතරෙනා** යනු උස්පහත් වශයෙනි.

පරිසඝයානං සහිතා අචඡමහි යනු මෙහි ඉවසති. කාය සිත් පිරිහෙත්. හේ ඔවුන්ගේ සම්පත් හෝ ඒවා වෙන්කොට නිදත්නුයි **පරිසඝයා** නම් බාහිර වූ සිංහ ව්‍යාඝ්‍රාදින්ගේද, අභ්‍යන්තර කාමච්ඡන්දාදින්ගේ කාය චිත්ත උපද්‍රවයන්ගේ මෙය විශේෂ වචනයකි. ඒ ඇසුරෙහි මැනවින් ඉවසීමද වීර්ය ආදි ධර්මයන් ඉවසයි යනු **පරිසඝයානං සහිතා** නම් වේ. තද වූ බියක් නැති ගැනීමක් නැති නිසා **අචඡමහි** නම් වේ. කුමක් කියන ලද්දේ වේද? යම්සේ ඒ ශ්‍රමණයෝ සතරදෙනා මෙසේ අවශේෂ වශයෙන් සතුටුවනු ලබන්නේ, මෙහි පිළිවෙත් සරු ආකාරයෙන් පිහිටි සතුටින් සිටියේ, සතර දිශාවල මෛත්‍රිය ආදිය වඩන නිසා චාතුද්දිසෝ නම් වේ. සත්ත්ව සංඛාරාදිය විෂයෙහි, විනාශ කරන ලද බිය ඇති බැවින්, **අප්පටිඝ** නම් වෙයි. හෙතම සිවු දිශාවලට කියන ලද අයුරින් අනතුරු සහිත බැවින් ක්‍රෝධ නැත්තේමය. බියක් තැතිගැනීමක් නැත්තේද වෙයි. මේ පිළිවෙත් සරු ගුණය දැක, නුවණින් පිළිපැද, පසේබෝධිය අධිගම කළේනුයි. නැතහොත් ඒ ශ්‍රමණයෝ මෙන් සතුටු සිතැත්තේ, කලින් කියන ලද අයුරින් සතර දිශාව වෙයි යයි දැන මෙසේ සතරදිශා භාවය ප්‍රාර්ථනා කරන්නේ සිහිනුවණින් පිළිපැද, අධිගම කළේය. එහෙයින් වෙනත් මෙබඳු තැනක් ප්‍රාර්ථනා කරනු ලබන්නේ සතර දිශාවේම ප්‍රවේශම් සහිත බැවින් ප්‍රතිඝයෙන් වැලකී බිය සන්ත්‍රාස රහිතව, **එකො චරෙ ඛග්ග විසාණ කප්පො** යනුයි. ඉතිරිය කියන ලද අයුරින්මය.

සිවුදිශා ගාථා වර්ණනාවයි.

1-9

දුඝසංගහා යනු කවර උපතක්ද? බරණැස් රජුගේ අගමෙහෙසිය කලුරිය කළාය. ඉක්බිති ශෝකයෙන් යුතුව කල්ගත කරන කල්හි, එක දවසක් ඇමතියෝ, රජවරුන්ගේ නම්, ඒ ඒ ක්‍රියාවලදී අගමෙහෙසියක් අවශ්‍යයෙන්ම කැමැතිවිය යුතුය. යහපති දේවයන් වහන්ස, වෙනත් දේවියක රැගෙන ඒවා'යයි ආයාචනා කළහ. රජු! එසේ වීනම් බොලවු, අනුදැන ගනිවු! යයි කීවේය. ඔවුහු සොයනු ලබන්නේ, හාත්පස රාජ්‍යයෙහි රජු මියගියේය. ඔහුගේ දේවිය රාජ්‍යය අනුශාසනා කරයි. ඇයද ගැබිණියක් වූවාය. ඇමතියෝ මැය රජුට සුදුසු යයි, දැන ඇයට ආයාචනා කළහ. ඇය, ගැබිනියක නම් මිනිසුන්ට අමනාප වෙයි. යම්තාක් ප්‍රසූත කරම්ද, ඉදින් අනතුරුව එවු! යහපති මෙසේ. ඉදින් වෙනකකු නොසොයවු යයි

කීවාය. ඔවුහු මේ කරුණ රජුට දැන්වූහ. රජු, ගැබිනියක වේවා, රැගෙන එවු යයි කීවේය. ඔවුහු රැගෙන ආහ. රජු ඇය අභිෂේක කොට සියලු මෙහෙසියකගේ සම්පත් පිරිනැමීය. ඇගේ පිරිවර ජනයාද නොයෙක් පුදපඬුරුවලින් සංග්‍රහ කරයි. ඇය කලකින් පුතකු වැදුවාය. ඔහුද රජු තමන්ගේ පුතකු මෙන් සියලු ඉරියව්වල ඇකයෙහිද උරහිසෙහිද කොට වාසය කරයි. එකල දේවියගේ පිරිවර ජනයා සිතූහ. රජු කුමරුට අභිශයින් සංග්‍රහ කරයි. රජුගේ හදවතට අවිශ්වාසනීය වේ. ඉදින් එය බිඳවන්නෙමුයි, ඉක්බිති කුමරුට කීහ. දරුව නුඹ, අපගේ රජතුමාගේ පුතෙකි. මේ රජුගේ පුතකු නොවේ. මෙහිලා විශ්වාස නොකරවු. ඉක්බිති කුමරු පුත, මෙහි එන්න යයි කියනු ලබන්නේද, අතින් අදිනු ලබන්නේ ද, පෙර මෙන්, රජුට ඇලුම් නොකරයි. රජු කුමන කරුණක් නිසාදැයි විමසන්නේ ඒ පුවත දැන, මොනු මා විසින් සංග්‍රහ කරන ලද්දේ නමුත් පිළිකුල් වතින් යුතුවම සිටි කලකිරී රාජ්‍යය හැරදමා පැවිදි විය. රජු පැවිදි වූයේ යයි ඇමති පිරිවර ජනයෝද බොහෝසෙයින් පැවිදි වූහ. පිරිවර ජනයා සහිත රජුද රජු පැවිදි වූයේ යයි මිනිස්සු ප්‍රණීත ආහාරපාන සපයති. රජු ප්‍රණීත ආහාර අභිවෘද්ධියට යොදවති. එහිදී යම් සුන්දරත්වයක් ලබති. ඔවුහු සතුටු වෙති. සෙස්සෝ කෑගසති. අපි පිරිවෙන් ආදිය අතුපතුගාමින් සියළු කටයුතු කරන්නේ, රළු බත් ද, දිරාගිය වස්ත්‍ර ද ලබමු. ඔහු එය දැන මේ අනුපිළිවෙළින් වැඩිමහළු පිළිවෙළින් දෙනු ලබන්නේ ද, කෑකෝ ගසති. අනේ නොහික්මුණු පිරිසකි. පාසිවුරු රැගෙන හුදකලාවම වනයට පිවිස, විදර්ශනාව වඩා, පසේබෝධිය සාක්ෂාත් කළේය. එහි පැමිණියවුන් විසින් කමටහන් විචාරණ ලදුව මේ ගාථාව කී සේක. එහි අර්ථය ප්‍රකට වේමය.

මේ යොදුන වනාහි, **දුස්සංගෝ පබ්බ ජිතාපි එකෙ** යමෙක් නොඇලුණේ මඩනා ලද්දේ වී. එපරිදිම. **අථෝ ගහට්ඨාපරමාව සත්තා** මෙසේ මම ඉවසීමට නොහැකි බව පිළිකුල් කරන්නේ විදර්ශනාව වඩා අධිගම කළේය. ඉතිරිය පෙර පරිද්දෙනි.

දුස්සංග ගාථා වර්ණනාවයි.

1-10

ඔරොපයිත්වා යනු කවර උපතක්ද? බරණැස සිවුමාස් බ්‍රහ්මදත්ත

නම් රජු ග්‍රීෂ්ම ඍතුවේ පළමු මාසයේ උයනට ගියේය. එහි රමණීය භූමිභාගයක නිල්වන්පාටින් යුතු (හරිත) කොළවලින් ගැවසුණු මදාරා ගසක් දැක මදාරා ගස මුල, මගේ යහනවා පනවවු යයි පවසා උද්‍යානයේ ක්‍රීඩාකොට සවස් කාලයේ එහි නිදා ගත්තේය. නැවත ගිම්හානයේ මධ්‍යම මාසයේ උයනට ගියේය. එදින පරසතු ගස මලින් බරවී තිබේ. එදිනද එසේම කළේය. යළිත් ග්‍රීෂ්මයේ පශ්චිම මාසයේ ද ගියේය. එකල පරසතු ගස මැලවුණු පත්‍ර ඇත්තේ ගස වියලී මෙන් තිබුණි. එදිනද රජ නොදැකම ඒ ගස පෙර පරිදිම එහිම සයනය කිරීමට අණ කළේය. ඇමතියෝ දන්නේ නමුත් රජුගේ අණ බැවින් එහි සයනය කිරීමට සංඥා කළහ. ඔහු උයනේ සෙල්ලම්කොට සවස් කාලයේ එහි යහනට කැපවන්නේ ඒ ගස දැක, මේ පෙර අතුවලින් ගැවසුණු මැණික් මෙන් විය. මනාරූ සටහනින් යුක්ත විය. තවද මැණික් වර්ණ අතු අතරද, තබන ලද මුතු අංකුර හා සමාන මල්වලින් මනා සෝභාවෙන් දර්ශනීය මත්විය. මුතු දැල් හා සමාන විසුරුවන ලද, වැලි ඇත්තේ ඔහුගේ යට භූමිභාගය බැම්වලින් මිදුණු මල්වලින් ගැවසුණු රතු බුමුතුරුණුවක් සේ විය. ඔහු නම් අද, වියලුණු ගසක් මෙන් අතු පමණක් ඉතිරිවී තුබුණේ අහෝ ජරාවෙන් මඩනා ලද්දේ බිඳුණේ යයි සිතා අනුපිළිවෙළින් ජරාවට පත්වුණේ යයි හඟියි. හටගත් නිසාවෙන් අනිත්‍ය සංඥාව උපදවා ගත්තේය. ඒ අනුසාරයෙන් සියළු සංස්කාර ධර්මයෝ දුකයි, අනාත්මයි යනුවෙන් විදර්ශනා වඩන්නේ අහෝ ඒකාන්තයෙන්ම මමද වියලුණු පරසතු පත්‍රයක් මෙන් පහවුණා වූ ගිහි ස්වරූපය ඇත්තේ යයි ප්‍රාර්ථනා කරන්නේ පිළිවෙළින් ඒ යහන්තලාවේ දකුණු පැත්තෙන් හොත්තේම, විශේෂයෙන් බලා පසේබුදු බව සාක්ෂාත් කළේය. ඉක්බිති ගමන්යන කල්හි ඇමතියන් විසින්, දේවයන් වහන්ස, යාමට කාලය යයි කී කල්හි මම රජකු නොවේ ආදිය පවසා පෙර පරිදිම මේ ගාථාව කී සේක.

එහි **ඔරොපයිත්වා** යනු පහකොට ඉවත්වී **ගිහිබ්‍යඤ්ජනානි** යනු කෙස් රවුල් සුදු වස්ත්‍ර අලංකාරාදිය මල් සුවඳ දුම් විලේපන අඹු දරු දැසි දාසියන් මේ ආදි ගිහි ජීවිතයට අදාල දේවල්. **ගිහිබ්‍යඤ්ජනානි** යයි කියනු ලැබෙති. **සංසිනපතෙතා** යනු වැටුණු කොල. **ඥෙත්‍වානා** යනු මාර්ග ඥාණයෙන් සිඳ, **වීරෝ** යනු මාර්ග වීර්යෙන් සමන්විතව. **ගිහිබන්ධනානී** යනු කාම බන්ධනාදිය කාමයෝ වනාහි ගිහියන්ගේ බන්ධන වේ. මෙහි පදාර්ථයයි.

මේ අදහස වනාහි ඒකාන්තයෙන් මම දුරුකොට ගිහි ස්වරූපය, වියලි පත්‍රයක් මෙන් පරසතු රුකක ස්වරූපය වන්නේ මෙසේ සිතනු ලබන්නේ විදර්ශනාව වඩා අධිගම කළේය. සෙස්ස පෙර පරිද්දෙන් දත යුතුය.

කෝවිළාර ගාථා (පරසතු) වර්ණනාවයි.

1-11,12

සචෙ ලභෙථ යනු කවර උපතක්ද? පෙර කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ පසේබුදුවරු දෙනමක් පැවිදිව වර්ෂ විසිදහසක් යාම-ඒම වත සපුරා දෙව්ලොව උපන්නාහ. අනතුරුව චුතවී බරණැස් රජුගේ පුතකු බවට ජ්‍යෙෂ්ඨයා පත්විය. කනිෂ්ඨයා පුරෝහිතගේ පුත්‍රයා විය. ඔවුනු එකදිනම පිළිසිඳගෙන එක දිනයේම මව්කුසින් නික්ම වැලිකෙළියේ පටන් මිත්‍රව වාසය කළහ. පුරෝහිත පුත්‍රයා ප්‍රඥාවන්ත විය. ඔහු රාජ පුත්‍රයාට මෙසේ කීවේය.

මිත්‍රය, ඔබ පියාගේ ඇවෑමෙන් රාජ්‍යය ලබන්නෙහිය. මම පුරෝහිත තනතුරේ වෙමි. මනා හික්මීමෙන් රාජ්‍යය අනුශාසනා කිරීමට හැකිය. එන්න ශිල්ප උගෙන ගන්නෙමු. ඉක්බිති දෙදෙනාම යාගයට සැරසුණු මොටුව ඇතිව සිට ගම් නියම්ගම්වල පිඬු පිණිස හැසිරෙමින් ප්‍රත්‍යන්ත ජනපද ගමකට ගියේය. ඒ ගම පසේ බුදුවරු පස්දෙනෙකු පිඬු පිණිස හැසිරෙන වේලාවේ පිවිසෙත්. එහි මිනිස්සු පසේ බුදුවරුන් දැක ඉතා උත්සාහවත්ව ආසන පනවා, ප්‍රණීත කෑයුතු බීයුතු ආහාර එළවත්. ගරු කරත්. පුද සත්කාර කරත්. ඔවුන්ට මෙසේද අදහසක් පහළවිය. අප හා සමාන උසස් කුලවතුන් නම් නැත. තවද මේ මිනිස්සු ඉදින් යමක් කැමැතිවත්ද? අපට භික්ෂාව දෙති. ඉදින් නොකැමැති වෙත්ද? එවිට නොදෙත්. මෙබඳු ආකාර පැවිද්දන්ට මේ ආකාර සත්කාර කරත්. ඒකාන්තයෙන් මේ අය කිසියම් ශිල්පයක් දනිති. ඔවුන්ගේ සමීපයේ ශිල්ප ඉගෙන ගනිමු නම් මැනවි. ඔවුනු මිනිස්සු ඉවත්ව ගියකල්හි, ඉඩකඩක් ලැබ, ස්වාමීනි නුඹලා ශිල්ප දනිවුද? එය අපටද උගන්වවු යයි ඉල්ලූහ. පසේ බුදුවරු, පැවිදි නොවූවන් විසින් ශික්ෂා දානය කළ නොහැකි යයි කීහ. ඔවුහු පැවිද්ද ඉල්ලා පැවිදි වූද, ඉක්බිති ඔවුන්ගෙන් පසේ බුදුවරු මෙසේ තොප වාසය කළ යුතුය. සිවුරු පෙරවිය යුතුය ආදී

වශයෙන් මූලික චාරිත්‍ර විධි උගන්වා මේ ශිල්පය එකම අභිරහස් ඇලි නිෂ්පාදනය කළ යුතුය. එහෙයින් නුදකලාවම හිඳිය යුතුය. නුදකලාවම සක්මන් කළයුතුය. එකට සිටිය යුතුය. එකට නිදාගත යුතුය. පිළියෙළ පන්සල දුන්හ. ඉක්බිති ඔවුහු තම තමන්ගේ පන්සලට පිවිස නුන්හ. පුරෝහිත පුත්‍රයා නුන්නා වූ කාලයේ පටන් චිත්ත සමාදානය ලැබ, ධ්‍යාන ලබා ගත්තේය. රාජපුත්‍රයා මොහොතකින් කලකිරුණේ ඔහුගේ සමීපයට ආවේය. ඔහු හේ දැක, මිත්‍රය කිමෙක්දැයි විචාලේය. මම කලකිරුණේ වෙමියි කීවේය. එසේ වීනම් මෙහි හිඳ ගනිවු යයි ඔහු එහි මොහොතක් හිඳ මෙසේ කීවේය. මිත්‍රය මේ ශිල්පයේ නුදකලාව ඇලීමේ අවස්ථාවයි. පුරෝහිත පුත්‍රය; එසේ වීනම් මිත්‍රය නුඹ තමන් නුන්නා වූ ස්ථානයටම යන්න. මේ ශිල්පයේ නිමාව උගන්වන්නෙමි. ඔහු ගොස් නැවත මොහොතකින් කලකිරුණේ පෙර පරිද්දෙන්ම තුන්වරක් ආවේය. ඉක්බිති ඔහුව පුරෝහිත පුත්‍රයා එසේම පිටත්කොට එහි ගියකල්හි මෙසේ සිතුවේය. මෙතෙම තමාගේ වැඩද අතපසු කරයි. මාද මෙහි භික්ෂාවලට එන්නේ යයි ඔහු පන්සලෙන් නික්ම වනයට පිවිසියේ අනෙකා, තමන්ගේ පන්සලේම නුන්නේ යළිත් මොහොතකින් කලකිරුණේ ඔහුගේ සමීපයට ගොස් ඔබිමොබ ගමන් කරන්නේ හේ නොදැක සිතුවේය. යමෙක් ගෘහස්ත කාලයේ පඬුරු රැගෙන ආවේද? මා දැකීමට නොලැබුණේය. ඔහු දැන් මා පැමිණිකල්හි දැකීමටද නොදැනු කැමැතිව පහව ගියේය. බොල මිත්‍රය, ලජ්ජා නැතිද? මා සිවු වතාවක් මෙහි පැමිණියේය. ඒ දැන් ඔබගේ වසඟයෙහි පවත්වන්නෙමියි, ඔබ අන් දෙයක් පෙන්වමින් මා වසඟයෙහි පවත්වන්නෙමියි, තමන්ගේ සෙනසුනට පිවිස, විදර්ශනා වඩා පසේබෝධිය සාක්ෂාත්කොට අහසින් නන්දමූලක පර්වතයට ගියේය. අනෙකාද විදර්ශනා අරඹා පසේබෝධිය සාක්ෂාත් කොට එහිම ගියේය. ඒ දෙදෙනාට හිරියල්තලාවේ හිඳ පිළිවෙළින් මේ ගාථා කීවානුය.

එහි **නිපකං** යනු ස්වභාවයෙන්ම දක්ෂ පණ්ඩිත වූ කසිණ පරිකර්මවල දක්ෂ. **සාධු විහාරිං** යනු අර්පණා උපචාර විධිවලින් සමන්විත. **ධීරං** යනු ප්‍රඥාසම්පන්න එහි නිපුණතාවයෙන් ප්‍රඥා සම්පත්තිය කියන ලදී. මෙහි වනාහි ප්‍රඥා සම්පන්න යන අර්ථයයි. **ධිති** යනු ලිහිල්නොවූ දැඩි උත්සාහයයි. "කාමය මස් නහර සම ආදියෙහි" මෙසේ පවත්වන ලද වීර්යට වඩා මෙය විශේෂ වචනයකි. නින්දා කරන ලද පාපය ඇත්තේ ධීරෝ නම් වේ. **රාජාව රට්ඨං විජිතා පහායා** යනු, යම්සේ යුවරජු දිනන ලද රට අර්ථ විරහිත බව දැන රාජ්‍යය හැරදමා නුදකලාව හැසිරෙයි.

මෙසේ බලසේනාව හැර හුදකලාව හැසිරෙන්නේය. නැතහොත් **රාජාව රට්ඨං** යනු යම්සේ සුතසෝම රජු රාජ්‍යය ද විජිතය හැර හුදකලාව හැසිරුණේය. යම්සේ මහජනක රජු මෙනි. මෙසේ හුදකලාව හැසිරෙයි. මෙයද එහි අර්ථයයි. සෙස්ස කියන ලද අයුරින්ම දැනගැනීමට හැකිය. විස්තර නොමැත.

සභාය ගාථා වර්ණනාවයි.

1-13

අදධා **පසංසමා** යනු මේ ගාථාවද යම්තාක් අහස්තලයේ පනවන ලද ආසනයේ, පසේ බුදුවරුන් හිඳ, සිව්දිශා ගාථාවන්ගේ උපත සමානවම උපතකි. මේ වනාහි විශේෂයකි. යම්සේ ඒ රජු රාත්‍රියෙහි තුන්වතාවක් නැති ගත්තේය. එය එසේ මෙසේ නොවේ. ඔහු යාගයක් සූදානම් කළේද, නොවීය. ඔහු අහස් තලයේ පනවන ලද ආසනවල පසේ බුදුවරුන් වඩා හිඳුවා නුඹලා කවුරුන්දැයි විචාලේය. අපි මහරජ, නිරවද්‍ය භෝජන ඇත්තෝ නම් ස්වාමීනි, අනවජ්ජ භොජනො යනු මේ කවර අර්ථයක්ද? සුන්දර හෝ අසුන්දර කවර ලද්දක් නොවෙනස්ව වලඳමු මහරජතුමනි. ඒ අසා රජුට මෙබඳු අදහසක් පහළවිය. ඉදින් මම මේ පිරිස පරීක්ෂා කරන්නේ නම් යෙහෙකි මේ ආකාරද නැද්ද යන වග. එදවස සුන්සහල් සමඟ කාඩි හොද්දක් එළඹීය. එය පසේ බුදුවරු අමෘතය මෙන් නොවෙනස්ව වැළඳූහ. රජ, ප්‍රතිඥා දෙන ලද අයුරින් එකදිනක පවා නොවෙනස් වෙති. නැවත හෙට දැනගන්නෙමියි, හෙට දවස සඳහාද ආරාධනා කළේය. දෙවෙනි දිනයේද එසේම අනුභව කළහ. ඉක්බිති රජු, සොඳුරු දේ දී විමසන්නෙමියි, නැවතද ඇරයුම්කොට දෙදිනක් මහත් සත්කාර කොට ප්‍රණීත අතිවිචිත්‍ර කෑයුතු බීයුතු භෝජනයෙන් සංග්‍රහ කළේය. ඒවාද එසේම නොවෙනස්ව වළඳා රජුට යහපත පවසා පිටත්ව ගියහ. රජු චිරාත්කල් ඉක්ම නොගිය උන්වහන්සේ කෙරෙහි නිරවද්‍යභෝජින බව දැන "අහෝ ඒකාන්තයෙන් මමත් නිරවද්‍යභෝජී වන්නෙමි සිතා මහාරාජ්‍යය හැරදමා, ප්‍රව්‍රජ්‍යාව සමාදන් වී විදර්ශනාව වඩා පසේබුදු වී දිව්‍යරුකක් මුල පසේ බුදුවරුන්ගේ මධ්‍යයෙහි තමන්ගේ අරමුණු වඩමින් මේ ගාථාව වදාළ සේක.

ඒ පදාර්ථ මතු කියන ලදමය. හුදෙක් වනාහි **සභාය සම්පදං** යනු

මෙහි අශෛක්ෂයන් විසින් සීලාදි ගුණ සමුදායෙන් සමන්විත වූ මිත්‍රයෝම සහාය සම්පදා යයි දතයුතුය.

මේ එහි අර්ථයෝජනයයි. මේ යමක් සහාය සම්පදා යයි කියන ලද්දේද, එය සහාය පිළිවෙතයි. අදධා **පසංසාම** එකහෙලාම ස්තුති කරමුයයි කියන ලද්දේ වෙයි. කෙසේද? **සෙට්ඨා සමා සෙවිතබබා සහාය** යනු කවර හෙයින්ද? තමන් විසින්, ශීලාදි ශ්‍රේෂ්ඨයන් සේවනය කරනු ලබන්නේ, සීලාදි ධර්ම ඒ අනුව උපදින්. උපන්නේද, වෘද්ධියට වැඩි බවට විශාලත්වයට පැමිණෙත්. එසේ සේවනය කරනු ලබන්නාගේ අන්‍යොන්‍ය සාධාරණ බවද, කකුසඳ, විනෝදනයට ලද්දේ නොපිරිහෙත්. මේ සහායකයෝ වනාහි ශ්‍රේෂ්ඨද සමද වේ. අලද්ධා කුහනාදි මිථ්‍යා ආජීවය හැරදමා දැහැමින් සෙමින් උපන්නා වූ භෝජනය අනුභව කරන්නේ එහි දැඩි තරහව නූපදවන්නේය. අනවජ්ජභෝජී වී වැඩකැමැති කුලපුත්‍රයා. **එකො වරෙ බගගවිසාණකපෙපා** මමද මෙසේ හැසිරෙන්නේ මේ සම්පත්තිය අධිගම කළේය.

අදධා පසංසා ගාථා වර්ණනාවයි.
ඒකාන්තයෙන් ප්‍රශංසන ලද ගාථාව

1-14

දිසවා සුවණණසස යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු ග්‍රීෂ්ම කාලයේ දිවා යහනට පිවිසියේ විය. ඔහුගේ මෙහෙකාර දාසිය සුදුහඳුන් ඉසියි. ඇගේ එක් බාහුවක එක් රන් වළල්ලක්ද, එක් බාහුවක දෙකක්ද ඒවා ගැටෙත්. අනෙක් ඒවා නොගැටෙත්. රජු එය දැක එසේම සමූහ වාසය ගැටීමටද, හුදකලා වාසය නොගැටීමටද සිත නැවත නැවත ඒ දාසිය දෙස බැලුවේය. එසමයෙහි සියළු අලංකාරවලින් අලංකාර වූ දේවිය එය පරීක්ෂා කරමින් සිටියේ වෙයි. ඇය වර්ණ දාසිය කෙරෙහි රජු පිළිබඳ සිත් ඇත්තේ යයි සිතා ඒ දාසිය වෙත එළඹ තෙමේම ඉසීමට පටන් ගත්තාය. ඇගේද අත් දෙකේම නොයෙක් ආකාර රන්වළලු වෙති. ඒවා එකට ගැටෙන්නේ මහා ශබ්දයක් හටගත්හ. ඒවා ගැටීමෙන් මහා ශබ්දයක් හටගත්හ. රජු අතිශය සියුම් ලෙස කළකිරුණේ දකුණු පැත්තෙන් සිටිමින්ම විදර්ශනා වඩා පසේබුදුබව සාක්ෂාත් කළේය. ඒ නිරුත්තර සුවයෙන් සැපයට පත්වූයේ සඳුන් ගෑ අත් ඇතිව දේවිය වෙත එළඹ

'මහරජ, ආලේප කරමියි'යි කීවේය. ඔහු ඉවත්වෙව. මා ආලේපනය නොකරව'යි කීවේය. ඇය කිම මහරජ? මම මහරජ නොවෙමි. මෙසේ ඔවුනොවුන්ගේ කථාබස් අසා ඇමැතියෝ පැමිණියහ. ඔවුන් විසින්ද මහාරාජවාදයෙන් ආමන්ත්‍රණය කරන ලද්දේ බොලවු, මම රජු නොවේයයි කීවේය. ාසස්ස පළමු ගාථාවේ කියන ලද පරිද්දෙනි.

මේ ගාථා වර්ණනාවයි. එහි **දිසවා** යනු බලා. **සුවණ්ණසසා** යනු රත්රන් වළලුයි. සෙසු පායයයි. අවශේෂ පාඨ මෙහි අර්ථයයි. **පභසසරානි** යනු ප්‍රභාස්වර බබළන්නා වූ යනාදිය කියන ලද්දේ වෙයි. සෙස්සද ඉහත කී අර්ථයමය. මේ යෝජනාව දැක. **භූජසමිං** රන්වළලු ආදිය සමූහවාසයයි. එය ඇතිකල්හි ගැටීම් ඇතිවේ. නුදකලා වාසය නොගැටීම් වේ යයි මෙසේ සිතා විදර්ශනා වඩා අධිගමයට පත්වූයේ යන අර්ථයයි. සෙස්ස අර්ථය පැහැදිලි බව දත යුතුමය.

රන් වළලු ගාථා වර්ණනාවයි.

1-15

එවං දුතියෙන යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු ළඳරු කාලයේම පැවිදිවනු කැමැත්තේ ඇමතියන්ට අණ කළේය. දේවිය ගෙන රාජ්‍යය පරිහරණය කරවු. මම පැවිදි වන්නෙමි. ඇමතියෝ මහරජ, අරාජිකය. රාජ්‍යය අප විසින් රැකිමට නොහැකිය. හාත්පස රජවරු පැමිණ කොල්ල කන්නාහ. එකම පුතකුවත් උපදවන්න. ඒතාක් සිටින්නැයි සංඥා කළහ. මෑදු සිත් ඇති රජු ඉවසීය. ඉක්බිති දේවිය ගැබ් ගත්තීය. රජු නැවත ඔවුන්ට අණ කළේය. දේවිය ගර්භනීය. පුත්‍රයකු උපදී. රාජ්‍යය අභිෂේකකොට රාජ්‍යය පරිහරණය කරවු. මම පැවිදි වන්නෙමි. ඇමතියෝ, මහරජ ඉදින් දේවිය පුතකු හෝ දුවකු ප්‍රසූත කරන්නී යයි නොදනියි. ප්‍රසව කරන කාලය පැමිණියේ යයි යළිත් රජුට සංඥා කළහ. ඉක්බිති ඇය පුතකු වැදුවාය. ඉක්බිති රජු එසේම ඇමතියන්ට අණ කළේය. මහරජ, මොහු ශක්ති සම්පන්න වනතුරු නොයව යයි බොහෝ කාරණාවලින් හැඟවූහ. ඉක්බිති කුමරු ප්‍රතිබල වූ කල්හි ඇමතියන් කැඳවා, දැන් මොහු ප්‍රතිබලය මොහු රාජ්‍යයේ අභිෂේක කොට පිළිපදිවා යයි ඇමතියන්ට අවසර දී එක උරයක් කෂාය වස්ත්‍ර ආදියෙන් පොරවා පැවිදි පිරිකර ගෙන්වාගෙන ඇතුල් පුරයේදීම පැවිදිවී මහා බ්‍රහ්මයා

මෙන් නික්ම ගියේය. සියලු පිරිවර ජනතාව නොයෙක් ආකාරයෙන් වැලපෙන්නේ, රජු ලුහුබැඳ ගියේය. රජු තමන්ගේ රාජ්‍යය සීමාව දක්වා ගොස්, සැරයටියකින් ඉරක් ඇඳ, 'මේ රේඛාව නොඉක්මවිය යුතුයයි කීවේය. කුමරු පියාණනි, පියාණනි යයි දුවගොස් රජු වෙත පැමිණියේය. රජු කුමරු දැක මොහු මහජනයා පිරිවරා රාජ්‍යය කළෙමි. කිම දැන් එක දරුවකු පරිහරණය කිරීමට නොහැකි වෙත්දැයි කුමරු ගෙන වනයට පිවිසියේය. එහි පෙර පසේ බුදුවරුන් විසින් වාසය කළ පන්සලක් දැක පුත්‍රයා සමග වාසය කළේය. ඉක්බිති කුමරු උතුම් යහනාවල කරන ලද පරිචය ඇත්තේ., තෘණ ඇතිරියේ හෝ ලණු ඇඳේ හෝ නිදමින් හඬයි. ශීතල වාතාදිය ස්පර්ශ වූයේ සමාන පියාණනි, ශීතලය. පියාණනි. උණුසුම්ය පියාණනි. මැස්සෙකු කෑවේය. පියාණනි, බඩගිනි. පියාණනි, පිපාසිතය යයි කියයි. රජු ඔහුට සංඥා කරමින්ම රාත්‍රිය කල්ගත කරයි. ඔහු දිවා කාලයේද පිඬු පිණිස හැසිර බත් පිරිනමයි. කුමරු "මිශ්‍රවූ බත තණහාල් මුං කඩල ආදිය බහුල වූයේ අනුභව කරන්නේද, පිළිකුල් වශයෙන් අනුභව කරන්නේ දින කිහිපයකින් උණුසුම් වේ. (අව්වේ) තබන ලද පියුමක් මෙන් මිලාන විය. රජ සමවතට සමවැදීමෙන් නොවෙනස්වම අනුභව කරයි. ඉක්බිති ඔහු කුමරුට සංඥා කරමින් කීවේය. දරුව, නගරයේ ප්‍රණීත ආහාරපාන ලැබෙයි. එහි යමු. පියාණනි, එසේය. ඉක්බිති ඔහු පෙරටුකොට ආවා වූ මාර්ගයෙන්ම පැමිණුනේය. කුමාර මව වූ දේවියද "දැන් රජකුමරු ගෙන වනයෙහි බොහෝකලක් වාසය නොකරන්නේ යයි දැන කිපදිනකින් පෙරළා පැමිණෙන්නේ යයි සිතා රජු විසින් සැරයටියෙන් ලියන ලද ස්ථානයම ආරක්ෂා කොට කල්ගත කළාය. ඉක්බිති රජු ඇය වාසය කළ ස්ථානයට නුදුරේ සිට, ඔබගේ මව මෙහි හුන්නීය. යව යයි පිටත් කළේය. ඔහු එතැනට පැමිණේද? ඒතාක් බලමින් සිටියේය. කිසියම් වෙහෙසක් නොවේවා. කුමරු මව සමීපයට දුවගෙන ගියේය. ආරක්ෂක පුරුෂයෝ කුමරු එන්නේ දැක දේවියට කීහ. දේවිය විසිදහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා ගොස් පිළිගත්තාය. රජුගේ පුවතද විචාලාය. ඉක්බිති පසුපස එයි. යයි අසා මිනිසුන් යැවීය. රජුද එකෙණෙහි සිය වාසස්ථානයට ගියේය. මිනිස්සු රජු නොදැක නැවතුණහ. ඉක්බිති දේවිය ආශා රහිත වී පුතු ගෙන නගරයට ගොස් රාජ්‍යයේ අභිෂේක කළේය. රජුද තමන් වසන තැන හිඳ විදර්ශනා වඩා, පසේබෝධියට පැමිණ දිව්‍ය වෘක්ෂයක් මුල පසේ බුදුවරුන්ගේ මැද මේ උදාන ගාථාව කී සේක.

ඒ පදාර්ථ ඉහත කියන ලද අයුරිනි. මේ එහි විශේෂ අදහසකි. මේ දෙවෙනි කුමරු විසින් ශීතල උණුසුම නිවේදනය කරමින්, සමග වාසය කිරීම හඟවමින්, මගේ වාචාහිලාපො ඔහු කෙරෙහි සෙනහස වශයෙන් අභිසජ්ජනා හටගත්තා වූ ඉදින් මම මොහු අත්නොහරිමි නම් මත්තෙහිද එසේ වෙයි. දැන් යම්සේද එසේය. එවං දුතියෙන සහ මමසස වාචාහිලාපො අභිසජ්ජනා වා මේ දෙදෙනාම අන්තරායකර විශේෂ අධිගමයක් වන්නේය. එතං භයං ආයතිං පෙක්ඛමානො ඔහු අතහැර නුවණින් පිළිපැද පසේබුදු බව අධිගම කළෙමි. සෙස්ස කියනලද අයුරින්මය.

ආයතිභය ගාථ වර්ණනාවයි.

1-16

කාමාහි චිත්‍රා යනු කවර උපතක්ද? බරණැස සිටුපුත්‍රයා ළදරු කාලයේම සිටු තනතුර ලැබීය. ඔහුට ඍතු තුනට ගැලපෙන සේ ප්‍රාසාද තුනක් වූහ. ඔහු සියලු සම්පත්වලින් දිව්‍ය කුමාරයකු මෙන් හැසිරෙයි. ඉක්බිති ඔහු ළදරු කාලයේම පැවිදි වන්නෙමියි මව්පියන්ගෙන් විචාලේය. ඔවුහු වලක්වති. ඔහු එයම ඉල්ලයි. යළිදු ඔහුට මව්පියෝ 'දරුව, නුඹ සියුමැලිය. පැවිද්ද දුෂ්කරය. දැලිපිහි මුවහත උඩ ගමන් කිරීම සමාන යයි නොයෙක් ආකාරයෙන් වලක්වති. ඔහු එහිම ඇලෙයි. ඔවුහු මෙසේ සිතූහ. 'ඉදින් මෙතම පැවිදි වෙයි නම්, අපට දොම්නස් වෙයි. අපිට දොම්නස් වේවා, මොහුට අනුදැනීම් නොවෙව. ඉක්බිති ඔහු සියලු පිරිවර ජනයා අඩා වැලපෙන්නේ නොකැමැත්තේ ඉසිපතනයට ගොස් පසේ බුදුවරුන්ගේ සමීපයේ පැවිදි විය. ඔහුට උදාර සේනාසනයක් නොපැමිණෙයි. ඇඳෙහි කුඩා පැදුරක් අතුරා නිදාගත්තේය. ඔහු උතුම් යහනේ කරන ලද නිදාගැනීම ඇත්තේ මුලු රාත්‍රියම දුකෙන් කල්ගත කළේය. අළුයම ශරීර කෘත්‍යය කොට පාසිවුරු රැගෙන පසේ බුදුවරුන් සමග පිඬු පිණිස හැසිරුණේය. එහි වැඩිමහල්ලෝ මුල් ආසනද, අග්‍ර ආහාරද ලබත්. නවකයෝ යම්කිසි ආසනයක්ද, රූක්ෂ ආහාරයක්ද ලබත්. ඔහු ඒ රූක්ෂ ආහාරයෙන් ඉතා දුකට පත්විය. ඔහු කිහිප දිනකින්ම කෘශ වූයේ දුර්වර්ණ වී හොත්තේය. යම්සේ හේ ශ්‍රමණ ධර්මයෙහි නොපැසුණේ විය. ඉක්බිති මව්පියන්ට දූතයකු යවා උපැවිදි විය. ඔහු කිපදිනකින්ම ශක්තිය ලබාගෙන යළිත් පැවිදිවනු කැමැත්තේ විය. ඔහු දෙවෙනිවරද පැවිදි වී යළිත් උපැවිදිව තෙවෙනිවර පැවිදිවී මැනවින් පළිපන්නේ විදර්ශනා වඩා පසේ බෝධිය සාක්ෂාත් කොට මේ උදාන ගාථාව පවසා පසේ බුදුවරුන්ගේ මැද මේ ව්‍යාකරණ ගාථාව කීවේය.

එහි **කාමා** යනු වස්තුකාම, ක්ලේශ කාම යන දෙකයි. එහි වස්තු කාමය යනු ප්‍රියමනාප ආදි අරමුණු ධර්ම **ක්ලේශකාම** නම් ඡන්ද ආදි සියලු රාග ප්‍රභේද මෙහි වස්තුකාමයම ප්‍රධාන වේ. රූපාදි නොයෙක් ආකාර වශයෙන් **චිත්‍රා** නම් වේ. ලෝකාශ්වාද වශයෙන් මධුරා නමි. බාල පෘථග්ජනයන්ගේ මනස සතුටුකරන නිසා **මනොරමා** නම් වේ. **විරූප රූපෙන** යනු විවිධ අයුරින් නොයෙක් ස්වභාවයෙන් යුක්ත බව කියන ලද්දේ වෙයි. එම රූපාදි වශයෙන් විසිතුරු වූ රූප ආදියෙහි නිල්පාට ආදි වශයෙන් විවිධ රූ ඇත්තේය. මෙසේ ඒ ඒ විරූපී රූපයෙන් එසේ එසේ ආශ්වාද පෙන්වා, **මථෙනති චිත්තං** පැවිද්ද පිණිස සතුටුවීමට නොදෙත්. සෙසු අර්ථ ප්‍රකට වේමය. නිගමනය පද දෙකතුනක් යොදා මුල් ගාථාවල කියන ලද අයුරින්ම දතයුතුය.

කාම ගාථා වර්ණනාවයි.

1-17

ඊනිචා යනු කවර උපතක්ද? බරණැස් රජුට ගඩුවක් (තුවාලයක්) හටගත්තේය. බලවත් වේදනා පවතිත්. වෛද්‍යවරු සැත්කමින් තොරව සුවපත් නොවෙයි යයි පවසති. රජු ඔවුන්ට අභය දී සැත්කමක් කරවීය. ඔවුහු එය පලා පැසවූ ලේ ඉවත්කොට නිර්වේදනාකොට, තුවාලයෙහි රෙදිකඩක් බැන්දාහ. ආහාර ගන්නා වේලාවෙහි ඔහුට මැනවින් අවවාද කළහ. රජු රූක්ෂ ආහාරයෙන් ශරීරය කෘෂ විය. ඔහුගේ ගණ්ඩ මීලාන විය. ඔහු පහසු ඉරියව් ඇතිවී. සිනිඳු ආහාර අනුභව කළේය. එයින් හටගත් ශක්තිය ඇත්තේ ක්‍රියාවේද නිරත විය. ඔහුගේ ගඩුව නැවත පෙර පරිදිම සම්පූර්ණ විය. මෙසේ තුන්වරක් සැත්කමක් කොට වෛද්‍යවරුන් විසින් වර්ජනය කරන ලද්දේ, කලකිරී, මහාරාජ්‍යය හැරදමා පැවිදිව අරණ්‍යයට පිවිස විදර්ශනා අරඹා, වර්ෂ හතකින් පසේ බුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව පවසා නන්දමූලක පර්වතයට වැඩි සේක.

එහි පැමිණේනුයි - **ඊති** ආගන්තුක වශයෙන් ඇතිවන අකුසල නිසා සිදුවන විපත් සඳහා විශේෂ වචනයකි. එහෙයින් කාමගුණයෝද, නොයෙක් ව්‍යසන ඉසිලීම් වශයෙන් අනර්ථයක් හටගන්නේ යන අර්ථයෙන් ඊති නම් වේ. ගණ්ඩද (තුවාල) අශුචි අපිරිසිදු දේ වැගිරෙයි. කුණුවූ පැසවගිය පරිභාණියට පත්වූයේ වෙයි. එහෙයින් මේ කෙලෙස් නැමැති අසූචි

වැගිරීමෙන් හටගත් ජරාවෙන් බිඳීගිය කුණුවූ පැසව සැරව ගලන ස්වභාවයෙන් යුතුවූයේ **ගණ්ඩ** නම් වේ. උපද්‍රව ඇතිකරන නිසා **උපද්‍රව** නම් වේ. අනර්ථයක් උපදවමින් අභිබවා යයි. එතර කරවයි යන අර්ථයයි. රාජ දණ්ඩන දීම් ආදි විශේෂ වචනයකි. එහෙයින් කාමගුණයෙන් නිර්වාණාවබෝධය වලකනු පිණිස හේතුවන සියලු උපද්‍රවයන්ට මුල්වන නිසා උපද්දව නම් වේ. යම් හෙයකින් මේ කෙලෙස් ආතුරභාවය උපදවන්නේ සීලය සංඛ්‍යාත නිරෝගිකමට අනර්ථයක් උපදවන්නේ ස්වාභාවික වූ නිරෝගිකම උදුරාගන්නේ එහෙයින් මේ නිරෝගිකම උදුරා ගන්නේනුයි **රොගො** නම්. අභ්‍යන්තර වශයෙන් මනුෂ්‍යයන්ගේ ඇතුළත වේදනා ඇති කරන ස්වභාවය **සල්ලං** යනු වේ. මෙලොව වශයෙන් ඇතිවන බියජනනය කරන නිසා **භය** නම් යනු මේ අර්ථ යයි. **මෙතං** සමාන අර්ථ ඇත්තේ නිගමනය කියන ලද අයුරින්ම දතයුතුය.

ඊති ගාථා වර්ණනාව

1-18

සීතඤ්ච යනු කවර උපතක්ද? බරණැස සීතාලුක බ්‍රහ්මදත්ත නම් රජකු විය. ඔහු පැවිදිවී වනයෙහි තෘණ ලැහැබක වාසය කරයි. ඒ ප්‍රදේශයේ සීතල වේලාවට සීතලද, උෂ්ණයට උෂ්ණයද වෙයි. එම ඉඩකඩ ඇති ප්‍රදේශයේ සත්ත්වයෝ ඒ ගොදුරු ගම ප්‍රදේශයේ ඇති තරම් ආහාරපාන නොලබයි. පැන් ජලයද දුර්ලභය. වාත, අව්ව, සුළඟ, මැසි මදුරු උවදුරුවලින්ද බාධා කරති. ඔහුට මෙබඳු අදහසක් පහළ විය. මෙයින් අඩ යොදුනක පමණ මත්තෙහි සාරවත් ප්‍රදේශයකි. එහි සියළු ප්‍රමාණවත් පිරිස නැත. ඉදින් මම එහි යන්නේ නම් යෙහෙකි. පහුසවෙන් සැපසේ වාසය කිරීමට හැකිය. ඔහුට යළින් මෙබඳු අදහසක් විය. පැවිදි වූවෝ නම් ප්‍රත්‍යයේ ගිජුවීමක් නොවෙත්. මෙබඳු ආකාර වූවෝ සිත තමන්ගේ වසඟයෙහි පවත්වා ගනිත්. සිත වසඟයේ නොපවතිත්. මම නොයන්නෙමියි, මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට නොගියේය. යම්පමණ මෙසේ උපන් සිතිවිලි පිළිබඳ ප්‍රත්‍යවේක්ෂා කොට නතරවිය. ඉක්බිති එහිම සත්වසක් වාසයකොට මැනවින් පිළිපදින්නේ පසේබුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව පවසා නන්දමුල පර්වතයට ගියේය.

එහි **සීතංච** යනු සීතල දෙපරිදිය. අභ්‍යන්තර ධාතු කැලඹෙන යන අරුතින්ද, බාහිර ධාතු කැළඹෙන යන අර්ථයෙන් ද වේ. එසේ **උණ්හමපි** වේ. **ඩංසා** යනු පියාඹන මැස්සෝ. **සිරිංසපා** යනු යම්කිසි දීර්ඝජාතික

සත්ත්වයෝ සිහිකොට යත් සෙස්ස ප්‍රකට වේමය නිගමනයද කියන ලද අයුරින්ම දතයුතුය.

සීතාලුක (සීත උණ්ණ) ගාථා වර්ණනාවයි.

1-19

නාගොවා යනු කවර අර්ථයක්ද? බරණැස එක්තරා රජකෙනෙකු වර්ෂ විස්සක් රාජ්‍යය කරවා කලුරිය කළේ අපායේ වසර විස්සක් පමණ පැසී හිමාලයේ ඇත්කුලයක උපත ලබා මනාරූ ඇති ශරීරයක් ඇත්තේ, පියුම් වරණැති මුළු සිරුරට උදාර වූයේ සමූහ නායක ඇති රජකු විය. අතුපතර බිඳ දමා පොඩිකර ඇත් පැටව් මෙන් අනුභව කරති. දියෙහි බැස ඇතින්නියන්ට මඩවතුරෙන් ආලේපනය කරති. සියල්ල පාරිලෙය්‍යක ඇත්රජුගේ මෙන් විය. ඔහු සමූහයෙන් කලකිරී පිටත්ව ගියේය. ඉක්බිති ඔහුව පියවර අනුසාරයෙන් රැළ ලුහුබැඳ ගියේය. මෙසේ දින තුනක් පුරා ලුහුබැඳ ගියේය. අනතුරුව මෙසේ සිතීය. දැන් මගේ මුනුබුරා බරණැස රාජ්‍යය කරවයි. මම තමන්ගේ පෙර ජාතියේ වූ උයනට යන්නේ නම් යෙහෙකි. එවිට ඔහු මාව එහිදී රකින්නේය. ඉක්බිති ඇත්රැළ රාත්‍රියෙහි නිදාගත් පසු රංචුව හැරදමා තෙමේ උයනට පිවිසියේය. උයන්පල්ලා දැක රජුට දැන්වීය. රජු ඇතු අල්ලා ගන්නෙමියි සේනාව යෙදවීය. ඇතා රජුගේම ඉදිරියට යයි.

රජු, මා අභිමුඛව එයි යයි කඩු මුවහත අමෝරා සිටියේය. ඉක්බිති ඇතුට විදින්නේද, මෙතෙම මානුෂික වූ වචනයෙන් "බ්‍රහ්මදත්ත මට නොවිදින්න. මම ඔබගේ සීයා"යයි කීවේය. රජු; කුමක් කියහිදැයි සියල්ල විචාලේය. ඇතුද, රාජ්‍යයෙහිද නරකයෙහිද, ඇත්යෝනියේ සියලු ප්‍රවෘත්ති දැනුම් දුන්නේය. රජු; සුන්දරය, බිය නොවව. කිසි හිංසාවක් නොවේවා'යි ඇතුට කෝටුවක්ද, ආරක්ෂකයෙක්ද, ඇත් භාණ්ඩද එළඹවීය. ඉක්බිති එක දවසක් රජු ඇත්පිට නැගී මෙතම විසිවර්ෂයක් රාජ්‍යයකොට, නරකයේ පැසී, පැසී අවසානයේ තිරිසන් යෝනියේද උපත්තේ, එහිද සමූහ වාසයේ ගැටුම් නොඉවසන්නේ මෙහි පැමිණියේ අහෝ දුකකි. ගණ සංවාසය හුදකලා වාසයට සැපයක් යයි සිතා එහිම විදර්ශනා වඩා පසේ බුදුභාවය සාක්ෂාත් කළේය. ඒ ලෝකෝත්තර සැපයෙන් සුබිතව ඇමතිවරු වෙත එළඹ තමස්කාරකොට යන කල්හි මහරජ යයි කීවාහුය. ඉක්බිති මම 'රජු නොවෙමි' යයි පවසා පෙර පරිදිම මේ ගාථාව කීවේය.

ඒ පදාර්ථය ප්‍රකටමය. ඒ මෙහි විශේෂ අර්ථ යෝජනයයි. යුක්ති වශයෙන්ද, ඇසූ මාත්‍රයෙන් නොවේ. යම්සේ මේ ඇතා මිනිසුන් අතර දැකිය හැකි ශීලයන් කෙරෙහි දැමුණු බැවින් නොදැමුණු භූමියට නොයයි යයි හෝ ශරීරය මහත් බැවින් **නාගො** නම් වේ. මෙසේ ආර්ය කාන්ත ශීලයන් අතර දැමුණු බැවින් 'නොදැමුණු භූමියට නොපැමිණෙන බැවින් නරක දේ නොකරන්නේ මෙසේ නොපැමිණෙන බැවින්ද, ගුණ ශරීරය මහත් බැවින්ද, **නාග** වන්නෙමි. යම්සේ මෙය යුථා යනු වෙන්වී නුදකලා වාසය කිරීමේ සැපයෙන්. **යථාභිරන්තං විහරං අරඤ්ඤේ එකොචරෝ** බඟ **විසාණ කප්පෝ** මම මෙසේ සමූහය අතහැර ඒකාන්ත විහරණ සුවයෙන්, ධ්‍යාන සුවයෙන් කැමැති පරිදි අරණ්‍යයේ විහරණය කරන්නේ තමන්ට යම් යම් සැපයක් වේද, ඒ ඒ පරිදි යම්පමණ කැමැති වෙමිද? එපමණ අරණ්‍ය විහරණයයි. **එකො චරෙ බඟවිසාණ කප්පෝ** නුදකලාව හැසිරෙන්නේ යන අර්ථයයි. යම්සේ මෙසේ මනාව පිහිටි කඳක් ඇති බැවින්, **සඤ්ඡාතකබන්ධ** නම් වේ. මෙසේ අශෛක්ෂ සීලස්කන්ධයෙන් මහත් බැවින් හටගත් කළක් (සඤ්ඡාතකබන්ධ) නම් වන්නේය. යම් සේ එය පියුම් හා සමාන බෝධි අංගය මහත් බැවින් ආර්ය ජාති නම් පියුමෙහි උපන් බැවින් 'පදුම' නම් වන්නෙමි යම්සේ මෙතෙම බලශක්තියෙන් යුතු බැවින් **උළාර** නම් පිරිසිදු කයින් යුතුව **සමාචාර** ශීල සමාධි ප්‍රඥා ආදියෙන් උදාර වූ බව වන්නේය. මෙසේ සිතමින් විදර්ශනා වඩා පසේබුදු බව අධිගම කළෙමි.

නාගගාථා වර්ණනාවයි.

1-20

අඨානතං යනු කවර උපතක්ද? බරණැස් රජුගේ පුතා ළදරු කාලයේම පැහැදී පැවිදිවනු කැමැතිව මව්පියන්ට ආමන්ත්‍රණය කළේය. මව්පියෝ ඔහු වලක්වති. ඔහු වලක්වනු ලබන්නේද, වලක්වන්නේමය. ඉන් අනතුරුව ඔහු පැවිදි වන්නෙමියි පෙර සිටුපුත්‍රයා මෙන් සියල්ල පවසා අනුදැනහ. පැවිදි වී උයනේම වාසය කළයුතු යයි අනුදැන වදාළහ. ඔහු එසේ කළේය. ඔහුගේ මව උදේම විසිදහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා උයනට ගොස් පුතුට කෑඳ පොවවා, අනතුරුව කැවිලි-පෙවිලි ආදිය දී මධ්‍යාහ්න වේලාව දක්වා ඔහු සමග කථාබස්කොට නගරයට පිවිසෙයි. පියාද මධ්‍යම වේලාවේ අවුත් ඔහුට භෝජනය දී තෙමේද අනුභවකොට

දවස පුරා ඔහු සමග කථාබහකර සවස් කාලයේ කැපකාර පුරුෂයන් තබා නගරයට පිවිසෙයි. ඔහු මෙසේ දිවාරාත්‍රී නොවෙනස්ව වාසය කරයි.

එසමයෙහි ආදිච්ච බන්ධු නම් පසේ බුදුරජ නන්දමූලක පර්වතයේ වාසය කරති. උන්වහන්සේ ආවර්ජනා කරන්නේ ඔහු දුටුවේය. මේ කුමරු පැවිදිවීමට නොහැකිය. කෙළෙස් සිඳීමට නොහැකිවෙයි. අනතුරුව, ආවර්ජනා කළ සේක. තමන්ගේ ධර්මතාවයන් කලකිරෙන්නේද නැද්ද? ඉක්බිති ධර්මතාවයෙන් කලකිරෙන්නේ අති වීරයෙකු වන්නේ යයි දැන ඔහුගේ අරමුණු පෙන්වන්නෙමියි පෙර පරිද්දෙන්ම හිරියල් පර්වතයට පැමිණ උයනේ සිටි සේක. රාජ පිරිස දැක මහරජ; පසේ බුදුවරයෙකු වැඩම කළේ යයි දැන්වීය. රජු, දැන් මගේ පුතා සේ බුදුවරයෙකු සමග එකට බැඳී නොකළකිරුණේ වාසය කරන්නේ යයි සතුටු සිත් ඇති මනසින් යුතුව, පසේ බුදුරදුන්ට සකසා උපස්ථානකොට එහිම වාසය කිරීමට අයැද, පන්සලේ දිවා විහරණ, සක්මන්සල් සියල්ල කරවා, වාසය කළේය. උන්වහන්සේ එහි වාසය කරන්නේ, එක් දවසක් ඉඩක් ලැබ කුමරුගෙන් විචාළේය. නුඹ කවරෙක්ද? මම පැවිද්දෙක් වෙමි. පැවිද්දෝ නම් මේ ආකාර නොවෙත්. ඉක්බිති, ස්වාමීනි; කෙබඳු ආකාර වෙත්ද? කිම, මා නුසුදුසුදැයි කී කල්හි, නුඹ තමන්ට නුසුදුසු බව නොපෙනෙහි. නුඹගේ මව විසිදහසක් ස්ත්‍රීන් සමග පෙරවරු කාලයේ එති. උයන අපිරිසිදු කරයි. පියාද මහත් බල සේනාව සමග සවස් කාලයේ පැමිණෙයි. ආරක්ෂක පුරුෂයෝ මුළු රාත්‍රියේම වෙති. පැවිද්දෝ නම් ඔබ හා සමාන නොවෙත්. මෙබඳු ආකාර වෙත් යයි එහි සිටියේම සෘද්ධියෙන් හිමාලය අතරින් එක්තරා විහාරයක් පෙන්වීය. උන්වහන්සේ එහි පසේ බුදුවරුන් අරමුණු බහා තබා සිටියේ සක්මන් කරන්නේද, කෙලෙස් දුරුකොට පිරිසිදු කර්ම කරන්නේද දැක කීවේය. නුඹලා මෙහි නොයවුද? පැවිද්දෝ නම් නුඹලා විසින් අනුදැන වදාරා ඇත්ද? එසේය. පැවිද්දෝ අනුදැන වදාරා ඇත. පැවිදි වූ කාලයේ පටන් ශ්‍රමණයෝ නම්, තමන්ගේ නිශ්ශබ්දව විසීමට අනුන්ගේ සිතන පතන ප්‍රදේශවලට යාමට ලැබෙත්. මෙපමණම වටී යයි පවසා අහසේ සිට,

"යමක් ස්පර්ශ කිරීමෙන් විමුක්තිය සෑදේද,
සමූහය ඇලුණු අයෝග්‍ය තැන් දුරු කරත්."

මේ උපගාථාව පවසා පෙනෙන්නා වූ අහසින් නන්දමූල පර්වතයට ගියේය. මෙසේ පසේ බුදුරදුන් ගියකල්හි හෙතම තමන්ගේ පන්සලට පිවිස, හොත්තේය. ආරක්ෂක පුරුෂයාද නිදාගත්තේය. කුමරු දැන්, කොහේ යන්නේදැයි, ප්‍රමාදවී, නිද්‍රාවට බැස්සේය. හෙතම ඔහුගේ ප්‍රමාද බව දැන පාසිවුරු රැගෙන අරණ්‍යයට පිවිසෙයි. එහි සිට විදර්ශනා වඩා පසේබුදු බව සාක්ෂාත් කොට පසේ බුදුපදවියට ගියේය. එහිදී ක්‍රියාව අධිගම කළේයයි විචාරණ ලදුව, ආදිච්චබන්ධු පසේ බුදුරද විසින් වදාරණ ලද ගාථා අර්ථය සම්පූර්ණකොට කීවේය.

එහි අර්ථය :- **අට්ඨානතං** යනු ඒ නුසුදුසු තැනය. එය කරුණු නොවූ බව කියන ලද්දේ වෙයි. නුසුදුසු කලාපයයි 'අරිය සච්චාන දස්සනං' ආදියෙහි මෙනි. ආර්ය සත්‍යය දැකීමට සුදුසු තැනක් නොවේ. **සංගණිකාර** කස්සා යනු සමූහයෙහි ඇලුණේ **යං** යනු ඒ කාරණයමය. "යමක් ලජ්ජාව ඇතිකරයිද, ලජ්ජා විය යුතුය යන අදහස" **එසසයෙ** යනු ලබන්නේය. **සාමයිකං විමුත්තිං** යනු ලෞකික සමාපත්තියයි. එය අයෝග්‍ය කාලයේම ප්‍රත්‍යක්ෂ වශයෙන් මිදීම් වශයෙන් සාමයික බව විමුක්තිය ඇති කරයි යන අර්ථය කියනු ලැබේ. ඒ සාමයික විමුක්තිය අයෝග්‍ය නැත. ඒ කාරණය විද්‍යමාන නොවේ. සමූහයේ ඇලුණු අයට යම් කරුණකින් විමුක්තිය ස්පර්ශ වේද, මේ **ආදිච්ච බන්ධුසස පච්චෙක බුද්ධසස** වචො නිසම්ම ආදිච්ච බන්ධු පසේ බුදුරදුන්ගේ නියමයෙන් සමූහයේ ඇලීම දුරුකොට සිහිනුවණින් පිළිපදින්නේ අධිගම කළේ යයි කීහ. සෙස්ස කියන ලද පරිද්දෙනි.

අට්ඨාන ගාථා වර්ණනාවය

දෙවෙනි වර්ගයයි.

1-21

දිට්ඨී විසූකානි යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු, රහසිගතව මෙසේ සිතුවේය. යම්සේ ශීතල ආදිය නැසීම නිසාවෙන් උෂ්ණය ආදිය ඇත. එසේ වෘත්තය වටය විනාශ කිරීමට විවර්ටයක් නැද්ද? ඔහු ඇමතියන් විචාලේය. විවර්තයක් දනිවු ද? ඔවුහු 'මහරජ දනිමු'යි කීවාහුය. රජු එය කුමක්ද? අනතුරුව 'ලෝකය අන්තය' ආදී වශයෙන් ශාස්වත-උච්ඡේද ආදිය කීහ. රජු, මොවුන් නොදනිත්. සියළුම

දෘෂ්ටි ගතිකයෝ තෙමේම ඔවුන්ගේ නොගැලපෙන බවද අයුක්තියද දැන සසර විනාශ කරන, වෙන්වීමක් ඇතැයි එය සෙවිය යුතුයයි සිතා රාජ්‍යය හැරදමා පැවිදිවී විදර්ශනා වඩන්නේ පසේ බුදුබව සාක්ෂාත් කළේය. මේ උදාන ගාථාවද ප්‍රකාශ කළහ. පසේබුදුවරුන්ගේ මැද වියරණ ගාථාවද කී සේක.

එහි අර්ථය :- **දිට්ඨි විසුකානි** යනු දෙසැටක් දෘෂ්ටිගතව ඒවා මාර්ග සම්මා දිෂ්ටියෙන් බැහැර විරුද්ධාර්ථවත් වූද කලඹන්නා වූද විරුද්ධ වූ දෘෂ්ටිගතව පවතින හෙයින් **දිට්ඨි විසුකානි** නම් වේ. **උපාතිවත්තෙනා** යනු දර්ශන මාර්ගයෙන් ඉක්මවා ගොස්. **පත්තෙනා නියාමං** යනු පුරුදු කළ ධර්මතා ඇති බැවින් සම්බෝධිය පරායණකොට ඇති නියත බව අධිගම කළ, සම්මත වූ නිශ්චිත මාර්ග සංඛ්‍යාත පළමු මාර්ගයයි. මෙපමණ, පළමු මාර්ගය කෘත්‍යය, නිෂ්පත්තිය සහ එහි ප්‍රතිලාභය කියන ලදි. දැන් **පටිලද්ධ මග්ගෝ** යනු මේ අයුරින් සෙසුමාර්ග ප්‍රතිලාභයද පෙන්වයි. **උප්පන්න ඤාණොමහි** යනු උපන්නා වූ පසේබෝධි ඥානය වෙමි. මෙයින් ප්‍රතිඵලය දක්වයි. **අනඤ්ඤනෙය්‍යෝ** යනු අන් අය විසින් මෙය සත්‍යයක් යයි දැනගෙන මෙයින් තෙමේ අවබෝධ කරන බව පෙන්වයි. පසේ බෝධිඥානයට පැමිණියේද, වෙනත් ඤාණ මාර්ගයක් නොපෙනෙන නිසා, තෙමේම අවබෝධ කරගත් විදර්ශනාවෙන්, දෘෂ්ටි වෙනම දැනගැනීමට පැමිණීමයි. මුල් මාර්ගයෙන් නියමයට පැමිණ, සෙසු ඥාන මගින් ලබන ලද මාර්ග ඵල ඥානයෙන් උපන් ඥානය ඇති ඒ සියල්ල තමන් විසින්ම අධිගම කරන ලද්දේයි අන්‍යයන්ට නොපෙනෙන යනුයි. සෙස්ස කියන ලද අයුරින්ම දතයුතුය.

දිට්ඨි විසුක (දෘෂ්ටිය හඳුනා ගැනීම)

ගාථා වර්ණනාවයි.

1-22

නිලෙලාලූපෝ යනු කවර උපතක්ද? බරණැස් රජුගේ අරක්කැමියා, වෙනත් බතක් පිස පිළිගැන්වීය. මනෝඥ වූ දැකුම්කළු වූ මැනවින් රසැති මෙය රජු මට ධනය ලබාදෙන්නේ නම් යෙහෙකි. එය රජු සුවදින්ම අනුභව කෙරේවා'යි කැමැත්ත ඉපදවීය. මුවට කෙළ උනන්නේද

විය. පළමුවෙන්ම මුවෙහි ඔබාගත් කල්හි, රස නහර පිනවමින් අමෘතය ස්පර්ශ කළේ මෙන් වූහ. 'අරක්කැමියා' දැන් මට පෙන්වයි යයි සිතුවේය. රජුද "අරක්කැමියාට සත්කාර කළ යුතුයයි" රජුද 'අරක්කැමියා සත්කාර කළ යුතුයයි සිතුවේය. රසය පානයකොට සත්කාර කරන්නේ, මට ලෝවැඩිය අවලාද නගන්නේය. මේ රජු රසයට ගිජු කරන්නෙකි යනුවෙනි. එසේ වුවත් පව්කාරයා කීර්තිශබ්දය අහස සිසාරා පැතිරවී යයි කිසිවක් කථා නොකළාය. මෙසේ ආහාර වළඳා අවසානයේ අරක්කැමියා 'දැන් පෙන්වයි' 'දැන් පෙන්වයි' රජුද නොගැලපෙන බැවින් කිසිවක් නොබිඳියි. දෙවෙනි දිනයේ අම්හිරි රසයක්වැ පැමිණවිය. රජු අනුභව කරන්නේ තර්ජනය බැහැර කරන්නේ 'ඒකාන්තයෙන් අද අරක්කැමියා යයි දැනගන්නේ පෙර මෙන් ප්‍රත්‍යවේක්ෂා කොට අවර්ණ බියෙන් කිසිවක් කථා නොකළේය. ඉක්බිති අරක්කැමියා රජු සුන්දර හෝ වේවා අවසුන්දර යයි දැනීදැයි සිතා සියළු පිරිවැය තමන්ම ගෙන කිසියම් දෙයක් පිස, රජුට දෙයි. 'රජු අහෝ! ධනලෝභයා වූ මට විසිදහසක් නගර අනුභව කරන්නේ මේ ලෝභකමින් බත්පිඩක්වත් නොලබයි කලකිරී, රාජ්‍යය පැවිදි වී විදර්ශනා වඩා පසේ බුදුබව සාක්ෂාත් කළේය. පෙර පරිදිම මේ ගාථාව කිවයුතුය.

එහි **නිලෙලොලුපො** යනු ලොල් නොවූයේ යනුයි. යමෙක් රස තෘෂ්ණාවෙන් මඩනා ලද්දේ වෙයිද ඔහු බොහෝසෙයින් ලොල්වෙයි. නැවත නැවත ලොල් වෙයි. එයට ලොල්වීම යයි කියනු ලැබේ. එහෙයින් මෙතම එය ප්‍රතික්ෂේප කරන්නේ නුයි, ලොල් නොවූ බව කීහ. **නිකතුහො** යනු මෙහි කිසියම් විධියකින් යමෙකුට ත්‍රිවිධාකාර කුහක වස්තු නැත්ද? හෙතම කුහක නොවූ බවට විශේෂ වචනයකි. මේ ගාථාවේ සුදුසු වූ ආහාරපානාදියෙහි ඇලෙමින් සිටින්නේ එයින් වෙන්වීම කුහක නොවේ යනු අර්ථයයි. **නිපපිපාසො** යනු මෙහි පානය කිරීමට කැමැත්තේ පිපාසාවයි එය නොමැති වූ විට පිපාස රහිත බව නිප්පිපාස නම් වේ. යහපත් රසයේ ලෝභකමින් අනුභව කිරීමට කැමැති බව වැලකීමයි යන අර්ථයයි. **නිමමකෙඛා** යනු මෙහි අනුන්ගේ ගුණ විනාශකිරීමේ ලක්ෂණ ගුණමකු බවයි. එහි අභාවය නැතිකම ගුණමකු රහිත බවයි. තමන් ගෘහස්ථ ජීවනසමයේ අරක්කැමියාගේ ගුණමකු බව සඳහා කියන ලදි. **නිදධනන කසාවමොහො** යනු මෙහි රාගාදි ත්‍රිවිධ කාය දුශ්චරිතාදියද, යම්සේ හටගන්නේ අප්‍රසන්න අර්ථයෙන් තමන්ගෙන් දුරුකොට අනුන් තුළ ආරෝපණය කිරීම, කසට ඇති අර්ථයෙන් කාෂාව බව දතයුතුයි. එබැවින්

කීහ. 'එහි ත්‍රිවිධාකාර කහටබව කෙසේද? රාග කාෂාවය දේවෂ කාෂාවය, මෝහ කාෂාවය මේ තුන කහට නම් වේ. මෙහිදී තවත් කාෂාවයක් ඇත්ද? කාය කාෂාවය, වචී කාෂාවය, මනෝ කාෂාවය යනුවෙනි. ඒවා අතර මෝහය හැර ඒ සියලු පස්වැදෑරුම් කාෂාවයන් මූලකාරණා වූ මෝහය දුරුකරන බැවින් දුරුකරන ලද මෝහ කාෂාවය ගතයුතුය. සෙසු ලොල් රහිත බවද රාග කහට දුරු කිරීමටද, අනුන්ගේ ගුණ නැසීමෙන් වැලකීම දෝෂ කාෂාවයටද අදාළව සිද්ධ වේ. **නිරාසයො** යනු තෘෂ්ණා රහිත බවයි. **සබ්බලොකෙ භවිත්වා** යනු මුළු ලෝකයෙහි, භව තුනෙහිද, දොළොස් වැදෑරුම් ආයතනවලද, භව විභව තෘෂ්ණාවෙන් වෙන්වීම සිට, යන අර්ථයයි. සෙස්ස කියන ලද අර්ථයෙන් දතයුතුය. අනතුරුව පද තුන ගැන පවසා 'හුදකලාව හැසිරීම' යනුවෙන් මෙසේ හෝ හුදකලාව හැසිරීමට හැකිවන්නේ යයි, මෙසේ අර්ථය සම්බන්ධය කළයුතුයි.

රස තෘෂ්ණා රහිත (නිලෙලොලුපගාථා) වර්ණනාවයි

1-23

පාපං සහායං යනු කවර උපතක්ද? බරණැස එක්තරා රජකු මහත් රාජානුභාවයෙන් නගරය ප්‍රදක්ෂිණා කරන්නේ මිනිසුන් කෝෂ්ටාගාරයෙන් පුරාණ ධාන්‍ය ආදිය පිටතට ගෙනයනවා දැක 'බොල, මේ කුමක්දැයි' ඇමතියන්ගෙන් විචාලේය. ඇමතියෝ - මහරජ, දැන අළුත් ධාන්‍ය නිපදවන්නාහ. ඔවුන්ට ඉඩකඩ ලබාදීමට මේ මිනිස්සු, පුරාණ ධාන්‍යාදිය ඉවත් කරති යයි කීවාහුය. රජු; බොලව්, කිම ස්ත්‍රීන් වසන අන්තඃපුර සෙනඟ ආදිය පිරිපුන්දැයි කීවේය. මහරජ, එසේය. පරිපූර්ණ වේ. එසේ වීනම් බොලව්, දානශාලා කරවවු. දන් දෙන්නෙමු. මේ ධාන්‍යාදිය උපකාර රහිතව විනාශ නොකරවු. ඉක්බිති ඒ වෙනත් දෘෂ්ටිගති ඇති ඇමතියකු 'දුන් දියෙහි ඵලක් නැත ආදියෙහි පටන් 'බාලයන්ද, පණ්ඩිතයන්ද දක්වා සැරිසරා දුක් කෙළවර කරන්නේ යයි, පවසා එය වැලැක්වීය. රජු, දෙවනුවද, තෙවනුවද, කෝෂ්ටාගාරය මංකොල්ලකනවා දැක එසේම අණ කළේය. තෙවනුවද, ඔහුට මහරජ, පනවන ලද්දා වූ දානය දෙනු ලැබේවා'යි එය වැලැක්වීය. ඔහු 'බොල, මම මා සතු දේ දීමටද නොලබමි. මේ කිමෙක්ද? පාප සහායකයන් කෙරෙන් කලකිරුණා වූ රජු රාජ්‍යය හැරදමා පැවිදිව විදර්ශනා වඩා පසේ බුදුබව සාක්ෂාත් කළ සේක. ඒ පාපසහාය බවට ගර්හා කරන්නේ මේ උදාන ගාථාව වදාළ සේක.

එහි සංක්ෂිප්ත අර්ථයයි. මේ දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියෙන් සමන්විත වූයේ, පාපකරුය. අනර්ථය පෙන්වන නිසා අනර්ථදස්සි නම් වේ. විෂම වූ කාය දුශ්චරිතාදියෙන් පහවූයේ, ඒ අර්ථකාමී වූ කුලපුත්‍රයා **පාපං සහායං පරිවජ්ජයෙථ අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං සෙවෙ** යනු තමන්ගේ වශයෙන් එය සේවනය නොකරන්නේය. ඉදින් අනුන්ගේ වසඟයෙහි පැවැතියේ වෙයිද? කිම කිරීමට හැකිවන්නේමය. **පසුතං** යනු ප්‍රශස්තව දෘෂ්ටි වශයෙන් ඒ ඒ තැන ළඟින් යන අර්ථයයි. **පමත්තං** කාම ගුණයෙහි පැතිරුණු සිත් ඇති කුසල වැඩීමෙන් තොර වූ, මෙබඳු ආකාර මිතුරන් සේවනය නොකළ යුතුය. භජනය නොකළ යුතුය. ඇසුරු නොකළ යුතුය යනු, **ඒකො චරෙ ඛග්ග විසාණ කප්පො** යයි දතයුතුය.

පාපසහාය ගාථා වර්ණනාවයි.

1-24

බහුස්සුතං යනු කවර උපතක්ද? පෙර කාශ්‍යප බුදුරදුන්ගේ ශාසනයේ පසේ බුදුවරුන් අටදෙනෙකු, පැවිදිව ඒම යාම පිළිබඳ වත් පුරා දෙව්ලොව උපන්නේ යයි ආදි සියළු නිරවද්‍ය දේ අනුභව කළේ ගාථාව සමාන වේමය. මේ මෙහි විශේෂත්වයයි. පසේබුදුවරුන් වඩා හිඳුවා රජු මෙසේ කීවේය. නුඹලා කවුරුන්ද, ඔවුහු කීහ. මහරජ, අපි බහුශ්‍රැතයෝ නම් වෙමු. රජු; මම සුත බ්‍රහ්මදත්ත නම් වේ. ඇසීමෙන් තෘප්තියට නොයමි. ඉදින් ඔවුන්ගේ සමීපයේ විචිත්‍රවත් ලෙස ධර්මදේශනය අසන්නෙමියි සතුටු සිතැත්තේ පැන් දී පිරිසිදු කොට, බත්කිස අවසානයේ සංඝ තෙරුන්ගේ සමීපයේ හිඳ, ස්වාමීනි; දැහැමිකථා කරවු යයි කීවේය. ඔහු මහරජ; සුවත් වේවා! රාගය ක්‍ෂය වේවායි පවසා නැගී සිටියේය. රජු; මෙතම බහුශ්‍රැත නොවේ. දෙවැන්නා බහුශ්‍රැතයෙකු වන්නේය. හෙට දැන් ඔහුගෙන් විසිතුරු ධර්ම දේශනාවක් අසන්නෙමියි හෙට සඳහා ඇරයුම් කළේය. මෙසේ සියල්ලෙන් අනුපිළිවෙළින් යයි ඒ තාක් ඇරයුම් කළේය. ඒ සියල්ලෝම ද්වේෂය ක්‍ෂය කෙරේවා. මෝහය ක්‍ෂය කෙරේවා. උපත ක්‍ෂය කරේවා. භවය ක්‍ෂය කෙරේවා. සසර ගමන කෙළවර කෙරේවා. කෙලෙස් ක්‍ෂය කෙරේවා. තෘෂ්ණාව ක්‍ෂය කෙරේවායි මෙසේ එක එක පදයට විශේෂණකොට, සෙස්ස පළමු අයුරින් විමසා නැගී සිටියහ. ඉක්බිති රජතුමා, මේ අය බහුශ්‍රැත වෙත්නුයි පවසති. ඔවුන්ගේ විසිතුරු කථා නොමැත. ඔවුන් විසින් කුමක් කියන ලද්දේ දැයි, ඔවුන්ගේ වචන අර්ථය පරීක්‍ෂා කිරීමට පටන් ගත්තේය. ඉක්බිති රාගය ක්‍ෂය වේවා!

පරීක්ෂා කරන්නේ, රාගය ක්ෂය වූ කල්හි, ද්වේෂයද, මෝහයද, අනෙක් ඉතිරිවූ ක්ලේශද, ක්ෂය වෙත්වායි දැන සතුටු සිතැත්තේ විය. මේ ශ්‍රමණයෝ පර්යාය වශයෙන් නොවූ බහුශ්‍රුතයෝය. යම්සේ පුරුෂයකු විසින් මහපොළොව හෝ ආකාශය හෝ ඇඟිල්ලෙන් නිර්දේශ කරන්නේ, ඇඟිල්ලෙන් ප්‍රදේශයක් නිර්දිෂ්ට කිරීම නොකළ හැකි වෙයි. එපරිදි මුළු පෘථිවිය ආකාශයේම නිර්දිෂ්ට වෙති. මේ අයුරින් එක එක අර්ථය නිර්දේශ කිරීමෙන් අප්‍රමාණ අර්ථයෝ නිර්දිෂ්ට වෙති. ඉක්බිති ඔහු කවරනම් වේද, මමද, මෙසේ බහුශ්‍රුත වන්නෙමියි, එබඳු ආකාර බහුශ්‍රුතභාවය ප්‍රාර්ථනා කරන්නේ, රාජ්‍යය හැර පැවිදි වී විදර්ශනා වඩා පසේබුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව වදාළ සේක.

එහි මේ සංක්ෂිප්ත අර්ථයයි. බහුසසුතං යනු බහුශ්‍රුත භාවය දෙපරිදි වේ. තුන්පිටකයෙහි අර්ථ වශයෙන් නිශ්චල වූ පර්යාප්ති ධර්මයෙන් බහුශ්‍රුත වූ, මාර්ගඵල ප්‍රතිලාභය සහිත ප්‍රඥාවෙන්, යුක්ත වූ බැවින් අවබෝධ කළ බහුශ්‍රුත බවට පැමිණියේ යන අර්ථයෙන් **ධම්මධර** නම් වේ. උදාර වූ කාය වාග් මනෝ කර්මයන්ගෙන් සමන්විත වූයේ **උළාර** නම් වේ. ප්‍රතිභානයෙන් යුක්ත වූද, ප්‍රතිභානයෙන් මිදුණා වූද, ප්‍රතිභානයෙන් යුක්ත මුක්ත වූ බැවින් **පටිභාණවා** පර්යාප්ති පරිපුච්ඡ, අධිගම වශයෙන් තෙවැදෑරුම් වේ. පටිභාන බව දත යුතුය. යමෙකුට ත්‍රිපිටක ධර්මයෙහි ප්‍රතිභානයක් වේද? හෙතම පරියාප්ත පටිභාණ විශාරද නම් වේ. යමෙකුට අර්ථයද, ඤාණයද, ලක්ෂණද, තැන-නොතැන ද විමසන්නෙකුට නැවත විමසා පිළිතුරු දීමට හැකි බව ප්‍රතිභානයයි. හෙතම විමසා යළිත් විමසා පිළිතුරු දෙන්නේ, යමෙකුට මාර්ග ආදිය ප්‍රතිවේද වෙයි. හෙතම අධිගම පටිභාණ නම් වේ. එබඳු ආකාර වූ **බහුසසුතං ධම්මධරං භජෙථ මිත්තං උළාරං පටිභාණවන්තං.** බහුශ්‍රුත ධර්මධර වූ ප්‍රතිභා ඥානයෙන් පිරිපුන් උදාර මිතුරකු ඇසුරු කරවු. ඉක්බිති ඒ ආනුභාවයෙන් තමන්ටද, අනුන්ටද, දෙපක්‍ෂයටම මෙලොව එලදීම් වශයෙන් පිහිටවන පරමාර්ථ ඥේදයෙන් යුතු නොයෙක් ආකාර වූ **අඤ්ඤාය අත්ථා** යනු අනතුරුව, මම අතීතය ඉක්මවා ගියේ යන ආදි අර්ථවල සැක සහිත ස්ථානවල **විනෙය්‍යකංඛං** විචිකිච්ඡාව (සැකය) දුරුකොට, විනාශකොට මෙසේ කරන ලද සියලු කෘත්‍ය ඇති **එකොචරෙ බගවිසාණ කපෙපා** හුදකලාව හැසිරෙන කඟවේනකු මෙන් යන අර්ථය දතයුතුය.

බහුශ්‍රුත ගාථා වර්ණනාවයි.

1-25

බිඩඩං රතිං යනු කවර උපතක්ද? බරණැස විභූෂක බ්‍රහ්මදත්ත නම් රජු උදෑසනම කැඳ හෝ බත් වළඳා නොයෙක් ආකාර අලංකාරවලින් තමන් අලංකාර කොටගෙන මහා කැඩපතකින් මුලු සිරුර දැක මෙය යමෙක් නොකැමැති වේද එය ඉවත්කොට වෙනත් වෙනත් අලංකාර දෑවලින් අලංකාර කරවයි. ඔහුට එක් දවසක්, මෙසේ කරන්නේ බත් වේලාවට අදාළ මධ්‍යාහ්න සමය උදාවිය. විපිළිසර වූ අලංකාරයෙන් දුහුල්, වස්ත්‍රයකින් හිස වෙලා ආහාර අනුභවකොට දවල් සයනයට සූදානම් විය. යළිත් නැගීසිට එසේම කරනවිට සූර්යා බැස ගියේය. එසේම දෙවෙනි දිනයද, තෙවෙනි දිනයද එසේම විය. ඉක්බිති ඔහුට බොහෝසෙයින් අලංකාර කිරීම නිසා පිටේ රෝගයක් හටගත්තේය. ඔහුට මෙබඳු අදහසක් පහළ විය. බොලවු; මම සියළු ආකාරයෙන් අලංකාර කරන්නේ, මේ කල්පයෙහි නොසතුටට පත්වී ලෝභය උපදවා ගත්තේය. ලෝභයද මෙය අපාය ගමනීය වූ ධර්මතාවයකි. ලෝභයට නිග්‍රහ කරමියි රාජ්‍යය හැරදමා පැවිදිවී විදර්ශනා වඩන්නේ පසේබුදුබව ප්‍රත්‍යක්ෂ කොට මේ උදානය ප්‍රකාශ කළ සේක.

මෙහි බිඩඩා ද රතියද පෙර කියන ලදි. **කාමසුඛං** යනු වස්තුකාම සැපයයි. වස්තුකාමයද, සැපයට විෂය වන බැවින් සැප යයි කියනු ලැබෙත්. යම්සේ රූපයේ සැපයක් ඇත්ද? එය සැපයට වැටෙත් මෙසේ, **බිඩඩං රතිං කාම සුඛංච** නම්. මේ අවස්ථාවේ **ලොකෙ අනලංකරිත්වා** සුදුසු යයි නොකොට, සෑහීමකට පත්වී හෝ සාර වශයෙන් හෝ නොගෙන. **අනපෙකඛමානො** යනු ඒ අලංකාර නොකිරීමෙන් අපේක්ෂා රහිත ඇල්මෙන්, ගැතිනොවී, තෘෂ්ණාව රහිතව. **විභූසණට්ඨානා විරතො සච්චවාදි එකොචරෙ** යනු එහි අලංකාරය දෙවැදෑරුම් වේ. අගාරික අලංකාරය අනගාරික අලංකාරය යනුවෙනි. සළු එතීම මල් සුවඳ ආදි අලංකරණය අගාරික විභූසා නම් වේ. පාත්‍රය සැරසීම් ආදිය අනගාරිය විභූසා නම් වේ. අලංකාරයම අලංකාර අර්ථයෙන් යෙදේ. එහෙයින් විභූෂණ අර්ථයෙන් තෙවැදෑරුම් විරතියක් කියන ලදි. සත්‍යවාදි බව එහි සම්පූර්ණ අර්ථය වශයෙන් දතයුතුය.

විභූෂණ අර්ථ ගාථා වර්ණනාවයි.

1-26

පුත්තංච දාරං යනු කවර උපතක්ද? බරණැස් රජුගේ පුතා ළදරු කාලයේම අභිෂේක ලැබ රාජ්‍යය කරවීය. හෙතම පළමු ගාථාවේ කියන ලද අයුරින් පසේ බෝධිසත්ත්වයෙකු මෙන් රාජ්‍යශ්‍රිය අනුභව කරමින් එක්දිනක් මෙසේ සිතුවේය. මම රාජ්‍යය කරවමින් බොහෝ දෙනෙකුට දුක් ඇතිකරමි. කිමෙක්ද මගේ මේ එකකුගේ බත පිණිස මේ පාපකර්මයෙන් ඇති ඵලය? සැපය උපදවමියි, රාජ්‍යය හැර පැවිදිවී විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව කී සේක.

එහි ධනානි යනු මුතු මැණික රතු මැණික සක් පබළු රිදී ආදි සියළු රත්න වර්ග. **ධඤ්ඤානි** යනු සැල් වී, යව, පරිප්පු, කඩල, මුං ආදි සෙසු සත්වැදෑරුම් කොළ ගෙඩි වර්ග. **බන්ධවානි ඤාති බන්ධු**, ගෝත්‍ර බන්ධු, මිත්‍ර බන්ධු, ශිල්ප වශයෙන් සිවු වැදෑරුම් වූ නෑදෑයෝ වෙති. **යථොධිකානි** යනු ස්වකීය ස්වකීය සීමා වශයෙන් සිටියේම සෙස්ස කියන ලද අයුරිනි.

අඹුදරු (පුත්තදාරා) ගාථා වර්ණනාවයි

1-27

සංගො එසො යනු කවර උපතක්ද? බරණැස පාදලෝල නම් බ්‍රහ්මදත්ත රජ කෙනෙකු විය. ඔහු උදෑසනම කෑද බත් වළඳා ප්‍රාසාද තුනෙහි ත්‍රිවිධ නාටක බලයි. ත්‍රිවිධ නාටක නම්, රජු පැමිණීමට පෙර, රජු පැමිණෙන අතර, තමන් සිටිනා කාලයේ යනුවෙනි. ඔහු එක දවසක් උදෑසනම ළදරු නාටක ප්‍රාසාදයට ගියේය. නාටක ස්ත්‍රීහු රජු සතුටු කරන්නෙමුයි ශක්‍ර දේවේන්ද්‍රයාගේ අප්සරාවන් මෙන් ඉතා මනෝහර නාට්‍ය ගීත වාදන යොදාගත්හ. රජු මේ ළදරු නාටක අසිරිමත් නොවේ යයි නොසතුටු වී, මධ්‍යම නාට්‍ය ප්‍රාසාදයට ගියේය. එහි නාටක ස්ත්‍රීහුද එසේම කළහ. ඔහු එහිදීද එසේම නොසතුටට පත්වී මහලු නාටක ප්‍රාසාදයට ගියේය. ඇලාද එසේම කළහ. රජු දෙතුන් රජ මාළිගාවකදි අතීතයේ ඇලාගේ මහලු බව නිසා අස්ථි ක්‍රීඩා සමාන නාට්‍ය දැක, ගීතයද අමධුර බව අසා යළිත් දහර නාටක ප්‍රාසාදයද, මධ්‍යම නාටක ප්‍රාසාදයේ ද මෙසේ හැසිර කිසිවකුනුත් නොසතුටුව සිතුවේය. මේ නාටක ස්ත්‍රීහු ශක්‍ර දේවේන්ද්‍රයාගේ අප්සරාවෝ මෙන් මා සතුටු කරනු කැමැත්තේ

සියලු ආකාරයේ නෘත්‍ය ගීත වාදන යෙදවූහ. ඉදින් මම කිසිවකුටත් නොසතුටුව ලෝභය වර්ධනය කරමි. ලෝභය නම් අපායගාමනී වූ ධර්මතාවයකි. ඉදින් මම ලෝකයට නිග්‍රහ කරමියි, රාජ්‍යය හැර පැවිදිවී විදර්ශනා වඩන්නේ පසේබුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථා වදාළ සේක.

එහි අර්ථය : **සංගෝ එසෝ** යනු තමන්ගේ පරිහරණය කරන භෝග නිර්දේශ කරයි. ඔහු එහි ප්‍රාණීන්ට මඩෙහි ලැග්ගා වූ ඇත්රංවුව මෙන් සතුටු කරති. **රිත්තමෙත්ථ සෙඛ්‍යං** යනු මෙහි පංචකාම ගුණයන් පරිහරණය කරන කාලයේ, වෙනස් වූ සංඥාවෙන්, උපදවා ගතයුත්ත, කාමාවචර ධර්මයට බැසගත්තාක් මෙන් ලාමක වූ සෞඛ්‍යය ස්වල්පයක් මෙනි. විදුලිඑළියේ බබළවන ලද, නෘත්‍ය දර්ශන සැපය මෙන් ඉතිරිය තාවකාලික යයි කියන ලද්දේ වෙයි. **අපපස්ස දො දුක්ඛමෙත්ථ භියෝ** යනු මෙහි, 'මහණෙනි, යම්බඳු වූ, මේ පංචකාම ගුණය නිසා සැපය සොම්නස උපදියිද? මෙය කාමයන්ගේ ආශ්වාදයයි කියන ලද්දේය. හෙතම යම්බඳු වූ 'මහණෙනි, කාමයන්ගේ ආදීනව කවරේ ද? මහණෙනි, මෙලොව කුලපුත්‍රයා යම් ශිල්පාර්ථයකින් ජීවිතය ගෙවයි ද? යම් මුද්‍රාවකින් හෝ ගණන් ගැනීමකින් හෝ මේ ආදී වූ අර්ථයෙන් මෙහි දුක කියන ලදි. ඒ නිසා අල්ප වූ ජල බිංදු මාත්‍රයක් මෙන් විය. ඉක්බිති මහණෙනි දුක, බොහෝසෙයින් සතර සමුද්‍රයෙහි මහා ජලය මෙන් වෙයි. එහෙයින් කියන ලදී. **අපපස්සාදො දුක්ඛමෙත්ථ භියො** යනුවෙනි. **ගළො එසෝ** යනු ආශ්වාදය පෙන්වා, ඇදගැනීම් වශයෙන් මේ බහුල වශයෙන් මේ පංචකාම ගුණයන් යෙදේ. **ඉති ඤත්වා මුනිමා** යනු මෙසේ දැන බුද්ධිමත් පණ්ඩිතයා පුරුෂයා සියල්ල හැර දමා **එකො චරෙ ඛග්ගවිසාණ කප්පො** යනු ලෙසය.

සංගගාථා (සමූහ) වර්ණනාවයි.

1-28

සඳ්දාලයිත්වා යනු කවර උපතක්ද? බරණැස අනිවත්ත බ්‍රහ්මදත්ත නම් රජකු විය. ඔහු යුද්ධයට බැස්සේ නොදිනම වෙනත් කෘත්‍යයක් ආරම්භ කළේ, නිමනොකර නොනවතියි. එහෙයින් හේ මෙසේ හඳුනා ගත්හ. ඔහු එක් දවසක් උයනට යයි. එසමයෙහි කැලෑ ගින්නක් හට ගත්තේය. ඒ ගින්න වියලි වූද, හරිතවර්ණ තෘණාදිය දවමින් නොනවතිත්ම යයි. රජු එය දැක ඒ නිමිත්තක්කොට අදහසක් පහළ කරගත්තේය. ඉදින්

මේ කැලෑ ගින්න එපරිදි එකොළොස් වැදෑරුම් ගිනි සියලු සත්ත්වයන් දවමින් නොනවති ගමන් කරයි. මහා දුකක් උපදවන්නේ වේද? මමද මේ දුක නවතනු ලබන්නේ, මේ ගින්න මෙන් ආර්ය මාර්ග ඤාණ නැමැති ගින්නෙන් කෙලෙස් දවමින් නොනවතිමින් යන්නේ නම් ඉක්බිති මොහොතක් ගොස්, නදිය අසබඩ කෙවුලන් මසුන් ගනිමින් ඔවුන් දැල අතරට පිවිසියේ එක් මහා මත්ස්‍යයකු දැල පලා පළාගියේය. ඒ ඔවුහු මත්ස්‍යයා දැල කපාගෙන ගියේ යයි ශබ්ද කළහ. රජු ඒ වචනය අසා ඒ පිළිබඳ නිමිත්තක් ඉපදවීය. ඉදින් මමත් ආර්ය මාර්ග ඤාණයෙන් තෘෂ්ණා නැමැති දෘෂ්ටි ජාලය කපා, නොඇලීමට යන්නේ යයි ඔහු රාජ්‍යය හැරදමා පැවිදිවී විදර්ශනා වඩා පසේ බුදුබව සාක්ෂාත් කළේය. මේ උදානයද ප්‍රකාශ කළේය.

එහි දෙවෙනි පදයෙහි යනු නූල්වලින් උපන් යන අර්ථය කියනු ලැබේ. අම්බු යනු ජලයයි. එහි හැසිරෙයි යන අර්ථයෙන් **අබ්‍භමාරී** නම් වේ. මත්ස්‍යයන්ට මෙය විශේෂ වචනයකි. ජලයෙහි හැසිරෙන්නී ඒ නදී ජලයෙහි **දැල හෙලා** ගියාවූ, ජලයේ හැසිරෙන්න. (මාළු මෙන්) කියන ලද්දේ වෙයි. තෙවෙනි පදයෙහි **දඬ්ඪං** යනු පහරදුන් තැන කියනු ලැබේ. අගි යම්සේ ගින්න දැවෙන ස්ථානය යළිත් නොනවතියිද? එහි බොහෝ සෙයින් නොපැමිණෙයි. මෙසේ මාර්ග ඤාණ නැමැති ගින්නෙන් දවන ලද කාමගුණ අර්ථයයි. **අනිවත්තමානෝ** එහි බෙහෝසෙයින් නොපැමිණෙන්නේය යයි කියන ලද්දේ වෙයි. සෙස්ස කියන ලද පරිදිමය.

(සඳාල) කඩාබිඳ දැමීමේ ගාථා වර්ණනාවයි.

1.29

ඔකිඤ්ඤ චක්ඛූ යනු කවර උපතක්ද? බරණැස චක්ඛුලෝල බ්‍රහ්මදත්ත නම් රජ, පදලෝල බ්‍රහ්මදත්ත මෙන් නාට්‍යය දැකීමේ යෙදුණේ වෙයි. මේ එහි විශේෂත්වයයි. ඔහු නොසතුටුව ඒ ඒ තැන යයි. මෙතෙම ඒ ඒ නාටක දැක බොහෝසෙයින් සතුටු වී, නාට්‍ය දැකීමේ පෙරළියෙන්, දර්ශන තෘෂ්ණාව වඩවමින් හැසිරෙයි. ඔහු නාට්‍ය දැකීමේ ආශාවෙන් පැමිණි එක්තරා කෙලෙඹි බිරිඳක දැක රාග සිතක් ඉපදවිය. ඉක්බිති

සංවේග උපදවා බොල, මම මේ තෘෂ්ණාව වඩන්නේ අපායගාමී වන්නෙමි. ඉදින් එය නිගුහ කරමියි පැවිදිවී විදර්ශනා වඩන්නේ පසේබෝධිය සාක්ෂාත් කොට තමන්ගේ ළමු ප්‍රතිපත්තිවලට ගරහමින් ඒ ප්‍රතිවිරුද්ධ ගුණ බබුළුවනු පිණිස මේ උදාන ගාථාව කී සේක.

එහි **ඔක්ඛිත්ත චක්ඛු** යනු යටට හෙළන ලද ඇස් ඇත්තේ, සත්වැදෑරුම් ග්‍රීවා ඇට පිළිවෙළින් තබා, සිහිකරන්නේ, ප්‍රභාණය කළයුතු දර්ශන අර්ථය මොහොතක් බලනු ලබන්නේ යයි කියන ලද්දේ වෙයි. කොපුල් ඇටයෙන් නොව හදවත සමග ගැටෙන්නේ, මෙසේ බැසගත් ඇස් ඇත්තා විසින් මෙය ශ්‍රමණ සාරුප්‍යයට නොගැලපෙයි. **නව පාදලොලො** යනු එකකුට දෙකක්, දෙකකට තුනක් මෙසේ පිරිස මැද පිවිසෙනු කැමැති බැවින් කියනු ලබන පාද මෙන් නොවන්නේ දීර්ඝ චාරිකාවක් නොවන්නේ, චාරිකවෙන් වැලකුණේය. **ගුත්තින්ද්‍රියො** යනු ඉන්ද්‍රියයන් හයෙහි මෙහි මනෝ ඉන්ද්‍රියෙහි වෙන්කොට කියන ලද බැවින් කියන ලද ආකාරයෙන් රක්නා ලද ඉන්ද්‍රිය ඇත්තේය. **රක්ඛිත මානසානො** යනු මනසමය. සිතේ ඒ රැකගනු ලබන්නෙමු. රකින ලද මනසක් ඇති බැවින් යම්සේ කෙළෙස්වලින් පීඩාවක් නොවෙයි. මෙසේ රක්නා ලද සිත් ඇත්තේ යයි කියන ලද්දේ වෙයි. **අනවසඝුතො** යනු මේ ප්‍රතිපත්තියෙන් ඒ ඒ අරමුණුවල කෙලෙස් අනුව යන බව වලක්වන ලද්දේ වේ. **අපරිඩයහමානො** යනු කෙලෙස් ගින්න විසින් නොදවනු ලබන්නේ, පිටතින්ද ඉක්මවන ලද්දේ අධ්‍යාත්ම වශයෙන් නොදවනු ලබන්නේය. සෙස්ස කියන ලද පරිද්දෙනි.

පහතට හැරවූ නෙත් (ඔක්ඛිත්ත චක්ඛු)
ගාථා වර්ණනාවයි.

1-30

ඔහාරයිත්වා යනු කවර උපතක්ද? බරණැස වෙනත් චාතුමාසික බ්‍රහ්මදත්ත නම් රජු සිවුමසක් සිවුමසක් පාසා උද්‍යාන ක්‍රීඩාවට යයි. ඔහු එක් දවසක් ග්‍රීෂ්ම ඍතුවේ මධ්‍යම මාසයේ උයනට පිවිසෙන්නේ උයන් දොරටුවේ කොළවලින් ගැවසුණු, මල්වලින් අලංකාර වූ අතු වෙළප් ඇත්තේ පරසතු මදාරා මල් දැක එක මලක් ගෙන, උයනට පිවිසියේය.

ඉක්බිති රජු විසින් අග, මල ගන්නා ලදැයි, එක්තරා ඇමතියකු ඇතු පිට සිටිමින්, එකම මලක් කඩාගත්තේය. මේ ආකාරයෙන් සියළු බලසේනාව මල් නෙලීය. මල් නොමැති බැවින් පතු ද ගත්හ. ඒ ගස හටගත් මල් කොල නැති, කඳ පමණක් විය. රජු සවස් කාලයේ උයනින් නික්මෙන්නේ ඒ දැක මේ ගසට කුමක් කළේදැයි, මා එන වේලාවේ මැණික් වර්ණ ඇතු පතර මුතු මෙන් දිළිසෙන මල්වලින් අලංකාර විය. දැන් මල්, කොල නැතිව සිටී යයි සිතන්නේ ඒ නුදුරෙහි මල් නොපිපුණු ගසක් ගැවසී ගත් අතු අතර දුටුවේය. දැක, ඔහුට මෙබඳු අදහසක් පහළ විය. මේ ගස මල්බරින් අතු පතරින් සරුසාරය. බොහෝ ජනතාවට ලෝභ සිත් උපදනේය. එයින් මොහොතකිනුදු විපතකට පැමිණියේය. මෙය වනාහි රජුගේ අලෝභය නිසා එහිම සිටියේය. මෙයද රාජ්‍යය මෙන් මල්වලින් පිරි ලෝභය ඉපදවන රුකකි. භික්ෂුභාවය නම් මල් නැති ගසක් මෙන්, ලෝභකම නැත්තේය. එම නිසා මේ ගස මෙන් නොසැලෙයි. මෙය අන්‍ය වූ කොලවලින් පිරිපුන් පරසතු රුක මෙන් මෙසේ කසාවතින් ගැවසුනේ වී, පැවිදිකම ද එසේ වන්නේ යයි, ඔහු රාජ්‍යය හැරදමා පැවිදි වී විදර්ශනා වඩන්නේ පසේ බුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව කී සේක.

එහි **කාසායවතෙථා අභිනික්ඛමිත්වා** යනු මේ ගෘහස්ථයන් ගෙදරින් නික්ම, කසාවත් හැඳපොරවන්නේ වී, මෙබඳු අර්ථය දතයුතුය. සෙස්ස කියන ලද අයුරින් දැනගැනීමට හැකිවේ. විස්තර අවශ්‍ය නොවේ.

පරසතු ගාථා වර්ණනාවයි.

තෙවෙනි වර්ගය

2.31

රසෙසූ යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු උද්‍යානයේ ඇමති පුත්‍රයන් විසින් පිරිවරන ලදුව, ගල්තලා පොකුණේ සෙල්ලම් කරයි. ඔහුගේ අරක්කැමියා සියලු මස් රසය ගෙන ඉතාම රසවත් ලෙස අමෘතය මෙන් වූ විශේෂ බතක් පිළියෙළ කොට පිරිනැමීය. ඔහු එහි

ගිජුබවට පැමිණියේ කිසිවෙකුට කිසිවක් නොදී තෙමේම අනුභව කළේය. ජලක්‍රීඩාවේ බොහෝ වේලාවක් නිරත වීම නිසා ඉක්මණින් ඉක්මණින් අනුභව කළේය. යමකු සමග පෙර අනුභව කරයිද, ඒ කිසිවෙකුත් සිහිපත් නොකළේය. ඉක්බිති පසු සැක සංකාව උපදවා "අහෝ! මා විසින් පාප කර්මයක් කරන ලදී." ඒ මම රස තෘෂ්ණාවෙන් මඩනා ලද්දේ 'සියලු ජනතාව අතහැර හුදකලාවට අනුභව කළෙමි. ඉදින් ඒ රස තෘෂ්ණාවට නිග්‍රහ කරමියි රාජ්‍යය හැර පැවිදි වී විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත් කොට තමන්ගේ පෙර ප්‍රතිපත්තිවලට ගරහමින් ඒ ප්‍රතිපක්ෂ වූ ගුණ සිහිපත් කරමින් මේ උදාන ගාථාව කී සේක.

එහි **රසෙසු** යනු ඇඹුල් මිහිරි තිත්ත කටුක ලුණු කාරම් කෂාය ආදි ප්‍රබේධවලට අයත් විවිධ රසවලය **ගෙධං අකරං** යනු ගිජු බව නොකරන්නේ, තෘෂ්ණාව නූපදවන්නේ යයි කියන ලද්දේ වෙයි. **ආලොලෝ** යනු මෙය අනුභව කරන්නෙමි. මෙය බඩසායින් පෙළෙන්නෙමි. මෙසේ රස විෂයෙහි ව්‍යාකුල නොවී **අනඤ්ඤපොසී** යනු පෝෂණය කළයුතු සමග විහරණය කරන්නන්ගෙන් තොරව, කය සන්තර්පණය කිරීමට පමණක් සතුටුවූයේ යයි කියන ලදි. යම්සේ පෙර උයනේදි රසයන්හි ගිජුබවට පත්වූයේ අනෙකකු විසින් පෝෂණය කරනසුළු වූයේ මෙසේ නොවී යම් බඳු වූ තෘෂ්ණාවේ ලොල් වී, රසයන්හි ගිජු බව කරයිද? යම් තෘෂ්ණාවක් හේතුකොට, මතු තෘෂ්ණාවට මූලික වූ වෙනත් ආත්මභාවයක නූපදින විලාශයත්, අනඤ්ඤපොසි යයි කියන ලද්දේ වෙයි. නැතහොත්, අර්ථය බිඳීමේ අදහසින් කෙලෙස් නැති කළේ යයි කියනු ලැබෙත්. ඔවුන්ගේ පෝෂණය නැතිවීමත් අනඤ්ඤපොසි යන මේ අර්ථය වේ. **සපදානචාරී** යනු නොඉක්මවනසුළු; අනුව හැසිරෙන, ගෘහ පටිපාටියට අනුව අත්නොහැර; කුලවත් නිවසද, දිළිඳු කුලයද නිරන්තරයෙන් පිඬු පිණිස ප්‍රවේශවන්නේ යන අර්ථයයි. **කුලෙ කුලෙ අපපටිබද්ධ චිත්තෙනා** යනු ක්ෂත්‍රිය ආදි කුලවල යම්තැනක කිසියම් කෙලෙස් වශයෙන් නො ලගින සිත් ඇත්තේ, චන්ද්‍රයා උපමා කොට ඇති වක් නොවී යන අර්ථයයි. සෙසු දේ කියන ලද පරිද්දෙනි.

රසයට ගිජුවීමේ ගාථා වර්ණනාවයි.

2.32

පහාය පඤ්චාවරණා යනු කවර උපතක්ද? බරණැස එක්තරා රජකෙනෙකු ප්‍රථමධ්‍යානලාභී විය. ඔහු ධ්‍යාන අනුව රකිමින් රාජ්‍යය හැර පැවිදිවී විදර්ශනා වඩා පසේ බුදුබවට පැමිණ තමන්ගේ ප්‍රතිපත්ති සමුදාය බබළවමින් මේ උදාන ගාථාව කී සේක.

එහි **පඤ්චාවරණානි** යනු නිවරණයෝමය. ඒවා උරග සූත්‍රයේ අර්ථ වශයෙන් කියන ලද්දේ වේ. ඒවා වනාහි වලාකුළු මෙන් සඳ-හිරු එළිය වලකාලති. එහෙයින් **ආවරණා නි චෙතසො** යයි කියන ලද්දේය. ඒවා උපචාර-අර්පණා වශයෙන් ද, **පහාය** දුරුකොට යන අර්ථයයි. **උපකිලෙසෙ** යනු පැමිණි සිතට අකුසල ධර්ම වශයෙන් බාධා කරන්නේ වස්තු උපමාදියෙහි කියන ලද අභිධ්‍යා ආදිය වේ. **බ්‍යපනුජ්ජා** යනු, ඉස්මතු වී විදර්ශනා මාර්ගයෙන් දුරුකොට යන අර්ථයයි. **සබ්බෙ** යනු නිරවශේෂ වශයෙන්. මෙසේ සමථ-විදර්ශනා සම්පන්න වූ පළමු මාර්ගයෙන්, දෘෂ්ටිය ඇසුරුකොට ඇති තැන් ප්‍රහීණ කළ බැවින්. **අනිසසිතො** සෙසු මාර්ගවලින් සිඳ දමා, තෙධාතුක වූ ස්නේහ දෝෂයද, තෘෂ්ණා රාගය ද කියන ලද්දේ වෙයි. ස්නේහයම ගුණයට ප්‍රතිවිරුද්ධ වූ විට ස්නේහ දෝෂය යයි කියන ලද්දේය. සෙස්ස කියන ලද අයුරිනි.

ආවරණ ගාථා වර්ණනාවයි.

2.33

විපිඨී කත්වානා යනු කවර උපතක්ද? බරණැස එක්තරා රජකෙනෙකු, චතුර්ථ ධ්‍යානලාභියෙකු විය. ඔහුද, ධ්‍යානය අනුව රකිමින් රාජ්‍යය හැරදමා පැවිදිවී, විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත් කොට, තමන්ගේ පිළිවෙත් සමුදාය බබළවමින් මේ උදානගාථාව කී සේක.

එහි **විපිඨීකත්වානා** යනු පිටපෙරළා, හැරදමා, දුරුකොට යන අර්ථයි. **සුඛංච දුක්ඛං** යනු කායික සැප දුක්ය. **සොමනසස-දොමනසසං** යනු චෛතසික සැප දුක්ය. **උපෙක්ඛං** යනු චතුර්ථධ්‍යානය අපේක්ෂා

කරන. **සමථං** යනු චතුර්ථ ධ්‍යාන නිසා හටගත් සමාධියටය. **විසුද්ධං** යනු පංච නීවරණ අසුවන, විචාර පීති සුඛ සංඛ්‍යාත නවවැදෑරුම් පංචනීය ධර්මයන්ගෙන් විනිර්මුක්ත වූ බැවින් ඉතා පිරිසිදු වූ. පිරිසිදු කළ රත්රන් මෙන් පහකරන ලද උපක්ලේශ යන අර්ථයයි.

මේ යෝජනා වනාහි සැපද - දුකද දුරුකොට **පුබ්බෙව** ප්‍රථම ධ්‍යාන උපචාරයම දුකකි. තෘතියධ්‍යාන උපචාරය සැපයක් යයි අදහස් කෙරේ. නැවත මුලපටන් කියන ලද, 'ච' කාරයෙන් පරව ගොස්, සොම්නසද, දොම්නසද, දුරුකොට පෙර කියන ලද පරිද්දෙනි. එයින් සොම්නස චතුර්ථ ධ්‍යානයට අනුව යෙදී ඇත. දොම්නසද ද්විතීය ධ්‍යානයම බබළවයි. මේවා, මේවා පර්යාය වශයෙන් ප්‍රහාණය කිරීම් අර්ථයෙනි. පරියාය අර්ථ වශයෙන් නොවන තැන්වල දුකට ප්‍රථම ධ්‍යානය ද, දොම්නසට ද්විතීය ධ්‍යානයද සැපයට තෘතිය ධ්‍යානය ද සොම්නසට චතුර්ථ ධ්‍යානයද ප්‍රහාණය කිරීම් අර්ථයෙන් කියන ලද්දේ වෙයි. ප්‍රථම ධ්‍යානයට සපැමිණ වාසය කරයි. මෙහි උපන් දුක්ඛ ඉන්ද්‍රිය නිරවශේෂ වශයෙන් නිරුද්ධ වේ. සියල්ල අර්ථසාලිනි නම් ධම්මසංගිනි අට්ඨකථාවේ කියන ලද්දේ වේ. යම් හෙයකින්, **පුබ්බෙව** ප්‍රථම ධ්‍යානාදි තුනෙහි, දුක් දොම්නස්, සැප දුරුකොට මෙහිම චතුර්ථ ධ්‍යානයෙහි සොම්නස දුරුකොට මේ ප්‍රතිපදාවෙන් **ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං** හුදකලාව හැසිරෙයි. සෙස්ස කියන ලද පරිද්දෙනි.

විපිටඨි ගාථා (දුරුකිරීම) වර්ණනාවයි.

2-34

ආරද්ධවීරියො යනු කවර උපතක්ද? එක්තරා ප්‍රත්‍යන්ත රජකෙනෙකු දහසක යෝධ බලකායක් සමග රාජ්‍යයෙන් කුඩා, ප්‍රඥාවෙන් මහත්ව සිටියේය. ඔහු එක දවසක් ඉදින් මම රාජ්‍යයෙන් කුඩා වුවත් ප්‍රඥාවෙන් මහත් බැවින් මුළු දඹදිවම අල්ලා ගැනීමට හැකි වේයයි, සිතා හාත්පස රජවරුන්ට දූතයකු යැවීය. දින හතක් ඇතුළත මට රාජ්‍යය දේවා නැතිනම් යුද්ධ කරමියි යනුවෙනි. ඉක්බිති ඔහු තමන්ගේ ඇමතියන් රැස්කරවා, කීවේය. 'මා විසින් නුඹලාගෙන් නොවිචාරාම සැහැසිකමක් කරන ලදි. අසවල් රජතුමාට මෙසේ යවන ලදි. කුමක් කළ යුතුද? යනුවෙනි. ඔවුහු මෙසේ කීහ. මහරජ, ඒ දූතයා නැවැත්වීමට හැකිය. නො එසේ නම්

ගියේ වන්නේය. ඉදින් ඔබ විසින් විනාශයක් කරන ලදි. එසේ වීනම්, අන්‍යයකු ආයුධයකින් මැරීමට දුකය. ඉදින් තවද අපි ඔවුනොවුන් පහරදී මරමු. තමන් පහරදී මරමු. උල තියමු. විෂ පොවමු. මෙසේ ඔවුනතර එක එකා මරණයම වර්ණනා කරයි. ඉක්බිති රජු, මොවුන් විසින් මට කුමක් කියහු? පින්වත මට මහත් යෝධයෝ ඇතැයි කීවේය. ඉක්බිතිඃ මහරජ, මම යෝධයෙකි. මහරජ මම යෝධයකැයි යෝධයෝ දහසක් නැගී සිටියේය. රජු මොවුන් පරීක්‍ෂා කරන්නෙමියි, මහත් චිතකයක් සාදා කීවේය. "බොලවු, මා විසින් මෙනම් වූ සැහැසිකමක් කරන ලදි. එයට මට ඇමැතියෝ අක්‍රෝෂ කරති. ඉදින් මම චිතකයට පිවිසෙන්නෙමි. කවරෙක්, මා සමග පිවිසෙන්නේද? කවරකු විසින් මගේ ජීවිතය පරිත්‍යාග කරන්නේදැයි, මෙසේ කී කල්හි පන්සියයක් යෝධයෝ නැගී සිටියහ. 'මහරජ, අපි විමසන්නෙමු' ඉක්බිති, මහරජු ඉතිරි පන්සියදෙනාට කීවේය. 'දරුවනි, නුඹලා දැන් කුමක් කරන්නෙහුද? ඔවුහු කීහ. මහරජ, මේ පුරුෂාකාර වූ ස්ත්‍රී චර්යා රටාවෝය. තවද මහරජු විසින් විරුද්ධ රජතුමා දූතයකු යවන ලදි. ඒ අපි, ඒ රජු සමග යුද්ධකොට මරන්නෙමු. ඉක්බිති, පරිත්‍යාග කරන ලද, නුඹලා විසින් මගේ ජීවිතයට චතුරංගනී සේනාව සන්නද්ධකොට ඒ යෝධයන් දහසකුත් පිරිවරාගෙන ගොස්, රාජ්‍ය සීමාවේ හුන්නේය. ඒ යුවරජුද ඒ පුවත අසා බොල, ඒ කුඩා රජු, මගේ දාසයකුදු තරම නොවටී යයි පවසා සියලු බලසේනාව ගෙන යුද්ධ කිරීමට නික්ම ගියේය. කුඩා රජු ඒ පුදුමාකාර පුවත අසා කීවේය. දරුවනි, නුඹලා බහුල නොවේ. සියල්ලම ඒකරාශි වී කඩුසමක් ගෙන වහාම මේ රජුගේ ඉදිරියේ ඍජුවම ගමන් කරවු. ඔවුහු එසේ කළහ. ඉක්බිති ඒ සේනාව ජීවග්‍රහයෙන් අල්ලාගෙන තමන්ගේ රජුගේ ඔහු මරන්නෙමියයි, පැමිණියහු හට දුන්හ. යුවරජු, ඔහුගෙන් අභයදානය ඉල්ලීය. රජු ඔහුට අභයදානය දී, සපථ කරවාගෙන තම වසඟයෙහි තබාගෙන ඔහු සමග වෙනත් රජවරුන් ගෙන්වාගෙන තම රාජ්‍ය සීමාවේ සිට යැවීය. 'මට රාජ්‍යය දෙවු. නැතිනම් යුද්ධ කරවු. ඒ මම එකම යුද්ධයක් හෝ නොඉවසමි. රාජ්‍යය පවරා ගනුව. ඒ උපායෙන් සියලු රජවරු අල්ලාගෙන කෙළවර බරණැස රජවරුන්ට මුල පිරිනැමීය. ඔහු එකසියයක් රජවරු පිරිවරාගෙන මුළු දඹදිව ඉසුරුමත් රාජ්‍යය උපදනේය. ඉදින් මගේ මේ ඍද්ධාණය ලෞකික වීර්ය සම්පන්නතාවය නිසාම වූවකි. කලකිරීම පිණිස නොපවතියි. විරාගය පිණිස නොපවතියි. ඉදින් ඒ නිසා මම මේ ඍද්ධාණයෙන් ලෝකෝත්තර ධර්මය සොයන්නේ නම් යෙහෙකි. ඉක්බිති බරණැස් රජුට රාජ්‍යය දී, අඹුදරුවෝද සිය ජනපදයට යවා, සියල්ල හැර පැවිදිවී විදර්ශනා වඩා

පසේ බුදුබව සාක්ෂාත්කොට තමන්ගේ විරිය සම්පත්තිය බබළවමින් මේ උදාන ගාථාව වදාළ සේක.

එහි ඔහුට පටන්ගත් වීර්ය ඇත්තේනුයි, **ආරද්ධ විරියො** නම් වේ. මෙයින් තමන්ගේ මහා වීර්ය බව දක්වයි. පරමාර්ථය යයි නිවනට කියනු ලැබේ. පරමාර්ථයට පැමිණීමයි. පරමත්ථපත්ති. ඒ **පරමාර්ථයට පැමිණීමයි.** එපරිදි වීර්ය ආරම්භ කිරීමෙන් පැමිණිය යුතු ඵලය පෙන්වයි. **අලීනචිත්තො** යනු වීර්ය ආරම්භ කිරීමෙන් චිත්ත-චෛතසිකයන්ගේ නොඇලුණු බව පෙන්වයි. **අකුසිතවුනති** යනු මේ ස්ථාන සක්මන් කිරීම්වල ශරීරයේ අකුටිල බව පෙන්වයි. **දළහ නික්කමො** යනු 'කාමය සමඳ නහරද යනු මෙසේ පවත්නා වූ ආරම්භක වීර්ය පෙන්වයි. යම්බඳු අනුපූර්ව ශික්ෂාපදවල යෙදෙමින් කායිකවද පරමාර්ථ සත්‍යය සාක්ෂාත් කරයි යයි කියනු ලැබේ. නැතහොත්, මෙයින් මාර්ග සම්ප්‍රයුක්තවූ වීර්ය පෙන්වයි. එයද, දැඩිසේ භාවනාවෙන් පරිපූර්ණත්වයට ගිය බැවින්, නික්මීමද, සියළු දේට විරුද්ධව නික්මෙන බැවින් එහෙයින් තාම වීර්යයෙන් යුතු පුද්ගලයා, දළ්හ නික්කම නම් වේ. දැඩිවූ නික්මයාම ඔහුට ඇති බැවින් **දළහනික්කම** යයි කියනු ලැබේ. **ඨාමබලූප පනෙතා** යනු මාර්ගඥානය නිසාවෙන් කායික වීර්යද, ඤාණ බලයෙන්ද උපන්, නැතහොත් සත්ත්වඨාම වීර්ය බලයෙන් උපන් දැඩි ස්ථිර වූ. ඨාම බලයෙන් උපන් යන අර්ථයයි. මෙසේ ඒ වීර්යයට විදර්ශනා ඥානය උපයෝගි වීමෙන් බබළන්නා වූ සිහිබුද්ධි ඇති යෝනිසෝ මනසිකාරයෙන් යුක්ත භාවාර්ථය සාධනය කරයි. එය තෙවැදෑරුම් වේ. පූර්වභාග මධ්‍යම සහ උත්කෘෂ්ට වීර්යයෙන් යුතු වශයෙනි. ඒ පද තුනද යෙදිය යුතුය. සෙස්ස කියන ලද අයුරින්මය.

ආරද්ධ විරිය ගාථා වර්ණනාවයි.

2-35

පටිසල්ලාණ යනු කවර උපතක්ද? මේ ගාථාවේ ආවරණ ගාථාව මේ උත්පත්තියයි. කිසි විශේෂයක් නැත.

මෙහි අර්ථ වර්ණනාව වනාහි. **පටිසල්ලාණං** යනු ඒ ඒ සත්වැදෑරුම් සංස්කාරවලින් නවතා, සමවත් එකත්පසෙක සේවනය කරන ලද්දේ ඒකීයභාවය කාය විවේකය යන අර්ථයයි. **ඣානං** යනු ප්‍රත්‍යයන් අනුව

විමසීමෙන්ද අරමුණු ලකුණු ගැනීමෙන්ද ලැබෙන චිත්ත විවේකය යයි කියනු ලැබේ. එහි අෂ්ට සමාපත්ති පංච නීවරණ ආදි ප්‍රත්‍යය ක්ෂය කිරීමෙන්, කසිණාදි අරමුණුවලින් යුක්ත වූවේ ඣාන යයි කියනු ලැබේ. විදර්ශනා ඇති මාර්ගඵල ආදියෙන්ද, සප්ත සඥාදි වශයෙන් ඇතිවන ලක්ෂණ සංසිඳවීම ධ්‍යාන යයි කියනු ලැබේ. මෙය අරමුණු වශයෙන් ගැනීම නිසා සමවත් සුවයට සමවැදීමද, ධ්‍යාන නම් වේ. **අරිඤ්චමානො** දුරු නොකරන්නේ. ධම්මෙසු යනු විදර්ශනා ආදි පංචස්කන්ධාදි ධර්මයන්. **නිච්චං** යනු නිරතුරුව ශාන්ත ලෙස බැසගත්තා වූ. **අනුධම්මචාරි** ඒ ධර්මයන් අරබයා පවත්නා වූ අනුපාත විදර්ශනා ධර්මයන්හි හැසිරෙන්නේ, නැතහොත්, ධර්මයන්හි මෙහි ධම්මා යනු නවලෝකෝත්තර ධර්මයන්ය. ඒ ධර්මයන් මුලසිට බැලීම ධම්ම නම් වේ. අනුධර්ම යනු විදර්ශනාවට විශේෂ වචනයකි. එහි ධර්මයන්ගේ නිතර අනුව හැසිරීම අනුධම්මචාරී යයි කිවයුතුය. ගාථා බන්ධනයන්ගේ විභක්ත්‍ය වශයෙන් බෙදීම් වශයෙන් කියන ලද්දේ වෙයි. **ආදීනවං සම්මසිතා භවෙසු** යනු ඒ අනුධර්ම හැසිරෙන විදර්ශනා වශයෙන් තුන්භවයෙහි අනිත්‍යාදි දොස් මැනවින් බලා මේ කාය චිත්ත විවේකයටද පැමිණි, විදර්ශනා සංඛ්‍යාත ප්‍රතිපදාව අධිගම කළේ යයි දතයුතුය. **එකො චරෙ** යනු මෙසේ යෝජනා දතයුතුය.

පටිසල්ලාණ (සමවත්) ගාථා වර්ණනාවයි.

2-36

තණ්හක්ඛයං යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු, මහත් රාජ්‍ය ආනුභාවයෙන් නගරය ප්‍රදක්ෂිණා කරයි. ඔහුගේ ශරීර ශෝභාවෙන් නොබැඳුණු හදවත් ඇති සත්ත්වයෝ ඉදිරියෙන් යන්නේ නමුත්, නැවතී ඔහු දෙසම බලති. පසුපසින් යන්නෝ ද දෙපැත්තෙන් යන්නෝද, එසේමය. ප්‍රකෘතියෙන්ම බුදුන් දැකීමද, පූර්ණචන්ද්‍රයා, සමුද්‍රය, රජු දැකීමද ලෝකයාට තෘප්තියක් නැත. ඉක්බිති එක්තරා කෙළඹි බිරිඳක්ද ප්‍රාසාද මතු මහලට ගියේ, සිංහ කවුළුව විවරකොට බලමින් සිටියාය. රජු ඇය දැක පිළිබඳ සිතැත්තේ වී ඇමතියාට අණ කළේය. බොල; දැනගෙන එව. මේ ස්ත්‍රිය ස්වාමියෙක් සහිත ද අස්වාමික ද යන බව. ඔහු දැනගෙන සස්වාමික යයි රජුට දැන්වීය. ඉක්බිති රජු සිතුවේය. මැය විසිදහසක් නාටක ස්ත්‍රීහු දේව අප්සරාවෝ මෙන්, මා සමග එකවරක් රමණය කරත්. ඒ දැන් මම මැය ඉක්මවා අනුන්ගේ ස්ත්‍රියකට තෘෂ්ණාව උපදවා ගනිමි. ඒ උපන්නා වූ

සිතිවිල්ල නිසා අපායට ඇදගෙන යයි යනුවෙන් තෘෂ්ණාවේ ආදීනව දැක ඉදින් එයට නිග්‍රහ කරමියි, රාජ්‍යය හැරදමා පැවිදිව විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත් කොට, මේ උදාන ගාථාව දේශනා කළ සේක.

එහි **තණ්හක්ඛයං** යනු නිර්වාණයයි. මෙසේ තෘෂ්ණාවේ ආදීනව දැක නොපවත්නේ යනුයි. **අපපමත්තො** යනු අර්ථ සහිතව කරන්නේ සකසා වැඩ කරන්නේ යනුයි. **අනෙලමූගො** නොඇලුණු මුව ඇති නැතහොත් මෝඩ නොවූ පණ්ඩිත ව්‍යක්තයයි කියනු ලැබේ. හිතසුව සළසන පාපය දුරුකළ ඔහුට ශ්‍රැතවත් බව ඇතැයි **සුතවා** නම් වේ. ආගම සම්පන්න යයි කියන ලද්දේ වෙයි. **සතිමා** යනු චිරාත් කලක් කරන ලද, සිහිකරන ලද **සංඛාත ධම්මා** යනු ධර්මය පරීක්ෂා කරමින් මැනවින් අවබෝධ කළ ධර්ම ඇති. **නියතො** යනු ආර්ය මාර්ගයට නියත වශයෙන් පැමිණි. **පධානවා** යනු සම්‍යග් ප්‍රධන් වීර්ය සම්පන්න. අනුපිළිවෙළින් මේ පාඨය යෙදිය යුතුය. මේ ආදී වූ අප්‍රමාද ආදියෙන් සමන්විත වූ නියමාකාරයෙන් යුක්ත ප්‍රධන් වීර්යෙන් විශේෂණ වූ ඒ ප්‍රධන් වීර්යයෙන් නියත වශයෙන් අර්හත් මාර්ගයට පැමිණි අනතුරුව අර්හත් පන්තියට අදාළ ධර්මතාවයන් ය. **අරහං** යනු සංඛත ධර්මයන් අභාවයට පත්කිරීම යයි කියනු ලැබේ. මෙසේද කීහ. යමෙක් සංඛත ධර්මයන් ක්‍ෂය කළේද මෙලොව ශෛක්‍ෂයා යයි කියනු ලැබේ.

සෙස්ස කියන ලද පරිද්දෙනි

තණ්හක්ඛය ගාථා වර්ණනාවයි.

2-37

සීහොවා යනු කවර උපතක් ද? එක්තරා බරණැස් රජකු දුර උයනකට යයි. ඔහු උදෑසනම නැගිට උයනට යන්නේ අතරමග යානාවෙන් බැස ජලය ඇති තැනකට ගොස් මුහුණ සෝදන්නෙමියි ඒ පෙදෙසෙහි සිංහ පැටවකු අතහැර ගොදුරු පිණිස ගියහ. රාජපුරුෂයා එය දැක සිංහපැටවා දෙව් යයි දැනුම් දුන්නේය. රජු සිංහයා වනාහි කිසිවෙකුට බිය නොවේයයි,ඔහු පරීක්ෂා කිරීමට බෙරහඬ නංවාලීය. සිංහපැටවා ඒ ශබ්දය අසා එතැනම නිදාගත්තේය. තෙවෙනි වරද, දැනුම් දුන්නේය. ඔහු තෙවෙනි වර සිරස ඔසවා සියළු පිරිස බලා එතැනම නිදා ගත්තේය.

ඉක්බිති රජු යම්සේ උගේ මව නොඑයිද? හොඳයි යමු යයි පවසා යමින් මෙසේ සිතුවේය. සිංහපැටවකු උපන්නේ නමුත් තැති නොගනියි. බිය නොවෙයි. තෘෂ්ණාව නම් තෘෂ්ණා දෘෂ්ටි පසුතැවුල් සංතාප දුරුකොට තැති නොගන්නෙමි. බිය නොවන්නෙමියි ඔහු ඒ අරමුණු නිසා යන්නේ නැවත කෙවුලන් විසින් මසුන් අල්ලා අතුවල බැඳ දිගුකරන ලද දැලෙහි වාතය නොරැඳීම යන්නා සේ දැක ඒ නිමිත්ත අරමුණුකොට ගත්තේය. ඒ මග තෘෂ්ණා මිථ්‍යාදෘෂ්ටි ආදි මෝහ දැල පලා මෙසේ නොරැඳෙමි. යන්නාහ. ඉක්බිති උයනට ගොස් ගල්තලා පොකුණු තෙරේ හුන්නේ සුළං වැදීමෙන් පියුම් මැලවී නැමී ජලය ඉස වාතය පහව ගියකල්හි යළින් ඒ ස්ථානයේ සිටියා වූ ජලයෙන් නොතෙමෙන්නේ දැක එයද නිමිත්තක් ලෙස පිළිපැද්දේය. ඉදින් එපරිදිම ජලයේ උපන්නෙමියි නමුත් ජලයේ නොගැටී සිටින්නෙමි. ඔහු නැවත නැවත සිංහයා මෙන් වාතය, පියුම් මෙසේ දැකීමෙන් අසන්තෝෂයට පත් වීමෙන් ඇලීමට නොවන බව සිතිය යුතු යයි සිතා රාජ්‍යය හැර පැවිදි වී පසේබුදුබව සාක්ෂාත් කොට මේ උදාන පාඨය කීවේය.

එහි **සීහො** යනු සිවුවැදෑරුම් සිංහයෝය. තෘණසිංහයා, පඬුවන් සිංහයා, කළු සිංහයා සහ කේශර සිංහයා වශයෙනි. ඔවුන් අතර කේශර සිංහයෝම ශ්‍රේෂ්ඨ වේ. මේ එහි විශේෂත්වයයි. **වාතො** පෙරදිග වශයෙන් නොයෙක් ආකාරය. **පදුමං** රතු සුදු වශයෙන් ඒවා අතර යම්කිසි සුළඟක්, යම්කිසි පියුමක් වමියි යනුවෙනි. එහි යම්හෙයකින් සන්ත්‍රාසය නම් ආත්ම ස්නේහය වශයෙන් වෙයි. ආත්ම ස්නේහය නම් තෘෂ්ණාවට ආලේපයකි. එයද දෘෂ්ටි සම්ප්‍රයුක්ත වශයෙන් දෘෂ්ටි විප්‍රයුක්ත වශයෙන්ද ලෝභය වෙයි. එයද තෘෂ්ණාවම වේ. සත්පුරුෂයෝ වනාහි, එහි යළින් පරීක්ෂා කිරීමෙන් විරහිත වූ විට මෝහය නම් වෙයි. මෝහය ද අවිද්‍යාව ද, එහි යම්හෙයකින් සන්ත්‍රාසය ආත්ම සෙනෙහසින් වෙයි. ආත්ම ස්නේහය නම් අවිද්‍යාවයි. සමථ භාවනයෙන් තෘෂ්ණාව ප්‍රහාණය වෙයි. විදර්ශනාවෙන් අවිද්‍යාව ද එහෙයින් සමථයෙන් ආත්ම ස්නේහය දුරුකොට **සීහොව සද්දෙසු** අනිත්‍ය දුක්ඛ ආදියෙන් **අසනතසනෙතා** විදර්ශනාවෙන් මෝහය දුරුකොට **වාතොව ජාලමහි** ස්කන්ධ ආයතනවල **අසජ්ජමානො** සමථයෙන්ම ලෝභයද, ලෝභ සම්ප්‍රයුක්ත බැවින් මෙසේ දෘෂ්ටියද දුරුකොට **පදුමංව තොයෙන** සියලු භවභෝග පිළිබඳ ආශාවෙන් **අලිපමානො** මෙහි සමථයේ මුල් පියවර සමථයයි. සමාධියේ සමාධිය විදර්ශනාවයි. මෙසේ ධර්මතා තුනෙකි. ස්කන්ධ තුනෙක්ම සිද්ධ වෙත්.

එහි ශීලස්කන්ධයෙන් දක්ෂ වූයේ වෙයි. ඔහු සිංහයා මෙන් ශබ්ද කෙරෙහි, විනාශ කරන ලද වස්තුවල කිපේවා. කැමැත්තෙහි නොඇලෙයි. ප්‍රඥා ස්කන්ධයෙන් බැඳුණු ස්වභාව ඇත්තේ, වාතය දැලකින් බැඳීම ආදිය ධර්මතාවයක් සිදු නොවේය. සමාධි බන්ධයෙන් රාගය දුරුකළේ පියුම ජලයෙන් නොගැටෙන්නා සේ රාගයෙන් නොඇලෙයි. මෙසේ සමථ විදර්ශනාදි, සීල සමාධි ප්‍රඥා ස්කන්ධයන්ගෙන් මැනවින් හටගැනීමෙන්, තෘෂ්ණාවන්ගේද, ත්‍රිවිධාකාර අකුසල මූලයන්ගේ ප්‍රහාණය වශයෙන් නොඇලෙන්නේ නොලැගීමෙන් යයි දතයුතුය. සෙසු දේවල් කියනලද පරිද්දෙනි.

සීහාදි ගාථා වර්ණනාවයි.

2-38

සීහො යථා යනු කවර උපතක්ද? එක්තරා බරණැස් රජකු ප්‍රත්‍යන්ත ජනපදයේ කුපිතවූවන් සංසිඳවීම ගම්නියම්ගම් මාර්ග අතහැර ඍජුවම කැලෑබද මාර්ගයකින් මහත් සේනාව සමග ගමන් කරයි. එසමයෙහි එක්තරා පර්වතයක් මුල සිංහයා ළඟිරු රැස් තපිමින් හුන්නේ වෙයි. ඒ දැක රාජ පුරුෂයෝ රජුට දැනුම් දුන්හ. රජු සිංහයා තැති නොගනී යයි භේරිනාද ශබ්ද කරවිය. සිංහයා එහිම හොත්තේය. දෙවනුවද කරවිය. සිංහයා එසේම හොත්තේය. තෙවනුවද බෙර නාදය කරවිය. එකල සිංහයා මටද සතුරෝ ඇතැයි සිවුපාදයෙන් මැනවින් පිහිටා සිට සිංහනාද කළේය. ඒ අසා ඇත්ගොව්වෝද ඇතුන් ආදින් පිටනැගී, තෘණභූමිවලට පිවිසියහ. ඇත් අශ්ව සේනාවෝ දිශා විදිශාවලට පලා ගියහ. රජුගේ ඇතුද, රජු ගෙන වනලැහැබ් පොඩිකරමින් පලා ගියේය. රජු එය වැලක්වීමට නොහැකිවන්නේ, ගස් අතුවල එල්බ පෘථිවියට පැමිණ එක පදික මාර්ගයකින් යන්නේ පසේබුදුවරුන් වසන තැනට පැමිණියේය. එහිදී පසේබුදුවරුන්ගෙන් විචාලේය. ස්වාමීනි; ශබ්දයක් ඇසුවෝද, මහරජ; එසේය. ස්වාමීනි, කවර ශබ්දයක්ද? පළමුව බෙරසක් ආදින්ගෙන්ද, පසුව සිංහයාගේ හඬයි ස්වාමීනි. බිය නොවවු. මහරජ, අපි කිසිම ශබ්දයකට බිය නොවෙමු. ස්වාමීනි, අපටද එසේ කිරීමට හැකිවෙමුද? මහරජ, හැකිය. ඉදින් පැවිදි වෙහිද? ස්වාමීනි, පැවිදි වෙමි. ඉක්බිති හේ පැවිදි වී පෙර කියන ලද පරිද්දෙන්ම ආභිසමාචාරික ශික්ෂාපද ප්‍රගුණ කළහ. ඔහුද පෙර කියන ලද අයුරින් විදර්ශනා වඩන්නේ පසේබුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව කී සේක.

එහි ඉවසීමද නැසීමද සීඝ්‍ර ගමන් ඇති බැවින් **සීහො** නම් වේ. කේශර සිංහයා යනුද මෙහි විශේෂ හැඳින්වීමකි. දායා බලයක් දළ දෙකක් ඇති බැවින් **දායබලී** නම් වේ. සතුරන් මැඩ පවත්වනුයි 'බලහත්කාරයෙන් මැඩපවත්නා නිසා **පසය්හචාරී අභිභුය්‍ය චාරී** නම් වේ. එහි බලහත්කාරය නිග්‍රහකොට ඇතුන් දුරුකොට **පසය්හචාරී** ඇතුන් මැඩගෙන **සන්ත්‍රාසයට** පත්කොට වශී කරන නිසා **අභිභුය්‍යචාරී** වේ. ඉදින් මේ කාය බලයෙන් සතුරන් මැඩ පවත්වා, තේජසින් මැඩවත්වා එහි ඉදින් කිසිවක් කියන්නේ නම් කුමක් මැඩ පවත්වා හැසිරෙයිද? අනතුරුව **මිගානං** යනු ස්වාමි වචනයේ උපයෝගි අර්ථය කොට මුවන් බලහත්කාරයෙන් මැඩගෙන හැසිරේ යනුයි, පිළිගත යුතුය. **සනානි** යනු දුර. **සෙනාසනානි** යනු වසන තැනය. සෙස්ස කියන ලද අයුරින්ම දැනගැනීමට හැකිවන්නේය. විස්තර නැත.

දායබලි ගාථා වර්ණනාවයි.

2-39

මෙත්තං උපෙක්ඛං යනු කවර උපතක්ද? එක්තරා රජ කෙනෙකු මෛත්‍රී ආදි ධ්‍යානලාභියෙකු විය. ඔහු ධ්‍යාන සුවය විඳිමින් එයට අන්තරාවක් වන්නේ යයි, ධ්‍යානය රැකීම පිණිස රාජ්‍යය හැර පැවිදි වී විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත්කොට මේ උදාන ගාථාව කී සේක.

එහි 'සියළු සත්ත්වයෝ සුවපත් වෙත්වා' ආදි ක්‍රමයෙන් හිතසුව එලවනු කැමැත්තේ, **මෙත්තා** නම් වේ. 'අහෝ ඒකාන්තයෙන් මේ දුකෙන් මිදෙන්නෙමි'යි ආදි ක්‍රමයෙන් අහිත වූ දුක් දුරුකරනු කැමැත්ත කරුණා නම් වේ. පින්වතුන් සතුටු වෙත්වා. සත්ත්වයෝ තුටුපහටු වෙත්වා. යහපත සළසා ගනීවා'යි ආදි ක්‍රමයෙන් හිතසුව එකතු කරනු කැමැතිවීම **මුදිතා** නම් වේ. **ස්වකීය** කර්මයෙන් ප්‍රකට කරන්නේය. සුව දුක් උපේක්ෂා මැදහත් ලෙස බැලීම **උපෙක්ඛා** නම්. ගාථා බන්ධනයේ සුවය පිණිස, අනුපිළිවෙළින් මෛත්‍රිය පවසා, උපේක්ෂාව කියන ලද්දේ මුදිතාව පසුවට යොදා ඇත. **විමුත්තිං** යනු තමන් තුළ පිහිටි මේ සතර ප්‍රත්‍ය ධර්මයන් විමුක්තිය උදාකරන බැවින් විමුක්ති නම් වේ. එබැවින් කියන ලදි.

"මෛත්‍රිය ද, උපේක්ෂාව ද, කරුණාව ද, විමුක්තිය ද,
මුදිතාව ද සුදුසු කාලයේ සේවනය කළයුතුය.

එහි **ආසෙවමානො** යනු තෙවෙනි සිවුවෙනි ධ්‍යාන වශයෙන් වඩනු ලබන්නා වූ, උපේක්ෂාව චතුර්ථ ධ්‍යාන වශයෙන් වඩනු ලැබීමයි. **කාලෙ** යනු මෛත්‍රිය සේවනයකොට අනතුරුව නැගිසිට, කරුණාවද, අනතුරුව නැගී සිට මුදිතාවද, අනතුරුව ඉතිරියද, අනතුරුව ප්‍රීතියෙන් තොර ධ්‍යානයෙන්ද, නැගිසිට උපේක්ෂාව සේවනය කරනු ලබන්නේ, කාලය සේවනය කරනු ලැබේ යයි කියනු ලැබේ. සේවනය කිරීමට පහසු කාලයයි. **සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො** යනු දස දිශාවල සියළු සත්ත්වලෝක විසින් විරුද්ධ නොවනු ලබන්නේ, මෛත්‍රී ආදිය පුරුදු කළ බැවින්, සත්ත්වයෝ පිළිකුල් නොකරත්. සත්ත්වයන් කෙරෙහි පවත්නා විරුද්ධ බවද පටිඝය (ක්‍රෝධයද) සංසිඳවයි. එබැවින් කියන ලදි. 'සබ්බෙන ලෝකෙන අවිරුජ්ඣමානො' යනුවෙනි. මෙය මෙහි සංක්ෂේප අර්ථයයි. විස්තර වනාහි මෛත්‍රී ආදි කථාවයි. **අත්ථසාලිනි** නම් ධම්මසංගිණි අටුවාවේ කියන ලදි. සෙස්ස කියන ලද පරිද්දෙනි.

අප්‍රමාණ්‍ය ගාථා වර්ණනාවයි.

2-40

රාගඤ්ච දොසඤ්ච යනු කවර උපතක්ද? රජගහනුවර ඇසුරුකොට මාතංග නම් පසේබුදුරද, සියළු පශ්චිම පසේ බුදුවරුන්ට පසුව වැඩවාසය කරයි. ඉක්බිති අපගේ බෝධිසත්ත්වයන් උපන්කල්හි, දේවතාවෝ, බෝසතුන්ට පුද පිණිස එන්නා වූ උන්වහන්සේ දැක 'නිදුකාණනි, නිදුකාණනි, ලෝකයෙහි බුදුන් උපන්නාහ යයි කෝලාහල කළහ. උන්වහන්සේ නිරෝධ සුවයෙන් නැගී සිටින්නේ ඒ අසා තමන්ගේ ජීවිතය ක්ෂය වන බව දැක, හිමාලයේ **මහා ප්‍රපාත** නම් පර්වතයේ පසේ බුදුරදුන්ගේ පරිනිර්වාණය සිදුවන ස්ථානයයි. එතැනට අහසින් ගොස්, පිරිනිවන්පාන ලද පසේබුදුරදුන්ගේ ඇටසැකිලි ආදිය ප්‍රපාතයට හෙළා, ගල්තලාවේ හිඳ, මේ උදාන ගාථාව වදාළ සේක.

එහි **රාගදොස මොහා උරග සූත්‍රයේ** කියන ලද්දේය. **සංයොජනානි** යනු දස සංයෝජන ධර්ම වේ. ඒ ඒ මාර්ගයෙන්, **සඤ්ඤායිත්ථා අසන්තසං ජීවිතසංඛයම්හි** යනු ජීවිත සංඛාව කියනු ලැබේ. චුති සිතෙහි බිඳීමද, ඒ ජීවිත සංඛයෙහි. ජීවිතය කෙළවර බැවින් ප්‍රහීණ වන බැවින් නොඇලෙත්. මෙපමණ **සෝපාදිසේස නිර්වාණ ධාතුවද** තමන්ට පෙන්වා, ගාථාව අවසානයේ, **අනුපදිසේස නිර්වාණ ධාතුවෙන්** පිරිනිවන් පෑසේක.

ජීවිත සංඛය ගාථා වර්ණනාවයි.

2-41

භජනති යනු කවර උපතක්ද, බරණැස එක්තරා රජ කෙනෙකු මුල් ගාථාවේ කියන ලද අයුරින්ම ප්‍රීතියෙන් රාජ්‍යය අනුශාසනා කරයි. ඔහුට කෘර වේදනාවක් ආබාධයක් හටගත්තේය. දුක් වේදනා පවතිත්. විසිදහසක් ස්ත්‍රීහු ඔහුව පිරිවරාගෙන අත්පා සම්බාහනය කරති. ඇමැතියෝ "දැන් මේ රජු ජීවත් නොවන්නේය. බොලවු, අපි අපේ පිහිට සොයාගනිමු." යයි සිතා වෙනත් රජ කෙනෙකුගේ සමීපයට ගොස් උපස්ථානය ඉල්ලූහ. ඔවුහු එහිදී උස්ථාන කරන නමුත් කිසිවකුත් නොලබති. රජු ආබාධයෙන් නැගිට විචාළේය. අසවල් නම් ඇත්තා අසවල් නම් ඇත්තා කොහිද? ඉක්බිති ඒ පුවත අසා හිස සොළවා නිශ්ශබ්ද විය. ඒ ඇමතියෝද, රජු නැගී සිටියේ යයි අසා, එහි කිසිවක් නොලබන්නා වූ උතුම් වූ ධන පරිහානියෙන් බැහැරවී පීඩිතව නැවත අවුත් රජුට වැඳ, එකත්පසක සිටියහ. ඒ රජු විසින්ද, දරුවනි, නුඹලා කොහේදැයි කීවාහුය. දේවයන් වහන්ස, දුර්වල වූවකු දැක, ජීවත්වීමේ බියෙන් අපි අසවල් නම් ජනපදයට ගියෙමු. රජු හිස සොලවා මෙසේ සිතුවේය. මම මොහුට ආබාධ පෙන්වන්නේ නම් මැනවි. කුමක් නිසා නැවතත් නුඹලා අපට කුමක් කරනුද? ඔහු පෙර ස්වාභාවික රෝගයකින් ගැටී බලවත් වේදනාවක් දක්වමින්, රෝගී බවක් කළේය. ස්ත්‍රීහු පිරිවරාගෙන පෙර මෙන් සියල්ල කළහ. ඒ ඇමතියෝද එසේම නැවත බොහෝ ජනතාව ගෙන පිටත්ව ගියහ. එසේ රජු තෙවෙනිවර දක්වා සියල්ල පෙර මෙන් කළේය. ඔවුහුද එසේම පිටත්ව ගියහ. ඉක්බිති සතරවෙනිවරද ඔවුන් පැමිණියේ දැක රජු; 'අහෝ මොවුහු දුෂ්කර දෙයක් කළහ. යමෙක් මා රෝගීබව හැර අපේක්ෂා රහිතව පිටත්ව ගියහ' කලකිරුණේ රාජ්‍යය හැර පැවිදිව විදර්ශනා වඩමින් පසේ බුදුබව සාක්ෂාත් කොට මේ උදාන ගාථාව කී සේක.

එහි **භජනති** යනු ශරීරයෙන් ඇලෙත්. සමීපව ඇසුරු කරති. **සෙවන්ති** යනු ඇඳිලි බැඳීම් ආදියද කීකරු බව හඟවමින් පිරිවරා හැසිරෙත්. මේ කරුණු අර්ථවත් බවින් යුක්ත නිසා **කාරණත්ථා** නම් වේ. භජනය පිණිස සේවනය කරනු පිණිස, වෙනත් කරුණක් නැත. මේ කරුණු අර්ථයක් නැත්නම්, අර්ථය පිණිසම සේවනය කරයි යනුවෙන් කියන ලදී. **නිසකාරණා දුල්ලභා අජ්ජ මිත්තා** යනු මෙයින් කිසිවක් ගනිමු යනුවෙන් මෙසේ ලාභයක් ලැබීමේ කාරණයෙන් හුදෙක් නිකරුණේ යනුවෙනි.

> "උපකාරක යම් මිත්‍රයෙක්ද, සැප දුක් දෙකේ සිටින මිතුරා ද, අර්ථ හිතසුව එළවන යම් මිතුරා ද අනුකම්පක මිතුරා ද" වශයෙනි.

මෙසේ කියන ලද්දා වූ ආර්ය මිත්‍රභාවයෙන් සමන්විත වූ දුර්ලභ වූ අද පටන් මිතුරු වූ. **අත්තඤ්ඤපඤ්ඤා** යනු තමා කෙරෙහි පිහිටියා වූ ඔවුන්ගේ ප්‍රඥාවෙන් තමන්වම බලයි. වෙන අර්ථයක් නොවේ. **අත්තඤ්ඤ පඤ්ඤා** යන පෙළ පාඨයයි. තමන් තමන් ගැනම බලයි. අනුන් ගැන නොබලයි යන අර්ථයයි. **දිට්ඨධම්ම පඤ්ඤා** යනු මෙයද පෞරාණික පාඨයකි. එහි දැන් දක්නා ලද අර්ථය ඇත්තේම ඔවුන්ගේ ප්‍රඥාව මතු නොපවතියි යන අර්ථයයි. මිතුරුදම් කථාවම බලත්. දැන් සිදුවන දේ නොකියන ලද්දේ වෙයි. **අසූචි** යනු අපිරිසිදු අනාර්ය වූ කාය වාග් මනස් කර්මයෙන් සමන්විත වූ. **ඛග්ගවිසාණ කප්පෝ** යනු කඩුවෙන් ගස් ආදිය සිඳින්නාක් මෙන් සිය අඟෙන් පර්වත ආදිය සුණු විසුණු කරමින් හැසිරෙයි යනු ඛග්ගවිසාණ නම් වේ. විස සමාන අඟක් ඇති බැවින් විසාණා නම් වේ. කඩුවක් මෙන් ඛග්ග නම් වේ. කඟවේනකුගේ අඟක් මෙන් යම් මෘගයෙකුට වේද ඒ ඛග්ග විසාණ (කඟවේනා) නම් වේ. ඒ කඟවේනාට කැපවූයේ ඛග්ගවිසාණ කප්ප නම් වේ. කඟවේනකු හා සමාන පසේබුදුරදුන් හුදකලා වූයේ දෙවැන්නකු නොවන්නේ, අසහාය ලෙස හැසිරෙන්නේය. වාසය කරන්නේය. පවතින්නේය. යැපෙන්නේය යන අර්ථයයි.

විසුද්ධ සීලා යනු විශේෂයෙන් පිරිසිදු වූ සිල් ඇත්තේ, චතුපාරිශුද්ධ ශීලයෙන් පිරිසිදු වූ ශීලයයි. **සුවිසුද්ධ පඤ්ඤා** යනු පිරිසිදු අපිරිසිදු දෑ දැනෙන ප්‍රඥාවයි. රාගාදි කෙලෙස් නොමැති බැවින්, පිරිසිදු මාර්ගඵල පරිසම්භිදාදි ප්‍රඥාවයි. **සමාහිතා** යනු මැනවින් රැගෙන ආවා වූ සමීපයේ තබන ලද සිත් ඇති **ජාගරියානු යුත්තා** යනු නිදිවර්ජිතව සිටීමයි. ජාගර නිද්‍රාව ඉක්මවූයේ යන අර්ථයයි. නිදිවර්ජිත බව ජාගරිය නම් වේ. නිදිවර්ජිතව සිටීමේ අනුකූල වීම ජාගරියානුයුත්ත නම් වේ. **විපස්සකා** යනු අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විශේෂයෙන් දකින සීලයයි. විදර්ශනාවේ ආරම්භකොට, වාස කරන යන අර්ථයයි. **ධම්ම විසෙසඤ්ඤ** යනු දසකුසල ධර්මයන්ගේද චතුරාර්ය සත්‍ය ධර්මයේද නව ලෝකෝත්තර ධර්මයේද විශේෂයෙන් බලන සීලයයි. **මග්ගංග බොජ්ඣංග ඣතෙ** යනු සම්මා දිට්ඨි ආදි මාර්ග අංගවලින්ද, සති සම්බොජ්ඣංග ආදි බොජ්ඣංග ධර්මවලින්ද, යුක්ත වූ ආර්ය ධර්මයයි. **විජඤ්ඤා** යනු විශේෂයෙන් දැනගැනීම දැනගත්තේ යන අර්ථයයි.

සුඤ්ඤතාපණිහිතඤ්ඤානිමිත්තං යනු අනාත්ම අනුපස්සනා වශයෙන් අවබෝධ කළ මිදීමද, දුක් අනුව බැලීමෙන් අප්‍රණිත වූ

විමොක්ෂයද අනිත්‍යානුපස්සනා වශයෙන් නිමිතිවලින් මිදීමද වේ. **ආසෙවයිත්වා** යනු වඩා. යෙ කරන ලද සම්භාර ධර්මයෝ. **ධීර** ප්‍රඥාවන්ත ජනතාව බුද්ධ ශාසනයෙහි **සාවකත්තං** ශ්‍රාවක බවට. **න වජන්ති** නොපැමිණෙති. ඒ ධීරා ප්‍රඥාවන්තයෝ කරන ලද පුණ්‍ය සම්භාරයෝ **සයම්භු** සිය නුවණින් දැන **පච්චෙක ජිනා** පසේ බුදුබවටම වෙත්.

කුමක් වූවේද? මහනන ධම්මා පුරණ ලද බෝධිසම්භාර ධර්ම. බහුධම්මකායා නොයෙක් ධර්මතාවලින් පිරි ශරීර, නැවත කුමක් කිවේද, **චිත්තිසසරා** සිතේ එකඟකමද භාවනා (වැඩීම) සම්පන්න අර්ථයෙන් යුතු **සබ්බදුක්ඛෙ සත්තිණණ** සියළු සංසාර ඕඝය තරණය කළ, ඉක්මවා ගිය. **උදගඝචිත්තා** ක්‍රෝධය උපන්නාහ ආදි කෙලෙස් විරහිත බැවින් සොම්නසට පැමිණි සිත් ඇති සතුටු සිත් ඇති යන අර්ථයයි. **පරමත්ථ දසසි** පංචස්කන්ධ දොළොස් (චක්ඛු) ආදි ආයතනය දොළොස් වැදෑරුම් වූ පටිච්ච සමුප්පාද ධර්මය ආදි වශයෙන් පරමාර්ථය දකින සීලයෝය. නොසැලෙන අහිත වූ අර්ථයෙන් **සිංහාපමා** සිංහයා හා සමාන යන අර්ථයයි. **බගඝචිසාණ කපපා** කඟවේනකුගේ අඟ හා සමාන සමූහයේ නො ඇලෙන යන අර්ථයයි.

සන්තින්ද්‍රියානි චක්ඛු (ඇස) ආදි ඉන්ද්‍රියන්ගේ සියළු අරමුණු පැවැත්වීම වශයෙන් තමන් සතුව පවතින ඉන්ද්‍රියයන් **සන්තමනා** යනු ශාන්ත සංසිඳුණු සිත් ඇති. කෙලෙස් රහිත බැවින් ශාන්ත වූ ස්වභාවයෙන් සිත පිරී හුදකලා වූ යන අර්ථයයි. **සමාධි** යනු සරල යහපත් එකඟ වූ සිත්. **පවචන්න සන්තෙසු පතිපප චාරා** යනු ප්‍රත්‍යන්ත ජනපදවල සත්ත්වයන් කෙරෙහි දයා කරුණාව දක්වමින් සීලාදි ගුණ ධර්මයන් බබළවයි. **දීපා පරත්ථ ඉධ විජ්ජලනනා** සියලු ලෝකානුග්ගහ කිරීමෙන්ද පරලොවද මෙලොවද දල්වන්නා වූ පහනික. පහනක් හා සමාන යන අර්ථයයි. **පච්චෙක බුද්ධා සන්තං හිතාමෙ** යනු මේ පසේබුදුවරු නිරතුරුව සියළු කාලය මුළු ලොවට හිත පිණිස පිළිපන්නේ යන අර්ථයයි.

පහීණ සබ්බාවරණ ජනින්දා යනු ඒ පසේබුදුවරු ජනතාවට ශ්‍රේෂ්ඨ වූ අධික වූ උතුමෝ වෙති. සියලු පංච නීවරණ ධර්මයන්ගේ ප්‍රහීණත්වයට පැමිණි බැවින් පහින සබ්බාවරණා නම් වේ. **සනකඤ්චනාභා** යනු රතු ස්වර්ණවර්ණ, රතුකැට අධික රතු ස්වර්ණ පැහැයෙන් සමාන වඩන්නේ යන අර්ථයයි. **නිස්සංසයං ලොක සුදක්ඛිණෙය්‍යා** යනු ඒකාන්ත වශයෙන් ලෝකයාට යහපත දැකීම පිණිස දානයේ අග්‍ර කොටස පිළිගැනීමට

සුදුසුකමින් යුක්තය. නික්ලේශ බැවින් සත්ත්වයන්ගේ දානය පිළිගැනීමට සුදුසුය යන අර්ථයයි. **පවෙචකබුද්ධා සනතපිතා** මෙ යනු ප්‍රත්‍යක්ෂ ඥාන ඵලයට පැමිණි බුදුවරු නිරතුරුව, නිසිකලක් ගොස් ගියපසු සුසිල්වත් බවින් පිරිපුන්. සත්දිනක් නිරාහාර වූද, නිරෝධ සමාපත්ති ඵල සමාපත්ති වශයෙන් පිරිපුන් බවින් යුතු යන අර්ථයයි. අනුව පිළියෙළ **කිරිමේදී** සම්මා සම්බුදුරදුන් යයි දෙපැත්තේ නොවෙනස්බවින් යුතු ලක්‍ෂණ ඇති බුදුවරු **පසේබුදු** යනුයි. නැතහොත්

"උපසර්ග නිපාත ප්‍රත්‍යය යන මේ තුනද
නොයෙක් නොයෙක් ආකාර පනවා අර්ථ විවරණ
ඉදිරිපත් කිරීම නේරුත්තික යයි කියන ලදි."

කියන ලද බැවින් 'පති' යන උපසර්ග පදය ප්‍රධාන වී ස්වාමියා වී නොයෙක් දායකයන්ට අප්‍රමාණ වූ ආහාර පිළියෙළ කරවා, ස්වර්ග මෝක්‍ෂයට පැමිණියෙ වී. එසේම ආහාර වශයෙන් බත් කොටසක් පිළිගන්වා බලාසිටින්නීම අනුභවකොට දේවතාවන් විසින් සාධුකාර දෙවා, එකෙණෙහිම ඒ දුප්පතා සිටු තනතුරට පමුණුවා කෝටිසංඛ්‍යාත ධනය උපදවීමෙන්ද, බදිරංගාර ජාතකයේ, මාරයා විසින් මවන ලද කිහිරිඇඟුරු ළිඳ වටකොට නෙළුම් දණ්ඩක් වළඳා බෝසතුන් විසින් දෙන ලද පිණ්ඩපාතය පිළිගෙන ඔහු බලා සිටිද්දීම අහසින් ගොස් දානය පිළිගැනීමෙන් මහාජනක බෝසතුන්ගේද, දේවියගේද සොම්නස් උපදවාලනු පිණිස, එසේ අබුද්ධෝත්පාද කාලයක සියලු දඹදිව සාගත බියක් උපන්කල්හි බරණැස් සිටුතුමාට සාගත බිය නිසා, පුරවන ලද ඔහුගේ කෝෂ්ඨාගාරයේ වී ගොඩවල් ක්‍ෂය කොට බිම සාරන ලද ධනයද, දහසක් සැලිවල පුරවන ලද ධනයද, ක්‍ෂයකොට සියළු ප්‍රාසාද බිත්තිවල මැටි ආදිය මැද, ආලේ කරවන ලද ධාන්‍යයද ක්‍ෂයකොට එකල නැලියක් පමණ ඉතිරිවූ මේ කොටස අනුභවකොට අද මිය යන්නෙමුයි, සිත උපදවා තමන් සිටියා වූ ගන්ධමාදන පර්වතයෙන් එක් පසේබුදුවරයෙකු අවුත් ගෙදොර සිටි සේක. සිටුතුමා ඒ දැක ප්‍රාසාදයට නැග ජීවිත පරිත්‍යාග කරනු කැමැත්තේ පසේබුදුරදුන්ගේ පාත්‍රයට විසුරුවේය. පසේ බුදුරදුන් වසන තැනට ගොස් තමන්ගේ ආනුභාවයෙන් බලා සිටින්නේම සිටුතුමාගේ පන්සියයක් පසේබුදුවරුන් සමග අනුභවකළ සේක. එකල බත් පිසිනලද සැළිය වසා තැබූහ. නිදාවට බැසගත්තා වූ සටුතුමාට බඩසාය උපන්කල්හි ඔහු නැගී සිට, බිරිඳට කීවේය. "සොඳුර, සැළියේ බත් ස්වල්පයක් ඇත්දැයි බලනු මැනවි" මැනවින් හික්මුණා වූ ඇය

"සියල්ල දුන්නේ නොවේද?" නොකියා සැළියේ පියන විවර කළහ. සැළිය එකෙණෙහි දෑසමන් මල් ගැවසුණා වූ සමාන සුවඳ සැල්බතින් පිරුණේ විය. ඇයද සිටුතුමාද සතුටුවූවෝ තෙමේද සියලු ගෘහවාසීහුද, සියළු නගරවාසීහුද අනුභව කළහ. හැන්දෙන් ගන්නා ගන්නා ලද තැන් පිරුණේ විය. සියලු සිටුවරුන් දහසකගේ කෝෂ්ඨාගාරවල සුවඳ සැල්වලින් පිරුණේ වූහ. සියළු දඹදිවවාසීහු සිටුතුමාගේ ගෙදරින් ධාන්‍ය බීජ ගෙන සුඛිත මුදිත වූහ. මේ ආදී වූ නොයෙක් සත්ත්ව කොටිඨාශවල සැපසේ තරණය කළ ස්වර්ගමෝක්ෂ සම්පත්වලට පැමිණි කල්හි අධිපති බවට පත්වූවෝ බුද්ධනම් වූයේ පසේ බුදු වූයේ විය.

පචේචකබුද්ධානං සුභාසිතානි යනු පසේ බුදුවරුන් විසින් අවවාද අනුශාසනා වශයෙන් මැනවින් දේශනා කරන ලද කියන ලද වචනයෝය. **චරන්තිලොකමහි සදෙවකමහි** යනු දිව්‍යලෝක සහිත සත්ත්වලෝකයෙහි හැසිරෙත්. පවත්වන්නේ යන අර්ථයයි. **සුත්වා තථා යෙන කරොනති බාලා** යනු එබඳු ආකාර වූ පසේබුදුවරුන්ගේ සුභාෂිත වචන යම් බාල ජනයෙක් අනුගමනය නොකරත්ද, ඔවුනු බාලයෝය. **දුකෙඛසු** සංසාර දුක් ගොඩවල්වල **පුනප්පුනං** ඉපදීම් වශයෙන් ගමන් කරති. **චරන්ති** පවත්වති. ධාවනය කරත් යන අර්ථයයි. **පචේචක බුද්ධානං සුභාසිතා** යනු යහපත් වචන සතර අපායෙන් මුදවනු පිණිස කියන ලද වචන කුමක් වූයේද? **සවනතං** අල්ප වශයෙන් වැගිරෙන්නා වූ මධුං මීපැණි මෙන් මිහිරි වචන යන අර්ථයයි. යමෙක් **පටිපත්ති යුත්තා** උගත් ජනතාවද, ප්‍රතිපත්තිවල කියන ලද අනුසාරයෙන් පවත්වන්නා වූ එබඳු ආකාර වූ මිහිරි වචන අසාම වචනාර්ථ කරත්. ඒ පණ්ඩිත ජනයෝ **සච්චදසා** චතුරාර්ය සත්‍යය දකින්නා වූ **සපඤඤා** ප්‍රඥා සහිත **භවනති** යනු අර්ථයයි. ඔවුහු එබඳු ආකාර මිහිරි වචන අසාම පණ්ඩිතයෝ ජනතාව සමථ-විදර්ශනා සංඛ්‍යාත ප්‍රතිපත්තිවල යෙදුණාහු, පිළිපන්නා වූ ඒ පණ්ඩිත ජනතාව ප්‍රඥා සහිතව සොඳුරු ප්‍රඥාවෙන් යුතුව සත්‍ය දැකීමේ නිරත වෙත් යනු සම්බන්ධයි.

පචේචක බුද්ධහි ජිනෙහි වුත්තා යනු කෙළෙස් ජයගනිති. දිනත ලද්දේනුයි ජින නම් වේ. ඒ ජින වූ පසේ බුදුවරුන් විසින් කියන ලද්දා වූ **ප්‍රකාශ ගාථා උළාරා** ධජවන්ත වූ ප්‍රකට වූ අර්ථ පවතිත්. **තා** කථාවෝ. **සක්‍ය සීහෙන** ශාක්‍යරාජවංශ සිංහයා වූ ගෞතම තථාගතයන් විසින්. **අභිනික්ඛමිත්වා** බුදුරදුන්ගේ ස්වභාවයෙන් **නරුත්තමෙන** මිනිසුන්ගෙන් උත්තම වූ ශ්‍රේෂ්ඨ වූ. **පකාසිතා** ප්‍රකට කරන ලද දේශනා කරන ලද

සම්බන්ධයයි. කුමන අර්ථයක්දැයි කියන ලදී. ධම්මවිඡානත්ථං යනු නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය විශේෂයෙන් දන්වන ලද්දේ යන අර්ථයයි.

ලොකානුකම්පාය ඉමානි තෙසං යනු ලොවට අනුකම්පා පිණිස, ලෝකයට අනුකම්පා නිසා මේ වචනයද මේ ගාථාවෝද ඔවුන්ට **පචෙචක** බුදුඛානං විකුබ්බිතානි විශේෂයෙන් ධ්‍යානයෙන් ප්‍රකටවන ලෙස දේශනා කරන ලද යන අර්ථයයි. **සංවෙගා සංගම තිවඩඪ නත්ථං** යනු පණ්ඩිතයන්ගේ සංවේගය වර්ධනය පිණිස කෙලෙස් නොවැඩුණු පිණිස ඒකීයභාවය වර්ධනය පිණිස ප්‍රඥාව වඩනු පිණිස, ප්‍රඥාව අවදිවනු පිණිසද වේ. **සයමභුසීහෙන** ආචාර්ය නොවී සිට, තමන්ව අවබෝධ කිරීම වශයෙන් හටගත්. විඳිනා ලද අහිත වූ සිංහයෙකු බඳු ගෞතම සම්මා සම්බුදුරදුන් විසින් මේ වචන ප්‍රකාශ කරන ලද්දේ විවරණය කරන ලදී. අර්ථ ප්‍රකට කරන ලදි යන අර්ථයයි. **ඉති** යනු පරිසමාප්ත අර්ථයෙහි නිපාතයකි.

මෙසේ විසුද්ධජන විලාසිනි නම් අපදාන අර්ථ කථාවේ
පසේ බුදුවරුන්ගේ සංවර්ණනාව නිමියේය.

3

එයට අමතරව ථේරාපදාන සංග්‍රහ ගාථා වර්ණනා කිරීමට "**අථ ථෙරොපදානං සුණාථ**" යන්න කීහ. අපදාන ශබ්දයේ තේරුම යට කියන ලදී. මෙහි ථෙර ශබ්දය කාල, නොසෙල්වෙන, ස්ථිර, ප්‍රඥප්ති, නාම, ජ්‍යෙෂ්ඨ ආදී නොයෙක් අර්ථයන්හි යෙදේ. "**ථෙරෝ වසසිකානි පූතිනි චුණණක ජානානි**" යන ආදියෙහි ස්ථවිරයන් වහන්සේ බොහෝ කාලයක් වස් සමාදන් වූහ යන අර්ථයයි. "**ථෙරෝ පි නාව මහා**" ආදී තැන්හි ස්ථිර, නොසෙල්වෙන යන අර්ථයි. "**ථෙරකො ආයසමා මහලලකො**" ආදී තන්හි ප්‍රඥප්තියයි. ලොක ව්‍යවහාර මාත්‍රයයි. "**චුන්දත්ථෙරෝ - උසසත්ථෙරෝ**" ආදී තන්හි නම් කිරීමයි. මෙසේ නම් කරන ලද්දේ යන අර්ථයි. "**ථෙරොචායං කුමාරෝ මම පුතෙත සු**" ආදී තන්හි ජ්‍යෙෂ්ඨ බවයි, වැඩිමහල් බවයි. මෙහි වනාහි කාලයෙහි ද ස්ථිරත්වයෙහිද, වැටේ. එහෙයින් බොහෝ කාලයක් සිටියේ යයි ද, ස්ථිරසාර වශයෙන් සීල ආචාරාදියෙහි යුක්ත වූයේ යයි ද ථේර නම් වේ. තෙරුන් ස්ථවිරයෝය. ඒ ස්ථවිරාදීන්ගේ චරිත කථා ථේරාපදානයයි. "**තං ථෙරාපදානං සුණාථ**" යන්න හා බැඳේ.

3.1

හිමවතට නුදුරෙහි ලම්බක නම් පර්වතය ආදි ආයුෂ්මත් **සාරිපුත්‍ර තෙරුන්ගේ** අපදානයද, ඒ ආයුෂ්මත් මහා **මොග්ගල්ලාන තෙරුන්ගේ** වස්තුවද මෙසේ දතයුතුය.

අතීතයේ මෙයින් කල්ප ලක්‍ෂයකට අධික එක් අසංඛ්‍යයක් මත්තෙහි ආයුෂ්මත් **සාරිපුත්‍ර** තෙරුන් බ්‍රාහ්මණ මහාසාල කුලයේ ඉපිද, නමින් **සරද මානව** නම් විය. මහා මොග්ගල්ලාන තෙරුන්ද, ගෘහපති මහාසාල කුලයේ ඉපිද නමින් **සිරිවඩ්ඪ** කෙළෙඹියා නම් විය. ඒ දෙදෙනාම වැලිකෙලියේ පටන් මිත්‍රයෝ වූහ. ඔවුන් අතර සරද මානවකයා පියාගේ ඇවෑමෙන් කුලය සතු ධනය පිළිගෙන, එක්දිනක් රහසිගතව මෙසේ සිතුවේය. මේ සත්ත්වයන්ට මරණය නම් ඒකාන්තය. එහෙයින් මා විසින් එක් පැවිද්දකු වෙත එළඹ දුකෙන් මිදෙන මග ගවේෂණය කළ යුතුය. සහායක මිත්‍රයා වෙත එලඹ, 'මිත්‍රය මම පැවිදිවනු කැමැති වෙමි. කිම නුඹ පැවිදි කිරීමට හැකි වන්නෙහිද? කියා, ඔහු විසින් නොහැකි වන්නෙමියි කී කල්හි වේවා! මමම පැවිදි වන්නෙමියි, රුවන් කෝෂ්ඨාගාර ආදිය විවෘතකොට දිළින්දන්ට දී, පර්වත පාදයට ගොස්, ඍෂි පැවිද්දෙන් පැවිදි විය. ඒ පැවිද්දාට අනුව පැවිදි වූ සැත්තෑ හතරදහසක් පමණ වූ බ්‍රාහ්මණ පුත්‍රයෝ වූහ. ඔහු පංච අභිඥා අෂ්ට සමාපත්ති උපදවා ඒ ජටිලයන්ටද කසිණ සමවත් කීවේය. ඒ සියල්ලෝ පංච අභිඥා අෂ්ට සමාපත්ති උපදවා ඒ ජටිලයන්ටද කසිණ සමවත් කීවේය. ඒ සියල්ලෝ පංච අභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගත්හ. එසමයෙහි **අනෝමදස්සි** නම් සම්මා සම්බුදුරදුන් ලොව ඉපිද, පවත්වන ලද උතුම් ධර්මය ඇත්තේ සත්ත්වයන් සංසාරමහා සැඩපහරින් එතර කරවමින් එක්දවසක් සරද තාපසයාටද, අතවැසියන්ටද සංග්‍රහ කරනු කැමැත්තේ එකකු නොදෙවෙනි පාත්‍ර සිවුරු රැගෙන අහසින් ගොස් බුද්ධභාවය මට දැනේවා'යි තාපසයා බලා සිටිද්දීම අහසින් බැස පොළොවේ සිටියේය. සරද තාපසයාද, බුදුරදුන්ගේ සිරුරේ මහා පුරුෂ ලක්‍ෂණ බලා, සර්වඥ බුදුන් යයි නිශ්චයට පැමිණ පෙරගමන්කොට ආසනයක් පනවා දුන්නේය. පනවන ලද ආසනයේ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි සේක. සරද තාපසයා ශාස්තෘන් වහන්සේ සමීපයේ එකත්පසක හුන්නේය.

එසමයෙහි උන්වහන්සේගේ අන්තේවාසික සැත්තෑහතර දහසක් පමණ ජටිලයෝ ප්‍රණීත ප්‍රණීත ඕජවන්ත ගෙඩි රැගෙන පැමිණ ශාස්තෘන්

දැක, හටගත් පැහැදීම ඇත්තේ තමන්ගේ ගුරුවරයාට ශාස්තෘන් හුන් ආකාරය බලා, ගුරුතුමනි, අපි පෙර, නුඹ හා සමාන ශ්‍රේෂ්ඨතර කිසිවකු නැතැයි සිතමු. මේ පුරුෂයා වනාහි, නුඹලාට වඩා ඉතා ශ්‍රේෂ්ඨ යයි හඟිමියි කීහ. දරුවනි, කුමක් කියවුද? සැටදහසක් යොදුන් උස සිනේරු පර්වතය අබ ඇටයකට සමාන කිරීමට කැමැතිවහුද? සර්වඥ වූ බුදුරදුන් විසින් මට සමාන නොකරවූ. ඉක්බිති ඒ තාපසයෝ ගුරුතුමාගේ වචන අසා, ඒකාන්තයෙන් මේ උත්තම පුරුෂයෙකියි සියළුම දෙනා ළඟ වැටී අතර වැටී, ශාස්තෘන් වැන්දහ. ඉක්බිති ඒ ගුරුතුමා කීවේය. දරුවනි, ශාස්තෘන් වහන්සේ අපට සුදුසු වූ ධර්මය දුන්නේ නැත. ශාස්තෘන් වහන්සේ, පිඬු පිණිස හැසිරෙන වේලාවේ මෙහි වැඩම කළ සේක. ඉදින් අප දෙසිය යුතු ධර්මය සුදුසු පරිදි පෙන්වමු. නුඹලා විසින් යම් යම් ප්‍රණීත ගෙඩි කුඩා ගෙඩි රැගෙන එන ලදි. ඒ ඒ දේ ගෙන එවු යයි ගෙන්වාගෙන අත් සෝදා, තෙමේ තථාගතයන්ගේ පාත්‍රයේ පිහිටුවීය. ශාස්තෘන් වහන්සේ ගෙඩි කුඩා ගෙඩි පිළගැන්වූ මොහොතේ දෙවියෝ දිව්‍ය ඕජස් දැමූහ. තාපසයා ජලයද තෙමේ පෙරා දුන්නේය. ඉක්බිති ආහාර කෘත්‍යය නිමවා, ශාස්තෘන් වහන්සේ වැඩහුන් කල්හි සියළු අතවැසියන් කැඳවා, බුදුරදුන් සම්පයේ පිළිසඳර කථාකරමින් හුන්නේය. "ශාස්තෘන් වහන්සේ, අග්‍ර ශ්‍රාවකයෝ දෙනම භික්ෂු සංඝයා සමග පැමිණෙත්වා"යි සිතුවේය. එකෙණෙහි, ලක්ෂයක් රහතුන් පිරිවරා අග්‍රශ්‍රාවකයෝ පැමිණ, බුදුරදුන්ට වැඳ එකත්පසක හුන්හ. ඉක්බිති සරද තාපසයා අතවැසියන් ඇමතූ සේක. "දරුවනි, ශාස්තෘන් වහන්සේ, භික්ෂු සංඝයාට මල් අසුනින් පූජා කළයුතුය. එහෙයින්, මල් රැගෙන එවු. ඔවුහු එකෙණෙහි ඍද්ධියෙන් සුවඳමල් රැසක් ගෙනවුත්, බුදුරදුන්ට යොදුනක් පමණ මල් ආසනයක් පැනවූහ. අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනාට තුන් ගව්වක් පමද, සංඝ නවකයන්ට වෘෂභයකු පමණ වූ අසුනක්ද පැනවූහ. මෙසේ පනවන ලද ආසනවල සරද තාපසයා බුදුරදුන් ඉදිරියේ ඇදිලි බැඳ "ස්වාමීනි, මට අනුග්‍රහ පිණිස, මේ මල් ආසනයට නගිවු යයි කීහ. බුදුරදුන් මල් ආසනයේ හුන්නේය. බුදුරදුන් වැඩහුන් කල්හි අග්‍රශ්‍රාවකයෝ දෙනමද, සෙසු භික්ෂූන්ද, තම තමන්ගේ පනවන ලද ආසනයේ වැඩහුන්හ. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට, මහත්ඵල වේවායි නිරෝධයට සමවැදුණේය. ශාස්තෘන් වහන්සේ සමවතට හුන් බව දැන භික්ෂූන්ද නිරෝධ සමවතට හුන්හ. තාපසයා සත්දිනක් නිරතුරුව බුදුරදුන්ට මල් කුඩයක් දරමින් සිටියේය. සෙසු පිරිස වන මුල් ගෙඩි අනුභවකොට සෙසු වේලාවේ ඇදිලි බැඳ සිටියහ.

ශාස්තෘන් වහන්සේ සත්දිනක් ඇවෑමෙන් නිරෝධ සමාපත්තියෙන් නැගිට අග්‍රශ්‍රාවකයා වූ **නිසභ තෙරුන්** ඇමතූ සේක. තාපසයන්ගේ මල් ආසන අනුමෝදනාව කරනු මැනවි. තෙරුන්, ශ්‍රාවක පාරමිතා නුවණේ සිට, ඔවුන්ට මල් ආසනයේ අනුමෝදනාව කළහ. ඒ දේශනාව අවසානයේ, ශාස්තෘන් වහන්සේ දෙවෙනි ශ්‍රාවක වූ **අනෝම තෙරුන්** ඇමතූ සේක. නුඹද, මේ ධර්මය දේශනා කරනු මැනවි. උත්සාහයෙන්ද ත්‍රිපිටක බුද්ධ වචනය උගෙනගෙන ඔවුන්ට දහම් දේශනා කළ සේක. ධර්මදේශනා දෙකේදීම ඒ දෙදෙනාට ධර්මාභිසමය නොවීය. ඉක්බිති බුදුරදුන් බුද්ධ විෂයේ සිට ධර්මදේශනාව පටන් ගත්හ. දේශනාවසානය හැර සරද තාපසයාද අවශේෂ සියල්ලෝද සැත්තෑසතර දහසක් ජටිලයෝ අරහත් ඵලයට පැමිණියහ. ශාස්තෘන් වහන්සේ 'එවු මහණෙනි'යයි අත දිගුකළ සේක. ඔවුහු එකෙණෙහි අතුරුදන් වූ තාපස වෙස් ඇත්තේ, අෂ්ට පරිෂ්කාර දරමින් සැටවස් තෙරුන් මෙන් වූහ.

සරද තාපස වනාහි "අහෝ ඒකාන්තයෙන්ම මේ **නිසභ තෙරුන්** මෙන් අනාගතයේ එකම බුදුවරයකුගේ ශ්‍රාවකයා වන්නේ යයි දේශනා කාලයේ උපන්, පරිවිතර්කයෙන් මිදී සිට මාර්ගඵල අවබෝධ කිරීමට නොහැකි විය. ඉක්බිති බුදුරදුන් වැඳ එසේ ප්‍රාර්ථනාවක් කළ සේක. බුදරදුන් අතුරු ආත්මයක එය සඵලවන බව දැන 'මෙයින් කල්ප ලක්ෂයක් එක් අසංඛ්‍යයක් ඉක්මවා ගෞතමනම් **සම්මා සම්බුදුරදුන්**ගේ අග්‍රශ්‍රාවක **සාරිපුත්ත** නම් වන්නේ යයි විවරණ දී, ධර්ම කථාව අසා භික්ෂු සංඝයා පිරිවරා අහසට පැන නැංගේය.

සරද තාපසයා මිත්‍ර වූ **සිරිවඩ්ඪ**ගේ සමීපයට ගොස්, 'මිත්‍රය, මා විසින් **අනෝමදස්සි** බුදුරදුන්ගේ පාදමූලයේ සිට අනාගතයේ පහළවන්නා වූ **ගෞතම** සම්මා සම්බුදුරදුන්ගේ අග්‍ර ශ්‍රාවක තනතුර ප්‍රාර්ථනා කළෙමි. නුඹද දෙවෙනි ශ්‍රාවක තනතුර ප්‍රාර්ථනා කළ මැනවි. **සිරිවඩ්ඪ** ඒ උපදෙස් අසා තමන්ගේ නිවෙස්න දොරටුවෙහි අටලොස් රියනක් තැන් සමතලා කරවා, ලද පස්මල් විසුරුවා නිල් උපුල්මල් ගැවසුණු මණ්ඩපයක් කරවා, බුද්ධාසනයක් පනවා භික්ෂූන්ටද අසුන් පනවා, මහත් සත්කාර සම්මාන සරසවා, **සරද තාපස** විසින් ශාස්තෘන්ට ඇරයුම්කොට සත්දිනක් මහදන් දී බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට මාහැඟිවූ වස්ත්‍ර අදවා, දෙවෙනි ශ්‍රාවක භාවය ප්‍රාර්ථනා කළේය. බුදුරදුන් ඔහුගේ අනතුරු භවයක එය සමෘද්ධ වන බව දැන කියන ලද අයුරින් විවරණ දී භුක්තානුමෝදනාව කොට

පිටත්ව ගියේය. **සිරිවඩ්ඩ** තුටු පහටුව දිවි ඇතිතෙක් කුසල කර්මකොට දෙවෙනි සිත් වාරයෙහි කාමාවචර දෙව්ලොව උපන්නේය. සරද තාපසයා සතර බඹ විහරණ වඩා බඹලොව උපන්නේය. එතැන් පටන් ඒ දෙදෙනාගේම අනතුරු කථා නොකියන ලදි. අපගේ බුදුරදුන් ඉපදීමට පෙරටුවම **සරද** තාපසයා **රජගහට** නුදුරෙහි **උපතිස්සගම රූපසාරි** බැමිණියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. එදවසම සහායකයා රජගහට නුදුරෙහි කෝලිතගම **මුගලන්** බැමිණියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. එහෙයින් මොග්ගල්ලාන = මොග්ගලි බැමිණියගේ පුත්‍රයා **මොග්ගල්ලාන** නම් වේ. නැතහොත් මව කුමාරික කාලයේ ඇගේ මාපියන් විසින් කියන ලද 'වමාරන්න එපා. වමාරන්න එපා' යන වචනය එකතු වීමෙන් **මුග්ගලි** නම් වේ ඒ මුග්ගලිගේ පුතා **මොග්ගල්ලාන** නම් වේ. නැතහොත් සෝවාන් ආදි මාර්ග අදිගම ලාභය නිසා එය ප්‍රතිවේධ කිරීමට සමත් බැවින් මොග්ගල්ලාන නම් වේ. ඒ කුල දෙකක සිට කුල සතක් දක්වා එකට බැඳුණු මිත්‍රකමක් ඇත්තේය. ඒ දෙදෙනාම එකම දිනයේ ගැබ් පෙළහර ලදහ. දසමාසයක් ඇවෑමෙන් උපන් බැවින් හැටහයක් කිරිමව්වරු පැනවූහ.

නම් තබන දිනයේ **රූපසාරි** බැමිණියගේ පුතාට **උපතිස්ස** ගමේ ජ්‍යෙෂ්ඨ කුලයක පුතකු බැවින් **උපතිස්ස** යයි නම් කළහ. අනෙකාට **කෝලිත** ජ්‍යෙෂ්ඨ කුලයක පුතකු බැවින් **කෝලිත** යයි නම් කළහ. ඒ දෙදෙනාම මහත් පිරිවරින් වැඩෙමින් සියලු ශිල්පවල පරතෙරට ගියහ. ඉක්බිති එක් දිනයක ඔවුහු රජගහනුවර ගිරග්ග සමජ්ජ නම් නාටකය බලන්නා වූ මහජනයා රැස්වනු දැක නුවණින් මුනුකුරා ගිය බැවින් සිහිනුවණින් කලකිර බලන්නාහු "සියල්ලෝම වර්ෂ සියයක් ඇවෑමෙන් මරු වසඟයට පිවිසෙත්." යයි සංවේග උපදවා, "අප විසින් මෝක්ෂ මාර්ගය සෙවිය යුතුය. එය සොයනු ලබන්නේද, එක පැවිද්ද ලැබීමට වටීයයි, නිශ්චයකොට මානවකයන් පන්සියයක් සමග **සංජය** පරිබ්‍රාජකයාගේ සමීපයේ පැවිදිවූහ. ඔවුන් පැවිදි වූ කාලයේ පටන් සංජය ලාභයෙන් කීර්තියෙන් අගතැන්පත් විය. ඔවුහු කිහිප දිනක් ඇවෑමෙන් සංජයගේ සියළු ආගමික විෂය තතු පරිදි දැන එතැන හරයක් නොදැක එතැනින් නික්ම ඒ ඒ තැන උගත් යයි සම්මත ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් ප්‍රශ්න විචාරති. ඔවුහු ඔවුන් විසින් විමසන ලද්ද සම්පාදනය නොකරති. අනෙක් ආකාරයෙන් ඔවුන් දන්නා දේ විචාරති. මෙසේ ඔවුහු මෝක්ෂය සොයමින් කථිකා කළහ. "අප අතර යමෙක් පළමුව අමෘතය අවබෝධ

කරගනිද? ඔහු අනෙකාට කියනු ලැබේවා. ඒ සමයේ අපගේ ශාස්තෘන් වහන්සේ පරම අභිසම්බෝධියට පැමිණ පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තේ අනුපිළිවෙළින් උරුවෙල **කස්සප** ආදි දහසක් ජටිලයන් දමනයකොට **රජගහනුවර** වාසය කරන්නේ එක් දිනක් **උපතිස්ස** පරිබ්‍රාජකයා පරිබ්‍රාජක ආරාමයට යන්නේ ආයුෂ්මත් **අස්සජි** තෙරුන් රජගහනුවර පිඬු පිණිස හැසිරෙන බව දැක මා විසින් මෙබඳු ආකාර ආකල්ප සම්පත්වලින් යුක්ත පැවිද්දකු පෙර නුදුටු විරූය. මෙහි සත්පුරුෂ ධර්මයක් නම් විය යුතුය. හටගත් ප්‍රසාද ඇත්තේ ප්‍රශ්න විමසීමට ආයුෂ්මතුන් පිටුපසින් ලුහුබැඳ ගියේය. තෙරුන්ද, ලබන ලද පිණ්ඩපාතය වැළඳීමට සුදුසු ඉඩකඩක් සොයා ගියේය. පරිබ්‍රාජකයා තමන්ගේ පරිබ්‍රාජක පුටුව පනවා දුන්නේය. බත්කිස අවසානයේ ඔහුගේ කෙණ්ඩියෙන් පැන් දුන්නේය. මෙසේ ඔහු ආචාර්යවත් ඉටුකොට කළ බත්කිස ඇත්තේ තෙරුන් සමග පිළිසඳර කථාකොට "ඔබේ ශාස්තෘවරයා කවරෙක්ද?" "කවරෙකුගේ ධර්මයක් ඔබ රුචි කෙරේද?" විචාළේය. තෙරුන් සම්මා සම්බුදුරදුන් ගැන වදාළේය. නැවත ඔහු විසින් බුදුරදුන් කුමනවාදියෙක්දැයි විමසන ලදුව, 'මේ ශාසනයේ ගැඹුරු බව පෙන්වන්නෙමියි' තමන්ගේ නවක භාවය අවබෝධකොට සංක්ෂිප්ත වශයෙන් එම ශාසන ධර්මය ප්‍රකාශ කරමින් **යෙ ධම්මා හේතුප්පභවා** යන ගාථාව වදාළ සේක. පිරිවැජියා ජේළි දෙකක්ම අසා, දහසක් ක්‍රම සහිත සෝවාන්මාර්ග ඵලයේ පිහිටියේය. ඉතිරි පද දෙක සෝවාන් කාලයේ නිමවිය. ගාථාව අවසානයේ ඔහු සෝවාන් වී, මතු විශේෂ ධර්මයෝ අප්‍රමාද වන්නේ යයි, මෙහි කාරණාව සලකා, තෙරුන්ට කීවේය. "ස්වාමීනි, මතු ධර්මදේශනා නොවඩවු. මේ ටිකම ප්‍රමාණවත්ය. කොහේ අපගේ ශාස්තෘන් වැඩවාසය කරත්ද? ස්වාමීනි, වේළුවනයේය. නුඹලා පෙරටුව යවු. මම මගේ මිත්‍රයාට කරන ලද ප්‍රතිඥාව ඉටුකොට ඔහු රැගෙන එන්නෙමියි, පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණාකොට තෙරුන් පිටත්කොට, පරිබ්‍රාජකාරාමයට ගියේය. **කෝලිත** පරිබ්‍රාජකයා දන්වන්නේ දුරදීම එනවා දැක, "මුහුණේ පැහැය වෙනත් දවස්වල මෙන් නොවේ. ඒකාන්තයෙන් මොහු විසින් නිවන අවබෝධ කළේ වන්නේ යයි ඔහු සමග විශේෂ අධිගමය ගැන සාකච්ඡා කොට අමෘත අධිගමය ගැන විචාළේය. ඔහුද ඇවැත්නි, නිවන අධිගම කළේදැයි පිරිවිස දැන එම ගාථාව කී සේක. ගාථා අවසානයේ **කෝලිත** සෝවාන් ඵලයේ පිහිටුවා කීවේය. අපගේ ශාස්තෘන් වහන්සේ කොහේද? වේළුවනයේය. ඔහු විසින් ඇවැත්නි ආමන්ත්‍රණය කරමු. ශාස්තෘන් වහන්සේ බලන්නෙමු. **උපතිස්ස** සියළු කාලයේම ගුරු පූජකයෙකි. එහෙයින්

සංජයට බුදුගුණ ප්‍රකාශකොට නුඹද බුදුරදුන් සමීපයට පමුණුවනු කැමැත්තේයි කීවේය. ලාභ ඉවසීමේ අපේක්ෂාවෙන් අතවැසිභාවය නොකැමැත්තේ 'සැළියේ සිට ජලය ඉසීමට නොහැකි වෙමි. ප්‍රතික්ෂේප කළේය. ඔවුහු නොයෙක් කාරණාවලින්, එය දැනුම්දීමට නොහැකි වන්නේ තමන්ගේ අවවාදයේ පවතිනු ලබන්නේ තිස්දහසක් පමණ අතවැසියන් සමග වේළුවනයට ගියහ. ශාස්තෘන් වහන්සේ ඔවුන් දුරදීම එනවා දැක, "මේ මගේ ශ්‍රාවක යුගලය වන්නේ යයි, අග්‍රශ්‍රාවක බව ගැන පවසා, ඔවුන්ට පිරිස්මැද ධර්මදේශනා කොට රහත්ඵලයේ පිහිටුවා ඒහිභික්ෂු භාවයෙන් උපසම්පදාව දුන්නේය. යම්සේ, ඔුන්ගේ මෙසේ අග්‍රශ්‍රාවක බවට අදාළව ඍද්ධිමය වූ සිවුරු පැමිණියේය. මාර්ග කර්තව්‍යය නිම නොවීය. කුමක් හෙයින්ද? ශ්‍රාවක පාරමී ඥානය මහත් බවට පත්වේ. ඔවුන් අතර ආයුෂ්මත් **මහා මොග්ගල්ලාන** පැවිදි වීමෙන් සත්වෙනි දිනයේ මගධ රට **කල්ලවාල** ගම ශ්‍රමණ ධර්ම කරමින්, සිතේ මැලි බව පහව ගියකල්හි බුදුරදුන් සංවේගයට පැමිණ, 'ථීන-මිද්ධය දුරුකොට, ධාතු කර්මස්ථාන අසමින්ම මතු මාර්ග-ඵල අධිගම කරමින් ශ්‍රාවක පාරමී ඥාණය මස්තකප්‍රාප්ත විය. ආයුෂ්මත් **සාරිපුත්ත** පැවිදි පිණිස අඩමසක් ඉක්මවා ශාස්තෘන් සමග රජගහනුවර **ඌරා හෑරූ ලෙනෙහි** වාසය කරමින් තමන්ගේ බෑණා වූ, **දීඝනඛ** පරිව්‍රාජකයාම වේදනා පිළිබඳ විමසන සූත්‍රය දේශනා කරනු ලබන්නේ දේශනාව අනුසාරයෙන් ඥාණය මෙහෙයවා, අනුන්ට වඩන ලද බත අනුභව කරන්නාක් මෙන්, ශ්‍රාවක පාරමී ඥාණය මස්තකප්‍රාප්ත විය. මෙසේ අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනාගේ බුදුරදුන් සමීපයේම ශ්‍රාවක පාරමිතා ඥානය මස්තකප්‍රාප්ත විය. මෙසේ, පතන ලද ශ්‍රාවක පාරමී ඥානය ඇති ආයුෂ්මත් සාරිපුත්ත "කවර කර්මයකින් මේ සම්පත් ලබන ලද්දේදැයි ආවර්ජනා කරන්නේ, එය දැන සොම්නස් වශයෙන් උදානය උදම් ඇනීමෙන් හිමාලයට නුදුරේ සිට මෙසේ කීවේය.

"හිමාලයට නුදුරේ ලම්පක නම් පර්වතයක් ඇත.
මනාසේ සකස්කල, මගේ අසපුව මැනවින්
සාදා ඇති පන්සල එහි ඇත"

එහි **හිමවන්තස්ස** යනු හිම එහි ඇති බැවින්, හිමවා නම් වේ. ඒ හිමාලයට **අවිදූරෙ** සමීපයේ හිමාලය හා බැඳුණු වනයෙහි යන අර්ථයයි. **ලම්පකො නාම පබ්බතො** යනු එබඳු නමකින් යුක්ත පස් මිශ්‍ර පර්වතයයි.

අසසමෝ සුකතා මයහං යනු ඒ ලම්පක පර්වතයේ මගේ, මා සඳහාම කරවන ලද අසපුව, අරණ්‍යවාසය ආයුෂ්මතුන්ට සමාන වේ නිසා ආශ්‍රම නම් වේ. පව්ටුවන්ට සම වූ ඇසුරක් එහි නැති නිසා ආශ්‍රම නම් වේ. එය මේ අර්ථයෙන් අරණ්‍යවාසී වූයේ මැනවින් කරන ලද්දේ දිවා රාත්‍රී වාසයට සුදුසු කුටි මණ්ඩප ආදියෙන් යුක්ත වූයේ සුන්දර ලෙසින් කරන ලද අර්ථයයි. **පණ්ණසාල** යනු සැවැන්දරා මුල් ආදියෙන් විවිධ කොළ අතුවලින්ද වසන ලද නිවස්නය පන්සල නම් වේ.

"උසින් ගලා බසින නදියෙන්ද, මනෝරම්‍ය වූ
තොටුපළෙන්ද, සුපිරිසිදු වූ වැලිතලාවෙන්ද
නුදුරෙහි මගේ අසපුව ඇත."

සුසුදධ පුලිනාකිණණා යනු ඉතා පිරිසිදු සුදු මුතුදැල් සමාන වැලිවලින් ගැවසුණු යන අර්ථයයි. එය මෙනම් අර්ථයෙන් **නදිකා** කුඩා ගංගා. **මසසසමං** මගේ ආශ්‍රමයයි. **අවිදූරෙ** සමීපයේ විය යන අර්ථයයි. **අසසමං** යනු සත්තමී අර්ථයෙහි උපයෝගි වචනයෙහි යෙදිය යුතුයි.

"ගල්බොරළු නැති යහපත් වූ මනා සුවඳින් සුවඳවත් වූ
මගේ අසපුවට නුදුරින් එම නදිය ගලා බසියි."

එහි **අසකබරා** යනු වැලිවලින් ගැවසුණු යයි කියන ලද බැවින් අසක්බරා නම් වේ. ගල්බොරළු විරහිත **අපබභාරා** යනු ගැඹුරු නැති. ගැඹුරු වූ ඉවුරුවලින් තොර යන අර්ථයයි. **සාදු අපපටිගන්ධිකා** යනු යහපත් වූ රසයෙන් යුතු ජලයයි. ගඳක් නොමැති මගේ අසපුවේ මැනවින් ශෝභමාන බව රඳ පවතී. **නදිකා** කුඩා නදිය. **සන්දති** පවත්නේ යන අර්ථයයි.

"ඉදිබුවෝ මකරෝ සැඩපරුෂ මත්ස්‍යයෝ එහි සිටිති.
ශෝභාමත් වූ මගේ ආශ්‍රමය ඒ කුඩා නදිය
අසබඩ පිහිටා ඇත."

එහි **කුමභීල** මත්ස්‍යයෝ, **මකරා** මත්ස්‍යයෝ. **සුංසුමාරා** සැඩපරුෂ කිඹුලන් **කච්ඡප** ඉදිබුවෝද. **එත්** මේ නදියේ ක්‍රීඩා කරමින්, වූහ යන සම්බන්ධයයි. **මමසසමං සොභයනති නදිකා** කුඩා නදිය **සනදති** ගලාබසී යන සම්බන්ධයයි.

පෙති මාළුද, වල්ගය ඇති මාළුද, රතු මාළුද,
මඩකරි මාළුද නදියේ හැසිරෙත්. මගේ අසපුව
ශෝභමාන කරත්.

පාඨීන පෙති මාළුද, **පාවුස** දිගමාළුද, **වාලජ** වල්ගය සහිත මාළුද, **මුඤ්ජ** කුඩා මාළුද, **රොහිත** රතු මාළුද, **වඟුලා** මඩකරි මාළුද, මේ සියළු මත්ස්‍යජාතීහු ඔබ්මොබ හැසිරෙත්. **පපතායනතා** නදිය සමග සම්බන්ධව පවතිත්. **මම අසසමපදං සොභයනති** යන අර්ථයයි.

"නදියේ ඉවුරු දෙපස මල් ඇති ඵල ඇති
මහ ගස් ඇත. දෙපසම සරුසාර තේ
ඒ නිසා මගේ අසපුව ශෝභමාන වෙත්.

එහි **උභොකූලෙසු** යනු ඒ **නදියා** ගඟෙහි දෙපැත්තෙහි මහා වෘක්ෂ මල්බරින් හා ඵලබරින් යුක්ත වේ. **උභතො අභිසමපතනා** නදියේ යට තීරයේ නැමෙමින්. **මම අසසමං සොභයනති** යන අර්ථයයි.

අඹ, සල්, ඇසළ, පළොල්, මල් ඇති
දිව්‍ය සුවඳ ඇති ගස් මගේ අසපුව
හාත්පස සිසාරා ඇත.

එහි **අම්බා** යනු මී අඹ වේ. **සාල** සල්ගස්, **තිලකා** ඇසළ ගස්, **පටලි** පළොල්, **සිඳුවාරක** ඉන්දිරව ගස් මේ ගස් නිරතුරුවම **පුපඵිතා** මල්බරින් යුතු වූවා. **දිබබගන්ධාලුව** දිව්‍ය සුවඳ මෙන් **මම අසසමෙසු** මගේ අසපුවේ සුවඳ **සම්පවනති** හාත්පස පැතිරී පවතී. යනු අර්ථයි.

සපු, සල්, කොහොඹ, හා දොඹ වැටකේ
ගස් දිව්‍ය මල් සුවඳ හමමින් මල් පිපී මගේ
අසපුව අලංකාර කරත්.

එහි **චම්පක** සපුගස්ද, **සාල** සල් ගස්ද, රන්වන් පාටින් බබළන මල් පිපී ඇත්තේ **නිප** මැයිමල් ගස්ද, **නාග** නා ගස්ද, **පුනනාග** දොඹගස්ද, සුවඳවත් වූවෝ **කෙතක** වැටකේ ගස්ද, මේ සියළු ගස්ද, **දිබබගන්ධා** දිව්‍ය සුවඳ මෙන් **මම අසසම පුපඵිතා** මනාසේ පිපුණේ **සම්පවනති** මැනවින් සුවඳ හමමින් පවතී යන අර්ථයයි.

එහි අධිකලෙ මල් පිපී ඇති අශෝක මල් ද
අංකෝල, බිඹුවන් මල් දාමයේ මගේ
අසපුව හාත්පස පවතී.

එහි මල් පිපී ඇති **අධිමුත්ත** ඉතා හොඳින් වැඩුණු ගස්ද, **අසොකා** අශෝක ගස්ද මල් පිපී ඇති **භගිනිමාලා** වැල්අරටු ගස්ද මල් පිපී ඇති **අංකොලා** අංකෝලද, මල් පිපී ඇති **බිම්බිජාලාව** මේ ගස්ද **මම අසසමෙ** මැනවින් පිපී ඇත්තේ ශෝභමාන වෙත් යන අර්ථයයි.

වැටකේ කෙසෙල් ද, යව, තෘණසුලික ද
දිව්‍යමල් සුවඳ හමමින් මගේ අසපුව
බබළවත්.

එහි **කෙතකා** යනු සුවඳවත් වූ වැටකේ පඳුරු, **කදලි** කෙසෙල් ගස්ද, ගොමුක යව ගස්ද, **තිණසුලික** සුන්සහල් පඳුරුද, මේ සියළු ගස් ජාතිහු **දිබ්බගන්ධං** දිව්‍ය සුවඳ හමමින්, **මම අසසමං** සියලු අසපුව හාත්පස **සොභයනති** යන අර්ථයයි.

උඩින් මල් පිපෙන විවිධ ගස්වැල් ද, කුඹුක්ගස් ද
බහුල වශයෙන් පවතින්නේ මගේ අසපුව
ශෝභමාන වෙත්.

මෙහි **කණිකරා** ආදි ගස් **මම අසසමා** සියලු **සොභයනති දිබ්බගන්ධං සමපවත්තා** යන සම්බන්ධයි.

දොඹ පුවක් පරසතු මල් පිපී ඇති දිව්‍ය සුවඳ
මෙන් ශෝභමාන වෙමින් මගේ අසපුව
ශෝභමාන වෙත්.

පුනාගා ආදි දොඹ ආදි ගස් දිව්‍ය සුවඳ හමමින් **මමසසමපදං සොභයනති** යන අර්ථයයි.

ඇසළ ගස්ද, මුදුනේ මල් පිපෙන බක් මී ගස් ද,
බොහෝකොට ඇති මූණමල් ගස්ද, දිව්‍ය සුවඳ
පමුණුවමින් මගේ අසපුව ශෝභමාන වෙත්.

උදදාලක ඇසළ ආදි ගස් **දිබ්බගන්ධා** දිව්‍ය සුවඳ පතුරුවමින් **මමඤ්ඤමං සොභයන්ති** යන සම්බන්ධයි.

ආලක ඍෂි මුව කෙසෙල් මතුරාදි
සුවඳ හමන පැන්වලින් වර්ධනය වූයේ ඒ ගස්
ඵල දරමින් තිබේ.

එහි මේ **ආලක** ආදි පොකුණු සඳහන් සුවඳ හමන්නේ **ගන්ධොදකෙන** සුවඳ ජලයෙන් වැඩුණේ මනා වූ **එලානි** ගෙඩි දරන්නේ **මම අඤ්ඤමංසොභයන්ති** යන අර්ථයයි.

පොකුණේ වෙනත් පියුම් පිපී තිබෙත්. කෙසරු මල්
පිපී තිබෙත්. ඕලු මල් පිපී තිබෙත්. එකල මල්වලින්
පොකුණ පිරී පවතිත්.

එහි **අඤ්ඤඤ්ඤ පුප්ඵනති පදුමා** යනු මම අසපුව නුදුරෙහි **තළාකෙ** වෙනත් ඇතැම් පියුම් පිපී තිබෙත්. සමහර ඒවා කේශ ඇති නෙළුම් මල්ය. **ජායන්ති** හටගනිත් ඇතැම් **පදුමා ඔපුප්ඵා** ගිලිහුණු කොළ ඇති කේශර ඇති යන අර්ථයයි.

"නෙළුම් මල් නෙළුම් දඬු ආදියෙන් යුතුව උඩට
ඉස්මතු වී තිබේ. දිගහැරුණු පාත්‍ර ඇත්තේ තඩාගයේ
ගැවසී ශෝභමාන වෙත්."

එහි **ගබ්භං ගණ්හන්ති පදුමා** යනු එකල තාපසයා විසින් මා වාසය කරන කාලයේ ඇතැම් පියුම් පොකුණ අභ්‍යන්තරයේ පිපුණු මල් බවට පත්වෙති. මුළාලියො පියුම් මල්. **නිද්ධාවන්ති** මේ මඩ අතරින් ඇත් දළ මෙන් හානි යන අර්ථයයි. පිපුණු මල්වලින් ගැවසුණු පැතුරුණු පත්‍ර ඇතිව ශෝභමාන වේ යන අර්ථයයි.

"අල්ප වූ සුවඳ ඇති බඳු වද ගස් ඇති
දිව්‍ය සුවඳ පතුරුවමින් පොකුණේ එකල
මල් පිපී ඇත්තේය."

තදා මා වාසය කරන සමයේ පොකුණට නුදුරෙහි **නයිනා** යන්නේ ස්වල්ප වූ සුවඳ පැතිරුණු **උත්තලි** නම් පොකුරුද, බෑඩු **ජීවිකා** රතුවද ආදි මේ සියළු ගස්ද **පුපඵිනා** මල් දරමින් සුවඳ වහනය වෙමින් පොකුණු ශෝභමාන කරයි යන අර්ථයයි.

පෙතියෝ ද විශාල මත්ස්‍යයෝ ද, වාලධි සහිත මත්ස්‍යයෝ ද
රතු මාළු ද, මකරු ද, මගුරෝ ද එකල තඩාගයේ
වාසය කරති.

තදා මා වාසය කරන කාලයේ පෙතියෝ ආදි මාළු බිය නැතිව පොකුණේ වාසය කරති යන සම්බන්ධයයි.

කිඹුල්ලු, රකුසු, සුසුමාරා තන්තිගාහ
පිඹුරෝද එම පොකුණේ වාසය කරති.

තදා මා වාසය කරන කාලයේ මගේ අසපුව සමීපයේ පොකුණේ මේ **කිඹුල්ලු** ආදි මත්ස්‍යයෝ බිය නැතිව, නිරුපද්‍රිතව වාසය කරති යන සම්බන්ධයයි.

පරෙවියෝ සූර්යය හංසයෝ, සක්වාළිහිණි, ආදි
නදියේ හැසිරෙන තෙරහු ද, කොවුලෝ, සහ සැළලිහිණියෝ ද
ඒ විල හා විල අවට සැරිසරති

එහි මගේ අසපුව සමීපයේ විල ඇසුරුකොට පරෙවියෝ ආදි පක්ෂීහුද රවිහංස හංස පක්ෂීහුද **නදි චරණකා චකකවාක** නදියේ හැසිරෙන සක්වාළිහිණි පක්ෂීහුද **කෝකිල** පක්ෂීහුද ගිරා පක්ෂීහුද, සැළලිහිණි පක්ෂීහු ද **තං සරං උප** ඒ විල ඇසුරුකොට **ජීවන්ති** යන සම්බන්ධයි.

"සැවුලෝ වනයේ හැසිරෙන මොනර ගිරා
පෝතක ආදි පක්ෂීහු ද ඒ විල ඇසුරුකොට
ජීවත්වෙති."

එහි **කුකුත්ථකා** නම් පක්ෂීහුද, **කුලිරකා** කෑදැත්තෝ ද **වනපොක්ඛරසාතකා** කාලවර්ණ පක්ෂීහුද දෙනදිහා පක්ෂීහු ද **සුපොතකා**

ගිරා පැටව් ආදි පක්ෂීහුද, මේ සියළු පක්ෂීහු **තං** මගේ ආශ්‍රමය සමීපයේ **සරං** විල ඇසුරුකොට **වසනති** යනු සම්බන්ධයයි.

හංසයෝ කොස්වාළිහිණි, මොනරු කොවුල්
තම්බවුලක පම්පක ජීවංජීවකයෝද
ඒ විල ඇසුරුකොට ජීවත් වෙති.

මේ සියලු **හංසාදයො පක්ෂීහු තං සරංඋප** ඒ විල ඇසුරුකොට **ජීවනති** ජීවිතය පාලනය කරත් යන සම්බන්ධයයි.

"කෝසිකපොට්ඨ සීස, කුරර සෙනකා යන
බොහෝ පක්ෂීහුද, මහා කාලවර්ණ **ක්ෂීහුද,**
ඒ විල ඇසුරුකොට ජීවත්වෙති."

එහි **කොසිකා** පක්ෂීහු **පොථසීසා** කොණ්ඩ කුරුල්ලෝද, **කුරරා** පක්ෂීහුද **සේනකාච** සේනාව සහිත පක්ෂීහුද, **මහා කාලාච** මහ කාලවර්ණ පක්ෂියාද ගොඩබිම වසන බොහෝ පක්ෂීහුද ඒ **සරං** ඒ විල සමීපයේ ජීවිතය ගතකරයි යන අර්ථයයි. **ජීවනති** ජීවිතය ගතකරයි යන අර්ථයයි.

මුවෝද ඌරෝද, බොහෝ බක ආදි
සකද, රතුපාට වූ ගිරා පැටව්ද,
ඒ විල ඇසුරු කොට ජීවත්වෙති.

එහි **පසදාදයො** මේ ආදි මුවෝද, **තං සරං** ඒ විල සමීපයේ භූමි අර්ථයෙන් උපයෝගි වූ වචනයයි. ජීවිතය ගෙවා දමති යන අර්ථයයි.

සිංහයෝ ද, ව්‍යාඝ්‍රයෝ ද, වලස්, දිවි, එළුවෝ ද
තුන් තැනකින් බෙදුණු මාතංග ඇත්තු ද ඒ විල
ඇසුරු කරති.

මේ **සීහා** ආදි සිවුපාවෝ විල සමීපයේ උවදුරු රහිතව **ජීවනති** යනු සම්බන්ධයි.

කිඳුරෝ ද, වඳුරෝ ද, වනයේ වැද්දෝ ද
ඒ විල ඇසුරු කොට ජීවත්වෙති.

මෙහි මේ මෙබඳු නම් ඇත්තේය. **කිනනර** ආදි සත්ත්වයෝ ඒ විල සමීපයේ වාසය කරති යන අර්ථයයි.

තිඹිරිගස් පියල්ගස් මධුකේක සුමාර ආදි
නිරතුරුව ඵල දරන ගස් මගේ අසපුව
සමීපයේ තිබෙත්.

මේ **තිඳුකා** තිඹිරි ආදි ගස් නිරතුරුව හේමන්ත ග්‍රීෂ්ම වර්ෂා සංඛ්‍යාත ඍතු කාලත්‍රයේ මමඝසමතො මගේ අසපුවෙන් නුදුරු තැනේ මිහිරි **ඵලානි** ධාරෙනති ඵල දරත් යන සම්බන්ධයයි.

සාරවත් වූ ගෙඩිවලින් යුතු කොස් පළොල් කොහොඹ
ආදි රුක් නිතර ගෙඩි දරමින් මගේ අසපුව නුදුරේ පවතියි.

එහි මේ **කොසුමහා** කපු ආදි ගස් සාර ඵල මිහිරි ගෙඩි උත්තම ඵල දරමින් **සමායුතා** මැනවින් දීර්ඝ කාලයක් පවතින්නේ එකට යාවී නිතර ඵල දරමින් **මම අසඝම** මගේ අසපුව සමීපයේ ශෝභනය කරයි යන අර්ථයයි.

අරළු, නෙල්ලි, අඹ, ජම්බු ආදිය ද කෝලං,
බෙලි, බුළු ආදිය ද ඵල දරමින් එහි තිබෙත්

හරිතකාදයො රුකඛා මම අසඝම අරළු ආදි ගස් මගේ ආශ්‍රමය සමීපයේ උපන්නා නිතර **ඵලානි** ධාරයනති ඵල දරත් යන සම්බන්ධයයි.

ආලව කොබෝලීල, කෝලං, කෝල බෙලි,
වෙනිවැල්, සාදික්කා, ආදි බොහෝකොට
මගේ අසපුව සමීපයේ පවතිත්

මේ **ආලුවාදයො** යමෙක් මේ මුල් ගෙඩි කුඩාය මිහිරි රසය, **මම අසඝම සමීපෙ** බොහෝ පවතිත් යන සම්බන්ධයයි.

අසපුව නුදුරෙහි, තඩාගය ද මැනවින් නිමකර ඇති,
මහා ජලකඳ සිසිල් වූයේ තොටුපළේ මැනවින්
පිහිටා ඇත.

එහි අසසමසසා විදූරමහි අසපුවට ඉතා නුදුරෙහි, **සුනිම්මික** මැනවින් නැගීම් බැසීම් ආදිය කොට මැනවින් නිමකරන ලද, **අවෙඡදකා** කැලඹිණු ජලය ඇති. **සීතජලා** සිසිල් දිය. **සුපතිට්ඨා** සුන්දර තොටුපොළ. **මනොරමා** සොම්නස ඇතිකරන. **තළාකා** පොකුණක් වූහ යන අර්ථයයි.

පියුම් උපුල්වලින් ගැවසුණු සුදු පියුම් ද
වර්ණවත් වී මණ්ඩලයක් මෙන් කොට ගැවසුණේ
දිව්‍ය සුවඳ හමා යයි.

පදුමෙහි ච උප්පලෙහිච සඤ්ඡන්නා නෙළුම් උපුල්වලින් පිරිපුන් පුණ්ඩරීකෙහි සමායුතා සමන්විත වූ මණ්ඩාලකෙහි සඤ්ඡන්නා මැනවින් පිරි පැවති තඩාගයේ දිබ්බගන්ධා දිව්‍ය සුවඳ හමා යයි. හාත්පස පැතිරී තිබේ යන අර්ථයයි.

"මෙසේ සියලු දැයින් අංග සම්පූර්ණ වූ මල්-ඵල
බරින් යුතු වනයෙහි මැනවින් කරන ලද රම්‍ය වූ
ආරාමයේ එකල මම වාසය කළෙමි."

එහි එවං සබ්බංගසම්පන්නෙ යනු සියළුම පරිසරයට අදාළ අංගවලින් යුක්ත පිරිපුන් මල්-ඵල පිරි ගස්වලින් සෙවණ සැලසුණු වනයෙහි **සුකතෙ** සිත්කළු වූ අස්සමෙ අරණ්‍යවාසය **තදා** තාපස ප්‍රව්‍රජ්‍යා කාලයේ **අහං විහරාමි** යනු අර්ථයයි. මෙපමණ ආශ්‍රම සම්පත් පෙන්වා දැන් තමන්ගේ සීලාදි ගුණ සම්පත් පෙන්වමින්.

"සිල්වත් වූයේ සීලවතයෙන් පිරිපුන් ධ්‍යානලාභී
ධ්‍යාන රතියේ ඇලුණු පංචාභිඥා බලයට
පැමිණි සුරුචි නම් තාපසයා වෙමි.
යන ආදී ගාථාව කීහ.

එහි **සීලවා** යනු ධ්‍යාන සම්පත්තියෙන් යුක්ත චතුපාරිශුද්ධ සීලය හා සමාන වූ පංච සීලයෙන් සමන්විත යන අර්ථයයි. **වත සම්පන්නෙ** යනු මෙතැන්පටන් ගෘහවාසය ද, පංචකාම ගුණයද සේවනය නොකරන්නෙමියි සිවු සමාදානයෙන් යුක්ත වූයේ **ඣායී** ලක්ෂණ අරමුණු වශයෙන් ධ්‍යානයේ ඇලෙන සුළු වූයේ. **ඣානරතො** යු මේ ධ්‍යානවල ඇලුණේ ඇලි සදා ඒ පිළිබඳ ඇලී සිටියේ **පඤ්ඤාභිඥා බලපත්තො** යනු

ඍද්ධිවිධ, දිව්‍යශෝත, පරචිත්ත විජානන, පූර්වේනිවාසානුස්සති, දිබ්බචක්ඛු සංඛ්‍යාත පංච අභිඥාවලින් සමන්විත වූ විශේෂයෙන් ප්‍රඥා බල සම්පන්න වූ එමගින් පිරිපුන් යන අර්ථයයි. නමින් **සුරුචි නම් තාපසයා** වී වාසය කරමි යන සම්බන්ධයි. මෙපමණකින් තමන්ගේ ගුණ සම්පත් පෙන්වා පිරිස් සම්පත දක්වමින්:-

"විසිහතර දහසක් ශිෂ්‍යයෝ මට උපස්ථාන කළහ.
සියල්ලෝ ජාති ස්මරණ ඇති, කීර්තිමත් මේ
බ්‍රාහ්මණ වංශිකයෝ වේ" යනුවෙනි කීවේය.

එහි **මේ සියළු විසිහතර දහසක් බ්‍රාහ්මණයෝ මගේ ශිෂ්‍යයෝ ජාති සම්පන්න වූයේ යසස්සිනො** පිරිවර සම්පතින් යුක්ත වූයේ මට **උපට්ඨහුං** උපස්ථාන කළහ යන සම්බන්ධයි.

"ලක්ෂණ විද්‍යාව, ඉතිහාසය, නිඝණ්ඩු සහිත තර්ක ශාස්ත්‍රය
ව්‍යාකරණ, පද පෙරළිය ධර්මය සහිතව පරතෙරට ගියේ."

එහි **ලක්ඛණෙ** යනු ලක්ෂණ ශාස්ත්‍රයයි. සියළුම ලෝකිකයන්ගේ ස්ත්‍රී පුරුෂයන්ගේ මේ ලක්ෂණවලින් යුතු වුවොත් දුගති වෙති. මේ ලක්ෂණවලින් සුවපත් වෙති. ආදී ලක්ෂණ ප්‍රකාශ කිරීමය. ඒ ප්‍රකාශ කරන අර්ථයෙන් යුතු බවයි. ඒ ලක්ෂණයෙහි, **ඉතිහාසෙ** යනු මෙසේ සිදුවිය. මෙසේ අසා ඇත්තේනුයි වචන අර්ථය උද්දීපනය වන අයුරින් යෙදිය යුතුය. ලක්ෂණයෙහිද ඉතිහාසයේද, **පාරමිං** අවසානයට **ගතා** ගිය් යන සම්බන්ධයයි. රුක් පර්වත ආදියේ නම් ප්‍රකාශ කරන ග්‍රන්ථය නිඝණ්ඩු නම් වේ. ක්‍රියා අර්ථවල අදහස් ප්‍රකාශ කිරීමට කවින්ට උපකාර වන ග්‍රන්ථය කෙටුහ යයි කියනු ලැබේ. නිඝණ්ඩුව සමග පවත්නේ යයි **සනිඝණ්ඩු** නම් වේ. එහි **සනිඝණ්ඩු සකෙටුහෙ** ත්‍රිවේදයේ පරතෙරට ගියේ යන සම්බන්ධයි. **පදකා** නාමපද සමාස තද්ධිත ආඛ්‍යාත, කිතක ආදී පදවල පණ්ඩිත අරුත් දක්ෂ වූ, වෙය්‍යාකරණ තාන්ත්‍රු පාණිනි කලප් ආදී ව්‍යාකරණයේ දක්ෂයෝ. **සධම්මෙ පාරමිං ගතා** යනු තමන්ගේ ධර්මයෙහිද බ්‍රාහ්මණ ධර්මයෙහිද වේදත්‍රයේද, දක්ෂ පරිසමාප්තිය දක්වා කෙළ පැමිණි යන අර්ථයයි.

"සුභ අසුභ නිමිත්තවල ලක්ෂණ කීමෙහි දක්ෂ වූ
පෘථිවියේ සැමියේ අහසේ මගේ සිසුවෝ මැනවින් සුසුක්ෂිතයහ."

එහි උල්කාපාත භූමිකම්පා ආදියෙහිද **උප්පාතෙසුච නිමිත්තෙසු** සුභනිමිති අසුභ නිමිත්තවලද ස්ත්‍රී ලක්ෂණ, පුරුෂ ලක්ෂණ මහ පුරුෂ ලක්ෂණවලද **ලක්ඛණෙසුච අකොවිදා** දක්ෂ වූ **පථව්‍යාඡ** භූමියේ ද සියලු ලෝකයේද, **අනතලිකෙඛ** අහසේ සැමතැනද මැනවින් හික්මුණු මගේ ශිෂ්‍යයෝ වෙති.

"අල්පේච්ඡ, ප්‍රඥාවන්ත අල්ප ආහාර ගන්නා තණ්හා රහිත
ලාභ අලාභ දෙකේ සතුටින් ම සැමදා පිරිවර
සේනාව සමග සිටිමි."

එහි **අප්පිච්ඡා** යනු අල්ප ආහාරයේ යැපෙන්නා වූ. **නිපකා** යනු ප්‍රඥා සංඛ්‍යාත නුවණින් සමන්විත වූ. **අප්පහාරා** එකවේලේ ආහාරය ඒක හත්තික යන අර්ථයයි. **ආලොලුපා** යනු තෘෂ්ණාවේ නොබැඳුණු අල්ප පැවතුම් ඇති. **ලාභාලාභෙනා** යනු ලාභ අලාභ දෙකින් **සනතුට්ඨා** සොමිනසට පැමිණි, මේ මගේ ශිෂ්‍යයෝ සැමකල්හි නිතර **පරිවාරෙනති** උපස්ථාන කරත් යන අර්ථයයි.

"ධ්‍යාන වඩන සුළු, ධ්‍යානයේ ඇලුණු ශාන්ත වූ
එකඟ වූ සිත් ඇති කිසිදු උවදුරක් ප්‍රාර්ථනා
නොකරන්නා වූ පිරිස් සැමදා මා පිරිවරා සිටිති

එහි **ඣායි** යනු ලක්ෂණ ආරම්මණ ආදි ධ්‍යානවල ඇලුණු ධ්‍යානවලින් සමන්විත වූ හාත්පසින් ධ්‍යානයේ ඇලී ගැලී කටයුතු කරන **ඣාන රතා** යනු ඒ ධ්‍යානවල ඇලුණු **ධීරා** යනු ප්‍රඥා සම්පන්න වූ. **සන්ත චිත්තා** යනු සංසිඳුණු මනසින් යුතු, **සමාහිතා** යනු එකඟ වූ සිතින් යුතු **ආකිඤ්චඤ්ඤං** යනු පළිබෝධ උවදුරු රහිත **පඤ්ඤනතා** යනු කැමැති වන්නා වූ මෙබඳු ආකාර වූ මගේ ශිෂ්‍යයෝ **සැමදා මා පිරිවරා සිටි, යනු** සම්බන්ධයි.

"අභිඥා පාරමිතා ලැබ ලද ආහාරයෙහි සතුටු වූ
ආචාර ගෝචර සම්පන්න වූ අහසෙහිද හැසිරෙන
රහත්හු මා පිරිවරා සිටිති සැමදා"

එහි **අභිඤ්ඤාපාරමිප්පත්තා** යනු පංච අභිඥා ආදියෙහි කෙළවරට පැමිණි පුරණ ලද සමවත් ඇති යන අර්ථයයි. **පෙතිකෙ ගොචරෙරතා**

යනු බුදුරදුන් විසින් අනුදක්නා ලද, අනුමත කරන ලද, ලබන ලද ආහාරයෙහි ඇලුණු යන අර්ථයයි. **අනනලිකබචරා** යනු අහසින් යන්නා වූද, එන්නා වූද, යන අර්ථයයි. ධීරා යනු වීර සත්ත්වයෝ සිංහ ව්‍යාඝ්‍ර ආදි පිරිස් මැද තැති ගැනීම්වලින් තොර යන අර්ථයයි. මෙබඳු ආකාර වූ තාපසයෝ, **මා සදාකල්හි පිරිවරා සිටී** යන අර්ථයයි.

"සදොරෙහි සංවර වූ කෙළෙස් රහිත රකින ලද
ඉන්ද්‍රියයන් ඇති, නො ඇලුණු නොගැටුණු ඒ ප්‍රඥාවන්තයෝ
නරක මිතුරෝ ඉවත්කර මගේ යහපත් සිසුවෝ ගනිත්."

එහි චක්ඛු ආදි **ඡසු දවාරෙසු** රූප ආදි ආරම්මණවල **සංවුතා** වසන ලද, රකින ලද දොරටු ඇති යන අර්ථයයි. **අනෙජා** තෘෂ්ණා රහිත **රකඛිතින්ද්‍රියා** ආරක්ෂා කළ චක්ඛු ආදි ඉන්ද්‍රියයෝ **අසංසට්ඨා** ඤාති ආදි ගෘහස්ථ මිශ්‍ර නොවූ සත්ත්වයෝ යන අර්ථයයි. **දුරාසදා** නරක විපත් සලසා දීමට ගැටීමට නොහැකි වන්නා වූ අයෝග්‍ය යන අර්ථයයි.

"පලඟින් හිඳ සක්මන් කරන්නා වූ
ඔවුහු මුළු රාත්‍රියම නරක මිතුරෝ අතහැර
කල්ගත කරති."

මම සිසසා පල්ලංකෙන කලවා බද්ධ වූ ආසනයේ සයනය කිරීම හැර **නිසජ්ජායව යාතෙ චංකමණෙන** සියළු **රත්තිං** රාත්‍රිය විශේෂයෙන් **අතිනාමෙනති** ඉක්මවාලති යනු සම්බන්ධයි.

"කෙලෙස්වල නොරැඳෙත්. දෝෂකරණයේ දොස්
නොකරත්. මුළාවූයේ මුළා නොවෙත්. මගේ ශිෂ්‍යයෝ
නරක දේ අතහරිත්"

ඔවුහු මෙබඳු අර්ථ ඇත්තෝය. **මම සිසසා** තාපසයෝ **රජනියෙ** රැඳිය යුතු වස්තුවේ නොරැඳෙත්. රාගය උපදවා නොගනිත්. **දොසනියෙ** ද්වේෂ සහගත ක්‍රියාවේ දෝෂය උපදවාගත යුතු වස්තුවේ න දුසසරෙ ද්වේෂය නොකරත්. **මොහනියෙ** මුළා කිරීමට සුදුසු වස්තුවේ න මුයහනති මෝහය නොකරත්. ප්‍රඥා සම්පන්නව කටයුතු කරත් යන අර්ථයයි.

"ඔවුහු සදාකාලිකවම සෘද්ධි විෂය විමසමින්
පවතිත් රාගයේ නොඇලෙත් ඔවුහු පෘථිවිය
කම්පා කරවත්"

තෙ මගේ ශිෂ්‍යයෝ එකෙක්වී බොහෝ වෙති. බොහෝ වී එකකු වෙයි ආදී සෘද්ධි ප්‍රාතිහාර්ය කිරීමයි. **නිච්චකාලිකං විමංසමානා චත්තනති** යන සම්බන්ධයි. ඔවුහු මගේ ශිෂ්‍යයෝ අහසේද, ජලයේද, පොළවේ මවා ඉරියව් වෙනස් කරති යන අර්ථයයි. **සාරම්භෙන** පිළිකුල් සහගත කලහ කිරීම් ආදියෙන් නොඇලෙන සුළු යන අර්ථයයි.

"සෙල්ලම් කරනු කැමැති ඒ ශිෂ්‍යයෝ ධ්‍යාන **ක්‍රීඩාවේ**
නිරතවෙත්. ඉතා ඈතට ගිය මගේ ශිෂ්‍යයෝ
ජම්බුගසින් දඹ ඵල රැගෙන එත්."

තෙ මගේ **ශිෂ්‍යයෝ** ඉදින් **කීලමනා** ප්‍රථමධ්‍යාන ආදි ධ්‍යාන **ක්‍රීඩාවේ** ක්‍රීඩා කරති. රමණය කරති. ලොල් වෙති යන අර්ථයයි. **ජම්බුතො** ඵලමානෙනති යනු හිමාලයේ සියක් යොදුන් උස ජම්බුගසින් ගැටෙන්නා වූ වැටෙන්නා වූ දඹගෙඩි සෘද්ධියෙන් ගොස් රැගෙන එත් යන අර්ථයයි.

"ඇතැමෙක් අපර ගෝයානයට යති. ඇතැමෙක්
පූර්ව විදේහයට යති. ඇතැමෙක් උතුරුකුරු දිවයිනටද
පර්යේෂණය පිණිස යති."

ඒ මගේ ශිෂ්‍යයන් අතර අඤ්ඤෙ ඇතැමෙක් **ගොයානං** අපරගෝයාන දිවයිනටද යති. ඇතැමෙක් **පූර්ව විදේහක** දිවයිනට යති. ඇතැමෙක් **උතුරුකුරු** දිවයිනට යති. ඔවුහු **දුරාසදා** මේ ස්ථානවල **එසනාය** ගවේෂණය පිණිස ප්‍රත්‍යය සොයනු පිණිස යති යන සම්බන්ධයි.

"පෙරටුව කැඳ යවති. පසුව ඔවුහු ගමන් කරති.
විසිහතර දහසකින් අහස වැසී තිබෙනුයේ වෙයි"

ඒ මගේ ශිෂ්‍යයෝ අහසින් යනු ලබන්නේ ලුණුඇඹුල් පිරිකර බර පොරි **පුරතො පෙසෙනති** පළමුව ඉදිරියෙන් එය යවා තෙමේ ඔහුට පසුපසින් යති යන අර්ථයයි. මෙසේ යන්නා වූ **චර විසිහතර දහසක්**

තාපසයන් විසින් **අම්බරං** ආකාශතලය **ඡාදිතං** වසාගෙන සිටින්නේ **හොති** යනු සම්බන්ධයයි.

"ගින්නෙන් පිසන්නා වූද, ගිනිරහිතව දත්වලින්
පිස අනුභව කරන්නා වූද ගල්වලින් කොටන ලදුව
ඇතැම් බිමට වැටුණු ඵලද භෝජනය පිණිස ගනිත්."

එහි **කෙචි** ඇතැම් මගේ ශිෂ්‍යයෝ **අග්ගිපාකී** ගෙඩි කුඩා ගෙඩි කොළ ආදිය පිස අනුභව කරති. ඇතැමෙක් **අනග්ගි** නොපිස අමුවෙන්ම කති. ඇතැමෙක් දන්නෙහි සම උපුටුවා (ගලවා) කති. ඇතැමෙක් **උදුක්ඛලින** මෝල්ගසෙන් කොටා කති. ඇතැමෙක් **අසෙමන කොට්ටිතං** ගලෙන් කොටා කති. ඇතැමෙක් තමා වෙත වැටුණු කොළ ගෙඩි ආහාරයට ගනී යනු සම්බන්ධයි.

"කිසිවෙක් උදේ සවස ජලය වැඩීම කරයිද
මගේ ශිෂ්‍යයෝ ජලය වැඩීමේ අභිෂේකයේ ඇත
කාලයේ සිට නිරත වී සිටිති."

ඉතා ඈත කාලයේ පටන් මගේ ශිෂ්‍යයෝ පිරිසිදු බව කැමැත්තේ උදේ සවස ජලය වැඩීම කරයි යන අර්ථයයි. කිසිවකු **නොයාහිසෙක චරණා** ජලයෙන් තමන් අභිසිංචනය කරයි යන අර්ථයයි.

"ඉතා හොඳින් වැඩුණු නිය හා ලොම් ඇත්තේ මැනවින්
යුතු දත් පෙළ ඇති සිල් සුවඳින් සුවඳවත්
මගේ ශිෂ්‍යයෝ ඉතා බැරෑරුම් දේ කරන්නේය."

එහිදී ඔවුහු දුරාසදා මම සිස්සා කිසිලිවල, කිසිලි දෙකේම දෙපස අත්පාවල හටගත් දිග නිය හා ලොම් ඇත්තේ යන අර්ථයයි. දැළිපිහිය පාවිච්චි නොසරසන ලද යන අදහසයි. **පංක දනතා** යනු ඉටි සුණු කිරි ගල් කැබලි ආදි සුදු නොකිරීමෙන් කහට බැඳුනු දත් ඇති යන අර්ථයයි. **රජසිරා** යනු තෙල් ගා වැඩීමාදිය නොකළ බැවින් දූවිලිවලින් වැසුණු හිස් ඇති යන අර්ථයයි. **ගතධිතා සීලගන්ධන ධ්‍යාන සමාධි සමාපත්තිවලින් යුක්ත සීලයෙන් යුක්ත බැවින් ලෞකික සීල සුගන්ධයෙන් සියළු තැන සුවඳවත් වූ** යන අර්ථයයි. **මම සිස්සා දුරාසදා** මේ ආදි

කියන ලද අයුරින් ගුණාදියෙන් සමන්විත වූ නො ඇලීමට ගැටීමට නොහැකිවන්නේ මගේ ශිෂ්‍යයෝ යනු සම්බන්ධයයි.

පාතොව **සනතිපතිත්වා** යනු සියළු තැන ප්‍රත්‍යය පහළවූ උදේ ආහාරය පටන් මා සමීපයේ රැස්වූයේ යන අර්ථයයි. **උගතපනා** ප්‍රකට වූ තපස් ඇති ප්‍රාර්ථනා කළ තපස් චර්යා ඇති. **ජටිලා** ජටා දරන්නා වූ තාපසයෝ. **ලාභාලාභං පකිතෙතත්වා** මැද කුඩා වූද මහත් වූද ලාභ අලාභ ප්‍රකටකොට, **තදා** ඒ කාලයේ **අම්බරෙ** අහස්තලයේ **ගච්ඡනති** යති යන සම්බන්ධයයි.

නැවත ඔවුන්ගේම ගුණයන් ප්‍රකාශ කරන්නේ "එතෙසං පක්කමන්තානං" ආදිය කිවේය.

එහි අහසේ හෝ ගොඩබිම හෝ **පක්කමනතානං** යන්නවුන්ගේ **එතෙසං** තාපසයන්ගේ වැහැරි සිවුරෙන් ජනිත වූ. **මහා සද්දෝ පවත්තති** ශබ්ද පවත්නේ යන අර්ථයයි. **මුදිතා හොන්ති දෙවතා** යනු මෙසේ මහා ශබ්ද පවත්වා යන්නා වූ. **අජිනචම්ම සඳ්දෙන** අඳුන් දිවිසම හඬින් සතුටු වූවෝ යහපති! යහපති! ආර්යනි යයි, සොම්නසට පැමිණියේ දේවතාවෝ මූලිකව සතුටු වෙත් යන සම්බන්ධයයි.

නැවත ඔවුන්ගේම ගුණයන් ප්‍රකාශ කරන්නේ "එතෙසං පක්කමන්තානං" ආදිය කිවේය.

එහි අහසේ හෝ ගොඩබිම හෝ **පක්කමනතානං** යන්නවුන්ගේ **එතෙසං** තාපසයන්ගේ වැහැරි සිවුරු හඳුනාගන්නා වූ **මහා සද්දෝ පවත්තති** ශබ්ද පවත්නේ යන අර්ථයයි. **මුදිතා හොන්ති දෙවතා** යනු මෙසේ මහා ශබ්ද පවත්වා යන්නා වූ. **අජින චම්ම සඳ්දෙන** සතුටු වූවෝ යහපති! යහපති! ආර්යනි යයි, සොම්නසට පැමිණියේ දේවතාවෝ මුදිතව සතුටු වෙත් යන සම්බන්ධයයි.

දිසෝ දිසනති ඒ ඍෂිවරු අනතලිකඛචරා ආකාශචාරී වූ, දක්ෂිණ දිශාවලට **පක්කමනති** යති යනු සම්බන්ධයයි. **සකඛ ලෙනුපත්ථද්ධා** යනු තමන්ගේ ශරීර බලයෙන් හෝ ධ්‍යාන බලයෙන් හෝ සමන්විත වූවෝ **යදිච්ඡකං** යම් යම් තැන යනු කැමැත්තේ, ඒ ඒ තැන **ගච්ඡනති** යනු සම්බන්ධයයි.

නැවත ඔවුන්ගේ ආනුභාවය ප්‍රකාශ කරමින් **"පඨවි කම්පකා එතෙ"** යන ආදිය කීවේය.

එකල **එතෙ** සියළු තැන කැලැති පරිදි හැසිරෙන පොළොව කම්පා කරවන, පොළොව චංචල කරවන පිරුණු තේජස් ඇති, **දුප්පසහා** බොහෝ කොට අභිබවා යාමට නොහැකි වන්නේය යනුවෙන් **දුප්පසහා** නම් වේ. **සාගරොව අබොභියා** යනු වෙනස් කැලඹීම්වලින් නොසෙල්වුනා වූ සාගරය මෙන් සමුද්‍රය මෙන් වෙනත් කැලඹීම්වලින් කම්පා කිරීමට නොහැකි වන්නාහු වෙත් යනු සම්බන්ධයයි.

ඣානචංකමිනෝ කෙචි යනු ඒ මගේ සිසුන් අතර ඇතැම් ඍෂිවරු ඣාන (ස්ථාන) සක්මන් ඉරියව් සම්පන්න වේ. ඇතැම් ඍෂිවරු නෙසජ්ජිකා පැතිරුණු ඉරියව්වලින් යුක්ත ඇතැම් ඍෂිවරු **පවත්තඵලොජනා** තමන් වෙත පැමිණි කොල ආහාරකොට ඇත්තේ, මෙබඳු ආකාර ගුණයෙන් යුක්ත බැවින් **දුරාසදා** යන සම්බන්ධයයි.

ඒ සියල්ලෝ ස්තුති පුද කරන්නේ **මෙත්තාවිහාරික** ආදිය කීවේය.

එහි අප්‍රමාණ සක්වලවල අප්‍රමාණ සත්ත්වයෝ සුවපත් වෙත්වා'යි ආදි වශයෙන් සෙනෙහබර ලක්ෂණයෙන් මෛත්‍රිය පතුරුවා වාසය කරති. ආත්මභාවය පවත්වාගනිත් යනුයි. **මෙත්තා විහාරිකා** නම් වේ. එතෙ මගෙ ශිෂ්‍යයෝ යනු සම්බන්ධ අර්ථයයි. ඒ සියළු ඍෂිවරු **සබ්බපාණිනං** සියළු සත්ත්වයන්ට **හිතෙසී** හිතසැප ගවේෂණය කරන. **අනනුකකංසකා** තමන් උසස්කොට නොසළකා අවමන් නොකර **කසසචි** කිසියම් පුද්ගලයකු **න වමෙහනති** පහත්කොට නොසිතයි යනු අර්ථයයි.

ඒ මගේ ශිෂ්‍යයෝ සීල සමාධි සමාපත්ති ගුණයෙන් යුක්ත බැවින් **සිංහරාජයා** මෙන් **අසමහිතා** නිර්භයව **ගජරාජා ඉව** හස්තිරාජයා රාමවා ශරීර බලයෙන්ද ධ්‍යාන බලයෙන් සමන්විත වූවෝ. **වසභරාජා ඉව දුරාසදා** ගැටීමට නොහැකි වන්නේය. මා **සමීපයට** පැමිණෙන්නේය යන සම්බන්ධයයි. ඉක්බිති තමන්ගේ ආනුභාවය ඉදිරිපත් කිරීම මාත්‍රය ප්‍රකාශ කරන්නේ. **විජ්ජාධරා** යන ආදිය කීවේය.

එහි **මන්ත්‍ර** සජ්ඣායනා කරන, විද්‍යාධරයෝ ද, ගස් පර්වතවල වාසය කරන්නා වූ පොළෝතලවාසී **දේවතාවෝ ද** භූමියේ හා ගොඩබිමේ

වසන නාගයෝ ද, ගාන්ධර්වයෝ ද, දෙවියෝ ද, නපුරු රාක්ෂසයෝ ද, කුම්භාණ්ඩ දෙවියෝ ද, අසුර දේවතාවෝ ද, කැමැති කැමැති දේ පතනසුළු වූයේ ගුරුළෝ ද ඒ විල ඇසුරුකොට ජීවත්වෙති යන සම්බන්ධයයි. ඒ විලෙහි විල සමීපයේ වාසය කරත් යන අර්ථයයි.

තවද තමන්ගේම ශිෂ්‍ය තාපසයන්ගේ ගුණ වර්ණනා කරමින්. **තෙ ජටා බාරිභාරං** යන ආදිය ප්‍රකාශ කළේය.

ඒ සියල්ල ඉහත කියන ලද පරිච්ඡේදයෙහි **බාරිභාරං** යනු ජලය ගැනීමට ගන්නා කුඩා භාජනයක් ආදි තාපස පිරිකර බරයි.

යළිත් තමන්ගේ ගුණ ප්‍රකාශ කරමින් **උපපාතෙ සුපිනෙචාපි** යන ආදිය කීවේය. එහි බ්‍රාහ්මණ ශිල්පයේ නිපුණත්වයට ගිය බැවින් නැකැත් ශාස්ත්‍රයේද කෙළ පැමිණි 'මේ රාජ කුමාරවරු උපන්නා වූ නැකැත සුභය යහපත්ද අයහපත්ද උපන්නා වූ ලකුණුද, සිහිනයේ ප්‍රවෘත්තිද විචාරණ ලදුව, මේ සිහිනය යහපත්ය. මෙය අයහපත්ය. සිහිනය හටගැනීමේ කථාවද, සියළුම ස්ත්‍රී පුරුෂයෝ අත්පා ලක්ෂණ කීවේද? මැනවින් හික්මවන ලද්දේ සියළු දඹදිව පවත්නා වූයේ මන්ත්‍ර පද ද, ලක්ෂණ මන්ත්‍ර කොට්ඨාස ද, සියල්ල මම එකල මගේ තාපස කාලයේ දරමි යන සම්බන්ධයයි.

තමන්ගේ විස්තරය බුදුගුණ පෙරටුකොට ප්‍රකාශ කරන්නේ "අනෝම දස්සි" ආදිය කීවේය.

එහි ළාමක බව නැති නිසා - අනෝම නම් වේ. අනෝමය, මංසචක්ඛු, දිවැස්, සමන්තචක්ඛු, ධම්මචක්ඛු, බුද්ධචක්ඛු ආදි වශයෙන් සියලු සත්ත්වයන්ගේ බැලීමද දැකීමද යම් භගවත්හු හට වේද, හෙතම භගවා නම් වේ. **අනෝමදස්සි** භාග්‍යවන්ත කරුණුවලින් යුක්ත නිසා **භගවා** නම් වේ. ලෝවැසියාට ජ්‍යෙෂ්ඨ බැවින්ද, ශ්‍රේෂ්ඨ බැවින්ද **ලෝකජෙට්ඨ** නම් වේ. උසහ, නිසහ, ආසහ යනුවෙන් ගවයන්ගේ ජ්‍යෙෂ්ඨයන්ගේ තිදෙනෙකි. එහි ගවයන් සිය දෙනෙකුගෙන් ජ්‍යෙෂ්ඨයා උසහ නම් වේ. ගවයන් දහසකින් ජ්‍යෙෂ්ඨයා නිසහ නම්. ගවයන් ලක්ෂයකින් ජ්‍යෙෂ්ඨයා ආසහ නම් වේ. මිනිසුන්ගේ ශ්‍රේෂ්ඨ ජ්‍යෙෂ්ඨ, ප්‍රතිවේධ කළ සියළු ධර්මයන් ඇති බැවින් සම්බුද්ධ නම් වේ. **විවෙක**

කාමෝ හුදකලා බව කැමැති වන්නේ. **හිමවනතං** හිමාලය පර්වතයට **උපාගමි** යනු සම්බන්ධයයි. **අජ්ඣොගහෙත්වා හිමවනතං** යනු හිමාලය සමීපයට පැමිණ, පිවිසලා යන අර්ථයයි. සෙස්ස උඩ සඳහන් පරිද්දෙනි.

ජලිතං දිළිසෙන. **ඉන්දීවර** නිල් මානෙල් මල් මෙන්. **හුතාසනං** යාග හෝමාදියේ ආසක්ත වූ **ආදිත්තං** දිළිසෙන ගින්නක් මෙන්. **ගගනෙ** අහසේ බබළන්නා වූ **විජ්ජු** විදුලිය මෙන් මැනවින් පිපුණු සල්ගස මෙන් හුන්නා වූ **ලොකනායකං** අද්දස යන සම්බන්ධයයි.

දෙවියන්ට දෙවි වූයේ දේවදේව නම් වේ. ඒ දෙව දෙවානං **දිස්වා තස්ස ලක්ඛණං** දෙතිස්මහා පුරුෂ ලක්ෂණවලින් සමන්විත වූ ශරීරයක් ඇත්තේ බුදුරදුන්ට ස්තුති පුද කරන්නා වූ තාපසයා **තුවං සත්ථං** යන ආදිය කීවේය. එහි ස්වාමීනි, **සබ්බඤ්ඤු** ඔබවහන්සේ දෙවියන් සහිත ලෝකයාට ආචාර්යවරයාය. ශාස්තෘවරයාය. උත්තම අර්ථයෙන්ම ඔබම, **කෙතු** උස්ය. මුළුලොව ප්‍රකාශ කරන්නා වූ ඔබම ධජෝ. ලෝකතුයේ ඉගෙන ගත් බැවින් ඔබම යුපෝ ඔසවා තබන ලද ඉරියව් අඳින්න. සියළු සත්වවූ ප්‍රාණීන්ට ඔබම **පරායණෙ** උතුම් පිහිට වේ. ඔබම **පතියෝ** පිහිටි යුතු ලෝකයේ මෝහාන්ධකාරය දුරුකරන ඔබම පහනක් මෙන්සිව්පා ඇත්තේ **දිපදුත්තමං** සිව්පා සතුන් අතර දීපයන්ට උත්තම වූ.

නැවත භාග්‍යවතුන් වහන්සේටම ස්තුති කරමින් **සක්කා සමුද්දෙ උදකං** යන ආදිය කීවේය.

එහි අසූහාර දහසක් යොදුන් ගැඹුරු මුහුදේ ජලය ප්‍රමාණය මැනීමට හැකිවන්නේ යයි, ස්වාමීනි සර්වඥයන් වහන්ස; ඔබවහන්සේගේ ඤාණ **සම්භාරය** මෙපමණ ප්‍රමාණයක්දැයි **ප්‍රමාණය** මැනීමට නොහැකිවන්නේ යන අර්ථයයි.

තුල මණ්ඩලෙ තරාදියක තබා පොළොව දැරීමට හැකිද? ස්වාමීනි; සර්වඥයන් වහන්ස, ඔබගේ ඤාණය දැරීමට නොහැකි වේමය යන සම්බන්ධයයි.

ස්වාමීනි; සර්වඥයන් වහන්ස, ආකාශ මුළු අහස්තලය රැහැනකින් හෝ අඟුලකින් හෝ මැනීමට හැකි වන්නේය. ඔබගේ ඤාණය එසේ ප්‍රමාණ කිරීමට නොහැකි වෙයි යන අර්ථයි.

මහා සමුද්දෙ උදකං යනු අසූහාර දහසක් යොදුන් ගැඹුරු ඇති. අබ්බං උදකංච යොදුන් අනූහතර ලක්ෂයක් බහුල වූ. **අබ්බං පයවිංච ජහෙ** සියළු පොළොව අතහැර සම කරන්නේය. **උපමාතො** උපමා වශයෙන් **න යුජ්ජරෙ** නොයොදන්නේය. ඤාණයම වඩාත් ශ්‍රේෂ්ඨ වේ යන අර්ථයයි. **චක්ඛුම පස්** ඇස්වලින් යුක්ත නිසා චක්ඛුමන්ත වේ. එය ආමන්ත්‍රණ අර්ථයයි. දෙවියන් සහිතව පවත්නා ලෝකයයි. භූමි අර්ථයෙහි ස්වාමි වචනයයි. දෙවියන් සහිත ලෝකය ඇතුළත් වේ. **යෙසං** යම් පමණ සත්ත්වයන්ගේ **චිත්තං පවත්තති** මේ සිත් ඇති සත්ත්වයෝ **තව ඤාණම්හි** අනෙකා **ඤාලගතා** ඤාණ ජාලයෙහි ඇතුළට පිවිසියේ යන සම්බන්ධයයි. ඤාණ ජාලයෙන් සියළු සත්ත්වයන් දකියි යන අර්ථයයි.

ස්වාමිනි, සබ්බඤ්ඤූ සියළු ධර්ම දන්නා තැනැත්ත; ඔබ **යෙන** ඤාණෙන සතරමග සම්ප්‍රයුක්ත සියළු **උත්තම** බොධිං නිවන, **පත්තො** අධිගම කළේය මඳදසි යනු ඒ නුවණින් **පරතිත්ථියෙ** අන්‍ය තීර්ථකයන් මර්ධනය කරහි, අභිබවා යන්නෙහිය යන සම්බන්ධයයි.

ඒ තාපසයා විසින් ස්තුති ආකාරයෙන් ප්‍රකාශ කරන්නා වූ ධර්ම සංග්‍රහකාරක තෙරවරු මේ ගාථා ස්තුතිකොට කිවාහුය.

එහි **ඉමාගාථා** යනු මෙපමණ කියන ලද මේ ගාථාවන්. **ථවිත්වාන** ස්තුතිකොට නමින් සුරුචි නම් තාපසයා සෙසු අටුවා කථාවල **සරද** මානවකයා යයි සඳහන් වේ. අටුවාවේ ආ පාඨයම ප්‍රමාණ වේ. නැතහොත් සුන්දර වූ රුචි අධ්‍යාශය වශයෙන් නිර්වාණයට ආලය කරන නිසා ඔහුට සුරුචි යයි කියනු ලැබේ. ඉන්ද්‍රිය දමනය පිණිස සංවරව ගමන් කරයි. පවතියි යනුවෙන් **සරද** නම් වේ මේ අර්ථ දෙකම ගතයුතුය.

පමෙතවෙ ප්‍රමාණ කිරීමට නොහැකි වෙයි යන සම්බන්ධයයි. **සුබුමවඡිකෙන** සියුම් වූ සිදුරකින් **ජාලෙන** යම් මහා සමුද්‍රය **උදකං පරිකඛිපෙ** හාත්පස වටකොට පවත්නේය. මෙසේ වටකොට ඇතිකල්හි **යෙ කෙචි** ප්‍රාණීහු **උදකෙ** ජලයෙ සියල්ලෝ උපන්නෝය. **අනෙකා ජාලගතා සියුං** වන්නේ යන අර්ථයි.

එය උපමාවකින් දක්වන්නෙමි. **තථෙවහි** යන ආදිය කීවේය. එහි යම්සේ ජලයේ උන් ප්‍රාණීහු ජලය ඇතුළත ගියේ වෙත්. **තථෙව මහාවීර**

මහාබෝධි ඥානය පිණිස වීර්ය වඩන්නනි. **යෙ කෙචි පුථු** නොයෙක් **තිත්ථියා** මිථ්‍යාදෘෂ්ටිගත තීර්ථකයෝ **දිට්ඨිගහන පකඛනනා** දෘෂ්ටිවලට බැසගත්තේ පවිටුවූවෝ **පරාමාසෙන** ස්වභාවයෙන්ම අනුන්ගේ දෘෂ්ටිවල එල්බගත්තේ **මොහිතා** වසා දමා සිටිත්. **තව සුදෙධන නික්ලේශ** වශයෙන් **ඤාණෙන අනාවරණ** දැකීමෙන් සියළු ධර්මයන්ගේ ආවරණ රහිත දර්ශනයෙන් හා සීලයෙන් යුතු **එතෙ** සියළු තීර්ථකයෝ **අනෙතා ජාලගතා** ඤාණ ජාලයෙන් අන්තයට ප්‍රවේශ වූවෝ. එසේම යන සම්බන්ධයි. **ඤාණං තෙ නාතිවත්තරෙ** යනු ඔබගේ ඤාණය ඒ තීර්ථකයෝ නොහික්මවති යන අර්ථයයි. මෙසේ ප්‍රකාශ කරන ලද්ද අවසානයේ බුදුරදුන්ට තමන්ගේ විවරණය ඉදිරිපත් කිරීමට **භගවා තමහි සමයෙ** යන ආදිය කීවේය. එහි යම්කලෙක තාපසයා බුදුරදුන්ට තුති ළ කළේද? ඒ ස්තුතිය පිණිස සොයන කාලයේ සංඛ්‍යාව ඉක්මවූ පිරිවර සේනාව **ජිනො සමාධිමහා** අර්පිත සමාධියේ වුටඨ **හිත්වා** නැගී සිට සියළු දඹදිව දිවැසින් බැලුවේය යන සම්බන්ධයයි.

ඒ **අනොමදස්සිස්ස** අනෝමදස්සි නම් බුදුරදුන්ට **මුනිනො** මෞන සංඛ්‍යාත ඤාණයෙන් සමන්විත වූයේ, **නිසභො නාම සාවකො සන්ත චිත්තෙහි** සංසිඳවන ලද කෙලෙස් මනසින් යුතුව **තාදිහි** ඉටු අනිටු දේ කෙරෙහි කම්පා නොවන ස්වභාවයෙන් යුක්ත බැවින්, **බිණාසවෙහි සුදෙධහි පිරිසිදු** කාය කර්ම ආදියෙන් යුක්ත බැවින්, **ජලහිඤ්ඤාහි තාදිහි** අෂ්ටලෝක ධර්මයෙන් කම්පා නොවන ස්වභාවයෙන් යුක්ත වූයේ **සත සහසෙසහි පරිවුතො බුද්ධස්ස චින්තං අඤ්ඤාය** දැන **ලොකනායකං උපෙසි** එකෙණෙහි සමීපයට පැමිණියේය යන සම්බන්ධයයි. ඔවුහු එසේ ආවා වූ සමානය. **තත්‍ථ** බුදුරදුන් සමීපයේ **අන්තලික්ඛෙ** ආකාශයේ **ඨිතා** බුදුරදුන් **පදක්ඛිණ** කළහ. **තෙ** සියල්ලෝ **පඤ්ජලිකා** නමස්කාර කරමින් අහසින් බුදුන් සමීපයට **ඔතරුං** බැසගත්හ යන සම්බන්ධයයි.

නැවත විවරණ දීම් වශයෙන් පූර්වභාග කරණය ප්‍රකාශ කරමින් **සිතං පාතුකරි** යන ආදිය ප්‍රකාශ කළේය. ඒ සියල්ල ඉහත සඳහන් පරිදි වේ.

යො මං පුපෙඵන යනු යම් තාපසයකු මා කෙරෙහි සිත් පහදවා, නොයෙක් මල්වලින් මා පූජා කළේය. **ඤාණඤ්ච** මගේ දැනුම අනු නැවත නැවත **ථවි** ස්තුති කෙළේය. **තමහං** යනු යම් තාපසයකු වූ මම

කිත්තයිස්සාමි ප්‍රකට කරන්නෙමි. **මම භාසතො** කියන්නා වූ මගේ වචන සුණාථ ශ්‍රවණයට ගනිවු! මෙනෙහි කරවු! **පච්ඡිමෙභව සම්පත්තෙ** යනු ව්‍යාකරණ දෙනු ලබන්නේ බුදුරදුන් මෙසේ වදාළ සේක. එහි පසුව අවසාන කාලයේ භව සම්පත්තියක් ඇතිකල්හි **මනුස්සත්තං** මනුෂ්‍ය ජාතිය **ගමිස්සති** මිනිස්ලොව උපදින්නේය යන අර්ථයයි. රූප, ධන, වයස, කුල, කේසර පින් යන සාරවලින් සාරවත් වූයේ යන අර්ථයයි. **සාරිනාම බ්‍රාහ්මණී කුච්ඡිනා ධාරයිස්සති** යනුවෙන් ව්‍යාකරණ මූලය ආරම්භ කරයි. **අපපමෙය්‍ය ඉතො කප්පෙ** යනු මෙහි අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනා අතර එකකු අසංඛ්‍යෙය්‍ය කල්ප ලක්ෂයක් පාරමී පිරිය යුතුය. එසේම ගාථා බන්ධනය සැප පිණිස අතුරු අර්ථය ප්‍රකාශ කිරීම පිණිස මෙසේ කියන ලද්දේ යයි දතයුතුය. **සාරිපුත්තොති නා මෙන හෙස්සති අග්ගසාවකා** යනුවෙන් විවරණ දුන් සේක. ව්‍යාකරණ දී එයට **ස්තුති** කරමින් ඒ බුදුරදුන් **අයං භාගිරම්** යන ආදිය කී සේක. ගංගා, යමුනා, සරභූ, මහී, අචිරවති යන පංචමහා ගංගාවන් අතර මේ භාගිරම් නම් පළමු මහා ගංගාව වේ. **හිමවන්තපභාවිකා** හිමාලයේ සිට පැමිණියා වූ අනෝතප්ත විලෙන් මුල්කොට ඇති මහොදධිං මහා ජලස්ඛන්ධය **අපපයන්ති** පැමිණෙත්. **මහාසමුද්දං** මහා සාගරය **අපෙපති**. වෙත පැමිණෙන අයුරිනි. **තථාචව අයං සාරිපුත්තෙනා සකෙ තීසු විසාරදො** තමන්ගේ කුලයෙහි පවතින්නා වූ ත්‍රිවේදයේ පරතෙරට ගිය, **පඤ්ඤාය** අපිරිසිදු නොවූ ඤාණයෙන්, පැතිරුණු ගැඹුරු දැනුමෙන් **පාරම්ං ගන්තවා** තමන්ගේ ශ්‍රාවක ඥානයේ කෙළවරට ගොස් **පාණිනො** සියළු සත්ත්වයන් **තපයිස්සති** සන්තර්පණය කරන්නේය. ඉතා හිතවත් බව කරන්නේය යන අර්ථයයි.

හිමවන්තං උපාදාය යනු හිමාලය පර්වතය මුල්කොට ඇති. මහොදධිං මහා සමුද්‍රයේ ජලභාරය ඇති සාගරය කෙළවරකොට ඇති **එත්තන්තරෙ** මේ පර්වතය හා සාගරය යන දෙක අතර මැද, **යං පුලිනං** යම් පමණ වැලි රාශියක් ඇත්තේද? **ගණනානො අසංඛ්‍යා** එය සංඛ්‍යාව ඉක්මවන්නේය. **තම්පි සකකා අසෙසෙන** යනු ඒ වැල්ලද නිරවශේෂ වන්නේය. **සංඛාතුං** හැකිවන්නේය. එය **ගණනා යථා ගණන්** කළහැකි වේ යනු සම්බන්ධයි. එසේම **සාරිපුත්තසස පඤ්ඤාය අනෙතා සැරියුත්** තෙරුන්ගේ ඤාණය කෙළවරකට පත් නොවන්නේය යන අර්ථයයි. **ලකෙඛ - භවිස්සති ලකෙඛ** ඤාණ ලක්ෂණයෙහි ද, ඤාණයේ එක කොටසක් ද, **ඨපියමානම්හි** තැබූ කල්හි **ගංගාය වාලුකා බිංයෙ** පිරිගිමට ඉවරවීමට යන්නේය යන අර්ථයයි. **මහා සමුද්දෙ** අසූහාර දහසක් යොදුන්

ගැඹුරු ඇති සිවුමහා සාගරයයි. **උම්මියො** ගවුවක් පමණ ප්‍රභේදගත මුහුදු රැලි ඇති. **ගණනාතො අසංඛ්‍යා** සංඛ්‍යාව ගණන විරහිත වෙති. **එසේම සාරිපුත්ත** තෙරුන්ගේ **ප්‍රඥාවේ කෙළවරක් න හෙසසති** නොවන්නේය යන අරුතයි.

ඒ හෙතම මෙසේ ප්‍රඥාවන්ත සාරිපුත්ත තෙරුන් ගෞතම ගෝත්‍රයට අයත් බැවින් ගොතම නම් වේ. ශාක්‍ය කුලයේ ජ්‍යෙෂ්ඨයා බැවින් **සම්බුද්ධ සක්‍යපුංගවං ආරාධයිත්වා** වත්පිළිවෙත්වලින් සීලාදි ආචාර ධර්මවලින් සිත් සතුටුකරවා **පඤ්ඤාය** ශ්‍රාවක ඥානියෝ **පාරමිං** කෙළවරට **ගනත්වා** ගොස් ඒ බුදුරදුන්ගේ අග්‍රශ්‍රාවක වන්නේය යන සම්බන්ධයි.

හෙතම මෙසේ අග්‍රශ්‍රාවක තනතුරට පැමිණියේ **සක්‍යපුත්තෙන** බුදුරදුන් විසින් ඉෂ්ට අනිෂ්ට ස්වභාවයෙන් කම්පා නොවන්නේ **පවත්තිතං** ප්‍රකට කරන ලදි. **ධම්මචක්කං** සද්ධර්මය **අනුවත්තෙතසසති** විනාශනොවී දරන්නේය. **ධම්මවුට්ඨියො** ධර්මදේශනා සංඛ්‍යාත වර්ෂාව **වසෙසතෙතා** දේශනා කරන්නේ, ප්‍රකාශ කරන්නේ, විවරණය කරන්නේ, බෙදා දක්වන්නේ අර්ථ විභාග දක්වන්නේ, පවත්නේය යන අර්ථයයි.

ගොතමො සක්‍ය පුංගවො භාග්‍යවතුන් වහන්සේ **එතං සබ්බං අභිඤ්ඤාය** විශේෂ ඥාණයෙන් දැන **භික්ඛු සංසෙ** ආර්ය පුද්ගලයන් මැද **නිසිදිත්වා අගඨඨානෙ** සියළු ප්‍රඥාදි ගුණ ගණයෙන් පැතිරී උච්ච ස්ථානයේ සිටින්නේ **ඨපෙසසතිති** තබන්නේය යනු සම්බන්ධයි.

මෙසේ උන්වහන්සේ ලද ව්‍යාකරණ ඇත්තේ සොම්නසට පැමිණ ප්‍රීති සොම්නස් වශයෙන් උදානය ප්‍රකාශ කරමින් අහො මෙ **සුකතං කම්මං** යනාදිය කීවේය. එහි **අහො** යනු විශ්මයාර්ථයේ නිපාතපදයකි. **අනොමදසසිසස** බුදුරදුන්ගේ **සත්ථුනො** ශාස්තෘන්ගේ **සුකතං** මැනවින් කරන ලද්ද අදහා, කරන ලද කර්මය පින් කොටස, අහෝ විශ්මයකි. නොසිතිය හැක්කකැයි යන අර්ථයයි. ඒ බුදුරදුන්ගේ අහංකාරං පින් රාශියකොට **සබ්බඤ්ඤු** සියලු ගුණ සමූහය කෙළවරට පැමිණියේ ගතො පරම නිෂ්ඨාවට පැමිණියා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අහෝ පුදුමයකි යන සම්බන්ධයි.

අපරිමෙය්‍ය යනු සංඛ්‍යා ඉක්මවා ගිය කාලයෙහි කතං කරන ලද

කුසල කර්ම බව, ඉධ මේ පශ්චිම ආත්මභාවයේ **ඵලං** විපාක දැක්වීය. **සුමුත්තා** දක්ෂයා විසින් දුනු වේගයෙන් දමා ගැසුවේ, **සරවෙගො ඉව** අහං ඊතල වේගය මෙන් මම ඒ පුණ්‍ය ඵලයෙන් කෙලෙස් **ඛ්‍යාපයිං** දවාලූයෙමි යන අර්ථයයි.

තමන්ගේම ක්‍රියාව ප්‍රකාශ කරමින් අසංඛත ආදිය කීවේය. එහි **අසංඛතං** යනු සංඛ්‍යාව රහිත ආත්මභාවයට පැමිණ නොකරන ලද යන අර්ථයයි එය අසංඛත නම් වේ. **නිබ්බාණං** කෙලෙස් විනාශ කිරීමේ ස්වභාවයෙන්. **අමලං** පිහිටුවා වූ. **පදං ගවෙසනෙතා** නිවන්පදය සොයන්නේ. **සබ්බෙ තිත්ථියෙ** සියළු තීර්ථාකාරයන් දක්නා ලද පුද්ගලයන් විචිනං පරීක්ෂා කරන්නේ **තදාහං** එකල ඒ මම **භවෙ** කාමාදි භවයෙහි **සංසරිං** පරිභ්‍රමණය කළෙමි.

තමන්ගේ අදහස ප්‍රකාශ කරමින් **යථාපිබ්‍යාධිපොසො** යනාදිය කීවේය. එහි **බ්‍යාධිතො** යනු රෝගාදියෙන් පෙලුනා වූ **පොසො** මිනිසා. **ඔසධං පරියෙසෙය්‍ය** එසේ මම **අසංඛිත** වූ **නිර්වාණ පදය සොයමින්** අබ්බොච්ඡිනනං සසර පුරා සැරිසැරුයෙමි. **පඤ්චසතං** ජාති පන්සියයක් ආත්ම භාවවල **ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන්** පැවිදි වූයෙමි.

කුතිච්චං සඤ්චරිං අහං යනු ලාමක තීර්ථයන් කරා ගමන් කරන මම සැරිසැරුයෙමි. **සාරත්ථිකො පොසො** හරවත් දේ සොයන පුරුෂයා කදලිං දෙඩා ඵාලයෙ යනු කෙසෙල් කඳ ඉදින් දෙපරිදි පළන්නේ ද **න තත්‍ථ සාරං විඤ්ඤෙය්‍ය** යනු පළා එහි කෙසෙල් කදේ හරයක් නොලබන්නේය. **සො** මිනිසා **සාරෙන රිත්තකො තුච්ඡ** හිස් යන අරුතයි. එසේම, **ලොකෙ තිත්ථියා නානාතිර්ථකයෝ බුද්ධජනා අසංඛතෙන** නිර්වාණයෙන් **රිත්තා** හිස් යයි සැලකේ. **සෙ** යනු නිපාතපදයකි. පශ්චිම භවයෙහි සොයමින් සිටින්නේ බ්‍රහ්ම බන්ධු බ්‍රාහ්මණ කුලයේ උපන්නෙමි, **අහං-මම** වීමී යන අරුතය. **මහාභොගං ඡඩ්ඩයිත්වා** යනු මහත් භෝග ස්කන්ධයන් කෙළපිඬක් මෙන් ඉවත දමා, **අනගාරියං** කෑමි, වෙළඳ ආදී ක්‍රියාවලින් තොරවූ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන්. **පබ්බජිං** පිළිපන්නෙමි යන අර්ථයයි.

මෙසේ විසුද්ධජන විලාසිනි නම් අපදාන අට්ඨ කථාවේ
පළමු බණවර වර්ණනාව සමාප්තයි.

අඤ්ඤායකො -පෙ- මුනිං මොනෙ සමාහිතං මෝන යයි ඤාණයට කියනු ලැබේ. ඒ ඤාණයෙන් සමන්විත වූයේ මුනි නම් වේ. ඒ මුනි වෘත්තයෙහි මනා ලෙස යොදන ලද්දේ තබන ලද එකඟ වූ සිත් ඇත්තේ යන අර්ථයයි. ආගු සංඛ්‍යාත පාප නොකරන නිසා නාග නම් වේ. **අසඝි තෙරුන්** ඒ මහානාග නම් වේ. මැනවින් පිපුණු විකසිත වූ **පියුම යම්සේ** බබළන්නේ යන අර්ථයයි. **දිසවා මෙ පුඤ්ඤං අමතං පදං** යනු ඉහත අර්ථ ගන්වන ලදි.

වීථිනතරෙ යනු වීදි අතර **අනුපපත්තං** පැමිණි, එළඹි ඒ තෙරුන්. **උපගන්ත්වාන** සමීපයට ගොස් මම විචාළෙමි යන සම්බන්ධයයි. **කිදිසනෙත මහාවීරා** යනු සියළු ප්‍රඥාවන්ගෙන් සමන්විත පුරුෂය, ශාසනයේ රහතුන් අතර පළමුව ධම්මචක්‍රය පවත්වන අවස්ථාවේ රහත් ඵලයට පත් මහාවීරය, **අනුඡාත** පිරිවර බහුල වූ **මහායසතෙ** ඔබට බුදුරදුන් කෙබඳු ආකාරද? **සාසනං ධම්මං** දේශනා සංඛ්‍යාත ශාසනය සම්බන්ධ වේ. **භො** සොඳුරු මුහුණැත්ත, මෙ මට **සාධු** යහපත් **සාසනං කථයසසු** සසුන කියනු මැනවි යන අර්ථයයි.

හෙතම කථාකරන ආකාරය පෙන්වමින් 'සො මෙ පුට්ඨො ආදිය කීවේය.

එහි **සො** යනු **අසඝි තෙරුන් මෙ** මා විසින් **පුට්ඨො** ශාසනය කෙබඳු ආකාරයදැයි කියන ලද්දේ **සබබං සාසනං** අර්ථය ගැඹුරු බැවින්. **ගම්භීර** නම්. දේශනා ධර්යද, ප්‍රතිවේධ කළයුතු ධර්මයද, ගැඹුරු බැවින් ගම්භීර නම් වේ. පරමාර්ථ සත්‍යය බෙදා දක්වන බැවින්, **නිපුණං පදං නිර්වාණය - තණ්හා සල්ලසස හනතාරං** සියළු සසර දුක් විනාශ කරන නිසා. **අපනුදනං** ක්ෂය කරන ධර්මයකැයි සම්බන්ධ වේ.

ඔහු විසින් කියන ආකාර පෙන්වමින් 'යෙ ධම්මා' ආදිය කීවේය.

හෙතුපභවා හේතුවෙන්, කාරණයෙන් උපන්නා වූ හටගත්, මැනවින් හටගත්, උපන් බැවින් විශේෂයෙන් උපන් බැවින් **යෙ ධම්මා** යම් ප්‍රත්‍ය සහිත සංස්කාර ධර්මයෝ වෙති. විද්‍යමාන වෙත්. පහළ වෙත් යන සම්බන්ධයයි. **තෙසං** ධර්මයන්ගේ **හෙතුං** කාරණාව. **තථාගතො ආහ.** වදාළ සේක. **තෙසංච යො නිරොධො** යනු ඒ හේතු ධර්මයන්ගේ යම්

නිරුද්ධ වීමක් වේද, නසන ස්වභාවයක් වේද, **එවං වාදී මහා සමණෝ** යනු සීල සමාධි ප්‍රඥා ආදි ගුණ පිරිවර මහත් ලෙස පාපයන් සංසිඳවන ලද පාපයන් විධ්වංසනය කළ මහා ශ්‍රමණයෝ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු වාදියෙකි. හේතු සංසිඳවීමෙහිලා ප්‍රියවචන දොඩන සේක. කියන ලද්දේ යන අර්ථයයි.

ඉක්බිති කියන ලද ධර්මය අසා තමා විසින් ප්‍රත්‍යක්ෂ කරන ලද ප්‍රකාරය දක්වමින්, "සො හං" යන ආදිය කීවේය.

එසෙව ධම්මෝ යදි තාවදෙවා යනු, ඉදින් මෙයින් එතරවීමක් නැත. මෙපමණමය. මේ සෝවාන්ඵලයම පැතිය යුතුය. එපරිදි මේ ධර්මයම යන අර්ථයයි. **පච්චබ්‍යත්ථ** නුඹලා ප්‍රතිවේධ කළෝ. **අසොකං** පදං නිර්වාණයයි. අප විසින් මේ පදය **බහුහි කප්පන චුතෙහි අදිටයමෙව** යථාහං ධම්මං ගවෙසනෙතා යනු යම්බඳු මට ධර්මය ශාන්තිපදය සොයන්නේ, පර්යේෂණය කරන්නේ. **සො මෙ අතෙථා අනුප්පතෙතා** යනු හෙතම සොයාබැලිය යුතුය යන අර්ථයයි. මා විසින් පැමිණියේ සපැමිණියේය. දැන් වනාහි මේ මට **නප්පමජ්ජිතුං** අප්‍රමාදීවීමට සුදුසු කාලය යයි යන අර්ථයයි.

මම අස්සජි තෙරුන් විසින් තොසිතො කරන ලද සොම්නස් ඇත්තේ නිශ්චලව නිර්වාණ පදයට **පත්‍යාන** පැමිණි සහායක කෝලිත මාණවකයා සොයන්නේ අසපුවට පැමිණියේ යන අර්ථයයි.

දූරතොව මමං දිස්වා යනු අසපුවට නුදුරින්ම එන්නා වූ මා දැක **සුසිකඛිතො මෙසභායො හිදීමි** සැහැපීම් ආදි ඉරියව්වලින් යුක්තව, සමගි වූ ඉදං මතු කියනු ලබන්නාව, **වචනං අබ්‍රවී** වචන කීවේය යන අර්ථයයි. පින්වත් මිත්‍රය, **පසන්න මුඛනෙත්තොසි** ප්‍රසන්න වූ ශෝභන වූ දීප්තිමත් වූ මුවින් හා නෙත්වලින් යුතුව වෙහි. **මුනිභාවො ඉව තෙ දිස්සති** මුනිභාවය මෙන් ප්‍රකට වේ යන අර්ථයයි. නුඹ අමතාධිගතො අමෘත වූ නිර්වාණය අධිගම කළෙහි **කච්චි අවචුතං නිබ්බාණං පදං කිසිවක්** අධිගම කළේද? විචාරමි යනු අර්ථයයි.

සුභානුරූපො ආයාසි යනු ශුභ වූ ප්‍රසන්න වර්ණ ඇති, සුදුසු රූප ඇතිව ලැබී ආවේද? **ආනෙඤ්ජකාරිතො විය** යනු කඩු තෝමරවලින්

කරන ලද හික්මවන ලද ඇතකු මෙන් **දනෙනාව** තුන්මාසයකින් මැනවින් හික්මුණේ මෙන් බහා තබන ලද පාප ඇති බැවින් බ්‍රාහ්මණ වූ දනතදමථෝ ශික්ෂාවෙන් හික්මවූ නිර්වාණ පදයෙහි **උපසනෙනා** උපශාන්ත වූයේ දැයි විචාළේය.

ඔහු විසින් විමසන ලදුව "අමතං මයා" යනාදිය කීවේය. එය උඩ සඳහන් පරිදිමය.

අපරියොසිත සංකපෙපා යනු අනාගතයේ එක බුදුවරයකුගේ අග්‍ර ශ්‍රාවකයා වන්නේය යන ප්‍රාර්ථනාවෙන් කෙළවරට සපැමිණි සංකල්පනාව ඇති යන අරුතයි. **කුතිතෝ** නොයා යුතු මාර්ගයේ **අහං සංවරිං** ඇවිද්දෙමි-ස්වාමිනි; ගෞතමයන් වහන්ස, ලෝකජ්‍යෙෂ්ඨයන් වහන්ස; **තව දසසනං ආගමම** පැමිණ **මම සංකපෙපා** මගේ ප්‍රාර්ථනාව පුරන ලද්දේ, අර්හත් මාර්ගාධිගමයෙන් ශ්‍රාවක පාරමී ඤාණයට පැමිණීමෙන් පිරිපුන් වූයේ යන අදහසයි.

පඨවියං පතිට්ඨාය යනු පොළොවේ උපන්නෝ **සමයෙ** හේමන්ත කාලයේ **පුපඵනති** පිපෙත්. **දිබබගන්ධා** සුවඳ ඉතා සියුම් ලෙස හමා යති. පැතිරෙති. **සබබපාණිනං** සියලු දිව්‍ය මනුෂ්‍යයන් **තොසෙනති** සොම්නසට පැමිණියේ වෙති. **යම්සේ තථෙවාහංමහාවීර** යනු මහාවීර්යවන්තයාණනි, සක්‍යකුලයෙන් උපන් මහ පිරිවර ඇත්ත; **තෙ** ඔබගේ **සාසනෙ පතිට්ඨාය** මම පිහිටා **පුපඵිතුං** අර්හත් මාර්ග ඤාණයෙන් විකසිත වීමට **සමයං** කාලය **එසාමි** ගවේෂණය කරමි. එසේ වෙහි යන සම්බන්ධයයි. **විමුතති පුපඵං** යනු සියලු ක්ලේශවලින් මුදනු ලබන්නේ, මිදීම් වශයෙන් හේ විමුක්තිය, අර්හත්ඵල විමුක්ති සංඛ්‍යාත මල්, විමුක්ති පුෂ්ප නම් වේ. **එසනෙනා** ගවේෂණය කරන්නේ, එයද **භවසංසාර මොචනං** කාමභවාදි භවවල සැරිසැරීම ගමන් කිරීම භව සංසාරං එතැනින් මිදීම භව සංසාර මෝචනයයි. **විමුතතිපුපඵලාභෙන** යනු මිදීමය. මිදීම් වශයෙන් කරන ලද සම්භාරය මෙපමණකැයි විමුක්ති නම් වේ. අග්‍රඵලය, පිපෙත් විකසිත වෙත්. මෙපමණකින් හික්මෙත්. පුෂ්පය, විමුක්තියම පුෂ්පකොට ඇත්තේ විමුක්ති පුෂ්ප නම් වේ. ලැබීම = **ලාභො** විමුක්ති පුෂ්පයාගේ ලාභය විමුක්ති පුෂ්පලාභය ලබන ලද බැවින් **සබබපාණිනං** සියලු සත්ත්වයන් **තොසෙමි** සොම්නසට පමුණුවමි යන අර්ථයයි.

යාවතා බුදධ බෙනතමහි යන ආදියෙහි, **චකකුම** පසැස්වලින් යුතු තැනැත්ති යම්බඳු තැනක රතන සූත්‍රාදිය පිරිත් කළ අණින් ආනුභාවයෙන්, පවත්වයි. එපමණ ලක්‍ෂයක් කෝටියක් සක්වල බුද්ධ ක්‍ෂේත්‍රයයි. **යමපෙචචාන** මහාමුනිං සම්මා සම්බුදුරදුන් වර්ජනයකොට අවශේෂ සත්ත්වයන් කෙරෙහි අන්‍ය වූ කිසිවෙකු **තව පුතතසස** ඔබගේ පුත්‍රයා විසින් මට **පකඛඤඤාය සදිසෝ** සමා නැත යන සම්බන්ධය සෙස්ස උඩ සඳහන් පරිද්දෙනි.

පටිපනනා යනු චතුමාර්ග ඵලයෙන් සමන්විත වූ **ඵලට්ඨා** අර්හත් ඵලයෙහි පිහිටියා වූ **සෙකඛඵල සමංගිනෝ** යට සඳහන් ත්‍රිවිධ ඵලයන්ගෙන් සමන්විත වූ මේ ආර්ය අටපිරිස භික්‍ෂූහු **උතතමතථං** නිර්වාණයට **ආසිංසකා** ගවේෂණය කරන්නේ ඒ ප්‍රඥාවන්ත වූ **පරිවාරෙනති සදා** සියලු කල්හි සේවනය කරති ඇසුරු කරති. පයිරුපාසනය කරති යන අර්ථයයි.

කාය, වේදනා, චිත්ත, ධම්ම යන අනුපස්සනා සංඛ්‍යාත සතර සතිපට්ඨානයන්ගේ දක්‍ෂ වූ සති සම්බොජ්ඣංගාදීන්ගේ පවත්නා වූ බෝධි අංග ධර්මයන්ගේ වැඩීම පිණිස, වර්ධනය පිණිස **රතා** ඇලුණා වූ.

උළුරාජාව තාරකා රජ මෙන් **ශෝභමානවෙහි** ගස් පර්වත සත්රුවන් ආදිය දරන නිසා = ධරණී නම් වේ. දැරීමට සුදුසු හටගත් වර්ධනය වූ නිසා ධරණීරුහ නම් වේ. ගස් පොළොවේ පිහිටුවා **රුහනති** වැඩෙත්. වෘද්ධියට මහත්බවට පැමිණෙති. **වෙපුලලනං** විපුල බවට, පිරිපුන් බවට පැමිණෙත්. තෙ ඒ ගස් ක්‍රමයෙන් **ඵලං දසසයං** යනු ඵල දරන්නේය යන අර්ථයයි.

යළිත් බුදුරදුන්ටම ස්තුති කරන්නේ "**සිනධු සරසසති**" යන ආදිය කිවේය.

එහි **සිනධු** නම් ගංගාව ද, **සරස්වති** නම් ගංගාවද, **නදිය** ගංගාව ද, **චනදභාගි** නම් ගංගාවද **ගංගා** නම් ගංගාවද **සනදමානානං** යන්නා වූ **එතාසං** ගංගාවන්ගේ **සාගරෝ'ව** සමුද්‍රයම **සමපටිචජති** පිළිගනියි. දරයි. එසේ මේ සියළු ගංගාවෝ **පුරිමං නාමං සිනධුවාරිගංගා** අධික කොට ඇති පළමු නාමයෙන්ම ප්‍රඥප්තියෙන් ව්‍යවහාර කරයි. **ජහති** දුරු කරත්. **සාගරොතෙව** සාගරයම **ඤායති** ප්‍රකට වෙයි. යම්සේ **තථෙව** එසේම

ඉමෙචතුබ්බණ්ණා ක්ෂත්‍රිය වෛශ්‍ය බ්‍රාහ්මණ ශූද්‍ර යන සතර කුලයෝය. **තවන්තිකෙ** ඔබ සමීපයේ ඇසුරේ **පබ්බජිත්වා** පාත්‍ර කාෂාය සිවුරු දරන්නා වූ පිරිවර හැසිරෙන **පුරිමං නාමං** දුරුකරත්. බුද්ධපුත්තා යනු බුදුරදුන්ගේ ඖරස පුත්‍රයෝ යයි ඥායරෙ ප්‍රකට වන්නාහ.

චන්දෝ චන්ද්‍ර මණ්ඩලය, ආකාශය, මිහිකත, දූවිලි, දුම, රාහු යන පංච උපක්ලේශවලින් වැලකුණු බැවින්, **විමලෝ** පහවූ කෙලෙස් ඇති නිර්මල වූ **ආකාසධාතුයා** ආකාශ ගර්භයේ **ගච්ඡං** යන්නා වූ **සබ්බ** තාරකා සමූහය **ආභාය** මර්ධනය කරමින් **ලොකෙ අතිරොචති** බබළවන්නේ යම්සේද? **තථෙව** එසේම **ත්වං** -පෙ- **උදකෙ ජාතෝ** ජලයේ හටගත් **කුමුදාමඤ්ඤාලකා** බොහෝ සංඛ්‍යාවක් ඉක්මවා යන **නොයෙන** ජලයෙන් **කඳුමකලලෙනව උපලිම්පනති** ඇලෙන්නේ යම්සේද **තථෙව බහුකා සත්තා** අප්‍රමාණ සත්ත්වයෝ. **ලොකෙ ජාතා** සංවර්ධන වූවෝ රාගයෙන් ද්වේෂයෙන්ද, **අවිධීනා** බඳනා ලද්දේ **විරූහරෙ** බබළත් **කඳමෙ කුමුදං යථා** කුමුදු මඩේ යම්සේ හටගනිද, වැඩේද **කෙසරී** යනු පියුම්ය. **රම්මකෙ මාසෙ** යනු කාර්තික මාසයේ "කොමුදියා චතුමාසිනියා" යයි කියන ලද බැවිනි. **තං මාසං තං** ඉල් මාසයේ **නානිවත්තනනති** ජලය හා සම්බන්ධ වේ. නොපවතිත්.

සමයෝ පුප්ඵනාය සෝ යනු ඉල් මාසය මල් පිපීම සඳහා විකසිත වීම පිණිස සුදුසු කාලය යන අර්ථයයි. යම්සේ මල් පිපේද? **තථෙව තථං සක්‍යපුත්ත** පිපී විකසිත වූවෙහි. **පුප්ඵිතා තෙ විමුත්තියා** යනු ඒ ඔබගේ ශිෂ්‍යයෝ කරන ලද පින් සම්භාර ඇත්තේ භික්ෂූහු විමුක්තිය පිණිස අර්හත්ඵල ඥාණයෙන් පිපී විකසිත වූවේ **යථා වාරිජං පදුමං** මල් සමය නොඉක්මවයි. එසේ ඔවුහු **සාසනං** අවවාද අනුශාසනා **නාතිවත්තනති** නොඉක්මවන්නේය යන සම්බන්ධයි.

යථාපි සෙලෝ හිමවා යනු හිම සහිත කාලය නම්, ශෛලමය පර්වතයෙන් **සබ්බ පාණීනං** සියළු රෝගාබාධ සහිත සත්ත්වයන්ට **ඔසධෝ** ඖෂධ වන්නේ සියළු නාගයන්ට සියළු අසුරයන්ට සියළු දෙවියන්ට වාසස්ථාන වූ ගිහිගෙය වසන අයටද එසේය. **තථෙව තවං මහාවීර;** සියළු ප්‍රාණීන්ගේ ජරා ව්‍යාධි මරණ ආදියේ මුදවනු ලබන්නේ ඖෂධ මෙන් ඒ හිමාලය නාගාදීන්ට වාසස්ථාන වූයේ, එපරිදි **තෙවිජ්ජාය ඡළභිඤ්ඤායව ඉදධියා පාරමිං නිවිදාහා ෂට් අභිඥා ඉද්ධි පාරමිතා**

කෙළවරට **ගතා** පැමිණි ඔබ නිසා වාසය කරත් යන සම්බන්ධයයි. යටද, මතුද, උපමා-උපමේය වශයෙන් ගාථාවන්ගේ සම්බන්ධය මැනවින් දත යුත්තේය.

ආසයානුසයං ඤත්වා යනු මෙහි ආසයෝ යනු බලාපොරොත්තු චරියාවයි. අනුසයෝ යනු දැඩිව හටගත් කෙලෙස්. මේ රාග චරිතය, මේ ද්වේෂ චරිතය, මේ මෝහ චරිතය, ආදි වශයෙන් ආසයද අනුසයද කෙලෙස් වශයෙන් පවතින බව දැනගෙන යන අර්ථයයි. **ඉන්ද්‍රියානං බලාබලං** යනු ශ්‍රද්ධා ඉන්ද්‍රිය ආදින්ගේ පංච ඉන්ද්‍රියන්ගේ 'තීක්ෂණ ඉන්ද්‍රිය, මුදිඉන්ද්‍රිය, ස්වාකාර, දෙයාකාර, සුවිඥානක, දුවිඤ්ඤාපය ආදි මෙසේ බල-අබල දැන **භබ්බා භබ්බෙ විදිත්වාන** යනු "මා විසින් දේශනා කරන ලද ධර්මය අවබෝධ කරගැනීමට මේ පුද්ගලයා නුසුදුසු යයි දැන ප්‍රත්‍යක්ෂ කොට, "සුදුසුය, සමර්ථය මේ පුද්ගලය" යයි දැන, ස්වාමීනි, සර්වඥයන් වහන්ස; ඔබවහන්සේ සතර දිශාවෙන් හමා එන මහා වලාකුලක් මෙන් ධර්මදේශනා නැමැති සිංහනාදයෙන් අහිත නාදයෙන් **ගජ්ජසි** සියළු සක්වල එකට නින්නාද කළෙහි.

චකකවාළ පරියනතා යනු හාත්පස චක්‍රවාළ ගර්භය පුරා **පරිසා නිසිනනා භවෙය්‍ය** ඔවුහු මෙසේ හුන්නෝ නොයෙක් දෘෂ්ටි නොයෙක් දර්ශන ගත්තේ, විවාද කරන්නේ, විරූප වන්නේ, විවාද කරත්. ඒ ඔවුන්ගේ **විමතිච්ඡෙදනාය** දුර්බුද්ධිය සිදිනු පිණිස, **සබ්බසං** සත්ත්වයන්ගේ **චිත්ත** මඤ්ඤාය සිත්වාරය දැන **ඔපම්මකුසලෝ** උපමා උපමේයන්හි දක්ෂ මෙන් මුනි **එකං පඤ්හං කථෙනෙනාව** එකම ප්‍රඥා කථාවෙන් සියළු සක්වල ගැබ හුන්නා වූ ප්‍රාණීන්ගේ **විමතිං** සැකය **ඡින්දසි** නිසැක කරහි යන අර්ථයයි.

උපදිසදිසෙහෙව යනු මෙහි ජලය මතුපිට දක්නට ලැබෙත්. ප්‍රකට වෙත්. උප දිශාවල සෙවෙල්. උපදිසා හා සමාන බැවින් උපදිස සදිස නම් වේ. මිනිස්සු යම්සේ උපදිශාවල සෙවෙල ජලය නොපෙනෙනු කොට, ඒ මතුපිට පැතිරී පවතිත්. එසේ **වසුධා** පොළොව ඒ උපක්ලේශ සහිතවම මිනිසුන් විසින් නිරතුරුව පැතිරී, සිටියා වූ **පූරිනා භවෙය්‍ය තෙ සබ්බෙව** පෘථිවිය පුරා සිටියා වූ මිනිස්සු, **පඤ්ජලිකා** සිරසින් ඇඳිලිබැඳ සිටියාහු, **කිනෙනයනුං ලොක නායකං** ලෝකනායක වූ බුදුන්ගේ ගුණ කියන්නාහුය.

තෙ සියළු දෙව් මිනිස්සු **කප්පංවා** මුළු කල්පයක් **කිර්තිය** පතුරවමින් ගුණ කියන්නාහු **නා නා** වණ්ණගි නොයෙක් ආකාර ගුණවලින් **කිත්තයුං** කියන්නාහ. එසේම ඒ සියල්ලෝ **පරිමෙතුං** ගුණ ප්‍රමාණය කීමට **න පපොයුං** නොපැමිණියාහුය. නොහැකිවූහ. **අපපමෙය්‍යා තථාගතො** සම්මා සම්බුරදුන් අපරිමාණ ගුණයෙන් යුතුය. මෙබඳු මහත් ගුණය දීපනය කරයි.

සකෙන ථාමෙන තමන්ගේ බලයෙන් යටකියන ලද උපමා උපමේය වශයෙන් **ජිනො** දිනන ලද කෙළෙස් ඇති බුදුවූ මා විසින් **කිත්තිතො** කීර්තියෙන් යම්සේ වූයේද, එවමෙම සියළු දෙව් මිනිස්සු **කප්පකොටිං** කල්පකෝටි සියයක් **කිත්තයනෙතා** කීර්තිගුණය කියන්නාහ. නැවත ගුණයන්ගේ අප්‍රමාණ බව දැක්වීමට "සචෙහි කොචි දේවොවා" යනාදිය කීවේය.

පුරිතං පරිකඩ්ඪය්‍ය යනු මහා සමුද්දයේ පුරවන ලද ජලය හාත්පසින් අදින්නේද, **සො** ඒ පුද්ගලයා **විඝාතංව දුකක්ම ලභෙය්‍ය** පැමිණෙන්නේය යන අර්ථයි.

වනෙතමි ජිනසාසනං යනු බුදුරදුන් විසින් දේශනා කරන ලද, සියළු පිටක, පිටකත්‍රය කියමි. පවත්වමි. රකිමි යන අර්ථයයි. **ධම්මදෙසනාපති** යනු ධර්මයේ ප්‍රඥාවෙන් බුදුරදුන්ට සිවුපිරිස සහිත පිරිසට අධිපතියා ප්‍රධානියා ධර්ම සේනාපති වූ **ශාක්‍යපුත්‍ර** වූ බුදුරදුන්ගේ **ශාසනයේ** අද මේ වර්තමාන කාලයේ සක්විති රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර මෙන් සියළු බුද්ධ ශාසනය රකිමි යන අර්ථයයි.

තමන්ගේ සංසාර චක්‍රය පෙන්වමින් "යොකොචි මනුජො භාරං" යනාදිය කීවේය.

යො කොචි මනුජො මිනිස් වර්ගයා **භාරං** හිසේ බර **මත්තකෙ** හිසෙහි තබාගෙන **ධාරෙය්‍ය** උසුලන්නේය. **සදා** සියළුකල්හි ඒ මිනිසා ඒ බරින් **දුකඛිතො** පෙලුණේ මඩනා ලද්දේ, **අසස** වන්නේය. හි සත්‍යයකි. **භාරො** දරන ලද බර **හරිතො** ඉතාම බැරෑරුම් වූයේ. තථා ඒ ආකාරයෙන් **අහං** රාග ගින්න, ද්වේෂ ගින්න, මෝහ ගින්න සංඛ්‍යාත **තීහි අග්ගීහි ඩය්හමානො** - තුන් ගින්නෙන් දැවෙනු ලබන්නේ, **ගිරි උදධිරිතො** යථා

මහාමේරු පර්වතය උදුරා ඔසවා, හිසෙහි තබන ලද්දේ මෙන් **භවභාරෙන** භව සංසාර උත්පත්ති බරින් බර වූයේ දුකට පත් වූයේ භවවල **සංසරිං** ඇවිද්දෙමි යන සම්බන්ධයි.

ඔරොපිතො ච මෙ භාරො යනු දැන් පැවිදි කාලයේ පටන් ඒ භවභාරය මට මා විසින් බහා තබන ලද්දේ නික්මෙන්නේ, **භවා උග්ඝාටිතා මයා** යනුවෙන් සියළු අඵත් භවයන් මා විසින් දුරුකරන ලද්දෙමි. **සක්‍ය පුත්තස්ස** බුදුරදුන්ගේ ශාසනයේ, මේ **කරණීයං** කළ යුතු, මාර්ග පිළිවෙළින් කෙළෙස් විධ්වංසනය කළේය. ඒ සියල්ල මා විසින් කරන ලද්දේය යන අර්ථයයි.

නැවත තමන්ගේ විශේෂය දක්වමින් "යාවතා බුද්ධ ඛෙත්තම්හි" යනුවෙන් කිහ.

එහි **යාවතා** යම් පමණ දසදහසක් සක්වල සංඛ්‍යාත බුද්ධ ක්ෂේත්‍රයෙහි, **සක්‍ය පුංගවං** ශාක්‍ය කුලයට ජ්‍යෙෂ්ඨ වූ භාග්‍යවතුන් **යත්ථො** අවශේෂ කිසි සත්ත්වයන් අතර ප්‍රඥාවෙන් මා හා සමාන කෙනෙක් නැත යන අර්ථය දක්වයි. එසේ හෙයින් කියන ලදී. "**මම ප්‍රඥාවෙන් අග්‍ර වෙමි. මා හා සමාන කෙනෙකු විද්‍යමාන නොවේ**" යනුවෙනි.

නැවත තමන්ගේ ආනුභාවය ප්‍රකාශ කරමින් **සමාධිම්හි** යනාදිය කිහ. එය විශේෂයෙන් දතයුතුය.

ඣාන විමොක්ඛ බිපපලාභි යනු ප්‍රථම ධ්‍යානාදීන් ධ්‍යානයන්ගේ ලෝකයෙන් මිදීමට විමොක්ෂය සංඛ්‍යාත ගිය අෂ්ට වැදෑරුම් ලෝකෝත්තර විමෝක්ෂය වහාම ලැබීමය. වහාම පැමිණෙමි යන අර්ථයයි.

මෙසේ මහානුභාව සම්පන්න වූ තමන්ගේ සබ්‍රහ්මචාරීන් විෂයෙහි ගරු බුහුමන් වඩමින් ප්‍රකාශ කරන්නේ උද්ධට "**විසොවා**" යනාදිය කිහ.

එහි උද්ධට විසො උදුරණ ලද සෝර විෂ ඇති **සපෙපා ජීනන විසාණො සිදින** ලද අං ඇති **වෘෂභයකු** මෙන් මම දැන් **නිකඛිනනමාන දපෙපා** හරනා ලද ගෝත්‍ර මද ආදි මාන එඩි ඇති **ඍණං** සංඝයාගේ **සමීපයට ගරුගාරවෙන** ආදර බහුමානයෙන් **උපෙමි** එළඹෙමි.

දැන් තමාගේ ප්‍රඥාවේ මහත් බව ප්‍රකාශ කරමින් "යදි රුචිනි" ආදිය කීවේය.

මෙබඳු ආකාර වූ මහත් ප්‍රාඥ ඇත්තේ, අරූපී හා **සමාන** වෙත්ද, ඉදින් රූපී වන්නේද, එකල මෙ මගේ **පඤ්ඤා වසුපතීනං** පෘථිවියට අධිපති රජවරුන්ට **සමෙය්‍ය** සමාන වන්නේය යන අදහසයි. මෙසේ තමන්ගේ ප්‍රඥාවෙන් මහත් බව දක්වා, අනතුරුව පූර්වේනිවාසානුස්සති ඤාණයෙන් පෙර කර්ම සිහිකොට **අනොමදසසි** යනාදිය කීවේය. එහි **අනොමදසසි** බුදුරදුන්ගේ මා විසින් කරන ලද, **නුවණ, ස්තුති කිරීමේ ඵලය** මෙසේ මගේ ප්‍රඥාව මහත් බවට පත්වේ යන අර්ථයයි.

පවත්තිතං ධම්මචක්කං යනු මෙනි. 'චක්‍ර ශබ්දය වනාහි, සිවු චක්‍ර යානයේ ආදි වාහනයේ පවතියි. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මචක්‍රය පවත්වන ලදි යන දේශනාවේ සියළු ප්‍රාණීන්ට චක්‍රය පවත්වයි, ආදියෙහි, දානමය පුණ්‍ය ක්‍රියාවද, දිවා රාත්‍රියෙහි චක්‍රය පවත්වයි ආදියෙනි. ඉරියව් වේ. 'කැමැත්ත නැසුනා වූ පුරුෂයාගේ චක්‍රය මස්තකයෙහි කැරකේ' යන ආදියෙහි, උරචක්‍රයෙහි, චක්‍රවර්ති රජතුමා, චක්‍රානුභාවයෙන් පවත්වන්නේ, යන ආදියේ රතන චක්‍රයේ. මේ දේශනාවේ වනාහි, **නාදිනා** නාදිගුණයෙන් සමන්විත වූ **සක්‍යපුත්තෙන** ගෞතම සම්බුදුරදුන් විසින් **පවත්තිතං** දේශනා කරන ලද ත්‍රිපිටකය සංඛ්‍යාත. **ධම්මචක්කං** අහං මනාකොට නොවෙනස්ව පවත්වමි. අනුව ගොස්, පවත්වමි. දේශනා කරමි. දේශනාව කරමි. මේ අනුව පවත්නා වූ, දේශනාවට අනුව ගොස්, පසු දේශනාව පෙර බුදුවරුන්ගේ කරන ලද **ඤාණ ඵොමනාය ඵලං** යන **සම්බන්ධයයි.**

අනතුරුව සත්පුරුෂ ආශ්‍රයෙන් යෝනිසෝ මනසිකාර ආදි පුණ්‍ය ඵලයන් දක්වමින් "මා මෙ කදාමි පාපිච්ඡො" යන ආදිය කීවේය.

එහි **පාපිච්ඡො** ලාමක බව කැමැත්තේ එයින් සමන්විතව, පාපචාරී පුද්ගලයාද, සිටීම් සැතපීම් වශයෙන් වත්පිළිවෙත් කිරීමද, **කුසීතොච** ධ්‍යාන සමාධි මාර්ගභාවනාවල **හීන විරියොච** ග්‍රන්ථධූරය විරහිත බැවින් **අපපසුතොච** ආචාර්ය-උපාධ්‍යාය ආදි ආචාර විරහිත බැවින් **අනාචාරොච** පුද්ගලයා **කදාචි** සුදුසු කාලයේ, **කහඵචි** ස්ථානයේ **මෙ** මා සමග **සමෙතො** රැස්වූ **මා ආහ** නොවේවා! යන **සම්බන්ධයයි.**

බහුසුතො යනු පර්‍යාප්ති-ප්‍රතිවේධ වශයෙන් දෙපරිදි වේ. බහුශ්‍රැත වූ පුද්ගලයාය. **මේධාවී** යනු ප්‍රඥාවෙන් සමන්විත වූ **සීලෙසුසුසමාහිතො** යනු චතුපාරිශුද්ධි සීලයෙන්ද, මාර්ගයෙන් යුක්ත පංචසීල අෂ්ටාංග සීලාදියෙහි මැනවින් නිරත වූ තබන ලද සිත් ඇති **චෙතොසමථානු යුත්තො** යනු සිතේ ඒකීය භාවයෙන් යුක්ත පුද්ගලයාය. **අභි මුදධනි තිට්ඨතු** යනු මෙබඳු ආකාර පුද්ගලයා, මගේ මුදුනේ සිරසෙහිද සිටීවා යන අර්ථයයි.

තමන් ලබන ලද ප්‍රතිඵල ආනිශංස පවසා එහි අනෙකකු නියෝජනය කරන්නේ "තංවො වදාමි භද්දන්තෙ" යන ආදිය කීවේය. එය විශේෂ අර්ථයක්මය.

යමහං යනු යම් **අස්සජි තෙරුන්** වූ මම **පඨමං** පළමුව දිසවා සෝතාපත්ති මාර්ග ප්‍රතිලාභයෙන් සක්කායදිට්ඨිය (ආත්ම දෘෂ්ටිය) ආදි ක්ලේශයන්ගේ ප්‍රහීණ බැවින්. **විමලො** කෙලෙස් රහිත **අහු** විය. **සො අස්සජි** තෙරුන් මෙ මගේ **ආචරියො** ලෝකෝත්තර ධර්මය පුහුණු කරන්නා වූ අහු මම ඔහුට දැනීම පිණිස අනුශාසනයෙන්. අද ධර්ම සේනාපති වූහ. **සබ්බත්‍ථ** සියලු ගුණවල **පාරමිප්පත්තො** කෙළවරට පැමිණියේ අනාසවො කෙලෙස් රහිතව වාසය කරමි.

තමන්ගේ ගුරුවරයා කෙරෙහි ගෞරව දක්වමින් "යො මෙ ආචරියො" යන ආදිය කීවේය.

යම් අස්සජි නම් තෙරුන් ශාස්තෘ ශ්‍රාවක වූයේ මෙ මට **ආචරියො** ආසි විය. ඒ තෙරුන් **යස්සං දිසායං** යම් දිශා භාගයක **වසති අහං** ඒ දිශාභාගය **උසසීසමහි** ශීර්ෂය මුදුනේ කරමි යන සම්බන්ධයයි.

අනතුරුව තමන්ගේ තනතුරට පැමිණි බව පෙන්වමින් "මම කම්මං" යනාදිය කීවේය.

ගොතමො බුදුරදුන් **සක්‍ය** පුංගවො ශාක්‍ය කුලයට ධජයක් බඳු වූ සර්වඥතා ඥානයෙන්, මම පෙර කරන ලද **කර්ම සරිත්‍රාන** දැන භික්ෂු සංඝයා මැද සිටින්නේ, අග්‍රශ්‍රාවක තනතුරේ මා තැබුවේය යන සම්බන්ධයයි. අර්ථ ප්‍රතිසම්පදා, ධර්ම පටිසම්භිදා, නිරුක්ති ප්‍රටිසම්භිදා,

පටිභාන පටිසම්භිදා යන වශයෙන් මේ සිවුපිළිසිඹියාපත් ද ඒවායේ ප්‍රභේද, **පටිසම්භිදා මගග** කියන ලද්දේමය. සතරමග සතරඵල වශයෙන්ද රූප අරූප ධ්‍යාන වශයෙන් හේ අෂ්ට විමොක්ෂා, සංසාර මිදීමේ ධර්මයන්ද ඍද්ධිවිධ ආදි ෂඩ් අභිඥාවෝ ද යමෙක් සාක්ෂාත් කළේද, ප්‍රත්‍යක්ෂ කලේ, **බුද්ධසස අනුසාසනං** යනුවෙන් අවවාද සංඛ්‍යාත ශාසනය **කතං** අර්හත් මාර්ග ඥාණයෙන්, නිපදවිය යන අර්ථයයි. **ඉත්ථංසුදං** මෙහි **ඉත්ථං** යනු නිදර්ශන අර්ථයේ නිපාතයකි. මේ ආකාරයෙන් යන අර්ථයයි. එයින් මුලු සාරිපුත්ත චරිතය පෙන්වා දෙයි. **සුදං** යනු පද පූරණ නිපාතයකි. **ආයස්මා** යනු ගරුකටයුතු විශේෂ වචනයකි. **සාරිපුත්තෙතා** යනු මාතෘ නාම වශයෙන් කරන ලද හැඳින්වීමයි. **ඉමා ගාථා** යනු මේ සියලු සාරිපුත්ත ථෙරාපදානය ගාථාවෝය. **අභාසි** වදාල සේක. **ඉති** ශබ්දය පටිසමාප්ත අර්ථයේ නිපාතයකි. සියලු සාරිපුත්‍ර චරිතාපදානය නිමවී යන අර්ථයයි.

මෙසේ විසුද්ධජන විලාසිනි නම් අපදාන අට්ඨ කථාවේ
සාරිපුත්‍ර තෙරුන්ගේ වර්ණනාව සමාප්ත වේ.

-තුන්වන-

3.2

අනොමදසසි භගවා යන ආදියෙන් ආයුෂ්මත් මහා මොග්ගල්ලාන අපදානය වේ. මේ තෙරුන්ද පෙර බුදුවරුන් විෂයෙහි කරන ලද අධිකාර ඇත. ඒ ඒ භවයෙක්හි පෙරළෙමින් අවුත් පින් රැස්කරන්නෝ **අනොමදසසි** බුදුරදුන්ගේ කාලයේ යැයි **සාරිපුත්ත** තෙරුන්ගේ ධර්ම සේනාපතිව තෙරුන් පැවිදි වූදා පටන් සත්වන දිනයේ **මගධ රටේ කල්ලවාලගාමකං** ඇසුරුකොට ශ්‍රමණය දහම් කරන්නේ සිත්-සිතිවිලි උදාසීනකම පිටකරන්නේ ශාස්තෘන් වහන්සේ "මොග්ගල්ලාන ඔබගේ උත්සාහය පහත්කොට නොවේවා!" ආදියෙන් නම් සංවේගයට පත්වූයේ, ථීන-මිද්ධ දුරුකොට බුදුරදුන් කියනු ලබන ධාතු කමටහන් අසන්නේ විදර්ශනා පටිභායෙන් මතු මා අගත්‍රයට පැමිණ අග්‍ර ඵලය වූ ශ්‍රාවක ඥාණය මස්තකප්‍රාප්ත විය. මෙසේ දෙවෙනි ශ්‍රාවක භාවයට පැමිණ ආයුෂ්මත්

මහාමුගලන් මහා මොග්ගල්ලාන තෙරුන් තමන්ගේ පෙර කර්ම ආදිය සිහිපත් සිහිකොට සොම්ස් වශයෙන් සහගත වශයෙන් පළමුව පූර්ව චාරිකා පූර්ව චරිත අපදානය ප්‍රකාශ කරමින් **අනොමදස්සි භගවා** ආදිය කීවේය.

එහි ළාමක නොවන නිසා අලාමක දර්ශනය බැලීම ඔහුට ඇත්තේනුයි **අනොමදස්සි** නම් වේ. උන්වහන්සේට දෙතිස්මහා පුරුෂ ලක්ෂණයෙන් අලංකාර වූ ශරීරයක් ඇති බැවින් මුළු දවසම, මුළු මාසයම, මුළු අවුරුද්ද පුරාම අවුරුදු ලක්ෂයක් පමණ පැහැදුණා වූ දේව මනුෂ්‍යයන්ට අතෘප්තිකරව පෙනෙන් ළාමක නොවූ අලාමක නිර්වාණ දර්ශනයේ ඇලුණේනුයි හෝ **අනොමදස්සි** යන නම් ලද, භාග්‍යවන්ත කාරණාවලින් **භගවා** නම් වේ. **ලොකජෙට්ඨො** යනු මුළු **සත්ත්වලෝකයට** ජ්‍යෙෂ්ඨ ප්‍රධාන වේ. අසහාය ශ්‍රේෂ්ඨත්වයෙන් යුක්ත බැවින් ශ්‍රේෂ්ඨ නරයා වන බැවින් **නරාසභ** නම් වේ. ඒ ලෝක ජ්‍යෙෂ්ඨ වූ නරාසභ වූ **අනොමදස්සි** භාග්‍යවත්හු දෙවසංඝපුරක්ඛතා දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව, හිමාලයේ බැබලුණු සේකයන සම්බන්ධයයි. යම්කලෙක දෙවෙනි ශ්‍රාවක භාවයට දෙවෙනිවර ප්‍රාර්ථනා කළේය. එකල නමින් වරුණ නම් මම නාගරාජ වී උපන්නේ වී යන අර්ථයයි. එබැවින් කියන ලදි. **"වරුණො නාම නාමෙන නාගරාජා අහං තදා"** යනුවෙනි. **කාමරූපි** යනු යම් කාම වස්තුවක් කැමැති වීද, නිර්මාණශීලි වූයේද, **විකුබ්බාමි** යනු විවිධ ඍද්ධි ප්‍රාතිහාර්ය කරමි. මහොදධි **නිවාසභං** යනු මදටිය පාට නාගසේ භූමිගත වූ නාගයෝ පර්වතවාසී නාගයෝ ගංගා ආශ්‍රිත නාගයෝ සමුද්‍රවාසී නාගයෝ යනුවෙන් මේ නාගයන් අතර මහමුහුදුවැසි නාගයකු වූ මම මහා සාගරයෙහි සමුද්‍රයෙහි වාසය කළෙමි යන අර්ථයයි.

සංගණියං ගණං හිත්වා යනු නිතර පිරිවර සහිතව, සිය පිරිවරින් යුතු නාග සමූහයා නිර්වාණශීලී වී, **තූරියංපටියපෙසභං** යනු මම තූර්යනාද කළෙමි. පැවැත්වූයෙමි යන අර්ථයයි. **සම්බුද්ධං පරිවාරෙත්වා** යනු **අනොමදස්සි** සම්බුදුරදුන් හාත්පස සේවනය කරනු ලබන්නේ, **අච්ඡරා** නාග මානවිකාවෝ වාදෙසුං දිව්‍ය වාදනයෙන්, ගීත වාක්‍යවලින් වාද කළහ. ලබන ලද අනුරූප පරිදි පැවැත්වීම් කළහ. **තදා** යන අර්ථයයි.

වජ්ජමානෙසු තූරියෙසු මනුෂ්‍ය නගරයේ පංච තූර්යනාදය පවත්වන කල්හි, **දෙවාතූරියානි වජ්ජයුං** යනු චාතුර්මහාරාජික දෙවිවරු දිව්‍ය

තූර්යනාද පැවැත්වූහ. වාදනය කළහ යන අර්ථයයි. **උභිනනං සද්දං සුත්වාන** යනු දේව මනුෂ්‍ය යන දෙපාර්ශ්වයේම භේරිනාදය අසා තුන්ලොවට ගුරුවූ අසහාය බුදුරදුන් **සම්පබුජ්ඣථ** දනියි අසයි යන අර්ථයයි. **නිමනතයිත්වා සම්බුද්ධං** යනු ශ්‍රාවක සංඝයා සහිත සම්බුදුරදුන්ට හෙට දවස සඳහා **නිමන්තයිත්වා** ආරාධනාකොට **සකභවනං** යනු තමන්ගේ නාග භවනයට **උපාගමිං** ගොස් **ආසනං පඤ්ඤාපෙත්වාන** යනු රාත්‍රිස්ථාන, දිවාස්ථාන, කූට මණ්ඩප නිදන හිඳින තැන් පනවා-සරසවා යන අර්ථයයි. **කාල මාරොචයිං අහං** යනු මෙසේ කරන ලද පූර්ව විධි විධාන ඇත්තා වූ මම "ස්වාමීනි; බත් සඳහා වැඩසිටීමට කාලය යයි" කාලය දැනුම් දුනිමි. දැනුවත් කළෙමි.

බීණාසව සහසෙසහි යනු එකල ඒ බුදුරදුන් රහතුන් වහන්සේ දහසක් සමග පිරිවරා ලෝක නායකයාණෝ සියලු දිශා බබුළුවමින් මගේ භවනට උපාගමි පැමිණියේ යන අර්ථයයි.

තමන්ගේ භවනට පිවිසි බුදුරදුන් භෝජනය පිළිගන්නා බව දක්වමින් "**උපවිට්ඨං මහාවීරං**" යන ආදිය කීහ. එම අර්ථය වෙසෙසා දතයුතුය.

ඔක්කාක කුල සම්භවො යනු **ඔක්කාක** රජුගේ පරම්පරාවෙන් පැමිණි රාජවංශයෙහි උපන්නා වූ මුළු දඹදිව ප්‍රකට රජකුලයක උපන්නා වූ හෝ ගෝත්‍රයෙන් ගෝත්‍ර වශයෙන් **ගෝතම** නම් ශාස්තෘන් වහන්සේ මිනිස්ලොව වන්නේය.

සො පඤ්ඤා පබ්බජිතවාන යනු ඒ නාරජු පසුව පශ්චිම භවයෙහි **කුසල මූලෙන** පුණ්‍ය සම්භාරයෙන් **චොදිතො** යොදන ලද්දේ ශාසනයේ පැවිදි වී ගෞතම බුදුරදුන්ගේ දෙවෙනි අග්‍ර ශ්‍රාවකයා වන්නේ යයි විවරණ දුන් සේක.

ආරද්ධ විරියො යනු හිඳීම සිටීම ආදී ඉරියව්වල වීර්ය වඩා, **පහිතතෙතා** යනු නිර්වාණයට යැවූ සිත් ඇති **ඉදධියා පාරමිං ගතො** යනු මේ මගේ ශ්‍රාවකයන් අතර ඍද්ධිමතුන්ගේ මොග්ගල්ලාන තෙරුන් අග්‍රයයි අධිෂ්ඨාන ඍද්ධි ප්‍රාතිහාර්ය කර්ම විපාක ආදිය විවරණය කිරීමෙහිලා, නිපුණත්වයට කෙළවරට පැමිණියේ යන අර්ථයයි. **සබ්බාසවෙ** යනු භාත්පසින් ශ්‍රවණය කළේ, පැවැත්වූයේ ආසව යන නම ලබන ලද්දේ,

කාම, භව දිට්ඨී අවිජ්ජා යන සියළු ධර්මයෙහි **පරිඤ්ඤාය** හාත්පසින් දැන අවබෝධකොට **අනාසවෝ** කෙලෙස් රහිත **නිබ්බායිසසති** ක්ලේශ බන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන්නේ යන සම්බන්ධයයි.

මෙසේ තෙරුන්, තමන්ගේ පින් වශයෙන් ලබන ලද, ව්‍යාකරණ පවසා, නැවත පාප චර්යාව ප්‍රකාශ කරන්නේ, "**පාපමිත්තෙනා පනිසසයා**" යන ආදිය කීවේය. එහි **පාපමිත්තෙන** පාපක ලාමක මිත්‍රයන් නිසා ඇසුර නිසා ඔවුන් සමග සංසර්ග (ඇසුරු) කොට යන අර්ථයයි. එහි මේ අනුපිළිවෙළ කථාවයි.

එක්සමයෙක්හි තීර්ථකයෝ රැස්ව සාකච්ඡා කළහ. "ඇවැත්නි, දනිවුද? කවර කරුණක් ශ්‍රමණ **ගෞතමයන්ට** ලාභසත්කාර බහුල වී උපන්නේද? නොදනිමු. "නුඹලා වනාහි දැනගනිවු" යයි එසේය දැන ගනිමු. **මොග්ගල්ලාන** නම් එක් භික්ෂුවක් නිසා උපන්නකි. උන්වහන්සේ දෙව්ලොවට ගොස් දේවතාවන් විසින් කරන ලද ක්‍රියා විචාරා, අවුත් මිනිසුන්ට පවසයි. "මෙනම් දේ කොට මෙබඳු ආකාර සම්පත් ලබත්" ආදියයි. නිරයේ උපදින්නවුන්ගේ කර්මවිපාක විචාරා අවුත් මිනිසුන්ට පවසති. "මෙබඳු ආකාර විපාකකොට මෙබඳු ආකාර දුක් අනුභව කරයි" යනුවෙනි. මිනිස්සු උන්වහන්සේගේ වචනය අසා මහත් ලාභ සත්කාර ලබාගැනීමට පෙළඹෙත්. ඉදින් ඔහු මරන්නට හැකිවන්නෙමුද? තමන්ගේ උපස්ථාන වශයෙන් සමාදන් කරවා කහවනු දහසක් ලැබ මිනිසුන් මරණ සොරුන් කැඳවා **මොග්ගල්ලාන** නම් වූ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයා කාලසිලා පව්වේ වැඩ සිටිති. නුඹලා එහි ගොස් උන්වහන්සේ මරවු යනුවෙනි. ඔවුන්ට දහසක් දුන්හ. සොරු ධනලෝභයෙන් පිළිගෙන තෙරුන් මරන්නෙමුයි ගොස් උන්වහන්සේ වසන තැන වටකළහ. තෙරුන්, ඔවුන් විසින් වටකොට බව අසා යතුරු සිදුරෙන් නික්ම පලාගියෝය. සොරු ඒ දවස තෙරුන් නොදැක නැවත දිනක ගොස් උන්වහන්සේ වසන තැන වට කළහ. තෙරුන් ඒ බව දැන කැණිමඬල බිඳී අහසට පැන්නේය. මෙසේ ඔවුහු පළමු මාසයේද, මධ්‍යම මාසයේද තෙරුන් අල්ලා ගැනීමට නොහැකි වූහ. පසු මාසයෙහි පැමිණි කල්හි තෙරුන් තමන් විසින් කරන ලද කර්මය පසුපස ඇදී එන බව දැන පිටත්ව නොගියහ. සොරු උන්වහන්සේට පහරදෙන්නෝ සහල් ඇට පමණ ඇට කුඩුකරමින් බින්දාහ. ඉක්බිති උන්වහන්සේ මිය ගියේයයි සිතා එක් ලඳු කැලෑවක දමා පිටත්ව ගියහ. තෙරුන් "ශාස්තෘන් වහන්සේ බලා, වැඳ පිරිනිවන්පාන්නෙමි යයි, ආත්මභාවය ධ්‍යාන වෙළුමෙන් වෙලා අහසින්

බුදුරදුන් සම්පයට ගොස් ශාස්තෘන් වැඳ "ස්වාමීනි, පිරිනිවන්පාන්නෙමි" යයි කීහ. මොග්ගල්ලාන පිරිනිවන් පාන්නේද? ස්වාමීනි එසේය. කවර තැනකට ගොස් පිරිවන් පාන්නෙහිද? ස්වාමීනි කාලසිලා ප්‍රදේශයට ගොසිනි. එසේ වීනම් මොග්ගල්ලාන, මගේ ධර්ම කථාව කියා යන්න. එබඳු ආකාර වූ ශ්‍රාවකයාට දර්ශනයක් නැත. හෙතම ස්වාමීනි, මෙසේ කරන්නෙමි යයි, බුදුරදුන් තුළ අහසට පැන නැගී සැරියුත් තෙරුන් මෙන් පිරිනිවන්පානා දිනයේ නොයෙක් ආකාර ඍද්ධි මවා ධර්මය පවසා බුදුරදුන් වැඳ කාලශිල්ප ප්‍රදේශයට ගෙනගොස් පිරිනිවන්පෑ සේක. තෙරුන්, සොරු මරා දැමීමේ යයි යන මේ කථාව මුළු දඹදිවම පැතිරුණේය. අජාසත්ත රජු සොරුන් සෙවීම පිණිස චර පුරුෂයන් යෙදවීය. ඒ සොරුන් අතර සුරාපානය කරන්නකු සුරාපානය කොට මත්වූ කල්හි එකකු අනෙකාගේ පිටට පහරදී බිම හෙළීය. හෙතම ඔහුට තර්ජනය කරන්නේ, පින්වත් දුර්විනීත කවරකු විසින් මගේ පිටට පහරදී බිම හෙළුවේද? කිම බොල ඒ දුෂ්ටතරයා ඔබ විසින් මහා මුගලන් තෙරුන්ට පළමුව පහර දුන්නේදැයි කීවේය. කිම ඔබ මා විසින් පළමුව පහර දුන් බව නොදනිහිද? මෙසේ ඔවුන්ට මා විසින් පහර දුන්නේය, මා විසින් පහර දුන්නේ යයි කියන්නේ අසා, ඒ චර පුරුෂයෝ ඒ සියලු සොරුන් අල්ලාගෙන රජුට දැන්වූහ. රජු ඒ සොරුන් කැඳවා විචාළේය. "නුඹලා විසින් තෙරුන් මැරුවෝද? රජතුමනි, එසේය. කවරකු විසින් නුඹලා ඒ සඳහා යෙදවූවෝද? දේවයන් වහන්ස, නිගණ්ඨ ශ්‍රමණයන් විසිනි. රජු පන්සියයක් නග්න ශ්‍රමණයන් ගෙන්වාගෙන පන්සියයක් සොරුන් සමග රජ මිදුලෙහි නැබක් පමණ වලවල්වල සාරවා පැදුරුවලින් වසා ගිනි දැමීය. ඉක්බිති ඔවුන් දැවුණු බව දැන යකඩ නගුලකින් සීසා සියල්ලෝ කැබලි කැබලිවලට කරවීය. එකල භික්ෂූහු ධර්මසභාවේ කථාවක් පහළ කළහ. මහමුගලන් තෙරුන් තමන්ට නුසුදුසු මරණයකට පත්වූයේ යනුවෙනි. බුදුරදුන් වැඩමවා "මහණෙනි, කවර කථාවකින් යුක්තව සිටියේදැයි විචාරා ස්වාමීනි, මෙනම් කථාවකැයි කී කල්හි, මහණෙනි, මොග්ගල්ලාන තෙරුන්ට මේ ආත්මභාවයේ නුසුදුසු මරණයක් වූයේය. පෙර ඔහු විසින් කරන ලද කර්මයට අනුරූපමය යයි පවසා ස්වාමීනි; පෙර කරන ලද කර්මය කවරෙක්දැයි විචාරණ ලදුව එය විස්තරකොට කීවේය.

මහණෙනි, අතීතයේ බරණැස එක් කුල පුත්‍රයෙකු තෙමේම කැපීම පිසීම ආදිය කරමින් මව්පියන් පෝෂණය කළේය. ඉක්බිති ඔහුගේ මව්පියෝ, දරුව; නුඹ හුදකලාව ගෙයද, වනයෙහිද, වැඩ කරමින් සිටින්නේ ක්ලාන්ත

විය. ඔබට එක් කුමාරිකාවක් රැගෙන එමු යයි පවසා, අම්මේ, තාත්තේ නුඹලා යම්කලක් ජීවත්වන්නෙහුද? ඒ තාක් ඔබට දිවිහිමියෙන් උපස්ථාන කරන්නෙමි'යි ඔහු විසින් ප්‍රතිඤ්ඤා කරන ලද්දේ, නැවත නැවත ඉල්ලා, කුමාරිකාවක රැගෙන ගෙනාවෝය. දින කිහිපයක් උපස්ථානකොට, පසුව ඔවුන්ගේ දැකීමද, නොකැමැති යයි ඔබේ මව්පියන් සමග එකට වාසය කිරීමට නොහැකියයි, විරෝධයපා, ඔහු තමන්ගේ කථාව ගණන් නොගත් කල්හි, ඔහු පිටත නික්ම ගියකල්හි, කෙඳිකැබලිද, කැඳ පෙනද ගෙන ඒ ඒ තැන විසුරුවා ඔහු පැමිණ, මේ කිමෙක්දැයි විචාරණ කල, මේ ඔබගේ මහළු අන්ධයන්ගේ වැඩය. මේ ගේ සියල්ල කිලිටි කරමින් හැසිරෙයි. මොවුන් සමග එකට වාසය කිරීමට නොහැකිය. මෙසේ ඇය විසින් නැවත නැවත කියනු ලබන්නේ මෙබඳු ආකාර වූද, පුරණ ලද පාරමීදම් ඇති සත්වයකු, මව්පියන් සමග බිඳුණේය. ඔහු වේවා, ඔවුන්ට කළයුත්ත දන්නෙමි'යි ඔවුන්ට කවා පොවා "අම්මේ, තාත්තෙ, අසවල් නම් තැන නුඹලාගේ ඥාතීහු පැමිණීම බලාපොරොත්තුව සිටිත්. එහි යන්නෙමු'යි ඔවුන් යානාවක නංවාගෙන රැගෙන යන්නේ, වනය මැදට පැමිණි කල්හි, "පියාණනි; රැහැන්ලණුව ගන්වා ඇත්තේය. ගොනා හී වැටේ හැඟීමෙන් යන්නාහ. මේ ස්ථානයේ සොරු වාසය කරති. මම බැසගෙන හැසිරෙමි'යි පියාගේ අතෙහි නාස් ලණුවද, දී බස්සවා, යන්නේ, ශබ්දය පරිවර්තනය කොට සොරුන් සේ කෑගසන ශබ්දය කළේය. මව්පියෝ ශබ්දය අසා සොරු පැමිණියෝ යයි සංඥාවෙන් පියාණනි, සොරු පැමිණියාහ. අපි මහළු වෙමු. ඔබ තමාවම රැකගනුව යයි, කීහ. ඔහු මව්පියන් හඬන්නේම සොර පාදය නිකුත් කරමින් කොටා, මරා වනයම දමා ගසා පෙරළා ගියේය.

ශාස්තෘන් වහන්සේ මේ ඔහුගේ පෙර කර්මය පවසා "මහණෙනි, මොග්ගල්ලාන තෙරුන් මෙපමණ කර්මකොට නොයෙක් වර්ෂ සියලක්ෂ වාරයක් පමණ කල් නිරයේ පැසී එය පැසවා අවසානයේ අවසන් ආත්ම භාව සියය ගෙන මෙසේම කොටා, සුණුවිසුණු කොට මරණය මරණයට පැමිණියේය. මෙසේ මුගලන් තෙරුන් විසින් තමන්ගේ කර්මානුරූපව මරණය ලද්දේය. පන්සියයක් සොරුන් සමග පන්සියයක් දෙනා මගේ පුනා පිරිසිදු වූ අපිරිසිදු කොට ඔහුට ගැලපෙන අද්දාව මරණයම ලැබූහ. කාරණා දහයකින් සිත අපිරිසිදු වන්නේ යයි පවසා අනුසන්ධි ගළපා, ධර්ම දේශනා කරන්නේ මේ ගාථාවන් වදාළ සේක.

"දඬුවම නොසුදුසුය. කිසිවකුට වරද නොකළ රහත් කෙනෙකු
හට යම් වරදක් කරන්නේද හෙතම මතු කියවෙන
දස කරුණුවලින් එකකට පැමිණෙන්නේය.

කර්කශ වූ වේදනාවකට හෝ හානියකට හෝ ශරීර බිඳීමකට හෝ
බලවත් රෝගයකට හෝ උමතුබවට පැමිණෙන්නේය

රජුන්ගෙන් වන උපද්‍රවයකට, දරුණු දෝෂාරෝපණයකට
ඥයන්ගෙන් පිරිහීමකට හෝ භෝග සම්පත් විනාශයකට හෝ
පැමිණෙන්නේය.

නැතහොත් ගින්න ඒ පුද්ගලයාගේ ගෙය දවාලයි.
ඒ අඥානයා මරණින් මතු අපායටද පැමිණෙන්නේය
යනුවෙනි.

පවිවෙක මනුයුත්තෙතා යන ආකාරයෙන් විවේකයද හුදකලා බවද සුදුසු වන්නේය. යෝජිත ආකාරයෙන් පවත්නා ලද. **සමාධි භාවනා රතෝ** යනු ප්‍රථම ධ්‍යාන ආදී භාවනාවේ ඇලුණු, ඇලුම් කළ, **සබ්බාසවෙ** සකල ක්ලේශ ධර්මයන්. **පරික්ඛයාය** දැන අවබෝධකොට දුරුකොට **අනාසවෝ** කෙළෙස් රහිත. **විහරාමි** වාසය කරමි යන සම්බන්ධයයි.

දැන් තමන්ගේ පුණ්‍යසම්භාර වශයෙන් පූර්ව චරිතයේ ඵලය දක්වමින්, **'ධරණමපි සුගමහිරං'** යන ආදිය කීවේය. **ඉදධියා පාරමිං ගතෝ** යනු විශේෂ ඍද්ධි මවාපෑමේ කෙළවරට පැමිණි යනුයි.

අසම්මානං යනු මම ප්‍රඥා සීල සමාධි සම්පන්න වෙමි ආදි අස්මිමානයයි. **න පසසාමි** නොදකිමි යන අර්ථයයි. එයම අර්ථ දක්වමින් **"මානෝ මයහං නවිජ්ජති"** ආදිය කීවේය.

සාමණෙරෝ උපාදාය යනු සාමණේරයන් මුල්කොට සියළු භික්ෂු සංඝයාය. **ගරු චිත්තං** ගරු කළයුතු සිත් ඇති ආදර බහුමානයෙන්. **මම කරමි** යන අර්ථයයි.

අපරිමෙය්‍ය ඉතෝ කපෙප යනු මෙතැනින් අප උපන් කල්පයේ පටන් අතුරු කප් ආදි අප්‍රමාණ එක් අසංඛ්‍යයක් මත්තෙහි ලක්ෂයක් කල්ප යන අර්ථයයි. **යං කම්මං අභිනීහරිං** යනු අග්‍ර ශ්‍රාවක භාවයට

පැමිණි පුණ්‍ය සම්පත්තිය පූරණය කළෙමි. **නාහං භූමිං අනුප්පත්තෝ** යනු මම ඒ ශ්‍රාවක භූමියට පැමිණියෙමි. **ආසවක්ඛය** සංඛ්‍යාත නිර්වාණයට **පත්තෝ අස්මි** පැමිණියේ වෙමි යන අර්ථයයි. ඒ ඒ තැන පටිසම්භිදා ආදි සිවු පිළිසිඹියා ද, සෝතාපන්න ආදි මාර්ගයෝද, අෂ්ට විමොක්ෂ, ඍද්ධිවිධ ආදිය ෂට් අභිඥාවෝද මෙ මා විසින් **සච්ඡිකතා** ප්‍රත්‍යක්ෂ කරන ලදි. බුද්ධස්ස බුදුරදුන්ගේ අනුශාසනා සහිත වූ. **සාසනං** මා විසින් කරන ලදි. සිල් පිළිවෙත් පිරීම් ආදි වශයෙන් කෙළවරට පැමිණි. **ඉත්ථං** යනු මේ ආකාරයෙන් යට කියන ලද අයුරින් මෙසේ ඔහු හුදකලාව **අනොමදස්සි** බුදුරදුන්ගේ සමීපයේ තුන්වරක් විවරණ ලැබිය. කෙසේද යට කියන ලද අයුරින් සිටුකෙනෙකු වී, ඒ බුදුරදුන්ගේ සමීපයේ ලබන ලද ව්‍යාකරණ ඇත්තේ එයින් චුතවී සාමුද්‍රික නම් නාග භවනයේ උපන්නේ, ඒ බුදුරදුන්ගේ දීර්ඝායුෂ භාවයෙන් උපහාරකොට ඇරයුම්කොට ආරාධනාකොට මහත් පූඵයන් කවාපොවා මහා පූජාවක් කළේය. එදින ද බුදුරදුන් ව්‍යාකරණ කීවේය. සුදං යනු පද ආයසමා ප්‍රිය වචනයකි. **මහා මොග්ගල්ලාන** ථෙරෝ මේ අපදාන ගාථාවෙන් **අකාසිත්ථ** කළේය. **ඉති** යනු නිපාතයකි.

මෙසේ විසුද්ධජන විලාසිනී නම් අපදාන අට්ඨකථාවේ
මහමුගලන් තෙරුන්ගේ අපදාන වර්ණනාව
සමාප්ත වේ.

3.3

පදුමුත්තර යනු බුදුරදුන්ගේ ද, ආයුෂ්මත් **මහාකස්සප** තෙරුන්ගේ ද චරිතයයි. මෙයද පෙර බුදුවරුන් විෂයෙහි කරන ලද අධිකාරී ඇත්තේ ඒ ඒ භවයෙහි විපර්යාස වශයෙන් උපනිශ්‍ර වූ පින් ද, පුණ්‍ය සංසාර ධර්මයන් ද, රැස් කරන්නේ **පදුමුත්තර** භගවත්හුගේ කාලයේ **හංසවතී** නුවර **වේදේහ** නම් අසූ කෙලක් ධනය ඇති කෙළෙඹියෙකු විය. හෙතෙම බුද්ධමාමක, ධර්මමාමක, සංඝමාමක උපාසකයකු වී වාසය කරන්නේ, එක් උපෝසථ දිනයක උදැසනම රස ආහාර වළඳා, උපෝසථ අංග අධිෂ්ඨානකොට සුවඳ මල් ආදිය රැගෙන විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේ, **නිසභ** නම් තෙරුන් තෙවෙනි ශ්‍රාවක කොට, "මහණෙනි මගේ

ශ්‍රාවක භික්ෂු සංඝයා අතර ධුත සමාදානයේ **නිසභ** තෙරුන් අග්‍ර යයි" ප්‍රමුඛස්ථානයේ තැබූ සේක.

උපාසකයා ඒ අසා පැහැදුණේ, ධර්ම කථාව අවසානයේ මහජනයා නැගට ගිය කල්හි ශාස්තෘන් වහන්සේ වැඳ, "ස්වාමීනි; හෙට මගේ දානය ඉවසනු මැනැවැයි" ඇරයුම් කළේය. සැට අටදහස් භික්ෂූන් සමඟ, ස්වාමිනී එක සාමණේරයකුදු විහාරයේ නොතබා සියල්ලෝ මගේ දානය පිළිගනිවු' යයි කිවේය. බුදුරදුන් ඉවසා වදාළ සේක උපාසකයා, බුදුරදුන් ඉවසා වදාළ බව දැන ගෙට ගොස් මහාදානයට සරසවා 'දෙවන දිනයේ බුදුරදුන්ට කාලය දැන්වූ සේක බුදුරදුන් පා පිවුරුගෙන භික්ෂු සංඝයා පිරිවරා උපාසකගේ ගෙදරට ගොස් පනවන ලද ආසනයේ වැඩ හුන්නේ දක්ෂිණාව අවසානයේ කැඳ ආදිය පිළිගන්වන්නේ, බත නිමාවට පත් කළේය. උපාසකයාද ශාස්තෘන් සමීපයේ හුන්නේය.

එසමයෙහි **මහා නිසභ** තෙරුන් පිඬු පිණිස හැසිරෙන්නේ එම විථියටම පිළිපන්නේය. උපාසකයා දැක නැගිට ගොස් තෙරුන් වැඳ, "ස්වාමිනි; පාත්‍රය දෙනු මැනැවැ"යි කීවේය. තෙරුන් පාත්‍රය දුන් සේක. "ස්වාමිනි; මෙතැනටම වඩිනු මැනැවි. ශාස්තෘන් වහන්සේ ද ගෙදර වැඩ සිටිති. උපාසකය නොවටින්නේය. ඔහු තෙරුන්ගේ පාත්‍රය රැගෙන පිණ්ඩපාතය පුරවා උන්වහන්සේට දුන්නේය. ඉක්බිති තෙරුන් ටික දුරක් ගොස් නතරවූයේ, බුදුරදුන් සමීපයේ හිඳ මෙසේ කීවේය. **'මහානිසභ** තෙරුන්ද, ස්වාමිනි ගෙදර වැඩ සිටින්නේ යයි කී කල්හි, පිවිසීමට නොකැමැති වෙයි. උන්වහන්සේට ඔබවහන්සේට වඩා වැඩි ගුණයක් ඇද්දේ බුදුවරුන්ගේ වර්ණයෙහි මසුරුකමක් නම් නැත. එහෙයින් ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළ සේක. උපාසකය; අපි භික්ෂාවගමන කාලයේ ගෙදර වැඩ සිටිමු. ඒ භික්ෂුව එසේ වැඩ නොසිට භික්ෂාව පිළිගනියි. අපි ගම් සෙනසුනේ වාසය කරමු. උන්වහන්සේ අරණ්‍යයේ වාසය කරති. භාග්‍යවත්හු මේ මේ දේ ඔහුගේ ගුණ යයි, මහා සමුද්‍රය පුරවන්නාක් මෙන් ඔහුගේ ගුණ දැක්වූ සේක.

උපාසකයා ද, ස්වභාවයෙන්ම දිළිසෙන ඇවිලෙන පහනට තෙල් ඉසින්නාක් මෙන් මැනවින් පැහැදුණේ වී, මෙසේ සිතුවේය. මගේ වෙනත් සම්පතක් කුමටද?

මම අනාගතයේ එක් බුදුවරයෙකුගේ සමීපයේ ධුතංගධාරීන් අතර අග්‍ර තනතුර ප්‍රාර්ථනා කරන්නෙමි. උන්වහන්සේ යළිත් බුදුරදුන් නැමැද ඒ අයුරින්ම දින හතක් මහ දන්දී, සත්වෙනි දිනයේ බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට චීවර පූජාකොට, ශාස්තෘඃපාද මූලයේ වැඩහිඳ මෙසේ කීය. "යම් බදු මා විසින් සත් දවසක් දන්දෙනු ලබන්නේ, මෛත්‍රී කායකර්මයද, මෛත්‍රී වචී ධර්මද, මෛත්‍රී මනෝ කර්මද, පිහිටුවන ලදිමි. මේ අයුරින් මම වෙනත් දේව සම්පත්තියක් හෝ ශක්‍ර මාර බ්‍රහ්ම සැපතක් හෝ ප්‍රාර්ථනා නොකරමි. මේ මගේ ප්‍රාර්ථනාව අනාගතයේ එක් බුදුවරයෙකු සමීපයේ **මහානිසභ** තෙරුන් විසින් ප්‍රාර්ථනා කරන ලද තනතුරට පැමිණෙනු පිණිස ධුතංගධාරීන් අතර අග්‍ර තනතුර ලැබේවා යනුයි. "ශාස්තෘඃන් වහන්සේ, මහත් වූ මේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේද නැද්දැයි, බලන්නේ, සමෘද්ධ වන බව දැන මෙසේ කීය. "ඔබගේ ප්‍රාර්ථනාව තනතුර මනාපය. අනාගතයේ කල්ප ලක්‍ෂයක් අවසානයේ **ගෝතම** නම් බුදුරදුන් උපදින්නාහ. ඔබ උන්වහන්සේගේ තෙවෙනි ශ්‍රාවක වූ මහා කස්සප නම් තෙරුන් වහන්සේ යයි විවරණ දුන් සේක. ඒ අසා උපාසකයා බුදුවරුන්ගේ කථා දෙකක් නම් නැත. දෙවෙනි දිනයේ ප්‍රාර්ථනා කළ දෙයක් මෙන් ඒ සම්පත් දැනගත්තේය. හෙතම ආයු ඇති පරිදි දන් දී සිල්රැක නොයෙක් ආකාර පින්කම්කොට කලුරිය කොට දෙව්ලොව උපන්නේය.

එතැන් පටන් දෙව් මිනිසුන් අතර සම්පත් අනුභව කරමින් මෙයින් කල්ප අනූඑකක් මත්තෙහි **විපස්සී** සම්බුදුරදුන් **බන්ධුමතී** නගරය ඇසුරුකොට **ක්‍ෂේම** වූ **මිගදායේ** වාසය කරන්නේ, දෙව්ලොවෙන් චුතව එක්තරා වැහැරීගිය බ්‍රාහ්මණ කුලයෙක උපන්නේය. එකල **විපස්සී** බුදුරදුන් සත්වෙනි අවුරුද්දේ ධර්ම දේශනා කළ සේක. මහත් කෝලාහලද විය. සියලු දඹදිව දේවතාවෝ "බුදුරදුන් දහම් දේශනා කරන සේකැ"යි දැනුම් දුන්හ.

බ්‍රහ්මණයා ඒ අස්න ඉවසීය. ඔහු පළඳින එකම සළුව විය. බැමිණිය ද එසේමය. දෙදෙනාටම එකම පොරෝනයක් විය. ඔහු මුළු නගරයේ **ඒකසාටක බ්‍රාහ්මණයා** යයි ප්‍රකට විය. ඒ බමුණා **කිසියම්** ක්‍රියාවක් සඳහා බ්‍රාහ්මණයන් අතරට යන්නේ නම් බැමිණිය ගෙදර නවතා තෙමේ ඒ වස්ත්‍රය පොරවා ගෙන යයි. බැමිණිය එසේ යන කල්හි තෙමේ ගෙදර සිටියි. බැමිණිය ඒ වස්ත්‍රය පොරවා ගෙන යයි.

එදවස හෙතම බැමිණියට කීවේය; පින්වතිය කිම නුඹ රාත්‍රියේ බණ අසන්නීද? නැතහොත් දවල් කාලයේද? ස්වාමිය; මම ස්ත්‍රියකි. රාත්‍රියේ බණ ඇසීමට නොහැකි වෙමි දවල් අසන්නෙමි. ඇය බමුණා ගෙදර තබා වස්ත්‍රය පොරවාගෙන උපාසිකාවන් සමඟ විහාරයට ගොස් ශාස්තෘන් වැඳ එකත්පසක හුන්නී බණ අසා උපාසිකාවන් සමඟ ආවාය.

ඉක්බිති බමුණා, ඇය, ගෙදර තබා, ඒ වස්ත්‍රය පොරවාගෙන විහාරයට ගියේය. ඒ වේලාවේ බුදරද පිරිස මැද අලංකාරවූ ධර්මාසනයේ වැඩ හුන්නේ, විසිතුරු විජිනිපත ගෙන අහස් ගඟෙන් බසින්නාක් මෙන් සිනේරු පව්වේ සිට සාගරයට කිමිදෙන්නාක් මෙන් බණ කථා වදාළ සේක. බ්‍රාහ්මණයාට පිරිස කෙළවර හුන්නේ බණ අසනවිට පළමු යාමයේදීම මුළු සිරුරට පුරවනු ලබන්නාක් මෙන් පස්වනක් ප්‍රීතිය හටගත්තේය. ඔහු පොරවන ලද වස්ත්‍රය ඉවතට ගෙන දසබලවූ බුදුරදුන්ට දෙන්නෙමි'යි සිතුවේය. ඉක්බිති ඔහුට එහි ආදීනව දහසක් පෙනෙන්නේ මසුරුකම හටගත්තේය. 'බැමිණියටද ඔබටද එකම වස්ත්‍රයකි. අන්කිසි පොරෝනාවකුදු නැත. නොපොරවා පිටත නික්ම යාමද නොහැකි වෙයි. සියලු අයුරින් නොදෙනු කැමැත්ත විය. ඉක්බිති ඔහුට පළමු යාමය මධ්‍යම යාමද නික්මෙන කල්හිද ප්‍රීතිය උපන්නේය. ඔහු 'මරණය හෝ වේවා! නොමැරීම හෝ වේවා! පසුව දැනගන්නෙමි' එදින හෙතම මසුරුකම දිනා වස්ත්‍රය ඉවතට ගෙන ශාස්තෘ පාදමූලයේ තැබීය. ඉක්බිති වම් අතින් වහගෙන දකුණු අතේ හකුළුවාගෙන මා විසින් දිනන ලදී. මට නදිය තරණය කිරීමට දිනන ලදී.

එසමයේ බන්ධුමා රජු ධර්මාසනයෙන් පසුපස කෙළවර සිටින්නේ බණ අසයි. රජුගේ මා දිනන ලදී යන ශබ්දයට අමනාප වෙයි. රජු මිනිසකුට අණ කළේය. බොල යව! මෙය විචාරව. ඔහු කුමක් කියයිද. බමුණා එතැනට ගොස් විචාරණ ලද්දේ, අවශේෂ ඇත් යානාදියට නැග කඩු සම් ආදිය ගෙන සතුරු සේනාව දිනත්. එය ආශ්චර්යක් නොවේ. මම වනාහි පසුව එන්නවුන් කුළු ගොනාගේ හිස මුගුරෙන් බිඳ පලන්නාක් මෙන්, මසුරු සිත් දිනා පොරවන ලද වස්ත්‍රය බුදුරදුන්ට දුන්නෙමි. එවිට මට දිනන ලද මසුරුකම ආශ්චර්යක් යයි' කීවේය.

ඔහු ගොස් ඒ පුවත රජුට දැන්වීය. රජු "බොල; අප විසින් දසබලයන්ට, සුදුසු දෙය නොදනිමු. බමුණා දනියි යයි ඔහුට පැහැදී,

වස්ත්‍ර යුගලයක් යැවීය. එය දැක බමුණා සිතුවේය. "රජු මගේ නිශ්ශබ්දව සිටින විට පළමුව කිසිවක් නොදී, ශාස්තෘ ගුණ කියන්නාට දුන්නේය. ශාස්තෘ ගුණ නිසා මෙය හටගත්තේය. ශාස්තෘන් වහන්සේටම සුදුසු වන්නේය. ඒ වස්ත්‍ර යුග්මයද, බුදුරදුන්ට දුන්නේය. රජු, බමුණා විසින් කුමක් කරන ලද්දේදැයි අසා, වෙනත් වස්ත්‍ර යුගලයක්ද යැවීය. ඔහු ඒවාද බුදුරදුන්ට දුන්නේය. රජු, බමුණා විසින් කුමක් කරන ලද්දේදැයි අසා, වෙනත් වස්ත්‍ර යුගලයක්ද යැවිය. ඔහු ඒවාද බුදුරදුන්ට දුන්නේය. නැවත රජු වෙනත් සතරක්ද, මෙසේ වැඩිකොට තිස්දෙකක් දක්වා වස්ත්‍ර යුගල යැවීය.

ඉක්බිති බමුණා "මෙය වැඩිකොට වැඩිකොට ගත්තාක් මෙන් වෙයි" යයි තමන්ට වැඩපිණිස, එකක් බැමිණියටද, එකක් තමන්ට දැයි දෙකක් වස්ත්‍ර යුගල ගෙන තිස් යුගලයක් බුදුරදුන්ට දුන්නේය. එතැන් පටන් හෙතෙම බුදුරදුන්ගේ විශ්වාසවන්ත බව හටගත්තේය. ඉක්බිති ඒ රජ තෙම එක දවසක් සීත කාලයේ බුදුරදුන් සමීපයේ බණ අසන්නා වූ ලක්ෂයක් පමණ තමන්ගේ රතු කම්බිලිය පොරවා සිටිනු දැක කීවේය "මෙතැන පටන් මෙය පොරවාගෙන බණ අසනු" හෙතම, මට රතු කම්බිලියෙන් මේ කුණුකය පෙරවීමෙන් කුමන ඵලයක් දැයි සිතා ඇතුළත ගඳ කිළියේ තථාගතයන්ගේ ඇඳ මත්තෙහි වියනක් කොට ගියේය.

ඉක්බිති එක්දිනක් රජු උදෑසනම විහාරයට ගොස් ඇතුළත ගඳකිළියෙහි බුදුරදුන්ගේ සමීපයේ හුන්නේය. එසමයේ සවණක් බුදුරජ්ස් කම්බිලියේ ප්‍රතිරාව නැංවෙති. කම්බිලිය අතිශයින් බබළයි. රජු බලන්නේ, දැනගෙන මෙසේ කීවේය. "ස්වාමිනි මේ අපගේ කම්බිලියයි. අප විසින් ඒකසාටක බමුණාට දෙන ලද්දකි." "මහරජ; නුඹලා විසින්ද, බ්‍රහ්මණයා පුදන ලද්දේය. බමුණා විසින් මා පුදන ලදී. රජු "බමුණාං" සුදුස්සක් දන්නා ලදී. අපි නොවේ යයි පැහැදී යම් මිනිසුන්ට උපකරණයක් වේද, සියල්ල අටපරිදි කොට **'සබ්බටික'** නම් දානය දී, පුරෝහිත තනතුරේ තැබිය. ඔහුද, අට්ඨවීටක යනු සැටහතරක් වේයයි, සැටහතරක් සලාක බත් පිළියෙළ කරවා, දිවි ඇති තෙක් දන් දී, සිල් රැක, ඉන් චුතව දෙව්ලොව උපන්නේය.

නැවත එතැනින් චුතව මේ කල්පයෙහි භාග්‍යවත් කෝණාගමන බුදුරදුන්ගේද, භාග්‍යවත් කස්සප බුදුරදුන්ද දෙදෙනා අතර බරණැස කෙළෙඹි

කුලයක උපන්නේ, වැඩිවිය පැමිණ ගෘහවාසයේ වසන්නේ, එක් දවසක් ආරණ්‍යයේ සක්මන්මළුවේ හැසුරුණේය. එසමයේ පසේබුදුවරයකු ගංතෙර සිවුරුකම් කරන්නේ, සිවුරුපටිය ඉවත් කිරීමට සුදානම් වෙමින් සිටියේය. "සිවුරු පටිය නොහොබිණේද, ස්වාමිනි; මෙයින් කරවුයයි උතුරු සළුවද, උපනුපන් ආත්ම භාවය මට කිසියම් හානියක් නොවේවා"යි ප්‍රාර්ථනා කළේය.

ඔහුගේ ගෙදර නැගණිය සමඟ බිරිඳ කෝලාහල කරන්නී, පසේබුදුරද පිඬු පිණිස පිවිසි සේක. ඉක්බිති ඔහුගේ නැගණිය පසේබුදුරදුන්ට පිණ්ඩපාතය දී, ඔහුගේ බිරිඳ සඳහා මෙබඳු ආකාර බාලයන් යොදුන් සියගණනින් දුරුකළ යුතු වන්නේයයි ප්‍රාර්ථනා කළාය. ඇය ගෙදර මිදුලේ සිටියේ, එය අසා, මෑ විසින් දෙන ලද බත නොවළඳවායි, පාත්‍රය ගෙන බත් ඉවත්කොට, මඩ පුරවා දුන්නේය. අනෙකා දැක, "බාල තැනැත්තිය; මට අක්‍රෝෂ කොට හෝ පහරදීම හෝ මෙබඳු ආකාර වැඩ අසංඛ්‍ය දෙකක් පුරණ ලද පාරමී ඇත්තේ පසේබුදු කෙනෙකුගේ පාත්‍රයෙන් බත් ඉවත්කොට මඩ පුරවා දීමට නුසුදුසු"යයි කීවාය. ඉක්බිති ඔහුගේ බිරිඳට කළකිරීමක් ඉපදුණි. ඇය; "ස්වාමිනි, පොඩ්ඩක් සිටින්නැ"යි, මඩ ඉවත්කොට, පාත්‍රය සෝදා, සුවඳ සුණුවලින් පිරිමැද, ප්‍රණීත බතට වතුමධුර පුරවා මත්තෙහි පියුම් ගැබක වර්ණයෙන් යුතුව ඉසින ලද ගිතෙලින් බබළන්නා වූ පාත්‍රය, පසේ බුදුරදුන්ගේ අතේ තබා යම්සේ මේ පිණ්ඩපාතය බබළන්නේ වේද, මෙසේ මගේ ශරීරයද බබළවා'යි ප්‍රාර්ථනා කළාය. පසේ බුදුරදුන් අනුමෝදනාකොට අහසට පැන නැංගේය. ඒ යුවල දිවි ඇතිතෙක් සිට, ඉන් චුතව ස්වර්ගයේ උපන්හ. යළි එතැනින් චුතව, උපාසකව, කස්සප බුදුරදුන්ගේ කාලයේ බරණැස් නුවර අසූකෙළක් ධනසම්පත් ඇති කුලයක උපන්නේය අනෙකාද එබඳු ආකාර සිටුවරයෙකුගේ දියණියක වී උපන්නීය. ඔහු වැඩිවිය පැමිණි කල්හි සිටු දියණියක රැගෙන ආහ. ඇගේ පෙර අනිටු විපාකදායක පාපකර්මයේ ආනුභාවයෙන් පතිකුලයට පිවිසෙන්නාවූ කල, එළිපත්තේ පටන්, මුළුගෙයම උදුරණ ලද වැසිකිළියක මෙන් දුගඳක් හටගත්හ. කුමරු "මේ කවර ගඳක් දැයි විචාරා, සිටු කන්‍යාවියකගේ යයි අසා, බැහැර කරවු, ඇය ඇගේ ගෙදරටම බැහැර කරවු! යයි, කුලගෙදරට යැවීය. ඇය එසේ බැහැර කරන්නේ ස්ථාන හතක නතරවූවාය.

එසමයේ **කස්සප** බුදුරදුන් පිරිනිවන්පෑ සේක. ඔහුගේ දහසක්

අනර්ඝ වූ රත්වන් වූ යොදුන් අටක් උසවූ දාගැබක් සැදීමට පටන් ගත්හ. ඒ චෛත්‍යය කරවන කල්හි ඒ සිටු දියණිය සිතුවාය. මම ස්ථාන හතක පෙරළා නැවති සිට, කිමෙක්ද මගේ මේ ජීවිතය. තමන්ගේ ආභරණාදිය ගලවා දමා රන්වන් අටැස් කොටුවක් කරවූවාය. රියනක් පළල, වියනකුත් අඟල් සතරක් උසවූ එසේම හරිතවර්ණ මනෝහිරියැල් පිඬක් ගෙන පිපුණු උපුල්මල් අටක් අතට ගෙන චෛත්‍යය කරවන ස්ථානයට ගියාය. එකෙණෙහි එක් ගඩොල් උලු වටකොට පැමිණෙන්නාවූ ගැටීම් අඩු කරයි. සිටු දියණිය වඩුවාට කිවාය. මේ මගේ ගඩොල මෙහි තබාවා! දරුව, යහපත් කාලය පැමිණ තිබේ. තෙමේම තබවා ඇය නැග තෙල්වලින් කොල මනෝහිරියල් පිඬට යොදා, ඒ බැම්මෙන් ගඩොල බැඳ, මත්තෙහි උපුල් මල් අටමිටකින් පූදා, වැඳ, උපනුපන් ආත්මභාවයක මගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමාවා! මුඛයෙන් මානෙල් මල්සුවඳ වේවා'යි ප්‍රාර්ථනා කොට දාගැබට වැඳ ප්‍රදක්ෂිණ කොට ගෙට ගියාය.

එකෙණෙහි, යස කුලපුත්‍රයන්ගේ පළමු පළමු ගෙදරට එලඹියාය. ඔහුට එය අරබයා සිහිය පහළ විය. නගරයේද නැකැත්කෙළි හටගත්තේ වෙයි. ඔහු උපස්ථායකට කීවේය. "එදා මෙහි රැගෙන ආවා වූ කුලදුවණිය කොහිද?" "ස්වාමිනි, කුල ගෙදරයි." "ඇය රැගෙන එවූ. නැකැත් ක්‍රීඩාව කරන්නෙමි." ඔවුහු ගොස්, ඇයට වැඳ, "දියණියනි; දරුවා, කුමක් නිසා ආවේද?" ඇගෙන් විචාරණ ලදුව, ඇයට ඒ පුවත කීවාහුය "පියාණනි, මා විසින් ආභරණ භාණ්ඩවලින් චෛත්‍යය පුදන ලදී. මට ආභරණ නැත. ඔවුහු ගොස්, සිටුපුත්‍රයාට දැන්වූහ. ඇය රැගෙන එවූ. පළඳනා ලැබෙන්නේ යයි ඔවුහු ඇය රැගෙන ආහ. ඇය ගෙට පිවිසෙන කල්හි මුළු ගෙදරම සඳුන් සුවඳද, මානෙල් සුවඳද හැමුවාය. සිටුපුත්‍රයා ඇගෙන් විචාළේය. සොඳුර, ඔබගේ ශරීරයෙන් පළමුව, දුර්ගන්ධය හැමුවාය. දැන් ඔබේ සිරුරින් සඳුන් සුවඳද මුඛයෙන් මානෙල් සුවඳද හමයි. මේ කුමක් නිසාද? ඇය මුල පටන් තමන් විසින් කරන ලද කර්මය දැනුම් දුන්නාය. සිටු පුත්‍රයා, බුද්ධ ශාසනය 'වෙනස් නොවේ යයි පැහැදී, යොදුනක් ප්‍රමාණයේ රන් දාගැබක්, කම්බිලි සැට්ටයකින් වසා, ඒ ඒ තැන රථචක්‍රයක ප්‍රමාණයේ රන් පියුම්වලින් අලංකාර කළෝය. ඒවා දොළොස් අතකින් එල්ලී සිටි.

ඔහු එහි ආයුෂ ඇති පරිදි සිට එතැනින් චුතව දෙව්ලොව උපදී, නැවත, එතැනින් චුතව බරණැසින් යොදුනක් පමණ තැන එක්තරා ඇමති කුලයක උපන්නේය. ඔහුගේ බිරිඳ ද දෙව්ලොවින් චුතව රාජකුලයේ

ජ්‍යෙෂ්ඨ රාජ දියණියක වී උපන්නීය. ඔවුන් වැඩිවිය පැමිණි කල්හි, කුමරු වසන ගම නැකැත් කෙළිය හටගත්තේය. ඔහු මවට කිවේය; "මැණියනි; මට සළුවක් දෙන්න. නැකැත්කෙළිය කරන්නෙමි. ඇය සෝදන ලද වස්ත්‍රයක් ගෙනවුත් දුන්නේය. 'මෑණියනි, මෙය ඉතා කුඩාය කීවාය. ඇය අනෙකක් ගෙනවුත් දුන්නේය. ඔහු එයද ප්‍රතික්ෂේප කළේය. ඉක්බිති හේ මවට කීවේය. පියාණනි, ගෙදර තිබුණු දෙයක් මා විසින් දෙන ලදී. අපට මෙය සියුමැලි වූ පුණ්‍ය ප්‍රතිලාභයකි. එබැවින් එය ලැබෙන තැනකට යම් මැණියනි යයි කීවේය. පුත්‍රය; මම අද ඔබව බරණැස් නගරයේ රාජ්‍ය ප්‍රතිලාභය කැමති වෙමි ඔහු මවට වැඳ මැණියනි; යමි; කීවේය. "දරුව යව, ඔහු පුණ්‍ය මහිමයෙන් නික්ම බරණැසට ගොස් උයනේ මඟුල් ගල්තලාවේ හිස සහිතව පොරවාගෙන හොත්තේය.

ඒ බරණැස් රජුගේ කළුරිය කිරීමෙන් සත්වෙනි දිනය වෙයි. 'ඇමතියෝ රජුගේ ශරීර කටයුතු කොට, රජ මිදුලේ රැස්වී සාකච්ඡා කළහ. රජුගේ එකම දියණියක ඇත. පුතකු නැත. ආරාජික රාජ්‍යය නැසෙන්නේය. කවරකු රජ වීමට සුදුසුද, නුඹ වෙන්න. ඔබ රජ වෙන්නැයි, පුරෝහිතයා කිවේය 'බොහෝ දෙයක් බැලීමට නොවටී. මංගල රථය සරසවන්නෙමු. ඔවුනු කුමුදුවර්ණ වූ සතර සෛන්ධවයන් යොදවා පස්වැදෑරුම් රාජ කකුධ භාණ්ඩද, සුදු කුඩයක්ද එහි තබා, රථය සරසවා, පසුව තූර්යවාදක වාදනය කළහ. රථය නැගෙනහිර දොරටුවෙන් නික්ම උයනට අභිමුඛව ගියේය. එය නවත්වමුයි කිසිවකු කීහ. පුරෝහිතයා එය නොනවත්වවු! යයි කිවේය. රථය ගොස් කුමරු ප්‍රදක්ෂිණා කොට අලංකාරව නැගී සිටියේය. පුරෝහිතයාද පොරවණ ලද කණ ඉවත්කොට පාද තලය බලමින් මේ දිවයින පවතීවා! දෙදහසක් පිරිවර දිවයින්ද සතර මහද්වීපවලද මෙතම රාජ්‍යය කරවීමට සුදුසුයයි පවසා, තූර්යනාද කරවු යයි, තුන්වරක් තූර්යනාද කරවූහ. ඉක්බිති කුමරු මුව විවර කොට බලන්නේ, "කවර කර්මයකින් මෙහි ආවේදැ"යි කීවේය. "දේවයනි; ඔබගේ රාජ්‍යයට පැමිණියේ" යයි, රජු තොප කොහේද? ස්වාමිනි, දේව ආත්මයක දින කිපයක් ඉක්මවත්ද අද සත්වෙනි දිනයයි. පුතෙකු හෝ දුවණියක නැද්ද? දේවයන් වහන්ස දියණියක ඇත. පුතකු නැත. එසේ වීනම් රාජ්‍යය කරන්නෙමි.

ඔවුහු එකෙණෙහි, අභිෂේක මණ්ඩපයේම කරවා, රාජ දියණිය සියලු අලංකාර වලින් අලංකාරකොට උයනට රැගෙන ගොස්, කුමරුගේ අභිෂේකය කළහ. ඉක්බිති ඔහුගේ කරන ලද අභිෂේකය

ඇත්තේ ලක්ෂයක් අගනා වස්ත්‍රයක් පිරිනැමූහ. ඔහු මේ කිමෙක්ද පියාණනි කීවේය. දේවයන් වහන්ස; පොරවණ වස්ත්‍රයකි. පියාණනි; මහත් නොවේද? මිනිසුන් පරිභෝග කරන වස්තුවල මීට වඩා සියුම් බවක් නැත රජතුමනි, නුඹලා පින් කැමැත්තෝ නොසිතයි. රත්රන් කෙණ්ඩිය රැගෙන එව. වස්ත්‍රයක් ලබන්නෙමි. රත්රන් කෙණ්ඩිය ගෙන්වාගෙන නැගී සිට අත් සෝදා මුඛ පිරිසිදුකොට අතින් ජලය ගෙන පෙරදිග දිශාවට වත්කළේය. සන පොළොව බිඳී කල්ප වෘක්ෂ අටක් පැන නැංගාහ. නැවත ජලය ගෙන දකුණු, උතුරු නැගෙනහිර දිශාවන්හි මෙසේ සතර දිශාවල වත්කළේය. ඔහු එක් දිව්‍ය වස්ත්‍රයක් හැඳ එකක් පොරවා **නන්දිය** රජුගේ රාජ්‍යයෙහි නූල් කටින්නාවූ එම ස්ත්‍රීහු නුල් නොකටීවුමාවායි, මෙසේ බෙරහඬ නංවාලුවායි පවසා කොඩියක් ඔසවා අලංකාරයෝ කරන ලද ඇතුන් පිරිවරණ ලද්දේ, නගරයට පිවිස ප්‍රාසාදයට නැග මහත් සම්පත් අනුභව කළෝය.

මෙසේ කාලය ගෙවීයන්නේ දේවිය, රජුගේ සම්පත් දැක, 'අහෝ ඒකාන්තයෙන් තපස් ඇත්තිය' යයි කරුණාවන්ත බව දැක්වීය. දේවිය මේ කිමෙක්දැයි විචාරණ ලදුව දේවයන් වහන්ස ඔබගේ සම්පත් ඉතාම මහත්ය. අනිත් බුදුවරුන් අදහා කරන ලද යහපත් ඵල ඇත්තේ දැන් අනාගතය උදෙසා පින් නොකරවු'දැයි කීවේය. කවරෙකුට පෙන්වන්නෙමුද? සිල්වත්හු නොමැත දේවයන් වහන්ස. ජම්බුද්වීපය රහතුන් කෙරෙන් ශූන්‍යයි. දේවයන් වහන්ස, නුඹලා දාන පිළියෙල කරවු. මම රහතුන් ලබමියි කීවේය. දෙවන දිනයේ රජතුමා නැගෙනහිර දොරටුවේ දානයක් පිළියෙල කරවිය. දේවිය උදෑසනින්ම උපෝසථ සීලය අධිෂ්ඨානකොට ප්‍රාසාද මතුයෙහි, ඉදිරියට මුහුණලා උරහිසින් හොවා, 'ඉඳින් මේ දිශාවේ රහතන් ඇත්ද? හෙට පැමිණි අපගේ භික්ෂාව පිළිගනීවා! යනුවෙන් කීවේය. ඒ දිශාවේ රහතුන් නොවූහ. යාචකයන්ට සත්කාර කළහ. දෙවැනි දිනයේ දක්ෂිණ දොරටුවේ සරසා එසේම දක්ෂිණාව නොලැබූහ. ඊළඟ දිනයේද එසේම විය.

උතුරු දොරටුවේ පිළියෙළ කළ දිනයේ දේවිය විසින් එසේම ඇරයුම් කොට හිමාලයෙන් වාසය කරන **පදුමවතී** ගේ පුත්‍රයන් වූ පන්සියයක් පසේ බුදුවරුන්ට ජ්‍යෙෂ්ඨ වූ මහාපදුම පසේබුදුරද සොයුරන්ට ආමන්ත්‍රණය කළහ නිදුකාණනි, **නන්දිය රජ** ඔබට ආමන්ත්‍රණය කරයි. ඔහුගේ දානය ඉවසමු. ඔවුහු ඉවසා **අනෝතප්ත විලෙන්** මුව සෝදා

අහසින් ගොස් උතුරු දොරටුවට බැස්සාහ. මිනිස්සු දැක ගොස් දේවයන් වහන්ස; පන්සියයක් පසේ බුදුවරු පැමිණියාහ යයි රජුට දැන්වූහ. රජු සමඟ දේවිය ගොස් වැඳ, පසේ බුදුවරුන් ප්‍රාසාදයට නංවා, එහි ඔවුන්ට දන් දී කරන ලද බත් කිස අවසානයේ රජු සංඝ තෙරුන්ගේද, දේවිය සංඝ නවකයන්ගේද පා මුල වැටී, 'ස්වාමිනි, ආර්යයනි; ප්‍රත්‍යවලින් ක්ලාන්ත නොවන්නාහ. අපිද පිනෙන් නොපිරිහෙන්නෙමු, අපට දිවි ඇතිතෙක්, මෙහි වාසය පිණිස ප්‍රතිඥා දෙව' යයි ප්‍රතිඥා කරවා, උයනේ පන්සියයක් පන්සල් පන්සියයක් සක්මළුද, සියලු ආකාරයෙන් වාසය කරන ස්ථාන සපයා, එහි වාසය කළහ. මෙසේ කාලය ඉක්මවායන කල්හි, රජුගේ අතවැසියා කිපුණේය. රජ 'මට' අන්තේවාසිකයා සංසිඳවීමට යමි' නුඹ පසේ බුදුවරුන් විෂයෙහි අප්‍රමාද වවු යයි දේවියට අවවාද දී ගියේය. ඔහු නොපැමිණි කල්හි, පසේ බුදුවරුන්ගේ ආයුසංස්කාර ක්ෂය වී මහාපදුම පසේ බුදුරද, තුන්යම රාත්‍රියක් අවදි වී සිටියේම අනුපාදිශේෂ නිර්වාණධාතූන් පිරිනිවන් පෑ සේක. මේ අයුරින් සෙසු සියල්ලෝම පිරිනිවන් පෑහ.

ඊලඟ දිනයේ දේවිය, පසේ බුදුවරුන් වැඩ හිඳිනා තැන සරසවා මල් විසුරුවා, දුම්ගෙයි වාසය කොට, ඔවුන්ගේ පැමිණීම බලමින් හුන්නේ එන බව දැක, මිනිසුන් යැවීය. 'දරුවනි, යවු ! දැනගෙන එවු, ආර්යයන්ට කුමන අපහසුවක්ද යනවග. ඔවුහු ගොස් මහාපදුම පසේ බුදුරදගේ පන්සලේ දොරටුව විවෘතකොට එහි උන්වහන්සේ නොදකින්නේ, සක්මනට ගොස් එල්ලෙන පුවරුව ඇසුරුකොට හිඳිනා බව දැක වැඳ, 'ස්වාමිනි කාලය' යයි කීහ. පිරිනිවන් පෑ ශරීරය කුමක් කරාකරන්නේද, ඔවුහු "නිදාගෙන ඇතැයි පවසා, පිටිපතුල අතින් පිරිමැද පාදයන්ගේ ශීතල බව දැන, 'තදබවද දැන පිරිනිවන් පෑ බව දැන, රජගෙදරට ගියහ. "දරුවනි පසේ බුදුවරු කොහේද' විචාරණ ලදුව දේවියනි; පිරිනිවන්පෑහ"යි කීවානුය. දේවිය අඬන්නි, වැලපෙන්නි නික්ම ගොස්, නාගරිකයන් සමඟ එහි ගොස් යහපත් කිළියක් කරවා පසේබුදුවරුන්ගේ ආදාහන කටයුතුකොට, ධාතු ගෙන්වාගෙන චෛත්‍යයක් පිහිටුවිය. රජු අතවැසියා සංසිඳවා පැමිණියේ, පෙරගමන් ආවාවූ, දේවියගෙන් විචාළේය, සොඳුර; කුමක්ද? නුඹ පසේ බුදුවරුන් විෂයෙහි ප්‍රමාද වූයෙහිද? "ආර්යයන් වහන්සේලා නිරෝගීද? දේවයන් වහන්ස පිරිනිවන්පෑහ. ඒ අසා රජු සිතුවේය. මෙබඳු ආකාර පණ්ඩිතයන්ටද මරණය උපදියි. අපට කවර මෝක්ෂයක්ද? ඔහු නගරයට නොපිවිස උයනටම ගොස් ජ්‍යෙෂ්ඨ පුත්‍රයා

කැඳවා ඔහුට රාජ්‍යය පිළියෙළකොට දී, තෙමේ ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි විය. දේවියද, රජු පැවිදි වූ කල්හි මා කුමක් කරන්නෙමිද? එසේම උයනට ගොස් පැවිදි වූවාය. දෙදෙනාම ධ්‍යාන ඩබා ඉන් චුතව බ්‍රහ්මලෝකයේ උපන්නාහ.

ඔවුහු එහි වාසය කරන කල්හි, අපගේ ශාස්තෘන් වහන්සේ ලොව ඉපිද, පවත්වන ලද උතුම් ධර්ම චක්‍රය ඇත්තේ අනුපිළිවෙළින් රජගහ නුවරට පිවිසි සේක. ශාස්තෘන් වහන්සේ එහි වාසය කරන කල්හි, මේ **පිප්පිලී** මානවකයා මගධ රටේ **මහාතිත්ථ** බමුණුගම **කපිල** බ්‍රාහ්මණයාගේ බිරිඳගේ කුසෙහි උපන්නේය. මේ බිරිඳ **කාපිලානි** මද්ද රටෙහි **සාගල** නුවර **කෝසියගොත්ත** බ්‍රාහ්මණයාගේ බිරිඳගේ කුසෙහි උපන්නීය. ඔවුන් අනුපිළිවෙළින් වැඩෙනු ලබන්නේ, **පිප්පලි** මානවකයාට අවුරුදු විස්සේදී ද භද්‍රාවට සොළොස් වියේදීද සපැමිණි කල්හි මව්පියෝ පුතු බලා, "දරුව නුඹ වැඩිමහලු වූයේ කුලවංශයේ පිහිටුවීම සුදුසු යයි, අතිශයින් නොපෙළවුද, මානවකයා කීවේය. "මගේ කණට ඇසෙනසේ මෙබඳු ආකාර කථා නොපවසවු" මම නුඹලාව දරන තාක් පෝෂණය කරන්නෙමි. නුඹලාට පසුව නික්ම පැවිදිවන්නෙමි" යනුවෙනි. ඔවුහු කිපදිනක් ඉක්ම ගොස් නැවත කීහ. ඔහුද යළිත් ප්‍රතික්ෂේප කළේය. එතන් පටන් මම නිරතුරුව කියන්නේමය මානවකයා මවට හඟවන්නෙමියි රන්රුවන් දහසක් දී රන්කරුවන් ලවා ස්ත්‍රී රූපයක් කරවා, එහි මැදට ගැටීම් ආදි කර්මාන්ත අවසානයේ එය රතු වස්ත්‍රයකින් පොරවා, රත් මල් ගොඩකින්ද නොයෙක් අලංකාර වලින්ද, අංලකාර කොට "මෑණියනි, මෙබඳු ආකාර අරමුණක් ලබමින් ගෙදර වාසය කරන්නෙමි. නොලබන්නේනම් නොවසන්නෙමියි, කීය. පණ්ඩිත බැමිණිය මෙසේ සිතුවාය. "මගේ පුතා පුණ්‍යවන්තයෙකි. පරිත්‍යාගශීලිවේ. කරන ලද අභිනිහාර ඇත්තේ පෙර පින්කරමින් හුදකලාව නොවිය. ඒකාන්තයෙන් මේ සමඟ කරන ලද පින් ඇත්තේ රන්වන් ප්‍රතිලාභි වන්නේ යනුවෙනි. ඉක්බිති බමුණන් කැඳවා සියලු භෝගවලින් සතුටු කරවා රන්වන් රූපය රථයක තබා දරුවනි; යව! යම් තැනෙක අප හා සමාන ජාති ගෝත්‍ර භවභෝග සම්පත් සහිත කුලයක මෙබඳු ආකාර දැරියක බලහුද? එහිදී, මේ රන්වන් රූපය සත්කාරකොට පැමිණෙවු! යනුවෙන් පිටත්කළේය. ඔවුහු "අපට මෙය වැඩක්දැයි" නික්ම "කොහිදී ලබන්නෙමිද? මද්දරට නම් ස්ත්‍රී ආකාරයකි. මද්දරට යන්නෙමු යි, සාගල නුවරට පැමිණියහ. එහිදී, ඒ රන්වන් රූපය නාන තොටුපොළේ තබා එකත්පසක හිඳගත්හ.

ඉක්බිති භද්‍රා ද, කම්මව ද, නාම අලංකාරකොට තෙමේ නෑමට දියතොටුපොළට ගොස්, රන්වන් රූපය දැක, මේ කවර තැනැත්තියක්ද? අවිනීත තැනැත්ති, මෙහි අවුත් සිටින්නීයයි. පිට පැත්තට පහරදී රන්වන් රූපයක් බව දැන මැය දුවණියක් යන හැඟීම ඉපදවීමි. මේ වනාහි ආයි දුවරු වාසය කරන පෝෂණය කළ පෝෂණය කළ යුතු අසමාන යයි කිවේය. ඉක්බිති ඔහුට ඒ බ්‍රහ්මණයා, මෙබඳු ආකාර වූ ඒ ස්වාමී දියණිය විචාරණ කල්හි, ඇය "මේ රන්වන් ප්‍රතිමාවට සියයක් ගුණයෙන් දහස් ගුණයෙන්, ලක්ෂයක් ගුණයෙන් යුතු මගේ දියණිය අතිශයින් මනා රූ ඇත්තිය. එසේම පහන් නොදමන කළ ද අත් දොළසක ගැබෙහි හුන්නා ශරීර ශෝභායෙන් අඳුර දුරු කරන්නී යයි කිවාය.

"එසේ වී නම්, ඇගේ මව්පියන්ගේ සමීපයට යමු'යි රන්වන් රූපය රථයෙහි නංවා ඒ කිරිමම අනුව ගොස් **කෝසිය** ගෝත්‍රිකගේ ගෙදොර සිට, පැමිණිම දැක්වූහ. බමුණා විසින් පිළිසඳර කරාකොට "කොහේ සිට පැමිණියේ"දැයි විචාළේය. ඔවුහු **මගධරට මහා තිත්ථග්‍රාමයේ කපිල** බමුණාගේ ගෙදර සිට මෙනම් කරුණක් සඳහා ආවෝයයි කීහ. දරුවනි; යහපති! අප හා සමාන ගෝත්‍ර සම්භවයකින් යුතු ඒ බ්‍රාහ්මණයා දකිමු, දරුව යයි පඬුරු ගත්තේය. ඔවුහු කපිල බමුණාට හස්නක් එවූහ. "අපගේ භද්දා නම් දැරිය ලබමු කළයුතු දේ දනිවු" යනුවෙනි.

ඒ හස්න අසා **පිප්ඵලි** මානවකයාට සහ දැරිය ලබන ලදී. පිප්ඵලි මානවකයා, "මට නොලබන්නේ යයි සිතුවෙමි. මේ ලබන ලදද එවමි, අනර්ථ වී පඬුරු එවන්නෙමි. රහසිගතව හස්නක් ලිවීය. 'භද්‍රා තමන්ගේ ජාති ගෝත්‍ර සම්පත් වලට අනුරූප වූ ස්වාමියකු ලබාවා! මම නික්ම ගොස් පැවිදි වන්නෙමි. පසුව විපර්යාස ඇත්තියක නොවේවා! භද්‍රා ද, අසවලාට මා දෙනු කැමතිවේවා'යයි දැන රහසිතගතව පඬුරු හස්නක් ලිවීය. "ආර්ය පුත්‍රයා තමන්ගේ ජාතිගෝත්‍ර පිරිස්වලට දැරියක ලබාවා මම පැවිදිවන්නෙමි. මා පසුව විපිළිසර වූවෙකු නොවේවා!

පඬුරු වර්ග දෙකක් අතරමගදී හමුවූහ. මේ කවරකුගේ පඬුරුද, පිප්ඵලි මානවකයා විසින් භද්‍රාවට යවන ලදී. මේ කවරෙකුගේද? භද්‍රාවට පිප්ඵලිමානවක සිතින්, මේ දෙදෙනා විචාරා බලවු! දරුවන්ගේ ක්‍රියාව ඉරා අරණ්‍යයේ හැරදමා අනෙක් තැති ගන්වන හසුනක් ලියා, මේ වෙත යැවූහ. මෙසේ කුමරුගේ ද, කුමාරිකාවගේ ද, සමාන පඬුරු ලෝකයාගේ යහපත පිණිස පවතීවා! නොකැමැත්තේම ඒ දෙදෙනාගේ එක්වීම විය.

එදවස පිප්ඵලි මානවකාද, එක් මල්දමක් යැවිය. භද්‍රා ද, ඒවා යහන මැද තබා දෙදෙනම පටිහරණය කරනු කැමැත්තේ, යහනට නැගීමට පටන්ගත්හ. ඔවුන් අතර මානවකයා දකුණු පැත්තෙන්, යහනට නැංගේය. භද්‍රා වම්පසිනි. ඔවුහු ඔවුනොවුන් ශරීර ස්පර්ශ කිරීමේ බියෙන් මුලු රාත්‍රියම නිදි නොලබන්නේම කල් යැවූහ. දවල් කාලයේ සිනා මාත්‍රාවක් නොකළහ. ඔවුහු ලෝක ආමිෂයෙන් නො ඇලුණ යම්තාක්ද මව්පියෝ දරත්ද ඒ කෙළෙඹියා බාරගෙන ඔවුන් කළුරිය කළ කල්හි විචාළහ. මානවකයාගේ සම්පත් අතිවිශාලය. එක දවසක් ශරීරය උගුලවා හැරදමා රන්කුඩුම මගධවැසියන්ට දොළොස් නැලියක් පමණ ලැබීමට වටීය. යන්ත්‍ර බඳනා ලද මහා පොකුණු හැටකි. කර්මාන්ත දොළොස් යොදුන් වේ. අනුරාධපුර ප්‍රමාණ ගම් දාහතරක් ද ඇතුන් දාහතක් පමණ ඇත. දාහතරක් අශ්වයෝද දාහතරක් රථයෝද වෙති.

ඔහු ඉක්බිති එක් දවසක් අලංකාර කළ අශ්වයකු පිට නැගී, මහජනයා පිරිවරා කර්මාන්ත කරන තැනට ගොස්, ක්ෂේත්‍රය කෙළවර සිටියේ, නඟුල් වලින් සිදුරු කරන (සාන) ලද තැන්වලින් කපුටු ආදීහු පක්ෂියෝ ගැඩිවිල් ආදි පණුවන් උදුරාගෙන කමින් සිටිනවා දැක "දරුවනි මොවුන් කුමක් අනුභව කරත්දැ"යි විචාලේය. ආර්යනි! ගැඩිවිල් ආදින්ය. "මොවුන් විසින් කරන ලද පාප කවරකුට වෙයිද?" "ආර්යන් නුඹ වහන්සේ දනී" ඔහු සිතුවේය. "ඉදින් මොවුන් විසින් කරන ලද පාපය මට වෙයි. මා කුමක් කරන්නේද? අසූ හත්කෙළක් ධනය ඇත්තේ, දොළොස් යොදුන් කර්මාන්ත කුමක් කරන්නේද? යන්ත්‍ර බඳනා ලද නඟුල්වලින් කිම ගම් දාහතරින් කිම? මේ සියල්ල **භද්‍රා කපිලාදීන්ට** පවරා දී නික්මගොස් පැවිදි වන්නෙමි.

භද්‍රා කපිලයෝ එකෙණෙහි වෙනත් පැත්තක තල කළ තුනක් අතුරා, කිරිමව්වරුන් විසින් පිරිවරා හුන්නා, කපුටන් තලවල සිටින පණුවන් කන ආකාරය දැක මෑණිවරුනි, මොවුහු කිමක් කත්දැයි විචාලේය. ආර්යයනි, පණුවන් කවරකුගේ අකුශලයක් වේද? ආර්යයනි, නුඹලාගේය. ඇය සිතුවාය. මගෙ අතපය සතරට නැලියේ බත් පතක්වත් ලබන්නට වටී. ඉදින් මොවුන් විසින් කරන ලද අකුසල මම භව සංසාර දහසකිනුදු මෙබදු වටයක් හිස එසවීමට නොහැකිය. ආර්ය පුත්‍රයා ආපු විගසම සියල්ල ඔහුට පවරා දී නික්ම පැවිදි වන්නෙමි.

මාණවකයා පැමිණ ප්‍රාසාදයට නැග මාහැඟි පලඟේ හුන්නේය. ඉක්බිති ඔහුට සක්විති රජකුට උචිතව ආහාරපාන සැපයූහ. දෙදෙනා අනුභව කොට පිරිවර ජනතාව නික්ම යන කල්හි රහසිගතව පහසු තැනක හිඳගත්හ. ඉක්බිති මානවකයා **භද්‍රාට** මෙසේ කීවේය. "සොඳුර; මේ ගෙදරට පැමිණෙමි කොපමණ ධනය ගෙනාවේද? ආර්යයනි, පනස් පන්දහසක් ගැල් පුරවාගෙන ආවේමි." "මේ සියල්ල, මේ ගෙදර අසූහාර කෝටියක් යන්තු බඳනා ලද ධනයද, සැටක් පමණ පොකුණු ආදි මෙබඳු ආකාර සම්පත් ඇත. ඒ සියල්ල ඔබටම පවරාදෙමි." "ආර්යයනි; ඔබතුමා කොහි යන්නද?" "මම පැවිදිවන්නෙමි" "ආර්යයනි; මමත් ඔබගේ පැමිණීම බලමින් හුන්නේ, මමත් පැවිදිවන්නෙමි. ඔවුහු අපට ඇවිලගත් පන්සල් කුටි මෙන් තුන් භවය උපස්ථාන කරමින් පැවිදි වන්නෙමුයි පවසා අනතුරුව කෂාය වර්ණ කහපාට සිවුරුද මැටි පාත්‍රද ගෙන්වාගෙන ඔවුනොවුන් කෙස් බහා තබා 'ලෝකයේ යම් රහත් කෙනෙක් වෙත්ද? ඔවුන් උදෙසා අපගේ ප්‍රවෘජ්‍යාව යයි පැවිදි වී පසුම්බිවල පාත්‍ර ඔබා, උරහිසේ එල්ලාගෙන ප්‍රාසාදයෙන් බැසගත් ගෙදර දාසයන් හෝ කම්කරුවන් හෝ කිසිවකු නොදනී.

ඉක්බිති ඔවුහු බ්‍රාහ්මණගමින් නික්ම දාසගම් දොරටුවට යන්නේ ආකල්ප සම්පත් වලින් දාසගාමවාසීහු හඳුනාගත්හ. ඔවුහු අඬමින් පාමුල වැටී "ආර්යයන් කුමක් නිසා අපව අනාථ කළෝද?" කීහ. "බොල! අපි භව තැනක පටන් ගිනිගත් පන්සලක මෙන් සිට පැවිදි වුණෙමු. නුඹලා අතර වෙන වෙනම දාසකම් කරමු. සියක් වසක් නොපවතියි. නුඹලා නුඹලාගේ හිස් සෝදා දාසයෝ වී, ජීවත් වවු! යනුවෙන් පවසා ඔවුන් හඬද්දීම නික්ම ගියහ. මානවකයා පෙරටුව යන්නේ, නැවති බලා සිටීමින් මෙසේ සිතුවේය. මේ **භද්‍රකාපිලාවරු** සියලු දඹදිව අග්‍රගණ්‍ය ස්ත්‍රියක් වුවා මට පිටුපසින් පැමිණෙයි. නියම තැන විද්‍යමානවේ. යම් කිසිවකු මෙසේ සිතන්නේය. "මොවුහු පැවිදිවීමෙන් තොරව වන්නට නොහැකිවෙත් නුසුදුස්සක් කරත්" යනුවෙනි. මෙසේ කිසිවකු පාපක මනසින් සිත් දූෂ්‍ය කොට අපාය අභිමුඛ වන්නේය. මෙය මා හැර යන්නට වටියයි, සිත උපදවා, ඉදිරියෙන් යන්නේ, මාර්ගයේ දෙමංසලක් දැක ඔහුගේ සිතට අදහසක් ආවේය. **භද්‍රාවනි;** අවුත් වැද සිටියහ. ඉක්බිති ඇයට කීවේය. **භද්‍රාවනි;** ඔබවැනි ස්ත්‍රියක මා පසුපසින් පැමිණෙන්නේ දැක මේ පැවිදිවීම තොරව ජීවත්වීමට නොහැකිවන්නේ යයි අප කෙරෙහි නරක සිතින් මහජනයා අපායගාමී වන්නේය. මේ ස්ථානයේ මාර්ග

දෙකක් ඇත. නුඹ එකක යන්න. මම එකකින් යන්නෙමි. "ආර්‍යයනි එසේය. ස්ත්‍රිය පැවිද්දන්ට උවදුරකි. පැවිදිවීම හැර වෙනත් දෙයක් නොවෙත්. අපගේ දෝෂ දකින්නේය. තෙවරක් ප්‍රදක්ෂිණාකොට සතර තැනක පසඟ පිහිටුවා වැඳ නිය දහය එක එකතුවන සේ ඇඳිලි බැඳ ලක්‍ෂවාරයක් පමණ කරන ලද සංසාර මාර්ගයේ වූ මිත්‍ර සන්ධානය අද බිඳේ. නුඹලාට දක්ෂිණාහි නම් නුඹට දක්ෂිණ මාර්ගය වටී. අපි මාගමයි. වම් ජාතිහුවෙති. අපට වම් මාර්ගය වටී යයි වැඳ මාර්ගයට පිළිපන්නාය.

ඔවුන් දෙපරිදි බෙදුනු කල්හි මම සක්වල මහමෙර පර්වතාදිය දැරීමට හැකිවන්නේ නමුත් නුඹලාගේ ගුණ දරන්නට නොහැකිවෙමියි කියන්නාක් මෙන් ගොරවමින් කම්පා වූහ. අහසේ හෙණ හඬ මෙන් පැවතුණි. චක්‍රවාට පර්වතය මහ හඬින් ගුගුළේය. සම්මා සම්බුදුරදුන් වේළුවන මහා විහාරයේ ගඳකිළියේ වැඩ වාසය කරන්නේ පොළොව කම්පාවන ශබ්දය අසා, කුමකට පොළොව කම්පා වූයේදැයි ආවර්ජනා කරන්නේ, **පිප්ඵලි මානවකයා, ද භද්‍රා කාපිලානි ද,** මා උදෙසා අප්‍රමාණ සම්පත් හැරදමා පැවිදි වූහ. ඔවුන් දෙදෙනාගේ වෙන්වීම නිසා දෙදෙනාගේ ගුණ බලයෙන් මේ පොළොව කම්පා විය. මා විසින්ද ඔවුන්ට සංග්‍රහ කිරීම වටී යයි, ගන්ධකිළියෙන් නික්ම තෙමේම පාසිවුරු රැගෙන අසූ මහා තෙරුන් විෂයෙහි කිසිවක් නොවිචාරා තුන් ගව්වක් පමණ පෙරගමන් කොට රජගහනුවරත් නාලන්දාවත් අතර බහුපුත්‍ර නම් නුගරුක් මුල පළඟක් බැඳ වැඩසිටිනේ වැඩ සිටින්නේද, එක්තරා පාංශු කුලිකයකු මෙන් වැඩනොසිට බුදුවෙස්ගෙන රියනක් අඳුරට අතින් බුදුරැස් විහිදුවමින් වැඩ සිටිසේක. මෙසේ එකෙණෙහි, කරත්ත රෝදයක ගරාදි ප්‍රමාණයට පැතිරුණු බුදුරැස්, ඔබමොබ පැන නගිමින් දුවමින් සඳහිරු දහස බැගින් එසවන කාලයක මෙන් කරමින් ඒ වනන්තරය ඒකාලෝක කළහ. දෙතිස් මහ පුරුෂ ලක්‍ෂණ ශ්‍රියාවෙන්ද, බබළන තාරකා සමූහය මෙන්ද, අහස මනාව පිපුණු නෙලුම්විලක මෙන් ජලයෙන් පිරී, වනන්තරය බබළයි නුගරුකේ කඳ ස්වභාවයෙන්ම සුදුපාට වෙයි. පත්‍ර නිල්පාටය. පැසුනු රතුපාට. එදවස සියලු නුගගස් රන්වන්පාටින් විය. මහාකස්සප තෙරුන් එය දැක "මේ අපගේ ශාස්තෘ වන්නේයයි, මේ මම උදෙසා පැවිදි වූයේයයි" දුටුතැන් පටන් බැතිබරව සිට තුන් තැනක වැඳ, "ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස; මාගේ ශාස්තෘනුගේ ශ්‍රාවකයෙකු වෙමියි කිවේය.

ඉක්බිති ඔහුට බුදුරදුන් වදාළහ. **කස්සප;** ඉදින් නුඹ, මේ නියම

අයුරින් මහපොළොව කරන්නේද, එය දරන්නට නොහැකි වන්නේ නම්, තථාගතයන්ගේ මෙසේ මහත් වූ ගුණ ගැන දැනගනිවු. ඔබ විසින් කරන ලද සම්මාන මගේ ලෝමයකුදු සෙලවීමට නොහැකිවෙයි. වැඩ සිටින්නා **කස්සපයනි;** ඔබට දායාද දෙන්නෙමි. ඉක්බිති බුදුරදුන් අවවාද තුනෙකින් උපසම්පදාව දුන්නේය. දී බහුපුත්‍රක නුගරුක් මුලෙන් නික්ම තෙරුන්ට පසු ශ්‍රමණයා කොට මාර්ගයට පිළිපන්නේය. බුදුරදුන්ගේ ශරීරය දෙතිස් මහ පුරුෂ ලක්ෂණවලින් විසිතුරුය. **මහා කස්සප** තෙරුන්ගේ මහා පුරුෂ ලක්ෂණ හතකින් අලංකෘතය. උන්වහන්සේ රත්රන් නැවක පසුපස බඳනා ලද්දාක් මෙන් බුදුරදුන්ගේ පියවර අනුව ගමන් කරති. ශාස්තෘන් වහන්සේ ස්වල්ප දුරක ගොස් මාර්ගයෙන් ඉවත්ව, එක්තරා ගසක් මුල වැඩහිඳිනු කැමැත්තේ යයි දැන තමන්ගේ පට වස්ත්‍රයෙන් කළ සඟල සිවුර හතරට නමා පැනවීය. බුදුරදුන් එහි වැඩහිඳ අතින් සිවුර පිරිමදිමින්, "කස්සපය මේ ඉතා මෘදුය" යි වදාළහ. පොරවනු කැමැත්තේය යයි දැන ස්වාමීනි; භාග්‍යවතුන් වහන්ස! සඟල සිවුර පොරවාවා" යයි කීවේය. "නුඹ කුමක් පොරවන්නේද **කස්සපය?**" නුඹ වහන්සේ ගේ නිවස්නට ලැබෙන දෙයක් පොරවන්නෙමි ස්වාමිණි. කස්සපය, කිම නුඹ මේ පරිභෝග කළ දිරාගිය පාංශුකූලය දැරීමට හැකිවන්නෙහිද? මා විසින් මේ පාංශුකූල වස්ත්‍රය ගන්නා ලද දිනයේ සමුද්‍රය කෙළවර කොට මහ පොළොව කම්පා විය. මෙය බුදුන් පරිභෝග කළ චිවරය ලබන ලදැයි, දැන් මා උතුම් විය යුතුයයි උඩඟු බවක් නොකොට, බුදුරදුන්ගේ සම්පයේම තෙලෙස් ධුතාංග ගුණ සමාදන් වී, දින හතක් පමණ පෘථජ්ජනව විය. අටවෙනි දිනයේ සිවු පිළිසිඹියා සමඟ රහත් ඵලයට පත්විය.

ඉක්බිති උන්වහන්සේට ශාස්තෘන් වහන්සේ "මහණෙනි කස්සප, චන්‍ද්‍රයා උපමා කොට ඇති කුලයක අල්ප ගැබ් ඇත්තේ මේ ආදී අයුරින් ප්‍රශංසා කොට සවස්කාලයේ ආර්ය සමූහයා මැද හුන්නේ, "මගේ ශ්‍රාවකයන් අතර ධුතංග සමාදානයේ **මහකස්සප** තෙරුන් අග්‍රයයි, ධුතවාදනයේ අග්‍රශ්‍රාවක තනතුරේ තැබුහ. මෙසේ භගවත්නු විසින් අග්‍රස්ථානයේ තබන ලද ආයුෂ්මත් මහා කස්සප තෙරුන් මහා ශ්‍රාවක බවට පැමිනේ. තමන්ගේ පෙර කම් සිහිපත් කොට, සොම්නස් වශයෙන් පෙර චරිතාපදාන ප්‍රකාශ කරන්නේ **'පදුමුත්තරස්ස භගවතෝ'** ආදිය කිහ.

එහි **පදුමුත්තරස්ස** යනු ඒ භාග්‍යවතුන් මව්කුසින් නික්මෙන කාලයේ පටන් අපදානය නික්මෙන කාලයට පියවර තබන පාසාම ලක්ෂයක්

පියුම් පත් පොළොව බිඳගෙන නැගී සිටියහ. එහෙයින් උන්වහන්සේ ට එම නම විය. සියලු සත්ව කොටියාසවල එකකු විසින් සියක් සියක් පින්කම් කළ කල්හි උන්වහන්සේගේ පිනේ සත්පුරුෂ ගුණය නිසා පිංකම් කළ බැවින් **භගවතො** යන අර්ථයයි. **ලොක ජෙට්ඨස්ස තාදිනො** යනු සත්වලෝකය ප්‍රධාන කොට ඇත්තේ, ඉෂ්ට අනිෂ්ට දේවල් කෙරෙහි අකම්පිත බව ප්‍රකට කළ බැවින් තාදිතො නම් වේ. **නිබ්බුත ලොක නාථම්හි** යනු සර්ව ලෝකයට පිළිසරණ වූ භාග්‍යවතුන් වහන්සේගේ ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන් පෑ කල්හි නොපෙනීමට ගියේය යන අර්ථයයි. **පූජං කුබ්බනති සත්තුනො** යනු සදේවකලෝකගේ ඇලෙන බැවින් සත්ථා යන නාමය ලබන ලද්දේ, භාග්‍යවතුන් යහපත් ක්‍රීඩා කරන්නේ පුජා කරන්නේ යන සම්බන්ධයයි.

අගිංචිනනති ජනතා යනු ජන සමූහයා අදාහන පුජාව පිණිස, ගිනි දල්වන්නා, රැස් කරන්නේ මැදහත්වූ සතුටින් යුතුව සන්තෝෂය මුඛ්‍ය කාරණා වශයෙන් ගෙන ප්‍රමුඛව සතුටු පුජා කරත් යන සම්බන්ධයයි.

තෙසු සංවෙග ජාතෙසු යන ඒ ජන සමූහයා අතර සංවේග හටගත් කල්හි තැති ගැනීමට පත් කල්හි, මෙ මගේ පීති සතුට උදපප්පථ පහළවේ යන අර්ථයයි. ඤාති මිත්තෙ සමානෙත්වා යනු ඤාති සමූහයා සමානකොට රැස් කොට මහාවීරෝ භාග්‍යවතුන් වහන්සේ **පරිනිබ්බුතො**, නොපෙනීමට ගියේ යනුයි. **ඉදං වචනං අබ්‍රවිං** කිවෙමි යන සම්බන්ධයයි. **හන්ද පුජං** කරොමසෙ යනු හන්ද යනු වචනයේ අග අර්ථයට නිපාත පදයයි. ඒ කාරණයෙන් අපි රැස්වී පුජා කරමු යන අර්ථයයි. **සෙ** යනු නිපාත පදයකි. සාධුති තෙ පටිසුත්වා යනු ඒ මගේ ඤාති මිත්‍රයො යහපත් යයි, දැන මගේ වචනය අසා පිළිගෙන, මෙ මගේ **හියේ‍යා අතිරේක හාසං ප්‍රීතිය** ජනිංසු ඉපදවූහ යන අර්ථයයි.

ඉක්බිති තමා විසින් කරන ලද පුණ්‍ය සම්භාර ධර්මය පෙන්වමින්, බුද්ධසම්මං ලොකනාථම්හි යන ආදිය කීහ. සියගණන් අත් උඩෙ ඔසවා කල කිරීමට සංවේගයට පත්වූයේ යනුයි. **සමුග්ගතං** පැතිරුණු විමානය අහස් තලයේ පහළවුවකි. **අග්ගියං සුකතං** සුන්දර ආකාරයෙන් කරන ලද **කත්වා** කරවාද, **පුඤ්ඤසඤ්ඤවයං** පින්රාශිය **කාහාසිං** කළෙමි යන සම්බන්ධයයි. **කත්වාන අග්ගියං තත්‍රා** යනු ඒ චෛත්‍ය පුජා ස්ථානයේ තල්පෙළ විසින් **චිතනිතං** යහපත් වූ මා හැඟිලෙස කරන ලද සොඳුරු

විලාසයෙන් කළ **කාවාන** කරවා **සකං චිතනං** තමන්ගෙ සිත **පසාදෙත්වා චෙතියං පූජයුනනමං** යනු උත්තම බුද්ධධාතු නිධන්කරන ලද චෛත්‍යයට පූජා කළෙමි යන සම්බන්ධයයි.

ඒ චෛත්‍යයේ මහිමය පෙන්වමින් "අග්ගික්ඛන්ධොවා" යන ආදිය කීවේය. එහි **අගගිකඛනධොවා** යනු අහසේ දිළිසෙන්නා වූ ගිනිගොඩක් මෙන් ගිනි රැසක් මෙන් ඒ දාගැබ සත්රුවනක්, **ජලති දිළිසෙයි** වුලලිතො පිපුණු මල් සල්රුක් රජකු මෙන් **ආකාසේ ඉනදුලටඨිව** දේදුන්නක් මෙන්, සතර දිශාවල **ඔභාසති** බබළයි යන සම්බන්ධයයි. **තත්ථ චිතතං පසාදෙත්වා** යනු එහි බබළන ධාතුගර්භයෙහි **චිනත** සිත **පසාදෙත්වා** සොම්නස් කොට ඒ චිත්තප්‍රසාදයන බහුං නොයෙක් ආකාර **කුසල** පින් කොට ධාතු ගර්භයේද ශාසනයේද, මෙපමණ වූ පින්කම් මා විසින් කරන ලද්දේ යනුයි. මෙසේ **පුඤඤකමමං සරිත්වා** පින්කම් සිහිකොට කළුරිය කොට **තිදසං** තව්තිසභවනයට නිදා පිබිදියෙකු මෙන් **අහං උපපජ්ජිං** මට උපන්නෙමි යන සම්බන්ධයයි.

තමන් උපන් දිව්‍යලෝකයේ ලබන ලද සම්පත් ප්‍රකාශ කරමින් **"සහසසයුත්තතං"** යන ආදිය කීවේය. එහි **හයවාහිං** සෙන්ධව අශ්වයන් දහසක් යොදන ලද දිව්‍යරථය **අධිට්ඨිතො** භූමි සතකින් මැනවින් කොට උඩට එසවූ උස්වූ මගේ භවන විමානය විය යන අර්ථයයි. ඒ විමානයේ, **සබබසොවණණ මයා** සම්පූර්ණයෙන් ස්වර්ණමය වූ **කූටාගාර සහසසාන** කුමාගාර දහසක් වූහ යන අර්ථයයි. **සකතෙජෙන** තමන්ගේ ආනුභාවයෙන්, සබ්බදසදිසා විභාසයං බබළන්නේ **ජලනති** විද්‍යමාන වෙත් බබළත් යන සම්බන්ධයයි. එහි මගේ විමානය පහළ වූයේ යනුයි. **අඤඤෙපි නියයුහා** ප්‍රධාන ශාලාවෙන් **සන්ති** විද්‍යමාන වෙති. **ලොහිතංකමය** රුවන් **මණිමයා** සැම කල්හි **තෙජි** සතර දිශාවල පැතිරි **ආභාය** ප්‍රභාවෙන් **ජොතෙතනි බබළත්** යන සම්බන්ධය **සබබෙ දෙවෙ** - සියලු සදිව්‍යලෝකවල දෙවිවරුන් අභිභොමි අභිබවා යමි. කවරකුගේ ඵලයක්ද, මා විසින් කරන ලද්දකි. පුණ්‍යකර්ම යාගෙ මෙයද ඵලයකි යන අර්ථයයි.

ඉක්බිති මනුෂ්‍ය සම්පත්තිය දක්වමින්, "සටඨිකපප සහසසමහි" යනාදිය කීවේය. එහි මේ කල්පයෙන් යට, සැටදහස් කල්පයට මත්තෙහි, **චාතුරනෙතා** සිවු මහාද්වීප ආශ්‍රිතව, **විජිතාවි** සියලු ප්‍රත්‍යන්ත ජයගත්තාවූ මම, **උටඨියො** එනම් සක්විතිරජව, **පඨවිං ආවසිං** රාජ්‍යය කළෙමි යන

සම්බන්ධයයි. **තපෝවහඳකෙ කපෙප** යනු පසේ බුදුවරුන්ගෙන් සැරසූ, **හද්දකෙ** එනම්, **කප්පෙ තිංසක්ඛත්තුං තිස්** ජාතියකින් **චතුදීපමහි ඉස්සරෝ** ප්‍රධාන චක්‍රරත්නය ආදි කොට ඇති සප්ත රත්නවලින් සම්පන්න වූ, ඇසුරු කළාවූ, **සකකකමමාභිරදෙධා** තමන්ගේ ක්‍රියාවේදී දස රාජ ධර්මයන්හි ඇලී, ගැලී, **චක්කවතතිරාජා අමහ** වූයෙමි යනුයි. තමන්ගේ චක්‍රවර්ති රාජ්‍ය කාලයේ. හේතු සම්පත් දක්වමින් **"තසසාපි භවනං මයහං"** යනාදිය කීවේය. **තසස** ඒ චක්‍රවර්ති රාජ්‍යයෙහි මයිහං භවනං මගේ භවන **ඉඤ්ජලඨිවඋගගතං** අහසේ පිහිටි, බබළන්නාවූ විදුලියමෙන් උස්වූ සත්මහල් ප්‍රාසාදයක් සේ උස, **ආයාමතො** දීර්ඝවූ ද උස් වූද, විසිහතර යොදුන් පළල, **දොළොස** යොදුනක් විය යන සම්බන්ධයයි. සියලු ජනතාවගේ මනස ඇලී තිබෙන බැවින් **රමමක නම් නගරය** විය යන අර්ථයයි. දැඩි වූ දොළොස් රියන් හෝ තිස් රියන් උස් වූ **ප්‍රාකාර තොරණවලින්** සම්බන්ධව පෙනෙයි. **තදඩඪකං** අතුරුව අඩක් අර්ධ අඩ යොදුනක් යන අර්ථයයි. **පකඛිතතා පණවිසති** විස්සක් වෙළඳසැල් බහන ලද, නිරතුරුව විවර කළ විථී ඇත්තේ යන අර්ථයයි. **බ්‍රහමඤඤකුල සහභූතො** යනු බ්‍රාහ්මණ කුලයේ සුජාතව, සෙස්ස කියන ලද පරිදි දතයුත්තේමය.

මහා කස්සපථෙරා පදාන අටුවාවයි.

3-4

සුමේධ භගවනතාහං යන ආදිය ආයුෂ්මත් **අනුරුද්ධ තෙරුන්ගේ චරිතයයි.** මෙයද පෙර බුදුවරුන් විෂයෙහි කරන ලද අධිකාර ඇත්තේ, ඒ ඒ භවයේ පින්කම් රැස්කරන්නේ **පදුමුත්තර** භාග්‍යවතුන්ගේ කාලයේ බොහෝ සම්පත් ඇති කෙළෙඹි කුලයක උපන්නේය. වැඩිවිය පැමිණ, එක දිනක් විහාරයට ගොස් ශාස්තෘ සමීපයේ බණ අසමින් බුදුරදුන් විසින් එක් භික්ෂුවක් දිව්‍ය චක්ෂුධර භික්ෂුන් අතර අග්‍ර තනතුරේ තබනවා දැක තමා ඒ තනතුර ප්‍රාර්ථනා කොට ලක්ෂයක් භික්ෂුන් පිරිවරා බුදුරදුන්ට සත් දිනක් මහදන් පවත්වා, සත්වෙනි දිනයේ භගවත්හු හට හා භික්ෂු සංඝයාට උත්තම වස්ත්‍ර දන්දී ප්‍රාර්ථනාව කළේය. ශාස්තෘන් වහන්සේද, ඔහුගේ අනතුරුව පැතුම සමෘද්ධ වන බව දැක 'අනාගතයේ **ගෞතම සම්මා** සම්බුදුරදුන්ගේ ශාසනයේ, දිවැස් ඇති භික්ෂුන්ගේ අග්‍ර තනතුර, වන්නේ යයි විවරණ කළසේක. ඔහුද එහිදී පින් කරන්නේ බුදුරදුන්

පිරිනිවන්පෑ කල්හි, සත් යොදුනක් දුර ස්වර්ණ ථූපයක බොහෝ රන් පේළිවලින් යුතු පහන් රුක්වලින්, පහන් පැල්වලින්ද යුතුව "දිබ්බචක්ඛු ඤාණය පහළ වේවා" යයි උදාර වූ ප්‍රදීප පූජාවක් කළේය. මෙසේ දිවි ඇති තෙක්, පින්කම්කොට, දෙව්මිනිස් ලෝකවල සැරිසරන්නේ, **කස්සප** බුදුරදුන්ගේ කාලයේ **බරණැස** කෙළෙඹි නිවස ඉපදී, ප්‍රඥාවන්ත වූයේ, ශාස්තෘන් වහන්සේ පිරිනිවන්පා කල්හි, නිමවූ කල යොදුනක රන්ථූපයක් බොහෝ ස්වර්ණ පහන්වල ගිතෙල් පුරවා, මැද වෙන වෙනම උක්සකුරු බෝලය බැගින් තබා, මුවෙන් මුව පහන්වැටි ස්පර්ශ කරමින්, චෛත්‍යය වටකොට තැබීය. තමා විසින් ගන්නා ලද, රන් පහන්වල ගිතෙල් පුරවා දහසක් පහන් තිරවලින් දල්වා හිසේ තබා, මුළු රාත්‍රියම චෛත්‍යය වටා සැරිසැරීය.

මෙසේ ඔහු ඒ ආත්මභාවයේ දිවි ඇතිතෙක් කුසල කර්මකොට දෙවිලොප ඉපිද, එහි ආයුෂ ඇති පරිදි සිට ඉන් චුතව බුදුරදුන් උපන් කල්හි, **බරණැසම** දුප්පත් කුලයක උපන්නේය. **අන්නභාරනිස්ස** යයි නම් විය. හෙතම **සුමන** නම් සිටුතුමාගේ ගෙදර වැඩකරමින් ජීවත් වෙයි. එක දවසක් හෙතම **උපරිට්ඨ** නම් පසේබුදුරද, නිරෝධ සමවතින් නැගිට **ගන්ධමාදන** පර්වතයෙන් අහසින්ම අවුත් බරණැස නගර මැදට බැස, සිවුර පොරවා, නගරයේ පිඬු පිණිස හැසිරෙනු දැක, ප්‍රසන්න මනසින් පාත්‍රය ගෙන තමන් සඳහා තබන ලද, බත් කොටස, පාත්‍රයට දමා, පසේ බුදුරදුන්ට දීමට පටන් ගත්තේය. ඔහුගේ බිරිඳද තමාගේ බත් කොටසද දැමීය. ඔහු එය රැගෙන ගොස්, පසේ බුදුරදුන්ගේ අතේ තැබීය. පසේ බුදුරද එය ගෙන, අනුමෝදනාකොට පෙරළා ගියේය. එදවස සුමන සිටුතුමාගේ කුඩයට අධිපති දේවතාවා "**අහෝ දානං පරමදානං උපරිට්ඨෙ සුපපතිට්ඨිතං**" යනුවෙන් මහා ශබ්දයෙන් අනුමෝදනාව අසා, සුමන සිටුතුමා මෙසේ දේවතාවාට අනුමෝදන් කිරීමට මෙයම උතුම් දානය යයි සිතා පාත්‍රය ඉල්ලීය. **අන්නභාර** ඔහුට පාත්‍රය දුන්නේය. ඉන් පැහැදුණු සිත් ඇති සුමන සිටු ඔහුට දහසක් දී, මෙතැන් පටන්, ඔබට අර්ථයෙන් ක්‍රියා කිරීමේ වැඩක් නැත. සුදුසු වාසයට ගැලපෙන ගෙයක් කොට, නිතර වාසය කරවයි කීවේය. යම්හෙයකින් නිරෝධ සමාපත්තියෙන් නැගිටි පසේබුදුරදුන්ට දෙන ලද පිණ්ඩපාතය එදවසම උදාර විපාක ගෙන දෙයි. එහෙයින් සුමන සිටු රජුගේ සමීපයට යන්නේ ඔහු රැගෙන ගියේය. රජු වනාහි ඔහු දෙස සාදරයෙන් බැලීය. සිටුතුමා, "මහරජතුමනි, මෙතම "බැලිය යුත්තෙකැයි" පවසා එදින ඔහු විසින් කරන ලද කර්මය

තමා විසින් ඔහුට දහසක් දුන් බව කීවේය. ඒ අසා, රජු ඔහුට සතුටු වී, දහසක් දී, අසවල් තැන, ගෙයක්කොට වාසය කරවයි. ඔහුට ගෙට යාමට අණ කළේය. ඔහුගේ ඒ ස්ථානය සෝදා පිරිසිදු කළ කල්හි මහත් වූ ධනය පිරවූ කලගෙඩි පහළ වූහ. ඔහු එය දැක රජුට දැන්වීය. රජු සියළු ධනය උදුරාගෙන රැස්කොට "මෙපමණ ධනය මේ නගරයේ කවර ගෙදරට අත්දැයි ඇසීය. දේවයන් වහන්ස, කිසිවකුට නැත. එසේ වීනම් **අන්නභාර** මේ නගරයේ මහා ධනසිටු නම් වේවා'යි, එදවසම ඔහුට සිටු කුඩය එසවීය. ඒ සිටුතුමා දිවි ඇති තෙක්, යහපත් වැඩ කොට දෙව්ලොව උපන්නේ, දීර්ඝ කාලයක් දෙවිමිනිස් ලොවවල සැරිසරා අපගේ බුදුරදුන් උපන් කල්හි, **කපිලවස්තු නගරයේ සුක්කොදන** නම් ගෙදර පිළිසිඳ ගත්තේය.

ඔහු උපන් කල්හි **අනුරුද්ධ** යයි නම් කළහ. ඔහු **මහානාම** සක්විතිගේ කනිෂ්ඨ සොයුරු, බුදුරදුන්ගේ සුළුපියා වූ පුතු වූයේ ඉතාම සියුමැලිය. මහත් පින් ඇත්තෙකි. රත්රන් භාජනයකම ඔහුට බත ඉපදවීය. ඉක්බිති ඔහුගේ මව එක දවසක් "මගේ පුතා නැතැයි" පියවරක් නොදනියි. ඔහු ගැන දැනගන්නෙමියි, සිතා එක් රජු වර්ණ සැළියක් හිස්බව දැන, රන් පියනින් වසා, ඔහුට යැවීය. අතරමග දේවතාවෝ එය දිව්‍ය කැවුම්වලින් පිරවූහ. මෙසේ මහපිනැති, සෘතු තුනට ගැලපෙන ප්‍රාසාදවල ලස්සන නාටිකාංගනාවන් පිරිවරාගෙන දෙවියකු මෙන් මහා සම්පත් වින්දේය.

අපගේ බෝසත්හුද, එසමයේ තුසිත පුරයෙන් චුතව, **සුද්ධෝදන** මහරජුගේ අගමෙහෙසියගේ කුසෙහි ඉපිද, පිළිවෙළින් වැඩෙන්නේ එකුන්තිස් වසක් (29) ගිහිගෙය මැද වාසයකොට මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්ම අනුපිළිවෙළින් අවබෝධ කළ සර්වඥතා ඥානය ඇත්තේ, බෝධිමූලයේ සත්සතියක් කල්යවා, **ඉසිපතන** මිගදායේ ධර්මචක්‍රය පවත්වා, ලොවට අනුග්‍රහ කරමින්, රජගහනුවරට ගොස් වේළුවනයේ වැඩසිටි සේක. බොල යවු, මගේ පුතා රැගෙන එවු යයි, දසදහසක් පිරිවරද ඇමතියන් දහසක්ද යැවීය. ඒ සියල්ලෝ ඒහිභික්ෂුභාවයෙන් පැවිදි වූහ. ඔවුන් අතර උදායි තෙරුන් විසින්, චාරිකාගමනට ඉල්ලන ලද්දේ, බුදුරදුන් විසිදහසක් මහරහතුන් පිරිවරා රජගහනුවරින් නික්ම කපිලවස්තුවට ගොස් ඤාති සමාගමම නොයෙක් ආකාර පෙළහරයෙන් පෙළහරට විචිත්‍ර වූ ධර්මදේශනාවක් කොට මහජනයාට අමෘතපානය පොවා, දෙවන දිනයේ,

පාසිවුරු රැගෙන, නුවර දොරටුවේ සිට කිම, කුල නගරයට පිවිසියා වූ සියළු බුදුවරුන්ට සමාන ක්‍රියාවකැයි ආවර්ජනා කරන්නේ, පිළිවෙළින් පිඬු පිණිස හැසිරෙයි. රජු ඔබේ පුතා පිඬු පිණිස හැසිරේයයි අසා, ඉක්මනට ඉක්මනට අවුත් අතුරු වීථියකදී බණ අසා තමන්ගේ මන්දිරයට පැමිණ මහත් වූ සත්කාර සම්මාන කළේය. බුදුරදුන් එහිදී කළයුතු ඤාති සංග්‍රහකොට, **රාහුල** කුමරු පැවිදිකොට, නොබෝකලක් කපිලවස්තු නගරයෙන්, **මල්ල** රටෙහි චාරිකා කරන්නේ **අනුපිය** අඹවනයට පිවිසි සේක.

එසමයේ සුද්ධෝදන මහරජු ශාක්‍යපුත්‍රයා රැස්කොට කීවේය. ඉදින් මගේ පුතා ගිහිගෙය වාසය කළේ නම්, චක්‍රවර්ති රජ වන්නේය. ක්ෂත්‍රිය සේනාව පිරිවරා සත්රුවන් සම්පන්නද විවන්නේය. මුණුබුරු වූ මගේ රාහුල කුමරුද ක්ෂත්‍රිය සේනාව සමග ඔහු පිරිවරා වසන්නේය. නුඹලා මේ කරුණ දැනගනිවු. දැන් වනාහි මගේ පුතා බුදුවිය. ඔහුට ක්ෂත්‍රියයෝ පිරිවර වෙත්වා. නුඹලා එක එක කුලයෙන් එක එක දරුවා බැගින් දෙවු යයි මෙසේ කී කල්හි, එකපහරින්ම අසූදෙකක් ක්ෂත්‍රිය කුමාරයෝ පැවිදි වූහ. එසමයෙහි මහා ශාක්‍ය කෙළෙඹි ස්වාමියා ඔහු තමාගේ කනිටු, අනුරුද්ධ ශාක්‍යයා වෙත එළඹ මෙසේ කීවේය. "දරුව අනුරුද්ධ, පැවිදිව භාග්‍යවතුන් වෙනුවෙන් අනුව පැවිදි වවු. ශාක්‍ය කුමාරවරු මැනවින් අවබෝධ කරන්නාහ. අනගාරික ගිහිගෙයින් නික්ම පැවිදි වූ කෙනෙකු අපගේ කුලයෙත් නැත. එසේ හෙයින් නුඹ හෝ පැවිදි වෙව. මම හෝ පැවිදි වන්නෙමියි ඒ අසා, අනුරුද්ධ ගෘහවාසයේ රුචිය නොකොට තමන් සත්වෙනිව ගිහිගෙයින් අනගාරික ප්‍රව්‍රජ්‍යාවට පත්විය.

ඔහුගේ පළමු පැවිදිවීමේ අනුපිළිවෙළකව සංඝභේදක ඛන්ධකයේ පැවසෙන පරිද්දෙනි. මෙසේ අනුපිය අඹවනයට ගොස් පැවිදි විය. ඔවුන් අතර ඔහුට ඇතුල් වසා **භද්දිය** තෙරුන් රහත් බවට පත්විය. අනුරුද්ධ තෙරුන් දිව්‍ය චක්ෂුර් ඥානය ඉපදවිය. **දේවදත්ත** අෂ්ට සමාපත්ති ඉපදවිය. **ආනන්ද** තෙර සෝවාන් ඵලයේ පිහිටි සේක. **භගු, කිම්බිල** තෙරවරු පසුව අර්හත් ඵලයට පැමිණියහ. ඒ සියළුම තෙරවරුන් තම තමන් ආවා වූ ස්ථානවල පෙර ප්‍රාර්ථනා බලයෙන් අභිනීහාර සිදුකර ගත්හ. මේ **අනුරුද්ධ** මහතෙරුන් ධර්ම සේනාපති සමීපයේ කමටහන් ගෙන **චේතිය රට ප්‍රාචීන වංශයට** ගොස් මහණදම් කරමින්, සත්මහා පුරුෂ ලකුණ මෙනෙහි කළෝය. අටවැන්නේදී ක්ලාන්ත වෙයි. ශාස්තෘන් වහන්සේ,

අනුරුද්ධ තෙර අටවැනි මහා පුරුෂ ලක්ෂණයේදී ක්ලාන්ත වන බව දැන උන්වහන්සේගේ සංකල්පය පුරවන්නෙමියි එහි ගොස් පනවන ලද උතුම් බුද්ධාසනයේ වැඩහුන්නේ, අටවෙනි මහාපුරුෂ විතර්කය පුරවා සිවුපසයේ සන්තෝෂභාවයෙන් සරසන ලද අරියවංස ප්‍රතිපදාව පවසා ආකාශයට පැනනැග **හේෂකලා වනයටම** ගියේය. තෙරුන් තථාගතයන් වහන්සේ ගියකල්හි ත්‍රිපාද පාපත් මහාඍණාශ්‍රවයකු වී, "බුදුරදුන් මගේ මනස දැන අවුත් අටවෙනි මහාපුරුෂ විතර්කය පුරවා දුන් සේක. උන්වහන්සේද මගේ මනදොළ මස්තකප්‍රාප්ත වූයේ යයි, බුදුවරුන්ගේ ධර්මදේශනාව තමන්ගේද ප්‍රතිවේධ ධර්මය අරබයා මේ උදාන ගාථා කිහ.

"ලොවට අනුත්තර ශාස්තෘහු මගේ සංකල්පය දැන
මනෝමය සිරුරින් ඍද්ධියෙන් මා වෙත එළඹී සේක.

යම්සේ සංකල්පනාවක් වූවහුද, එයට පිළිතුරු
දේශනා කළ සේක. ප්‍රපංචයන්ගෙන් තොර බුදුරදුන්
නිෂ්ප්‍රපංචය පිණිස ධර්ම දේශනා කළ සේක.

මම උන්වහන්සේගේ ධර්මය දැන ශාසනයේ ඇලී
වාසය කළෙමි. ත්‍රිවිද්‍යා සාක්ෂාත් කරගත්තේ
බුද්ධ ශාසනයේ

ඉක්බිති උන්වහන්සේ සවස් කාලයේ ශාස්තෘන් වහන්සේ ජේතවනයේ වැඩවාසය කරන්නේ, දිවැස්ලාභී භික්ෂූන් අතර අනුරුද්ධ තෙරුන් අග්‍රයයි අග තනතුරේ තැබූ සේක. මෙසේ උන්වහන්සේ බුදුරදුන් සමීපයේ දිවැස්ලාභීන්ගේ අග තනතුර ලබා තමන්ගේ පෙර කර්ම සිහිපත් කොට සතුටින් තමන්ගේ පෙර කර්ම සිහිපත්කොට සතුටින් යුතුව තමන්ගේ පෙර කර්ම සිහිපත් කරන්නේ **සුමෙධං භගවන්තානං** ආදිය කිහ.

එහි සුන්දර උපස්ථානයෙන්ද, ප්‍රඥාවෙන් මාර්ගල ප්‍රඥාවට පත් විදර්ශනා ප්‍රඥාව සිවු පිළිසිඹියාපත් සංස්කාර ධර්මයන් ගැඹුරු නුවණින් දකින, යම් භගවත්හු කෙනෙක් වේද, ඒ සුමේධයන්ය. භාග්‍ය සම්පන්න බැවින් **භගවන්තං** වේ. ලෝකයට ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨ, ප්‍රධාන, සංසාරයෙන් පළමුවෙන් නික්මුණු මිනිසුන්ට ශ්‍රේෂ්ඨ ගුරු ව **වූපකට්ඨා** විවේකී වූ සමූහයේ ඇලීගැලීමෙන් වෙන්වී වාසය කරන මම **දුවුවෙමි** යන සම්බන්ධයි.

සියළුම ධර්මයන් තෙමේම අවබෝධ කරගත් බැවින් **සම්බුද්ධ** නම්. **උපගච්ඡාන** සමීපයට පැමිණ යන අර්ථයයි. **අඤ්ජලිං විගහෙත්වාන** යනු දසඟලි බැඳ මුදුනේ තබා යන අර්ථයයි. සෙස්ස ඉහත සඳහන් පරිද්දෙනි.

දිවාරත්තිං පස්සාමි යනු එකල දිව්‍ය ලෝකයේද, මනුෂ්‍ය ලෝකයේද, උපන් කල්හි, මසැසින් යුක්ත වූයේ හාත්පස යොදුනක් බලමියි යන අර්ථයි. **සහස්සලොකං ඤාණෙන** යනු ප්‍රඥා ඇසින්, දහසක් සක්වළ බලමි යන අර්ථයයි. **සත්ථු සාසනෙ** යනු දැන් ගෞතම භාග්‍යවතුන්ගේ **දීපදානස්ස**. පහන් පූජාවෙන්, **ඉදං ඵලං** මේ ඵලයෙන් **දිබ්බචක්ඛුං අනුප්පත්තෝ** දිවැස් ලබන ලද්දේ, උපදවා ගත්තෙමි යන අර්ථයි.

අනුරුද්ධ තෙරුන්ගේ අපදාන අට්ඨ කථාවයි.

3.5

අජ්ඣායකෝ මනත්ධරෝ යනාදි කොට ඇති ආයුෂ්මත් **පුණ්ණමන්තානි පුත්ත** තෙරුන්ගේ චරිතයයි. මෙයද පෙර බුදුවරුන් විෂයෙහි කරන ලද ප්‍රාර්ථනා ඇත්තේ ඒ ඒ භවවල හටගත් වාසනා ගුණයෙන් පින්දහම් රැස් කරන්නේ පදුමුත්තර බුදුරදුන්ට පෙරදීම **හංසවතී** නගරයේ බ්‍රාහ්මණ මහසල් කුලයක උපත ලබා අනුපිළිවෙළින් ප්‍රාඥ බවට පත්වූයේය. පසුකාලයේ **පදුමුත්තර** බුදුරදුන් ඉපිද අවබෝධ කළ යුතු සත්ත්වයන්ට ධර්මදේශනා කරන කල්හි, යට සඳහන් අයුරින්, මහජනයා සමග විහාරයට ගොස්, පිරිස කෙළවර හිඳ බණ අසන්නේ, ශාස්තෘන් එක් භික්ෂුවක් ධර්ම කථිකයන් අතර අග්‍ර ස්ථානයේ, තබනවා දැක "මා විසින්ද අනාගතයේ මෙබඳු ආකාර වීමට වටනේ යයි" සිතා දේශනාවසානයේ නැගී සිටි පිරිස අතරින් ශාස්තෘන් වහන්සේ වෙත එළඹ ආරාධනාකොට යට සඳහන් අයුරින් මහත් සත්කාරකොට බුදුරදුන්ට මෙසේ **කීවේය.** "ස්වාමීනි, මම මේ ආකාරයෙන් වෙනත් සම්පතක් නොපතමි. යම්සේ මේ භික්ෂුව, සත්වෙනි දවසකට ඉහත නුඹ වහන්සේ විසින් ධර්මකථිකයන් අතර අග්‍ර ස්ථානයේ තබන ලදී. එසේ මමද අනාගතයේ එක බුදුවරයකුගේ ශාසනයේ, ධර්මකථිකයන් අතර අග්‍ර වන්නෙමියි, ප්‍රාර්ථනා කළේය. ශාස්තෘන් වහන්සේ අනාගතය ලා ඔහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන බව දැන

"අනාගතයේ කල්ප ලක්ෂයක් මස්තකයේ **ගෝතම** නම් ධර්ම කථිකයන්ගේ අග්‍ර බවට පත්වන්නේ යයි විවරණ දුන් සේක. ඔහු ආයුෂ ඇති පරිදි යහපත් වැඩ කොට ඉන් චුතවී කල්ප ලක්ෂයක් මුළුල්ලේ පුණ්‍ය සම්භාර ධර්මයන් රැස්කරමින් දිව්‍ය-මනුෂ්‍ය ලෝකවල සැරිසරා, අපගේ භගවත්හු කාලයේ **කපිලවස්තු** නගරයට නුදුරු දෝණවත්‍ථු නම් බ්‍රාහ්මණගම බමුණු මහසල් කුලයක **අඤ්ඤා කොණ්ඩඤ්ඤ** තෙරුන්ගේ බෑණා කෙනෙකු වී උපන්නේය. ඔහුට **පුණ්ණ** යයි නම් කළහ. හෙතම බුදුරදුන් අභිසම්බෝධියට පැමිණ, පවත්වන ලද උතුම් ධර්මචක්‍රය ඇත්තේ, අනුපිළිවෙළින් රජගහනුවර ඇසුරුකොට වාසය කරන්නේ, අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන් සමීපයේ පැවිදිවී ලබන ලද උපසම්පදා ඇත්තේ ප්‍රධන් වීර්යය වඩන්නේ, සියළු පැවිදි කිස මුදුන් පමුණුවා, දසබල බුදුරදුන් වෙත යන්නෙමියි, යන කල්හි, මා තුළ තෙරුන් (මාමා) සමග ශාස්තෘ සමීපයට අවුත්, කපිල වස්තුව හෝ විසඳීම නැවති යෝනිසෝ මනසිකාරයෙන් ක්‍රියා කරමින් නොබෝ දිනකින්ම විදර්ශනා නංවා රහත් ඵලයට පැමිණියේය.

ඒ පුණ්ණ තෙරුන් සමීපයේ පැවිදි වූ කුලපුත්‍රයෝ පන්සියයක් වූහ. තෙරුන් ඔවුන්ට දසකථා වස්තුවෙන් අවවාද කළ සේක. ඒ සියල්ලෝ, දසකථා වස්තුවෙන් අවවාද ලබා, ඒ අවවාදයේ පිහිටා අර්හත්ඵලයට පැමිණ, තමන්ගේ පැවිදි කිස, මස්තකප්‍රාප්ත බව දැන, උපාධ්‍යායන් වෙත එළඹ කීවාහුය. "ස්වාමීනි, අපි පැවිදිකිස මුදුන්පැමිණියෝ වෙමු. දසකථාවස්තු ලැබුවෝ වෙමු. අපට දැන් බුදුරදුන් දැකීමට සුදුසු කාලයයි යනුවෙනි. තෙරුන් ඔවුන්ගේ වචන අසා සිතූහ. "මගේ දසකථාවස්තු ලැබූ බව බුදුරද දනියි. මම දහම් දෙසමින්, දසකථාවස්තු නොමුදාම දේශනා කරමි. මා යන කල්හි, මේ සියළු භික්ෂූහු මා පිරිවරා යන්නාහ. මෙසේ මා සමූහයා සමග බුදුරදුන් දැකීමට යාම නුසුදුසුය. මේ පිරිස බුදුරද දැකීමට යත්වා'යි ඉක්බිති ඔවුහු මෙසේ ඇවැත්නි, නුඹලා පෙරටුව ගොස් බුදුරදුන් බලහු. මගේ වචනයෙන් තථාගත පා වඳිහු. මමද නුඹලා යන මාර්ගයෙන්ම පැමිණෙන්නෙමි. ඒ සියල්ලෝ බුදුරදුන් උපන් භූමියේ, වාසය කරන, සියළු ක්ෂීණාශ්‍රවයෝ, සියල්ලෝ දසකථා වස්තුලාභීහු, උපාධ්‍යායගේ වචනය නොසිඳ, අනුපිළිවෙළින් චාරිකාවේ හැසිරෙමින්, සැටයොදුන් මගගෙවා, **රජගහනුවර වේළුවන** මහා විහාරයට ගොස් දසබලයන්ගේ පා වැඳ එකත්පසක හුන්හ. සුපුරුදු ලෙසින්ම භාග්‍යවත් බුදුරදුන් ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කථා කරනු කැමැත්තෝ,

භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේ සමග මහණෙනි, කිම පහසු විහාරයෙන්දැයි ආදි ලෙසින් මිහිරි ලෙස පිළිසඳර කථාකොට, "මහණෙනි, නුඹලා කොහි සිට පැමිණියෙහුදැයි විචාරා, ඔවුන් විසින් "උපන්බිමේ සිට" යයි කී කල්හි, මහණෙනි, උපන් බිම යනු කවරක් ද? සබ්‍රහ්මචාරී භික්ෂූන් මෙසේ අදහන ලද්දේ තමන් විසින්ද, අල්පේච්ඡව, අල්පේච්ඡ කථා ඇතිව, භික්ෂූන් කරන ලද්දේ යයි, දස කථාවස්තුලාභී භික්ෂුව විචාළේය. උන්වහන්සේලා ද, ස්වාමීනි, පුණ්ණ, ආයුෂ්මත් මන්තානිපුත්ත යයි ද දැන්වූහ.

ඔවුන්ගේ කථා අසා ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන් දකිනු කැමැත්තේ විය. ඉක්බිති බුදුරද, රජගහ සිට සැවැත්නුවරට වැඩි සේක. පුණ්ණ තෙරුන්ද, බුදුරදුන්ගේ එහි වැඩමවීම අසා, 'ශාස්තෘන් බලන්නෙමි'යි ගොස් ඇතුළත ගඳකිළියටම තථාගතයන් පැමිණි සේක. බුදුරද උන්වහන්සේට ධර්මදේශනා කළ සේක. තෙරුන් බණ අසා, බුදුන් වැඳ සමවත් පිණිස **අන්ධවනයට** ගොස් එක්තරා ගසක් මුල දිවා විහරණයෙන් වැඩහුන් සේක. සාරිපුත්ත තෙරුන්ද, උන්වහන්සේගේ ගමන අසා, හිස් මුදුන්කොට ගොස්, අවකාශ සලකා ඒ ගසමුල හුන්නා වූ උන්වහන්සේ වෙත එළඹ තෙරුන් සමග සතුටු කථාකොට ඒ විශුද්ධිය ගැන විචාළේය. උන්වහන්සේද විචාල විචාළ ප්‍රශ්නයන්, රථවිනීත උපමාවෙන් අතිශයින් සිත සතුටු කළ සේක. ඔවුහු ඔවුනොවුන් සුභාෂිත බස් තෙපළහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ සවස් කාලයේ, භික්ෂු සංඝයා මැද වැඩහුන් තෙරුන්ට, "මගේ ශ්‍රාවක භික්ෂූන් අතර පුණ්ණ තෙරුන් ධර්මකථිකයන් අතරින් අග්‍රයයි අග තනතුරේ තැබූ සේක. උන්වහන්සේ පෙර කර්ම සිහිකොට සොම්නස් වශයෙන් පෙර චරිතාපදාන සිහිපත් කරන්නේ, "**අජ්ඣායකො**" ආදිය කීහ.

එහි **අජ්ඣායකො** යනු නොයෙක් බ්‍රාහ්මණාදීන්ගේ වචනයෙන් හික්මවන ලදි. **මන්තධරෝ** යනු මන්ත්‍රයන් දරන නිසා යන අර්ථයයි. වේද සංඛ්‍යාත චතුර්වේදය සජ්ඣායනා කිරීම ශ්‍රවණය කිරීම වශයෙන් දරයි යනුවෙන් කියන ලද්දේ වෙයි. **තිණ්ණං වේදානං** යනු ඍග්වේද, යජුර්වේද, සාමවේද සංඛ්‍යාත ත්‍රිවේදයන් නුවණින් දරන ලද බැවින් 'වේද' යයි ලබන ලද නම් ඇත්තේ ත්‍රිවේද ග්‍රන්ථවල පරතෙරට ගියේ යන අර්ථයයි. **පුරකඛතොමහි සිසෙසහි** යනු මගේ නිතර පිරිවර සංඛ්‍යාත සිසුන් විසින් පිරිවරා මම සිටිමි. **උපගඤ්ඡිං නරුත්තමං** යනු මිනිසුන්ගෙන්

උතුම් වූ බුදුරදුන් වෙත එළඹියෙමි. සමීපයට ගියේ යන අර්ථයයි. සෙස්ස දත යුත්තේමය. **අභිධම්ම නයඤ්ඤූනං** යනු මම එකල ඒ බුදුරදුන්ගේ කාලයේ, අභිධර්ම න්‍යායේ දක්ෂවෙමි යන අර්ථයයි. **කථාවත්‍ථුවිසුද්ධියා** යනු **කථාවත්‍ථුපකරණයේ** පිරිසිදු දක්ෂ අල්පේච්ඡකථා සතුටු කථා ආදි දසකථා වස්තුවල දක්ෂ. ඒ කථාවස්තුවේ පිරිසිදු වූ. **සබ්බසමිපි පණ්ඩිත** ජනයන්ගේ **විඤ්ඤූපෙත්‍ථාන** අවබෝධකොට. **අනාසවෝ** නික්ලේශීව **විහරාමි** වාසය කරමි. **ඉතෝ පඤ්චසතෙ කප්පෙ** යනු පස්බුදුවරුන් විසින් අලංකාර වූ, භද්‍රකල්පයෙන්, පන්සියයක් කල්පයෙක්හි, **සුපකාසකා** සරළ ප්‍රකට වූ චක්‍රරත්නාදි සත්රුවනින් යුක්ත වූ, සතර මහා දිවයින්වල ජම්බුද්වීප ආදී **ඉස්සර** ප්‍රධාන වූ. **චතුරෝ** චක්‍රවර්ති රජවරු සිවුදෙනා වූහ යන අර්ථයයි. සෙස්ස කියන ලද පරිද්දෙනි.

පුණ්ණ මන්තාණී පුත්ත තෙරුන්ගේ අපදාන
අට්ඨකථාවයි.

3.6

"නගරෙ හංසවතියා" ආදි කථාවෙන් ආයුෂ්මත් **උපාලි** තෙරුන්ගේ චරිතාපදානයයි. මෙයද පෙර බුදුවරුන් විෂයෙහි කරන ලද අධිකාරි ඇති, ඒ ඒ භවයෙහි කරන ලද පින්දහම් රැස් කරමින් **පදුමුත්තර** බුදුරදුන්ගේ කාලයේ හංසවතී නගරයේ භෝග සම්පත් ඇති බ්‍රාහ්මණ කුලයක උපන්නේ, එක් දවසක් ශාස්තෘ සමීපයේ බණ කථා අසන්නා වූ එක් භික්ෂුවක් බුදුරදුන් විසින් විනයධරයන් අතර අග්‍ර තනතුරේ තබනවා දැක, ශාස්තෘන්ට විශේෂ කර්මකොට, ඒ තනතුර ප්‍රාර්ථනා කළේය. ඔහු දිවි ඇති තෙක් කුසල්කොට දෙව් මිනිසුන් අතර සැරිසරන්ේ මේ බුද්ධෝත්පාද කාලයේ, කරණවැමි ගෙදරට උපන්නේ, උපාලි යයි ඔහුට නම් කළහ. ඔහු වැඩිවිය පැමිණියේ, අනුරුද්ධ ඡන්න ආදී ක්ෂත්‍රියයන්ගේ ප්‍රියමිත්‍රයකු වී, බුදුරදුන් අනුපිය අඹ වනයේ වාසය කරන කල්හි පැවිද්දට නික්මෙන ක්ෂත්‍රියන් සමග නික්ම පැවිදි විය. උන්වහන්සේගේ පැවිදි ස්වභාවය පෙළෙහි සඳහන් පරිදිමය. හෙතම පැවිදි වී, උපසම්පදා වී, ශාස්තෘ සමීපයේ කමටහන් ගෙන "ස්වාමීනි, මගේ අරණ්‍යයේ වාසය කිරීම අනුදනිව්" යනුවෙන් කීහ. "භික්ෂුව අරණ්‍යයේ වාසය කරනවිට එකම කටමහනක් වඩන්නේය. මා සමීපයේ වාසය කරනවිට විදර්ශනා ධුරයද, ග්‍රන්ථ ධුරයද පරිපූර්ණ කරන්නේය. හෙතෙම ශාස්තෘ වචනය පිළිගෙන

විදර්ශනා පිණිස වැඩකරන්නේ නොබෝ කලකින්ම අර්හත් බවට පත්විය. ශාස්තෘන් වහන්සේද, ධර්ම තෙමේම සියළු විනය පිටකය ඉගැන්වීය.

උන්වහන්සේ පසුකාලයේ භාරුකච්ඡ වස්තු වූ අජ්ජුක වස්තුව, කුමාරකස්සප වස්තුව වශයෙන් මේ තුන්වස්තු විනිශ්චය කළේය. ශාස්තෘන් වහන්සේ එක එක විනිශ්චයේ සාධුකාර දී, විනිශ්චය තුන විභාග කොටබලා තෙරුන් විනයධරයන් අතර අග තනතුරේ තැබීය. මෙසේ උන්වහන්සේ අග්‍ර ස්ථානයට පැමිණ තමන්ගේ පූර්ව කර්මයන් සිහිකොට සොම්නසට පැමිණියේ, ඒ පූර්ව චිතාපදානය ප්‍රකාශ කරන්නේ, **නගරෙ හංසවතියා** යනාදිය පැවැසීය.

එහි **හංසවති** යනු හංසයන්ගේ ආකාරයෙන් වටකරන ලද ප්‍රාකාර ඇත්තේ යම් නගරයකද, ඒ නගරය හංසවතී නම් වේ. නැතහොත් අනේකාකාර හංසයෝ පොකුණු විල්තෙර ආදියෙහි වාසය කරන්නාහු, ඔබ්මොබ දුවමින් වාසය කරති. මේ නිසා හංසවතී නම් වේ. **සුජාතො නාම බ්‍රාහමණො** මැනවින් උපත ලද බැවින් **සුජාත** නම් වේ. "**අකඛිත්තො** අනුපකුට්ඨො" යන වචනයෙන් ගර්හාවට ලක් නොකර උපන්නේ යන අර්ථයි. **අසීතිකොටි නිචයො** යනු අසූකෝටියක් ධනය ඇති **පහූතධනඤඤවා** අප්‍රමාණ ධන ධාන්‍යවලින් උපන් බ්‍රාහ්මණ සුජාත නම් විය යන සම්බන්ධයි.

යළිත් එහිම මහත් බව දක්වමින් "**අජඣායකො**" යනාදිය කීවේය. එහි **අජඣායකො** යනු අනුන්ගේ වේදත්‍රය ආදි වන මාර්ගයයි. **මනතධරො** යනු ප්‍රඥාවට මන්ත්‍ර යයි කියනු ලැබේ. අථර්වන්වේද ව්‍යාකරණ දැනගැනීම ආදිය ප්‍රඥාවන්තයා යයි **ලකඛණෙ** යනු ලක්‍ෂණ ශාස්ත්‍රයයි. බුදු පසේබුදු චක්‍රවර්ති, ස්ත්‍රී පුරුෂ අත් පාවල පෙනෙන ලක්‍ෂණ ප්‍රකාශ කරන ග්‍රන්ථයේද යන අර්ථයයි. **ඉතිහාසෙ** යනු මෙසේ වීය. මෙසේ වූයේය යනුවෙන් පුරාණ අර්ථ ප්‍රකාශ කරන ග්‍රන්ථයෙහි වේ. **සධම්මෙ** යනු ස්වකීය ධර්මය බ්‍රාහ්මණ ධර්මයෙහි **පාරමිංගතෙ** කෙළවරට ගියේය යන අර්ථයයි.

පරිබබජා යනු නිඝණ්ඨ ශ්‍රාවකයෝය. ඒ සියල්ලෝ නොයෙක් දෘෂ්ටි ඇත්තේ එකල මහියා ෂට් තලයේ හැසිරෙත් යන සම්බන්ධයයි. **යාව යම්පමණ** කාලයක් බුදුරද නූපදීද ඒතාක් **බුදොධාති වචනං නත්ථි** යන අර්ථයයි. **අවචයෙන අහොරත්තං** යනු දිවා රාත්‍රිය දැන දිවා රාත්‍රි නම්

වේ. වර්ෂයක් ඉක්මවන්නේය යන අර්ථයයි. සෙස්ස විශේෂයෙන් දතයුතුය. **මනතාණි පුතෙතා** යනු මන්තාණි නම් වූ කරණවෑම් දියණියකගේ පුතෙකි. මාස පිරුණු බැවින් ද, දවස පිරුණු බැවින් ද ලබන ලද නාමයක් ඇත්තේය යන අර්ථයයි. ඒ ශාස්තෘහුගේ ශ්‍රාවකයා **හෙසසති** වන්නේය යන සම්බන්ධයයි.

එවං කිතතයි සො බුදෙධා යනු ඒ පදුමුත්තර බුදුරදුන් මෙසේ මේ ආකාරයෙන්. **සුනන්දං** සුන්දර ආකාරයෙන් සොම්නස්දායක වූ **කිතතයි** විවරණ දුන්නේය යන අර්ථයි. **සබබං ජනං** සියලු ජන සමූහයා **හාසයනෙතා** සොම්නස් බව පළ කරන්නේ **සකං බලං** තමන්ගේ **හාසයනෙතා** සොම්නස් බව පළ කරන්නේ **සකං** බලං තමන්ගේ බලය **දසසයනෙතා** ප්‍රකට කරන්නේය යන සම්බන්ධයයි. ඉන් අනතුරුව තමන්ගේ ආනුභාවය අන් ආකාරයෙන් දක්වන්නේ, **කතඤඣලි** යනාදිය කීහ. **තදා** ඒ බුද්ධෝත්පාද කාලයේ පෙරකාලයේ සුනන්ද තාපසයා කරන ලද ඇදිලි බැඳ ඇත්තේ සියළු **විනයෝ නමස්කාර කරත්** යන සම්බන්ධයයි. **බුදෙධකාරං කරිසසා නා** යනු මෙසේ ඔහු සියළු ජනතාව පුදන ලද්දේ සමාන පුදන ලදිමි මානයක් නොකොට බුද්ධ ශාසනයේ, අධික කෘත්‍යකොටතමන්ගේ **ගතිං** සොදෙසි පිරිසිදු කළේය යන අර්ථයයි. **සුසසාන මුනිනො වචං** යනු ඒ සම්මා සම්බුදුරදුන්ගේ වචනය ගාථා බන්ධනයේ යහපතට 'ආ'කාරයට හ්‍රස්වකොට 'වචං' යනුවෙන් කියන ලදි. අනාගතයේ මාර්ගයේ ගෝතම නම් ශාස්තෘ ලොව පහළ වන්නේ යයි, මේ මුනිවරයාගේ වචන අසා, යථා යම් ආකාරයෙන්. ගොතමං භාගාවතුන් දකිමි ඒ ආකාරයෙන් අධික කටයුතු පුණ්‍ය සම්භාරයයි. **කසසාමි** කරන්නෙමි. මෙ මගේ **සංකපපො** චේතනා මෙනෙහි කිරීම අහු විය යන සම්බන්ධයයි. **එවාහං චිනතයිසාන මම** යනුවෙන් මා විසින්. **කිදිසං** පින්කළ යුතුය යනුවෙනි. **කිරියං** කළයුතු කටයුතු සිතුවෙමි යන අර්ථයයි. **කමමං ආචරාමි** යනුවෙන් මම කෙබඳු පින්කමක් රැස්කරමි. පුරමි යන අර්ථයයි. **පුඤඤකෙඛතෙත අනුනතරෙ** උත්තර නැති, සියළු පින්කම්වලට හේතුසාධක වූ රතනත්‍රයෙහි යන අර්ථයයි. **අයංච පාඨිකො භික්ඛු** යනු මේ භික්ෂුව ස්වර බිඳීම් වශයෙන් ග්‍රන්ථ පෙළ වශයෙන්, ඛාන මාර්ගයෙන් කියන්නා වූ පාඨික යන ලබන ලද නාමය ඇත්තේ භික්ෂුව බුද්ධශාසනයේ කියන්නා වූ පාඨික යන ලබන ලද නාමය ඇත්තේ භික්ෂුව බුද්ධශාසනයේ සියළු පෙළ කියන්නවුන්ගේ පාඨක වන ඇත්තේ අතර. **විනයෙ අගනිකඛිතෙතා** අග්‍ර යයි තබන ලද්දේ **තං ඨානං** ඒ භික්ෂුව විසින් පිහිටුවන ලද තනතුර

ඇත්තේ මම ප්‍රාර්ථනා කළෙමි යන අර්ථයයි. ඉන් අනතුරුව තමන්ට පින් කරනු පිණිස උපාය දක්වන්නේ **ඉදං** මෙ **අමිතං** භොගං යාදිය කීවේය. මෙ මගේ **අමිතං** ප්‍රමාණ විරහිත භෝගරාශිය **අකෙඛාඛහං** ක්‍ෂය කිරීමට නොහැකිවන්නේ. **සාගරූපමං** සාගරය හා සමාන **තෙන භොගෙන** එබඳු ආකාර ධනයෙන් **බුද්ධසස ආරාමං මාපයිං** යන සම්බන්ධයි. සෙස්ස උඩ සඳහන් පරිද්දෙනි.

භික්ඛු සංඝෙ නිසීදිත්වා සම්බුදුරුන් ඔහු විසින් මැනවින් කරන ලද්දේ **මාපිතං** කරවන ලද, **සංඝාරාමය** පිළිගෙන ඒ ආරාමයේ ආනිශංස ප්‍රකාශ කරන, **ඉදං වචනං අබ්‍රවී** කීවේය යන සම්බන්ධයි. කෙසේද, "යො සො" යනුවෙනි. **යො** සංඝාරාම දායක තාපසයා **සුමාපිතං** කුටිලෙන මණ්ඩප ප්‍රාසාද, හර්ටිය ප්‍රාකාර ආදියෙන් සරසන ලද සංඝාරාමය **සංඝස්ස පාදාසි** ප්‍රාකාරයෙන් සොමනස් සහගත සිතින්, දුන්නේය. ඒ මම **කිත්තයිසසාමි** යනුවෙන් ඒ තාපසයා වූ මම ප්‍රකට කරන්නෙමි. දේශනා කරන්නෙමි. එතර කරන්නෙමි යන අර්ථයයි. **සුණාථ මම භාසතො** යනු කථා කරන්නා වූ මගේ වචනය අසවු. බහා තබන ලද කන් ඇති, නොවිසුරුණු සිත් ඇත්තේ මෙනෙහි කරවු යන අර්ථයයි.

ඔහු විසින් දෙන ලද ආරාමයේ ප්‍රතිඵල දක්වමින් **හත්ථී අසසාරථා පතති** යන ආදිය කීවේය. එය විශේෂ වශයෙන් දතයුතුය. **සංඝාරාමසසිදං ඵලං** යනු, මේ මතු අනුභව කළ යුතු සම්පත් සංඛ්‍යාත ඉෂ්ට ප්‍රතිඵල සංඝාරාම දානයේ ප්‍රතිඵල විපාක යන අර්ථයයි. **ඡළාසී** යනු අසූහයකි. **සහසසානි සමලංකතා** මැනවින් අලංකාර කළ සරසන ලද, **නාරියො** ස්ත්‍රීහු **විත්තවත්‍යා හරණා** යනු විසිතුරු නොයෙක් රූප ඇති වස්ත්‍ර හා ආභරණවලින් සමන්විතව **ආමුත්තමණිකුණ්ඩලා** යනු එල්ලන ලද මුතුහර මැණික් ඔබබවන ලද කන් ඇති යන අර්ථයයි. එබඳු ස්ත්‍රීන්ගේ රූපශෝභාව අතිශය වර්ණනා කරමින් **ආළාර පමහා** යන ආදිය කීහ. එහි **ආළාරානි** යනු මහත් වූ ඇස් ගුළ සමාන යම් ස්ත්‍රියන්ගේ ඒ ඇහිබැම වේ. බඹරුන්ගේ මෙන් මන්ද ලෝන ඇති යන අර්ථයයි. **භාසුලා** ස්වාභාවික සිතහවෙන් පිරි ලීලා විලාශය යන අර්ථයයි. **සුසඤඤා** යනු සුන්දර සියුමැලි ශරීර අවයව ඇති, **තනුමජ්ඣිමා** යනු කුඩා බඩ උදරය පෙදෙසයි. සෙස්ස කියන ලද පරිදි දතයුතුය.

තසස ධමෙමසු දායාදො යනු ඒ ගෞතම බුදුරදුන්ගේ ධර්මයෙහි

දායාද වූ ධර්ම කොට්ඨාශයයි. **ඔරසෝ** යනු උරහිසින් දරා, උපන්, ලිහිල් සහ ආදි දසවැදෑරුම් ව්‍යඤ්ජනවලින් යුක්ත කණ්ඨජ තාලුජ, ඕෂ්ඨජ ආදි පංචවිධ ස්ථානයේ ගැටී දේශනා කරන ලද ධර්ම දේශනාව අසා, සෝතාපන්න ආදි මාර්ග පිළිවෙළින් සියලු කෙලෙස් ක්ෂයකොට අර්හත් ඵලයෙහි සිටි බැවින් උරහිසින් උපන් පුතා යන අර්ථය කියනු ලැබේ. ධම්ම **නිම්මිතෝ** යනු ධර්මය හා සමාන වූ දඬුවමින් තොර අවි ආයුධවලින් තොරව නිමකරන ලද ප්‍රකට වන්නේය යන අර්ථයයි. **උපාලි නාම නාමෙනා** යනුවෙන් කිසිවකු හෝ හෙතම මවගේ නාමයෙන් මන්තාණි පුත්ත යන නම ඇත්තේ අනුරුද්ධ ආදීන් සමග ගොස් පැවිදි වූ බැවින් ක්ෂත්‍රියන්ට ඉතා සමීපව ඇලීමෙන් යුතුව සිතින් හා කයින් බැඳි කටයුතු කරන නිසාවෙන් **උපාලි** යන නාමයෙන් ශාස්තෘ ශ්‍රාවකයා වන්නේය යන අර්ථයයි. **විනයෙ පාරමිං පත්තා** යනු විනය පිටකයෙහි කෙළවරට පැමිණ යානායානෙකොවිදෝ යනුවෙන් කාරණා කාරණා විෂයෙහි දක්ෂ, කුසලතාවයෙන් පිරි යන අර්ථයයි. **ජින සාසතං ධාරයනෙතා** බුදුරදුන් විසින් දේශනා කරන ලද අනුශාසනා ඇත්තේ, බුදුරදුන්ගේ තුන්පිටකයෙහි වාචන ශ්‍රවණ චින්තන හා ධාරණ වශයෙන් දරමින් සළකමින් යන අර්ථයයි. **විහරිසසත්‍යනාසවෝ** යනු නික්ලේශී සතර ඉරියව්වලින් නොපරිහෙළන්නා වූ ආත්මභාව පවත්වා ගන්නේය යන අර්ථයයි. **අපරිමෙය්‍යුපාදාය** යනු නොයෙක් සියදහස් ගණන් මුල්කොට, **පතෙථමි තව සාසනං** යනුවෙන් ගෞතම බුදුරදුන්ගේ ශාසනයේ විනයධරයන් අතර අග්‍ර වන්නේය. ඔබගේ ශාසනය ප්‍රාර්ථනා කරමි. කැමැති වෙමි යන අර්ථයයි. **සො මෙ අතෙථා** යනු හෙතම අග්‍රස්ථානයේ තබන ලද අර්ථයෙන් යුක්ත බවකි. මෙ මා විසින් පැමිණේය යන අර්ථයි. **සබ්බසංයොජනක්ඛයො** යනුවෙන් සියළු සංයෝජන ධර්මයන් ක්ෂයකොට මා විසින් පිළිපන්නේ යන සම්බන්ධයයි. නිර්වාණය සාක්ෂාත් කළේ යන අර්ථයයි. **රාජ දණ්ඩන තජ්ජිතෝ** පෙළන ලද්දේ, **සුලාවුතෝ** හුලෙන් ආවරණය කරන ලද්දේ, **පොසෝ** මිනිසා **සුලෙ සාතං** මිහිරි සුව නොවිඳින්නේ, අනුභව නොකරන්නේ **පරිමුත්තිංව** මිදුණේමය. **ඉච්ඡති** යම්සේ යනු සම්බන්ධයයි. **මහාවීර** වීරයන් අතර වීර උත්තමය. මම භව දණ්ඩෙන්, ජාති දණ්ඩෙන්. **තජ්ජිතෝ** පෙළන ලද්දේ, කර්ම සුලයෙන් යුතුව, කුසල අකුසල කර්ම නමැති හුලෙහි ආවරණය කරන ලද්දේ ශාන්තවම විද්‍යමාන වන්නේ පිපාස වේදනාවද පිපාස ආතුර බවද, **අට්ටිතෝ** මඩනා ලද්දේ දුක ආවරණය කර **භවෙ සාතං** සසරේ මිහිරි සැපය **න වින්දාමි** නොලබමි.

රාග ගින්න, ද්වේෂ ගින්න, මෝහ ගින්න සංඛ්‍යාත නරක ගින්න, කල්ප විනාශ කරන දුක් ගින්න සංඛ්‍යාත වූද, **තිහි අගිහි ඛයනෙනා** මිදීමට විශේෂයෙන් මිදීම පිණිස ගවෙසාමි සොයා බලමි. එසේම වේ යන සම්බන්ධයයි. යම්සේ, රාජදඬුවම්ද, මෙයින් ගියේ පැමිණියේ, මිදුණේ, සොයයිද, එසේ මට භව දණ්ඩයට පැමිණියේ, ඉන් මිදීමට සොයමියි යන සම්බන්ධයයි. නැවත සසරින් මිදීම උපමා උපමේය වශයෙන් දක්වමින් **යථාවිසාදෝ** යන ආදිය කීවේය. එහි විෂෙන් සර්ප විෂ වශයෙන් හාත්පසින් දෂ්ට කළේද, කලකිරුණේ, සර්ප දෂ්ට කළේ යන අර්ථයයි. නැතහොත් විෂෙන් හලාහළ විෂය අනුභව කරයි. ගිලියි යන විෂ කෑවේය යන අර්ථයයි. යම් පුරුෂයෙක් කලකිරුණේද, ඒ හා සමානව, **විසෙන පරිපීළිතෝ** ඒ විෂට **සාතාය** විනාශය පිණිස. **උපායනං** උපායශීලි වූ අගදං ඖෂධ **ගෙවසෙය්‍ය** පර්යේෂණය කරන්නේය. ගවේෂණය කරන්නේය. **විසසාතකං** විෂ නසන, අගදං ඖෂධය **පසෙසය්‍ය** දකින්නේ නම් හෙතම එම තමන් විසින් දක්නා ලද ඖෂධය **පිවිත්වා විසමහා** පානයකොට විෂෙන්. **පරිමුත්තියා** මිදීම පිණිස **සුඛී අස්ස** වන්නේය. යම්සේ යන සම්බන්ධයයි. **තථෙවාහන්නි යථා** යම් ආකාරයෙන් ඒ මිනිසා **විසහතෝ** විෂ සහිත සර්පයා විසින් දෂ්ට කරන ලද විෂ කන්නාද ඖෂධ පානය කොට සුවපත් වන්නේය. **තථෙව** ඒ ආකාරයෙන් මම **අවිජ්ජාය** මෝහයෙන් **සං** යහපත **පිළීතෝ සද්ධම්මාගදමෙසහං** මම සද්ධර්ම සංඛ්‍යාත ඖෂධ මෙතෙම සොයන්නේ යන අර්ථයයි. **ධමෙමා සධංගවෙසනෙනා** යනු සංසාර දුක් නැමැති විෂ විනාශ කිරීම පිණිස, ධර්ම නැමැති ඖෂධය සොයන්නේ, දුටුවෙමි. **සක්‍යසාසනං** යනු ශාක්‍ය කුලයෙන් පහළවූ ගෞතමයන්ගේ ශාසනය දුටුවෙමි යන අර්ථයයි. **අග්ගං සබෙබාසධානං** යනු සියළු ඖෂධයන් අතර ඒ ශාක්‍ය ශාසනය සංඛ්‍යාත ධර්ම නමැති ඖෂධයෙන් අග්‍ර, උතුම් යන අර්ථයයි. **සබ්බසල්ල විනොදනං** යනු රාග හුල් ආදීන්ගේ සියළු ශල්‍යයන්ගේ කළකිරීමට සංසිඳීමට **ධමෙමාසධං** ධර්මසංඛ්‍යාත ඖෂධය **පිවිත්වා සබ්බං විසං** සියළු සංසාර දුක් විෂ **සමුහනිං** නැසුවෙමි යන සම්බන්ධයයි. **අජරාමරං** යනු ඒ දුක් නැමැති විෂ දුරුකොට **අජරං** ජරාවෙන් තොර **අමරං** මරණයෙන් තොර **සීතිභූතං** රාග වේදනාවෙන් තොර වූ බැවින් සිසිල් වූ නිවණ මට **එසසයිං** ප්‍රත්‍යක්ෂ කළෙමි යන සම්බන්ධයයි.

නැවත ක්ලේශ නැමැති අන්ධකාරයට උපමා බව දක්වන්නේ, **යථා භූතට්ඨිතෝ** යනුවෙන් කීහ. එහි **යථා** යම් ආකාරයෙන් භූතයෙකු

වශයෙන් සිටියේ, **භූතෙන** යක්ෂයකු විසින් **අධිට්ඨතෝ** පෙළුණු පොසොමිනිසා **භූතගාහෙන** යක්ෂාවේශයෙන් **පීළිතෝ** දුකට පත්වූයේ, **භූතසමා** යක්ෂාවේශයෙන්, **පරිමුත්තියා** මිදීම පිණිස, **භූතවෙජ්ජං ගවෙසෙය්‍ය තං ගවෙසමානොව භූත** වෛද්‍යවරයා සරළ ලෙස **කොවිදං** දක්ෂ ලෙස **භූතවෙජ්ජං** භූතවිද්‍යාව දකින්නේය. ඒ භූත වෛද්‍යවරයා, ඒ ඒ යක්ෂාවේශ වූ පුරුෂයාගේ ආවේශ වීම **විහෙඨෙඤ්ඤ** විනාශ වන්නේය. **සමූලංච** මුල සංග ඉදිරිය නොසොයා, **විනාසයෙ** විද්වංසනය කළේ යන සම්බන්ධයයි. මහාවීර, වීර උත්තමය, **තමගගාහෙන** ක්ලේශ අන්ධකාරයෙන් පෙළුණු මම එසේම ඒ ප්‍රකාරයෙන්ම **තමතෝ** ක්ලේශ අන්ධකාරයෙන්, **පරිමුත්තියා** මිදීම පිණිස **ඤාණාලොකං** ප්‍රඥා ආලෝකය සොයමියන සම්බන්ධයයි. ඉන් අනතුරුව, **කිලෙසතමසොධනං** ක්ලේශාන්ධකාර දුරුකරන, **සක්‍යමුනිං** අදඳසං යන අර්ථයයි. ඒ ශාක්‍යමුනිතෙම **මෙ** මගේ **තමං** අන්ධකාර ක්ලේශ පටලය **භූතවෙජ්ජාව භූතිකං** යක්ෂයකු අල්ලා ගත්තාක් මෙන් **විනොදෙසි** දුරුකළේය යන සම්බන්ධයයි.

ඒ මම මෙසේ මිදුණේ, **සංසාරසොතං** සංසාර ප්‍රවාහය **සං** සරළ ලෙස **ඡින්දිං** දුරුකළෙමි. **තණ්හාසොතං** තෘෂ්ණා නමැති ඕඝය. **නිවාරයිං** නිරවශේෂ වශයෙන් නොපවත්වන ලෙස කළෙමි යන අර්ථයයි. **භවං උගඝාතයිං සබබං** යනුවෙන් කාමභව ආදි සියළු අළුත් භවයක ගැටුණෙමි. විනාශ කළෙමි යන අර්ථයයි. **මූලතෝ** විනාශ කරන්නේ භූත වෛද්‍යවරයෙකු මෙන් මුලපටන් **උගඝාටයිං** යන සම්බන්ධයයි. අනතුරුව නිවන සොයනු පිණිස උපමා දක්වමින්, **යථා** යනාදිය කීවේය. එහිදී බරපතල වූ බැරෑරුම් ලෙස නාග ගිලයි යනුවෙන් **ගරුළොා** නම් වේ. බරපතල ලෙස හෝ නාගයා ඇදගනියි යනුවෙන්ද, **ගරුළොා** ගුරුළුරජා **අත්තනොා භක්ඛං** සිය ගොදුරට **පන්නගං** පකාරයෙන් අනුන්ගේ අතට නොයයි යනුවෙන් පන්නගොයන නම් ලදුයේ නාගයා ගැනීම පිණිස උඩ පනියි. බිම වැටෙයි. **සමන්තා සමන්තතොයොජනසතං** සියක් යොදුන් පමණ **මහාසරං** මහා සමුද්‍රය තමන්ගේ පියාපත් සුළඟින් **විකෙඛාසොමි** කලඹයි යන සම්බන්ධයයි. **සො** සුපර්ණයා ගුරුළු **විහංගතොා** අහසේ යන සුළු වූයේ අහස්ගමනේ ඇලුණේ **පන්නගං** නාගයා **ගහෙත්වා අධොසීසං** එල්ලාගෙන **විහෙඨයං** ඒ ඒ තැන විවිධ ලෙස වෙහෙස කිරීමෙන් පෙළන්නේ **ආදාය** දඩිකොටගෙන **යෙන කාමං** යම්තැනකට යනු කැමැත්තේද, එහි **පක්කමති** යයි යනු සම්බන්ධයයි. **ස්වාමීනි, මහාවීර යම්සේ ගරුළොා බලි** බලවත් නාගයා ගෙන, පිටත්ව යයිද? **තථා එවං**

එසේ මම **අසංඛත** හේතු-ප්‍රත්‍යයෙන් නොකරන ලද, නිර්වාණය **ගවෙසනෙතා** සොයන්නේ, ප්‍රතිපත්ති පිරීම් වශයෙනි. **දොසෝ** සියළු එක්දහස් පන්සියයක් ක්ලේශ **විකබාලයිං** විශේෂයෙන් සමුච්ඡේද ප්‍රහාණයෙන් පිරිසිදු කළෙමි මම යන සම්බන්ධයයි. යම්සේ ගුරුළා, නාගයා රැගෙන අනුභවකොට වාසය කරයිද? යම්සේ මම **ධම්මවරං** උතුම් ධර්මය **දිට්ඨෝ** බැලුවෙමි. මෙසේ **සනතිපදං** නිවන්පදය **වලංජෙත්වා** වළඳා වාසය කරමි යන සම්බන්ධයයි.

දැන් "නිවණට දුර්ලභ බව පෙන්වන්නේ **ආසිව** එහි සියළු දෙවියන්ට ආශ්‍රාව කැමැත්ත මේ වැලට ඇත්තේනුයි **ආසවනී** නම් වැල **චිත්තලතා වනෙ** නොයෙක් විසිතුරු වැල්වලින් ගහණ වූ වනයෙහි උද්‍යානයෙහි **ජාතා** උපන්නේය යන අර්ථයයි. **තඤඤා** වැලේ **වඤඤහඤඤන** වර්ෂ දහසක් ඇවෑමෙන් **එකං එලං නිබ්බත්තග** එක ගෙඩියක් හටගනියි. **තං** දේවා යනුවෙන් ඒ ආසාවතිවැල, බොහෝ දුර ගෙවා ගෙඩිය එපමණ චිරාත් කාලයක් ඉක්මවා ගෙඩි හටගත්තේ සතුට විද්‍යමාන වන්නේ දේවා තව්තිසාවැසි දෙවියෝ **පයිරුපාසනති** භජනය කරති. **අහං ආසවනි නාම ලතුනතමා** වැල් අතර උත්තම වැල මෙසේ, දෙවියන්ට ප්‍රිය වූයේය යන සම්බන්ධයයි. **සතසහඤඤුපාදාය** යනු සියදහස් ගණන් සංවත්සර මුල්කොට **නාහං පරිචරෙ මුනි** යනුවෙන් මෞත වෘත්තිය මෞත වෘත්තය කියනු ලැබේ. ඤාණයයි ස්වාමිනි, ඤාණවන්ත මුනිවරයා, සර්වඥ වූ මම වෙමි. **තං** පින්වතුන් **පරිච්ඡා** ලඟින් ඇසුරු කරමි. **කායපාතං නමඤඤාමි** යනු සවස් කාලයද, පෙරවරු කාලයද, දෙතුන්වරක් නමස්කාර කරන්නෙමි. ප්‍රණාම කරමි. යම්සේ දෙවා තව්තිසා දෙවිවරු මෙන් ආසවනී වැල සවසද උදයද ඇසුරු කරති යන සම්බන්ධයයි. අවඤඤා **පරිචරියා** යනු යම්හෙයකින් බුදුරදුන් දකිනු ලද කැමැත්තද නිර්වාණ ප්‍රතිලාභය වූයේය. එහෙයින් බුදුරදුන් අනුව යාමෙන් ද වත්පිළිවෙත් ක්‍රියාවන් අවඤඤා හිස්නොවී පහත් නොකොට **නමඤඤාන** ප්‍රණාම කිරීමද, අමොඝා හිස් නොවූ එබැවින් **දුරාඝානං** දුරසිට සංසාර මාර්ගයට ආවේනුයි, මා පෙනෙන විද්‍යමාන වන්නේ, **බණ්ඩෙයං** මේ බුද්ධ පාදඤඤය **න විරාධය** ඉක්ම නොයමි. මා ඉක්මවා නොගියේ යන අර්ථයයි. බුදුන් දැකීමට හේතුවාසනා ඇත්තේ නිර්වාණයට පත් මම මතු උපදින භව, මගේ පිළිසිඳ ගැනීම **විචිනනෙතා** පරීක්ෂා කර බලන්නේ නොදකිමි යන සම්බන්ධයයි. **නිරුපධි** ඤාති උපධි, ක්ලේශ උපධිවලින් විරහිත වූ තොර වූ **විප්පමුනෙතා** සියළු ක්ලේශවලින් මිදුණා වූ **උපසනෙතා** ක්ලේශ දාහයෙන් මිදුණා වූ ශාන්ත

මනසින් හැසිරෙමි. මම යනු සම්බන්ධයයි. නැවත තමන්ගේ බුදුවීම පිණිස වූ උපමා දක්වමින් **යථාපි පදුමං නාම** යනාදිය කීවේය. **සූරියරංසෙන** සූර්ය රශ්මිය ස්පර්ශ වීමෙන්. යම්සේ **පදුමං** නාමද **පුප්ඵති** පිපෙයි. **මහාවීර** විරූ උත්තමය, මම එසේම **බුද්ධරංසෙන** භාග්‍යවත් බුදුරදුන් දේශිත දහම් රැස් ප්‍රභාවයෙන් පිපෙන ලද්දේ යන අර්ථයයි.

නැවත බුද්ධ දර්ශනයෙන් නිර්වාණ දර්ශනය බබළන නිසා "යථා බලාකා" යනාදිය කීවේය. එහි **බලකායොනිමහි** බක ජාතියෙහි **සදා** සැමකල්හි **ප්‍රමා** යම්සේ පුරුෂයකු **න විජානති** පුරුෂයකු ලෙස අවිද්‍යමාන කල්හි කෙසේ කොකුන්ගේ ගැබ් ගැනීමක් වේද, ඉදින් **මෙසෙසු ගජ්ජමානෙසු** ශබ්ද කරන කල්හි මේඝ ගර්ජනා අසා, ඒ බකිනියෝ **සදාකල්හි ගබ්භං ගණ්හනති** බිජුවට දරත් යන අර්ථයයි. **යාව යම්තාක් කල් මෙසො න ගජ්ජති** වලාකුළු ශබ්ද නොකරයිද, **තාව** එපමණ කල් චිරාත් කාලයක් ගැබ බිජුවට දරත්. **යදා** යම් කාලයක මේඝ වර්ෂා වන්නේද ප්‍රකාරයෙන් ගර්ජනාකොට වර්ෂා කරයි. වැසි ධාරා වැගිරෙයි. **තදා** ඒ කාලයේ **භාරතො** ගැබ් දැරීමෙන් **පරිමුචචනති** බිත්තර හෙළත් යන අර්ථයයි. ඉන් අනතුරුව උපමේය සම්පත් දක්වමින් **පදුමුත්තර බුද්ධසසා** යනාදිය කීවේය. පදුමුත්තරස්ස බුද්ධසස ධම්මමෙසෙන ව්‍යවහාර පරමාර්ථ දේශනා සංඛ්‍යාත මේඝයෙන් **ගජ්ජනො** ගර්ජනා කරන්නේ දේශනා කරන්නා වූ ධම්මමෙඝසස සදෙදන ඝෝෂානුසාරයෙන් මම එකල ධම්මගබභා විවෘතව ලා දාන සීලාදි පුණ්‍ය සම්භාර ධර්ම ගැබ **අගණ්හිං** ගත්තෙමි යන සම්බන්ධයයි.

සතසහසසුපාදාය කල්ප ලක්ෂයක් ආදිකොට **පුඤඤගබභං** දාන සීලාදි පුණ්‍ය සම්භාර මම **ධාරෙමි** පුරමි. යම්තාක් **ධම්මමෙඝො** ධර්ම දේශනා **න ගජ්ජති** බුදුරදුන් විසින් දේශනා නොකරත්ද? ඒතාක් මම **භාරතො** සංසාර ගර්භ බරින් **නපපමුඤචාමි** නොමුදමි. වාසය නොකරමි යනු සම්බන්ධයයි. ස්වාමීනි, **සකයමුනි** ශාක්‍ය වංශයේ උපන්න, **යදා** යම් කාලයක **සුද්ධෝදන මහරජ්ජුගේ** ඔබේ පියතුමා, **රමෙම** රමණීය **කාපිලවත්ථවෙ** කපිල වස්තු නම් නගරයේ **තුවං** ධර්ම මේඝයෙන් **ගජ්ජති** ඝෝෂා කරයි? **තදා** ඒ කාලයේ මම **භාරතො** සංසාර ගැබ්බරින්, **පරිමුඤචිං** මිදුණේ වෙමි යන සම්බන්ධයි. ඉන් අනතුරුව තමන් විසින් අධිගත වූ මාර්ග-ඵල දක්වමින් **සුඤඤතං** යන ආදිය කීවේය. එහි තමන්ගේ මුල් කාරණා නොපෙනෙන නිසාවෙන්, **අපපණිහිතං** විමොක්ෂයද, ආර්ය මාර්ගයද, අධිගම කළෙමි. වූයෙමි යන සම්බන්ධයයි. **චතුරො ඵලෙ**

සබ්බෙ සතර මහණදම් ඵල සියල්ල සාක්ෂාත් කළෙමි යන අර්ථයයි. **ධම්මෙවං විජටෙසහං** යනු මම මෙසේ සියළු ධර්ම අවුල් දුරු කළෙමි කෙලෙස් විද්වංසනය කළෙමි යන අර්ථයයි.

දෙවෙනි බණවර වර්ණනාවයි.

ඉන් අනතුරුව තමන් අධිගත වූ විශේෂය පෙන්වමින්, **අපරිමෙයුපාදාය** යනාදිය කීවේය. එහි පරිමාවක් ප්‍රමාණයක් නැත්තේනුයි, අපරිමෙය්‍ය නම් වේ. වර්ෂයක් පාසා ගණන් ගැනීම් වශයෙන්, ප්‍රමාණ කිරීමට නොහැකි වන්නේ යන අර්ථයයි. අප්‍රමාණ කල්පයක් ඇසුරුකොට **තව සාසනං** 'අනාගතයේ ගෞතම බුදුරදුන්ගේ ශාසනයේ විනයධරයන් අතර අග්‍ර වන්නෙමි. මෙසේ, **පත්ථෙමි** අතීත අර්ථයෙහි වර්තමාන වචනය ප්‍රාර්ථනා කළෙමි යන අර්ථයයි. **සො මෙ අත්ථො** යනු ඒ ප්‍රාර්ථනා සංඛ්‍යාත අර්ථය මෙ මා විසින් **අනුපපත්තෙනා** නිපදවූයේ යනු අර්ථයයි. **අනුත්තරං සන්තිපදං** නිවණට අනුව පැමිණියෙමි අධිගත කළෙමි යන සම්බන්ධයි. ඒ මම අධිගම කළ බැවින් **විනයෙ** විනය පිටකයේ **පාරමිපත්තෙනා** කෙළවරට පැමිණියේ යම්සේ, **පාටිතො ඉසි** යනුවෙන්, යම්සේ පදුමුත්තර බුදුරදුන්ගේ ශාසනයේ විනයධරයන් යම්සේ පදුමුත්තර බුදුරදුන්ගේ ශාසනයේ විනයධරයන් අතර අග්‍ර ඍෂි භික්ෂුව වශයෙන් ප්‍රකට විය. එසේම මමද යන අර්ථයයි. **නමෙ සම සමො අත්ථි** යනුවෙන් විනය දැරීම නිසා මෙ මා විසින්, **සමසමො** සමාන අන්‍ය වූ අර්ථයක් නැත යනුවෙනි. ශාසනය අවවාද අනුශාසන සංඛ්‍යාතව ශාසනය දරම් පුරම් යන අර්ථයයි. නැවත තමන්ගේ විශේෂත්වය දක්වමින් **විනයෙහ බන්ධකෙ චාපි** යනාදිය කීවේය. එහි **විනයෙ** යනු උභතො විභංගයයි. **බන්ධකෙ** යනු මහාවග්ග චුල්ලවග්ග දෙකයි. **තිත්තිකචෙජදෙ** යනු තේරස සංඝාදිශේෂ පාචිත්තිය නිහ ආදියයි. **පඤ්චමෙ** යනු පරිවාරපාළිය ද **එත්ථ** මෙහි සියළු විනය පිටකයෙහි මගේ **විමති** සැකය **නත්ථි**. විද්‍යමාන නොවේ. **අක්ඛරෙ** යනු විනය පිටකය කෙළවර අකාරාදි අක්ෂර ව්‍යඤ්ජනෙ යනු 'ක' ආදිකොට ඇති ව්‍යඤ්ජන හෝ මට සැකයක් නැත යන සම්බන්ධයයි. **නිගහෙ පටිකම්මෙ චා** යනුවෙන් පාපි භික්ෂූන්ට නිග්‍රහ කිරීමද ඇවැත්වලට පත් භික්ෂූන්ට පරිවාස නොදීම ආදි පිළියම්ද, **යානා යා නෙ** කාරණා අකාරණා වශයෙන් **කොවිදො** දක්ෂ යන අර්ථයි.

ඔසාරණෙ කර්ජනිය ආදි කර්මවලට පිළිසරණ වීම් වශයෙන් අවවාද අනුශාසනා ලැබීමටද වුට්ඨාපනෙච ආපත්තිවලින් නැගී සිට නිරවුල් බවට පැමිණීමේ දක්ෂ වූ යන සම්බන්ධයයි **සබ්බත්ථ පාරමිං ගතො** යනු සියළු විනය කර්මයේදී කෙළවරට පැමිණියේ, දක්ෂ, කුසල යන අර්ථයයි. **විනයෙ බන්ධකෙ චාපි** යනුවෙන් කියන ලද අයුරින් විනයෙහිද, ඛන්ධකයෙන්ද පියවරකි. **නික්ඛිපිත්වා** පටන්ගෙන **උභතො විනිමටෙත්වා** යනුවෙන් විනයෙන් යන දෙකෙන් නිමකරවා, නහය ගෙනහැර පෙන්වා **රසතො කෘත්‍ය** වශයෙන් **ඔසාරෙය්‍යං** ගමන්කිරීම යනුවෙනි. **නිරුත්තියාච කුසලො** යනු වෘක්ෂ, වස්ත්‍ර, කල, මල් සැරසිලි ආදියෙහි ව්‍යවහාර කිරීම් ආදියෙහි දක්ෂ වූ **අත්‍ථානත්‍ථෙ කොවිදො** යනුවෙන් අර්ථය වැසීමද අනර්ථයට දක්ෂ වූ **අනඤ්ඤාතං මයා නත්‍ථි** යනුවෙන් විනය පිටකයේ හෝ සියළු පිටකත්‍රයෙහි හෝ මා විසින් නොදන්නා ලද, අවබෝධ නොකරන ලද, නොදන්නා කිසිවක් නැත යන අර්ථයයි. **එකගෙගා සත්‍ථුසාසනෙ** යනු බුද්ධ ශාසනයේ මමම එකම විනයධරයන් අතර අග්‍ර ශ්‍රේෂ්ඨ උත්තම යන අර්ථයයි. **රූපදක්ඛෙ අහං අජ්ජ** යනු අද මේ කාලයේ **සක්‍යපුත්තස්ස** භගවත්හුගේ **සාසනෙ** කාලයේ බුද්ධ වචනයෙහි මම **රූප** දක්ඛෙ රූප දර්ශනයෙහි, විනය විනිශ්චයෙහි **සබ්බං කම්බං** සියළු සැක සංකා දුරුකරමි යන සම්බන්ධයයි. **ඡින්දාමි සබ්බ සංසයං** යනුවෙන් වීම් මම අතීතයෙහි මුල්කොට සියළු තුන්කාලයේ අරබා උපන් සියළු දොළොස් වැදෑරුම් සැකයන් **ඡින්දාමි** සංසිඳවමි. සියල්ල විද්වංසනය කරමි යන අර්ථයයි. **පදං අනුපදංචාපි** යනුවෙන් පදයද පූර්ව පදයද අනුපදද පසුපදද, **අක්ඛරං** එක එක අක්ෂරද, **බ්‍යඤ්ජනං** සිටිලධනිත ආදි දසවැදෑරුම් ව්‍යඤ්ජන විධානයන්, **නිදානෙචෙති** එසමයෙහි ආදිකොට ඇති නිදානයේ, **පරියොසානෙ** යනුවෙන් නිගමනයෙහිද, **සබ්බත්‍ථ කොවිදො** යනු සියළු ස්ථානවල දක්ෂ යන අර්ථයයි.

ඉන් අනතුරුව භගවත්හුගේම ගුණ ප්‍රකාශ කරමින් **යථාපි රාජා** බලවා යනාදිය කීවේය. එහි යම්සේ **බලවා** ශක්ති බල සම්පන්න වූ සේනා බලසම්පන්න වූ **රාජාපරං** අන්‍ය වූ ප්‍රතිවිරුද්ධ රජවරුන්ගේ සේනාව **නිගණ්හිත්වා** නිරවශේෂ වශයෙන් ගෙන පලාගොස්, **තපෙය්‍ය** සන්තාපයට දුකට පත් කරන්නේය. **විජිනිත්වාන සංකාමං** යනු සුද්ධං සතුරු සේනා සමාගම තුළින් යුද්ධය දිනා විශේෂයෙන් දිනා ජයගෙන **නගරං තත්‍ථ මාපයෙ** යනුවෙන් එහි ඒ දිනන ලද තැන නගරය ප්‍රාසාද හර්මී ආදියෙන් අලංකාර වූ වාසස්ථානය **මාපයෙ** කරවන්නේය යන

අර්ථයයි. **ප්‍රාකාරය**, සුදුපිරියම්කොට කැමති පරිදි ප්‍රාකාරද කරවා යන සම්බන්ධයයි. **පරිඛඤ්චාපි** මැටි පිරියම්, ජල පිරියම් වියළි පිරිකම්ද කරවන්නේය. **එසිකං දවාරකොට්ඨකං** නගර ශෝභනය පිණිස ඔසවන ලද ස්ථම්භයද, මහත්වූ කෝෂ්ඨාගාරයද, සිවුමහල් දොර කොරටුද කරවන්නේය. **අට්ටාලකෙ විවිධෙ** යනුවෙන් සිවුමහල් ආදි ප්‍රභේදගත ඉතා උස් අට්ටාලද, විවිධ නොයෙක් ආකාර බොහෝ දේ කරවූයේ යන සම්බන්ධයයි. **සුවිභත්තනන්තරාපණං** මැනවින් බෙදන ලද, කොට්ඨාස වශයෙන් අතුරු ආපන නොයෙක් ආකාරයේ දහසක් පමණ කරවන්නේ යන සම්බන්ධයි. **කාරාපෙත්‍ය සභං තත්‍ථ** යනු ඒ මවන ලද නගරයෙහි සභාද, ධර්මාධිකරණ ශාලාවද කරවන්නේය. **අත්‍ථානත්‍ථවිනිච්ඡයං** වැරැද්ද, නිවරැද්ද, විනිශ්චය කිරීමට, විනිශ්චය ශාලාවක් කරවූයේය යන සම්බන්ධයයි.

නිග්ගාහකානං අමිත්තානං යනුවෙන් ප්‍රතිවිරුද්ධ රජුන්ගේ වැලක්වීමට **ඡිද්දාඡිදංච ජානිතුං** යනු දෝෂයද, අද්දෝෂයද, දූනගැනීමට **රකඛාය බලකායඤ්ඤා** යනු ඇත්, අස්, රථ, පංති හා සංඛ්‍යාත බලකායද සේනා සමූහයද රැකවරණ පිණිස ඒ නගර ස්වාමි වූ රජතුමා යනුයි. **සෙනාපචචං** සෙනෙවියා සේනාවට නායක වූ, මහා අමාත්‍යවරයා **ඨපෙති** අදාළ තනතුරේ පිහිටුවයි යන අර්ථයයි. **ආරකඛණත්‍ථාය භණ්ඩස්ස** යනුවෙන් උපන් රිදී මුතු මැණික් ආදි රාජ භාණ්ඩයන්ගේ රැකවරණ පිණිස, හාත්පසින් රැකීම පිණිස මෙ මගේ **භණ්ඩ මා නසසිති නිධාන කුසලං** රැකීමේ දක්ෂ, කුසලතා ඇති **නරං** මිනිසා **භණ්ඩරකඛං** රකිමින්, ඒ රජ භාණ්ඩාගාරයේ තබයි යන සම්බන්ධයයි. **මමත්තා හොති යො රඤ්ඤෝති යො පණ්ඩිත** වූ රජා **මමත්තෙතා** මාමක වූ, පක්‍ෂපාතී වෙයි. වුදධිං **යසස ඉච්ඡති** යනු මේ රජුගේ අභිවෘද්ධියද, වැඩිවූයේ, යමෙක් කැමති වේද, **තසස** මෙබඳු ආකාර පණ්ඩිතයෙකුට රජු අධිකරණං විනිශ්ය තනතුර දෙයි. **මිත්තසස** මිත්‍ර භාවයට, **පටිපජ්ජතු** යන සම්බන්ධයයි. **උපපාතෙසු** යනු උල්කාපාත ආදිය පහළවන කල්හි **නිමිත්තෙසු** මීයන් කැපීම ආදිය සිදුවන විටද, මේ නිමිත්ත ශුභය. මේ නිමිත්ත අශුභ යයි මෙසේ ද නිමිති දැනීමේ ශාස්ත්‍රයෙහිද, **ලකඛණෙ චා** යනුවෙන් ස්ත්‍රී පුරුෂයන්ගේද අත් පා ලක්‍ෂණ දැනගන්නා ශාස්ත්‍ර විෂයෙහිද, **කොවිදං** දක්ෂ වූ **අජඣායකං** නොයෙක් ශිෂ්‍යයන්ට ව්‍යාකරණ පුහුණු කිරීමද, මනතධරං ත්‍රිවේදය සම්බන්ධ මන්ත්‍ර දරන පණ්ඩිත වූ ඒ රජතුමා **පොරොහිච්චෙ** පුරෝහිත තනතුරේ තබයි යන සම්බන්ධයි.

එතෙහංගෙහි සම්පතෙනා යනු මේ කියන ලද, ආකාරයේ අංගවලින් අවයවවලින් යුක්ත වූ, සමගි වූ ඒ රජු **බතතියොහි පවුචචති** යයි කියනු ලැබේ. **සදා රකඛනති රාජානං** යනුවෙන් මේ සේනාපතියා ආදිකොට ඇති, අමාත්‍යයෝ සියළු කල, ඒ රජවරුන් රකිති. **රූකවරණ සපයන චකකවාකොව දුකඛිතං දුකට පත් සිය නෑයන් රකිමින් සක්වාළහිණි** පක්ෂියා මෙන් යන අර්ථයයි. **තථෙව තථං මහාවීර** යනු විරුදත්තමය. යම්සේ ඒ රජතුමා සේනාපති ආදි අංග සම්පූර්ණ නගර ද්වාර රූක වාසය කරයි. එසේම නුඹද, **හතාමිතෙනා** බැහැර කරන ලද පසමිතුරු ඇති බතතියෝ මෙන් **සදෙවකසස ලොකසස** දෙවියන් සමග පවත්නා ලෝකයට **ධම්ම රාජා** දහැමින් සෙමින් යුතු රජව, දස පාරමී දම් පිරීමෙන් රාජභාවයට පත් ධර්මරාජායයි, **පවුචචති** කියනු ලැබේ යන සම්බන්ධයයි.

නිතථියෙ නිනරිතවානා යනු ධර්මරාජ භාවයට ප්‍රතිවිරුද්ධ වූ සියළු තීර්ථකයන් බැහැර කොට ඉතිරි නොකොට බැහැර කොට **සසෙනකං මාරඤඳාපා** සේනාව සමග වසවර්ති මාරයා ද බැහැර කොට **තමනධකාරය** විධමිතවා යනු තම (අඳුර) සංඛ්‍යාත මෝහ අන්ධකාරය විධිවංසනං කොට දුරු කොට **ධමමනගරං සත්තිස්** බෝධිපාක්ෂිය ධර්ම සහිත ස්කන්ධ, ධාතු ප්‍රත්‍ය පටිච්ච සමුප්පාදය, සප්ත බොජ්ඣංග ගැඹුරනය හාත් පස ඇති පට්ඨාන ධර්ම සංඛ්‍යාත නගරය **අමාපංයි** නිර්මාණය කළේය. පිහිටුවිය යන අර්ථයයි.

සීලංපාකාරිකං කතවා යනුවෙන් ඒ පිහිටවූ ධර්ම නගරයෙහි, චතුපාරිශුද්ධ සීල ප්‍රාකාරය **ඤාණං තෙ දවාර කොටඨකං** යනුවෙන ඒ ඔබගේ දීපංකර පාද මූලයේ පටන් සර්වඥතා ඤාණ කරණයද, ශ්‍රද්ධාවෙන් ඔසවන ලද අලංකාර වූ ස්ථම්භයකි යන අර්ථයයි. **දවාරපාලොව සංවරෝ** යනු ඒ ඔබගේ සදොරින් සංවර වූ රූකවරණ සපයන දොරටුපල්ලා, දොරටුව රක්නා යන අර්ථයයි. **සතිපටඨාන මටටාලං** යනු ඒ ඔබගේ සතර සතිපට්ඨාය නැමැති අට්ටාලයෙන් වසනා ලද, **පඤඤා තෙ වචචරං මුනෙ** යනු ස්වාමීනි මුනෙ ඤාණවන්ත වූ **තෙ** ඔබගේ ප්‍රාතිහාර්ය ආදි නොයෙක් ආකාර ඤාණ **වචචරං** මාර්ග සමවතට නගර-වීථි යන අර්ථයයි **ඉදධිපාදංච සිංඝාටං** යනු ඔබගේ ඡන්ද, චිත්ත, විරිය, වීමංස, සප්ඛ්‍යාත, සතර සංද්ධිතද හා ගැටුණු චතු මාර්ගය සම්බන්ධව **ධමමවීථි සුමාපිතං** සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සංඛ්‍යාත වීථිය මැනවින් මවන සරසන ලද ඒ ධර්ම නගරය යන අර්ථයයි. **සුතතනතං අභිධමමංචා** යනුවෙන් ඔබගේ මේ ධර්ම නගරයේ ඔබට සුත්‍රාන්තද, අභිධම්ද, විනය ද **කෙවලං** සියළු

සුත්ත, ගෙය්‍ය ආදියද, **නවංගං බුද්ධවචනං ධම්මසභා** ධර්ම අධිකරණ ශාලා යන අර්ථයයි. **සුඤ්ඤතං අනිමිත්තංචා** යනු අනාත්ම අනුපස්සනා වශයෙන් ලබන ලද, ශූන්‍යතා වශයෙන්ද, අනිත්‍යානු අනුපස්සනා වශයෙන් ලබන ලද, ශූන්‍යතා වශයෙන්ද, අනිත්‍යානු අනුපස්සනා වශයෙන් ලබන ලද, අනිමිත්ත විහරණයද, **විහාරංචපපණිහිතං** යනු දුක්ඛ අනුපස්සනා වශයෙන් ලබන ලද, ආශාවෙන් තොර වූ විහරණයද, **අනෙජඤ්චා** යනු අචල, අකම්පිත චතු සාමඤ්ඤඵල සංඛ්‍යාත කෙළෙස් රහිත වාසයද, **නිරොධොචා** යනු සියළු දුක් නිරෝධය, නිර්වාණය, **එසාධම්ම කුටි තවා** යනු මේ සියළු නව ලොකෝත්තර ධර්ම සංඛ්‍යාත ඔබගේ ධර්ම කුටි වාසය කරන ගෙන යන අර්ථයයි. **පඤ්ඤාය අග්ගො නිකඛිතෙනා** යනු ප්‍රඥා වශයෙන් ප්‍රඥාවන්තයන්ගෙන් අග්‍ර යයි බුදුරදුන් විසින් නිමවා තබන ලද තෙරුන් **පටිභානෙ** ප්‍රඥාවෙන් කළයුතු කිස සුක්ත වූ ප්‍රතිභානයේද දක්ෂ කුසල වූ **නාමෙන සාරිපුත්තෙනා** යනුවෙන් ප්‍රකට ඔබගේ ධර්මසේනාපති ඔබ විසින් දේශනා කරන ලද, ත්‍රිපිටකයට අයත් ධර්ම සමූහය දරන්නේ, අග්‍ර ප්‍රධාන වී, සේනාපති ධූරය කරයි යන අර්ථයි. **චුතුපපාත කුසලෝ** යනු ස්වාමීනි, මුනිවරයා චුතුපපාති ඤාණයෙන් යුක්තය. චුත වීමෙහි ද ඉපදීමෙහි ද සියලු තොරතුරු දන්නා දක්ෂයෙක් වේ. සම්පූර්ණයෙක් වේ. **ඉදධියා පාරමිං ගතො** යනු එකකු විබොහෝ වෙයි. බොහෝ රූ පමා එකකු වෙයි. ආදි වශයෙන් කියන ලද බැවින් ඍද්ධි ප්‍රභේද වශයෙන් පාරමී අවසානයේම ගියේ නමින් **කොලිත** නම් වූ මොග්ගල්ලාන තෙරුන් පුරෝහිත වූයේ ඔබෙගේ **පුරෝහිතො** යන **සම්බන්ධයයි. පොරාණක වංසධරෝ** යනු ස්වාමීනි, ඤාණවන්ත මුනිවරයා, පුරාණ වංශය දරන්නා වූ, පරම්පරාව වශයෙන් දන්නා වූ, **උගතතෙජෝ** ප්‍රකට වූ තේජස් ඇත්තේ, **දුරාසදෝ** ආසාදනය වීමට ගැටීමට දුකකි. නොහැකි වන්නේය යන අර්ථයයි. ධුතවාදි ගුණ නගෙහා තුන් සිවුරු දරමින්, තෙලෙස් ධුතාංග දරමින් කියයි. අවවාද දෙයි. ගුණයෙන්, ධුතාංගයෙන් අග්‍ර වූයේ ශ්‍රේෂ්ඨ වූ **මහා කස්සප තෙරුන්** ඔබගේ අර්ථ පැහැදීමේද ව්‍යවහාර කරණයේ ප්‍රධාන වූයේ යන අර්ථයයි. **බහුස්සුතෙ ධම්මධරෝ** යනු ස්වාමීනි, මුනිවරය, බොහෝ අසූහාර දහසක් ධර්මස්කන්ධ මැනවින් ගත් බැවින් භගවත්හු භික්ෂු සංඝයාගෙන් උගත් බැවින් බහුශ්‍රුත වූ **ධම්මධරෝ** යනු නොයෙක් සය ලක්ෂයක් පමණ වූ, ආගම ධර්මයේ ද සතිපට්ඨානයේද පරමාර්ථ ධර්මයන්ද දරන බැවින් ධම්මධර නම් වූ **ආනඤ්ඤා, සබබපාඨීච සාසනෙ** යනුවෙන් බුද්ධ ශාසනයේ සියළු පෙළ කියන්නා වූ හා මොනවට හදාරන්නා වූ භික්ෂූන් අතුරෙන් අග්‍ර වූ ශ්‍රේෂ්ඨ

වූ සියල්ල පෙළ නමින්ම වදාරන ආනන්ද නම් තෙරුන්, **ධම්මාකෙඛාතවා** යනුවෙන් ඔබගේ පිටකතුයට සම්බන්ධ ධර්ම භාණ්ඩාගාරික යන අර්ථයයි. **එතෙ සබෙබ අතික්කමම** යනු භාග්‍යවත් බුදුරදුන් මේ සාරිපුත්ත ආදි මහානුභාව තෙරවරුන් ඉක්මවා ඉවතලා **මමං යො පමෙසි** ප්‍රමාණ කෙළේය යන අර්ථයයි. **විනිච්ඡයං** මෙ **පාදාසි** යනු විනය විනය දන්නා පණ්ඩිතයන් විසින් දේශනා කරන ලද, ප්‍රකාශ කරන ලද විනය විනිශ්චය, දෝෂ විචාරණය, මට භගවත්හු මැනවින් ලබා දුන් සේක. මටම භාර කළේය යන සම්බන්ධයයි. **යොකොපි විනයෙ පඤ්ඤං** යනුවෙන් යම්කිසි භික්ෂුවක් බුද්ධශ්‍රාවක වූයේ විනය ඇසුරු කරන ලද්දේද **පඤ්ඤං මං පුච්ඡති තත්‍ථ** එහි විචාරණ ලද අර්ථය මම කියමි යන සම්බන්ධයයි. **යාවතා** බුද්ධ **බෙනතමහි** යම් පමණ යම්තැනක බුදුන්ගේ අණ පවතිද? මහාමුනිං සම්මා සම්බුදුන් තබා **විනයෙ** විනය පිටකයේ විනිය විනිශ්චය කාරණයේ හෝ **මාදිසො** මා හා සමාන වූවකු නැති මමම අග්‍ර වේ. **හියෙය්‍යා** මට වඩා **කුතො හවිසසති** යන සම්බන්ධයයි. **භික්ඛු සංඝෙ නිසිදිත්වා** භික්ෂු සංඝයා මැද හුන්නේ ගොතමො භගවත්හු **එවං ගච්ඡති** සිහනාද කරයි **කෙසේද** විනයෙ උභතෝ විභංගයෙහි **බහුකෙසු** මහාවග්ග/චූලවග්ග වලඳව ශබ්දයෙන් පරිවාර පාළිද, **උපාලිස්ස** උපාලි තෙරුන් විසින් **සමො** සමාන **නත්‍ථි** යයි මෙසේ ගර්ජනා කරයි. **යාවතා** යම් පමණ. බුද්ධ භාෂිතං බුදුරදුන් විසින් දේශිත. **සුකත ගෙය්‍යාදි නවංග සත්ථු සාසනං** ශාස්තෘන් විසින් දේශිත සියළු. **විනයොගයිතං** විනය ඇතුළතට පිවිසි විනයමූලක වූ මෙසේ **පසසිනො** බලන්නා වූ **මම කම්මං කරිත්වානා** යනුවෙන් ගෞතම වූ. **සක්‍යපුංගවො** ශාක්‍ය වංශයට ප්‍රධාන. **මමං කම්මා** මගේ පෙර ප්‍රාර්ථනා කළ කර්ම අතීත ඥානයෙන්. **සරිත්වාන** ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැන භික්ෂු සංඝයා මැදට ගියේ "මහණෙනි, මගේ ශ්‍රාවකයන් අතර විනයධර භික්ෂූන් අතුරින් උපාලිම අග්‍රයයි අග තනතුරේ තැබූ සේක" යන සම්බන්ධයයි.

සත සහසසුපාදායා යනු ලක්ෂයක් කල්ප මුල්කොට යම් **ඉමං** තනතුර **අපත්‍ථයි** ප්‍රාර්ථනා කළෙමි. **සො** මෙ **අත්‍ථො මා විසින් අනුප්පත්තො** අධිගමව ලබන ලද්දේ. **විනයෙ පාරමිංගතො** කෙළවරට පැමිණියේ යන අර්ථයයි. **සක්‍යානං** ශාක්‍යවංශ රජවරුන්ගේ **නන්දිජ නනො** සොම්නසට කාරණා වූ මම **පුරෙ** පෙර **කප්පකො** වූයෙමි. **තං ජාතිං** ඒ කුලය යෝනිය, **විජහිත්වාන** විශේෂයෙන් ඉවතලා දුරුකොට. **මහෙසිනො** සම්මා සම්බුදුරදුන්ගේ **පුත්තොජාතො** ශාක්‍ය පුත්‍රයෙක් බවට පත්වූයේ, ශාසනය දරණුයේ යන අර්ථයයි.

ඉන් අනතුරුව තමන්ගේ දාස කුලයෙහි උපදින චරිතාපදානය දක්වමින් **ඉතො දුතියකෙ කපෙ** යනුවෙන් කීවේය. එහි **ඉතො** භද්‍ර කල්පයෙන් යට **දුතියෙ කපෙ** නමින් **අඤ්ඤසො නාම ඛත්තියො** එක රජකු **අනන්තතේජෝ** සංඛ්‍යා විරහිත තේජස් ඇත්තේ **අමිතයසො** පමණ ඉක්මවූ පිරිවර ඇත්තේ **මහද්ධනො** නොයෙක් කෝටි සියගණන් ධනය ඇති **භූමිපාලො** පෘථිවි ආරක්ෂකයා විය යන සම්බන්ධයයි. **තස්ස රඤ්ඤො** යනු ඒ එබඳු රජ කෙනෙකුගේ **පුත්තො මම චන්දනනාම ඛත්තියො ක්ෂත්‍රිය කුමරු** වූයෙමි. ඒ **මම ජාති මදෙන, යස මදෙනව භොග මදෙනව උපත්තිදෙධා උපසටමහ** වූයේ උඩට ගියේ යන අර්ථයයි. නාගසතසහස්සානි යනු ලක්ෂයක් ඇත්තු මාතංගා මාතංග කුලයේ උපන්. නිධාජපහිනනා ඇස කණ කෝෂ සංඛ්‍යාත තුන් තැනකින් බිඳුණු මද ගිලෙන **සබබාලංකාර භූසිතා** සියළු ඇත් අලංකාරවලින් අලංකාර වූ **සදා** සියලු කල්හි මා පිරිවරකොට ඇති යන සම්බන්ධයයි. **සබලෙහි පරිනොහං** යනු එකල මම **සබලෙහි** තමන්ගේ සේනා බලයෙන් **පරිතො** පිරිවරාගෙන **උය්‍යානංගනතුකමො** කැමැත්තේ, **සිවික** නම් නාග-හස්තියා ආරූඪ පිටනැගි නගරයෙන් නික්මෙත් යන සම්බන්ධයයි. **චරණනව සම්පන්නො** ශීල සංවරාදි පනස්හතර වැදෑරුම් චරණ ධර්මයෙන් යුතු. **ගුත්තද්වාරො** වසන ලද ඇස ආදි ද්වාර හය **සුසංවුතො** මනාසේ සංවර කරගත් සිත, කය ඇති **දෙවලො නාම සම්බුද්ධො** පසේ බුදුරදුන් මමං මගේ පුත්තෙනා ඉදිරියේ **ආගඤ්ඡි** පැමිණියේ යන අර්ථයයි. **පෙසෙත්වා සිරිකං නාගං** යන ඒ පැමිණි පසේ බුදුරදුන් දැක මම සිරිතං නම් වූ නාගයා ඉදිරියට පෙසෙත්වා බුදුන් ආසාදයිං ගැටුවෙයි. දූෂණය කළෙමි යන අර්ථයයි. **තතො සඤ්ඤාතකොපො සො** යනු ඉක්බිති මා අනිශයින් පෙළා, යවන ලද බැවින් ඒ හස්තිරාජයා මා කෙරෙහි හටගත් කෝපය ඇත්තේ, පදං තමන්ගේ පාදය නුද්ධරත නුදුරයි. නිශ්චලවම පවතී. **නාගං රුධිරමනං දිසවා** යනු රුදුරු නපුරු සිත නාගයා දැක, මම බුද්ධෙ පසේ බුදුන් කෙරෙහි, **කොපං අකාසිං** දොස් ඉපදවීම් යන අර්ථයයි. **විහෙසයිත්වා සම්බුද්ධං** දේවල පසේ බුදුරදුන් වෙහෙසත්වා.

ඝානං තසථ නවින්දාමි යනු ඒ විපතේදි සැපතක් නොවිඳිමි. ආසාදනං නිමිත්තද මිහිරි සැපයක් නොලබමි යන අර්ථයයි. **සිරො පජ්ජලිතො යථා** හිස මගේ හිස දිළිසෙන්නේ යම්සේද, දැල්වෙන්නාක් මෙන් වෙයි යන අර්ථයයි. **පරිළාහෙන ඩයහාති** යනු පසේබුදුන් කෙරෙහි කෝපකල බැවින් පශ්චාත්තාප පරිදාහයෙන් දැවෙමි උණු වූ සිත් ඇත්තේ වෙමි.

සසාගරනනා යනු ඒ පාප කර්ම බලයෙන් සාගරය කෙළවරකොට ඇති, සියළු මහා පොළොවද මෙ මට ආදිත්තා මෙන් දිළිසෙන්නේ, හොති විනාශ වෙයි යන අර්ථයයි. පිතු සන්තිකුපාගම්මා යනු මෙසේ සිතහව උපන් කල්හි, මම තමන්ගේ පියරජුගේ සමීපයට උපාගම්ම එළඹ ඉදං වචනං අබ්‍රවිං එසේ වූයේ යන අර්ථයයි. ආසිවිසංව කුපිතං හලාහල විෂ ඇති සර්පයකු කුපිතව කිපියේ මෙන් දැල්වෙමින් **අගිකඛන්ධං ඉව චමතතං** තුන්ආකාර වූ දන්තිං දන්ත වූ **කුඤ්ජරං** උතුම් හස්තියකු මෙන් **ආගතං** පසේ බුදුවූ **සයමභුං** තෙමේම බුදුවූ මම නො ඇළෙමි. ගැටීමි යන සම්බන්ධයයි.

ආසාදිතො මයා බුදෙධා යනු ඒ පසේ බුදුරද මා විසින් ගමනා ලද්දේ සොරෝ අන් අය කෙරෙන් ගැටීමට නොහැකි වන්නේ, සෝර වූ උගතපො ප්‍රකට වූ තපස්කම් ඇයි ජිනො පස්මරුන් දිනවා මෙසේ ගුණසම්පන්න වූ පසේ බුදුරදුන් මා විසින් ගැටීමට පත් කළේ යන අර්ථයයි. **පුරා සඛෙඛ විපසසාමා** ඒ පසේ බුදුරදුන් කෙරෙහි කරන ලද අනාදරය ඇත්තේ අපි සියල්ලෝම විනාශ වන්නෙමු. විවිධ අයුරින් නැසෙන්නෙමු. අළු මෙන් වෙමු යන අර්ථයයි. **බමාපෙසසාම තං මුනිං** යනු ඒ පසේ බුද්ධමුනි තෙම විනාශ නොකරන්නෙමු. ක්‍ෂමාව යදින්නෙමු යන සම්බන්ධයයි. නො චෙ තං **නිජඣපෙස්සාමා නි අතත දනතං** දමනය වූ සිත් ඇති **සමාහිතං** එකඟ වූ සිත් ඇති ඒ පසේ බුදුවරු **නො චෙ නිජඣපෙසසාම** ක්‍ෂමා කරන්නෙමු.

ඔරෙන සතත දිවසා දින හතක පටන් සත්දවසක් නොඉක්මවා සම්පූර්ණ වූ **රථං** මගේ සියල්ල **විධමිසසති** විනාශ වන්නේය.

සුමෙබලො කොසියො චා යනු මේ සියුමැලි සතර රජවරු ආදීහු **ඉසයො ආසාදයිතවා** ගථා ආදර නොකොට **සරථකා** රටවැසි ජනපදවාසීන් සමග **දුගගතා** විනාශයට ගියේ යන අර්ථයයි. කුප්පත්ති ඉසයො යන යම්කාලයෙක සඤ්ඤතා කාය සංයමය ආදි සංයමයෙන් යුතු වූවෝ බ්‍රහ්මචාරිතො උත්තම චරිත ඇති ශ්‍රේෂ්ඨ චරිත ඇති ඍෂිවරු **කුපපනනි** දොම්නස් වෙත් එකල **සසාගරං සනිබබාං සදෙවකං** ලෝකය විනාශ වන්නේය යන සම්බන්ධයි.

තියොජන සහසසමහි යනු ඒ ඍෂිවරුන්ගේ ආනුභාවය දැන ඔවුන්

ක්‍ෂමා කරවා ගැනීමට **අවචයං** අපරාධයක් **දෙසනත්ථාය** ප්‍රකාශ කිරීම පිණිස යොදුන් තුන්දහසක් ප්‍රමාණ වූ ප්‍රදේශයේ **පුරිසෙසනනිපාතයිං** යන සම්බන්ධයයි. **සයම්භු** පසේ බුදුරද **උපසමකම්මං** සමීපයට වැඩියේය යන අර්ථයයි. **අල්ලවත්ථා** යනු මා සමග රාශි වූ සියළු ජනතාව **අල්ලවත්ථා** ජලයෙන් තෙමුණු වස්තු ඇතිව උතුරුසළු කොට **අල්ලසිරා** තෙත් වූ කෙස් ඇතිව **පඤ්ජලිකතා** මුදුනේ පිහිටි ඇදිලි බැඳීම් කොට බුද්ධස්ස පසේ බුදුරදුන්ගේ **පාදෙ** පා සමීපයේ **නිපතිත්වා** හොවා **ඉදං වචන මබ්‍රවිං** මහාවීර්ය ක්‍ෂමා වේවා ආදි වචන කීහ යන අර්ථයයි. **මහාවීර** වීර උත්තමය.

ස්වාමීනි, පසේ බුදුරදුනි, මා විසින් නුඹවහන්සේලා විෂයෙහි නොදැනීමෙන් අපරාධයක් කරන ලද්දේද බමස්සු **තුවං** දුරුකරව. මෙනෙහි නොකරව යනුයි. **ජනො** ජන සමූහයා ඒ භගවත්හු හට **අහි** විශේෂයෙන් **ඉල්වයි පරිළාහං** දෝෂ මෝහ වශයෙන් කරන ලද සිත් දාහයන් **අම්හාකං** දුරුකරව. **තො** අපගේ **රට්ඨං** සියළුරට වැසි ජනපදවාසීහු **මා විනාසය** විනාශ නොකරව යන අර්ථයයි. **සදෙවමානුසා සබ්බෙ** සියළු මනුෂ්‍යයෝ **සදෙවා සදෙනවා** අසුරයා සහිත රකුසන් සමග **අයොමයෙන කුමෙන** මහා මුගුරකින් **සදා** සියලු කල **මෙ සිරං** මගේ හිස බිඳවා පලාවා! යනුයි.

ඉන් අනතුරුව බුදුවරුන්ගේ ක්‍ෂමාවත බවද ප්‍රකාශ කරමින් **උදකෙ අගහි න සණ්‍ඨාති** යනාදිය කීවේය. එහි යම්සේ ජලයේ ගින්න නොසිටීද? නොවැඩේ ද යම්සේ **බීජං සෙලෙ** ශෛලමය පර්වතයේ නොවැඩේ ද, යම්සේ **අගදය** ඖෂධයේ **කිමි** ප්‍රාණීහු **න සණ්‍ඨාති** එසේ **කොපො** සිත් කෝපය නරක සිත බුදෙඩ චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බුදුවරුන් කෙරෙහි **න ජායති** නූපදියි යන අර්ථයයි. නැවත පිරිසිදුකමේ ආනුභාවය ප්‍රකාශ කරමින් **යථාපි භූමි** ආදිය කීවේය. එහි යම්සේ **භූමි** පොළොව **අචලා** නිශ්චල වේද, එසේ බුදුවරු අචල වේ යන අර්ථයයි. යම්සේ **සාගරෝ** මහා සමුද්‍රය **අප්පමෙය්‍යො** ප්‍රමාණ කිරීමට ප්‍රමාණ වශයෙන් ගැනීමට නොහැකි වන්නේද, එසේ බුදුරද අප්‍රමාණ වේ යන අර්ථයි. යම්සේ **ආකාසො** ආකාශය **අනන්තකො** කෙළවර රහිත වේද එවං එසේ බුදෙඩා **අබොහියො** ප්‍රමාණ කිරීමට මැනීමට නොහැකි වන්නේය යන අර්ථයයි. ඉන් අනතුරුව පසේ බුදුරදුගේ ක්‍ෂමා වචනය දක්වමින් **සදා ඛතතා මහාවීරා** යනාදිය කීවේය. එහි **මහාවීරා** උතුම් වීර්යවන්ත බුදුවරු **තපසසිතො පාපයනෙතා** කරන නිසා තපස් යන නම ලද්දේ, වීර්යයෙන්

යුක්තව ඉවසීමෙන් යුක්තව **බටිතා** අනුන්ගේ අපරාධ ක්‍ෂමා වන සහිතව **සදා** සියලු කල වෙත්.

ඛන්තානං ඛමිකතඤ්ඤා ඒ ක්‍ෂත්‍රිය බුදුවරුන්ගේ මුව සිට යුක්ත වූවන්ගේ කරන ලද අපරාධ ක්‍ෂමා වන සහිතව **ගමනං** ඡන්ද ආස අගි අගති ගමනයෙන් **විද්‍යමාන නොවේ** යනස අර්ථයයි.

මෙසේ මේ වචන **පවසා** බුදුරදද පසේද රදද **පරිලාහං** සත්වයන්ට උපදින දාහය **විනොදයං** දුරු කරන්නේ **මහාජනස්ස පුරතො රැස්වූවාවු** රජතුමා සහිත මහා ජනකාය ඉදිරියේ **රදා සි.** ඒ කාලයේ **නහං** ආකාශයට අඛභූගගමි පැන නැංගේය යන අර්ථයයි **ඒ, කටෙනහං ධීරා** යනු ප්‍රඥාවන්ත ධෛර්ය සම්පන්න වූ මම **තෙන කමෙමන** පසෙ බුදු රදුන් විසින් කරන ලද අනාදරය කර්‍මය පසක් මේ පශ්චිම ආත්ම භාවයේ හිත බවට ලාමක බවට රජවරුනගේ විවිධ වධබන්ධන වලට ගුම්හියේ යන අර්ථයයි. **සමතිකකමම තං ජාතිං** යනු ඒ පිරිහුන ජාතිය යහපති ඉක්මවා, **පාවිසිං අභයං පුරං** යනුවෙන් බිය රහිත නිර්වාණ පුරයට නිවන් නැමැති මහා නගරයට පිවිසියෙමි යන අර්ථයයි. **තදාපි මං මහා විරා** යනුවෙන් විර උත්තමය, එක ලද ඒ පසෙ බුදුරදුන්ගේ නොගැලපෙන සමයෙහිද, පසේ බුදුරද, රෝගකාරක හේතු උපතින් සතේ කයේ වේදනාව දුරු කළෝය. **ඔයහමානං** මෙසේ ස පශ්චාත් තාපයෙන්, කුකුසන් දැවෙන්නා වූ **සුසණකිනං** දෝෂයෙන් දෝෂය දකිමින්, යහපතින් යහපත දැක **ඛමාපයි** ඒ අපරාධය ඉවසියයත සම්බන්ධය **අජ්ඣාජා මං මහාවිරා** යනුවෙන් වීර් උත්තමය, අදද නුඹ රැස්වන කාලයේ, **තීහගගීහි** රාග දෝස මෙහෙගිනි සංඛ්‍යාත හේ අපාය යන්න, ප්‍රේත ගින්න සංසාර යන තුන් ගිනි වලින් හෝ ඛයහමානං දුක් අනුභව කරන්නා වූ භගවත් වූ මා **සීතිභාවං** දොම්නස විනාශයෙනි, සත් පුරුෂ කාය සංඛ්‍යාත සිසිල බව ද නිර්වාණය ද අපායයි. අවබෝධ කළෙය. **කයො අගගි** කියන ලද ආකාරයෙන් ඒ තුන් ගින්න නිවන ලද්දේය සංසිදවිය යන අර්ථයයි.

මෙසේ තමන්ගේ හීන චරිතය බුදුරදුන්ට පෙන්වා දැන් අනෙකක් ඔහුගේ සවණට යොදවා අවවාද දෙන්නේ, **යෙසං සොතාවධානන්ති** යන ආදිය කීවේය. එහි **යෙසං** නුඹලාගේ **සොතාවධානං** කණේ අවධානයට යොමු කිරීම **අත්ථි විද්‍යමාන** වේ. **තෙ නුඹලා භාසතො** කියන්නා වූ මගේ වචන **සුණාථ** මෙනෙහි කර වූ **අත්ථං තුම්හංපවකඛමි** යථා යම්

ආකාරයකින් **මයා** මා විසින් දිට්ඨං **පදං** නිර්වාණං **තථා** ඒ ආකාරයෙන් නිර්වාණ සංඛ්‍යාත පරමාර්ථ ධර්මය නුඹලාට පවසමි යන සම්බන්ධය.

එය පෙන්වමින් **සයමභූතං විමානෙත්වා** යනාදිං කිවේය. එහි **සයඤභූතං** තෙමේම අවබෝධ කරගත් ආර්ය ජාතියේ උපන්. **සන්ත චිත්තං** සමාහිත වූ පසේ බුදු රද **පමානෙත්වා** අනාදර කොටස් කම්යෙන් කරන ලද අකුසල යෙන්. **අජ්ජ** මේ වර්තමාන කාලයේ මම **නිවයොනියං** පිරිනුණු උපතක උපන්නෙ **අම්හි** වෙමි. **මා වො බණ්ණ වීරාධමා** යනු බුද්ධ උප්පාද ක්ෂණයක වෝ නුඹලා මා **වීරාධෙථ** අයහපතක් නොකරවු. සත්‍යයකි **බණාතීනා** බුද්ධපාදෝත් තලයක අතීතය ඉක්මවා සත්වයෝ **සොචරෝ** ශෝක කරත්. මා විසින් අවාසත් තවුසා, නපුරු සිත් ඇත්තේ වෙමුයි මෙසේ ශෝක කරත් යන අර්ථයයි. **සදත්ථෙ** තමන්ගේ අර්ථ සිද්ධියෙහි **වායමෙයහථ** වීර්ය කරවූ වෝ තොප විසින් බුද්ධ උත්පාද ක්ෂණයක **පටිපාදිමා** නිෂ්පාදනයට උපතට පැමිණියේ යන අර්ථය.

ඉන් අන්තුරුව සංසරගත සත්වයන්ගේ ආදීනව උපමා උපමේය වශයෙන් ප්‍රකාශ කරමින් **එකචචානංච චමනං** යනාදිය කිහ. **එකචචානං** කිසියම් පුද්ගලයන්ගේ **චමනං** උඩින් වමාරීම **එකචචානං විරෙචනං** යටින් වැගිරීම **එකචචානං හලාහලං** විෂ මූර්ෂා වීම් වශයෙන් ඇතැම් පුද්ගලයන්ට ඖෂධ රැකවරණ උපායකි. බුදුරදුන් මෙසේ පිළිවෙලින් වදාළ සේක.

චමනං පටිපන්නානං හි පටිපන්නානං මාර්ගයට පිළිපන්නා වූ **චමනං** සංසාර ඉවතලීම සංසාර මිදීම බුදුරදුන් වදාළ සේක යන සබෙත් ධයපි **ඵලට්ඨානං** ප්‍රතිඵලයේ සිටියාවූ **විරෙචනං** සංසාරය වැගිරවීම කියන ලදී. **ඵලලා හීනං** ප්‍රතිඵල ලැබ, සිටියවුන්ට නිර්වාණය ඖෂධයකි. කියන ලදී. **ගවෙසිතං** මනුස්සයාට දෙව්යාට නිර්වාණ සම්පත් සොයන්නවුන්ට පුණ්‍ය ක්ෂෙත්‍රයක් වූ සංඝයා ගැන කියන ලදී. **සාසනෙත විරුද්ධානං** ශාසනයට විරුද්ධ වූ හලාහල විෂා කුතුහලය, පාපකුසලය කැයි කියන ලදී. **යම් ආසිවිසො** යනු ශ්‍රද්ධා නැත්තවුන්ගේ කරන ලද පාපයන් පුද්ගලයන් සංසාරයේ දුකින් උසුලන ලද්දේ ආෂි විෂ හා සමත, යම් සේ ආසිරි දැකීම් පමණින් ඇථ බවට පත් වූයේ **දිට්ඨවිසො** සර්පයා තමා විසින් දෂ්ට කල මිනිසාට හලාහල විෂයට ව්‍යාප්ත කරයි. සතර අපා වල දවවයි. වියලවයි යන සම්බන්ධයි. **සකිං පීතං හලා හලං** යනු හලාහල විෂ පොවන ලද **සකිං** එක් වරක් ජීවිතය **උපරුන්ධෙති** නසාලන **සාසනෙන** ශාසනයේ

විරජ්ඣිත්වා අපරාධ කොට පුද්ගලයා **කප්පකොටිම්හි** කල්පකොටියෙහි පිරිහේ යන අර්ථයයි. මෙසේ ශ්‍රද්ධාරහිත පුද්ගලයන්ගේ ඵල විපාක පෙන්වා, දැන් බුදුවරුන්ගේ ආනුභාවය පෙන්වන්නේ **ඛන්තියා** ආදිය කීහ. එහි යම් බුදුවරයෙකු වමන ආදිය කියන ලදීද, ඒ බුදුරද **ඛන්තියා** ක්ෂාන්තියක් **අවිහිංසාය** සත්වයන්ට හිංසා නොකිරීමෙන් **මෙත්ත චිත්ත** චතායච මෛත්‍රී සිත් වන්ත භාවයෙන් ද **සදෙවකං** දෙවියන් සහිත දෙවිවරු වර්තමාන ලෝකය තරණය කරයි ඉක්මවාලයි. නිවාලයි එහෙයින් කරණාවෙන් බුදුවරු නොපට අවිරෝධිව වාසය කිරීමට නොහැකි වන්නේ බුද්ධ ශාසනයේ පිළිපදිවූ යන අර්ථයයි. ලාභ අලාභයෙද, **න සජ්ඣකති** භජනය නොකරත්, නොලැගෙත්. **සම්මානනෙ** ආදරය කිරීමේද, **විමානනෙ** ආදරය නොකිරීමේද **අචලා** පොළව හා සමාන වෙති. එහෙයින් කාරණාවෝ ඒ බුදුවරු නුඹලා විසින්. **න විරාධියා** විරෝධය නොපෑ යුතුය. විරුද්ධ වීමට නොහැකි වන්නේ නම් යන අර්ථයයි. බුදුවරුන්ගේ මධ්‍යස්ථ බව පෙන්වමින් **දෙවදන්තෙ** යනාදිය **කීවේය.** එහි වධක අවධක සියළු සතුන් විෂයෙහි **සමකො** සමාන කරන්නේ **මුනි** ඒ බුද්ධමුනි යන අර්ථයයි. **එතෙසං පටිසං නත්ථි** මේ බුදුවරුන් කෙරෙහි **පටිසං** සැඩපරුෂ බවක් හෝ ද්වේෂ සිතක් හෝ විද්‍යමාන නොවේ. **රාගො මෙසං න විජ්ජති** මේ බුදුවරුන්ට රාගයේ සතුටක් ඇලීමක් **න විජ්ජති** නොලබයි. ඒ කාරණාවෙන්, වධකයාගේ හොඳ කෙනාගේද, සියල්ලන්ගේ **සමකො** සම සිත් ඇති බුදුරද වෙයි නැවත ද බුදුවරුන්ගේම ආනුභාවය පෙන්වමින් 'පපඤ්ච දිසවාන කාසාවං' යනාදිය කීවේය. එහි **මිළ්හ මකඛිතං** අඟුචි මිශ්‍ර වූ කාසාවං කහවින් රඳවන ලද චීවරය, **ඉසදධජං** ආර්යන්ගේ ධජයයි. පිරිකරයි. **පපඤ්ච** මාර්ගයේ හැර දැමුණු දැක බලා **අංජලිංකත්වා** දස ඇඟිලි එකතු කොට මුදුනේ තබා **සරසා** හිසින් **වන්දිතබබං ඉසිදධජං** අර්හත් ධජං බුදු පසේ බුදු ආර්යය ශ්‍රාවකයන්ගේ චීවරයට නමස්කාර කළ යුතුය පිදිය යුතුය. ගරුබුහුමන් කළ යුතුය යන අර්ථයයි.

අඛතීතා යනු අහි උසස් බවට ගියේ නිවණ නම් යම් බුදුරදුකු වතතමානා දැන් උපන්නේ **යො බුදධා අනාගතා** නූපන් පහළ නොවූ නූපන් යම් බුදුවරයකු **ධජෙනානෙන සුජඣනති නි අනෙන ඉසිදධජෙන** චීවරයෙන් මේ බුදුවරු **සුජඣනති** පිරිසිදු වෙත් බබළති. **තසමා** ඒ කාරණයෙන් **එතෙ** බුදුවරු **නමසසියා** නමස්කාර කළ යුතුය යන අර්ථයයි. 'එතං නමසසතියං' යන පාඨයයි. මේ ඒ ඉසිදජයට නමස්කාර කළ යුතුය යන අර්ථයයි. ඉන් අනතුරුව තමන්ගේ ගුණය දක්වමින් **සත්ථු කපපං**

ආදිය කීවේය. එහි **සත්‍ථු කප්පං** බුදුරදුන් සමාන **සුවිනයං** සුන්දර විය සුන්දර ආකාරයෙන් තිදොර දමනය කරන්නේ හදයෙන සිතින් අහං ධාරෙමි ශ්‍රවණ දරීම් ආදියෙන් ප්‍රත්‍යවේක්ෂා කරමි යනුයි. **විනයං** විනය පිටකයට **නමස්සමානො** වඳින්නේ විනයෙහි ආදරය කරමින් **විහරිසසාමි සබ්බදා** සියළු කල්හි වාසය කරමි **විනයො ආසයො මය්හං** විනය පිටකය මට ඇසීම, ධාරණය, නිතර සිහිකිරීම, උද්ග්‍රහණය, පිළිවිසීම පවත්වාගෙන යාම් වශයෙන්, නිතර පරිහරණය කරමි යන අර්ථයි. **විනයො ඨාන චංකමං** විනය මගේ ශ්‍රවණාදී කෘත්‍යය කිරීම් වශයෙන් සිටියෙන්ද, සක්මන් කිරීම් වශයෙන්ද, **කප්පෙමි විනයෙවාසං** විනය පිටකයේ විනය පෙළ, විනය සිරිත පැවැත්වීම වශයෙන් **වාසං** සයනය කරමි. **විනයො මය්හං ගොචරෝ** යනු විනය පිටකය මගේ **ගොචරෝ** ආහාරයයි. භෝජනයයි. නිතර දැරීම, මෙනෙහි කිරීම් වශයෙනි. **විනයෙ පාරම්පපත්තො** යනු සියළු විනය පිටකයේ **පාරමිං** කෙළවරට. **පත්තො සමථෙවාපි කොවිදෝ** යනුවෙන් පාරාජිකාදි සප්ති ආපත්ති බන්ධකයේ, **සමථෝ** සංසිඳවීමේ **කොවිදෝ** දක්ෂ අධිකරණ සමථයෙක් සුදුස්සෙක් වෙමි.

"විවාදය අනුවාදය ආපත්ති අධිකරණ ද,
කිච්ච අධිකරණද අධිකරණ සතර යයි කියන ලදි.

"සම්මුඛ, සති අමූලහ, පටිඤ්ඤාතකරණ
යෙභුය්‍ය, පාපිය්‍ය, තිණවත්ථාරක

යන ඒවාද මෙසේ කියන ලද සප්ත අධිකරණ සමථවල, **අභිකොවිදෝ** දක්ෂ යන අර්ථයයි. **උපාලි තං මහාවීරා** යනුවෙන් ස්වාමීනි, **මහාවීර** චතුරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ සර්වඥතා ඤාණ අධිගමයට වීර්ය වඩන්නේ. **සත්‍ථුනො** දෙව් මිනිසුන්ට අනුශාසක වූ **තං** ඔබගේ **පාදෙ** පා යුගලය උපාලි භික්ෂුව **වන්දති** ප්‍රණාම කරයි. **සො අහං** ඒ මම පැවිදිව බුදුන්වහන්සේ නමස්කාර කරන්නේ.

ධම්මසස්ව ඒ බුදුරදුන් විසින් දේශිත නව ලෝකෝත්තර ධර්මයේ **සුධම්මතං** සුන්දර බව දන ධර්මයට නමස්කාර කරමින් ගමින් ගම, නගරයෙන් නගරය පුරයෙන් පුරයට **විචරිසසාමි** හැසිරෙන්නෙමි යනුයි. **කිලෙසා ඣාපිතා මය්හං** යනු මා විසින් අවබෝධ කළ අරහත් මාර්ග ඤාණයෙන් මගෙ සිත් තුළ පවත්නා සියළු එක්දහස් පන්සියයක් පමණ

ක්ලේශයෝ **ඣාපිතා** වියළවන ලද්දේ දවන ලද්දේ. **හවා සබ්බ සමූහතා** යනු කාමභව ආදි සියළු අළුත් භවයන් මා විසින් **සමූහතා** සරළ ලෙසින් සමූල සාතනය කොට ක්ෂය කොට **සබ්බාසවා පරික්ඛීණා** යනු කාම ආසව, භව, දිට්ඨි, අවිජ්ජා යන සතර ආසවයෝ **පරික්ඛීණා** හාත්පසින්ම ක්ෂය කරන ලද්දේ **ඉදානි** මේ රහත් ඵලයට පැමිණි කල්හි **පුනබ්භවෝ** යළිත් ඉපදීම සංඛ්‍යාත භවය, භවයේ ඉපදීම නැත යන අර්ථයයි. මත්තෙහිත් සොම්නස් වශයෙන් උදානය ප්‍රකාශ කරන්නේ, **සඞ්ගතං** ආදිය කීවේය. එහි **බුද්ධංසෙට්ඨසස** උතුම් බුදුරදුන්ගේ **සන්තිකෙ** සමාගමයෝ එක නගරයක් සේ මගේ පැමිණීම **සඞ්ගතං** යහපත් පැමිණීමක්, සුන්දර ගමනයක් යයි ඒකාන්තයෙන් **ආසි** විය. **නිසෙසා විජ්ජා** යනු පූර්වේනිවාස, දිව්‍ය චක්ෂුර්, ආසවක්ඛය යන විද්‍යාවෝ වෙති. **අනුපපත්තා** සපැමිණියේ ප්‍රත්‍යක්ෂ කළේ යන අර්ථයයි. **අනුපපත්තා** සපැමිණියේ ප්‍රත්‍යක්ෂ කළේ යන අර්ථයයි. **කතං බුද්ධස්ස සාසනං** බුදුරදුන් විසින් දේශිත මනාව පිහිටි ශාසනයයි. **කතං** නිෂ්පාදනය කරන ලද, එත් පිළිවෙත් පුරා කමටහන් මෙනෙහි කොට, අරහත්ත මාර්ග ඤාණ අධිගමයෙන් සම්පාදනය කළ යන අර්ථයයි. **පටිසම්භිදා චතසෙසා** යනු අර්ථ පටිසම්භිදා ආදි සතර ප්‍රඥාවෝ **සච්ඡිකතා** ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ **විමොක්ඛාපි අථවීමෙ** යනු සතර මාර්ග ඤාණයන් සතර ඵලයන් යන මේ අෂ්ට විමෝක්ෂා සසරින් මුදවන උපායෙන් ප්‍රත්‍යක්ෂ කළේ යන සම්බන්ධයයි. **ඡළභිඤ්ඤා** ෂට් අභිඥාවෝ සාක්ෂාත් කළේනුයි

ඉද්ධිවිධ, දිව්‍යශ්‍රෝත, චේතෝපරිය ඤාණ,
පූර්වේනිවාසානුස්සති, ඤාණය ද, දිව්‍යචක්ඛු
ආසවක්ඛය

යන මේ ෂට් අභිඥාවෝ සාක්ෂාත් කළේ ප්‍රත්‍යක්ෂ කළේය. මේ ඤාණයන්ගෙන් සාක්ෂාත් කිරීම බුදුරදුන්ගේ ශාසනය විසින් කරන ලදි යන අර්ථයයි. **ඉතරං** යනු යටකියන ලද ආකාරයකි. **සුදං** යනු පද පූරණයේ නිපාත පදයකි. ආයස්මා උපාලි ථෙරෝ යනු ස්ථිරසාර සීලාදි ගුණයෙන් යුක්ත ශ්‍රාවකයා වේ. **ඉමා** පූර්ව චරිත අපදානය බැබළේ. **ගාථායො අභාසිත්ථ** කියන ලදී යන අර්ථයයි.

මෙසේ උපාලි තෙරුන්ගේ අපදාන අර්ථකථාවයි.

සමාප්තයි

Vol XLIII

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ

අපදානට්ඨ කථා

දෙවන කොටස

(සිංහල පරිවර්තනය)

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

පාලි අටඨකථා සිංහල පරිවර්තන - 19

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ

අපදානට්ඨ කථා

දෙවන කොටස

(සිංහල පරිවර්තනය)

සිංහල පරිවර්තනය

දයා ගුණසේකර

ප්‍රාචීන පණ්ඩිත - (පළමුවැනි පන්තිය) බී.ඒ (පේරාදෙණිය)

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256 ෆැක්ස්: 21736737

පෞරාණික කිසියම් ස්ථවිරයන් වහන්සේ නමක විසින් විරචිත

විසුද්ධජනවිලාසිනී නම් වූ
අපදානට්ඨ කථා - II

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2007

I S B N - 978-955-1604-42-4

පරිගණක අකුරුකරණය
උපමාලි කුලසේකර - කටුගස්තොට.

පිටකවරය
සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය
අජන් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය,
බොරලැස්ගමුව.
දුරකථනය : 0112517269

ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk
www.buddhistcc.com

පටුන

පිටු අංකය

අපදානට්ඨ කථා II

3-7	අඤ්ඤා කොණ්ඩඤ්ඤ	ස්ථවිර චරිතය	327
3-8	පිණ්ඩෝල භාරද්වාජ	ස්ථවිර චරිතය	330
3-9	බදරවනිය	ස්ථවිර චරිතය	332
3-10	ආනන්ද	ස්ථවිර චරිතය	337
3-11	සීහාසන දායක	ස්ථවිර චරිතය	343
3-12	එකපටමහ දායක	ස්ථවිර චරිතය	345
3-13	නන්ද	ස්ථවිර චරිතය	346
3-14	චුල්ලපන්ථක	ස්ථවිර චරිතය	349
3-15	පිළින්දිවච්ඡ	ස්ථවිර චරිතය	354
3-16	රාහුල	ස්ථවිර චරිතය	357
3-17	උපසේන වංගන්ත	ස්ථවිර චරිතය	360
3-18	රට්ඨපාල	ස්ථවිර චරිතය	362
3-19	සෝපාක	ස්ථවිර චරිතය	372
3-20	සුමංගල	ස්ථවිර චරිතය	375
3-21	සුභූති	ස්ථවිර චරිතය	378
3-22	උපවාන	ස්ථවිර චරිතය	384
3-23	සරණගමනීය	ස්ථවිර චරිතය	386
3-24	පංචසීල සමාදානීය	ස්ථවිර චරිතය	387
3-25	අන්න සංසාවක	ස්ථවිර චරිතය	388
3-26	ධූපදායක	ස්ථවිර චරිතය	389
3-27	පුලින පූජක	ස්ථවිර චරිතය	390

3-28	උත්තිය	ස්ථවිර චරිතය	390
3-29	ඒකඤ්ඡලික	ස්ථවිර චරිතය	392
3-30	ඛොමදායක	ස්ථවිර චරිතය	393
3-31	කුණ්ඩදාන	ස්ථවිර චරිතය	394
3-32	සාගත	ස්ථවිර චරිතය	400
3-33	කච්චායන	ස්ථවිර චරිතය	401
3-34	කාලුදායී	ස්ථවිර චරිතය	403
3-35	මොඝරාජ	ස්ථවිර චරිතය	410
3-36	අධිමුත්ත	ස්ථවිර චරිතය	411
3-37	ලඝුණ්ඩායක	ස්ථවිර චරිතය	412
3-38	ආයාග දායක	ස්ථවිර චරිතය	413
3-39	ධම්මචක්කදායක	ස්ථවිර චරිතය	414
3-40	කප්පරුක්ඛිය	ස්ථවිර චරිතය	415
3-41	උපාලි	ස්ථවිර චරිතය	416
3-42	කොටිකණ්ණ	ස්ථවිර චරිතය	417
3-43	කාලිඝොධාපුත්ත	ස්ථවිර චරිතය	418
3-44	සනනිට්ඨාපක	ස්ථවිර චරිතය	420
3-45	පඤ්චහත්ථිය	ස්ථවිර චරිතය	421
3-46	පදුමච්ඡදනිය	ස්ථවිර චරිතය	422
3-47	සයනදායක	ස්ථවිර චරිතය	422
3-48	චංකමදායක	ස්ථවිර චරිතය	423
3-49	සුභද්‍ර	ස්ථවිර චරිතය	424
3-50	චුන්ද	ස්ථවිර චරිතය	427
3-51	විධූපනායක	ස්ථවිර චරිතය	428
3-52	සතරංසික	ස්ථවිර චරිතය	429
3-53	සයනදායක	ස්ථවිර චරිතය	430

3-54	ගතෝදකීය	ස්ථවිර චරිතය	431
3-55	ඔපවුය්හ	ස්ථවිර චරිතය	432
3-56	සපරිවාරාසන	ස්ථවිර චරිතය	433
3-57	දීපක	ස්ථවිර චරිතය	434
3-58	ධජදායක	ස්ථවිර චරිතය	435
3-59	පදුම	ස්ථවිර චරිතය	436
3-60	අසනබෝධිය	ස්ථවිර චරිතය	437
3-61	සකචින්තනිය	ස්ථවිර චරිතය	439
3-62	අවොපුප්ඵීය	ස්ථවිර චරිතය	440
3-63	පචවාගමනීය	ස්ථවිර චරිතය	441
3-64	පරප්පසාදක	ස්ථවිර චරිතය	442
3-65	හිසදායක	ස්ථවිර චරිතය	443
3-66	සුචින්තිත	ස්ථවිර චරිතය	444
3-67	වත්ථදායක	ස්ථවිර චරිතය	445
3-68	අම්බදායක	ස්ථවිර චරිතය	446
3-69	සුමන	ස්ථවිර චරිතය	447
3-70	පුප්ඵ චංගොටිය	ස්ථවිර චරිතය	448
3-71	නාගසමාල	ස්ථවිර චරිතය	449
3-72	පද සඤ්ඤක	ස්ථවිර චරිතය	450
3-73	සඤ්ඤක	ස්ථවිර චරිතය	451
3-74	හිසාලුව දායක	ස්ථවිර චරිතය	452
3-75	එකසඤ්ඤක	ස්ථවිර චරිතය	453
3-76	තිණසත්ථර දායක	ස්ථවිර චරිතය	453
3-77	සුවිදායක	ස්ථවිර චරිතය	454
3-78	පාටලී පුප්ඵීය	ස්ථවිර චරිතය	455
3-79	ඒතඤ්ජලිය	ස්ථවිර චරිතය	456

3-80	තිපදුමනිය	ස්ථවිර චරිතය	457
3-81	තිමිරපුපජීය	ස්ථවිර චරිතය	458
3-82	ගතසඤ්ඤක	ස්ථවිර චරිතය	459
3-83	නිපන්නඤ්ජලිය	ස්ථවිර චරිතය	460
3-84	අධොපුපජීය	ස්ථවිර චරිතය	461
3-85	රංසි සඤ්ඤක	ස්ථවිර චරිතය	462
3-86	දුතියරංසි සඤ්ඤක	ස්ථවිර චරිතය	463
3-87	ඵලදායක	ස්ථවිර චරිතය	464
3-88	සද්ද සඤ්ඤක	ස්ථවිර චරිතය	465
3-89	බෝධි සිඤ්චක	ස්ථවිර චරිතය	465
3-90	පදුම පුපජීය	ස්ථවිර චරිතය	466
3-91	සුධා පිණ්ඩිය	ස්ථවිර චරිතය	467
3-92	සුචින්තිත	ස්ථවිර චරිතය	468
3-93	අඩ්ඩ චෙළක	ස්ථවිර චරිතය	469
3-94	සුචි දායක	ස්ථවිර චරිතය	470
3-95	ගන්ධමාලිය	ස්ථවිර චරිතය	470
3-96	තිපුපජීය	ස්ථවිර චරිතය	471
3-97	මධුපිණ්ඩික	ස්ථවිර චරිතය	472
3-98	සෙනාසනදායක	ස්ථවිර චරිතය	473
3-99	වෙය්‍යාවච්චකර	ස්ථවිර චරිතය	473
3-100	බුද්ධුපට්ඨාක	ස්ථවිර චරිතය	474
3-101	භික්ඛාදායක	ස්ථවිර චරිතය	474
3-102	ඤාණසඤ්ඤික	ස්ථවිර චරිතය	475
3-103	උපඵල හත්ථක	ස්ථවිර චරිතය	476
3-104	පදපූජක	ස්ථවිර චරිතය	477
3-105	මුට්ඨිපුපජීය	ස්ථවිර චරිතය	478

3-106	උදක පූජක	ස්ථවිර චරිතය	478
3-107	නළමාලිය	ස්ථවිර චරිතය	479
3-108	ආසනුපඨාපක	ස්ථවිර චරිතය	480
3-109	බිළාලිදායක	ස්ථවිර චරිතය	481
3-110	රේණු පූජක	ස්ථවිර චරිතය	482
3-111	මහා පරිවාර	ස්ථවිර චරිතය	483
3-112	සුමංගල	ස්ථවිර චරිතය	484
3-113	සරණාගමනීය	ස්ථවිර චරිතය	485
3-114	ඒකාසනිය	ස්ථවිර චරිතය	486
3-115	සුවණ්ණ පුපඵිය	ස්ථවිර චරිතය	487
3-116	චිතක පූජක	ස්ථවිර චරිතය	487
3-117	බුද්ධ සඤ්ඤික	ස්ථවිර චරිතය	488
3-118	මග්ග සඤ්ඤික	ස්ථවිර චරිතය	489
3-119	පඨවුපඨාන සඤ්ඤක	ස්ථවිර චරිතය	490
3-120	ජාති පූජක	ස්ථවිර චරිතය	491
3-121	සෙරෙය්‍යක	ස්ථවිර චරිතය	492
3-122	පුපඵ ධූපය	ස්ථවිර චරිතය	493
3-123	පායාස දායක	ස්ථවිර චරිතය	494
3-124	ගන්ධොදකිය	ස්ථවිර චරිතය	495
3-125	සම්මුඛාථවික	ස්ථවිර චරිතය	496
3-126	කුසුමාසනිය	ස්ථවිර චරිතය	497
3-127	ඵලදායක	ස්ථවිර චරිතය	498
3-128	ඤාණසඤ්ඤක	ස්ථවිර චරිතය	499
3-129	ගන්ධපුපඵිය	ස්ථවිර චරිතය	500
3-130	පදුම පූජක	ස්ථවිර චරිතය	500
3-131	සෝභිත	ස්ථවිර චරිතය	502

3-132	සුදසසන	ස්ථවිර චරිතය	502
3-133	චන්දන පූජක	ස්ථවිර චරිතය	503
3-134	පුපඵ ඡදනීය	ස්ථවිර චරිතය	504
3-135	රහොසඤ්ඤක	ස්ථවිර චරිතය	505
3-136	චම්පක පුප්ඵීය	ස්ථවිර චරිතය	506
3-137	අපථසන්දසසක	ස්ථවිර චරිතය	507
3-138	එකඅසාදනීය	ස්ථවිර චරිතය	508
3-139	සාලපුපඵදායක	ස්ථවිර චරිතය	508
3-140	පියාල ඵලදායක	ස්ථවිර චරිතය	509
3-141	ඡත්තාදි ඡත්තිය	ස්ථවිර චරිතය	510
3-142	ථම්භාරොපක	ස්ථවිර චරිතය	511
3-143	බුද්ධ වේදික	ස්ථවිර චරිතය	512
3-144	සපරිවාරිය	ස්ථවිර චරිතය	513
3-145	උම්මාපුප්ඵීය	ස්ථවිර චරිතය	514
3-146	අනුලෙපදායක	ස්ථවිර චරිතය	515
3-147	මගදායක	ස්ථවිර චරිතය	516
3-148	ඵලකදායක	ස්ථවිර චරිතය	517
3-149	වටංසකීය	ස්ථවිර චරිතය	518
3-150	පල්ලංකදායක	ස්ථවිර චරිතය	518
3-151	බන්ධුජීවක	ස්ථවිර චරිතය	519
3-152	තම්බපුප්ඵීය	ස්ථවිර චරිතය	521
3-153	වීථිසම්මජ්ජක	ස්ථවිර චරිතය	521
3-154	කක්කාරු පුපඵ	ස්ථවිර චරිතය	522
3-155	මන්දාරව පුපඵපූජක	ස්ථවිර චරිතය	523
3-156	කදම්බ පුප්ඵීය	ස්ථවිර චරිතය	523
3-157	තිණසුළක	ස්ථවිර චරිතය	524

3-158	නාග පුජ්ය	ස්ථවිර චරිතය	525
3-159	පුනනාග පුජ්ය	ස්ථවිර චරිතය	526
3-160	කුමුදදායක	ස්ථවිර චරිතය	527
3-161	සුපරිචරිය	ස්ථවිර චරිතය	528
3-162	කණවෙර පුජ්ය	ස්ථවිර චරිතය	529
3-163	බජ්ජදායක	ස්ථවිර චරිතය	529
3-164	දේසපූජක	ස්ථවිර චරිතය	530
3-165	කණිකාර ඡදනිය	ස්ථවිර චරිතය	531
3-166	සපිදායක	ස්ථවිර චරිතය	532
3-167	යුථිකා පුජ්ය	ස්ථවිර චරිතය	533
3-168	දුසසදායක	ස්ථවිර චරිතය	534
3-169	සමාදපක	ස්ථවිර චරිතය	535
3-170	පඤ්චංගුලිය	ස්ථවිර චරිතය	536
3-171	කුමුදමාලිය	ස්ථවිර චරිතය	537
3-172	නිසෙසණදායක	ස්ථවිර චරිතය	537
3-173	රතති පුජ්ය	ස්ථවිර චරිතය	538
3-174	උදාාන දායක	ස්ථවිර චරිතය	539
3-175	සීහාසන දායක	ස්ථවිර චරිතය	540
3-176	මගගදකකික	ස්ථවිර චරිතය	541
3-177	ඒකදීපිය	ස්ථවිර චරිතය	542
3-178	මණි පූජක	ස්ථවිර චරිතය	542
3-179	තිකිචඡක	ස්ථවිර චරිතය	543
3-180	සංසුපටඨාක	ස්ථවිර චරිතය	544
3-181	තිණසතථාර දායක	ස්ථවිර චරිතය	545
3-182	බණඩ චුලලිය	ස්ථවිර චරිතය	546

3-183	සොණකොළිවිස	ස්ථවිර චරිතය	558
3-184	පුබ්බකම්ම පිලොතික	ස්ථවිර චරිතය	560
3-185	පිලින්දිවච්ඡ	ස්ථවිර චරිතය	560
3-186	බකකුල	ස්ථවිර චරිතය	561
3-187	ගිරිමානන්ද	ස්ථවිර චරිතය	562
3-188	මහාකච්චායන	ස්ථවිර චරිතය	570
3-189	වක්කලී	ස්ථවිර චරිතය	572
3-190	මහා කප්පින	ස්ථවිර චරිතය	576
3-191	දබ්බමල්ලපුත්ත	ස්ථවිර චරිතය	585
3-192	කුමාර කස්සප	ස්ථවිර චරිතය	588
3-193	දාරුචීරිය	ස්ථවිර චරිතය	590
3-194	මහාකොට්ඨිත	ස්ථවිර චරිතය	596
3-195	උරුවෙල කස්සප	ස්ථවිර චරිතය	598
3-196	රාධ	ස්ථවිර චරිතය	600
3-197	මොඝරාජ	ස්ථවිර චරිතය	601
3-198	ලකුණ්ඨක භද්දිය	ස්ථවිර චරිතය	601
3-199	කංඛාරේවත	ස්ථවිර චරිතය	603
3-200	සීවලී	ස්ථවිර චරිතය	603
3-201	වංගීස	ස්ථවිර චරිතය	612
3-202	නන්දක	ස්ථවිර චරිතය	615
3-203	කාලුදායී	ස්ථවිර චරිතය	615
3-204	අභය	ස්ථවිර චරිතය	622
3-205	ලොමක සංගීය	ස්ථවිර චරිතය	623
3-206	වනවච්ඡ	ස්ථවිර චරිතය	624
3-207	සුගන්ධ	ස්ථවිර චරිතය	626

විසුද්ධජනවිලාසිනී නම් වූ
අපදානට්ඨ කථා

දෙවන භාගය

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා!

3.7

පදුමුත්තර සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන්ගේ අපදානයයි. මොහු වනාහි පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ ඒ ඒ භවයෙහි නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර මහසල් ගෘහපති කුලයක ඉපිද දැනමිති බවට පත්ව එක්දිනක් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක තම සසුනෙහි පළමුව අවබෝධ කරගත් ධර්ම ඇති චිරරාත්‍රඥයන් අතර අගතන්හි තබනු දැක තමාද ඒ තනතුර පතන්නේ සියදහසක් භික්ෂූන් පිරිවරාගත් භාග්‍යවතුන් වහන්සේට සත්දවසක් මහදන් පවත්වා ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් වහන්සේද ඔහුට අනතුරක් නැති බව දැක වාසනා සම්පත්තිය ප්‍රකාශ කළ සේක. ඔහු දිවි ඇතිතාක් පින් කරන්නේ ශාස්තෘන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි චෛත්‍යයක් ප්‍රතිෂ්ඨාපනය කරනු ලබනවිට චෛත්‍යය ඇතුළෙහි රුවන්ගෙයක් කරවීය. චෛත්‍යය වටා රුවන් ඇගෑ දහසක්ද කරවීය. ඔහු මෙසේ පින්කොට එයින් මියපරලොව ගොස් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මහාකාල නම් කෙළෙඹියෙක්ව අට

කිරියක් තරම් කුඹුරෙහි හැල්සහල් ගබඩාව හැර ගත් හැල්සහලින් නොකඩවා කිරිබත් සාදවා එහි මීපැණි, ගිතෙල්, සකුරු ආදිය බහා බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දුන්නේය. හැල්සහල් ගබඩාව හැර ගත් ගත් තැන නැවත පුරවන ලද්දේය. ගොයම් කිරිවදනා කල්හි පුටුකග්ග නම් දානයක් දුන්නේය. ගොයම් කපන කල්හි ලායනග්ග නම් දානයක්ද, මිටිබඳනා කල්හි වේණග්ග නම් දානයක්ද, කොළකැටි කරන කල්හි කලාපග්ග නම් දානයක්ද ගොයම් මඩනා කල්හි බටග්ග නම් දානයක්ද, ගොඩගසනා කල්හි භණ්ඩග්ග නම් දානයක්ද, වී මනිනා කල්හි මිනග්ග නම් දානයක්ද කොටුගෙවල්හි තබනා කල්හි කොට්ඨග්ග නම් දානයක්ද යනුවෙන් මෙසේ එක් ශස්‍ය වාරයෙක්හි නවවරක් අග්‍රදානය දුන්නේය. එම ශස්‍යය වනාහි තවතවත් ඉතිරිව තිබුණේය. මෙසේ දිවි ඇතිතෙක් පින්කොට දෙවියන් අතරද මනුෂ්‍යයන් අතරද සැරිසරන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙරම කපිලවත්ථු නගරයට නුදුරෙහි දොණවත්ථු නම් බමුණු ගමෙහි බමුණු මහසල් කුලයෙහි උපන්නේය. ඔහුට කොණ්ඩඤ්ඤ යනුවෙන් ගෝත්‍රයෙන් ලැබුණු නමක් විය. ඔහු වැඩිවිය පත්ව තුන්වේදය උගෙන ලක්ෂණ මන්ත්‍රයන්හිද පරතෙරට ගියේය. ඔහු වනාහි, අපගේ බෝධිසත්වයන් වහන්සේ තුසිපුරයෙන් චුතව කපිලවත්ථු නුවර සුදොවුන් මහරජුගේ ගෙහි උපත ලැබ ඔහුගේ නම් තබන දිනයෙහි බමුණන් එකසිය අටදෙනෙකුන් කැඳවනු ලැබූ කල්හි, ලක්ෂණ පරීක්ෂා කරනු පිණිස මහාතලයට කැඳවනු ලැබුවාවූ බමුණන් අටදෙන අතුරින් නවකයා ව මහාපුරුෂයාගේ ලක්ෂණ සම්පත්තිය දැක නිසැකයෙන්ම මොහු බුදුවන්නේ යයි නිශ්චයවට පැමිණ බෝධිසත්වයන්ගේ මහාභිනිෂ්ක්‍රමණය අපේක්ෂා කරන්නේ හැසිරෙයි. බෝධිසත්වයන් වහන්සේද මහත් පිරිවරින් වැඩෙන්නේ පිළිවෙළින් වැඩිවිය පත්ව ඥානය මුහුකුරා ගොස් එකුන් විසිවැනි වර්ෂයෙහි මහාභිනිෂ්ක්‍රමණය කරමින් අනෝමා ගංතෙර දී පැවිදිව පිළිවෙළින් උරුවේලාවට ගොස් මහාප්‍රධාන වීර්යය කළේය. එකල්හි කොණ්ඩඤ්ඤ මානවක තෙමේ බෝසතුන් පැවිදි වූ බව අසා ලක්ෂණ පරීක්ෂා කළ බමුණන්ගේ පුත්‍රයන් වූ වප්ප මාණවක ආදීන් සමග තමා පස් වැනිව පැවිදිව පිළිවෙළින් බෝසතුන් වෙත එළඹ සයවසක් උන්වහන්සේට උපස්ථාන කරන්නේ, රළු ආහාර අනුභවයෙන් කලකිරී ඉවත්ව ඉසිපතනයට ගියේය.

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ රළු ආහාර අනුභවයෙන් ලද කායබල ඇත්තේ. වෙසක් පුණු පොහෝදා බෝරුක්මුල අපරාජිත

පර්යංකයෙහි හුන් සේක් තුන්මරුන්ගේ හිස් මැඩ බුද්ධත්වයට පත්ව සත් සතියක් බෝමැඩ ම කල්ගෙවා පස්වග තවුසන්ගේ ඥානය මුහුකුරා ගිය බව දැන ඇසළ පුණුපොහෝ දින ඉසිපතනයට වැඩ ඔවුන්ට ධම්මචක්කප්ප වත්තන සූත්‍රය දේශනා කළ සේක. දේශනාව කෙළවර කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ දහඅට කෝටියක් බ්‍රහ්මයන් සමග සෝවාන් ඵලයෙහි පිහිටියහ.

ඉක්බිති පුරපස පස්වන දින අනන්තලක්ඛණ සූත්‍රාන්ත දේශනාවෙන් රහත්බව සාක්ෂාත් කරගත් සේක. මෙසේ උන්වහන්සේ රහත්බවට පත්ව කවර කර්මයක් කොට මම ලොව්තුරා සැපයට පැමිණියෙමි දෝ හෝයි මෙනෙහි කරනසේක් තමන් වහන්සේගේ පූර්ව කර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැන සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය උදානයක් ලෙස දක්වන සේක් **'පදුමුත්තරබුද්ධං'** යනාදිය කියූ සේක. එහි අර්ථය යට කියන ලද්දේමැයි. **ලෝකජෙට්ඨං විනායකං** යනු සකල සත්ව ලෝකයට ජ්‍යෙෂ්ඨය, ප්‍රධානය යන අර්ථයි. විශේෂයෙන් හික්මවිය යුතු සත්වයන් සංසාර සාගරයෙහි පරතෙර වූ අමෘතමහා නිර්වාණයට පමුණුවයි. **සම්ප්‍රාප්ත** කරවානුයි විනායක නම්. එම විනායකයා. **බුද්ධභූමි අනුපපත්තං** යනු බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් බිම = බුද්ධභූමි, සර්වඥතාඥානය. එයට පැමිණියේ, එය අවබෝධ කරගත්තේනුයි බුද්ධභූමි අනුපපත්ත නම්. ඒ බුද්ධභූමියට පැමිණ සර්වඥතා ඥානයට පැමිණියනු බුද්ධභූත යන අර්ථයි. **පඨමං අද්දසං අහං** යනු පළමුව වෙසක් පුණුපොහෝ දින රාත්‍රියෙහි අළුයම් වේලෙහි බුදුබවට පත් පදුමුත්තර සම්මා සම්බුදුරජාණන් වහන්සේ මම දුටුවෙමි යන අර්ථයි. **යමනා බෝධියා මූලෙ** යනු බෝරුක සමීපයෙහි යම් පමණ යක්ෂයෝ පැමිණියෝය. රැස් වූවෝය. **සම්බුද්ධං** බුදුවූ ඒ බුදුරජාණන් වහන්සේ. **පඤ්ජලිකතා** දසඇඟිලි එක්තැන් කොට දෝත්මුදුන් දී වඳින්, නමදින් යනු සම්බන්ධයි. **සබ්බෙදෙවා තුටඨමනා** යනු බුදුබව ලැබූ තැනට පැමිණි ඒ සියලු දෙවියෝ තුටුසිත් ඇත්තානු ආකාසයෙහි හැසිරෙන්නුයි සම්බන්ධයි. **අන්ධකාරතමොනුදෝ** යනු ඝන අන්ධකාරය වූ මෝහය දුරුකරන්නා වූ පිටුදකින්නා වූ මේ බුදුරජාණන් වහන්සේ පැමිණි සේක යන අර්ථයි. **තෙසංභාස පරෙතානකං** යනු සිතාවෙන් ප්‍රීති සෝමනස්සයෙන් යුක්ත වූ එම දෙවියන්ගේ මහා නාදයයි. මහා ශබ්දයයි. **පවත්තථ** යනු පවතී. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සාසනයෙහි කෙලෙස් ලෝභාදි කෙලෙස් දහම් දවාලන්නෙමුයි සම්බන්ධයි. **දෙවානං ගිරමඤ්ඤාය වාචාසභිං** යනු වචන සමග කියන ලද දෙවියන්ගේ

ශබ්දය දැන. **හටෙඨා හටෙඨන චිත්තෙන** සොම්නස් සහගත සිතින්. **ආදිහිකඛං** ප්‍රථම ආහාරය, බුදුවූ උන්වහන්සේට මම දුනිමියි සම්බන්ධයි. **සතතාහං අභිනිකඛමම** යනු මහබිනික්මන් කොට සත්දිනක් පධන් වීර්යකොට, සර්වඥතාඥානය පදනම්කොට ඇති අර්හත් මාර්ගඥාන නම් වූ බෝධිය **අජඣගමං** යනු මම අවබෝධ කරගත්තෙමි යන අර්ථයි. **ඉදං** මෙ **ඡඨමං භත්තං** යනු මේ සිරුර යැපෙන ආහාරයයි. **බ්‍රහ්මචාරිස්ස** උතුම් හැසිරීම් ඇත්තහුට. මෙ මාගේ මේ දේවපුත්‍රයා විසින් පළමුකොට දෙනලද්දේ විය යන අර්ථයි. **තුසිතාහි ඉධාගන්ත්වා** යනු තුසිත භවනයෙහි සිට මේ මිනිස්ලොවට පැමිණ, යම් දේවපුත්‍රයෙක් මෙ මට **භික්ඛං උපානය** දුන්නේද, ඒ දේවපුත්‍රයා **කිත්තයිස්සාමි** කියන්නෙමි. ප්‍රකට කරන්නෙමි. **භාසතො** කියන්නා වූ මාගේ වචනය අසවු යනු සම්බන්ධයි. මෙතැන්පටන් නොගැඹුරු පද ම වර්ණනා කරන්නෙමියි දක්වයි.

අගාරා යනු තමා උපන් බමුණු ගෙයින් නික්ම පැවිදිව සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කරන බෝසතුන් සමග වාසය කරන්නේය යනු සම්බන්ධයි. **තතො සතතමකෙ වසෙස** යනු පැවිදිවූ කල්හි සිට සත්වැනි අවුරුද්දෙහි බුදෙධා **සචචං කථෙස්සතී** යනු සයවසරක් දුෂ්කරක්‍රියා කොට සත්වැනි වසරෙහි බුදුවී බරණැස ඉසිපතන මිගදායෙහි ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනාවෙන් දුක්ඛ සමුදය, නිරෝධ මාර්ග සත්‍ය සංඛ්‍යාත වූ චතුරාර්ය සත්‍යය කියන්නේය යන අර්ථයි. **කොණ්ඩඤ්ඤ නාම නාමෙන** යනු නමින් ගෝත්‍රනාම වශයෙන් කොණ්ඩඤ්ඤ නමි. **පඨමං සච්ඡිකාහිති** යනු පස්වග තවුසන් අතර ප්‍රථම ආදියෙහිම සෝතාපත්ති මාර්ගඥානය සාක්ෂාත් කරගත්තේයයි ප්‍රත්‍යක්ෂ කරගත්තේ, යන අර්ථයි. **නික්ඛන්තොනානු පබ්බජිං** යනු නික්මයන බෝසතුන් සමග නික්මී පැවිදිවීම් යන අර්ථයි. එසේ පැවිදිව මාවිසින් **පධානං** වීර්යය, **සුකතං** මනාසේ කරන ලදී. දැඩිකොට කරන ලදී යන අර්ථයි. **කිලෙසෙ ඣාපනත්ථාය** යනු කෙලෙස් දවාහරිනු පිණිස, විධිවංසනය කරනු පිණිස **අනගාරියං** ගිහිගෙයට හිතකර කෘෂිවාණිජ්‍යාදී කටයුතුවලින් විරහිත සාසනය. **පබ්බජිං** පිළිපැද්දෙමි යන අර්ථයි. **අධිගන්ත්වාන සබ්බඤ්ඤූ** යනු සියලු අතීත අනාගත වර්තමාන වූ හෝ සංඛාර, විකාර **ලකඛණ, නිබ්බාන පඤ්ඤත්ති** සංඛ්‍යාත වූ ඥෙය්‍ය ධර්මය හෝ දන්නේ දෙවියන් සහිතව පවත්නා සත්ව ලෝකයෙහි මුවවනය වූ මිගදාය විහාරයට **අභිගන්ත්වා** එළඹ මයා මාවිසින් සාක්ෂාත් කරගනු ලැබුවා වූ සෝතාපත්ති මාර්ග ඥානයෙන්. **අමතභෙරිං** අමෘතමහා නිර්වාණ නමැති භේරිය, **ආහනි** ගැසීය. දක්වයි යන අර්ථයි. **සොදානි** යනු ඒ මම

පළමුව සෝවාන්ව දැන් අර්හත් මාර්ග ඥානයෙන් **අමතං සනතං** සන්සුන් ස්වභාවය පිළිපැදිය යුතුය. එයට පැමිණිය යුතුය. **අනුත්තරං** ඊට වඩා ශ්‍රේෂ්ඨ තැනක් නැති නිර්වාණයට පැමිණියේ එය අවබෝධ කරගත්තේ යන අර්ථයි. **සබබාසවෙ පරිඤ්ඤාය** යනු කාමාසව ආදී සියලු ක්ලේශයන් **පරිඤ්ඤාය** ප්‍රහාණ පරිඥාවෙන් බැහැරකොට **අනාසවො** නිකෙලෙස්ව **විහරාමි** ඉරියව් සහිතව වාසය කරමි. **පටිසමභිදා චතසෙසා** ආදී වූ ගාථා කියන ලද අර්ථ ඇත්තේමය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ පසුකලෙක ජේතවන මහා විහාරයෙහි භික්ෂුසංඝයා මැද පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහුන් සේක් පළමුකොට තමන්වහන්සේ අවබෝධ කරගත් ධර්මය ඇති බව දක්වන සේක් "මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් චිරරාත්‍රඥ වූ කෙනෙක් වේද ඒ කොණ්ඩඤ්ඤය"යි උන්වහන්සේ අග්‍රස්ථානයෙහි තැබූ සේක. උන්වහන්සේ දැඟසව්වන් විසින් තමා කෙරෙහි කරනු ලබන ග්‍රාමාන්ත සේනාසනයෙහි ආකීර්ණ හැසිරීමද අත්හැර දමනු කැමති සේක්, විවේකාභිරතියෙන් වාසයකරනු කැමති සේක්, තමා සමීපයට පැමිණි ගිහිපැවිද්දන් පිළිසඳර කථාකිරීමද ප්‍රපංචයක් සේ සිතන සේක්, ශාස්තෘන් වහන්සේ විමසා හිමවතට පිවිස ඡද්දන්ත ඇතුන් විසින් උවටැන් කරනු ලබන සේක්, ඡද්දන්ත විල්තෙර දොළොස් මසක් වාසය කළ සේක. මෙසේ එහි වසන තෙරුන් වහන්සේ වෙත එක් දවසක් ශක්‍රදේව රාජයා එළඹ සිට මෙසේ කීය. ස්වාමීනි, ආර්යයන් වහන්සේ මට ධර්මය දේශනා කරනු මැනවි. තෙරුන් වහන්සේ චතුරාර්ය සත්‍යයෙහි අන්තර්ගත වූ ත්‍රිලක්ෂණයෙන් ගනු ලැබූ ශූන්‍යතාවෙන් යුක්ත වූ නානානයින් විචිත්‍ර වූ අමා ඔසුවක් බඳු ධර්මය බුද්ධ ලීලාවෙන් දේශනා කළ සේක. ඒ අසා ශක්‍රදේවේන්ද්‍ර තෙමේ ප්‍රසාදය පළකරන්නේ

බෙහෙවින් පහන් වෙමි - මහාරස දම් කනැලා
විරාගී දම් දෙසුණේ - හැමතින් කෙලෙස් මුදනුව

තෙරුන්වහන්සේ ඡද්දන්ත විල්තෙර දොළොස් හවුරුද්දක් වැස පරිනිර්වාණය එළඹි කල්හි ශාස්තෘන් වහන්සේ කරා එළඹ පිරිනිවන්පෑම අනුදන්වාගෙන එහිම වැඩ පිරිනිවන්පෑ සේක.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.8

පදුමුත්තරෝ නාම ජිනෝ ආදි වශයෙන් ආයුෂ්මත් පිණ්ඩාල භාරද්වාජ තෙරුන්ගේ අපදානයයි. මොහුද පෙර බුදුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනතැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිංහයෝනියෙහි ඉපිද පර්වතය පාමුල ගුහාවෙහි වසයි. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුග්‍රහ කරනු පිණිස, ඔහු ගොදුරු සොයා නික්මුණුකල්හි ඔහුගේ නිදන ගුහාවට පිවිස නිරෝධ සමාපත්තියට සමවැදී හුන් සේක. සිංහයා ගොදුරුගෙන ආපසු එන්නේ ගුහාදොර සිට භාග්‍යවතුන් වහන්සේ දැක තුටුපහටුව ජලයෙහි හටගත් මලින්ද, ගොඩබිම හටගත් මලින්ද පූජාකොට, සිත් පහන් කරන්නේ භාග්‍යවතුන් වහන්සේගේ ආරක්ෂාව පිණිස අනිකුත් වන මෘගයන් ඉවත්කරනු පිණිස තුන්වේලාවක සිංහනාද කරන්නේ බුදුන් කෙරෙහි පිහිටුවාගත් සිහියෙන් සිටියේය. පළමු දිනයෙහි යම්සේද එසේ සත්දිනක් පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ සත්දින ඇවෑමෙන් නිරෝධ සමාපත්තියෙන් නැගිට මොහුට මෙපමණක් හේතුසම්පත් වටින්නේමැයි ඔහු බලාසිටියදීම අහසට පැනනැඟී විහාරයටම වැඩිසේක. සිංහයා බුදුරජාණන් වහන්සේ වෙන්වයාමේ දුක ඉවසා දරාගනු නොහැක්කේ කලුරියකොට හංසවතී නුවර මහා සම්පත් ඇති කුලයක ඉපිද වැඩිවිය පත්ව නුවරවැසියන් සමග විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පැහැදී සත්දිනක් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට මහදන් පවත්වා දිවිඇතිතාක් පින්කොට චරින්වර දෙවිමිනිසුන් අතර හැසිරෙන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කොසඹෑවෙහි උදේන රජුගේ පුරෝහිතයාගේ පුත්‍රයකු වී උපන්නේය. භාරද්වාජ යයි ඔහුට නමක් විය. ඔහු වැඩිවිය පත්ව තුන්වේදය උගෙන මාණවකයන් පන්සිය දෙනකුට මන්ත්‍ර හදාරවන්නේ මාහැඟි බවින් ගරුබවට පත්වූයේ ඔවුන් විසින් අත්හැර දමනු ලැබුයේ රජගහ නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සංඝයාට ලැබෙන ලාභසත්කාර දැක සසුනෙහි පැවිදිව ආහාරයෙහි පමණ නොදන්නෙක් ව වාසය කරයි. ශාස්තෘන් වහන්සේ උපායයෙන් ආහාරයෙහි පමණදත් බවෙහි පිහිටුවන ලද්දේ විදර්ශනා වඩා නොබෝ කලකින්ම අර්හත්ඵල ඇත්තෙක් විය. අර්හත්ඵල ඇත්තෙක් ව, බුදුන් හමුවෙන් ශ්‍රාවකයන් විසින් යමකට 'පැමිණිය යුතුද මා විසින් එයට පැමිණෙන ලද්දේය'යි භික්ෂු සංඝයා අතර යම්කෙනෙකුට මාර්ගය ගැන හෝ ඵලය ගැන යම් සැකයක් ඇත්තේනම් ඔහු මා විමසාවා'යි සිංහනාද

කළේය. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, මාගේ සිංහනාද කරන ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් වේද ඒ පිණ්ඩෝලභාරද්වාජ යයි අග්‍ර ස්ථානයෙහි තැබූ සේක. අගතැන්පත්ව පෙර කරන ලද පුණ්‍ය සම්භාරය සිහිකොට සොම්නස් වශයෙන් තමාගේ පුණ්‍යකර්ම අපදානය දක්වන්නේ **පදුමුත්තරෝ** ආදිය කීය. එහි අර්ථය යට කියන ලද්දේමය. **පුරතෝ හිමවන්තස්ස** යනු හිමාලය පර්වතයෙන් පූර්ව දිග්භාගයෙහි යනු අර්ථයි. **චිත්තකූටෙ වසී තදා** යනු යම්කලෙක මම මෘගයන්ට රජවූ සිංහයෙක් ව හිමාලය පර්වත සමීපයෙහි වසමිද එකල්හි පදුමුත්තර නම් ශාස්තෘන් වහන්සේ නොයෙක් ඖෂධවලින්ද, නොයෙක් රත්නයන්ගෙන්ද චිත්‍ර වූ බැවින්ද, විචිත්‍ර වූ බැවින්ද **චිත්තකූටෙ** චිත්‍රපර්වත මුදුනෙහි විසූහයි **සම්බන්ධයි. අභිතරූපෝ නත්ථාසි** යනු අභීත ස්වභාව ඇති, නිර්භය ස්වභාව ඇති මෘගරාජයෙක් එහි **ආසි** විය යන අර්ථයි. **චතුක්කමෝ** යනු **යස්ස සද්දං සුණිත්වාන** යනු යම් මෘගරාජයකුගේ සිංහනාදය අසා බහුජනා බොහෝ සත්වයෝ **විකම්මහනති** විශේෂයෙන් කම්පනයට පත්වෙති. බිය වෙති. **සුට්ඨුල්ලං පදුමං ගායහ** යනු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන් මැනැවින් පිසුණු නෙළුම්මලක් ඩැහැගෙන **නරාසභං** මිනිසුන්ට **ආසභං** උත්තම වූ ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ **උපගඤ්ඡිං** යනු සමීපයට ගියෙමි යන අර්ථයි.

වුට්ඨිතස්ස සමාධිම්හා යනු නිරෝධ සමාපත්තියෙන් නැගුණු බුදුරජාණන් වහන්සේට එම මල **අභිරෝපයිං** පූජා කෙළෙමි යන අර්ථයි. **චතුද්දිසං නමස්සිත්වා** යනු සිව්දිසාවන්හි නමස්කාරකොට **සකං චිත්තං පසාදෙත්වා** ආදරයෙන් පිහිටුවා **සීහනාදං** අභීත නාදයක් කෙළෙමි යන අර්ථයි. **ඉන්පසු** බුදුරජාණන් වහන්සේ විසින් දෙවා වදාළ විවරණය ප්‍රකාශ කරන්නේ පදුමුත්තරෝ ආදිය කීය. එය නොගැඹුරුය. **වදතං සෙට්ඨෝ** යනු අපි බුදුවරු වෙමුයි අපි බුදුවරු වෙමුයි කියන අන්‍ය **තීර්ථකයන්ට** ශ්‍රේෂ්ඨ වූ උත්තම වූ බුදුරජාණන් වහන්සේ වැඩිසේක යනු **සම්බන්ධයි.** ඒ වැඩවදාළ භාග්‍යවතුන් වහන්සේගේ ඒ ධර්මය ප්‍රකාශ කරන්නෙමු. අසන්නෙමු යන අර්ථයි. **තෙසං භාසපරෙතානං** යනු සිනාවෙන් සෝමනස්සයෙන් **පරේතානං** මැඩුණු පැමිණි ඒ දෙවිමිනිසුන්ට **ලොකනායකෝ** යනු ලෝකයට නායක තෙමේ. ස්වර්ගමෝක්ෂ සම්පාදක තෙමේ. **මම සද්දං** මාගේ සිංහනාදය. **පකිත්තෙසි** ප්‍රකාශ කළේය. කීවේය. **දීඝදස්සී** අනාගත කාලය දක්නා. මුනිවරුන් අතර මහාමුනිවරයා. සෙසු ගාථා පහසුවෙන් දතහැකි වේමය.

පදුම නමින් සක්විති රජකුවී ජාතීන් හැටසයකට ප්‍රධාන වූ ප්‍රධාත්වයට පත්වූ රාජ්‍යය කරන්නේය යන අර්ථයි. **කප්පසත සහස්සම්හි** කල්ප සියදහසක අවසානයෙහි යන අර්ථයි. **පකාසිතෙ පාවචනෙ** යන ඒ ගෞතම භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්පිටකයෙහි ප්‍රකාශ කරන ලදී. දේශනා කරන ලදී යන අර්ථයි. **බ්‍රහ්මබන්ධු භවිස්සති** යනු එදා ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මේ මෘගයන්ට රජවූ සිංහයා බ්‍රාහ්මණ කුලයෙහි උපදින්නේය යන අර්ථයි. **බ්‍රහ්මඤ්ඤා අභිනික්ඛම්ම** යනු බමුණු කුලයෙන් නික්ම ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි වන්නේය යනු සම්බන්ධයි. **පධාන පහිතත්තො** යනු වීර්ය කරනු පිණිස මෙහෙයවූණු සිත් ඇත්තේ, උපධි සංඛ්‍යාත වූ ක්ලේශයන් නැතිවීමෙන් **නිරූපධී** කෙලෙස් පීඩාවන් නැතිවීමෙන් සංසිඳුණේ, **උපසන්තෝ සබ්බාසවෙ** සියලු කෙලෙස්. **පරිඤ්ඤාය** හැර. **අනාසවෝ** කෙලෙස් නැත්තේ **නිබ්බායිස්සති පිරිනිවනින්** නිවුණේ වන්නේය යන අර්ථයි. **විවනෙ පන්ත සෙය්‍යම්හි** යනු ජනසම්බාධ රහිත දුරු අරණෙක සෙනසුනෙක යන අර්ථයි. **වාලමිග සමාකුලෙ** යනු කලුසිංහ ආදී චණ්ඩවූ මෘග ගණයන්ගෙන් **ආකුලෙ** ගැවසුණු යන අර්ථයි. ඉතිරිය කියන ලද අර්ථ ඇත්තේමය.

පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගේ
අපදාන අටුවාවයි.

3.9

ගංගාභාගීරසීනාම යනාදි වශයෙන් ආයුෂ්මත් බදිරවනිය රේවත තෙරුන්ගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ, ඒ ඒ භවයෙහි පින් රැස්කරන්නේ පදුමුත්තර බුදුරදුන් කල්හි හංසවතී නුවර තීර්ථනාවික කුලයෙහි ඉපිද මහා ගංගාවෙහි ප්‍රයාග තීර්ථයෙහි තීර්ථ නොකාවකින් කර්මාන්ත කරන්නේ එක්දිනක් ශ්‍රාවකයන් සමග භාග්‍යවතුන් වහන්සේ ගංතෙරට පැමිණිබව දැක ප්‍රසන්න සිතින් පහුර යොදා මහත් වූ පූජා සත්කාරයෙන් යුතුව එගොඩට පමුණුවා එක්තරා භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ විසින් ආරණ්‍යක භික්ෂූන් අතර අගතන්හි තබනු ලබනු දැක එම තනතුර පතා භාග්‍යවතුන් වහන්සේටද භික්ෂු සංඝයාටද මහදන් පවත්වා ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ප්‍රාර්ථනාව නිවැරදි බව ප්‍රකාශ කළ සේක. ඔහු එතැන්

පටන් පින් රැස්කරන්නේ දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් විඳ මෙම බුද්ධෝත්පාද කාලයෙහි මගධරට නලගම රූපසාරි නමැති බැමිණියකගේ කුසයෙහි උපන්නේය. මව්පියෝ වැඩිවියපත් ඔහු ගෘහබන්ධනයෙන් බඳිනු කැමැතිව ඔහුට දැන්වූහ. ඔහු සැරියුත් තෙරුන්ව පැවිදි වූ බැව් අසා මාගේ දෙටු සොහොයුරු උපතිස්ස ආර්යයා මේ සම්පත් හැරදමා පැවිදි විය. ඔහු හැලූ කෙලපිඩ මම කෙසේනම් අනුභව කරන්නෙම්දැයි උපන් සංවේග ඇත්තේ මලපුඩුව වෙතට නොයන මෘගයකු මෙන් ඥාතීන් රවටා හේතු සම්පත්තියෙන් පොළඹවනු ලබන්නේ භික්ෂූන් සමීපයට ගොස් ධර්ම සේනාපතිගේ බාල සොහොයුරා බව දන්වා තමාගේ පැවිදිවීමට කැමැත්ත දැන්වීය. භික්ෂූහු ඔහු පැවිදිකරවා විසිවයස් පිරුණු ඔහු උපසම්පදා කොට කර්මස්ථානයෙහි යෙදවූහ. ඔහු කමටහන් ගෙන කිහිරි වනයට පිවිස විශ්‍රාම ලබන්නේ උත්සාහ කරන්නේ වෑයම් කරන්නේ ඥානය මුනුකුරා ගිය බැවින් නොබෝ කලෙකින්ම ෂට් අභිඥා සහිතව රහත් විය. ඔහු රහත්ව ශාස්තෘන් වහන්සේද ධර්ම සේනාපතීන් වහන්සේද වැඳීමට සෙනසුන හකුලා තබා පාසිවුරු ගෙන නික්ම අනුපිළිවෙළින් සැවැත් නුවරට පැමිණ ජේතවනාරාමයට පිවිස ශාස්තෘන් වහන්සේද ධර්මසේනාපතීන් වහන්සේද වැඳ කිහිපදිනක් ජේතවනාරාමයෙහි වාසය කළේය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ආර්ය සංඝයා මැද වැඩහුන් සේක් ඔහු ආරණ්‍යක භික්ෂූන් අතර අගතන්හි තැබූ සේක. "මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් ආරණ්‍යක භික්ෂූන් අතරින් අග්‍රවේද ඒ රේවතය"යි මෙසේ අගතැන්පත්ව තමාගේ පූර්ව කර්මයන් සිහිකොට සතුටු සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ ගංගා **භාගීරසී** යි ආදිය කීය.

එහි ගංගා යනු ගයමින් ඝෝෂා කරමින් යන්නීයයි ගංගා නම් වේ. නැතහොත් ගො කියන්නේ පෘතුවියයි. එහි ගියාය පැවැත්තා යයි ගංගානම් වෙයි. අනවතප්ත විල තුන්යලක් පැදකුණුකොට ගියතන්හි ආවර්ත ගංගා යන වචනයෙන් පර්වත මුදුනින් ගියතන්හි වැදුණු තන්හි **බහලගංගා** මහාගංගා යනුවෙන්ද, තිරිසන් පර්වතයෙහි වැද ගියතන්හි **උම්මග්ගගංගා** උමංගඟ යනුවෙන්ද, එතැනින් මහා පර්වතයෙහි වැදී පස් යොදුනක් අහසින් ගිය තන්හි **ආකාසගංගා** අහස්ගඟ යනුවෙන්ද ඇයම වැටුණු තැන බිඳගෙන හටගත් පස්යොදුන් පොකුණු සමූහය බිඳගෙන එහිදී ඇඟිලි පස මෙන් පහකට බෙදී ගංගාය, යමුනාය, සරභූය, මහීය, අචිරවතීය යනුවෙන් නම් පසක් ඇතිව දඹදිව කැබලි පහක් කොට කොටස් පහක් කොට, කැබලි පස, කොටස් පස මෙසේ ගියාහු පැවැත්තාහු

භාගීරසි නමි. ගංගා වූවාද භාගීරසි වූවාද ගංගාභාගීරසි නමි. භාගීරසිගංගා යයි කිවයුතු තැන ගාථා බන්ධන පහසුව පිණිස පෙර පුරුදු වශයෙන් කියන ලදැයි දතයුතුය. **හිමවන්නා පභාවිතා** යනු සතුන් හිංසා කරතියි, ශීතලෙන් මරතියි මඩිතියි අළෝලනය කරතියි හිම නමි. හිම එයට ඇතියි හිමවා නමි. ඒ හිමවත පටන් පෝෂණය වූවා, පැවතුණා ගලාබස්නා වෙතියි හිමවන්ත පභාවිතා නමුදු. **කුතිතෝ නාවිකෝ ආසිං** යනු ගංගාවෙහි සැඩපහරින් යුතු විෂම තොටුපළෙක කෙවුල් කුලයෙහි උපන්නේ නැවියෙක් ආසිං විමියි අර්ථයි.

ඔරිමෙවතරිංඅහං යනු පැමිණි පැමිණි මිනිසුන් එගොඩ සිට මෙගොඩට අහං මම **තරිං** තරණය කරවූවෙමි යන අර්ථයි. **පදුමුත්තර නායකෝ** යනු දෙපා ඇත්තවුන්ට උත්තම වූ සත්වයන් නිර්වාණයට නායකෝ පමුණුවන්නකු වූ බුදුරජාණන් වහන්සේ මාගේ පුණ්‍ය සම්පත්තිය නිපදවන සේක් **වසී සතසහස්සෙහි** ක්ෂීණාශ්‍රවයන් සියදහස් ගණනක් සමග ගංසැඩපහර තරණය කිරීමට එහි වැඩිසේක් යන සම්බන්ධයි. **බහූනාවා සමානෙත්ථා** යනු සපැමිණි ඒ සම්බුදුරජාණන් වහන්සේ දැක සුසංඛතං වඩුවන් විසින් මනාසේ **සංඛතං** කරනලද, නිෂ්පාදනය කරන ලද බොහෝ නැව් ගෙන්වා නැව් දෙක දෙක එකතැන්කොට ඒ නැවෙහි මත්තෙහි මඩුලුවහලක් **කත්වා** නංවා ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයකු වූ පදුමුත්තර සම්බුදුරජාණන් වහන්සේ පටිමානිං පිදුවෙමි යන අර්ථයි. **ආගතත්වා න ච සම්බුදෙධා** යනු මෙසේ එකට බැඳි නැවින් එහි වැඩමවා ගෙනවුත් තෂ්ණවනාවකං උතුම් නැවට නැඟුණු සේක යනු සම්බන්ධයි. වාරිමජෙඣධීතෝ සත්ථා යනු නැවට නැඟුණු ශාස්තෘන් වහන්සේ ගංදිය මැද සිටිසේක්ම මෙම සොම්නස් සහිත ගාථා **අභාසථ** දෙසූ සේක යන සම්බන්ධයි. **යෝ සෝ තාරෙසි සම්බුද්ධං** තවද ඒ නාවිකයා ගංදිය පහරින් සම්බුදුරජාණන් වහන්සේ තරණය කරවූයේය. **සංසංවාපි අනාසවං** සම්බුදුරජාණන් වහන්සේ තරණය කරවූයේ පමණක් නොව **අනාසවං** නිකෙලෙස් සංසයාද තරණය කරවීය යන අර්ථයි. **තෙන චිත්තපසාදෙන** යනු ඒ නැව පදවන කල්හි උපන් සොම්නස් සහගත සිත් පැහැදීමෙන් දේවලෝකෙ කාමස්වර්ග සයෙහි **රමිස්සති** දිව්‍ය සම්පත් අනුභව කරන්නේය යන අර්ථයි. **නිබ්බත්තිස්සති තෙ ව්‍යමහං** දෙව්ලොව උපන් **තෙ** ඔබගේ **ව්‍යමිහං** විමානය සුතං මනාසේ නිපන්නේය. **නාවා සණ්ඨිතං** නැවක හැඩයට **නිබ්බත්තිස්සති** යනු පහළ වන්නේය යන අර්ථයි.

ආකාසෙ පුප්ඵජ්දනං යනු නැව මුදුනෙහි මණ්ඩපයක් කළ කර්මයෙහි ගලායාමෙන් සැමකල්හි ගියගිය තැන ආකාසයෙහි මල් සෙවනක් දරන්නේයයි සම්බන්ධයි. **අධ්‍යපණ්ණාස කපපමහි** යනු මේ පින්කරන කල්හි පටන් අටපනස් කපක් ඉක්මවා නමින් **තාරණෝ නාම චක්කවත්තී ඛත්තියෝ චාතුරන්තෝ** ද්වීප සතරෙහි අධිපති **විජිතාවී** ජයග්‍රාහී වන්නේයයි සම්බන්ධයි. සෙසු ගාථා නොගැඹුරු අරුත් ඇත්තේමය. **රේවතෝ නාම නාමෙන** යනු රෙහෙණ නැකතින් උපන් බැවින් රෙවත යන නම ලැබුයේ. බ්‍රහ්මබන්ධු බ්‍රහ්මයාගේ පුත්‍ර භාවයට පත්වූයේ වන්නේ යයි බ්‍රාහ්මණ කුලයෙහි උපදින්නේය යන අර්ථයි.

නිබ්බායස්සති නාසවෝ යනු නිකෙලෙස්ව ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන් පාන්නේය. **විරියං** මෙ **ධුරධොරයහං** යනු මෙසේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරනු ලැබූ මම කෙමෙන් පාරමිතාවන්ගේ කෙළවරට පැමිණ මෙ මාගේ **විරියං** අතිශයින් ලිහිල් වීර්යය **ධුරධොරයහං** වියගස උසුලන්නක්, ධුරයට ආධාරයක් යෝගයන්ගෙන් **ඛෙමස්ස** බියරහිත නිර්වාණයට **අච්චාහ** වාහනයක් විය යන අර්ථයි. **ධාරෙමි අනතිමං දෙහං** දැන් මම සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ සාසනයෙහි අවසාන ශරීරය දරා සිටිමි යන සම්බන්ධයි. ඔහු අල්පභෝග ඇති, තමා උපන්ගමට ගොස් චාලා උපචාලා සිසුපචාලා යන සහෝදරියන් තිදෙනාගේ පුත්‍රයන් වන චාල උපචාල සිසුපචාල යන බෑණාවරුන් තිදෙන ගෙන්වා පැවිදිකොට කර්මස්ථානයන්හි නියුක්ත කළේය. ඔව්හු කර්මස්ථානයෙහි යෙදී වාසය කළහ. එසමයෙහි තෙරුන් වහන්සේට කිසියම් ආබාධයක් උපන්නේය. මේ අසා සාරිපුත්ත තෙරුන් වහන්සේ රෙවතගේ ගිලන්බව විමසීමද අධිගම විමසීමද කරන්නෙමැයි ඔහු වෙත වැඩි සේක. රෙවත තෙරුන් වහන්සේ, ධර්ම සේනාපතීන් වහන්සේ දුරදීම වැඩමවනු දැක එම සාමණේරවරුන්ට සිහිය ඉපදවීම් වශයෙන් අවවාද දෙන සේක් **චාල** යනුවෙන් ගාථාවක් වදාළ සේක. එහි **චාලෙ උපචාලෙ සිසූපචාලෙ** යනු ඔවුන්ට ඇමතීමයි. චාලා උපචාලා සිසූපචාලා යනු උපන් ලිංග වශයෙන් ලදනම් ඇති දරුවෝ තිදෙන පැවිදිවිද එසේ ව්‍යවහාර කරනු ලබති. චාලී උපචාලී සිසූපචාලී යනුවෙන් ඔවුන්ගේ නම් වූහයි කියති. ඒ අර්ථය සඳහා **චාලෙ** ආදි වශයෙන් ආමන්ත්‍රණ කරන ලදී. එය දක්වන්නේ සුවචභාවයෙන් තමා වාසය කළයුත්තේ යයි කියා එහිදී කාරණ කී සේක. **ආගතො වො චාලංචිය වෙධි** යන ආදිය. **පතිසසතිකා** යනු සුවච බවයි. **බො** යනු ආධාරණයෙහි.

ආගතො යනු පැමිණියේය. වො යනු ඔබගේ. වාලංවියවේධි ඉලක්කයට විදින දුනුවායා මෙන්. මෙය වනාහි මෙහි කෙටි අරුතයි. තීක්ෂ්ණ ජවන නිබ්බිත ප්‍රඥාව ඇති බැවින් ඉලක්කයට විදින දුනුවායකුගේ ස්වරූපය ඇති ශාස්තෘන් වහන්සේ වැනි තොපගේ මයිලණු තෙරුන්වහන්සේ පැමිණි සේක. ඒ නිසා ශ්‍රමණ සංඥාව ඇතිකරගෙන සිහිනුවණ ඇතිවම වාසය කරවු. අවබෝධ කරගත් විහරණයෙහි අප්‍රමාදී වවු. ඒ අසා ඒ සාමණේරවරු ධර්මසේනාපතීන් වහන්සේට පෙරගමන් ආදී වත්කොට මයිලණු තෙරුන් දෙදෙනා වහන්සේගේ පිළිසඳර වේලාවෙහි නුදුරෙහි සමවැද හුන්නාහුය. ධර්මසේනාපතීන් වහන්සේ රෙවත තෙරුන් සමග පිළිසඳර කථාකොට හුනස්නෙන් නැගී ඒ සාමණේරවරුන් වෙත එළඹි සේක. ඔව්හු ඒ අයුරින් කාලපරිච්ඡේදය තුළ කළ බැවින් තෙරුන්වහන්සේ වඩනා කල්හි නැගිට වැඳ සිටියාහුය. තෙරුන්වහන්සේ කිනම් විහාරයකින් වසන්නාහුදැයි විමසනු ලැබුවාහු ඔවුන් මෙයින්ය මෙයින් යැයි කියූ කල්හි දරුවෝද එසේයයි සිතනසේක් මාගේ සහෝදරයා සත්‍යවාදීය. ධර්මයට අනුව හැසිරේයයි තෙරුන්වහන්සේට ප්‍රශංසා කර ආපසු වැඩි සේක. මෙහි ශේෂය නොගැඹුරු අරුත් ඇත්තේමැයි.

ඛදිරවනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.10

ආරාමදඩාරා නිකඛමම යනාදීන් ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු පෙරබුදුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තන්හි නිර්වාණයට හේතුවූ පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර ශාස්තෘන් වහන්සේගේ වෙනත් මවකගෙන් උපන් සහෝදරයෙක්ව උපන්නේය. ඔහුට සුමනයයි නමක් විය. ඔහුගේ පියා වනාහි නන්දරාජා නම් විය. ඔහු තමාගේ පුත්‍රයා වූ සුමන කුමාරයා වැඩිවිය පත්වූ විට හංසවතී නගරයට යොදුන් දෙදහසක් ඈත භෝග නගරය දුන්නේය. ඔහු ඉඳහිට පැමිණ ශාස්තෘන් වහන්සේද පියාද බලයි. එකල්හි රජතෙමේ ශාස්තෘන් වහන්සේටද සිය දහසක් පමණ භික්ෂූන්ට ද තමාම මනාසේ උපස්ථාන කරයි. අන් අයට උපස්ථාන කිරීමට නොදෙයි. එසමයෙහි ප්‍රත්‍යන්තය

කිපුණේ වෙයි. කුමාරයා එම ප්‍රත්‍යන්තය කුපිත වූ බව රජුට නොදන්වා තමාම එය සංසිඳවූයේය. ඒ අසා රජතෙමේ සතුටු සිතැත්තේ දරුව, ඔබට වරයක් දෙමි. ගනුවයි කීය. කුමාරයා ශාස්තෘන් වහන්සේටද භික්ෂු සංඝයාටද නෙමසක් උපස්ථාන කරමින් ජීවිතය නොවඳ කරගන්ට කැමැත්තෙමියි කීය. නොහැකියි. අනිකක් කියවයි කීය. දේව ක්ෂත්‍රියයන්ගේ කථා දෙකක් නම් නැත. මෙය මට දෙන්න, අනිකකින් වැඩක් නැතැයි කීය. යම්හෙයකින් ශාස්තෘන් වහන්සේ අනුදැන වදාරන සේක්ද දුන්නානම් වෙයි. ඔහු ශාස්තෘන් වහන්සේගේ සිත දැනගන්නෙමියි විහාරයට ගියේය.

එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියට පිවිසුණාහු වෙති. ඔහු භික්ෂූන් වෙත එළඹ ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස ආවෙමි. මට පෙන්වනු මැනවි. භික්ෂූන් වහන්සේද සුමන නම් තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ උපස්ථායකයාය. උන්වහන්සේ වෙත යවයි කීහ. ඔහු තෙරුන්වහන්සේ වෙත ගොස් ස්වාමීනි, මට ශාස්තෘන් වහන්සේ පෙන්වනු මැනවැයි කීය. ඉක්බිති තෙරුන් වහන්සේ ඔහු බලා සිටියදීම පොළොවෙහි කිමිද භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ස්වාමීනි, රාජපුත්‍රයා ඔබවහන්සේ දකිනු පිණිස පැමිණියේයයි කීහ. භික්ෂුව, එසේනම් අසුනක් පනවන්න. තෙරුන්වහන්සේද බුද්ධාසනය ගෙන ගඳකිළිය ඇතුළතදීම කිමිද ඔහු බලා සිටියදී පිරිවෙන පිටතදී මතුවී ගඳකිළි පිරිවෙනෙහි අසුන පැනවූහ. කුමාරයා මෙය දැක මේ භික්ෂූන් වහන්සේ මහත්වූ කෙනෙකැයි සිතක් ඇතිකර ගත්තේය. භාග්‍යවතුන් වහන්සේද ගඳකිළියෙන් නික්ම පැනවූ අසුනෙහි වැඩහුන් සේක. රාජකුමාරයා ශාස්තෘන් වහන්සේ වැඳ පිළිසඳර කථාකොට ස්වාමීනි, මේ තෙරුන්වහන්සේ ශාසනයෙහි හිතැත්තෙකැයි හඟිමි. එසේය කුමාරය, හිතවතෙකි.

ස්වාමීනි මුන්වහන්සේ කුමක්කොට වල්ලභ වූ සේක්ද? දානාදී වූ පින්කොට. මමත් අනාගතයෙහි බුද්ධ ශාසනයෙහි මේ තෙරුන් වහන්සේ මෙන් වන්නට කැමැත්තෙමි. හෙතෙමේ බුදුපාමොක් සංඝයා වහන්සේට සත්දවසක් කඳවුරෙහි දන් දී සත්වැනි දිනයෙහි ස්වාමීනි මා විසින් පියාගෙන් ඔබවහන්සේට තුන්මසක් පිළිදැගුම් කිරීමේ වරය ලැබුවෙමි. තුන්මසක් මාගේ වස්වැසුම ඉවසා වදාරනු මැනවැයි කියා ශාස්තෘන් වහන්සේ ඉවසා වදාළ බව දැන පිරිවර සහිත භාග්‍යවතුන් වහන්සේ ගෙන යොදුනෙක්හි යොදුනෙක්හි ශාස්තෘන් වහන්සේටද භික්ෂු සංඝයාටද වැසීමට සුදුසු විහාර කරවා ඒ ඒ තන්හි වස්වන්නේ තමා වසන තැන

සමීපයෙහි සියදහසෙකින් මිලට ගත් සෝභන නමැති උයනෙහි සියදහසකින් කරවන ලද විහාරයට පිවිසවා

සත සහසෙසන මෙ කීතං - සතසහසෙසන කාරිතං
සොභනං නාම උය්‍යානං පටිගණහ මහා මුනී

සිය දහසෙකින් ගෙන - සිය දහසෙකින් කරවූ
සෝබන නමැති මෙඋයන - පිළිගනු මැනවි මහමුනි

වස් එළඹෙන දිනයෙහි ශාස්තෘන් වහන්සේට මහදන් පවත්වා මේ ආකාරයෙන් දන් දෙනු මැනවැයි අඹුදරුවන් ඇමතීන් දන් දීමෙහිද කාර්ය ඉටුකිරීමෙහිද නියුක්ත කරවා තමා සුමන තෙරුන්වහන්සේ වසන තැන සමීපයෙහිම වාසය කරන්නේ මෙසේ තමාගේ වාසස්ථානයෙහි ශාස්තෘන් වහන්සේට තෙමසක් එවැන්න් කළේය. පවාරණය ළංවූ කල්හි ගමට පිවිස සත්දවසක් මහදන් පවත්වා සත්වැනි දිනයෙහි ශාස්තෘන් වහන්සේගේ හා භික්ෂු සංඝයාගේද පාමුල තුන්සිවුරු තබා වැඳ ස්වාමීනි, මා විසින් කඳවුරෙහි පටන් යම් පුණ්‍යකර්මයක් කරන ලද්දේද එය ස්වර්ග සම්පත්ති ආදිය සඳහා කරන ලදී. ඉක්බිති මමද සුමන තෙරුන්වහන්සේ මෙන් අනාගතයෙහි එක් බුදුවරයකුට උපස්ථායකයෙක්ද හිතවතෙක්ද වන්නේනම් මැනවැයි ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ අනන්තරතාව දැක විවරණ දී වැඩසේක. ඔහු මේ බුද්ධෝත්පාද කාලයෙහි වසර සියදහසක් පින්කම් කොට ඉන් පසුවද භවයෙහි ඒ ඒ තැන උදාර පින්කම් රැස්කොට දෙවිමිනිසුන් අතර, සැරිසරන්නේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ දැනමුතු බවට පත්ව පිඬුසිඟා වඩනා එක් තෙර කෙනෙකුන්ගේ පාත්‍රය ගනු පිණිස උතුරුසළුව පූජා කළේය. නැවත ස්වර්ගයෙහි ඉපිද එයින් චුතව බරණැස රජු වී පසේබුදුවරුන් අටනමක් දැක උන්වහන්සේලා වළඳවා තමාගේ මඟුල් උයනෙහි පන්සල් අටක් කරවා උන්වහන්සේලාට සැතපෙනු පිණිස සියල්ල රුවන්මුවා ආසන අටක් ද මැණික් ආධාරක ද පිළියෙලකොට දී වසර සියදහසක් භවයෙහි තැන තැන පින් රැස් කරන්නේ අපගේ බෝධිසත්වයන් වහන්සේ සමග තුසිත පුරයෙහි ඉපිද එයින් චුතව අමිතෝදන ශාක්‍යයාගේ ගෙහි ඉපිද සියලු නෑයින් සතුටු කරමින් උපන්නේ යයි ආනන්ද යනුවෙන්ම නමක් ලැබිය. ඔහු පිළිවෙළින් වැඩිවියට පත්වූයේ කරන ලද අභිනිෂ්ක්‍රමණය ඇත්තේ සම්මා සම්බෝධියට පත්ව පවත්වන ලද උතුම් ධර්මචක්‍ර ඇත්තේ පළමුව කපිලවස්තු නුවරට ගොස් එයින් භාග්‍යවතුන් වහන්සේ නික්මෙන කල්හි උන්වහන්සේගේ පිරිවර සඳහා පැවිදිවීමට නික්මයන

භද්දිය ආදීන් සමග නික්ම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදිව ආයුෂ්මත් පුණ්ණ මන්තාණිපුත්ත තෙරුන් හමුවෙහි දහම්කතා අසා සෝවාන් ඵලයෙහි පිහිටියේය.

එසමයෙහි බුදුව පළමු විසිවසක් කඩින්කඩ උපස්ථායකයෝ සිටියහ. එක් දවසක් නාගසමාල පාසිවුරු ගෙන හැසිරෙයි. එක්දවසක් නාගිතය. එක්දවසක් උපවාණය. එක්දවසක් සුනකඛතතය. එක් දවසක් චුන්ද සාමණේරය. එක් දවසක් සාගතය. එක් දවසක් මෙසියය. ඔවුහු බෙහෙවින් ශාස්තෘන් වහන්සේගේ සිත සතුටු නොකළහ. ඉක්බිති එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ ගඳකිළි පිරිවෙන්හි පනවන ලද උතුම් බුද්ධාසනයෙහි වැඩහුන් සේක් භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, මම දැන් මහලුයි. එක්තරා භික්ෂු කෙනෙක් මේ මගින් යමියි කියූවිට අන් මගකින් යති. එක්තරා භික්ෂු කෙනෙක් මාගේ පාසිවුරු බිම තබති. මා හට නිබඳව උපස්ථාන කරන්නකු දැන ගනුව. ඒ අසා භික්ෂූන්ට ධර්ම සංවේගය පහළ විය. ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ ස්වාමීනි, මම ඔබවහන්සේට උපස්ථාන කරන්නෙමියි කී සේක. භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ සේක. මේ උපායයෙන් මහා මොග්ගල්ලාන ආදී වූ මහා ශ්‍රාවකයන් වහන්සේ මම උවටැන් කරන්නෙමි. මම උවටැන් කරන්නෙමියි නැගී සිටියාහුය. ආයුෂ්මත් ආනන්ද තෙරුන් හැර උන්වහන්සේලාද භාග්‍යවතුන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක. ආනන්ද මුවින් නොබැණ හුන්නේය. ඉක්බිති භික්ෂූහු මෙසේ කීහ. ආයුෂ්මතුනි, ඔබද ශාස්තෘන් වහන්සේගේ උපස්ථායකස්ථානය ඉල්ලන්න. ඉල්ලා ලද උපස්ථානය කෙසේ වේද? කැමැත්තේනම් ශාස්තෘන් වහන්සේ තුමූම කියන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූනි, අනුන් විසින් ආනන්ද නොපෙළඹිය යුතුයි. තමා ම දැන මාහට උපස්ථානය කරන්නේ යයි කී සේක. ඉක්බිති භික්ෂූහු ආනන්ද ආයුෂ්මතුනි, නැගිටින්න. ශාස්තෘන් වහන්සේගේ උපස්ථායකස්ථානය ඉල්ලවයි කීහ. තෙරුන් වහන්සේ නැගිට, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ තමන්ට ලැබෙන ප්‍රණීත වූ සිවුරු මට නොදෙන්නේ නම්, ප්‍රණීත පිණ්ඩපාතය නොදෙන්නේ නම්, එක් ගඳකිළියෙහිම වසන්නට නොදෙන්නේ නම්, ආරාධනයක් ලැබ නොයන්නේද මේ අයුරින් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නෙමියි කීහ. මෙපමණක් ලබන්නකුට ශාස්තෘන් වහන්සේගේ උපස්ථානය කවර බරක්ද යන උපවාදයෙන් මිදීම පිණිම මේ ප්‍රතික්ෂේප සතර කෙළෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මා ලැබූ ආරාධනයන්ට වඩින්නේ නම්, මම අන්‍ය දේශයන්ගෙන් පැමිණෙන්නවුන් ඔබ වහන්සේට

දැක්වීමට ලබම් නම්, යම්කලෙක මට සැකයක් උපදිනම් එකෙණෙහි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ විමසීමට ලබම් නම්, භාග්‍යවතුන් වහන්සේ මා අනභිමුඛයෙහි දේශනා කරන ලද ධර්මය නැවත මාහට පවසන්නේ නම් මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නෙමි. මෙපමණක්වත් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි අනුග්‍රහයක් නොලැබෙයයි උපවාදයෙන් මිදීම පිණිසද, ධර්ම භාණ්ඩාගාරික භාවය පරිපූර්ණ කිරීම පිණිස මේ ඉල්ලීම් සතර කෙළෙමි. මේ අටවර ලබා නිබඳ උපස්ථායක විය. එම තනතුර සඳහාම කල්ප සියදහසක් පුරනලද පාරමිතාවන්ගේ ඵලය පැමිණියේය. උන්වහන්සේ උපස්ථායක තනතුර ලැබූ දිනයෙහි පටන් දසබලධාරී බුදුරජාණන් වහන්සේට දෙවැදෑරුම් ජලයෙන් තෙවැදෑරුම් දැහැටියෙන්, පා මිරිකීමෙන්, පිට මිරිකීමෙන්, ගඳකිළි මිදුල හැමදීමෙන් යනාදි කාර්යයෙන් උවටැන් කරන්නේ මෙනම් වේලාවෙහි ශාස්තෘන් වහන්සේට මෙය ලැබීම වටී, මෙනම් දෙයක් කරන්ට වටී යයි ශාස්තෘන් වහන්සේ කැඳවන විට පිළිවදන් දෙනු පිණිසත් මැළිබව නැති කිරීම පිණිසත්, දවල් කාලයෙහි සමීපයෙහි හැසිරෙති. රාත්‍රි කාලයෙහි දඬුවැට පහනක් ගෙන ගඳකිළි මිදුලෙහි නවවරක් ඒ වටා යති.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ ජේතවනාරාමයෙහි ආර්ය සංඝයා මැද වැඩහුන් සේක් නොයෙක් ආකාරයෙන් ප්‍රශංසාකොට බහුශ්‍රැත වූ, සිහි ඇත්තා වූ, පාඩම් කර ගැනීමේ ශක්තිය ඇත්තා වූ උත්සාහවන්ත වූ උපස්ථායක භික්ෂූන් අතරෙහි අග්‍රස්ථානයෙහි තැබූ සේක. මෙසේ ශාස්තෘන් වහන්සේ විසින් පස්තැනකදී අග්‍රස්ථානයෙහි තබන ලදුයේ සතර අද්භූත ධර්මයන්ගෙන් යුතු වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම කෝෂ්ඨාගාරය ආරක්ෂා කරන්නා වූ මේ මහා තෙරුන් වහන්සේ, සේඛ සමානව ශාස්තෘන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි යට කියූ ආකාරයෙන් භික්ෂූන් විසින් උනන්දු කරවනු ලැබූයේ දේවතාවුන් විසින්ද දැනුවත් කරන ලද්දේ හෙටම ධර්ම සංගීතිය කළයුතුය. කළයුතු දෑ ඇති සේඛ පුද්ගලයෙක් වූ මට අසේඛ වූ රහතන් සමග ධර්මය සංගායනා කිරීමට සඟ සමුළුවට යාම නුසුදුසු යයි හටගත් උත්සාහ ඇත්තේ විදර්ශනාවෙහි පිහිටා බොහෝ රැයක් විදර්ශනාව සඳහා කටයුතු කරන්නේ ඇවිදීමෙහි වීර්ය සමථය නොලැබ එයින් විහාරයට පිවිස ඇඳෙහි හිඳ නිදනු කැමැත්තේ සිරුර නැඹුරු කළ සේක. හිස කොට්ටයට ළං නොවීමත් පාද පොළොවින් මිදීමත් අතරෙහි උපාදානාදී ආශ්‍රවයන්ගෙන් සිත මිදිණ. ෂට් අභිඥාලාභී වූ සේක. මෙසේ ෂට් අභිඥා ආදී වූ ගුණයන්ගෙන් සෑදුණාහු උපස්ථායක ආදී ගුණයන්ගෙන් අගතැන්පත් වූවාහු තමාගේ

පූර්ව කර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය දක්වන්නාහු **ආරාමදඩාරා නිකඛමම** ආදිය කී සේක. එහි **ආරාමදඩාරා** යනු සියලු සතුන්ට දහම් දෙසනු පිණිස විහාර දොරින් නික්ම බිහිදොර අඹයස කරන ලද මණ්ඩපයේ මැද පැනවූ උතුම් බුද්ධාසනයෙහි හුන් සේක් පදුමුත්තර නම් **මහාමුනි** සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ **වස්සසතෙතා අමතං** වුටඨි යනු ධර්මදේශනා නමැති මහා අමෘත ධාරාවන් සහිත දහම් වැසි වස්වන්නේ **නිබ්බාපෙසි** මහාජනං යනු මහජනයාගේ චිත්ත සන්තාන ගතවූ කෙලෙස් ගිනි **නිබ්බාපෙසි** නිවූ සේක. මහජනයාට නිර්වාණ නමැති අමාව පෙවීමෙන් ශාන්ත ශීත බවට පැමිණවූ සේක යන අර්ථයි. **සතසහස්සා තෙ ධීරා** යනු පරිවාර සම්පත්තිය දක්වන්නාහු කී සේක. ෂට් අභිඥාවන්ගෙන් ඉද්ධිවිධ ආදී ඥාන කොටියාසයන්ගෙන් යුත් නොයෙක් සියදහස් සක්වල සැණෙන් යාමට සමත් වූ සෘද්ධීන්ගෙන් යුතු බැවින් මහා සෘද්ධි ඇති **තෙධීරා** සියදහසක් රහතන්වහන්සේ **ඡායාව අනපායිනී** යනු කොතැනකදීවත් වෙන්ව නොයන සෙවනැල්ල මෙන් **තං සම්බුද්ධං** ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ **පරිවාරෙනති** පිරිවරා ධර්මය අසති යන අර්ථයි. **හත්ථිකඛන්ධගතො ආසී** යනු එකල්හි භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන කල්හි මම ඇතුපිට හුන්නෙම් **ආසිං** වීමි යන අර්ථයි. **සෙසචඡත්තං චරුනතමං** යනු පුටුවෙහි තබා උතුම් වූ සේසත මාගේ හිසින් දරන්නේ ඇතුපිට හුන්නේ යන සම්බන්ධයි. **සුචාරුරූපං දිසවාන** යනු සුන්දර වූ **චාරුං** මනහර රූපයෙන් යුත් ධර්මය දෙසන සම්බුදුන් දැක මෙ මගේ. **චිතනි** සතුටු සොම්නස **උපපජජං** උපදී යන අර්ථයි. **ඔරුයහ හත්ථිකඛන්ධමහා** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ හිඳිනු දැක ඇතුපිටින් **ඔරුය්හ** බැස **නරාසභං** උත්තම පුරුෂයා **උපගඤඡි** සමීපයට ගියේය යන අර්ථයි. **රතනමය ඡත්තං** මෙ යනු රුවනින් විසිතුරු මෙ මාගේ **ඡත්තං** ඡත්‍රය ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේට ඉහළින් දැරුවෙමියි **සම්බන්ධයි. මමසංකප්ප මඤඤාය** යනු මාගේ පැහැදීමෙන් උපන් සංකල්පය දැන සෘෂීන් අතර මහත්වූ ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ. **තං කථං ඨපයිත්වාන** යනු ඒ තමා විසින් දෙසනු ලබන ධර්මකථාව නවතා මට විවරණ දෙනු පිණිස **ඉමාගාථා අභාසි** යනු මේ ගාථා දේශනා කළ සේක යන සම්බන්ධයි. ඒ කෙසේද **යොසො** යනාදිය වදාළ සේක. ස්වර්ණාලංකාරයෙන් අලංකාර කරන ලද ඡත්‍රය යම් කෙනෙක් මට ඉහළින් දැරුවේද ඒ රාජකුමාරයා යන සම්බන්ධයි. **තමහං කිත්තයසසාමි** යනු ඒ රාජකුමාරයා මම **කිත්තයිසසාමි** ප්‍රකට කරන්නෙමි. **සුණාථ මෙ භාසතො** යනු කියන්නා වූ මාගේ වචනය අසවු. කන්යොමා

සිහිකරවූ යන අර්ථයි. **ඉතො ගන්ත්වා අයං පොසො** යනු මේ රාජකුමාරයා **ඉතො** මිනිස් ලොවින් මිය පරලොව ගියේ තුසිත දෙව්ලොවට ගොස් වාසය කරන්නේය, එහි වසන්නේය, එහි දෙවගනන් පෙරටු කොටගෙන පිරිවරන ලද්දේ තුසිත භවනයෙහි සැප සම්පත් අනුභව කරන්නේය යන සම්බන්ධයි. **චතුනතිංසකඛත්තුං** යනු තුසිත භවනයෙන් චුතව තව්තිසා භවනයෙහි උපන්නේ තිස්හතර වසක් දේවේන්ද්‍රව දෙව්රජය කරන්නේය යන සම්බන්ධයයි. **බලාධිපො අඨසතං** යනු තව්තිසා භවනයෙන් චුතවූයේ මිනිස්ලොව උපන්නේ **බලාධිපො** සිව්රඟ සෙනගට **අධිපො** ප්‍රධාන වූයේ අටසියයක් උත්පත්තිවලදී ප්‍රදේශ රජව වසුධං නොයෙක් රුවන් දරන **ආවසිස්සති** පොළොවෙහි වාසය කරන්නේය යන අර්ථයි. **අඨපඤ්ඤා සකඛත්තුං** යනු සියලු දඹදිව් තලයෙහි **විපුලං** ගිණිය නොහැකි **දෙසරජ්ජං කාරයසති සක්‍යානං කුලකෙතුසස** යනු ශාක්‍ය රජවරුන්ගේ කුලයට කොඩියක් වූ බුදුරජාණන් වහන්සේගේ ඥාතියෙක් වන්නේය යන අර්ථයි. **ආතාපී** යනු වීර්යවන්ත, නෙපක්ක සංඛ්‍යාත වූ ප්‍රඥාවෙන් යුතු වූයේ. **බාහුසච්චෙපසු** බහුශ්‍රැත භාවයන්හි, පිටකත්‍රය දැරීම්හි, **කොවිදො දක්ඛයා.** **නිවාතවුත්ති** අනුන් විසින් හසුරුවනු ලබන්නේ. **අථද්ධා** කායාඩම්බර ආදී තදබවින් විරහිත වූයේ. **සබ්බපාඨී** සියලු ත්‍රිපිටකය දරන්නෙක් වන්නේය යන සම්බන්ධයි. **පධාන පහිතෙතාසො** යනු ඒ ආනන්ද තෙරුන් වහන්සේ වීර්ය කිරීම සඳහා මෙහෙයවුණු සිත් ඇත්තාහු සෝවාන් මගින් ප්‍රහාණය කළයුතු. කෙළෙසුන් නැසූ බැවින් **උපසනෙතා** ශාන්ත වූ කායචිත්ත ඇත්තාහු **සනති** **ආරඤ්ඤකා** යනු ආරණ්‍යයෙහි වවෝ මහ වනයෙහි උපන්නෝ. **සට්ඨිහායනානි** යනු සැටවස් කල්හි ගෙවියන බල. **තිවසාභිඤා** යනු ඇස්කන් කෙස් සංඛ්‍යාත වූ තුන් තන්හි බිඳුණු මද ඇත්තහු, **මාතංගා** යනු මාතංග ඇත් කුලයෙහි උපන්නෝ යනුයි. **ඊසා දනතා** යනු කෙසෙල් කඳන් වැනි දත් ඇත්තාහු, යම්සේ **උරුළහවා** රාජවාහන වූ කුඤ්ජර සංඛ්‍යාත වූ නාගා ඇත් රජවරු **සනති** දක්නට ලැබෙත්ද යන සම්බන්ධයි. එසේම සියදහස් ගණන් ක්ෂීණාශ්‍රව සංඛ්‍යාත වූ පණ්ඩිත වූ මහාඍද්ධි ඇති රහතන් වහන්සේ නැමැති ඇත්තු ඇත්ද ඒ සියලුදෙන බියෙන් බියපත් වූවෝ තම ස්වරූපයෙන් සිටීමට අසමත් වූවෝය යන අර්ථයි. සෙස්ස කියන ලද ආකාරයෙන් නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ආනන්ද තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

මෙපමණකින් පළමුවන බුද්ධවර්ග වර්ණනාව නිමියේය.

3.11

නිබ්බුතෙ ලොකනාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් සීහාසන දායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ හවයෙහි තැන තැන පින් රැස් කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විභව සම්පත් ඇති සැදැහැවත් එක් කුලයෙක ඉපිද භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳිනා කල්හි දෙව්ලොව වැස භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි උපන් බැවින් දැනුමැති බවට පත්වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික චෛත්‍යය දැක අහෝ මට අලාභයෙකි. භාග්‍යවතුන් වහන්සේ ජීවත්වන කාලයක් නොපැමිණියේ යයි සිතා චෛත්‍යය කෙරෙහි සිත පහදවා සොම්නස් හටගත්තේ සියල්ල රන්මුවා වූ දෙවියන් නිමවූ දෙයක් බඳු ධර්මාසනයෙහි සිහසුනක් කරවා දිවමන් බුදුරදුන්ට මෙන් පූජා කළේය. එයට උඩින් දිවවිමනක් බඳුව ගෙයක් කරවීය. පාතබන පාපුටුවක්ද කරවීය. එසේ දිවි ඇති තෙක් පහන් දුම් මල් සුවඳ ආදියෙන් නානාවිධ පූජාකොට එයින් චුතව දෙව්ලොව උපන්නේ කාමස්වර්ග සයෙහි නැවත නැවත දෙව් සැපත් අනුභව කොට ගණන් නැති ප්‍රදේශ රාජ සම්පත්ද අනුභව කොට කාශ්‍යප බුදුරදුන්ගේ සසුනෙහි පැවිදිව මහණදම් කොට ඒ අතරෙහි දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් විභව සම්පත් ඇති කුලයෙක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා ලැබූ සැදැහැ ඇත්තේ පැවිදිව ලැබූ උපසම්පදාව ඇත්තේ කමටහන් ගෙන උත්සාහ කරන්නේ නොබෝ කලකින්ම රහත්බවට පත්විය.

මෙසේ පැමිණි අරහත්ඵල ඇත්තේ තමාගේ පෙර කර්මය සිහිකොට සොම්නස් උපදවා පෙර අපදානය ප්‍රකාශ කරන්නේ **නිබ්බුතෙ ලොකනාථම්හි** යනාදිය කීය. එහි ලෝකයට නාථ වූයේ ප්‍රධාන වූයේනුයි **ලොකනාථො.** තුන්ලොවට ස්වාමී යන අර්ථයි. ලෝකනාථ වූ සිද්ධාර්ථ බුදුරදුන් පිරිනිවි කල්හි යන සම්බන්ධයි. **විභාරිතෙ පාවචනෙ** යනු බුදුදහම නමැති තුන්පිටකයෙහි **විභාරිතෙ** පිහිටි කල්හි ප්‍රකට වූ කල්හි යන අර්ථයි. **බාහුජඤ්ඤම්හි සාසනෙ** යනු ශික්ෂාත්‍රය සංගෘහීත වූ බුද්ධ ශාසනයෙහි නොයෙක් සියදහස් ගණන් ක්ෂීණාශ්‍රව සංඛ්‍යාත වූ බොහෝ ජනයන් විසින් දැනගත් අවබෝධ කරගත් යන අර්ථයි. **පසනනචිත්තො සුමනො** යනු එදා මම බුදුන් දිවමන් කල්හි **අසම්පතෙත** නොපැමිණ,

පිරිනිවන්පෑ කල්හි දෙව්ලොවින් චුතව මිනිස්ලොව උපන්නේ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරිකධාතු චෛත්‍යය දැක පහන් සිත් ඇත්තේ ශ්‍රද්ධා සම්ප්‍රයුක්ත මනසින් යුක්ත වූයේ **සුමනො** සොඳුරු මනසින් යුතුව අහෝ මාගේ ආගමනය මනාගමනකැයි හටගත් ප්‍රසාද බහුමාන ඇත්තේ මා විසින් නිවන අවබෝධ කරනු පිණිස එක් පිනක් කිරීමට වටී යයි සිතා භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍යය සමීපයෙහි භාග්‍යවතුන් වහන්සේ උදෙසා **හිරඤ්ඤ** රන්රුවන් ආදියෙන් අලංකාරකොට සිහසුනක් කළේය. එහි හුන්නහුට පාතබනු පිණිස පාපුටුවක්ද කරවීමි. සිහසුන නොතෙමෙනු පිණිස එයට උඩින් ගෙයක් ද කරවීමි. එහෙයින් කියන ලදී. **සීහාසන මකාසහං -පෙ- ඝරංනෂ්ට අකාසහං** යනුවෙන් **තෙන චිත්තපසාදෙන** යනු දිවමන් භාග්‍යවතුන් වහන්සේගේ වැනි සිංහාසනයක් මා විසින් කරන ලදී. ඒ චිත්ත ප්‍රසාදයෙන් **තුසිතං උපජ්ජහං** යනු තුසිත භවනයෙහි උපන්නෙමි යන අර්ථයි. **ආයාමෙන චතුබ්බිසා** යනු එහි දෙවියකුව උපන් මාගේ **සුකතං** පිනින් උපන්, පහළ වූ විමානය **ආයාමෙන** උසින් යොදුන් විසිහතරකි. **විත්ථාරෙන** පුළුලින් යොදුන් දහහතරකි. **තාවදෙව** උපන් කෙණෙහිම **ආසි** විය යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැකිමය. **චතුනවුතෙ ඉතො කප්පෙ** යනු මෙයින් අනූහතරවැනි කල්පයෙහි **යංකම්මං අකරි** කළේය. තදා එතැන් පටන් කරන ලද පින් පලයෙන් **කිසිදු දුගතිං නාභිජානාමි** අනුභව කළ කිසිදු දුගතියක් නැත යන අර්ථයි. **තෙ සත්තති ඉතො කප්පෙ** යනු මේ කල්පයෙන් සැත්තෑවැනි කල්පයෙහි **ඉන්‍දනාමා තයො ජනා** යනු පිළිවෙළින් ජාති තුනකම ඉන්ද්‍ර නම් වූ සක්විති රජවරුන් තිදෙනෙක් වීමි යන අර්ථයි. **දෙව සත්තති ඉතො කප්පෙ** යනු මෙයින් සැත්තෑ දෙවැනි කල්පයෙහි සුමන නම් ඇතිව තෙවරක් සක්විති රජවරු තිදෙනෙක් වූහ. **සමසත්තතිම්හි තො කප්පෙ** යනු මේ කල්පයෙන් අඩුවැඩි නොවූ සත්තෑවැනි කල්පයෙහි, **වරුණ නාමකා** වරුණ සක්විතිය යන එබඳු නම් ඇතිව සක්විති රජවරු තිදෙනෙක්ම සත්රුවනින් යුතු සිව් දිවයින්හි අධිපතිහු වූහ යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

සීහාසනදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.12

සිද්ධත්‍ථස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් එකපථමිහ දායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තන්හි නිවන් ලැබීමට උපකාරී වන පින් රැස්කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වන කාර්මිකයකුව එක් විභව සම්පත් ඇති කුලයෙක උපන්නේය. එසමයෙහි සියලු ශ්‍රද්ධා සම්පන්න උපාසකවරු එක්සිත්ව භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන ශාලාවක් කරමුයි දැව සඳහා වනයට පිවිස එම උපාසකයා දැක අපට එක් කණුවක් දෙවයි ඉල්ලූහ. ඔහු මේ පුවත අසා ඔබ නහමක් සිතවයි ඔවුන් හැමදෙන උනන්දුකොට එක් හරවත් කණුවක් ගෙන ශාස්තෘන් වහන්සේට පෙන්වා ඔවුන්ටම දුන්නේය. ඔහු එයින්ම හටගත් සොම්නස් ඇත්තේ එයම මුල්කොට අනික් දානාදි පින්කොට එයින් මියපරලොව ගොස් දිව්‍යලෝකයෙහි ඉපිද සඳෙළිලොවිහි නැවත නැවත දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතරද අග්‍රවූ සක්විති සැපත් නොයෙක් වර අනුභව කොට නොගිණිය හැකි ප්‍රදේශරාජ සම්පත්ද අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ශ්‍රද්ධා සම්පන්න එක් කුලයෙක උපන්නේ මව්පියන් සමග භාග්‍යවතුන් වහන්සේ සම්පයෙහි ධර්මය අසා පැවිදිව ලැබූ උපසම්පදාව ඇත්තේ කමටහන් ගෙන මෙනෙහි කරන්නේ නොබෝ කලකින්ම රහත් විය. ඔහු මෙසේ රහත් බවට පත්වූයේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පෙර චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සිද්ධත්‍ථස්ස** යනාදිය කියි.

එහි **සිද්ධත්‍ථස්ස භගවතො** භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ **මහාපූගගණො** යනු මහා උපාසක සමූහයා. අහූ විය යනු අර්ථයි. **සරණං ගතාව තෙ බුද්ධං** යනු බුදුන් සරණ ගියාහු, සේවනය කළාහු හෝ දත්තාහු හෝ ඔවුහු උපාසකයෝය. **තථාගතං සද්දහන්ති** බුදුගුණ තම සිත් සතන්හි තබති යන අර්ථයි. **සබ්බෙ සංගම්ම මනෙතත්‍ථා** යනු සියලුදෙන පැමිණ එක්ව ඔවුනොවුන් දන්වා එක්සිත් ඇත්තාහු වී, **මාලං උපස්ථාන ශාලාව** ශාස්තෘන් වහන්සේ උදෙසා. **කුබ්බන්ති** කරති යන අර්ථයි. දැව රාශිය තුළ එක් කණුවක්වත් නොලබන්නාහු බ්‍රහ්මවනෙ මහා වනයෙහි සොයති යනු සම්බන්ධයි. **තෙහං අරඤ්ඤදිසවාන** යනු මම එම උපාසකවරුන් වනයෙහිදී දැක **ගණං** සමූහය **උපගම්ම** සමීපයට ගොස් **අඤ්ජලිමපගහෙත්වා** දසැඟිලි එක්කොට ඇඳිලිය හිසෙහිකොට

අහං ගණං උපාසක සමූහය. තොපි මේ වනයට කුමක් සඳහා පැමිණියාහුද. **තදා** එකල්හි විචාරති යනු සම්බන්ධයි. ඒ සිල්වත් උපාසකවරු මෙ මා විසින් විචාරණ ලද්දාහු අපි ශාලාවක් කරනු කැමැත්තෝ ව අප විසින් එක් කණුවක්වත් නොලැබෙතියි ප්‍රකාශ කළහ. විශේෂයෙන් කියූහ යනු සම්බන්ධයි. **මමං** මාහට **එකත්ථම්භංදෙථ අහං** එය ශාස්තෘන් වහන්සේට දෙන්නෙමි. මම සමීපයට කණුව ගෙනෙන්නෙමි. ඒ පින්වත්හු කණුව ගෙන ඒමේ අල්ප වූ උනන්දුවක් ඇත්තෝ උත්සාහ නැත්තෝ වෙත්වායි සම්බන්ධයි. **යං යං යොනුපජ්ජාමි** යනු කිසියම් කිසියම් **යොනිං** දේවත්වයකට. ඉක්බිති මනුෂ්‍යත්වයකට එළඹෙමි යන අර්ථයි. අනාගත අර්ථයෙහි යෙදෙන වචනයෙකි. යම් යම් දෙව්ලොවක හෝ මනුෂ්‍ය ලෝකයෙහි හෝ යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

එකත්ථම්භදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.13

පදුමුත්තරස්ස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් නන්ද තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර එක් කුලයක ඉපිද දැනමිති බවට පැමිණියේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ඉන්ද්‍රියයන්හි මුවහ කළ දොර ඇති භික්ෂූන් අතර අගතන්හි තබනු දැක තමාද ඒ තනතුර පතන්නේ භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සංඝයාට පූජා සත්කාර බහුල මහදන් පවත්වා 'ස්වාමීනි, මම අනාගතයෙහි ඔබවහන්සේ වැනි බුදුකෙනෙකුන්ගේ මෙවැනි ශ්‍රාවකයෙක් වන්නෙමි'යි ප්‍රාර්ථනයක් කළේය.

ඔහු එතැන් සිට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ **අත්ථදස්සි** භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ධම්මතා නම් නදියෙහි මහ කැස්බකු වී උපන්නේ එක්දවසක් ශාස්තෘන් වහන්සේ නදියෙන් එතරවනු පිණිස ඉවුරෙහි සිටිනු දැක තමා භාග්‍යවතුන් වහන්සේ තරණය කරනු කැමැත්තේ

ශාස්තෘන් වහන්සේගේ පාමුල වැදහොත්තේය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ අධ්‍යාශය දැන පිටට නැගි සේක. ඔහු තුටුපහටුව වේගයෙන් සැඩ දියපහර සිඳිමින් වඩාත් ඉක්මණින් එගොඩට පැමිණිවීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුමෙවෙනි කියනසේක් වියහැකි සම්පත් වදාරා වැඩි සේක. එදා එම පුණ්‍යකර්මයෙන් සුගතීන්හි පමණක් සැරිසරන්නේ අපගේ මෙම භාග්‍යවතුන් වහන්සේ උපන් කල්හි කපිලවස්තු නුවර සුදොවුන් මහරජුගේ අගමෙහෙසී වූ මහා ප්‍රජාපති ගෞතමියගේ කුසෙහි උපන්නේය.

ඔහුට නම්තබන දවසෙහි ඥාති සමූහයා සතුටු කරමින් උපන්නේ යයි නන්ද යනුවෙන්ම නමක් තැබූහ. ඔහු වැඩිවිය පත් කල්හි භාග්‍යවතුන් වහන්සේ පවත්වන ලද උතුම් දම්සක් ඇතිසේක් ලෝකයාට අනුග්‍රහ කරමින් පිළිවෙළින් කපිලවස්තු නුවරට වැඩ ඥාති සමාගමයෙහි පොකුරුවැස්ස නිදානය කොට වෙස්සන්තර ජාතකය දෙසා වදාරා, දෙවැනි දවසෙහි පිඬු පිණිස පිවිස 'උතනිටෙය නපපමජ්ජය' යන ගාථාවෙන් පියාණන් සෝවාන් ඵලයෙහි පිහිටුවා නිවසට වැඩ 'ධම්මංචරෙ සුචරිතං' යන ගාථාවෙන් මහා ප්‍රජාපතිය සෝවාන් ඵලයෙහි ද සකෘදාගාමී ඵලයෙහි ද පිහිටුවා තෙවැනි දවසෙහි නන්ද කුමාරයාගේ අභිෂේක, ගෘහප්‍රවේශ ආවාහ මංගල්‍යයන් පවතිද්දී පිඬු පිණිස පිවිසි සේක.

ශාස්තෘන් වහන්සේ නන්ද කුමරුගේ අතට පාත්‍රය දී මඟුල් කියා ඔහු අතින් පාත්‍රය නොගෙනම විහාරයට වැඩි සේක. ඔහු පාත්‍රය අතැතිව විහාරයට පැමිණියහු අකමැති වද්දීම පැවිදි කළ සේක. එසේ පැවිදි වූ නිසාම අනභිරතියෙන් පීඩා විඳින්නහු දැන උපායෙන් ඔහුගේ ඒ අනභිරතිය නැතිකළ සේක. ඔහු නුවණින් මෙනෙහිකොට විදර්ශනා උපදවා නොබෝ කලෙකින්ම රහත්බවට පත්විය.

තෙරුන්වහන්සේ නැවත දිනෙක භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මෙසේ කීහ. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පරෙවියන්ගේ වැනි පා ඇති අප්සරාවන් පන්සියයක් මාහට ලබාදෙන බවට යම් ඇපයක් වූ සේක්ද, ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ මම ඇපයෙන් මුදවමි'. භාග්‍යවතුන් වහන්සේද 'යම්සේ නන්ද, උපාදානයන්ගෙන් තොරව කෙලෙසුන්ගෙන් සිත මිදුණේ ද, එසේනම් මම මෙම ඇපයෙන් මිදුණේ වෙමි'යි කී සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ඉන්ද්‍රියයන්හි මුවහ කළ දොර ඇති බව විශේෂයෙන් දැන ඒ ගුණය පැහැදිලි කරන

සේක් මහණෙනි, මාගේ ඉන්ද්‍රියයන්හි මුවහකළ දොර ඇති ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් අග්‍රවේදි ඒ 'නන්ද' යයි ඉන්ද්‍රියයන්හි මුවහ කළ දොර ඇති බැවින් අගතන්හි තැබූ සේක. තෙරුන්වහන්සේ වනාහි ඉන්ද්‍රියයන්ගේ අසංවරය නිසා මෙම විප්‍රකාරයට පත්වූයෙමි. මම එය මනාසේ නිග්‍රහ කරන්නෙමියි හටගත් උත්සාහ ඇතිව බලවත් හිරි ඔත්තප්පයෙන් යුතුව එහිම කරන ලද උත්සාහ ඇති බැවින් ඉන්ද්‍රිය සංවරයෙහි උසස් පාරමිතාවට පැමිණි සේක.

මෙසේ ඔහු අගතැන්පත්ව තමාගේ පෙර කර්මය සිහිකොට සොම්නසට පැමිණියේ පෙර චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරස්ස භගවතො** ආදිය කීය.

වත්ථං ඛොමං මයා දිනනං යනු බෝම රටෙහි උපන් වස්ත්‍රය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සිත් පැහැදීමෙන් ගරුබුහුමනින් මා විසින් අතිශයින් සියුම් වූ බෝම වස්ත්‍රය දෙන ලදී යන අර්ථයි. **සයම්භුස්ස** යනු තමාම **භූතස්ස** උපන් ආර්ය ජාතියෙහි උපන් **මහෙසිනො** මහත් වූ සීල සමාධි පඤ්ඤා විමුත්තිඤාණ දස්සන ස්කන්ධයන් **එසි** සෙවීයයි මහේසී නම්. ඒ මහේසී වූ ස්වයංභූ වූ භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු පිණිස බෝම වස්ත්‍රයක් මා විසින් දෙනලදැයි යන සම්බන්ධයි.

තංමෙ බුද්ධා වියාකාසී යනු මෙහි **තං** යනු සාමාන්‍යර්ථයෙහි යෙදෙන වචනයකි. ඒ වස්ත්‍රදායක වූ මාගේ දානඵලයෙහි **විසෙසෙ අකාසි** බුදුරජාණන් වහන්සේ වදාළ සේක යන අර්ථයි. **ජලජුත්තමනාමකො** යනු පදුමුත්තර නම් ඇත්තේ. ජලජුත්තම නායකො යනුවෙන්ද පාඨයක් ඇත්තේය. උන්වහන්සේට බැබලෙන දෙවි මිනිසුන්ගේ **උත්තමනායකො** ප්‍රධාන වූ යන අර්ථයි. **ඉමිනා වත්ථදානෙන** යනු මේ දානයෙහි විපාකයෙන් ඔබ අනාගතයෙහි හෙමවණෙණා රන්වන් වන්නෙහිය. **දෙව සම්පත්ති** අනුභොත්වා යනු දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාත වූ සම්පත්තිද්වය අනුභවකොට. **කුසලමූලෙහි චොදිනො** යනු කුසල අවයවයන්ගෙන් කුසල කොටස්වලින් චොදිතො මෙහෙයවනු ලැබූ ඔබ මේ පිනින් ශාස්තෘන් වහන්සේගේ කුලයෙහි උපදිනියි මෙහෙයවන ලද්දේ වනැයි යන අර්ථයි. ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ කණිටු සොහොයුරා ඔබ වන්නෙහි යයි ප්‍රකාශ කළේය යන සම්බන්ධයි. **රාගරත්තො සුබසීලො** ක්ලේශකාමයන්හි ඇළුණේ කායසුඛ චිත්තසුඛ අනුභව කරන ස්වභාව ඇත්තේ,

කාමෙසුගෙධමායුතෝ යනු වස්තු කාමයන්හි ගේධ සංඛ්‍යාත වූ තෘෂ්ණාවෙන් **ආයුතෝ** යුක්තවූයේ යන අර්ථයි. **බුදෙධන චොදිතෝ සනෙනා තතෝ භවං** යම්හෙයකින් කාමයන්හි ගැලුණේ **තතෝ** එයින් **භවං** තමාගේ සහෝදරයා වූ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් **චොදිතෝ** පැවිද්ද කෙරෙහි යොදවා උන්වහන්සේ සමීපයෙහි පැවිදි වන්නෙහිය යන සම්බන්ධයි. **පබබජිත්වාන භවං තත්‍ථ** ඒ ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි ඔබ පැවිදිව **කුසලමූලෙන** මූලභූත වූ කුසල සම්භාරයෙන් **චොදිතෝ** භාවනාවෙහි යොදවන ලද්දේ **සබබාසවෙ** සියලු කෙලෙස් **පරික්ඛයාය** දැන අත්හැර **අනාමයෝ** නිදුක් වූයේ **නිබ්බායිසසති** නොපෙනෙන බවට පමුණුවන්නෙහිය. නොපෙනෙන බවට යන්නේය යන අර්ථයි. **සතකපප සහසසමහි** මේ කල්පට පෙර එක්දහස් එකසිය කල්පයෙහි චෙල නමින් සක්විති රජවරු සතරදෙනෙක් වූහ යන අර්ථයි. **සථීකපප සහසසානි** කල්ප එක්දහස් සැටක් ඉක්මවා යට එක් කල්පයක උපචාල නම් සතර දෙනෙක් ජාති සතරක වූහ යන අර්ථයි. **පඤචකපප සහසසමහි** එක්දහස් පස්වැනි කල්පයෙහි චෙල නම් සක්විති රජවරු සතරදෙනෙක් සත්රුවනින් යුතුව සමගිව ජම්බුද්වීප, අපරගෝයාන, උත්තරකුරු, පූර්වවිදේහ, සංඛ්‍යාත සිව් දිවයින්හි ඊශ්වරව, ප්‍රධානව විසුං වූහ යන අර්ථයි. සෙස්ස කියන ලද පරිදිමය.

නන්‍ද තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.14

පදුමුත්තරෝ නාමජිනෝ යනාදි වශයෙන් ආයුෂ්මත් චුලලපන්ථක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තැන නිවනට හේතු වූ පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි යමක් මෙහි අර්ථෝත්පත්ති වශයෙන් කිවයුතුද එය පළමුව අෂ්ටක නිපාතයෙහි මහාපන්ථක වස්තුවෙහිදී කියන ලද්දේමය. විශේෂය මෙපමණමය. මහාපන්ථක තෙරුන් වහන්සේ රහත්බවට පත්ව ඵලසමාපත්ති සුඛයෙන් දවසරින්නේ මෙසේ සිතූ සේක. 'කෙසේද චුල්ලපන්ථකද මේ සැපයෙහි පිහිටුවන්නට හැක්කේ' යනුවෙන් උන්වහන්සේ තම මුත්තණුවන් වූ ධන

සිටුවරයා වෙත එළඹ මෙසේ කීහ. යම්හෙයකින් මහ සිටුවරයා අනුදන්නේ නම් මම චුලලපත්ථක පැවිදි කරන්නෙමි'. 'ස්වාමීනි, පැවිදි කරන්න'. තෙරුන් වහන්සේ ඔහු පැවිදි කළ සේක. ඔහු දසසිල්හි පිහිටියේ සහෝදරයා හමුවෙහි

පදුමං යථා කොකනදං සුගන්ධං
පාතෝ සියා ඵුල්ලමවීත ගන්ධං
අංගීරසං පස්ස විරොචමානං
තපන්ත මාදිච්ච මිවන්ත ලික්ඛ

සුවඳැති රත් පියුමක් සේ
උදෑසන පිපී සුවඳ හමනා
බලව දිදුලන බුදුරදුන් දෙස
අහස්කුස දිලෙන හිරු සේ

ගාථාව ඉගෙන ගන්නේ සිව් මසෙකින් ඉගෙනීමට නොහැකි විය. උගත් දෙය හෘදයෙහි නොසිටී. ඉක්බිති මහාපන්ථක තෙමේ "චුල්ලපන්ථක, ඔබට මේ සසුන සුදුසු නැත. සිව් මසෙකින් එක් ගාථාවක්වත් ඉගෙනීමට නොහැකි වූයෙහිය. පැවිදිකිස කෙසේ නම් මුදුන්පමුණුවා ගන්නෙහිද. මෙයින් නික්මී යව. තෙරුන් විසින් නෙරපා දමනු ලැබූ ඔහු දොර කොටුව සමීපයෙහි හඬමින් සිටියේය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ජීවකගේ අඹවනයෙහි වාසය කරන සේක. ඉක්බිති ජීවක තෙමේ පුරුෂයකු යැවිය. "යව, පන්සියයක් භික්ෂූන් සමග ශාස්තෘන් වහන්සේට ආරාධනා කරව"යි. එකල්හි ආයුෂ්මත් මහාපන්ථක තෙරුන්වහන්සේ දාන අධිකාරී වෙති. හෙතෙමේ 'පන්සියයක් භික්ෂූන්ට භික්ෂාව පිළිගනු මැනැවයි කියනු ලැබුවාහු චුල්ලපන්ථක හැර සෙසු භික්ෂූන්ට පිළිගනිමියි කීහ. ඒ අසා චුල්ලපන්ථක තෙමේ බෙහෙවින් දොම්නසට පැමිණියේ විය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ සිතෙහි හැසිරීම දැන චුල්ලපන්ථක මා විසින් කරන ලද උපායෙන් අවබෝධ කරගන්නේ යයි ඔහුට නුදුරු තැන තමා දක්වා කිමෙක්ද පන්ථක හඬන්නෙහිදැයි ඇසූ සේක. ස්වාමීනි, සොහොයුරා මා නෙරපතියි කීය. පන්ථක නහමක් සිතව, ඔබගේ පැවිද්ද මාගේ සසුනෙහිය. එන්න මෙය ගෙන 'රජොහරණං, රජොහරණං' යනුවෙන් සිත්හි තබා ගනුවයි ඍද්ධියෙන් පිරිසිදු රෙදිකඩක් මවාදුන් සේක. ඔහු ශාස්තෘන් වහන්සේ විසින් දෙන ලද රෙදිකඩ රජොහරණං රජොහරණං යනුවෙන්

අතින් පිරිමදින්නේ හුන්නේය. ඔහු එය පිරිමදිද්දී කිලිටි විය. නැවත පිරිමදිනවිට ඉඳුල් පිස්නාවක් මෙන් විය. ඔහු ඥානය මුහුකුරා ගිය හෙයින් මෙසේ සිතීය. මේ රෙදිකඩ ප්‍රකෘතියෙන් පිරිසිදුය. මේ කර්මයෙන් හටගත් සිරුර නිසා කිලිටි විය. වෙනස් විය. ඒ නිසා මෙයද අනිත්‍යයි. මෙසේ සිතට ප්‍රීති ක්ෂයව්‍යය එළවාගෙන එම නිමිත්තෙහිම ධ්‍යාන උපදවා ධ්‍යානපාදක කොට විදර්ශනා පිහිටුවා පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියේය. රහත්බවට පත් ඔහුට ත්‍රිපිටකය අභිඥාපස පැමිණියේය. ශාස්තෘන් වහන්සේ එකක් අඩු පන්සියයක් භික්ෂූන් සමග වැඩ ජීවකගේ නිවසෙහි පැනවූ අසුනෙහි හුන් සේක. චුල්ලපන්ථක වනාහි තමා භික්ෂාව සඳහා නොපිළිගනු ලැබූ හෙයින්ම නොගියේ විය. ජීවක කෑද පිළිගන්වන්නට ආරම්භ කෙළේය. ශාස්තෘන් වහන්සේ අතින් පාත්‍රය වැසූ සේක. ස්වාමීනි, කුමක් නිසා නොපිළිගන්නහුදැයි ඇසූකල්හි ජීවක වෙහෙරෙහි එක් භික්ෂුවක් ඇතැයි කී සේක. හේ එක් පුරුෂයකු යැවීය. යව ඔහු ගෙනෙවයි චුල්ලපන්ථක තෙරුන් වහන්සේද රූපයෙන්ද ක්‍රියාවෙන්ද එකිනෙකාට අසමාන භික්ෂූන් දහසක් මවා හුන්හ. ඒ පුරුෂයා විහාරයෙහි භික්ෂූන් බොහෝ දෙනකු දැක ජීවකට කීය. මේ භික්ෂු සංඝයාට වඩා විහාරයෙහි භික්ෂු සංඝයා බහුතරය. කැඳවිය යුතු ආර්යයන් වහන්සේ නොදනිමි. ජීවක ශාස්තෘන් වහන්සේ විචාළේය. ස්වාමීනි විහාරයෙහි හුන් භික්ෂුව කවර නම් ඇත්තේද. චුල්ලපන්ථක නමීය. දරුව, යව. චුල්ලපන්ථක නම් කවරෙක්දැයි විමසා ඔහු ගෙන එව. ඔහු විහාරයට ගොස් ස්වාමීනි චුල්ලපන්ථක නම් කවරෙක්දැයි ඇසීය. මම චුල්ලපන්ථක. මම චුල්ලපන්ථක යයි එකපැහැර දහසක් භික්ෂූහු කථාකළහ. ඔහු නැවත අවුත් ඒ පුවත ජීවකට දැන්වීය. ජීවක අවබෝධ කරගත් සත්‍ය ඇති බැවින් ආර්යයන් වහන්සේ සෘද්ධි ඇත්තෙකැයි සිතමියි නය වශයෙන් දැන දරුව යව, පළමුව කථාකරන ආර්යයන් වහන්සේම ශාස්තෘන් වහන්සේ ඔබවහන්සේ කැඳවතියි සිවුරු කොණින් ගනුවයි කීය. ඔහු විහාරයට ගොස් එසේ කළේය. එකෙණෙහිම මැවුණු භික්ෂූහු අතුරුදහන් වූහ. ඔහු තෙරුන් වහන්සේ ගෙන ගියේය. ශාස්තෘන් වහන්සේ එකෙණෙහි කැඳ කැවිලි ආදී දේ පිළිගත් සේක. කරන ලද බත්කිස ඇතිසේක් භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනාව කරවයි චුල්ලපන්ථකට අණකළ සේක. ඔහු දියුණු කළ පටිසම්භිදා ඇත්තේ මහාමේරුව ගෙන මහසමුද්දර මත්ගාන්නාක් මෙන් ත්‍රිපිටක බුද්ධවචනය කළඹමින් ශාස්තෘන් වහන්සේගේ අධ්‍යාශය ගෙන අනුමෝදනාව කළේය.

දසබලධාරී බුදුරජාණන් වහන්සේ කරන ලද බත්කිස ඇතිසේක් විහාරයට වැඩිකල්හි දම්සබාවෙහි කථාවක් උපන්නේය. බුදුවරුන්ගේ ආනුභාවය පුදුමයි. යම්තැනෙක වනාහි සිව්මසෙකින් එක් ගාථාවක්වත් ඉගෙනීමට නොහැකි වූවකු සුළු මොහොතකින්ම මෙසේ මහා ඍද්ධි ඇත්තකු කළ සේක. එසේ ජීවකගේ නිවසෙහි හුන්සේක් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අයුරින් චුලලපන්ථකගේ සිත සන්සුන් කරන ලදී. විදර්ශනා මාර්ගයට පිළිපන්නේ යයි දැන තමා හුන් පරිද්දෙන්ම දක්වා පන්ථක, මේ රෙදිකඩ කිලිටි වූයේ දූවිල්ලෙන් යුතුවූයේ පමණක් නොව, මින් වනාහි ආර්ය විනයෙහි වෙනත් කිලිටිද දූවිලි යයි දක්වන්නේ

රාගො රජො නචපන රෙණු වුචචති
රාගසෙසතං අධිවචනං රජොති
එතං රජං විපපජහෙත්ව භික්ඛවො
විහරනති තෙ විගත රජසස සාසනෙ

රාගය කිලුට මිස දුහුවිලි අසක් නොවේ
රාගය කිලුට සමරුන් දෙන වදන්ම වේ
මෙකිලුට හැරදමා මහණෝ වැඩවසති
විරාගී බුදුරජුගෙ සසුනේ

දොසො රජො -පෙ- විගත රජසස සාසනෙ
දෝසය කිලුට මිස -පෙ- විරාගී බුදුරජුගෙ සසුනේ

මොහො රජො -පෙ- විගත රජසස සාසනෙ
මෝහය කිලුට මිස -පෙ- විරාගී බුදුරජුගෙ සසුනේ

මේ ගාථා තුන වදාළ සේක. ගාථා අවසන චුලලපන්ථක සිව්පිළිසිඹියා සහිත රහත්බවට පැමිණියේ යයි ශාස්තෘන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කතා සල්ලාපය අසා පැමිණ බුද්ධාසනයෙහි වැඩහිඳ මහණෙනි, කුමක් කියවුදැයි අසා, ස්වාමීනි මෙනම් යයි කී කල්හි මහණෙනි, චුලලපන්ථක මෙසේ මාගේ අවවාදයෙහි පිහිටා ලෝකෝත්තර දායාදය ලද්දේ දැන් පමණක් නොවේයයි කියා ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලැබූ සේක් චුලලසෙට්ඨි ජාතකය වදාළ සේක.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ ආර්ය සංඝයා පිරිවරා ධර්මාසනයෙහි වැඩහුන් සේක් මනෝමය සිරුරු මවාගන්නා වූද සිත වෙනස් කිරීමේ දක්ෂ වූද භික්ෂූන් අතර ඔහු අගතන්හි තැබූහ. මෙසේ ඔහු පත්වූ අගතන් ඇත්තේ පූර්ව කර්මය සිහිකොට ප්‍රීති සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදිය කීය.

එහි මුල්පද දෙක කියූ අර්ථ ඇත්තේමය. **ගණමහා වූපකට්ඨෝ සෝ** යනු ඒ පදුමුත්තර නම් ශාස්තෘන් වහන්සේ **ගණමහා** මහා සංඝ සමූහයෙන් වූපකට්ඨෝ වෙන්වූ සේක් විවේකයට පැමිණ **තදා** මාගේ තාපස කාලයෙහි **හිමවන්තෙ** හිමාලය පර්වත සමීපයෙහි **වසී** වාසය කළේය. ඉරියව් සතරින් යුතුව වාසය කළ්ය යන අර්ථයි. **අහම්පිතදා** යනු යම්කලෙක ඒ භාග්‍යවතුන් වහන්සේ හිමවතට පැමිණ විසූසේක් ද, එකල්හි මමද හිමවත සමීපයෙහි කරන ලද ආශ්‍රමයක හාත්පසින්ම කාය චෙතොබිල සංඛ්‍යාත වෙහෙස මෙහිදී සමනය වෙත්නුයි ආශ්‍රමයයි ලද නම් ඇති අරණ්‍ය වාසයෙහි වසමියි සම්බන්ධයි. **අචිරාගතං මහාවීරං** යනු පැමිණ නොබෝකල් ඇති මහා වීර්යවන්ත ලෝක නායක වූ ප්‍රධාන වූ ඒ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙමියි සම්බන්ධයි. පැමිණි කෙණෙහිම එළඹෙමියි අර්ථයි. **පුප්ඵඡත්තං ගහෙත්වා** යනු මෙසේ එළඹෙන්නේම නෙළුම් මානෙල් ආදී මල්වලින් වසන ලද මලින් සෑදූ කුඩයක් ගෙන **නරාසභං** ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ වසන්නේ **උපගඤ්ඡිං** සමීපයට ගියේ වෙමි යන අර්ථයි. **සමාධිං සමාපජ්ජනතං** යනු රූපාවචර සමාධියට, ධ්‍යානයට නොපැමිණ හුන්නහුට අනතුරක් මම නොකෙළෙමි යන සම්බන්ධයි. **උභෝ හත්ථේහි පග්ගය්හ** යනු ඒ මැනවින් අලංකාර කරන ලද මල්කුඩය දෑතින් ඔසවා මම භාග්‍යවතුන් වහන්සේට දුනිමි යන සම්බන්ධයි. **පටිග්ගහෙසි** යනු ඒ මා දුන් මල්කුඩය පිළිගත් සේක. සාදරයෙන් ඉවසා වදාළ සේක යන අර්ථයි. **සත පත්තකං පග්ගය්හ** යනු එක් එක් නෙළුම් මලෙහි පෙති සියය සියය වශයෙන් පෙති සියයක් ඇති නෙලුම් මලින් වසන ලද මල්කුඩය **පකාරෙන** ආදරයෙන් ගෙන තාපසයා මට දුන්නේය යනු අර්ථයි. **තමහං කිත්තයිස්සාමි** යනු ඒ තාපසයා මම **කත්තයිස්සාමි** ප්‍රකට කරන්නෙමි යනු අර්ථයි. **මම භාසතො** කියන්නා වූ මාගේ වචනය අසවු. සිත්හි දරවු. **පඤ්චවීසති කප්පානි** යනු මේ මල්කුඩය දීමෙන් විසිපස් වරක් තව්තිසා භවනයෙහි ශක්‍රයා වී දේවරාජ්‍යය කරන්නේයි යනු සම්බන්ධයි. **චතුත්තිංසක්ඛත්තුං** යනු තිස්සතර වරක් මිනිස්ලොව

සක්විති රජවන්නේය. **යංයංයොනිං** යනු මනුෂ්‍ය ජාති ආදියෙන් යම් යම් ජාතියක සැරිසරයි. **ගච්ඡති** ඒ ඒ ජාතියෙහි උපදියි. **අඛෙහාකාසෙ** ශූන්‍යස්ථානයෙහි **පතිට්ඨන්තං** හුන්නාහු හෝ සිටියහු. **පදුමං ධාරයිස්සති** ඉහළින් වසනු ලබන්නේය යන අර්ථයි. **පකාසිතෙ පාවචනෙ** ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සියලු තුන්පිටකයෙහි **පකාසිතෙ** විස්තර කරන ලද. **මනුසසතතං** මිනිස් ජාතියෙහි **ලභිස්සති** උපදින්නේය. **මනොමයම්හි කායම්හි** මනෙන ධ්‍යාන සිතින් උපන්නේනුයි මනෝමය නම් වේ. යම්සේ සිත පවතීද එසේ කය පැවතේනුයි චිත්තගතික කරයි යන අර්ථයි. එම මනෝමය කයෙහි ඒ තාපසයා චුලලපථක නම්ව **උත්තමො** අග්‍ර වූයේ වන්නේය යන අර්ථයි. සෙස්ස යට කියන ලද බැවින්ද නොගැඹුරු අර්ථ ඇති බැවින්ද පහසුවෙන් දතහැකි වන්නේමය. **සරිං කොකනදං අහං** යනු මම භාග්‍යවතුන් වහන්සේ මැවූ රෙදි කැබැල්ල පිරිමදින්නේ රත් පියුම සිහි කෙළෙමි යන අර්ථයි. එහි **චිත්තං විමුචචමෙ** යනු ඒ රත් පියුමෙහි මාගේ සිත **අධිමුචචි** නොඇලුණේ එයින් මම රහත්බවට පැමිණියෙමි යන සම්බන්ධයි. මොහු මනෝමය වූ චිත්තගතික වූ කායයන්හි සියලුතැන සියලු පාරමී කෙළවරට **ගතො** පැමිණියේය යනු සම්බන්ධයි. සෙස්ස කියන ලද පරිදිමය.

චුලලපන්ථක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.15

නිබ්බුතෙ ලොකනාථම්හි ආදි වශයෙන් ආයුෂ්මත් පිළිනඳිවචජ තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර මහා සම්පත් ඇති කුලයෙක උපන්නේ යට කියන ලද පරිදි ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක දෙවියන්ට ප්‍රියමනාප බැවින් අගතන්හි තබනු දැක ඒ තනතුර පතා දිවි ඇතිතාක් කුසල්කොට එයින් චුතවූයේ දෙවිමිනිසුන් අතර

සැරිසරන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේය. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ස්තූපය පූජාකොට සංඝයාට මහදන් පවත්වා එයින් චුතව දෙවි මිනිසුන් අතර උභයසම්පත් අනුභවකොට බුදුන් තුපන් කල්හි සක්විති රජව මහජනයා පන්සිල්හි පිහිටුවා ස්වර්ග පරායණය කළේය. ඔහු අපගේ භාග්‍යවතුන් වහන්සේ නූපන් කල්හිම සැවත්නුවර බමුණු කුලයෙක උපන්නේය. පිළින්දිතිස්ස යනුවෙන් නම්කළහ. වච්ඡ යනු ගෝත්‍රයයි. ඔහු පසුකලෙක පිළිඳිවච්ඡ යනුවෙන් ප්‍රසිද්ධ විය. සසර සැරිසැරීමෙන් සංවේග බහුලතාව නිසා පිරිවැජි පැවිද්දෙන් පැවිදිව චුල්ලගන්ධාර නම් විද්‍යාවක් උගෙන ඒ විද්‍යාවෙන් අහස්හි හැසිරෙන්නෙක්වද අනුන් සිත් දන්නෙක්වද රජගහනුවර ලාභයෙන්ද යසසින්ද අගතැන්පත් වූයේ වාසය කරයි. ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ අභිසම්බෝධියට පත්ව පිළිවෙළින් රජගහනුවරට පැමිණි සේක. එතැන් පටන් බුද්ධානුභාවයෙන් ඔහුට ඒ විද්‍යාව පල නොදරයි. තමාගේ කාර්ය සාර්ථක නොවෙයි. ඔහු මෙසේ සිතීය. ආචාර්ය ප්‍රාචාර්යයන් මෙසේ කියනු අසා ඇත. යම්තැනක මහා ගන්ධාර විද්‍යාව පවතීද එතැන චුල්ලගන්ධාර විද්‍යාව පල නොදරයි. ශ්‍රමණ භවත් ගෞතමයන් පැමිණි කල්පටන් මාගේ මෙම විද්‍යාව පල නොදරයි. නිසැකයෙන්ම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මහාගන්ධාර විද්‍යාව දන්නා සේක. මම උන්වහන්සේ ආශ්‍රයකොට උන්වහන්සේ සමීපයෙහි එම විද්‍යාව හදාරන්නේ නම් මැනවි. ඔහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මෙසේ කීය. 'ශ්‍රමණය, මම ඔබගේ සමීපයෙහි ඒ විද්‍යාව හදාරනු කැමැත්තෙමි. මට අවකාශයක් දෙව'යි. එසේනම් මා සමීපයෙහි පැවිදිවෙවයි කී සේක. හෙතෙමේ පිළියම පැවිද්දයයි සිතන්නේ පැවිදිවිය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට ධර්මය කියාදී චරිතානුකූල කමටහනක් දුන් සේක. ඔහු හේතුසම්පත් ඇති බැවින් නොබෝ කලෙකින්ම විදර්ශනාව පිහිටුවා රහත් බවට පත්විය. යම් දෙවිකෙනෙක් පෙර ජාතියෙහි ඔහුගේ අවවාදයෙහි සිට දෙව්ලොව උපන්නාහුද ඒ දේවතාවෝ ඒ කෘතඥතාව නිසා ඔහු කෙරෙහි හටගත් බුහුමන් ඇත්තාහු උදේ සවස තෙරුන් වහන්සේ ආශ්‍රයකොට යෙති. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ඔහු දෙවියන් අතිශයින් ප්‍රියමනාප බැවින් යුතු බැවින් අගතන්හි තැබූ සේක. 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් දෙවියන්ට ප්‍රියමනාප වෙත්ද ඒ පිළින්දිවච්ඡය'යි මෙසේ පැමිණි අගතැන් ඇත්තේ ඔහු තමාගේ පූර්ව කර්මය සිහිකොට ප්‍රීති සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **නිබ්බුතෙලොකනාථම්හි** යනාදිය කීය.

එහි කාමරූප අරූප ලෝකයට නාථවූයේ ප්‍රධානවූයේනුයි ලෝකනාථ නම්වෙයි. මෙධා යනුවෙන් සර්වඥතාඥාණය කියැවෙයි. අනාවරණ ඥාන ආදී වූ සුන්දර වූ ප්‍රශස්ත වූ හෝ සර්වඥතාඥානයක් යමකුට වේද හේ සුමේධ නම් වේ. අග්‍රවූයේද පුද්ගල වූයේද අග්‍රපුද්ගල නමි. සුමේධ වූ ලෝකනායක වූ අග්‍රපුද්ගලයා ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන්පෑ කල්හි යනු සම්බන්ධයි.

පසන්න චිත්තෝ සුමනෝ යනු ශ්‍රද්ධාවෙන් පහන්කළ සිත් ඇත්තේ සොම්නසින් සුන්දර මනසින් යුතු වූ මම ඒ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ **ථූපපූජං** චෛත්‍ය පූජාව කෙළෙමි යන අර්ථයි. **යෙව බ්‍රහ්මසවා තතෝ** යනු ඒ සමාගමයෙහි යම් **බ්‍රහ්මසවා** නැසූ කෙලෙස් ඇත්තාහු. **ඡළභිඤ්ඤා** අභිඥා සයෙන් යුක්ත වූවාහු **මහිද්ධිකා** මහා ඍද්ධීන් යුක්ත වූවාහු. ඒ සියලු ක්ෂීණාශ්‍රවයන් මම මෙහි **සමානෙත්වා** මනා ආදරයෙන් ගෙනවිත් **සංඝ භත්තං** සියලු සංඝයාට දියයුතු දන් **අකාසිං** ඔවුන් වැළඳවූයෙමි යන අර්ථයි. **උපට්ඨාකෝ තදා අහු** යනු එදා මා සංඝයාට දන්දෙන කල්හි සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ නමින් සුමේධ නම් වූ උපස්ථායක ශ්‍රාවකයෙක් **අහූ** වීය යන අර්ථයි. **සෝ** යම් ශ්‍රාවකයෙක් මාගේ පූජා සත්කාර **අනුමොදිත්ථ** අනුමෝදන් වූයේ ආනිසංස කියුවේ යන අර්ථයි. **තෙ චිත්තපසාදෙන** යනු ඒ චෛත්‍ය පූජා කිරීම් වශයෙන් උපන් චිත්තප්‍රසාදයෙන් දෙව්ලොව දිව්‍ය විමානයකට **උපපජ්ජි** පැමිණියේ වෙමි යන අර්ථයි. එහි උපන්නේ වෙමියි කියන ලද්දේ වෙයි. **ඡළාසීති සහස්සානි** යනු එම විමානයෙහිද අසූහයදහසක් දෙවඟනෝ **මෙ** මාගේ සිත රමිංසු සතුටු කරවූහ යනු සම්බන්ධයි. **මමෙව අනුවත්තන්ති** යනු ඒ දෙවඟනෝ **සබ්බකාමෙහි** දිව්‍යමය වූ රූප ආදී වූ වස්තු කාමයන්ගෙන් උවටැන් කරති. යමෙක් මට මෙසේ අනුව පවතිත්ද මාගේ වචනය ඉටුකරත්ද **සදා** සැමකල්හි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

පිළින්දිවච්ඡ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.16

පදුමුත්තරස්ස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් රාහුල තෙරුන් වහන්සේගේ අපදානයයි.

මෙම ආයුෂ්මත් තෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තැන නිවනට හේතුවූ පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ දනුම්හි බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ශික්ෂාකාමීන් අතර අගතන්හි තබනු දැක ඔහුද එම තනතුර පතන්නේ සෙනසුන් පිරිසිදු කිරීම අලංකාර කිරීම ආදි උදාර පින්කොට ප්‍රාර්ථනයක් කළේය. ඔහු එයින් චුතව දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභයසම්පත් අනුභවකොට මෙම බුද්ධෝත්පාදයෙහි අපගේ බෝධිසත්වයන් නිසා යශෝධරා දේවියගේ කුසෙහි ඉපිද රාහුලයයි ලබන ලද නම් ඇත්තේ මහත් වූ ක්ෂත්‍රිය පිරිවරින් වැඩුණේය. ඔහුගේ පැවිදි විධානය බන්ධකයෙහි ආ පරිදිමය. ඔහු පැවිදිව ශාස්තෘන් වහන්සේ සමීපයෙහි නොයෙක් සූත්‍රාපදේශයන්ගෙන් ලද අවවාද ඇත්තේ මුහුකුරා ගිය ඥානය ඇත්තේ විදර්ශනාවෙහි උත්සුකව රහත් බවට පත්විය. රහත් වී තමාගේ ප්‍රතිපත්තිය නැවත බලා රහත් බව ප්‍රකාශ කරන්නේ:

උභයෙනෙව සම්පන්නො රාහුලභද්දොතිමංවිදු
යඤ්චහි පුත්තො බුද්ධස්ස - යඤ්ච ධම්මෙසු චක්ඛුමා

උබය සැපතින් යුතු
දනිති රාහුල භද්දයැයි මා
බුදුරදුගෙ පුත් වෙමි
දහමෙහි යෙදූ ඇස් ඇති

යඤ්චමෙ ආසවා ඛීණා-යඤ්චනත්ථි පුනබ්භවො
අරහා දක්ඛිණෙය්‍යොම්හි - තෙවිජ්ජෝ අමතං දදො

මාකෙලෙස් සිදුණේය
නැත නැවත ඉපදීමක්
රහත් වෙමි දනට නිසිවෙමි
තෙවිදු දත්තෙමි අමා දෙන්නෙමි

කාමඤා ජාල පවඤනා - තණ්හාඡදන ඡාදිනා
පමත්ත බන්ධුනා බද්ධා - මච්ඡාව කුම්නාමුඛෙ

කාමයෙන් අඳවී මොහොදැල ඇලී පැටලී
තණ්හා වැස්මෙන් වැසුණෝ
මරහුට බැඳී ඇත
කෙමන මුවෙහි මසුන් මෙන්

තං කාමං අහමුජ්ඣිත්වා - ජෙත්වා මාරස්ස බන්ධනං
සමූලං තණ්හං අබ්බුය්හ සීතිභූතොඝම් නිබ්බුතෝ

ඒ කම් සැපත් අත්හැර
මරහුගෙ බැමිද සිඳදා
තණ්හාව සහමුලින් උදුරා
සිහිල් වූයෙමි නිවුණෙමි

ගාථා සතර කීය.

එහි උභයෙනෙව සම්පනෙනා යනු ජාති සම්පදාව ප්‍රතිපත්ති සම්පදාව යන උභය සම්පත්තියෙන් **සම්පනෙනා** යුක්ත වූයේ. රාහුලභද්දොති මංචිදූ යනු සමග බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෝ හඳුන්වති. ඔහුගේ උපන් පුවත අසා බෝධිසත්වයන් විසින් රාහුලයෙක් උපන්නේය. බන්ධනයක් ඇති වූයේ යයි කියූ වචනය උදෙසා සුද්ධෝදන මහරජතුමා රාහුලයයි නමක් තැබීය. හේ මුලින්ම පියා විසින් කියන ලද ක්‍රමයම ගෙන රාහුල භද්‍රයයි මා හැඳින්වූහ යනු කීය. **භද්දො** යනු ප්‍රශංසා වචනයක්මය. පසුකලෙක ශාස්තෘන් වහන්සේ ඔහු ශික්ෂාකාමී බවින් අගතන්හි තැබූ සේක. මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් ශික්ෂාකාමීන් අතර අගතැන්පත් වේද ඒ රාහුලයයි. මෙසේ ඔහු පැමිණි අගතැන් ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පඳුමුත්තර භගවතො** යනාදිය කීය. **සත්තභූමිම්හි පාසාදෙ** යනු ප්‍රසාදය සොම්නස දනවතියි පාසාදනම් වේ. එකක් මත එකක් සිටි බිම් සතක්යම් ප්‍රාසාදයක ඇත්තේද ඒ ප්‍රාසාදය සත්බුමුනම්. ඒ සත්බුමු ප්‍රාසාදයෙහි **ආදාසං සන්ථරි අහං** යනු කැටඩපතක් නිපදවා ලෝකයට ජ්‍යෙෂ්ඨ වූ භාග්‍යවත් වූ තාදී ගුණ ඇති

බුදුරදුන්ට මම ඇතිරිල්ලක් දුනිමි. අතුරා පූජා කෙළෙමි යන අර්ථයි. **බීණාසව සහසෙසහි** යනු රහතුන් දහස් ගණනකින් **පරිකිණ්ණා** පිරිවරන ලදුයේ. **දිපදිච්චො** දෙපා ඇත්තවුන්ට **ඉච්චො ස්වාමී** වූ, **නරාසභො** මහා මුනීන්ද්‍රයන් වහන්සේ. ඔවුන් සමග ගඳකිළියට **උපාගමි** පිවිසි සේක යන අර්ථයි. **විරොචනෙතා ගන්ධකුටිං** යනු ඒ ගඳකිළිය බබුළුවන්නේ. දෙවියන්ට දෙවිවූයේ දේවදේව නමි. නරයන්ට ප්‍රධාන වූයේ නරාසභ නම් වූ ජ්‍යෙෂ්ඨ වූ ශාස්තෘන් වහන්සේ හික්ෂු සංඝයා මැද හිඳ මෙම විවරණ ගාථා **අභාසථ** කියූ සේක යන සම්බන්ධයි. **යෙනායං ජොතිතා සෙය්‍යා** යනු යම් උපාසකයකු විසින් මේ ප්‍රාසාද සංඛ්‍යාත **සෙය්‍යා ජොතිතා** අලංකාර කරන ලද්දේද ජෝතිමත් කරන ලද්දේද **ආදාසොව** කංසලෝහමය වූ කැඩපතක් මෙන් මනාසේ සමකොට අතුරන ලද්දේ. ඒ උපාසකයා **කිත්තයිස්සාමි** ප්‍රකට කරන්නෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

අධ්‍යානමෙතං යං තාදී යනු යම් කරුණෙකින් **තාදී** ඉටු අනිටු කරුණුවලදී කම්පානොවන බැවින් තාදීනමි. **අගාරෙ** ගෘහ වාසයෙහි **රතිං** ඇලුණු බව **අජ්ඣගා** පැමිණියේය යනුයි. මේ කරුණ අස්ථාන කරුණ යන අර්ථයි. **නික්ඛම්මචා අගාරසමා** යනු ගෘහවාසයෙන් නික්ම, එය තණසුලක් මෙන් අතහැර දමා, **සුබබතො** මනාසේ හික්මුණේ. **පබ්බජිස්සති රාහුලො නාම නාමෙන** යනු සුදොවුන් මහරජතුමා විසින් යවන ලද කුමාරයාගේ උපන් හසුන අසා පියා වූ සිද්ධාර්ථ විසින් 'රාහුලයෙක් උපන්නේය. බන්ධනයක් ඇතිවුණේය'යයි කියූ නම් ඇති බැවින් රාහුල නම් වෙයි යන අර්ථයි. යම්සේ චන්ද්‍ර සූර්යයන්ගේ විමානයන්හි ප්‍රභාව කිලිටි කිරීමෙන් රාහු අසුරේන්ද්‍රයා යම් තැනකට **උපෙති** යයිද, එසේම මොහු මාගේ අභිනිෂ්ක්‍රමණය පැවිද්ද ආදියට අනතුරක් කරන්නේම උපන්නේ වේයයි අදහසින් රාහුලයෙක් උපන්නේ යයි කීහයි දතයුතුය. **අරහා සො භවිස්සති** යනු එබඳු උපනිශ්‍රය සම්පන්න වූ ඔහු විදර්ශනාවෙහි යෙදුණේ අහෝ නැසූ කෙලෙස් ඇත්තෙක් වන්නේය යන අර්ථයි. **කිකීව අණ්ඩං රකෙඛය්‍ය** යනු **අණ්ඩං** බිජුවට රකින **කිකී** කිරළිය මෙන් අප්‍රමාද වූයේ සිල් රක්නේය. **චමරීවිය වාලධිං** යනුවලිගය රක්නා කටුවල වලිගය ඇමිණෙනවිට සිදීයන බියෙන් නොඇද මියයන්නා වූ සෙමර මුවදෙන මෙන් ජීවිතයද පරිත්‍යාගකොට සිල් නොබිඳ රක්නේය. **නිපකො සීල සම්පන්නො** යනු නෙපක්ක යනු ප්‍රඥාවයි. ඒ නෙපක්කයෙන් යුතු වූයේ නිපක නම් වේ. කඩසිදුරු ආදි බවට නොපමුණුවා රක්නා

බැවින් සීලයෙන් යුක්ත වූවෙක් වන්නේය. මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ විවරණ ප්‍රකාශ කළ සේක. ඔහු මෙසේ පැමිණි අර්හත්ඵල ඇත්තේ එක් දවසක් විවේකස්ථානයෙහි හුන්නේ සොම්නස් වශයෙන් එවං රකඛි මහාමුනි ආදිය කීය. එය පහසුවෙන් දතහැක්කේ මය.

රාහුල තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි

3.17

පදුමුත්තරං භගවනතං ආදි වශයෙන් ආයුෂ්මත් උපසෙන වංගනත-පුත්‍ර තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තැන නිවනට හේතුවූ පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනය අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක පහදවන්නවුන් අතර අගතන්හි තබනු දැක ප්‍රාර්ථනාවක් කොට එම තනතුර පතා දිවි ඇතිතාක් කුසල්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මෙම බුද්ධෝත්පාද කාලයෙහි නාග නම් ගමෙහි රූපසාරී නම් බැමිණිය කුස උපන්නේය. ඔහුට උපසෙන යනුවෙන් නමක් විය. ඔහු වැඩිවිය පත්වූයේ වේදත්‍රය ඉගෙන ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි ධර්මය අසා ලැබූ ශ්‍රද්ධා ඇත්තේ පැවිදිව උපසම්පදාවෙන් එක්වස් ඇත්තේ ඇදුරු පරපුර වර්ධනය කරමියි වෙනත් භික්ෂුවක් තමා සමීපයෙහි උපසම්පදා කොට ඔහු සමග ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස්, ශාස්තෘන් වහන්සේ ඒ වස් නැති භික්ෂුවගේ සද්ධිවිහාරික භාවය අසා 'හිස් පුරුෂය, තෝ පමණට වඩා ගියේවෙහිය. එය ඉතා පහත් යයි ගර්හා කරනු ලැබූයේ දැන් මම පිරිස හමුවෙහි ශාස්තෘන් වහන්සේ විසින් ගර්හා කරනු ලැබුවේ වෙමි. පිරිස හමුවෙහිම ශාස්තෘන් වහන්සේ පහන් කරන්නෙමියි විදර්ශනාව සඳහා කටයුතු කරන්නේ නොබෝ කලකින්ම රහත්බවට පත්විය. රහත්ව තමාම සියලු ධුත ධර්මයන් සමාදන්ව ජීවත් වෙයි. අන්‍යයන්ද ඒ සඳහා

සමාදන් කරවයි. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ඔහු සියල්ලන් පහදවන්නවුන් අතර අගතන්හි තැබූ සෙක.

ඔහු පසුකලෙක කොසඹෑ නුවර කලහය හටගත් කල භික්ෂු සංඝයාද දෙකට බෙදුණු කල, ඒ කලහය වර්ජනය කරනු කැමැති එක් භික්ෂුවක් විසින් 'දැන් කලහය ඇතිවී තිබේ. භික්ෂු සංඝයාද දෙකට බෙදුණේ වෙයි. අපි කෙසේ පිළිපදින්නමෝදැයි විචාරන ලද්දේ විවේක වාසයෙහි පටන් තම ප්‍රතිපත්තිය කීය. මෙසේ තෙරුන් වහන්සේ භික්ෂුවට ඔවදන් දෙන මුවාවෙන් තමාගේ කථාවට පිළිපන් බව පැහැදිලි කරන්නාහු රහත් බව ප්‍රකාශ කළහ. ඔහු මෙසේ පත්වූ අගතැන් ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොමනස් වශයෙන් පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරං භගවන්තං** ආදිය කීය.

මහා පබ්භාරම්හි නිසින්නං යනු ඉදිරියෙන් බරට **නමිතං** නැමුණේනුයි පබ්භාර නම්. විවේක කැමතිව වනමැද ඉබේ හටගත් පර්වත ගුහාවෙහි හුන් නරෝත්තම වූ භාග්‍යවතුන් වහන්සේ වෙත. **අහං උපගඤ්ඡිං** එළැඹියෙමි යන අර්ථයි. **කණිකාරං පුප්ඵිතං දිස්වා** යනු එසේ එළඹෙන්නේ ඒ පෙදෙසෙහි මනාසේ පිපුණු කිණිහිරි ගසක් දැක **වණ්ණං ජෙට්ඨානහං තං තදා** යනු ඔහු තථාගතයන් වහන්සේ දුටුකල ඒ මල **වණ්ණං** නටුවෙන් **ජෙට්ඨාන** කඩා. **අලංකරිත්වා ඡත්තමහි** යනු ඒ මලින් කුඩය අලංකාරකොට. **බුද්ධස්ස අභිරොපයිං** යනු ගුහාවෙහි හුන්නා වූ බුදුරජාණන් වහන්සේගේ හිසට ඉහළින් තැබුවෙමියි අර්ථයි. **පිණ්ඩපාතං ච පාදාසිං** යනු එහිම වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට පිණ්ඩපාතය වැළඳවූයෙමි යන අර්ථයි. **පරමන්නං** සොඳුරු බොජුන් සංඛ්‍යාත **පරමන්නං** උතුම් ආහාරය, **බුද්ධන නවමේ තහ්** යනු ඒ විවේකස්ථානයෙහි බුදුරජාණන් වහන්සේ සමග නවයක් වූ මහණුන් අටනමක් වූ පව් තවාහළ කෙලෙස් නැසූ භික්ෂූන් වැළඳවූයෙමි යන අර්ථයි. **යං වදන්ති සුමේධෝ** යනු මහා ප්‍රඥා ඇති පෘථිවි සමාන ප්‍රඥා ඇති සුමේධ සුන්දර ප්‍රඥා ඇති බැවින් ප්‍රඥාවන්ත වූ යම් ගෞතම සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ සුමේධ යයිද, සුන්දර ප්‍රඥා යයිද පඬිවරු කියති. මේ කලපයෙන් සියදහස්වැනි කල්පයෙහි මේ ගෞතම සම්‍යක් සම්බුදු රජාණන් වන සේක යන යම්බන්ධයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

උපසෙන වංගන්ත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.18

පදුමුත්තරස්ස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් රට්ඨපාල තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තන්හි තන්හි නිවනට හේතු වූ පින් රැස්කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පළමුවම හංසවතී නුවර මහාසාර කුලයෙක ඉපිද වැඩිවිය පත්වූවාහු පියාගේ ඇවෑමෙන් ගෘහවාසයෙහි පිහිටා රුවන් ගබඩාවෙහි කම්කරුවන් විසින් දක්වන ලද අප්‍රමාණ වූ පරම්පරාගත ධනය දැක මේ මෙපමණක් වූ ධනරාශිය මාගේ පියමුතුන් මිත්තන් ආදීහු තමා සමග ගෙන යන්ට නොහැකි වූහ. මා විසින් ගෙනයන්ට වටනේයයි සිතා දුගීමගීන්ට මහදන් දුන්හ. ඔහු එක් අභිඥාලාභී තාපසයකු කරා එළඹ ඔහු විසින් දෙව්ලොව අධිපති තනතුරෙහි නියුක්ත කරවනු ලැබූවාහු දිවි ඇති තෙක් පින්කොට එයින් චුතව දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් අනුභව කරන්නාහු එහි ආයුෂ ඇතිතාක් සිට එයින් චුතව මනුෂ්‍ය ලෝකයෙහි බිඳුණු රට දැරීමට සමර්ථ වූ කුලයෙක එකම පුත්‍රයා වී උපන්හ.

එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ලොව ඉපිද පවත්වන ලද උතුම් දම්සක් ඇත්තාහු හික්මවිය හැකි සත්වයන් නිර්වාණ මහා නගර සංඛ්‍යාත ක්ෂේමභූමියට පැමිණවූ සේක. ඉක්බිති ඒ කුලපුත්‍රයා අනුක්‍රමයෙන් දැනමිති බවට පත්වූයේ එක් දවසක් උපාසකයන් සමග වෙහෙරට ගොස් ශාස්තෘන් වහන්සේ දම්දෙසනු දැක පහන්වූ සිත් ඇත්තේ පිරිස් කෙළවර හුන්නේය. එසමයෙහි ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ශ්‍රද්ධාවෙන් පැවිදිවූවන් අතර අගතන්හි තැබූ සේක. ඔහු එය දැක පහන්වූ සිත් ඇත්තේ සියදහසක් භික්ෂූන් පිරිවරාගත් භාග්‍යවතුන් වහන්සේට සත්දිනක් මහදන් දී ඒ තනතුර ප්‍රාර්ථනා කළේය. ශාස්තෘන් වහන්සේ අන්තරායකින් තොරව එම පැතුම ඉටුවන බව දැක මේ තෙමේ අනාගතයෙහි ගෞතම නම් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි ශ්‍රද්ධාවෙන් පැවිදි වූවන් අතර අග්‍ර වන්නේ යයි විවරණ දුන් සේක. ඔහු ශාස්තෘන් වහන්සේද භික්ෂු සංඝයාද වැඳ ගියේය.

මෙසේ දිවිඇතිතෙක් පින්කොට එයින් චුතව දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මින් අනුදෙවැනි කල්පයෙහි ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ශාස්තෘන් වහන්සේගේ වෛමාත්‍රක රාජපුත්‍රයන් ශාස්තෘන්

වහන්සේට උපස්ථාන කරන කල්හි පුණ්‍යක්‍රියාවලදී සහායව කටයුතු කළේය. මෙසේ භවයෙහි තැනින් තැන බොහෝ කුසල් රැස්කොට සුගතීන්හිම සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කුරුරට ථුල්ලකොට්ඨිත ගමෙහි රට්ඨපාල සිටුවරයාගේ ගෙහි උපන්නේය. එහි බිඳුණුරට දැරීමට සමර්ථ වූ කුලයෙක උපන් බැවින් රට්ඨපාලයයි පරම්පරානුගත නමක්ම විය. ඔහු මහපිරිවරින් වසන්නේ අනුක්‍රමයෙන් යොවුන් බවට පත්වූයේ මාපියන් විසින් සුදුසු බිරිඳක සමග සංභෝග කරනු ලැබුයේ මහත්වූ යසඉසුරෙහි පිහිටවනු ලැබුයේ දිව්‍ය සම්පත් හා සමාන සම්පත් අනුභව කරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කුරුරටෙහි ජනපදචාරිකාවෙහි හැසිරෙන සේක් ථුල්ලකොට්ඨිත නියම්ගමට වැඩමකළ සේක. ඒ අසා මහා රට්ඨපාල කුලපුත්‍රයා ශාස්තෘන් වහන්සේ කරා එළඹ උන්වහන්සේගේ ධර්ම දේශනය අසා ලැබූ ශ්‍රද්ධාව ඇත්තේ පැවිදිවනු කැමැත්තේ සත්වරක් උපවාසකොට මහත් අසීරුවෙන් මව්පියන් අනුදන්වා ශාස්තෘන් වහන්සේ කරා එළඹ පැවිද්ද ඉල්ලා ශාස්තෘන් වහන්සේගේ අණින් අන් කෙනකු සමීපයෙහි පැවිදිව යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන්නේ විදර්ශනා වඩා රහත්බවට පත්විය.

රහත්බවට පත්ව ශාස්තෘන් වහන්සේ අනුදන්වා මව්පියන් දක්නට ථුල්ලකොට්ඨිත ගමට ගොස් එහි ගෙපිළිවෙළින් පිඬුසිඟා යන්නේ පියාගේ ගෙහි පිළිණු වූ යව අහර ලැබ අමාවක් මෙන් වළඳන්නේ පියා විසින් නිමන්ත්‍රණය කරනු ලැබුයේ හෙට පිණිස දන් ඉවසා දෙවැනි දවසෙහි පියාගේ නිවසෙහි පිණ්ඩපාතය වළඳා අලංකාර කර පිළියෙල කරන ලද අන්තඃපුර ජනයා වෙත ගොස් 'ආර්යපුත්‍රය, ඔබ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නේ කෙබඳු අප්සරාවන් සඳහාදැ'යි ආදිය කියා පොළඹවා ගැනීමක් කරන්ට පටන් ගත්විට ඇයගේ අදහස විපරිවර්තනය කරන්නේ අනිත්‍යාදී යුක්ත ධර්මය කියන්නේ:

පස්ස චිත්තකතං බිම්බං
අරුකායං සමුස්සිතං
ආතුරං බහු සංකප්පං
යස්ස නත්ථි ධුවං ඨිති

බලව විසිතුරු කෙරුණු සැකිලිය
නැගුණු හොරිවණයෙන් යුත්
ලෙඩවුවද බොහෝ සිතිවිලි ඇත
නොතිරය පැවැත්මක් නැත

පසස චිත්තකතං රූපං
මණිනා තුණ්ඩලෙන ච
අධිත්තවෙන ඔනද්ධං
සහ වත්ථෙහි සොභති

බලව විසිතුරු කෙරුණු රූපය
මිණියෙන් හා කොඬොලින්ද
ඇටෙන් හමෙන් වැසිණි
හැඳිවතින් නම් හොබනේ

අලත්තක කතාපාදා
මුඛං චුණ්ණක මකඛිතං
අලං බාලසස මොහාය
නොච පාර ගවෙසිනො

පාදයෝ ලතු ගෑ
මුහුණ වත්සුණු ගෑ
මෝහයෙන් අඳබාලයා හට මිස
නිවන් සොයනහුට එය නොහොඳී

අධ්‍යපාද කතා කෙසා
නෙත්තං අඤ්ජන මකඛිතං
අලංබාලසස මෝහාය
නොචපාරගවෙසිනො

අටකට බෙදූ කෙස්
අඳුනින් අලෙව් දුන් ඇස්
මෝහයෙන් අඳ බාලයාට මිස
නිවන් සොයනහුට එය නොහොඳී

අඤ්ජනිව නවාචිත්තා
පූතිකායො අලංකතො
අලං බාලසස මොහාය
නොච පාර ගවෙසිනො

විසිතුරු නව අඳුන් බඳුනක් බඳු
කුණු කය හැඩදමා ඇති
මෝහයෙන් අඳ බාලයා හට මිස
නිවන් සොයනහුට එය නොහොබී

ඔදහි මිගවො පාසං
නාසාදාවාකරං මිගො
භුත්වා නිවාපං ගච්ඡාමි
කහැනෙතමිග බන්ධකෙ

මුවවැදි මළපුඩුව දැමුවද
මුවා එහි නොගැටියේ
ගොදුරු කා යමි මම
මුවවැදි හඬා වළපිත

අඡ්ඡිඳුපාසං මිගස්ස
නාසාදා වාකරංමිගො
භුත්වා නිවාපං ගච්ඡාමි
සොචනෙත මිග ලුද්දකෙ

මුව වැදි මළපුඩුව නොසිඳ
මුවා එහි නොගැටී යේ
ගොදුරුකා යමි මම
වැද්දා සෝක වද්දී

මේ ගාථා කීය. මේ ගාථා කියා අහසට පැන නැගී කොරව්‍ය රජුගේ මිගාචීර වනෝද්‍යානයෙහි මගුල් ගල් තලාවෙහි හුන්නේය. තෙරුන් වහන්සේගේ පියා දොරටු සතෙහි අඟුලු දම්මවා රාජ පුරුෂයින්ට මෙසේ අණ කළේය. 'නික්මෙන්ට නොදෙවු. කහසිවුරු හරවා සුදු රෙදි අන්දවවු. ඒ නිසා තෙරුන් වහන්සේ අහසින් වැඩි සේක. ඉක්බිති කෝරව්‍ය රජතුමා තෙරුන් එහි හුන් බව අසා උන්වහන්සේ කරා එළඹ, පින්වත් රට්ඨපාලයෙනි, පැවිදිවන්නේ ව්‍යාධියෙන් පිරිහීමක් හෝ ජරාජාති භෝග ඥාති පරිහානියක් හෝ විචාරන ලද්දේ පැවිදිවෙයි. ඔබ වනාහි කිසිදු පරිහානියකට නොපැමිණම කුමක් නිසා පැවිදි වූයෙහි දැයි ඇසීය. ඉක්බිති තෙරුන්

වහන්සේ ඔහුට ලෝකය මෙසේ පෙන්වා දෙනු ලබයි. ලෝකය නොතිරය. ලෝකය ආරක්ෂාවක් නැත. ලෝකය වූ කලී නායකයෙක් නැත්තකි. ලෝකය අනියතය. සියල්ල අත්හැර යායුතුය. ලෝකය අඩුපාඩු ඇත්තකි. අතෘප්තිමත්ය. තෘෂ්ණාවට දාසය. මෙම සතර සමුද්දේසයන් තමා දත් බව කියා එම දේශනාවට දෙවැනිව කියන්නේ.

පසසාමි ලොකෙ සධනෙමනුසෙස
ලද්ධා විතතං න දදනති මොහා
ලුද්ධා ධනං සනිචයං කරොනති
භීයොව කාමෙ අභිපත්ථයනති

ලොවෙහි දන ඇත්තවුන් දක්නෙමි
දනය ලැබ මෝහෙන් නොදෙත් ඔහු
ලොබ බැඳ දන රැස් කෙරෙති
තවතවත් කාමයන් පතමින්

රාජා පසය්හා පථවිං ජිනිත්වා
ස සාගරනතං මහිමාවසනෙතා
ඔරං සමුද්දස්ස අනිතත රූපෝ
පාරං සමුද්දස්ස පි පත්ථයෙථ

රජ තෙමේ බලයෙන් පොළොවදිනා
මුහුදු තෙරටම දෙරණ වසමින්
සමුදුරු මෙතෙරින් නොසෑහී
සමුදුරින් එතරද පතයි

රාජාව අඤ්ඤව බහු මනුසසා
අවිත තණහා මරණං උපෙනති
ඌනා ව හුත්වාන ජහන්ති දෙහං
කාමෙහි ලොකමහි නහත්ථි තිත්ති

රජද අන් බොහෝ මිනිස්සුද
තණ්හාවෙන් යුතුවම මියැදෙත්
නුපුන් මනදොළින් සිරුර හැරයති
කාමයන්ගෙන් නොමැත ලොව සෑහීමක්

කහනති නං ඤාතිපරිකිරිය කෙසෙ
අහො වතා නො අමරාති වාහු
වත්ථෙන නං පාරුතං නීහරිත්වා
චිතකං සමාදාය තකොඩහන්ති

කෙහෙවලු කඩා නෑයෝ හඬති ඔහු ගැන
අපේ නෑයෝ අමර වෙන්වයි
රෙදිකඩින් පෙරවූ ඔහු ගෙන ගොස්
සෑයෙහි තබා අළුකරත්

සොඩයහති සූලෙහි තුජ්ජමානො
එකෙන වත්ථෙන පහාය භොගෙ
නමීයමානසස භවනති තාණා
ඤාතීධ මිත්තා අථවා සහායා

නුලින් ඇනි ඇනි හේ දැවී යයි
බෝගයන් හැර එක්වතින් පමණක්
මියැදෙන ඔහුට හවිහරණක් නොවෙති
නෑයෝ මිතුරෝ සහායකයෝ

දායාදකා තසසධනං හරනති
සත්තා පන ගච්ඡති යෙන කම්මං
න මීයමානං ධන මත්ථෙති කඤ්චි
පුත්තාච දාරාච ධනං ච රට්ඨං

ඔහුගේ දනය ගෙනයති හිමිකරුවෝ
සත්වයා නම් කළකම් අනුවයේ
මියැදෙන්නාහු අනුව පසුපසින් යන
අඹුදරු දන රට කිසිවක් නැත්තේය

නදීසමායුං ලහතෙ ධනෙන
නචාපි විත්තෙන ජරං විහන්ති
අප්පඉදං ජීවිතමාහු ධීරා
අසසසතං විපරිනාම ධමමං

දනයෙන් නොලැබේ දිගු අවි
දනයෙන් දිරුම නොනැසේ
දිවිය කෙටියයි සදානන නැනැයි
වෙනස්වන සුලුයයි කියති පඬුවෝ

අඩඪා දළිද්දා ච ඵුසනති එසසං
බාලොව ධීරොව තථෙව පුථෙථා
බාලොහි බාල්‍යාවධිතොවසෙති
ධීරොව නා වෙධති එසසඵුථෙථා

දනවත්තුද දිළින්දෝද පහස විඳිති
මෝඩයාද නැණවතාද එසේමය
මෝඩයා මෝඩකමින්ම හොවී
නැණවතා පහස ලැබ නොසැලේ

තසමාහි පඤඤාව ධනෙන සෙය්‍යා
යාය වොසානමිධාධි ගච්ඡති
අව්‍යාධිතතතා හි භවාභවෙසු
පාපානි කම්මානි කරොනති මොහා

එහෙයින් නුවණම දනයට වඩා යෙහෙකී
එයින් ලොව කෙළවරට යාහැකි
බාදක නැති බැවින් බවයෙහි කුදුමහත්
මෝහෙන් කරති පව්කම්

උපෙති ගබභඤච පරඤච ලොකං
සංසාර මා පජ්ජ පරංපරාය
කසසපප පඤඤා අභිසදදහනෙතා
උපෙති ගබභඤච පරඤච ලොකං

මව්කුසට පරලොවට එළඹෙයි
පැමිණ යළි යළි සසරට
පව්කම් අදහන මඳනුවණ ඇත්තේ
මව්කුසට පරලොවට එළඹෙයි

චොරෝ යථා සඤ්ඡිමුබෙ ගහීතෝ
සකම්මනා හඤ්ඤති පාපධම්මෝ
එවං පජා පෙච්ච පරම්හි ලොකෙ
සකම්මනා හඤ්ඤති පාපධම්මෝ

ගෙවල් බිඳුමෙහි ගත් සොරකු මෙන්
තමා කරගත් පව්කමින් වදවේ
මෙසේ පරලොව පැමිණි ජනයා
තමා කරගත් පව්කමින් වද වේ

කාමාහි චිත්‍රා මධුරා මනොරමා
විරූප රූපෙන මථනති චිත්තං
ආදීනවං කාමගුණෙසු දිසවා
තසමා අහං පබ්බජිතොම්හි රාජ

මහරජ කාමයෝ විසිතුරුය මදුරය මනහරය
අළලයි සිත නානා රූපයෙන්
කාමගුණයෙහි ආදීනව දැක
පැවිදිබව ලැබුවෙමි මම

දුමපඵලානෙව පතන්ති මානවා
දහරාච වුද්ධාච සරීරභෙදා
එවම්පි දිසවා පබ්බජිතොම්හි රාජ
අපණ්ණකං සාමඤ්ඤමෙව සෙය්‍යා

මිනිස්සු ගසක ගෙඩි මෙන් බිම පතිත වෙති
සිරුර බිඳුමෙන් තරුණෝද වැඩිහිටියෝ
මෙදැක මහරජ පැවිදි වූයෙමි මම
නිසැක මහණුවම යෙහෙකි මට

සද්ධාය පබ්බජිතොම්හි
උපෙතෝ ජින සාසනෙ
අවඤ්ඣා පබ්බජ්ජා මයහං .
අනණෝ භුඤ්ජිං භොජණං

සැදැහැයෙන් පැවිදිව
එළැඹියෙමි බුදුසසුනට
නොවඳය පැවිදි බව මා
ණය නැතිව වැළඳීමි අහර

කාමෙ ආදිනතතො දිසවා
ජාතරූපෙ අසනතතෙ
ගබහ වොකබනතිනො දුකබං
නිරයෙසු මහබභයා

කාමයන් ඇවිලි ගිනි මෙන්ද
මිලමුදල් අවි මෙන්ද දුටුවෙමි
ගැබ පිළිසිඳ ගැනුමෙහි පටන් දුක්ය
නිරයෙහි මහබියක් ඇත

එවමාදීනවං ඤතවා
සංවේගං අලහිංතදා
සොකවිදධා සදා සනෙතා
සමපතෙතා ආසවකබයං

මෙබඳු ආදීනව දැක
එකල සංවේගය ලැබ
සෝකයෙන් විදිනු ලැබුවෙමි
රහත් බවට සපැමිණියෙමි

පරිවිණණා මයා සතථා
කතං බුදධසස සාසනං
වොහිතො ගරුකො භාරො
භවනෙතනි සමූහතා

බුදුරදුන් ඇසුරුකොට
අවවාද පිළිපැදියෙමි
ගුරුබර තබා බිම
තණ්හාව වැනසුයෙමි

යසසත්‍ථාය පබ්බජිතෝ
අගාරසමා අනගාරියං
සොමෙ අත්‍ථෝ අනුප්පත්තෝ
සබ්බ සඤ්ඤොජනක්ඛයා

යමකට පැවිදි වූයෙමි
ගිහිගෙන් නික්ම සසුනෙහි
එම අරුතට පැමිණියෙමි
සියලු සංයෝජන නසා

මේ ගාථා කීය. මෙසේ තෙරුන්වහන්සේ කෝරව්‍ය රජුට දහම් දෙසා ශාස්තෘන් වහන්සේ සමීපයටම ගියාහු ශාස්තෘන් වහන්සේද පසුකලෙක ආර්ය සංඝයා මැද හුන් සේක්. තෙරුන් වහන්සේ ශ්‍රද්ධාවෙන් පැවිදි වූවන් අතර අගතන්හි තැබූ සේක. මෙසේ තෙරුන් වහන්සේ පැමිණි අගතැන් ඇත්තාහු පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පෙර චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තරස්ස භගවතෝ** ආදිය කීහ.

වරනාගෝ මයා දිනෙනා යනු ඒ භාග්‍යවතුන් වහන්සේගේ රූප කායෙහි පැහැදී **වරෝ** උත්තම ශ්‍රේෂ්ඨ. **ඊසාදනෙනා** රථර්ශාවක් බඳු දත් ඇත්තේ. **උරුළහවා** යුද්ධයෙහි දක්ෂ වූ රජුට සුදුසු **සෙතච්ඡත්තෙනාප සොභිතෝ** යනු ඇත් බඳෙහි ඔසවන ලද සේසතින් සෙවුණේ බබලන්නේ. යළිත් වරනාගයා කවර විශිෂ්ටත්වයක් ඇත්තෙක්ද? **සකපපනෝ** හස්ති අලංකාර සහිතය. **සංඝාරාමං** බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට වසනු පිණිස **ආරාමං** විහාරයක් **කාරයිං** කෙළෙමි. **චතුපඤ්ඤාස සහස්සානි** යනු ඒ කරවන ලද විහාරය ඇතුළත පනස්සතර දහසක් ප්‍රාසාදයන්ද මම **අකාරයිං** කරවූයෙමි යන අර්ථයි. **මහොසඤ්ච කරිත්වාන** යනු සියලු පිරිකර සහිත මහෝඝයක් බඳු මහදනක් සදවා. **මහෙසිනෝ** මුනීන්ද්‍රයන් වහන්සේට පැවරුවෙමි යන අර්ථයි. **අනුමොදි මහාවීරෝ** යනු අසංඛ්‍යෙය්‍ය කල්ප සතර ලක්ෂයක් නොකැඩුණු උත්සාහ සංඛ්‍යාත වීර්යයෙන් මහාවීර නම්. **සයම්භූ** තමාම හටගත් උපන්. ලැබූ සර්වඥතාඥාන ඇතිසේක් අගෙහා ශ්‍රේෂ්ඨ පුද්ගලයා. **අනුමොදි** විහාර අනුමෝදනාව කළ සේක. **සබ්බෙජනෙ හාසයනෙනා** යනු සියලු අනන්ත අපරිමාණ දෙවි මිනිසුන් හාසයනෙනා සතුටු කරන්නේ. අමාමහ නිවන ඇතුළත්වන චතුරාර්ය සත්‍ය ධර්ම

දේශනය දෙසෙසි ප්‍රකාශ කළ සේක. අනාවරණය කළ සේක. විභජනය කළ සේක. පැහැදිලි කළ සේක යන අර්ථයි. **තමෙහ වියාකාසි** යනු ඒ මාගේ කළපින් පලය විශේෂයෙන් ප්‍රකට කළ සේක. **ජලජුත්තමනාමකො** යනු ජලයෙහි උපන්නේ ජලජ නම්. **ජලජ** පියුම. පදුමුත්තර යන අර්ථයි. ජලනුත්තම නායකො යනුවෙන්ද පාඨයක් ඇත. තමා අභිබවා දිලිසෙතියි **ජලනා** චන්ද්‍ර සූර්ය දේව බ්‍රහ්මයෝ. ඒ දිලිසෙන්නවුන් අතර උතුම් වූයේ ජලනුත්තම නම්. සියලු සත්වයන්ට නායක **උත්තමො** යනු නායක. හේතුසම්පත් ඇති සත්වයන් නිවනට ගෙනයයි පමුණුවයි හෝ නායක නම්. ජලනුත්තම වූයේද නායක වූයේද හේ ජලනුත්තම නායක නම්. **භික්ඛුසංඝෙ නිසිදිත්වා** යනු භික්ෂු සංඝයා මැද හුන් සේක් **ඉමාගාථා** අභාසථ ප්‍රකට කොට කී සේක යන අර්ථයි. සෙස්ස නොගැඹුරු වේමැයි.

රථපාල තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.19

පබභාරං සොධයනතසස යනාදි වශයෙන් ආයුෂ්මත් සෝපාක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවූ පින් රැස්කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තරා කෙළෙඹියකුගේ පුතුයෙක්ව උපන්නේය. එක් දවසක් ශාස්තෘන් වහන්සේ දැක බීජයන්ගෙන් පිරුණු පලතුරු ශාස්තෘන් වහන්සේට පිළිගැන්වීය. භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාව නිසා වැළඳූ සේක. ඒ භික්ෂුව ශාස්තෘන් වහන්සේ කෙරෙහිද සංඝයා කෙරෙහිද අතිශයින් පහන් වූයේ සලාක දන් පිහිටුවා සංඝයා උද්දේශ වශයෙන් භික්ෂූන් තුන්නමකට දිවි ඇති තෙක් කිරිබත් දුන්නේය. ඔහු ඒ පින් නිසා දෙවි මිනිසුන් අතර සම්පත් අනුභව කරන්නේ එක්කලෙක මනුෂ්‍ය යෝනියෙහි උපන්නේ එක් පසේ බුදුවරයකුට කිරිබත් දුන්නේය. මෙසේ තන්හි තන්හි පින්කොට සුගතියෙහි පමණක් සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි පෙර කළ කම් හේතුවෙන් සැවැත්නුවර එක්තරා දුප්පත් ස්ත්‍රියකගේ කුස පිළිසිඳ ගත්තේය. ඇය ඔහු දසමසක් කුසින් දරා ගැබ මුහුකුරා ගිය කල්හි වදනකල වදන්ට

නොහැකි වන්නී මූර්ඡාවට පැමිණ බොහෝ වේලාවක් මළාක් මෙන් වැදහොත්තීය. ඥාතීහු මළායයි හැඟීමෙන් සොහොනට ගෙනගොස් චිතකයට නගා දෙවියන්ගේ අනුභසින් නැගුණු වාත වර්ෂාවෙන් ගිනි නොදී ගියාහුය. දරුවා පශ්චිම භවික වූ බැවින් දෙවියන්ගේ අනුභසින්ම නිරෝගීව මව්කුසින් නික්මියේය. මවනම් කලුරිය කළාය. දෙවියෝ මිනිස් වෙසින් පැමිණ ඔහු ගෙන සොහොන් ගොව්වාගේ ගෙහි තබා කිහිප දිනක් සුදුසු අහරින් පෝෂණය කළහ. එතැන් පටන් සොහොන් ගොව්වා තමාගේම පුත්‍රයා කොට වර්ධනය කළේය. ඔහු එසේ වැඩෙන්නේ ඔහුගේ පුත්‍ර වූ සුප්‍රිය නම් දරුවා සමග ක්‍රීඩා කරන්නේ හැසිරුණේය. ඔහුට සොහොනෙහි ඉපදී වැඩුණු බැවින් සෝපාක නම් අනවර්ථ නාමයක් විය.

ඉක්බිති එක්දවසක් භාග්‍යවතුන් වහන්සේ උදෑසන වේලාවෙහි ඥාන ජාලය පතුරුවා හික්මවිය යුතු බන්ධූන් බලනසේක් එම දරුවා ඥාන ජාලයෙහි අන්තර්ගත වූ බව දැක එම සොහොන් පොළට වැඩි සේක. දරුවා පූර්ව හේතුවෙන් මෙහෙයවනු ලබන්නේ පහන් වූ සිත් ඇත්තේ ශාස්තෘන් වහන්සේ කරා එළඹ සිටියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට ධර්මය දෙසූ සේක. ඔහු ධර්මය අසා පැවිද්ද ඉල්ලා, පියා විසින් අනුදන්නා ලද්දේදැයි කියන ලද්දේ පියා ශාස්තෘන් වහන්සේ සමීපයට කැඳවාගෙන ආවේය. ඔහුගේ පියා ශාස්තෘන් වහන්සේට වැඳ මේ දරුවා පැවිදි කරනු මැනවැයි අනුමත කළේය. ඔහු පැවිදිකොට භාග්‍යවතුන් වහන්සේ ඔහු මෛත්‍රී භාවනාවෙහි නියුක්ත කළ සේක. ඔහු මෛත්‍රී කර්මස්ථානය ගෙන සොහොනෙහි වෙසෙන්නේ නොබෝ කලකින්ම මෛත්‍රී ධ්‍යානය උපදවා ධ්‍යානය පාදකකොට විදර්ශනා වඩා රහත් බව සාක්ෂාත් කළේය. රහත්ව අනිකුත් සුසානයෙහි වෙසෙන භික්ෂූන්ට මෛත්‍රී භාවනා විධිය දක්වන්නේ **යථාහි එකපුත්තසමිං** යන ගාථාව කිවේය. මෙය කියන ලද්දේ වෙයි. යම්සේ ප්‍රියමනාප වූ එකම පුත්‍රයා කෙරෙහි මව පියා යහපත කැමතිව ඒකාන්ත හිතෙෂී වන්නේද, එසේම පෙරදිග ආදී භේද ඇති සියලු දිසාවලද කාමභව ආදී භේද ඇති සියලු භවයන්හිද දහර ආදී භේද ඇති සියලු අවස්ථාවල ද සිටි සියලු සත්වයන් කෙරෙහි ඒකාන්ත හිතෙෂී භාවය නිසා යහපත කැමති වන්නේ ය. මිත්‍රයෙක් ය, උදාසීන වූවෙක් ය, සතුරෙක් ය යන සීමාවක් නොකොට සීමා බිඳීම් වශයෙන් සියලු තැන එකම රසයක් ඇති මෙත් වඩවූ. භාග්‍යවතුන් වහන්සේ විසින් 'සුබංසුපති' ආදී වශයෙන් මෛත්‍රියෙහි එකොළොසක් අනුසස් වදාළ සේක් එබැවිනි. ඒකාන්තයෙන් එයින් ඒවාට කොටස්කරුවෝ

වවු යයි අවවාද දුන්නේ ය. මෙසේ පැමිණි ඵලාවබෝධ ඇත්තේ තමා කළ පුණ්‍ය කර්මය නැවත මෙනෙහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය දක්වන්නේ **පබභාරං සොධයනතසස** ආදිය කීය.

එහි **පබභාරං** යනු ගල් පර්වතයෙහි විවේකස්ථානයයි. පැවිද්දන්ට සුදුසු බැවින් ගඩොල් ප්‍රාකාරයක් කොට දොරකවුළුවක් යොදා භික්ෂූන්ගේ වාසය පිණිස දුන්නේය. ප්‍රකාරයෙන් බර පැතිය යුත්තේනුයි පබභාර නම්. එය පිරිසිදු කරන්නා වූ මාගේ සමීපයට සිද්ධාර්ථ නම් භාග්‍යවතුන් වහන්සේ ආගසූහි වැඩි සේක. බුදුඩං උපගතං දිසවා යනු මෙසේ මාගේ සමීපයට පැමිණි භාග්‍යවතුන් වහන්සේ දැක. **තාදිනො** ඉෂ්ට අනිෂ්ට අකම්පිත ස්වභාව ඇති බැවින් තාදි ගුණයෙන් යුතු ලෝකජ්‍යෙෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේට. **සතථරං** තණකොළ ආදි ඇතිරිල්ලක්. දර ඇතිරිල්ලක් **පඤඤාපෙතවා** නිමවා **පුපඵාසනං** මලින් තැනූ ආසනයක් මම දුනිමි. **පුපඵාසනෙ නිසීදිතවා** ඒ පැනවූ මල් අසුනෙහි හිඳ. **ලොකනායකො** සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ. **මම ච ගතිමඤඤාය** යනු මාගේ ගතිං මත්තෙහි උපදින ස්ථානය **අඤඤාය** දැන, **අනිචචතං** අනිත්‍ය බව. උදාහරි කී සේක. **අනිචචාවත සංඛාරා** යනු **වත** ඒකාන්තයෙන් සංඛාරා ප්‍රත්‍යයන් සමෙවෙව එකතුව කරනු ලබන සියලු ප්‍රත්‍ය සහිත ධර්ම. ඇතිවී අභාවයට යන බැවින් **අනිචචා** නම්. **උපපාදවයධම්මිනො** යනු උපදී විනාසවන ස්වභාව ඇත්තෝය. **උපපජජිතවා** පහළවී මේ සංස්කාර **නිරුජඣනති** විනාශ වෙයි යන අර්ථයි. **තෙසං වූපසමො සුඛො** යනු ඒ සංඛාරයන්ගේ විශේෂයෙන් සංසිඳීම සැපයෙකි. ඒවා සංසිඳුවන නිර්වාණයම ඒකාන්ත සැපයෙකි යන අර්ථයි. **ඉදංවත්‍ථාන සබබඤඤූ** යනු සියලු ධර්මයන් දන්නා භාග්‍යවතුන් වහන්සේ ලෝකසත්වයන්ට ජ්‍යෙෂ්ඨ වූ සේක් වෘද්ධ වූ සේක් නරයන්ට **ආසභො** ප්‍රධාන වීර පුරුෂයා මේ අනිත්‍ය ප්‍රතිසංයුක්ත වූ ධර්ම දේශනාව **වත්‍වාන** කියා **අම්බරෙ** අහසෙහි හංසරාජාව්ව හංසරාජයකු මෙන් **නභෙ** අහසෙහි නැගුණේය යන සම්බන්ධයි. **සකං දිට්ඨිං** තමාගේ ලබ්ධිය **ඛනතිං** රුචිය අධ්‍යාශය **ජහිත්‍වාන** හැර. **භාවයං නිචචසඤඤතං** යනු අනිත්‍යයෙහි අනිත්‍යයයි පැවති සංඥාව මම **භාවයිං** වැඩුවෙමි. සිහිකෙළෙමි. **තත්‍රාකාලකතො අහං** යනු එහි ඒ ජාතියෙහි ඒ ජාතියෙන් මම කලුරිය කළෙමි. චුතවීමි. දෙව **සම්පතති අනුභොත්‍වා** යනු මනුෂ්‍ය සම්පත්ති දිව්‍ය සම්පත්ති සංඛ්‍යාත වූ ද්විවිධ සම්පත්ති අනුභවකොට **සුකත මූලෙන චොදිතො** යනු පුරාණ කුසල මූලයෙන්, මූලභූත වූ කුසලයෙන්, චොදිතො මෙහෙයවන ලද්දේ. **පච්ඡිම භවෙ සම්පතතෙ** යනු අවසාන භවය **සම්පතත** පැමිණි කල.

සපාකං යොනුපාගමිං යනු තමා පිසූ බත. **සපාකංයොනිං උපාගමිං** යම් කුලයක තමා පිසූ බත අනුන් විසින් නොකෑ යුතුද ඒ සැඩොල් කුලයෙහි උපන්නේ වෙමි යන අර්ථයි. නැතහොත් **සා** යන්නෙන් කියැවෙන්නේ සුනඛයාය. සුනඛයා ඉඳුල් කළ බත් බුදින සැඩොල් කුලයෙහි උපන්නේ වෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සොපාක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.20

ආනුනිං යිටඨුකාමො යනාදි වශයෙන් ආයුෂ්මත් සුමංගල තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මත් පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස් කරන්නේ පියදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි රුක් දෙවියෙක් ව උපන්නේය. ඔහු එක් දවසක් ශාස්තෘන් වහන්සේ පැන් සනහා එක් සිවුරක් ඇතිව සිටිනු දැක සොම්නසට පැමිණියාහු අත් පොළසන් දුන්නේය. ඔහු ඒ පිනින් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවරට නුදුරෙහි එක්තරා ගමක එබඳුම කර්ම හේතුවෙන් දිළිඳු කුලයෙක උපන්නේ ය. ඔහුට සුමංගල යයි නමක් විය. ඔහු වැඩිවිය පත්වූයේ පිහියා කඩු නගුල් උදලු පිරිකර ඇත්තේ ව කෘෂිකර්මයෙන් ජීවිකාව කළේය.

එක් දවසක් ප්‍රසේනජිත් කෝසල රජු විසින් භාග්‍යවතුන් වහන්සේටද භික්ෂු සංඝයාටද මහදන් පවත්වනු ලබන කල්හි දාන උපකරණ ගෙන එන්නා වූ මිනිසුන් සමග දීකිරි කළයක් ගෙන පැමිණියේ, භික්ෂූන්ට කෙරෙන සත්කාර සම්මාන දැක මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සියුම් වස්තු හැඳ සුබොජුන් වළඳ නිසංසල සෙනසුන්හි වසති. මමත් පැවිදි වී වළඳන්නෙමි නම් මැනවැයි සිතා එක්තරා මහතෙර නමක් වෙත එළඹ තමාගේ පැවිදි වීමේ අදහස දැන්වීය. උන්වහන්සේ ඔහුට කරුණාව දක්වන්නාහු පැවිදිකොට කමටහන් ඇස්වූහ. ඔහු අරණෙහි වසන්නේ නුදෙකලාව විසීමේ කළකිරුණේ උකටලී වූයේ සිවුරු හැරීමට කැමැත්තේ

නැගමට යන්නේ අතරමග කැසපට බැඳ කිලිටි වස්ත්‍ර හැඳ හැමතින් දූවිලි වැකුණු සිරුරු ඇතිව වාතයෙන් අව්වෙන් සුසුම්ලමින් කෙත් හාන්නා වූ මිනිසුන් දැක මේ සත්වයෝ ජීවිතය සඳහා මහත් දුකක් විඳිතියි සංවේගය ලැබුවේය. ඥානය මුහුකුරා ගිය බැවින් ගත් කමටහන එළඹ සිටියේය. ඔහු එක්තරා රුක්මුලකට ගොස් විවේක ලැබ නුවණින් මෙනෙහි කරන්නේ විදර්ශනා වඩා මාර්ග පිළිවෙළින් රහත් බවට පැමිණියේය. මෙසේ ඔහු පැමිණි අර්හත්ඵල ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **ආහුතිං යිට්ඨුකාමොහං** යනාදිය කීය.

එහි **ආහුතිං** යනු ආහාරපානාදී අනේකවිධ වූ පූජා සත්කාරයන් සඳහා වූ උපකරණ. **යිට්ඨුකාමෝ** යනු යඥ කිරීමට කැමැත්තේ, දන්දෙනු කැමැත්තේ. **අහං පටියාදෙත්ථාන භොජනං** යනු අහර **පටියාදෙත්ථා** පිළියෙලකොට, **බ්‍රාහ්මණෙ පතිමානෙනෙතා** යනු පිළිගන්නා වූ පිරිසිදු පැවිද්දන් සොයන්නේ, **විසාලෙ මාලකෙ ඨිතො** යනු පිරිසුදු සුදු වැලිතලාවෙන් අබිරම් වූ විසල් මළුවෙහි සිටියේ. **අථද්දසාසිං සම්බුද්ධං** යනාදියෙහි **මයාසයං** මහත් පිරිවර ඇති. **සබ්බලොකං** සියලු සත්ව ලෝකය. **විනෙතාරං** විශේෂයෙන් **නෙතාරං** නිවනට පමුණුවන. **සයම්භූ** තමාම වූ ගුරුවරයකු නැති. **අගගපුග්ගලං** ශ්‍රේෂ්ඨ පුද්ගලයා. **භගවන්තං** භාග්‍යවන්ත ආදී ගුණයෙන් යුතු, **ජුතිමන්තං** නිලපීත ආදී ප්‍රභාසම්පන්න වූ සාවකෙහි පුරාණං පිරිවරන ලද. **ආදිච්චම්ව සූරියා** මෙන්. **විරොචන්තං** සෝභමාන වූ. **රථියං** වීදියෙහි. **පටිපන්නකං** වඩනා පියදස්සි නම් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දුටුවෙමියි සම්බන්ධයි. **අඤ්ජලිමපග්ගහෙත්වාන** යනු බැඳි ඇඳිලිය හිස්මුදුනෙහි කොට **සකංචිත්තං** තමාගේ සිත. **පසාදයිං** මෙසේ වූ භාග්‍යවතුන් වහන්සේගේ ගුණයෙහි. **පසාදෙසිං** පහන් කළෙමියි අර්ථයි. **මනසාව නිමනෙනසිං** යනු සිතින්ම පැවරුවෙමි. **ආගච්ඡතුමහාමුනී** යනු ගරුකරන ලද්දේ පූජාවට සුදුසු වූයේ **මුනී** භාග්‍යවතුන් වහන්සේ මගේ නිවසට වඩිනු මැනවි. **මම සංකප්පමඤ්ඤාය** යනු මාගේ චිත්ත සංකල්පය දැන. **ලොකෙ** සත්ව ලෝකයෙහි **අනුත්තරෝ** උසස් කෙනකු නැති ශාස්තෘන් වහන්සේ. **බීණාසව සහස්සෙහි** දහසක් රහතුන් විසින් පිරිවරන ලද සේක් **මම්දවාරං** මාගේ ගෙදොරට **උපාගමි** සම්ප්‍රාප්ත වූ සේක. එසේ සපැමිණි ශාස්තෘන් වහන්සේට මෙසේ නමස්කාර කළෙමි. **පුරිසාජඤ්ඤ** පුරුෂයන්ට **ආජඤ්ඤ** ශ්‍රේෂ්ඨය මාගේ නමස්කාරය. **තෙ** ඔබවහන්සේට **අත්ථු වේවා**. **පුරිසුත්තම** පුරුෂයන්ට **උත්තම** අධික ගුණයෙන්

විශිෂ්ට **තෙ** ඔබවහන්සේට මාගේ නමස්කාරය වේවා. **පාසාදං** ප්‍රසාද ජනක වූ මාගේ නිවසට වැඩ **සීහාසනෙ** උතුම් අසුනෙහි ඔබවහන්සේ වැඩහිඳිනු මැනවැයි අයැද සිටියෙමි යන අර්ථයි. **දනෙතා දනත පරිවාරෝ** යනු මාගේ තිදොරින් දැමුණේ, එසේ දැමුණු භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සංඛ්‍යාත සිව්වණක් පිරිස විසින් පිරිවරන **තිණෙණා තාරයතං වරෝ** යනු තමා **තිණෙණා** සංසාරයෙන් එගොඩ වූයේ නික්ම ගියේ **තාරයතං** එතෙර කරන්නා වූ විශිෂ්ට පුද්ගලයන්ට **වරෝ** උත්තම වූ භාග්‍යවතුන් වහන්සේ මාගේ ආරාධනයෙන් ප්‍රාසාදයට නැගී **පවරාසනෙ** උතුම් අසුනෙහි. **නිසීදි** වැඩහුන් සේක. **යං මෙ අත්‍ථි සකෙ** ගෙහෙ යනු තමාගේ ගෙහි **යං** ආමිසං පචුපටඨිතං සම්පාදනය කරන ලද රැස්කරන ලද යමක් ඇත්ද **තාහං** බුදුරජාණන් වහන්සේට හා බුදුපාමොක් සංඝයාට ඒ ආමිෂය **පාදාසිං** පිළිවෙළින් දුනිමි යන අර්ථයි. **පසනෙනා සෙසපාණිහි** යනු තමාගේ දැතින් පහන් සිත් ඇත්තේ ගෙන දුන්නෙමි යන අර්ථයි. **පසනනචිත්තෙනා** පහදවා ගත් සිත හා අදහස් ඇත්තේ **සුමනෝ** සොඳුරු සිත් ඇත්තේ. **වෙදජාතෝ** උපන් වෙදෝ උපන් සොම්නස් ඇත්තේ **කතඤ්ජලී** හිසෙහි තැබූ ඇඳිලි ඇත්තේ. **බුද්ධසෙට්ඨං නමසසාමි** ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේට ප්‍රණාමය කරමි යන අර්ථයි. **අහො බුද්ධසසුලාරතා** යනු අවබෝධ කරගත් චතුරාර්ය සත්‍ය ඇති ශාස්තෘන් වහන්සේගේ **උලාරතා** මහත්බව අහෝ ආශ්චර්යජනකයි යන අර්ථයි. **අඨයනනං පයිරුපාසනං** යනු ආශ්‍රය කරන්නා වූ **භඤ්ජං** වළඳන්නා වූ අට අරී පුගුලන් අතර **ඛීණාසවා** රහත් වූවෝම බොහෝ වෙති යන අර්ථයි. **තුයෙහ වෙසො ආනුභාවො** යනු මේ අහසෙහි ඇවිදීම - දියෙන් නැගීම - දියෙහි ගිලීම ආදී ආනුභාවය. **තුයෙහව** ඔබගේම ආනුභාවයයි. අනිකකුගේ නොවේ. **සරණනතං උපෙමහං** යනු ඒ එසේ වූ ඔබ **සරණං** ආරක්ෂක ස්ථානයයි, පිහිටයයි ඇලුම් කටයුතු ස්ථානයයි **උපෙමි** යමි දනිමි ද අර්ථයි. ලෝක ජ්‍යෙෂ්ඨ වූ නරයන්ට උතුම් වූ පියදසසි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා මැද හිඳ මෙම විවරණ ගාථා **අභාසථ** කියූ සේක යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

සුමංගල තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දෙවැනි සිංහාසන වර්ගයෙහි වර්ණනාව නිමියේය.

3.21

හිමවන්තසසාවිදූරෙ ආදි වශයෙන් ආයුෂ්මත් සුභූති තෙරුන් වහන්සේගේ අපදානය යි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ මෙම කල්පයට කල්ප සියදහසකට පෙර පදුමුත්තර භාග්‍යවත් ලෝකනාථයන් වහන්සේ නූපන් කල්හිම හංසවතී නුවර එක්තරා බමුණු මහසල් කුලයෙක එකම පුත්‍රයා වී උපන්නේය. ඔහුට නන්ද මාණවක යයි නමක් තැබූහ. ඔහු වැඩිවියපත්ව තුන්වේදය ඉගෙන එහි හරයක් නොදක්නේ තමාගේ පිරිවර වූ සතළිස්සතර දහසක් මාණවකයන් සමග පර්වත පාදයෙහි ඍෂි පැවිද්දෙන් පැවිදිව අටසමවත් හා පංච අභිඥා උපදවා ගත්තේය. අතවැසියන්ට ද කමටහන් කියා දුන්නේය. ඔවුහු ද නොබෝ කලෙකින් ධ්‍යානලාභීහු වූහ. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ලොව ඉපිද හංසවතී නගරය නිසා වාසය කරන සේක් එක් දවසක් උදෑසන කාලයෙහි ලොව බලන සේක් නන්ද තාපසයාගේ අතවැසියන්ගේ රහත් බවට උපනිශ්‍රය ඇති බව හා නන්ද තාපසයාගේ අංග දෙකකින් යුත් ශ්‍රාවක තනතුරට ඇති ප්‍රාර්ථනාව ද දැක උදෑසනම සිරුර පිළිදැගුම් කොට පෙරවරුයෙහි පාසිවුරු ගෙන අන් කිසිවකු නොඅමතා ඒකචර සිංහයකු මෙන් තාපසයාගේ අතවැසියන් පලවැල සොයා ගියකල්හි මාගේ බුදුබව දනීවායි බලා සිටියදී ම නන්ද තාපසයාගේ අසපුවෙහි අහසින් බැස පොළොවෙහි සිටි සේක. නන්ද තාපසයා බුද්ධානුභාවයත් ලක්ෂණයන්ගෙන් පිරිපුන් බවත් දැක ලක්ෂණ මන්ත්‍ර සිහිකොට මේ ලකුණින් යුත් පුද්ගලයා නම් ගිහිගෙයි වසන්නේ සක්විති රජ වෙයි. පැවිදි වන්නේ ලෝකයෙහි සර්වඥ බුදුවරයෙක් වෙයි. මේ ආජානේය පුරුෂයා නිසැකයෙන්ම බුදුන්වහන්සේ යයි දැන පෙරගමන් කොට පසඟ පිහිටුවා වැඳ අසුනක් පනවා දුන්නේ ය.

භාග්‍යවතුන් වහන්සේ පැනවූ අසුනෙහි වැඩහුන් සේක. තාපසයාද තමාට ගැළපෙන අසුනක් ගෙන එකත්පසෙක හුන්නේ ය. එකෙණෙහි සතළිස් සතර දහසක් ජටිලයෝ මිහිරි මිහිරි වූ ඕජාවත් වූ පලවැල ගෙන ආචාර්යවරයා සමීපයට පැමිණියාහු බුදුරජාණන් වහන්සේගේද ආචාර්ය වරයාගේද හුන් අයුරු බලා ඇසූහ. 'ආචාර්යයන් වහන්ස, අපි මෙලොව ඔබවහන්සේට වඩා වැඩි කෙනෙකු නැතැයි සිතුවෙමු. මේ පුරුෂයා වනාහි ඔබවහන්සේට වඩා වැඩි කෙනෙකැයි හඟිමු'යි. තාපසයා,

'දරුවෙනි, ඔබ අඹ ඇටයක් සමග අටසැටදහසක් යොදුන් උස මහාමේරුව සමකිරීමට කැමැත්තහුය, සර්වඥ බුදුවරයකු සමග මා සමාන නොකරවු' යයි කීය. ඉක්බිති ඒ තාපසයෝ යම්හෙයකින් මොහු පහත් කෙනෙක් වෙත්නම් අපගේ ආචාර්යවරයා මෙබඳු උපමාවක් නොගෙන එනු ඇත. මේ ආජානේය පුරුෂයා මහත් විය යුතුයයි පාමුල වැටී මුදුනින් වැන්දානුය. ඉක්බිති ආචාර්යවරයා ඔවුන්ට මෙසේ කීය. 'දරුවෙනි, අපට බුදුවරුන්ට යෝග්‍ය දියයුතු දෙයක් නැත. භාග්‍යවතුන් වහන්සේ ද පිඬු සිඟා වඩනා වේලාවෙහි මෙහි පැමිණි සේක. ඒ නිසා අපි අපගේ පමණට දියයුතු දෙයක් දෙමු. ඔබ විසින් යම් යම් මිහිරි මිහිරි වූ පලවැලක් ගෙන එන ලද්දේද ඒ ගෙනෙවයි ගෙන්වාගෙන තම අතින්ම දොවා තමාම තථාගතයන් වහන්සේගේ පාත්‍රයෙහි තැබීය. ශාස්තෘන් වහන්සේ පලවැල පිළිගත් කෙණෙහි දේවතාවෝ දිව්‍යඕජස් බැහුහ. තාපසයා ජලය ද තමා ම පෙරා දුන්නේය. ඉන් බොජුන් කිස නිමවා ශාස්තෘන් වහන්සේ හුන් කල සියලු අතවැසියන් කැඳවා ශාස්තෘන් වහන්සේ හමුවෙහි සිහිකටයුතු කථාවක් කරමින් හුන්නේ ය. ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා පැමිණෙවායි සිතූ සේක. ශාස්තෘන් වහන්සේගේ සිත දැන දහසක් පමණ රහතන් වහන්සේ පැමිණ ශාස්තෘන් වහන්සේ වැඳ සිටියහ. ඉක්බිති නන්ද තාපසයා අතවැසියන් ඇමතීය. දරුවෙනි, බුදුරජාණන් වහන්සේ වැඩසිටි අසුනද මිටිය. සියදහසක් ශ්‍රමණයන්ට ආසනයක්වත් නැත. අද ඔබ විසින් භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සංඝයාට උදාර සත්කාරයක් කරන්ට වටී. පර්වත පාදයෙන් වර්ණගන්ධ සම්පන්න මල් ගෙනෙවු යයි කීය. ඍද්ධි විෂයෙහි අචින්ත්‍ය බව නිසා ඔවුහු මොහොතකින් වර්ණ ගන්ධ සම්පන්න වූ මල් ගෙනවුත් බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයාට යොදුනක් පමණ මල් අසුනක් පැනවූහ. අගසව්වන්ට ගවු තුනක්ද සෙසු භික්ෂූන්ට අඩයොදුන් ආදී භේදයෙන්ද, නවක සංඝයාට බඹයක් පමණද පැනවූහ. පැනවූ අසුන්වල, නන්ද තාපසයා තථාගතයන් වහන්සේ ඉදිරියෙහි ඇඳිලි බැඳ සිටියේ 'ස්වාමීනි, බොහෝකලක් අපට හිතසුව පිණිස මේ මල් අසුනට නැග හිඳිනු මැනවැයි කීය. භාග්‍යවතුන් වහන්සේ අසුනෙහි වැඩහුන් සේක. ශාස්තෘන් වහන්සේ මෙසේ වැඩහුන් කල්හි ශාස්තෘන් වහන්සේගේ ආකාරය දැන භික්ෂූහු තම තමාට පැමිණි අසුනෙහි හුන්හ. නන්ද තාපසයා මහත්·වූ මල් කූඩයක් ගෙන තථාගතයන් වහන්සේට උසුලමින් සිටියේය. ශාස්තෘන් වහන්සේ තාපසයන්ගේ මේ සත්කාරය මහත්ඵල ඇත්තක් වේවායි නිරෝධ සමාපත්තියට සමවන් සේක. ශාස්තෘන් වහන්සේ සමවන් බව දැන භික්ෂූහුද සමාපත්තියට

සමවන්හ. තථාගතයන් වහන්සේ සතියක් නිරෝධයට සමවැදී හුන් කල්හි අතවැසියෝ පිඬුසිඟා යන වේලාව පැමිණිවිට වනමුල්පල වළඳා සෙසු කල්හි බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට ඇදිලි බැඳ සිටියහ. නන්ද තාපසයා පිඬුසිඟාවත් නොගොස් මල්කුඩය දරමින්ම සතියක් ප්‍රීති සුඛයෙන්ම දවසැරියේය. ශාස්තෘන් වහන්සේ නිරෝධයෙන් නැගිට නිකෙලෙස්ව විසීමේ පිළිවෙතින්ද, දානයට සුදුසු අංගයෙන්ද යන අංග දෙකින් යුතු එක් ශ්‍රාවකයකුට ඍෂි ගණයාට මල්අසුන් අනුමෝදනාව කරවයි අණකළ සේක. උන්වහන්සේ සක්විති රජු සම්පයෙන් ලැබූ මහාලාභ ඇති මහා යෝධයකු මෙන් සතුටු සිතැත්තාහු තමාගේ විෂයයෙහි සිට තෙවළා බුදුවදන සම්මර්ශනය කොට අනුමෝදනාව කළ සේක. උන්වහන්සේගේ දේශනාව අවසානයෙහි සියලු සිව්සතළිස් දහසක් ශිෂ්‍යයෝ රහත්බවට පත්වූහ. ශාස්තෘන් වහන්සේ එව මහණෙනියි අත දිගුකළ සේක. එකෙණෙහිම ඔවුන්ගේ කෙස් රුවුල් අතුරුදහන් විය. අටපිරිකර සිරුරෙහි රැඳුණේ විය. ඔවුහු සැටවස් පිරුණු තෙරුන් මෙන් ශාස්තෘන් වහන්සේ පිරිවරා සිටියහ.

නන්ද තාපසයා වනාහි වික්ෂිප්ත සිත් ඇති බැවින් විශේෂත්වයට නොපැමිණියේය. ඔහුට අරණවිහාරී තෙරුන්වහන්සේගේ ධර්මය ඇසීමට ඇරඹූ තැන්පටන් 'අහෝ, මමද අනාගතයෙහි එක් බුදුවරයකුගේ සසුනෙහි මේ ශ්‍රාවකයා විසින් ලද ගුණය ලබන්නේ නම් මැනවැයි සිතක් උපන. ඔහු එම විතර්කය නිසා මාර්ගඵල ප්‍රතිවේධය ලැබීමට නොහැකි විය. තථාගතයන් වහන්සේ වැද ඇදිලිබැඳ ඉදිරියෙහි සිට මෙසේ කීය. 'ස්වාමීනි, යම් භික්ෂුවක විසින් ඍෂි ගණයාට පුෂ්පානුමෝදනාව කරන ලද්දේද, ඔබවහන්සේගේ සසුනෙහි උන්වහන්සෙ කවරනම් ඇත්තාහුද. නික්ලේශීව වාසය කරන බැවින්ද දානය ලැබීමට සුදුසු බැවින්ද අගතැන්පත් වූයේ මේ භික්ෂුවයි. 'ස්වාමීනි, සතියක් මල් කුඩයක් දරන මා විසින් යමෙක් සත්කාර කරනු ලැබීද, ඒ අධිකාරයෙන් අන් සැපතක් නොපතමි. අනාගතයෙහි එක බුදුවරයකුගේ සසුනෙහි මේ තෙරුන් වහන්සේ මෙන් අංග දෙකින් යුතු ශ්‍රාවකයෙක් වන්නෙමියි ප්‍රාර්ථනයක් කළේය. ශාස්තෘන් වහන්සේ මේ තාපසයාගේ ප්‍රාර්ථනය ඉටුවන්නේ දැයි අනාගතංශ ඥානය විහිදුවා බලනසේක් කල්ප සියදහසක් ඉක්මවා ඉටුවන බව දැක, 'තාපසය, ඔබගේ මේ ප්‍රාර්ථනය හිස් වූවක් නොවේ. අනාගතයෙහි කල්ප සිය දහසක් ඉක්මවා ගෞතම නම් බුදුකෙනෙක් උපදින්නේ ය. උන්වහන්සේ සම්පයෙහි ඉටුවන්නේ යයි කියා ධර්ම කථාවක් කොට භික්ෂු සංඝයා

පිරිවරා අහසට පැනනැගි සේක. නන්ද තාපසයා යම්තාක් දෘෂ්ටි පථය ඉක්මවා යයිද ඒ තාක් ශාස්තෘන් වහන්සේට හා භික්ෂු සංඝයාටද ඇඳිලි බැඳ සිටියේය.

ඔහු පසුකලෙක කලින් කල ශාස්තෘන් වහන්සේ කරා එළඹ දහම් අසා නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ කලුරිය කොට බඹලොව උපන්නේ ඉන්පසු ජාති පන්සියයකදී පැවිදිව අරණ්‍යවාසීව ගත පච්ඡාගත වත් පිරුවේය. මේ වත නොපුරා මහා ශ්‍රාවක බවට පත්වන්නෝ නම් නැත. ගතපච්ඡාගත වත වනාහි ආගම අටුවා කථාවල කියූ අයුරින්ම දත යුත්තේය. ඔහු වර්ෂ විසිදහසක් ගතපච්ඡාගත වත පුරා කලුරියකොට තව්තිසා දෙව්ලොව උපන්නේය. මෙසේ ඔහු තව්තිසා දෙව්ලොව නැවත නැවත ඉපදීම් වශයෙන් දිවසැපත් අනුභවකොට එයින් චුතව මිනිස් ලොව නොයෙක්වර සක්විති රජව ද ප්‍රදේශ රජව ද උදාර සම්පත් විඳ අපගේ භාග්‍යවතුන් වහන්සේ උපන් කල්හි සැවැත්නුවර සුමන සිටුමැදුරෙහි අනාථපිණ්ඩික සිටුවරයාට බාලව උපන්නේ ය. ඔහුට සුභූතියයි නමක් විය. එසමයෙහි අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව ඉපිද පවත්වන ලද උතුම් ධම්මචක්ක ඇති සේක් අනුපිළිවෙළින් රජගහ නුවරට වැඩ එහි වේළුවනය පිළිගැනීම් ආදියෙන් ලෝකානුග්‍රහ කරන සේක් රජගහනුවර නිසා සීතවනයෙහි විසූ සේක. එකල්හි අනේපිඬු සිටු තෙමේ සේවා භාණ්ඩයක් ගෙන තමාගේ මිත්‍රයා වූ රජගහ සිටුගේ ගෙට ගොස් බුදුන් උපන් බව අසා සීතවනයෙහි වසන ශාස්තෘන් වහන්සේ කරා එළඹ පළමු දැක්මෙන්ම සෝවාන් පෙලෙහි පිහිටා ශාස්තෘන් වහන්සේට සැවැත්නුවරට පැමිණෙන ලෙස ඉල්ලා ඉන් පන්සාළිස් යොදුන්මග යොදුනෙන් යොදුන සියදනසක් වියදම්කොට විහාර පිහිටුවා සැවැත්නුවර අටකිරියක් තරම් ජේත කුමාරයාගේ උයන්බිම කෝටියක් අතුරා මිලට ගෙන එහි භාග්‍යවතුන් වහන්සේට විහාරයක් කරවා දුන්නේ ය. විහාරය පූජාකරන දවසෙහි මේ සුභූති කෙළෙඹියා අනේපිඬු සිටුවරයා සමග ගොස් දහම් අසන්නේ ශ්‍රද්ධාව ලැබ පැවිදිව උපසපන් වූයේ උභය මාතෘකාව ප්‍රගුණකොට කමටහන් කියවාගෙන අරණ්‍යයෙහි මහණදම් පුරන්නේ මෛත්‍රී ධ්‍යානය උපදවා එය පාදකකොට විදර්ශනා වඩා රහත්බවට පත්විය. උන්වහන්සේ ධර්මය දේශනා කරන සේක් යම්හෙයකින් ශාස්තෘන් වහන්සේ දේශනා කළ නියාමයෙන් එක් පුද්ගලයකුට සීමා නොකොට දේශනා කරත්ද ඒ නිසා නික්ලේශීව වසන්නවුන් අතර අග්‍ර වූහ. යම්හෙයකින් පිඬු පිණිස හැසිරෙත්නම් ගෙයක් ගෙයක් ගානේ

මෛත්‍රී සමාපත්තියට සමවැද නැගිට භික්ෂාව පිළිගනිත්ද, මෙසේ දායකයන්ට මහත්ඵල ඇති වන්නේ ය. ඒ නිසා දානය ලැබීමට සුදුස්සන් අතර අග්‍රවූහ. ඒ නිසා භාග්‍යවතුන් වහන්සේ ඔහු 'නික්ලේශීව වසන්නවුන් අතරද දන් ලැබීමට සුදුස්සන් අතරද අග්‍රවූ මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් කෙනෙක් වේද ඒ සුභූති යයි අංග දෙකකින් යුත් අගතන්හි තැබූ සේක. මෙසේ මේ මහතෙරුන් වහන්සේ තමා විසින් පුරන ලද පාරමිතාවන්ගේ ඵලයෙහි මස්තකය වූ රහත් බවට පැමිණ ලෝක ප්‍රසිද්ධ වූ විශේෂයෙන් දන්නා ලද වූවාහු බොහෝ ජනයාගේ හිතසුව පිණිස ජනපද චාරිකාවෙහි හැසිරෙන්නාහු අනුපිළිවෙළින් රජගහ නුවරට ගිය සේක. බිම්බිසාර රජතුමා උන්වහන්සේගේ පැමිණීම ගැන අසා එළඹ 'ස්වාමීනි, මෙහිම වසනු මැනව. ඔබවහන්සේට වාසස්ථානයක් කරන්නෙමියි කියා ආපසු ගියේ එය අමතක විය. තෙරුන්වහන්සේ සෙනසුනක් නොලබන්නාහු එළිමහනෙහි ගතකළ සේක. තෙරුන් වහන්සේගේ අනුහසින් වැසි නොවසී. මනුෂ්‍යයෝ වැසි නොලැබ කරදරයට පත්වූවෝ රජගෙදර දොරටුවෙහි උද්ඝෝෂණ කළහ. රජ කවරනම් කරුණකින් වැසි නොවසීදැයි විමසන්නේ තෙරුන් වහන්සේ එළිමහනෙහි වසන හෙයින් වැසි නොවසීයයි හඟිමියි සිතා උන්වහන්සේට පන්සලක් කරවා ස්වාමීනි, මේ පන්සලෙහි වසනු මැනවැයි කියා වැඳ ගියේය. තෙරුන් වහන්සේ කුටියට පිවිස තණ ඇතිරියෙහි පලක්බැඳ හුන් සේක. එකල වැස්ස මඳින් මද වසී. ධාරානිපාතයෙන් නොවසී. ඉක්බිති තෙරුන් වහන්සේ ලෝකයාගේ වැසිනැති බිය තුරන් කරනු කැමැත්තාහු තමාගේ ආධ්‍යාත්මික බාහිර දැයකට උවදුරක් නැති බව දන්වන්නාහු **ඡන්නා මෙසා කුටිකා** යනාදී ගාථාව කී සේක. එහි අර්ථය තෙර ගාථාවෙහි කියන ලද්දේම ය.

මුන්වහන්සේ කවර හෙයකින් තමාගේ ගුණ ප්‍රකාශ කළ සේක්ද. මුන්වහන්සේ විසින් දිගුකලෙකින් නොපැමිණි පරමගම්භීර වූ අතිශයින් ශාන්ත වූ ප්‍රණීත වූ තමා විසින් අවබෝධ කරගනු ලැබූ ලෝකෝත්තර ධර්මය නැවත සිහිකොට ප්‍රීතිවේගයෙන් උපදවන ලද ප්‍රීතිය පැහැදිලි කරනු පිණිස ශාසනයාගේ නෛර්යාණික භාවය පැහැදිලි කරනු පිණිසද ආර්යයන් වහන්සේලා පරම අල්පේච්ඡ වුවද තමන්ගේ ගුණ පවසති. යම්සේ ලෝකනාථයන් වහන්සේ අවබෝධ කළයුත්තවුන්ගේ අධ්‍යාශය වශයෙන් මහණෙනි, තථාගත තෙමේ දසබලයෙන් යුක්තය. චතුර්වෛශාරද්‍යයෙන් විශාරදය යනාදී වශයෙන් තමාගේ ගුණ පවසත්ද

එසේ මේ තෙරුන් වහන්සේගේ රහත් බව පවසන ගාථාවක්ද වීය. මෙසේ ඔහු පත්වූ රහත්ඵල ඇත්තේ හා පත්වූ අගතැන් ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය පවසන්නේ **හිමවනතසසාවිදූරෙ** යනාදිය කීය. එහි **හිමවනතසස** යනු හිමාලය පර්වතයට **අවිදූරෙ** ආසන්නයෙහි සමීපයෙහි. පර්වතපාදයෙහි මිනිසුන්ගේ ගමනාගමනයෙන් යුත් හැසිරෙන ස්ථානයෙහි යන අර්ථයි. **නිසභොනාම පබබතො** යනු පර්වතයන්ට ජ්‍යෙෂ්ඨ බැවින් නමින් නිසභ නම් ශෛලමය පර්වතයක් විය යනු සම්බන්ධයි. **අසසමො සුකතො මයහං** යනු එහි පර්වතයෙහි මාගේ විසීම පිණිස අසසමො අරණ්‍යවාසයක් මනාසේ කරන ලද කුටිය. රාත්‍රිස්ථාන දිවාස්ථාන වැටින් වටකිරීම් ආදි වශයෙන් සොඳුරු අයුරින් කරන ලද්දේය යන අර්ථයි. **පණණසාලා සුමාපිතා** යනු කොළවලින් වසන ලද ශාලාවක් මාගේ විසීම පිණිස මැනවින් මවන ලද්දේ නිමවන ලද්දේය යන අර්ථයි. **කොසියො නාම නාමෙන** යනු මව්පියන් විසින් තබන ලද නමින් කෝසිය නම්. **උගගතාපනො** ප්‍රකට තපස උග්‍ර තපස. **එකාකියො** අන් අය නැති බැවින් මම ම හුදෙකලාව **අදුතියො** දෙවැනි තාපසයකු නැතිව. **ජටිලො** ජටාධර තාපසයා. **තදා** ඒ කාලයෙහි නිසභ පර්වතයෙහි **වසාමි** වාසය කරමියි සම්බන්ධයි. **එලං මූලංච පණණාඤච නහුඤජාමි අහං තදා** නිසභ පර්වතයෙහි වසන කල්හි තිඹිරි ආදී පල ද හාතාවාරිය ආදී මුල් ද කරකොළ ආදී කොළ ද ගසින් කඩාගෙන නොවළඳමි යි අර්ථයි. මෙසේ ඇතිකල්හි කෙසේ ජීවත්වේදැයි එය දක්වන්නේ **පවතතංච සුපාතාහං** යයි කීය. එහි **පවතතං** තෙමේම උපත්. **සුපාතං** තමාගේම ස්වභාවයෙන් වැටුණු කොළ ආදිය ආහාර කොටගෙන **තාවදෙව** එකල **ජීවාමි** ජීවිකාව කෙරෙමි යන සම්බන්ධයි. **පවතත පණඩුපතතානි** යනුවෙන්ද පාඨයක් වෙයි. එහි තෙමේම වැටුණු ගස්වල පඬුවන් කොළ නිසා ජීවත්වෙමි යන අර්ථයි. **නාහං කොපෙමි ආජීවං** යනු මම ජීවිතය හැරයන්නේ වුව ද පරිත්‍යාග කරන්නේ වුව ද තෘෂ්ණා වශයෙන් පලමුල් ආදී ආහාර සෙවීම පිණිස සම්‍යක් ආජීවය **නකොපෙමි** විනාශ නොකරමි යන සම්බන්ධයි. **ආරාධෙමි සකං චිතතං** යනු තමාගේ සිත අල්පේච්ඡතාවෙන් ද, සන්තුෂ්ටියෙන්ද **ආරාධෙමි** පහන් කරමි. **විවජෙජමි අනෙසනං** යනු වෛද්‍යකර්ම දූතකර්මාදී වශයෙන් **අනෙසනං** නුසුදුසු සෙවීම **විවජ්ජෙමි** දුරුකරමි. **රාගූපසංහිතං චිතතං** යනු **යදා** යම්කලෙක මාගේ රාගයෙන් යුතු සිත උපදීද, එකල්හි **සයමෙව** තමාම **පචවෙකඛාමි** ඥානයෙන් නැවත සලකා බලා දුරුකරමි. **එකගෙගා තං දමෙමහං** යනු මම එක්

කමටහන් අරමුණක එකඟෙහා සමාහිතව ඒ රාගසිත දමෙමි දමනය කරමි. රඤ්ජසි රජනියොව යනු රජනියෙ ඇලියයුතු රූපාරම්මණ ආදි වස්තුවෙහි රඤ්ජසි ඇලුණේ අසි වෙහි. දොසනියෙව දුසසි යනු දුසසිතබෙබ දෝෂකරන වස්තුවෙහි දූෂකයෙක් වෙහි. මුයහසෙ මොහනියෙව මොහිතබෙබ මුළාවිය යුතු වස්තුවෙහි මුයහසි මුළා වූවෙක් අසි වෙහි. ඒ නිසා ඔබ වනා වනයෙන් අරණ්‍යවාසයෙන් නික්ඛමසසු පහවී යව යනුයි. මෙසේ තමා දමනය කරවයි සම්බන්ධයි. තිම්බරූසක වණණාහො යනු රන් තිම්බරූසක වණණාහො ජම්බෝනද ස්වර්ණ වර්ණ යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

සුභූති තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.22

පදුමුත්තරො නාම ජිනො යනාදි වශයෙන් ආයුෂ්මත් උපවාන තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේ පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි දිළිඳු කුලයෙක ඉපිද දැනුමිති බවට පත්වූවාහු භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි උන්වහන්සේගේ ශාරීරික ධාතු ගෙන මනුෂ්‍ය දේව නාග ගරුඬ යක්ෂ කුම්භාණ්ඩ ගාන්ධර්වයන් විසින් සත්රුවන් මුවා සත්යොදුන් ස්තූපයක් කරන ලද කල්හි එහි මනාව සේදූ තමාගේ උතුරුසළුව රිටිඅග බැඳ ධ්වජයක් කොට පූජා කළහ. එය ගෙන දෙවියන් චෛත්‍ය පූජා ආරක්ෂණය පිණිස තැබූ අභිසම්මතක නම් යක්ෂ සේනාපතියා අදෘශ්‍යමාන සිරුරක් ඇත්තේ එය අහසෙහි දරමින් චෛත්‍යය තෙවරක් ප්‍රදක්ෂිණා කළේය. ඔහු එය දැක බෙහෙවින් පහන් සිතැත්තේව ඒ පුණ්‍ය කර්මයෙන් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මෙම බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර බමුණු කුලයෙක ඉපිද උපවානයයි ලද නම් ඇත්තේ වැඩිවිය පත්ව ජේතවනය පිළිගැනීමේදී බුද්ධානුභාවය දැක

ලැබුවා වූ ශ්‍රද්ධාව ඇත්තේ පැවිදිව විදර්ශනාව සඳහා කටයුතු කරන්නේ රහත් බවට පත්ව ෂට් අභිඥා ඇත්තේ විය.

යම්කලෙක භාග්‍යවතුන් වහන්සේට අපහසුවක් වීද, එකල්හි තෙරුන් වහන්සේ උණුදිය සුදුසු බෙහෙත් පැන් ද භාග්‍යවතුන් වහන්සේට පිරිනැමූහ. එයින් ශාස්තෘන් වහන්සේගේ රෝගය සංසිඳිණ. ඔහුට භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කළ සේක. මෙසේ ඔහු පැමිණි රහත්ඵල ඇත්තේ ලැබූ අගතන් ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරොනාම ජිනො** යනාදිය කීය.

එහි සියලු ලෞකික ලෝකෝත්තර ධර්මයන්හි පරතෙරට ගිය කෙළවරට නිර්වාණයට **ගතො** පැමිණි පදුමුත්තර නම් **ජිනො** දිනූ පස් මරුන් ඇති භාග්‍යවතුන් වහන්සේ ගිනිකඳක් මෙන් සවණක් බුදුරැසින් දිලිහී මුළුලොව දහම් පහනින් බබුළුවා **සම්බුදෙධා** මැනවින් බුදුවූයේ අවිද්‍යා නමැති නිද්‍රාවට ගිය ප්‍රජාවගේ සවාසනා කෙලෙස් නින්දෙන් **පටිබුදෙධා** පිපුණු නෙත් නැමැති නෙළුම් ඇත්තේ **පරිනිබ්බුතො** ස්කන්ධ පරිනිර්වාණයෙන් **නිබ්බුතො** අදර්ශනයට පැමිණියේ යන සම්බන්ධයි. **ජංඝා** යනු චෛත්‍ය කරන කල්හි මත්තෙහි තැබිය යුතු ගඩොල් තැබීම පිණිස බඳිනු ලබන ඉණිමග. **සුධොතං රජකෙනාහං** යනු වස්ත්‍ර සෝදන්නා වූ පුරුෂයා විසින් මනාසේ සෝදන ලද සුපිරිසිදු කරන ලද. **උත්තරෙය්‍යපටං** මාගේ උතුරුසළුව මම රිටි අග බැඳ ධජයක් කොට එසවීමි. **අම්බරෙ** අහසෙහි එසවූයෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

උපවාන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.23

නගරෙ බන්ධුමතියා ආදි වශයෙන් ආයුෂ්මත් සරණාගමනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බන්ධුමති නුවර කුලගෙයක ඉපිද අඳ මාපියන්ට උවටැන් කළේය. ඔහු එක් දවසක් මෙසේ සිතිය. මම මාපියන්ට උවටැන් කරන්නේ පැවිදිවන්ට නොලබමී. තුන්සරණ ගන්නෙමි නම් මැනවි. මෙසේ දිළිඳු බවින් මිදෙන්නෙමියි නිසඟ නම් වූ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ අගසවු වෙත එළඹ තිසරණ ගත්තේ ය. ඔහු ඒවා සියදහසක් වස් රැක එම කර්මයෙන්ම තව්තිසා භවනයෙහි උපන්නේ ඉන්පසුව දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභව කොට මෙම බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර මහසල් කුලයෙක ඉපිද දැනමිති බවට පැමිණියේ සත්හැවිරිදිව දරුවන් විසින් පිරිවරන ලද්දේ එක් සංඝාරාමයකට ගියේය. එහි එක් රහත් තෙරනමක් ඔහුට දහම් දෙසා සරණ දුන්නේ ය. හෙතෙම සරණ ගෙන පෙර තමා විසින් රක්නා ලද සරණ සිහිකොට විදර්ශනා වඩා රහත් බවට පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ රහත් බවට පැමිණි ඔහු උපසම්පදා කරවූ සේක. ඔහු රහත් බවට පැමිණියේ උපසම්පන්නව තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය පවසන්නේ **නගරෙ බන්ධුමතියා** යනාදිය කීය. එහි **මාතුපට්ඨායකො** අහු යනු මම මාපියන් **උපට්ඨාකො** පෝෂණය කරන්නේ බන්ධුමති නගරයේම සිටියෙමියි සම්බන්ධයි. **තමන්ධකාර පිහිතා** යනු මෝහාන්ධකාරයෙන් **පිහිතා** වැසුණු. **තිවිධගගීහි ඩයහරෙ** යනු රාගාග්නිය, දෝෂාග්නිය, මෝහාග්නිය සංඛ්‍යාත වූ ගිනි තුනින් **ඩයහරෙ** සියලු සත්වයෝ දැවෙත් යන සම්බන්ධයි. **අඣහෙතු ලභාමහං** යනු සැපයට හේතුවන කරුණු අට ලබමී යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැකි වන්නේ ම ය.

සරණාගමනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.24

නගරෙ චන්දවතියා යනාදි වශයෙන් ආයුෂ්මත් පංචසීල සමාදානිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ හවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ පෙර හවයෙහි කරන ලද කුසල කර්මානුරූපයෙන් දිළින්දෙක්ව අල්ප වූ ආහාරපාන බුදින්නේ අනුන්ගේ බැලමෙහෙවර කොට ජීවත්වන්නේ සසර ආදීනව දැක පැවිදිවනු කැමැත්තේ වුවද පැවිද්ද නොලබන්නේ අනොමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ නිසභ තෙරුන්වහන්සේ සමීපයෙහි පන්සිල්පද සමාදන් විය. දීර්ඝායුෂ ඇතිකලෙක උපන් බැවින් වර්ෂ සියදහස් ගණනක් සිල් රැක්කේය. ඒ කර්මයෙන් ඔහු දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මෙම බුද්ධෝත්පාද කාලයෙහි විශාලා නුවර මහාභෝග කුලයෙක උපන්නේ මව්පියන් සිල්සමාදන් වනු දැක තමාගේ සිලය සිහිකොට පැවිදිව විදර්ශනා වඩා රහත්බවට පැමිණියේය. තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වූයේ උදාන වශයෙන් පූර්ව චරිතාපදානය පවසන්නේ නගරෙ චන්දවතියා යනාදිය කීය.

හතකො ආසභං තදා යනු මා පින්කරන කාලයෙහි මම හතකො බැලමෙහෙ කරන්නෙක් **ආසිං** වීමි. **පරකම්මායනෙ යුත්තො** යනු බැලයෙන් අනුන්ගේ වැඩ කිරීමෙන් ආහාරයෙහි **යුත්තො** යොදවන ලදුයේ අවසරයක් නොමැති බැවින් සසරින් මිදීම පිණිස මම පැවිද්ද නොලබමි. **තමන්ධකාර පිහිතා** යනු කෙලෙස් අඳුරින් **පිහිතා** වැසුණාහු. **තිවිධගගීහි ඩයහරෙ** යනු නරකාග්නිය, ප්‍රේතාග්නිය, සංසාරාග්නිය සංඛ්‍යාත වූ තුන් ගින්නෙන් දැවෙති. මම වනාහි කුමන උපායකින් කුමන කරුණකින් වෙන්වූයේ වන්නෙමිද යන අර්ථයි. **දෙය්‍යධම්මො** ආහාරපානාදී දියයුතුව තිබෙන වස්තුවක් මට නැත. ඒ නැතිකමින් මම **වරාකො** දුප්පතෙකි. **හතකො** බැලමෙහෙවරින් ජීවත් වන්නෙකි. මම පන්සිල් **රක්‍ඛය්‍යං** පුරන්නෙමි නම් මැනවැයි පන්සිල් සමාදන්ව පුරන්නේ **යන්නූන රක්‍ඛය්‍යං** මනාසේ හොඳින් සොඳුරු කොට පාලනය කරන්නෙමි යන අර්ථයි. **සොහං යසං අනුභවිං** යනු ඒ මම දෙවිමිනිසුන් අතර මහත්වූ යසසක් අනුභව කෙළෙමි.

නෙසං සීලානං වාහසා ආනුභාවයෙන්ය යන අර්ථයි. කල්පකෝටියක් වුවද ඒ සිල්වල ඵල කියන්නේ එක් කොටසක් පමණක් කිතතයෙ ප්‍රකට කරන්නෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

පංචසීල සමාදානිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.25

සුවණණවණණං සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් අනනසංඝාවක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ පිඬු පිණිස හැසිරෙන දෙතිස්මහා පුරුෂ ලක්ෂණ ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් උපශෝභිත වූ භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට ගෙට පමුණුවා උතුම් අන්නපානයෙන් සන්තර්පණය කොට පවරා වැළඳවූ සේක. ඔහු ඒ සිත් පැහැදීමෙන් එයින් චුතව දෙව්ලොව ඉපිද දිවසැපත් අනුභවකොට එයින් චුතවූයේ මිනිස් ලොව උපන්නේ මිනිස් සැප අනුභව කොට එසේ වරින්වර දෙවිමිනිස් සැප අනුභව කොට, මෙම බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයක උපන්නේ සසුනෙහි පැහැදී පැවිදි ව විදර්ශනා වඩා රහත් බවට පත්විය. හෙතෙමේ පෙර කරන ලද පිනක නම් වශයෙන් අනන සංඝාවක තෙරුන් යයි ප්‍රකට නම් ඇත්තේ විය. පසුකලෙක තමාගේ පෙර කර්මය සිහිකොට සොම්නස් වූයේ මෙසේ මා විසින් මේ පුණ්‍ය සම්භාරයෙහි ආනුභාවයෙන් පැමිණි රහත් බවයයි තමාගේ පූර්ව චරිතාපදානය උදාන වශයෙන් පවසන්නේ සුවණණ වණණං යනාදිය කිය.

එහි ස්වර්ණයෙහි වර්ණය මෙන් වර්ණයක් යම් භාග්‍යවතුන් වහන්සේ කෙනකුන්ට වේද එය ස්වර්ණවර්ණයයි. ඒ ස්වර්ණ වර්ණ සම්බුද්ධ වූ සිද්ධාර්ථ යන අර්ථයි. ගච්ඡනතං අනතරාපණෙ යනු වෙළඳුන්ගේ ආපණ පෙළෙහි ඇතුළු වීදියෙහි ගමන්කරන. කඤ්චනගඝිය සංකාසං යනු රන් තොරණක් හා සමාන දෙතිස් උතුම් ලකුණින් යුතු.

ලොකපජ්ජොතං සියලු ලොවට පහනක් වූ. **අපපමෙය්‍යං** ප්‍රමාණ විරහිත. අනොපමං උපමා රහිත. **ජුතිඤ්ඣරං** ආලෝකධාරී. නීලපීතාදී සවණක් බුදුරැස් දරන්නා වූ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ දැක **පරමං** උතුම් වූ ප්‍රීතියක් **අලත්ථං** ලැබුවෙමි යි සම්බන්ධයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

අනන සංසාවක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.26

සද්ධත්ථස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් ධූපදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සිත් පහදවා ඒ භාග්‍යවතුන් වහන්සේගේ ගඳකිළිය සඳුන් අගිල් කාලානුසාරී ආදියෙන් කරන ලද නොයෙක් ධූපයන්ගෙන් ධූප පූජාවක් කළේය. ඔහු ඒ පිනින් දෙවියන් අතරද මිනිසුන් අතරද උභයසම්පත්තීන් අනුභව කරන්නේ උපනුපන් භවයෙහි පිදිය යුත්තෙක්ව මේ බුද්ධෝත්පාදයෙහි එක් කුලගෙයක උපන්නේ පුණ්‍ය සම්භාරයෙහි ආනුභාවයෙන් සසුනෙහි පැවිදිව විදසුන් වඩා රහත්බවට පත්ව කරන ලද ධූප පූජා පින් ඇති බැවින් නමින් ධූපදායක තෙරුන් වහන්සේ යයි සියලු තැන ප්‍රකට විය. ඔහු පත්වූ රහත්ඵල ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වූයේ පූර්ව චරිතාපදානය දක්වන්නේ **සිද්ධත්ථස්සභගවතො** යනාදිය කීය.

සිද්ධො පිරිපුන් සර්වඥතාඥාන සංඛ්‍යාත අත්‍ථ ප්‍රයෝජනය යම් භාග්‍යවතුන් වහන්සේ කෙනකුන්ටද ඒ සිද්ධාර්ථ නම්. ඒ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේට. **භගවතො** භාග්‍ය ආදී ගුණ ඇති **ලොක ජෙට්ඨස්ස** සියලු ලෝකයට උත්තම වූ. **තාදිනො** ඉටුඅනිටු දහම්හි **තාදිස්ස** නොසැලී සිටින්නා වූ යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ධූපදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.27

විපසසිසස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් පුලිනපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස් කරන්නේ විපසසී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලයක උපන්නේ සසුනෙහි පහන්සිත් ඇත්තේ සෑමළු බෝමළුවල පැරණි වැලි ඉවත්කොට අලුත් මුතුඇට වැනි සුදුවැලි විසුරුවා මළු අලංකාර කළේය. ඒ කර්මයෙන් ඔහු දෙව්ලොව උපන්නේ එහි දිව්‍යමය රත්නයන් ගෙන් බබලන යොදුන් ගණනක් වූ රන්විමනෙක දිව්‍යසම්පත් අනුභවකොට එයින් චුතව මිනිස්ලොව සත්රුවනින් යුතු වූයේ සක්විති රජ ව මිනිස් සම්පත් අනුභවකොට තැන තැන හැසිරෙන්නේ මෙම බුද්ධෝත්පාද කාලයෙහි ධනසම්පත් ඇති එක් කුලයක උපන්නේ සසුනෙහි පැහැදී පැවිදි ව විදර්ශනා වඩා රහත්බවට පත්විය. තමා කළ පිනෙහි නමට සමාන නමින් පුලිනපූජක තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. උන්වහන්සේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් ඇත්තාහු පෙර චරිතාපදානය දක්වන්නාහු විපසසිසස භගවතො යනාදිය කීහ.

එහි විවිධ ලෙස බලතියි විපසසි නම්. වෙන්වෙන්ව බලතියි හෝ විපසසි නම්. විවිධ වූ ආත්මාර්ථ පරාර්ථ ආදි භේද ඇති අර්ථයන් බලතියි හෝ විපස්සි නම්. ඒ විපසසි බුදුරදුන්ගේ. **පුරාණ පුලිනං** වැලි, ඉවත්කොට පිරිසිදු සුදුවැලි ආකිරිං ඇතිරුවෙමි. සෙස්ස පහසුවෙන් දතහැකි වන්නේ ම ය.

පුලිනපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.28

චන්‍දභාගා නදීතීරේ යනාදි වශයෙන් ආයුෂ්මත් උතතිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි චන්‍දභාගා

නදියෙහි කිඹුලෙක්ව උපන්නේ නදීතෙරට පැමිණි භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ එතෙරට ගෙනයනු කැමැත්තේ ගංතෙර සමීපයෙහි වැදහොත්තේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් පිටමත පා තැබූ සේක. ඌ සතුටුවූයේ ඔදවැඩියේ ප්‍රීති වේගයෙන් අතිශයින් උත්සාහවත්ව දියපහර බිඳගෙන මහත් ජවයෙන් භාග්‍යවතුන් වහන්සේ එතෙරට ඇරලීය. භාග්‍යවතුන් වහන්සේ උගේ චිත්තප්‍රසාදය දැන මූ මෙයින් චුතව දෙව්ලොව උපදින්නේ ය. එතැන් පටන් සුගතීන්හිම සැරිසරන්නේ මෙයින් අනූහතර වැනි කල්පයෙහි නිවනට පැමිණෙන්නේයයි ප්‍රකාශකොට වැඩි සේක. ඌ එසේ සුගතීන්හි පමණක් සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක්තරා බමුණකුගේ පුත්‍රයෙක් ව උපන්නේ ය. ඔහුට උත්තිය යයි නමක් තැබූහ. ඔහු වැඩිවියට පත්ව නිවන් සොයන්නෙමියි පරිබ්‍රාජකයෙක්ව එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ දැක එළඹ දහම් අසා ලැබූ ශ්‍රද්ධා ඇත්තේ සසුනෙහි පැවිදිව ශීල දෘෂ්ටීන් පිරිසිදු නැති බැවින් විශේෂයක් නිපදවා ගන්නට නොහැකි වන්නේ වෙනත් භික්ෂුවක් විශේෂයක් නිපදවාගෙන අනෙකකුට ප්‍රකාශ කරනු දැක ශාස්තෘන් වහන්සේ කරා එළඹ සංක්ෂේපයෙන් අවවාද ඉල්ලා සිටියේය. ශාස්තෘන් වහන්සේද 'ඒ නිසා උත්තිය, මෙහිදී පළමුවෙන්ම සීලය පිරිසිදු කරව'යි ආදි වශයෙන් සංක්ෂේපයෙන්ම අවවාද දුන් සේක. උන්වහන්සේ ශාස්තෘන් වහන්සේගේ අවවාදයෙහි සිට විදර්ශනාව ඇරඹූහ. ඇරඹූ විදර්ශනා ඇති උන්වහන්සේට ආබාධයක් හටගැනිණ. ආබාධය ඇතිවූ විට උපන් සංවේග ඇත්තාහු වීර්ය ආරම්භ කිරීමට ඇති කරුණ දැන විදර්ශනා වඩා රහත්බවට පැමිණියහ. මෙසේ ඔහු කරන ලද කුසල සම්භාර අනුරූපව පැමිණි රහත්ඵල ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය පවසන්නාහු **චන්‍දභාගා නදීතීරෙ** යනාදිය කීය.

එහි **චන්‍දභාගා නදීතීරෙ** යනු පිරිසිදු සුදු වැලිතලාවන්ගෙන් ද ප්‍රභා සම්පන්න මිහිරි ජලයෙන් ද පිරිපුන් බව නිසා සහ චන්ද්‍රප්‍රභා කිරණින් සශ්‍රීක ආලෝකයක් මෙන් **නදමානා** ශබ්ද නගමින් යති යි චන්‍දභාගා නදී නම්. ඒ චන්‍දභාගා නදී තෙර කිඹුලෙක් වීමි යි සම්බන්ධයි. එහි **සුංසුමාරෝ** යනු කුඩා මාළු අයින් කඩකඩ කරමින් මරතියි සුංසුමාර නම් ද, චණ්ඩ මත්ස්‍යයෙක් ද කිඹුලෙක් ද යන අර්ථයි. **සහොජන පසුතාහං** යනු මම **සහොජනෙ** තමාගේ ගොදුරෙහි **පසුතො** ව්‍යාපෘත වූයේ **නදීතිත්ථං ආගච්ඡිං** යනු භාග්‍යවතුන් සේ පැමිණෙන කාලයෙහි මම ගං තෙරට **ආගඤ්ඡිං**

පැමිණියේ වෙමි. **සිද්ධත්ථොතමහි සමයෙ** එහි මාගේ තීර්ථයට පැමිණෙන කාලයෙහි සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ අග්‍ර පුද්ගලයා වූවාහු සියලු සත්වයන් අතර අග්‍ර වූ සේක් ජ්‍යෙෂ්ඨ වූ සේක. **සයම්හු** තමා ම වූයේ උපන්නේ බුදුවූයේ ඒ භාග්‍යවතුන් වහන්සේ නදිය තරණය කරනු කැමැත්තාහු නදී තෙරට පැමිණි සේක. **පෙතිකං විසයං මයහං** යනු මගේ පියමුතු ආදීන් විසින් පරම්පරාවෙන් ගෙනඑන ලද පැමිණි පැමිණි මහානුභාව ඇත්තවුන්ගේ එතෙර කරවීම යන අර්ථයි. **මම ගජ්ජනං සුත්වා** යනු මාගේ ගර්ජනය ආරාධනය අසා මහාමුනි භාග්‍යවතුන් වහන්සේ නැගුණු සේක යනු සම්බන්ධයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

උත්තිය තෙරුන් වහන්සේගේ
අපදාන අට්ඨවාවයි.

3.29

සුවණ්ණවණ්ණං යනාදී වශයෙන් ආයුෂ්මත් එකඤ්ජලික තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවූ පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පැමිණියේ තෙරුවන්හි පැහැදුණේ පිඬු පිණිස හැසිරෙන විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිත් ඇත්තේ ඇඳිලිබැඳ සිටියේය. ඔහු ඒ පුණ්‍යකර්මයෙන් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ සියලු තන්හි පූජනීයව උභය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති කුලයක ඉපිද සසුනෙහි පැහැදී පැවිදි ව විදසුන් වඩා රහත්බවෙහි පිහිටියේය. පෙර කරන ලද පින් නිසා එකංජලික තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. ඔහු තමාගේ පින්කම සිහිකොට එය අතැඹුලක් සේ දැක උදාන වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සුවණ්ණ වණ්ණං** යනාදිය කීය. **විපස්සිං සන්තවාහගං** යනු වෙළඳුන් කාන්තාරයෙහි ගෙනයතියි තරණය කරවතියි සත්ථවාහො නම්. වැලිකතර, සොර කතර, දුබික් කතර, යක් කතර, දුබික් කතර, යන කාන්තාරවලින් තරණය කරවයි, එතෙර කරවයි, හොඳින් තරණය කරවයි එගොඩ කරවයි කෙම්බිමට පමුණුවයි යන අර්ථයි. කවරෙක් ඒ වෙළඳ දෙටුවා වේද,

සාත්තුවාහකයා හා සමාන බැවින් මේ භාග්‍යවතුන් වහන්සේද සත්‍ථවාහ නම් වෙති. එසේම උන්වහන්සේ ත්‍රිවිධ බෝධිය ප්‍රාර්ථනා කරන සේක් කරන ලද පුණ්‍ය සම්භාරයෙන් සත්වයන් ජාති කාන්තාරය, ජරා කාන්තාරය, මරණ කාන්තාරය, සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස කාන්තාරයෙන්ද සියලු සංසාර කාන්තාරයෙන්ද තරණය කරවතියි, එතෙර කරවතියි හොඳින් එතෙර කරවතියි එගොඩ කරවතියි නිවන් පලයට පමුණුවතියි යන අර්ථයි. සත්‍ථවාහ වූයේ ද හෙම අග්‍ර ශ්‍රේෂ්ඨ ප්‍රධාන වූයේනුයි සත්‍ථවාහගග නම්. ඒ සත්‍ථවාහගග වූ විපසසී සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ යනු සම්බන්ධයි. **නරවීර විනායකං** යනු නරයන් අතර අතිශය ලිහිල් නොවූ පරාක්‍රම ඇත්තේනුයි නරවීර නම්. විශේෂයෙන් කරන ලද පුණ්‍ය සම්භාරයන් ඇති සත්වයන් ගෙන යයි නිවන්පුරට පමුණුවයිනුයි නායක නම්. ඒ **අදනතදමනං තාදිං** යනු රාග දෝස මෝහ ආදී කෙලෙස් සම්පතින් යුතු බැවින් කාය-වාක්-මනෝ ද්වාරයන්ගෙන් අදාන්ත වූ සත්වයන් දමනය කෙරේනුයි අදනතදමන නම්. ඒ භාග්‍යවතුන් වහන්සේ ඉෂ්ටානිෂ්ට වූ අකම්පත්‍යාදී ගුණ ඇත්තේනුයි තාදී නම් ඒ **මහාවාදිං මහාමතිං** යනු ස්වසමය පරසමයවාදීන් අතරෙහි තමා හා සම අධික පුද්ගලයකු නැති බැවින් මහාවාදී නම්. මහපොළොව සමාන වූද මහාමේරු සමාන වූද ඥානයක් යමෙකුට වේද හේ මහාමති නම්. ඒ මහාමති වූ මහාවාදී වූ සම්බුදුරජාණන් වහන්සේ යනු මෙය තුල්‍යාධිකරණ විශේෂණයයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

එකඤ්ඣලී තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.30

නගරෙ බන්ධුමතියා යනාදි වශයෙන් ආයුෂ්මත් බොමදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නිවනට හේතුවන පින් රැස්කරන්නේ විපසසී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලයක උපන්නේ සසුනෙහි අතිශයින් ප්‍රසන්න වූයේ රත්නත්‍රය මාමක වූයේ විපසසී භාග්‍යවතුන්

වහන්සේගේ සමීපයෙහි දහම් අසා පහන්සිත් ඇත්තේ කොමු රෙදිවලින් පූජා කළේය. ඔහු එයම මුල්කොට දිවි ඇතිතෙක් පින්කොට එයින් දෙව්ලොව උපන්නේ සදෙව්ලොව කලින් කල දිව්‍යමය සැපත් අනුභවකොට එයින් චුතව මිනිස්ලොව සක්විති ආදී අනේකවිධ මිනිස්සැපත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දහම් අසා පිළිලද සැදැහැ ඇත්තේ පැවිදිව විදසුන් වඩා නොබෝ කලෙකින්ම රහත්බවට පත්විය. කරන ලද පිනෙහි නමින් බොමදායක තෙරුන් වහන්සේයයි ප්‍රකට වූ උන්වහන්සේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස්ව පූර්ව චරිතාපදානය දක්වන්නාහු **නගරෙ බන්ධුමතියා** යනාදිය කීහ. එහි බන්ධු යනුවෙන් කියැවෙන්නේ නෑයෝය. ඒ නෑයෝ යම් නගරයක ඔවුනොවුන් එක්ව වසත්ද, ඒ නගරය බන්ධුමතී යයි කියනු ලැබේ. **රොපෙමි බීජසම්පදං** යනු දාන සීල ආදී පුණ්‍ය බීජ සම්පත් රොපෙමි රෝපණය කරමි. පිහිටුවමි යන අර්ථයි.

බොමදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

තෙවැනි සුභූති වර්ගයෙහි වර්ණනාව සමාප්තයි.
සතර බණවර නිමියේය.

3.31

සතානඃං පටිසලලීනං යනාදි වශයෙන් ආයුෂ්මත් කුණඩධාන තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර කුලගෙයක උපන්නේ කියන ලද පරිදි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ප්‍රථමයෙන්

සලාකය ගන්නවුන් අතර අගතන්හි තබනු ලබන්නහු දැක ඒ තනතුර ප්‍රාර්ථනා කොට එයට අනුරූප වූ පින් කරන්නේ හැසිරුණේය. ඔහු එක් දවසක් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගිහුන් කල්හි රත්සිරියෙල් වැනි රතු රන්වන් පැහැ ඇති, මහත් වූ කෙසෙල්ගෙඩි ඇවරියක් පිළිගැන්වීය. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන වැළඳූ සේක. ඔහු ඒ පින්කමින් එකොළොස්වරක් දෙවියන් අතර දේවරාජ තනතුර දැරිය. විසිසතර වරක් සක්විති රජ විය. මෙසේ ඔහු වරින්වර පින්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි දේවතාවෙක්ව උපන්හ.

දීර්ඝායුෂ ඇති බුදුවරුන් අර්ධමාසිකව කෙරෙන උපෝසථය කරනු නොලැබේ. එසේම විපසසී භාග්‍යවතුන් වහන්සේට සයවසක් ඉක්මගිය කල්හි උපෝසථය විය. කාශ්‍යප දශබලයන් වහන්සේ මාස සයෙන් සයෙන් ප්‍රාතිමෝක්ෂය අවසාරණය කළ සේක. උන්වහන්සේ ප්‍රාතිමෝක්ෂය අවසාරණය කරන කල්හි දිසාවැසි යහළු භික්ෂු දෙනමක් උපෝසථය කරන්නෙමුයි යති. ඔවුන් දැක මේ බූමාටු දෙවියා මෙසේ සිතීය. මේ භික්ෂූන් දෙදෙනාගේ මිත්‍රත්වය අතිශයින් දැඩිය. භේදවීමට හේතුවක් ඇතිකල්හි භේදවීමේ ඇති වරද කිම? ඇය ඔවුන්ගේ අවකාශයක් බලන්නී ඔවුන්ගේ නුදුරින්ම යයි. ඉක්බිති එක් තෙරනමක් අනික් තෙරනමගේ අතට පාසිවුරු දී සිරුර පහසු කරගැනීමේ අදහසින් පැන් පහසු තැනකට ගොස් සෝදාගත් අත්පා ඇත්තේ වනළැහැබෙහි පැත්තකින් නික්මෙයි. බූමාටු දෙවියා ඒ තෙරනමගේ පසුපස යන්නී උතුම් රූ ඇති ස්ත්‍රියක් ව හිසකෙස් ලිහා එක්තැන්කොට බැඳ ගන්නී මෙන් ද පිට පස් පිසදමන්නී මෙන් සළුව එක්කොට හැඳගන්නී මෙන් ද වී තෙරනමගේ පසුපසින් ළැහැබින් නික්මුණාය.

එකත්පසෙක සිටි සහායක තෙරනම එය දැකම දොම්නස් ඇත්තේ, මේ භික්ෂුව සමග බොහෝකලක් පැවති ස්නේහය දැන් නැසුණේය. මා මෙබඳු දෙයක් දන්නෙම නම්, මෙපමණ කලක් මොහු සමග විශ්වාසය නොතබන්නෙමි යයි සිතා, ඔහු එද්දීම 'ආයුෂ්මත්නි, ගන්න ඔබගේ පාසිවුරු. තා වැනි පාපියකු සමග එකමග නොයමි'යි කීය. ඒ අසා ඒ ලජ්ජී භික්ෂුවගේ හදවත තියුණු අවියක් ගෙන විද්දාක් මෙන් විය. ඉන්පසු මෙසේ කීය. 'ඔබ කුමක් කියයිද, මම මෙතෙක් කලක් දුෂ්කෘතාපත්තියකට වත් පැමිණි බවක් නොදනිමි. අද මා පාපියෙකැයි කියන්නේ කුමක්

නිසාද? ඔබ දුටුවේ කුමක්ද? අන් කිසිවක් නොදැක්කෙමි. මෙබඳු අලංකාරව සැරසුණු ගැහැණියක සමග එක්තැන සිට නික්මුණේ කිම? 'ඇවැත්නි, එය මගේ නොවේ. මම මෙබඳු ගැහැණියක නොබලමි. තෙවරක්ම කියද්දීත් අනික් තෙරනම කථාව නොඅදහා තමා දුටු කරුණම අදහන්නේ ඔහු සමග එක්මග නොගොස් අන් මගකින් ශාස්තෘන් වහන්සේ සමීපයට ගියේය. අනිත් භික්ෂුවද වෙනත් මගකින් ශාස්තෘන් වහන්සේ සමීපයට ගියේය. පළමුව ගිය භික්ෂුව ඒ භික්ෂුව පෝය ගෙහිදී දැක හැඳින 'මේ පෝය ගෙයි එක් පාපී භික්ෂුවක් ඇත. මම ඔහු සමග පොහොය නොකරන්නෙමි'යි නික්ම ගොස් පිටත සිටියේය. ඉක්බිති බූමාටු දේවතාවා 'මා විසින් බැැරුම් දෙයක් කරන ලද්දේ වනැයි මහලු උපාසක වෙසකින් ඔහු සමීපයට ගොස් 'ආර්යයන් වහන්සේ කුමක් නිසා මෙතැන සිටියනුදැ'යි ඇසීය. 'උපාසකය, මේ පෝය ගෙට එක් පාපී භික්ෂුවක් පිවිසියේය. මම ඔහු සමග පොහොය නොකරමියි පිටත සිටියෙමි වෙමි'. 'ස්වාමීනි, එසේ නොසිතන්න. මේ භික්ෂුව පිරිසිදු සිල් ඇත්තේය. ඔබ දුටු ස්ත්‍රිය අන් කිසිවෙක් නොවේ, මමය. මම ඔබ පරීක්ෂා කරනු පිණිස මේ තෙරුන්ගේ මිත්‍රත්වය දැඩිද නැතහොත් එසේ නොවේදැයි බිඳෙන නොබිඳෙන බව බලන්නා වූ මා විසින් එය කරන ලදී. 'සත්පුරුෂය, ඔබ කවරෙක්ද?' 'මම ස්වාමිනි බූමාටු දේවතාවක් වෙමි'යි කියන්නේම දිව්‍යාත්ම භාවයෙන් සිට උන්වහන්සේගේ පාමුල වැටී 'ස්වාමීනි, මට සමාවුව මැනව. තෙරුන් වහන්සේට මේ දෝෂය නැත. පොහොය කරනු මැනවයි තෙරුන්ගෙන් ඉල්ලා පොහොය ගෙට ප්‍රවේශ කරවීය. උන්වහන්සේ එක්තැනක පොහොය කළහ. නැවත මිත්‍රත්වයෙන් එක් තැනක නොවිසූහ. උන්වහන්සේ මේ තෙරුන් වහන්සේගේ දොස් නොකීහ. පසුකලෙක තෙරුන්වහන්සේ විදර්ශනාව සඳහා කටයුතු කරන්නාහු රහත්බවට පත්වූහ. බූමාටු දේවතාවා ඒ කර්මයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එක් බුද්ධාන්තරයක් අපායෙන් නොමිදුණේය. යම්හෙයකින් කිසියම් කලෙක මිනිසත්බවට පැමිණෙනම්, වෙනයම් අයකු විසින් කරන ලද දෝෂය ඔහු මත ම වැටෙන්නේ ය.

ඔහු අපගේ භාග්‍යවතුන් වහන්සේ උපන්කල්හි සැවැත්නුවර බමුණු කුලයෙක උපන්නේය. ධානකුමාර යයි ඔහුට නමක් තැබූහ. ඔහු වැඩිවිය පත්වූයේ තුන්වේදය ඉගෙන මහලු කල ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා ලද සැදැහැ ඇත්තේ සසුනෙහි පැවිදිව උපසපන් විය. උපසපන් දිනයෙහි පටන් එක් අලංකාරයෙන් සැරසුණු ස්ත්‍රියක් ඔහු ගමට පිවිසෙනවිට ඔහු සමගම පිවිසෙයි. නික්මෙනවිට නික්මෙයි. විහාරයට

පිවිසෙනවිට සමගම පිවිසෙයි. සිටිනවිට සිටියි. මෙසේ නිතර සබඳතාවක් පෙනෙයි. තෙරුන්වහන්සේ ඇය නොදකිති. උන්වහන්සේ පූර්ව කර්මයෙහි විපාක වශයෙන් ඈ අන්‍යයන්ට උවටැන් කරයි. ගමෙහි කැඳ හා අහර දෙන ස්ත්‍රීහු 'ස්වාමීනි, මේ එක් කොටසක් ඔබ වහන්සේටය. එක් කොටසක් ඔබ වහන්සේගේ මේ සහායිකාවට'යයි විහිළු කරති. තෙරුන් වහන්සේට මහත් ගැහැටක් වෙයි. විහාරයට ගියාහුද සාමණේරයන්ද තරුණ භික්ෂූන්ද පිරිවරා ධාන කුණ්ඩයෙක් වියයි විහිළු කළහ. උන්වහන්සේට ඒ නිසාම කුණ්ඩධාන තෙරුන් වහන්සේ යයි නමක් ඇතිවිය. උන්වහන්සේ හැමවිටම ඔවුන් විසින් කරනු ලබන විහිළුව ඉවසන්නට නොහැකි වන්නාහු උමතු කථා කියන්නාහු තොපිද නීචයෝය, තොපගේ උපධ්‍යායයාද නීචයෙකි. ගුරුවරයාද නීචයෙකි. කියති. ඉක්බිති මේ බව ශාස්තෘන් වහන්සේට දැන්වූහ. ශාස්තෘන් වහන්සේ ඔහු කැඳවා ධාන, ඔබ තරුණ සාමණේරයන් සමග පරොස් බස් බෙණෙතියි යනු සත්‍යයක්දැ'යි ඇසූ සේක. උන්වහන්සේ විසින් 'සත්‍යයි ස්වාමීනි'යි කී ලද කල්හි මෙසේ කුමක් නිසා කියහිදැයි ඇසූ සේක. 'ස්වාමීනි, නිතර ගැහැට ඉවසනු නොහැක්කෙමි. මෙසේ කියමියි'. 'ඔබ පෙර කළ කර්මය අද දවස තෙක් දිරවාලන්නට නොහැක්කෙහිය. නැවත මෙසේ පරොස් බස් නොකියවයි කියා,

මාවොච ඵරුසං කඤ්චි - වුත්තා පටිවදේ‍යුතං
දුක්ඛාහි සාරම්භකථා - පටි දණ්ඩා ඵුසෙය්‍යුතං

පරොස් බස් නොකියනු
කියනු ලැබුවෝ පිළිවදන් දෙති
තරහ බස් දුක් ගෙන දෙයි
පළිගැනීමට තුඩු දෙයි

සචෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා
එස පත්තොසි නිබ්බානං සාරම්භෝ තෙ න විජ්ජති

හඬ නගා දෙඩුවොත්
රිදී බඳුනට පහර දුන් සේ
නිවනට පැමිණි අයකුට
තරහවක් නැත්තේ ම ය

කී සේක.

ඒ තෙරුන්වහන්සේ ස්ත්‍රියක සමග හැසිරෙන මේ කරුණ කොසොල් රජුට ද කීහ. රජ තෙමේ ද 'යවු දරුවෙනි, එය විමසවු' යයි කියා යවා තමා ද පිරිවර සහිතව තෙරුන් වහන්සේ සමීපයට ගොස් එකත්පසෙක බලන්නේ සිටියේය. එවේලෙහි තෙරුන්වහන්සේ ඉදිකටුවකින් මසමින් සිටියහ. ඒ ස්ත්‍රියද නුවුරු තැනක සිටියාක් මෙන් පෙනෙයි. රජ එය දැක මෙබඳු කරුණක් ඇත්දැයි ඇය සිටි තැනට ගියේය. ඇය ඔහු එත් එත්ම තෙරුන් වහන්සේ වසන පන්සලට පිවිසියාක් මෙන් වූවාය. රජ තෙමේ ද ඇය සමගම පන්සලට පිවිස හැමතැන බලන්නේ නොදැක මේනම් ස්ත්‍රියක් නොවේ. තෙරුන් වහන්සේගේ කර්ම විපාකයයි සනිටුහන් කොට පළමුව තෙරුන් වහන්සේ සමීපයට එන්නේ තෙරුන් නොවැඳ ඒ කරුණ මුසාවක් යයි දැන පන්සලින් නික්මී තෙරුන් වැඳ එකත්පසෙක හුන්නේ 'ස්වාමීනි, පිණ්ඩාහාරයෙන් ක්ලාන්ත නොවන්නේදැ'යි විචාළේය. තෙරුන්වහන්සේ 'වටියි මහරජ' යයි කීහ. 'ස්වාමීනි මෙබඳු උපක්ලේශයක් සමග හැසිරෙන නුඹවහන්සේට පැහැදෙන්නේ කවරෙක්ද? මෙතැන් පටන් නුඹවහන්සේ ඇවිදීමට උවමනාවක් නැත. මම සිවුපසයෙන් උපස්ථාන කරන්නෙමි. නුඹවහන්සේ යෝනිසෝ මනසිකාරයෙන් යුතුවන්න පමා නොවන්න'යයි කියා නිබඳව භික්ෂාව පිහිටවීය. තෙරුන්වහන්සේ රජුන්ගේ උපකාර ලබා බොජුන් වැළඳීමෙන් ඒකාග්‍ර වූ සිත් ඇත්තෙක්ව විදර්ශනා වඩා රහත්බවට පත්වූහ. එතැන් පටන් ස්ත්‍රිය නොපෙනුණාය.

එකල සුභද්‍රාව උග්‍ර නගරයෙහි මිසදිටු කුලයක වාසය කරන්නී ශාස්තෘන් වහන්සේ මා හට අනුකම්පා කරන සේක්වායි පෙහෙවස් අංගයන් අධිෂ්ඨානකොට මස්මාංස අනුභව නොකරන්නී ව ප්‍රාසාදයෙහි උඩුමහල් තලයෙහි සිටියා 'මේ මල් අතරක නොසිට දසබලධාරීන් වහන්සේගේ හිසට උඩින් වියනක් වී සිටීවා. දසබලධාරීන් වහන්සේ මේ සංඥාවෙන්ම හෙට භික්ෂූන් පන්සියනමක් සමග මාගේ භික්ෂාව පිළිගන්නා සේක්වායි සත්‍යක්‍රියා කොට සමන්මල් මිටු අටක් විසුරුවා හැරියාය. මල් ගොස් දම්දෙසන වේලාවෙහි බුදුරජාණන් වහන්සේ මත්තෙහි වියනක්ව සිටියේය. ශාස්තෘන් වහන්සේ ඒ සමන්මල් වියන දැක සිතින්ම සුභද්‍රාවගේ භික්ෂාව ඉවසා දෙවන දවස්හි අරුණු නැගුණු කල්හි ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කී සේක. ආනන්ද, අද මම දුරුපෙදෙසක පිඬු පිණිස හැසිරෙන්නෙමි. පෘථග්ජනයන්ට දානය නොදී ආර්යයන්ට පමණක් දෙව'යි. තෙරුන් වහන්සේ භික්ෂූන්ට දැන්වූහ. ඇවැත්නි, අද ශාස්තෘන් වහන්සේ

දුර පෙදෙසක පිඬු පිණිස හැසිරෙන සේක. පෘථග්ජනයෝ සලාකය නොගනිත්වා. ආර්යයන් වහන්සේම සලාකය ගනිත්වායි කුණ්ඩධාන තෙරුන්වහන්සේ මෙසේ කීහ. ඇවැත්නි, සලාකය ගෙනඑන්නැයි පළමුවම සලාකය ගැනීමට අත දිගුකළහ. ආනන්ද තෙරුන් වහන්සේ 'ශාස්තෘන් වහන්සේ ඔබ වැන්නන්ට සලාකය නොදෙවන සේක. ආර්යයන් වහන්සේටම දෙවන සේකැයි විතර්කයක් උපදවා ගොස් දැන්වූහ. ශාස්තෘන් වහන්සේ සලාකය ගෙන එන්නහුට දෙවයි කී සේක. තෙරුන් වහන්සේ මෙසේ සිතූහ. යම්හෙයකින් කුණ්ඩධාන තෙරුන්ට සලාකය දීම සුදුසු නොවේනම්, ශාස්තෘන් වහන්සේ එය වළක්වන සේක. මෙහි යමක් ඇතැයි කුණ්ඩධාන තෙරුන්ට සලාකය දීමට ගියහ. කුණ්ඩධාන තෙරුන් වහන්සේ ඔහු ඒමට පළමුවම අභිඥා පාදකකොට ඇති චතුර්ථධ්‍යානයට සමවැද ඍද්ධියෙන් අහසෙහි සිට ඇවැත්නි, ආනන්දය, ශාස්තෘන් වහන්සේ මා දන්නා සේක. මා වැනි භික්ෂුවක් පළමුව සලාකය ගන්නහු ශාස්තෘන් වහන්සේ නොවළක්වන සේකැයි අත දික්කොට සලාකය ගත්හ. ශාස්තෘන් වහන්සේ මෙම කරුණ මුල්කොට ගෙන තෙරුන් වහන්සේ මේ සසුනෙහි පළමුව සලාක ගන්නවුන් අතර අගතන්හි තැබූ සේක. යම් කරුණක් නිසා මේ තෙරුන්වහන්සේ රජවරුන්ගේ උපකාරය ලැබ පථ්‍ය ආහාර ලැබීමෙන් සමවන් සිත් ඇත්තේ විදර්ශනාව සඳහා කටයුතු කරන්නාහු උපනිශ්‍රය සම්පත් ඇති බැවින් ෂට් අභිඥාලාභී වූහ. මෙසේ වූ මේ තෙරුන් වහන්සේගේ ගුණ නොදත් යම් පෘථග්ජන භික්ෂු කෙනෙක් මොහු පළමුව සලාකය ගනිති. මේ කිමෙක්දැයි විමතියක් උපදවති. ඔවුන්ගේ ඒ විමතිය නැතිකරනු පිණිස තෙරුන්වහන්සේ අහසට පැනනැගී ඍද්ධි ප්‍රාතිහාර්ය පෙන්වා වෙනෙකක් දක්වන ආකාරයෙන් රහත් බව ප්‍රකාශ කරන්නාහු **'පඤ්චඡළභිඤ්ඤෙ'** යන ගාථාව කීහ. මෙසේ ඔහු පුරන ලද පුණ්‍ය සම්භාරයන්ට අනුරූපව රහත් ව පැමිණි අගතැන් ඇත්තේ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වශයෙන් පෙර චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සත්තාහං පටිසල්ලීනං** යනාදිය කීය.

එහි **සත්තාහං** දවස් සතක් නිරෝධ සමාපත්ති විහාරයෙන් **පටිසල්ලීනං** විවේකී වීය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

කුණ්ඩධාන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.32

සොහිතො නාම නාමෙන ආදි වශයෙන් ආයුෂ්මත් සාගත තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි ඒ ඒ තන්හි නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් බමුණු කුලයක උපන්නේ සියලු ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණියේ නමින් සොහිත නම් ව තුන්වේදයෙහි පරතෙර දුටුවේ නිඝණ්ඩු කේටුභ සාක්ෂර ප්‍රභේදයන්හි ඉතිහාසය පස්වැනි කොට ඇති පද දත්තේ ව්‍යාකරණ දත්තේ ලෝකායත මහා පුරුෂ ලක්ෂණයන්හි දක්ෂ විය.

ඔහු එක් දවසක් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ශ්‍රීයෙන් ශෝභමානව උයන්දොරින් යන්නා වූ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ දැක අතිශයින් පහන්සිත් ඇත්තේ නොයෙක් උපායෙන් නොයෙක් ගුණ වර්ණනයෙන් ස්තුති කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ස්තුතිය අසා අනාගතයෙහි ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි සාගත නමින් ශ්‍රාවකයෙක් වන්නේයයි විවරණයක් දුන් සේක. ඔහු එතැන් පටන් පින් කරන්නේ දිවි ඇති තෙක් සිට එයින් චුතව දෙව්ලොව උපන්නේ කල්ප සියදහසක් දෙවි මිනිසුන් අතර උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපදුණේ ඔහුගේ මව්පියෝ සොමනස වඩන සුජාත ආවේනුයි සාගත යයි නමක් තැබූහ. ඔහු සසුනෙහි පැහැදී පැවිදිව විදර්ශනා වඩා රහත් බවට පැමිණියේය. මෙසේ පුණ්‍ය සම්භාර අනුරූපව පත්වූ රහත්ඵල ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොමනස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සොහිතො නාම නාමෙන** ආදිය කීය.

මෙහි එකල්හි පුණ්‍ය සම්භාරයන් පුරන කල්හි නමින් සෝහිත නම් බමුණෙක් වීම යනු සම්බන්ධයි. **විපථා උද්ධරිත්වාන** යනු විරුද්ධ මාර්ගයෙන් වැරදි මාර්ගයෙන් උන්මාර්ගයෙන් **උද්ධරිත්වා** පහව. **පථං ආචික්ඛසෙ** යනු ස්වාමීනි, සර්වඥතා මාර්ගය සත්පුරුෂ මාර්ගය නිවන් අවබෝධ කිරීමේ උපාය **ආචික්ඛසෙ** කීය. දේශනා කළේය. විභජනය කළේය. පැහැදිලි කළේය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සාගත තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.33

පදුමුත්තර නාමස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් කච්චායන තෙරුන් වහන්සේගේ චරිතාපදානයයි. මොහු ද පෙරබුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගෘහපති මහාසාල කුලගෙයක ඉපිද වැඩිවිය පැමිණියේ එක් දවසක් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් කියන ලද දෙය විස්තර වශයෙන් අර්ථය බෙදා විස්තර කරන්නවුන් අතර අගතන්හි තබනු ලබන එක් භික්ෂුවක දැක තමා ද එම තනතුර ප්‍රාර්ථනා කරන්නේ දන් ආදී පින්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විද්‍යාධරයෙක් ව අහසින් යන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේ එක් වනළැහැබෙක හිඳිනු දැක පහන්සිත් ඇත්තේ කිණිහිරි මලින් පූදා ගියේය. ඔහු ඒ පින්කමින් කලින් කල සුගතීන්හි පමණක් ඉපදී කාශ්‍යප දශබලධාරීන් වහන්සේගේ කාලයෙහි බරණැස්නුවර කුලගෙයක ඉපිද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිකල්හි ස්වර්ණ චෛත්‍යය කරන ස්ථානයට දසදහසක් වටිනා රන් ගඩොලින් පූජාකොට මේ පින්කමෙහි විපාක වශයෙන් උපනුපත් තැන මාගේ ශරීරය රන්වන් වේවායි ප්‍රාර්ථනයක් කළේය.

ඉන්පසු දිවි ඇතිතාක් කුසල්කොට එක් බුද්ධාන්තරයක් දෙවි මිනිසුන් අතර සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි උදේනී නුවර චණ්ඩ ප්‍රද්‍යෝත රජුගේ පුරෝහිතයාගේ ගෙහි උපන්නේය. ඔහුට නම් තබන දිනයෙහි මව්පියෝ අපගේ පුත්‍රයා රන්වන්වම තමාගේ නම ගෙන පැමිණියේ වනැයි කාංචනමානව යයි ඔහුට නම් තැබූහ. ඔහු වැඩිවිය පත්ව තුන්වේදය ඉගෙන පියාගේ ඇවෑමෙන් පුරෝහිත තනතුර ලැබීය. ගෝත්‍ර වශයෙන් කච්චායන යයි දන්නා ලද්දේය. චණ්ඩ ප්‍රද්‍යෝත රජතුමා බුදුන් උපන් බව අසා ආචාර්යය, ඔබ එහි ගොස් ශාස්තෘන් වහන්සේ මෙහි වඩමවාගෙන එන්නැයි යැවීය. තමා අටවැනිව ශාස්තෘන් වහන්සේ සමීපයට එළැඹියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දම්දෙසූ සේක. දේශනාව කෙළවර ඔහු පිරිවර සත්දෙන සමග පිළිසිඹියා සහිතව රහත්බවෙහි පිහිටියේය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ එව මහණෙනි අත දිගුකළ සේක. ඔවුහු එකෙණෙහි දැඟුලක් පමණ වූ කෙස් රවුල් ඇත්තාහු, ඍද්ධිමය පාසිවුරුධරව සැටවස් ඇති තෙරවරුන් මෙන් වූහ. මෙසේ තෙරුන්වහන්සේ උතුම් අර්ථය

නිෂ්පාදනය කොට 'ස්වාමීනි, ප්‍රද්‍යෝත රජ තෙමේ ඔබවහන්සේගේ පා වැන්දේය. ඔහු දහම් ඇසීමට ද කැමැත්තේ යයි ශාස්තෘන් වහන්සේට දැන්වීය. ශාස්තෘන් වහන්සේ භික්ෂුව ඔබම එහි යන්න. රජ ප්‍රසාදයට පත්වන්නේ යයි කී සේක. තෙරුන් වහන්සේ තමන් අටවැනිව එහි ගොස් රජු පහදවා අවන්ති ජනපදයෙහි සසුන පිහිටුවා නැවත ශාස්තෘන් වහන්සේ සමීපයටම ගියහ. මෙසේ උන්වහන්සේ පැමිණි රහත්ඵල ඇත්තාහු 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යමෙක් සංක්ෂේපයෙන් කියූ දෙය විස්තර වශයෙන් අර්ථ විභජනය කළ හැක්කේද. ඒ කච්චායන යයි අගතන්හි තබන ලද්දේ තමාගේ පූර්ව කර්මය සිහිකොට පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරස්ස නාථස්ස** ආදිය කීය.

එහි **පදුමං නාම චෙතියං** යනු පද්මයන්ගෙන් වසනු ලැබූ නිසා හෝ පද්මාකාරයෙන් කරන ලද බැවින් හෝ භාග්‍යවතුන් වහන්සේ වාසය කරන ගන්ධකුටි විහාරය ද පූජනීය බැවින් චෛත්‍ය වේ. යම්සේ ගෞතමක චෛත්‍යය, ආලවක චෛත්‍යයයි කියූකල්හි ඒවා යක්ෂයන්ගේ නිවාසස්ථාන පූජනීය ස්ථාන වූ බැවින් චෛත්‍යය යයි කියනු ලැබේ. මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේගේ වසන ස්ථානය චෛත්‍යයයි කියනු ලැබේ. ධාතු නිදන් නො කරන ලද චෛත්‍යයක් යයි දතයුතුය. පිරිනිවන් නොපෑ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් නොමැති බැවින් ධාතු චෛත්‍යයක් නොකළේය යනුයි. **සිලාසනං කාරයිත්වා** යනු ඒ පදුම නම් ඇති ගඳකිළියෙහි පුෂ්පාධාරත්‍රයට යටින් පළිඟු මුවා ශෛලාසනයක් කරවා. **සුවණ්ණනාභි ලෙපයිං** යනු ඒ ශෛලාසනය දඹරන් පැහැයෙන් ආලේප කළෙමි. අති විශේෂයෙන් මල් අසුනට යන අර්ථයි. **රතනාමයං** සත්රුවනින් කරන ලද ඡත්‍රය අල්ලාගෙන හිස්මුදුනෙහි දරා වල් විදුනාවක් උතුම් වූ සුදු සෙමර වලිගයක්ද අල්ලාගෙන බුදුරජාණන් වහන්සේට එසවූයෙමි. **ලොක ජෙට්ඨස්ස තාදිනො** යනු සකල ලෝකයට ඥාතියකු බඳු තාදී ගුණ යුත් බුදුරජාණන් වහන්සේට දරා සිටියෙමියි අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

මහාකච්චාන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.34

පදුමුත්තරස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් කාලුදායී තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවූ පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර කුලගෙයක උපන්නේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් කුල පහදවන භික්ෂූන් අතර අගතන්හි තබනු ලබන එක් භික්ෂුවක දැක එබඳු උතුම් ප්‍රාර්ථනාවක් කොට ඒ තනතුර ප්‍රාර්ථනා කළේය. හේ දිවි ඇතිතෙක් කුසල්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ අපගේ බෝධිසත්වයන් වහන්සේ මවගේ කුසෙහි පිළිසිඳගන්නා දවසෙහි, ඔහුද කපිලවස්තු නගරයෙහි ම ඇමතියකුගේ ගෙහි පිළිසිඳ ගත්තේය. බෝධිසත්වයන් වහන්සේ සමගම එක් දිනයෙහිම උපන්නේ විය. එදවස ම ඔහු දුහුල් සුඹුළුවෙක හොවා බෝධිසත්වයන් වහන්සේ ළඟට ගෙන ආහ. බෝධිසත්වයන් වහන්සේ සමග, බෝරුක, රාහුල මාතාව, සතරමහා නිධාන, කන්ථක, ආනන්ද, ඡන්න, කාලුදායී යන මේ සත එක් දවසෙක උපන් බැවින් සහජාත නම් වූහ. ඉක්බිති ඔහුට නම් තබන දවසෙහි සියලු නගරයෙහි ඔදවැඩුණු සිත් ඇති දවසෙහි උපන් බැවින් උදායී යනුවෙන්ම නමක් තැබූහ. මදක් කාලවර්ණ ස්වභාවය ඇති බැවින් කාලුදායී යනුවෙන් දන්නා ලද්දේ විය.

ඔහු බෝධිසත්වයන් සමග කුමර කෙළි කෙළින්නේ වැඩිවිය පත්විය. පසුකලෙක ලෝකනාථයන් වහන්සේ මහබිනික්මන් නික්ම අනුක්‍රමයෙන් සර්වඥ තත්වයට පත්ව පවත්වන ලද උතුම් දම්සක් ඇත්තේ රජගහනුවර නිසා වේළුවනාරාමයෙහි වාසය කරන සේක්, සුදොවුන් මහරජ ඒ පුවත අසා පුරුෂයන් දහසක් පිරිවර ඇති එක් ඇමතියකු පුත්‍රයා මෙහි ගෙනෙවයි යැවීය. ඔහු ධර්මදේශනා වේලාවෙහි ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් පිරිස් කෙළවර සිටියේ ධර්මය අසා පිරිවර සහිතව රහත්බවට පත්විය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ එවූ මහණෙනියි ඔවුන්ට අත දිගුකළ සේක. සියලු දෙන එකෙණෙහිම ඍද්ධිමය පාසිවුරු ධරව සියවස් පිරුණු තෙරුන් මෙන් වූහ. රහත් බවට පත්වූ තැන් පටන් ආර්යයෝ මධ්‍යස්ථයෝම වෙති. ඒ නිසා රජු විසින් එවන ලද ඒ හසුන දසබලධාරීන් වහන්සේට නොකීහ. රජ තෙමේ 'ගියකෙනා එන්නේද නැත. හසුනක් අසන්නටද නැතැ'යි වෙනත් ඇමතියකු පුරුෂයන් දහසක් සමග යැවීය.

එහිදී ද ඒ අයුරින්ම සිදුවූ කල තවත් ඇමතියකු යැවීය. මෙසේ පුරුෂයන් අනූදහසක් සමග ඇමතියන් නව දෙනකු යැවිය. සියලුදෙන රහත්බවට පත්ව නිහඬ වූහ. ඉක්බිති රජතෙමේ මෙසේ සිතීය. මෙපමණ ජනයෝ මා කෙරෙහි සෙනේ නැති බැවින් දසබලධාරීන් වහන්සේ මෙහි වැඩමවාගෙන ඒම පිණිස කිසිවක් නොකීහ. මේ උදායී දශබලධාරීන් වහන්සේ සමග සමවයස් ඇත්තේය. වැලිකෙළියේ එකට යෙදුණේය. මා කෙරෙහි සෙනෙහෙ ඇත්තේද වෙයි. මොහු යවන්නෙමියි ඔහු කැඳවා 'දරුව, නුඹ පුරුෂයන් දහසක් පිරිවර ඇතිව රජගහ නුවරට ගොස් දශබලයන් වහන්සේ මෙහි වඩමවාගෙන එව'යි කියා යැවීය. හෙතෙමේ 'දේවයන් වහන්ස, යම් හෙයකින් මට පැවිදි වන්නට ලැබේනම් පමණක් භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩමාගෙන එන්නෙමි'යි කියා 'යම්කිසි දෙයක් කොට මාගේ පුත්‍රයා දක්වව'යි කී කල්හි රජගහනුවරට ගොස් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනා වේලාවෙහි පිරිස් කෙළවර සිටියේ දහම් අසා පිරිවර සහිතව රහත්බවට පත්වී ඒහිභික්ඛුභාවයෙන් උපසම්පදාව ලැබීය. රහත්බවට පත්ව තවමත් දශබලධාරීන් වහන්සේ කුල නුවරට වැඩමවීමට කල් නොවේ. වසන්තය පැමිණි කල වන ළැහැබ් මලින් බරවූ කල බිම නිල් තණපතින් ගැවසුණු කල වැඩමවීමට කාලය වන්නේ යයි කල් බලන්නේ වසන්තය උදාවූ කල ශාස්තෘන් වහන්සේට කුලනුවරට වැඩමවීමට ගමන්මග වරුණ මැනවින් වර්ණනා කරන්නේ:

අංගාරිනෝ දානි දුමා භදන්තෙ
ඵලෙසිනෝ ඡදනං විප්පහාය
තෙ අචිම්මනෙතාව පභාසයන්ති
සමයෝ මහාවීර භගීරසානං

හිමියනි මෙවිට රුක් හිස් සහළඟුරු වගේ
පරඬැල් සලා පල දැරුමට ළඟයි වගේ
ඒ රුක් පහන්සිළු මෙන් බබලමින් නැගේ
සැකිකුලවුන්ට අත දෙත මේ කලැයි හැඟේ

දුමානි පුප්ඵානි මනොරමානි
සමනනතනෝ සබ්බදිසා පවන්ති
පත්තම්පභාය ඵලමාසසානා
කාලෝ ඉතෝ නික්ඛමනාය වීර

විරුවනි එරුක් මල් බරවී මනහරය
සුවඳින් පුරාලයි සැමදෙස පරිසරය
පලබරවනුව සැරසෙයි පරඬැල් හැරය
මෙතැනින් නික්මෙන්ට දැන් කාලය හරිය

නෙවාති සීතං නපනාති උණ්හං
සුඛාඋ අදධනියා හදනෙත
පසසනතු තං සාකියා කොළියාව
පඨමුබං රෝහිණිං තාරයනතං

වැඩි සීතලක් නැත වැඩි උණුසුමක් නැත
මහමග යන්ට සුන්දර රිතු ගුණය ඇත
රෝහිණි නදිය තරණය කොට ඔබ වඩින
සැකි -කෝළියෝ පැළදිග දෙස බලනු ඇත

ආසාය කසතෙ ඛෙත්තං
බීජං ආසාය වපති
ආසාය වාණිජා යනති
සමුද්දං ධන හාරකා
යාය ආසාය තිට්ඨාමි
සා මෙ ආසා සමිජ්ඣතු

සිතැඟි ලෙස කෙත් සැකසේ
සිතැඟි ලෙස බිජු වැපිරේ
දනය ගෙන යන වෙළඳ ජනයා
සිතැඟි ලෙස මහ සමුදුරේ යති
මමද යම් සිතැඟියක සිටිනෙමි
එයද ඉටුවනු දකිනු රිසියෙමි

පුනපපුනං චෙව වපනති බීජං
පුනපපුනං වසති දෙවරාජා
පුනපපුනං ඛෙත්තං කසනති කසසකා
පුනපපුනං ධඤඤමුපෙති රට්ඨං

යළි යළි බිජුවට වපුරාලන්නේ
යළි යළි මහවැසි දහර වසින්නේ
යළි යළි ගොවියන් කෙත් සකසන්නේ
යළි යළි රටවෙත වියැට ඇදෙන්නේ

පුනප්පුනං යාචනකා චරන්ති
පුනප්පුනං දානපති දදන්ති
පුනප්පුනං දානපති දදිත්වා
පුනප්පුනං සඟමුපෙන්තියානං

යළි යළි ඉල්ලා ඇවිදිති යදියෝ
යළි යළි ඔවුනට දෙති දන්පතියෝ
යළි යළි දන් දී ඒ දන්පතියෝ
යළි යළි යහපත් තැනට සැපැතියෝ

වීරෝ භවෙ සත්ත යුගං පුනෙති
යසම්ං කුලෙ ජායති භූරිපඤ්ඤෝ
මඤ්ඤාමහං සක්කති දෙවදෙවෝ
තායාහිජාතෝ මුනි සච්චනාමෝ

පවුලක මහ පැනැති විරුවකු උපන්විට
හත්මුතු පරපුරක් යෙයි පිරිසුදු බවට
හැකිවේයයි සිතමි දෙවි දෙවි වූ ඔබට
ගැළපෙයි එයින් ඔබ සත්‍යය යන නමට

සුද්ධෝදනෝ නාම පිතා මහෙසිනෝ
බුද්ධස්ස මාතා පන මාය නාමා
යා බොධි සත්තං පරිහරිය කුච්ඡිනා
කායස්ස භෙදා තිදිවමහි මොදති

ඔබගේ පියතුමා සුදොවුන් නම් වේය
ඔබගේ මව්තොමෝ මායා නම් වේය
බෝසත් කුසදරා සිට ඈ මියැදේය
ඉන්පසු තුටුවෙමින් දෙව්ලොව වැජඹේය

සාගොතමී කාලකතා ඉතොචුතා
දිබ්බෙහි කාමෙහි සමංගිභූතා
යා මොදතී කාම ගුණෙහි පඤ්චහි
පරිවාරිතා දෙවගණෙහි තෙහිතෙ

ඒ ගෝතමිය කලුරියකොට මින් චුතව
දෙව්ලොව කම් සැපෙහි හැම අඟකින් යුතුව
පස්කම් ගුණෙන් ඈ දැන් මොනවට තුටුව
සැප විඳිනිය දෙව්ගණ පිරිවර ඇතුව

මේ ගාථා කී සේක. එහි අංගාරිනෝ යනු අඟුරු මෙනැයි අංගාරානි අඟුරු වැනි රතුපබළු පැහැගත් ගස්වල මල්දලු මේවාට ඇතැයි අංගාරිනෝ. අතිශයින් රත්පැහැ ගත් මල් දලුවෙන් අඟුරු වැස්සෙන් හාත්පසින් **භදනෙත** යනු මොහුගේ අන්තයෙහි යහපතැයි **භද්දනෙත** යනුවෙන් කිවයුතු තන්හි එක් දකාරයක් ලොප්කොට **භදනෙත** යි කියන ලදී. ගුණ විශේෂයන්ගෙන් යුක්ත වූවන්ටද අග්‍ර වූ ශාස්තෘන් වහන්සේ. ඒ නිසා **භදනෙත** යනු ශාස්තෘන් වහන්සේ ඇමතීමක්මය. මේ දුතියා වචනයද ඒකාරාන්ත වේ. සුකතෙ, පටික්කමෙම, සුඛෙ, දුක්ඛෙ ආදියෙහි මෙන්. මෙහි ආලපන අර්ථයෙහි දතයුතුය. එහෙයින් කියන ලදී. භදනෙත යනු ආලපන වේයැයි. භද්ද ශබ්දය හා සමානාර්ථ ඇති එක් පදාන්තරයක්ද ඇතැයි සමහරු කියති. එල සොයත්නුයි **එලෙසිනෝ**. අචේතනික නාමපදයන්හි ද සචේතනික ක්‍රියාවක් කීය. මෙසේ තෙරුන් වහන්සේ විසින් යාචිත වූ භාග්‍යවතුන් වහන්සේ එහි යාමෙන් බොහෝ දෙනකුට සිදුවන විශේෂ අධිගමයක් දැක විසිදහසක් රහතුන් පිරිවරන ලද සේක් රජගහනුවර සිට අනුපිළිවෙළ චාරිකාවක් වශයෙන් කපිලවස්තුවට දිවෙන මහා මාර්ගයට පිළිපන් සේක. තෙරුන් වහන්සේ ඍද්ධියෙන් කපිල වස්තුවට ගොස් රජුගේ ඉදිරියෙහි අහසෙහි සිටියාහු නුදුටුවිරූ වේශයක් දැක රජු විසින් 'ඔබ කවරෙක්දැයි විමසන ලද්දාහු ඔබ විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයට යවන ලද අමාත්‍යපුත්‍රයා වූ මා නොදන්නා ඔබ මෙසේ දනුවයි දක්වන්නාහු

බුද්ධස්ස පුත්තොම්හි අසයහසාහිනෝ
අංගීරසසපටිමස්ස තාදිනෝ
පිතුපිතා මයහං තුවංසි සක්ක
ධම්මෙන මෙ ගොතම අය්‍යකොසීති

අසැහි සැහිවූ අංගිරස වූ තාදි ගුණගණ යුතු
අසමසම වූ බුදුපියාණන් වහන්සේගේ මම පුතු
මාපියාණන් පියාවෙති ඔබවහන්සේ සැකිකුල ගොයුම් හොතු
සොබාවෙන්මත් ඔබවහන්සේ වන සේක මාගේ මුතු

එහි බුද්ධස්ස පුත්තොම්හි යනු සර්වඥ බුදුරජාණන් වහන්සේගේ ඖරස පුත්‍රයා වෙමි. **අසඤ්ඤ සාහිනෝ** යනු නිර්වාණාවබෝධයට පෙර මහබෝසතුන් හැර අන්‍යයන් විසින් අභිභවනය කිරීමට නොහැකි වූ බැවින් අභිභවනය කළ නොහැකි සියලු බෝධි සම්භාරයන් මහාකරුණා අධිකාරයන් අභිභවනය කරන බැවින්. ඉන්පසුවත් අනුන් විසින් **සහිතුං** අභිභවනය කරන්ට නොහැකි බැවින් අභිභවනය කළ නොහැකි පස්මරු් **සදනෙනා** අභිභවනය කරන හෙයින්, ආසයානුසය චරිතාධිමුත්ති ආදි විභාව අවබෝධයෙන් සුදුසු පරිදි භික්ෂුවිය යුත්තන්ට මෙලොව පරලොව පරමාර්ථයන්ගෙන් අනුශාසන සංඛ්‍යාත අන්‍යයන් විසින් අභිභවනය නොකළහැකි බුද්ධකෘත්‍ය අභිභවනය කරන හෙයින්, ඒ ඒ තැන හෝ යහපත් දේ කරන හෙයින්, **අසයහසාහි** නම් වේ. **අඛගීරසස්ස** යනු පිළිගත් ශීලාදි සම්පත් ඇති අඟපසඟින් නික්මෙන ආලෝකය ඇති, යනුයි. කිසිවෙක් අංගීරස, සිද්ධාර්ථ යනුවෙන් නම් දෙකක් පියා විසින්ම තබන ලද්දේයයි කියති. **අපපටිමස්ස** අනුපම වූ, ඉටුඅනිටු දැයෙහි නොසැලෙන ලක්ෂණ සම්පත්තියෙන් තාදිනෝ නම්. **පිතුපපි තාමයඤං තුවංසි** යනු ආර්යජාති වශයෙන් මාගේ පියා වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ ලෝක ව්‍යවහාරයෙන් පියා ඔබ වෙහි. **සක්ක** යනු ජාති වශයෙන් රාජවරුන්ට අමතයි. **ධම්මෙන** යනු ස්වභාවයෙන් ආර්ය ජාතිය ලෞකික ජාතිය යන ජාතීන්ගේ ස්වභාව එකතුවෙන්. **ගොතම** යනු රජවරුන්ට ගෝත්‍රයෙන් අමතයි. **අය්‍යකොසි** යනු මුත්තණුවෝ වෙති.

මෙහිද බුද්ධස්ස පුත්තොම්හි ආදිය කියන තෙරුන්වහන්සේ රහත් බව ප්‍රකාශකිරීම් වශයෙන් තමා හඳුන්වා තුටුපහටු වූ රජතුමා විසින් මාහැඟි පුටුවෙක හිඳුවා තමාට පිළියෙල කරනු ලැබූ නානාග්‍රරසයෙන් යුතු භෝජනයෙන් පාත්‍රය පුරවා දුන්කල්හි යන ආකාරයක් දැක්වූ සේක. 'ස්වාමීනි, කුමක් හෙයින් යනු කැමැත්තේද වළඳනු මැනවැයි'ද කී කල්හි 'ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් වළඳන්නෙමි යි. කොහිද ස්වාමීනි ශාස්තෘන් වහන්සේ? විසිදහසක් පිරිවරකොට ඔබ දකිනු පිණිස මගට පිළිපන් සේක. ඔබවහන්සේ මේ පිණ්ඩපාතය වළඳනු මැනවි. වෙනෙකක්

භාග්‍යවතුන් වහන්සේට යවනු මැනවි. යම්තාක් මාගේ පුත්‍රයා මේ නගරයට පැමිණේද, එතෙක් ඔහුට මෙතැනින් පිණ්ඩපාතය ගෙනයනු මැනවැයි කී කල්හි තෙරුන්වහන්සේ බත්කිස කොට රජුට පිරිසිදු ධර්මය කියා ශාස්තෘන් වහන්සේ පැමිණීමට පළමුවෙන්ම මුළු රජමැදුර රත්නත්‍රයෙහි අතිප්‍රසන්න කරන්නාහු ශාස්තෘන් වහන්සේට ගෙන ආ යුතු බත් පිරුණු පාත්‍රය අහසෙහි යවා තමාද අහසට පැනනැඟී පිණ්ඩපාතය පිරිනමා ශාස්තෘන් වහන්සේගේ අතෙහි තැබූ සේක. ශාස්තෘන් වහන්සේ ඒ පිණ්ඩපාතය වැළඳූ සේක. මෙසේ සැටයොදුන් මග දවසින් දවස යොදුනක් යන්නා වූ භාග්‍යවතුන් වහන්සේට පිණ්ඩපාතය ගෙනවුත් දුන් සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, මුන්වහන්සේ මාගේ පියාගේ මුළු නිවසම පැහැද වූහයි මහණෙනි මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර කුලප්‍රසාදක යම් කෙනෙක් වේද ඒ කාළුදායියයි කුලප්‍රසාදක භික්ෂූන් අතර අගතන්හි තැබූ සේක.

මෙසේ උන්වහන්සේ කරන ලද පුණ්‍ය සම්භාර අනුරූපයෙන් රහත් බවට පත්ව පැමිණි අගතැන් ඇත්තාහු තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර** බුදුඳසඳ ආදිය කී සේක. **අදධානං පටිපන්නස්ස** යනු වෙනත් රටකට යනු පිණිස දුරුමගට පිළිපන් **චරතෝ චාරිකංතදා** යනු අනෙකා මණ්ඩලය මධ්‍ය මණ්ඩලය බහි මණ්ඩලය යන තුන් මණ්ඩලයන්හි එකල චාරිකාවෙහි **චරතෝ** සරන්නා වූ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ. **සුථුල්ලං** මැනවින් පිපුණු පිබිදුණු. **ගඡඡ** අල්ලාගෙන එකම පද්මයක් ද මහනෙල් මලක් ද **ථුල්ලිතං** පිපුණු මම ගඡඡ දැතින් ගෙන පිදුවෙමි යන **සම්බන්ධයි. පරමන්නං ගහෙත්වාන** යනු පරම වූ උත්තම වූ ශ්‍රේෂ්ඨ වූ මධුර වූ සියල්ල මැනවින් පිසූ හැල්බත් ගෙන ශාස්තෘන් වහන්සේට **අදාසිං** වැළඳවූයෙමි යන අර්ථයි. **සක්‍යානං නන්දිජනනෝ** යනු ශාක්‍යරාජ කුලයෙහි වූ භාග්‍යවතුන් වහන්සේගේ ඥාතීන්ට ආරෝහ පරිණාහ රූප යෞවන වචන ආලපන **සම්පත්තියෙන්** සතුට **ජනෙනෙතා** උපදවන්නේ. **ඤාති බන්ධු භවිස්සති** යනු දන්නා ලද ප්‍රකට වූ ඥාතියෙක් වන්නේ ය. සෙස්ස පහසුවෙන් දතහැකි වන්නේ ම ය.

කාළුදායී තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.35

අත්‍ථදස්සි තු භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් මොඝරාජ තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ අත්‍ථදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණියේ එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක් රළුසිවුරු දරන්නන් අතර අගතැන්හි තබනු දැක ඒ තනතුර අපේක්ෂා කරන්නේ ප්‍රාර්ථනාවක් කොට භවයෙහි තැනින් තැන පින් කරන්නේ අත්‍ථදස්සි භාග්‍යවතුන් වහන්සේ ධරමාන කාලයෙහිම නැවත බමුණු කුලයක ඉපිද බමුණන්ගේ විද්‍යා ශිල්පයන්හි පරතෙරට ගියේ එක්දවසක් අත්‍ථදස්සි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා වීදියෙහි යනු දැක පහන් සිත් ඇත්තේ පසඟ පිහිටුවා වැඳ හිසෙහි ඇඳිලි බැඳ 'යාවතා රූපිනො සත්තා' යනාදී ගාථා සයකින් ප්‍රශංසා කොට බඳුන පුරවා මීපැණි පිරිනැමීය. ශාස්තෘන් වහන්සේ එය පිළිගෙන අනුමෝදනා කළ සේක.

ඔහු ඒ පුණ්‍යකර්මයෙන් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කාෂ්ටවාහන නම් රජුගේ අමාත්‍යයකුව උපන්නේ, ඔහු විසින් ශාස්තෘන් වහන්සේ වඩමවාගෙන එනු පිණිස යවන ලද්දේ ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් දහම් අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව විසිදහසක් අවුරුදු මහණදම් පුරා එයින් චුතව එක් බුද්ධාන්තරයක් සුගතීන්හිම පරිවර්තනය වන්නේ මෙම බුද්ධෝත්පාද කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද මොඝරාජ යයි ලැබූ නම් ඇත්තේ, පාවාරිය බමුණාගේ සමීපයෙහි උගත් ශිල්ප ඇත්තේ, සංවේගයට පත්වූයේ, තවුස් පැවිද්දෙන් පැවිදිව තවුසන් දහසක් පිරිවරකොට ඇත්තේ අජිත ආදීන් සමග ශාස්තෘන් වහන්සේ සමීපයට යවන ලද්දේ ඔවුන්ගේ පහළොස් වෙනියාව රහත් බවට පත්ව වස්ත්‍රයෙන් රළු, මැස්මෙන් රළු වර්ණයෙන් රළු යන විශේෂත්වයක් ඇති ත්‍රිවිධාකාර රළු බවින් යුතු පාංශුකූලය දැරිය. ඒ නිසා ශාස්තෘන් වහන්සේ ඔහු රළුසිවුරු දරන්නවුන් අතර අගතැන්හි තැබූ සේක. මෙසේ ඔහු ප්‍රාර්ථනාකුලව රහත් ඵලයට පත්ව තමාගේ පෙර කළ දේ දැක පූර්වකර්ම අපදානය ප්‍රකාශ කරන්නේ 'අත්‍ථදස්සිතු භගවා' යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේමය. **පුටකං පූරයිත්‍වා** පුටක යනු බඳුන හෝ කළය හෝ යයි

කියනු ලැබේ. අනෙලකං දොසක් නැති. මැසි බිජු නැති නොවැදගත් මීපැණියෙන් කළය පුරවා එය දැතින් අල්ලා ගෞරවාදරයෙන් ගෙන මහේසී භාග්‍යවතුන් වහන්සේට පිරිනැමීය යනු සම්බන්ධයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

මොඝරාජ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.36

නිබ්බුතෙ ලොක නාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් අධිමුත්ත තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ අසඨදසසි ලෝකනාථයන් වහන්සේ පිරිනිවි කල්හි එක් කුලගෙයක උපන්නේ තෙරුවන්හි පැහැදුණේ භික්ෂු සංඝයාට ආරාධනාකොට උක්ගසින් මණ්ඩපයක් කොට මහාදානයක් පවත්වා අවසන්හි නිර්වාණය ප්‍රාර්ථනා කළේය. ඔහු එයින් චුතව දෙවිමිනිසුන් අතර උභයසම්පත් අනුභව කොට මෙම බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ සසුනෙහි පැහැදී ශ්‍රද්ධාවෙන් පැවිදි වූ බැවින් අධිමුත්ත තෙරුන්වහන්සේ යයි ප්‍රකට වූයේ විය. මෙසේ කරන ලද දේ වශයෙන් රහත්බවට පත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වූයේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ නිබ්බුතෙ ලොකනාථම්හි ආදිය කිය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

අධිමුත්ත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.37

හිමවනතසසාවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් ලසුණදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නාහු විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව ගිහිගෙයි ආදීනව දැක ගිහිගෙය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවත ඇසුරුකොට වනයෙහි වසන්නාහු බොහෝ සුදුලූණු වවා එම වනමුල් ගෙඩිද අනුභව කරන්නාහු වාසය කළහ. ඔහු බොහෝ සුදුලූණු කදින් ගෙන මිනිස් පියසට ගෙනවුත් පහන් සිතින් දන් දී බුදුපාමොක් භික්ෂු සංඝයාට බෙහෙත් පිණිස දී යයි. මෙසේ ඔහු දිවි ඇති තෙක් පින්කොට ඒ පින් බෙලෙන්ම දෙව්මිනිසුන් අතර සැරිසරන්නේ, උභය සම්පත්තීන් අනුභවකොට ක්‍රමයෙන් මෙම බුද්ධෝත්පාද කාලයෙහි උපන්නේ ලැබූ ශ්‍රද්ධා ඇත්තේ පැවිදිව විදර්ශනා වඩා නොබෝ කලෙකින්ම රහත්බවට පැමිණියේ පූර්වකර්ම වශයෙන් ලසුණදායක තෙරුන් වහන්සේයයි ප්‍රකට වූයේ තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වූයේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **හිමවනතසසාවිදූරෙ** යනාදිය කීය. එහි හිමාලය පර්වතය කෙළවර මිනිසුන් හැසිරෙන තන්හි යම්කලෙක විපස්සි භාග්‍යවතුන් වහන්සේ උපන්සේක්ද එකල්හි මම තවුසෙක් වීමි යනු සම්බන්ධයි. **ලසුණං උපජීවාමි** යනු සුදුලූණු වවා එයම ආහාරයට ගෙන ජීවිතය ගෙනයමියි අර්ථයි. එසේ හෙයින් කියන ලදී, **ලසුණං මය්හං භොජනං** බාරියො පූරයිත්වාන යනු තාපසයන්ගේ බඳුන් සුදුලූණුවලින් පුරවා කදින් ගෙන සධාරාමං සංඝයා වසන තැන. හේමන්ත ආදී තුන්කල්හි සංඝයා සිව් ඉරියව්වෙන් වාසය කරන විහාරයට අගඤ්ඡිං ගියෙමි යනු අර්ථයි. **විපසසිසස** -පෙ- **නිරතසසහං** යනු නරයන්ට අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි මම නිරත වීමි යන සම්බන්ධයි. **සධසසස ලසුණං දත්වා කප්පං සගගමහි මොදහං** යනු මම සංඝයාට ලූණු දන් දී සගගමහි මනා අග්‍රයක් ඇති දෙව්ලොව ආයු කල්පයක් දිවසැපත් අනුභව කරමින් මොදිං සතුටුවූයේ වෙමි යි අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

ලසුණදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.38

නිබ්බුතො ලොකනාථම්හි ආදී වශයෙන් ආයුෂ්මත් ආයාගදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවූ පින් රැස් කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිකල්හි එක් කුලගෙයක උපන්නේ සසුනෙහි පැහැදුණේ වඩුවන්ට මුදල් දී අතිමනෝහර දික් බොජුන්හලක් කරවා භික්ෂු සංඝයාට ආරාධනාකොට ප්‍රණීත ආහාරයෙන් වළඳවා මහදන් දී සිත පැහැදවිය. ඔහු දිවි ඇති තෙක් පින්කොට දෙවි මිනිසුන් අතරම සැරිසරන්නේ උභයසම්පත්තීන් අනුභවකොට මෙම බුද්ධෝත්පාදයෙහි එක් කුලගෙයක උපන්නේ ලද සැදැහැ ඇත්තේ පැවිදිව උත්සාහ කරන්නේ වෑයම් කරන්නේ විදර්ශනා වඩා නොබෝ කලෙකින්ම රහත් බවට පත්විය. පෙර කරන ලද පුණ්‍ය වශයෙන් ආයාග තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. මෙසේ ඔහු කරන ලද පුණ්‍යසම්භාර වශයෙන් රහත් බවට පත්ව තමා විසින් පෙර කරන ලද කුසල කර්මය සිහිකොට සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ නිබ්බුතෙ ලොකනාථම්හි ආදිය කීය.

එහි **වදනං** අපි බුදුවරුයයි කියන්නවුන් අතරෙහි, වරෙ උත්තම වූ සිබී භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි යන අර්ථයි. හටෙඨා හටෙඨන **චිත්තෙන** යනු ශ්‍රද්ධාව නිසා තුටුපහටු වූයේ සොම්නස් සහිත සිත් ඇති බැවින් පහටු වූ සිතින්. **උත්තමං ථූපං** ශ්‍රේෂ්ඨ චෛත්‍යය. **අවඣිං** වැන්දෙමියි අර්ථයි. **වඩඪකීහි කරාපෙත්වා** යනු බොජුන්හලෙහි **පමාණං** ප්‍රමාණය කොපමණදැයි කියවා යනු අර්ථයි. **මූලං දත්වානහං තදා** යනු තදා එකල්හි මම වැඩකරනු පිණිස ඒ වඩුවන්ට මුදල් දී **ආයාගං** දිග බොජුන්හලක් **සන්තුට්ඨා** සොම්නස් සිතින්. මම **කරාපෙසහං** කරවීමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය. **ආයාගස්ස ඉදංඵලං** යනු බොජුන්හල් දන්දීමේ මේ විපාකයයි අර්ථයි.

ආයාගදායක තෙරුන්වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.39

සිද්ධත්ථස්ස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් ධම්මචක්කදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ අඹුදරුවන් සමග වැඩුණේ විභව සම්පත් ඇත්තේ මහාභෝග ඇත්තේ තුනුරුවන්හි පැහැදුණේ සැදැහැ ඇත්තේ දම්සබාවෙහි ධර්මාසනය පිටුපස රුවන්මුවා ධර්මචක්‍රයක් කරවා පූජා කළේය. ඔහු ඒ පුණ්‍ය කර්මයෙන් දෙවිමිනිසුන් අතර උපනුපන් තැන ශක්‍රසම්පත්තිය ද චක්‍රවර්ති සම්පත්තිය ද අනුභවකොට ක්‍රමයෙන් මෙම බුද්ධොත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ විභව සම්පත් ඇත්තේ උපන් ශ්‍රද්ධා ඇත්තේ පැවිදිව විදර්ශනා වඩා නොබෝ කලකින්ම රහත්බවට පත්ව පෙර කරන ලද කුසල නාමයට සමාන නමින් ධම්මචක්කිය තෙරුන්වහන්සේයයි ප්‍රකට විය. හෙතෙම පුණ්‍යසම්භාර අනුරූපව පැමිණි රහත්ඵල ඇත්තේ තමාගේ පෙර කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සිද්ධත්ථස්ස භගවතො** යනාදිය කීය.

සීහාසන සම්මුබා යනු **සීහස්ස** වැඩහුන් භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි බුද්ධාසනය ඉදිරිපිට ස්ථානයෙහි යන අර්ථයි. **ධම්මචක්කං මයා ඨපිතං** යනු මා විසින් ධර්මචක්‍රාකාරයෙන් දෙපස සිංහරූපය දක්වා මැද දර්පණයක් වැනිව කරවන ලද ධර්මචක්‍රය තබන ලදී. කුමක් සිදුවීද. හොඳින් දන්නා වූ බුද්ධිමතුන් විසින් අතිසුන්දරයයි වර්ණනා කරන ලදී. ස්ථිරව තබන ලද මනාසේ කරන ලද ධර්මචක්‍රය යන සම්බන්ධයි. **චාරුවණ්ණාව සොභාමි** යනු ස්වර්ණ වර්ණ මෙන් **සොභාමි** බැබලෙමියි අර්ථයි. සිව්වණින් බැබලෙමි යනුද පාඨයකි. ඔහුට ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර සංඛ්‍යාත වූ චතුර්වර්ණයෙන් **සොභාමි** බබලමි යන අර්ථයි. **සයොගබල වාහනො** යනු රන්සිවිගවෙල් ආදි වූ යෙදුම්වලින් ද සේනාපති මහාමාත්‍ර ආදී වූ සේවකයන්ගෙන් ද බලයන්ගෙන් ද අශ්වරථ සංඛ්‍යාත වූ වාහනයන්ගෙන් ද යුක්ත වූ යන අර්ථයි. **බහුජ්ජනා** බොහෝ මිනිස්සු. **අනුයුත්තා** මට අනුව පවත්නාහු **නිච්චං** නිතිකල් මා පිරිවරති යනු සම්බන්ධයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

ධම්මචක්කිය තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.40

සිදධත්ථසස භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් කපපරුකඛිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු ඒ ඒ භවයෙහි නිර්වාණාවබෝධයට උපායභූත වූ පින් රැස් කරන්නාහු සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විභව සම්පත් ඇති එක් කුලයක උපන්නාහු මහාධන ඇත්තාහු මහාභෝග ඇත්තාහු ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණාහු සත්රුවනින් විසිතුරු වූ රුවන්මුවා කප්රුකක් කරවා සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍යය සමීපයෙහි තබා පූජා කළහ. ඔහු මෙබඳු පින්කොට දිවි ඇති තෙක් සිට එයින් චුතව සුගතීන්හිම සැරිසරන්නේ ක්‍රමයෙන් මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ගිහිගෙය තබා තෙරුවන්හි පැහැදුණේ දහම් අසා ලැබූ සැදැහැ ඇත්තේ ශාස්තෘන් වහන්සේ සතුටුකොට පැවිදි වූයේ නොබෝ කලෙකින්ම රහත්බවට පැමිණ පෙර කරන ලද පුණ්‍ය කර්මයෙන් කපපරුකඛිය තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. ඔහු මෙසේ පැමිණි රහත්ඵල ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සිදධත්ථසස භගවතො** යනාදිය කීය. **ථූපසෙට්ඨසස සම්මුඛා** යනු ශ්‍රේෂ්ඨ වූ උත්තම වූ ධාතු නිදන් කරන ලද **ථූපසස** චෛත්‍යයට සමීප තැනක, **විචිත්‍ර** මනහර චිත්‍රපට සෝමාරපට ආදී රෙදි. **ලංඝිත්වා එල්ලා. කපපරුකඛං** යපෙසහං මම පිහිටු වූයෙමි යන අර්ථයි. සෙස්ස කියන ලද අර්ථ ඇත්තේ ම ය.

කපපරුකඛිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

සතරවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.41

බීණාසව සහසෙසහි ආදි වශයෙන් ආයුෂ්මත් උපාලි තෙරුන් වහන්සේගේ බෑනණු උපාලි තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු ඒ ඒ භවයන්හි පින් රැස් කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නාහු වැඩිවිය පත්ව ගෘහවාසයෙහි ආදීනව දැක ගිහිගෙය අතහැර ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව, පඤ්චඅභිඥා අෂ්ට සමාපත්තිලාභීව හිමවතෙහි විසූහ. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ විවේකීව වසනු කැමති සේක් හිමවතට පිවිසි සේක. තවුසා පූර්ණ චන්ද්‍රයා මෙන් බබලන භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක පහන් වූ සිතැත්තේ අඳුන්දිවි සම ඒකාංශකොට ඇඳිලිබැඳ වැඳ සිටියේම දසනිය එක්කොට ගත් ඇඳිලි හිසමත තබා නොයෙක් උපමාවන්ගෙන් නොයෙක් ස්තුති වචනයන්ගෙන් භාග්‍යවතුන් වහන්සේට ස්තුති කළේය. ඒ අසා භාග්‍යවතුන් වහන්සේ 'මේ තවුසා අනාගතයෙහි ගෞතම නම් ශාස්තෘන් වහන්සේගේ සසුනෙහි පැවිදිව විනයෙහි තියුණු නැණ ඇත්තවුන්ට අග්‍ර වන්නේයයි විවරණ දුන් සේක. ඔහු දිවිඇති තාක් සිට නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේ, එයින් චුතව දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිලවස්තු නගරයෙහි උපාලි තෙරුන් වහන්සේගේ බෑනණුවන් වී උපන්නේය. ඔහු ක්‍රමයෙන් වැඩිවයපත් වූයේ මාමා වූ උපාලි තෙරුන් වහන්සේ සමීපයෙහි පැවිදිව, කමටහන් ගෙන විදසුන් වඩා නොබෝ කලෙකින්ම රහත් විය. උන්වහන්සේ ආචාර්යයන් සමීපයෙහි විසූ බැවින් විනය ප්‍රශ්නයෙහි තියුණු නැණ ඇත්තෝ වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, මාගේ ශ්‍රාවකයන් අතර විනය ප්‍රශ්නයෙහි තියුණු නැණ ඇති යමෙක් වේද ඒ බෑනණු උපාලිය'යි උන්වහන්සේ අගතන්හි තැබූ සේක. උන්වහන්සේ මෙසේ තැනට පැමිණ තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වූවාහු පෙර චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **බීණාසව සහසෙසහි** ආදිය කී සේක.

එහි හාත්පස සිට භවාග්‍රය තෙක් ගලාබසිති පවතිතියි ආසවා නම්. කාමාසව ආදී සතර ආසවයෝ. ඒ ආසව ක්‍ෂය කරන ලද්දේ වියලන ලද්දේ විශේෂයෙන් වියලන ලද්දේ විධ්වංසනය කරන ලද්දේ යම් කෙනකු විසින්ද ඒ ක්‍ෂීණ ආශ්‍රවයෝම දහසක් බීණාසවසහස්සා. ඒ

දහසක් බිණාසවයන් විසින්. **පරෙතො පිරිවරන** ලද්දේ, **ලොකනායකො** ලෝකයා නිර්වාණයට පමුණුවන තැනැත්තේ, **විවේකමනුයුතෙතා** සැඟවී සිටීමට, තනිවී සිටීමට ගියේයි සම්බන්ධයි. **අජ්ජෙන නිවතොහං** යනු මම අද්‍යන්දිවි සමින් වැසුණේ අදුන් දිවිසම වස්ත්‍රයක් සේ අඳින්නේ යන අර්ථයි. **නිදණ්ඩපරිවාරකො** යනු කෙණ්ඩිය තබනු පිණිස දඬුවක් ගෙන දරන්නේ යන අර්ථයි. **භික්ඛුසංඝපරිබ්බුළ්හං භික්ඛු සංඝයා** විසින් පිරිවරන ලද ලෝකනායක බුදුරජාණන් වහන්සේ දුටුවෙමියි සම්බන්ධයි. සෙස්ස පැහැදිලි ම ය.

භාගිනෙය්‍ය උපාලි තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.42

අනොමදස්සිස්ස මුනිනො යනාදි වශයෙන් ආයුෂ්මත් කොටිකණ්ණ තෙරුන් වහන්සේගේ අපදානයයි. මුන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන නිවනට හේතුවූ පින් රැස් කරන්නාහු අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නාහු වැඩිවියට පත්වූවාහු අඹුදරුවන් විසින් වඩන ලද්දාහු ධන සම්පත් ඇත්තාහු සසුනෙහි පැහැදුණාහු භාග්‍යවතුන් වහන්සේට සක්මන් කරනු පිණිස අලංකාර වූ සක්මනක් කරවා සුණුපිරියම් කරවා ආදාසතලයක් මෙන් සමසේ බබලන්නක් කොට පහන් සුවඳ දුම් මල් ආදියෙන් සරසා භාග්‍යවතුන් වහන්සේට පවරා බුදුපාමොක් භික්ෂු සංඝයා ප්‍රණීත අහරින් පිදූහ. ඔහු මෙසේ දිවි ඇතිතෙක් පින්කොට එයින් චුතව දෙව්ලොව උපන්නේ එහි පෙළෙහි කියූ නයින් දිව්‍ය සම්පත් අනුභව කොට අතරෙහි ඔක්කාක කුලයෙහි උපන්නේ යයි ඒ සියල්ල පෙළෙහි කියූ අයුරින් දතයුතුය. පශ්චිම භවයෙහි කෝලිය රාජ වංශයෙහි උපන්නේ. වැඩිවිය පැමිණියේ කෝටියක් අගනා කන් පළඳනාවක් දැරූ බැවින් කොටිකණ්ණ කුටිකණ්ණ යනුවෙන්ද ප්‍රකට විය. ඔහු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණේ දහම් අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව

විඳසුන් වඩා නොබෝ කලකින්ම රහත්බවට පැමිණියහ. උන්වහන්සේ රහත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට උපන් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය විස්තර කරන්නාහු **අනොමදස්සිස්ස මුනිනො** ආදිය කිහ.

අනොමදස්සිස්ස යනු **අනොමං** අලාමක වූ සොඳුරු දැක්ම දෙතිස් මහපුරිස් ලකුණින් ප්‍රතිමණ්ඩිත වූ බැවින්, ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් යුක්ත බැවින්, ආරෝහපරිණාහයෙන් යුක්ත බැවින්ද දර්ශනීය වූ ශරීරය යම් භාග්‍යවතුන් වහන්සේ කෙනකුන්ගේද ඒ අනෝමදස්සී මුනීන්ද්‍රයන් වහන්සේගේ යන අර්ථයි. **තාදිනො** යනු ඉටු අනිටු දෙයෙහි නොසැලෙන ස්වභාව ඇති. **සුධාය ලොනං කත්වා** යනු සුණුයෙන් තැවරූවක් කොට පහන් සුවඳ දුම් මල් ධජ පතාකාදියෙන් ද අලංකාර වූ සක්මනක් **කාරයිං** කෙළෙමි යන අර්ථයි. සෙසු ගාථාවල අර්ථය පෙළ අනුසරින් පහසුවෙන් දතහැක්කේ ම ය. පිරිවර සම්පත්, ධන සම්පත් සංඛ්‍යාත යසස කරතියි යසෝධරා නමි. මේ සියලු සත් සත් චක්‍රවර්ති රජවරු යශෝධර නමින් එක් නමක් ඇත්තාහුයි සම්බන්ධයි. **අඞ්ගීරසො** යනු අංගයන්ගෙන් ශරීරයෙන් නික්මුණු රශ්මිය යමකුගේද හෙතෙම අඞ්ගීරස නමි. ඡන්ද, දෝස, මෝහ, භය, අගතින්ගෙන් හෝ පාපාචාර වශයෙන් හෝ සතර අපායට නොයතියි නාග නමි. මහත් වූයේද පූජිත වූයේද හෙතෙම නාග වෙතියි මහානාග නමි. සෙස්ස කියන ලද අර්ථ ඇත්තේ ම ය.

කොටිකණ්ණ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.43

පදුමුත්තර සම්බුද්ධං යනාදී වශයෙන් ආයුෂ්මත් හද්දිය කාලිඝොඨා පුත්ත තෙරුන් වහන්සේගේ අපදානයයි. මුන්වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ධන සම්පත් ඇති එක් කුලයක උපන්නාහු වැඩිවිය පත්වූවාහු අඹුදරුවන් විසින් වර්ධනය කරන ලද්දාහු නුවරවැසියන් පින් කරනු දැක තමාද

පින්කරනු කැමැත්තාහු බුදුපාමොක් භික්ෂු සංඝයා ආරාධනය කොට සත හැසුණු මල්කම් ආදිය යොදා නොයෙක් මාහැඟි යහන් පනවා සංඝයා සමග භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් කල්හි ප්‍රණීත ආහාරයෙන් වළඳවා මහා දානයක් දුන්හ. හේ මෙසේ දිවි ඇති තාක් පින්කොට දෙවි මිනිසුන් අතර උභය සම්පත්තීන් අනුභවකොට පසුකලෙක මෙම බුද්ධෝත්පාද කාලයෙහි කාලිගෝධා නම් දේවියගේ පුත්‍ර ව උපන්නේ ය. හේ දැනමිති බවට පත්වූයේ ආරෝහ පරිණාහ අත්පා රූප සම්පත්තියෙන් සුන්දර වූ බැවින්ද, කාලිගෝධා දේවියගේ පුත්‍රයා වූ බැවින්ද භද්දිය කාලිගෝධාපුත්‍රයයි ප්‍රකට වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද මව්පියන් සතුටුකොට පැවිදි ව නොබෝ කලෙකින්ම රහත් විය. හේ රහත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තර සම්බුද්ධං** යනාදිය කීය. එය පෙර කී අර්ථය ම ය. **මෙත්ත චිත්තං** යනු සියලු සත්වයන් කෙරෙහි මෘදුවෙයි. සෙනෙහෙවත් වෙයි. සතුටුවෙයි නුයි මෙත්තා. මෛත්‍රියෙන් යුත් සිත මෙත්තචිත්තං. එය මේ භාග්‍යවතුන් වහන්සේට ඇත්තේනුයි මෙත්තචිතෙතා. එය මෙත්තචිත්තං. **මහාමුනී** යනු සියලු භික්ෂූන්ට මහත්වේනුයි මහාමුනි. උන්වහන්සේ **පදුමුත්තර සම්බුද්ධං** යනු සම්බන්ධයි. **ජනතා සබ්බා** යනු සියලු ජනකාය. සියලු නගර වැසියෝ යන අර්ථයි. **සබ්බ ලොකගහනායකං** යනු සියලු ලෝකයට අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ නිර්වාණයට ගෙනයන බැවින් පමුණුවන බැවින් නායක වූ පදුමුත්තර සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ. **ජනතා උපෙති** සමීපයට යතියි සම්බන්ධයි. අග්ගලා අත්සුණු සංඛ්‍යාත ආමිෂය. නැතහොත් බත්, කැවුම්, කෑයුතු දෑ, බිවයුතු දෑ, කැඳ ආදිය යාවකාලික බැවින් ආමිෂ වූ බෙහෙත් ද පැන් ද ගෙන පින්කෙත් වූ අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ වෙත දෙති යනු සම්බන්ධයි. **ආසනං බුද්ධපුත්තකං** යනු බුදුන්ට යෝග්‍ය වූ, බුදුන්ට සුදුසු වූ, බුදුන්ට ගැළපෙන්නා වූ සත්රුවන් මුවා අසුන යන අර්ථයි. සෙස්ස නියමානුයෝගයෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

භද්දිය කාලිගොධා පුත්‍ර තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.44

අරඤ්ඤකුටිකං කත්වා යනාදි වශයෙන් ආයුෂ්මත් සනනිඨාපක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහු පෙරබුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ දැනමිති බවට පැමිණියේ ගෘහබන්ධනයෙන් බැඳුණේ ගිහිගෙයි ආදීනව දැක වස්තුකාම ක්ලේශ කාමයන් හැර හිමවත නුදුරෙහි පර්වත අතරෙහි අරණ්‍යවාසය කළේය. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ විවේක කැමති බැවින් එතැනට පැමිණි සේක. ඉක්බිති ඒ තවුසා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ වැඳ වැඩහිඳිනු පිණිස තණ ඇතිරියක් පනවා දුන්නේය. එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ නොයෙක් මිහිරි තිඹිරි ආදී කුදුමහත් ඵලයෙන් සන්තර්පණය කළේය. හේ ඒ පින්කමින් එයින් චුතව දෙවියන් අතරද මනුෂ්‍යයන් අතරද වරින්වර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ ශ්‍රද්ධා ඇත්තේ පැවිදි වූයේ විදසුන් වඩා නොබෝ කලකින්ම රහත් විය. හිස බානා කල්හිම රහත් ඵලයට පත්වූවාක් මෙන් නිරුත්සාහයෙන්ම ශාන්තිපද සංඛ්‍යාත වූ නිර්වාණයෙහි මනාව සිටි බැවින් සනනිඨාපක තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. රහත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වූයේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **අරඤ්ඤකුටිකං කත්වා** යනාදිය කීය. එහි **අරඤ්ඤ** යනු සිංහ ව්‍යාඝ්‍ර ආදීන්ගේ භය නිසා මනුෂ්‍යයෝ එහි නොඇලෙති. රමණය නොකරති. ඇලීගැලී නොසිටිතියි අරඤ්ඤ නම් වේ. එම අරණ්‍යයෙහි **කුටිකං** යනු තණ හෙවූ කුඩා කුටියක් කොට පර්වත අතරෙහි **වසාමි** වාසය කරමි යන අර්ථයි. ලාභයෙන් ද, අලාභයෙන් ද, යසසින් ද, අයසින් ද සතුටුව විසුවෙමියි සම්බන්ධයි. **ජලජුත්තම නාමකං** යනු ජලයෙහි උපන් **ජලජං** පියුම ජලජං උත්තමං ජලජුත්තමං. පියුමකට සමාන නමක් යමකුට ඇත්ද හේ ජලජුත්තම නම් වේ. ඒ පදුමුත්තර නම් වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ යන අර්ථයි. සෙස්ස පෙළෙහි නියමානුසාරයෙන් පහසුවෙන් දතහැක්කේ ම ය.

සනනිඨාපක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.45

සුමේධොනාම සම්බුද්ධො යනාදි වශයෙන් ආයුෂ්මත් පඤ්චහත්ථීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්ව තෙරුවන්හි පැහැදී වාසය කළේය. එසමයෙහි උපුල්මල් මිටි පහක් ගෙනාවාහුය. හේ එම උපුල්මල් මිටි පහ ගෙන වීථියෙහි ගමන් කරන්නා වූ සුමේධ භාග්‍යවතුන් වහන්සේට පූජා කළේය. ඒවා ගොස් අහසෙහි වියනක්ව සෙවන සඳමින් තථාගතයන් වහන්සේ සමගම ගියේය. හේ එය දැක සොම්නස්ව ප්‍රීතියෙන් පිරුණු සිරුර ඇත්තේ දිවිඇති තාක් එම පිනම සිහිකොට එයින් චුතව දෙව්ලොව උපන්නේ යළියළිත් සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පැමිණියේ සැදැහැ ඇත්තේ පැවිදිව විඳසුන් වඩා නොබෝ කලෙකින්ම රහත්විය. කරනලද කුසලයෙහි නමින් පඤ්චහත්ථීය තෙරුන්වහන්සේ යයි ප්‍රකට විය. හේ තමාගේ පූර්ව කර්මය සිහිකොට ප්‍රත්‍යක්ෂයෙන් ප්‍රඥාවෙන් දුටු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සුමේධොනම සම්බුද්ධො** ආදිය කිය.

එහි **සුමේධො** යනු යහපත් සොඳුරු නුවණ චතුරාර්ය සත්‍ය අවබෝධය. පටිසම්භිදා ආදි ප්‍රඥාව යමෙකුට ඇත්තේද ඒ භාග්‍යවතුන් වහන්සේ සුමේධ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ය. **අනන්තරාපණෙ** අතුරු වීදියෙහි යයි යනු සම්බන්ධයි. **ඔකඛිත්තචක්ඛු** යටට නැඹුරුවූ ඇස්. **මිතභාණී** යනු පමණ දැන කථාකරන සුලු, පමණ දැන ධර්මය දේශනා කරයි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

පඤ්චහත්ථීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.46

නිබ්බුතෙ ලොකනාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් පදුමච්ඡදනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද පුණ්‍ය සම්භාර ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ තෙරුවන්හි පැහැදුණේ, පිරිනිවන්පෑ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ චිතකය නෙළුම්මලින් පිදුවේය. හේ එම සිත් පැහැදීමෙන් දිවි ඇතිතාක් කල් සිට එයින් සුගතීන්හිම සැරි සරන්නේ දිව්‍ය සම්පත්තිය මනුෂ්‍ය සම්පත්තිය යන උභය සම්පත්තීන් නොයෙක්වර අනුභවකොට මේ අපගේ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද සසුනෙහි පැවිදිවූයේ වෑයම් කරන්නේ නොබෝ කලකින්ම රහත්විය. රාත්‍රිස්ථාන දිවා ස්ථානයන්හි ඒ ඒ තැන වසන්නා වූ උන්වහන්සේගේ විහාරය නෙළුම්මලින් වැසීයයි. එයින් උන්වහන්සේ පදුමච්ඡදනිය තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූවාහු තමාගේ පූර්ව කර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු නිබ්බුතෙ **ලොකනාථම්හි** යනාදිය කීහ.

එහි නිබ්බුතෙ යනු ස්කන්ධ පරිනිර්වාණයෙන් ශාස්තෘන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි විපස්සි සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ සිරුර චිතමානීයමානෙ චිතකයට නැංවූ කල්හි සුපුල් නෙළුම්මල් කලඹක් ගෙන මම චිතකයට ආරොපයිං පිදුවෙමි යන අර්ථයි. සෙසු ගාථාවල අර්ථ යට කියූ පරිදි වේ.

පදුමච්ඡදනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.47

සිද්ධත්ථස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් සයනදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තැනැත්තේ ද පෙර බුදුවරුන්

හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තරා කුලගෙයක උපන්නේ දැනමිති බවට පැමිණියේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද ඇත් දත් රන් ආදියෙන් නිදනු පිණිස ඇඳක් කරවා අනර්ඝ වූ විසිතුරු ඇතිරිලිවලින් අතුරා භාග්‍යවතුන් වහන්සේට පූජා කළේය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පාවෙන් පිළිගෙන පරිහරණය කළ සේක. හේ එම පින්කමින් දෙව් මිනිස් සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ සසුනෙහි පැහැද පැවිදිව විදසුන් අරඹා නොබෝ කලෙකින්ම රහත් විය. පෙර කරන ලද පින්කමෙහි නමින් සයනදායක තෙරුන් වහන්සේයයි ප්‍රකට විය. උන්වහන්සේ එක් දවසක් තමාගේ පුණ්‍යකර්මය සිහිකොට සොමනස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **සිද්ධත්‍ථස්ස භගවතො** යනාදිය කීහ. ඒ සියල්ල පාළියෙහි නියමානුසාරයෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

සයනදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.48

අත්‍ථදස්සිස්ස මුනිනො යනාදි වශයෙන් ආයුෂ්මත් චඞ්කමදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙම ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු ඒ ඒ භවයන්හි නිවනට හේතුවූ පින් රැස් කරන්නාහු අත්‍ථදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නාහු දැනමිති බවට පත්වූවාහු ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී උස් පාදමක් ඇති සුණු පිරියම් කළ රිදී රැසක් බඳු අලංකාර සක්මනක් කරවා මුතුදැල් වැනි සුදුවැලි අතුරා භාග්‍යවතුන් වහන්සේට දුන්හ. භාග්‍යවතුන් වහන්සේ සක්මන පිළිගත් සේක. පිළිගෙනද ස්වකීය සිත සමාධියට නංවා අනාගතයෙහි ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි ශ්‍රාවකයෙක් වන්නේ යයි ප්‍රකාශ කළ සේක. හේ එම පුණ්‍යකර්මයෙන් දෙවිමිනිසුන් අතර නැවත නැවත සැරිසරන්නේ

උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ සැදැහැ ඇත්තේ සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත් බවට පත්ව කරන ලද පින්කමෙහි නමින් චඞ්කමදායක තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. උන්වහන්සේ එක් දවසක් තමා විසින් පෙර කරන ලද පුණ්‍ය කර්මය සිහිකොට සොම්නස් වූවාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **අත්ථදස්සිස්ස මුනිනෝ** යනාදිය කීහ.

එහි **අත්ථදස්සිස්ස** යනු **අත්ථං** ප්‍රයෝජනය වෘද්ධිය නැගීම නිර්වාණය පෙන්වතියි දකිතියි අර්ථයි. නැතහොත් අත්ථං අර්ථය, නිර්වාණය දකිනසුලු, දන්නාසුලු යන අර්ථයි. ඒ අත්ථදස්සිහුගේ. **මුනිනෝ මොනෙන** ඤාණයෙන් යුක්ත වූ භාග්‍යවතුන් වහන්සේගේ. **මනෝරමං** මනබඳනා. **භාවනීයං** සිත තබා ගතයුතු සක්මනක් කරවීය යනු සම්බන්ධයි. සෙස්ස කියූ පරිදි පහසුවෙන් දතහැක්කේමය.

චඞ්කමදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.49

පදුමුත්තරෝ ලොකවිදූ ආදි වශයෙන් ආයුෂ්මත් සුභද්‍ර තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන නිර්වාණාවබෝධයට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ධනසම්පත් ඇති සැදැහැති එක් කුලගෙයක උපන්නේ දැනමිහි බවට පැමිණ ගෘහ බන්ධනයෙන් බැඳුණේ තෙරුවන්හි පහන් වූයේ පිරිනිවන් මංචකයෙහි වැදහොත් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ දැක, රැස්වූ දසදහසක් සක්වළ දෙවියන් ද දැක පහන් සිතැත්තේ නිග්ගුණ්ඩි, කේතකී, නීලක, අසෝක අසිත ආදි නොයෙක් සුවඳමලින් පූජා කළේය. හේ එම පුණ්‍යකර්මයෙන් දිවි ඇතිතාක් සිට එයින් මියගොස් තුසිත ආදියෙහි දිව්‍යසම්පත් අනුභවකොට ඉන් මනුෂ්‍යයන් අතර උපනුපන් තැන්වලදී ද සුවඳ මලින් ද පුදන ලද්දේ විය. මේ බුද්ධෝත්පාද කාලයෙහි එක්

ධනසම්පත් ඇති කුලයෙක ඉපිද මිනිස් සැප අනුභවකොට දැනමිනි බවට පැමිණියේ කාමයන්හි ආදීනව දැක පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පානා කල්හි එතෙක් නොලද බුද්ධ දර්ශන ඇත්තේ අපගේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් මංචකයෙහි වැදහොත් කල්හිම පැවිදිව රහත්බවට පත්විය. පෙර කරන ලද පින්කමෙහි නමින් සුභද්‍ර යයි ප්‍රකට විය. හේ තමාගේ පූර්වකර්මය සිහිකොට සොම්නස් වශයෙන් පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තරෝ ලොකවිදූ** යනාදිය කීය. එය නොගැඹුරු අරුත් ඇත්තේමය. "මා කියන්නක් අසවු. ආශ්‍රව නැත්තේ පිරිනිවන් පාන්නේය"යි මෙය පිරිනිවන් මංචකයෙහි වැදහොත් සේක්ම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

(පස්වැනි මහ බණවර වර්ණනාව
සමාප්තයි.)

හේ තමාගේ ප්‍රතිපත්තිය දක්වන්නේ පුබබකමෙමන **සංයුත්තෝ** ආදිය කීය. **එකගෙහා** යනු ඒකාග්‍ර සිත් ඇත්තේ. **සුසමාහිතෝ** යනු මනාසේ සමාහිත වූයේ නිවුණු සිතැත්තේ යන අර්ථයි. **බුද්ධස්ස ඔරසොපුත්තෝහා** යනු බුදුරජාණන් වහන්සේගේ **උරසා** හදවතින් නික්මුණු අවවාද අනුශාසනා අසා පැමිණි රහත්ඵල ඇත්තේය යන අර්ථයි. **ධම්මජොමහි සුනිම්මිතෝ** යනු ධර්මයෙන් කර්මස්ථාන ස්වභාවයෙන් උපන්නේ ආර්ය ජාතියෙන් **සුනිම්මිතෝ** මනාසේ නිපදවාගත් සියලු කෘත්‍ය ඇත්තේ **අහි** වෙමියි අර්ථයි. **ධම්මරාජං උපාගමම** යනු ධර්මයෙන් සියලු සත්වයන්ට **රාජානං** ප්‍රධාන වූ භාග්‍යවතුන් වහන්සේ කරා **උපගන්ත්වා** සමීපයට ගොස් යන අර්ථයි. **ආපුච්ඡිං පඤ්හමුත්තමං** යනු උතුම් වූ ස්කන්ධ ආයතන ධාතු ප්‍රතීත්‍ය සමුත්පාද ආදියෙන් යුතු ප්‍රශ්නයක් ඇසුවෙමි යන අර්ථයි. **කථයනෙතා ච මෙ පඤ්හං** යනු මේ අපගේ භාග්‍යවතුන් වහන්සේය. මෙ මාගේ ප්‍රශ්න කථයනෙතා ප්‍රකාශ කරන්නේ **ධම්මසොතං උපානයී** යනු අනුපාදිශේෂ නිර්වාණ සංඛ්‍යාත වූ ධම්මසොතං ධර්මය නමැති ප්‍රවාහයට **උපානදි පිවිසියේය** යන අර්ථයි. **ජලජුත්තරනායකෝ** යනු පදුමුත්තර නම් ඇති. මකාරයට රකාරය කොට

කරන ලද ව්‍යවහාරයයි. **නිබ්බායි** නොපෙනුණේය. නොපෙනී ගියේය. මනුෂ්‍ය ලෝකාදියෙහි කිසිතැනක නොපිහිටියේය යන අර්ථයි. **දීපොව තෙල සඬ්ඛයා** යනු පහන්වැටි නැතිවීමෙන් නිවීගිය පහනක් මෙන් යන සම්බන්ධයි. **සත්තයොජනිකං ආසී** යනු පිරිනිවියා වූ ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ රුවන්මුවා ස්තූපය යොදුන් සතක් උස **ආසි** විය යන අර්ථයි. **ධජංතත්‍ථ අපූජයිං** යනු **තත්‍ථ** ඒ චෛත්‍යයෙහි **සබ්බ** භද්දං සියල්ල සුන්දර වූ මනහර වූ ධජයක් පිදුවෙමි යන අර්ථයි. **කස්සපස්සව බුද්ධස්ස** යනු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ කාලයෙහි පටන් පැමිණ දෙවිමිනිසුන් අතර හැසිරීමෙන් පසුව කාශ්‍යප සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයා වූ තිස්ස තෙමේ මාගේ පුත්‍රයා විය. ජින සාසනෙ බුද්ධ ශාසනයෙහි දායාදයක් **ආසි** විය යනු **සම්බන්ධයි. තස්ස හීනෙන මනසා** යනු ඒ මාගේ පුත්‍ර වූ තිස්ස නම් අග්‍ර ශ්‍රාවකයාට හීනෙන ලාමක වූ මනසා සිතින් **අභද්දකං** අසුන්දර වූ අයුතු වූ **අන්තකො** අන්තකයා පශ්චිමයාය. යන **චාඛං** වචනයක් **අභාසිං කිවෙමියි** අර්ථයි. **තෙන කම්මවිපාකෙන** යනු ඒ රහත්බවට නිගරුකිරීම් සංඛ්‍යාත අකුසල කර්මයෙහි විපාකයෙන්. **පච්ඡිමෙ අද්දසංජිනං** යනු **පච්ඡිමෙ** අවසානයෙහි, පිරිනිවන්පානා අවස්ථාවෙහි මල්ලයන්ගේ උපවර්තන සල්වනයෙහි පිරිනිවන් මංචකයෙහි වැදහොත් **ජිනං** සියලු මරුන් දිනූ අපගේ ගෞතම සම්බුදුරජාණන් වහන්සේ මම දුටුවෙමි යන අර්ථයි. පච්ඡිමෙ අසි භද්දකං යනුවෙන්ද පාඨයක් ඇත. ඒ භාග්‍යවතුන් වහන්සේගේ අවසාන කාලයෙහි, පිරිනිවන්පෑමට ආසන්න කාලයෙහි **මෙ** මාගේ **භද්දකං** සොඳුරු වූ චතුරාර්ය සත්‍ය අවබෝධය **ආසි** විය යන අර්ථයි. **පබ්බාජෙසි මහාවීරො** යනු මහාවීර්ය ඇති සියලු සතුන්ට හිතවත් කරුණාවෙන් යුතු මරුන් දිනූ මුනිවරයන් වහන්සේ මල්ලයන්ගේ උපවර්තන සල්වනයෙහි අවසන් සයනයෙහි පිරිනිවන් මංචකයෙහි වැදහොත් සේක්ම මා පැවිදිකළ සේක යනු සම්බන්ධයි. **අජ්ජවදානි පබ්බජ්ජා** යනු **අජ්ජඑව** භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන්පානා දවසෙහිම මාගේ පැවිද්ද විය. එසේම උපසම්පදාව විය. එදිනම බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමද විය යනු සම්බන්ධයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

සුහද්‍ර තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.50

සිද්ධත්‍ථස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් චුන්ද තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද පුණ්‍ය සම්භාර ඇත්තේ භවයෙහි තැනින්තැන පින් රැස් කරන්නේ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ධනසම්පත් ඇති කුලයක උපන්නේ දැනමිති බවට පැමිණ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී සත්රුවන්මුවා රන් ඇඟෑයක් කරවා සමන්මලින් වසා භාග්‍යවතුන් වහන්සේට පූජා කළේය. ඒ මල් අහසට පැනනැගී වියනක ආකාරයෙන් සිටියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනාගතයෙහි ඔහු ගෞතම නම් භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි චුන්ද නම් ශ්‍රාවකයෙක් වන්නේයයි ප්‍රකාශ කළ සේක. හේ එම පුණ්‍යකර්මයෙන් ඉන් චුතවූයේ දෙව්ලොව උපන්නේ ක්‍රමයෙන් කාමාවචර සයෙහි දෙවියන් අතර සැප අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සම්පත් අනුභව කළේය. ඉන්පසු මේ බුද්ධෝත්පාද කාලයෙහි බමුණු කුලයෙහි රූපසාරියගේ පුත්‍ර වූ සාරිපුත්‍ර තෙරුන් වහන්සේගේ බාල සොහොයුරා වී උපන්නේය. දැනමිති බවට පත් ආරෝහ පරිණාහ රූප අවයවයන්ගේ සොඳුරු බව නිසා සකාරයව චකාරය තබා චුන්දයයි නම් කළහ. හේ වැඩිවිය පත්වූයේ ගිහිගෙයි ආදීනවද පැවිද්දෙහි ආනිසංසද දැක සොහොයුරු තෙරුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිව විදසුන් වඩා නොබෝ කලකින්ම රහත්බවට පැමිණියේය. උන්වහන්සේ පැමිණි රහත්ඵල ඇත්තාහු එක් දවසක් තමාගේ පුණ්‍යකර්මය සිහිකොට පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **සිද්ධත්‍ථස්ස භගවතො** ආදිය කීහ. එය යට කියන ලද පරිදි වේ. **අගසියං** යනාදියද නොගැඹුරු අර්ථ ඇත්තේමය.

විනිඤ්ඤකඩ්ඪා සම්බුද්ධා යනු විශේෂයෙන් මාර්ගාධිගමයෙන් විචිකිච්ඡාව අත්හැර දැමූ බැවින් **විනිඤ්ඤකඩ්ඪා** සැක නැති සම්බුදු රජාණන් වහන්සේය. **නිඤ්ඤාසෙහි පුරක්ඛතො** යනු කාමාදී සතර ඕඝයන්ගෙන් **නිඤ්ඤකො** එතෙර වූ බැවින්, ඕඝතරණය කළ රහතන් වහන්සේ විසින් **පුරක්ඛතො** පිරිවරන ලද්දේ යන අර්ථයි. ව්‍යාකරණ ගාථා නොගැඹුරු අර්ථ ඇත්තේමය. **උපඨඤ්හිං මහාවීරං** යනු උත්තම අර්ථ ඇති නිර්වාණයට **පත්තියා** පැමිණීම පිණිස කල්ප දසදහසකට අධික චතුරාසංඛ්‍ය කල්පයන්හි පාරමී පුරන්නා වූ කරන ලද වීර්ය ඇති බැවින් **මහාවීරං** බුදුරජාණන් වහන්සේට **උපඨඤ්හිං** උපස්ථාන කෙළෙමි

යන අර්ථයි. අඤ්ඤව පෙසලෙ බහු යනු හුදෙක් උපස්ථාන කළේ බුදුරජාණන් වහන්සේට පමණක් නොවේ. පෙසලෙ ප්‍රියශීලි වූ සීලවන්ත වූ අනික් බොහෝ අග්‍රප්‍රාප්ත වූ ශ්‍රාවකයන්ට. මෙ මාගේ **භාතරං** සැරියුත් තෙරුන් වහන්සේද උපස්ථාන කෙළෙමි යනු සම්බන්ධයි. **භාතරං** මෙ **උපට්ඨිහිත්‍ථා** යනු මාගේ සහෝදරයාට **උපට්ඨිහිත්‍ථා** වත් පිළිවෙත් කොට උන්වහන්සේ පිරිනිවියේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීමට කලින් බැවින් උන්වහන්සේගේ ශාරීරික ධාතූන් ගෙන පාත්‍රයෙහි බහා **ලොකජෙට්ඨස්ස** මනුෂ්‍යයන්ට ප්‍රධාන වූ බුදුරජාණන් වහන්සේට **උපනාමෙසිං** දුන්නෙමි යන අර්ථයි. **උභොහත්‍ථෙහි පගය්හාහි** යනු ඒ මා දුන් ධාතූන් ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ දෑතින් මනාව ගෙන ඒ ධාතූන් **සං** මනාසේ පෙන්වමින් අග්ගසාවකං සාරිපුත්‍ර තෙරුන් වහන්සේ **කිත්තයි** ප්‍රකාශ කළ සේක යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

චුන්ද තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

පස්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.51

පදුමුත්තර බුද්ධස්ස ආදි වශයෙන් ආයුෂ්මත් විධූපනදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි පුරන ලද පුණ්‍ය සම්භාර ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ධනසම්පත් ඇත්තේ හටගත් ශ්‍රද්ධා ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණේ ග්‍රීෂ්ම කාලයෙහි රන්රිදී මුතුමැණික් මුවා විජිනිපතක් කරවා භාග්‍යවතුන් වහන්සේට දුන්නේ ය. හේ එම පුණ්‍ය කර්මයෙන් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ උපන්කල්හි එක් කුලගෙයක උපන්නේ ගෘහ බන්ධනයෙන් බැඳී ගිහිගෙයි

ආදීනව ද පැවිද්දෙහි ආනිසංස ද දැක ශ්‍රද්ධා ඇත්තේ සසුනෙහි පැවිදිව විදසුන් වඩා නොබෝ කලකින්ම රහත් විය. "මා විසින් ඒ පුණ්‍යකර්මයෙන් මේ ලෝකෝත්තර සම්පත්තිය ලබන ලද්දේය"යි තමාගේ පූර්ව කර්මය සිහිකරන්නේ එය ප්‍රත්‍යක්ෂයෙන් දැන පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පදුමුත්තර බුද්ධස්ස** යනාදිය කීය. එය යට **කියන** ලද පරිදි වේ. **විජනිකා මයා දිනනා** යනු විශේෂයෙන් තාපයට පැමිණි සත්වයන්ගේ උෂ්ණය **නිබ්බාපෙනි** නිවයි. සීතල වාතය උපදවයිනුයි විජනී නම්. විජනී ම විජනිකා නම්. සත්රුවන් මුවා විජිනිපත කරවා දෙන ලද්දේය යන අර්ථයි.

විධූපනදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.52

උච්චියං සෙලමාරුය්හ යනාදි වශයෙන් ආයුෂ්මත් සතරංසික තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි උපන්නේ දැනමිති බවට පත්වූයේ සංස්කෘත ව්‍යාකරණයෙහිද ත්‍රිවේදයෙහිද පරතෙරට ගියේ ගිහිගෙයි වාසය හැර අරණ්‍යයට පිවිස ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමවතෙහි වාසය කළේය. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ විවේකය කැමති බැවින් එක් උස් පර්වතයකට නැග දැල්වෙන ගිනිකඳක් මෙන් වැඩහුන් සේක. එසේ වැඩහුන් ඒ භාග්‍යවතුන් වහන්සේ දැක තාපසයා හටගත් සොම්නස් ඇත්තේ ඇඳිලි බැඳ නොයෙක් කරුණින් ස්තුති කළේය. හේ එම පුණ්‍යකර්මයෙන් එයින් චුතවූයේ කාමාවචර දේවලෝක සයෙහි දිව්‍ය සම්පත් අනුභව කොට එයින් මනුෂ්‍ය ලෝකයෙහි සතරංසි නම් සක්විති රජ ව උපන්නේ ය. ඒ සම්පත්තියද නොයෙක්වර අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ පුණ්‍ය සම්භාර වශයෙන් ඥානය මුහුකුරා ගිය

බැවින් සත්හැවිරිදි වියෙහිම පැවිදිව රහත් විය. උන්වහන්සේ මම කිනම් කර්මයකින් සත්හැවිරිදි වියෙහිදීම නිර්වාණයට පැමිණියේ වෙම්දැයි සිහි කරන්නාහු පූර්ව කර්මය ඥානයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැක හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය උදාන වශයෙන් ප්‍රකාශ කරන්නාහු **උච්චියං සෙලමාරුයහ** යනාදිය කීහ. එහි **උච්චියං** යනු උස සෙල්මුවා පර්වතයට නැඟ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වැඩහුන් සේක යනු සම්බන්ධයි.

පබ්බතසඝාවිදූරමහි යනු භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් පර්වතයට ආසන්න ස්ථානයෙහි යන අර්ථයි. **බ්‍රාහ්මණා මන්තපොරගූ** යනු මන්ත්‍ර සංඛ්‍යාත තුන්වේදයෙහි **පාරං** අවසානයට, කෙළවරට ගිය එක් බ්‍රාහ්මණයෙක් යන අර්ථයි. අනිකකු මෙන් තමා නිර්දේශ කරයිද මොහු මන්තපාරගූ නමි. **උපච්ඨාංමහාවීරං** යනු එම පර්වතයෙහි වැඩහුන් වීරවත් වූ විශිෂ්ට වූ බුදුරජාණන් වහන්සේ දෙවදෙවං සියලු කාමාවචර බ්‍රහ්මයන්ට හා දෙවියන්ට උතුම් දෙවි වූ **නරාසභං** නරයන්ට **ආසභං** ශ්‍රේෂ්ඨ වූ. ලොකනායකං සියලු සත්වලෝකය ගෙනයන්නා වූ නිවනට පමුණුවන්නා වූ, මම අඤ්ජලිං දසනිය එක්කර තැනූ ඇඳිලිය. **සිරසි** මුදුනෙහි පගඟහෙට්ඨාන පිහිටුවා. **සත්ථිං** මනාසේ ස්තුති කෙළෙමි යන සම්බන්ධයි. අභාසථ යනු 'යම්හෙයකින් මොහු ඇඳිලි දුන්නේ -පෙ- ඔහු රහත් වන්නේය'යයි ප්‍රකාශ කළ සේක. සෙස්ස කී පරිදි ම වෙයි.

සතරංසික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.53

පදුමුත්තරබුද්ධස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් සයනදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ගෘහවාසයෙහි පිහිටා සැප අනුභව කරමින් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා

ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ ඇත්දත් රන්රිදී මුතුමැණික් මුවා මාහැඟි ඇඳක් කරවා චීනපට කම්බිලි ආදිය අතුරා සැතපෙනු පිණිස භාග්‍යවතුන් වහන්සේට දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුග්‍රහ කරන්නාහු එහි සැතපුණු සේක. ඔහු එම පුණ්‍ය කර්මයෙන් දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ ඊට අනුරූප වූ අහස් ගමන් සැප සයන ආදී සැප අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති එක් කුලයක ඉපිද දැනමිති බවට පැමිණ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් වූ සිතැත්තේ පැවිදිව විදර්ශනා වඩන්නේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ තමාගේ පූර්වකර්මය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර** බුදුසස්ස යනාදිය කීහ. එය යටකී අර්ථ ඇත්තේ ම ය.

සුබෙත්ත බීජ සම්පදා යනු යම්සේ තණ කැලිකසල නැති මඩ ආදිය යුතු මනා වූ කෙතෙහි වපුළ බිජුවට යහපත් පල නිපදවයිද, එසේම රාග දෝස ආදී එක්දහස් පන්සියයක් වූ කෙලෙස් නම් වූ තණ කැලිකසල රහිත සුද්ධ වූ සන්තානයෙහි, පින්කෙතෙහි වපුළ දන් අල්ප වුව ද මහත්ඵල වන්නේයයි අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

සයනදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.54

පදුමුත්තර බුදුසස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් ගන්ධෝදකිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර මුනිවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයකඋපන්නේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ කල්හි නුවරවැසියන් පූජා පවත්වනු දැක විසිතුරු කරන ලද කළයක් සඳුන් කපුරු අගිල් ආදියෙන් මිශ්‍ර සුවඳ ජලයෙන් පුරවා බෝරුක නැහැවීය. එකෙණෙහි මහවැසි වැස්සේය. එදා ඔහු හෙණ පහරින් කලුරිය කළේ එයින්ම දෙව්ලොව උපන්නේ ය. එහිම

සිට 'අහො බුද්ධා අහො ධම්මා' යනාදි ගාථා කීයේය. මෙසේ ඔහු දෙවි මිනිසුන් අතර සම්පත් අනුභව කොට සියලු උපද්‍රවයන්ගෙන් මිදුණේ උපනුපන් තැන සිහිල්බවට පැමිණියේ සැපවත් වූයේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ කමටහන් අරඹා විදසුන් වඩන්නේ නොබෝ කලකින්ම රහත්බවට පත්වීය. පෙර කරන ලද පිනෙහි නමින් ගන්ධොදකිය තෙරුන් වහන්සේයයි ප්‍රකට වීය. උන්වහන්සේ එක් දවසක් තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු ඒ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු පදුමුත්තර බුදුසස ආදිය කීහ. එය කියන ලද අර්ථ ඇත්තේ ම ය. මහාබෝධි මණ්ඩ අනු යනු මහබෝරුකට පූජාවක් විය යන අර්ථයි. **විචිත්තං** සටමාදාය යනු නොයෙක් සිත්තම් රන්කම් වලින් විචිත්තං සෝභමාන වූ සුවඳපැනින් පිරුණු කළය ගෙන යන අර්ථයි. ගන්ධොදකමදාසහං යනු සුවඳපැන් දුන්නෙමි. මම සුවඳපැනින් නැහැවූයෙමි යන අර්ථයි. **නහාන කාලෙව** බෝධියා බෝධීන් වහන්සේට පූජාකරන අවස්ථාවෙහිම යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ගන්ධොදකිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.55

පදුමුත්තර බුදසස යනාදි වශයෙන් ආයුෂ්මත් ඔපවුය්‍හ තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ නමැති සූර්යයා ලොව පහළවූ කල්හි එක් ධනසම්පත් ඇති කුලයක උපන්නේ දැනමිති බවට පත් ව මහාධන ඇත්තේ මහභෝග සම්පත් ඇත්තේ ගිහිගෙයි වසමින් සසුනෙහි පැහැදුණේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පහන් බුහුමන් ඇත්තේ ආජානීය සෛන්ධව අශ්වයකු පූජා කළේය. එසේ පුදා බුද්ධාදී ශ්‍රමණයන්ට ඇත් අසුන් ආදී දේ නො කැපය. කැප බඩුවක් දෙමියි සිතා එය මිලකරවා

එම අගය ඇති කහවණුවලින් කපු පිළි සිවුරු ද, කම්බිලි හා පළස් ද, කපුරු, කපුකිනිස්ස ආදීකොට ඇති බෙහෙත් පිරිකර ද දුන්නේ ය. ඔහු ඒ පුණ්‍ය කර්මයෙන් දිවි ඇතිතෙක් සිට එයින් චුතවූයේ දෙවියන් අතර ද මිනිසුන් අතරද ඇත් අස් ආදී නොයෙක් වාහනයන් ඇතිව සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ, දැනමිති බවට පත් වූයේ, සැදැහැ ඇත්තේ, සසුනෙහි පැවිදිව කමටහන් ගෙන විදසුන් වඩා මාර්ග පිළිවෙළින් රහත් බවෙහි පිහිටියේය. පෙර කරන ලද පුණ්‍ය සම්භාර වශයෙන් ඔපවුයහ තෙරුන්වහන්සේ යයි ප්‍රකට විය. උන්වහන්සේ කිනම් කරුණකින් මා විසින් මේ නිවන්පදය අවබෝධ කරන ලද්දේ දැයි සලකා බලන්නාහු පූර්වකර්මය ඥානයෙන් ප්‍රත්‍යක්ෂයෙන් දැන හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය උදාන වශයෙන් ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර** බුදධසස යනාදිය කීහ. එය කියන ලද පරිදි ම ය. **ආජානීයමදාසහං** යනු උතුම් වූ ජාති සෛන්ධවයකු මම **අදාසිං** පූජා කෙළෙමි යන අර්ථයි. **සපත්තභාරෝ** යනු තමාට පැමිණි අටපිරිකර බර ඇත්තේ යමකුටද හේ **සපත්තභාර** නම්. අටපිරිකරින් යුතු යන අර්ථයි. **බමනීයමදාසහං** යනු බමනීයං යෝග්‍ය වූ සිවුරු ආදී කැප පිරිකර යන අර්ථයි. **චරිමෝ** යනු අවසාන කෙළවරට පැමිණි භවය'යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

ඔපවුයහ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.56

පදුමුත්තර බුදධසස යනාදි වශයෙන් ආයුෂ්මත් සපරිවාරාසන තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයන්හි තැනින්තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ධන සම්පත් ඇති කුලයක උපන්නේ වැඩිවිය පත් වූයේ සැදැහැ ඇත්තේ සසුනෙහි පැහැදුණේ දානඵලය අදහන්නේ නොයෙක් අග්‍රරස භෝජනයෙන් භාග්‍යවතුන් වහන්සේට පිණ්ඩපාතය දුන්නේ ය. දීද වනාහි බොජුන්හලෙහි බොජුන්

පිණිස වැඩහුන් අසුන දැසමන් ආදී මලින් අලංකාර කළේය. භාග්‍යවතුන් වහන්සේ ද භුක්තානුමෝදනාව කළ සේක. හෙතෙමේ ඒ පුණ්‍යකර්මයෙන් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ නානාවිධ සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්ව සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ මෙසේ පැමිණි ශාන්තිපද ඇත්තේ 'කවරනම් පිනකින් මේ ශාන්තිපදයට පැමිණියෙම්දැ'යි ඥානයෙන් සලකා බලන්නාහු පූර්ව කර්මය දැක හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර බුද්ධස්ස** යනාදිය කීහ. එය කියන ලද අර්ථ ඇත්තේ ම ය. **පිණ්ඩපාතමදාසහං** යනු ඒ ඒ තැන පිඬු ගුළි ගුළිකොට පිය යුතු බැවින් කෑයුතු බැවින් ආහාරෝ පිණ්ඩපාතය. ඒ පිණ්ඩපාතය භාග්‍යවතුන් වහන්සේට දුනිමි. භාග්‍යවතුන් වහන්සේ වැළඳවූයෙමි යන අර්ථයි. අකිනතයි **පිණ්ඩපාතං** යනු මා විසින් දෙන ලද පිණ්ඩපාතයෙහි **ගුණං** ආනිසංස ප්‍රකාශ කළ සේක යන අර්ථයි. **සංවුතෝ පාතිමොක්ඛසම්ං** යනු ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සිල සංවෘත වූයේ **පිහිතෝ** වැසුණේ යන අර්ථයි. **ඉන්ද්‍රියෙසුච පඤ්චසු චක්ඛු ඉන්ද්‍රිය** ආදී පසිඳුරන්හි රූප ආදියෙන් **ගොපිතෝ** ඉන්ද්‍රිය සංවර සීලය ද පාලනය කරන ලද්දේ යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

සපරිවාරාසන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.57

පදුමුත්තර බුද්ධස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් දීපක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ උපනුපන් භවයන්හි පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව ගිහිගෙයි වසන්නේ ධර්මය අසා සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටියේ සැදැහැ ඇත්තේ පහන් වූයේ මහජනයා බෝධිපූජා කරනු දැක බෝධිය වටා පහන් දල්වා බෝධියට පූජා කළේය. හේ ඒ පුණ්‍ය කර්මයෙන් දෙවිමිනිසුන්

අතර සැරිසරන්නේ චක්‍රවර්ති සම්පත් ආදිය අනුභවකොට උපන් සෑම භවයන්හිම බබලමින් ජෝතිමත් විමාන ආදියෙහි වැස, මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් ධනසම්පත් ඇති කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ උපන් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පහන් පූජාවේ පිනින් දීපක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ, උන්වහන්සේ එක් දවසක් තමාගේ පූර්ව කර්මය සිහිකොට උපන් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර බුද්ධස්ස** යනාදිය කීහ. එය කියන ලද අර්ථ ඇත්තේ ම ය. **උජුදිට්ඨී අහොසහං** යනු වංකවූ මිථ්‍යා දෘෂ්ටිය හැරදමා ඍජු වූ අවංක වූ නිර්වාණ අභිමුඛයට පමුණුවන සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වීමි යන අර්ථයි. **පදීපදානං පාදාසිං** යනු මේ මැනවින් දැල්වෙයි. දිලෙයි යනු පදීප නම් වේ. ඒ දානය ප්‍රදීප දානයයි. අදාසිං ප්‍රදීප පූජාවක් කෙළෙමි යන අර්ථයි. සෙස්ස සැමතැන නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

දීපක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.58

පදුමුත්තර බුද්ධස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් ධජදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද සුන්දර වූ නොයෙක් වස්ත්‍රයන්ගෙන් කොඩි කරවා ධ්වජ පූජාවක් කළේය. හේ එම පුණ්‍යකර්මයෙන් උපනුපන් භවයන්හි උසස් කුලවලම උපන්නේ පූජා ලැබිය යුතු කෙනෙක් වූයේය. පසුකලෙක මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව අඹුදරුවන් සමග ඍඩි මහාභෝග ඇත්තේ යසස් ඇත්තේ උපන් සැදැහැ ඇත්තේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද ගිහිගෙය අතහැර පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පැමිණි අර්හත්ඵල ඇත්තාහු පූර්වකර්මය සිහිකොට

උපන් සොම්නස් ඇත්තාහු තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තර බුදුඅසස** යනාදිය කීහ. එහි අර්ථය පෙර කියන ලද්දේ ම ය. **හථෝ හථෙන චිත්තෙන** යනු සොම්නස් සහගත සිත් ඇති බැවින් සතුටු වූයේ පිරිපුන් රූපකාය ඇත්තේ. ශ්‍රද්ධා සම්ප්‍රයුක්ත සිත් ඇති බැවින් **හථෙන චිත්තෙන** සතුටු වූ සිතින් යන අර්ථයි. **ධජමාරොපයිං** අහං යනු සෙලවෙතියි. කම්පනය වෙතියි. සැලෙතියි ධජනම් වේ. එම ධජය ආරොපයිං උණගසෙක අග බැඳ පූජාකෙළෙමි යන අර්ථයි. **සත පත්තානි ගණ්හිත්වා** යනු වැටුණු බෝකොළ සියයක් ගෙන මම පිටතට විසිකෙළෙමි යන අර්ථයි. **අත්තනා සුද්ධං බහිසුද්ධං** යනු **අත්තනා** චිත්ත සන්තානය නමැති කයින්ද, **බහි** චක්ඛුසෝත ආදී රූප කායෙන්ද **සුද්ධං** අතිශයින් මිදුණු, **කිලෙසතො විමුත්තං** කෙළෙසුන්ගෙන් මිදුණු, ආශ්‍රව රහිත වූ සම්බුදුන් වහන්සේ හමුවෙහි මෙන් බෝධිය **අවඤ්ඣං** වැන්දෙමි. යන අර්ථයි. සෙස්ස සියලු තැන කියන ලද අර්ථ ඇත්තේ ම ය.

ධජදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.59

චතුසච්චං පකාසෙන්තා යනාදි වශයෙන් ආයුෂ්මත් පදුම තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල සම්භාර ඇත්තේ පදුමුත්තර මුනීන්ද්‍රයන් වහන්සේ විසින් දහම් පහන දල්වනු ලබන කල්හි, එක් කුලගෙයක උපන්නේ ගෘහවාසයෙහි පිහිටා භෝග සම්පත් ඇත්තේයයි ප්‍රකට විය. හේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද මහජනයා සමග ධර්මය අසන්නේ මහජනයා සමග නෙළුම්මල් කලඹක් ගෙන ඒ නෙළුම්මල් කලඹ අහසට දැමීය. ඒ අසිරිය දැක අතිශයින් හටගත් සොම්නස් ඇත්තේ විය. හේ දිවි ඇති තාක් කුසල්කොට දිවි කෙළවර ස්වර්ගයෙහි උපන්නේ ධජයක් මෙන් කාමාවචර සයෙහි ප්‍රකට වූයේ, පූජිත වූයේ දිව්‍ය සම්පත් අනුභවකොට මනුෂ්‍යයන් අතරෙහි ද චක්‍රවර්ති සම්පත් අනුභවකොට, මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති ශ්‍රද්ධා සම්පන්න එක් කුලගෙයක ඉපදී හටගත් සැදැහැ ඇත්තේ වයස අවුරුදු පහේදීම පැවිදිව නොබෝ කලකින්ම රහත්වී,

කරන ලද පිනෙහි නමින් පදුම තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. තමාගේ පුණ්‍ය කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **චතුසචචං පකාසෙනෙනා** යනාදිය කීය. එහි **සචචං** යනු සත්‍ය වූ අසත්‍ය නොවූ විපරීත නොවූ හෙයින් ඇත්ත නම් වේ. දුක්ඛ සමුදය නිරෝධ මගඵ වශයෙන් සතර සත්‍යයන් එක්තැන් **චතුරාර්ය සත්‍යය චතුසචචං. පකාසෙනෙනා** ලොවෙහි ප්‍රකට කරන්නේ යන අර්ථයි. **වරධම්ම වසසිතකො** යනු උත්තම වූ දහම් වැසි වස්වන්නේ, ප්‍රකාශ කරන්නේ, යන අර්ථයි. අමතවුටඨි යනු අමෘත මහා නිර්වාණ නමැති වැසිදහර වස්වන්නේ, ගලා යවන්නේ, දෙවියන් සහිත ලෝවැස්සන් තෙමේමින් **තෙමෙනෙනා** සියලු කෙලෙස් දාහය නිවාලන්නේ ධර්ම නැමැති වර්ෂාව වස්වයි යන අර්ථයි. **සධඡං පදුමං ගඡඡ** යනු ධ්වජය සමඟ එක්කොට **පදුමං** නෙළුම් මල් කලඹ රැගෙන යන අර්ථයි. **අඩඩකොසෙධීතො අහං** යනු දෙකම ඔසවා සිටි මම යන අර්ථයි. සෙස්ස සියලු තැන නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

පදුම තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.60

ජාතියා සත්තවසෙසාහං යනාදි වශයෙන් ආයුෂ්මත් අසනබෝධිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තරා කුලගෙයක ඉපදී වැඩිවිය පත්ව සුවපත්ව සසුනෙහි පැහැදී පියා නම් බෝ රුකෙන් ඵලයක්ද අසනබෝධියෙන් ගෙන ඒ බෝධියෙන් පහලට වැටෙන මුල්ද ගෙන, බෝධියක් රෝපණය කළේය. එය යම්සේ විනාශ නොවේද එසේ ජලය ඉසීම් ආදී කාර්යයෙන් රැක පූජා කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නේ අවශ්‍ය කරුණු මුහුකුරා ගිය බැවින් සත්වැනි වයස්හිම පැවිදිව,

---

"අසන" බෝධිය නම් තිස්ස බුදුරදුන් බුදු වූ "පියා" නම් වූ බෝධියයි.

හිස මුඩු කරද්දීම රහත් බවට පත්විය. පෙර කරන ලද පිනෙහි නමින් අසනබොධිය තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ පුණ්‍ය සම්භාරය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **ජාති සත්තවසෙසාහං** යනාදිය කීය.

එහි **ජාතියා** යනු මව්කුසින් උපන්කල්හි පටන් යන අර්ථයි. **සත්වස්** වූයේ පිරිපුන් සම්පත් ඇත්තේ මම ලෝකනායක වූ තිසස භාග්‍යවතුන් වහන්සේ දුටුවෙමි යනු සම්බන්ධයි. **පසන්නචිත්තෙනා සුමනෝ** යනු ප්‍රසන්න නොසැලුණු කම්පා නොවූ සිත් ඇත්තේ **සුමනෝ** සොඳුරු මනස් ඇත්තේ සොම්නස් සහගත සිත් ඇත්තේ යන අර්ථයි. **තිසසසසාහං භගවතෝ** යනු "තෙවරක් උපන් හෙතෙම **මාතුගබහතෝ** මනුෂ්‍ය ජාතියෙන් පඤ්චස්කන්ධයෙන් මිදී **ජාතෝ** උපන්නේ. බුදුවූයේ යන අර්ථයි." ඒ තාදී ගුණ ඇති ලෝකයට ජ්‍යෙෂ්ඨ උත්තම වූ තිසස භාග්‍යවතුන් වහන්සේගේ අසනබෝධිය රෝපණය කෙළෙමි යන සම්බන්ධයි. **අසනෝ** නාමධෙය්‍යෙන යනු නාම ප්‍රඥප්තියෙන් නාම සංඥාවෙන් **අසනොනාම** අසන නම් බෝධියක් විය යන අර්ථයි. **ධරණීරුහපාදපෝ** යනු ගස්-වැල් පර්වත ගංගා සාගර ආදීන් දරානුයි ධරණී නම්. ඒ කවරක්ද? පෘථිවියයි. එහි රුහති පිහිටා සිටිනුයි ධරණීරුහ නම්. පාදයෙන් පානය කෙරේනුයි පාදප නම්. පාද සංඛ්‍යාත වූ මුලින් ඉසින ලද ජලය පානය කරයි. ආපොරසං තෙතමනය දරානුයි අර්ථයි. ධරණීරුහ වූයේද පාදප වූයේද එය ධරණීරුහපාදප නම්. ඒ උතුම් වූ අසනබෝධිය පස්වසක් **පරිචරිං** පෝෂණය කෙළෙමි යන අර්ථයි. **පුපඵිතං පාදපං දිසවා** යනු ඒ මා විසින් පෝෂණය කරනු ලැබූ අසනබෝධි වෘක්ෂය මල් පිපී ආශ්චර්ය අද්භූතව රෝමෝද්ගමනය කරනු දැක **සකං කම්මං** තමාගේ කර්මය **පකිත්තෙනෙතා** මනාව කියමින් බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ ළඟට ගියෙමි යන අර්ථයි. සෙස්ස සියලු තැන නොගැඹුරු අර්ථ ඇත්තේමය.

අසනබොධිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

සවැනිවග වර්ණනාවයි.

3.61

පවනං කානනං දිසවා යනාදි වශයෙන් ආයුෂ්මත් සකචින්තනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේය. වැඩිවිය පත්වූ ඔහු ආයුෂ කෙළවර ජීවත්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පිරිනිවන් පෑ කල්හි ඍෂි පැවිද්දෙන් පැවිදිව හිමාලයෙහි වසන්නේ, විවේකී වූ රමණීය වූ එක් වනයකට පැමිණ එහි එක් කඳුරෙක වැලි චෛත්‍යයක් කොට භාග්‍යවතුන් වහන්සේයයි හැඟීම ඇතිකොට, ධාතූන් සහිතයයි හැඟීම ද ඇතිකොට වනමලින් පූජා නමදිමින් ගරු කළේය. ඒ පුණ්‍ය කර්මයෙන් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ දෙලොවම අග්‍ර වූ ශක්‍ර සම්පත්තිය ද අග්‍ර වූ චක්‍රවර්ති සම්පත්තිය ද අනුභවකොට, මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ ධනසම්පත් ඇත්තේ, සැදැහැ ඇත්තේ, ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව රහත්ව ෂට් අභිඥා ඇත්තේ විය. හේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පවනං කානනං දිසවා** යනාදිය කීය. එහි පවනං යනු ක්‍රමයෙන් වනය විස්තීර්ණ වූයේ ගහණ වූයේනුයි පවන නම්. අපිරිසිදු ආශ්වාස ප්‍රශ්වාස කිරීම් කැඳවීම් කානන නම්. ඒ කානන සංඛ්‍යාත වූ පවන. මිනිස් හඬ නැති බැවින් අල්ප ශබ්ද යන අර්ථයි. අනාවිලං යනු නආවිලං උපදුව නැති යන අර්ථයි. **ඉසීනං අනුචිණණං** යනු බුදු පසේබුදු රහත් ක්‍ෂීණාශ්‍රව සංඛ්‍යාත වූ ඍෂීන් විසින් **අනුචිණණං** සේවනය කරන ලද්දේ යන අර්ථයි. **ආහුනීනං පටිගහං** යනු **ආහුනං** පූජා සත්කාර ප්‍රතිග්‍රහණයෙහි ගෙයක් වැනිය යන අර්ථයි. **ථූපං කත්‍වාන** වෙළුනා යනු උණපතුරුවලින් චෛත්‍යයක් කොට යන අර්ථයි. **නානා පුපඵං සමොකිරිං** යනු සපු ආදී නොයෙක් මලින් **සමොකිරිං** සැදුවෙමි යන අර්ථයි. **සම්මුඛා විය සම්බුද්ධං** යනු ජීවමාන සම්බුදුරජාණන් වහන්සේ සමීපයෙහිම නිර්මාණය කරන ලද උත්පාදනය කරන ලද කරවන ලද චෛත්‍යය මම විශේෂයෙන් වඳිං ප්‍රණාම කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

සකචින්තනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.62

විහාරා අභිනිකඛමම යනාදි වශයෙන් ආයුෂ්මත් අවොපුපජීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ සිඛී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව සැදැහැ ඇත්තේ දහම් අසා සොම්නසට පැමිණියේ නොයෙක් මල් දැනින් ගෙන බුදුරජාණන් වහන්සේ මතින් විසුරුවා හැරියේය. හේ එම පුණ්‍යකර්මයෙන් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ ස්වර්ග සම්පත්තිය ද චක්‍රවර්ති සම්පත්තියද අනුභවකොට සැමතැන පූජිත වූයේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපදී වැඩිවිය පත්ව සසුනෙහි පැහැද පැවිදි වූයේ නොබෝ දිනකින්ම රහත් විය. **ආ හාත්පසින් කාසනි** බබුළුවානුයි ආකාස නමි. ඒ ආකාසයෙහි මල් විසුරුවා හැරියේය. එයින් අවොපුපජීය තෙරුන් වහන්සේ යනුවෙන් ප්‍රකට වූයේ මෙසේ පැමිණි ශාන්ති පද ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **විහාරා අභිනිකඛමම** යනාදිය කීය. එහි විහාරෝ යනු විශේෂයෙන් **හරති** සිව් ඉරියව්වෙන් නොතැවෙන ආත්මභාවය **ආහරති** මෙහි පවත්වා ගනිනුයි විහාර නමි. විශ්වාසයෙන් **නිකඛමම** නික්මී අබහුථා සිංව වඩකමෙ සක්මන් කරනු පිණිස සැටරියන් සක්මනෙහි විශ්වාසයෙන් යුතුව **උපථාසිං** නැගුණෙමි යන අර්ථයි. **චතුසචචං පකාසෙනෙතා** යනු එම සක්මනෙහි සක්මන් කරන්නේ දුකඛ සමුදය නිරොධ මගඵ සංඛ්‍යාත වූ චතුස්සත්‍යය **පකාසෙනෙතා** ප්‍රකට කරන්නේ. අමතංපදං නිර්වාණය. දෙසෙනෙතා විභජනය කරන්නේ පැහැදිලි කරන්නේ එම සක්මනෙහි යනු සම්බන්ධයි. **සිබිසස ගිරමඤඤාය** බුදධසෙටඨසස තාදිනො යනු ශ්‍රේෂ්ඨ වූ තාදිගුණ ඇති බුදුරජාණන් වහන්සේගේ ගිරං ශබ්දය ඝෝෂාව. **අඤඤාය** දැන. **නානාපුපඵං ගහෙතවා** යනු නා පුවක් ආදී නොයෙක් මල් ගෙනවා ගෙනැවිත්. **ආකාසමහි සමොකිරිං** යනු සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ මුදුනෙහි අහසෙහි ඔකිරිං පිදුවෙමි. තෙන **කමමෙන දිපදිඤා** යනු මිනිසුන්ට දෙවි මිනිසුන්ට ඉන්දු! ප්‍රධාන වූ තැනැත්ත! **නරාසභ!** නරයන්ට ප්‍රධාන වූ තැනැත්ත! **පනෙතාමහි අචලංථානං** යනු ඔබගේ සම්පයෙහි පැවිදිව **අචලථානං** නිවනට පැමිණියේ **අමහි** වෙමි. **හිතවාජයපරාජයං** යනු දිව්‍ය මනුෂ්‍ය සම්පත්ති සංඛ්‍යාත වූ ජයද, සතර අපාය දුක් සංඛ්‍යාත වූ පරාජයද **හිතවා** හැරදමා නිවනට පැමිණියේ වෙමි යන අර්ථයි.

අවොපුපජීය තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.63

සිත්ධුයා නදියාතීරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් පචවාගමනීය තෙරුන් වහන්සේගෙ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සින්ධු ගංගාව සමීපයෙහි සක්වා යෝනියෙහි ඉපිද පෙර කළ පින් ඇති බැවින් පණ ඇති සතුන් නොකා සෙවෙල්ම කමින් හැසිරෙයි. එසමයෙහි විපස්සි භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ට අනුග්‍රහ කරන්නේ එහි වැඩි සේක. එකෙණෙහි සක්වාලිහිණියා බබලන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිත් ඇතිව තුඩින් සල් රුකකි සල්මලක් කඩාගෙන අවුත් පූජා කළේය. ඌ එම සිත් පැහැදීමෙන් ම එයින් මියගොස් දෙව්ලොව උපන්නේ නැවත නැවත සය කාමාවචර සම්පත් අනුභවකොට එයින් චුතව මිනිස්ලොව ඉපිද චක්‍රවර්ති සම්පත් ආදිය අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයෙක උපන්නේය. එහි දැනමිති බවට පැමිණි හෙතෙම පෙර සිරිත් වශයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව නොබෝ කලෙකින්ම රහත්විය. සක්වාලිහිණියකුව භාග්‍යවතුන් වහන්සේ දැක කිසියම් තැනකට ගොස් මලක් ගෙනවුත් පිදූ බැවින් පිනෙහි නමින් පචවාගමනීය තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේය. හේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සින්ධුයා නදියා තීරෙ** යනාදිය කීහ. **සන්සුන්** ශබ්ද කරමින් **ධුනාති** සැලේනුයි **සින්ධු. නදති** ශබ්ද කරමින් යතියි **නදී. චකකවාකො අහං තදා** යනු රියසකක් වේගයෙන් යන්නාක් මෙන් දියෙහි හෝ ගොඩබිම හෝ අහසෙහි හෝ වේගයෙන් **වාති** යනුයි චකකවාකො; එකල්හි විපස්සි බුදුරජාණන් වහන්සේ දක්නාවිට මම සක්වාලිහිණියෙක් වීමි යන අර්ථයි **සුදධසෙවාල හකෙඛාහං** යනු වෙනත් ගොදුරකින් නොමුසු බැවින් පිරිසිදු සෙවෙල්ම **කන්නේ** මම වසමි. **පාපෙසු ච සුසඤඤතො** යනු පූර්ව වාසනා වශයෙන් පව් කිරීමෙහි මනා සංයමයකින් **තුන්දොරින් සඤඤතො** මැනවින් හික්මුණෙ, **අදදසං විරජං බුදධං** යනු රාග දෝසයන්ගෙන් විරහිත බැවින් විරජ වූ නික්ලේශී වූ බුදුරජාණන් වහන්සේ අදදසං දුටුවෙමි. **ගචඡනතං අනිලඤඡසෙ** යනු **අනිලඤඡසෙ** අහස් මගෙහි වඩින්නා වූ බුදුරජාණන් වහන්සේට **තුණෙඩන** මාගේ **තුඩින් සාලං** සල්මලක්. **පගගයහ** ගෙන, **විපසසිසසාහි-රොපයිං** විපස්සි බුදුරජාණන් වහන්සේට පූජා කෙළෙමි යන අර්ථයි.

පචවාගමනීය තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.64

උසභං පවරං වීරං යනාදි වශයෙන් ආයුෂ්මත් පරපසාදක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ සිද්ධත් භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙක උපන්නේය. ඉතිහාසය පස්වෙනිකොට ඇතිව වේදත්‍රයෙහි පරතෙරට ගිය ඔහු ව්‍යාකරණ නිඝණ්ඩු සහිත කේටුභයන්හි ද ලෝකායත මහාපුරුෂ ලක්ෂණයන්හිද දක්ෂ වූයේ නමින් සේල බ්‍රාහ්මණයා යයි ප්‍රකට වූයේය. සිද්ධත් භාග්‍යවතුන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින්ද අසූ අනුව්‍යඤ්ජන යෙන් ද බබලනු දැක පහන් සිතැත්තේ නොයෙක් කරුණුවලින් උපමාවලින් ස්තුති කළේය. හේ එම පුණ්‍යකර්මයෙන් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ ඒ දෙකෙහි අග්‍රවූ ස්වර්ග සම්පත්තියද අග්‍ර වූ චක්‍රවර්ති සම්පත්තියද අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ද සැදැහැ ද ඇති එක් කුලගෙයක උපන්නේය. අපගේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිව නොබෝ කලකින්ම සිව්පිළිසිඹියා ෂට් අභිඥාවන්ට පත්වූයේ මහා ඍෂිණාශ්‍රව කෙනෙක් විය. බුදුරජාණන් වහන්සේට ස්තුති කිරීමෙන් සියලු සතුන්ටත් සිත් පැහැදවීම් කිරීම නිසා පරපසාදක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේය. එක් දවසක් තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **උසභංපවරං වීරං** යනාදිය කීය. එහි **උසභං** යනු වසභය, නිසභය, විසභය, ආසභ යයි ජ්‍යෙෂ්ඨ පිරිමි ගවයෝ සිව් දෙනෙකි. එහි ගවයන් සියයකට ජ්‍යෙෂ්ඨ වූයේ වසභ නමි. ගවයන් දහසකට ජ්‍යෙෂ්ඨ වූයේ නිසභ නමි. ගවයන් දසදහසකට ජ්‍යෙෂ්ඨ වූයේ විසභ නමි. ගවයන් කෝටි දස දහසකට ජ්‍යෙෂ්ඨ වූයේ ආසභ නමි. උසභ යනුද වේ. යම් කිසිවකුට ස්තුති කරන්නා වූ බහුශ්‍රැත බමුණු පඬිවරු තම තමන්ගේ ප්‍රඥා වශයෙන් ස්තුති කරති. බුදුවරුන්ට සර්වාකාරයෙන් ස්තුති කිරීමට සමර්ථ වූ එකෙක්වත් නැත. බුදුරජාණන් වහන්සේ නොමිනිය හැකි වෙති. මෙය කියන ලදී.

'බුද්ධොපි බුද්ධසස භණෙය්‍යවණ්ණං
කපපම්පි චෙ අඤ්ඤමහාසමානෝ
බීයෙථ කපෙපා විරදීඝමනතරෙ
වණ්ණෝ නබීයෙථ තථාගතසස' ත්‍යාදිකං

'කපක් කල් වෙන බසක් නොබැණම
බුදුකෙනෙකුගේ ගුණ වණත් හොත්
කප ගෙවී යයි කල් ඇවෑමෙන්
බුදුන්ගේ ගුණ නොසිඳයේමැයි

මේ බමුණාද මුවට නැගුණු පමණින් මෙයද සිද්ධි වශයෙන් ආසභං යනුවෙන් කියයුතු කල්හි උසභං යනුවෙන් කීවේය. අත්හළ යුත්තේ ප්‍රාර්ථනා කළ යුත්තේ වර නම්. නොයෙක් කල්ප සිය දහසක් කල්හි කරන ලද වීර්ය ඇත්තේනුයි වීර නම්. මහත්වූ ශීලස්කන්ධ ආදිය සොයනුයි ගවේෂණය කරනුයි මහේසී නම්. විශේෂයෙන් ක්ලේශ ස්කන්ධ මාර ආදී වූ මාරයන් දිනන ලද්දේනුයි ජිතවා නම්. ඒ විජිතාවී නම් වූ සම්බුදු රජාණන් වහන්සේ. රනෙහි වර්ණය වැනි වර්ණය යම් සම්බුදුවරයකුට ඇද්ද උන්වහන්සේ සුවණ්ණවණ්ණ නම්. ඒ රන්වන් සම්බුදු රජාණන් වහන්සේ දැක කවරෙක් නම් නොපහදීද යනුයි.

පරපසාදක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.65

වෙසසභූ නාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් හිසදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ වෙසසභූ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවතෙහි ඇත් යෝනියක ඉපදී එහි වාසය කරයි. එසමයෙහි වෙසසභූ භාග්‍යවතුන් වහන්සේ විවේක කැමති සේක් හිමවතට පැමිණි සේක. උන්වහන්සේ දැක ඒ ඇත්රජ පහන් සිතැත්තේ නෙළුම් මුල් අල ගෙන භාග්‍යවතුන් වහන්සේ වැළඳවීය. ඌ ඒ කුශල කර්මයෙන් ඇත් යෝනියෙන් චුතව දෙව්ලොව ඉපිද, එහි ෂට් කාමාවචර සම්පත් අනුභව කොට මිනිස් බවට පැමිණියේ මිනිසුන් අතර චක්‍රවර්ති සම්පත් ආදීන් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි මහා ධන ඇති එක්තරා කුලගෙයක උපන්නේය. පූර්ව වාසනා වශයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව

නොබෝ කලෙකින්ම රහත් විය. උන්වහන්සේ පෙර කළ පිනෙහි නමින් හිසදායක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූවාහු තමාගේ පූර්ව කර්මය සිහිකොට පූර්ව චරිතාපදානය දක්වන්නාහු වෙසසභූනාම නාමෙන යනාදිය කීහ.

එහි **වෙසසභූ** යනු වෛශ්‍යයා ධුනාති ඉක්මවා යේනුයි වෙසසභූ. නැතහොත් වෛශ්‍යවාණිජ කර්මයෙහි හෝ කාමාරාගාදිය මෙන් කුසල් ආදි කර්මයෙහි හෝ වස්තු කාම ක්ලේශ කාමයන් මෙන් **භූනාති** අභිභවනය කෙරේනුයි වෙසසභූ උන්වහන්සේ නමින් වෙසසභූ නම් භාග්‍යවතුන් වහන්සේය. **ඉසීනං තතියෝ අහූ** යනු කුශල කර්මයන් සොයන්නේනුයි ගවේෂණය කෙරේනුයි ඉසි නමි. විපසසි සිබි වෙසසභූ යැයි කියූ බැවින් තුන්වැනි ඉසි. තුන්වැනි භාග්‍යවතුන් වහන්සේ වූ සේක. **කානනං වන** මොගයහා යනු කානන සංඛ්‍යාත වූ වනය **ඔගාය්හ** විසීය යන අර්ථයි. **හිසංමූලාළං ගණ්හිත්වා** යනු පා දෙකක් ඇත්තවුන්ගේද පා සතරක් ඇත්තවුන්ගේ ද පිපාසය **හිසති** නසානුයි හිස නමි. නෙළුම් මුල **හිසො** මුලළොා මුල් අල ද වෙයි. නෙළුම් අල ගෙනවුත් යන අර්ථයි. **කරෙනව පරාමට්ඨා** යනු ඒ මා විසින් දෙන ලද දානය. **වෙසසභූ වරබුද්ධිනා** උතුම් බුද්ධි ඇති වෙසසභූ භාග්‍යවතුන් වහන්සේ විසින්. **කරෙන** අත් තලයෙන් **පරාමට්ඨා** කරන ලද ස්පර්ශ ඇත්තේ විය. **සුබාහං නාභිජානාමි සමං තෙන කුතුහනරිං** ඒ සැපයට සමාන සැපයක් නොදනිමි. එයට ඉහළ. එයින් අන්‍ය වූ එයට වැඩි සැපයක් කොයින්ද යන අර්ථයි. සෙස්ස නය අනුසාරයෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

හිසදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.66

ගිරිදුගචරෝ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් සුචිනති තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ අත්‍රදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත් පෙදෙසෙහි වැදිකුලයෙක ඉපදී මුවන් ඌරන් ආදීන් මරා කමින් වාසය

කරයි. එකල්හි ලෝකනාථයන් වහන්සේ ලෝකයාට අනුග්‍රහය ද, සත්වයන්ට අනුග්‍රහය ද නිසා හිමවතට වැඩි සේක. එකල්හි ඒ වැද්දා පහන් සිතැත්තේ තමාට කෑම පිණිස ගෙන ආ උතුම් මධුර මාංශය භාග්‍යවතුන් වහන්සේට දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස පිළිගත් සේක. එය වළඳ අනුමෝදනා කොට ආපසු වැඩි සේක. ඔහු ඒ පිනින් ඒ සොම්නසින් එයින් චුතව සුගතිවල හැසිරෙන්නේ ෂට් කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති සම්පත් ආදිය අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදි වූයේ නොබෝ කලෙකින්ම රහත් විය. සිව්පිළිසිඹියා පස් අභිඥා ආදී ඡේදවලට පැමිණ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **ගිරිදුගචරෝ ආසිං** යනාදිය කීය.

කතා කෙරේනුයි ශබ්ද කෙරේනුයි ගිරි නම්. ඒ කුමක්ද? ගල් පස් පර්වතයයි. දුට්ඨ දුකසේ යා යුතු වූයේ **දුගං** දුගග නම්. පර්වත නිසා දුර්ගය නැගීමට අපහසු වේ යන අර්ථයි. ඒ ගිරිදුර්ගයෙහි පර්වත අතරෙහි චරෝ හැසිරෙන සුලු. **ආසිං** වීමි. **අභිජාතොව කෙසරී** යනු විශ්වාසයෙන් **ජාතෝ** උපන්නේ **කෙසරීව** කේශර සිංහයකු මෙන් ගිරි දුර්ගයෙහි හැසිරෙමි. **ගිරිදුගං පවිසහං** යනු මම එකල්හි ඒ මුවමස් දානයෙන් හටගත් ප්‍රීති සොම්නස් ඇත්තේ පර්වත අතරට පිවිසියෙමි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

සුචින්තිත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.67

පකඛිජාතෝ තදාආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් වජ්ජදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නිවනට හේතුවන පින් රැස්කරන්නේ අජ්ජදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගුරුළු යෝනියෙහි උපන්නේය. ගන්ධමාදන පර්වතයට වඩින්නා වූ අජ්ජදස්සි භාග්‍යවතුන් වහන්සේ දැක

පැහැදුණු සිත් ඇතිව ගුරුළු ස්වරූපය හැර තරුණයකුගේ ස්වරූපය මවාගෙන මාහැඟි දිවසළුවක් ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට පූජා කළේය. ඒ භාග්‍යවතුන් වහන්සේ ද පිළිගෙන අනුමෝදනා වදාරා වැඩි සේක. හේ ඒ සොම්නසින් ම දවස් ගෙවා දිවි ඇති තෙක් සිට එයින් චුතව දෙව්ලොව උපන්නේ එහි වරින්වර සැරිසරන්නේ පින් අනුභවකොට එයින් මිනිසුන් අතර මනුෂ්‍ය සම්පත් ද යන සැමතැන මාහැඟි වස්තු ආභරණද ලැබීය. ඉන්පසු උපනුපන් භවයෙහි වස්තු සෙවනැල්ලෙහි ගිය ගිය තැන වසන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිහි බවට පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදි වූයේ නොබෝ කලෙකින්ම ෂට් අභිඥාවන්ට පැමිණි රහත් කෙනෙක් විය. පෙර කරන ලද පුණ්‍යකර්මයෙන් වජ්ටදායක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ උන්වහන්සේ තමාගේ පුණ්‍යකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පකඛිජාතො තදා ආසිං'** යනාදිය කීහ.

එහි **පකඛිජාතො** යනු එයින් පනිනුයි. එයින් පාවේනුයි සකුන නම්. පියාපත් **'පකඛමස්ස අත්ථී'** ඔහුට පියාපත් ඇත්තේනුයි **පකඛී** නම්. **පකඛිජාතො** පක්ඛි යෝනියෙහි උපන්නේ යන අර්ථයි. **සුපණ්ණො** යනු සොඳුරු පියාපත් ඇත්තේ යමෙකුටද ඔහු සුපණ්ණ නම්. වාතය අල්ලා ගන්නා රන්වන් දිලිසෙන පියාපත් නමැති මහ බරක් ඇත්තේ යන අර්ථයි. ගරුළාධිපො යනු නයින් අල්ලා ගැනීම පිණිස ගරුං බර ගල් ගිලින්නෝනුයි ගරුළා. ගරුඬයන්ට අධිපති වූයේ රජ වූයේ ගරුළාධිපො නම්. විරාගී බුදුරජාණන් වහන්සේ මම දැක්කෙමි යන සම්බන්ධයි.

වජ්ටදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.68

අනොමදස්සි භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් අම්බදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින්

රැස් කරන්නේ අනොමදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වඳුරු යෝනියෙහි ඉපිද හිමවතෙහි වඳුරු රජෙක්ව වාසය කරයි. එසමයෙහි අනොමදසසි භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස හිමවතට වැඩි සේක. ඉක්බිති ඒ වඳුරු රාජයා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ සුමධුර වූ අඹ ඵලයක් පැණි ස්වල්පයක් සමග දුන්නේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහු බලා සිටියදීම ඒ සියල්ල වළඳ අනුමෝදනා කොට වැඩි සේක. ඉක්බිති ඔහු සොම්නසින් පිරුණු හදවතින් යුතුව එම ප්‍රීති සොම්නසින් දිවි ඇති තෙක් සිට එයින් චුතව දෙව්ලොව උපන්නේ වරින්වර එහි දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතර මිනිස් සම්පත් ද අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති එක් කුලයෙක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිව නොබෝ කලෙකින්ම ෂට් අභිඥාවන්ට පැමිණියේ විය. පෙර පිනෙහි නමින් අම්බදායක තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. පසුකලෙක තමා විසින් කරන ලද කුශල බීජය දැක හටගත් සොම්නස් ඇත්තේ තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'අනොමදසසි භගවා'** යනාදිය කීය. **මෙත්තාය අඵරීලොකං අපපමාණං නිරූපධි** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු ලොව අපමණ සත්වයෝ සුවපත් වෙත්වායි ආදියෙන් නිරූපධි උපධි විරහිත කොට **මෙත්තාය** මෛත්‍රී සිත අඵරී පැතිරූ සේක. වර්ධනය කළ සේක යන අර්ථයි. **කපි අහං තදා ආසිං** යනු එකල්හි උන්වහන්සේ වඩනා කල්හි මම වඳුරු රජෙක් වීමි යන අර්ථයි.

අම්බදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.69

සුමනො නාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් සුමන තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මල්කරුවකුගේ කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ පහන් සිතැත්තේ සමන් මල් මිටි ගෙන දැතින්ම පූජා කළේය. හේ ඒ පුණ්‍ය කර්මයෙන්

දෙවිමිනිසුන් අතර උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව අඹුදරුවන් සමග වැඩි සුමන නමින් ප්‍රකට වූයේ ශාස්තෘන් කෙරෙහි පැහැදී පැවිදි වී නොබෝ කලකින්ම රහත් විය. හේ රහත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සුමනොනාම නාමෙන' යනාදිය කීය. සොඳුරු වූ **මනං** සිතක් ඇත්තේ යමකුටද හේ සුමනො නම්. ශ්‍රද්ධා ප්‍රසාද බහුමානයෙන් යුතු වූයේ එදා නමින් සුමන නම්. මල්කරුවෙක් වීම්. **සිබිනො ලොකබන්ධුනො** යනු සිබා හිස බබලානුයි සිබී නම්. නැතහොත් සම්ප්‍රයුක්ත සම්ප්‍රයෝගයෙහි කානුයි, විනාශ කෙරේනුයි සිබී නම්. ඒ කවරක්ද? ගිනිසිළුවක් මෙන් හිස දිලෙන බැවින් සිබී නම්. යම්සේ ගිනිසිළුවක් දිලේද ප්‍රකට වේද, පතු තණකබල් පරඬැල් ආදිය දහනය කෙරේද, එසේම මේ භාග්‍යවතුන් වහන්සේද නීල පීත ආදී රශ්මියෙන් බබලන සේක් ද, සියලු ලෝක සන්නිවාසයෙහි ප්‍රකට වන සේක්ද, ස්වකීය සන්තානගතවූ සියලු කෙලෙස් වියලවන සේක් ද, විනාශ කරන සේක් ද, දවාලන සේක් දැයි ව්‍යවහාර නාම කර්මයක් නමක් යමකුට ඇත්ද ඒ සිබී භාග්‍යවතුන් වහන්සේගේ, සියලු ලෝකයට බන්ධු ඥාතියෙක් වන සේක්නුයි ලොකබන්ධු නම්. ඒ සිබී නම් ලෝකබන්ධු වූ භාග්‍යවතුන් වහන්සේට සමන් මලක් **අභිරොපයිං** පූජා කෙළෙමි යන අර්ථයි.

සුමන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.70

අහිතරූපං සීහංවා යනාදි වශයෙන් ආයුෂ්මත් පුපඵවංගොටිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතු වූ පින් රැස්කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේය. වැඩිවියට පත් ඔහු මහා ධනසම්පත් ඇත්තේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැහැදුණු අයුරු පෙන්වන්නේ, රන්වන් කටුකරඬු මල් බහා වට්ටියක් පුරවා භාග්‍යවතුන් වහන්සේට පූජාකොට, මේ

විපාකයෙන් උපනුපන් තැන රන්වන්ව පිදිය යුත්තේව නිවනට පැමිණෙන්නෙමි යි ප්‍රාර්ථනාවක් කළේය. හේ ඒ පිනෙන් දෙවි මිනිසුන් අතර උපන්නේ සියලු තන්හි පුදනු ලැබුවේ රන්වන්ව සුරූපී විය. හේ මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති එක් කුලගෙයක ඉපදී වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වූයේ විදසුන් වඩා නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පැමිණි අර්හත්ඵල ඇත්තාහු තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **අභිතරූපං සීහංව** යනාදිය කීහ. එහි **සීහං** යනු දෙපා සිව්පා ආදී සත්වයන් අභිභවනය කෙරේනුයි, යටපත් කෙරේනුයි සීහො. **අභිතරූපො** අභිත ස්වභාව ඇත්තේ, ඒ අභිත ස්වරූප ඇති සිංහයකු මෙන් වැඩහුන් බුදුරජාණන් වහන්සේ පිදුවෙමි යන සම්බන්ධයි. පක්ෂීන්ට අග්‍ර වූ කුරුලු රජකු මෙන් උතුම් වූ කේසර සිංහයකු මෙන් තුන්ලොවට සරණ වූ සිබී සම්මා සම්බුදුරජාණන් වහන්සේ. කවරෙක් වීද? **අනෙජං** නිකෙලෙස්. ස්කන්ධ මාරාදීන් විසින් අපරාජිතව වැඩහුන් සිබී බුදුරජාණන් වහන්සේ යනු සම්බන්ධයි. **සමණානගඝං** යනු සියලු කෙලෙසුන් නැසීමෙහි දැවීමෙහි අග්‍ර වූ, පසේබුදු බුදුසව්වන්ට අග්‍ර වූ යනු සම්බන්ධයි. භික්ෂු සංඝයා පෙරටුකොට **පරිවාරිතං** පිරිවරා වැඩහුන් සිබී බුදුරජාණන් වහන්සේ යනු සම්බන්ධයි. **චඬෙගාටකෙ ගහෙඨාන** යනු උතුම් වූ කටුකරඹුමළු කරඹුවක පුරවා ශ්‍රේෂ්ඨ වූ සිබී සම්බුදු රජාණන් වහන්සේට **සිමොකිරිං** පූජාකෙළෙමි යන අර්ථයි.

පුපඵවංගොටිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

සත්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.71

අපාටලිං අනං පුපඵං යනාදි වශයෙන් ආයුෂ්මත් නාගසමාල තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේය.

වයසින් දැනමිති බවට පත්වූයේ ගෘහවාසයෙහි පිහිටා සුදුසු සත්පුරුෂ ආශ්‍රයක් නැති බැවින් ශාස්තෘෘන් වහන්සේ ජීවත්වන කාලයෙහි දැකීම් ඇසීම් පිදීම් නොකොට, පිරිනිවන්පෑ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු චෛත්‍යය කෙරෙහි සිත් පහදවා, පළොල්මලක් පූජාකොට සොමනස් උපදවා දිවි ඇති තාක් සිට එම සොමනසින්ම එයින් චුතව තුසිත පුරයෙහි දෙදෙව්ලොව සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපදී දැනමිති බවට පත්වූයේය. නා ගස්වල දලු හා සමාන කෝමල වූද රත්පැහැ වූ ද සමාන ශරීරයක් ඇති බැවින් නාගසමාල යයි මාපියන් විසින් තබන ලද නම් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුව පූර්ව කර්මය සිහිකොට 'අපාටලිං අහං පුපඵං' යනාදිය කීහ. එහි අපාටලිං යනු හාත්පසින් හෝ ආදරයෙන් හෝ පළොල්මලක් ගෙන මම ස්තූපයෙහි අභිරොපෙසිං පිදුවෙමි යන අර්ථයි. උජ්ඣිතං සුමහාපථෙ යනු සියලු නගරවාසීහු සඳුන් පුදනු පිණිස මහාපථෙ නුවර මැද වීථියෙහි උජ්ඣිතං ගොඩනැගූ උළුකම් සුණුකම් ආදියෙන් නිෂ්පාදනය කරන ලද යන අර්ථයි. සෙස්ස යට කියන ලද පරිදි පහසුවෙන් දත හැක්කේමය.

නාගසමාල තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.72

අක්කනත්ඤ්ච පදංදිස්වා යනාදි වශයෙන් ආයුෂ්මත් පදසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ උපනුපන් භවයෙහි පින් රැස්කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් ශ්‍රද්ධා සම්පන්න වූ උපාසක ගෘහයක ඉපිද දැනමිති බවට පත්ව තෙරුවන්හි පැහැදුණේ, භාග්‍යවතුන් වහන්සේ විසින් ඔහුට අනුකම්පාවෙන් දක්වන ලද පද සලකුණ දැක රෝමෝද්ගමන ඇත්තේ සඳුන් පූජා ආදි බුහුමන් කළේය. හේ මනා වූ කෙතක මනාසේ කරන ලද එම පිනින් එයින් චුත වැ ස්වර්ගයෙහි ඉපිද

එහි දිවසැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධනසම්පත් ඇති කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පෙර කරන ලද පිනෙහි නමින් පදසඤ්ඤක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ එක් දවසක් තමාගේ පුණ්‍යකර්මය සිහිකොට පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'අකකනතඤ්ඤවපදංදිසවා' යනාදිය කීය. එහි අකකනතං යනු පාතැබූ තැන දක්වන ලදී. සියලු බුදුවරුන්ගේ සියලු කල්හි සිව්අඟුල් ප්‍රදීපයක මෙන් ගමනක් වෙයි. මෙය ඔහුගේ ශ්‍රද්ධා සම්පන්නභාවය දැන මොහු මා දකීවායි පාද චෛත්‍යය පෙන්වූ සේක. ඒනිසා ඔහු එහි පැහැද සඳුන්පූජා ආදි සත්කාර කළේය යන අර්ථයි. සෙස්ස සියලු තැන නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

පදසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.73

දුමගෙ පංසුකූලිකං යනාදි වශයෙන් ආයුෂ්මත් සඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ ගස් මුදුනක රැඳී තිබුණු පාංශුකූල චීවරයක් දැක, එය භාග්‍යවතුන් වහන්සේගේ අර්හත් ධජය යැයි පහන් සිතැතිව සඳුන් පූජා ආදී සත්කාර කළේය. හේ ඒ පුණ්‍යකර්මයෙන් දෙවි මිනිසුන් අතර සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති එක් කුලගෙයක ඉපිද හටගත් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලකින් ම රහත් විය. රහත්බවට පැමිණි උන්වහන්සේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'දුමගෙ පංසුකූලිකං' යනාදිය කීහ. එහි හිස් අවකාශය අහස්තලය පුරවානුයි දුමො දැම නම් වේ- වෘක්ෂයයි. දුමසස අගෙහා කොටිනී ගසෙහි උඩ අග කෙළවරේ තිබුණේ යයි. දුමගහ නම් වේ. ඒ ගස උඩ තිබුණු, පංසුකූල චීවරං පිළිකුල් බවටද අමනෝඥ භාවයට

යනුයි පංසකූල නම් වේ. ඒ පංසුකූල සිවුර ගස උඩ තිබෙනු දුටු මම ඇදිලි බැඳ වැන්දෙමි. ප්‍රණාමය කළෙමි යන අදහසයි. **තනති** වනාහි නිපාත මාත්‍රයකි. සෙස්ස සියලු තැන නොගැඹුරු අර්ථ ඇත්තේමය.

සඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.74

කානනං වන මොගයහ යනාදි වශයෙන් ආයුෂ්මත් හිසාලුවදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත සමීපයෙහි අරණ්‍ය වාසයෙහි වසන්නේ, වනමුල්පල ආහාරකොට ඇත්තේ, විවේක වශයෙන් පැමිණි විපසසි භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ නෙළුම් අල පහක් දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත පහදවා ඔහු බලා සිටිය දී ම වැළඳූ සේක. හේ චිත්තප්‍රසාදයෙන් කලුරිය කොට තුසිත ආදී දිව්‍ය ලෝකවල සම්පත් අනුභවකොට පසුව මනුෂ්‍ය සම්පත් ද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපදී ධන සම්පත්තියට පැමිණියේ එය අත්හැර සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත් බවට පත්විය. ඉන් තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'කානනං වන මොගයහ' යනාදිය කීය. එය යට කියූ පරිදි වේ ම ය. **වසාමි විපිනෙ අහං** යනු මම විවේක වාස ඇත්තේ වාසය කරමි යන සම්බන්ධයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

හිසාලුවදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

අටවැනි බණවර වර්ණනාව සමාප්තයි.

3.75

ඛණ්ඩා නාමාසි නාමෙන ආදි වශයෙන් ආයුෂ්මත් එකසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපදී දැනමිති බවට පත්වූයේ තෙරුවන්හි පැහැදුණු සිතැත්තේ ඒ ශාස්තෘන් වහන්සේගේ ඛණ්ඩ නමැති අග්‍රශ්‍රාවකයා දන්පිණිස හැසිරෙනු දැක සැදැහැයෙන් යුතුව පිණ්ඩපාතය දුන්නේ ය. හේ එම පුණ්‍ය කර්මයෙන් දෙව්මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණියේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනය අසා ලැබූ සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ එක් දවසක් පිඬු පිණිස වූ සංඥාව සිහිකොට ලැබූ විශේෂය නිසා එකසඤ්ඤක තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූවාහු පසුකලෙක තමාගේ පින සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'ඛණ්ඩා නාමාසි නාමෙන' යනාදිය කීහ. ඒ අග්‍රශ්‍රාවක තෙරුන් වහන්සේ කෙලෙස් කඩන ලද බැවින් ඛණ්ඩ යයි නම් වූහ. සෙස්ස සියලුතන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

එකසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.76

හිමවන්තසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් තිණසන්ථරදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේය. බුද්ධෝත්පාදයට පෙරාතුව උපන් බැවින් ගෘහවාසය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවත නුදුරෙහි එක් විලක් ඇසුරුකොට වාසය කරයි. එසමයෙහි තිසස භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස

අහසින් වැඩි සේක. ඉක්බිති ඒ තවුසා අහසින් බැස සිටි ඒ භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ තණ කපා තණ ඇතිරියක් කොට වඩා හිඳවා බුහුමන් අදරින් පසඟ පිහිටුවා වැඳ ගියේය. හේ දිවි ඇති තෙක් සිට එයින් චුත ව දෙව්මිනිසුන් අතර සැරිසරන්නේ නොයෙක් ආකාර වූ සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාදයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පුණ්‍යකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරමින් හිමවනතසස අවිදූරෙ යනාදිය කීහ. එය යට කියන ලද අරුත් ඇත්තේ ම ය. **මහාජාතසසරො** යනු දෙපා සිව්පා සත්වයෝ පිපාසිත වූවාහු බොනු පිණිස මෙහි හැසිරෙත්නුයි සරං නම්. නැතහොත් මෙහි ගංගා කඳුරු ආදිය ගලාබසීනුයි සරං නම්. මහත්වූ ද එය තෙමේම හටගත් බැවින් සරද වෙයි. **මහාජාතසසරො** අනෝතත්ත විල ඡද්දන්ත විල ආදිය මෙන් ප්‍රකට නම් නොමැති බැවින් මහාජාතසසරො යයි කියන ලදැයි දතයුතුය. **සතපත්තෙහි සඤ්ඡනෙනා** යනු එක් එක් මලෙහි සියයක් සියයක් පෙති වශයෙන් **සතපත්තෙහි** සුදු නෙළුම්න් **සඤ්ඡනෙනා** ගහණ වූයේය යන අර්ථයි. **නානාසකුණානමාලයො** යනු නොයෙක් හංස ආදීහු එක්ව **කූනන්ති** ශබ්ද කරත්නුයි **සකුණ** යයි ලද නම් ඇති පක්ෂීන්ට **ආලයො** ආධාර වූයේය යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

තිණසත්ථරදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.77

තිංසකප්ප සහසසමහි යනාදි වශයෙන් ආයුෂ්මත් සුවිදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු මැසීමට ඉදිකටු පහක් දුන්නේය. හේ ඒ

පිනින් දෙවිමිනිසුන් අතර පින් අනුභවකොට හැසිරෙන්නේ උපනුපත් භවයෙහි තියුණු ප්‍රඥා ඇත්තේ ව උපන්නේ ය. මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වන්නේ තියුණු ප්‍රඥා ඇති බැවින් හිසමුඩු කරද්දීම රහත් බවට පත්විය. උන්වහන්සේ පසුකලෙක පින නැවත බලන්නාහු ඒ දැක හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු '**තිංස කප්ප සහස්සමහි**' යනාදිය කීහ. මෙහි අතරතුර පහසුවෙන් දතහැක්කේමය. **පඤ්චසූචි මයා දිනනා** යනු සූචති සිදුරු කෙරේනුයි විදිනුයි සුචිනම්. පහක් පමණ ඉදිකටු මා විසින් දෙන ලදී යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

සූචිදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.78

සුවණ්ණ වණ්ණං සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් පාටලී පුපඵීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ තිස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ දක්ෂවූයේ කුසල සංඥා ඇත්තේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පළොල්මලක් ගෙන ශාස්තෘන් වහන්සේට පූජා කළේය. හේ එම පිනින් බෙහෙවින් සුවසම්පත් අනුභව කරමින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ, මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **සුවණ්ණ වණ්ණං සම්බුද්ධං** යනාදිය කීය. **අන්තරාපණෙ** යනු හාත්පසින් අමුරන් රත්රන් ආදී භාණ්ඩ **පණෙන්ති** මෙහි ගෙන එන්නුයි විකුණන්නුයි පතුරන්නුයි ආපණ නම්. රන් බඩු විකිණීමට වෙන් වූ වීදිය ආපණ අතුරුවීදිය යනුයි අන්තරාපණං, එහි අන්තරාපණෙ. රන්වන් වූ රන්මුවා ඇඟයක් සේ

දෙතිස් වර ලක්‍ෂණ ඇති සම්බුදුන් දැක පළොල් මලක් පිදුවෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

පාටලීපුප්පීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.79

මිගලුද්දෝ පුරෙ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් ඨිතඤ්ජලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ උපනුපන් භවයන්හි තැනින් තැන පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි පෙර කරන ලද කර්ම විපාකයක් අනුව එක් වැදි යෝනියෙක ඉපිද දැනමිහි බවට පත්වූයේ මුවන් උගරන් ආදීන් මරා දඩයමින් අරණ්‍යයෙහි වාසය කළේය. එසමයෙහි තිස්ස භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස හිමවතට වැඩි සේක. හේ දෙතිස් වර ලක්‍ෂණයන්ගෙන් අසූවක් අනුව්‍යංජනයන්ගෙන් ව්‍යාම ප්‍රභාවන්ගෙන්ද දිලිසෙන ඒ භාග්‍යවතුන් වහන්සේ දැක හටගත් සොම්නස් ඇත්තේ ප්‍රණාම කොට ගොස් කොළ ඇතිරියෙහි හිඳගත්තේය. එවේලෙහි අහස ගුගුරමින් හෙණයක් වැටුණේය. වැද්දා එයින් මියයන කල්හි බුදුන් සිහිකොට නැවත ඇදිලි බැඳගත්තේය. හේ එම පිනින් මනා කෙතක කරන ලද කුශලයක් බැවින් අකුශල විපාකය පසුබාවා ස්වර්ගයෙහි ඉපිද කාමාවචර සම්පත් ද, මිනිසුන් අතර මනුෂ්‍ය සම්පත් ද අනුභවකොට පසුකලෙක මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව පෙරකළ වාසනා හේතුවෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ ඉන්පසුව පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **මිගලුද්දෝ පුරෙ ආසිං** යනාදිය කීහ. එහි **මිගලුද්දෝ** යනු මුවන් මරනු පිණිස ලඟට යේනුයි මිගලුද්දෝ. **මිගහි** වාත වේගයෙන්ම යනුයි දුවානුයි මිගලුදද නම් වේ. ඒ මම පෙර භාග්‍යවතුන් වහන්සේ දකින අවස්ථාවෙහි මුවවැද්දෙක් **ආසිං** වීමි යන අර්ථයි. **අරඤ්ඤකානනෙ** යනු **අරහි** මුව සමූහයා මෙහි යේනුයි අරඤ්ඤ නාට්. නැතහොත් හාත්පසින්

රජ්ජනති එහි විවේක කැමති බුදු පසේබුදු ආදීහු ද මහා ඓශ්වර්යට පැමිණි සත්පුරුෂයෝ ද ඇලෙතියි අරඤ්ඤ නම්. පහත් අයුරින් හෝ භයානක අයුරින් **නදනති** ශබ්ද කරත්නුයි හෝ කානන නම්. එම අරණ්‍යයෙහි කානනයෙහි පෙර මුවවැද්දෙක් වීම් යන සම්බන්ධයි. **තඤ්ඤදඤඤහං සම්බුද්ධං යනු තඤ්** ඒ අරණ්‍යයෙහි සමීපයට පැමිණි සම්බුදුන් වහන්සේ අද්දසං දුටුවෙමි යන අර්ථයි. පෙර දර්ශනය නුදුරෙහි විය. ඒ නිසා මනෝද්වාර අනුසාරයෙන් චක්ඛුවිඤ්ඤාණය, පෙර හැසිරෙන කායවිඤ්ඤාණය සම තත්වයට පමුණුවයි යන අර්ථයි. **තතො මෙ අසනිපාතො** යනු හාත්පසින් **සනනෙනා** ගර්ජනය කරමින් වැටෙනුයි අසනි. අසනියෙහි පාතය අසනි පාතො නම්. දෙවියන්ගේ දණ්ඩ යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ඛීතඤ්ජලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.80

පදුමුත්තරෝ නාමජිනෝ යනාදි වශයෙන් ආයුෂ්මත් තිපදුමිනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර මාලාකාර කුලයක උපන්නේ වැඩිවිය පත්වූයේ මාලාකාර කර්මය කොට වාසය කරන්නේ එක් දවසක් අනේකවිධ වූ දියගොඩ මල්ගෙන රජුගේ සමීපයට යනු කැමැත්තේ මෙසේ සිතීය. රජ මේ මල් කම් දැක පැහැදී ප්‍රසාද වශයෙන් ධනය හෝ ගම් ආදියක් දෙන්නේය. ලෝකනාථයන් වහන්සේ පූදා නිර්වාණාමෘත ධනය ලබමි. මෙයින් යමක් සුන්දරනම් එයින් භාග්‍යවතුන් වහන්සේ පූදා ස්වර්ග මෝක්ෂ සම්පත්තීන් සාදා ගැනීමම වටනේ යයි සිතා වර්ණ ගන්ධයෙන් යුක්ත වූ අතිශයින් උත්තම වූ මල්තුනක් ගෙන පූජා කළේය. ඒවා ගොස් අහස වසා පැතිරී සිටියේය. නුවරවැසියෝ ආශ්චර්ය අද්භූත සිත් ඇත්තාහු දහස් ගණන් පිළි එසවීම් පැවැත්වූහ. ඒ දැක භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනාව කළ සේක. හේ

ඒ පුණ්‍ය කර්මයෙන් දෙවි මිනිසුන් අතර සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ගෘහපති කුලයක උපන්නේ වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී දහම් අසා ලැබූ ශ්‍රද්ධා ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු පදුමුත්තරෝ නාම ජිනෝ යනාදිය කීහ. එහි අර්ථය යට කියන ලද්දේ ම ය. සබ්බ ධම්මාන පාරගූ යනු සියලු නවලෝකෝත්තර ධර්මයන් පාරං නිර්වාණය ගතෝ ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය යන අර්ථයි. දනෙහා දනෙහහි පරිවුතෝ යනු තමා කායවාචාදියෙහි දමනය වූයේ. අගපත් වූයේ යයි දේශනා කරනු ලැබූ ශ්‍රාවකයන් විසින් පිරිවරන ලද්දේ යන අර්ථයි. සෙස්ස අර්ථ සම්බන්ධ වශයෙන් නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

තිපදුමිනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

අටවැනි වර්ග වර්ණනාවයි.

3.81

චන්‍දභාගානදීතීරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් තිමිරපුප්ඵීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසයෙහි පිහිටා වාසය කරන්නේ ආදීනව දැක ගෘහවාසය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව චන්‍දභාගා නදිය අසබඩ වාසය කරයි. විවේක කැමති බැවින් හිමවතට වැඩි සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ දැක වැඳ උන්වහන්සේගේ ගුණ සිහිකොට තිමිර මලක් පූජා කළේය. හේ ඒ පිනින් දෙවියන් අතරද මනුෂ්‍යයන් අතරද සම්පත් අනුභව කරමින් සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **චන්‍දභාගා**

නදීතීරෙ යනාදිය කීහ. එහි අර්ථය යට කියන ලදී. **අනුසොතං වජාමහං** ගඟ ආසන්නයෙහි, ගංතෙර යන අනුසාරයෙන් යට කියන ලද පරිදි **වජාමි** යමි. තැන තැන වසමි යන අර්ථයි. **නිසිනනං සමණං දිසවා** සමනය කරන ලද පාපයන් ඇති බැවින්, දවාලන ලද පාපයන් ඇති බැවින් ශ්‍රමණ සංඛ්‍යාත වූ සම්මා සම්බුදුන් වහන්සේ දැක යන අර්ථයි. **එවං විනෙතසහං තදා** යනු මේ භාග්‍යවතුන් වහන්සේ තමන් එතරවූ සේක් සියලු සත්වයන් **තාරයිසසති** සංසාරයෙන් එගොඩ කරවන සේක. තමන් කායද්වාර ආදියෙන් දමනය වූ සේ මේ භාග්‍යවතුන් වහන්සේ අනුන් දමනය කරන සේක. තමන් **අස්සසතෝ** අස්වැසුණු බවට පත්වූවාහු ක්ලේශ පරිදාහයෙන් මිදුණාහු සංසාරයෙන් මිදුණාහු අනුන් සංසාරයෙන් මුදවන සේක. ඒ මේ භාග්‍යවතුන් වහන්සේ තමන් කෙලෙස් ගින්නෙන් මිදුණාහු අනුන්ද කෙලෙස් ගින්නෙන් නිවාලන සේක. මෙසේ මම එදා සිතුවෙමි යන අර්ථයි. **ගහෙත්වා තිමිරං පුප්ඵං** යනු සියලු වනාන්තරය නිල්වන් රශ්මීන්ගෙන් අන්ධකාරයක් මෙන් කරමින් ගෙවියනුයි **තිමිරපුප්ඵං**. ඒ තිමිර පුෂ්පයි කර්ණිකාවෙන් තංගහෙත්වා අල්ලාගෙන මත්තකෙ හිසට උඩින් අහසෙහි **ඔකිරිං** පිදුවෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

තිමිර පුප්ඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.82

ජාතියා සත්තවසෙසාහං යනාදි වශයෙන් ගතසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරමින් තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද, පෙර කරන ලද වාසනා වශයෙන් හටගත් සැදැහැ ඇත්තේ සත්හැවිරිදි වියෙහි ම පැවිදි වූයේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රණාමකරණයෙන්ම ප්‍රකට විය. හේ එක් දවසක් අතිශයින් නිල්වන් මැණිකක පැහැය ඇති නගුලින් සීසෑ අංගනයෙහි නැගුණු මල්සතක් ගෙන අහසෙහි පිදුවේය. හේ දිවි ඇතිතෙක් මහණදම් කොට ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ මේ

බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී නොබෝ කලෙකින්ම රහත් විය. පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'ජාතියා සත්තවසෙසාහං' යනාදිය කීය. එහි ජාතියා යනු මව්කුසින් උපන්තැන් පටන් පිරිපුන් සත්වස් වූයේ යන අර්ථයි. පබ්බජිං අනගාරියං යනු අගාරයට හිතවූයේ අගාරියං. කෘෂි වණිජ් කර්ම. අගාරිය නැත්තේ අනාගරිය නම්. බුදුසසුනෙහි මම පැවිදි වූයෙමි යන අර්ථයි. සුගතෙන ගතමගගං - බුදුන් වහන්සේ ගියමග. සුගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මානුධර්ම ප්‍රතිපත්ති පිරීම් වශයෙන්. හඨ්ඨමානසො තුටුසිතින් පුදා යන සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේමය.

ගතසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.83

රුකඛමූලෙ නිසිනෙනාහං යනාදි වශයෙන් ආයුෂ්මත් නිපනනඤ්ජලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ පැවිදි වී රුක්ඛමූලිකාංගය පුරමින් අරණ්‍යයෙහි වාසය කරයි. එක්කලෙක කටුක ආබාධයක් හටගත්තේය. එයින් පෙළුණේ අතිශයින් අනුකම්පා කටයුතු බවට පත්වූයේ විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුට කරුණාවෙන් එහි වැඩි සේක. ඉක්බිති ඔහු වැදහොත්තේම නැගිටින්නට අපොහොසත් වූයේ හිසෙහි ඇදිලිකොට භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කළේය. හේ එයින් චුතව තුසිත භවනයෙහි උපන්නේ එහි සම්පත් ද කාමාවචර සයෙහි සම්පත් ද අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වූයේ නොබෝ කලකින්ම රහත් විය. පෙර කරන ලද පින් වශයෙන් නිපනනඤ්ජලිය තෙරුන්

වහන්සේ යයි ප්‍රකට වූයේ පසුකලක පුණ්‍ය සම්පත් බලා හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'රුකඛමූලෙ නිසිනොහං' යනාදිය කීය. එහි වැඩෙනුයි නැවත වැඩෙනුයි මුදුන උසට නගීනුයි රුකඛ නම්. එම රුකෙහි මූලෙ සම්පයෙහි යන අර්ථයි. **බ්‍යාධිතො පරමෙනාහං** යනු **පරමෙන** අධික වූ බරෙන කටුක වූ බ්‍යාධිනා රෝගයෙන් මම යුක්ත වූයෙමි යන අර්ථයි. **පරම කාරුඤ්ඤ පත්තොමහි පරමං** අධික වූ **කාරුඤ්ඤං** කරුණාවන්ත බවට දීන බවට දුක්ඛිත බවට පැමිණියේ **අරඤ්ඤ** වනයෙහි යන සම්බන්ධයි. **පඤ්ඤවාසුං මහාසිඛා** යනු හිසෙහි පළඳින අර්ථයෙන් සිඛා යයි කියනු ලැබේ. සිළුමිණක් මෙන් බබලන සිඛාවක් ඔහුට ඇත්තේනුයි සිඛා නම්. එක් නමක් ඇති සක්විති රජවරු පස්දෙනෙක් **ආසුං** වූහ යන අර්ථයි. සෙස්ස සියලුතැන නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

නිපනනඤ්ඤජලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.84

අභිභූනාම සො භික්ඛු යනාදි වශයෙන් ආයුෂ්මත් අධොපුප්පීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි පින් රැස්කරන්නේ සිඛී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ වැඩිවිය පත්වූයේ ගෘහවාසය පිහිටුවා පසුකලෙක කාමයන්හි ආදීනව දැක එය අත්හැර ඍෂි පැවිද්දෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ට සමාපත්තිලාභීව ඍද්ධීන්හි ද නිපුණ බවට පත්ව හිමවතෙහි වෙසෙයි. ඉන්පසුව සිඛී භාග්‍යවතුන් වහන්සේගේ අභිභූ නම් අග්‍රශ්‍රාවකයන් වහන්සේ විවේකය කැමැතිව හිමවතට වැඩි සේක. ඒ තවුසා අග්‍රශ්‍රාවකයන් වහන්සේ දැක, තෙරුන් වහන්සේ සිටි පව්වට නැග, එහි යටතලයෙන් සුවඳවත් පැහැපත් මල් සතක් ගෙන පූජා කළේය. ඉක්බිති ඒ තෙරුන් වහන්සේ ඔහුට අනුමෝදනාව කළහ. ඒ තවුසා ද තමාගේ අසපුවට ගියේය. එහිදී එක් පිඹුරකු විසින් පීඩා කරන ලද්දේ නොපිරිහුන් ධ්‍යාන ඇත්තේ එම උපද්‍රවයෙන් ම බ්‍රහ්මලෝකයට පැමිණියේ විය. සදිව්‍ය ලෝකවලදී

කාමාවචර සම්පත් අනුභව කොට, මිනිසුන් අතර මනුෂ්‍ය සම්පත් ද ගෙවා මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපදී වැඩිවිය පත්වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා පැහැදුණු සිත් ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලක තමා කරන ලද පිනෙහි නමින් අධොපුප්පීය තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ එක් දවසක් තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **අභිභූනාමසොභිකඛු** යනාදිය කීය.

එහි සීල සමාධීන්ගෙන් අනුන් අභිභවනය කෙරේනුයි අභිභූ නම්. ස්කන්ධ මාරාදී මාරයන් **අභිභවති** යටපත් කෙරේනුයි හෝ අභිභූ නම්. ස්වසන්තාන පරසන්තාන ගත ක්ලේශයන් යටපත් කෙරේනුයි, දවා හරිනුයි විශේෂයෙන් දවා හරිනුයි, විධ්වංසනය කෙරේනුයි හෝ අභිභූ නම්. පිඬු සිඟා යන සුලු යදිනසුලු වූයේ භික්ඛු නම්. සුන්බුන් වස්තු දරානුයි හෝ භික්ඛු නම්. අභිභූ වූයේද හේ භික්ඛු වූයේද ඒ භික්ෂුවනුයි අභිභූ භික්ඛු නම්. ඒ අග්‍රශ්‍රාවක නම් වේනුයි අර්ථයි. සිබී භාග්‍යවතුන් වහන්සේගේ අග්‍රශ්‍රාවක භික්ෂුව යන සම්බන්ධයි. **අජගරෝ මං පීළෙසි** යනු මහත් වූ පිඹුරෙක් එබඳු සිල්වත් ධ්‍යානවත් තාපසයා පෙර කරන ලද පවින් හා වෛරයෙන්ද පෙළීය. හේ ඒ උපද්‍රවයෙන්ම උපද්‍රවයට පත්වූයේ නොපිරිහුන් ධ්‍යාන ඇත්තේ කලුරියකොට බ්‍රහ්මලෝක පරායණ විය. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

අධොපුප්පීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.85

පබ්බතෙ හිමවන්තමහි යනාදි වශයෙන් ආයුෂ්මත් රංසිසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ ඒ ඒ භවයන්හි පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසයෙහි පිහිටා කාමයන්හි ආදීනව දැක ගෘහවාසය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව අඳුන්දිවිසම් දරන්නේ හිමවතෙහි වාසය කළේය.

එසමයෙහි විපස්සී භාග්‍යවතුන් වහන්සේ හිමවතට වැඩි සේක. ඉක්බිති ඒ තවුසා ඔහු වෙතට පැමිණි භාග්‍යවතුන් වහන්සේ දැක ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙන් නිකුත්වූ සවණක් බුදුරැස්හි පැහැදී ඇඳිලිබැඳ පසඟ පිහිටුවා නමස්කාර කළේය. හේ ඒ පුණ්‍ය කර්මයෙන් ම එයින් චුත ව තුසිත ආදී දිව්‍යලෝකවල දිවසැපත් අනුභවකොට පසුකලෙක මිනිස් සැපත් ද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසයෙහි පිහිටා එහි ආදීනව දැක ගිහිගෙය අත්හැර පැවිදි ව නොබෝ කලකින් ම රහත් විය. හේ පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **පබ්බතෙ හිම වනතම්හි** යනාදිය කීය. එහි **පබ්බතෙ** යනු ක්‍රමයෙන් බෑහැකි වැඩෙන්නේනුයි **පබ්බත** නම්. එයට හිම ඇත්තේනුයි හිමවා නම්. හිමවනත වූයේද එම පබ්බත වූයේ ද හිමවනත පබ්බත නම්. හිමවනතම්හි යයි කියන ලදී. පෙර මම හිමවත් පව්වෙහි වාසය කෙළෙමි යන සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නියමාකාරයෙන් නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

රංසිසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.86

පබ්බතෙ හිමවනතම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් දුතිය රංසිසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල් ඇත්තේ උපනුපන් භවයෙහි පින් රැස් කරන්නේ ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවියට පත්වූයේ ගෘහවාසයෙහි පිහිටා එහි දොස් දැක එය හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවත් පව්වෙහි වාසය කරන්නේ වැහැරී සිවුරු හඳින්නේ විවේක සුවයෙන් වාසය කරයි. එසමයෙහි හේ ඵුස්ස භාග්‍යවතුන් වහන්සේ ඒ පෙදෙසට පැමිණි බව දැක උන්වහන්සේගේ ශරීරයෙන් නික්මුණු සවණක් බුදුරැස් එහිමෙහි දිවෙනු දඬුවැට පහන් වැටක් සේ එහා මෙහා ඈතට ඈතට විහිදෙනු දැක එහි පැහැදුණේ ඇඳිලිබැඳ වැඳ සිත පහදවා ඒ ප්‍රීති

සෝමනස්ස- යෙන්ම කලුරියකොට තුසිත ආදී දේවලෝකවල උපන්නේ එහි සය කාමාවචරයන්හි සම්පත් ද අනුභවකොට පසුකලෙක මිනිස් සැපත් ද අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ පූර්ව වාසනා වශයෙන් පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පසුකලෙක පූර්ව කුශලය සිහිකොට හටගත් සොමනස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පබ්බතෙහිමවනතමහි' යනාදිය කීහ. එය නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

දුතිය රංසිසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.87

පබ්බතෙ හිමවනතමහි යනාදි වශයෙන් ආයුෂ්මත් ඵලදායක තෙරුන් වහන්සේගේ අටුවාවයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල සම්භාර ඇත්තේ භවයෙහි ඒ ඒ තන්හි පින් රැස් කරන්නේ ථූසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද සියල්ල අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව කළඅඳුන් දිවිසම් දරන්නේ වාසය කරයි. එසමයෙහි ථූසස භාග්‍යවතුන් වහන්සේ එහි පැමිණි බව දැක පහන් සිතැත්තේ මිහිරි පල ගෙන වැළඳවීය. හේ ඒ කුසලයෙන් දිව්‍ය ලෝකාදියෙහි පුණ්‍ය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව රහත් විය. පසුකලෙක තමාගේ පුණ්‍යකර්මය සිහිකොට පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ පබ්බතෙ හිමවනතමහි යනාදිය කීය. ඒ සියල්ල යට කියන ලද පරිදි නොගැඹුරු අර්ථ ඇත්තේමය.

ඵලදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.88

පබ්බතෙ හිමවන්තම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් සද්ද සඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවියට පැමිණියේ හටගත් සැදැහැ ඇත්තේ තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවතෙහි අරණ්‍ය වාසය වසන්නේ තමාට අනුකම්පා පිණිස පැමිණියා වූ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා දහම්හි සිත් පහදවා දිවි ඇතිතාක් සිට පසුකලෙක කලුරිය කොට තුසිත ආදි සදිව්‍යලෝකවල කාමාවචර සම්පත් ද මිනිසුන් අතර මිනිස් සම්පත් ද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ විදසුන් වඩා රහත්බවට පත්විය. උන්වහන්සේ පසුකලෙක පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පබ්බතෙ හිමවන්තම්හි' යනාදිය කීහ. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

සද්දසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.89

විපස්සිස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් බොධිසිඤ්චක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතිවලදී පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තරා කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ සසුනෙහි පැවිදිව වත්පිළිවෙතින් සසුන බබලවන්නේ මහජනයා බෝධිපූජා කරනු දැක නොයෙක් මල්ද සුවඳ පැන්ද ගෙන්වාගෙන පූජා කළේය. හේ ඒ පිනින් දෙව්ලොව උපන්නේ කාමාවචර සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ උපන් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලෙකින්ම

රහත් විය. රහත් ව සාසනඵල අනුභව කරන්නේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'විපස්සිස්ස භගවතො මහාබොධිමහො' යනාදිය කීය. එහි විශේෂයෙන් පරම වූ නිර්වාණය බලානුයි විපස්සී නම්. විපස්සනෙතා චතුරාර්ය සත්‍යය දක්නාසුලුනුයි විපස්සී නම්. විශේෂයෙන් ශ්‍රද්ධාවත් අශ්‍රද්ධාවත් ජනයන් බලානුයි විපස්සී නම්. ඒ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ මහාබෝධි උත්සවය විය යන සම්බන්ධයි. එහිද මහාබොධී යනු සතරමග ඥානය බෝධියයි කියනු ලැබේ. එය මෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළසේක්නුයි කිණිහිරි රුකද බෝධියයි කියනු ලැබේ ම ය. දෙව්බඹුන් නරන් විසින් පුදන ලද්දේ එය බෝධි යනුයි මහාබෝධි නම්. මහත් වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ බෝධි හෝනුයි මහාබොධි නම්. එයට මහා පූජාවක් විය යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

බොධිසිඤ්චක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.90

පොකඛරවනං පවිට්ඨොහං යනාදි වශයෙන් ආයුෂ්මත් පදුමපුප්ඵීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තරා කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව පද්මයන්ගෙන් යුතු එක් පොකුණකට පිවිස නෙළුම් අල කන්නේ පොකුණ නුදුරෙහි වසනා ඵුස්ස භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතැත්තේ එයින් නෙළුම් මල් නෙළා අහසෙහි ඔසවා භාග්‍යවතුන් වහන්සේ පිදීය. ඒ මල් අහසෙහි වියනක් ව සිටියේය. හේ බෙහෙවින් පැහැදුණු සිතැත්තේ පැවිදි ව පිළිවෙත් සරු වූයේ මහණදම් පුරා එයින් චුතව තුසිත භවනය අලංකාර කරමින් මෙන් එහි ඉපිද ක්‍රමයෙන් කාමාවචර සම්පත්ද මිනිස් සම්පත්ද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ හටගත් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලෙකින්ම රහත් විය. පසුකලෙක

තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'පොකඛර වනං පවිට්ඨො යනාදිය කීය. එහි මනාව දඬුකොළ ආදියෙන් වැගිරෙත්නුයි පොකඛරාති. පොකුණු සමූහය යනුයි පොකඛර වනය. නෙළුම් පඳුරු මඬුලුවලින් අලංකෘත මධ්‍යයට මම පිවිසියෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේමය.

පදුම පුපඵීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

නවවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.91

පූජාරහෙ පූජයතො යනාදි වශයෙන් ආයුෂ්මත් සුධාපිණ්ඩිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිදධත්‍ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ ජීවත්ව සිටියදී පිනක් කරන්නට නොහැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ධාතු නිදන්කොට චෛත්‍ය කරනු ලබන කල්හි හුණු පිඬු දුන්නේය. හේ එම පිනින් අනූහතර වැනි කල්පයෙහි පටන් මේ අතරතුර සතර අපාය නො දැක දෙව්මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'පූජාරහෙ' යනාදිය කීය. එහි පූජාරහ නම් බුදු පසේබුදු ශ්‍රාවක ආචාර්ය උපාධ්‍යාය මව්පිය ගුරු ආදීහුය. ඒ පූජාවට සුදුස්සන් කෙරෙහි මල්දම් පහන් සුවඳදුම් වස්ත්‍රාභරණ ආදී සිව්පසයෙන් **පූජයතො** පුදන්නාවූ පුද්ගලයාගේ පින් කොටස දහස සියදහස ආදි වශයෙන් ගණන් කිරීමට

කිසිදු මහානුභාව ඇත්තකු විසින්වත් නොහැක්කේය යන අර්ථයි. හුදෙක් ජීවත්වන්නා වූ බුද්ධාදී උත්තමයන්ට පුදන්නහුට පමණක් නොව, පිරිනිවි භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍ය ප්‍රතිමා බෝධි ආදිය කෙරෙහිද මෙම ක්‍රමයමය. එය පැහැදිලි කිරීමට 'චතුන්නමපි දීපානං' ආදිය කීය. එහි **චතුන්නං දීපානං** යනු ජම්බුද්වීපය. අපරගෝයානය, උත්තරකුරු, පූර්වවිදේහ සංඛ්‍යාත වූ සතර ද්වීපයන් හා එයට ඇතුළත් දෙහසක් කුඩා දිවයින්ද එකතුකොට සියලු සක්වළ ගැබට ප්‍රධාන වූ සක්විති රජය කරන්නේය යන අර්ථයි. **එකිස්සා පූජානායෙතං** යනු චෛත්‍යයෙහි ධාතු ගර්භයෙහි කරන ලද එක් පූජාවකින්, පිදුමකින් එකක්, සියලු දඹදිව සප්තරත්න ආදි වූ සියල්ල. **කලං නාගඝති සොළසිං** යනු චෛත්‍යයෙහි කළ පූජාව දහසයවරක් බෙදූ දහසයවැනි කොටස තරම් නො අගී යන අර්ථයි. 'සිද්ධත්ථස්ස නරගණස්ස චෙතියෙ එලිතනතරෙ' යනු නරයන්ට අග්‍රවූ ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍යයෙහි ධාතු ගර්භයෙහි සුණු පිරියම් කෙරෙන කල්හි පිරිසිදීම් අතරෙහි මැද, නැතහොත් මල් තබන තැන් අතරෙහි. යං යනු යමෙක් මා විසින් හුණුපිඩ **දිනෙනා** තබන ලද්දේද යන සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි ප්‍රකට ම ය.

සුධාපිණ්ඩිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.92

තිස්සස්ස ලොකනාථස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් සුචිනතිත තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතිවල නිර්වාණය අවබෝධ කරනු පිණිස පින් රැස්කොට තිස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද ශාස්තෘන් වහන්සේට වැඩහිඳීම පිණිස පිරිසිදු සිනිඳු දැවමුවා මාහැඟි පුටුවක් දුන්නේ ය. හේ එම පින්කමින් සුගතියෙහි සැප අනුභව කරමින් ඒ ඒ තැන සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී

පැවිදි වූයේ නොබෝ කලකින්ම රහත් විය. පැමිණි රහත්ඵල ඇත්තේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'තිසසසස ලොකනාථසස' යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සුචිනතිත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.93

තිසසසසාහං භගවතො යනාදී වශයෙන් ආයුෂ්මත් අඩ්ඩවෙලක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් අකුසල කර්මයකින් දුප්පත් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව සද්ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ සිවුරු පිණිස රෙද්දකින් අඩක් දුන්නේය. හේ ඒ සොම්නසින්ම කලුරිය කොට ස්වර්ගයෙහි උපන්නේ ස කාමාවචර සම්පත් අනුභවකොට එයින් චුතව මිනිසුන් අතර මිනිස් සම්පත්තීන්හි අග්‍රවූ චක්‍රවර්ති සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා පහන් සිතැත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ '**තිසසසසානං භගවතො**' යනාදිය කීය.

අඩ්ඩවෙලක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.94

කම්මාරොහං පුරෙ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් සුචිදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ අතරතුර කුසල්බිජු පුරන්නේ විපසසී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි අතරතුර කරන ලද එක් වැරදි ක්‍රියාවකින් කඹුරු කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව ස්වකීය ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණියේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනය අසා පහන් සිතැත්තේ සිවුර මැසීම පිණිස ඉදිකටු දානයක් දුන්නේ ය. හේ ඒ පිනින් දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභවකොට පසුකලෙක මිනිසුන් අතර ඉපිද චක්‍රවර්ති ආදී සම්පත්ද අනුභව කරන්නේ උපනුපන් භවයෙහි තියුණු නුවණ ඇත්තේ වප්‍රප්‍රඥා ඇත්තේ විය. හේ ක්‍රමයෙන් මේ බුද්ධෝත්පාද කාලයෙහි ඉපිද වැඩිවිය පත්ව හටගත් ශ්‍රද්ධා ඇත්තේ මහා ධන ඇත්තේ තියුණු නුවණ ඇත්තේ විය. එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනය අසා ධර්මානුසාරයෙන් ඥානය යවා හුන් අසුනෙහිම රහත් විය. හේ රහත් වූයේම පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සිද්ධස්සස භගවතො' යනාදිය කීය. එහි **කම්මාරො** යනු යකඩ වැඩ ලෝහ වැඩ ආදී කර්මයකින් ජීවත්වේනුයි, **රුහති** දියුණුවට වැඩි දියුණුවට පැමිණේනුයි කම්මාර නම්. පෙර පින් කරන කල්හි කඹුරෙක්. **ආසිං** වීම් යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

සුචිදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.95

සිද්ධස්සස භගවතො යනාදි වශයෙන් ගන්ධමාලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද පින් රැස්කිරීම් ඇත්තේ සිද්ධස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ විය. හේ ශාස්තෘන්

වහන්සේ කෙරෙහි පැහැදී සඳුන් අගිල් කපුරු කස්තුරි ආදී වූ නොයෙක් සුවඳ වඩා ශාස්තෘන් වහන්සේට ස්තූපයක් කරවීය. එහි මුදුන සමන්මලින් වැසීය. බුදුන්වැඳ ප්‍රාර්ථනාවක් ද කළේය. ඒ පිනින් දෙව්මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධනසම්පත් ඇති එක් කුලගෙයක ඉපිද වැඩිවියට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සිද්ධත්ථස්ස භගවතෝ' යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අර්ථ ඇත්තේමය.

ගන්ධමාලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.96

මිගලුද්දෝ පුරෙ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් තිපුපජීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ අතරෙහි එක්තරා අකුසල දෝෂයකින් විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි නේසාද කුලයෙහි උපන්නේ මුව වැද්දෙක් ව අරණ්‍යයෙහි වාසය කරයි. එකල්හි විපසසි භාග්‍යවතුන් වහන්සේගේ පළොල් බෝධිය පිරුණු කොළදලු ඇත්තේය. හරිත වර්ණ ඇත්තේය. නිල් ආලෝකය ඇත්තේය. මනෝරම්‍ය වූයේය. ඒ දැක මල් තුනකින් පුදා පරඬැල් හැර භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙහි මෙන් පළොල් මහා බෝධිය වැන්දේය. හේ එම පිනින් එයින් චුතවූයේ දෙව්ලොව උපන්නේ එහි දිව්‍ය සම්පත් අනුභවකොට එයින් චුතවූයේ මිනිසුන් අතර ඉපිද එහි චක්‍රවර්ති ආදි සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලැබූ සොම්නස් සහගත හදවත් ඇත්තේ ගිහිගෙය අත්හැර පැවිදිව නොබෝ කලෙකින්ම රහත්විය. හේ මෙසේ ශුද්ධත්වයට පත්වූයේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'මිගලුද්දෝ පුරෙ ආසිං' යනාදිය කීය. එහි මරණයට

යතියි පමුණුවතියි මිග නමි. නැතහොත් බලමින් **ඉහති** පවත්නේනුයි මිග නමි. මුවන් මැරීමෙහි **ලුද්දෝ** ලොබ වූයේ කපන්නේ මිගලුදු නමි. පෙර මා පින් කරන සමයෙහි කානත සංඛ්‍යාත වූ මහා අරණ්‍යයෙහි මුවවැද්දෙක් වීමි යන සම්බන්ධයි. **පාටලිහරිතංදිසවා** යනු එහි මැනවින් පාලන කෙරේනුයි රත්පැහැ වේනුයි පාටලී. මල් රත්පැහැ ඇති බැවින් පාටලී යයි ව්‍යවහාරයක් වෙයි. පතු හරිතවර්ණ බැවින් නීල වර්ණ බැවින් හරිත වූ නීලවර්ණ පළොල් බෝධිය දැක යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නියමාකාරයෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

තිපුපඨිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.97

විවනෙ කානනෙ දිසවා යනාදි වශයෙන් ආයුෂ්මත් මධුපිණ්ඩික තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි නේසාද යෝනියෙහි ඉපිද මහා අරණ්‍යයෙහි වාසය කරයි. එකල්හි විවේකය කැමැත්තෙන් සපැමිණි සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ දැක සමාධියෙන් නැගුණු උන්වහන්සේට සුමිහිරි මීපැණි දුන්නේය. එයින් වෙසෙසින් පහන් වූ සිතැත්තේ වැඳ ගියේය. හේ ඒ පිනින්ම සම්පත් අනුභව කරන්නේ දෙවිමිනිසුන් අතර සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වූයේ නොබෝ කලෙකින්ම රහත් විය. පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'විවනෙ කානනෙ දිසවා' යනාදිය කීය. එහි **විවනෙ** යනු විශේෂයෙන් වනය පැතිරුණේ විවන නමි. ඇත් අස් රිය ශබ්දයන්ගෙන්ද බෙර හඬින්ද වස්තුකාම කලේශ කාමයන්ගෙන් පහවූ ව්‍යාප්ත නොවූ යන අර්ථයි. කානන සංඛ්‍යාත වූ මහා අරණ්‍යයෙහි විවනෙ යන සම්බන්ධයි. **ඔසධිංච විරොචනං** යනු අභිවර්ධනය වේනුයි **ජොතනං** කැමති කැමති දේ නිපදවානුයි ඔසධී. ඕෂධී තාරකාව මෙන්

බබලත්නුයි කියයුතු තන්හි ගාථා බන්ධන පහසුව සඳහා **ඔසධිංව** විරොචනති යනුවෙන් කියන ලදී. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේමය.

මධුපිණ්ඩික තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.98

සිද්ධත්ථස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් සේනාසන දායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී තමාගේ වසනස්ථානය වූ වනාන්තරයට සපැමිණි භාග්‍යවතුන් වහන්සේට ප්‍රණාම කොට කොළ ඇතිරියක් අතුරා දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැන වටා බිත්තියක් කොට මල්පූජාවක් කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත්විය. පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සිද්ධත්ථස්ස භගවතො' යනාදිය කීය. ඒ සියල්ල යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සේනාසන දායක තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.99

විපස්සිස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් වෙය්‍යාවච්චකර තෙරුන් වහන්සේගේ අපදානයයි. උන්වහන්සේගේ උත්පත්ති ආදිය යට කියන ලද පරිද්දෙන් ම දතයුතු ය.

වෙය්‍යාවච්චකර තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.100

විපස්සිනො භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් බුද්ධුපට්ඨාක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සක්පිඹින කුලයක ඉපිද වැඩිවිය පත්ව තමා සියලු සක්පිඹීමෙහි දක්ෂ වූයේ විය. හේ නිතරම භාග්‍යවතුන් වහන්සේට සක පිඹීය. සක් හඬින්ම පූජා කළේය. හේ එම පිනින්ම දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සැමතැන ප්‍රකට වූයේ මහා ප්‍රතිරාව දෙන හඬ ඇත්තේ මිහිරිහඬ ඇත්තේ විය. මේ බුද්ධෝත්පාද කාලයෙහි ප්‍රසිද්ධ කුලයක ඉපිද වැඩිවිය පත්වූයේ මධුරස්වර යයි ප්‍රකට වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. එක් දවසක් තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **විපස්සිස්ස භගවතො** යනාදිය කීය. එය යට කියන ලද්දේ ම ය. 'අහොසිං සඞ්ඛධම්මකො'යනු සක් පිඹීනුයි සෝෂා කරානුයි සඞ්ඛධම්ම නමි. ඒ මම සඞ්ඛධම්මක වීමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

බුද්ධුපට්ඨාක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දසවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.101

'**සුවණ්ණ වණ්ණං සම්බුද්ධං**' යනාදි වශයෙන් ආයුෂ්මත් හිකඛාදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ධන සම්පත් ඇත්තේ හටගත් සැදැහැ ඇත්තේ විහාරයෙන් නික්ම පිඬු පිණිස හැසිරෙන සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ

ආහාර දුන්නේ ය. ඒ භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන අනුමෝදනා කියා වැඩි සේක. හේ එම කුසලයෙන්ම දිවි ඇතිතෙක් සිට ආයුෂ කෙළවර දෙව්ලොව උපන්නේ ස කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතරද මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සුවණ්ණ වණ්ණං' යනාදිය කීහ. ඒ සියල්ල යටකී පරිදිමය. 'පවරා අභිනික්ඛමනතං' යනු මනාසේ උතුම් දෙය ප්‍රාර්ථනා කළ යුතුනුයි පවර නම්. රම්‍ය වූයෙන්ද, විවේක වූයෙන්ද ස්වකීය විහාරයෙන් විශ්වාසයෙන් යුතුව නික්මෙන යන අර්ථයි. **වානා නිබ්බන මාගතං** යනු **වානං** යනු තෘෂ්ණා යයි කියනු ලැබේ. එයින් නික්මුණු බැවින් වාන නම් වූ තෘෂ්ණාව **නිබ්බනං කත්‍වා** සියලු කෙලෙස් හැර නිර්වාණයට පැමිණියේ යන අර්ථයි. **කටච්ඡුභික්ඛං දත්‍වාන** යනු අත්ලෙන් ගතයුතු හැන්ද කටච්ඡු නම්. පිඬු සිඟනු ලබන්නේනුයි ආයාචනය කෙරේනුයි භික්ඛා නම්. විශ්වාසයෙන් කෑයුතු භක්ෂණය භික්ඛා නම්. හැන්දෙන් බත් දී යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

භික්ඛාදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.102

සුවණ්ණ වණ්ණං සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් ඤාණසඤ්ඤික තෙරුන් වහන්සේගේ අපදානයයි. කුමක්ද උත්පත්තිය? මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ සිදධපථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ සද්ධර්මය ඇසීමෙහි ආදර ඇත්තේ ආලය ඇත්තේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනා අනුසාරයෙන් ඥානය යවා සෝෂප්‍රමාණ බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ඥානයෙහි පැහැදුණේ පසඟ අටඟ නමස්කාර

වශයෙන් ප්‍රණාමකොට ගියේය. හේ එයින් චුතව දේවලෝකවල ඉපදී එහි සදිව්‍යලෝක සම්පත් අනුභව කරන්නේ එයින් චුතව මිනිස් ලොව ඉපිද එහි අග්‍ර වූ චක්‍රවර්ති සම්පත් ආදිය අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ධන සම්පත් ඇති එක්තරා කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සුවණ්ණවණ්ණං සම්බුද්ධං' යනාදිය කීහ. එය කියන ලද අර්ථ ඇත්තේ ම ය. **නිසභාජානියං** යථා ගවයන් සියදහසකට ජ්‍යෙෂ්ඨයා නිසභ නම්. නිසභ වූයේ ද හෙම ආජානීය වූයේ ද උත්තම වූයේ ද ශ්‍රේෂ්ඨ වූයේ ද නිසභාජානීය නම්. භාග්‍යවතුන් වහන්සේද එසේමය යන අර්ථයි. ලෝකවිෂය සංඥාව. එය ප්‍රඥප්ති වශයෙන් මෙසේ කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ අනුපම වූ සේක. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ක්ෂාණසක්ෂුදික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.103

තීවරායං නිවාසීහං යනාදි වශයෙන් ආයුෂ්මත් උපපලහත්ථක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල් ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මාලාකාර කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව මාලාකාරයෙක්ව නොයෙක් මල් විකුණන්නේ ජීවත් වෙයි. ඉක්බිති එක් දවසක් මල් ගෙන හැසිරෙන්නේ භාග්‍යවතුන් වහන්සේ රුවන් ඇගෑයක් මෙන් දිලිසෙනු දැක රත් උපුල්මල් කලඹකින් පූජා කළේය. හේ එයින් චුතවූයේ ඒ පිනින්ම සුගතීන්හි පින් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව හටගත් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ '**තීවරායං නිවාසීහං**' යනාදිය කීය.

එහි **නිවරා** යනු උණරන් තිදෙනකු විසින් කරවන ලද සැඟවුණු නගරයි. ඒ නගරයෙහි **නිවාසී** වසනසුලු වූයේ නිවසන අර්ථයෙන් ගෙහි හෝ වසන මම යන අර්ථයි. අහොසිං මාලිකො තදා යනු නිවන් පිණිස පින් රැස් කරන කල්හි **මාලිකො** මල්කරුවෙක්ව මල් විකුණන්නේ ජීවත් වන්නේ වීමි යන අර්ථයි. **පුපඵහට්ඨ** මදාසහං යනු සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ දැක උපුල්මල් කලඹ අදාසිං පිදුවෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

උපලභට්ඨක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.104

සිද්ධත්ථ භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් පදපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුල ගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද සමන්මලින් පාමුල පිදුවේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ ශක්‍රසම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව විදසුන් වඩා රහත්ඵලයෙහි පිහිටියේය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'සිද්ධත්ථස්ස භගවතො'** යනාදිය කීහ. **ජාතිපුපඵමදාසහං** යනු දැසමන් මලක් මම පිදුවෙමියි කියයුතු කල්හි ගාථා බන්ධන පහසුව පිණිස සුමන ශබ්දය ලොප්කොට කියන ලදී. එහි ජාතියෙන් උපන්නේ පිපෙනවිටම ජනයාගේ **සුමනං** සොම්නස ඇති කරවානුයි සුමන නම්. **පුපඵනථෙන** පිපෙන අරුතින් පුපඵ නම්. සුමන වූයේද හෙම මල වූයේද සුමනපුපඵ නම්. ඒ සමන්මල් සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට මම පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

පදපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.105

සුදසසනො යනාදි වශයෙන් ආයුෂ්මත් මුටඨිපුපජීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මාලාකාර කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව ස්වකීය ශිල්පයෙහි නිෂ්පත්තියට පත්වූයේ එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ දෑසමන්මල් දෑතින් ගෙන භාග්‍යවතුන් වහන්සේගේ පාමුල විසුරුවා පූජා කළේය. හේ එම කුසල සම්භාරයෙන් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ පූර්ව වාසනා වශයෙන් ශාස්තෘෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'සුදසසනොති නාමෙන'** යනාදිය කීහ. එහි **සුදසසනො** යනු ආරෝහ පරිණාහ රූපයෙන් රූප ලක්ෂණයෙන් යෞවනයෙන් සොඳුරු දසුන් ඇත්තේනුයි සුදසසන නම්. නමින් සුදසසන නම් මල්කරුවෙක්ව දෑසමන් මලින් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිදුවෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු වේ ම ය.

මුටඨිපුපජීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.106

සුවණණ වණණං සම්බුදධං යනාදි වශයෙන් ආයුෂ්මත් උදකපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි පුරන ලද කුශල සමූහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් පුරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද, වැඩිවිය පත්ව කුසල් අකුසල් දන්නේ, පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ අහසින් වඩනාකල්හි නික්මුණු සවණක් බුදුරැස් කෙරෙහි පහන්වූයේ, දෑතින් ජලය ගෙන පූජා කළේය. ඔහු විසින් පුදන ලද ජලය රිදී බුබුලක්

මෙන් අහසෙහි සිටියේය. හේ අතිශයින් පැහැදුණේ ඒ සොම්නසින්ම තුසිත දෙව්ලෝ ආදියෙහි උපන්නේ දිව්‍ය සම්පත් අනුභවකොට පසුකලක මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සුවණ්ණ වණ්ණං සම්බුද්ධං' යනාදිය කීහ. එය යට කියන ලද අර්ථ ඇත්තේ ම ය. **සත්‍ථාසනම්ච ජලිතං** යනු සත්‍ථ යනු ගිතෙල්ය. ගිතෙලට **ආසනං** ආධාර වේනුයි සත්‍ථාසන යනු ගින්නය. නැතහොත් එය **අසති** අනුභව කරන්නේනුයි සත්‍ථාසන යනු ගින්නමය. යම්සේ ගිතෙල් ඉසිවිට ගින්නෙහි ගිනිදැල් අතිශයින් දැල්වේද, එසේ ගිනිකඳක් මෙන් දිලිසෙන භාග්‍යවතුන් වහන්සේ යන අර්ථයි. **ආදිත්තංව හුත්‍වාසනං** යනු හුත යනු පූජා සත්කාරයයි කියනු ලැබේ. **හුත්‍වස්ස** පූජා සත්කාරයට අසුන් වූයේනුයි හුත්‍වාසන නම්. බබලන්නා වූ සූර්යයා මෙන් දෙතිස් උතුම් මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් බබලන්නා වූ රන්වන් සම්බුදුන් වහන්සේ **අනිලඤ්ජසෙ** අහසෙහි වඩිනු දුටුවෙමි යන සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

උදක පූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.107

පදුමුත්තර බුද්ධස්ස යනාදි වශයෙන් ආයුෂ්මත් නළමාලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතීන්හි නිවනට හේතුවන කුශලකර්ම රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසය පිහිටුවා කාමයෙහි ආදීනව දැක ගිහිගෙය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව තණඇතිරියක් ඇතිරුවේය. එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට බටමල්වලින් විජිනිපතක් කොට පවන්සලා දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස පිළිගත් සේක. අනුමෝදනාද කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ

උපනුපන් භවයෙහි පරිදාහ සන්තාප නොමැතිවූයේ කායචිත්ත සුඛයට පැමිණියේ නොයෙක් සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව පෙර වාසනා බලයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පදුමුත්තර බුද්ධස්ස' යනාදිය කීහ. එය යටකියන ලද්දේ ම ය. **නළමාලංගහෙත්වාන** යනු **නළනි අසාරෝ නිස්සාරව** බටදඬුවෙන්ද **තනුකෝ** ලුහුවූයේනුයි නළනම්. බටදඬුවෙහි මාලා මල නළමාල නම්. ඒ නළමාලයෙන් විජිනිපතක් කරවූයේනුයි සම්බන්ධයි. විජනී විශේෂයෙන් වාතය මෙයින් දිනානුයි විජනී. ඒ විජනිය බුදුරජාණන් වහන්සේට පිරිනැමුවෙමි. බුදුරජාණන් වහන්සේ පිළිගත් සේක යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු වූයේ ම ය.

නළමාලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

සත්වැනි බණවර වර්ණනාව සමාප්තයි.

3.108

කානනං වනමොගඣා යනාදි වශයෙන් ආයුෂ්මත් ආසනුධ්‍යාපක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ අත්‍යදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද ගිහිගෙයි වසන්නේ එහි දොස් දැක ගිහිගෙය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවතෙහි වසන්නේ එහි සපැමිණි භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණේ සිංහාසනයක් දුන්නේය. එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට මල්කලඹක් ගෙන පුදා පැදකුණුකොට ගියේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උපනුපන් භවයෙහි උසස්කුල ඇත්තේ ධන සම්පත් ඇත්තේ විය. හේ කාලාන්තරයකින් මේ

බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිවූයේ නොබෝ කලකින් ම රහත් විය. උන්වහන්සේ රහත්වී තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'කානනං වන මොගඣ'** යනාදිය කීහ. ඒ සියල්ල යට කියන ලද්දේ ම ය.

ආසන්නුපට්ඨාපක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.109

හිමවනතසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් බිලාලිදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගිහිගෙයි වසන්නේ එහි ආදීනව දැක ගිහිගෙය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවතෙහි වසන්නේ අතිශයින් අල්පෙච්ඡ සන්තුෂ්ට වූයේ අලමුල් ආදියෙන් යැපෙන්නේ වාසය කරයි. එකල්හි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස හිමවතට වැඩි සේක. උන්වහන්සේ දැක පැහැදුණේ වැඳ ඇඹුල්කැඳ ගෙන පාත්‍රයෙහි වත් කළේය. තථාගතයන් වහන්සේ එය ඔහුට අනුකම්පාවෙන් සොම්නස් දනවමින් වැළඳූ සේක. හේ ඒ කර්මයෙන් එයින් චුතවූයේ දෙවිමිනිසුන් අතර උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ කුශලකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පදුමුත්තර බුද්ධසස'** යනාදිය කීහ. ඒ සියල්ල යට කියන ලද පරිදි බැවින් නොගැඹුරු ම ය. අලමුල් ආදිය ඒ ඒ මුල් ජාතීන්ගේ නම් මය.

බිලාලිදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.110

සුවණ්ණ වණ්ණං සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් රෙණුපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ ගිනිකඳක් මෙන් බබලන භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතැත්තේ නාමල් රේණුවක් ගෙන පූජා කළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනාව කළ සේක. හේ ඒ පිනින් එයින් චුත වූයේ දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට උපනුපන් භවයෙහි සියලු තැන පුදනු ලැබුවේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ පූර්ව වාසනා බලයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. රහත් වී දිවැසින් තමාගේ පූර්ව කර්මය දැක හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සුවණ්ණ වණ්ණං සම්බුද්ධං' යනාදිය කීය. එය යට කියන ලද අර්ථ ඇත්තේ ම ය. **සතරංසිව භානුමං** යනු **සතමත්තා** සියයක් **පමණ රංසි** ප්‍රභා යම් පුරුෂයකුට වේද හේ සතරංසි නම්. ගාථාවේ ඡන්දස් පහසුව පිණිස සතරංසී යනුවෙන් කියන ලදී. නොයෙක් දහස් ගණන් නොයෙක් සියදහස් ගණන් රැස් යන අර්ථයි. **භානු** යනු ප්‍රභාවයි. **භානු** ප්‍රභාව යමෙකුට වේද හේ භානුමා නම්. ඒ සූර්යයා වැනි විපස්සි භාග්‍යවතුන් වහන්සේ දැක රේණු සහිත නාමලක් ගෙන අභිරෝපයිං පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු වේ ම ය.

රෙණුපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

එකොළොස්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.111

විපසසි නාම භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් මහා පරිවාර තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි තෙමේ ම යක්ෂ යෝනියෙහි ඉපිද නොයෙක් සියදහස් ගණන් යක්ෂ පිරිවර ඇත්තේ එක් කුඩා දිවයිනක දිව්‍ය සම්පත් අනුභවකොට වෙසේ. ඒ දිවයිනෙහි චෛත්‍ය ආදියෙන් අලංකාර වූ විහාරයක් ඇත. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කළ සේක. ඉක්බිති ඒ යක්ෂ සේනාධිපතියා භාග්‍යවතුන් වහන්සේ එහි වැඩම කළ බව දැක දිවසළු රැගෙන ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ දිවසළුවලින් පූජා කළේය. පිරිවර සහිතව සරණ ගියේය. හේ එම පුණ්‍යකර්මයෙන් එයින් චුතව දෙව්ලොව ඉපිද එහි ස කාමාවචර සැප අනුභවකොට එයින් චුතව මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සැප අනුභවකොට පසුකලක මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි වූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'විපසසි නාම භගවා' යනාදිය කීහ. එහි විශේෂ වූ පරමාර්ථ නිර්වාණය දකිනුයි විපසසි නම්. විවිධ වූ සතිපට්ඨානාදී සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් දකිනුයි හෝ විපසසි නම්. විවිධ වූ අනේකප්‍රකාර වූ අවබෝධ කරවිය හැකි සත්වයන් වෙන වෙනම දකිනුයි හෝ විපසසී නම්. ඒ විපසසි භාග්‍යවතුන් වහන්සේ ඒ දිවයිනෙහි චෙතියං පූජනීය ස්ථානයට වැඩිසේක යන අර්ථයි. සෙස්ස සියලුතන්හි නොගැඹුරු වේ ම ය.

මහා පරිවාර තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.112

අට්ඨදස්සි ජිනවරෝ යනාදි වශයෙන් ආයුෂ්මත් සුමංගල තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ අට්ඨදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් තඩාගයක් සමීපයෙහි රුක්දෙවියෙක් ව උපන්නේ ය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් නික්ම නහනු කැමතිසේක් ඒ තඩාගයෙහි ඉවුරට වැඩමකොට එහි ස්නානය කොට එක් සිවුරකින් බබලන බ්‍රහ්මයා මෙන් සූර්යයා මෙන් රන් පිළිමයක් සේ වැඩසිටි සේක. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා හටගත් සොම්නස් ඇත්තේ ඇදිලිබැඳ ස්තුති කළේය. තමාගේ දිව්‍යගීත තූර්ය වාදනයෙන් උපහාරද කළේය. හේ එම කර්මයෙන් දෙවිමිනිසුන් අතර සම්පත් අනුභවකොට පසුකලක මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිනි බවට පත්වූයේ ශාස්තෘෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පසුව පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **අට්ඨදස්සි ජිනවරෝ** යනාදිය කීහ. එහි පරමාර්ථ නිර්වාණය දකබති දකින්නේනුයි අට්ඨදස්සි නම්. නැතහොත් සියලු සත්වයන්ට චතුරාර්ය සත්‍ය සංඛ්‍යාත අර්ථං ප්‍රයෝජනය දක්නාසුලු වූයේ යනුයි අට්ඨදස්සි නම්. කෙලෙස් දිනුවේය. දිනයි දිනන්නේනුයි ජිනනම්. සියලු සත්වයන් විසින් හැසිරිය යුත්තේ ප්‍රාර්ථනා කළයුත්තේනුයි **වර** නම් අට්ඨදස්සි ජිනවූයේ ද හෙම වරවූයේ ද අට්ඨදස්සි ජිනවර නම්. ලොකජෙට්ඨෝ යනු දිරානුයි විශේෂයෙන් දිරානුයි ලෝක නම්. බුද්ධාදීන් විසින් බලනු ලැබෙනුයි. පිහිටනු ලැබෙනුයි පරතෙර පත්වූයේනුයි හෝ ලෝක නම්. ලෝකයට ජ්‍යෙෂ්ඨ වූයේ නරයන්ට උත්තම වූයේ යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු වේ ම ය.

සුමඞ්ගල තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.113

උභිනනං දෙවරාජුනං යනාදි වශයෙන් ආයුෂ්මත් **සරණාගමනිය** තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ උපතුපත් භවයෙහි පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ උපන්කල්හි මොහු හිමවතෙහි දෙවිරජෙක් ව උපන්නේය. ඒ අසලම විසූ යක්දෙවි රජු සමග සංග්‍රාමය පිණිස එළැඹියේ දෙදෙන නොයෙක් යක්‍ෂයන් දහස් ගණන් පිරිවර ඇත්තාහු පලිස් ආයුධ ගත් අත් ඇත්තාහු වූහ. එකල්හි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ ඒ සත්වයන් කෙරෙහි කරුණාව උපදවා අහසින් එහි වැඩමවා පිරිවර සහිත දෙවිරජුන් දෙදෙනාට ධර්මය දේශනා කළ සේක. එකල්හි ඒ සියලු පලිස් ආයුධ හැරදමා භාග්‍යවතුන් වහන්සේට ගරු බුහුමන් සහිතව වැඳ සරණ ගියහ. මේ තෙමේ ඔවුන්ගෙන් පළමුව සරණ ගියේය. හේ ඒ පිනින් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක පෙර කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'උභිනනං දෙවරාජූනං'** යනාදිය කීහ. එහි සුචිලෝම ඛරලෝම, ආලවක කුම්භීර කුවේර ආදීන් මෙන් නාම ගෝත්‍රයෙන් අප්‍රකට වූ යක් රජුන් දෙදෙන වෙනත් අයුරකින් දක්වන්නේ උභිතනං දෙව රාජුනං යනාදිය කීහ. **සඞ්ගාමො සමුපටඨිතො** යනු **සං** මනාසේ ගාමෝ කලහ පිණිස පැමිණීම යනු සංගාම නම්. ඒ සංග්‍රාමය **සං** මැනවින් **උපටඨිතො** පැමිණ සිටියේ වෙයි යන අර්ථයි. **අහොසි සමුපබ්බුළ්හො** යනු **සං** මැනවින් **උප** සමීපයෙහි එක්රැස් වූයේ යන අර්ථයි. **සංවෙජෙසි මහා ජනං** යනු එක්රැස් වූ යකුන්ට අහසෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ චතුස්සත්‍ය ධර්ම දේශනාවෙන් **සං** මනාසේ **වෙජෙසි** ආදීනව දැක්වීමෙන් ගැන්වූ සේක දැන්වූ සේක අවබෝධ කරවූ සේක යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සරණාගමනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.114

වරුණොනාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් ඒකාසනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ හවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ අපරදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වරුණ නම් දෙව්රජෙක් ව උපන්නේ ය. හේ භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ සුවඳමල් ආදියෙන් ද ගීතවාදිතයන්ගෙන් ද උවටැන් කරන්නේ පිරිවර සහිතව පූජා කළේය. ඉන් පසුකලක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ මහාබෝධි වෘක්ෂය බුදුන් දැක්මක් මෙන් සියලු තූර්ය තාල යෙදීම්වලින් පිරිවර සහිතව උපහාර කළේය. හේ ඒ පිනින් කලුරිය කොට නිර්මාණරතී දිව්‍ය ලෝකයෙහි උපන්නේ ය. මෙසේ දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතරද මිනිසෙක් ව මිනිස් සම්පත්ද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුව ස්වකීය කර්මය සිහිකොට එය තථ්‍ය පරිදි දැන හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **වරුණොනාම නාමෙන** යනාදිය කීය. එහි මම යම්කලක සතුටුවීම පිණිස බුද්ධ බෝධියද පිදුවෙමි ද, එකල්හි වරුණනම් දෙව්රජ වීමි, යන සම්බන්ධයි. **ධරණීරුහ පාදපං** යනු වෘක්ෂලතා පර්වත සත්රුවන් ආදිය දරානුයි ධරණී නම්. එහි වැඩෙනුයි පිහිටානුයි ධරණීරුහ නම්. පයින් පානය කෙරේනුයි පාදප නම්. ඉසින ලද ජලය පාදයෙන් බොයි, රුක් කඳ අතු රිකිලිවලින් ආපෝරසය පතුරුවා හරී යන අර්ථයි. ඒ ධරණීරුහ පාදපය වූ බෝධිවෘක්ෂය යන සම්බන්ධයි. **සකකම්මාභිරද්ධෝ** යනු තමාගේ කුසල කර්මයෙන් **අභිරද්ධෝ පසනෙනා** උතුම් බෝධිය කෙරෙහි පැහැදුණේ යන සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ඒකාසනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

1.115

විපසසි නාම භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් සුවණ්ණපුපඵිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක්තැනක බූමාටු දිව්‍ය පුත්‍රයෙක් ව ඉපදී ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා පහන් සිතැත්තේ රන්මල් සතරක් පූජා කළේය. ඒ මල් අහසෙහි රන් වියනක් වී වසාගති. රන් පැහැය ද බුදුරජාණන් වහන්සේගේ සිරසෙහි පැහැයද එකක් ව මහා ආලෝකයක් විය. හේ වැඩි වැඩියෙන් පැහැදුණේ ස්වකීය භවනයට ගිය ද සිහි කෙරේමය. හේ ඒ පුණ්‍ය කර්මයෙන් තුසිත භවනය ආදී සුගතීන්හිම සැරිසරන්නේ දිව්‍ය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණියේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා සසුනට උර දී පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. පසුකලක පෙර කළ කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ විපසසිනාම භගවා යනාදිය කීය. එය යට කියන ලද්දේ ම ය. පාමොජ්ජං ජනයිස්සාන යනු බලවත් ප්‍රීතියක් උපදවා සිතෙහි මෝදනය ප්‍රමෝදනය හාසය ප්‍රහාසය ප්‍රීතිය ප්‍රමෝදය ප්‍රමුදිත භාවය සතුටු බව ආදිය මෙන් සතුටු සිත් ඇති බව උපදවා යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු ම ය.

සුවණ්ණපුපඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

1.116

වසාමි රාජායතනෙ ආදි වශයෙන් ආයුෂ්මත් චිතකපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ ඉන්පසුව උපනුපන් භවයෙහි පින් රැස් කරන්නේ සිඛී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි රාජායතන රුක් දෙවියෙක් ව ඉපිද අතරින්පතර දෙවියන් සමග ධර්මය අසා පැහැදුණේ සපිරිවරින්

සුවඳ පහන් දුම් මල් බෙර ආදිය ගෙන්වාගෙන භාග්‍යවතුන් වහන්සේ ආදාහන කළ තැනට ගොස් පහන් ආදිය පුදා නොයෙක් තූර්යයෙන් නොයෙක් වාදිතයෙන් එය පිදුවේය. එතැන් පටන් ස්වකීය භවනයට පිවිසියේ ද භාග්‍යවතුන් වහන්සේ ම සිහිකොට සම්මුඛයෙහි මෙන් වඳියි. හේ එම පිනින් ම ඒ චිත්තප්‍රසාදයෙන් ම රාජායතනයෙහි කලුරිය කළේ තුසී දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් අනුභවකොට ඉන්පසු මිනිසුන් අතර මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි උපන් චිත්තප්‍රසාද ඇත්තේ භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත්විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'වසාමි රාජායතනෙ' යන දිය කීහ. 'රාජායතන' යනු දෙවිරදුන්ගේ ආයතනය රාජායතන නම්. ඒ රුකට නමක් හෝ වෙයි. **පරිනිබ්බුතෙ භගවති** යනු භාත්පසින් කිසිවක් ඉතිරි නොකොට ස්කන්ධ පරිනිර්වාණ කාලයෙහි පිරිනිවනට පත් සිවී ලෝකබන්ධු වූ බුදුරජාණන් වහන්සේගේ යනු සම්බන්ධයි. **චිතකං අගමාසහං** යනු සඳුන් අගිල් දෙව්දුරු කපුරු තකුල් ආදී වූ සුවඳ **චිතං** රැස්කරන ලද්දේනුයි චිත නම්. චිතම චිතකයයි. බුදුන්ට ගෞරව පිණිස චිතකය පුදනු සඳහා චිතකය සමීපයට මම ගියෙමි යන අර්ථයි. එහි ගොස් කරන ලද කාර්යය දක්වන්නේ 'තූරියංතත්‍ථ වාදෙත්‍වා' යනාදිය කීහ. ඒ සියල්ල පහසුවෙන් දත හැක්කේ ම ය.

චිතකපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.117

යදා විපස්සි ලොකගෙහා යනාදි වශයෙන් ආයුෂ්මත් බුද්ධසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් බූමාටු විමනක දෙවි පුතෙක් ව උපන්නේය. එකල විපස්සි භාග්‍යවතුන්

වහන්සේ ආයු සංස්කාරය හළ සේක. සියලු දසදහසක් ලෝකධාතූද චතුස්සාගරද බුද්ධ සඤ්ඤක පර්වතද ප්‍රකම්පනය විය. එදා දෙව්පුතුගේ විමන ද කම්පනය විය. එකෙණෙහි ඒ දේවපුත්‍රයා සැක හටගත්තේ පෘථිවි කම්පනයෙහි උපත කිමෙක්දැයි සිතා බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාර හළ බව දැන මහා ශෝක සංවේගයක් ඉපදවීය. එකල්හි වෛශ්‍රවණ මහරජ තෙමේ පැමිණ ඒ ගැන නොසිතවයි අස්වැසීය. ඒ දේවපුත්‍රයා එයින් චුතව ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්වූයේ ගිහිගෙය අත්හැර පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. පසුකලක පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'යදා විපසසි ලොකඝෝ'** යනාදිය කීය. **ආයුසඛ්ඛාර මොසසජි** යනු හාත්පසින් යුනොති සත්වයන් පාලනය කෙරේනුයි ආයු නම්. ආයුෂයෙහි **සංඛාරෝ** ඒකරාශී වීම ආයුසංඛර නම්. ඒ ආයු සංස්කාරය **ඔසසජි** ප්‍රතික්ෂේප කළ සේක. අත්හළ සේක යන අර්ථයි. එම ආයුසංස්කාර හැරීමෙහිදී **ජලමෙඛලා** සාගරජල මේඛලාව සහිත සියලු දසදහසක් චක්‍රවාට පෘථිවිය ප්‍රකම්පනය විය යනු සම්බන්ධයි. **ඔතතං විත්තං ඔතතනං විතතං** විසිතුරු වූ සුපිරිසිදු වූ **චිතතං** නොයෙක් සත්රුවනින් චිත්‍රවිචිත්‍ර වූ සෝභමාන වූ මාගේ භවන **පකම්පිසථ** ක්‍රමයෙන් ප්‍රකම්පනය විය යන අර්ථයි. සෙස්ස සියලුතන්හි නොගැඹුරුමය.

බුද්ධසඤ්ඤික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.118

පදුමුත්තර බුද්ධසස සාවකා ආදි වශයෙන් ආයුෂ්මත් මඟසඤ්ඤික තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ එයින් පසුව භවයෙහි තැනින්තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවතෙහි දිව්‍යපුත්‍රයෙක් ව ඉපිද කැළයට ගොස් මංමුළා වූ මාර්ගය සොයන්නා වූ උන්වහන්සේගේ ශ්‍රාවකයන් වළඳවා මාර්ගය කීය. හේ ඒ පිනින් දෙව්

මිනිස් සැප අනුභවකොට උපනුපත් භවයෙහි සියලු තන්හි මුළා නොවූයේ සංඥා ඇත්තේ විය. ඉක්බිති මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගෘහවාසයෙහි නොඇලුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්වනාහු **'පදුමුත්තර බුදධසස'** යනාදිය කීහ. **සාවකා වනචාරිනො** යනු භාග්‍යවතුන් වහන්සේ කියූ වචනය මැනවින් ආදරයෙන් අසන්නුයි සාවක නම්. නැතහොත් භාග්‍යවතුන් වහන්සේගේ දේශනා අනුසාරයෙන් ඥානය මෙහෙයවා සද්ධර්මය අසන්නුයි සාවක නම්. **වනචාරිනො** වනයෙහි හැසිරෙන ශ්‍රාවකයෝ ය. **විපනථං** මංමුළා වී මහා වනයෙහි අන්ධාව ඇස් නැත්තවුන් මෙන් **අනුසරෙ** හැසිරෙති යනු සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

මගඝසඤ්ඤික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.119

අපථදසසි සුගතෙ යනාදි වශයෙන් ආයුෂ්මත් පච්චුපථ්‍යාන සඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ අපථදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි යක් යෝනියෙහි ඉපිද භාග්‍යවතුන් වහන්සේ ජීවමාන කාලයෙහි දැක්මක් නොලැබුණු බැවින් පසුව පිරිනිවි කල්හි මහත් ශෝකයට පැමිණ වාසය කළේය. එකල්හි උන්වහන්සේගේ සාගත නම් අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ අනුශාසනා කරන සේක් 'භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු පූජාව නම් ජීවත්ව සිටියදී කරන ලද පූජාවක් මෙන් මහත්ඵල වෙති'යි කියා ස්තූපයක් කරවයි යොදවනු ලැබුයේ ස්තූපයක් කරවීය. එයට පූජාකොට එයින් චුතවූයේ දෙවිමිනිසුන් අතර සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද පැවිදි වූයේ නොබෝ කලකින්ම රහත් විය.

උන්වහන්සේ පසුකලක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'අසීදසිමිහි සුගතෙ'** යනාදිය කීහ. එය යට කියන ලද්දේ ම ය. **යක්ඛයොනිං උපපජ්ජිං** යනු මෙහි තමාගේ ඉදිරියට පැමිණි පැමිණියවුන් කමින් **යාති** යතියි යකඛ නම්. යකුන්ගේ **යොනි** ජාතියනුයි යකඛයොනි නම්. යක්ෂ යෝනියෙහි උපන්නේ යන අර්ථයි. **දුලද්ධං වත මෙ ආසිං** යනු මෙ මා විසින් ලැබුණු යසස අපහසුවෙන් ලබන ලද්දේය. බුදුවූ ශාස්තෘන් වහන්සේට සත්කාරයක් නොකරන ලද බැවින් වරදවා ලබන ලද්දේය යන අර්ථයි. **දුපපභාතං** යනු දුෂ්ප්‍රභාතයක්, රාත්‍රිය එලඹීමක්, මාගේ අතිශයින් දුෂ්ප්‍රභාතයක් යන අර්ථයි. **දුරුට්ඨිතං** යනු දුට්ඨුතං සූර්යාගේ උදාවීම මාහට නරක උදාවීමක්ය යන අර්ථයි. සෙස්ස සියලුතන්හි නොගැඹුරු ම ය.

පඨවුපට්ඨාන සඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.120

ජායනතසස විපසසිසස යනාදි වශයෙන් ආයුෂ්මත් ජාතිපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ නැකැත් කියන්නන් විසින් විපස්සි බෝධි සත්වයන්ට කියන ලද **ලක්ෂණ නිමිත්ත** අසා, 'මේ කුමාරයා වනාහි බුදුවී සකල ලෝකයාට අග්‍රව ශ්‍රේෂ්ඨව සියලු සත්වයන් සසරින් ගොඩදමන්නේ යයි අසා, ඒ භාග්‍යවතුන් වහන්සේ කුමාර කල්හිම බුදුන්ට මෙන් පසුව ක්‍රමයෙන් කුමාරකාලය, යුවරජ කාලය රජ කාලයයි කාලත්‍රය ඉක්මවා බුදුරජාණන් වහන්සේ උපන් කල්හිද මහා පූජාවක් කොට එයින් චුතවූයේ තුසිත ආදි දිව්‍ය ලෝකවල ඉපිද දිව්‍යසැප අනුභව කොට පසුව මිනිසුන් අතර චක්‍රවර්ති ආදී මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නේ හත්අට වයස් කල්හිම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිව විදසුන් වඩා නොබෝ කලෙකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ කුශලකර්මය සිහිකොට හටගත් සොම්නස්

ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'ජායනතසස විපසසිසස'** යනාදිය කීහ. එය යටකියන ලද අර්ථ ඇත්තේ ම ය. **නෙමිනතානං සුණිඤාන** යනු මෙහි **නිමිත්තං** කරුණ සැපදුක් ඇතිවීමට හේතුව දනිත්නුයි නෙමිත්තා නම්. ඒ **නෙමිත්තානං** නක්ෂත්‍ර පාඨකයන්ගේ වචනය අසා යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු වේ ම ය.

ජාතිපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දොළොස්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.121

අජඣායකො මනතධරො යනාදි වශයෙන් ආයුෂ්මත් සෙරෙය්‍යක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ ආත්මභාව සියදහස් ගණන් පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද දැනමිති බවට පත්ව තුන්වේදයෙහි පරතෙරට ගොස් ඉතිහාස ආදී සියලු බ්‍රාහ්මණ ධර්මවල කෙළවරට පැමිණියේ, එක් දවසක අභ්‍යවකාශයෙහි වැඩසිටි සපිරිවර භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ මහරි මලක් ගෙන පූජා කරමින් අහසට දැමීය. ඒ මල් අහසෙහි වියනක් ව සත්දිනක් තිබී පසුව අතුරුදහන් විය. හේ එම අසිරිය දැක අතිප්‍රසන්න සිත් ඇත්තේ එම ප්‍රීති සොම්නසින්ම කලුරිය කොට තුසිත ආදී දෙවිලෝවල ඉපිද එහි දිවසැපත් අනුභවකොට ඉන්පසුව මිනිස් සුව අනුභව කළේය. ඉන්පසු මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක උපන්නේ දැනමිති බවට පැමිණ පූර්ව වාසනා බලයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදි ව නොබෝ කලකින් ම රහත් විය. උන්වහන්සේ පසුකලක පෙර කරන ලද කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'අජඣායකො මනතධරො'** යනාදිය කීහ. එය යට කියන ලද අර්ථ ඇත්තේමය. **සෙරෙය්‍යකං ගහෙඤාන** යනු

මහරිගසෙහි හටගත් ජාති පුෂ්පය සෙරෙය්‍ය නම්. සෙරෙය්‍ය සෙරෙය්‍යක නම්. ඒ සෙරෙය්‍යකය ගෙන යන සම්බන්ධයි. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණේ දෑසමන් මූනමල් සපු ආදී මල් පිහිටුවා පූජා කිරීමට කලක් නැති බැවින් එහි තිබුණු මහරිමල ගෙන පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු වේ ම ය.

සෙරෙය්‍යක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.122

හිමවන්තසස්‍ස විදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් පුපඵපූජිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිති බවට පැමිණ ස්වකීය ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණියේ එහි හරයක් නොදක්නේ ගිහිගෙය අත්හැර හිමවතට පිවිස තමා සමග වූ පන්දහසක් ශිෂ්‍යයන් සමග පංචඅභිඥා අෂ්ට සමාපත්ති උපදවා කුක්කුර නම් පර්වතය සමීපයෙහි පන්සලක් කරවා වාසය කරයි. එකල බුදුන් උපන් බව අසා ශිෂ්‍යයන් සමග බුදුරජාණන් වහන්සේ සමීපයට යනු කැමැත්තේ, කිසියම් ව්‍යාධියකින් පෙළුණේ පන්සලට පිවිස ශිෂ්‍යයන් හමුවෙන් බුද්ධානුභාව ලක්‍ෂණ අසා පහන් සිතැත්තේ හිමවතින් සපු අසෝක දුම්මැල්ල තණ වැටකේ ආදී නොයෙක් මල් ගෙන්වාගෙන ස්තූපයක් කොට බුදුන්ට මෙන් පූජාකොට කලුරියකොට බ්‍රහ්මලෝකයට පැමිණියේ විය. ඉක්බිති ඔහුගේ ශිෂ්‍යයෝ ඔහුගේ ආදාහනය සිදුකොට බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් ඒ පුවත ශාස්තෘන් වහන්සේට දැන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් බලා අනාගත සංඝානනයෙන් ප්‍රකට කිරීමක් කළ සේක. හේ පසුකලක මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ පූර්ව වාසනා බලයෙන් ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. ඉක්බිති තමාගේ පූර්ව කුශලය සිහිකොට

හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'හිමවන්තසඤ්ඤිවූරෙ' යනාදිය කීය. එය යටකියන ලද අර්ථ ඇත්තේ ම ය. **කුකකුරොනාම පබ්බතො** යනු පර්වතයෙහි ශිබරය **කුකකුරාකාරෙන** බල්ලකුගේ ආකාරයෙන් පිහිටි බැවින් කුක්කුර පර්වතයයි ප්‍රසිද්ධියට ගියේ, ඒ සමීපයෙහි පන්සලක් කොට තවුසන් පන්දහසක් සමග වාසය කරන්නේ යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරුය.

පුප්ඵථූපිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.123

සුවණ්ණවණ්ණං සම්බුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් පායාසදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් විභව සම්පත් ඇති කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව ගිහිගෙයි වසන්නේ ඇත් අස් ධන ධාන්‍ය සත්රුවන් ආදී විභව සම්පත් ඇත්තේ සැදැහැ ඇත්තේ කම්පල අදහා දහසක් පමණ රන් පාත්‍ර කරවා එහි කිරිබත් දහසක් පුරවා ඒ සියල්ල ගෙන්වාගෙන හිඹුල් වනයට ගියේය. එසමයෙහි විපස්සි භාග්‍යවතුන් වහන්සේ අහසෙහි සක්මනක් මවා සවණ්ණ රැස් විහිදුවා එහි සක්මන් කරන සේක. ඒ සිටුවරයා ඒ අසිරිය දැක අතිශයින් පැහැදුණේ පාත්‍ර තබා වැඳ පිළිගන්නා ලෙස ආරාධනා කළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා පිළිගත් සේක. පිළිගෙන ද වනාහි ඔහුට සොම්නස් උපදවනු පිණිස දහසක් පමණ භික්ෂූන් සමග වැළඳූ සේක. ඊට අමතරව නොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේ වැළඳූ සේක. හේ ඒ පිනින් සුගතීන්හිම සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපදී දැනමිති බවට පත්වූයේ සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින් ම රහත්විය. උන්වහන්සේ පසුකලක තමාගේ කුසලය නැවත බලන සේක් එය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සුවණ්ණ වණ්ණං සම්බුද්ධං' යනාදිය කීහ. එය යට කියන ලද්දේ ම ය. **වඩ්ඪමං සුසමාරුළ්හො** යනු **වදිනනෙතා** පියවර

තබමින් **කම** යේනුයි චඬකම නම්. චඬකමසස පියවර තැබීමට ආධාරභූත වූ පොළෝ පෙදෙස සක්මන යන අර්ථයි. ඒ සක්මනට සුවිශේෂයෙන් නැගුණේ යනු සම්බන්ධයි. **අම්බරෙ අනිලායනෙ** යනු **වරියති** අන්තය වසනු ලැබේනුයි අම්බර නම්. සුදු රෙද්දක් වැනි අහස යන අර්ථයි. සැඟවීමක් රැකීමක් මෙහි නැත්තේනුයි අනිල නම්. හාත්පසින් **යනති** මෙයින් යානුයි ආයන නම්. අනිලද එම ආයනද අනිලායන නම්. ඍද්ධි ඇත්තේ ඒ අහසෙහි අනිලායනයෙහි සක්මනක් මැවුයෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නො ගැඹුරු ම ය.

පායාසදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.124

නිසජ්ජ පාසාදවරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් ගතෙධාදකිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සිටුකුලයෙහි ඉපිද දැනමීති බවට පත්වූයේ මහත්ධන ඇත්තේ මහාභෝග ඇත්තේ දිවසැප බඳු මිනිස් සුව අනුභව කරන්නේ එක් දවසක් උතුම් ප්‍රාසාදයෙහි සිටියේ වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ස්වර්ණ මේරුව මෙන් වීදියෙහි වඩනා සේක. ඒ වඩනා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ ගොස් වැඳ සුවඳ ජලයෙන් භාග්‍යවතුන් වහන්සේ ඉසිමින් පූජා කළේය. හේ එම පිනින් දෙව්මිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමීති බවට පත්වූයේ ගෘහවාසයෙහි නො ඇලුණේ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදි ව කමටහන් ගෙන විදසුන් වඩා නොබෝ කලකින්ම රහත්විය. පසුකලක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ '**නිසජ්ජ පාසාදවරෙ**' යනාදිය කීය. එහි **පාසාදො** යනු **පසාදං** සොම්නස **ජනෙති** උපදවානුයි පාසාද නම්. මල්කම් සිත්කම් රන්කම් ආදියෙන් එහි පිවිසි ජනයාට සොම්නස දනවයි යන

අර්ථයි. ගන්ධොකිය එම ප්‍රාර්ථනා කළයුතු අර්ථයෙන් වර වූයේද පාසාදවර නමි. ඒ ප්‍රාසාද වරයෙහි **නිසජ්ජ** හිඳ විපසසි බුදුරජාණන් වහන්සේ දුටුවෙමියි සම්බන්ධයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු ම ය.

ගන්ධොදකිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.125

ජායමානෙ විපසසිමහි යනාදි වශයෙන් ආයුෂ්මත් සම්මුඛාථවික තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි උපන්නේ සත්හැවිරිදි වයස් කල්හිම ස්වකීය ශිල්පයෙහි නිෂ්පත්තියට පත්වූයේ ගෘහවාසය පිහිටුවා වසන්නේ, විපස්සි බෝධිසත්වයන් උපන්කල්හි පහළවූ ලකුණු දැක වේදතුයෙහි දිස්වන අයුරින් ඒ ලකුණු සියලු ජනකායට විස්තර කරන්නේ නිසැකයෙන්ම මොහු ලෝකයේ බුදුවන්නේ යයි ප්‍රකාශකොට ජනයන්ගේ සිතෙහි බෝසතුන් කෙරෙහි ප්‍රසාදය දැනවීය. හේ එම කුසල කර්මයෙන් ස කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතර ද චක්‍රවර්ති සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින් ම රහත් විය. කරන ලද කුසලයේ නමින් සම්මුඛාථවික තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූහ. උන්වහන්සේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු ජායමානෙ විපසසිමහි යනාදිය කීහ. විපස්සි සම්බුදු රජාණන් වහන්සේ ජායමානෙ මව්කුසින් නික්මෙන කල්හි පහළවූ **නිමිත්තං කාරණය** බුදුබවට හේතුවෙතියි බ්‍යාකරිං කීවෙමි. නොයෙක් ආශ්චර්ය ප්‍රකට කෙළෙමි යන අර්ථයි. සෙස්ස කියන ලද පරිද්දෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

සම්මුඛාථවික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.126

නගරෙ ධඤ්ඤවතියා යනාදි වශයෙන් ආයුෂ්මත් කුසුමාසනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිති බවට පත්වූයේ මහත්ධන ඇත්තේ මහාභෝග ඇත්තේ තුන්වේදයෙහි පරතෙරට පැමිණියේ බ්‍රාහ්මණ ශිල්පයන්හි කෙළ පැමිණියේ ස්වකීය හා පර සමයෙහි දක්ෂ වූයේ මවුපියන් පුදනු කැමැත්තේ උපුල්මල් කලප් පහක් තමාගේ සමීපයෙහි තබා හුන්නේය. එකල්හි භික්ෂු සංඝයා පිරිවරාගත් විපස්සි භාග්‍යවතුන් වහන්සේ වඩිනු දැක නීල පීත ආදී ඝන බුදුරැස් දැක පහන් සිතැත්තේ අසුන් පනවා එහි ඒ මල් අතුරා භාග්‍යවතුන් වහන්සේ එහි හිඳුවා ස්වකීය ගෘහයෙහි මව පිණිස පිළියෙල කරන ලද සියලු කෑයුතු දෑද බිය යුතු දෑද ගෙන සපිරිවර භාග්‍යවතුන් වහන්සේ තම අතින් සන්තර්පණය කරන්නේ වැළඳවීය. වළඳ අවසන්හි එක් උපුල්මල් අතක් දුන්නේය. එයින් හටගත් සොම්නස් ඇත්තේ ප්‍රාර්ථනයක් කළේය. භාග්‍යවතුන් වහන්සේද අනුමෝදනාව කොට වැඩි සේක. හේ ඒ පිනින් දෙව්මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද දැනමිති බවට පත්වූයේ භෝගයෙන්ද යසසින්ද වැඩුණේ කාමයන්හි ආදීනව දැක ගෘහවාසය අත්හැර පැවිදිවූයේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක පෙර කරන ලද කුසල පූර්වේනිවාස ඥානයෙන් සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'නගරෙ ධඤ්ඤවතියා' යනාදිය කීහ. ධන්‍ය පුණ්‍යවන්ත වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන්ට නොයෙක් කුලයන්ට ආකර වූ බැවින් ධඤ්ඤවතී නම්. නැතහොත් මුතුමැණික් ආදී සත්රුවන්වලට සප්තවිධ ධාන්‍යයන්ට උපභෝග, පරිභෝග සම්පත්තීන්ට ආකර බැවින් ධඤ්ඤවතී නම්. නැතහොත් **ධඤ්ඤානං** බුදු පසේබුදු රහතුන්ගේ **වසනට්ඨානං** ආරාම විහාර ආදී නව ආකාර වූ බැවින් ධඤ්ඤවතී නම්. ඒ ධන්‍යවතී නුවරෙහි **නගරං** යනු රජ යුවරජ මහාමාත්‍යාදීන්ගේ වසන ස්ථානය නගර නම්. **ආඤ්ඤාති** ගනිනුයි නගර නම්. රාජ ආදීන්ගේ වසනස්ථානභූත වූ ප්‍රාකාර **පරික්ඛේප** ආදියෙන් **පරිකඛිත්තං** සැඟවුණු තැන නගර නමැයි අර්ථයි. ඒ නගරයෙහි යම්කලෙක මම විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි

විවරණ ලැබුවෙමි. එකල්හි ඒ ධඤ්ඤවති නගරයෙහි බ්‍රාහ්මණයෙක් වීමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරුමය.

කුසුමාසනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.127

අජඣායකො මනතධරො යනාදි වශයෙන් ආයුෂ්මත් ඵලදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි පින් රැස්කර ඇත්තේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිති බවට පත්ව ත්‍රිවේදය ආදී ස්වකීය ශිල්පයන්හි පරතෙරට පැමිණියේ නොයෙක් බමුණන් දහස් ගණනකට ප්‍රධාන ආචාර්යවරයා වීය. තමාගේ ශිල්පයන්හි කෙළවරක් නො දැක එහිද හරයක් නොදක්නේ ගෘහවාසය අත්හැර ඍෂි පැවිද්දෙන් පැවිදි ව හිමවත නුදුරෙහි අසපුවක් කරවා ශිෂ්‍යයන් සමග වාසය කළේය. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස හැසිරෙමින් ඔහුට අනුකම්පා පිණිස ඒ පෙදෙසට සම්ප්‍රාප්ත වූ සේක. තාපසයා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ තමාගේ ප්‍රයෝජනය පිණිස බෙණයක තබා ගස්මුදුනෙහි තැබූ මීහිරි වූ පදුමපල[1] මීපැණි සමග දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට සොම්නස දනවනු පිණිස ඔහු බලා සිටියදී ම වළඳ අහසෙහි වැඩසිටි සේක් ඵලදානයෙහි අනුසස් වදාරා වැඩි සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරමින් උභය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති එක් කුලගෙයක ඉපිද සත්හැවිරිදි ව සිටිය දී ම රහත්බවට පත්ව පෙර කරන ලද කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **අජඣායකො මනතධරො** යනාදිය කීය. එහි අජ්ඣෙති සිතානුයි අජඣායී නම්. හේ ම අජඣායක නම්. මෙහිදී අකාරය 'ප්‍රතිෂේධ වෘද්ධි තද්භාවයෙහි -පෙ- **අකාරො** වෙන්කෙරේනුයි මෙසේ කියන ලද අර්ථ කියූ කල්හි තද්භාවයෙහි පවතී. ශිෂ්‍යයන්ගේ

---

[1] අපදාන පාළියේ දක්වන්නේ 'පුණ්ඩරික ඵලානි' ඇටඹ ගෙඩි වශයෙනි.

ශ්‍රවණ ධාරණ ආදි වශයෙන් යහපත **අජ්ඣෙති** සිතයි අධ්‍යයනය කරයිනුයි අජ්ඣායක නම්. සිතන්නා යන අර්ථයි. ගුරුවරයා හමුවෙහි උගත් සියලු මන්ත්‍ර මනසින් ධාරෙති පවත්වා ගනීනුයි **මන්තධර** නම්. **තිණ්ණං වෙදානංපාරගූ** යනු වේදය යනු ඥානයයි කියනු ලැබේ. වේදයෙන් වෙදිතබ්බා දතයුතු වූයේ වෙද නම්. ඍග්වේද යජුර්වේද සාමවේද සංඛ්‍යාත වූ ග්‍රන්ථ තුන. එම වේදයන්ගේ **පාරං** අවසානයට කෙළවරට පැමිණියේනුයි පාරගූ නම්. සෙස්ස ප්‍රකට ම ය.

ඵලදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.128

පබ්බතෙ හිමවන්තමහි යනාදි වශයෙන් ආයුෂ්මත් ඤාණසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ ඒ ඒ උපනුපන් භවයෙහි පින් රැස්කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව හිමවත නුදුරෙහි පන්සලක් කරවා පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා වසන්නේ එක් දවසක් පිරිසිදු පඬෙරවන් වැලිතලාවක් දැක බුද්ධඥානය මේ ලෙසට පරිශුද්ධ යයි බුදුන්ගේ ඥානය සිහිකළේය. ස්තුති කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව සසුනෙහි පැවිදිව නොබෝ කලකින්ම රහත්බවට පත්වූයේ පෙර කරන ලද පින සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'පබ්බතෙ හිමවන්තමහි' යනාදිය කීය. **පුලිනං සොභනං දිසවා** යනු පරිපූර්ණ කරන ලද්දක් මෙන් **විපුලාකාරෙන** පිරිසිදු කරන ලද අයුරින් **පවත්තං** සිටියේනුයි පුලින නම්. සෝභන වූ වැලි දැක ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ සිහිකෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

ඤාණසඤ්ඤක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.129

සුවණ්ණ වණ්ණා සම්බුද්ධා යනාදි වශයෙන් ආයුෂ්මත් ගන්ධපුජීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතිවල කරන ලද පින්රැස් ඇත්තේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද උපභෝග පරිභෝගයන් ගෙන් අනූන වූයේ එක් දවසක් විපසසි භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් සමග වැඩහිඳිනු දැක පැහැදුණු සිතැත්තේ ලදපස්මලින් පූජා කළේය. හේ එම සිත් පැහැදීමෙන් දිවි ඇති තෙක් සිට එයින් දෙව්ලොව උපන්නේ දිව්‍ය සම්පත් අනුභවකොට පසුකලෙක මිනිසුන් අතර මිනිස් සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් බවට පැමිණියේය. හේ එක් දවසක් පෙර කරන ලද පින සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ මේ කුසලයෙන් මම නිවනට පැමිණියේ වෙමි යි පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'සුවණ්ණ වණ්ණා සම්බුද්ධා'** යනාදිය කීය. ඒ සියල්ල යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ගන්ධපුජීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.130

හිමවනතසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් පදුමපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කොට පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිති බවට පත්ව ස්වකීය ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ එහි හරයක් නොදක්නේ බුද්ධෝත්පාදයට පෙරාතුව උපන් බැවින් අවවාද අනුශාසනා නොලැබ ගෘහවාසය අත්හැර සෘෂි පැවිද්දෙන් පැවිදි ව

හිමවත නොදුරෙහි ගෝතමක නම් පර්වතය ඇසුරුකොට ධ්‍යාන සුවයෙන් ම වාසය කළේය. එකල්හි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ බුදුව සත්වයන් සසරින් ගොඩලමින් වාසය කරන සේක. ඉක්බිති ඔහුට අනුකම්පා පිණිස හිමවතට වැඩි සේක. තාපසයා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ ස්වකීය ශිෂ්‍යයන් කැඳවා ඔවුන් ලවා නෙළුම් මල් ගෙන්වාගෙන පූජා කළේය. ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද සැදැහැ ඇත්තේ පැහැදුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ තමාගේ පුණ්‍යකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'හිමවන්තස්ස අවිදූරේ'** යනාදිය කීහ. **ගොතමො නාම පබ්බතො** යනු නොයෙක් යකුන් හා දෙවියන්ට නිවාසයක් වූ බැවින් අධිෂ්ඨාන වශයෙන් ගෝතමගේ භවන වූ බැවින් ගෝතමයයි ප්‍රකට වූයේ විය. **නානාරුක්ඛෙහි සඤ්ඡන්නො** යනු වැඩෙනුයි පිහිටානුයි රුක්ඛ නම්. නැතහොත් පොළොව හාරමින් උඩට නැගේනුයි රුක්ඛ නම්. **නානා** අනේකප්‍රකාර සපු කපුරු නා අගිල් සඳුන් ආදී රුක්නුයි නානාරුක්ඛා. එයින් **සඤ්ඡන්නො** ප්‍රකීර්ණ වූ ගෝතම පර්වතය යනු සම්බන්ධයි. **මහාභූතගණාලයො** යනු වෙන්නුයි ජායන්ති උපදිත්නුයි වැඩෙත්නුයි භූත නම්. මහත් වූ ඒ භූතයෝ ද මහාභූත නම්. මහාභූතයන්ගේ ගණො සමූහය මහාභූතගණො නම්. මහාභූත ගණයාගේ ආලයය මහාභූත ගණාලය නම්. **වෙමජ්ඣම්හිව තස්සාසී** යනු ඒ ගෝතම පර්වතයෙහි වෙමජ්ඣ අභ්‍යන්තරයෙහි ආශ්‍රමයක් **අභිනිම්මිතො** නිෂ්පාදනය කරන ලද්දේ ය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

පදුමපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දහතුන්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.131

පදුමුත්තරො නාම ජිනො යනාදි වශයෙන් ආයුෂ්මත් සොභිත තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිහි බවට පත්වූයේ ගෘහවාසය පිහිටුවා එක් දවසක් ශාස්තෘන් වහන්සේ විසින් දහම් දෙසනු ලබන කල්හි උන්වහන්සේ කෙරෙහි පැහැදුණු සිතැත්තේ නොයෙක් ආකාරයෙන් ස්තුති කළේය. හේ එම සොමනසින් ම කලුරියකොට දෙවියන් අතර උපන්නේ එහි දිව්‍යසැප අනුභවකොට මිනිසුන් අතර මිනිස් සැපද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක උපන්නේ සත්හැවිරිදි වියෙහි දී ම පැවිදි ව නොබෝ කලකින් ෂට් අභිඥා සහිතව රහත් විය. උන්වහන්සේ පසුකලක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොමනස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පදුමුත්තරො නාම ජිනො' යනාදිය කිහ. ඒ සියල්ල යට කියූ පරිද්දෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

සොභිත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.132

විපඨාය නදීතීරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් සුදස්සන තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන කරන ලද පින් රැස්කිරීම් ඇත්තේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසය පිහිටුවා වසන්නේ විපඨා නම් ගංගාව සමීපයෙහි (පිලකුඵලිතං) පලදරන පුලිල ගසක් සොයන්නේ ඒ ඒ ගංගා තීරයෙහි දැල්වෙන ගින්නක් මෙන් වැඩහුන් සිබී සම්බුදුරජාණන් වහන්සේ දැක පහන් සිතැත්තේ වැටකේ මලක් නටුව සමගම කඩා පුදමින් මෙසේ කීය. ස්වාමීනි, යම් ඥානයකින් ඔබවහන්සේ මෙසේ මහානුභාව සම්පන්නව,

සර්වඥ බුදුවරයෙක් වූ සේක්ද ඒ ඥානය මම පුදමි යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනාව කළ සේක. හේ ඒ පිනින් දෙවි මිනිසුන් අතර ඉපිද උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ තමා කරන ලද කුසල සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'විජටාය නදීතීරේ' යනාදිය කීහ. එහි **විජටාය** යනු **විජටෙති** පැතිරේ, විස්තීර්ණ වේනුයි **විජටා** නම්. **නදනති** ශබ්ද කෙරෙත්නුයි **ඉතා** ගියාහු පැවතියාහුය නදී නම්. එයට පැමිණ තරණය කළාහු **තීරං** නම්. ඒ නදියෙහි තීරය සම්පයෙහි යන අර්ථයි. **කෙතකං පුපඵිතං දිසවා** පහත් අයුරින් ගන්නවුන්ගේ අත කටු ඇනේනුයි කෙත නම්. කේතගේ මෙයනුයි **කෙතකංපුපඵං**. එය දැක නටුව කඩා යනු සම්බන්ධයි. **සිබිනො ලොකබන්ධුනො** යනු සිබී යනු ගින්නයි. ගිනි හා සමාන නීලපීත ආදී භේදයෙන් යුතු දිලෙන සවණක් රැස් යමකුට වේද හේ සිබී නම්. ඒ **ලොකස්ස** සියලු තුන්ලෝකයෙහි **බන්ධු** ඥාතියා යනු ලොකබන්ධු නම්. ඒ ලෝකබන්ධු වූ සිබී බුදුරජාණන් වහන්සේට වැටකේ මලක් නටුවෙන් කඩා පිදුවෙමි යනු සම්බන්ධයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

සුදස්සන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.133

චන්දභාගා නදී තීරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් චන්දනපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත චන්දභාගා නදිය සමීපයෙහි කින්නර යෝනියෙහි ඉපිද මල් අනුභව කරන්නේ මල් හඳින්නේ සඳුන් අගිල් ආදියෙහි සුවඳින් විභූෂිත වූයේ හිමවතෙහි බූමාටු දෙවියකු මෙන් උයන් දියකෙළි ආදී නොයෙක් සැප අනුභව කරමින් වාසය කළේය. එකල්හි අත්‍යදස්සි භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස

හිමවතට වැඩ අහසින් බැස සඟල සිවුර පනවා වැඩහුන් සේක. ඒ කිඳුරා ඒ භාග්‍යවතුන් වහන්සේ බබලමින් එහි වැඩහිඳිනු දැක පහන් සිතැත්තේ යුවඳ සඳුනින් පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුමෝදනා කළ සේක. හේ ඒ පිනින් ඒ සොම්නසින් දිවි ඇති තෙක් සිට එයින් චුත වූයේ දෙව්ලොව ඉපිද වරින්වර ස කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති සම්පත් ප්‍රදේශ රාජ්‍ය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ පැවිදිව නොබෝ කලකින්ම රහත් බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'චඤ්ඤභාගා නදීතීරේ' යනාදිය කීය. එහි චඤ්ඤං සිත රුචිං අධ්‍යාශය දැන මෙන් උපන්නේනුයි චඤ්ඤා නම්. චන්ද්‍ර මණ්ඩලයෙන් ප්‍රසන්න නිර්මල ජලයෙන් දෙපැත්තේම මුතුදැල් හා සමාන සුදුවැලි තලයෙන්ද යුක්ත වූ බැවින් චන්ද්‍රයා හා සමාන පැති ඇයට ඇත්තේනුයි චඤ්ඤභාගා නම්. ඒ නදී තෙර සම්පයෙහි යන අර්ථයි. සෙසු සියල්ල යට කියන ලද පරිද්දෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

චඤ්ඤපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

අටවැනි බණවර වර්ණනාව සමාප්තයි.

3.134

සුනඤ්ඤානාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් පුපඵඳනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිති බවට පත්ව ස්වකීය ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණියේ මහාභෝග ඇත්තේ මහා යසස් ඇත්තේ දන්දීමෙහි ඇලුණේ විය. එක් දවසක් සියලු දඹදිව මේ යාචකයෝ නම් මම දානය නොලබන ලද්දේ වෙමි කියන්නට නොලබත්වා යි! මහා දානයක් පිළියෙල කළේය. එකල්හි පදුමුත්තර

භාග්‍යවතුන් වහන්සේ පිරිවර සහිතව අහසින් වඩනා සේක. බමුණා උන්වහන්සේ දැක පහත් සිතැත්තේ සිය සිසුන් කැඳවා මල් ගෙන්වාගෙන අහසෙහි උඩට දමා පූජා කළේය. ඒවා මුළුනුවර වසා සත් දවසක් සිටියේය. හේ ඒ පින්කමින් දෙවි මිනිසුන් අතර සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක් කුලගෙයක ඉපිද සැදැහැ ඇත්තේ පැවිදිව හිසකෙස් මුඩුකරනවිටම රහත්බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ සුනන්දෝනාම නාමෙන යනාදිය කීය. එය යට කියන ලද පරිද්දෙන් පහසුවෙන් දත හැක්කේමය.

පුප්ඵඡදනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.135

හිමවන්තසාවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් රහෝ සඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ එක් බුදු කෙනකුන් නැති කලක මධ්‍යම දේශයෙහි බමුණු කුලයක ඉපිද වැඩිවිය පත්ව ස්වකීය ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණ එහි හරයක් නොදක්නේ හුදෙක් බඩම පුරවාගෙන ක්‍රෝධය මානය ආදිය අකුසලයෙහි ම ඵල සේ දැක ගෘහවාසය අත්හැර හිමවතට පිවිස ඍෂි පැවිද්දෙන් පැවිදි ව නොයෙක් සියගණන් තවුසන් පිරිවරකොට ඇත්තේ වසභ පර්වත සමීපයෙහි ආශ්‍රමයක් මවා වර්ෂ තුන්දහසක් හිමවතෙහිම වසමින් මම මෙපමණක් සිසුන්ට ගුරුවරයා යයි සම්මත වූ ගුරුතන්හි තැබිය යුතු ගරු කටයුතු වන්දනීය වූ ගුරුවරයෙක් මට නැතැයි දොම්නසට පත්වූයේ ඒ සියලු ශිෂ්‍යයන් රැස්කරවා බුදුවරුන් නැතිකල්හි නිර්වාණ අධිගමයක් නැති බව ප්‍රකාශකොට, තමා හුදෙකලාව රහසින් විවේකස්ථානයෙහි ම හුන්නේ බුදුන් හමුවෙහි හුන්නාක් මෙන් බුද්ධ සංඥාව සිතෙහි තබා බුදුන් අරමුණු කොට ගත් ප්‍රීතිය උපදවාගෙන ශාලාවෙහි පර්යංකයක් බැඳගෙන හුන්නේ කලුරිය කොට බඹලොව

උපන්නේ ය. එහි ධ්‍යාන සුඛයෙන් බොහෝකල් වැස මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද කාමයන්හි නොඇලුණේ සත්වස් ඇත්තේ පැවිදිව හිසකෙස් මුඩුකරද්දී ම රහත්වවට පැමිණ ෂට් අභිඥා ඇත්තෙක් ව පෙරවිසූ කඳ පිළිවෙළ දන්නා නුවණින් තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'හිමවන්තසසාවිදූරේ' ආදිය කීය. වසභෝ නාම පබ්බතෝ යනු හිමවත් පව්ව හැර සෙසු පර්වතවල වඩා උස්බව නිසා ශ්‍රේෂ්ඨතර බව නිසා වසභයයි ප්‍රසිද්ධියට ගිය පර්වතය යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු ම ය.

රහොසඤ්ඤක තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.136

කණිකාරංව ජොතනතං යනාදි වශයෙන් ආයුෂ්මත් චම්පක පුපඵීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ වෙසසභූ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූයේ ස්වකීය ශිල්පයන්හි නිෂ්පත්තියට පත්ව එහි හරයක් නොදැක ගෘහවාසය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව වනාන්තරයෙහි වසන්නේ වෙසසභූ භාග්‍යවතුන් වහන්සේ උදෙසා සිසුන් විසින් ගෙනඑනු ලැබූ සපුමල් පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනාව කළ සේක. හේ ඒ කුසලයෙන් දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණ පූර්ව වාසනා බලයෙන් ගෘහවාසයෙහි නොඇලුණේ පැවිදිව නොබෝ කලකින් රහත් විය. හේ පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'කණිකාරංව ජොතනතං' යනාදිය කීය. එහි **කණිකාරං** යනු සියලු කොළ පරඬැල් අත්හැර මල් හටගන්නා කල්හි කැකුලක්ව මල්කෙමි හටගන්නා බැවින් කර්ණිකා කාරයෙන් උපන්නේ යයි කණිකාර නම්. කර්ණිකා කෙරේනුයි කියයුතු තන්හි නිරුක්ති නියමයෙන් අකුරු ලොප්කොට

කණිකාරයයි කියන ලදැයි දතයුත්තේ ය. ඒ පිපුණු කිණිහිරි රුකක් මෙන් බබලන බුදුරජාණන් වහන්සේ දුටුවෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

චම්පක පුපඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.137

විසාල මාලෙ ආසීනො යනාදි වශයෙන් ආයුෂ්මත් අපඨසඳසසක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ආත්ම භාවයන්හි කරන ලද පින් රැස්කිරීම් ඇත්තේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව ස්වකීය ශිල්පයන්හි නිෂ්පත්තියට පත්වූයේ එහි හරයක් නැති බව දැන ගිහිගෙය අත්හැර හිමවතට ගොස් රමණීය ස්ථානයක පන්සලක් කොට වාසය කරයි. එකල්හි සත්වානුකම්පාවෙන් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ හිමවතට වැඩි සේක. උන්වහන්සේ දැක පහන් සිතැත්තේ පසඟ පිහිටුවා වැඳ ස්තුති වචනයන්ගෙන් ප්‍රශංසා කළේය. හේ ඒ පිනින් දිවි ඇතිතෙක් සිට කලුරියකොට බ්‍රහ්ම ලෝකයට පැමිණියේ විය. හේ පසුකලෙක මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව රහත්බවට පත්විය. ඉන්පසු උන්වහන්සේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'විසාල මාලෙ ආසීනො' යනාදිය කීහ. එහි **විසාල මාලෙ** යනු විසාල පැතිරුණු විස්තීර්ණ වූ මහා මල් ඇත්තේ යම් තැනකද එය විසාලමාලා නම්. ඒ විසාල මාලයෙහි. **ආසීනො** හුන් මම ලෝකනායකයන් වහන්සේ දුටුවෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

අපඨසඳසසක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.138

නාරදෝ ඉති මෙ නාමං යනාදි වශයෙන් ආයුෂ්මත් එකපසාදනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතීන්හි කරන ලද කුසල් ඇත්තේ අපථදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද කේසව යයි ප්‍රකට වූයේ වී දැනමිති බවට පැමිණ ගෘහවාසය අත්හැර පැවිදිව පැවිදි සුවෙන් වසයි. හේ එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා ඇඳිලිබැඳ අතිශයින් හටගත් ප්‍රීති සොම්නස් ඇත්තේ පෙරදිග දෙසට ගියේය. හේ දිවි ඇති තෙක් සිට ඒ සොම්නසින්ම කලුරියකොට දෙවියන් අතර ඉපිද එහි දිව්‍ය සම්පත් අනුභව කොට මිනිසුන් අතර ඉපිද එහි මිනිස් සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක්තරා කුලගෙයක ඉපිද වැඩිවියපත් වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ කළ කුසල කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'නාරදෝ ඉති මෙ නාමං'** යනාදිය කීහ. එහි නාරදෝ යනු ජාති වශයෙන් පිරිසිදු ශරීර ඇත්තේ, මොහුගේ සිතෙහි රජස් දූලි නැත්තේනුයි නාරද නමි. ජ කාරයට ද කාර ආදේශය. නාරද යනු කුලයෙන් දෙන ලද නමයි. **කෙසවො** යනු කිසවච්ඡ ගෝත්‍රයෙහි උපන් බැවින් කෙසවනමි. නාරද කේසව යනුවෙන් ජනයා මා විඳූ දනිතියි අර්ථයි. සෙස්ස ප්‍රකටමය.

එකපසාදනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.139

මිගරාජා තදා ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් සාලපුප්ඵදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන කරන ලද කුසල් රැස්කිරීම් ඇත්තේ කිසියම් කර්ම දෝෂයකින් හිමවතෙහි සිංහ යෝනියෙහි

ඉපිද නොයෙක් සිංහයන් පිරිවර කොට වාසය කළේය. එකල්හි සිබී භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස හිමවතට වැඩි සේක. සිංහයා උන්වහන්සේ පැමිණි බව දැක පහන් සිතැත්තේ සල් අත්තක් බිඳ නටුව සහිත සල්මලක් ගෙන පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුමෝදනා කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදි ව රහත් බවට පත්වූයේ තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොමනස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'මිගරාජා තදා ආසිං'** යනාදිය කීය. එහි මරණයට යත්නුයි මිගා, ගොදුරු **මඟනන** සොයත්නුයි මිගා, මුවන්ගේ රජ මිගරාජා. සියලු සිව්පාවුන්ට රජබව ඇතිකල්හිද ගාථා බන්ධන පහසුව පිණිස මිගෙ ආදිකොට මිගරාජා යයි කියන ලදී. භාග්‍යවතුන් වහන්සේ දැක මල් සහිත සල් අත්තක් බිඳ පූජා කෙළෙමි. එකල්හි මම මුවරජ වීමි යන අර්ථයි. **සකෙටං පුපඵමාහරිං** යනු නටුව සහිත (සකනතිකං) සල්මල ආහරිං පිදුවෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේමය.

සාලපුපඵදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.140

පරොධකො තදා ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් පියාලඵලදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වැදි කුලයෙහි ඉපිද හිමවතෙහි එක් බෑවුමක මුවන් මරා ජීවිකාව කරමින් වාසය කරයි. එකල්හි එහි පැමිණි සිබී භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ උදය සවස නමස්කාර කරමින් කිසියම් දියයුතු දෙයක් නොදක්නේ මිහිරි මොරගෙඩි නෙලා දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඒවා වැළඳූ සේක. ඒ වැද්දා බුද්ධාලම්බන ප්‍රීතියෙන් නිරන්තරයෙන් පිරුණු සිරුරු ඇත්තේ පාප කර්මයෙහි නොඇලුණු සිත් අත්තේ මුල්පල ආහාර කොටගෙන

බොහෝ කලකින් කලුරියකොට දෙව්ලොව උපන්නේ ය. හේ එහි දිව්‍ය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ගෘහපති කුලයෙහි ඉපිද දැනමිනි බවට පත්වූයේ ගෘහවාසය පිහිටුවා එහි නොඇලුණේ ගිහිගෙය අත්හැර ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදිව විදසුන් වඩා නොබෝ කලකින් රහත් බවට පැමිණියේ තමා විසින් කරන ලද ඵලදාන කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'පරොධකො තදා ආසිං' යනාදිය කීය. එහිදී මම පියල් පලයක් දී සිත් පැහැදවීමි. එකල්හි මම වැද්දෙක් වීමි යනු සම්බන්ධයි. **පරොධකො** යනු **පරඝනත රොධකො පර සත්වයන්ට** වෙහෙස ගෙන දෙන්නෙක්. පරරොධකො යනුවෙන් කියයුතු තන්හි පූර්ව රකාරය ලොප් කොට පරොධකො යනුවෙන් කියන ලදී. **පරිචාරිං විනායකං** යනු නිර්වාණයට පමුණුවන ශාස්තෘන් වහන්සේට, ස්වාමීනි මේ ඵලය වළඳනු මැනවැයි පැවරීමි. **නිමනෙතසිං** ආරාධනය කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

පියාලඵලදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දස සතරවැනි වර්ග වර්ණනාව නිමියේය.

3.141

පරිනිබ්බුතෙ භගවති යනාදි වශයෙන් ආයුෂ්මත් ජත්තාධිඡතිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ අපරදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද ජීවත්ව සිටි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි අහෝ මාගේ පරිහානිය යයි සිතා මාගේ උත්පත්තිය සඵල කරන්නෙමි යි කරන ලද සනිටුහන් ඇත්තේ ඡත්‍රයක් කරවා ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් කර ඇති ධාතු ගර්භය පිදීය. පසුකලක මල්කුඩයක් කරවා එම ධාතු

ගර්භයට පිදුවේය. හේ එම ඡත්‍රාධිඡත්‍රදාන පිනින් දෙව්මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ගෘහපති කුලයෙහි ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව කමටහන් ගෙන උත්සාහ කරන්නේ නොබෝ කලකින්ම රහත් බවට පැමිණියහ. පසුකලෙක උන්වහන්සේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පරිනිබ්බුතෙ භගවති'** යනාදිය කීහ. එහි **ඡත්තාධිඡත්තං** යනු **ඡාදියති** අව්ව ආදිය වසනු ලැබෙනුයි ඡත්ත නම්. **ඡත්තස්ස අධිඡත්තං** ඡත්‍රයට උඩින් කරන ලද ඡත්‍රය ඡත්තාධිඡත්තං යන අර්ථයි. **ථූපමහි අභිරොපයිං** යනු **ථූපීයති** රැස් කෙරේනුයි ථූප නම්. නැතහොත් **ථූපෙති** ස්ථිර භාවයෙන් වෘද්ධියට වර්ධනයට විශාලත්වයට පැමිණෙමින් පිහිටානුයි ථූපනම්. ඒ ස්තූපයෙහි මා විසින් කරවන ලද ඡත්‍රය මතුමත්තෙහි තැබීම් වශයෙන් විශ්වාසයෙන් යුතුව ආරොපයිං පූජා කෙළෙමි යන අර්ථයි. **ථූපඵුදනං කත්‍වාන** යනු පිපුණු සුවඳ හමන නොයෙක් මලින් **ඡදනං** ඡත්‍රය ඉහළින් වියනක් කොට පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

ඡත්තාධිඡත්තිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.142

නිබ්බුතෙ ලොකනාථම්හි යනාදී වශයෙන් ආයුෂ්මත් ථමහාරොපක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ ධම්මදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද සැදැහැ ඇත්තේ පැහැදුණේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධාතුගර්භ මාලකයෙහි කොඩිගසක් නංවා එහි කොඩියක් එසවීය. බොහෝ දෑසමන් මල්ගොතා ඉණිමගින් ගොස් ස්තූපයෙහි පූජා කළේය. හේ දිවි ඇතිතාක් සිට කලුරියකොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට සැමතැන පූජිත වූයේ මේ

බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලගෙයක ඉපිද බාල කාලයෙහි සිට පූජනීය වූයේ සසුනෙහි බැඳුණු සැදැහැ ඇත්තේ පැවිදිව පිළිසිඹියා සහිත කොට රහත් බවට පත්විය. පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'නිබ්බුතෙ ලොකනාථම්හි' යනාදිය කීය. නිබ්බුතෙ ලොකනාථම්හි යනු සියලු ලොවට නාථෙ පිළිසරණ වූ ශාස්තෘන් වහන්සේ ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවි කල්හි නිවුණු පහන් සිළුවක් මෙන් නොපෙනී ගියකල්හි යන අර්ථයි. ධම්මදසසි නරාසභෙ යනු සිව්සස් දහම් දකීනුයි ධම්මදසසි නම්. නැතහොත් සතිපට්ඨාන ආදී වූ බෝධිපාක්ෂික ධර්මයන් දසසන සීලො දකිනසුලු වූයේනුයි ධම්මදසසී නම්. නරයන්ට ප්‍රධානවූයේ පවරො උත්තම වූයේනුයි නරාසභො නම්. ඒ ධම්මදසසි නරාසභයන් වහන්සේ කෙරෙහි ආරොපෙසිං ධජසථම්භං යනු චෛත්‍ය මළුවෙහි කණුවක් සිටුවා එහි කොඩියක් ආරොපෙසිං බැඳ තැබුවෙමි යි අර්ථයි. නිසෙසණිං මාපයිත්වාන යනු මේ නිසා නංඉනනති එයට යත්නුයි නගිත්නුයි නිසෙසණි නම්. ඒ ඉණිමග මාපෙත්වා කරවා ශ්‍රේෂ්ඨ ස්තූපයට නගිත් යනු සම්බන්ධයි. ජාතිපුපඵං ගහෙත්වාන යනු උපදින්නාක් මෙන් ජනයන්ගේ සොඳුරු මනසක් කරානුයි ජාතිසුමනං. ජාතිසුමන වූයේ ද එම මලවූයේ ද ජාතිසුමන පුපඵං යනුවෙන් කියයුතු තන්හි ගාථාබන්ධන පහසුව පිණිස සුමන ශබ්දයට ලෝපයක් කොට ජාතිපුපඵං යනුවෙන් කියන ලදී. ඒ ජාතිසුමන මල් ගෙන ගොඩා ස්තූපයෙහි නැංවූයෙමි. නංවා පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

ඵමහාරොපක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.143

නිබ්බුතෙ ලොකනාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් බුදුවේදික තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ පියදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විභව සම්පත් ඇති එක්

කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගෘහවාසය තබා ශාස්තෘන් වහන්සේ පිරිනිවි කල්හි පැහැදුණේ උන්වහන්සේගේ චෛත්‍යයෙහි වළල්ලක් කරවීය. සත්රුවනින් පුරවා මහා පූජාවක් කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ නොයෙක් සියදහස් ගණන් ජාතිවල පිදිය යුතු බවට පත්වූයේ මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ උභය සැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද විභව සම්පත් ඇත්තේ පැවිදි ව වෑයම් කරන්නේ නොබෝ කලකින්ම රහත් විය. හේ එක් දවසක් කරන ලද කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'නිබ්බුතෙ ලොකනාථම්හ' යනාදිය කීය. එයට යට කියන ලද අර්ථ ඇත්තේමය. **පියදස්සි නරුත්තමෙ** යනු ප්‍රිය වූ සොම්නස් දනවන දර්ශනය යමකුගේද හේ පියදස්සි නම්. ආරෝහ පරිණාහ දෙතිස්මහා පුරුෂ ලක්ෂණ අසූඅනු ව්‍යංජන ව්‍යාමප්‍රභා මණ්ඩලයන්ගෙන් සාධු මහාජනයන්ගේ ප්‍රසාදය උපදවන ආකාර දර්ශනය යන අර්ථයි. නරයන්ට උත්තම වූයේ නරුත්තම නම්. පියදස්සි වූයේද හෙම නරුත්තම වූයේද පියදස්සි නරුත්තම නම්. ඒ පියදස්සි නරුත්තමයන් වහන්සේ පිරිනිවි කල්හි ධාතුගර්භයෙහි මුතු වේදිකාවක් මම කෙළෙමි යනු සම්බන්ධයි. මල් පූජාකිරීම පිණිස කෙළවර වේදිකා වළල්ලක් කෙළෙමි යන අර්ථයි. **මණිහි පරිවාරෙත්වා** යනු **මිනාති** ප්‍රභාවන්ගෙන් බබලානුයි මණි නම්. නැතහොත් ජනයන්ගේ සිත පුරවන්නේ සොම්නස් කරන්නේ මෙයින් ගියේ පැවතියේනුයි මණි නම්. දෑරඹමැණික් වෙරළුමිණි ආදී නොයෙක් මැණික්වලින් කරන ලද වේදිකා වළල්ල වටා උතුම්වූ මහා පූජාවක් කෙළෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

බුද්ධවේදික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.144

පදුමුත්තරෝ නාමජිනෝ යනාදි වශයෙන් ආයුෂ්මත් සපරිවාරිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතීන්හි පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති

බවට පත්වූයේ මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ විය. ඉක්බිති පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි මහජනයා උන්වහන්සේගේ ධාතු නිදන්කොට මහත්වූ චෛත්‍යයක් කරවා පූජා කළේය. එකල්හි මේ උපාසකයා ඒ මතුපිට සඳුන් හරයෙන් චේතියඝරයක් කරවා මහා පූජාවක් කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව කුසල්කොට සැදැහැයෙන් සසුනෙහි පැවිදි ව නොබෝ කලෙකින්ම රහත් විය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පදුමුත්තරෝ නාමජිනෝ' යනාදිය කීහ. එහි **ඔමත්තං** යනු ලාමක බවයි. නීච බවක් හෝ නොදකිමි නොදනිමි මා විසින් නීචත්වයක් නුදුටු විරූය යන අර්ථයි. සෙස්ස ප්‍රකටමය.

සපරිවාරිය තෙරුන්වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.145

නිබ්බුතෙ ලොක නාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් **උම්මාපුප්ඵිය** තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසය තබා වසන්නේ පිරිනිවි භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍ය උත්සවය පවත්නා කල්හි ඉන්ද්‍රනීල මාණික්‍යයක වර්ණය ඇති දියබෙරලිය මලක් ගෙන පූජා කළේය. හේ ඒ පිනින් සුගතීන්හි පමණක් සැරිසරන්නේ දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභවකොට උපනුපත් භවයෙහි බෙහෙවින් නීලවර්ණ වූයේ ජාතිසම්පන්න වූයේ විභව සම්පන්න වූයේ විය. මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද දැනමිති බවට පත්ව හටගත් සැදැහැ ඇත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත්බවට පත්විය. උන්වහන්සේ පසුකලක පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'නිබ්බුතෙ ලොක මහිතෙ'** යනාදිය කීහ. එහි **ලොක**

මහිතෙ යනු ලෝකයා විසින් මහිතො යනු ලෝකයා විසින් ගරුකරනු ලැබිය. පූජා කරනු ලැබියයි ලොකමහිතො නම්. ඒ ලෝකමහිත වූ සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි යනු සම්බන්ධයි. **ආහුතීනං පටිගහෙ** යනු ආහුතිනො යනු ප්‍රජාසත්කාර යයි කියනු ලැබේ. ඒ පූජා සත්කාරයන් පිළිගැනීමට සුදුසු වේනුයි ආහුතීනං පටිගහො නම්. අලුප්ත කෘදන්ත සමාසයයි. ඒ පූජාසත්කාර පිළිගන්නා භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි යන අර්ථයි. **උම්මාපුපඵං** යනු උදකං මුදුන නිල්පැහැ මුදමින් **පුපඵති** පිපේනුයි **උම්මාපුපඵං**. එය ගෙන චෛත්‍යයෙහි පූජා කළේය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේමය.

උම්මාපුපදීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.146

අනොමදස්සි මුනිනො යනාදි වශයෙන් ආයුෂ්මත් අනුලෙපදායක තෙරුන්වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ අනොමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝරුකට වේදිකා වළල්ලක් කරවා සුණුපිරියම් ද කරවා වැලි අතුරා දිදුලන රජත විමානයක් මෙන් කරවීය. උන්වහන්සේ ඒ පිනින් සැමතන්හි සැපයට පැමිණියාහු උපනුපන් භවයෙහි රජත විමානවල රජත ප්‍රාසාද ආදියෙහි සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක උපන්නාහු දැනමීති බවට පත්වූවාහු ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී පැවිදිව විදසුන්හි යෙදී නොබෝ කලකින්ම රහත් වූහ. උන්වහන්සේ පසුකලෙක කුමක්නම් කුසලයක් කොට මා විසින් මේ විශේෂය අධිගමනය කරන ලද්දේදැයි පූර්වේනිවාසානුස්මෘති ඥානයෙන් පිළිවෙළින් සිහිකොට පෙර කරන ලද කුසලය දැන හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **අනොමදස්සි මුනිනො** යනාදිය කීහ. **අනොමකං** අලාමක වූ දසසනං දර්ශනීය වූ ශරීරය යමකුට වේද හේ

අනොමදසසි නම්. දෙතිස් වර මහා පුරුෂ ලක්ෂණ අසූ අනුව්‍යංජන ව්‍යාම ප්‍රභාවෙන් දිලිසෙන ශරීර ඇති බැවින් සොඳුරු දසුන් ඇත්තේ යන අර්ථයි. සුධාය පිණ්ඩං දත්වාන යනු බෝධිසරයෙහි වේදිකා වළල්ලක් කරවා මුළු බෝධිසරයෙහි සුණුපිරියම් කොට යන අර්ථයි. එාතිකම්ම මකාසහං යනු ලී අරටුවෙන් පාත්‍ර තනා ඒවා අතින් මට්ටම් කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ මය.

අනුලෙපදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.147

උත්තරිත්වාන නදිකං යනාදි වශයෙන් ආයුෂ්මත් මගධදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි නිවන් අවබෝධය පිණිස පින් රැස්කරන්නේ සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ලෝකසම්මත කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසයෙහි වසන්නේ එක් දවසක් භාග්‍යවතුන් වහන්සේ එක් නදියකින් එගොඩ වී වනාන්තරයට වඩිනු දැක පහන් සිතැත්තේ දැන් මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ මාර්ගය සම කිරීමට වටනේ යයි සිතා උදැල්ලක්ද කූඩයක්ද ගෙන භාග්‍යවතුන් වහන්සේ වඩිනාමග සමකොට වැලි විසුරුවා භාග්‍යවතුන් වහන්සේගේ පා වැඳ ස්වාමීනි, මේ මාර්ග අලංකරණයෙන් උපනුපන් තැන පිදිය යුත්තෙක් වන්නෙමි නිවනටද පැමිණෙන්නෙමි යි ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ අදහස් කළ කරුණ ඉටුවේවායි අනුමෝදනා කියා වදාරා වැඩි සේක. හේ ඒ පිනින් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ සැමතැන පිදියයුත්තෙක් විය. මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් ප්‍රසිද්ධ කුලයක ඉපිද ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව විඳසුන් වඩා නොබෝ කලකින්ම රහත්බවට පත්ව තමාගේ පූර්ව කර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැන හටගත් සොම්නස් ඇත්තේ තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'උත්තරිත්වාන නදිකං' යනාදිය කීය. එහි **නදති** ශබ්ද නගානුයි නදී, නදියම නදික වෙයි. ඒ නදිකය **උත්තරිත්වා** අතික්‍රමණය කොට යන අර්ථයි. **කුදාල පිටක මාදාය** යනු කූ යනු

පෘථුවියයි. එය විදාලනෙ කෙටිමෙහිදී උඩපැනීමෙහි සුදුසු වේනුයි කුද්දාල නම්. පිටක යනු පස්වැලි ආදිය ගෙනයන තල්පත් වේවැල් ආදියෙන් කරන ලද බඳුන. උදැල්ලද ඒ කුඩයද ආදිය ගෙන යන අර්ථයි.

මගධදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.148

යානකාරො පුරෙ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් ඵලදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ආත්මභාවයන්හි කරන ලද පුණ්‍යසම්භාර ඇත්තේ සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වඩු කුලයෙහි ඉපිද තෙරුවන්හි පැහැදුණේ සඳුනින් ඵල්ලෙන ලෑල්ලක් කොට භාග්‍යවතුන් වහන්සේට දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුමෝදනා කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සැමතන්හි සිත්සුවයෙන් පිරුණේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා හටගත් ප්‍රසාද ඇත්තේ පැවිදිව වෑයම් කරන්නේ නොබෝ කලකින්ම පිළිසිඹියා සහිත රහත් බවට පැමිණ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'යානකාරො පුරෙ ආසිං' යනාදිය කීය. එහි **යානකරො** යනු මෙයින් කැමති කැමති තැනට යත්නුයි යාන නම්. එය කරානුයි යානකර නම්. පුරෙ බුදුන් දක්නා කාලයෙහි මම යානකරුවෙක් වීමි යන අර්ථයි. **චඳනං ඵලකං කත්‍වා** යනු **වඳති** පරිදාහය මෙයින් නිවේනුයි චන්දන නම්. නැතහොත් සඳුන් සුවඳ හැමීම පිණිස මෙයින් සිරුර ගල්වත්නුයි චන්දන නම්. එයින් ඵල්ලෙන ඵලකයක් කොට යන අර්ථයි. **ලොකබන්ධුනො** යනු සියලු ලොවට බන්ධු නැවූයේනුයි ලෝකබන්ධු. ඒ ලෝකබන්ධු වූ ශාස්තෘන් වහන්සේට දුනිමි යන අර්ථයි. ඉසස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

ඵලදායක තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.149

සුමෙධො නාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් වටංසකිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ සුමෙධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගෘහවාසය තබා එහි ආදීනව දැක ගිහිගෙය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව මහවෙනෙහි වාසය කළේය. එසමයෙහි සුමෙධ භාග්‍යවතුන් වහන්සේ විවේක කැමති බැවින් ඒ වනයට වැඩි සේක. ඉක්බිති තවුසා භාග්‍යවතුන් වහන්සේ දැක පැහැදුණු සිතැත්තේ පිපුණු හොරමලක් ගෙන නළල් පළඳනාවක ආකාරයෙන් ගොතා භාග්‍යවතුන් වහන්සේගේ පාමුල පිදුවේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත් පැහැදීම පිණිස අනුමෝදනා කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති කුලයක ඉපිද වැඩිවිය පත්ව සැදැහැ ඇත්තේ පහන් වූයේ පැවිදි ව නොබෝ කලකින්ම රහත්විය. ඉන්පසු කලක පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'සුමෙධො නාම නාමෙන' යනාදිය කීය. විවෙකමනූ බ්‍රූහනෙතා යනු ජනාකීර්ණ විහාරය අත්හැර විවේක සිත අනුබ්‍රූහනෙතා වඩන්නේ බහුල වශයෙන් කරන්නේ මහා වනයට අජ්ඣොගහි පිවිසි සේක යන අර්ථයි. සෙස්ස නොගැඹුරු ම ය.

වටංසකිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.150

සුමෙධස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් ඵලඛාදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි නිවන් අවබෝධය පිණිස කරන ලද පින් රැස්කිරීම් ඇත්තේ සුමෙධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගෘහපති කුලයක ඉපිද වැඩිවිය පත්ව මහාභෝග සම්පත්

ඇත්තේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදී දහම් අසා ඒ ශාස්තෘන් වහන්සේට සත්රුවන්මුවා ආසනයක් තනවා මහා පූජාවක් කළේය. හේ ඒ පිනින් දෙව්මිනිසුන් අතර සැරිසරන්නේ සියලු තන්හි පුදනු ලැබුවේ විය. හේ අනුක්‍රමයෙන් මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගෘහවාසය තබා ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනය අසා පැහැදුණේ පැවිදිව නොබෝ කලකින් රහත් බවට පැමිණ පෙර කරන ලද පිනෙහි නමින් පලලඬ්කදායක තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. පෙර මෙන් පසුවද පෙර කරන ලද පිනෙහි නමින් තෙරුන් වහන්සේලාගේ නම් මේ අයුරින් දතයුතුය. උන්වහන්සේ එක් දවසක් තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සුමෙධස්ස භගවතො' යනාදිය කීහ. 'පලලඬ්කොහි මයාදිනෙනා' යනු පලලඬ්කං අරමිණියා ගොතාගෙන යම්තැනක උපදිසනි හිඳගනිත්ද එය පර්යංකයයි කියනු ලැබේ. ඒ සත්රුවන්මුවා පර්යංකය මා විසින් දිනෙනා පූජාකරන ලද්දේය යන අර්ථයි. **සඋත්තරි ස පඩ්ඝදෝ** යනු වියනින් හා පසුතිරයෙන් යුත් වූයේ සඋත්තරි සපඩ්ඝදෝ. උඩවියනක් බැඳ අසුන උතුම් වස්ත්‍රයෙන් වටකොට යන අර්ථයි. සෙස්ස ප්‍රකටමය.

පලලඬ්කදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

පසළොස්වැනි වර්ග වර්ණනාව නිමියේය.

3.151

චන්දංව විමලං සුද්ධං යනාදි වශයෙන් ආයුෂ්මත් බන්ධුජීවක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙම ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නාහු සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්ව ගෘහවාසය තබා වාසය කරන්නාහු සිබී භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය සම්පත්තිය දැක පැහැදුණු සිත් ඇතිව බදු වදමල්

ගෙන භාග්‍යවතුන් වහන්සේගේ පාමුල පූජා කළහ. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ චිත්තප්‍රසාදය වර්ධනය කරනු පිණිස අනුමෝදනාව කළ සේක. හේ දිවි ඇති තාක් සිට ඒ පිනින් ම දෙව්ලොව ඉපිද ස කාමාවචර සම්පත් ද මිනිසුන් අතර චක්‍රවර්ති ආදි සම්පත් ද අනුභවකොට මේ අපගේ සම්මා සම්බුදුරජාණන් උපන් කල්හි ගෘහපති කුලයෙහි ඉපිද රූපයෙන් ද යසසින් ද අග්‍රප්‍රාප්ත වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනය අසා සැදැහැ ඇත්තේ ගිහිගෙය අත්හැර පැවිදිවූයේ රහත්බවට පැමිණියේය. උන්වහන්සේ පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණින් කරන ලද කුසලකර්මය අත්දැක හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'චන්දංව විමලං සුද්ධං'** යනාදිය කීහ. එහි චන්දංව විමලං සුද්ධං යනු වලාකුළු මීදුම් දුම් දූලි රාහු යන උපක්ලේශ මලයෙන් විනිර්මුක්ත වූ චන්ද්‍රයා මෙන් එක්දහස් පන්සියයක් උපක්ලේශ මල ප්‍රහීණ කළ බැවින් විමල නම්. නික්ලේශී බැවින් සුද්ධං ප්‍රසන්න වූ සිබී සම්බුදුරජාණන් වහන්සේ යනු සම්බන්ධයි. කෙලෙස් මඩ නැති බැවින් අනාවිලං නොකැළඹුණේ විය. නන්දිභව සංඛ්‍යාත වූ ඵල විශේෂයෙන් හාත්පසින් ක්ෂීණ වූ බැවින් **නන්දිභවපරික්ඛීණං. තිණ්ණං** ලොකෙ යනු ලෝකත්‍රයෙන් **තිණ්ණං** උත්තීර්ණ වූයේ අතික්‍රාන්ත වූයේ. **විසත්තිකං** යනු විසත්තිකා යනු තෘෂ්ණාවයි. තෘෂ්ණාව නැත්තේ යන අර්ථයි. **නිබ්බාපයන්තං ජන්තං** යනු ධර්මය නැමති වර්ෂාව වස්වන්නේ **ජන්තං** ජන සමූහය කෙලෙස් පරිදාහ නැති බැවින් **නිබ්බාපයන්තං** ව්‍යුපසමනය කරන්නේ, තමා සංසාරයෙන් එතෙරවූයේ සියලු සත්වයන් සංසාරයෙන් **තාරයන්තං.** එතෙර කරන්නේ චතුරාර්ය සත්‍යයන් දන්නා බැවින් මුනි නම්. සිබී සම්බුදුරජාණන් වහන්සේ යනු සම්බන්ධයි. **වනස්මිං** ඣායමානං යනු ආරම්මණ උපනිජ්ඣාන ලක්ඛණ උපනිජ්ඣානයන්ගෙන් ඣායනතං වනමැද සිතන්නේ යන අර්ථයි. **එකග්ගං** ඒකාග්‍ර වූ. සිත. **සුසමාහිතං** මනා අරමුණෙහි ආහිතං තැබූ සිත සිබී මුනිවරයන් වහන්සේ දැක යන සම්බන්ධයි. **බන්ධුජීවක පුප්ඵානි** යනු බන්ධුනං ඥාතීන්ගේ **ජීවිතං** ජීවිතනිශ්‍රය වූ හදමස් ලේ **බන්ධුජීවිතං** හෘදයය. එවැනි වර්ණවත් මලක් ගෙන ලෝකබන්ධු වූ සිබී බුදුරජාණන් වහන්සේට පිදුවෙමි යන අර්ථයි. සෙස්ස නොඟ-ඹුරු අර්ථ ඇත්තේ ම ය.

බන්ධුජීවක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.152

පරකම්මායනෙයුත්තෙනා යනාදි වශයෙන් ආයුෂ්මත් තම්බපුප්ඵීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නාහු පියදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කිසියම් පෙර කරන ලද අකුසල කර්මයකින් දුගී කුලයක ඉපිද වැඩිවිය පත්වූවාහු අනුන්ගේ කුලීවැඩ කොට ඒ කුලියෙන් ජීවිකාව කළහ. හේ මෙසේ දුකින් වසන්නේ අනුන්ට අපරාධකොට මරභයින් පළාගොස් වනයට පිවිසියේය. ඒ ගියතැන පළොල් බෝධිය දැක වැඳ හැමද එක් රුකක තඹවන් මල් දැක ඒ සියල්ල නටුවෙන් කඩා බෝධිපූජාවක් කළේය. එහි සිත පහදවා වැඳ පලක් බැඳ හුන්නේය. එකෙණෙහි ඒ මිනිස්සු පා අනුව ලුහුබැඳ එහි ගියාහුය. හේ ඔවුන් දැක බෝධිය ආවර්ජනය කරමින්ම පළා ගොස් භයානක වූ ගිරිදුර්ගයක ප්‍රපාතයට වැටී මිය ගියේය. හේ බෝධිපූජාව සිහිකළ බැවින් ඒ ප්‍රීති සොම්නසින් ම තව්තිසා ආදියෙහි ඉපදී ස කාමාවචර සම්පත්තීන් ද මිනිසුන් අතර මිනිස් සැපද අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසා පහන් සිතැත්තේ පැවිදිව නොබෝ කලකින්ම රහත්වී පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'පරකම්මායනෙ යුත්තෙනා'** යනාදිය කීය. එහි අනුන්ගේ වැඩ පරකම්ම නම්. පරකර්මයන් අයනෙ කිරීමෙහි හෝ **යුත්තෙනා** යොදනු ලැබුවේ වීම් යන අර්ථයි. සෙස්ස ප්‍රකට ම ය.

තම්බපුප්ඵීය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.153

උදෙනතං සතරංසිව යනාදි වශයෙන් ආයුෂ්මත් වීථිසම්මජ්ජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතීන්හි කරන ලද පින් රැස්

කිරීම් ඇත්තේ ගෘහවාසයෙහි වසන්නේ නුවරවැසියන් සමඟ විථිය සරසා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ විථිය සමකොට එහි කොඩියක් එසවීය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසා ලද සැදැහැ ඇත්තේ බුහුමන් සහිත හදවත ඇත්තේ පැවිදිව ලබන ලද උපසම්පදා ඇත්තේ නොබෝ කලකින් ම රහත් වී තමාගේ පූර්ව කර්මය සිහිකරන්නේ ප්‍රත්‍යක්ෂයෙන් දැන පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'උදෙනතං සතරංසීව' යනාදිය කීය. එහි **උදෙනතං** උඩට යන **සතරංසිං** සියයක් රශ්මි ඇති. **සතරංසි** යනු දේශනා ශීර්ෂ මාත්‍ර නොයෙක් සියදහසක් රශ්මි ඇති සූර්යයා මෙන් යන අර්ථයි. **සතරංසිව භානුමං** යනු **සතරංසිං** සංකුචිත රශ්මි ඇති **භානුමං** ප්‍රභාවත් චන්ද්‍ර මණ්ඩලය මෙන් සම්බුදුරජාණන් වහන්සේ දැක යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

විථිසම්මජ්ජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.154

දෙවපුතෙනාහං සනෙනා යනාදි වශයෙන් ආයුෂ්මත් **කක්කාරු** පුපඵ පූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයන්හි කරන ලද පින් රැස්කිරීම් ඇත්තේ සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බ්‍රාහ්මණ දිව්‍ය පුත්‍රයෙක්ව ඉපිද සිබී සම්බුදුරජාණන් වහන්සේ දැක දිව්‍ය කක්කාරු මලක් ගෙන පූජා කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ **තිස්එකක්** කල්ප අභ්‍යන්තරයෙහි උභය සැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදුණේ පැවිදිව නොබෝ කලකින්ම රහත්වී තමාගේ පූර්වකර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැන හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'දෙවපුතෙනා අහං සනෙනා'** යනාදිය කීය. එහි **දිබ්බනති** පංචකාම ගුණයන් සමඟ ක්‍රීඩා කරත්නුයි දේව නම්.

දෙවියන්ගේ පුත්‍රයා වූ දෙවියන් මවු හෝ පුත්‍රයා, මම දේව පුත්‍රයෙක් වූයේ දිව්‍යමය වූ කක්කාරු මලක් ගෙන සිබී භාග්‍යවතුන් වහන්සේට **අභිරෝපයිං** පිදුවෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

කක්කාරු පුප්ඵ පූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.155

දෙවපුත්තෙනා අහං සනෙනා යනාදි වශයෙන් ආයුෂ්මත් මන්දාරව පුප්ඵපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නාහු සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බූමාටු දේව පුත්‍රයෙක්ව ඉපිද සිබී භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැතිව දිව්‍ය මන්දාරව මලින් පූජා කළහ. හේ තෙන පුඤ්ඤන යනාදි සියල්ල අනන්තර තෙරුන් වහන්සේගේ අපදාන වර්ණනාවෙහි කියන ලද පරිදි දතයුත්තේය.

මන්දාරව පුප්ඵපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.156

හිමවන්තසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් කදම්බපුප්ඵිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ **සම්මා සම්බුදුවරුන්ගෙන්** හිස්වූ ලෝකයෙහි එක්තරා කුලයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසයෙහි වෙසෙන්නේ එහි ආදීනව දැක ගෘහවාසය අත්හැර ඍෂි පැවිද්දෙන් පැවිදිව හිමවත සමීපයෙහි කුක්කුට නම් පර්වතයෙහි ආශ්‍රමයක් කොට වාසය කළේය. හේ එහි පසේබුදුවරුන් සත්නමක් දැක

පහන් සිතැත්තේ පිපුණු [1]කොලොම් මලක් කඩා පසේ බුදුවරුන් පිදුවේය. උන්වහන්සේලා ද **'ඉච්ඡිතංපෙත්තිතං'** ආදී අනුමෝදනාව කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත්වී පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'හිමවනතසස අවිදූරෙ'** යනාදිය කීය. එය කියන ලද අරුත් ඇත්තේ ම ය. **කුකකුටො නාම පබබතො** යනු එහි දෙපැත්තෙහිම කුකුල් කරමලයක ආකාරයෙන් පවිකුළු පෙනෙන බැවින් කුක්කුට යයි ප්‍රසිද්ධියට ගියේ ක්‍රමයෙන් හරස්ව පිහිටානුයි පබබතො. **තමහි පබබත පාදමහි** යනු ඒ පර්වතය සමීපයෙහි. **සත්තබුද්ධාවසනනි** යනු පසේ බුදුවරුන් සත්නමක් ඒ කුක්කුට පර්වත පාදයෙහි පන්සලෙහි වසත් යන අර්ථයි. **දීපරාජංව උගහතං** යනු දීපයන්ට රජනුයි දීපරාජා. සියලු පහන්වලට දැල්වෙන තාරකාවලට රජවූ චන්ද්‍රයා යන අර්ථයි. සියලු ජම්බුද්වීපය, පූර්ව විදේහය, අපරගොයානය, උතුරුකුරු සංඛ්‍යාත වූ සතර දිවයින්වලද ආලෝකය පතුරුවන හෙයින් චන්ද්‍රයා **දීපරාජ** යයි කියනු ලැබේ. ඒ අහසෙහි නැගුණු චන්ද්‍රයා මෙන් **සුපුපඵිතං** පිපුණු කොලොම් ගසක් දැක එයින් මල් නෙලා දෝතින් පගයහ ගෙන සත් පසේ බුදුවරුන් වෙත **සමොකිරිං** මනාසේ විසුරුවෙමි. ආදරයෙන් පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

කදම්බපුප්ඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.157

හිමවනතසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් තිණසුළක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද පින් රැස්කිරීම් ඇත්තාහු උපනුපන් භවයෙහි කුසල් රැස්කරන්නාහු සිබී භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද ගෘහවාසය තබා එහි දොස් දැක එය අත්හැර තවුස් පැවිද්දෙන් පැවිදිව

1 කදම්බ - කොළොම්, බක් මී, පළොල් ගස්

වසන්නාහු හිමවත සමීපයෙහි භූතගණ නම් පර්වතයෙහි වසන්නා වූ හුදෙකලාව විවේකය විඳින්නා වූ සිබී සම්බුදුරජාණන් වහන්සේ දැක පහන් සිතැත්තාහු තිණසුළ මල් ගෙන පාමුල පිදූහ. බුදුරජාණන් වහන්සේද ඔහුට අනුමෝදනාව කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද වැඩිවිය පත්ව සසුනෙහි පැහැදුණේ පැවිදිව උපනිශ්‍රය සම්පත් ඇති බැවින් නොබෝ කලකින්ම රහත්බවට පැමිණ පූර්වකර්මය සිහිකොට සොමනසට පැමිණියේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'හිමවනතසස අවිදූරෙ' යනාදිය කීය. **භූතගණොනාම පබ්බතො** යනු **භූතගණානං** දෙවියන්ට හා යකුන්ට නිවාස වූ බැවින් භවනයක් සමාන වූ බැවින්ද නැගී සිටිනා බැවින් පවත්නා බැවින්ද භූත ගණ නම් පර්වතය. එහි **එකො** දෙවැනියකු නැතිව. ජිනො යනු මරුන් දිනූ බුදුරජාණන් වහන්සේ. **වසතෙ** දිව්‍ය බ්‍රහ්ම ආර්ය ඊර්‍ය්‍යාපථ විහාරයෙන් වාසය කරති යන අර්ථයි. **එකුන සත සහසස කපපං න විනිපාතිකො** යනු ඒ තිණසුල මල් පූජා කිරීමේ විපාකයක් වශයෙන් නිරතුරුව එකක් අඩු සියදහස් කල්පයන් විනාශ නොකරන්නේ සිව් උපායෙන් විනිර්මුක්ත වූයේ සම්පත්ති භවයට පැමිණියේ විය යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

තිණසුළක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.158

සුවච්ඡො නාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් නාගපුප්ඵිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව වේදත්‍රයාදී ස්වකීය ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණ එහි හරයක් නොදැක හිමවතට පිවිස තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යාන සමාපත්ති සුඛයෙන් දවස් ගෙවූහ. එසමයෙහි පදුමුත්තර නම් භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස එහි වැඩි සේක. ඒ තවුසා ඒ භාග්‍යවතුන්

වහන්සේ දැක ලක්ෂණ ශාස්ත්‍රයෙහි දක්ෂ බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ලක්ෂණ රූප සම්පත් දැක පැහැදුණේ වැඳ ඇඳිලි බැඳ සිටියේය. අහසින් නොබට බැවින් පූජාසත්කාර නොකරන ලද කල්හිම අහසින් වැඩි සේක. ඉක්බිති ඒ තවුසා ශිෂ්‍යයන් සහිතව නාමල් කඩා ඒ මලින් භාග්‍යවතුන් වහන්සේ වැඩි දිශාභාගයෙහි මාර්ගයට පූජා කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභව කරන්නේ සියලු තන්හි පූජිත වූයේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත් නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව සැදැහැවත් වූයේ පැවිදිව වත්පිළිවෙතින් සසුන බබලවන්නේ නොබෝ කලකින්ම රහත්වී කුමන කුසල කර්මයකින් මා විසින් මේ ලෝකෝත්තර සම්පත්තිය ලබන ලද්දේදැයි අතීත කර්මය සිහිකරන්නේ පූර්ව කර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'සුවච්ඡෝ නාම නාමෙන'** යනාදිය කීය. එහි වච්ඡ ගෝත්‍රයෙහි උපන් බැවින් වච්ඡගොත්ත නම්. සුන්දර වූයේද වච්ඡවූයේද සුවච්ඡ නම් බ්‍රාහ්මණයා **මන්තපාරගූ** වේදත්‍රය ආදී සකල මන්ත්‍ර ශාස්ත්‍රයෙහි කෙළවරට පත්වූයේය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

නාගපුජ්ජිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.159

කානනං වන මොගයහ යනාදි වශයෙන් ආයුෂ්මත් පුනනාග පුජ්ජිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ ඵුස්ස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වැදිකුලයෙහි ඉපිද මහා වනයට පිවිසියේ එහි මැනවින් පිපුණු දොඹමලක් දැක හේතුසම්පත් ඇති බැවින් බුද්ධාලම්බන ප්‍රීතිය නිසා භාග්‍යවතුන් වහන්සේ සිහිකොට ඒ මල්කිනිති නෙළා වැලිවලින් චෛත්‍යයක් කොට පූජා කළේය. හේ ඒ පිනින් කල්ප අනූදෙකක් නිරන්තරයෙන් දෙවිමිනිස් සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර විභව සම්පත් ඇති කුලයක ඉපිද වැඩිවිය පත් ව

පෙර වාසනා බලයෙන් සසුනෙහි පැහැදුණේ පැවිදි ව වෑයම් කරන්නේ නොබෝ කලකින් ම රහත් වී පෙර කරන ලද කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'කානනං වන මොගගයහ' යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

පුනනාග පුප්ඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.160

හිමවනතසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් කුමුදදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු නොයෙක් භවයන්හි පින් රැස් කරන්නාහු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත අසල මහා ජාතස්සරයක කකුධ නම් පක්ෂියෙක් ව ඉපිද කිසියම් අකුසලයකින් පක්ෂියකු සමාන වුවත් පෙර කරන ලද පිනින් බුද්ධිමත් වූවාහු පිනෙහි දක්ෂ වූවාහු සිල්වත් වූවාහු පණැති ගොදුරින් වෙන්වූහ. එසමයෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ අහසින් වැඩ ඔහුගේ සමීපයේ සක්මන් කරන සේක. ඉක්බිති ඒ පක්ෂියා භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ කුමුදමලක් ඩැහැගෙන භාග්‍යවතුන් වහන්සේගේ පාමුල පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සොම්නස උපදවනු පිණිස පිළිගෙන අනුමෝදනාව කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර උභය සැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක්තරා කුලයක ඉපිද වැඩිවිය පත් ව මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ තෙරුවන්හි පැහැදුණේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් වී තමාගේ පූර්වකර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැන හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'හිමවනතසසාවිදූරෙ' යනාදිය කීය. **පදුමුපල සඤ්ඡනෙනා** යනු සියපතින් සම්පූර්ණ වූ සුදු නෙළුම් ද නිල් රතු සුදු උපුල් ද **පදුමුපලානි** නම්. එයින් **සඤ්ඡනෙනා** ගහණ වූයේ

සම්පූර්ණ වූ මහා ජාතස්සරයක් විය යන අර්ථයි. **පුණ්ඩරික සමොහථොා** යනු **පුණ්ඩරිකෙහි** රන් පිසුමෙන් **ඔකිණ්ණා** සම්පූර්ණ වූයේ යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේමය.

කුමුදදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දහසයවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.161

පදුමො නාම නාමෙන යනාදි වශයෙන් ආයුෂ්මත් සුපාරිවරිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි යක් යෝනියෙහි ඉපිද හිමාලයෙහි යක්ෂ සමාගමට ගියේ භාග්‍යවතුන් වහන්සේ දේව යක්ෂ ගාන්ධර්ව නාගයින්ට කළ ධර්මදේශනාව අසා පහන් සිතැත්තේ දෑත් හකුලා අත්පොළසන් දුන්නේ ය. නමස්කාර ද කළේය. හේ ඒ පිනින් එයින් චුතව ඉහළ දෙව්ලොවක ඉපිද එහි දිව්‍ය සම්පත් අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවත්නුවර කුලගෙයක ඉපිද ආඪ්‍ය වූයේ මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ තෙරුවන්හි පැහැදුණේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා හටගත් සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත්බවට පත්විය. උන්වහන්සේ එක් දවසක් තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පදුමොනාම නාමෙන'** යනාදිය කීහ. එහි **පදුමො** යනු යමකුගේ පාද තබන කල්හි පොළොව බිඳගෙන නෙළුම් පැනනැඟී පාදතලය පිළිගනීද ඒ සංග්‍රහයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ පදුම යයි ප්‍රසිද්ධ වූ සේක. මෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ අභිප්‍රේතය. ඒ භාග්‍යවතුන් වහන්සේ **පවනා** වසන විහාරයෙන් නික්ම වන මැදට පිවිස ධර්මය දේශනා කරන සේක යනු සම්බන්ධයි. **යක්ඛානං සමයො** යනු

දේව සමාගම ආසි විය යන අර්ථයි. අජ්ඣාපෙක්ඛිංසු තාවදෙ යනු ඒ දේශනාව අවස්ථාවෙහි අතිශයින් අපේක්ෂා කළහ. විශේෂයෙන් දකිනසුලු වූහ යන අර්ථයි. සෙස්ස ප්‍රකට ම ය.

සුපාරිචරිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.162

සිද්ධත්ථො නාම භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් කණවෙර පුප්ඵිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ශුද්‍ර කුලයෙහි ඉපිද වැඩිවිය පත් ව රජුගේ අන්තඃපුර පාලකයා විය. එසමයෙහි සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා රජවිදියට පිළිපන් සේක. ඉක්බිති ඒ අන්තඃපුර පාලකයා ඇවිදින භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේව කණේරු මලකින් භාග්‍යවතුන් වහන්සේ පුදා නමස්කාර කරමින් සිටියේය. හේ ඒ පිනින් සුගති සම්පත්ම අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ පැමිණි අග්‍රඵල ඇත්තාහු පෙර කරන ලද කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'සිද්ධත්ථො නාම භගවා' යනාදිය කීහ. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

කණවෙරපුප්ඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.163

තිස්සස්ස ඛො භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් ඛජ්ජදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි

කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ශුද්ධ කුලයෙහි ඉපිද භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ අඹදඹ ආදී මිහිරි කුදුමහත් පලද නෙරළු ද කැවුම් ද දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ප්‍රසාදය වර්ධනය කරනු සඳහා බලා සිටියදීම වැළඳූ සේක. හේ ඒ පිනින් සුගති සම්පත්ම අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා හටගත් සැදැහැ ඇත්තේ ප්‍රසාද බහුමාන ඇත්තේ පැවිදි ව වත් පිළිවෙතින් සසුන බබුළුවන්නේ සිල් අබරණින් සැරසුණේ නොබෝ කලකින්ම රහත්බවට පත්විය. උන්වහන්සේ පූර්ව කර්මය සිහි කරන්නාහු පෙර මා විසින් යහපත් කෙතක කරන ලද කුසලය සුන්දර යයි හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'තිසසසස බො භගවතො'** යනාදිය කීහ. එහි **තිසෙසා** යනු භාග්‍යවතුන් වහන්සේ සම්පත් දෙමින් උපන්නේනුයි මව්පියන් විසින් දෙන ලද නම් වශයෙන් තිසස නම්. නැතහොත් තුන් සරණාගමනයෙන් අස්වසන්නේ අවවාද දෙන්නේ හේතුසම්පත් ඇති පුද්ගලයන් සගමොක් දෙකෙහි පිහිටුවමින් උපන්නේනුයි තිසස නම්. සමාපත්ති සුබ ආදී වාසනාවන්ගෙන් යුක්තනුයි භගවා නම්. ඒ තිසස භාග්‍යවතුන් වහන්සේට මම පෙර පල දුනිමි යන අර්ථයි. **නාලිකෙරඤ්ච අදාසිං** යනු නාලිකාකාරයෙන් පැවැති ඵල නාලිකෝර ඵලනම් එය ද දුනිමි යන අර්ථයි. **බජ්ජකං අභිසම්මතං** යනු කෑයුතු දෙය බජ්ජක නම්. විශ්වාසයෙන් මීපැණි හකුරු ආදියෙන් මිශ්‍රකොට නිපදවන ලද මධුර යයි සුන්දරයයි **සම්මතං** දත්, අභිසම්මත වූ කැවිලි දුනිමි සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

බජ්ජදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.164

අත්ථදසසිතු භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් දෙසපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නාහු

අපඨදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව සැදැහැ ඇත්තාහු රත්නත්‍රය මාමක වූවාහු එකල්හි අපඨදසසි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා විසින් පිරිවරන ලද සේක් චන්ද්‍රයා මෙන් ද සූර්යයා මෙන්ද අහසින් වඩනා සේක. ඒ උපාසකයා භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ දිසාභාගය සුවඳමල් ආදියෙන් පූජා කරන්නේ ඇඳිලි බැඳ නමස්කාර කරමින් සිටියේය. හේ ඒ පිනින් දෙව්ලොව ඉපිද ස්වර්ග සම්පත් අනුභවකොට මිනිසුන් අතර ද මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයක ඉපිද වැඩිවිය පත්වූයේ උපභෝග පරිභෝග සම්පත් ඇත්තේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ ගෘහවාසයෙහි නොඇලුණේ පැවිදි ව වත් සහිත වූයේ නොබෝ කලකින් රහත්වී තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'අපඨදසසිතු භගවා' යනාදිය කීය. එය යට කියන ලද අරුත් ඇත්තේමය. **අනිලඤ්ජසෙ** යනු මඟ පන්ථ පථ අඤ්ජස වටුමායන යන පර්යායයෙන් කියන ලද බැවින් අනිලඤ්ජස නම්. ඒ **අනිලඤ්ජසෙ** අහසෙහි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

දෙසපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.165

වෙසසභු නාම සම්බුද්ධො යනාදි වශයෙන් ආයුෂ්මත් කණිකාර ඡදනිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ වෙසසභු භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ සැදැහැ ඇත්තේ විය. එසමයෙහි වෙසසභු භාග්‍යවතුන් වහන්සේ විවේක කැමති සේක් මහවනයට පිවිස වැඩහුන් සේක. ඉක්බිති ඒ උපාසකයා ද කිසියම් කටයුත්තක් සඳහා එහි ගොස් ගිනිකඳක් මෙන් බබලමින් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ කිණිහිරි මලක් නෙළා ඡත්‍රයක් කොට භාග්‍යවතුන් වහන්සේ

වැඩහුන් තැන වියනක් තනා පූජා කළේය. එය භාග්‍යවතුන් වහන්සේගේ අනුභසින් සත්දිනක් නොමැළ වී එහි තිබිණ. භාග්‍යවතුන් වහන්සේද පලසමවතට සහ නිරෝධ සමාපත්තියට සමවැද වාසය කළ සේක. හේ ඒ අසිරිය දැක හටගත් සොම්නස් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වැඳ ඇදිලිබැඳ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ සමාපත්තියෙන් නැගිට විහාරයටම වැඩම කළ සේක. හේ ඒ පිනින් දෙව්මිනිස් සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත් ව සැදැහැ ඇත්තේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ගෘහවාසයෙහි නොඇලුණේ පැවිදිව වත්පිළිවෙතින් බුදුසසුන බබුළුවන්නේ නොබෝ කලකින්ම රහත් වී තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'වෙසභූනාම සම්බුදෙධා' යනාදිය කීය. එහි වෙසභූ යනු වෛශ්‍ය ජනයා භූනාති අභිභවනය කෙරේනුයි වෙසභූ නම්. නැතහොත් වෙසෙස පස්මරුන් අභිභූනාති අභිභවනය කෙරේනුයි වෙසභූ නම්. තමාම සත්‍යයන් අවබෝධ කරගත්තේනුයි සම්බුදෙධා නම් නමින් වෙස්සභූ නම් සම්බුදුරජාණන් වහන්සේ යන අර්ථයි. දිවාවිහාරාය මුනී යනු දිබබනි බබුළුවයි, ඒ ඒ වස්තුව ප්‍රකට කෙරේනුයි දිවා නම්. සූර්යෝදයෙහි පටන් අස්තයට යාම තෙක් පිරිසිදි කාලයයි, විහරණං ඉරියව්වලින් පැවැත්ම විහාර නම්. දිවා කාලයෙහි විහරණය දිවා විහාරයයි. ඒ සතර ඉරියව්වෙන් ලෝකයට ජ්‍යෙෂ්ඨ වූ නරාසභ වූ බුද්ධ මුනිතුමා දිවා විහාරය පිණිස ඔගාහිත්වා පිවිස යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

කණිකාරඡදනිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.166

ඵුසෙසා නාම භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් සපපිදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ ඵුසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා විසින් පිරිවරනු ලදුව වීදියෙහි ඇවිදිනසේක් ඒ උපාසකයාගේ ගෙදරට වැඩි සේක. ඉක්බිති ඒ උපාසකයා

භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ වැඳ පාත්‍රය පුරා ගිතෙල්ද තෙල්ද දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා වදාරා වැඩි සේක. හේ ඒ සොම්නසින්ම දිවි ඇති තෙක් සිට එයින් චුතවූයේ ඒ පිනින් දෙව්ලොව ඉපිද එහි දිවසුව අනුභවකොට මිනිසුන් අතර ද ඉපිද උපනුපන් භවයෙහි ගිතෙල් තෙල් මීපැණි හකුරු ආදී මිහිරි අහර සුව අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර එක් කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ සැදැහැ ඇත්තේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ පැවිදි ව වත් සම්පන්න වූයේ නොබෝ කලකින් රහත් විය. උන්වහන්සේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'ථූසෙසා නාම නාමෙන' යනාදිය කීහ. එහි ථූසෙසා යනු පුස නැකැත් යෝගයෙන් උපන් බැවින් මව්පියන් විසින් තබන ලද නාමයක් ඇති හෙයින් ථූසෙසා නමී. නැතහොත් නිර්වාණය ථූසි දුටුවේය. සාක්ෂාත් කෙළේනුයි ථූසෙසා නමී. නැතහොත් සමත්‍රිංශත් පාරමිතා, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම හා සියලු ත්‍රිපිටක සහිත පර්‍යාප්ති ධර්මයන් ථූසි දුටුවේනුයි දැනගත්තේනුයි ථූසෙසා නමී. භගවා භාග්‍ය ඇත්තේනුයි භගවා නමී. ආහුතී යනු පූජා සත්කාර යයි කියනු ලැබේ. ඒ පූජා සත්කාර පිළිගැනීමට සුදුසු වේනුයි ආහුතිනං පටිගගහො නමී. මහජනයා නිවමින් වීර වූ ථූසස නම් භාග්‍යවතුන් වහන්සේ විදියෙහි වඩනා සේක. ඉක්බිති එකල්හි වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේගේ යනු සම්බන්ධයි. සෙස්ස ප්‍රකට ම ය.

සපපිදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.167

චන්දභාගා නදීතීරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් යුථිකාපුත්‍රපථිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු නොයෙක් සියගණන් ජාතිවල නිවනට හේතුවන පින් රැස්කරන්නාහු ථූස්ස භාග්‍යවතුන් වහන්සේගේම කාලයෙහි ශුද්‍ර කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූවාහු චන්දභාගා නදී තෙර කිසියම් දේවක්‍රියාවකින් යටගං බලා හැසිරෙන්නාහු පැන් සනහනු කැමති ථූසස භාග්‍යවතුන් වහන්සේ ගිනිකඳක් මෙන් දිදුලනු

දැක හටගත් සොම්නස් ඇත්තාහු එහි හටගත් සමන්මලක් නෙළා භාග්‍යවතුන් වහන්සේ පිදූහ. භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුමෝදනා කළ සේක. හේ එහි ඒ පින් කොටසින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ පැවිදිව වත්පිළිවෙතින් සසුන බබුළුවන්නේ නොබෝ කලකින්ම රහත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'වඤ්ඣාගා නදී තීරේ'** යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

යුථිකාපුප්ඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.168

තීවරායං පුරෙ රමෙම යනාදි වශයෙන් ආයුෂ්මත් දුසසදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ ආයුෂ්මතුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තාහු භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නාහු සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි රජ කුලයෙහි ඉපිද වැඩිවිය පත් කල්හි යුවරජ බවට පත්ව ප්‍රකට වූවාහු මෙසේ ජනපදයක් ලැබ එහි අධිපති වී සියලු ජනපදවාසීන්ට දාන ප්‍රියවචන අර්ථචර්යා සමානාත්මතා සංඛ්‍යාත සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කෙරෙත්. එසමයෙහි සිද්ධත්ථ නම් භාග්‍යවතුන් වහන්සේ ඒ ජනපදයට සපැමිණි සේක. ඉක්බිති ඒ යුවරජ තෙමේ පණිවුඩයක් ලැබ එහිදී සියුම් වස්ත්‍රයෙන් භාග්‍යවතුන් වහන්සේ පිදීය. භාග්‍යවතුන් වහන්සේ එය අතින් පිරිමැද අහසට පැන නැඟි සේක. ඒ වස්ත්‍රයද භාග්‍යවතුන් වහන්සේ අනුවම ගියේය. ඉක්බිති ඒ යුවරජ තෙමේ ඒ අසිරිය දැක අතිශයින් පැහැදුණේ ඇඳිලිබැඳ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ පැමිණි පැමිණි තැන සියලු ජනයෝ ඒ අසිරිය දැක ආශ්චර්ය අද්භූත සිත් ඇත්තෝ ඇඳිලිබැඳ සිටියාහුය. භාග්‍යවතුන් වහන්සේ විහාරයටම වැඩි සේක. යුවරජ තෙමේ ඒ කුසල කර්මයෙන්ම එයින් චුතවූයේ දෙව්ලොව ඉපිද එහි දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති

එක් කුලයක ඉපදී දැනමිති බවට පත්වූයේ ගෘහවාසය තබා තෙරුවන්හි පැහැදුණේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව වෑයම් කරන්නේ නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ එක් දවසක් තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'තිවරායං පුරෙ රමෙම'** යනාදිය කීහ. එහි තිවරා නම් නගරයෙහි මම රමණීය වූ රාජපුත්‍රයෙක් ව සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ වස්ත්‍රයකින් පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

දුස්සදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.169

නගරෙ බන්ධුමතියා යනාදි වශයෙන් ආයුෂ්මත් සමාදපක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරුන් වහන්සේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල් සම්භාර ඇත්තාහු නොයෙක් භවයන්හි පින් රැස් කරන්නාහු විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසය තබා පින් කරන්නාහු සැදැහැත්තාහු පැහැදුණාහු බොහෝ උපාසකයන් රැස්කරවා ගණ්ඩජ්‍යෝෂ්ඨව මළුවක් කරන්නෙමුයි ඒ සියලුදෙන සමාදන්කොට එක් මළුවක් සමකොට සුදුවැලි ඉස භාග්‍යවතුන් වහන්සේට පැවරූහ. හේ ඒ පිනින් දෙව්ලොව උපන්නේ ස කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුණේ ධර්මය අසා පහන් සිතැත්තේ සැදැහැ ඇත්තේ පැවිදි ව සිල්වත් වූයේ නොබෝ කලකින්ම රහත්බවට පැමිණියේය. උන්වහන්සේ පසුකලක තමා විසින් කරන ලද කුසල කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'නගරෙ බන්ධුමතියා'** යනාදිය කීහ. එහි **බන්‍ධනති** ඥාතිගෝත්‍ර ආදී වශයෙන් සියලු නගරවාසීහු එකට සම්බන්ධ වෙතියි බන්ධු නම්. මෙහි බන්ධුහු ඇත්නුයි බන්ධුමති. ඒ බන්ධුමති නගරයෙහි. **මහාපුගගණො** උපාසක සමූහය යන අර්ථයි. **මාලං කසසාමි සඨසස** යනු මෙහි **මාති**

පැමිණි පැමිණි ජනයන්ගේ සිත ගනිනුයි මාලං නම්. මාලයම මාලක වේ. භික්ෂු සංඝයාගේ පහසු විහරණය සඳහා මාලකයක් කරන්නෙමු යන අර්ථයි. සෙස්ස ප්‍රකටමය.

සමාදපක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.171

තිසෙසා නාමාසි භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් පඤ්චඩඟුලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ තිසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලයක ඉපිද වැඩිවිය පත් ව ගෘහවාසය තබා විභව සම්පත් ඇත්තේ විදියෙන් විහාරයට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ දැක දෑසමන් ආදී නොයෙක් සුවඳමල් චන්දන ආදී විලේපනද ගෙන්වාගෙන විහාරයට ගියේ මලින් භාග්‍යවතුන් වහන්සේ පුදා විලේපනයන්ගෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි පසැඟිලි සලකුණු කොට වැඳ ගියේය. හේ ඒ පිනින් දෙව්මිනිසුන් අතර උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද වැඩිවිය පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ පැවිදිව විදසුන් වඩා නොබෝ කලකින්ම රහත්වී පූර්ව කර්මය සිහි කරන්නේ ප්‍රත්‍යක්ෂයෙන් දැන මෙනම් කුසලයක් කොට මෙබඳු ලොව්තුරා සම්පත්තියකට පැමිණියේ වෙමියි පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'තිසෙසා නාමාති භගවා'** යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේමය.

පඤ්චඩඟුලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දහහත්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.171

පබ්බතෙ හිමවන්තමහි යනාදි වශයෙන් ආයුෂ්මත් කුමුදමාලිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනමද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ අත්‍යදසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හිමවත් පව්ව සමීපයෙහි මහා ජාතස්සරය ආසන්නයෙහි රාක්ෂසයෙක් ව ඉපිද අත්‍යදසසි භාග්‍යවතුන් වහන්සේ එහි පැමිණ සිටිනු දැක පහන් සිතැත්තේ කුමුදමල් නෙළා භාග්‍යවතුන් වහන්සේ පිදීය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කොට වැඩි සේක. හේ ඒ පිනින් එයින් චුතව දෙව්ලොව ඉපිද ස කාමාවචර සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ තෙරුවන්හි පැහැදුණේ පැවිදිව වෑයම් කරන්නේ බ්‍රහ්මචර්යය අවසන්කොට ඇති රහත්බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'පබ්බතෙ හිමවන්තමහි' යනාදිය කීය. **තත්‍රජො රක්ඛසො ආසිං** යනු ඒ ජාතස්සර සමීපයෙහි **ජාතො** උපන්නේ **රක්ඛසො** අනුන්ගේ ලේ මස් කන්නා වූ නිර්දය වූ සෝර වූ රූපයක් ඇති භයානක ස්වභාවයක් ඇති මහාබල ඇති මහා ශක්තියක් ඇති කර්කශ වූ යකෙක් ආසිං වීමි යන අර්ථයි. **කුමුද පුප්ඵකෙ තත්‍ර** යනු ඒ මහා විලෙහි හිරුරැස් නැති කල්හි සවස් කාලයෙහි. **මුකුලිතං** පිළිකුල් අයුරින් **නිපජ්ජහං** අවර්ණ වේනුයි කුමුදයයි ලද නම් ඇති මල පුප්ඵතෙ විකසිත වේයයි යන අර්ථයි. **චක්කමත්තානි ජායරෙ** යනු ඒ මල් රියසක් පමණ වී හටගනී යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

කුමුදමාලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.172

කොණ්ඩඤ්ඤස්ස භගවතො යනාදි වශයෙන් ආයුෂ්මත් නිසෙසණි දායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් ජාතීන්හි නිවනට හේතු

වූ පින් රැස් කරන්නේ කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වඩු කුලයෙහි ඉපදී සැදැහැ ඇත්තේ පැහැදුණේ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා පහන් සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රාසාදයට නැගීම පිණිස ලී අරටුවෙන් ඉණිමගක් කොට ඔසවා තැබීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ප්‍රසාදය වඩනු පිණිස බලා සිටියදීම පහය උඩට නැගි සේක. හේ අතිශයින් පැහැදුණේ ඒ ප්‍රීති සොම්නසින්ම කලුරියකොට දෙව්ලොව ඉපිද එහි දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතර ඉපදෙන්නේ ඉණිමං දන්දීමේ හේතුවෙන් උසස් කුලයක උපන්නේ මිනිස් සුව අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයක ඉපිද ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසා පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'කොණ්ඩඤ්ඤසස භගවතො'** යනාදිය කීහ. එහි **කොණ්ඩඤ්ඤසස** යනු පිළිකුල් ව **ඩෙති** පවතීනුයි **කොණ්ඩා** ලාමක සත්වයා. ලාමක සත්වයාගෙන් අන්‍ය වූයේ කොණ්ඩඤ්ඤ නමි. අලාමක උත්තම පුරුෂයා යන අර්ථයි. නැතහොත් බ්‍රාහ්මණ ගෝත්‍රයෙහි උපන්නේ කොණ්ඩඤ්ඤ යයි ගෝත්‍ර වශයෙන් උන්වහන්සේගේ නමයි. ඒ කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේගේ සෙස්ස ප්‍රකටමය.

නිසෙසණීදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.173

මිගලුදෙදාපුරෙ ආසිං යනාදි වශයෙන් ආයුෂ්මත් රත්තිපුපදීය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස් කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි වැදි කුලයෙහි ඉපිද මිගදාය අරණ්‍යයෙහි හැසිරෙයි. එකල්හි ඔහුට කරුණාවෙන් අරණ්‍යයෙහි හැසිරෙන විපසසි භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ පිපුණු රත්තික නමැති මලක් ද කුටජ මලක් ද නටුව සමග නෙළා සොම්නසින් පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කොට වැඩි සේක. හේ ඒ පිනින්ම දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ උභය

සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ තෙරුවන්හි පැහැදී ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා කාමයන්හි ආදීනව දැක පැවිදිව නොබෝ කලකින්ම රහත් බවට පත්වූයේ තමාගේ පූර්ව කර්මය සිහිකොට වැදි කුලයෙහි උපන් මා විසින් කරන ලද කුසලය සුන්දරයයි හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'මිගලුද්දෝ පුරෙ ආසිං' යනාදිය කීය. එහි මුවන්ගේ ලුද්දෝ සාහසිකයාද මාරයාදනුයි මිගලුද්දෝ නම්. මුවන් කෙරෙහි හෝ ලුද්දෝ ලෝභී වූයේ මිගලුද්දෝ. වැද්දෙක් ආසිං පෙර වීමි යන අර්ථයි. රතනිකං පුපඵිතං දිසවා යනු නෙළුම්මල් ආදි නොයෙක් මල් සූර්ය රශ්මිය ස්පර්ශ කිරීමෙන් දිවා කාලයෙහි පිපෙයි. රාත්‍රියෙහි මුකුලිත වෙයි. දැසමන් මල්ලිකා ආදී නොයෙක් මල් රාත්‍රියෙහි පිපෙයි දවල් කාලයෙහි නොවේ. ඒ නිසා රාත්‍රියෙහි පිපෙන බැවින් රැ මල් නමින් යුතු නොයෙක් සුවඳ මල් ද කුටජ මල් ද ගෙන පිදුවෙමි යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

රතනිපුපඵිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.174

විපසසිනො භගවතො ආදි වශයෙන් ආයුෂ්මත් උදපානදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනම ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ නොයෙක් භවයන්හි කරන ලද පින් රැස් කිරීම් ඇත්තේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ මා විසින් පැන් දන් දීමක් කළ යුතුය. එයද නිරතුරු කොට පැවැත්වීමට වටී යයි සිතා එක් ළිඳක් කණවා ජලය සහිත කාලයෙහි උළු ගොඩගසා එහි උඩට ආ ජලයෙන් පිරුණු ඒ ළිඳ විපසසි භාග්‍යවතුන් වහන්සේට පවරා දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පැන් දන්දීම දැක්වෙන අනුමෝදනාවක් කළ සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උපනුපන් තන්හි පොකුණුළිං පිය යුතු දෑ ආදියෙන් යුක්ත වූයේ සැප අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයෙක ඉපිද වැඩිවිය පත් ව සැදැහැ ඇත්තේ පැහැදුණේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. හේ පසුකලෙක තමාගේ පූර්ව කර්මය

සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'විපසෙසිනො භගවතො'** යනාදිය කීය. එහි **උදපානො කතො මයා** යනු මෙහි පැන් බොන්නුයි උදපානො, ළිංපොකුණු තඩාගවලට මෙය සමාන වචනයකි. ඒ **උදපානො** ළිඳ විපසසි භාග්‍යවතුන් වහන්සේ සඳහා **කතො** කණින ලද්දේය යන අර්ථයි. සෙස්ස පොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

උදපානදායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.175

නිබ්බුතෙ ලොකනාථම්හි යනාදි වශයෙන් ආයුෂ්මත් සීහාසනදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන නිර්වාණය අවබෝධ කිරීම පිණිස කරන ලද පුණ්‍ය ප්‍රත්‍ය ඇත්තේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගෘහපති කුලයෙහි ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා තෙරුවන්හි පැහැදුණේ ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි සත්රුවනින් කැටයම් කළ සිංහාසනයක් කරවා බෝධිවෘක්ෂය පිදුවේය. බොහෝ මල්ගඳ දුමින් ද පිදුවේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට සැමතන්හි පූජිත වූයේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසයෙහි වසන්නේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා පහන් සිතැත්තේ ඥාතිවර්ගයා හැර පැවිදි ව නොබෝ කලකින්ම රහත් වී පෙර රැස්කළ පුණ්‍ය සම්භාරය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'නිබ්බුතෙ ලොකනාථම්හි'** යනාදිය කීය. එහි **සීහාසන මදාසිං** යනු සිංහරූප රන්රුවනින් කැටයම් කළ ආසනය සීහාසන නම්. සිංහයකුගේ හෝ ආශ්චර්යවත් භාග්‍යවතුන් වහන්සේගේ වැඩහිඳීමට සුදුසු වූ හෝ ශ්‍රේෂ්ඨ වූ උත්තම වූ ආසන නුයි සීහාසන වේ. එය මම දුනිමි. බෝධිවෘක්ෂය පිදුවෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

සීහාසනදායක තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.176

අනොමදසසි භගවා යනාදි වශයෙන් ආයුෂ්මත් මගඳදතතික තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ භික්‍ෂුවද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්ව ගෘහවාසය තබා වසන්නේ අනොමදස්සි භාග්‍යවතුන් වහන්සේ අහසෙහි සක්මන් කරනුද පාඔසවනවිට සක්මන් කරන ස්ථානයෙහි මල් විසිරෙන අසිරියද දැක පහන් සිතැත්තේ අහසෙහි මල් ඔසවා තැබීය. ඒවා වියනක්ව සිටියේය. හේ ඒ පිනින් සුගතීන්හිම සැරිසරන්නේ සැමතන්හි පූජිත වූයේ සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි එක් කුලයක ඉපිද ක්‍රමයෙන් යෞවනයට පැමිණ සැදැහැ ඇත්තේ පැවිදි ව පිනින් යුක්ත වූයේ නොබෝ කලකින්ම රහත් බවට පැමිණියේ සක්මන පුදන ලද බැවින් මගඳදතතික තෙරුන් වහන්සේ යයි ප්‍රකට විය. උන්වහන්සේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'අනොමදසසි භගවා'** යනාදිය කීය. **දිට්ඨධම්ම සුඛත්‍ථාය** යනු මේ ආත්මභාවයෙහි ශරීරගත සුඛ ආදී සැප නිසා යන අර්ථයි. **අඛෙභාකාසමහි චඞ්කමිං** යනු අභ්‍යවකාශස්ථ **චඞ්කමිං** පාතැබීම, පද සංචාරය කෙළෙමි යන අර්ථයි. **උදධතෙපාදෙ පුපඵානි** යනු සක්මන් කරන්නහු පාදයන් එසවූ විට නෙළුම් උපුල් ආදී මල් පැනනැගී සක්මනෙහි විසිරිණ යන අර්ථයි. **සොහං මුදධනි තිට්ඨරෙ** යනු බුදුරජාණන් වහන්සේගේ මුදධනි හිසෙහි බබළමින් ඒවා සිටී යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

මගඳදතතික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.177

පදුමුත්තරස්ස මුනිනෝ යනාදි වශයෙන් ආයුෂ්මත් එකදීපිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ භික්ෂුව ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල සම්භාර ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගෘහපති කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූයේ සැදැහැ ඇත්තේ භාග්‍යවතුන් වහන්සේගේ සලලමහා බෝධියෙහි එක් පහනක් පිදීය. ස්ථිරකොට නිතර එක් පහනක් පිදීම පිණිස තෙල්වැට පිහිටවී ය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සැමතන්හි බැබළෙන්නේ ප්‍රසන්න ඇස් ඇත්තේ උභය සැප අනුභව කොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර විභව සම්පත් ඇති එක් කුලයක ඉපිද දැනමිහි බවට පත්වූයේ තෙරුවන්හි පැහැදුණේ පැවිදිවිය. පැවිදි ව නොබෝ කලකින්ම රහත්බවට පත්වූයේ පහන් පූජාවෙන් ලත් විශේෂ අධිගම ඇති බැවින් එකදීපිය තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ පසුකලක තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'පදුමුත්තරස්ස මුනිනෝ'** යනාදිය කීය. ඒ සියල්ල නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

එකදීපිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.178

ඔරෙන හිමවනතසස යනාදි වශයෙන් ආයුෂ්මත් මණිපූජක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනමද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක ඉපිද ගෘහවාසය තබා එහි ආදීනව දැක ගෘහවාසය හැර තවුස් පැවිද්දෙන් පැවිදි ව හිමවතට මෙපිට එක් නදියක් අසබඩ පන්සලක් කරවා වසන්නේ විවේක කැමැත්ත නිසා ද ඔහුට අනුකම්පාව නිසා ද එහි වැඩම කළ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ මැණික් පුටුවක් භාග්‍යවතුන් වහන්සේට පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ප්‍රසාදය වර්ධනය

වනු සඳහා එහි වැඩහුන් සේක. හේ බෙහෙවින් පැහැදුණේ නිර්වාණ අධිගමය පිණිස ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා වදාරා වැඩි සේක. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සැමතන්හි පූජිත වූයේ සැප අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර විභව සම්පත් ඇති කුලයක ඉපිද ගෘහවාසයෙහි වසන්නේ එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝ කලකින්ම රහත් විය. උන්වහන්සේ එක්දවසක් තමා විසින් කරන ලද කුසලය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'ඔරෙන හිමවනතසස' යනාදිය කීහ. එහි **ඔරෙන** යනු හිමවතෙහි අපරභාගය හැර මෙපස ආධාර අර්ථයෙහි කරණ වචනයයි. මේ පස දිශාභාගය යන අර්ථයි. **නදෙකා සමපවත්තථ** යනු අප්‍රකට නමක් ඇති එක් නදියක් මනා සේ පවත්නේ ගලයි, ගලාබසිමින් තිබිණ යන අර්ථයි. **තසසා චානුප ඛෙත්තමහි** ඒ නදියෙහි **අනුපඛෙත්තමහි** තෙර සම්පයෙහි යන අර්ථයි. **සයමභුවසතෙ තදා** යනු යම්කලෙක මම මිණිපලඟ පිදුවෙමිද එකල්හි ගුරුවරයකු නැත්තේව තෙමේ ම බුදු වූ භාග්‍යවතුන් වහන්සේ **වසතෙ** වාසය කරන සේක යන අර්ථයි. **මණිං පගගයහ පලලඞකං මනං නි** චිත්තාරාධනය කෙරේනුයි සොම්නස් කෙරේනුයි මණි. නැතහොත් ආභරණ යනු මණි. රජවරු ආදීහු මැරුණත් එය අත්නොහරිති. ඒ සඳහා සටන් කරත්නුයි මණි. ඒ මැණික. **මිණිපලඟ** මනහරය. **සාධුචිත්තං** මනාසේ විචිත්‍ර වූ සිතින්. **පගගයහ** ගෙන බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේට **ආරොපයිං** පිදුවෙමි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අරුත් ඇත්තේමය.

මණිපූජක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.179

නගරෙ බන්ධුමතියා යනාදි වශයෙන් ආයුෂ්මත් තිකිච්ඡක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ භික්ෂුව ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බන්ධුමතී නගරයෙහි වෙද කුලයක

උපන්නේ බහුශ්‍රැත වූයේ මනා සේ හික්මුණේ වෛද්‍ය කර්මයෙහි දක්ෂ වූයේ බොහෝ රෝගීන්ට ප්‍රතිකාර කරන්නේ විපසසි භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායක අසොක නම් තෙරුන් වහන්සේගේ රෝගයට පිළියම් කළේය. හේ ඒ පිනින් දෙවිමිනිසුන් අතර වරින්වර සැප අනුභව කරන්නේ උපතුපත් භවයෙහි නීරෝගී වූයේ දීර්ඝායුෂ ඇත්තේ රත්වන් සිරුරක් ඇත්තේ විය. මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර ගෘහපති කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව සියලු ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණියේ නීරෝගී වූයේ සැපවත් වූයේ විභව සම්පත් ඇත්තේ තෙරුවන්හි පැහැදුණේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනය අසා ලද සැදැහැ ඇත්තේ ගෘහවාසය හැර පැවිදි ව නොබෝ කලකින්ම රහත් ව පූර්වකර්මය සිහිකොට හටගත් සොමනස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'නගරෙබන්ධුමතියා' යනාදිය කීය. ඒ සියල්ල යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අරුත් ඇත්තේමය.

තිකිච්ඡක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.180

වෙසසභුමහි භගවති යනාදි වශයෙන් ආයුෂ්මත් සංසුපට්ඨාක තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනමද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද කුසල සම්භාර ඇත්තේ නොයෙක් භවයන්හි නිවනට හේතුවන පින් රැස්කරන්නේ වෙසසභු භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ඒ ආරාමිකයාගේ පුත්‍රයා ව ඉපිද දැනමිති බවට පැමිණ ශ්‍රද්ධා ඇත්තේ පැහැදුණේ විහාරයන්හි ආරාමික කර්මය කරන්නේ සකසා සංඝයාට උපස්ථාන කළේය. හේ ඒ කුසල කර්මයෙන් ම දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර ගෘහපති කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූයේ විභව සම්පත් ඇත්තේ සැපවත් වූයේ ප්‍රකට වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසා පැවිදිව සසුනෙහි පැහැදුණේ වත් සම්පන්න වූයේ සසුන බබුළුවන්නේ විදසුන් වඩා නොබෝ කලකින්ම පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියේ ෂට් අභිඥා ඇත්තේ පෙර කරන ලද පින්කම් වශයෙන් සංසුපට්ඨාක

තෙරුන් වහන්සේ යයි ප්‍රකට වූයේ විය. හේ එක් දවසක් පෙර මා විසින් කිනම් කර්මයක් කොට මේ ලොවිතුරා සැපත් ලබන ලද්දේදැයි තමාගේ පූර්ව කර්මය සිහිකොට ප්‍රත්‍යක්ෂයෙන් දැන හටගත් සොම්නස් ඇතිව පූර්වචරිතාපදානය ප්‍රකට කරන්නේ 'වෙසසභූමහි භගවති' යනාදිය කීය. එහි **අහොසාරාමිකො** අහං යනු මම වෙසසභූ භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි ආරාමිකයෙක් වීමි යන අර්ථයි. සෙස්ස යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

සංඝුපට්ඨාක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දහඅටවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

මින්පසුව දහනවවැනි වර්ගයෙහි පැමිණි මේ කූටජ තෙරුන් වහන්සේ ආදී තෙරුන් වහන්සේ දසනමගේ අපූර්වයක් නැත. ඒ තෙරුන් වහන්සේලා පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද පුණ්‍යසම්භාර අනුව ප්‍රකට වූ නම් ඇත්තාහුමය. නිවාස නගර ආදියද යට කියන ලද පරිද්දෙන් දතයුත්තේය. ඒ සියල්ල පහසුවෙන් දත හැක්කේ ම ය.

දහනවවැනි වර්ග වර්ණනාව නිමියේය.

3.181

විසිවැනි වර්ගයෙහි පළමුවැනි තෙරුන් වහන්සේගේ අපදානය නොගැඹුරු ම ය. දෙවැනි තෙරුන් වහන්සේගේ අපදානයෙහි **යං දායවාසිකො ඉසී** යනු ඍෂි පැවිද්දෙන් පැවිදි ව වනයෙහි වසන බැවින් දායවාසික ඍෂි යයි ප්‍රසිද්ධියට ගියේ තමාගේම අනුකම්පාව පිණිස ඒ වනයට වැඩමකළ සිද්ධත්‍ථ ශාස්තෘන් වහන්සේ වසන තැන මඩුවෙහි

වහලය සඳහා යම් තණක් වේද එය **ලායති** කපානුයි අර්ථයි. කුසතණ වහලයක් තනා නොයෙක් කුඩා දඬුවලින් මඩුවක් තනා එය තණපතින් වසා සිද්ධපට භාග්‍යවතුන් වහන්සේට **අදාසිං** පිදුවෙමි යන අර්ථයි. **සත්තාහං ධාරයුංතසස** යනු ඒ මඩුව එහි සිටි දෙවිමිනිස්සු සත්දිනක් නිරෝධ සමාපත්තියට සමවැදී වැඩහුන් ශාස්තෘන් වහන්සේට හා දෙවි මිනිසුන්ට උපකාරී වූහ. ධාරයිංසු යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේම ය.

තිණසන්ථර දායක තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.182

තුන්වැනි තෙරුන් වහන්සේගේ අපදානයෙහි බණ්ඩථුල්ලිය තෙරුන් වහන්සේ යනු මෙහි **බණ්ඩං** යනු බදාම කඩන ලද බැවින් සුන්බුන් වූ ස්ථානය **ථුල්ල** යනු බදාම? කැඩුණු තැන කණගාකිත හතුවැනි මල් පිපීම. බණ්ඩ ද ථුල්ල ද බණ්ඩථුල්ල වේ. කටුකොහොල් ප්‍රතිසංස්කරණය යනු නැවත නැවත තහවුරු කිරීම යනු බණ්ඩථුල්ල පටිසංඛරණ නම්. මේ තෙරුන් වහන්සේ පුණ්‍ය සම්භාර පුරන කල්හි ථූසස භාග්‍යවතුන් වහන්සේගේ චෛත්‍යයෙහි සුන්බුන් තන්හි හුණුපිඬක් ආලේපකොට තහවුරු කිරීම බණ්ඩථුලල පටිසංඛරණ නම්. ඒ නිසා උන්වහන්සේ බණ්ඩථුල්ලිය තෙරුන් වහන්සේයයි ප්‍රකට වූහ.

බණ්ඩථුලලිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

සතරවැනි තෙරුන් වහන්සේගේ අපදානයෙහි **රඤ්ඤා බදධචරෝ ආසිං** යනු රජුගේ පරිවාරකයෙක් ද වැඩකරුවෙක් ද වීමි යන අර්ථයි. **ජලජුත්තම නාමිනෝ** යනු **ජලෙ** ජලයෙහි උපන් ජලජ. ඒ කුමක්ද පද්මයයි. පද්මයට සමාන නමක් ඇති බැවින් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ

යන අර්ථයි. උත්තම වූ පදුම නම් භාග්‍යවතුන් වහන්සේගේ හෝ අර්ථයි. සිව්වැන්න පස්වැන්න නො ගැඹුරු ය. සයවැන්නෙහි **නගරෙ ද්වාරවතියා** යනු මහදොරින් ද ජනෙල් කවුළුවලින් ද වැටපවුරු අගුල් ගෝපුර මඩදිය අගලින් ද යුතු නගර යනුයි ද්වාරවතී නගරය නම්. දොර ද වැට ද ප්‍රධානකොට නගරය උපලක්ෂිත වූ බැවින් ද්වාරවතී නගරයයි ව්‍යවහාර කරති. ද්වාරවතී නගරයෙහි යනු නගරයයි කියන ලදී. **මාලාවච්ඡො** මට මල් උයනක් අහූ විය යන අර්ථයි. **තෙ කිසලයා** යන ඒ අසෝක දලු. සවැනි, සත්වැනි, අටවැනි, නවවැනි අපදාන නොගැඹුරු අරුත් ඇත්තේමය. දසවැන්නෙහිද අපූර්වයක් නැත.

විසිවැනි වර්ග වර්ණනාවයි.

මින්පසුව සියලු තන්හි ගැඹුරු පද වර්ණනාව කරන්නෙමි. විසිඑක් වැනි විසිදෙවැනි විසිතුන්වැනි වර්ගයෙහි ද මනාසේ කරන ලද පිනින් ලද නම් ඇත්තා වූ කරන ලද පින් ඇත්තවුන් ද සියලු තෙරුන් වහන්සේලාගේ විවිධත්වය ද, විවරණ දෙන්නා වූ බුදුවරුන්ගේ නම් ද, වාසය කරන ලද නගර ද යට කියන ලද පරිද්දෙන් සියල්ල නොගැඹුරු ය. අපදාන ගාථාවන්හි අර්ථය ද නයානුසාරයෙන් දතයුතුය.

තුන්වැනි අපදානයෙහි අරුණවතියා නගරෙ යනු හාත්පසින් ආලෝක කරමින් **උදෙති** උඩට නැගේනුයි අරුණ නම්. එය එහි දක්නට ලැබේනුයි අරුණවතී. ඒ නගරය එලිය කරමින් සූර්යයා උඩට නැගේ යන අර්ථයි. සෙසු නගරවලද හිරු උදාව දක්නට ලැබෙද්දීත් විශේෂ වචනයකි. සියලු සිව්පාවුන්ට පොළොවෙහි වසානුයි පොළොවෙහි නිදානුයි මහිසයයි කියන්නාක් මෙන් රූඪී වශයෙන් කියන ලදැයි දතයුතුය. නැතහොත් ප්‍රාකාර ප්‍රාසාද මන්දිර ආදියෙහි රන්රිදී මිණිමුතු ආදී සත්රුවන් පැහැයෙන් අරුණ නැගෙන්නාක් මෙන් ප්‍රභා ඇත්තී අරුණවතී නම්. ඒ අරුණවතී නගරයෙහි **පූපිකො** මම කැවුම් විකිණීමෙන් ජීවිකාව කරන්නේ වීමි යන අර්ථයි. සිව්වැනි අපදානයෙහි **තීවරායං** පුරෙ රමෙම යනු පවුරු තුනකින් **පරිවාරිතා** වටකරන ලද්දේනුයි තීවරා. කෑම්බීම් උපභෝග වස්ත්‍රාභරණ ආදී නැටුම් ගැයුම් ආදියෙන් රමණීය වේනුයි **රමමං**. ඒ තීවරා **පුරෙ** රම්‍ය නගරයෙහි මම කුළුපොත්තෙක් වීමි යනු සම්බන්ධයි. පස්වැනි අපදානය

නොගැඹුරු අරුත් ඇත්තේ ම ය. සවැනි අපදානයෙහි **වණ්ණකාරෝ අහං තදා** යනු නිල් කහ රතු ආදී වර්ණ වශයෙන් වස්ත්‍ර කරානුයි වර්ණ ගන්වානුයි වර්ණකාර නම්. එහි රජකයෙක් ව චෛත්‍යය වස්ත්‍රවලින් වසනකල්හි නොයෙක් වර්ණ ඇති රෙදිවලින් වර්ණ ගැන්වීම් යන අර්ථයි. සත්වැනි අපදානයෙහි **පියාලං පුපඵිතං දිසවා** මැනවින් පිපුණු මොරගසක් දැක **ගතමගෙ බිපිං අහං** යනු මම මුවන්මරන වැද්දෙක්ව මොරමල් නෙළා බුදුරජාණන් වහන්සේ වැඩි මාර්ගයෙහි බිපිං පූජා කෙළෙමි යන අර්ථයි. අටවැනි අපදානයෙහි **සකෙ සිප්පෙ අපජාදෙධා** යනු තමාගේ තර්ක ව්‍යාකරණ ආදී ශිල්පයෙහි **අපජාදෙධා** පිහිටියේ දක්ෂවූයේ මම වනයට අගමං ගියේ වෙමි. **සම්බුද්ධං යනතං දිසවාන** යනු වනාන්තරයෙහි වැඩම කරන්නා වූ විපසි සම්බුදුරජාණන් වහන්සේ දැක. **අම්බයාගං අදාසහං** යනු මම අඹදානයක් දුනිමි යන අර්ථයි. නවවැනි අපදානයෙහි **ජගතී කාරිතා මයාං** යනු අජ්ඣදසි භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් නිදන් කළ චෛත්‍යයෙහි **ජගති** සුන්බුන් **ආලිඤ්ඣ** මල්දෙන තැන් සංඛ්‍යාත වූ ජගති මා විසින් **කාරිතා** කරවන ලද්දේය යන අර්ථයි. දසවැනි අපදානය නොගැඹුරු අරුත් ඇත්තේමය.

විසිහතරවැනි වර්ග වර්ණනාව නිමියේය.

විසිපස්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **හරිචාතුවරමාදාය** යනු [1]තුවරටයී මෑ ඇට වැනි තුවර ඇට තලා පුපුරවා භාජනයකින් ගෙන **සංසසඤ** වනමැද වෙසෙන සංඝයාට අද්දීං දුනිමි යන අර්ථයි. දෙවැනි අපදානයෙහි **ධනුං දෙවජඤං කඤාන** යනු මුව ආදීන් මරනු පිණිස දුන්න සාදාගෙන හැසිරෙමින්. **තෙසරං ඔසවං දිසවා** යනු මැනවින් මල් පිපුණු කුඩා විලක් දැක. **බුද්ධසස අභිරොපෙසිං** යනු මම සිත පහදවාගෙන වනයට සපැමිණි තිසස භාග්‍යවතුන් වහන්සේට **අභිරොපෙසිං** පූජා කෙළෙමි යන අර්ථයි. තෙවැනි අපදානයෙහි **ජලකුක්කුටෝ** යනු ජාතස්සරයෙහි හැසිරෙන දියසැවුළා. **තුණ්ඩෙන කෙසරිං ගයහ** යනු නෙළුම්මලක් මුවතුඩින් ඩැහැගෙන, අහසින් වඩින්නා වූ තිසස භාග්‍යවතුන් වහන්සේට **අභිරොපයිං** පිදුවෙමි යන අර්ථයි. සිව්වැනි අපදානයෙහි **විරවපුපඵං පගහයහ** යනු විවිධ ලෙස නද කරානුයි ශබ්ද නගානුයි **විරවං**, හඬ නගන වේලාවෙහි පිපෙන විරවයයි නම් ලද මල් සමූහයක් **ආදාය**

1 තුවරටයී - තුවර ඇට, තෝර ගස (පා.ගැ) තෝර පරිජ්පු-(කා-ගෙ)

ගෙන සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට **අභිරොපයිං** පූජා කෙළෙමි යන අර්ථයි. පස්වැනි අපදානයෙහි **කුටිගොපකො** යනු සෙනසුන් පාලකයා. **කාලෙන කාලං ධූපෙසිං** යනු පැමිණි පැමිණි කාලානුකාලයෙන් ධූපෙසිං දුමින් සුවඳ කෙළෙමි යන අර්ථයි. සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේගේ ගඳකිළිය කාලානුරූප සුවඳ දුමින් සුවඳවත් කළෙමියි කියන ලද්දේ වෙයි. සවැනි සත්වැනි අපදාන නොගැඹුරුමය. අටවැනි අපදානයෙහි **සතතසතතලි පුප්ඵානි** යනු සතතලි සංඛ්‍යාත වූ සත්පෙති දෑසමන් මල් සතක් හිසින්ගෙන වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේට **අභිරොපයිං** පූජා කෙළෙමි යන අර්ථයි. නවවැනි අපදානයෙහි **බිම්බිජාලික පුප්ඵානි** යනු රත්කරව් මල්. සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට පිදුවෙමි යන අර්ථයි. දසවැනි අපදානයෙහි **උදුම්බරකං ගහෙත්වා** යනු ස්වාභාවික විලෙහි කුරුලු කෙමෙහි හටගත් ඇසල මලක් නෙළා **කකුසඳ** භාග්‍යවතුන් වහන්සේට පූජා කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය.

විසිපස්වැනි වර්ග වර්ණනාව නිමියේය.

විසිහයවැනි වර්ගයෙහි පළමුවැනි අපදානය නොගැඹුරුමය. දෙවැනි අපදානයෙහි **විජහිත්වා** දෙවවණ්ණං යනු දේවතා ශරීරය **විජහිත්වා** හැරදමා මනුෂ්‍ය ශරීරයක් මවාගෙන යන අර්ථයි. **අධිකාරං කතතුකාමො** යනු **අධිකකිරියං** පින් රැස් කිරීමක් කරනු කැමැත්තේ දේවර නම් වූ මම දේවර භාර්යාව සමග බුද්ධ ශ්‍රේෂ්ඨයින් වහන්සේගේ සසුනෙහි ආදර ඇති බැවින් **ඉධ** මේ මිනිස්ලොව. ආගමිං පැමිණියේ වෙමි යන අර්ථයි. **තසස භික්ඛා මයා දිනනා** යනු පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ යම් දෙවරනම් ශ්‍රාවකයෙක් වීද, ඒ ශ්‍රාවකයාට මා විසින් අතිශයින් ප්‍රසන්න වූ සිතින් **භික්ඛාදිනනා** පිණ්ඩපාතය දෙන ලදී යන අර්ථයි.

තෙවැනි අපදානයෙහි **ආනන්දො නාම සම්බුදෙධා** යනු ආනන්දං සන්තෝෂය ජනනය කරන බැවින් **ආනන්ද නම්** පසේ බුදුරජාණන් වහන්සේ යන අර්ථයි. **අමනුස්සමහි කානනෙ** යනු අමනුෂ්‍යයන් විසින් අරක් ගන්නා ලද **කානනෙ** මහා වනයෙහි **පරිනිබ්බායි** අනුපාධිසේස නිර්වාණ ධාතුවෙන් අනතරධායි නොදැක්මට වැඩි සේක යන අර්ථයි. **සරීරං තසස ඣාපෙසිං** යනු මම දෙව්ලොවින් මේ මිනිස්ලොවට පැමිණ ඒ භාග්‍යවතුන් වහන්සේගේ සිරුර මේ මහවනයෙහි **ඣාපෙසිං** ආදාහනය

කෙළෙමි යන අර්ථයි. සවැනි අපදානයෙහි **අහොසිං චන්දනොනාම** යනු නාමෙන ප්‍රඥප්ති වශයෙන් චන්දන නම්. **සම්බුද්ධසසත්‍රජෝ** යනු පසේ බුදුවන්නට පළමුව උන්වහන්සේගේ **අත්‍රජෝ** පුත්‍ර බවට මම පත්වීමි. **එකොපාහනෝ මයා දිනෙනා** යනු පාවහන් යුගලයක් මා විසින් දෙන ලදී. බොධිං **සම්මජ්ජ මෙ තුවං** යනු පින්වත් පාවහන් යුගලය, මෙ මාගේ ශ්‍රාවක බෝධිය ඔබ හැමද උපදවන්න යන අර්ථයි.

සත්වැනි අපදානයෙහි **මඤ්ජරිකං කරිත්වාන** යනු මදටියමලින් පිරුණු ගොටුවක් ගෙන **රථියා** වීදියෙහි පිළිපන්නෙමි. මම එසේ පිළිපන්නේ ව භික්‍ෂු සංඝයා **පුරකඛතං** පිරිවරන ලදුව. **සමණානගගං භික්‍ෂූන්ට** අග්‍රවූ ශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දුටුවෙමි යනු **සම්බන්ධයි. බුද්ධසස අභිරොපයිං** යනු ඒ මල දැක දෝතින් ගෙන ඔසවා **බුද්ධසස** ඵුස්ස භාග්‍යවතුන් වහන්සේට **අභිරොපයිං** පූජා කෙළෙමි යන අර්ථයි.

අටවැනි අපදානයෙහි **අලොණ පණණ භකෙඛාමහි** යනු කිරි සහිත කොළ ආදිය ඇවිද අහුලා ගෙනවුත් ලුණු නැති කොළ පිස කමි, **අලොණ පණණ භකෙඛා අමහි** වෙමි යන අර්ථයි. **නියමෙසුව සංයමො** යනු පෙරබත් කල් නොපැමිණි කල්හි. **සිද්ධත්‍ථො උපගඤ්ඡිං මං** යනු මාගේ සමීපයට සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ **උපගඤ්ඡි** සපැමිණි සේක. **තාහං බුද්ධසස පාදාසිං** යනු මම ඒ ලුණු නැති කොළ ඒ බුදුරජාණන් වහන්සේට දුනිමි යන අර්ථයි. නවවැනි අපදානය නොගැඹුරුමයි.

දසවැනි අපදානයෙහි **සිඛිනං සිඛිනං** යථා යනු ශරීරයෙන් නික්මුණු සවණක් රැසින් **ඔභාසයනතං** දිලිසෙන **සිඛිනං** සිඛි භාග්‍යවතුන් වහන්සේ දිලෙන ගිනිකඳක් මෙන්. **අගගජං පුපඵමාදාය** යනු අග්‍රජ නම් මල් ගෙන බුද්ධසස සිඛි භාග්‍යවතුන් වහන්සේට අභිරොපයිං පූජා කෙළෙමි යන අර්ථයි.

විසිහයවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

විසිහත්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **ජලජගෙ දුවෙ ගයහ** යනු **ජලෙ** ජලයෙහි හටගත් අග්‍ර වූ උත්පල ආදී මල් දෙකක් ගෙන බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් එක් මලක් පාමුල **නිකඛිපිං** පූජා

කෙළෙමි. එක් මලක් අහසට දැමීම් යන අර්ථයි. දෙවැනි අපදානය ප්‍රකට ම ය. තෙවැනි අපදානයෙහි **බොධියාපාදපුත්තමෙ** යනු උතුම් වූ බෝධි වෘක්ෂයෙහි. **අඩ්ඪවාදං මයා දිනනං** යනු ඒ බෝධිමූලයෙහි අර්ධ චන්ද්‍රාකාරයෙන් මා විසින් නොයෙක් මල් පූජාකරන ලද්දේය යන අර්ථයි. **ධරණීරුහාපාදපෙ** යනු වෘක්ෂ පර්වත රත්න ආදී දරානුයි ධරණී, පෘථිවියයි. ධරණියෙහි රුහති පිහිටානුයි ධරණීරුහ නමි. පාදසංඛ්‍යාත වූ මුලින් ජලය පානය කෙරේනුයි කඳ අතු ආදියෙහි පැතිරේනුයි පාදප නමි. ධරණීරුහ වූයේ ද හෙම පාදප වූයේ ද ධරණීරුහපාදප නමි. ඒ ධරණීරුහ පාදපයෙහි මා විසින් මලක් පූජා කරන ලද්දේය යන අර්ථයි. සිව්වැනි අපදානය නො ගැඹුරු ම ය.

පස්වැනි අපදානයෙහි **හිමවන්තසසාවිදූරෙ** යනු හිමවතට ආසන්නයෙහි **රොමසො නාම පබ්බතො** යනු රුක්ලිය ගැබින් හෝ හුදෙක් කුසතණ ආදියෙන් ගැවසුණු බැවින් රොමසො නම් පර්වතයක් විය. **තසමිං පබ්බත පාදමහි** යනු ඒ පර්වතය කෙළවර **සමණො භාවිතින්ද්‍රියො** පව් නැසූ සන්සුන් කළ කෙලෙස් ඇති සමණො වඩන ලද ඉන්ද්‍රිය ඇති රැකි චක්ෂු ඉන්ද්‍රිය ඇති යන අර්ථයි. නැතහොත් වඩන ලද ඉන්ද්‍රිය ඇත්තේ වඩන ලද ශ්‍රද්ධා ඉන්ද්‍රිය ඇත්තේ යන අර්ථයි. ඒ ශ්‍රමණයන් වහන්සේට මම බිළාලි ආලුවෙ-නෙළුම් අල ගෙන දුනිමි යන අර්ථයි. සවැනි -සත්වැනි - අටවැනි - නවවැනි - දසවැනි අපදාන නොගැඹුරුමය.

විසිහත්වෙනි වර්ග වර්ණනාවයි.

විසිඅටවැනි වර්ගයෙහි පළමුවැනි අපදානය නොගැඹුරු ම ය. දෙවැනි අපදානයෙහි **මනොමයෙන කායෙන** යනු සිතට අනුරූප වශයෙන් පැවති කය යන අර්ථයි. තෙවැනි අපදානයෙහි **මහා සමුද්දං නිසසාය** යනු මහා සාගරය ආසන්නයෙහි සිටි පර්වතය අතරෙහි පර්වත ලෙනෙහි යන අර්ථයි. සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ විවේක කැමැත්තෙන් **වසති** වාසය කරන සේක යන අර්ථයි. **පච්චුග්ගනත්ථාන කාසාහං** යනු මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ **පටිඋග්ගනත්ථා** පෙරමගට සම්පයට ගොස් වැඳීම් ආදී පින් කෙළෙමි යන අර්ථයි. **චඩ්ඩගාටක මදාසහං** යනු සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේට මම මලින් බර වූ **චඩ්ඩගාටකං කලඹික්** ගොටුවක් **ආදාසිං** පූජා කෙළෙමි යන අර්ථයි. සිව්වැනි අපදානයෙහි **අකක්කස චිත්තසස** යනු පරුෂ නොවූ සිතට. අථ ශබ්දය පදපූරණයෙහිය. පස්වැනි අපදානයෙහි

උදුම්බරෙ වසනතසස යනු අත්තික්කා ගස මුල රුක් සෙවනෙහි වසන්නා වූ තිස්ස භාග්‍යවතුන් වහන්සේට, **නියතෙ පණණ සතථරෙ** යනු නියාමිතෙ එකට බැඳුණු **පණණාසතථරෙ** අතුකැබලි අසුනෙහි වැඩසිටියා වූ. **ථුතොකාසො මයා දිනනො** යනු **විවිතතො** මණ්ඩපද්වාර ආදියෙන් වසන ලද අවකාශ ඇති එය මයා දිනනා සම්පාදනය කරන ලද්දේය යන අර්ථයි. සවැනි අපදානයෙහි **පොතථදානං මයා දිනනං** යනු **පොතථපටට පොතථජලී** හණපටිට තලා කරන ලද සළුව **විසම** ගොඇසුකෙන ගටා නිමවන ලද නූල් ගෙන කපා ඒ නූලින් හිඳිනු පිණිස හෝ බුමුතුරුණු සඳහා හෝ සළුවක් වියවා ඒ සළුව මා විසින් තෙරුවනට දෙන ලදී යන අර්ථයි. සත්වැනි අපදානයෙහි **චනදභාගා නදීතීරෙ** යනු චන්‍ද්‍රභාගා නම් නදියෙහි තෙරින් වෙන්වීමෙහි ආධාර විබතයි. **අනුසොතං** යනු එහි යටිගං බලා **වජාමි** මම යමි යන අර්ථයි. **සතතමාලුව පුපඵානි චිතක මාරොපයිං** අහං යනු පෙති සතක් ඇති මාලුව මල්ගෙන **චිතකෙ** වැලිගොඩෙහි වැල්ලෙන් ස්තූපයක් කොට පූජා කෙළෙමි යන අර්ථයි. අටවැනි අපදානයෙහි **මහාසිනධු සුදසසනා** යනු සොඳුරු දසුන් සොඳුරු ජලය සුවුවැල්ලෙන් ශෝභමාන වූ බැවින් මනාසේ සිත් ඇදගන්නා මහාසින්ධු නමැති ජලනදියක් විය. **නසථ** ඒ සින්ධු ජලනදියෙහි. **සපපභාසං** ප්‍රභාවෙන් යුක්ත. **සුදසසනං** සුන්දර රූප ඇති **පරමොපසමෙ යුතතං** උත්තම වූ උපසමයෙහි යෙදුණු හමුවුණු රහතන් වහන්සේ මම දුටුවෙමි යන අර්ථයි. **දිසවාහං විමිහිතාසයො** යනු මෙබඳු භයානක වූ හිමවතට කෙසේ පැමිණියේදැයි **විමිහිත අජඣාසයො** ආශ්චර්ය අද්භූත සිත් ඇත්තේ යන අර්ථයි. **ආලුවං තසස පදාසිං** ඒ රහතන් වහන්සේට මම පහන් සිතැත්තේ අල කැබැල්ලක් ආදරයෙන් දුනිමි යන අර්ථයි. නවවැනි දසවැනි අපදාන නොගැඹුරුම ය.

විසිඅටවැනි වර්ග වර්ණනාවයි.

විසිනවවැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **පණණහොජනහොජනො** යනු කිරි සහිත කොළ ආදී බොජුන් බුදිනු පිණිස පන්සලෙහි හුන්නේ **අමහි** වෙමි යන අර්ථයි. **උපවිධඤඤව මං සනතං** යනු පන්සලට පිවිස **මං සනතං** විද්‍යමාන වූ මා **උපාගඤඡි මහා ඉසි** යනු මහත්වූ ශීලාදී ස්කන්ධයන් සොයන බැවින් මහාඉසි. **ලොක පජජොතො** ලෝකයට ප්‍රදීපයක් වූ සිද්ධත්ථ භාග්‍යවතුන් වහන්සේ **උපගඤඡි** මා සමීපයට පැමිණි සේක යන

අර්ථයි. **නිසිනනං පණ්ණ සනථරෙ** යනු පැමිණ කොළ ඇතිරියෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට වැළඳීම පිණිස වාෂ්පයෙන් තැම්බූ කොළ මා විසින් දෙන ලදී යනු සම්බන්ධයි. **දුතියාපදානෙ** දෙවැනි අපදානයෙහි **සිනෙරු සමසනෙතා** ඒ පර්වතයක් හා සමාන සිද්ධාර්ථ භාග්‍යවතුන් වහන්සේ යනු සම්බන්ධයි. **චුටයිත්වා සමාධිමහා** යනු නිරෝධ සමාපත්තියෙන් නැගී වෙන්වී යන අර්ථයි. **භික්ඛායමමුපටඨිතො** යනු පිඬු පිණිස හැසිරෙන වේලාවෙහි අද මට යමෙක් කිසියම් දානයක් දෙයිද ඔහුට මහත්ඵල වේයයි සිතා හුන් මාගේ **සනතිකං උපඨිතො** පැමිණි සේක යන අර්ථයි. හරිතකං -පෙ **එාරුසක ඵලානිච** යනු මෙසේ සියලු ඒ පල සර්වලෝකයට හිතානුකම්පී වූ ඒ සිද්ධත්‍ථ මහර්ෂීන් වහන්සේට මා විසින් අතිශයින් පැහැදුණු සිතින් දෙන ලදී යන අර්ථයි. තෙවැනි අපදානයෙහි **සීහංයථාවනචරං** යනු වනයෙහි හැසිරෙන සිංහරාජයකු මෙන් හැසිරෙන සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ යනු සම්බන්ධයි. **නිසභාජානියං යථා** යනු උසභය, වසභය, නිසභය, ආසභය යන ගව ජෝෂ්ඨයෝ සතරදෙන. ඔවුන්ගේ ආජානිය වූ අභිත වූ නිශ්චල වූ උසභ රාජයකු මෙන් යන අර්ථයි. **කකුධං විලසනතං** විය යනු මල් පල්ලෙන් සෝභමාන වූ කුඹුක්ගසක් මෙන් **නරාසභං** නරයන්ට ආසභ වූ උත්තම වූ පැමිණෙන සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ දැක සැදැහැයෙන් යුක්ත බැවින් අතිශයින් පැහැදුණු සිතින් පෙරගමන් කෙළෙමි යන අර්ථයි.

විසිනවවැනි වර්ග වර්ණනාවයි.

තිස්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි ආහුතිං යිටඨුකාමොහං යනු පූජා සත්කාර කරවනු කැමැත්තේ මම **නානාපුපඵං සමානයිං** යනු අනේකප්‍රකාර සපුසල් ආදී මල් **සං** මැනවින් **ආනයිං** රැස් කෙළෙමි යන අර්ථයි. **සිබිනො ලොක බනධුනො** යනු සියලු තුන්ලොවෙහි **බනධුසස ඥාතී** වූ පිරිනිවන්පෑ සිබී භාග්‍යවතුන් වහන්සේගේ **චිතකං** ආදාහන චිතකය. **දර සෑය ජලනනං** දැල්වෙද්දී මා විසින් රැස්කරන ලද මල් **ඔකිරිං** පූජා කෙළෙමි යන අර්ථයි. **දෙවැනි අපදානයෙහි අජිනුත්තරවාසිනො** යනු අදුන් දිවිසම උතුරු සළුවක් කොට නිවාසිනො හඳින්නහුගේ යන අර්ථයි. **අභිඤඤා පඤඤව නිබබත්තා** යනු ඉද්ධිවිධ ආදී පඤඤඅභිඤඤා යෝ නැණපස **නිබබත්තා** උත්පාදනය කරන ලද්දේය, නිෂ්පාදනය කරන ලද්දේය. **චනදසස පරිමජජකො** යනු චන්ද්‍ර මණ්ඩලය වටා **මජජකො**

ස්පර්ශ කරන්නේ වීමි යන අර්ථයි. **විපස්සිං ලොක පජ්ජොතං** යනු සියලු තුන්ලොව පහනක් බඳු විපස්සි භාග්‍යවතුන් වහන්සේ මාගේ සමීපයට **අභිගතං** විශේෂයෙන් සපැමිණෙනු දැක, **පාරිචරියතාය පූජයානි** යනු දෙව්ලොවින් පරසතු මල් ගෙනවුත් විපස්සි ශාස්තෘන් වහන්සේගේ මතුයෙහි ඡත්‍රයක ආකාරයෙන් මම දුනිමි යන අර්ථයි. තෙවැනි අපදානයෙහි **පුත්තෙනා මම පබ්බජිතො** යනු මාගේ පුත්‍රයා සැදැහැයෙන් පැවිදිවූයේ. **කාසාය වසනො තදා** යනු ඔහු පැවිදිවුණු කල්හි **කාසාය** නිවසෙන බාහිරක පැවිද්දෙන් පැවිදි වූයේ යන අර්ථයි. **සොව බුද්ධතතං පත්තෙනා** ඒ මාගේ පුත්‍රයා බුදුවරුන් සතරනම අතුරින් ශ්‍රාවක බුද්ධ භාවයට **සං** මනාසේ **පත්තෙනා** අර්හත්වයට පැමිණියේ යන අර්ථයි. **නිබ්බුතො ලොකපූජිතො** යනු සකල ලෝකයා විසින් කරන ලද සත්කාර ඇත්තේ ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවන්පෑය යන අර්ථයි. **චිච්චනෙනා සකංපුත්තකං** යනු මම ඔහු ගිය අත විචාරා තමාගේ පුත්‍රයා සොයා යන්නේ. **පච්ඡතො අගමං** අනුව ගියේ වෙමි යන අර්ථයි. **නිබ්බුතස්ස මහනතස්ස** යනු මහත්වූ ශීල ස්කන්ධාදියෙන් යුතු බැවින් මහත්වූ ඒ මාගේ ඒ රහත් වූ පුත්‍රයාගේ **ආදාහනට්ඨානං** දරසෑය තිබුණු තැනට මම ගියෙමි යන අර්ථයි. **පගය්හ අඤ්ජලිංතත්‍ථ** යනු ඒ ආදාහන ස්ථානයෙහි **අඤ්ජලිං** දසැඟිලි එක්කොට බැඳගෙන හිස් මුදුනෙහි තබා මම **චිතකං** දැවෙන දරසෑය **වන්දිත්වා** ප්‍රණාමකොට. **සෙතච්ඡතතඤ්ච පගය්හ** යනු හුදෙක් වැඳීම පමණක් නොකොට සේසතද **පගය්හ** ඔසවා මම **ආරොපෙසිං** පිහිටුවිමි යන අර්ථයි. සිව්වැනි අපදානයෙහි **අනුගතම්හි** ආදිවෙව යනු සූර්යයා **අනුගතෙ** නොනැගුණු අළුයම් කාලයෙහි යන අර්ථයි. **පසාදො විපුලො අහු** යනු රෝගයෙන් පීඩිත වූ මාගේ චිත්තප්‍රසාදය විපුලො බුදුන් සිහිකිරීමෙන් අතිරේක වූයේ අහු විය. **මහෙසිනො** ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේගේ ලෝකයෙහි **පාතුභාවො** ප්‍රකටවීම සිදුවිය යනු සම්බන්ධයි. **සද්දමසෙසාසභං තසස** යනු උන්වහන්සේගේ පහළවීම ඇතිකල්හි මම ගිලන්වූයේ බුදුරජාණන් වහන්සේ උපන් සේකැයි යන සෝෂාව ඇසුවෙමි. **නචපසසාමි තංජිනං** යනු ඒ පස්මරුන් දිනූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නොදකිමි. දැඩිසේ ගිලන් බැවින් ගොස් බැලීමට නොහැක්කෙමි යන අර්ථයි. **මරණඤ්ච අනුපපත්තෙනා** යනු මරණාසන්න කාලය **අනුපපත්තෙනා** මරණාසන්න වී යන අර්ථයි. **බුද්ධසඤ්ඤමනුසසරිං** බුද්ධ යන නම අනුස්සරිං බුද්ධාලම්බනය සිතෙහි ඇතිකර ගත්තෙමි යන අර්ථයි.

පස්වැනි අපදානයෙහි **ආරාමද්වාරා නික්ඛම්ම** යනු ආරාමයේ දොරින් සංඝයා වහන්සේ නික්මෙන දොරටුවෙහි යන අර්ථයි. **ගොසීසං සඝාතං මයා** යනු ඒ නික්මෙන දොරටුවෙහි භාග්‍යවතුන් වහන්සේගේ ද භික්ෂු සංඝයාගේද පාදයෝ මඩ නොපාගත්වායි නික්මයාම පිණිස උතුම් වූ සඳුන් ගැටයක් මා විසින් අතුරන ලදී යන අර්ථයි. **අනුභොමි සකං කම්මං** යනු තමාගේ කර්මයෙහි බලයෙන් ආජානීය වූ වාතවේග ඇත්තා වූ සෙන්ධවයන්ද සීඝ්‍ර වාහන ආදී විපාකඵල අනුභව කරමි යන අර්ථයි. **අහොකාරං පරමකාරං** යනු මනා කෙතක් වූ සංඝයා කෙරෙහි මා විසින් මනා සේ කරන ලද **කාරං** සුළු වූද කාර්යය මහත්ඵල දෙන බැවින් පරමකාරං උතුම් කාර්යයක් විය. විස්මයකි යන අර්ථයි. යම්සේ තෘණ ආදී දෝෂයන්ගෙන් විරහිත වූ මනා වූ කෙතෙහි වපුරවන ලද හැල්බිජු මහත්ඵල දේද එසේම රාග ද්වේෂ ආදී දෝෂ රහිත පිරිසිදු කායවචී සමාචාර ඇති සංඝයා නමැති කෙතෙහි කරන ලද සඳුන් ගැටය ඇතිරීම නම් කර්මය මා විසින් කරන ලදී. මෙය මහත්ඵල දෙතියි කියන ලද්දේ වෙයි. **නඅඤ්ඤං කලමගඝතී** යනු අඤ්ඤං බාහිර සසුනෙක කරන ලද කර්මය සංඝයා කෙරෙහි කරන ලද **කාරස්ස** පූජා සත්කාරයාගේ **කලං** සොළොස් වැනි **කලං** කොටසක්වත් නොඅගී යනු සම්බන්ධයි. සවැනි-සත්වැනි-අටවැනි-නවවැනි-දසවැනි අපදාන නොගැඹුරු මැ යි.

තිස්වැනි වර්ග වර්ණනාවයි.

තිස්එක්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **ඉසිසඩ්ඪඅහං පුබ්බ** යනු මම පෙර බෝධිසම්භාරයන් පුරනකල්හි **ඉසි සඩ්ඪ** පසේබුදු සෘෂි සමූහයෙහි, උන්වහන්සේලා සමීපයෙහි හිමවත් පව්වෙහි මාතංග ඇත් කුලයෙහි **වාරණෝ** චණ්ඩ හස්තියෙක් වීමි යන අර්ථයි. මනුෂ්‍ය ආදීන් වළක්වානුයි වාරණ නම්. නැතහොත් වචනයෙන් **රවති** කුංචනාද කරතියි වාරණ නම්. **මහෙසිනං පසාදෙන** යනු පසේබුදු මහර්ෂීන්ගේ ප්‍රසාදයෙන්. **පච්චෙකජින සෙට්ඨෙසු ධුතරාගෙසු තාදිසු** යනු ලෝක ධර්මයන්ගෙන් නොසෙල්වෙන පසේබුදුවරුන් කෙරෙහි. **පදුමකෙසරං** නෙළුම් රේණු. **ඔකිරිං** විසුරුවෙමි යන අර්ථයි. දෙවැනි තෙවැනි අපදාන නොගැඹුරු ය.

සිව්වැනි අපදානයෙහි **මහාබොධි මහෝ අහු** යනු විපසසි භාග්‍යවතුන් වහන්සේගේ සිව්මග නැණ දරන බැවින් බෝධි යන නම්ලද රුකට

පූජාවක් විය යන අර්ථයි. **රුක්ඛධෝ විය සම්බුද්ධා** යනු මේ බෝධිපූජා පැවැත්වෙන කල්හි මහජනයාට ලෝකජ්‍යෙෂ්ඨ වූ නරාසභ වූ සම්බුදු රජාණන් වහන්සේ **රුක්ඛධෝ ඉව** රුකෙහි සිටියාක් මෙන් පෙනේ යන අර්ථයි. **භගවා තම්හි සමයෙ** එසමයෙහි පූජා පැවැත්වෙන කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පෙරටුකොට පිරිවරන ලද සේක. **වාචාසභිමුදීරයං** යනු මුදු සිලිටි මිහිරි උතුම් ගොස **උදීරයං** කියන්නේ නිකුත් කරන්නේ චතුස්සත්‍යය ප්‍රකාශ කළ සේක. දේශනා කළ සේක යන අර්ථයි. **සඩ්ඛිත්තෙනව දෙසෙනෙතා** යනු හික්මවිය යුතු පුද්ගලයන්ගේ අධ්‍යාශ අනුරූපව දේශනා කරන්නේ සංක්ෂේපයෙන්ද විස්තර වශයෙන්ද දේශනා කරන සේක යන අර්ථයි. **විවටවඡදෝ** යනු රාගය ආවරණයකි. දෝසය ආවරණයකි, මෝහය ආවරණයකි. සියලු කෙලෙස් ආවරණයෝය යනුවෙන් මෙසේ කියන ලද ආවරණ විවර කරන ලද්දේය පැහැදිලි කරන ලද්දේය. විනාශ කරන ලද්දේය යනුවෙන් විවටවඡද සම්බුදුරජාණන් වහන්සේ ඒ මහජනයා දේශනා අවසානයෙහි නිවන ලද සේක. පරිදාහය නිවාලන ලද්දේය යන අර්ථයි. **තසසාහං ධම්මං සුත්වාන** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනු අසා පස්වැනි අපදානයෙහි **ඵලහත්ථෝ අපෙබවා** යනු විපසසි භාග්‍යවතුන් වහන්සේ දැක මිහිරිපල ගෙන **අපෙබවා** නොඉක්මවත් සෙමින් ආශ්‍රමයට යන අර්ථයි. සවැනි - සත්වැනි අපදාන නොගැඹුරුමැයි. අටවැනි අපදානයෙහි **නිටඨිතෙ නවකම්මෙ ච** යනු සීමාවෙහි නවකම් අවසන් වූ කල්හි. **අනුපලෙපමදාසහං** යනු අනු පසුව සුණු ආලේප කරවූයෙමි යන අර්ථයි. නවවැනි දසවැනි අපදාන නොගැඹුරු මැ යි.

තිස්එක්වැනි වර්ග වර්ණනාවයි.

තිස්දෙවැනි වර්ගයෙහි පළමුවැනි දෙවැනි තෙවැනි අපදාන පහසුවෙන් දතහැක්කේමය. සිව්වැනි අපදානයෙහි **ජලජගෙහි ඔකිරිං** යනු ජලයෙහි හටගත් උතුම් මහනෙල් නෙළුම් මලින් **ඔකිරිං** පිදුවෙමි යන අර්ථයි. පස්වැනි අපදානය නොගැඹුරුමය. සවැනි අපදානයෙහි **චෙතියං උත්තමං නාම සිබිනො ලොක බන්ධුනො** යනු සියලු තුන්ලොවට බන්ධුනො ඖති වූ සිබි භාග්‍යවතුන් වහන්සේගේ උත්තම චෛත්‍යය **ඉරිනෙ** ජනයාගේ හැසිරීමෙන් විරහිත. විවනෙ මිනිසුන්ගේ කෝලාහල රහිත මහා අරණ්‍යයෙහි විය යනු සම්බන්ධයි. **අඤාභිණ්ඩාමහං තදා** යනු ඒ කාලයෙහි

වනයෙහි මංමුළා වූ බැවින් අන්ධ වූ ඇසින් අන්ධ නොවූයේ **අහං මම ආහිණ්ඩාමි** මාර්ගය සොයමි යන අර්ථයි. **පවනා නිකඛමනෙත්තන** යනු මහා වනයෙන්නික්මෙන මා විසින්. **සීහාසනං** උතුම් අසුන. සිංහයාගේ අසුන හෝ භාග්‍යවතුන් වහන්සේගේ අසුන දුටුවෙමි යන අර්ථයි. **එකංසං අඤ්ජලිංකත්වා** යනු උතුරුසළුව එකස්කොට හිසෙහි අඤ්ජලිය තබා යන අර්ථයි. **ථොමිසසං ලොකනායකං** යනු සියලු තුන්ලොව **නයනතං** නිවනට පමුණුවන ලෝකනාථයන් වහන්සේට ථොමිසසං ස්තුති කෙළෙමි යන අර්ථයි. සත්වැනි අපදානයෙහි **සුදසසනො මහාවීරො** යනු සොඳුරු දසුන් ඇති දෙතිස් සංවර මහා පුරුෂ ලක්‍ෂණ ඇති ශරීරයක් ඇති බැවින් මනහර දසුන් ඇති මහාවීර්ය ඇති සිද්ධත්‍ථ භාග්‍යවතුන් වහන්සේ යනු **සම්බන්ධයි. වසතී සර මුත්තමෙ** යනු උතුම් වෙහෙරෙහි වසන සේක යන අර්ථයි. අටවැනි නවවැනි දසවැනි අපදාන නොගැඹුරු ම ය.

තිස්දෙවැනි වර්ග වර්ණනාවයි.

තිස්තුන්වැනි වර්ගයෙහි පළමුවැනි දෙවැනි තෙවැනි සිව්වැනි පස්වැනි සවැනි අපදාන නොගැඹුරු ම ය. සත්වැනි අපදානයෙහි **සමූහං අගමාසහං** යනු **සමූහං** එකතුවන තැනට **අහං** මම ගියෙමි යන අර්ථයි. **අබබුද නිරබබුදා** යනු කෝටි සයදහසකගේ සියය අබබුද නමි. අබබුද සියදහසකගේ සියය නිරබබුදයයි කියන ලද බැවින් ආයුෂයෙන් අබබුද නිරබබුද ගණනක් ගිය මහා ආයුෂ ඇති රජවරු චක්‍රවර්තීහු ක්‍ෂත්‍රියයෝ අට අට වී කල්ප විසිපන්දහසක්හි **ආසුං** වූහ යන අර්ථයි. අටවැනි නවවැනි දසවැනි අපදාන ප්‍රකටමය.

තිස්තුන්වැනි වර්ග වර්ණනාවයි.

තිස්හතරවැනි වර්ගය, තිස්පස්වැනි වර්ගය, තිස්හයවැනි වර්ගය, තිස්හත්වැනි වර්ගය, තිස්අටවැනි වර්ගය නොගැඹුරු අරුත් ඇත්තේමය. තිස්නවවැනි වර්ගයෙහිද පළමු අපදාන ආදිය නොගැඹුරුමය.

3.182

නවවැනි අපදානයෙහි **විපස්සිනො පාවචනෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් සොණ කොළිවිස තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙර නමද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි මහාවිභව සම්පත් ඇති සිටුකුලයක ඉපිද වැඩිවිය පත්වූයේ සිටුවරයෙක් ව උපාසකයෙකු සමග විහාරයට ගොස් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා පහන් සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරන ස්ථානයෙහි සුණුපිරියම් කරවා එක් ලෙනක්ද කරවා නොයෙක් වර්ණ නැති වස්ත්‍රවලින් ලෙන්බිම අතුරා මතුයෙහි වියනක්ද කොට සිව්දිගින් වඩනා සංඝයාට පවරා සත්දිනක් මහදන් පවත්වා ප්‍රාර්ථනාවක් කෙළේය. භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කළ සේක. හේ ඒ පින්කමින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට ඉන්පසු කාශ්‍යප දසබලයන් වහන්සේ පිරිනිවි කල්හි භාග්‍යවතුන් වහන්සේ නොපැමිණ තිබියදී බරණැස කුලගෙයක ඉපිද දැනමිති බවට පැමිණියේ ගංගා නදීතෙර පන්සලක් කරවා වසන්නේ එක් පසේබුදු කෙනකුන් වහන්සේ නමකට තුන්මසක් සිව්පසයෙන් සකසා උපස්ථාන කළේය. පසේ බුදුරජාණන් වහන්සේ විසූවස් ඇත්තේ පිරිපුන් පිරිවර ඇත්තේ ගන්ධමාදනයටම වැඩි සේක. ඒ කුලපුත්‍රයා දිවි ඇතිතාක් එහි පින්කොට එයින් චුතවී දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි චම්පා නුවර අගසිටුවරයාගේ ගෙහි පිළිසිඳ ගත්තේය. ඔහු පිළිසිඳ ගන්නා කාලයෙහි පටන් සිටුවරයාට මහාභෝග රැසක් වැඩිවිය. ඔහු මව්කුසින් නික්මෙන දවසෙහි මුළු නුවරම මහා ලාභසත්කාර සම්මාන ඇතිවිය. උපන්නා වූ ඔහුට පෙර පසේ බුදුරජාණන් වහන්සේට සියදහසක් අගනා රතුපලසක් පරිත්‍යාග කිරීමෙන් සුවඳ වූ ද රතුවූ ද රන්වන් වූ ද ආත්මභාවයක් විය. ඒ නිසා ඔහුට සෝණ යැයි නමක් විය. ඔහුගේ පියා ඔහුට කෝටියක් අගනා කන් පළඳනාවක් කරවිය. ඒ උදෙසා පසුකලෙක සෝණ කෝටිකණ්ණ යයි නාමයක් විය. හේ මහත් පිරිවරින් වැඩුණේය. ඔහුගේ අතුල්පතුල් බඳුවදමල් පැහැ විය. ඒ අතුල්පතුල්වල සියවරක් නෙළූ කපුපුළුන් මෙන් මුදුපහසක් විය. පතුල්වල මිණිකොඩොල් වැනි ලෝම ඇතිවිය. වැඩිවිය පත් ඔහුට තුන් සෘතූන්ට ගැළපෙන ප්‍රාසාද තුනක් කරවා නාටක ස්ත්‍රීන් ලවා උපස්ථාන

කරවීය. හෙතෙමේ එහි මහත් වූ සම්පත් අනුභව කරන්නේ දෙවි කුමරකු මෙන් වාසය කරයි. ඉක්බිතිව අපගේ භාග්‍යවතුන් වහන්සේ සර්වඥ භාවයට පැමිණ පවත්වන ලද උතුම් දම්සක් ඇතිසේක් රජගහනුවර නිසා වාසය කරන සේක් බිම්බිසාර රජු විසින් කැඳවන ලදුව අසූදහසක් ගැමියන් සමග රජගහ නුවරට පැමිණියේ ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් දහම් අසා ලද සැදැහැ ඇත්තේ මව්පියන් අනුදන්වා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදිව ලද උපසම්පදා ඇත්තේ ශාස්තෘන් වහන්සේ හමුවෙහි කමටහන් ගෙන ජනආශ්‍රය ලබනු පිණිස සීත වනයෙහි විසුවේය. හේ එහි වසන්නේ මාගේ සිරුර සියුමැලිය. සැපයෙන් සැපය අවබෝධ කරගත නොහැකියයි. කය වෙහෙසවා හෝ මහණදම් පුරනුවට වටී යයි සිතා හිටි සක්මන අධිෂ්ඨාන කොට ප්‍රධන්වීර්යයෙහි යෙදෙන්නේ පතුල්වල බිබිලි නැගුණුවිට වේදනාව උපේක්ෂාවෙන් සලකා දැඩි වීර්යය කරන්නේ අතිශයින් අරඹන ලද වීර්යය ඇති බැවින් විශේෂයක් උපදවා ගන්නට නොහැක්කෙමි. පැවිද්දෙන් මා හට කවර ප්‍රයෝජනයක්දැයි සිවුරුහැර භෝගයන් අනුභවකරමි. පින්ද කරන්නෙමියි සිතීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේගේ සිත් හැසිරීම් දැන එහි වැඩමවා වීණා උපමාවාදයෙන් අවවාදකොට වීර්යය සමකිරීම පිණිස යෙදෙන ආකාරය දක්වා කමටහන් යොදා ගිජුකුළු පව්වට වැඩි සේක. සෝණද ශාස්තෘන් වහන්සේ සමීපයෙන් අවවාද ලැබ වීර්ය සමථය යොදා විදර්ශනාව උත්සාහවත් කොට රහත්බවෙහි පිහිටියේය. සොණ රහත්වී තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'විපසසිනො පාවචනෙ'** යනාදිය කීය. එහි **විපසසී** යනු විශේෂයෙන් හෝ විවිධ ලෙස බලානුයි විපසසී. **පාවචනෙ** පිළිවෙළින් කියනු ලැබෙනුයි පාවචන නම්. පිටකත්‍රයයි. ඒ විපසසි බුදුරජාණන් වහන්සේගේ ඒ පිටකත්‍රයෙහි යන අර්ථයි. **ලෙණං** යනු සත්වයෝ මෙහි ඇලෙත්නුයි ලෙණ නම්. විහාරයයි. **බන්ධුමා රාජධානියා** යනු කුල පරම්පරා වශයෙන් ඔවුනොවුන් හමුවෙත්නුයි බැඳෙත්නුයි බන්ධු නම්. නෑයෝ. ඔවුහු මෙහි වසත්නුයි බන්ධුමා නම්. ඔහුට බන්ධුහු ඇතැයි හෝ බන්ධුමා නම්. රජවරුන්ගේ වසනස්ථානයනුයි රාජධානි. බන්ධුම වූයේද රාජධානි වූයේද බන්ධුමා රාජධානි. එයට ලෙණක් මා විසින් කරන ලදී යනු සම්බන්ධයි. මෙහි සෙස්ස නොගැඹුරුමය.

සොණකොළිවිස තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.183

දසවැනි අපදානයෙහි **අනොතත්තසරාසනෙන** යනු පර්වත කූටයන්ගෙන් වැසුණු බැවින් චන්ද්‍ර සූර්යයන්ගේ තැවීමෙන් උණුසුම් බවක් මෙහි නැතැයි අනොතත්ත නම්. **සරනති** මහා නදීහු මෙතැනින් යත්නුයි හටගනිත්නුයි ගලාබසිත්නුයි සරො නම්. සිංහමුඛ ආදියෙන් නික්මුණු මහානදීහු තුන් තුන් වරක් පැදකුණුකොට නික්මුණු නික්මුණු දිසාභාගයෙන් **සරනති** යත්නුයි සරො. එයට ආසන්න සමීප ස්ථානයනුයි **අනොතත්ත සරාසනනං. තසමිං** අනෝතත්ත විලට ආසන්නයෙහි සමීපයෙහි යන අර්ථයි. **රමණීයෙ** යනු දේවඅසුර ගාන්ධර්ව කින්නර උරග බුදු පසේබුදු ආදීන් විසින් **රමිතබ්බං** ඇලිය යුතු රමණීය නම්. **තසමිං** ඒ රමණීය වූ **සිලාතලෙ** යනු එකට සත වූ පර්වත ශිලාතලයෙහි යන අර්ථයි. **නානාරතන පජ්ජොතෙ** යනු පද්මරාග වේළුරිය ආදි නොයෙක් රත්නයන්ගෙන් පජ්ජොතෙ පිළිවෙළින් බබළන. **නානාගන්ධ වනන්තරෙ** යනු නානාප්‍රකාර වූ සඳුන් අගිල් කපුරු කොල්ලන් අසෝක නා පුවක් කේතක ආදී නොයෙක් සුවඳ මලින් ගහණ වූ වනාන්තරයෙහි ගුණමහත් බැවින් ද සංඛ්‍යා මහත් බැවින් ද මහත් භික්ෂු සංඝයා විසින් **පරෙතො** පිරිවරන ලද්දේ **ලොකනායකො** තුන්ලොවට ස්වාමී වූ **සම්මා** සම්බුදුරජාණන් වහන්සේ ඒ සිලාසනයෙහි වැඩ හුන්සේක් තමාගේ පූර්වකර්මයන් ප්‍රකාශ කළ සේක. විශේෂයෙන් ප්‍රකට කළ සේක යන අර්ථයි. බුද්ධ අපදානයෙහි ඇතුළත් වුවද මෙහි අපදානයෙහි කුසල අකුසල කර්ම කියැවෙන බැවින් වර්ග සංග්‍රහ වශයෙන් ධර්ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා සංගායනා කළාහුය.

පුබ්බකම්ම පිලොතිකගේ අපදාන අටුවාවයි.

තිස්නවවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.184

සතළිස්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **නගරෙ හංසවතියා** යනාදි වශයෙන් ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි

තැනින්තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර දොරටුපාල පවුලක ඉපිද මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ විය. හේ කෝටි ගණනින් උපයන ලද ධනරාශිය බලා රහසිගතව හුන්නේ මේ සියලු ධනය මා විසින් මැනවින් ගෙන යන්නට වටියයි සිතා බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට සියලු පිරිකර සහිත මහා දානයක් දෙන්නට සනිටුහන් කොට සියලු පරිභෝග පරිෂ්කාර සියදහසක් වශයෙන් කරවා පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට ආරාධනාකොට බුද්ධප්‍රමුඛ මහා සංඝයාට මහා දානයක් දුන්නේ ය. මෙසේ සත්දිනක් දන් දී අවසන් දවසෙහි නිවන් අවබෝධය පතා දිවි ඇති තෙක් පින්කොට ජීවිතය කෙළවර දෙව්ලොව උපන්නේ ස කාමාවචර දිව්‍ය සම්පත් අනුභවකොට මිනිසුන් අතර චක්‍රවර්ති ආදි සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද සියලු ශිල්පයන්හි නිෂ්පත්තියට පැමිණියේ ගෝත්‍ර වශයෙන් පිළින්දිවච්ඡ යයි ප්‍රකට විය. හේ එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව නොබෝකලකින් රහත් වී තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ උදාන වශයෙන් එය ප්‍රකාශ කරන්නේ **නගරෙහංසවතියා** යනාදිය කීය. එහි අර්ථය යට කියන ලදී. **ආසිං දොවාරිකො ආසිං** යනු හංසවතී නුවර රජුගේ ගෘහපාලකයා **ආසිං** වීම යන අර්ථයි. **අකෙඛාහං අමිතං භොගං** යනු රජුට වල්ලභ හෙයින් අනුන් විසින් බොහෙතුං සොලවන්නට නොහැකි අමිතං අප්‍රමාණ **භොගං** ධනය මාගේ ගෙහි **සනනිචිතං** රැස්කරන ලද්දේ විය යන අර්ථයි. **බහුමෙධිගතා භොගා** යනු මෙ මා විසින් **අධිගතා** පැමිණෙන ලද්දේ ලබන ලද්දේ යන අර්ථයි. කුඩ දැලි පිහි ආදී පිරිකරවල නමිද පහසුවෙන් දතහැකිය. පිරිකර දන්දීමේ ආනිසංසද නියාමානුකාරයෙන් පහසුවෙන් දතහැක්කේ ම ය.

පිළිඳිවච්ඡ තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.185

දෙවැනි, තෙවැනි, සිව්වැනි, පස්වැනි අපදාන නොගැඹුරුමය. **සවැනි අපදානයෙහි හිමවනතසස අවිදූරෙ** ආදි වශයෙන් ආයුෂ්මත් **බක්කුල** තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනමද අතීතයෙහි

මෙයින් අසංඛ්‍ය කල්ප සියදහසකට අධික කලකට පෙර අනොමදස්සි භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙරාතුවම බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූයේ තුන්වේදයන් ඉගෙන එහි හරයක් නොදක්නේ පරලොව දියුණුව සොයා යන්නෙමියි සෘෂි පැවිද්දෙන් පැවිදි ව පර්වත පාදයෙහි වාසය කරන්නේ පංචඅභිඥා අෂ්ට සමාපත්තිලාභීව බුදුන් උපන් බව අසා ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගොස් දහම් අසා සරණයන්හි පිහිටියේ ශාස්තෘන් වහන්සේට වාතාබාධ ඇතිවූ කල්හි වනයෙන් බෙහෙත් ගෙනවුත් එය සුව කළේය. හේ එයින් චුතව බඹලොව ඉපිද එක් අසංඛෙය්‍යයක් දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර එක් කුලගෙයක ඉපිද දැනමිනි බවට පැමිණ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක අල්පාබාධ ඇත්තවුන් අතර අගතන්හි තබනු දැක තමා ද ඒ තනතුර අපේක්ෂා කරන්නේ ප්‍රාර්නාවක් කොට දිවි ඇති තෙක් කුසල කර්මයන් රැස්කොට සුගතීන්හිම සැරිසරන්නේ විපස්සි භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙරාතුවම බන්ධුමතී නුවර බමුණු කුලයෙහි උපන්නේ ය. හේ සියලු ශිල්පයන්හි නිෂ්පත්තියට පත්වූයේ එහි හරයක් නොදක්නේ සෘෂි පැවිද්දෙන් පැවිදිව ධ්‍යානලාභී වී පර්වත පාදයෙහි වසන්නේ බුදුන් උපන් බව අසා ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් දහම් අසා සරණයන්හි පිහිටා භික්ෂූන්ට පීතස් රෝගය වැළඳුණු කල්හි එය සුවපත්කොට දිවි ඇතිතෙක් සිට එයින් චුතවූයේ බඹලොව ඉපිද අනූඑක්වැනි කල්පයෙහි දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ කසසප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බරණැස කුලගෙයක ඉපිද ගෘහවාසයෙහි වසන්නේ එක් දිරාගිය විනාශයට යන විහාරයක් දැක එහි පොහොය ගෙය ආදී සියල්ල වාසස්ථානයක් කරවා, එහි භික්ෂු සංඝයාට සියලු බෙහෙත් පිළියෙලකොට දිවි ඇතිතෙක් කුසල්කොට බුද්ධාන්තරයක් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙරාතුවම කොසඹෑනුවර සිටු කුලයක උපන්නේය. හේ මව්කුසින් නික්ම කිරිමවුන් විසින් නීරෝගී බව පිණිස යමුනා නදියෙහි නහවනු ලබන්නේ ඔවුන්ගේ අතින් මිදුණේය. එකල්හි එක් මසකු විසින් ගිලින ලද්දේ විය. කෙවුලෝ ඒ මත්ස්‍යයා දැලින් ගෙන බරණැස සිටුවරයාගේ බිරිඳට වික්කාහුය. ඇය ඌ ගෙන පලන්නී පෙර කරන ලද පින් බලයෙන් නීරෝගී දරුවා දැක 'මට පුතෙක් ලැබුණේයයි ගෙන පෝෂණය කළාය. ජාතක මව්පියන් විසින් ඒ පුවත අසා ගොස් 'මේ අපගේ පුත්‍රයාය. ඔහු අපට දෙව'යි බලකළ කල්හි රජු විසින් දෙදෙනාටම

සාධාරණයක් වේවා'යි කුල දෙකටම දායාදයක් ලෙස විනිශ්චයකොට තැබූ බැවින් බකකුලයයි ලද නම් ඇත්තේ වැඩිවිය පත්වූයේ මහා සම්පත් අනුභව කරන්නේ සිටුකුල දෙකෙහි එකින්එක සමසක් සමසක් වාසය කරයි. ඔවුහු තමතමන්ගේ වාරය පැමිණි කල්හි පහුරක් බැඳ ඒ මත රුවන් මණ්ඩපයක් කරවා පසඟතුරු දී කුමාරයා එහි හිඳුවා නගර දෙක මැද ගඟෙහි එක් තැනකට එති. අනිත් සිටුවරයාගේ මිනිස්සුද එසේම සදා එසේ ඒ ස්ථානයට ගොස් කුමාරයා ඒ අයුරින්ම ගෙන යති. හේ මෙසේ වැඩෙන්නේ දෙපිරිසේම ආශිර්වාදය ලබමින් සිටුවරුන් දෙදෙනාගේ පුත්‍රයා යයි ප්‍රකට වූයේ ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගොස් දහම් අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව සත්දිනයක් වැයම් කරන්නේ අටවැනි දවසෙහි පිළිසිඹියා සහිත රහත්බවට පත්විය. රහත්වී තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ 'හිමවනතසස අවිදූරේ' යනාදිය කීය. එහි අර්ථය යට කියන ලද්දේමය. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය. ඉන්පසු උන්වහන්සේ රහත්බවට පත්ව විමුක්ති සුඛයෙන් වාසය කරන්නාහු සැටදහසක් ආයුෂ ඇත්තේව පිරිනිවන් පෑ සේක.

බකකුල තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.186

සත්වැනි අපදානයෙහි හරියා මෙ කාලකතා යනාදි වශයෙන් ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන පින් රැස්කරන්නේ සුමෙධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ගෘහවාසය තබා වසන්නේ භාර්යාව ද දරුවන් ද කලුරිය කළකල්හි සෝනුලින් අනනා ලද්දේ අරණ්‍යයට පිවිස වැටුණු ඵල බොජුන් ඇත්තේ රුක්මුල්හි වාසය කළේය. එකල්හි සුමෙධ භාග්‍යවතුන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස එහි වැඩමකොට දහම් දෙසා සෝක නමැති හුල උගුලා දැමූ සේක. හේ දහම් අසා පහන් සිත් ඇත්තේ සුවඳමලින් භාග්‍යවතුන් වහන්සේ පුදා පසලා පිහිටුවා වැඳ හිසෙහි

ඇඳිලි බැඳ ස්තුති කළේය. හේ ඒ පින්කමින් දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ දෙතැනම සුව අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවර බිම්බිසාර රජුගේ පුරෝහිතයාට පුත් ව උපන්නේ ය. ඔහුට ගිරිමානන්ද යයි නමක් විය. හේ දැනමිති බවට පැමිණ ශාස්තෘන් වහන්සේ රජගහ නුවරට වැඩි ගමනේදී බුද්ධානුභාවය දැක ලද සැදැහැ ඇත්තේ පැවිදි ව මහණදම් පුරන්නේ කීපදවසක් ගම් අසපුවක වසා ශාස්තෘන් වහන්සේ වඳින්නට රජගහ නුවරට ගියේය. බිම්බිසාර මහරජ උන්වහන්සේගේ පැමිණීම අසා උන්වහන්සේ කරා එළඹ ස්වාමීනි මෙහිම වසනු මැනව. මම සිව්පසයෙන් උපස්ථාන කරමියි පවරා ගියේ නමුදු බොහෝ කළයුතු දෑ ඇති බැවින් එය සිහි නො කළේය. තෙරුන් වහන්සේ අවකාශ ස්ථානයක ම විසූ සේක. දෙව්වරු තෙරුන් වහන්සේ තෙමෙහියි යන බියෙන් වැසිදහර වැළකුහ. රජ තෙමේ වැසි නොවැසීමට කරුණ විමසා දැන තෙරුන්වහන්සේට කුඩා කුටියක් කරවීය. තෙරුන්වහන්සේ වසන්නාහු සේනාසන සප්‍රාය ලැබීමෙන් චිත්ත සමාධානය ලැබ වීර්ය මහත්වය යෙදූ විදසුන් උත්සුක කරවා රහත් බවට පැමිණියහ. උන්වහන්සේ රහත්බවට පැමිණ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'භරියා මෙ කාලකතා'** යනාදිය කීහ. භාග්‍යවතුන් වහන්සේට කළ දැන්වීමද භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද අනුශාසනාව ද මාර්ගඵල අධිගම අපදානය ද පෙළ අනුසාරයෙන් පහසුවෙන් දත හැක්කේ ම ය.

ගිරිමානන්ද තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

අටවැනි නවවැනි දසවැනි අපදාන නොගැඹුරු අර්ථ ඇත්තේමය

සතළිස්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.187

සතළිස් එක්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **පබ්බතකූටං නිසසාය** යනාදි වශයෙන් ආයුෂ්මත් තිසස මෙතෙතය්‍ය තෙරුන් වහන්සේගේ අපදානයයි. තවුස් පැවිද්දෙන් පැවිදි ව පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට අඳුන්දිවිසම දන්දීම පමණක් වෙනස්ය. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය. දෙවැනි අපදානයෙහි **පබ්භාරකූටං නිසසාය** යනාදි වශයෙන් ආයුෂ්මත් පුණ්ණක තෙරුන් වහන්සේගේ අපදානයයි. එහි හිමවතෙහි යක්ෂ සේනාපතියකු වී පිරිනිවි බුදුරජාණන් වහන්සේගේ ආදාහනය කිරීම පමණක් වෙනස්ය. සෙස්ස පෙළ අනුසාරයෙන් පහසුවෙන් දතහැක්කේ ම ය. **හිමවනතසස අවිදූරෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් මෙතගුත්ත තෙරුන් වහන්සේගේ අපදානයයි. හිමවත සමීපයෙහි අශෝක පර්වතයෙහි හේ තවුසෙක් ව පන්සලෙහි වසන්නේ සුමේධ සම්බුදුරජාණන් වහන්සේ දැක පාත්‍රය ගෙන ගිතෙලින් පුරවා දුන්නේය. එය විශේෂයයි. පින්පල ආදී සෙස්ස පහසුවෙන් දතහැක්කේ ම ය. අපදාන ගාථාවන්ගේ අර්ථයද ප්‍රකට ම ය. සිව්වැනි අපදානයෙහි **ගඞ්ගාභාගීරථීනාම** යනාදි වශයෙන් ආයුෂ්මත් ගොධක තෙරුන් වහන්සේගේ අපදානයයි. එහිද බමුණෙක් ව භාගීරථී ගංගාව තරණය කරන්නේ භික්ෂූන් දැක පහන් සිතැත්තේ ඒදඬුවක් කරවා බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට පවරාදුන් බව පමණක් විශේෂයි. පින්පල දක්වන ගාථාවල අර්ථය නියමානුසාරයෙන් පහසුවෙන් දතහැක්කේ ම ය. පස්වැනි අපදානයෙහි **හිමවනතසස අවිදූරෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් උපසීව තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතුමා ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ගෘහවාසය අත්හැර ඍෂි පැවිද්දෙන් පැවිදිව හිමවතෙහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ දැක තණ ඇතිරියක් අතුරා සතුටු වැඩහුන් භාග්‍යවතුන් වහන්සේට සල්මල් පූජාවක් කළේය යන්න මේ විශේෂයයි. **සෙස්ස නොගැඹුරු ම ය. සවැනි අපදානයෙහි මිගලුඳොපුරෙ ආසිං** යනාදි වශයෙන් ආයුෂ්මත් නඳක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතුමාද වනාහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ කාලයෙහි කරවික පක්ෂියෙක් ව මිහිරි හඬින් නාද කරමින් ශාස්තෘන් වහන්සේ ප්‍රදක්ෂිණා කළේය. පසුකලෙක මොනරෙක් ව එක්තරා පසේ බුදුරජාණන් වහන්සේ නමක් වසන ලෙන්දොර පහන් සිතැත්තේ දවසට තෙවරක් මිහිරිහඬින්

(නද කරනවිට) වැස්සක් වැස්සේය. මෙසේ භවයෙහි තැනින් තැන පින්කොට අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සැවැත්නුවර කුලගෙයක ඉපිද නඳකයයි ලද නම් ඇත්තේ ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි දහම් අසා පැවිදි ව විදසුන් වඩා රහත් බවට පැමිණියේය. උන්වහන්සේ පසුකලෙක තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'මිගලුදෙදාපුරෙ ආසිං' යනාදිය කීහ. එහි පසේ බුදුරජාණන් වහන්සේට මණ්ඩපයක් කොට නෙළුම්මලින් වැසීම පමණක් විශේෂයකි.

සත්වැනි අපදානයෙහි **පබ්භාරකුටං නිස්සාය** යනාදි වශයෙන් ආයුෂ්මත් හෙමක තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද ඍෂි පැවිද්දෙන් පැවිදි ව හිමවතෙහි වසන්නේ පියදසසි භාග්‍යවතුන් වහන්සේ පැමිණි බව දැක රන්මුවා පුටුවක් පනවා දුන්නේ ය. එහි වැඩහුන් බුදුරජාණන් වහන්සේට කළයක් තරම් දඹපලයක් ගෙනවුත් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත්පහන්වීම පිණිස ඒ ඵලය වැළඳූ සේක. විශේෂය මෙපමණය.

අටවැනි අපදානයෙහි **රාජාසි විජයො නාම** යනාදි වශයෙන් ආයුෂ්මත් තොදෙය්‍ය තෙරුන් වහන්සේගේ අපදානයයි. එහිද **රාජාසි විජයො නාම** යනු තරුණ කාලයෙහි පටන් සියලු සංග්‍රාමයන්හි ජයගන්නා බැවින් සතරසංග්‍රහ වස්තූන්ගෙන් ජනයා රංජනය කරන හෙයින් ඇලෙන බැවින් විජයනම් රජ වීය යන අර්ථයි. **කෙතුමතී පුරුත්තමෙ** යනු කේතු යනු ධ්වජපතාකය. නැතහොත් නගරයෙහි සිට පාලනය සඳහා නුවරමැද ඔසවන ලද රුවන් තොරන් ය. ඒ කේතු නිතරම ඔසවනලදුව බබලමින් ඇතැයි කේතුමතී, සියලු ජනයාගේ සිත් ධනධාන්‍යයෙන් පිරේනුයි **පුරං**. කේතුමතිය ද නගරය ද ශ්‍රේෂ්ඨ අර්ථයෙන් උත්තම ද වේනුයි **කේතුමතී පුරුත්තම** ඒ උතුම් පුරයෙහි. **සුරො විකකම සම්පන්නො** යනු අභිත වූ වීර්ය සම්පන්න වූ විජය නම් රජතෙමේ වාසය කරයි යනු සම්බන්ධයි. මෙබඳු වූ පුරය ද සියලු වස්තු වාහන ද හැරදමා හිමවතට පිවිස ඍෂි පැවිද්දෙන් පැවිදි ව වසන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේ දැක සොම්නස් උපදවා සඳුන් පූජා කිරීම පමණක් විශේෂයි.

නවවැනි අපදානයෙහි **නගරෙ හංසවතියා** යනාදි වශයෙන් ආයුෂ්මත් ඡත්‍රකණ්ණිය තෙරුන් වහන්සේගේ අපදානයයි. එහි සිටුපුත්‍රයෙක් ව රන්පහයෙහි වසන බව ආදිය කියන ලද්දේමය. දසවැනි අපදානයෙහි

හිමවනතසස අවිදූරෙ යනාදි වශයෙන් ආයුෂ්මත් උදෙන තෙරුන් වහන්සේගේ අපදානයයි. එහි හිමවත සමීපයෙහි පදුම පර්වතය නිසා තවුස් පැවිද්දෙන් පැවිදි ව වසන්නහු විසින් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට නෙළුම් මල්ගෙන පුදන ලද බවම විශේෂයයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරුමය.

සතළිස් එක්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

සතළිස්දෙවැනි වර්ගයෙහි ප්‍රථම අපදාන පහසුවෙන් දතහැක්කේ ම ය. **සිව්වැනි** අපදානයෙහි **නගරෙ බන්ධුමතියා** යනාදි වශයෙන් ආයුෂ්මත් මධුමංසදායක තෙරුන් වහන්සේගේ අපදානයයි. එහි **සුකරිකො** යනු ඌරුමස් විකුණා ජීවිතය කරන්නේ **උක්කොටකං රන්ධයිත්වා** යනු අක්මා පෙනහලු මස් පිස මධුමාංශයෙහි **ඔකිරිං** බැහුවෙමි. ඒ මසින් පාත්‍රය පුරවා භික්ෂු සංඝයාට දී ඒ පින්කමින් මේ බුද්ධෝත්පාද කාලයෙහි රහත් බවට පැමිණියෙමි යන අර්ථයි. නාගපලලවක තෙරුන් වහන්සේගේ පස්වැනි අපදානයයි. එකදීපිය තෙරුන් වහන්සේගේ පස්වැනි අපදානයයි. එකදීපිය තෙරුන් වහන්සේගේ සවැනි අපදානයද, උච්ඡඩ්ගපුප්ඵිය තෙරුන් වහන්සේගේ සත්වැනි අපදානයද, යාගුදායක තෙරුන් වහන්සේගේ අටවැනි අපදානයද පතෝදන දායක තෙරුන් වහන්සේගේ නවවැනි අපදානයද, මඤ්ඣදායක තෙරුන් වහන්සේගේ දසවැනි අපදානයද සියල්ල පහසුවෙන් දත හැක්කේමය.

සතළිස් දෙවැනි වර්ග වර්ණනාවයි.

සතළිස් තුන්වැනි වර්ගයෙහි සියලු තෙරුන් වහන්සේලාගේ අපදාන නොගැඹුරුම ය. හුදෙක් තෙරවරුන්ගේ නම්වල වෙනසත් පින්පල වෙනසත් විශේෂය. සතළිස් සතරවැනි වර්ගයෙහිද සියලු අපදාන ප්‍රකට ම ය. හුදෙක් පින්වල වෙනසත් ඵලයන්ගේ වෙනසත් විශේෂය. සතළිස් පස්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **කකුසන්ධො මහාවීරෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් විභිටකමිඤ්ජිය තෙරුන් වහන්සේගේ අපදානයයි. එහි **විජමිඤ්ජමදාසහං** යනු බුළුගෙඩි පළා **බීජානි** මද ගෙන මීපැණි හකුරු සමග යොදා කකුසන්ධ භාග්‍යවතුන් වහන්සේට දුනිමි යන අර්ථයි. දෙවැනි

අපදාන ආදී සියල්ල පහසුවෙන් දත හැක්කේ ම ය. තෙරවරුන්ගේ නාමයන්ගේ වෙනස්කම් ආදියද පෙළ අනුසරින් දතයුතුය. සතළිස් සයවැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **ජගතිං කාරයිං අහං** යනු උතුම් බෝරුක වටා ආලින්දයක් මම කරවීමි යන අර්ථයි. සෙසු දෙවැනි අපදාන ආදී සියල්ල නොගැඹුරු ම ය. සතළිස් සත්වැනි වර්ගයෙහි පළමුවැනි අපදාන ආදිය පෙළ අනුසරින් පහසුවෙන් දතහැක්කේ ම ය.

සතළිස් අටවැනි වර්ගයෙහි පළමුවැනි දෙවැනි අපදාන නොගැඹුරුමය. තෙවැනි අපදානයෙහි **කොසියො නාම භගවා** යනු කෝසිය ගෝත්‍රයෙහි උපන් බැවින් කොසිය නම් පසේබුදුරජාණන් වහන්සේ යන අර්ථයි. **චිත්තකූටෙ** යනු චිත්‍රකූට කෛලාශකූට සානුකූට ආදී අනෝත්තත්ත විල වටකොට සිටි පර්වත කූටවල නොයෙක් රත්න ඖෂධ ආදියෙන් විචිත්‍ර වූ චිත්‍රකූට පර්වතයෙහි ඒ පසේ බුදුරජාණන් වහන්සේ වසන සේක යන අර්ථයි. සිව්වැනි පස්වැනි අපදාන නොගැඹුරුමය. සවැනි අපදානයෙහි **කුසටයික මදාසනං** යනු පක්බිහත්ත, උපොසථික හත්ත ධුර හත්ත සලාක හත්ත ආදියෙහි කුසපත් වශයෙන් දියයුතු සලාක බත් අටක් මම දුනිමි යන අර්ථයි. සත්වනි අපදානයෙහි **සොභිතො නාම සම්බුද්ධො** යනු ආරෝහ පරිණාහ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ ව්‍යාමප්‍රභා ආදියෙන් ශෝභමාන වූ ශරීරයක් ඇති බැවින් සොභිත නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ යන අර්ථයි. අටවැනි අපදානයෙහි **කකකරායං වසීතදා** යනු ඒ දස පින්කිරියවත් කරන ජනයා මෙහි වෙසෙත්නුයි තක්කරා රාජධානි නම්. ඒ තක්කරා රාජධානියෙහි ඒකල්හි වෙසේ යන අර්ථයි. නවවැනි අපදානයෙහි **පානධිං සුකතං ගයහ** යනු සුන්දර ආකාරයෙන් නිෂ්පාදනය කරන ලද පාවහන් යුගලය ගෙන යන අර්ථයි. දසවැනි අපදානය පහසුවෙන් දත හැක්කේ ම ය.

සතළිස් අටවැනි වර්ග වර්ණනාවයි.

සතළිස් නවවැනි වර්ගයෙහි පළමුවැනි අපදානය පහසුවෙන් දතහැක්කේ ම ය. දෙවැනි අපදානයෙහි **අධිචුප්පතතිතා බුද්ධා** යනු **අධිවෙචන** කරුණක් නැතිව **උපපතතිකා** තෙමේම හටගත්. අනිකුත් දේව බ්‍රහ්ම මාරාදී උපදේශ දෙන්නවුන් රහිතව ස්වයංභූ ඥානයෙන් **උපපනනා** උපන් පහළවූ යන අර්ථයි. **ඔදුම්බරික පුපඵංව** යනු උදුම්බර රුකෙහි මල්

දුර්ලභය. දුර්ලභ උත්පත්තියක් මෙන්. **චන්දමහි සසකංයථා** චන්ද්‍ර මණ්ඩලයෙහි සස රේඛාව හා සමාන වූවක් දුර්ලභය. **වායසානං යථා බීරං** යනු කපුටුවන්ට නිතර රැඳවල් බඩසයින් පෙළෙන බැවින් කිරි දුර්ලභ වන්නා සේ. මෙසේ ලෝකනායකයෙක් දුර්ලභය. අසංඛ්‍ය සතරක් හෝ අසංඛ්‍ය අටක් හෝ අසංඛ්‍ය සොළොසක් හෝ කල්ප සියදහසක් පාරමී පුරා ලද බැවින් දුර්ලභ වූ ලෝකනායකයන් වහන්සේ යන අර්ථයි. තෙවැනි අපදානයෙහි **මධුං හිසෙහි සවති** යනු පොකුරුම් නෙළුම් කෙසුරින් **සංති** යනු වැගිරේ. **බිරං සපපි මුලාළීහි** යනු කිරි ද ගිතෙල් වෙඬරු ද නෙළුම් අලයෙන් **සවති** වැගිරෙයි. එහෙයින් මා සතු ඒ දෙකම බුදුරජාණන් වහන්සේ පිළිගන්නා සේක්වායි යන අර්ථයි. සිව්වැනි පස්වැනි සවැනි අපදාන නොගැඹුරුමය. සත්වැනි අපදානයෙහි **චත්තාළීස දිව්ජාපිච** යනු දෙවරක් උපන්නේනුයි ද්විජ. කුමාර වයසෙහි නැගුණු දත් වැටුණු බැවින් නැවත නැගුණු දත් ද්විජ නමි. විවරණය ද යට නිදාන කථාවෙහි කියන ලද අර්ථ ඇත්තේමය. අටවැනි අපදානය නොගැඹුරුමය. නවවැනි අපදානයෙහි **තදාහං මාණවො ආසිං** යනු යම්කලෙක සුමේධ පණ්ඩිත තෙමේ දීපංකර භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් විවරණ ලැබ්ද එකල්හි මම මේඝ නම් බ්‍රාහ්මණ මාණවකයෙක්ව සුමේධ තවුසා ඍෂි පැවිද්දෙන් පැවිදිව ශික්ෂාපදයන්හි මැනවින් හික්මුණේ කිසියම් පාපමිත්‍රයකු සමග එක්වූයේ එක්වීම් දෝෂයෙන් පාපවිතර්කයන්ගේ වසඟයට ගියේ මව මැරීමේ කර්මය නිසා නිරයෙහි ගිනිදැල් ආදී දුක් අනුභවකොට එයින් චුතවූයේ සමුද්‍රයෙහි තිමිංගල මහා මත්ස්‍යයෙක්ව උපන්නේ මුහුද මැද ගමන්කරන මහා නැවක් ගිලිනු කැමැත්තෙන් ගියේ මාදැක වෙළෙන්දෝ බියට පත්වූවෝ 'අනේ ගෞතම භාග්‍යවතුන් වහන්සේ'යැයි ශබ්දයක් කළහ. ඉක්බිති මහා මත්ස්‍යයා පූර්ව වාසනා බලයෙන් බුද්ධ ගෞරවය උපදවාගෙන එයින් චුතවූයේ සැවැත්නුවර විභව සම්පත් ඇති බමුණු කුලයෙක ඉපිද සැදැහැත්තේ ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පැවිදිව පිළිසිඹියා සහිත රහත්බවට පැමිණ දවසට තෙවරක් උපස්ථානයට ගොස් සිහිකරමින් වඳියි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **'චිරං ධම්මරුචිති'** යනාදිය කී සේක. ඉක්බිති ඒ තෙරුන් වහන්සේ **'සුචිරං සත පුඤ්ඤ ලකඛණං'** ආදී ගාථාවන්ගෙන් ස්තුති කරති. ස්වාමීනි, සියයක් පුණ්‍ය ලක්ෂණ දරන්නා වූ ගෞතමයන් වහන්ස, **පතිපුබබෙන විසුදධපචචයං** යන පෙර දීපංකර පාදමූලයෙහි පිරිපුන් පාරමී ප්‍රත්‍ය සම්භාර ඇත්තේ දිගුකලකින් මා විසින් නොදක්නා ලද්දෙහි යන අර්ථයි. **අහමජජ සුපෙකඛනං** යනු අද මේ දවසෙහි මම

සුපෙකඛානං සොඳුරු දසුනක්, සුන්දර දෘෂ්ටියක් හෝ **නිරූපමගඝහං** උපමා රහිත ශරීරයක් ඇති ගෞතමයන් වහන්සේ **වන** ඒකාන්තයෙන් **පසසාමි** දකිමි යන අර්ථයි. **සුචිරං විහතතමො තයා** යනු විශේෂයෙන් හතතමො විධිවංසනය කරන ලද මෝහ ඇත්තේ, ඔබවහන්සේ මා විසින්ද බොහෝ කලකින් ස්තුති කරන ලද්දේ වෙති යන අර්ථයි. **සුචිරකෙඛන නදී විසොහිනා** යනු මේ තෘෂ්ණා නමැති නදිය **සුරකෙඛන** රැකීම් වශයෙන් සොහිතා ඔබ විසින් අලංකාර කරන ලද්දේය යන අර්ථයි. **සුචිරං අමිලං විසොධිතං** යනු සුටයුචිරං දිගුකලකින් නිර්මල වූ නිර්වාණය විශේෂයෙන් සොධිතං මනාසේ අවබෝධ කරන ලදී යන අර්ථයි. **නයනං ඤාණමයං මහාමුනෙ චිරකාලං සමධිගතො** යනු මහාමුනෙ මහා ශ්‍රමණයන් වහන්ස, ඥානමය වූ දිව්‍යස ඔබවහන්සේ සමධිගතො ලබා බොහෝ කලෙකි යන අර්ථයි. **තයා න විනථො** පුනරනතරං යනු මම නැවත අතරමැද ඔබ විසින් **පරිනථො** අන්ධ කරන ලද්දේ නොවීමි යන අර්ථයි. **පුනරජ්ජ සමාගතො තයා** යනු අද මෙකල්හි ඔබ සමග නැවතත් **සමාගතො** එක්වූයේ ඔබ සමග වසමි යන අර්ථයි. **මාහි නසසති කතානි ගොතම** යනු ගොතම සර්වඥ වූ බුදුරජාණන් වහන්ස, ඔබ සමග කරන ලද එක්වීම් ආදිය **නහි නසසති** පරිනිර්වාණය තෙක් වෙනස් නො වන්නේ ය යන අර්ථයි. සෙස්ස නො ගැඹුරුම ය.

ධම්මරුචි තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

දසවැනි අපදානය පහසුවෙන් දත හැක්කේමය.

සතළිස් නවවැනි වර්ග වර්ණනාවයි.

පනස්වැනි වර්ගය ආදි වර්ග සතරෙහි සියලු අපදාන නොගැඹුරුමය. පනස් සතරවැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **පදුමුත්තරො නාම ජිනො** යනාදි වශයෙන් ආයුෂ්මත් මහා කච්චායන තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ

පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි ගෘහපති මහා කුලයක ඉපිද වැඩිවිය පත්වූයේ එක් දවසක් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් දෙසන ලද දෙය විස්තර වශයෙන් අර්ථ විභජනය කරන්නවුන් අතර අගතන්හි තබනු ලබන එක් භික්ෂුවක දැක තමාද ඒ ස්ථානය ප්‍රාර්ථනා කරන්නේ ප්‍රාර්ථනාවක් කොට දානාදී පින්කම් කොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ සුමේධ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි විද්‍යාධරයෙක්ව අහසින් යන්නේ එක් වන ළැඟැබක වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතැත්තේ කිණිහිරිමලින් පූජා කළේය. හේ ඒ පින්කමින් වරින්වර සුගතීන්හිම පරිවර්තනය වන්නේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි බරණැස කුලගෙයක ඉපිද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ස්වර්ණ චෛත්‍යයක් කරන ස්ථානයෙහි සියදහසක් අගනා රන් ගඩොළු ගොඩක් කොට මේ පිනින් උපනුපත් තැන මාගේ ශරීරය රන්වන් වේවායි ප්‍රාර්ථනාවක් කළේය. ඉන්පසු දිවි ඇති තාක් කුසලකර්ම කොට එක් බුද්ධාන්තරයක් දෙවිමිනිසුන් අතර සැරිසරා මේ බුද්ධෝත්පාද කාලයෙහි උදේනි නුවර චණ්ඩපජ්ජොත රජුගේ පුරෝහිතයාගේ ගෙහි උපන්නේ ය. ඔහුට නම් තබන දවසෙහි මාගේ පුත්‍රයා රන්වන් වූයේ නම ගෙනම ආයේ වනැයි කඤ්චන මාණව යනුවෙන්ම නමක් තැබීය. හේ වැඩිවිය පත්ව තුන්වේදය උගෙන පියාගේ ඇවෑමෙන් පුරෝහිත තනතුර ලැබීය. හේ ගෝත්‍ර වශයෙන් කච්චාන යයි දන්නා ලද්දේය. චණ්ඩපජ්ජොත රජ බුදුන් උපන් බව අසා 'ආචාර්යය, ඔබ එහි ගොස් ශාස්තෘන් වහන්සේ මෙහි වඩමවාගෙන එවයි ඔහු යැවීය. හේ තමා සත්වැනිකොට ශාස්තෘන් වහන්සේ සමීපයට ගියේය. ශාස්තෘන් වහන්සේ ඔහුට දහම් දෙසූ සේක. දේශනාවගේ කෙළවර මිනිසුන් සත්දෙන සමග පිළිසිඹියා සහිත රහත් බවෙහි පිහිටියේය. උන්වහන්සේ මෙසේ පැමිණි අර්හත් ඵල ඇත්තේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු 'පදුමුත්තරෝ නාම ජිනෝ යනාදිය කීහ. එය යට කියන ලද අර්ථ ඇත්තේ ම ය. මෙසේ තෙරුන්වහන්සේ උතුම් අර්ථයක් නිපදවාගෙන ස්වාමිනි, පජ්ජොත රජතුමා ඔබවහන්සේගේ පාවැදීමටත් ධර්මය ඇසීමටත් කැමැත්තේයයි දැන්වූහ. ශාස්තෘන් වහන්සේ කච්චාන ඔබම එහි යන්න. ඔබ ගියකල්හි රජ පැහැදෙන්නේ යයි කී සේක. තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ අණින් තමා සත්වැනි කොට එහි ගොස් රජු පහදවා අවන්හි ජනපදයෙහි සසුන පිහිටුවා නැවත ශාස්තෘන් වහන්සේගේ සමීපයට ම පැමිණි සේක.

තමාගේ පූර්වකර්ම වශයෙන් කච්චායන ප්‍රකරණය, මහා නිරුත්තිප්‍රකරණය, නෙත්තිප්‍රකරණය යන ප්‍රකරණ තුන සඟමැද ප්‍රකාශ කළ සේක. ඉක්බිති සතුටට පත් භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, මගේ ශ්‍රාවකයන් අතර සංක්ෂේපයෙන් කියූ දෙය විස්තර වශයෙන් විභජනය කරන යම් කෙනෙක් වේද ඒ කච්චායන යයි අග්‍රස්ථානයෙහි තබන ලද්දාහු අග්‍රඵල සුඛයෙන් වාසය කළ සේක.

මහාකච්චායන තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.189

දෙවැනි අපදානයෙහි **ඉතොසතසහසසමහි** යනාදි වශයෙන් ආයුෂ්මත් වක්කලී තෙරුන් වහන්සේගේ අපදානයයි. මේ තෙරනම ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි කුලගෙයක ඉපිද දැනමිති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගිය උපාසකවරුන් සමග විහාරයට ගොස් පිරිස් කෙළවර සිටියේ දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ශ්‍රද්ධාවන්තයින් අතර අගතන්හි තබනු දැක තමාද ඒ තනතුර ප්‍රාර්ථනා කරන්නේ සත්දිනක් බුදුපාමොක් භික්ෂු සංඝයාට මහදන් දී ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුට අන්තරායක් නැති බව දැක විවරණ දුන් සේක. හේ දිවි ඇතිතෙක් කුසල් රැස්කොට එය සමෘද්ධ වනසේ කොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සැවැත්නුවර බමුණු කුලයෙහි උපන්නේ ය. ඔහුට වක්කලී යයි නමක් තැබූහ. එය **කලි** යනු අපරාධ තලකැලැල් ආදී දෝෂයට සමාන වචනයකි. නොසේදූ ස්වර්ණ පිණ්ඩයක් බඳු බැවින් පහව ගිය **කලි** දොස් මොහුට ඇත්තේනුයි වකාර ආගමයක් කොට වක්කලී යයි කියනු ලැබේ. හේ වැඩිවිය පත්වූයේ තුන්වේදය ඉගෙන බ්‍රාහ්මණ ශිල්පයන්හි නිෂ්පත්තියට ගියේ ශාස්තෘන් වහන්සේ දැක රූපකාය සම්පත්තිය දැකීමේ අතෘප්ත වූයේ ශාස්තෘන් වහන්සේ සමගම හැසිරෙයි. ගිහිගෙයි වසන්නේ නිරන්තරයෙන් ශාස්තෘන් වහන්සේගේ දර්ශන නොලබන්නෙමියි ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි පැවිදිව අහර වළඳන කාලය හා

ශරීරකෘත්‍යය කරන කාලය හැර සෙසුකල්හි යම්තැනෙක සිට දසබලධාරීන් වහන්සේ දක්නට හැක්කේද එහි සිටියේ අනිකුත් කාර්ය හැරදමා භාග්‍යවතුන් වහන්සේ දෙසම බලමින් වාසය කරයි. ශාස්තෘන් වහන්සේ ඔහුගේ ඥාන පරිපාකයට පැමිණෙමින් බොහෝ කලක් ඔහු රූප දර්ශනයෙන් හැසිරෙන කල්හි කිසිවක් නොකියා නැවත එක් දවසක් වක්කලී, මේ කුණු ශරීරය දැකීමෙන් ඔබට ඇති ප්‍රයෝජනය කුමක්ද. වක්කලි, යමෙක් ධර්මය දකීද හේ මා දකී. වක්කලි ධර්මය දකින්නේ මා දකි'යයි කී සේක. ශාස්තෘන් වහන්සේ මෙසේ කියද්දීත් තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ දර්ශනය අත්හැර අන්තැනක යාමට නොහැක්කාහු වෙති. ඉන්පසු ශාස්තෘන් වහන්සේ 'මේ භික්ෂුව සංවේගය නොලැබ අවබෝධ කර නොගන්නේ යයි වස් එළඹෙන දිනයෙහි 'වක්කලී ඉවත්වන්නැ'යි අත දික්කළ සේක. හේ ශාස්තෘන් වහන්සේ විසින් මම එළවාදමන ලද්දේ වෙමියි ශාස්තෘන් වහන්සේ සමීපයෙහි සිටීමට නොහැක්කේ 'ශාස්තෘන් වහන්සේ දැකීමට නොලබම් නම් මාගේ ජීවිතයෙන් ඇති ප්‍රයෝජනය කුමක්දැයි ගිජුකුළු පව්වෙහි ප්‍රපාතස්ථානයකට නැගුණේය. ශාස්තෘන් වහන්සේ එපුවත දැන මේ භික්ෂුව මා සමීපයෙන් ආස්වාසයක් නොලබන්නේ මාර්ගඵලයන්ට ඇති උපනිශ්‍රය නසා ගත්තේය'යි තමන් වහන්සේ දක්වා ආලෝකයක් යවන සේක,

පාමුජ්ජ බහුලෝ භික්ඛු පසන්නෝ බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං

පමුදිත බව බහුල සසුනෙහි පහන් මහණහු
සකර සන්සුන් සුව ඇති - නිවන්පදයට පැමිණේ

ගාථාව වදාරා වක්කලි එන්නැයි අත දිගුකළ සේක. තෙරුන්වහන්සේ මා විසින් බුදුරජාණන් වහන්සේ දක්නා ලදහ. එන්නැයි ඇමතුමක්ද ලැබුණේයයි බලවත් ප්‍රීති සෝමනස්සයක් උපදවාගෙන කොතැනින් එම්දැයි තමාගේ පැමිණෙන ස්ථානය නොදැනම ශාස්තෘන් වහන්සේ සමීපයෙහි අහසෙහි පැන නගින්නේ පළමු පයින්ම පර්වතයෙහි සිටියේම ශාස්තෘන් වහන්සේ විසින් කියන ලද ගාථා ආවර්ජනය කරන්නේ අහසෙහිදීම ප්‍රීතිය ඔබා තබා සිව්පිළිසිඹියා සහිතව රහත් බවට පැමිණියාහු යයි අංගුත්තර අට්ඨාවේද ධම්මපද වර්ණනාවෙහිද පැමිණියේය. මෙහි වනාහි මෙසේ දතයුතුයි. **කිංතෙ වකකලී** යනාදි වශයෙන් ශාස්තෘන් වහන්සේ විසින්

අවවාද දෙනු ලැබුවේ ගිජුකුළු පව්වෙහි වාසය කරන්නේ විදර්ශනාව එළඹවා ගත්හ. ඔහුගේ ශ්‍රද්ධාවෙහි බලවත් බැවින් මෙසේ විදර්ශනා වීථියට නොබසී. භාග්‍යවතුන් වහන්සේ එය දැන කමටහන් පිරිසිදුකොට දුන් සේක. ඉන්පසුව ඔහු විදර්ශනාව මුදුන්පත් කරගැනීමට නොහැකි වූයේමය. ඉක්බිති ඔහුට ආහාර වෙනසින් වාතාබාධයක් උපන. ඔහු වාතාබාධයෙන් පෙළෙමින් සිටින බව දැන භාග්‍යවතුන් වහන්සේ එහි වැඩමකොට විචාරන සේක්,

වාතරොගාභි නීතො තවං විහරං කානනෙ වනෙ
පව්ටය ගොචරෙ ලූඛෙ කථං භික්ඛු කරිසසසි

මහණකුට නුසුදුසු ගොරහැඩි වෙනෙහි වෙසෙමින්
වාත රෝගයෙන් පෙළෙමින් මහණ ඔබ කුමි කෙරෙහිද?

යයි ඇසූ සේක.

ඒ අසා,

පීතිසුඛෙන විපුලෙන එරමානො සමුසසයං
ලුඛමපි අහි සමෙහානෙතා විහරිසසාමි කාන නෙ

මහා තුටු සුවයක් පතුරුවා මුළු සිරුරෙහි
කුළුඅහර වළඳමින් වෙසෙනෙමි මහා වනයෙහි

භාවෙනෙතා සතිපට්ඨානෙ ඉන්ද්‍රියානි බලානිව
බොජ්ඣංගානිව භාවෙනෙතා විහරිසසාමි කානනෙ

සීවටන් පස් ඉඳුරන් පස් බලයන්ද වඩමින්
සත් බෝ අඟ ද වඩමින් වෙසෙනෙමි මහා වනයෙහි

ආරද්ධ විරියො පහිතතෙතා නිචචං දළහ පරකකමො
සමගගෙ සහිතෙ දිසවා විහරිසසාමි කානනෙ

ඇරඹූ විරිය ඇත්තෙමි නිවන්මගම නහවා
නිතර දැඩි පැරකුම් වෙමි - වෙසෙමි මෙහි සඟයන් දැක

අනුසසරනෙනා සම්බුද්ධං අගඟං දනතං සමාහිතං
අනඤ්ඤතෝ රතනිං දිවං විහරිසසාමි කානනෙ

අග දැමී සමාහිත - සම්බුදුන් සිහිකරමින්
දිව රැ අනලස්ව - වසනෙමී මහා වනයෙහි

ගාථා හතර කීය. ඒ ගාථාවල අර්ථය ථේරගාථා වර්ණනාවෙහි කියන ලද්දේම ය. මෙසේ තෙරුන් වහන්සේ විදර්ශනාව උත්සුක කරවා රහත් බවට පැමිණියහ. රහත්බවට පත්ව තමාගේ පෙර කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු '**ඉතො සත සහසසමහි**' ආදිය කීහ. එහි **ඉතො** යනු කකුසඳ ආදී බුදුවරුන් උපන් භද්‍රකල්පයෙන් යට කල්ප සියදහසක් මතුයෙහි යන අර්ථයි. **පදුමාකරවදනො** යනු මනා සේ පිපුණු පියුමක සිරිය ඇති මුහුණ. **පදුමපකකකෙඛා** යනු සුදු පියුම් පෙති හා සමාන ඇස් යන අර්ථයි. **පදුමුත්තරගනධොච** යනු පියුම් සුවඳ ඇති මුඛය යන අර්ථයි. **අඤ්ඤානං නයනූපමො** යනු ඇස් නැති සත්වයන්ට ඇසක් වැනි දහම් ඇසීමට සියලු සත්වයන්ට ප්‍රඥා චක්ෂුස ආදී ඇස් දෙන්නේ යන අර්ථයි. **සනත වෙසො** යනු සංසුන් බව සංසුන් ඉරියව් ඇත්තේ **ගුණනිධී** යනු ගුණයන්ට නිධානයක් වූයේ. සියලු ගුණ සමූහයන්ට තබන ස්ථානයක් වූයේ යන අර්ථයි. **කරුණාමනි ආකරො** යනු සාධූන්ගේ සිත් කම්පාකිරීම් සංඛ්‍යාත කරුණාවෙන් පිරිසිදු වූ අදහසට ද **ආකරො** ආකාර වූයේ. බ්‍රහ්මසුර **සුරවචිතො** යනු බ්‍රහ්මයන් විසින් ද අසුරයන් විසින් ද දෙවියන් විසින් ද **අචචිතො** පුදන ලද්දේ යන අර්ථයි. **මධුරෙන රුතෙනච** යනු කෝකිලයන් විසින් කරන ලද මිහිරි හඬින් සියලු ජනයා රංජනය කරත් යනු සම්බන්ධයි. **සතථවී සාවකං සකං** යනු තමාගේ ශ්‍රාවකායට මධුර ධර්ම දේශනාවෙන් **සතථවි ස්තුති** කළ සේක යන අර්ථයි. **සදධාධිමුතතෙනා** යනු අදහන ශ්‍රද්ධාවෙන් සසුනෙහි **අධිමුතතෙනා** පිහිටියේය යන අර්ථයි. **මම දසසන ලාලසො** යනු මා දැක්මෙහි ව්‍යාවෘත වූයේ ඇලුණේ. **තංඛානමහි රොචයිං** යනු ඒ ශ්‍රද්ධාධිමුක්ත තනතුර **අභිරොචයිං** කැමති වීමී ප්‍රාර්ථනා කෙළෙමී යන අර්ථයි. **පීත** හෙමයඤ්ඤාපවිතධඞං යනු රන් අත්පා ඇති සිරුර යන අර්ථයි. **නොනීත සුබුමාලංමං** යනු නවනීත මෙන් මෘදු තරුණ අත්පා උපන්පා ජාතපලලව කොමලං යනු අසෝක දලු කොළවල ඇති කෝමල බව මෙන් මෘදු වූ යන අර්ථයි. **පිසාචිභය තජජිතා** යනු එකල්හි මෙසේ වූ කුමාර වූ මා අඤ්ඤාපිසාචි එක් රාක්ෂසියක් භයෙන් තර්ජනය

කළාය යන අර්ථයි. එකල්හි මහේසී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පාමුල මා **සයෙසය්‍යුං** තැබූහ. **දීනමානසා** බියට පත් සිත් ඇති මාගේ මව්පියෝ මේ දරුවා ඔබට දෙමුයි මොහුගේ සරණ ප්‍රතිෂ්ඨාව වේවායි නිදි කරවූහ යනු සම්බන්ධයි. **තදා පටිගහී සෝ මං** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ මාගේ මව වියපත් කල්හි **ජාලිනා** දැල් නූලෙන්. **සඞ්ඛලඛෙකන** චක්‍ර ලක්‍ෂණ ආදියෙන් ලක්‍ෂණ වූ. **මුදුකොමල පාණිනා** යනු මෘදුවූ වෙනස් වූ අත්ලෙන් මා අල්ලා ගත්තේය යන අර්ථයි. **සබබපාරමී සමඉතං** යනු සියලු දාන පාරමිතාදියෙන් **සමඉතං** උපන්. **ලකඛිනිලයනං පරං** යනු පුණ්‍ය සම්භාරයෙන් උපන් උතුම් වූ පෙර පින් ඇති **සබබ සුභාකිණණං** සියලු **සුභෙන වණ්ණන** සලකුණුවලින් **ආකිණණං** ගහණ වූ භාග්‍යවතුන් වහන්සේගේ අත්පා හිස් ආදී රූපය දැක **අතිතෙනා** තෘප්තියට නොපැමිණියේ මම වසම් යනු සම්බන්ධයි. **තදා පණණරසනතගො** යනු ඒ මා රහත් බවට පත්වූ කාලයෙහි ශීල ආදී පසළොස් චරණ ධර්මයන්ගේ අනතගො කෙළවරට පැමිණියේ, සම්පූර්ණ කළ තැනැත්තේ යන අර්ථයි. මරණනතගො යනුවෙන්ද පාඨයකි. ඒ මරණයාගේ **අනතං** නිවනට පැමිණියේය යන අර්ථයි. ශ්‍රද්ධාවෙන් බර වූවන්ගේ අග්‍රස්ථානය පෙන්වීය යනු සම්බන්ධයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂු සංඝයා මැද වැඩහුන් සේක් 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්‍ෂූන් අතර ශ්‍රද්ධාධිමුක්ත වූ යමෙක් අග්‍රවේද ඒ වක්කලී' යයි මා අග්‍රස්ථානයෙහි තැබූ සේකැයි කියන ලද්දේ වෙයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

වක්කලී තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.190

පදුමුත්තරො නාම ජිනො යනාදි වශයෙන් ආයුෂ්මත් මහාකපින තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි කුලගෙයක ඉපිද දැනමිනි බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්‍ෂුවක භික්‍ෂූන්ට අවවාද දෙන්නවුන් අතර අගතන්හි තබනු දැක ගරුබුහුමන් කොට ඒ තනතුර

ප්‍රාර්ථනා කළේය. හේ දිවි ඇතිතාක් කුසල්කොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ බරණැසට නුදුරෙහි එක් පෙහෙරගමක දෙටු පෙහෙකරුගේ ගෙහි උපන්නේය. එකල්හි දහසක් පමණ පසේබුදුවරු හිමවතෙහි අටමාසයක් වැස වස් කාලයෙහි සාරමසක් ජනපදයෙහි වසති. උන්වහන්සේලා එක්වරක් බරණැස නුදුරෙහි බැස සෙනසුන් පිළියෙල කරනු පිණිස අත්කම් ඉල්වවැයි රජුගේ සමීපයට පසේ බුදුවරුන් අටනමක් යැවූහ. එකල්හි වනාහි රජුගේ වප්මඟුල වෙයි. රජ තෙමේ පසේබුදුවරු වැඩියහයි අසා නික්ම පැමිණි කරුණ විමසා 'ස්වාමීනි, අද අවකාශයක් නැත. හෙට අපගේ වප්මඟුලය. තෙවැනි දවසෙහි කරන්නෙමියි පසේ බුදුවරුනට කීය. පසේ බුදුවරු වෙනත් ගමකට පිවිසෙන්නෙමුයි ගියහ. එසමයෙහි දෙටු පෙහෙකරුගේ බිරිය කිසියම් කටයුත්තක් සඳහා බරණැසට යන්නී ඒ පසේබුදුවරුන් දැක වැඳ 'ස්වාමීනි, අවේලාවෙහි ආර්යයන් වහන්සේලා වැඩියේ කුමක් නිසාදැයි ඇසුවාය. උන්වහන්සේලා මුලසිට කථාව කියූහ. ඒ අසා සැදැහැවත් බුද්ධිමත් ස්ත්‍රිය 'ස්වාමීනි, හෙට අපගේ භික්ෂාව ගනු මැනැවැයි ආරාධනා කළාය. 'නැගණියනි, අපි බොහෝ දෙනෙකි. කොපමණක්ද ස්වාමිනි? නැගණියනි දහසක් පමණ. 'ස්වාමීනි, අපගේ ගමෙහි දහසක් පමණ දෙන වසති. එක් එක්කෙනා එක් එක් නමකට භික්ෂාව දෙන්නේය. ඉවසා වදාළ මැනව. ඔබවහන්සේලාගේ වසන ස්ථානය මම ම කරවන්නෙමි'යි කීවාය. පසේබුදුවරු ඉවසා වදාළහ. ඈ ගමට පිවිස උද්ඝෝෂණය කළාය. අම්මේ තාත්තේ, මම දහසක් පමණ පසේබුදුවරුන් දැක ආරාධනා කෙළෙමි. ආර්යයන් වහන්සේලාට වැඩසිටිනා තැන් සංවිධාන කරවු. කැඳ බත් ආදිය සම්පාදනය කරවුයි ගම්මැද මණ්ඩපයක් කරවා ආසන පනවා දෙවැනි දවසෙහි පසේ බුදුවරුන් වඩාහිඳවා ප්‍රණීත ආහාර පානයෙන් වළඳවා බත්කිස අවසන්හි එගම සියලු ස්ත්‍රීන් ගෙන ඔවුන් සමග පසේබුදුවරුන් වැඳ තෙමසක් වසනු සඳහා ප්‍රතිඥාවක් ගෙන නැවත ගමෙහි උද්ඝෝෂණය කළාය. 'අම්මේ තාත්තේ එක් එක් පවුලකින් එක් එක් පුරුෂයෙක් පිහියා පොරෝ ආදිය ගෙන කැලෑවට පිවිස දැව ගොඩක් ගෙනවුත් ආර්යයන් වහන්සේලාට වසනස්ථානය කරනු මැනවැයි. ගම්වැසියෝ ඇයගේ නියෝගයෙහි පිහිටා එක් එක්කෙනා එක් එක් වසනස්ථානය කොට රාත්‍රිස්ථාන දිවාස්ථාන ආදිය සමග පන්සල් දහසක් නිමවා නැවත තමාගේ පන්සලට පැමිණි පසේ බුදුරජාණන් වහන්සේට 'මම සකසා උපස්ථාන කරන්නෙමි. මම සකසා උපස්ථාන කරන්නෙමි'යි කියා උපස්ථාන කළහ. ඈ වස් වැසිකල්හි තම තමාගේ පන්සලෙහි වස් විසූ පසේ බුදුවරුන්ට සිවුරු රෙදි පිළියෙල

කරවයි එකඟ කරවාගෙන එක් එක් පසේ බුදුරජාණන් වහන්සේට දහසක් වටනා සිවුරක් දෙවුවාය. පසේබුදුවරු විසූ වස් ඇත්තාහු අනුමෝදනා කොට වැඩියාහුය. ගම්වැසියෝ ද මේ පින්කමකොට ඉන්පසුව තව්තිසා දෙව්ලොව ඉපිද ගණ දේවතා නම් වූහ. ඔවුහු එහි දිව්‍ය සම්පත් අනුභව කොට කස්සප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි කෙළෙඹි ගෙයක උපන්හ. පෙර දෙටු පෙහෙකරු දෙටු කෙළෙඹියාගේ පුත්‍රයා විය. ඔහුගේ බිරියද එක් දෙටු කෙළඹියකුගේ දුවය. සෙස්සන්ගේ භාර්යාවරු සෙසු කෙළෙඹියන්ගේ දූවරු වූහ. ඒ සියල්ලෝම වැඩිවිය පත්වූවෝ අන් කුලයට යන්නාහු තමතමන්ගේම ගෙවල් විය. ඉක්බිති එක්දවසක් විහාරයෙහි ධර්මශ්‍රවණය දැන්වූ කල්හි ශාස්තෘන් වහන්සේ ධර්මය දේශනා කරතියි අසා ඒ සියලුම කෙළෙඹියෝ දහම් අසන්නෙමුයි භාර්යාවන් සමග විහාරයට ගියහ. ඔවුන් වෙහෙර මැදට පිවිසි කෙණෙහි වැස්සක් වැස්සේය. සෙසු ජනයෝ කුලුපග වූ ඥාති සාමණේර ආදීන්ගේ පිරිවෙන් ආදියට පිවිසියාහුය. ඔවුන්ට එබන්දවුන් නැති බැවින් කිසිතැනකට පිවිසෙන්ට නොහැක්කාහු වෙහෙර මැදම සිටියාහුය. ඉක්බිති දෙටු කෙළෙඹියා මෙසේ කීය. 'පින්වතුනි බලවු. අපගේ වෙනස. කුලපුත්‍රයෙක් නම් මෙපමණකින් ලජ්ජා විය යුතුයි. ආර්යය, කුමක් කරමුද. විශ්වාස වූ තැනක් නැති බැවින් අපි මෙබඳු වෙනසකට පැමිණියෝ වෙමු. සියලු ධනය ගෙනවුත් පිරිවෙනක් කරන්නෙමු. 'ආර්යය මැනවැයි දෙටු කෙළෙඹියා දහසක් දුන්නේ ය. සෙස්සෝ පන්සියය පන්සියය බැගින් දුන්හ. ස්ත්‍රීහු ඉන් අඩ බැගින් දුන්හ. ඔවුහු ධනය ගෙනවුත් දහසක් කුළුගෙවල් පිරිවරකොට ඇතිව ශාස්තෘන් වහන්සේට වැඩවසනු පිණිස මහා පිරිවෙනක් කරවූහ. නවකම් මහත් බැවින් ධනය ප්‍රමාණවත් නොවන කල්හි කලින් දුන් ධනයෙන් අඩක් බැගින් දුන්හ. පිරිවෙන නිමි කල්හි විහාර උත්සවය කරන්නාහු බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට සත්දිනක් මහදන් දී විසිදහසක් භික්ෂූන්ට සිවුරු පිළියෙල කළහ. දෙටු කෙළෙඹියාගේ භාර්යාව ප්‍රඥාවෙන් සිටියා 'මම ඔවුන්ට සමාන වූවක් නොකොට අතිරේක වූ යමක් කොට ශාස්තෘන් වහන්සේ පුදන්නෙමියි කටුකරඬු මල් පැහැති දහසක් වටනා සළුවක් සමග කටුකරඬුමල් ගොටුවක් ගෙන ශාස්තෘන් වහන්සේ අනෝජ (කටුකරඬු) මලින් පුදා ඒ සළුව ශාස්තෘන් වහන්සේගේ පාමුල තබා 'ස්වාමීනි, උපනුපන් තැන මාගේ සිරුර අනෝජමල් පැහැ වේවා. මාගේ නම අනෝජා නම් ම වේවායි ප්‍රාර්ථනාවක් කළාය. ශාස්තෘන් වහන්සේ එසේ වේවායි අනුමෝදනා කළ සේක. ඒ සියලු දෙනම දිවි ඇතිතාක් සිට එයින් චුත වූවාහු දෙව්ලොව උපන්හ. ඔවුහු මේ බුද්ධෝත්පාද

කාලයෙහි දෙව්ලොවින් චුතව ජ්‍යෙෂ්ඨයා කුක්කුටවතී නගරයෙහි රජකුලයෙහි ඉපිද දැනමිති බවට පැමිණ කප්පින රජනම් විය. සෙස්සෝ අමාත්‍ය කුලයෙහි උපන්හ. ජ්‍යෙෂ්ඨයාගේ භාර්යාව මගධ රට සාගල නුවර රජකුලයෙහි උපන්නාය. ඇයගේ සිරුර අනෝජමල් පැහැම විය. ඒ නිසා ඇයට අනෝජාදේවී යයි නමක් තැබූහ. ඈ වැඩිවිය පත්වූවා කප්පින රජුගේ ගෙට ගොස් අනෝජා දේවියයි ප්‍රකට වූවාය. සෙසු ස්ත්‍රීහුද අමාත්‍ය කුලයෙහි ඉපිද වැඩිවිය පත්වූවාහු ඒ අමාත්‍ය පුත්‍රයන්ගේ ගෙවලට ගියාහුය. ඒ සියලුදෙනම රජුගේ සම්පත් සමාන සම්පත් අනුභව කළාහුය. යම්කලෙක රජ තෙමේ අලංකාරයෙන් යුතුව ඇතුපිට නැගී හැසිරේද, එකල්හි ඔවුනු එසේම හැසිරෙති. මෙසේ ඔවුන් එක්ව කළ පින්වල විපාකයෙන් එක්වම සම්පත් අනුභව කළහ. රජුට වාළය, වාළවාහනය, පුෂ්පය, පුෂ්ප වාහනය සුපත්‍ර යයි අශ්වයෝ පස්දෙනෙක් වෙති. ඔවුන් අතරින් රජ සුපත්‍ර අසුගේ පිට නගියි. ඉතිරි සතරදෙන අසරුවන්ගේ හසුන් ගැනීම පිණිස දුන්නේ ය. රජතෙමේ උදෑසනම ඔවුන්ට කෑම දෙවා, කොල්ලනි, යමු. යොදුන් දෙකතුනක් ඇවිද බුදුන් හෝ දහම් හෝ සඟුන් හෝ උපන් බව අසා මට සුවහසුනක් දන්වවු යයි යැවීය. ඔව්හු සිව්දොරින් නික්ම දෙතුන් යොදුනක් ඇවිද කිසිදු හසුනක් නොලැබ ආපසු පැමිණියාහුය. ඉක්බිති එක් දවසක් රජ සුපත්‍ර අසුපිට නැගී ඇමතිවරුන් දහසක් පිරිවරා උයනට යන්නේ ක්ලාන්ත රූප ඇති පන්සියයක් පමණ වෙළඳුන් නගරයට පිවිසෙනු දැක මොවුහු මහමග ක්ලාන්ත වූවෝය. ඒකාන්තයෙන් මොවුන්ගේ සමීපයෙන් එක් යහපත් හසුනක් අසන්නෙමියි ඔවුන් කැඳවා 'කොහිසිට ආවහුදැ'යි ඇසීය. 'දේවයන් වහන්ස, මින් යොදුන් විස්සක් ඈත සාවත්‍ථි නම් නගරයක් ඇත. එහි සිට ආවෝ වෙමු'යි ඔබගේ දේශයෙහි කිසියම් හසුනක් ඇත්තේද. ඇත දේවයන් වහන්ස, බුදුරජාණන් වහන්සේ උපන් සේක. රජ තෙමේ එකෙණෙහිම බලවත් ප්‍රීතියෙන් පිරුණු ශරීර ඇත්තේ කිසිවක් සලකා ගැනීමට නොහැක්කේ මොහොතක් ගතකොට නැවත දරුවනි, කුමක් කියවුදැයි ඇසීය. දේවයන් වහන්ස, බුදුරජාණන් වහන්සේ උපන් සේක. රජතෙමේ දෙවැනි වරටත් තුන්වැනි වරටත් එසේම ගතකොට සිව්වැනි වර දරුවනි, කුමක් කියවුදැයි අසා, බුදුරජාණන් වහන්සේ උපන්සේකැයි කී කල්හි දරුවනි සුව හසුනක් ඇසීම වෙනුවෙන් ඔබලාව සියදහසක් දෙමියි කියා, දරුවනි වෙනත් හසුනක් ඇත්දැයි විචාළේය. ඇත දේවයන් වහන්ස, ධර්මය උපන්නේය. රජතෙමේ එය ද අසා පෙර පරිදිම තෙවරක් ගතකොට සිව්වැනි වර ධර්මය උපන්නේයයි කී කල්හි මෙහිදීත් ඔබට

සියදහසක් දෙමියි කියා, වෙනත් කිසියම් හසුනක් ඇත්තේද දරුවනියි ඇසීය. ඇත දේවයන් වහන්ස, සංඝයා උපන්නේ ය. රජතෙමේ එයද අසා එසේම තෙවරක් ගතකොට සිව්වැනි වර සංඝයා උපන්නේයයි කීකල්හි මෙහිදීත් ඔබට සියදහසක් දෙමියි කියා ඇමතිවරුන් දහසක් දෙන දෙස බලා දරුවෙනි, කුමක් කරන්නෙමුදැයි ඇසීය. දේවයන් වහන්ස, ඔබවහන්සේ කුමක් කරන්නේද? දරුවනි, මම බුදුන් උපන්නේ ය, ධර්මය උපන්නේය, සංඝයා උපන්නේ යයි අසා නො නවතින්නෙමි. භාග්‍යවතුන් වහන්සේ උදෙසා ගොස් උන්වහන්සේ සමීපයෙහි පැවිදි වන්නෙමි. දේවයන් වහන්ස, අපිත් ඔබවහන්සේ සමග පැවිදි වන්නෙමු. රජ තෙමේ රන්පතක අකුරු ලියවා වෙළඳුන්ට දී මෙය අනෝජා නම් දේවියට දෙවු. ඈ ඔබලාට තුන්සිය දහසක් දෙන්නීය. මෙසේත් ඇයට කියවු. රජු විසින් ඔබවහන්සේට ඓශ්වර්යය දෙන ලදී. සුවසේ සම්පත් වළඳන්න. යම්හෙයකින් රජ කොහිදැයි ඇසුවොත්, ශාස්තෘන් වහන්සේ උදෙසා පැවිදි වන්නෙමියි කියා ගියේයැයි දන්වවු යයි කීය. ඇමතියෝ ද තම බිරියන්ට එසේම හසුන් යැවූහ. රජතෙමේ වෙළඳුන් යවා දහසක් ඇමතිවරුන් පිරිවරකොට ඇත්තේ එකෙණෙහිම නික්මුණේය. ශාස්තෘන් වහන්සේද ඒ දවසෙහි උදෑසන ලෝකය බලනසේක් පිරිවර සහිත කප්පින රජු දැක මේ මහාකප්පින වෙළඳුන් අතින් තෙරුවන් උපන් බව අසා ඔවුන්ගේ වචනයට තුන්සිය දහසකින් පුදා රජකම හැරදමා දහසක් ඇමතිවරුන් පිරිවරකොට ඇත්තේ මා උදෙසා පැවිදිවනු කැමැත්තේම නික්මෙන්නේය. හෙතෙමේ පිළිසිඹියා සහිත රහත්බවට පැමිණෙන්නේ ය. ඔහුට පෙරගමන් කරන්නෙමියි. දෙවැනි දවසෙහි කුඩා ගමක් පාලනය කරන රජකුට පෙරගමන් කරන චක්‍රවර්ති රජකු මෙන් තමා ම පාසිවුරු ගෙන විසියොදුන් මග ගොස් චන්‍රභාගා නදී තෙර නුග රුකමූල සවණක් බුදුරැස් විහිදුවා වැඩහුන් සේක. රජද එන්නේ එක් නදියක් වෙත පැමිණ මේ කුමක්නම් ඇත්තිදැයි විමසීය. දේවයන් වහන්ස, අරවච්ඡා නමි. දරුවනි, මෙහි පරිමාණය කෙතෙක්ද? ගැඹුරින් ගවුවකි. පුළුලින් දෙගව්වකි දේවයන් වහන්ස. මෙහි නැවක් හෝ පහුරක් ඇත්තේද. නැත දේවයන් වහන්ස. රජ නදිය දෙස බලන්නේ, එම්බා, ජාතිය ජරාව කැඳවයි. ජරාව මරණය කැඳවයි. මම නොවෙනස් සිත් ඇත්තේ වී තෙරුවන් උදෙසා නික්මුණේ වෙමි. ඒ තෙරුවන් අනුභාවයෙන් මෙය ජලය සේ නොවේවායි තෙරුවන් ගුණ ආවර්ජනය කොට **'ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුදෙධා'** යනාදි බුදුගුණ සිහිකරන්නේ පිරිස් සහිතව අසුන් දහසක් සමග දිය මතුපිටට පැන්නේය. සෙන්ධවයෝ ගල්පිටක මෙන්

පැන්නාහුය. කුරවල අග පමණක් තෙමිණ. හේ ඉන් එය තරණයකොට පෙරට යන්නේ තවත් නදියක් දැක මේ කවර නම් ඇත්තිදැයි ඇසීය. දේවයන් වහන්ස, මැය නීලවාහා නම් ඇත්තිය. මැයගේ පරිමාණය කෙතෙක්ද? ගැඹුරිනුත් පුළුලිනුත් අඩයොදුනකි දේවයන් වහන්ස. සෙස්ස පෙර පරිදිමය. ඒ නදිය දැක **'ස්වාක්ඛාතො භගවතා ධම්මො'** යනුවෙන් ධර්මානුස්මෘතිය සිහිකරන්නේ පැන්නේය. එය ද ඉක්මවා යන්නේ තවත් නදියක් දැක මේ කිනම් වේදැයි ඇසීය. දේවයන් වහන්ස, චන්‍දභාගා නම්. මැයගේ පරිමාණය කෙතෙක්ද? ගැඹුරිනුත් පුළුලිනුත් යොදුනකි දේවයන් වහන්ස. සෙස්ස පෙර පරිදිම වේ. ඒ නදිය දැක **'සුපටිපන්නො භගවතො සාවක සංඝො'** යයි සංඝානුස්මෘතිය සිහි කරන්නේ පැන්නේ ය. ඒ නදිය ද ඉක්මවා යන්නේ ශාස්තෘන් වහන්සේගේ ශරීරයෙන් නික්මෙන සවණක් බුදුරැස් නුගරුකෙහි අතුරිකිලි පත් බබළවනු දැක මෙසේ සිතීය. මේ ආලෝකය සඳුගේ නොවේ. සූර්යයාගේ ද නොවේ. දේවමාරබ්‍රහ්ම සුපර්ණ නාගයන්ගෙන් කිසිවකුගේවත් නොවේ. ඒකාන්තයෙන් මම ශාස්තෘන් වහන්සේ උදෙසා පැමිණෙන්නේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දක්නා ලද්දේ වන්නේවෙමියි එකෙණෙහිම අසුපිටින් බැස නැමුණු සිරුරු ඇත්තේ බුදුරැස් අනුසාරයෙන් ශාස්තෘන් වහන්සේ කරා එළඹ හිඟුල් දියෙහි කිමිදෙන්නාක් මෙන් බුදුරැස් අන්තයට පිවිසියේය. හේ ඇමතිවරුන් දහස සමග ශාස්තෘන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. ශාස්තෘන් වහන්සේ ඔවුන්ට අනුපිළිවෙළ කථාව කියූ සේක. දේශනාවගේ කෙළවර පිරිවර සහිත රජ සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති සියල්ලෝ නැගිට පැවිද්ද ඉල්ලූහ. ශාස්තෘන් වහන්සේ මේ කුල පුත්‍රයන්ට ඍද්ධිමය පාසිවුරු පැමිණෙන්නේදැයි සලකා බලන්නේ මේ කුලපුත්‍රයෝ දහසක් පසේබුදුවරුන්ට සිවුරු දහසක් දුන්හ. කසසප බුදුරදුන්ගේ කාලයෙහි විසිදහසක් භික්ෂූන්ට විසිදහසක් සිවුරු දුන්හ. මේ කුලපුත්‍රයන්ට ඍද්ධිමය පාසිවුරු පැමිණීම ආශ්චර්යයක් නොවේ යයි දැන දකුණු අත දිගුකොට එව මහණෙනි, දුක මැනවින් අවසන් කරනු පිණිස බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙවු යයි කී සේක. ඔවුහු එකෙණෙහි අටපිරිකර දරන්නාහු සියවස් වූ තෙරවරුන් මෙන් වී අහසට පැන නැගි නැවත බැස ශාස්තෘන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නාහුය. ඒ වෙළෙන්දෝ රජගෙට ගොස් දේවියට රජු විසින් එවන ලද හසුන දන්වා දේවිය විසින් එන්නැයි කී කල්හි පිවිස එකත්පසෙක හුන්නාහුය. ඉක්බිති දේවිය ඔවුන්ගෙන් විචාළාය. දරුවනි, කුමන කරුණක් නිසා ආවාහුද? අපි රජතුමා විසින් ඔබවහන්සේ වෙත එවනු ලැබීමු. කුමන කරුණකටද?

තුන්සිය දහසක් දෙවන්න. මිතුරෙනි, ඔබලා බහුලව කතා කරවු. ඔබලා විසින් රජතුමා හමුවෙහි කුමක් කරන ලද ද. රජතුමා ඔබලාගේ කුමක් කෙරෙහි පැහැදිණිද, මෙතරම් ධනයක් දෙන්නැයි කියන්නේ? දේවියනි, කිසිවක් නොකරන ලදී. එක් හසුනක් පමණක් දැන්වූයෙමු. දරුවනි, මටද ඒ හසුන දන්වන්ට හැකිද? හැකිය දේවීනි. රන් කෙණ්ඩියෙන් මුව සෝදා දේවියනි, බුදුන් උපන්නේය යි. ඈද අසා ප්‍රීතියෙන් පිරිගිය සිරුරු ඇත්ති තෙවරක් කිසිවක් නොසලකා සිව්වැනි වර බුදුන් උපන්නේ යයි අසා දරුවෙනි, මේ පදයෙහි රජතුමා විසින් කුමක් දෙනු ලැබිද, දේවියනි, සියදහසකි. දරුවෙනි, මෙවැනි හසුනක් අසා ඔබලාට සියදහසක් දීමෙන් කර ඇත්තේ නුසුදුසු දෙයකි. මම ඔබලාට මාගේ දුප්පත් පඬුර තුන්සිය දහසක් දෙමි. තවත් ඔබලා විසින් දන්වන ලද්දේ කුමක්ද? ඔවුහු මේ මෙයයි ඉතිරි හසුන් දෙකද දැන්වූහ. දේවිය පෙර පරිදිම තෙවරක් නොසලකා සිව්වැනි වර තුන්සිය දහසක් දුන්නාය. මෙසේ ඔවුහු සියල්ල දොළොස් සියදහසක් ලැබූහ. ඉක්බිති දේවිය ඔවුන්ගෙන් විචාළාය. දරුවනි, රජතුමා කොහිද? දේවියනි, රජතුමා ශාස්තෘන් වහන්සේ උදෙසා පැවිදි වන්නෙමියි ගියේ විය. මට කිසියම් හසුනක් දෙනු ලැබිද? සියලු ඓශ්වර්යය ඔබතුමියට පවරා දෙනු ලැබිය. ඔබතුමී පහසුවෙන් සම්පත් අනුභව කරනු මැනව. ඇමතිවරු කොහි ගියෝද? දේවියනි, ඔවුහුද රජතුමා සමගම පැවිදි වන්නමුයි ගියාහුය. ඈ ඇමතිවරුන්ගේ භාර්යාවන් කැඳවා සොහොයුරියනි, ඔබගේ සැමියෝ රජතුමා සමග පැවිදි වන්නමුයි ගියාහුය. ඔබ කුමක් කරන්නහුද? දේවියනි, ඔවුන් විසින් අපට කිසියම් හසුනක් එවන ලද්දේද? ඔවුහු තමන්ගේ සම්පත් පහසුවෙන් අනුභව කරවයි ඔබට පවරා දෙනු ලැබිය. දේවියනි, ඔබතුමිය කුමක් කරන්නෙහිද? සොහොයුරියනි, ඒ රජතුමා මාර්ගයෙහි සිටියේම තුන්සිය දහසකින් තෙරුවන් පුදා කෙළපිඩක් මෙන් සම්පත් අත්හැර පැවිදි වන්නෙමියි නික්ම ගියේය. මා විසින්ද තෙරුවන් පිළිබඳ හසුන අසා ඒ තෙරුවන් නවසිය දහසකින් පූජාකරන ලදී. මේ සම්පත් රජතුමාට පමණක් නොව මටද දුකක් ම ය. රජතුමා විසින් හළන ලද කෙළපිඩ බිම දණගසා මුවින් ගන්නේ කවරෙක්ද? මටද සම්පතින් අර්ථයක් නැත. ශාස්තෘන් වහන්සේ උදෙසා පැවිදි වන්නෙමි. දේවියනි, අපටත් පුළුවන්නම්. අපිද ඔබතුමිය සමග පැවිදි වන්නෙමු. එසේනම් එවු. රිය දහසක් යොදවා රියට නැගී ඔවුන් සමග නික්මී අතරමග පළමුවැනි නදිය දැක යම්සේ රජතුමා පළමුවෙන් විචාළේද, එසේම විචාරා සියලු පුවත් අසා රජතුමා විසින් ගන්නා ලද මගම බලවු යයි කියා සෛන්ධවයන්ගේ පාසලකුණු

නොදක්නෙමුයි කීකල්හි, රජතුමා තෙරුවන් උදෙසා නික්මුණේ වෙමියි සත්‍යක්‍රියා කොට තෙරුවන් ගුණ සිහිකොට ගියේ වෙයි. මම ද තෙරුවන් උදෙසා නික්මුණා වෙමි. ඒ මේ ආනුභාවයෙන් මේ ජලය ජලය මෙන් නොවේවායි තෙරුවන් ගුණ සිහිකරන්නී රිය දහස යැවුවාය. ජලය ගල් මතුපිටක් මෙන් විය. රියසක්වල අග පමණක් තෙමිණ. මේ උපායෙන්ම ඉතිරි නදී දෙකද තරණය කළහ. ශාස්තෘන් වහන්සේ ඔවුන් ආ බව දැන යම්සේ ඔවුහු තමා සමීපයේ හුන් සැමියන් වූ භික්ෂූන් නොදකිත්ද එසේ අධිෂ්ඨාන කළ සේක. දේවිහු ද යන්නාහු ශාස්තෘන් වහන්සේගේ ශරීරයෙන් නික්මෙන රැස් දැක එසේම සිතා ශාස්තෘන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පසක සිටියාහු මෙසේ ඇසූහ. 'ස්වාමීනි, මහාකප්පින රජතුමා ඔබවහන්සේ උදෙසා නික්ම ආයේ වෙයි. ඔහු කොහිද? අපට ඔහු පෙන්වනු මැනවි. හිඳගන්න. දැන් මෙතැනදීම ඔහු දක්නහුය. සියල්ලෝ තුටුපහටු වූවෝ 'මෙහිම හුන් සැමියන් නොදකින්නෙමුයි හිඳගත්හ. ශාස්තෘන් වහන්සේ අනුපිළිවෙළ කථාව කියූ සේක. අනෝජා දේවිය දේශනාවගේ කෙළවර ඔවුන් සමග සෝවාන් ඵලයට පැමිණියාය. මහා කප්පින තෙරුන් වහන්සේ ඔවුන්ට දේශනා කරනු ලබන ධර්මදේශනාව අසා පිරිස් සහිතව පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියහ. එකෙණෙහි ශාස්තෘන් වහන්සේ ඔවුන්ට ඒ භික්ෂූන් පෙන්වූ සේක. ඔවුන්ට පැමිණි මොහොතෙහිම තම සැමියන් කහසිවුරු දරා හිස මුඩුකොට සිටිනු දැක සිත් ඒකාග්‍රතාවක් නොවනු ඇත. මාර්ගඵල නිපදවා ගැනීමට නොහැකිවනු ඇත. ඒ නිසා අචල ශ්‍රද්ධාවෙහි පිහිටිකල්හි පටන් රහත් බවට පැමිණි ඒ භික්ෂූන් පෙන්වූ සේක. ඔවුහුද ඔවුන් දැක පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි, ඔබවහන්සේලාගේ පැවිදිකිස මුදුන්පැමිණියේ වනැයි කියා ශාස්තෘන් වහන්සේ වැඳ එකත්පස්ව සිට පැවිද්ද ඉල්ලූහ. එසේ කී කල්හි ශාස්තෘන් වහන්සේ උප්පලවණ්ණා තෙරණියගේ පැමිණීම සිතූ සේක. ඈ ශාස්තෘන් වහන්සේ සිතූ කෙණෙහිම අහසින් පැමිණ ඒ සියලු ස්ත්‍රීන් රැගෙන අහසින් මෙහෙණවරට පමුණුවා පැවිදි කළාය. ඒ සියල්ලෝ නොබෝ කලකින්ම රහත්බවට පැමිණියාහුය. ශාස්තෘන් වහන්සේ භික්ෂූන් දහස රැගෙන අහසින්ම ජේතවනයට වැඩි සේක. එහිදී ආයුෂ්මත් මහාකප්පින තෙරුන් වහන්සේ රාත්‍රිස්ථාන ආදියෙහිදී අහෝ සැපයි අහෝ සැපයි යැයි උදන් අනමින් හැසිරෙත්. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. ස්වාමීනි, මහාකප්පින අහෝ සැපයි අහෝ සැපයි යනුවෙන් උදන් අනමින් හැසිරෙයි. තමාගේ රජසුවය අරබයා උදන් අනන්තේ යයි සිතමු. ශාස්තෘන් වහන්සේ ඔහු ගෙන්වා 'කප්පින, ඔබ කම්සුව අරබයා උදන් අනන්නේ සත්‍යයද?

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ අරබයා උදන් අනන බවද, නැතහොත් වෙනෙකක් අරබයා උදන් අනන බවද දන්නා සේක. ඉක්බිති ශාස්තෘන් වහන්සේ මහණෙනි, මාගේ පුත්‍රයා රජසුව අරබයා උදන් නො ඇනීය. ධර්මයෙහි හැසිරෙන මාගේ පුත්‍රයාට ධර්මප්‍රීතිය උපදී. හේ අමෘත මහා නිර්වාණය අරබයා මෙසේ උදන් අනන්නේ වේදැයි අනුසන්ධි ගළපා දහම් දෙසනසේක් මේ ගාථාව කී සේක.

ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙනන චෙතසා
අරියප්පවේදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො

දහම් රස බී සුවසේ - සුපසන් සිතින් සැනපේ
අරිජනයා දෙසූ දම්හී - නුවණැත්තේ හැමදා ඇලේ

ඉක්බිති එක් දවසක් ශාස්තෘන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. කෙසේද මහණෙනි, කප්පින භික්ෂූන්ට ධර්ම දේශනා කරයිද? **ස්වාමීනි, අල්ප** උත්සාහ ඇත්තේ දිවැධම්ම සුඛ විහාරයෙන් වාසය කරයි. අවවාද මාත්‍රයක්වත් නොදෙයි. ශාස්තෘන් වහන්සේ තෙරුන් කැඳවා 'කප්පින, අන්තේවාසිකයන්ට ඔබ අවවාද මාත්‍රයක්වත් නොදෙන්නේ ඇත්තද? භාග්‍යවතුන් වහන්ස, ඇත්තයි. බමුණ, එසේ නොකරව, අද පටන් පැමිණියවුන්ට දහම් දෙසව. හොඳමයි **ස්වාමීනි.** තෙරුන් **වහන්සේ** භාග්‍යවතුන් වහන්සේගේ වචනය හිස්මුදුනින් පිළිගෙන එක් අවවාදයකින්ම මහණුන් දහසක් රහත් බවෙහි පිහිටවූහ. **එයින් ශාස්තෘන් වහන්සේ** පිළිවෙළින් තමන්වහන්සේගේ ශ්‍රාවකයන් තනතුරෙහි තබන සේක් මහණෙනි, භික්ෂූන්ට අවවාද දෙන්නා වූ මාගේ ශ්‍රාවකයන් අතර අග්‍ර වූ යමෙක් වේද හේ මහා කපිනයැයි අගතන්හි තැබූ සේක. මෙසේ තෙරුන් වහන්සේ පැමිණි රහත්ඵල ඇත්තාහු තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ **කරන්නාහු** **'පදුමුත්තරෝ නාමජිනෝ'** යනාදිය කීහ. **උදිතෝ ජගදාකාසෙ** යනු සියලු අහසෙහි උදිතෝ නැගුණේ ප්‍රකට වූයේ. **සරදම්බරෙ** සරත් කාලයෙහි අහසෙහි. **රවිව සූරියයා** මෙන් යන අර්ථයි. **අඤ්ඤදසෙසා තදා ආසිං** යනු ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි **සාරදසසී** යහපත දක්නා ආචාර්යවරයා යැයි ප්‍රකට වූයේ වෙමි යන අර්ථයි. **සාවකස්ස කතාවිනෝ** යනු ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ මෙ **මනං** මාගේ **සිත සංසන්නස්ස** සතුටුකරන ශ්‍රාවකයාගේ **කතාවිනෝ** නිරන්තර කාර්යයෙහි නියුක්ත වූවහුගේ වචනය අසා යනු සම්බන්ධයි. **හංස සමාගාහාගෝ** යනු

හංසයකුට සමාන ගමන් ඇත්තේ. **හංස දූසූහිනීවචො** යනු හංසරාවය **දූසූහි** බෙරහඬ සමාන වචන ඇත්තේ. මෙසේ මහණෙනි මහාමාත්‍රයා බලවු යයි කී සේක යනු සම්බන්ධයි. **සමුගගත තනූරූපභං** යනු මනාසේ නැගුණු ලොම් නැගුණු අග් ඇති ලොම් උඩට නැගීම හෝ, **මුත්තවණ්ණං** යනු මුතුඇට සමාන වර්ණය. සුන්දර වූ ශරීර ප්‍රභාව ගෙන අර්ථයි. **පීණංසං** යනු පිරිපුන් විය. **පසන්න නයනානනං** යනු ප්‍රසන්න ඇස්, ප්‍රසන්න මුව යන අර්ථයි. **කතාවිනො** යනු කරන ලද උත්සාහ ඇති අගතන්හි තබනු ලැබූ භික්ෂුවගේ. වහාම මොහු මුදිතාවෙන් පහටු සිත් ඇති බැවින් ප්‍රාර්ථනා කළේය යනු සම්බන්ධයි. **සතසො අනුසාසියා** යනු දැහැමෙන් සෙමෙන් වචනයෙන් කාරණ වශයෙන් අනුශාසනාකොට යන අර්ථයි. **බාරාණසී සමාසන්නෙ** යනු බරණැස සමීපයෙහි පේසකාර ගමෙහි උපන්නේ. **කෙනිය ජාතියං** යනු නූල් වියන ජාතියෙහි පේසකාර කුලයෙහි උපන්නේය යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේ ම ය.

මහාකපින තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.191

සිව්වැනි අපදානයෙහි **පදුමුත්තරො නාමජිනො** යනාදි වශයෙන් ආයුෂ්මත් දබබමල්ලපුත්ත තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි සිටුපුත්‍රයෙක් ව ඉපිද විභව සම්පත් ඇත්තේ විය. ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැද ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක සේනාසන පනවන්නවුන් අතර අගතන්හි තබනු දැක පහන් සිතැත්තේ බුදුපාමොක් භික්ෂු සංඝයාට ආරාධනා කොට සත්දිනක් මහදන් දී සත්දින ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටී ඒ තනතුර පැතීය. භාග්‍යවතුන් වහන්සේ ද සමෘද්ධවන බව දැන විවරණ දුන් සේක. හේ දිවි ඇතිතාක් කුසල්කොට ඉන්පසු තුසිත ආදී දෙවියන් අතර දිව්‍යසම්පත් අනුභවකොට විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලයක ඉපිද අසත්පුරුෂයන් ඇසුරු කිරීමෙන් උන්වහන්සේගේ සව්වකු රහත්යයි දැනගෙන අහුත චෝදනා නැගීය. උන්වහන්සේම ශ්‍රාවකයන්ට කිරිබත්

සලාකයද දුන්හ. හේ දිවි ඇති තෙක් පින්කොට දෙව් මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත්තීන් අනුභවකොට කසසප බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද අවසාන කාලයෙහි සසුනෙහි පැවිදිවූයේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි සියලු ලෝකයෙහි කෝලාහල ඇතිවූ කල්හි භික්ෂූන් සත්නමක් ප්‍රතාන්ත ජනපදයෙහි වනමැද එක් පර්වතයකට නැගී 'ජීවිත ආශාව බැස යෙත්වායි ආලයෙන් තොරව හිඳිත්වායි ඉණිමග හෙළූහ. ඔවුන්ගේ අවවාද දායක ජ්‍යෙෂ්ඨ තෙරුන් වහන්සේ සත්දිනක් ඇතුළත රහත් වූහ. ඉන්පසු එන තෙරුන් වහන්සේ අනාගාමී වූහ. මේ පිරිසිදු සිල් ඇති පඬිනම එයින් චුතව දෙව්ලොව උපන්නාහු ඉන් අනතුරුව දිවසැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි පුක්කුසාති, සභිය, බාහිය, කුමාරකාශ්‍යප යන මේ සතරදෙන එහි උපන්නාහුය. මොහු වනාහි මල්ල රටෙහි රජගෙයි උපන්නේය. ඔහු මව්කුසින් නික්මුණු කල්හිම මව කලුරිය කළාය. ඉක්බිති එකෙක් ඇයගේ සිරුර දවනු පිණිස චිතකයෙහි නංවා දැව අතරෙහි වැටුණු දරුවා ගෙන පෝෂණය කරවිය. දර ගොඩෙහි වැටුණු බැවින් **දබ්බ මල්ලපුත්ත** යයි ප්‍රකට විය. පසුකලක පූර්ව පින් ඍස්කිරීම් වශයෙන් පැවිදි විය. හේ කර්මස්ථානයන්හි යෙදුණේ නොබෝ කලකින්ම පිළිසිඹියා සහිත රහත් බවට පැමිණියේය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ මධ්‍යස්ථ බැවින් යුතුව අනුහස් ඇති බැවින් යුතුව භික්ෂූන්ට සෙනසුන් පැනවීමෙහි හා බත් උදෙසීමෙහිද යෙදවූ සේක. සියලු මෙතිය භූමජක භික්ෂූහු උන්වහන්සේ වෙත පැමිණියාහුය. එය විනය බන්ධකයෙහි පැමිණියේමය. පසුකලෙක තෙරුන් වහන්සේ එක් උතුම් සලාක දායකයකුගේ සලාක බත් මෙතිය භූමජකා නම් භික්ෂුණිය ඇයි ස්වාමීනි, දොම්නස්වැයි ඔවුන්ගෙන් ඇසුවාය. ඔවුහු නැගණිය, දබ්බමල්ල පුත්‍රයා අප වෙහෙසවා පාලනය කරන්නේ ඇයිදැයි ඇසූහ. 'ස්වාමීනි, මා විසින් කළහැක්කේ කුමක්ද? උන්වහන්සේට දොස් නගන්නැයි කීවේය. ඇය තැනින් තැන තෙරුන් වහන්සේට අභූත චෝදනා කළාය. ඒ අසා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට දැන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දබ්බමල්ල පුත්‍රත කැඳවා 'ඔබ මෙතියා භික්ෂුණියට වෙනසක් කළේ ඇත්තදැ'යි ඇසූ සේක. 'භාග්‍යවතුන් වහන්සේ මා දන්නා සේකැ'යි කීය. දබ්බ මෙසේ ප්‍රතික්ෂේප නොකරව. කරන ලද බව හෝ නොකරන ලද බව හෝ කියව. ස්වාමීනි, මම එසේ නොකෙළෙමි. භාග්‍යවතුන් වහන්සේ මෙතියා භික්ෂුණියට වරදට සමාව දී ඒ භික්ෂූන්ට අවවාද කරවුයයි කියූ සේක. උපාලි තෙරුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ ඒ භික්ෂුණිය උපැවිදි කොට මෙතිය භූමජක

භික්ෂූන්ට වරද පෙන්වා දී ඔවුන් අප විසින් ඒ භික්ෂුණිය යොදවන ලද්දීයයි කී කල්හි භාග්‍යවතුන් වහන්සේට ඒ කරුණ දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙතිනිය භුම්මජක භික්ෂූන්ට අමුලුක සංඝාදිසේසය පැනවූ සේක. එසමයෙහි මලල තෙරුන් වහන්සේ භික්ෂූන්ට සෙනසුන් පනවන්නාහු වේළුවන විහාරය හාත්පස දසඅටක් මහා විහාරයන්ට සහාග භික්ෂූන් යවන්නාහු රාත්‍රී කාලයෙහි අන්ධකාරයෙහි ඇඟිල්ලෙන් පහන දල්වා ඒ ආලෝකයෙන්ම යැවූහ. මෙසේ තෙරුන් වහන්සේගේ සෙනසුන් පනවන තවත් උදෙසන කාර්යය ප්‍රකට වූ කල්හි ශාස්තෘන් වහන්සේ ආර්යගණයා මැද සියලු තෙරුන් වහන්සේලා තනතුරුවල තබන සේක්, මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් සේනාසන පනවන්නවුන් අතර යමෙක් අගතැන්පත් වේද ඒ දබ්බමල්ලපුත්ත යයි තෙරුන් වහන්සේ අගතන්හි තැබූ සේක. තෙරුන් වහන්සේ තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදිය කියූහ. ඒ සියල්ල යට කියන ලද අරුත් ඇත්තේ ම ය. මින් අනුවැනි කල්පයෙහි විපසසි නම් නායකයෙක් ලෝකයේ උපදී යනු සම්බන්ධයි. **දුට්ඨචිත්තෙනා** යනු දූෂිත සිත් ඇත්තේ දුර්ජනයන් ආශ්‍රය කිරීමෙන් අප්‍රසන්න සිත් ඇත්තේ යන අර්ථයි. **උපවදිං සාවකං** යනු ඒ භාග්‍යවතුන් වහන්සේගේ ක්ෂීණාශ්‍රව ශ්‍රාවකයකුට අවමන් කෙළෙමි. උන්වහන්සේ කෙරෙහි බොරු බස් කියූවෙමි. බොරුවෙන් චෝදනා කෙළෙමි යන අර්ථයි. **දුන්නුභියෝ** යනු දුන්දුං යයි ශබ්ද නගන හෙයින් දුන්නුභි සංඛ්‍යාත වූ බෙර. **නාදයිංසු** යනු ශබ්ද කළහ. **සමන්තතෝ අසනියෝ** යනු සියලු දිශා භාගයෙන් **අසනෙ** විනාශ කිරීමෙහි නියුක්ත වූයේනුයි අසනියෝ නම්. බිය එළවන දෙවියන්ගේ දඬුවම් පතිත විය යනු සම්බන්ධයි. **උකකා පතිංසු නභසා** යනු ආකාශයෙන් ගිනිකඳක් මෙන් පතිත විය යන අර්ථයි. **ධුමකෙතුව දිසසථ** යනු දුම්රොටු සහිත ගිනිකඳක් මෙන් **දිසසති** පෙනෙන්නේ ය යන අර්ථයි.

දබ්බමල්ල පුත්ත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.192

පස්වැනි අපදානයෙහි **ඉතො සහස්සමහි** යනාදි වශයෙන් ආයුෂ්මත් කුමාර කස්සප තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද වනාහි පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද දැනමිහි බවට පත්ව එක් දවසක් ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක චිත්‍රකථිකයන් අතර අග්‍රතන්හි තබනු දැක තමාද ඒ තනතුර ප්‍රාර්ථනා කරන්නේ ප්‍රාර්ථනාවක් කොට ඊට අනුරූප වූ පින් කරන්නේ දිවි ඇතිතාක් සිට එයින් චුතව දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට කස්සප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද ඒ භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි පැවිදි ව මහණදම් කොට එයින් චුතව දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ දිව්‍යසැපත් හා මිනිස් සැපත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවර එක්තරා සිටුදුවකගේ කුසෙහි උපන්නීය. ඈ වනාහි කුඩාකලම පැවිදිවනු කැමැත්තී මව්පියන්ගෙන් ඉල්ලා පැවිද්ද නොලබන්නී පතිකුලයට ගොස් ගැබ්ගෙන ඒ බව නොදැන සැමියාට දන්වා පැවිද්දට අනුමැතිය ලබාගන්නෙමියි සිතුවාය. සැමියාට ආරාධනා කරන්නී, ආර්යපුත්‍රය,

'සචෙ ඉමස්ස කායස්ස අඤ්ඤො බාහිරතො සියා
දණ්ඩං නූන ගහෙත්වාන කාතෙ සොණෙ නිවාරයෙ' ති.

ඉදින් මේ සිරුරෙහි - බඩවැල් පිටත ඇත්නම්
දඬුකඩකින් කවුඩුවන් - බල්ලන් එළවිය යුතුය

ආදි වශයෙන් ශරීරයෙහි දොස් දක්වන්නී ඔහුට ආරාධනය කළාය. ඈ සැමියා විසින් අනුදන්නා ලද්දී ගැබිනි බව නොදන්නී දේවදත්ත පාක්ෂික භික්ෂුණීන් වෙත පැවිදි වූවාය. ඇයගේ ගැබිනි බව දැක භික්ෂුණීහු දේවදත්තගෙන් ඇසූහ. ඔහු මෙහෙණක් නොවේයයි කිහ. 'ඈ මම දේවදත්ත උදෙසා පැවිදි නොවූයෙමි. භාග්‍යවතුන් වහන්සේ උදෙසා පැවිදි වූවා වෙමියි භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් උන්වහන්සේගෙන් විමසුවාය. ශාස්තෘන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේට පැවරූ සේක. තෙරුන්වහන්සේ සැවැත්නුවර වාසීන්ගේ පවුල් ද විසාකා උපාසිකාව ද කැඳවා රජු සහිත පිරිසෙහි එය විනිශ්චය කරන්නාහු පෙර ලද ගැබය. පැවිද්ද නිවරද යයි කිහ. ඒ අසා ශාස්තෘන් වහන්සේ උපාලි විසින්

අධිකරණය මැනවින් විනිශ්චය කරන ලද්දේයයි තෙරුන් වහන්සේට සාදුකාර දුන් සේක. ඒ භික්ෂුණිය රන් පිළිමයක් බඳු පුතකු වැදුවාය. පසේනදී කොසොල් රජතුමා දරුවන් හදාගැනීම භික්ෂුණීන්ට පලිබෝධයක් යයි ඒ දරුවා කිරිමවුන්ට දෙවා ඔහුට කසසප යයි නමක් තැබීය. ඔහු අලංකාර ලෙස පෝෂණය කරවීය. පසුකලෙක ශාස්තෘන් වහන්සේ සමීපයට ගෙන්වා පැවිදි කරවීය. කුමාර කල්හි පැවිදි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ කසසප කැඳවන්න. මේ ගෙඩිය හෝ කැයුත්තක් හෝ කසසපට දෙවැයි කී කල්හි කවර කසසපද කුමාර කසසප. මෙසේ ගන්නා ලද නම් ඇති බැවින් රජු විසින් පෝෂණීය වූ පුත්‍රයා හෙයින්ද වෘද්ධ කල්හිද කුමාර කසසපයැයි ප්‍රසිද්ධ විය. හේ පැවිදි වූ කල්හි පටන් විදර්ශනා කර්මය කරයි. බුද්ධවචනයද ඉගෙන ගනී. ඉක්බිති ඔහු සමග පර්වත මස්තකයෙහි මහණදම් පුරා අනාගාමී වී සුද්ධාවාසයෙහි උපන් මහා බ්‍රහ්මයා විදර්ශනාවට මග දක්වා මාර්ගඵල උපදවන්ට උපායක් කරන්නෙමියි ප්‍රශ්න පසළොසක් රැස්කොට අන්ධ වනයෙහි වාසය කරන තෙරුන් වහන්සේට මේ ප්‍රශ්න ශාස්තෘන් වහන්සේගෙන් විමසන්නැයි කීය. ඉක්බිති උන්වහන්සේ ඒ ප්‍රශ්න භාග්‍යවතුන් වහන්සේගෙන් විමසූහ. භාග්‍යවතුන් වහන්සේද උන්වහන්සේගේ ප්‍රශ්න විසඳූ සේක. තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කියූ ආකාරයෙන්ම ඒවා ඉගෙනගෙන විදර්ශනාව ගර්හ ගන්වා රහත් බවට පත්වූහ. උන්වහන්සේ රහත් බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **ඉතො සත සහස්සමහි** යනාදිය කීහ. එහි යමක් ඇත්නම් ඒ යට කියන ලද පරිදිය. නොගැඹුරු අරුත් ඇත්තේ ම ය. ඒ සියල්ල වර්ණනා නො කරන්නෙමි. ගැඹුරුපද පමණක් වර්ණනා කරන්නෙමි. **ආපනන ගබ්භා** මෙ මාතා යනු මාගේ මව ගරුගබ්භා ගර්භණීව ප්‍රසූතියට ආසන්න ගර්භ ඇත්ති යන අර්ථයි. **චම්මික සදිසං කායං** යනු ශරීරය නම් තුඹසක් වැන්න. යම්සේ තුඹස තැනින් තැන සිදුරු ඇත්තේ නැත්තේ ගැරඬි වේ ආදීන්ට නිවාසය වේද එසේම මේ ශරීරය නවදොරක් ඇත්තේ නිතර වැගිරේය යනු බුදුවූ භාග්‍යවතුන් වහන්සේ විසින් **දෙසිතං** ප්‍රකාශ කරන ලදී. ඒ අසා මාගේ සිත ආශ්‍රවයන් නොගෙන ඉතිරි නොකොට කෙලෙස්වලින් මිදුණේය. රහත්බවෙහි පිහිටියේය යන අර්ථයි. පසුකලෙක තැන තැන භික්ෂූන්ගේ විචිත්‍ර ධර්මකථික බව අසා ශාස්තෘන් වහන්සේ 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් චිත්‍ර කථිකයන් අතර අග්‍රවූයේ යමෙක්ද ඒ කුමාර කසසප'යයි අගතන්හි තැබූ සේක.

කුමාර කසසප තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.193

සවැනි අපදානයෙහි **ඉතො සත සහසසමහි** යනාදි වශයෙන් ආයුෂ්මත් බාහිය දාරුචීරිය තෙරුන්වහන්සේගේ අපදානයයි. මෙතෙමේ ද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයක ඉපිද බ්‍රාහ්මණ ශිල්පයන්හි නිෂ්පත්තියට ගොස් වේදාංගයන්හි පූර්ණත්වයට පත්වූයේ එක්දවසක් ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක වහා අවබෝධ වන්නවුන් අතර අගතන්හි තබනු දැක ඒ තනතුර ප්‍රාර්ථනා කරනු කැමැත්තේ සත්දිනක් බුදුපාමොක් සංඝයාට මහදන් දී සත්දින ඇවෑමෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැදහොත්තේ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මින් සත්වැනි දවසෙහි යම් භික්ෂුවක වහා අවබෝධ වන්නවුන් අතර අගතන්හි තැබූ සේක්ද, ඒ භික්ෂුව මෙන් මම ද අනාගතයෙහි එක් බුදුවරයකුගේ සසුනෙහි වහා අවබෝධ වන්නවුන් අතර අග්‍ර වන්නෙමියි ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ අනාගතංස ඥානයෙන් බලා අනාගතයෙහි ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි වහා අවබෝධ වන්නවුන් අතර අග්‍ර වන්නේ යයි ප්‍රකාශ කළ සේක. හේ දිවි ඇති තාක් පින්කොට එයින් චුතවූයේ දෙවිලොව ඉපිද එහි ස කාමාවචර සම්පත් අනුභවකොට නැවත මිනිසුන් අතර චක්‍රවර්ති ආදී සම්පත් නොයෙක් කල්පකෝටි සියගණන් අනුභවකොට කසසප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි එක් කුලගෙයක උපන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි පැවිදි වූයේ වෙයි. එකල්හි සසුන පිරිහී යද්දී භික්ෂූන් සත්නමක් සිව්පිරිසෙහි වැරදි හැසිරීම දැක සංවේගයට පත්වූවෝ ආරණ්‍යයට පිවිස යම්තාක් ශාසන අන්තර්ධානය නොවීද ඒ තාක් තමාට ප්‍රතිෂ්ඨාවක් කරන්නෙමුයි ස්වර්ණ චෛත්‍යය වැඳ මෙහි අරණ්‍යයෙහි එක් පර්වතයක් දැක 'ජීවිතයෙහි ආලය ඇත්තෝ නවතිත්වා, ආලය නැත්තෝ මේ පර්වතයට නගිත්වායි ඉණිමගක් බැඳ සියල්ලෝ ඒ පර්වතයට නැග ඉණිමග හෙළා මහණදම් කළහ. ඔවුන් අතරින් සංඝ ස්ථවිරයන් වහන්සේ එක් රැයක් ඉක්ම යාමේදී රහත් බවට පත්වූහ. උන්වහන්සේ අනෝතත්ත විලෙහි නාගලතා දැහැටිදඬුවක් හපා මුව දොවා උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය ගෙනවුත් ඒ භික්ෂූන්ට මෙසේ කීහ. 'ඇවැත්නි, මේ පිණ්ඩපාතය වළඳන්න. උන්වහන්සේලා මෙසේ කීහ. 'ස්වාමීනි, අප විසින් මෙබඳු කතිකාවක්

කරන ලදී. යමෙක් පළමුව රහත්බවට පත්වේද ඔහු විසින් ගෙනෙන ලද පිණ්ඩපාතය සෙස්සෝ වළඳත්වායි. 'ඇවැත්නි, එසේ නොවේ.' එසේනම් යම්හෙයකින් අපිද ඔබවහන්සේ මෙන් විශේෂයක් නිපදවා ගන්නෙමු නම්, අපි ගෙනවුත් වළඳන්නෙමුයි නොකැමති වූහ. දෙවැනි දවසෙහි දෙවැනි තෙරුන් වහන්සේ අනාගාමීව ඒ අයුරින්ම පිණ්ඩපාතය ගෙනවුත් අන් අයට ආරාධනා කළහ. ඔවුහු මෙසේ ඇසූහ. ඇවැත්නි, මහතෙරුන් වහන්සේ විසින් ගෙනඑන ලද පිණ්ඩපාතය නොවළඳ දෙවැනි තෙරුන් වහන්සේ විසින් ගෙන එන ලද පිණ්ඩපාතය වළඳන්නමුයි කතිකාවක් කරනු ලැබීද. නැත ඇවැත්නි, මෙසේ ඇතිකල්හි ඔබ මෙන් අපිද විශේෂයක් නිපදවා මේ මානුෂික ප්‍රයත්නයෙන් වළඳන්ට හැක්කාහු වළඳන්නමුයි නො කැමති වූහ. ඔවුන්ගෙන් රහත් බවට පත් තෙරුන් වහන්සේ පිරිනිවි සේක. දෙවැන්නා අනාගාමීව බඹලොව උපන්නේය. ඉතිරි පස්දෙන විශේෂයක් උපදවා ගැනීමට නොහැක්කාහු සුසුම් හෙළා සත්වැනි දවසෙහි කලුරිය කොට දෙව්ලොව උපන්හ. එහි දිවසුව අනුභව කළහ. මේ බුද්ධෝත්පාද කාලයෙහි එයින් චුතව මිනිසුන් අතර උපන්හ. ඔවුන්ගෙන් එකෙක් පුක්කුසාති රජ විය. එකෙක් ගන්ධාර රට තක්සලා නුවර කුමාර කසසපය. එකෙක් බාහිය දාරුචීරියය. එකෙක් දබ්බමල්ල පුත්තය. එකෙක් සභිය පරිබ්‍රාජකයාය.

ඔවුන් අතරින් මේ බාහිය දාරුචීරිය තෙමේ සුප්පාර පටුනෙහි වෙළඳ කුලයෙහි ඉපිද වාණිජ කර්මයෙහි නිෂ්පත්තියට ගියේ මහාධන ඇත්තේ මහාභෝග ඇත්තේ ස්වර්ණභූමියට යන්නා වූ වෙළඳුන් සමග නැව්නැගී විදේශයට යන්නේ කිහිපදිනක් ගොස් නැව බිඳුණුවිට සෙස්සන් මස් කැසුබුවන්ට අහර වූ කල්හි තනිවම ඉතිරි වූයේ එක් ලෑල්ලක් ගෙන වෑයම් කරන්නේ සත්වැනි දවසෙහි සුප්පාර පටුනට බැසගත්තේය. ඔහුට ඇඳුම් පොරෝනා නැත. හේ අන්කිසිවක් නොදක්නේ වියලි දරදඬුවක පොතුවලින් බැඳ හැඳ පොරවා දේවාලයෙන් කබලක් ගෙන සුප්පාර පටුනට ගියේය. මිනිස්සු ඔහු දැක කැඳ බත් ආදිය දී මේ එක් රහත් කෙනෙක් යයි සම්භාවනා කළහ. හේ වස්තු ළඟට ගෙනෙනු ලැබූ කල්හි යම්හෙයකින් හදිමි නම් පොරවමිනම් මාගේ ලාභසත්කාර පිරිහෙන්නේය. ඒවා පිළිකෙව් කොට දරරෙදිම ඇන්දේය. ඉක්බිති බොහෝ දෙනකු විසින් රහත් කෙනෙකැයි සම්භාවනා කරනු ලබන කල ඔහුට මෙවන් විතර්කයක් සිතෙහි උපන්නේය. ලොවෙහි අර්හත් වූවෝ හෝ අර්හත් මාර්ගයට පැමිණියාහු හෝ වෙත්නම් මම ඔවුන්ගෙන් එක් කෙනෙක්මි

යනුවෙන්. හේ මේ ක්‍රමයෙන් කුහකකමින් ජීවිකාව කරයි. කසසප බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි සත්දෙනකු පර්වතයට නැග මහණකම් කරද්දී, එක්කෙනෙක් අනාගාමී වී සුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි උපන්නේය. හේ තමාගේ බ්‍රහ්ම සම්පත්තිය බලන්නේ පැමිණි තැන ආවර්ජනා කරන්නේ පර්වතයට නැග මහණදම් පුරන තැන දැක සෙස්සන් උපන් තැන ආවර්ජනය කරන්නේ එක් අයකු පිරිනිවන් පෑ බවද ඉතිරි පස්දෙන කාමාවචර ලෝක පසෙහි උපන් බවද දැන ඔවුන් කාලනුකාලයෙන් ආවර්ජනය කළේය. මේ කාලයෙහි ඔවුහු කොතැනක සිටිත්දැයි ආවර්ජනා කරන්නේ දාරුචීරිය සුප්පාර පටුන නිසා කුහකකමින් ජීවත්වනු දැක, මේ මෝඩයා නැසුණේ වෙයි. පෙර මහණදම් පුරන්නේ අති උත්කෘෂ්ට බව හේතුකොටගෙන රහතන් වහන්සේ විසින් ගෙන එන ලද දෙය නොවළඳ දැන් බඩ සඳහා නොරහත්ව රහත්බව හඟවා ලෝකය වංචා කරමින් හැසිරෙයි. බුදුරජාණන් වහන්සේ උපන් බවක් නොදනී. දැන් යමි. ඔහු සංවේගයට පමුණුවා බුදුන් උපන් බව දැන ගන්වන්නෙමියි ඍෂණයෙන්ම බඹලොවින් බැස සුප්පාර පටුනෙහි රාත්‍රීභාගය අතරතුරෙහි දාරුචීරියගේ ඉදිරියෙහි පහළවිය. හේ තමාගේ වසන තැන එළියක් දැක පිටතට නික්ම මහාබ්‍රහ්මයා දැක ඇඳිලිබැඳ ඔබ කවුරුදැයි ඇසීය. මම ඔබගේ පැරණි මිත්‍රයාය. අනාගාමී ඵලයට පැමිණ බඹලොව උපන්නෙමි. අප සියල්ලන්ට ජ්‍යෙෂ්ඨයා රහත්ව පිරිනිවියේය. ඔබ පස්දෙන දෙව්ලොව උපන්නාහුය. ඒ මම දැන් ඔබ කුහකකමින් දිවි ගෙවනු දැක දමනය කිරීමට පැමිණියෙමියි කියා මේ කරුණ කීවේය. බාහිය, ඔබ රහත් කෙනෙක් නොවෙහි ය. අර්හත් මාර්ගයට පත්වී වත් නැත. යම් කිසිවකින් ඔබ රහත් කෙනෙක් වන්නෙහිද රහත්මගට හෝ පැමිණියහුද ඔබට ඒ ප්‍රතිපදාව වත් නැත. ඉක්බිතිව ඔහුට ශාස්තෘන් වහන්සේ උපන් බවත් සැවැත්නුවර වසන බවත් කියා ශාස්තෘන් වහන්සේ වෙත යව'යි ඔහු උනන්දු කරන්නේ අහසෙහි සිටියේය. බාහිය වනාහි අහසෙහි සිට කථා කරන මහා බ්‍රහ්මයා බලා මෙසේ සිතීය. මා විසින් කරන ලද්දේ බැරෑරුම් කාර්යයෙකි. නොරහත්ව රහත්යයි සිතුවෙමි. මොහු ද මට ඔබ රහතෙක් නොවේයයිද අර්හත් මාර්ගයටවත් නොපැමිණියේ යයිද කියයි. ලෝකයෙහි වෙනත් රහත් කෙනෙක් ඇත්ද. ඉක්බිති ඔහුගෙන් විචාළේය. දේවයිනි, දැන් ලෝකයෙහි ඉන්නා රහත් පුද්ගලයා කවුරුදැ? කවරෙක් අර්හත් මාර්ගයට හෝ පැමිණියේද. ඉක්බිති දේවතාවා ඔහුට මෙසේ කීය. බාහිය උත්තර ජනපදයෙහි සාවත්ථී නම් නගරයක් ඇත. එහි භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දැන් එහි වසන සේක. ඒ භාග්‍යවතුන්

වහන්සේ රහත් බවද රහත්බවට පත්වීම සඳහා ධර්මයද දේශනා කරන සේක. බාහිය රාත්‍රී භාගයෙහි දේවතාවාගේ කථාව අසා සංවේගයට පත් සිත් ඇත්තේ එකෙණෙහිම සුප්පාරකයෙන් නික්ම එක් රෑ වාසයකින් සැවැත්නුවරට ගියේය. යන්තේ ද දේවතානුභාවයෙන් ද බුද්ධානුභාවයෙන් ද දෙදහසක් යොදුන් මාර්ගය ඉක්මවා සැවැත්නුවරට පැමිණියේය. එකෙණෙහි ශාස්තෘන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස පිවිසියේ වෙති. හේ ජේතවනාරාමයට පිවිස එළිමහනෙහි සක්මන් කරන බොහෝ භික්ෂූන් විචාළේය..... 'ශාස්තෘන් වහන්සේ, දැන් කොහිද?' භික්ෂූහු 'සැවැත්නුවර පිඬු පිණිස පිවිසි සේකැ'යි කියා 'ඔබ කොහි සිට පැමිණියේ වෙහිදැයි ඇසූහ. 'සුප්පාරකයෙන් ආයේ වෙමි' දුරසිට ආයේ වෙහිය. හිඳගන්න. පා දොවා තෙල් ගා මදක් විශ්‍රාම ගන්න. පැමිණිවිට ශාස්තෘන් වහන්සේ දකින්නෙහි යයි කීහ. ස්වාමීනි, මම ශාස්තෘන් වහන්සේට හෝ තමාට හෝ ජීවිත අන්තරායක් නොදනිමි. කිසිතැනක නොසිට නොහිඳ එක් රැයකින්ම යොදුන් දෙදහසක් වූ මග ආවෙමි. ශාස්තෘන් වහන්සේ දැකම ගිමන් හරින්නෙමියි කීය. හේ එසේ කියා ඉක්මනින් සැවැත්නුවරට පිවිස භාග්‍යවතුන් වහන්සේ අනූපම බුද්ධශ්‍රීයෙන් හැසිරෙනු දැක ගෞතමයන් වහන්ස, මා විසින් බොහෝ කලකින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්නා ලද සේකැයි දුටුතැන සිට නමාගත් සිරුර ඇත්තේ මහ විදියෙහිදී පසඟ පිහිටුවා වැඳ ගොප්මසින් දැඩිසේ අල්ලාගෙන මෙසේ කීය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට ධර්මය දේශනා කරන සේක්වා. සුගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක්වා. ඒ මට බොහෝ කලක් හිතසුව පිණිස පවත්නේය. ශාස්තෘන් වහන්සේ බාහිය තවම නොකල්ය. ඇතුළු ගෘහයට පිඬු පිණිස පිවිසුණුමහයි ප්‍රතික්ෂේප කළ සේක. ඒ අසා බාහිය ස්වාමීනි සසර සැරිසරන මා විසින් ආහාර පිඩක් මිත්පෙර නොලබන ලදී. ඔබවහන්සේට හෝ මට හෝ ජීවිත අන්තරායක් වේයයි නො දනිමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට ධර්මය දේශනා කරන සේක්වා. සුගතයන් වහන්සේ ධර්මය දේශනා කරන සේක්වායි නැවත ඉල්ලා සිටියේය. ශාස්තෘන් වහන්සේ දෙවනුවද ප්‍රතික්ෂේප කළ සේක. ඔහුට මෙසේ සිතිණ. මුන්වහන්සේ දුටුතැන් පටන් සියලු සිරුර ප්‍රීතියෙන් නිතොරවම පිරීගියේ වෙයි. බලවත් ප්‍රීතිවේග ඇත්තේ දහම් අසා අවබෝධ කරගන්නට නො හැකි වන්නේය. මධ්‍යස්ථ උපේක්ෂාවෙන් සිටින්න. එක් රැයකින් යොදුන් දෙදහසක් මග ආවා වූ මොහුට වෙහෙස බලවත්ය. එයද සංසිඳවන්නැයි ඒ නිසා දෙවරක් පිළිකෙව් කොට තුන්වැනිව ඉල්ලා සිටිනු ලැබූ සේක්. ඒ නිසා මෙහිදී බාහිය, මෙසේ හික්මිය යුතුය. දුටු

දෙයෙහි දෘෂ්ටි මාත්‍රය වන්නේ යයි ආදී නයෙන් නොයෙක් පර්යායයෙන් ධර්මය දේශනා කළ සේක. හේ ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසන්නේම සියලු ආශ්‍රවයන් ගෙවා පිළිසිඹියා සහිතව රහත් බවට පත්විය. හේ රහත් බවට පත් කෙණෙහිම පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චර්යාපදානය ප්‍රකාශ කරන්නේ **ඉතො සතසහසසමහි** යනාදිය කීය. එය යට කියන ලද පරිදි බැවින් නොගැඹුරු අරුත් ඇත්තේ ම ය. ගැඹුරු පද වර්ණනාව පමණක් කරන්නෙමි. **පීණං සංපච්චවෙක්ඛන පිරිපුන් සොම්නස් ඇත. ප්‍රත්‍යවේක්ෂණය. කොමාරවණ්ණං** අති කෝමල යන අර්ථයි. **හෙමයඤ්ඤෝ පචිනඬං** යනු රන්නුයෙන් උපනයන සූත්‍ර යුතු අවයවං සිරුර දේහය යන අර්ථයි. **පලම්බබිම්බත-මෙබාඨං** යනු එල්ලෙන බිඹුපල හා සමාන රක්තවර්ණ දෙතොලින් යුතු යන අර්ථයි. **සිත තිණහ සමං දවිජං** යනු මුවහත් තීක්ෂණ අය ලෝහයෙන් ගටා සමකළාක් මෙන් සමදත් ඇති යන අර්ථයි. **පීති සම්ඵුල්ලිතානනං** යනු ප්‍රීතියෙන් මනාසේ ඵුල්ලිතං විකසිත වූ ආනනං මුව දර්පණ තලයක් බඳු මුඛවර්ණය යන අර්ථයි. **බිපපාභිඤ්ඤසස භිකඛුනො** යනු **බිපපං** දේශනාවෙන් ගැටුණු කෙණෙහිම විශ්වාසයෙන් දැනගන්ට සමර්ථ වූ භික්ෂුවගේ යන අර්ථයි. **අගං සහවනං යථා** යනු තමාගේ ගෙට මෙන් ස්වර්ග ලෝකයට ගියෙමි යන අර්ථයි. **නත්‍ථං උපාය මගගඤ්ඤු** යනු ඔබ නිර්වාණාධිගමයට උපාය භූත වූ මාර්ගය දන්නෙක් නොවෙහි යන අර්ථයි. **සත්‍ථුනො සදා ජිනං** යනු **සදා** සියලු කල්හි **ජිනං** නොදිනන්නේ පරාජිත වූවෙක් **සත්‍ථුනො** සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ **විමලානනං** දර්පණ තලයක් බඳු මුහුණ **පසසාමි** බලන්ට නික්මෙමි යන යෙදුමයි. **දිජෙ අපුචඡි කුහිං ලොක නත්‍ථනො** යනු කුමන ස්ථානයක ලෝකප්‍රසාදකර ශාස්තෘන් වහන්සේ සිටින සේක්දැයි **දිජෙ** බමුණන් භික්ෂූන් වහන්සේ ඇසුවෙමි යන අර්ථයි. **ස සො බිපපං මුනිදසසනුසසුකො** යනු මුනිදසසනෙ තථාගත මුනීන්ද්‍රයන් වහන්සේ. තථාගතයන් වහන්සේ දැකීමෙහි **උසසුකෙකා** උත්සාහ ඇත්තේ සාවකු මෙන් වහා පැමිණේ යන අර්ථයි. **තුවටං ගනත්වා** යනු වේගයෙන් ගොස්. **පිණඩතථමපිභාගිධං** යනු පිණ්ඩපාතය නිසා **අපිහං** පහවූ තණ්හා ඇති තෘෂ්ණාව නැති. **අලොලකඛං** යනු එහි මෙහි නොබලමින්, උතුම් වූ සැවත්නුවර පිඬු පිණිස හැසිරෙන්නහු දැක්කෙමි යනු සම්බන්ධයි. **සිරීනිලය සඬකාසං** යනු ශ්‍රීකාන්තාවගේ ලක්ෂණ අනුව්‍යඤ්ජන ශෝභාවෙන් **නිලය සඬකාසං** දිලෙන තොරණක් බඳු, **රවිදිනති හරානනං** යනු දිලිසෙන සූර්ය මණ්ඩලයක් මෙන් බබලන මුවමඬල. **කුපථෙ විපපනටඨසස** යනු **කුවඡිතපථෙ** උපද්‍රව සහිත මාර්ගයෙහි

මුළා වූ මිථ්‍යා මාර්ගයට පිළිපන් මා හට **සරණංගොහි** පිහිට වන්න. **ගොතම** යනු භාග්‍යවතුන් වහන්සේ ගෝත්‍රයෙන් අමතයි. **නතෂ්ඨ සුකඛා ජොතනති** යනු සුදුපැහැ ඇති දිලිසෙන ඕසධී තාරකාදිය නජොතනති නො බබලයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේ ම ය.

හේ මෙසේ පූර්ව චරිතාපදානය ප්‍රකාශකොට එකෙණෙහිම භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්ලීය. ඔබගේ පාසිවුරු සම්පූර්ණදැයිද විචාරන ලද්දේ සම්පූර්ණ නැතැයි කීය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ එසේනම් පාසිවුරු සොයවයි කියා ගිය සේක. හේ වනාහි විසිදහසක් අවුරුදු මහණදම් පුරන්නේ භික්ෂුවක විසින් නම් තමාගේ ප්‍රත්‍යය ලැබ අනිකක් නොබලා තමාම වළඳන්ට වටනේයයි කියා එක් භික්ෂුවකටවත් පාත්‍රයකින් හෝ සිවුරකින් සංග්‍රහ නොකළේය. ඒ නිසා මොහුට ඍද්ධිමය පාසිවුරු නූපදීයයි දැන භාග්‍යවතුන් වහන්සේ ඒහිභික්ෂුභාවයෙන් පැවිද්ද නුදුන් සේක. පාසිවුරු සොයමින් කසලගොඩින් රෙදිකැබලි ඇදබලන ඔහුට පෙර වෛර ඇති අමනුෂ්‍යයෙක් පැටියකු සිටින එළදෙනකගේ ශරීරයෙහි ආරූඪව කලවයට ඇන ජීවිතක්ෂයට පැමිණවීය. ශාස්තෘන් වහන්සේ පිඬු පිණිස හැසිර කරන ලද බත්කිස ඇත්තේ බොහෝ භික්ෂූන් සමග නික්මෙන සේක් බාහියගේ සිරුර කසල ගොඩෙහි වැටී තිබෙනු දැක 'මහණෙනි, මේ බාහිය දාරුචීරිය ගනුව'යි එක් ගෙයක තබා ඇඳක් ගෙන්වාගෙන මේ සිරුර නුවරදොරින් ගෙනගොස් දවා ධාතූන් ගෙන ස්තූපයක් කරව'යි භික්ෂූන් වහන්සේට අණකළ සේක. ඒ භික්ෂූහු සිව්මංසලෙහි ස්තූපයක් කරවා ශාස්තෘන් වහන්සේ කරා එළඹ තමන් විසින් කරන ලද කාර්යය දැන්වූහ. ඉක්බිති සංඝයා මධ්‍යයෙහි කථාවක් පැන නැංගේය. තථාගතයන් වහන්සේ භික්ෂු සංඝයා ලවා සිරුරක් දැවීමේ කාර්යය කරවූ සේක. ධාතූන්ද ගෙන්වාගෙන චෛත්‍යයක්ද කරවූ සේක. ඔහු විසින් කිනම් මාර්ගයක් අවබෝධ කරගනු ලැබීද? සාමණේරයෙක්ද? ඔහු භික්ෂුවක්ද? ශාස්තෘන් වහන්සේ එය අර්ථ උත්පත්තියක් කොට 'මහණෙනි, බාහිය දාරුචීරිය රහත් බවෙහි පිහිටියේයයි ඉහළට ධර්මදේශනාව වර්ධනය කරන සේක් ඔහු පිරිනිවන්පෑ බවද කියා 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් වහා අවබෝධ කරන්නවුන් අතර යමෙක් අග්‍රවේද ඒ බාහිය දාරුචීරිය යැයි අගතන්හි තැබූ සේක. ඉක්බිති භික්ෂූහු මෙසේ ඇසූහ. 'ස්වාමීනි, ඔබවහන්සේ බාහියදාරුචීරිය රහත් බවට පැමිණියේයයි වදාරන සේක. ඔහු රහත් බවට පැමිණියේ කවදාද? 'මහණෙනි, මාගේ ධර්මය ඇසූ වේලාවේ.' 'ඔහුට ඔබවහන්සේ දහම්

දෙසුවේ කවදාද?' 'භික්ෂාවෙහි හැසිරෙමින් මහ වීදියෙහි සිට.' 'ස්වාමීනි ඔබවහන්සේ මහ වීදියෙහි සිට දේශනා කරන ලද ධර්මය අල්පමාත්‍රය. ඔහු එපමණකින් විශේෂයක් නිපදවා ගත්තේ කෙසේද?' ඉක්බිති ශාස්තෘන් වහන්සේ 'මහණෙනි, මාගේ ධර්මය අල්පයයි මහත්යයි නොසිතන්න. අනර්ථ පද සහිත නොයෙක් ගාථා දහස් ගණනක් නොමැනවි. අර්ථ නිශ්‍රිත එක් ගාථා පදයක් වුවද මැනවි'යි කියා අනුසන්ධි ගළපා දහම් දෙසන සේක් මේ ගාථාව කියූ සේක.

'සහස්සමපි චෙ ගාථා අනත්ථපද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යො යංසුත්වා උපසම්මති'නි

නොමනා පද සහිත - ගාථා දහසකට වඩා
යමක් අසා සංසිඳේනම් - එබඳු එක් පදයක්ම මැනවී

දේශනාවගේ කෙළවර අසූසාර දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය.

බාහිය දාරුචීරිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.194

සත්වැනි අපදානයෙහි පදුමුත්තරෝ නාම ජිනෝ යනාදි වශයෙන් ආයුෂ්මත් මහා කොටිසීත තෙරුන් වහන්සේගේ අපදානයයි. උත්පත්තිය කුමක්ද? මෙතෙමේද පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි මහාභෝග ඇති කුලයක ඉපිද දැනමිහි බවට පත්වූයේ මව්පියන් ඇවෑමෙන් පවුල තබා ගෘහවාසයෙහි වසන්නේ එක් දවසක් පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන කල්හි හංසවතී නගරවාසීන් සුවඳමල් ආදිය ගත් අත් ඇතිව යම්තැනෙක බුදුරජාණන් වහන්සේ සිටින සේක්ද, ධර්මය යම්තැනෙක වේද, සංඝයා යම්තැනෙක වේද ඒ නිමිනයන්ට ඒ පොකුණුවලට ඒ බෑවුම්වලට යනු දැක ඔවුන් සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ ශාස්තෘන් වහන්සේ විසින් එක් භික්ෂුවක පිළිසිඹියාවන්ට පත්වූවන් අතුරින් අගතන්හි තබනු දැක 'මුන්වහන්සේ මේ සසුනෙහි පිළිසිඹියාවන්ට පත්වූවන් අතර අග්‍රය. එක් බුදුවරයකුගේ සසුනෙහි මුන්වහන්සේ මෙන් පිළිසිඹියාවන්ට පත්වූවන්ගෙන් අග්‍ර

වන්නෙමි නම් මැනවැයි සිතා ශාස්තෘන් වහන්සේගේ දේශනාවසානයෙහි පිරිස නැගී සිටිකල්හි භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ 'ස්වාමීනි, හෙට මාගේ ගෙයි භික්ෂාට ගනු මැනවැ'යි ආරාධනා කළේය. ශාස්තෘන් වහන්සේ ඉවසා වදාළ සේක. හේ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට තමාගේ ගෙට ගොස් මුළු රෑම බුදුරජාණන් වහන්සේටද භික්ෂු සංඝයාටද වැඩහිඳිනා තැන් සුවඳමල් ආදියෙන් අලංකාරකොට කෑයුතු දෑ බිය යුතු දෑ පිළියෙල කරවා ඒ රෑ ඇවෑමෙන් තම නිවසෙහි භික්ෂූන් සියදහසක් පිරිවරකොට ඇති ශාස්තෘන් වහන්සේ විවිධ කැඳකැවිලි පිරිවරකොට ඇති සුපව්‍යඤ්ජන සහිත සුවඳහැල් බොජුන් වළඳවා බත් කිස අවසන්හි මෙසේ සිතීය. 'මම මහත් වූ තනතුරක් පතමි. මා විසින් එක් දවසක් පමණක් දනක් දී ඒ තනතුර පතන්ට නුසුදුසුය. අනුපිළිවෙළින් සත්දිනක් දන් දී ප්‍රාර්ථනා කරන්නෙමි'යි ඔහු එපරිද්දෙන්ම සත්දිනක් මහදන් දී බත්කිස අවසන්හි ඔහුගේ කොටුගෙවල් විවර කරවා උතුම් වූ තුන් සිවුරුවලට පොහොනා සූක්ෂම රෙදි බුදුන් පාමුල තබා භික්ෂූන්ට සියදහසක් සිවුරු දී තථාගතයන් වහන්සේ කරා එළඹ 'ස්වාමීනි, ඔබවහන්සේ විසින් මෙයින් සත්වැනි දවසෙහි යම් භික්ෂුවක් පිළිසිඹියාවන්ට පත්වූවන් අතර අගතන්හි තබන ලද්දේද, මම ද ඒ භික්ෂුව මෙන් අනාගතයෙහි උපදින්නා වූ බුදුකෙනකුගේ සසුනෙහි පැවිදි ව පිළිසිඹියාවන්ට පැමිණියවුන් අතර අග්‍ර වන්නෙමියි ශාස්තෘන් වහන්සේගේ පාමුල වැදහෙව ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් ඔහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන බව දැන 'අනාගතයෙහි මෙයින් වර්ෂ සියදහසක් මතුයෙහි ගෞතම නම් බුදුකෙනෙක් ලොව පහළවන සේක. උන්වහන්සේගේ සසුනෙහි ඔබගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේයයි ප්‍රකාශ කළ සේක. හේ එහි දිවි ඇතිතාක් පින්කොට එයින් චුතවූයේ උභය සම්පත් අනුභවකොට කලින් කල දෙවිමිනිසුන් අතර පරිභ්‍රමණය විය. මෙසේ ඔහු සැරිසරන්නේ පින් රැස් කරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර බමුණු කුලයක උපන්නේය. කොටඨිතයයි ඔහුට නමක් තැබූහ. කුමක් නිසා මවගේ හෝ මුතුන් මිත්තන්ගේ නමක් හෝ නොගෙන මෙසේ නමක් තැබුවාහුද. තමාගේ නුවණැති බව නිසාත් වේදාංගයන්හි හා ස්වතර්ක පරතර්ක ආදියෙහිද, නිඝණ්ඩු සහිත කේටුභ ශාස්ත්‍රයන්හිද අක්ෂර සහිත ප්‍රභේද සහිත සියලු ව්‍යාකරණයන්හිද දක්ෂ වූ බැවින්ද ජ්‍යෙෂ්ඨ වූ ශ්‍රේෂ්ඨ වූ ජනයන් සැරපරුෂ වදන් නමැති ආයුධවලින් පහර දෙන්නේ නැවත නැවත පහර දෙන්නේ විදින්නේ හැසිරෙතියි අන්වර්ථ නමක් කළාහුයයි දතයුතුය. හේ වැඩිවිය පත්වූයේ වේදත්‍රය ඉගෙන බ්‍රාහ්මණ ශිල්පයෙහි

නිෂ්පත්තියට ගියේ, එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ සමීපයට ගොස් දහම් අසා ලද සැදැහැ ඇත්තේ පැවිදි ව උපසපන් කාලයෙහි පටන් විදර්ශනාව සඳහා කටයුතු කරන්නේ පිළිසිඹියා සහිත රහත් බවට පත්ව පිළිසිඹියාවන්හි ප්‍රගුණ වී නිර්භය වූයේ මහ තෙරුන් වහන්සේලා වෙත එළඹ ප්‍රශ්න විචාරන්නේ පටිසම්භිදාවන් ගැනම ප්‍රශ්න ඇසීය. මෙසේ මේ තෙරුන් වහන්සේ එහි කරන ලද උත්සාහ ඇති බැවින්ද එහි ප්‍රවීණත්වය නිසාද පිළිසිඹියාවන්ට පත්වූවන් අතර අග්‍ර වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහාවේදල්ල සූත්‍රය අර්ථ උත්පත්තිය කොට පිළිසිඹියාවන්ට පත්වූවන්ගේ අගතන්හි තැබූ සේක. 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් පිළිසිඹියාවන්ට පත්වූවන් අතර යම් කෙනෙක් අග්‍ර වේද ඒ මහාකොට්ඨිතය යනුවෙන්. උන්වහන්සේ පසුකලෙක විමුක්ති සැප කෙරෙහි සංවේදී වන්නාහු හටගත් සොම්නස් ඇතිව තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තරොනාම ජිනො** යනාදිය කීහ. ඒ සියල්ල යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අරුත් ඇත්තේ ම ය. **ඉත්ථංසුදං ආයසමා මහා කොට්ඨිතො** යනු මෙහි **සුදං** යනු නිදර්ශනාර්ථයෙහි නිපාතයි. ආයසමා ගෞරව සම වචනයකි. ආයස්මා මහා මොග්ගල්ලානො මෙනි.

මහාකොට්ඨිත තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.195

අටවැනි අපදානයෙහි **පදුමුත්තරො නාම ජිනො** යනාදි වශයෙන් ආයුෂ්මත් උරුවෙලකස්සප තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින්තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද වැඩිවිය පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ සමීපයෙහි දහම් අසා ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක මහා පිරිවර ඇත්තවුන් අතර අගතන්හි තබනු දැක තමා ද ඒ තනතුර ප්‍රාර්ථනා කරන්නේ මහදන් දී ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ අන්තරායක් නැති

බව දැක 'අනාගතයෙහි ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි මහ පිරිවර ඇත්තවුන් අතර අග්‍ර වන්නේ යයි ප්‍රකාශ කළ සේක. හේ එහි දිවි ඇතිතාක් පින්කොට එයින් චුතව දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ මින් කල්ප අතූදෙකක් මතුයෙහි ඵුසස භාග්‍යවතුන් වහන්සේගේ වෛමාතෘක කණිටුබෑයා වී උපන්නේය. ඔහුට තවත් කණිටුබෑයන් දෙදෙනෙක් වූහ. ඔවුහු ඉන්පසු බුදුපාමොක් භික්ෂු සංඝයාට ආරාධනා කොට පරම පූජාවෙන් පූජාකොට දිවි ඇතිතෙක් කුසල්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නාහු අපගේ භාග්‍යවතුන් වහන්සේගේ උත්පත්තියට පෙරාතුවම බරණැස බමුණු කුලයෙහි සහෝදරයන් තිදෙනෙක්ව උපන්නාහු ගෝත්‍ර වශයෙන් තිදෙනම කාශ්‍යපයෝ යැයි නම් ඇත්තෝ වූහ. ඔවුහු වැඩිවිය පත් වූවාහු වේදත්‍රය උගත්තෝය. ඔවුන්ගෙන් දෙවු සොහොයුරාට පන්සියයක් මාණවකයෝ පිරිවර වූහ. මද්දුමයාට තුන්සියයක්ද බාලයාට දෙසියයක්ද වූහ. ඔවුහු තමන්ගේ ග්‍රන්ථවල හරය බලන්නාහු දිට්ඨධම්මික බව දැක පැවිද්ද රුචි කළහ. ඔවුන් අතුරින් දෙවු සොහොයුරා තමාගේ පිරිවර සමග උරුවේලාවට ගොස් ඍෂි පැවිද්දෙන් පැවිදි ව උරුවෙල කසසප නම් විය. මද්දුමයා ගංගානදිය සමීපයෙහි පැවිදි වූයේ නදී කසසප නම් විය. බාලයා ගයා ශීර්ෂයෙහි පැවිදි වූයේ ගයා කසසප නම් විය. ඔවුන් ඍෂි පැවිද්දෙන් පැවිදි ව තැනින්තැන වසන කල්හි බොහෝ දවස් ඇවෑමෙන් අපගේ බෝසතුන් වහන්සේ මහබිනික්මන් කොට අවබෝධ කරගත් සර්වඥතාඥාන ඇති සේක් අනුක්‍රමයෙන් දම්සක් පවත්වා පස්වග තෙරුන් රහත් බවෙහි පිහිටුවා යසකුල පුත්‍රයා ප්‍රමුඛ යහළුවන් පණස්පස්දෙන හික්මවා රහතුන් සැටදෙන 'මහණෙනි, චාරිකා කරවු' යයි යවා භද්‍රවාර්ගිකයන් තිස්දෙන හික්මවා උරුවෙල කාශ්‍යපයන් වසන ස්ථානයට වැඩමවා වසනු පිණිස ගිනිහල්ගෙයට පිවිස එහි කරන ලද නාගදමන ආදී වූ දහසින් අඩින් අඩක් ප්‍රාතිහාර්යයන්ගෙන් උරුවෙල කසසප සහපිරිවරින් හික්මවා පැවිදි කරවූ සේක. ඔහුගේ පැවිදි විධානය ද ඍද්ධි ප්‍රාතිහාර්ය කිරීම ද සියල්ල නදී කසසප අපදාන අටුවාවෙහි පහළ වන්නේය. ඔහු පැවිදි වූ බව අසා අනිත් සහෝදරයෝ දෙදෙනද පිරිවර සහිතව පැමිණ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදි වූහ. ඒ සියලුදෙන ඍද්ධිමය පාසිවුරු දරන්නාහු ඒහිභික්ෂුහු වූහ. ශාස්තෘන් වහන්සේ ඒ මහණුන් දහස රැගෙන ගයා ශීර්ෂයට වැඩමවා ගලක් මත වැඩහුන් සේක් ආදිත්ත පරියාය දේශනාවෙන් ඒ සියලුදෙන රහත්බවෙහි පිහිටවූ සේක. හේ මෙසේ රහත් බවට පත්ව සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය

ප්‍රකාශ කරන්නේ **'පදුමුත්තරෝ නාම ජිනෝ'** යනාදිය කීය. මෙහිදී ගැඹුරුපද පමණක් විවර්ණනා කරන්නෙමු. **සොව සබ්බතමං හනත්වා** යනු ඒ භාග්‍යවතුන් වහන්සේ රාග දෝස මෝහ ආදී ක්ලේශාන්ධකාරය **විදමං සෙත්වා** දුරුකොට. **මහාජටං** යනු තෘෂ්ණා මාන ආදී වූ එක්දහස් පන්සියයක් ක්ලේශාංගයන්ගෙන් මහා ව්‍යාකුල වූ අවුල ලිහා **පදාලෙත්වා** පළා යන අර්ථයි. **සදෙවකං** දිව්‍යලෝක සහිත වූ සකලලෝක සන්නිවාසය සමාන **යම් තං තපපයනෙනා** සන්තර්පණය කරන්නේ පිණවන්නේ **අමතං වුටඨිං** මහා නිර්වාණ වැසිදහරාව. **වසසතෙ** වගුරුවතියි යෙදුමයි. එකල්හි බාරාණසියං **බාරසමනුසසා** දොළොසක් මනුෂ්‍යයෝ ආදියෙහි මෙන් බාරස ද්වාරස දවාදස වශයෙන් රාසී වී පෙර හිමවතෙහි සිට **ඉසයොව** ප්‍රත්‍යෙක බුද්ධඔුනි සංඛ්‍යාත වූ ඍෂිවරු ගන්ධමාදන පර්වතයෙන්ද අහසින්ද අවුත් මෙහි **ආගචඡනති** බසිත් පිවිසෙත්නුයි බාරාණසී. නැතහොත් සම්‍යක් සම්බුද්ධ සංඛ්‍යාත වූ නොයෙක් සියදහස් ගණන් ධර්මචක්‍රය පැවැත්වීම පිණිස බසින ස්ථානය නගරය ලිංග විපර්යාස කොට **ස්ත්‍රීලිංග** වශයෙන් බාරාණසී යයි කියනු ලැබේ. ඒ බාරාණසියෙහි. **නිකඛිනත සත්ථ පචචනතං** යනු අත්හැර දමන ලද ආයුධ ඇති තැබූ ආයුධ ඇති ප්‍රත්‍යන්ත ජනපදය වෙනසක් නොකොට **පුනරුපෙචචතං** යනු නැවතත් ඒ නගරයට **උපෙචච** පැමිණ සම්ප්‍රාප්තව යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

උරුවෙල කසසප තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.196

නවවැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් රාධ තෙරුන් වහන්සේගේ අපදානයයි. ඒ සියල්ල පෙළ අනුසරින් ක්‍රමය අනුව සිහිමෙන් නුවණැත්තන් විසින් පහසුවෙන් දත හැක්කේමය. හුදෙක් පින්වල වෙනස පමණි.

රාධ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.197

දසවැනි මොඝරාජ තෙරුන් වහන්සේගේ අපදානය පහසුවෙන් දතහැක්කේමය.

පනස් සතරවැනි වර්ග වර්ණනාව සමාප්තයි.

3.198

පනස් පස්වැනි වර්ගයෙහි පළමුවැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාම ජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් ලකුණටක භද්දිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි මහාභෝග ඇති කුලයක ඉපිද දැනමිනි බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසමින් සිටින්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක මධුරස්වර ඇත්තවුන් අතර අගතන්හි තබනු දැක මොහුද ඒ තනතුර ප්‍රාර්ථනා කරන්නේ බුදුපාමොක් භික්ෂු සංඝයාට ගිතෙල් සකුරු ආදී මිහිරි රසයෙන් සම්මිශ්‍ර වූ මහදන් දී 'ස්වාමීනි, මම ද අනාගතයෙහි මේ භික්ෂුව මෙන් එක් බුදුවරයකුගේ සසුනෙහි මධුරස්වර ඇත්තවුන් අතර අග්‍ර වන්නෙමියි ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ එයට අන්තරායක් නැති බව දැක ප්‍රකාශකොට වැඩි සේක. හේ දිවි ඇති තාක් පින්කොට දෙවි මිනිසුන් අතර සැරිසරන්නේ උභය සම්පත් අනුභවකොට ඵුසස භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ චිත්‍ර කෝකිලයෙක් ව ඉපිද රජුගේ උයනින් මිහිරි අඹපල තුඩින් ගෙන යන්නේ ශාස්තෘන් වහන්සේ දැක පහන් සිතැත්තේ බුදුරජාණන් වහන්සේට දෙන්නෙමියි සිතක් ඉපදවීය. ශාස්තෘන් වහන්සේ ඔහුගේ චිත්තාචාරය දැන පාත්‍රය ගෙන වැඩහුන් සේක. කෝකිලයා දසබලයන් වහන්සේගේ පාත්‍රයෙහි අඹපලය තැබීය. ශාස්තෘන් වහන්සේ ඔහුට සොම්නස් උපදවනු පිණිස ඔහු බලා සිටියදීම වැළඳූ සේක. ඉක්බිති ඒ කෝකිලයා පහන් සිතැත්තේ ඒ ප්‍රීති සුඛයෙන්ම සත්දිනක් ගතකළේය. ඒ පින්කමින්ම උපනුපන් භවයෙහි මධුර ස්වර ඇත්තේ විය. කසසප සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි වඩු කුලයෙහි ඉපිද දෙටු වඩුවා

වී ප්‍රකට විය. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි උන්වහන්සේගේ ශරීර ධාතූන් නිදන් කරන ලද සත් යොදුනක් පමණ වූ ස්තූපය ඇරඹී කල්හි ඔහු මෙසේ කීය. යොදුනක් පමණ කරමු. ඒ සියල්ලෝ ඔහුගේ වචනයෙහි සිටියාහුය. මෙසේ අප්‍රමාණ වූ බුදුරජාණන් වහන්සේගේ යොදුනක් පමණ චෛත්‍යය කරවීය. ඒ කර්මයෙන් උපනුපන් තැන්වල අන්‍යයන්ට වඩා අඩු උසක් ඇත්තේ විය. හේ අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද ඉතා මිටි බැවින් රන්පිළිමයක් මෙන් සොඳුරු සිරුරක් ඇති බැවින්ද ලකුණටක භද්දිය යයි ප්‍රසිද්ධ විය. පසුකලෙක ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසා ලද සැදැහැ ඇත්තේ පැවිදිව බහුශ්‍රැත වූයේ ධර්මකථික වූයේ වී මධුර ස්වරයෙන් අනුන්ට ධර්මය කීය. ඉක්බිති එක් උත්සව දවසක එක් බමුණකු සමග රථයෙන් යන්නා වූ එක් ගණිකාවක් තෙරුන් වහන්සේ දැක දත් පෙන්වා සිනාසුණාය. තෙරුන් වහන්සේ ඇයගේ විදුරුමසෙහි නිමිත්ත ගෙන ධ්‍යාන උපදවා එය ආදිකොට විදසුන් වඩා අනාගාමී වූහ. නිරන්තරයෙන් කායගතාසතියෙන් වාසය කරන්නාහු එක් දවසක් ආයුෂ්මත් ධර්ම සේනාපතීන් විසින් අවවාද දෙනු ලබන්නාහු අනුශාසනා කරනු ලබන්නාහු රහත් බවෙහි පිහිටියහ. ඇතැම් භික්ෂූහු ද සාමණේරවරු ද උන්වහන්සේ රහත්බවට පත්වූ බව නොදන්නාහු කන්වලින් අල්ලා අදිති. අත්පා ආදිය අල්ලා සොලවා කෙළින්නාහු වෙහෙසට පත් කරවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අසා 'මහණෙනි, මාගේ පුත්‍රයා වෙහෙස නොකරවු' යයි කියූ සේක. එතැන් පටන් උන්වහන්සේ රහත්යයි දැන වෙහෙසට පත් නො කළහ. උන්වහන්සේ රහත් ව හටගත් සොම්නස් ඇතිව තමාගේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පදුමුත්තරෝ නාම ජිනෝ'** යනාදිය කීහ. **මඤ්ජුනාභිනී කුජනං** යනු මධුර වූ ප්‍රේමණීය වූ ස්වරයෙන් **අභිනිකුජං** මම ශබ්ද පිට කෙළෙමී යන අර්ථයි. මෙහි සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

ලකුණටක භද්දිය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.199

දෙවැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් කඩබාරෙවත තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද

පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි උපන්නේ ය. ඒ සියල්ල පෙළ අනුව පහසුවෙන් දත හැක්කේමය.

3.200

තුන්වැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාම ජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් සීවලී තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක ඉපිද යට කියන ලද පරිදි විහාරයට ගොස් පිරිස් කෙළවර සිට දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ලාභීන් අතර අගතන්හි තබනු දැක මා ද මෙබඳු කෙනකු වන්නට වටීයයි දසබලයන් වහන්සේට ආරාධනාකොට සත්දිනක් මහදන් දී 'ස්වාමීනි, මේ උත්සාහක කර්මයෙන් අන් සැපතක් නොපතමි. අනාගතයෙහි එක් බුදු කෙනකුන්ගේ සසුනෙහි මම ද ඔබවහන්සේ විසින් මෙයින් සත්වැනි දවසෙහි අගතන්හි තබනු ලැබූ භික්ෂුව මෙන් ලාභීන්ගෙන් අග්‍ර වන්නෙමියි ප්‍රාර්ථනාවක් කළේය. ශාස්තෘන් වහන්සේ ඔහුට අනතුරක් නැති බව දැක 'ඔබගේ මේ පැතුම අනාගතයෙහි ගෞතම බුදුරජාණන් වහන්සේ හමුවෙහි සමෘද්ධ වන්නේ යයි ප්‍රකාශකොට වැඩම කළ සේක. ඒ කුලපුත්‍රයා දිවි ඇතිතාක් කුසල්කොට දෙවිමිනිසුන් අතර උභය සම්පත් අනුභවකොට විපසසි භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බන්ධුමති නගරයට නුදුරෙහි එක් කුඩා ගමක උපන්නේ ය. එසමයෙහි බන්ධුමතී නගරවැසියෝ රජු සමග කතිකාකොට දසබලධාරීන් වහන්සේට දන් දුන්හ. එක් දවසක් සියලුදෙනා එකතුව දනක් දෙන්නාහු 'අපගේ දන්ගෙයි නැත්තේ කුමක්දැයි බලන්නාහු මීපැණි සහ උක්සකුරු නොදුටුවාහුය. ඔවුහු 'කොහෙන් හෝ ගෙන එන්නෙමු'යි ජනපදයෙන් නගරයට පිවිසෙන මාර්ගයෙහි පුරුෂයකු තැබූහ. එදා ඒ කුලපුත්‍රයා තමාගේ ගමෙන් උක්සකුරු දීකිරි බඳුනක් ගෙන කිසිවක් හෝ ගෙනෙන්නෙමියි නගරයට යන්නේ මුවදොවා දෙවූ අත්පා ඇත්තේ යන්නෙමියි පහසු තැනක් බලන්නේ නගුල් හිසක් පමණ වූ මැස්සන් නැති දඬුවැල් බෑ මීයක් දැක මෙය මාගේ පිනින් උපන්නේ යයි ගෙන නගරයට පිවිසියේය. නාගරිකයන් විසින් තබන ලද පුරුෂයා

එය දැක 'පින්වත, මෙය කාහට ගෙනයහිදැ'යි ඇසීය. 'මහත්මයාණනි, කිසිවකුට නොවේ මා විසින් විකුණනු ලබන්නකි.' 'එසේනම් මේ කහවනුව ගෙන මේ මීපැණි ද උක්සකුරු සහ දිකිරි ද දෙව' හේ මෙසේ සිතීය. 'මෙය බොහෝ නොඅඟි. මොහුද එක්වරට බොහෝ දෙයි. විමසන්නෙමි'යි ඉන්පසු ඔහුට මෙසේ කීය. 'එක් කහවණුවකට නොදෙමි.' 'එසේනම් කහවණු දෙකක් ගෙන දෙව.' 'දෙකකටත් නොදෙමි.' මේ උපායෙන් වැඩිකොට දහස තෙක් පැමිණියේය. ඔහු මෙසේ සිතීය. 'වැඩිපුර රවටන්ට නොවටී.' 'හොඳයි මෙයින් කළයුතු දෙය අසන්නෙමි.' ඉක්බිති ඔහුට මෙසේ කීය. 'මෙය බොහෝ අගනා දෙයක් නොවේ. ඔබ බොහෝවක් දෙන්නෙහි. කුමක් සඳහා මෙය ගන්නෙහිද?' 'පින්වත මෙහි නුවරවැස්සෝ රජු සමග තරක් වී විපසසී සම්බුදුරජාණන් වහන්සේට දන් දෙන්නාහු මේ දෙවගය දන්ගෙයි නොදක්නාහු මා ලවා සොයවති. යම් හෙයකින් මේ ෙවග නොලබන්නාහු නම් නගරවැසියන්ට පරාජයක් වන්නේය. ඒ නිසා දහසක් දී ගනිමි.' 'නගරවැසියන්ට පමණක් මෙය වටින්නේ කුමක් නිසාද? නැතහොත් අන් අයටද දෙන්ට වටී. කිසිවකුට මෙය වැළැක්වීමක් නැත. නගරවැසියන් අතර එක් දවසකට දහසක් දෙන කෙතෙක් සිටිද? නැත මිතුර. එසේනම් යන්න. නගරවැසියන්ට මෙසේ දන්වන්න. 'එක් පුරුෂයෙක් මේ දෙවගය මුදලින් නො දෙයි. අප සමග තමාගේ අභින්ම දීමට කැමැත්තේය. ඔබලා මේ දෙදෙනාගේ කරුණු තර්ක නොකරන්නෝ වවු. 'ඔබ මේ දානයෙහි ජ්‍යෙෂ්ඨ බවට කාය සාක්ෂි වන්න යයි කියා ගියේය. ඒ කුලපුත්‍රයා ගමින් ද්‍රව්‍ය සඳහා ගත් කහවණුවෙන් පස්කුළු ගෙන සුණුකොට මීවදයක් මිරිකා පස්කුළු සුන්නෙන් හනා නෙළුම් කොළයක බහා බැඳ ගෙනවුත් දසබලධාරීන් වහන්සේ නුදුරෙහි හිඳගත්තේය. මහජනයා විසින් ගෙනඑනු ලබන සත්කාර අතරෙහි තමාගේ හාත්පස බලන්නේ අවසරයක් දැන ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් 'ස්වාමීනි මාගේ දුප්පත් සත්කාරයයි. මට අනුකම්පාකොට මෙය පිළිගනු මැනවැයි. ශාස්තෘන් වහන්සේ ඔහුට අනුකම්පා පිණිස සිව්මහරජුන් විසින් දෙන ලද ශෛල පාත්‍රයෙන් එය පිළිගෙන යම්සේ හැටඅට ලක්ෂයක් භික්ෂූන්ට දෙනුලබන දෙය නොගෙවී යන්නේද, එසේ අධිෂ්ඨාන කළ සේක. ඒ කුලපුත්‍රයා නිමකළ බත්කිස ඇති භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසක හුන්නේ මෙසේ කීය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අද බන්ධුමති නගරවාසීන් විසින් ඔබවහන්සේට සත්කාර ගෙනඑනු මා විසින් දක්නා ලද්දේය. මම ද මෙහි පිනෙන් උපනුපන් භවයෙහි ලාභයෙන්ද යසසින්ද අග්‍රප්‍රාප්ත වන්නෙමි. 'ශාස්තෘන් වහන්සේ කුලපුත්‍රයා එසේ

වේවා'යි කියා ඔහුට සහ නගරවාසීන්ට භුක්තානුමෝදනාව කොට නික්මගිය සේක.

ඒ කුලපුත්‍රයා දිවි ඇතිතාක් කුසල්කොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි සුප්පාවාසා රජදුවගේ කුසයෙහි පිළිසිඳ ගත්තේය. ඔහු පිළිසිඳ ගත් කල්හි පටන් නිරන්තරයෙන් පඬුරු පන්සියයක් සුප්පාවාසා වෙත ගෙනඑනු ලැබේ. ඉක්බිති ඇයගේ ඒ පින විමර්ශනය කරනු පිණිස අතින් බිජුපැස ස්පර්ශ කරවයි. ඒ එක් එක් බීජයෙන් සලාක සියයක්, දහසක් නික්මෙයි. කොටු පිරෙන කාලයෙහි ද කොටුදොර අතින් ස්පර්ශ කරන රජදුවගේ පිනින් ගන්නවුන් ගත් ගත් තැන් නැවත පිරෙයි. පිරිසුන් බත් සැළෙන් රජදුවගේ පින යැයි කියා යමකුට දෙන්නවුන්ට උඩට නොනැගෙන තාක් කල් වුවද බත් අඩු නො වෙයි. දරුවා කුසට ආ අවස්ථාවේ සිට සත්වසක් ඉක්ම ගියේය. ගැබ මුහුකුරා ගියකල්හි සත්දිනක් මහා දුකක් වින්දාය. ඈ සැමියා අමතා 'මරණයට පෙරාතුව ජීවදානයක් දෙන්නෙමි'යි ශාස්තෘන් වහන්සේගේ සමීපයට යවන්නී. හිමියනි, යන්න. මේ පුවත ශාස්තෘන් වහන්සේට දන්වා ශාස්තෘන් වහන්සේට ආරාධනා කරන්න. යමක් ශාස්තෘන් වහන්සේ කියන සේක්නම් එය මැනවින් සලකාගෙන පැමිණ මට කියන්න. ඔහු ගොස් ඇගේ හසුන ශාස්තෘන් වහන්සේට දැන්වීය. ස්වාමීනි ශාස්තෘන් වහන්ස. කෝලිය දුහිතෘව පා වදියි. ශාස්තෘන් වහන්සේ ඇයට අනුකම්පා කොට කෝලිය දුහිතෘ සුප්පවාසා සැපවත් වේවා. සැප ඇත්තී නිරෝග වූවා නිරෝගී පුත්‍රයකු බිහිකරාවායි කී සේක. හේ එය අසා භාග්‍යවතුන් වහන්සේ වැඳ තමාගේ ගම දෙසට ගියේය. ඔහු පැමිණීමට පෙරාතුවම සුපපවාසාවගේ කුසින් කෙණ්ඩියෙන් ජලය මෙන් දරුගැබ නික්මිණි. පිරිවරා හුන් ජනයා කඳුළු පිරි මුහුණින් හඬන්නට ඇරඹුවද එහි තුටුපහටු වූ මහාජනයා ඇයගේ සැමියාට සතුටු හසුන දැන්වීමට ගියහ. හේ ඔවුන්ගේ ඉඟිය දැක 'දසබලයන් වහන්සේ විසින් කියන ලද කථාව සඵල වන්නේ යයි සිතිය. හේ පැමිණ ශාස්තෘන් වහන්සේ කියූ දෙය රජදුවට කීවේය. රජදුව 'ඔබ විසින් ආරාධිත වූ ජීවදානය මගුල්බතක් වන්නේය. යන්න සත්දිනකට බුදුරදුන්ට ආරාධනය කරන්න. හේ එසේ කළේය. සත්දිනක් බුදුපාමොක් භික්ෂු සංඝයාට මහදන් පැවැත්වූහ. 'ඒ දරුවා ඥාතීන්ගේ තැවුණු සිත නිවාලමින් සිසිල් බව ඇතිකරමින් උපන්නේ යයි සීවලී යනුවෙන් නමක් තැබූහ. හේ සත්වසක් මව්කුස විසූ බැවින් උපන්කල්හි පටන් සියලු කර්මක්ෂම විය. ධර්ම සේනාපති සාරිපුත්ත

තෙරුන් වහන්සේ සත්වැනි දවසෙහි ඔහු සමග කථාසල්ලාප කළ සේක. ශාස්තෘන් වහන්සේද මේ ගාථාව වදාළ සේක.

යෝ ඉමං පලිපථං දුගගං සංසාරං මොහ මච්චගා
තිණ්ණෝ පාරගතෝ ඣායී අනෙජෝ අකථංකථී
අනුපාදාය නිබ්බුතෝ තමහං බ්‍රූමි බ්‍රාහමණං ති

කෙලෙස් ගොහොරුව සසර
මෝහය ඉක්මවාගිය
කෙලෙස් මහවතුරින් එතෙරව
දැහැන් වඩනා නිකෙලෙසි නිසැකි
කෙලෙස් පරිනිවුමෙන් පිරිනිවි
ඔහු බමුණෙකැයි කියනෙමි

ඉක්බිති තෙරුන්වහන්සේ ඔහුට මෙසේ කියූහ. 'ඔබ විසින් එබඳු දුකක් විඳ පැවිදිවන්නට නො වටීද? ලැබෙනම් පැවිදිවන්නෙමි ස්වාමීනි. සුපපවාසා ඒ දරුවා තෙරුන් වහන්සේ සමග කථාකරනු දැක 'මාගේ පුත්‍රයා ධර්ම සේනාපතීන් වහන්සේ සමග කතා කරන්නේ කුමක්දැ'යි තෙරුන් වහන්සේ කරා එළඹ විචාළාය. 'මගේ පුත්‍රයා ඔබවහන්සේ සමග කුමක් කතා කළේද ස්වාමීනි. තමා විසින් විඳින ලද ගැබ විසීමේ දුක කියා ඔබ විසින් අනුදන්නා ලද්දේ නම් පැවිදිවන්නෙමියි කියයි. 'මැනවි ස්වාමීනි. ඔහු පැවිදි කරන්න. තෙරුන් වහන්සේ ඔහු විහාරයට කැඳවා තචපඤ්චක කර්මස්ථානය දී පැවිදි කරවා 'සීවලී ඔබට වෙනත් අවවාදයකින් කම් නැත. ඔබ විසින් සත්වසක් විදි දුකම ප්‍රත්‍යවේක්ෂා කරන්න. 'ස්වාමීනි, පැවිද්ද නම් ඔබවහන්සේට බාරයි. මා විසින් යම්දෙයක් කළහැකිනම් එය දන්නෙමි. ඔහු වනාහි පළමු කෙස්වැටිය ඉවත්කළ කෙණෙහිම සෝවාන් ඵලයෙහි පිහිටියේය. දෙවැන්න ඉවත්කළ කෙණෙහි සකෘදාගාමී ඵලයෙහි පිහිටියේය. තෙවැන්න ඉවත්කළ කෙණෙහි අනාගාමී ඵලයෙහි පිහිටියේය. සියලු කෙලෙස් ඉවත් කිරීමත් රහත්ඵලය සාක්ෂාත් කිරීමත් පෙරපසු නොවී සිදුවිය. ඉක්බිති භික්ෂු සංඝයා අතර කතාවක් හටගත්තේය. අනේ, මෙතරම් පින්වත් තෙරණුවෝත් සත්මස් අධික සත් හවුරුද්දක් මව්කුස තුළ වැස සත් දවසක් මූසගර්භ වූයේ වාසය කළහ. ශාස්තෘන් වහන්සේ පැමිණ 'මහණෙනි, මෙහි මෙතෙක් වේලා කිනම් කථාවකින් හුන්නාහුදැයි අසා 'මේ නමැ'යි කී කල්හි 'මහණෙනි, මේ කුලපුත්‍රයා විසින් මේ

ජාතියෙහි කරන ලද කර්මයක් නොවේ'යයි කියා අතීතය ගෙනහැර දක්වා 'මහණෙනි, අතීතයෙහි මේ බුද්ධෝත්පාදයට පෙරාතුවම මේ කුලපුත්‍රයා බරණැස රජකුලයෙහි ඉපිද පියාගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා විභව සම්පත් ඇත්තේව ප්‍රකට විය. එකල්හි එක් ප්‍රත්‍යන්ත රජෙක් රාජ්‍යය ගන්නෙමියි පැමිණ නගරය වටලා කඳවුරු බැඳ විසීය. ඉක්බිති රජ මව සමග සම කැමැත්තේව සත්දිනක් කඳවුරු නුවර සිව් දිසාවන්හි දොරවල් වැස්වීය. නික්මෙන්නවුන්ට හා පිවිසෙන්නවුන්ට දොරමුළා විය. ඉක්බිති මිගදාය නුවර පසේ බුදුවරු උද්ඝෝෂණය කළහ. රජ අසා දොර විවෘත කරවීය. පසල් රජද පළා ගියේය. හේ ඒ කර්ම විපාකයෙන් නරකාදියෙහි දුක්විඳ මේ බුද්ධෝත්පාද කාලයෙහි රජකුලයෙහි ඉපිද වුවද මව සමග මෙසේ මේ දුක අනුභව කළේය. මොහු පැවිදි වූ තැන් පටන් භික්ෂු සංඝයාට සිව්පසය පමණටත් වඩා උපදියි. මේ අයුරින් එහි වස්තු ගොඩනැගිණ. පසුදිනෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරට වැඩි සේක. තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඳ ස්වාමීනි මාගේ පින්බලය විමසන්නෙමි. 'භික්ෂූන් පන්සියයක් දුන මැනවි'යි කීහ. 'ගන්න සීවලී' උන්වහන්සේ භික්ෂූන් පන්සියයක් ගෙන හිමවත දෙසට ගමන් කරන්නාහු වනමගට යති. පළමුකොට උන්වහන්සේට නුගගෙ හි අධිගෘහීත දේවතාවා සත්දවසක් දන් දුන්නාය. මෙසේ ඔහු

නිග්‍රොධං පඨමං පසසි - දුතියං පණ්ඩව පබ්බතං
තතියං අචිරවතියං - චතුත්ථං වර සාගරං

පළමුව නුගය දිටි - දෙවනුව පව්ව පණ්ඩව
තෙවනුව අචිරවතියද - සිව්වනුව මහ සයුරද

පඤ්චමං හිමවන්තං සෝ - ජටයං ඡද්දන්තුපාගමී
සත්තමිං ගන්ධ මාදනං - අට්ඨමං අථ රෙවතං ඉති

පස්වනුව හිමවත - සවනුව සදත් ඇතුවෙත
සත්වනු ගන්ධමාදන - අටවනුව රේවත හිමි

සියලු තන්හි දින සත බැගින් දන් දුන්හ. ගන්ධමාදන පර්වතයෙහි නාගදත්ත දිව්‍යරාජයා නම් සත්දවස්හි එක් දවසක් කිරිපිඬු දුන්නේය. එක් දවසක් ගිතෙල් පිඬු දුන්නේය. ඉක්බිති භික්ෂු සංඝයා උන්වහන්සේගෙන්

මෙසේ ඇසූහ. 'මේ දෙවිරජුට දොවන කිරිදෙනුන් දක්නට නැත. දීකිරි මිදවීමක්ද නැත. දිව්‍යරාජය ඔබට මේවා උපදින්නේද? ස්වාමීනි කස්සප දසබලධාරීන් වහන්සේගේ කාලයෙහි කිරිසලාක බත් දන්දීමෙහි මේ ප්‍රතිඵලය'යි දිව්‍යරාජයා කීයේය. පසුකලෙක ශාස්තෘන් වහන්සේ බදිරවනිය රෙවත තෙරුන් වහන්සේගේ ආපසුගමන අර්ථෝත්පත්තිකොට තෙරුන් වහන්සේ තමන්වහන්සේගේ සසුනෙහි ලාභයසස් අතින් අගතන්හි තැබූ සේක. ශාරිපුත්‍ර තෙරණුවෝ ශාස්තෘන් වහන්සේට යම්හෙයකින් මෙසේ කීවෝද. 'ස්වාමීනි, මාගේ කණිටුබෑයා රේවත පැවිදි විය. ඔහු සතුටින් සිටීද නැද්දැයි ගොස් බලන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ රේවතගේ ඇරඹූ විදර්ශනා ඇති බව දැන දෙවරක් ප්‍රතික්ෂේප කොට තෙවැනි වර අයැද සිටියාහු රහත්බවට පැමිණි බව දැන 'සාරිපුත්ත මමත් එන්නෙමි. භික්ෂු සංඝයාට දන්වන්න. තෙරුන් වහන්සේ භික්ෂූන් රැස්කරවා 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි හැසිරෙනු කැමැති සේක. ඒමට කැමති ඇත්තෝ පැමිණෙත්වා.' සියලු දෙනාට දැන්වූහ. දසබලධාරීන් වහන්සේ චාරිකාවක් සඳහා වැඩමවන කල පසුබසින භික්ෂූහු නම් අල්ප වෙති. ශාස්තෘන් වහන්සේගේ රන්වන් සිරුර බලන්නෙමි. මිහිරි දහම් කතා අසන්නෙමියි බෙහෙවින් යනු කැමැත්තෝ බහුතරයක් වෙති. මෙසේ ශාස්තෘන් වහන්සේ මහාභික්ෂු සංඝයා පිරිවරා රෙවත බලන්නෙමුයි භික්මුණු සේක. ඉක්බිති එක් පෙදෙසක ආනන්ද තෙරුන් වහන්සේ දෙමංසලකට පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් විමසූහ. 'මෙතැන දෙමංසලකි. කිනම් මගකින් භික්ෂු සංඝයා යායුතුද? 'ආනන්ද කුමන මාර්ගය ඍජුද?' 'ස්වාමීනි ඍජු මාර්ගය යොදුන් තිහකි. අමනුෂ්‍යයන්ගේ මාර්ගයකි. අනිත් මගනම් යොදුන් සැටකි. බියක් නැත. සුහික්ෂයි' 'ආනන්ද සීවලී අප සමග ආවා නේද? සීවලීගේ පින පරීක්ෂා කරන්නෙමු.' ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරකොට සීවලී තෙරුන් වහන්සේගේ පින පරීක්ෂා කිරීම පිණිස තිස්යොදුන් මගට හැරුණු සේක. හැරුණු තැන්පටන් දිව්‍ය සමූහයා යොදුනින් යොදුන නගර මවා බුදුපාමොක් භික්ෂු සංඝයාට වසනු පිණිස විහාර පිළියෙල කර දුන්හ. දිව්‍යපුත්‍රයෝ රජු විසින් එවන ලද කම්කරුවන් මෙන් කැඳකැවිලි ආදිය ගෙන 'සීවලී ආර්යයන් වහන්සේ කොහිදැයි කියන්නාහු යති. තෙරුන් වහන්සේ සත්කාර සම්මාන ගෙන්වාගෙන ශාස්තෘන් වහන්සේ සමීපයට යති. ශාස්තෘන් වහන්සේ භික්ෂු සංඝයා සමග වැළඳූ සේක. මේ ක්‍රමයෙන් ශාස්තෘන් වහන්සේ සත්කාර වළඳන සේක් දිනපතා යොදුනක් පමණ වැඩමවා තිස්යොදුන් කාන්තාර මාර්ගය ඉක්මවා බදිරවනිය රෙවත තෙරුන් වසන තැනට

පැමිණි සේක. තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ පැමිණීම දැන තමාගේ වසන තැන බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට පොහොනා විහාරද දසබලධාරීන් වහන්සේට ගඳකිළි රාත්‍රිස්ථාන දිවාස්ථාන ආදිය ඍද්ධියෙන් මවා තථාගතයන් වහන්සේ වඩනා පෙරමගට ගියහ. ශාස්තෘන් වහන්සේ අලංකාරයෙන් පිළියෙල කරන ලද මාර්ගයෙන් විහාරයට පිවිසි සේක. ඉක්බිති තථාගතයන් වහන්සේ ගඳකිළියට පිවිසි කල්හි භික්ෂූහු වස් පිළිවෙළට පැමිණ සෙනසුන්වලට පිවිසියහ. දෙවිවරු අකාලයෙහි අෂ්ටවිධ පානයක් ගෙනාවාහුය. ශාස්තෘන් වහන්සේ භික්ෂූන් සමග පානය වැළඳූ සේක. මේ ආකාරයෙන්ම තථාගතයන් වහන්සේ සත්කාර සම්මාන වළඳත්දීම අඩමසක් නික්ම ගියේය. ඉක්බිති එක්තරා උඩඟු භික්ෂු පිරිසක් එකම තැන හිඳිමින් කතාවක් ඉපදවූහ. දසබලධාරීන් වහන්සේ මගේ අග්‍ර ශ්‍රාවකයාගේ කණිටු සොහොයුරායයි කියා මෙබඳු නවකම් ඇති භික්ෂුවක් බලන්ට පැමිණි සේක. මේ විහාරය සමීපයෙහි දෙව්රම් මහවෙහෙර හෝ වේළුවනාරාම ආදිය හෝ තිබීමෙන් ඇති ඵලය කිම? මේ භික්ෂුවද මෙබඳු නවකර්ම කරන්නෙකි. මහණදම් පුරන්නේ කෙසේද? ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූ සේක. මා මෙහි බෝ කලක් වාසය කරන කල්හි මේ ස්ථානය ආකීර්ණ වන්නේය. ආරණ්‍යක භික්ෂූහු විවේක කැමැත්තෝය. රෙවතට පහසු විහරණයක් ද නැති වන්නේය. ඉන්පසු තෙරුන් වහන්සේගේ දිවාස්ථානයට වැඩි සේක. තෙරුන් වහන්සේ ද හුදෙකලාව සක්මන කෙළවර එල්ඹෙන ඵලකය අසල සෙල් පුවරුවෙහි හුන්නාහු ශාස්තෘන් වහන්සේ එනු දුරදීම දැක පෙරගමන්කොට වැඳ සිටියහ. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසූ සේක. රෙවත, මේ ව්‍යාල මෘගයන්ගේ ස්ථානයෙහි චණ්ඩ හස්තීන්ගේ අශ්වයන්ගේ ශබ්ද අසා කුමක් කෙරෙහිද? ස්වාමීනි, ඔවුන්ගේ හඬ අසනවිට අරණ්‍ය ප්‍රීතිය නම් දෙයක් උපන්නේ වෙයි. ශාස්තෘන් වහන්සේ මෙතැනදී රෙවත තෙරුන් වහන්සේට ගාථා පන්සියයකින් අරණ්‍යයෙහි ආනිසංස කියා දෙවැනි දවසෙහි නුදුරු තැන පිඬු පිණිස හැසිර රෙවත තෙරුන් වහන්සේ අමතා යම් භික්ෂු කෙනෙක් විසින් තෙරුන් වහන්සේගේ නුගුණ කියන ලද්දේද ඔවුන්ට කත්තර යෂ්ටි පාවහන් තෙල්ගුලා කුඩ උපදවන ලෙස කළ සේක. ඔවුහු තමාගේ පිරිකර සඳහා නැවතුණාහු පැමිණි මගින්ම යන්නාහු ද ඒ ස්ථානය හඳුනා ගැනීමට නොහැකි වෙති. පළමුකොට අලංකාර ලෙස පිළියෙල කරන ලද මගින් ගිය අය එදවස විෂම මගින්ම යන්නාහු එතැන උක්කුටිකව හුන්නාහු දණින් යති. ඔවුහු ලැහැබ් පඳුරු කටු මඩින්නාහු තමා විසූ පැත්තේ තැනට ගොස් එහි කිහිරි කණුවක ලැගුණු තමාගේ කුඩය හඳුනා ගනිති. පාවහන කත්තර

යෂ්ටිය, තෙල්ගුලාවද හඳුනා ගනිති. ඔවුහු එසමයෙහි මේ භික්ෂුව සෘද්ධි ඇත්තෙකැයි දැන තමාගේ පිරිකර ගෙන දසබලධාරීන් වහන්සේට පිළියෙල කරන ලද ලාභසත්කාර නම් මෙබඳු වේයයි කියන්නාහු ගියහ. පෙරාතුව පැමිණි භික්ෂූන් තමාගේ ගෙයි හුන්කල්හි විසාකා උපාසිකාව මෙසේ විචාළාය. 'රෙවත හාමුදුරුවන්ගේ වසන ස්ථානය සිත් ඇදගනීද?' 'උපාසිකාවනි, නන්ද භවනය චිත්‍රලතාවනය හා සමානයි. ඒ සෙනුසන.' ඉක්බිති ඔවුන්ට පසුව පැමිණි භික්ෂූන්ගෙන් ඇසුවාය. 'ආර්යවරුනි, රෙවත හාමුදුරුවන්ගේ වසන ස්ථානය සිත් ඇදගනීද?' 'උපාසිකාවනි, නොඅසනු මැනවි. කීම යුතු නැති තැනකි. වල් පැළ වැඩුණු ගල්කැට ගලින් විසම වූ කිහිරි වනයක්. ඒ භික්ෂුව එසේ එහි වසයි. විසාකාව කලින් ආ අයගේත් පසුව ආ අයගේත් කතාව අසා කවරකුගේ කතා සත්‍යයද කවරකුගේ අසත්‍යද? බතින් පසු සුවඳ මල් ගෙන දසබලධාරීන් වහන්සේට උපස්ථානයට ගොස් වැඳ එකත්පසෙක හුන්නී ශාස්තෘන් වහන්සේගෙන් මෙසේ ඇසුවාය. 'ස්වාමීනි, රෙවත තෙරණුවන්ගේ වසන ස්ථානය සමහර ආර්යයන් වහන්සේලා වර්ණනා කරති. සමහරු නින්දා කරති. ස්වාමීනි, මේ කුමක්ද? විසාකාවනි, රමණීය හෝ වේවා නොවේවා යම්තැනක ආර්යයන්ගේ සිත ඇලේද එබඳු තැන රමණීය නම් වේ යයි කියා මේ ගාථාව කී සේක.

ගාමෙවා යදිවා රඤ්ඤෙ - නිනෙනවා යදිවා ථලෙ
යත්ථ අරහනෙතා විහරනති - තංභූමිං රාමණෙය්‍යකං

ගමෙහි හෝ වනයෙහි - නිම්නයෙහි ගොඩබිමෙහි හෝ
යම්තැනක වෙසෙත්ද රහත්හු - ඒ බිම රමණීය වේ.

පසු අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ ආර්යයන් මැද වැඩහුන් සේක් 'මහණෙනි,' මාගේ ශ්‍රාවක භික්ෂූන් ගෙන් ලාභීන් අතර යමෙක් අග්‍රවේද ඒ සීවලීයයි තෙරුන් වහන්සේ අගතන්හි තැබූ සේක. ඉක්බිති ආයුෂ්මත් සීවලී තෙරුන් වහන්සේ රහත් බවට පත්ව පැමිණි අගතැන් ඇත්තාහු තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පදුමුත්තරෝ නාමජිනෝ'** යනාදිය කීහ. මෙහිදී ගැඹුරු අරුත් ඇති පද පමණක් කියන්නෙමි. **සීලං තස්ස අසඞ්ඛෙය්‍යං** යනු ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ ශීලය නොගිණිය හැකිය.

'නවකොටි සහසසානි අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහසසානි ඡත්තිංසාච පුනාපරෙ

නව කෙළ දහසක් හා සියකෙළ අසූවක්
සියදහස් පනසක් හා යළිත් තිස්හයක්

'එතෙ සංවරවිනයා සමබුද්ධෙන පකාසිතා
පෙය්‍යාල මුඛෙන නිද්දිට්ඨා - සික්ඛා විනය සංවරෙ

බුදුරදුන් පැවසූ - මෙය සංවර විනය
විනය සංවර සික - පෙය්‍යාලයෙන් දැක්විණ

මෙසේ කියන ලද ශික්ෂාපද භික්ෂූන්ට ප්‍රඥප්ති වශයෙන් කියන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේගේ ශීලය අසංඛෙය්‍ය වේ. ගණනය කිරීමට නොහැකිය යන අර්ථයි. සමාධි වජිරූපමො යනු යම් වජ්‍රයක් ඉඳුනිල්මිණි, වෙරළුමිණි, පලිඟු මැසිරිගල් ආදී රත්නයන් විදීද සිදුරු කුඩා සිදුරු කරයිද, එසේම පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ ලෝකෝත්තර මාර්ග සමාධි ප්‍රතිපක්ෂ ප්‍රත්‍යනීක ධර්ම විජ්ඣති සිදී සමුච්ඡේදනය කරයි යන අර්ථයි. අසඞ්ඛෙය්‍යං ඤාණවරං යනු ඒ බුදුරදුන්ගේ ඤාණවරං චතුරාර්ය සත්‍ය සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සංඛ්‍යාත වූ සංඛත ධර්මයන්ද ජානිතුං ප්‍රතිවේධ කරන්ට සමර්ථ වූ ස්වයංභූඥාන, සර්වඥතා ඥාන ආදී ඥාන සමූහය අසංඛෙය්‍යං අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න ආදී භේදයෙන් සංඛ්‍යා විරහිතය යන අර්ථයි. විමුත්තිව අනුපමා යනු සංක්ලේශවලින් විමුක්ත බැවින් සෝතාපත්ති ඵල ආදීකොට ඇති විමුක්තීහු අනූපමා උපමා රහිතය. මේවා මෙසේ වූහයි උපමා කරන්ට නොහැකිය යන අර්ථයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

සීවලී තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.201

සිව්වැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාම ජිනෝ** ආදි වශයෙන් ආයුෂ්මත් වංගීස තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නුවර මහාභෝග ඇති කුලයක ඉපිද වැඩිවිය පත්වූයේ දහම් ඇසීමට යන නුවරවැස්සන් සමග විහාරයට ගොස් දහම් අසන්නේ ශාස්තෘන් වහන්සේ එක් භික්ෂුවක ප්‍රතිභාන ඇත්තවුන් අතර අගතන්හි තබනු දැක ශාස්තෘන් වහන්සේට උවටැන් කොට 'මම ද අනාගතයෙහි ප්‍රතිභාන ඇත්තවුන් අතර අග්‍ර වෙම්වයි ප්‍රාර්ථනාවක් කොට, ශාස්තෘන් වහන්සේ විසින් ඒ බව ප්‍රකාශ කරන ලද්දේ දිවි ඇති තෙක් කුසල්කොට දෙවිමිනිසුන් අතර උභය සම්පත් අනුභවකොට මේ බුද්ධෝත්පාද කාලයෙහි සැවැත්නුවර බමුණු කුලයෙහි ඉපිද මව පරිබ්‍රාජිකාවක බැවින් පසුකලෙක පරිබ්‍රාජකයෙක් යැයි ප්‍රකටව වංගීස යයි ලද නම් ඇතිව වේදත්‍රය උගෙන ඉන්පසුව ගුරුවරයා සතුටුකොට මළමිනී හිස දන්නා මන්ත්‍රයක් උගෙන මිනී හිස් නියෙන් ගටා 'මේ සත්වයා අසුවල් යෝනියෙහි උපන්නේ යයි දනියි. බමුණෝ මොහු අපගේ ජීවිකාවට මාර්ගයෙකැයි වංගීස රැගෙන ගම්නියම්ගම් රජදනව්වල හැසිරුණාහුය. වංගීස වසර තුන්සියයකට පෙර මළවුන්ගේද හිස ගෙන්වාගෙන නියෙන් සූරා මේ සත්වයා අසුවල් යෝනියෙහි උපන්නේ යයි කියා මහජනයාගේ සැක නැතිකරනු පිණිස ඒ ඒ මිනිසුන් ගෙන්වා තම තමා උපන් තැන කියවයි. එයින් ඔහු කෙරෙහි මහජනයා අතිශයින් පැහැදුණේය. හේ ඒ නිසා මහජනයාගේ අතින් සියයක් දහසක් පවා ලබයි. බමුණෝ වංගීස රැගෙන හැසිරුණාහුය. වංගීස ශාස්තෘන් වහන්සේගේ ගුණ අසා ශාස්තෘන් වහන්සේ දකිනු කැමැත්තේ විය. බමුණෝ ශ්‍රමණ ගෞතම තෙමේ මායාවෙන් ඔහු හරවා ගන්නේයයි ප්‍රතික්ෂේප කළහ. වංගීස ඔවුන්ගේ වචනය නො අදහා ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් පිළිසඳර කොට එකත්පසෙක හුන්නේය. ශාස්තෘන් වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසීය. 'වංගීස, කිසියම් ශිල්පයක් දන්නෙහිද?' 'එසේය භවත් ගෞතමය, ඡවසීස නමැති මන්ත්‍රයක් දනිමි. එයින් වසර තුන්සියයකට පෙර මළවුන්ගේ වුව ද හිස නියෙන් සූරා උපන්තැන දනිමි. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔහුට නරකයෙහි උපන්නකුගේ හිසක්ද, මිනිසුන් අතර උපන්නකුගේ හිසක්ද දෙවියන් අතර උපන්නකුගේ හිසක්ද, පිරිනිවන්පෑ අයකුගේ

හිසක්ද ගෙන්වා දුන්නේ ය. හේ පළමුවැනි හිස සූරා, 'භවත් ගෞතමය, මේ සත්වයා නරකයෙහි උපන්නේ යයි කීය. 'මැනවි වංගීස! තා විසින් මැනවින් දක්නා ලදී. මේ සත්වයා කොහි උපන්නේදැ'යි ඇසූ සේක. 'මිනිස් ලොවෙහිය.' 'මොහු කොහිද?' 'දෙව්ලොව' තිදෙනගේම උපන් තැන් කීය. පිරිනිවි අයගේ හිස නියෙන් සූරන්‌නෝ අන්තයක් හෝ කෙළවරක් නො දකී. ඉක්බිති ශාස්තෘන් වහන්සේ 'නොහැකිද වංගීස?'යි ඇසූ සේක. 'බලනු මැන භවත් ගෞතමයෙනි, තවත් විමසා බලමියි නැවත නැවත පෙරලා බාහිර මන්ත්‍රයකින් ආශ්‍රවක්‍ෂය කළ කෙනකුගේ හිස දැනගන්ට නොහැකිය. ඉක්බිති ඔහුගේ හිසින් දහදිය පිටවිය. හේ ලජ්ජාවට පත්ව නිහඬවිය. ඉක්බිති ශාස්තෘන් වහන්සේ ඔහුට 'වෙහෙසද වංගීසැ'යි ඇසූ සේක. 'එසේය භවත් ගෞතමයෙනි, මොහු උපන් තැන දැනගන්ට නොහැකියි. යම්හෙයකින් ඔබ දන්නේ නම් කියන්නැ'යි. 'වංගීස මම මෙයත් දනිමි. මීට ඉහළිනුත් දනිමි'යි කියා:

චුතිං යො වෙදි සත්තානං - උපපත්තිංච සබ්බසො
අසත්තං සුගතං බුද්ධං - තමහං බ්‍රූමි බ්‍රාහ්මණං

සතුන්ගේ මරණය උපත - සැම අයුරකින් දන්නා
නිබය සුගත් ඒ බුදුවර - බමුණෙකැයි මම කියනෙමි

යස්ස ගතිං නජානාතකි දෙවා ගන්ධබ්බ මානුසා
ඛීණාසවං අරහන්තං - තමහං බ්‍රූමි බ්‍රාහ්මණංති

යමකු ගිය තැන නොදනිත්ද - දෙවිහු ගඳඔහු මිනිස්හු
ඒ නිකෙලෙස් රහත්හු - බමුණෙකැයි මම කියනෙමි

මේ ගාථා දෙක වදාළ සේක.

හේ 'එසේනම් භවත් ගෞතමය ඒ විද්‍යාව මට දෙනු මැනවැයි බුහුමන් කියා ශාස්තෘන් වහන්සේ සමීපයෙහි හුන්නේ ය. ශාස්තෘන් වහන්සේ 'අප හා සමලිංග ඇත්තකුට දෙමි'යි කී සේක. වංගීස තෙමේ යම් කිසිවක් කියා මා විසින් මේ මන්ත්‍රය ගන්ට වටියයි බමුණන් කරා ගොස් මෙසේ කීය. 'මා පැවිදි වනවිට ඔබලා අමුත්තක් නොසිතන්න. මම මන්ත්‍රය ඉගෙන සියලු දඹදිව ජ්‍යෙෂ්ඨයා වන්නෙමි. ඔබලාටත් එයින් යහපතක් ම වන්නේය. හේ මන්ත්‍රය පිණිස ශාස්තෘන් වහන්සේ සමීපයට එළඹ පැවිද්ද ඉල්ලීය. ඒ අවස්ථාවේ නිග්‍රොධකප්ප තෙරුන් වහන්සේ

භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි සිටියාහු වෙති. 'නිග්‍රොධ කප්ප මොහු පැවිදි කරව'යි භාග්‍යවතුන් වහන්සේ අණ කළ සේක. තෙරුන්වහන්සේ ශාස්තෘන් වහන්සේගේ අණින් ඔහු පැවිදි කරවා මන්ත්‍ර පරිවාසය ඉගෙන ගනුවයි ද්වත්තිංසාකාර කර්මස්ථානය, විදර්ශනා කර්මස්ථානයද කියා දුන්හ. හේ ද්වත්තිංසාකාර කර්මස්ථානය සජ්ඣායනය කරන්නේ විදර්ශනා කර්මස්ථානය එළඹවා ගත්තේය. බමුණෝ ඔහු වෙත එළඹ පින්වත් වංගීස ශ්‍රමණ ගෞතමයන් සමීපයෙහි ශිල්ප ඉගෙන ගන්නහුදැයි ඇසූය. 'එසේය උගෙන ගන්නා ලදී.' 'එසේනම් එන්න යන්නෙමු'. 'තෙපි යවු. ඔබලාගෙන් මට කළයුත්තක් නැත. බමුණෝ 'ඔහුනම් දැන් ශ්‍රමණ ගෞතමයන්ගේ වසඟයට පැමිණියේ මායාවෙන් වෙළුණේ වෙයි. තා සමීපයෙහි අපි කුමක් කරන්නෙමුදැයි ආ මගින්ම ගියහ. වංගීස විදර්ශනා වඩා රහත්බව සාක්ෂාත් කළේය. මෙසේ තෙරණුවෝ රහත්බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තාහු පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදිය කීහ. ගැඹුරු අර්ථ පමණක් වර්ණනා කරන්නෙමි. **පභාහි අනුරඤ්ජනෙනා** යනු ඒ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේ නීල පීත ආදී **ඡබ්බණ්ණ** පභාහි සවණක් රැසින් **අනුරඤ්ජනෙනා** දිලෙන්නේ බැබලෙන්නේ ජෝතිමත් වන්නේ යන අර්ථයි. වෙනෙය්‍ය **පදුමානිසෝ** යනු පදුමුත්තර නම් සූර්යයා තමාගේ වචන සංඛ්‍යාත සිරුරු රැසින් හික්මවිය යුතු ජනසංඛ්‍යාත පද්මයන් විශේෂයෙන් අවබෝධ කරවන්නේ, අර්හත් මාර්ග අධිගමයෙන් පිපුණුවුන් කරයි යන අර්ථයි. වෙසාරජ්ජහි **සම්පනෙනා** යනු අනතුරුවම පමුණුවානුයි නිබ්බානෙ ආශ්‍රව ක්ෂයයෙහි. ඒ තැන් හතරෙහි බුදුරජාණන් වහන්සේ මැනවින් විශාරද වනසේකැයි මෙසේ කියන ලදී. චතුර්වෛශාරද්‍ය ඥානයෙන් යුත්. **සම්ඵහිභූතෝ** යුක්තවූයේ යන අර්ථයි. **වංගීසෝ වාදි සූදනෝ** යනු **වාදිනං** පණ්ඩිත ජනයන්ට **ඵසෝ** ප්‍රධාන වාදීසෝ යයි කියයුතු කල්හි දකාරයට ග කාරය කොට මෙසේ කියන ලදැයි දතයුතුයි. ස්වකීය අර්ථ පරාර්ථවාද **සූදති** වගුරුවයි ප්‍රකාශ කෙරේනුයි වාදි සූදනෝ. **මාර මසනෝ** යනු ස්කන්ධමාරාදී පස්මරුන් **මසති** ස්පර්ශ කෙරේනුයි විධ්වංසනය කෙරේනුයි පරාමසනං. **දිට්ඨිසූදනෝ** යනු වොහාර පරමත්ථ සංඛ්‍යාත වූ දෘෂ්ටි දර්ශනය **සූදති** වගුරුවයි පැහැදිලි කරයි යන අර්ථයි. **විසසාමහූම් සන්තානං** යනු සියල් සසර සයුරෙහි ක්ලාන්ත වන්නාවුන්ට සෝවාන් මාර්ග අවබෝධ නමැති මගෙහි විශ්‍රාම භූමියකි. විෂමස්ථානයකි. සංසිඳුවන ස්ථානයකි යන අර්ථයි. **තතොහං විහතා රමෙහා** යනු ස්ථාන වශයෙන් පසේබුදුරදුන්ගේ සිරස දැකීමෙන් මම **විහතාරමෙහා** නැසූ

උද්ධච්ච ඇත්තේ, නැසූ මාන ඇත්තේ නිර්මද වූයේ වී පැවිද්ද මැනවින් යාච්ඤ අයැදුම් කෙළෙමි යන අර්ථයි. සෙස්ස පහසුවෙන් දත හැක්කේමය.

වඞ්ගීස තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.202

පස්වැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් නන්දක තෙරුන් වහන්සේගේ අපදානයයි. මෙතෙමේද පෙර බුදුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේය ආදී සියල්ල පෙළ අනුසරින් පහසුවෙන් දතහැක්කේමය.

නන්දක තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.203

සවැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාමජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් කාළුදායී තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි කුලගෙයක ඉපිද දැනමීති බවට පත්වූයේ ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාව අසන්නේ ශාස්තෘන් වහන්සේ භික්ෂුවක කුල පහදන්නවුන් අතර අගතන්හි තබනු දැක එබඳු ප්‍රාර්ථනාවක් කොට ඒ තනතුර පැතීය. ශාස්තෘන් වහන්සේ විවරණ දුන් සේක. හේ දිවි ඇති තාක් කුසල්කොට දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ අපගේ බෝධිසත්වයන් මව්කුස පිළිසිඳ ගන්නා දවසෙහි දෙවිලොවින් චුතව කපිල වස්තුවෙහිම ඇමති කුලයෙක පිළිසිඳ ගත්තේය. බෝසතුන් සමග එකම දවසෙහිම උපන්නේය. එදවසම ඔහු දුහුල් සුඹුළුවක හොවා බෝසතුන්ට උපස්ථානයට ගෙන ගියහ. බෝසතුන් සමග බෝධිවෘක්ෂය, රාහුල මාතාව, සතරමහා නිධාන, ආරෝහනී හස්තියා, කන්ථක, ඡන්න, කාළුදායී යන මේ සත්දෙන එක්දිනයෙක උපන් බැවින් සහජාත නම් වූහ. ඉක්බිති ඔහුට නම් තබන දවසෙහි සියලු නගරයෙහි උද්දාමයට පත් සිත් ඇති දවසෙහි උපන්

බැවින් උදායී යැයි නමක් තැබූහ. මදක් කාළවර්ණ බැවින් කාළුදායී යැයි ප්‍රසිද්ධියට පත්විය. හේ බෝධිසත්වයන් සමග කුමරකෙළි කෙළින්නේ වැඩිවියට ගියේය. පසුකලෙක ලෝකනාථයන් වහන්සේ මහබිනික්මනින් නික්ම අනුක්‍රමයෙන් සියල්ල දත් බවට පැමිණ පවත්වන ලද උතුම් දම්සක් ඇත්තාහු රජගහනුවර නිසා වෙළුවනයෙහි වාසය කරන සේක. සුදොවුන් මහරජතුමා ඒ පුවත අසා පුරුෂයන් දහසක් පිරිවර ඇතිව එක් ඇමතියකු 'මාගේ පුත්‍රයා මෙහි කැඳවාගෙන එවයි යැවීය. හේ ශාස්තෘන් වහන්සේ දහම් දෙසන වේලාවෙහි ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් පිරිස් කෙළවර සිටියේ දහම් අසා පිරිවර සහිතව රහත්බවට පැමිණියේය. ඉක්බිති 'මහණෙනි එවු'යයි අත දිගුකළ සේක. සියලුදෙන එකෙණෙහිම ඍද්ධිමය පාසිවුරු දරන්නාහු සියවස් සපිරූ තෙරුන් මෙන් වූහ. රහත්බවට පත්වූ තැන් පටන් ආර්යයෝ නම් මධ්‍යස්ථයෝ වෙති. ඒ නිසා යැවූ හසුන දසබලධාරීන් වහන්සේට නොදැන්වීය. රජතෙමේ 'ගිය තැනැත්තා නොපැමිණේ. හසුනක්ද අසන්නට නොලැබේ'යයි තවත් ඇමතියකු පුරුෂයන් දහසක් පිරිවරකොට යැවීය. ඔහුද එසේ පිළිපන් කල්හි තවත් ඇමතියකුද එනයින්ම පුරුෂයන් දහසක් පිරිවර කොට ඇමතිවරුන් නවදෙනකු යැවීය. සියලුදෙන ගොස් රහත්බවට පත්ව නිහඬවූහ. ඉක්බිති රජතුමා මෙසේ සිතීය. 'මෙපමණක් දෙන මා කෙරෙහි ස්නේහයක් නැති බැවින් දසබලධාරීන් වහන්සේ මෙහි පැමිණවීම පිණිස කිසිවක් නොකිහ. මේ උදායී වනාහි දසබලධාරීන් වහන්සේ සමග සමවයස් ඇත්තේය. එක්ව වැලිකෙළියෙහි යෙදුණේය. මා කෙරෙහිද ස්නේහවත්ය. මොහු යවන්නෙමියි ඉක්බිති ඔහු ගෙන්වා 'දරුව, ඔබ පුරුෂයන් දහසක් පිරිවරකොට ගොස් දසබලධාරීන් වහන්සේ මෙහි ගෙන එව'යි කියා යැවීය. ඔහු යන්නේ 'දේවයන් වහන්ස, යම් හෙයකින් පැවිදි වන්නට ලබන්නේ නම් ඒ අයුරින් මම භාග්‍යවතුන් වහන්සේ මෙහි ගෙන එන්නෙමි'යි කියා රජු විසින් 'පැවිදි වුවද මාගේ පුත්‍රයා පෙන්වව'යි කියන ලද්දේ රජගහනුවරට ගොස් ශාස්තෘන් වහන්සේ දහම් දෙසන වේලාවෙහි පිරිස් කෙළවර සිටියේ දහම් අසා පිරිවර සහිතව රහත්බවට පත්ව ඒහිභික්ෂු භාවයෙහි පිහිටියේය. 'තවමත් දසබලධාරීන් වහන්සේගේ කුල නුවර යාමට කාලය නොවේ. වසන්ත කාලයද නොළඹියේය. වනළැහැබ් මල් පිපුණු කල්හි හරිත තෘණයෙන් භූමිය ගැවසුණු කල්හි ගමනට කාලය වන්නේය'යි ගමනට කාලය අපේක්ෂාවෙන් වසන්නේ වසන්තය පැමිණි කල්හි ශාස්තෘන් වහන්සේට කුලනුවරට යාමට ගමන් වර්ණනාව කළේය. මෙය ථෙර ගාථාවෙහි කියන ලද්දේය.

'අධගාරිනො දානි දුමා භදනෙන - එලෙසිනො ඡදනං විපහාය
තෙ අචවිමනෙනාව පභාසයනති - සමයො මහාවීර භාගීරසානං

හිමියනි මෙවිට රුක්හිස් සහළගුරු වගේ
පරඬැල් සලා පලදැරුමට ළඟයි වගේ
ඒ රුක් පහන් සිළුමෙන් බබළමින් නැගේ
සැකිකුලවුන්ට අතදෙන මේ කලැයි හැඟේ

දුමානි ඵුල්ලානි මනො රමානි - සමනතතො සබබදිසා පවනති
පතතං පහාය ඵලමාසයානො - කාලො ඉතො පකකමනාය වීර

විරුවනි එරුක් මල්බර වී මනහරය
සුවඳින් පුරාලයි දසදෙස පරිසරය
පලබර වනුව සැරසෙයි පරඬැල් හැරය
මෙතැනින් නික්මෙනට දැන් කාලය හරිය

නෙවාති සීතං න පනාති උණහං - සුබාදතු අදධනියා භදනෙන
පසසනතුනං සාකියා කොලියාච - පචඡාමුඛං රොහිණීං තාරයනතං

වැඩි සීතලක් නැත වැඩි උණුසුමක් නැත
මහමග යන්ට සුන්දර රිතු ගුණය ඇත
රෝහිණි නදිය තරණය කර ඔබ වඩින
සැකිකෝළියෝ පැලදිග දෙස බලනු ඇත

ආසාය කසතෙ ඛෙතතං - බීජං ආසාය වජජති
ආසාය වාණිජා යනති සමුදදං ධන හාර කා
යාය ආසාය තිටඨාමි සාමෙ ආසා සමිජඣතු

සිතැඟි ලෙස කෙත් සැකසේ - සිතැඟි ලෙස බිජු වැපිරේ
දනය ගෙන යන වෙළඳ ජනයා - සිතැඟි ලෙස මහ සමුදුරේ යති
මමද යම් සිතැඟියක සිටිනෙමි - එයද ඉටුවනු දකිනු රිසියෙමි

නාති සීතං නාති උණහං නාති දුබභිකඛජාතකං
සඳදලා හරිතා භූමි එස කාලො මහාමුනී

වැඩි සීතලක් නැත වැඩි උණුසුමක් නැත
එතරම් දුබික් නැත සා පවසක්ද නැත
තණපතින් නිල්වන් බිමක් ඇත
මහමුනි තුමනි දැන් කල් එළඹිලා ඇත

පුනපපුනං යෙව වපනති බීජං - පුනපපුනං වසති දෙවරාජා
පුනපපුනං ඛෙත්තං කසනති කසකා - පුනපපුනං ඛඤ්ඤමුපෙති රථං

යළි යළි බිහුවට වපුරාලද්දී
යළි යළි මහවැසි දහර වසිද්දී
යළි යළි ගොවියන් කෙත් වපුරද්දී
යළි යළි රටවෙත එයි වී ඇද්දී

පුනපපුනං යාචනකා චරන්ති - පුනපපුනං දානපති දදන්ති
පුනපපුනං දානපති දදිත්වා - පුනපපුනං සග්ගමුපෙන්ති ඨානං

යළි යළි ඉල්ලා ඇවිදිති යදියෝ
යළි යළි ඔවුනට දෙති දන්පතියෝ
යළි යළි දන්දී ඒ දන්පතියෝ
යළි යළි යහපත් තැනට සැපැතියෝ

විරෝ භවෙ සත්තයුගංපුනෙති - යසම්ං කුලෙ ජායති භූරි පඤ්ඤා
මඤ්ඤාමහං සක්කති දෙව දෙවෝ - තයාහි ජාතෝ මුනි සච්චනාමෝ

පවුලක මහ පැනැති විරුවකු උපන්විට
හත්මුතු පරපුරක් යෙයි පිරිසුදු බවට
හැකිවේයයි සිතමි දෙවි දෙවි වූ ඔබට
ගැළපෙයි එයින් ඔබ සත්‍යය යන නමට

සුද්ධොදනෝ නාමපිතා මහෙසිනෝ - බුද්ධස්ස මාතාපන මාය නාමා
යාබොධිසත්තං පරිහරිය කුච්ඡිනා - කායස්ස භෙදා තිදිවූපගමි මොදති

ඔබගේ පියතුමා සුදොවුන් නම් වේය
ඔබගේ මව්තොමෝ මායා නම් වේය
බෝසත් කුසදරා සිට ඈ මියැදේය
ඉන්පසු තුටුවෙමින් දෙව්ලොව වැජඹේය

සාගොතමී කාලකතා ඉතොචුතා - දිබ්බෙහිකාමෙහි සමඞ්ගිභූතා
සාමොදති කාමගුණෙහි පඤ්චහි - පරිවාරිතා දෙවගණෙහි තෙහී

ඒ ගෝතමීය කලුරිය කොට ඉන් චුතව
දෙව්ලොව කම්සැපෙහි හැම අඟකින් යුතුව
පස්කම් ගුණෙන් ඈ දැන් මොනවට තුටුව
සැප විඳිනීය දෙව්ගණ පිරිවර ඇතුව

මේ ආදී වූ සැටක් පමණ ගාථාවලින් ශාස්තෘන් වහන්සේගේ ගමන වර්ණනා කළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ 'කාළුදායී මාගේ ගමන ප්‍රාර්ථනා කරයි. ඔහුගේ සංකල්පය සම්පූර්ණ කරන්නෙමි'යි එහි යාමෙන් බොහෝ දෙනකුන්ට සිදුවන විශේෂ අධිගමය දැක විසිදහසක් ක්ෂීණාශ්‍රවයන් විසින් පිරිවරන ලද්දාහු රජගහනුවර සිට අතුරිත චාරිකා වශයෙන් ප්‍රීතිසුඛ අනුභව කරන සේක් ද්විපද චතුෂ්පද ආදීන්ගේ සේවන පූජාවෙන් පුදනු ලබන සේක් කියනලද ආකාරයේ මල් සුවඳින් සුවඳවත් කරනු ලබන සේක් ගම්වැසියන්ට සංග්‍රහ කරමින් කපිලවස්තුවට දිවෙන මාර්ගයට පිළිපන් සේක. තෙරුන් වහන්සේ ඍද්ධියෙන් කපිලවස්තුවට ගොස් රජු ඉදිරියෙහි අහසෙහි සිටියාහු නොදුටුවිරූ වේශය දැක රජු විසින් 'ඔබ කවරෙක්දැ'යි විචාරන ලද්දාහු 'ඔබ විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයට යවන ලද අමාත්‍ය පුත්‍රයා නොහඳුනහිද, හේ මම යයි දනු මැනව'යි පෙන්වන්නාහු

බුද්ධස්ස පුත්තොම්හි අසය්හ සාහිනෝ
අඞ්ගීරසපපටිමස්ස තාදිනෝ
පිතුපිතා මය්හං තුවංසි සක්ක
ධම්මෙන මෙ ගොතම අය්‍යකොසී ති

ඇසැහි සැහි වූ අංගිරස වූ තාදි ගුණ ගණ යුතු
අසම සම වූ බුදුපියාණන් වහන්සේගේ මම පුතු
මාපියාණන් පියා වෙති ඔබවහන්සේ සැකිකුල ගොතු
සොබාවෙන් මත් ඔබවහන්සේ වන සේක මාගේ මුතු

එහි බුදධස්ස පුත්තොම්හි යනු සර්වඥ බුදුරජාණන් වහන්සේගේ සමීපයෙහි උත්සාහ ඇතිකරන ධර්මදේශනාවලින් උපන් බැවින් ඖරස පුත්‍රයා වෙමි. අසය්හ සාහිනෝ යනු අභිසම්බෝධියට පෙර මහාබෝධි සත්වයන් හැර අන්‍යයන් විසින් අභිභවනය කිරීමට නොහැකි බැවින් අසයහසස සකලබෝධි සම්භාරයන් ඇති මහා කාරුණිකයාණන්ටද සහනතො එයින්

මත්තෙහිද අන්‍යයන් විසින් **සහිතුං** අභිභවනය කිරීමට නොහැකි බැවින් පැරදවිය නොහැකි පස්මරුන් **සහනතො** අභිභවනය කරන බැවින් ආසය අනුසය චරිතාධිමුක්ති ආදී විභාගයන් අවබෝධ කිරීමෙහි සුදුසු පරිදි භික්මවිය යුත්තන්ට දිට්ඨධම්මික සම්පරායික පරමත්ථ ධර්මයන්ගෙන් අනුශාසනීය සංඛ්‍යාත වූ අන්‍යයන් විසින් අභිභවනය කළ නොහැකි බුදුකිස අභිභවනය කරන බැවින් එහි හෝ යහපත කරන බැවින් **අසයහ සාහිනො** නොපැරදවිය හැක්කවුන් පරදවන. **අඩ්ගීරසස්ස** යනු වැළඳගත් ශීලාදි සම්පත් ඇති. ඇතැම් කෙනෙක් අංගීරස, සිද්ධත්‍ථ යන මේ නම්දෙක පියා විසින්ම තබන ලද්දේ යයි කියති. **අපපටිමස්ස** යනු අනුපම වූ. ඉටු අනිටු තාදී ලක්‍ෂණ සම්පතින් **තාදිනා පිතුපිතා මයහං තුවංසි** යනු ආර්ය ජාති වශයෙන් මාගේ පියා වූ සම්මා සම්බුදු වූ ලෝකව්‍යවහාර වශයෙන් ඔබ පියා වෙහි. **සක්කා** යනු ජාති වශයෙන් රජුන්ට කියයි. **ධම්මෙන** යනු ස්වභාවයෙන් ආර්යජාති ලෞකික ජාති යන ජාති දෙකෙහි ස්වභාව එකට ගැනීමෙන්. ගොතම යනු ගෝත්‍රයෙන් රජුන්ට කියයි. **අය්‍යකොසි** යනු මුත්තා විය. මෙහිද **බුද්ධස්ස පුත්තොමහි** යන ආදිය කියන්නාහු තෙරුන්වහන්සේ රහත් බව ප්‍රකාශ කළහ. මෙසේ තමා හඳුන්වා තුටුපහටු වූ රජු විසින් මාහැඟි පුටුවක හිඳවා තමාට පිළියෙල කරන ලද නානා අග්‍රරස බොජුනින් පාත්‍රය පුරවා දුන්කල්හි යන ආකාරයක් දැක්වූහ. 'කුමක් හෙයින් යන්ට කැමැත්තේ මෙහි වළඳවුදැයි කීකල්හි 'ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් වළඳන්නෙමි. 'ශාස්තෘන් වහන්සේ කොහිද?' 'විසිදහසක් භික්‍ෂූන් පිරිවරා ඔබතුමා දකින්නට මාර්ගයට පිළිපන් සේක. 'ඔබවහන්සේ මේ පිණ්ඩපාතය වළඳන්න. වෙනෙකක් භාග්‍යවතුන් වහන්සේට ගෙනයන්න. යම්තාක් මාගේ පුත්‍රයා මේ නගරයට පැමිණෙන සේක්ද, ඒ තාක් උන්වහන්සේට මෙහෙන් පිණ්ඩපාතය ගෙනයන්න. තෙරුන් වහන්සේ බත්කිස කොට රජුටද පිරිසටද දහම් දෙසා ශාස්තෘන් පැමිණීමට පෙරාතුවම සියලු රජමැදුර රත්නත්‍රය ගුණයෙහි අතිප්‍රසන්න කරන්නාහු පැහැදුණුවුන් සියලු දෙනටම ශාස්තෘන් වහන්සේට ගෙන ආයුතු බතින් පිරුණු පාත්‍රය අහසෙහි යවා තමාද අහසට පැනනැඟී පිණ්ඩපාතය ගෙන්වා ශාස්තෘන් වහන්සේගේ අතෙහි තැබූහ. ශාස්තෘන් වහන්සේ එය වැළඳූ සේක. මෙසේ සැටයොදුන් මග දවසක් දවසක් පාසා යන්නා වූ භාග්‍යවතුන් වහන්සේට රජගහනුවරින් බත් ගෙනවුත් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ක්‍රමයෙන් කපිලවස්තු නුවරට පැමිණ දෙවන දවසෙහි රජවීදියෙහි පිඬු පිණිස හැසිරෙන සේක. ඒ අසා සුදොවුන් මහරජතුමා එහි ගොස් 'මෙසේ නොකළ යුතුය. මෙය රාජ වංශ ප්‍රවේණිය

නොවේ'. 'මහරජ, මේ ඔබගේ ප්‍රවේණියයි. අපගේ බුද්ධවංශය මෙබඳුය'යි කියා :

උතනිධෙ නපපමජ්ජෙය්‍ය - ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති - අස්මිං ලොකෙ පරම්හිච

නොපමාව නැගිටිනු - සුසිරිත් දම්හි හැසිරෙනු
දම් සැරි තැනැත්තේ - මෙලොව පරලොව වෙසේ සුවසේ

ධම්මං චරෙ සුචරිතං - නනං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති - අස්මිං ලොකෙ පරම්හි පරම්හිච

සුසිරිත් දම්හි හැසිරෙනු - නොහැසිරෙනු දුසිරිත් දම්හි
දම්සැරි තැනැත්තේ - මෙලොව පරලොව වෙසේ සුවසේ

දහම් දෙසූ සේක. රජතුමා සෝවාන් පෙලෙහි පිහිටියේය. ඉන්පසු රජතුමා බුදුපාමොක් භික්ෂු සංඝයාට ආරාධනාකොට සිය මැදුරෙහි වළඳවා පවරා වළඳ අවසන්හි ධර්මපාල ජාතකය අසා පිරිස් සහිතව අනාගාමී ඵලයෙහි පිහිටියේය. පසුකලෙක සේසතයට වැදහොත්තේම රහත්බවට පැමිණ පිරිනිවන් පෑයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාහුලමාතාව වූ බිම්බා දේවියගේ ප්‍රාසාදයට වැඩමවා ඇයට දහම් දෙසා ශෝකය පහකොට චන්දකින්නර ජාතක ධර්ම දේශනාවෙන් ප්‍රසාදය දනවා නිග්‍රෝධාරාමයට වැඩි සේක. ඉක්බිති බිම්බාදේවිය පුත්‍ර වූ රාහුල කුමාරයාට මෙසේ කීවාය. 'යන්න පියසතු ධනය ඉල්ලන්න'. කුමාරයා 'දායාදය දෙන්නැ'යි කියා භාග්‍යවතුන් වහන්සේ අනුව ගියේය. 'ශ්‍රමණයන් වහන්ස, ඔබගේ සෙවනැල්ල සැපය'යි කියමින් යයි. භාග්‍යවතුන් වහන්සේ ඔහු නිග්‍රෝධාරාමයට කැඳවා 'ලෝකෝත්තර දායාදය ගන්නැ'යි කියා පැවිදි කරවූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආර්ය ගණයා මැද වැඩහුන් සේක් 'මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන්ගෙන් යම් කෙනෙක් කුලයන් පහදවන්නවුන් අතර අග්‍රවේද ඒ කාළුදායී යයි උන්වහන්සේ අගතන්හි තැබූ සේක. තෙරුන් වහන්සේ පැමිණි අගතැන් ඇත්තාහු තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **'පදුමුත්තරෝ නාම ජිනෝ'** යනාදි ගාථා කීහ. මෙහි ගැඹුරු පද පමණක් වර්ණනා කරන්නෙමි. **ගුණාගුණ විදූ** යනු ගුණයද අගුණයද

ගුණාගුණ නම්. වර්ණ, අවර්ණ, කුසල අකුසල හෝ දනිනුයි ගුණාගුණ විදූ නම්. **කතඤ්ඤූ** යනු අනුන් විසින් කරන ලද ගුණ දනිනුයි **කතඤ්ඤූ** නම්. එක් දවසක් හෝ බත් දීම් ආදියෙන් කරන ලද උපකාරයට රාජ්‍යය වුවද දීමට සමර්ථ බැවින් කතඤ්ඤූ නම්. **කතවේදී** යනු කරන ලද දෙය විඳගනී. අනුභව කරයි පිළිගනීනුයි කෘතවේදී නම්. **තිසෝ යොජෙනි පාණිනො** යනු සියලු සතුන් නිර්වණයට ප්‍රවේශ වීමේ උපායෙහි **කුසලපථෙ** මාර්ගයෙහි දහම් දෙසීමෙන් යොදවයි. මැනවින් යොදවයි. පිහිටුවයි යන අර්ථයි. සෙස්ස සියලු තන්හි නොගැඹුරු අරුත් ඇත්තේමය. ගමන වර්ණනාවෙහි ගාථාවන්ගේ අර්ථය ථෙරගාථා අටුවාවෙහි කියන ලද්දේමය.

කාළුදායී තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.204

සත්වැනි අපදානයෙහි **පදුමුත්තරෝ නාම ජිනෝ** යනාදි වශයෙන් ආයුෂ්මත් අභය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හංසවතී නගරයෙහි බමුණු කුලයෙහි ඉපිද වැඩිවිය පත්ව වේදයෙහි පරතෙරට ගියේ සකසමය පරසමයෙහි දක්ෂ වූයේ එක් දවසක් ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා පහන් සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේ ගාථාවන්ගෙන් ස්තුති කළේය. හේ එහි දිවි ඇතිතෙක් සිට පින්කොට එයින් චුතවූයේ දෙව්ලොව උපන්නේය. ඉන්පසු කලින්කල සුගතීන්හිම සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවර බිම්බිසාර රජුගේ පුත්‍රයාව උපන්නේය. ඔහුට අභයයැයි නමක් තැබූහ. හේ වැඩිවිය පත්වූයේ නිගණ්ඨයන් සමග විශ්වාසවන්ත වී හැසිරෙන්නේ එක් දවසක් නිගණ්ඨනාථ පුත්‍රයා විසින් ශාස්තෘන් වහන්සේට වාදාරෝපණය **කිරීම** සඳහා යවන ලද්දේ නිපුණ ප්‍රශ්නය අසා, නිපුණ ව්‍යාකරණය අසා පැහැදුණේ ශාස්තෘන් වහන්සේ සමීපයෙහි පැවිදිව කර්මස්ථාන අනුරූපව ඥානය මෙහෙයවා නොබෝ කලකින්ම රහත්බවට පත්වූයේය.

උත්වහන්සේ රහත් බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්වචරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **පදුමුත්තරෝ නාම ජිනෝ** යනාදිය කීහ. ඒ සියල්ල පහසුවෙන් දත හැක්කේමය.

අභය තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.205

අටවැනි අපදානයෙහි **ඉම්මහි භද්දකෙ කප්පෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් ලොමසකඩ්ගිය තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස්කරන්නේ කස්සප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි බමුණු කුලයෙහි ඉපිද ශ්‍රද්ධා ඇත්තේ පැහැදුණේ විය. තවත් ඔහුගේ චලන නම් යහළුවෙක්ද විය. ඒ දෙදෙනම ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දහම් අසා පැවිදිව දිවි ඇතිතාක් සිල් රැක අතිපරිශුද්ධ සිල් ඇත්තාහු එයින් චුතවූවාහු දෙවිලොව ඉපිද එක් බුද්ධාන්තරයක් දිවසැප අනුභව කළහ. ඔවුන්ගෙන් මොහු මේ බුද්ධෝත්පාද කාලයෙහි ශාක්‍ය කුලගෙයක උපන්නේ ය. ඉක්බිති ඔහු ශාක්‍යකුල ප්‍රසාදක කාළදායී විසින් ආරාධිත වූයේ භාග්‍යවතුන් වහන්සේ විසින් ශාක්‍ය රජුන්ගේ මානය මර්දනය සඳහා පවත්වන ලද වෙස්සන්තර ධර්ම දේශනාවෙන් ඇති වූ පොකුරුවැසි ඍද්ධි ප්‍රාතිහාර්ය දැක පහන් සිතැත්තේ පැවිදිව මජ්ඣිම නිකායෙහි ආ භද්දෙකරත්ත සූත්‍ර දේශනාව අසා අරණ්‍යවාසයෙහි වෙසෙන්නේ ඒ දේශනා අනුශාසනාව සිහිකොට ඒ අනුසාරයෙන් ඥානය මෙහෙයවා රහත්බවට පත්විය. රහත් බවට පත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇත්තේ පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නේ **'ඉම්මහි භද්දකෙ කප්පෙ'** යනාදිය කීය. එහි කල්පය නම් සිව්වැදෑරුම්ය. සාරකල්පය, වර කල්පය, මණ්ඩක කල්පය, භද්‍රකල්පය යනුවෙන්. ඒ අතරින් යම් කල්පයෙක එක් බුදුකෙනෙක් උපදීද මෙය සාරකල්ප නම්. යමෙක බුදුවරුන් දෙනමක් හෝ තෙනමක් උපදිද්ද මෙය වරකල්ප නම්. යමෙක බුදුවරුන් සිව්නමක් උපදිද්ද මෙය මණ්ඩක කල්ප නම්. යමෙක බුදුවරුන් පස්නමක් උපදිද්ද මෙය භද්‍රකල්ප නම්. සාර කල්පය, මණ්ඩ කල්පය, සාරමණ්ඩ කල්පය, වර කල්පය, භද්‍ර

කල්පයයි කල්ප පස්වැදෑරුම් කොට ඇතැම්හු බෙදූහ. විනායක බුදුවරු එක්නමක් දෙනමක් තුන්නමක් සිව්නමක් පස්නමක් පිළිවෙළින් මේ කල්ප පසෙහි උපදිත්. මෙසේ කල්ප පසක් කියන ලදී. ඒ අතර මේ කල්පය කකුසඳ, කෝනාගමන, කස්සප, ගෞතම, මෛත්‍රෙය්‍ය යන බුදුවරුන් පස්නමගෙන් ප්‍රතිමණ්ඩිත බැවින් භද්‍රකල්ප නම් විය. ඒ නිසා **ඉමස්මිං භද්‍ර කප්පම්හි කස්සපෝ නාම නායකෝ උපපජ්ජති** යනු සම්බන්ධයි. සෙස්ස නොගැඹුරු අරුත් ඇත්තේමය.

ලොමසකඬ්ගික තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

3.206

නවවැනි අපදානයෙහි **ඉමම්හි භද්‍රකෙ කප්පෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් වනවච්ඡ තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන පින් රැස් කරන්නේ කස්සප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි කුලගෙයක උපන්නේ දැනමිති බවට පත්ව ශාස්තෘන් වහන්සේගේ ධර්ම දේශනාව අසා සැදැහැ ඇත්තේ පැවිදිව පිරිසිදු බඹසර හැසිර ඉන් චුත වූයේ දෙව්ලොව උපන්නේ ය. එයින් චුතවූයේ අරණ්‍යායතනයෙහි භික්ෂූන් සමීපයෙහි පරෙවි යෝනියෙහි උපන්නේ ඔවුන් කෙරෙහි මෙත්සිතින් දහම් අසා එයින් චුතවූයේ දෙවිමිනිසුන් අතර සැරිසරන්නේ මේ බුද්ධෝත්පාද කාලයෙහි කපිල වාස්තු පුරයෙහි බමුණු කුලයෙක උපන්නේය. ඔහු මව්කුසට ගියකල්හිම මවට දොළදුක් උපන්නේය. වනයෙහි වසන්ටත් වනයෙහි වඳින්ටත්. ඉන්පසු ඍද්ධි අනුරූපව වනයෙහි වසන්නියට දරු ප්‍රසූතිය සිදුවිය. ගර්භයෙන් නික්මුණු ඔහු සිවුරු කඩකින් පිළිගත්හ. බෝධිසත්වයන් උපන් කාලයයි. රජ තෙමේ ඒ කුමාරයා ගෙන්වා පුත්‍රයා සමගම පෝෂණය කළේය. ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණයෙන් නික්ම පැවිදිව සයවසක් දුෂ්කරක්‍රියා කොට බුදු වූහ. හේ මහා කස්සප හිමියන් වෙත ගොස් උන්වහන්සේගේ අවවාදයෙහි පහන් වූයේ උන්වහන්සේ ඇමුවෙන් බුදුන් උපන් බව අසා ශාස්තෘන් වහන්සේ සමීපයට ගොස් දහම් අසා පැවිදිව නොබෝ කලකින්ම

ෂඩභිඥා සහිතව රහත් විය. උන්වහන්සේ රහත් බවට පත්ව තමාගේ පූර්ව කර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **ඉමම්හි භද්දකෙ කප්පෙ** යනාදිය කීහ. එහි බ්‍රහ්මබන්ධු මහයසො යනු මෙහි බමුණන්ට බන්ධු ඥාතියෙක් වේ. බ්‍රාහ්මණ බන්ධු යයි කියයුතු තන්හි ගාථා බන්ධන පහසුව පිණිස බ්‍රහ්ම බන්ධු යයි කියන ලදැයි දතයුතුය. සෙස්ස සියල්ල පහසුවෙන් දතහැක්කේමය.

වනවච්ඡ තෙරුන් වහන්සේගේ අපදාන අටුවාවයි.

3.207

දසවැනි අපදානයෙහි **ඉමම්හි භද්දකෙ කප්පෙ** යනාදි වශයෙන් ආයුෂ්මත් සුගන්ධ තෙරුන් වහන්සේගේ අපදානයයි. මොහුද පෙර බුදුවරුන් හමුවෙහි කරන ලද උත්සාහ ඇත්තේ භවයෙහි තැනින් තැන නිවනට හේතුවන පින් රැස්කරන්නේ කසසප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි බරණැස විභව සම්පත් ඇති කුලයක ඉපිද දැනමිති බවට පැමිණ ශාස්තෘන් වහන්සේගේ ධර්මය අසා සැමකල්හි නමස්කාර කරමින් දන් දෙමින් මසකට සත්වරක් භාග්‍යවතුන් වහන්සේගේ ගඳකිළිය සතර වර්ගයක සුවඳින් ආලේප කළේය. මාගේ උපනුපන් තැන ශරීරයෙන් සුගන්ධය උපදීවායි ප්‍රාර්ථනාවක් කළේය. භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රකාශ කළ සේක. හේ දිවි ඇතිතාක් සිට පින්කොට එයින් දෙව්ලොව උපන්නේ කාමාවචර දිව්‍ය ලෝකය ශරීර සුගන්ධයෙන් සුවඳවත් කරමින් සුගන්ධ දිව්‍යපුත්‍රයා යයි ප්‍රකට විය. හේ දිව්‍යලෝක සම්පත් අනුභව කොට එයින් චුතවූයේ මේ බුද්ධෝත්පාද කාලයෙහි මහාභෝග ඇති කුලයක උපන්නේ ය. ඔහු මව්කුසට ගියකල්හි මවගේ සිරුරු සුවඳින් මුළුගෙයද මුළු නගරයද සුවඳින් පිරී ගියේය. උපන් කෙණෙහි මුළු සැවැත්නුවරම සුවඳ කරඬුවක් මෙන් විය. ඒ නිසා ඔහුට සුගන්ධයයි නමක් තැබූහ. හේ වැඩිවියට ගියේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරට පැමිණ දෙව්රම් මහවෙහෙර පිළිගත් සේක. ඒ දැක පහන් සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදිව නොබෝ කලකින්ම

පිළිසිඹියා සහිතව රහත් බවට පත්විය. ඔහු උපන් දිනයෙහි පටන් පිරිනිවන් පානා තෙක් මෙදෑතුර නිපන් තැන් ආදියෙහි සුවඳම හැමීය. දෙවියෝද දිවසුණු, දිවසුවඳ, දිවමල් විසුරුවති. ඒ තෙරුන් වහන්සේද රහත් බවට පත්ව තමාගේ පූර්වකර්මය සිහිකොට හටගත් සොම්නස් ඇතිව පූර්ව චරිතාපදානය ප්‍රකාශ කරන්නාහු **ඉමම්හි භද්දකෙ කප්පෙ** යනාදිය කීහ. ඒ සියල්ල යට කියන ලද පරිද්දෙන් නොගැඹුරු අරුත් ඇත්තේද, පහසුවෙන් දතහැක්කේද වේමැයි. හුදෙක් පින්වල වෙනසත් නම්වල වෙනසත් විශේෂයකි.


සුගන්ධ තෙරුන් වහන්සේගේ
අපදාන අටුවාවයි.

පනස් පස්වැනි වර්ග වර්ණනාව සමාප්තයි.

මෙසේ විසුද්ධජන විලාසිනී අපදාන අටුවාවෙහි මෙපමණකින්
බුදු පසේබුදු ශ්‍රාවක තෙරුන් වහන්සේලාගේ
අපදාන අටුවාව නිමියේය.

අල්පේච්ඡතාදී ගුණ ඇති ස්ථවිර වංශයට ප්‍රදීප වූ ආනන්ද ස්ථවිර ආදී සියලු සත්වයන්ගේ තෘෂ්ණාමාන දෘෂ්ටි ආදිය ඡේදන විග්‍රහ විවේචන ආදිය පිණිස සත්මසක් මහත් සාර්ථකත්වයෙන් ලැබුවා වූ කෞශල්‍යය ඇති බෝධිසම්භාර ගවේෂණය කරන ස්මෘති ධෘති ගති වීර්ය පරාක්‍රමයෙන් යුක්ත වූ මහා සාමන්ත ගුණයෙන් ශෝභිත වූ ත්‍රිපිටකධාරී වූ පණ්ඩිතයන් විසින් සිංහල ද්වීපයෙන් ගෙන එන ලද්දා වූ මේ අපදාන අටුවාව සදේවක ලෝකය දැනගනීවා.

අපදාන අටුවාව සමාප්තයි.



THE BO-TREE AT ANARAJAPOORA.

වෙනත්ව 1859

භදන්ත බුද්ධඝොෂාචාර්‍යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිංහලට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපෑල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-42-4